බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා: 10

සූත්‍රාන්තපිටකයෙහි

04 වන ග්‍රන්ථය

මජ්ඣිමනිකාය

ප්‍රථමභාගය

මූලපණ්ණාසකය

ලංකාබෞද්ධමණ්ඩලයෙහි ආරාධනයෙන්

ත්‍රිපිටක පරිවර්තන කාරක සභාවේ

මජ්ඣිමනිකාය සංශෝධක මණ්ඩලය

විසින් කරණ ලද

සිංහල පරිවර්තනයෙන් යුක්ත යි.

බු. ව. 2550

ක්‍රි. ව. 2006

Free Distribution www.aathaapi.org

Buddha Jayanti Tripitaka Series, Volume 10

The Fourth Book in the

Suttanta-Pitaka

4

MAJJHIMANIKĀYA (I)

MŪLAPANNĀSAKA

With the Sinhala Translation by

The Majjhimanikāya
Editorial Board of
The Tripitaka Translation Committee

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා
පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ
මහා ධර්ම දානමය පුණ්‍යකර්මය

"අපාරුතා තේසං අමතස්ස ද්වාරා
යෙ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං"

"කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී"

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ලයෙකු නො සළකා හිදිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්‍වඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල 'සද්ධා' නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව ("සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං") මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග ඵල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි ‘විමුත්තායතන’ සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !
බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !
ලෝ සත්නට සෙත් වේවා !

"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"
(*යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය*)

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය
මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ
සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද
පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,
සමින්ද රණසිංහ.
2009.06.28

සුත්තන්තපිටකෙ

මජ්ඣිමනිකායො

මූලපණ්ණාසකො

සූත්‍රාන්තපිටකයෙහි

මජ්ඣිමනිකාය

මූලපණ්ණාසකය

“තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො.”

“මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුණේ නො ම බබලයි.”

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 18 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:18 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

පටුන

CONTENTS

සංස්කාරක නිවේදනය	xxi - xxii
සංඥපනය	xxiii - xxviii
සංකේත නිරූපණය–Abbreviations	xxix
පාලි හෝඩිය–Pali Alphabet	xxx
විසයසූචි	xxxi - xxxii
පෙළ හා පරිවර්තනය	2 - 791
ගාථාදිපාදනුක්කමණිකා	793
සඤ්ඤනාමානුක්කමණිකා	794 - 798
විසෙසපදානං අනුක්කමණිකා	799 - 816

සංස්කාරක නිවේදනය

ත්‍රිපිටක - පාලියෙහි සූත්‍රාන්ත පිටකයට අයත් මජ්ඣිම නිකායෙහි ප්‍රථම භාගය වූ මූලපණ්ණාසකපාලිය සිංහලභාෂාවට පරිවර්තනය කිරීම පිණිස බුද්ධජයන්ති කාර්‍ය්‍ය සංවිධානය සඳහා පත් වූ ලංකා බෞද්ධ මණ්ඩලය විසින් - දැනට ශ්‍රීලංකා විද්‍යාලංකාරවිශ්වවිද්‍යාලයේ කථිකාචාර්‍ය්‍යවරයකු වන කොස්ගොඩ පණ්ඩිත ධම්මවංස මහානායකස්ථවිරයන් වහන්සේට පවරා දෙන ලදී.

ඒ නායක ස්ථවිරයන් වහන්සේ විසින් කරණ ලද මූලිකපරිවර්තනය ත්‍රිපිටකපරිවර්තනසංස්කාරක මණ්ඩලයට ඉදිරිපත් කළ පසු එය නැවත පරිවර්තනය කොට සකස් කල යුතු යයි සම්මත වූ බැවින් ඒ නායක ස්ථවිරයන් වහන්සේ ද, විද්‍යෝදයපරිවෙණාධිපති ව සිටි පණ්ඩිත වැලිවිටියේ සෝරත නායකස්ථවිරයන් වහන්සේද, අම්බලම්ගොඩ ශාස්ත්‍රෝදයපරිවෙණාධිපති පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල ස්ථවිරයන් වහන්සේ ද, ප්‍රධානපිරිවෙන්පරීක්ෂක පණ්ඩිත අකුරටියේ අමරවංශ නායක ස්ථවිරයන් වහන්සේ ද යන සිවුනම මජ්ඣිමනිකායසංශෝධක මණ්ඩලය වශයෙන් පත්වී ඒ කාර්‍ය්‍යයෙහි යෙදී සිටිනා අතර ගරු වැලිවිටියේ සෝරත නායක ස්ථවිරයන් වහන්සේ ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ අධිපති වීමෙන් ද, කොස්ගොඩ ධම්මවංස නායක ස්ථවිරයන් වහන්සේ රෝගී අවස්ථාවකට පැමිණීමෙන් ද, අකුරටියේ අමරවංශ නායක ස්ථවිරයන් වහන්සේත් ආබාධිත වීමෙන් ද ඒ කාර්‍ය්‍යය අඩාල විය.

ඉන්පසු මජ්ඣිමනිකාය ප්‍රථමභාගයේ ඉතිරි කොටසේ පරිවර්තනය හා සංස්කරණය - දැනට ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ කථිකාචාර්‍ය්‍ය වරයකු වන, අහංගම විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති පණ්ඩිත කෝදාගොඩ ඤාණාලෝක, දක්ෂිණලංකාවේ ප්‍රධානසංඝනායක ස්ථවිරයන් වහන්සේ වෙත පැවරුණේය. උන්වහන්සේ විසින් ඇතම් සූත්‍රාන්තයන් අමුතු ව ලා සිංහලයට නැගීමෙන් ද, විශේෂයෙන් පාඨාන්තරසංකලනයෙන් හා ලිපිදෝෂයෙන් ආකූලව තුබූ උද්දානගාථා සකස් කිරීමෙන් ද එය සම්පූර්ණ කොට මුද්‍රණයට යෝග්‍ය අවස්ථාවට පත් කරණ ලදී. ග්‍රන්ථය මුද්‍රණය කිරීමෙහි දී උන් වහන්සේ විසින් ද මුල් ශෝධ්‍යපත්‍ර බලන ලදී. ත්‍රිපිටකපරිවර්තන සංස්කාරක මණ්ඩලයෙහි සාමාජිකයන් වන - දැනට ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ කථිකාචාර්‍ය්‍යවරයකු වන පණ්ඩිත ලබුගම ලංකානන්ද ස්ථවිරයන් වහන්සේ ද, පණ්ඩිත කරගම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ ද ශෝධ්‍යපත්‍ර බැලීමෙහි සහායක වූහ.

ග්‍රන්ථාවසානයෙහි යෙදී ඇති ගාථාදිපාද - සඤ්ඤානාම - පදානුක්කමණිකාදිය සම්පාදනය සඳහා - දැනට ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ බුද්ධධර්මාධ්‍යයනාංශයේ ප්‍රමුඛාචාර්‍ය්‍ය බලත්ගොඩ ආනන්දමෛත්‍රෙය මහා නායක ස්ථවිරයන් වහන්සේ ද, කොහුවල විජයමංගලාරාමාධිපති ආචාර්‍ය්‍ය මකුළුදූවේ පියරතන ස්ථවිරයන් වහන්සේ ද, ලබුගම ලංකානන්ද ස්ථවිරයන් වහන්සේ සහ කරගම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ ද උපකාරී වූහ.

Free Distribution www.aathaapi.org

අපගේ අවසානසංස්කරණයෙන් මුද්‍රිත වූ මේ මජ්ඣිමනිකාය ප්‍රථම භාගය පිටක ග්‍රන්ථ සංඛ්‍යා වශයෙන් සූත්‍රාන්තපිටකයෙහි සිවුවන, මුද්‍රිත කාණ්ඩ සංඛ්‍යා වශයෙන් බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවෙහි දසවන ග්‍රන්ථය වේ. ප්‍රාචීනභාෂාවිෂයෙහි හා ධර්මශාස්ත්‍රයෙහි නිපුණ වූ, විශේෂයෙන් පාලිව්‍යාකරණයෙහි ද සිංහල සාහිත්‍යයෙහි ද ප්‍රවීණ පණ්ඩිතයකු වශයෙන් සම්භාවිත වූ කෝදාගොඩ ඤාණාලෝක නායක ස්ථවිරයන් වහන්සේ විසින් මේ ග්‍රන්ථයට මුඛෝද්ඝාත වශයෙන් ලියා ඇති සංක්‍ෂෙපනය ත්‍රිපිටකපාලියෙහි මජ්ඣිමනිකාය පිළිබඳ මහනීයත්වය විශද කිරීමෙහි පාශ්‍රීපත වනු ඇත.

මෙහි ඇතුළත් එක් එක් සූත්‍රාන්තයට විෂය වන ධර්මස්කන්ධය විභාවන කිරීමට නම් එක් එක් උපග්‍රන්ථයක් ලියයුතු වේ. තථාගතප්‍රණීත නිර්වාණාධිගමයට බාධක දෘෂ්ටිවාද මර්දනය මජ්ඣිමාගමයෙහි මුඛ්‍යඵලය වන බැව් කියා ඇත. එහි ප්‍රධාන දෘෂ්ටිවාදය වූ සත්කායදෘෂ්ටිය හෙවත් ආත්මවාදය පිළිබඳ සියලු දාර්ශනික මතයන්ගේ සම්භවය හා ව්‍යාප්තිය මූලපරියාය නම්වූ ප්‍රථම සූත්‍රයෙන් දත හැකි වේ. දර්ශනාන්තරයන්හි නානාත්වයෙන් ව්‍යවස්ථිත වූ ආත්මවාදය පිළිබඳ මූලධර්මයන්ගේ සංග්‍රහයක් වූ මේ සූත්‍රය පමණක් ම සර්වඥතාඥානයෙහි විෂයමහත්වයට ප්‍රමාණ වෙයි. ත්‍රිවේදපාරප්‍රාප්ත වූ පන්සියක් බමුණු පැවිදිතැන්ගේ මානමදනිරෝධය සඳහා බුදුරජාණන් වහන්සේ විසින් වේද විෂය ඉක්මවා නානා නය යුක්ත කොට දේශිත මේ සූත්‍රාන්තයෙහි දක්වෙන "පඨවිං.. සඤ්ජානාති" ආදි සූවිසි පදයන්ගෙන් සවස්තුක - අවස්තුක - සචේතනික - අචේතනික භාව විෂයන් කෙරෙහි ආත්මදෘෂ්ටිය නැගීගෙණ යන සැටිත්, සඞ්කල්පවශයෙන ඒ ඒ පුද්ගලයන් කෙරෙහි ඒ ආත්මදෘෂ්ටිය විශේෂවන සැටිත්, හේතුප්‍රත්‍යය විෂය කොට ඇති විවේක ඥානය ආත්ම දෘෂ්ටි විඝාතය කොට නිර්වාණාධිගමය සිද්ධ කරණ සැටිත් එයින් ප්‍රකාශ වේ.

සම්බුද්ධශාසනාභිවෘද්ධිසාධක වූ මේ උතුම් ධර්මග්‍රන්ථය මුද්‍රණද්වාරයෙන් මෙසේ ප්‍රසිද්ධියට පැමිණ වීමට උපකාරී වූ සංස්කාරක මහතෙරවරුන්ටත්, ලඞ්කාණ්ඩුවේ හා සංස්කෘතිකකායභාංශයේ අධිකාරීත්වටත් මහාබෝධි මුද්‍රණාලයේ කාත්‍යවිධායක - සේවක මණ්ඩලයටත් මෙයින් ජනිත ධර්මදානමය පුණ්‍යමහිමයෙන් සගමොක්සුව ලැබේවා යි ආශංසනය කරම්හ.

පරවාහැර වජිරඤාණ ස්ථවිර

ත්‍රිපිටපරිවර්තන සංස්කාරක
මණ්ඩලයෙහි සම්පාදක.

ත්‍රිපිටක කාර්‍යාලය, ධර්මදූතාශ්‍රම විද්‍යාලය,
සිරිවජිරඤාණ මාවත,
දෙමටගොඩ - කොළඹ.

සංඥාපනය

ග්‍රන්ථස්තුති:

"මජ්ඣිමපමාණසුත්තන්තඛචිතස්ස ඉධ මජ්ඣිමාගමවරස්ස,
බුද්ධානුබුද්ධසංවණ්ණිතස්ස පරවාදමථනස්ස."

විශුද්ධ බුද්ධීන් ප්‍රසිද්ධ වූ අනුබුද්ධබුද්ධඝොෂ ආචාරීන් වහන්සේ මැදුම් සඟියෙහි ස්වරූප විභාග කරනුවෝ 'මජ්ඣිමපමාණ සුත්තන්තඛචිතස්ස' යනාදීන් එයට ස්තොත්‍ර කෙරෙති. දීඝාගමාදීන් හා සසඳත් ම, මෙය මධ්‍යමප්‍රමාණ සූත්‍රාන්ත පිසින් සැදුම් ලද බව ද, බුද්ධානුබුද්ධයන් විසින් සංවර්ණිත බව ද පරවාදමථනය කරන බව ද එයින් පවසති. මෙහි බුද්ධානු-බුද්ධසංවර්ණිත විසින් විහිත ස්තොත්‍රය සාමාන්‍යයෙන් දීඝාගමාදීන් කෙරෙහිදු යෙදෙයි. පරවාදමථන විසින් අදාල ස්තොත්‍රය මජ්ඣිමාගමයෙහි යෙදෙන විශේෂයෙකි. එයින් මජ්ඣිමාගමය වෛනෙයජනයන්ට දෘෂ්ටිවිශුද්ධිසාධනයෙහිඅත්‍යන්තයෙන් හිතකර බව පැවසිණ.

ග්‍රන්ථවිභාග:

අර්ථකථාචාරීහු මෙහි පණ්ණාසක වශයෙනුදු, වර්ග වශයෙනුදු, සූත්‍ර වශයෙනුදු, පද වශයෙනුදු, අක්ෂර වශයෙනුදු, භාණවාර වශයෙනුදු, අනුසන්ධි වශයෙනුදු විස්තර විභාග කෙරෙති. මෙහි මූලපණ්ණාසකය, මජ්ඣිම පණ්ණාසකය, උපරිපණ්ණාසකය යි පණ්ණාසකයෝ තුන්දෙනෙක් වෙති. එක් එක් පණ්ණාසකයෙකැ පසක් පසක් බැගින් වර්ගයෝ පසළොස් දෙනෙක් වෙති. සූත්‍ර වශයෙන් ශෙළ සියක් හා අතිරේක දෙදෙනෙකැයි සූත්‍රයෝ එක්සිය දෙපනස් දෙනෙක් ඇති. පදවශයෙන් අසූදහස් පන්සියතෙවිසි පද කෙනෙක් වෙති. අක්ෂරවශයෙන් සත්ලක්ෂ සතලිස් දහස් තෙපනස් අක්ෂර කෙනෙක් වෙති. භාණවාර වශයෙන් පිරිපුන් අසූබණවරක් හා අඩබණ-වරක් හා තෙවිසිපද කෙනෙක් ඇත. අනුසන්ධි (අනුයාගත අථඝටනා) වශයෙන් පෘච්ඡානුසන්ධි ය, අධ්‍යාශයානුසන්ධි ය, යථානුසන්ධි යැ යි සැකෙවින් ත්‍රිවිධ අනුසන්ධි කෙනෙක් වෙති. විස්තර විසින් තුන්දහස් නවසිය අනුසන්ධි කෙනෙක් වෙති. මෙසේ පඤ්චාශත් ප්‍රමාණ ආදී වශයෙන් මෙහි විභාග දත්තේ ය.

ග්‍රන්ථසම්පද:

ධර්ම සඞ්ගීතියට නැඟුණු පරිදි තෙවළාදහම ගෙනැ ආඥා - ව්‍යවහාර-පරමාර්ථදෙශනා වශයෙන් බෙදා බලත් ම, තෙල මජ්ඣිමාගම වොහාර-දේශනායෙහි වැටෙයි. යථාපරාධ - යථානුලොම - යථාධර්මශාසන වශයෙන් බෙදා බලත් ම, යථානුලොම ශාසනයෙහි වැටෙයි. සංවරාසංවරදෘෂ්ටි-විමොචන - නාමරූපපරිච්ඡේද කථාවශයෙන් බෙදා බලත් ම, දෘෂ්ටිවිමොචන කථායෙහි වැටෙයි. ත්‍රිවිධශික්ෂා වශයෙන් බෙදා බලත් ම, ක්ලේශයන් නැඟීම් මැඩලන සමාධියට අයත් හෙයින් පර්යුත්ථාන ප්‍රහාණය කිසනු වෙයි. ධර්ම - අර්ථ - දේශනා - අභිසමය වශයෙන් පරමගම්භීර ද වෙයි. සම්පත් වශයෙන් ෂඩභිඥාසම්පත් උදාදෙනු වෙයි.

Free Distribution www.aathaapi.org

තවද, බුද්ධඝොෂාචාරීන් වහන්සේ මැදුම්සඟි අටුවායෙහි තෙල සඟිය ත්‍රිවිධ කල්‍යාණ ඇතිසේ දක්වති. එය ''සබ්බධම්මමූලපරියායං වො භික්ඛවෙ දෙසිස්සාමි''යි ප්‍රාරබ්ධ වන හෙයින් ආදිකල්‍යාණ වන බව ද, අවසන්හි ඉන්ද්‍රියභාවනා සූත්‍රයෙහිදී ''දෙසිතො අරියො භාවිතින්ද්‍රියො''යි වදාළ වචනවශයෙන් පර්‍ය්‍යවසානකල්‍යාණ වන බව ද, ආදි - අන්ත - උභය- සූත්‍රමධ්‍යයෙහි සුත්ත - ගෙය්‍යාදි නවාඞ්ග ඇතියෙන් මධ්‍යකල්‍යාණ වන බව ද කියති.

ග්‍රන්ථාශය:

මෙසෙයින් ත්‍රිවිධකල්‍යාණ වන මේ මැදුම් සඟිය 'මහාවිපස්සනා' නමින් පුරාණාචාර්‍ය්‍යයන් විසින් හඳුන්වන බව ද සඳහන් කොට මෙහි ආශය සකුළා ගෙනැ විශෙෂවිභාවන කරන්නාහු ''කුලපුත්‍රයනට දෘෂ්ටි- විශුද්ධිය පිණිස නය එළවන්නෙ මැදුම්සඟිය''යි කියති. දෘෂ්ටිවිශුද්ධි නම් නාමරූපයන්ගේ යථාවදර්ශන වෙයි. 'සත්ත්වයෙකැ, පුද්ගලයෙකැ' යන සත්ත්වසම්මොහය නස්නා සඳහා සූත්‍රාන්ත සිම්දිමින් 'නාමරූපමාත්‍ර වත්මුත් සත්ත්වයෙක්, පුද්ගලයෙක් නැති'යි ව්‍යවස්ථා කරන යෝගීනට ප්‍රතිෂ්ඨා වන සූත්‍රාන්තයෝ මෙහි බොහෝහ.

''සෙය්‍යථාපි ආවුසො කට්ඨඤ්ච පටිච්ච වල්ලිඤ්ච පටිච්ච මත්තිකඤ්ච පටිච්ච තිණඤ්ච පටිච්ච ආකාසො පරිවාරිතො අගාරන්තෙව සඞ්ඛං ගච්ඡති, එවමෙව ඛො ආවුසො අට්ඨිඤ්ච පටිච්ච න්හාරුඤ්ච පටිච්ච මංසඤ්ච පටිච්ච චම්මඤ්ච පටිච්ච ආකාසො පරිවාරිතො රූපන්තෙව සඞ්ඛං ගච්ඡති.'' යනාදි වශයෙන් මෙහි වදාළ ඒ ඒ සූත්‍රොපදේශය සත්සංඥජනක සම්මොහය නස්නට ඉවහල් වෙයි. පඤ්චොපාදානස්කන්ධයෙහි එක් එක් ස්කන්ධයක් වෙන වෙන ගෙනැ ඇතිතතු පරීක්ෂා කොට බලත් ම 'මම යැ, මාගෙ මෙය' යි ආත්මසාරවශයෙන් ග්‍රාහයට වස්තුභූත සත්ත්වයෙක් නැත, නාමරූපමාත්‍ර මිස ය යි දක්නහුගේ දර්ශනය යථාභූතදර්ශන නම් වෙයි.

යමෙක් මෙ යථාවදර්ශනය තබා 'සත්ත්වයෙක් ඇති'යි ගන්නේ වේ නම්, හේ ඒ සත්ත්වයාගේ විනාශය හෝ අවිනාශය පනවන්නේ ය. එහි විනාශය පනවන්නේ උච්ඡේදයෙහි හෙයි. අවිනාශය පනවන්නේ ශාශ්වතයෙහි හෙයි. මේ විපරීතග්‍රාහය බිඳුනට නානානයෙන් නාමරූප පරිච්ඡේද කොට සත්ත්වසංඥ නසා අසම්මොහ භූමියෙහි සිටුමින් දෘෂ්ටිවිශුද්ධි සිද්ධ කළමනා වෙයි. මේ සංස්කාර පරිච්ඡේදඥානය ලබන්නට මජ්ඣිමාගම ය නය දෙන්නේය. මූලපරියාය සූත්‍රය, සබ්බාසව සූත්‍රය, හත්ථිපදොපම සූත්‍රය, ආදි සූත්‍රාන්ත අනුසාරයෙන් එකරුණ මැනැවින් දන්නේ ය.

මෙසේ පරවාදවශයෙන් එන ශාශ්වතදෘෂ්ටි උච්ඡේදදෘෂ්ටි බිඳලන හෙයින් මේය පරවාදමර්ථනය යි කීම සපින වෙයි. වත්ථූපම සූත්‍රයෙහි එන සුන්දරික භාරද්වාජ බ්‍රාහ්මණාදීන්ගේ උදකාවගාහශුද්ධි ආදි මිථ්‍යාමත ද, උපාලිසූත්‍රාදියෙහි සඳහන් වන අචෙතනයන් චෙතනයන් කොට ගෙනැ කායදණ්ඩාදිය පැනැ වූ ඇතැම් කර්මවාදී ශාස්තෘන්ගේ විකල්ප විසඳීමෙන් පරසමයවාදීන්ගේ මිථ්‍යාවාද ද බිඳලූ සැටි මැදුම් සඟියෙහි වෙසෙසින් සඳහන් වන්නේ ය.

මෙකලැ කිසි අවිවේකී කෙනෙකුත් දීඝ සූත්‍ර මැදුම් සඟියෙහි ඇතියෙන් 'මජ්ඣමනිකාය' යනු අන්වර්ථ නොවන සේ කියතුදු විවිධ දෘෂ්ටි බිඳුමින් පරවාදමර්ථනය කරන්නට පොහොසත් ධර්මප්‍රදේශ විස්තර වශයෙන් ගෙන ප්‍රමාණාතී කොට දක්වන කල අන්වර්ථනාමයට විරෝධයෙක් නැත. ඒ ඒ නිකායට වෙන් කළ සූත්‍රසංඛ්‍යා පරිගණනායෙහි දී ප්‍රමාණ වශයෙන් මධ්‍යමප්‍රමාණ සංඛ්‍යායෙක් මෙහි ඇත්තුයි එයිනුදු තෙල අන්වර්ථ වන්නේය.

බුද්ධශාසනක්ෂේත්‍රය:

පමණ විසින් බලත් ම, අප දිවයින කුඩාවුව ද, එය බුද්ධශාසනයෙහි සිද්ධක්ෂේත්‍රය විසින් සැලැකියැ හෙන්නේ ය. අද ලෝකයෙහි ප්‍රවචනපාළිය පවත්නෙ එය ලක්දිව සිංහල මහතෙරවරුන් ලියා තැබූ හෙයිනි. ඉදින් එදා ඔබ මුඛපරම්පරයෙන් ගෙන ආ තෙවළාදහම මාතලේ අලුවිහාරයෙහි දී නො ලියුහු නම්, ලොව ත්‍රිපිටක පාළියෙක් නැත. හැම ත්‍රිපිටක අර්ථකථායෙක් සිය බසින් නිරවුල් ව මෙහි පැවැතිණ. ස්ථවිරවාද සංඛ්‍යාත විභජ්ජවාදයෙහි සිද්ධක්ෂේත්‍රය වන අනුරාධපුර මහාවිහාරය සිංහලයන් විසින් ම ගොඩනැංවිණ. බුදුන් පහළ වැ දහම් දෙසූ දඹදිව් තෙලෙහි සිට ඒ බුදුන්ගේ දහම නිසියේ දක්නට බුද්ධඝොෂාචාරීන් වහන්සේ බඳු මහ පඬිවරුන් සිංහලද්වීපයට පැමිණීම ද සිංහලයන් කෙරෙහි පැවැති ධර්මඥතමහිමය දක්වන සාධකයෙකි.

සම්බුද්ධ ශාසනභාරය නිඃශෙෂයෙන් සිංහල වර්ගයා කෙරෙහි රැඳියන බව දැනැ එය උන් කෙරෙහි පිහිටුවනු සඳහා මෙහි වැඩි මිහිඳු මහ රහතන් වහන්සේ සිංහලයනට පලමු මැ දෙසූ දහම වන චූලහත්ථිපදෝපමසූත්‍රය මේ මැදුම්සඟියෙහි ඇතුලත් වෙයි. එයින් සිංහල ජාතිය බුද්ධශාසනයෙහි උපාසකත්වයට පැමිණ වූයේ මෙ මජ්ඣිමාගම යයි සලකන්නේය.

මජ්ඣිමභාණකපරම්පරාව:

ප්‍රථම සංගායනාවසානයෙහි මජ්ඣිමාගමය සැරියුත් මහ රහතන් වහන්සේගේ ශිෂ්‍යගණයා හට දක්වා දුන ද, එය ඒ පරපුරෙහි වූ මජ්ඣිමභාණක සිංහල මහතෙරවරුන් තමන් ම ලත් ස්වදායාදයක් සෙයින් අත්‍යාදරයෙන් පුහුණුකළ සේ පෙනේ. මූලපරියාය සූත්‍රයෙහි ඒ ඒ භූමිපරිච්ඡේදයෙහි වැටෙන පැරැණි හෙළවැකිවැලිනුදු දිවයිනෙහි අශොකාක්ෂරයෙන් කෙටූ ලෙන් ලිපි රැසෙහි නොයෙක් තැනැ එන 'මජිමබණක' යන වචනයෙනුදු එබව හෙළි වෙයි. මෙරට පැරැණි ලෙන් ලිපි අතරැ 'මජිමබණක' යන සඳහන මිසැ ඉතිරි භාණකයන් ගෙනැ කල සඳහනෙක් දුර්ලභ ද වෙයි. මේ හැම කරුණින් හෙළිවන දෙයෙක් ඇත: සිංහල මහතෙරවරුන් "මජ්ඣිමාගමය සැරියුත් මහරහතන් වහන්සේගේ ශිෂ්‍යගණයා කෙරෙහි මතු නොවැ අප ද කෙරෙහි පවරා දුන් දයෙකැ"යි සිතුවාක් වැනි බවයි.

පුරාණපරිවර්තන:

අතීතයෙහි බුද්ධදාස මහරජහු දවස ධර්මකථික නම් අංගම්බර මහ තෙර කෙනෙකුන් සූත්‍රාන්තයන් සිය බසින් අරවා තැබූ බව ඉතිහාසයෙහි ප්‍රසිද්ධ වැ ඇත. එය බුද්ධඝොෂාචාරීන් වහන්සේ මෙරටට පැමිණෙන්නට පෙරැ ක්‍රිස්තුවර්ෂයෙන් සිවුවැනි ශතවර්ෂයෙහි සිදු වූ දෑයෙකි. මැදුම් සඟියත් ඒ පරිවර්තනයෙහි ඇතුලත් වුවද අද ඒ ලිපි නැත. ධම්පියාටුවා ගැටපද සන්නයෙහි "මහ තෙරුන් කසයින් සම්දිට්හැ සුතත් වියබැන් කෙරෙමින්" යනාදි පාඨයෙක් එයි. කලින් කල ඒ ඒ ඇදුරෙල්හි තෙරවරුන් සඟියෙහි සූත්‍රාන්ත ගෙනැ ව්‍යාඛ්‍යාන සැපයූසෙ එසින් පැවසෙතුදු අද ඒ ලිපි ද නැත. අමාවතුර කරන ගුරුළුගෝමීන් සච්චක සූත්‍රාදිය ඇසිරි කොට කළ පරිවර්තන කිහිපයෙක් අද ද ග්‍රන්ථාරූඪව ඇත. මූලපරියාය, සම්මාදිට්ඨි, මහාසීහනාද, වම්මික, රට්ඨපාල, සාලෙය්‍ය ආදි සූත්‍රාන්ත ගෙන වෙන වෙන කළ පරිවර්තන බෙහෙවින් ඇත ද එ හැම සම්පාතීතයෙහි වැටෙනුයෙන් එහි හැඳින්වියැ යුතු විශෙෂ දෑයෙක් නො එයි.

පාඨශුද්ධි:

පාඨාන්තර විමසා බලත් ම, ග්‍රන්ථාරූඪ සඞ්ගීතිය නෙක් පාඨශුද්ධි මැනැවින් පැවැත්මෙසයට සාධක කථා දක්නා ලැබේ. මහාසමය සූත්‍ර අටුවාවෙන් සිය බසට ගත් තෙල වැකිය බලත්තේය:

"කෙලපවු වෙහෙරැ නාලෙනදෙරැ නාරුකැ එක් දෙව් දුවක් වෙසෙයි. එක් ලදරු පැවිජ් කෙනෙක් ඇතුළුලෙනැ හිඳැ මෙසුත පිරිවහති. දෙව් දූ අසා සමහරයෙහි මහත් කොට සාධුකාර දුනැ. 'පැවිජ්ජෙ නො කවරහු' යි කීහු. 'වහන්සෙ, මම දෙව්දුවක්මු' යි කිවැ. කුමට සාධුකාර දුන්හු' යි කීහ. "වහන්සේ, බුදුන් මහාවනයෙහි වැඩැ හිඳැ මෙසුත දෙසන දවස් ඇසීම්. දූත් අද ඇසීම්. බුදුන් වදළ නියායෙන් එක් අකුරකුදු නො පිරිහෙලා ගත් දෑයැයි කිවැ."

මෙහි පාඨශුද්ධිය පිණිසැ දෙවියන් සාධුකාර දුන්සෙ කියනුයෙන් මුඛපාඨ වශයෙන් නෙවලා ගෙනැ ආ දවස් පාඨශුද්ධිය මැනැවින් වැටුණු බව පෙනේ. ගුරුවාසයෙහි දී මුඛපාඨවශයෙන් හදළ පෙළ අවුල් වන්නට කරුණෙක් නැත. ග්‍රන්ථාරූඪකරණයෙන් පසු ලෙඛකයන්ගේ අනවධානයෙනුදු, දෙශාන්තරයෙහි දී හටගත් විෂමපාඨහෙතුයෙනුදු බෙහෙවින් අවුල්වැ ගියනැන් මෙහිදු දක්නට ලැබේ. එහි නිර්මලීකරණය අද දුෂ්කර වූ ක්‍රියායෙකි. මෙහි අධොලිපි වශයෙන් බහාලූ පාඨරාශියෙන් එය දත හෙන්නේය. විශෙෂයෙන් මෙහි භාණකයන් ලියූ 'වගීංනන උදානගාථා, සලකා බලත් ම අවුල්වියවුලෙහි නතු කොතරම් වේ ද යනු දත හැකිවෙයි. පාඨශොධනය පිණිසැ මෙහි දැරූ උත්සාහ මේ ග්‍රන්ථය හදරන නුවණැතියනට මැනැවින් වැටහී යනවා ඇතිසි සිතම්හ.

පාළිපදප්‍රයොග:

පාළියෙහි බස විමසත් ම, එය බුද්ධකාලයෙහි ව්‍යවහාරපථයෙහි වැටුණු බසක් බව කියන සාධකයෝ බොහෝ වෙති. "පියඤ්ජනා, සුවාමී, දුවෙ, තුවං" ආදි සහස්‍රසඞ්ඛ්‍යාත ශිථිලපද ද, "අච්චායං, එවං ව්‍යා බො (අපි ච අයං, එවං විය බො)" යනාදි ශතසඞ්ඛ්‍යාත සත්ථි පද ද එයට දෙස් විසින් දක්විය හැකි. ප්‍රාකෘතිකගති ඇති පදයන්ගේ ප්‍රයෝග ද නිකායාන්තර-වාසීන්ගේ වාක්ප්‍රයෝග ද දේශභාෂා පදවශයෙන් විකෘත වූ පදයන්ගේ ප්‍රයෝග ද කිසි තැනෙකැ ඇත. "මහ ජෙ කාළි - කිං ජෙ දිවා උට්ඨාසි" යි කකචූපම සූත්‍රාදියෙහි එන 'ජෙ' යන පදය ප්‍රාකෘතික ගති ඇති සේ පෙනේ. බුද්ධකාලයෙහි පැවැති ලෝක චාරිත්‍ර විධි අනුවැ සිව්වැදෑරුම් දාසගණ-යෙක් වෙයි. 'අන්තොජාත, ධනක්කීත' ආදි වශයෙන් අටුවායෙහි එය සඳහන් කෙරෙති. මෙහි 'ජාත' යනු සියගෙහි මැ පරම්පරාවශයෙන් එන දාසයාට ද වැ දාසිය කුස උපන් දරු වෙයි ගේ නම 'ජාතදාස' යි. එහි කෙල්ල 'ජාතා' නමු. එහි සම්බුද්ධි රූපය 'ජාතෙ' යි වියැයුතුය. ප්‍රාකෘත-ධර්ම වශයෙන් 'ජාඑ'යි සිද්ධ වැ සංහිතා විසින් 'ජෙ' යි දාසිආමන්ත්‍රණපද-සිද්ධිය සැලකියැ හැක්කේය. නිඝණ්ඩුයෙහි නිර්විශේෂ ආමන්ත්‍රණනිපාත වශයෙන් කිව ද තෙල පදය ජාතදාස්‍යාමන්ත්‍රණයෙහි ම රූඪ වෙයි. ප්‍රාකෘත-යෙහිදු 'ජේ'යි නිපාතපදයක් කිව ද ඒ පදපූරණාර්ථයෙහි ම වෙයි. සකුයෙහි මේ රූපය නො ලැබේ. මෙබඳු ප්‍රාකෘතිකපද මේ සඟියෙහිදු එයි. මේ ද පාළියෙහි භාෂාව ව්‍යවහාරභාෂා වන හෙයින් සිද්ධසේ සලකම්හ. "එකූන පඤ්ඤාස ආජීවකසතෙ, පරිබ්බාජකසතෙ, නාගාවාසසතෙ, වීසෙ ඉන්ද්‍රියසතෙ" යි සඞ්ඛ සූත්‍රාදියෙහි එන වාක්‍යප්‍රදේශ සමයාන්තරවාසීන්ගේ වාක්ප්‍රයෝග විසින් සලකන්නේය. 'තං පවුත්තං' යනු පිණිසැ 'සෙ පවුත්තෙ' කියා ද, 'තං භිත්තං' යනු පිණිසැ 'සෙ භිත්තෙ' කියාද 'තං වත්තං' යනු පිණිසැ 'සෙ වත්තෙ' කියාදුයි 'ත' ශබ්දයාගේ 'සෙ' යන රූපයෙක් මෙහිදු පෙනේ. එය කලීවලිඞ්ගයෙහි වැටෙන්නාක් සෙයින් මැ පුංලිඞ්ගයෙහිදු වැටේ. 'සුතන්ත සුබුච්චාරණත්ථමක්ඛරලොපො, විපරීතතා ච' යන ශබ්දනීති සූත්‍රයෙහිදී 'එසො, සො, එකො' යනු 'එසෙ, සෙ, එකෙ' යි විපර්‍යාස වනසේ දක්වූහ. මෙහි 'සෙ' යනු පුංලිඞ්ගනිර්දේශවශයෙන් කියති 'ත' ශබ්දයාගේ රූපොත්පාදනයෙහි දී තෙල රූපය දේශාන්තරභේද වශයෙන් එන විපර්‍යාසරූප වන් මුත් මෞලිකරූප නොවනුයෙන් කච්චායන, මොග්ග-ල්ලායන දෙක්හි අනනුශිෂ්ට සේ සලකම්හ.

ශබ්දනීතිකාරයන් පාළියෙහි ආගම හකාරයක් කියා 'හෙවත්ථි' යනාදි පද උදාහරණ කරතුදු කච්චායනාදියෙහි එවන් උපදේශයෙක් නො එයි. ඒ පද කථාවත්ථු යෙහි එන කාලාන්තරසඤ්ජාත වූ උච්චාරණ විකෘති-රූප වන් මුත් පාළියෙහි එන මෞලිකශබ්දධර්ම නොවන හෙයිනි. 'ත' ශබ්දයාගේ රූපොත්පාදනයෙහිදී ද කච්චායනාදියෙහි 'සෙ' යනු සඞ්ගෘහීත නොවනුයේ තෙල හේතුයෙනැයි එසෙයින්මැ සැලකිය හැකි. මෞලික-රූප නොවතුදු 'සෙය්‍යථීදං' යනාදි පද අවයව විසින් බිඳගනුත් හොත් පාළියෙහිමැ දක්නා ලැබෙන 'සෙ' යනු මැ ගෙනැ නිෂ්පත්ති දක් විය හැකියැ. ශබ්දනීතිකාරයෝ "අථ පනාචරියා සෙය්‍යථීදන්ති ඔකාරස්ස එකා-රත්තමිච්ඡන්ති. පාඨන්තරං නෙහි දිට්ඨං භවිස්සති. මයං පන න පස්සාම"යි පැරැණියන් 'සො යථා'යි පද බිඳ ඔකාරයට එකාර කොට 'සෙය්‍යථා'යි සිද්ධි කියතුදු නමින් එබඳු පාඨාන්තරයක් නො දුටුසේ සඳහන් කෙරෙති.

"සෙය්‍යථීදන්ති සො කතමොති වා, තෙ කතමෙති වා, සා කතමාති වා, තා කතමාති වා, තං කතමන්ති වා, තානි කතමානීති වා, එවං ලිඞ්ගවචන වසෙන අනියමිතෙ අත්ථෙ" යි සෙය්‍යථීදං - යනු ලිඞ්ගත්‍රයෙහි ප්‍රථමා එක වචන බහුවචන දෙක්හි ම අනියමිතාර්ථයෙහි යෙදෙන බව ද සඳහන් කෙරෙති. මෙයින් පැරණියන් 'සො යථා' යි ගත ද එය තබා, මූලෑ කී 'සෙ' යන රූපය කිසි තැනෙකැ අසඞ්ඛ්‍ය ස්වරූපයෙන් සිටුනා සේ සැලැකිය හෙත්තේය. තකාර සකාරයෝ දෙදෙනා උත්පත්තින් දන්තජ වෙත් හුයි සකාරයා විසින් තකාරයා ආක්‍රාන්ත වත් මැ 'තං, තෙ' යනු පිණිසැ 'සෙ' යනු පැමිණිසැ හෙත්තේය. ඒ රූපය පාලියෙහි මැ අතිප්‍රයුක්තදේශපද වශයෙන් බැසැගෙනැ සිටුනාසේ දත හැකිවෙයි. තෙල සඟියෙහි එන 'සෙය්‍යංසො, පාපියංසො,' යනාදි පද විමසත් ම, වෛදික පක්‍ෂයෙහිත් සිටුනා 'ශ්‍රෙයස්, පාපීයස්' යනාදි ශබ්දයන්ගේ රූපාන්තර බව කියැ හැකියැ.

මෙසෙයින් පාලියෙහි නෛපුණ්‍යය ඇති නෛරුක්තිකයන් විසින් විමැසියැයුතු බොහෝ පදරත්නයන් උද්ධරණය කොටගන්නට මැදුම්සඟිය සාගරසදෘශ බව කියම්හ.

පිටකසංසන්දනා වශයෙන් පදප්‍රයොග විමසා බලත් හොත් විනය-පාලියෙහි ලැබෙන ඇතැම් ප්‍රයෝග විධි මෙහි දුර්ලභ බව කියැ යුතු වෙයි. "භික්ඛු නිසින්නෙ මාතුගාමෙ උපනිසින්නො වා" යි විනයෙහි 'භික්ඛුම්හි'යි තැබුව මනා පදය අවිභක්තිකනිර්දේශ වශයෙන් 'භික්ඛු' යි තැබී. එහි මෙබඳු බොහෝ යෙදුම් ඇත ද සූත්‍රාන්තපාලියෙහි එබඳු යෙදුම් දුර්ලභ වෙයි. මෙ හැම නුවණැතියන් විසින් ඒ ඒ තන්හි විමසා බලත්තේය.

මේ මජ්ඣිමනිකාය ප්‍රථමභාග පරිවර්තනසංස්කරණයෙහි දී ගෞරවාර්හ දර්ශනවිශාරද මහොපාධ්‍යාය පරවාහැර සිරි වජිරඤාණාභිධාන, කොළඹ තවකෝරලයෙහි ප්‍රධාන සඞ්ඝනායක මහාස්ථවිරපාදයන් වහන්සේගේ සදුපදේශ අත්‍යර්ථයෙන් එළිය දුන් බව ඔබ කෙරෙහි අතිශය ගෞරවයෙන් සඳහන් කරම්හ. ත්‍රිපිටකයෙහිදු දර්ශනශාස්ත්‍රවිෂයෙහිදු පරිණතබුද්ධිප්‍රභා ඇති ඔබගේ උපදේශ නො ලද නම්, මේ පරිවර්තනයෙහි ධර්මාර්ථයන් පිළිබඳ දුර්බොධස්ථාන සුබොධ නොවන බව කියනු කැමැතියම්හ.

කෝදාගොඩ ඤාණාලෝක ස්ථවිර

විද්‍යාචන්ද්‍ර පිරිවෙන, අහංගම.
බුද්ධ වර්ෂ - 2508

සඞ්කේතනිරූපණය

ABBREVIATIONS

සී.	——	වැලිගම අග්ගබෝධි රාජමහාවිහාරෙ සීහළ තාලපණ්ණ-පොත්ථකං.
සී. කතුවි.	——	අම්බලම්ගොඩ මහාවිහාරෙ තාලපණ්ණ පොත්ථකං.
සීමු.	——	විජ්ජාලඞ්කාර තිපිටක මණ්ඩල - සීහළක්ඛර - මුද්දිත-පොත්ථකං..
ස්‍යා.	——	ස්‍යාමක්ඛර - මුද්දිතපොත්ථකං.
මඡසං.	——	මරම්මඡට්ඨසඞ්ගීතිපිටකපොත්ථකං.
PTS.	——	Pali Text Society - Majjhimanikaya.

THE PĀLI ALPHABET

IN SINHALESE CHARACTERS.

VOWELS

අa ආā ඉi ඊī උu ඌū එē ඔō

CONSONANTS

කka	ඛkha	ගga	ඝgha	ඞṅa
චca	ඡcha	ජja	ඣjha	ඤña
ටṭa	ඨṭha	ඩḍa	ඪḍha	ණṇa
තta	ථtha	දda	ධdha	නna
පpa	ඵpha	බba	භbha	මma

යya	රra	ලla	වva	සsa	හha	ළḷa	අංaṃ
ක ka	කා kā	කි ki	කී kī	කු ku	කූ kū	කෙ kē	කො kō
ඛ kha	ඛා khā	ඛි khi	ඛී khī	ඛු khu	ඛූ khū	ඛෙ khē	ඛො khō
ග ga	=	=	=	=	=	=	=

Conjunct - Consonants

කක kka	ජ්ඣ jjha	ත්ථ ttha	බ්‍ර bra
කඛ kkha	ඤ්ඤ ññа	ත්‍ර tra, ත්ව tva	ම්ප mpa
ක්‍ය kya	ඤ්හ ñha	ද්ද dda	ම්ඵ mpha
ක්‍රි kri	ඤ්ච, ච ñca	ද්ධ, ධ ddha	ම්බ, ඹ mba
ක්ව kva	ඤ්ඡ, ඡ ñcha	ද්‍ර dra	ම්භ mbha
ඛ්‍ය khya	ඤ්ජ, ජ ñja	ද්ව ව, dva	ම්ම mma
ඛ්ව khva	ඤ්ඣ ñjha	ධ්ව dhva	ම්හ mha
ඞ්ක ṅka	ට්ට ṭṭa	න්ත nta	ය්‍ය, ය්‍ය yya
ඞ්ඛ ṅkha	ට්ඨ, ඨ ṭṭha	න්ථ ntha	ය්හ yha
ග්ග gga	ඩ්ඩ ḍḍa	න්ද nda	ල්ල lla
ග්ඝ ggha	ඩ්ඪ ḍḍha	න්ධ ndha	ල්‍ය lya
ග්‍ර gra	ණ්ණ ṇṇa	න්න nna,	ල්හ lha
ඞ්ග ṅga	ණ්ට ṇṭa	න්හ nha	ව්හ wha
ඞ්ඝ ṅgha	ණ්ඨ ṇṭha	ප්ප ppa	ස්ස ssa
ච්ච cca	ණ්ඩ, ඬ ṇḍa	ප්ඵ ppha	ස්ම sma
ච්ඡ ccha	ණ්හ ṇha	බ්බ bba	ස්ව swa
ජ්ජ jja	ත්ත tta	බ්භ bbha	හ්ම hma

හ්ව hva ළ්හ ḷha

ා ā ි i ී ī ු u ූ ū ෙ ē ො ō

Free Distribution www.aathaapi.org

මජ්ඣිමනිකායෙ මූලපණ්ණාසකෙ

විසයසූචි

සුත්තසඞ්ඛ්‍යා			පිට්ඨඞ්කා
	1. මූලපරියායවග්ගො		**2 – 154**
1.	මූලපරියාය	සුත්තං	2 – 18
2.	සබ්බාසව	,, ...	18 – 28
3.	ධම්මදායාද	,, ...	30 – 36
4.	භයභෙරව	,, ...	38 – 54
5.	අනඞ්ගණ	,, ...	54 – 74
6.	ආකඞ්ඛෙය්‍ය	,, ...	74 – 82
7.	වත්ථූපම	,, ...	82 – 92
8.	සල්ලෙඛ	,, ...	92 – 108
9.	සම්මාදිට්ඨි	,, ...	110 – 132
10.	සතිපට්ඨාන	,, ...	134 – 154

මූලපරියායවග්ගො පඨමො.

	2. සීහනාද වග්ගො		**154 – 306**
11	චූළසීහනාද	සුත්තං	154 – 164
12.	මහාසීහනාද	,, ...	164 – 198
13	මහාදුක්ඛක්ඛන්ධ	,, ...	200 – 214
14.	චූළදුක්ඛක්ඛන්ධ	,, ...	214 – 226
15	අනුමාන	,, ...	228 – 250
16.	චෙතොඛිල	,, ...	252 – 262
17.	වනපත්ථ	,, ...	264 – 272
18.	මධුපිණ්ඩික	,, ...	272 – 286
19.	ද්වෙධා විතක්ක	,, ...	288 – 298
20.	විතක්කසණ්ඨාන	,, ...	300 – 306

සීහනාදවග්ගො දුතියො.

	3. ඔපම්මවග්ගො		**308 – 492**
21.	කකචූපම	සුත්තං	308 – 322
22.	අලගද්දූපම	,, ...	324 – 354
23.	වම්මික	,, ...	354 – 360
24.	රථවිනීත	,, ...	362 – 372
25.	නිවාප	,, ...	374 – 392
26	අරියපරියෙසන	,, ...	394 – 424
27.	චූළහත්ථිපදොපම	,, ...	426 – 446
28.	මහාහත්ථිපදොපම	,, ...	448 – 462
29.	මහාසාරොපම	,, ...	462 – 476
30.	චූළසාරොපම	,, ...	478 – 492

ඔපම්මවග්ගො තතියො.

Free Distribution www.aathaapi.org

4. මහායමකවග්ගො 494 - 660

31. චූළගොසිඞ්ග සුත්තං ... ... 494 - 506
32. මහාගොසිඞ්ග ,, ... 508 - 524
33. මහාගොපාලක ,, ... 526 - 534
34. චූළගොපාලක ,, ... 536 - 540
35. චූළසච්චක ,, ... 540 - 558
36. මහාසච්චක ,, ... 560 - 592
37. චූළතණ්හාසඞ්ඛය ,, ... 592 - 600
38. මහාතණ්හාසඞ්ඛය ,, ... 602 - 632
39. මහාඅස්සපුර ,, ... 632 - 650
40. චූළඅස්සපුර ,, ... 652 - 660

මහායමකවග්ගො චතුත්ථො.

5. චූළයමකවග්ගො 662 - 790

41. සාලෙය්‍යක සුත්තං ... ... 662 - 672
42. වෙරඤ්ජක ,, ... 672 - 684
43. මහාවෙදල්ල ,, ... 684 - 700
44. චූළවෙදල්ල ,, ... 702 - 716
45. චූළධම්මසමාදාන ,, ... 718 - 726
46. මහාධම්මසමාදාන ,, ... 728 - 742
47. වීමංසක ,, ... 744 - 750
48 කොසම්බිය ,, ... 752 - 762
49. බ්‍රහ්මනිමන්තනික ,, ... 764 - 774
50. මාරතජ්ජනිය ,, ... 776 - 790

චූළයමකවග්ගො පඤ්චමො.

මූලපණ්ණාසකං නිට්ඨිතං.

සුත්තන්තපිටකෙ

මජ්ඣිමනිකායො

පඨමො භාගො

Free Distribution www.aathaapi.org

සුත්තන්තපිටකෙ

මජ්ඣිමනිකායො

මූලපණ්ණාසකො

---

1. මූලපරියායවග්ගො

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

1. 1.

මූලපරියායසුත්තං

1. එවං මෙ[1] සුතං: එකං සමයං භගවා උක්කට්ඨායං විහරති සුභගවනෙ සාලරාජමූලෙ තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. සබ්බධම්මමූලපරියායං වො භික්ඛවෙ දෙසෙස්සාමි[2]. තං සුණාථ. සාධුකං මනසි කරොථ. භාසිස්සාමීති. එවං භන්තෙති[3] ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

(1)

3. ඉධ භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී[4] අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී[4] සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො පඨවිං පඨවිතො[5] සඤ්ජානාති. පඨවිං පඨවිතො[5] සඤ්ඤත්වා පඨවිං මඤ්ඤති. පඨවියා මඤ්ඤති. පඨවිතො මඤ්ඤති. පඨවිං මෙති[6] මඤ්ඤති. පඨවිං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං[7] තස්සාති වදාමි. (1)

---

1. එවමෙම, ස්‍යා. PTS සී. I. සී. II.
2. දෙසිස්සාමි, ස්‍යා.
3. එවම්භන්තෙති, ස්‍යා PTS. සී. I. සී. II.
4. අදස්සාවි, සී. I.
5. පඨවිං පඨවිතො, මජසං
6. පඨවිමෙමිනි, ස්‍යා. PTS. සී. I. සී II.
7. අපරිඤ්ඤණං, සී. I

සූත්‍රාන්තපිටකයෙහි

මැදුම්සඟිය

මූලපණ්ණාසකය

---

1. මූලපර්‍යායවර්ගය

ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා.

1. 1.

මූලපරියායසූත්‍රය

1. **මා** විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ උක්කට්ඨානුවර සමීපයෙහි වූ සුභගවනයෙහි වනදෙටුමහරුකක් මුල වැඩ වසනසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූසේක. ඒ භික්ෂූහු 'ස්වාමීනි'යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළසේක:

2. මහණෙනි, තොපට සියලු සත්කායධර්මයනට මූලකාරණය දෙශනා කරන්නෙමි. එය අසවු. මනා කොට මෙනෙහි කරවු. දෙශනා කරන්නෙමි. 'එසේ ය, ස්වාමීනි'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක-

(1)

3. මහණෙනි, මේ ලොකයෙහි (බුද්ධාදි) ආර්‍යයන් නො දක්නාසුලු ආර්‍යධර්මයෙහි අදක්ෂ වූ ආර්‍යධර්මයෙහි නො හික්මුණා වූ (බුද්ධාදි) සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂධර්මයෙහි අදක්ෂ වූ සත්පුරුෂ-ධර්මයෙහි නො හික්මුණා වූ අශ්‍රැතවත් (ආගමාධිගමරහිත වූ) පෘථග්ජන තෙමේ පෘථිවිය පෘථිවිය වශයෙන් (තෘෂ්ණා මාන දෘෂ්ටි මන්‍යනාවෙන් සංඥාවිපර්‍යාසවශයෙන්) හඳුනයි. පෘථිවිය පෘථිවිය වශයෙන් හැඳින පෘථිවිය (තෘෂ්ණා මන්‍යනාදිවශයෙන්) හඟියි. 'මම පෘථිවියෙහි පිහිටියෙමි'යි හඟියි. 'මම පෘථිවියෙන් බැහැර වෙමි'යි හඟියි. 'පෘථිවිය මාගේ'යි හඟියි. පෘථිවිය අභිනන්දනය කෙරෙයි. ඒ කවර හෙයින ? යත්: ඔහුගේ පෘථිවිය (පිළිබඳ) පිරිසිඳ නො දැනීම (හෙයිනැ) යි කියමි. (1)

4. ආපං ආපතො සඤ්ජානාති. ආපං ආපතො සඤ්ඤත්වා ආපං මඤ්ඤති. ආපස්මිං මඤ්ඤති. ආපතො මඤ්ඤති. ආපං මෙති මඤ්ඤති. ආපං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං[1] තස්සාති වදාමි. (2)

5. තෙජං තෙජතො සඤ්ජානාති. තෙජං තෙජතො සඤ්ඤත්වා තෙජං මඤ්ඤති. තෙජස්මිං මඤ්ඤති. තෙජතො මඤ්ඤති. තෙජං මෙති මඤ්ඤති. තෙජං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං[1] තස්සාති වදාමි. (3)

6. වායං වායතො සඤ්ජානාති. වායං වායතො සඤ්ඤත්වා වායං මඤ්ඤති. වායස්මිං මඤ්ඤති. වායතො මඤ්ඤති. වායං මෙති මඤ්ඤති. වායං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං[1] තස්සාති වදාමි. (4)

7. භූතෙ භූතතො සඤ්ජානාති. භූතෙ භූතතො සඤ්ඤත්වා භූතෙ මඤ්ඤති. භූතෙසු මඤ්ඤති. භූතතො මඤ්ඤති. භූතෙ මෙති මඤ්ඤති. භූතෙ අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං[1] තස්සාති වදාමි. (5)

8. දෙවෙ දෙවතො සඤ්ජානාති. දෙවෙ දෙවතො සඤ්ඤත්වා දෙවෙ මඤ්ඤති. දෙවෙසු මඤ්ඤති. දෙවතො මඤ්ඤති. දෙවෙ මෙති මඤ්ඤති. දෙවෙ අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං[1] තස්සාති වදාමි. (6)

9. පජාපතිං පජාපතිතො සඤ්ජානාති. පජාපතිං පජාපතිතො සඤ්ඤත්වා පජාපතිං මඤ්ඤති. පජාපතිස්මිං මඤ්ඤති. පජාපතිතො මඤ්ඤති. පජාපතිං මෙති මඤ්ඤති. පජාපතිං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං[1] තස්සාති වදාමි. (7)

10. බ්‍රහ්මං බ්‍රහ්මතො සඤ්ජානාති. බ්‍රහ්මං බ්‍රහ්මතො සඤ්ඤත්වා බ්‍රහ්මං මඤ්ඤති. බ්‍රහ්මනි[2] මඤ්ඤති. බ්‍රහ්මතො මඤ්ඤති. බ්‍රහ්මං මෙති මඤ්ඤති. බ්‍රහ්මං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං[1] තස්සාති වදාමි. (8)

---

1. අපරිඤ්ඤණං, සී. I. 2. බ්‍රහ්මස්මිං, මජසං.

4. ආපය ආපය වශයෙන් (සංඥාවිපර්‍යාසයෙන්) හඳුනයි. ආපය ආපය වශයෙන් හැඳින ආපය (තෘෂ්ණාමාන්‍යදෘෂ්ටිවශයෙන්) හඟියි. 'මම ආපයෙහි පිහිටියෙමි' යි හඟියි. 'ආපයෙන් බැහැර වෙමි' යි හඟියි. 'ආපය මාගේ'යි හඟියි. ආපය අභිනන්‍දනය කෙරෙයි. ඒ කවර හෙයින? යත්: ආපය (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ)යි කියමි. (2)

5. තෙජස තෙජොවශයෙන් (සංඥාවිපර්‍යාසයෙන්) හඳුනයි. තෙජස තෙජොවශයෙන් හැඳින තෙජස (තෘෂ්ණාමාන්‍යදෘෂ්ටිවශයෙන්) හඟියි. 'මම තෙජසෙහි පිහිටියෙමි' යි හඟියි. තෙජසින් බැහැර වෙමි' යි හඟියි. 'තෙජස මාගේ' යි හඟියි. තෙජස අභිනන්‍දනය කෙරෙයි. ඒ කවර හෙයින? යත්: තෙජස (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ) යි කියමි. (3)

6. වායුව වායුවශයෙන් (සංඥාවිපර්‍යාසයෙන්) හඳුන යි. වායුව වායු වශයෙන් හැඳින වායුව (තෘෂ්ණාමාන්‍යදෘෂ්ටි වශයෙන්) හඟියි. 'මම වායුවෙහි පිහිටියෙමි' යි හඟියි. 'වායුවෙන් බැහැර වෙමි' යි හඟියි. 'වායුව මාගේ' යි හඟියි. වායුව අභිනන්‍දනය කෙරෙයි. ඒ කවර හෙයින? යත්: වායුව (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ) යි කියමි. (4)

7. භූතයන් (චාතුර්මහාරාජිකයෙන් යට සත්ත්වයන්) භූතයන් වශයෙන් (සංඥාවිපර්‍යාසයෙන්) හඳුන යි. භූතයන් භූතවශයෙන් හැඳින භූතයන් (තෘෂ්ණාමාන්‍යදෘෂ්ටිවශයෙන්) හඟියි. භූතයන් කෙරෙහි තෘෂ්ණාමානදිට්ඨි මන්‍යනා කෙරෙයි. භූතයන්ගෙන් (තමා හෝ මෙරමා) බැහැර වූ සේ හඟයි. 'භූතයන් මාගේ'යි හඟියි. භූතයන් අභිනන්‍දනය කෙරෙයි. ඒ කවර හෙයින? යත්: භූතයන් (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ) යි කියමි. (5)

8. දෙවියන් දෙවියන් වශයෙන් (සංඥාවිපර්‍යාසයෙන්) හඳුනයි. දෙවියන් දෙවියන් වශයෙන් හැඳින දෙවියන් (තෘෂ්ණාමාන්‍යදෘෂ්ටිවශයෙන්) හඟියි. දෙවියන් කෙරෙහි තෘෂ්ණාදීන් මන්‍යනා කෙරෙයි. දෙවියන්ගෙන් (තමා හෝ මෙරමා) බැහැර වූ සේ හඟියි. 'දෙවියන් මාගේ' යි හඟියි. දෙවියන් අභිනන්‍දනය කෙරෙයි. ඒ කවර හෙයින? යත්: දෙවියන් (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ)යි කියමි. (6)

9. ප්‍රජාපතිහු (මාරයා) ප්‍රජාපතිහු වශයෙන් හඳුනයි. ප්‍රජාපතිහු ප්‍රජාපතිහු වශයෙන් හැඳින ප්‍රජාපතිහු (තෘෂ්ණාදිමන්‍යනායෙන්) හඟියි. ප්‍රජාපතිහු කෙරෙහි (නිත්‍යතාදිය පිහිටියේ ය යි) හඟියි. ප්‍රජාපතිහු කෙරෙන් (තමා හෝ මෙරමා) බැහැර වූ සේ හඟියි. 'ප්‍රජාපතියා මාගේ' යි හඟියි. ප්‍රජාපතිහු අභිනන්‍දනය කෙරෙයි. ඒ කවර හෙයින? යත්: ප්‍රජාපතිහු (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ) යි කියමි. (7)

10. බ්‍රහ්මයා බ්‍රහ්ම වශයෙන් හඳුනයි. බ්‍රහ්මයා බ්‍රහ්ම වශයෙන් හැඳින බ්‍රහ්මයා (තෘෂ්ණාදිමන්‍යනායෙන්) හඟියි. බ්‍රහ්මයා කෙරෙහි (නිත්‍යතාදිය පිහිටියේ ය යි)) හඟියි. බ්‍රහ්මයා කෙරෙන් (තමා හෝ මෙරමා) බැහැර වූ සේ හඟියි. 'බ්‍රහ්මයා මාගේ' යි හඟියි. බ්‍රහ්මයා අභිනන්‍දනය කෙරෙයි. ඒ කවර හෙයින? යත්: බ්‍රහ්මයා (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ) යි කියමි. (8)

11. ආභස්සරෙ ආභස්සරතො සඤ්ජානාති. ආභස්සරෙ ආභස්සරතො සඤ්ඤත්වා ආභස්සරෙ මඤ්ඤති. ආභස්සරෙසු මඤ්ඤති. ආභස්සරතො මඤ්ඤති. ආභස්සරෙ මෙති මඤ්ඤති. ආභස්සරෙ අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං[1] තස්සාති වදාමි. (9)

12. සුභකිණ්ණෙ[2] සුභකිණ්ණතො[3] සඤ්ජානාති. සුභකිණ්ණෙ සුභකිණ්ණතො සඤ්ඤත්වා සුභකිණ්ණෙ මඤ්ඤති. සුභකිණ්ණෙසු මඤ්ඤති. සුභකිණ්ණතො මඤ්ඤති. සුභකිණ්ණෙ මෙති මඤ්ඤති. සුභකිණ්ණෙ අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං තස්සාති වදාමි. (10)

13. වෙහප්ඵලෙ වෙහප්ඵලතො සඤ්ජානාති. වෙහප්ඵලෙ වෙහප්ඵලතො සඤ්ඤත්වා වෙහප්ඵලෙ මඤ්ඤති. වෙහප්ඵලෙසු මඤ්ඤති. වෙහප්ඵලතො මඤ්ඤති. වෙහප්ඵලෙ මෙති මඤ්ඤති. වෙහප්ඵලෙ අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං තස්සාති වදාමි. (11)

14. අභිභුං අභිභුතො සඤ්ජානාති. අභිභුං අභිභුතො සඤ්ඤත්වා අභිභුං මඤ්ඤති. අභිභුස්මිං මඤ්ඤති. අභිභුතො මඤ්ඤති. අභිභුං මෙති මඤ්ඤති. අභිභුං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං තස්සාති වදාමි. (12)

15. ආකාසානඤ්චායතනං ආකාසානඤ්චායතනතො සඤ්ජානාති. ආකාසානඤ්චායතනං ආකාසානඤ්චායතනතො සඤ්ඤත්වා ආකාසානඤ්චා-යතනං මඤ්ඤති. ආකාසානඤ්චායතනස්මිං මඤ්ඤති. ආකාසානඤ්චායතනතො මඤ්ඤති. ආකාසානඤ්චායතනං මෙති මඤ්ඤති. ආකාසානඤ්චායතනං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං තස්සාති වදාමි. (13)

16. විඤ්ඤාණඤ්චායතනං විඤ්ඤාණඤ්චායතනතො සඤ්ජානාති. විඤ්ඤාණඤ්චායතනං විඤ්ඤාණඤ්චායතනතො සඤ්ඤත්වා විඤ්ඤාණඤ්චායතනං මඤ්ඤති. විඤ්ඤාණඤ්චායතනස්මිං මඤ්ඤති. විඤ්ඤාණඤ්චායතනතො මඤ්ඤති. විඤ්ඤාණඤ්චායතනං මෙති මඤ්ඤති. විඤ්ඤාණඤ්චායතනං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං තස්සාති වදාමි. (14)

1. අපරිඤ්ඤාණං සී I. 2. සුභකිණ්හ, මජසං. යසා. සී. I. සී. II. අ.
3. සුභකිණ්හතො, මජසං. යසා. සී. I. සී. II.

11. ආභස්සර(බ්‍රහ්ම)යන් ආභස්සරයන් වශයෙන් හඳුනයි. ආභස්සරයන් ආභස්සරයන් වශයෙන් හැඳින ආභස්සරයන් (තණ්හාමඤ්ඤනාදි-වසයෙන්) හඟියි. ආභස්සරයන් කෙරෙහි (නිත්‍යතාදිය පිහිටියේ ය යි) මඤ්ඤනා කෙරෙයි. ආභස්සරයන් කෙරෙන් බැහැර (තමා හෝ මෙරමා) වූ සේ හඟියි. 'ආභස්සරයන් මාගේ ය'යි හඟියි. ආභස්සරයන් අභිනන්දනය කෙරෙයි. ඒ කවර හෙයින? යත්: ආභස්සරයන් (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ)යි කියමි. (9)

12. සුභකිණ්ණයන් සුභකිණ්ණයන් වශයෙන් හඳුනයි. සුභකිණ්ණයන් සුභකිණ්ණයන් වශයෙන් හැඳින සුභකිණ්ණයන් (තණ්හාමඤ්ඤනාදි-වසයෙන්) හඟියි. සුභකිණ්ණයන් කෙරෙහි (නිත්‍යතාදිය පිහිටියේ ය යි) මඤ්ඤනා කෙරෙයි. සුභකිණ්ණයන් කෙරෙන් බැහැර (තමා හෝ මෙරමා) වූ සේ හඟියි. 'සුභකිණ්ණයන් මාගේ ය'යි හඟියි. සුභකිණ්ණයන් අභිනන්දනය කෙරෙයි. ඒ කවර හෙයින? යත්: සුභකිණ්ණයන් (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ)යි කියමි.(10)

13. වෙහප්ඵලයන් වෙහප්ඵලයන් වශයෙන් හඳුනයි. වෙහප්ඵලයන් වෙහප්ඵලයන් වශයෙන් හැඳින වෙහප්ඵලයන් (තණ්හාමඤ්ඤනාදිවසයෙන්) හඟියි. වෙහප්ඵලයන් කෙරෙහි (නිත්‍යත්‍යාදිය පිහිටියේ ය යි) මඤ්ඤනා කෙරෙයි. වෙහප්ඵලයන් කෙරෙන් බැහැර (තමා හෝ මෙරමා) වූ සේ හඟියි. 'වෙහප්ඵලයන් මාගේ ය'යි හඟියි. වෙහප්ඵලයන් අභිනන්දනය කෙරෙයි. ඒ කවර හෙයින? යත්: වෙහප්ඵලයන් (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ)යි කියමි. (11)

14. අභිභූන් (අසංඥසත්ත්වයන්) අභිභූ වසයෙන් හඳුනයි. අභිභූන් අභිභූවසයෙන් හැඳින අභිභූන් (තණ්හාදිමඤ්ඤනායෙන්) හඟියි. අභිභූන් කෙරෙහි (නිත්‍යතාදිය පිහිටියේ ය යි) හඟියි. අභිභූන් කෙරෙන් බැහැර (තමා හෝ මෙරමා) වූ සේ හඟියි. 'අභිභූන් මාගේ ය'යි හඟියි. අභිභූන් අභිනන්දනය කෙරෙයි. ඒ කවර හෙයින? යත්: අභිභූන් (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ) යි කියමි. (12)

15. ආකාසානඤ්චායතනය (තද්භූමක වූ කුශල - විපාක - ක්‍රියා වශයෙන් පවත්නා චතුර්විධ නාම ස්කන්ධ) ආකාසානඤ්චායතනය වශයෙන් හඳුනයි. ආකාසානඤ්චායතනය ආකාසානඤ්චායතනය වශයෙන් හැඳින ආකාසානඤ්චායතනය (තණ්හාදිමඤ්ඤනායෙන්) හඟියි. ආකාසානඤ්චා-යතනය කෙරෙහි (නිත්‍යතාදිය පිහිටියේ ය යි) හඟියි. ආකාසානඤ්චා-යතනයෙන් බැහැර (තමා හෝ මෙරමා) වූ සේ හඟියි. 'ආකාසානඤ්චා-යතනය මාගේ ය'යි හඟියි. ආකාසානඤ්චායතනය අභිනන්දනය කෙරෙයි. ඒ කවර හෙයින? යත්: ආකාසානඤ්චායතනය (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ)යි කියමි. (13)

16. විඤ්ඤාණඤ්චායතනය (තද්භූමක වූ චතුර්විධ ස්කන්ධ) විඤ්ඤා-ණඤ්චායතනය වශයෙන් හඳුනයි. විඤ්ඤාණඤ්චායතනය විඤ්ඤාණඤ්චා-යතනය වශයෙන් හැඳින විඤ්ඤාණඤ්චායතනය (තණ්හාදිමඤ්ඤනායෙන්) හඟියි. විඤ්ඤාණඤ්චායතනයෙහි (නිත්‍යත්වාදිය පිහිටියේ ය යි) හඟියි. විඤ්ඤාණඤ්චායතනයෙන් බැහැර (තමා හෝ මෙරමා) වූ සේ හඟියි. 'විඤ්ඤාණඤ්චායතනය මාගේ ය'යි හඟියි. විඤ්ඤාණඤ්චායතනය අභිනන්ද-නය කෙරෙයි. ඒ කවර හෙයින? යත්: විඤ්ඤාණඤ්චායතනය (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ)යි කියමි. (14)

17. ආකිඤ්චඤ්ඤායතනං ආකිඤ්චඤ්ඤායතනතො සඤ්ජානාති. ආකිඤ්චඤ්ඤායතනං ආකිඤ්චඤ්ඤායතනතො සඤ්ඤත්වා ආකිඤ්චඤ්ඤායතනං මඤ්ඤති. ආකිඤ්චඤ්ඤායතනස්මිං මඤ්ඤති. ආකිඤ්චඤ්ඤායතනතො මඤ්ඤති. ආකිඤ්චඤ්ඤායතනං මෙති මඤ්ඤති. ආකිඤ්චඤ්ඤායතනං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං තස්සාති වදාමි. (15)

18. නෙවසඤ්ඤානාසඤ්ඤායතනං නෙවසඤ්ඤානාසඤ්ඤායතනතො සඤ්ජානාති. නෙවසඤ්ඤානාසඤ්ඤායතනං නෙවසඤ්ඤානාසඤ්ඤායතනතො සඤ්ඤත්වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනං මඤ්ඤති. නෙවසඤ්ඤානාසඤ්ඤායතනස්මිං මඤ්ඤති නෙවසඤ්ඤානාසඤ්ඤායතනතො මඤ්ඤති. නෙවසඤ්ඤානාසඤ්ඤායතනං මෙති මඤ්ඤති. නෙවසඤ්ඤානාසඤ්ඤායතනං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං තස්සාති වදාමි. (16)

19. දිට්ඨං දිට්ඨතො සඤ්ජානාති. දිට්ඨං දිට්ඨතො සඤ්ඤත්වා දිට්ඨං මඤ්ඤති. දිට්ඨස්මිං මඤ්ඤති. දිට්ඨතො මඤ්ඤති. දිට්ඨං මෙති මඤ්ඤති. දිට්ඨං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං තස්සාති වදාමි. (17)

20. සුතං සුතතො සඤ්ජානාති. සුතං සුතතො සඤ්ඤත්වා සුතං මඤ්ඤති. සුතස්මිං මඤ්ඤති. සුතතො මඤ්ඤති සුතං මෙති මඤ්ඤති. සුතං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං තස්සාති වදාමි. (18)

21. මුතං මුතතො සඤ්ජානාති. මුතං මුතතො සඤ්ඤත්වා මුතං මඤ්ඤති. මුතස්මිං මඤ්ඤති. මුතතො මඤ්ඤති. මුතං මෙති මඤ්ඤති මුතං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං තස්සාති වදාමි. (19)

22. විඤ්ඤාතං විඤ්ඤාතතො සඤ්ජානාති. විඤ්ඤාතං විඤ්ඤාතතො සඤ්ඤත්වා විඤ්ඤාතං මඤ්ඤති. විඤ්ඤාතස්මිං. මඤ්ඤති. විඤ්ඤාතතො මඤ්ඤති. විඤ්ඤාතං මෙති මඤ්ඤති. විඤ්ඤාතං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං තස්සාති වදාමි. (20)

17. ආකිඤ්චඤ්ඤායතනය (තද්භූමක වූ චතුර්විධ ස්කන්ධ) ආකිඤ්චඤ්ඤායතනය වශයෙන් හඳුනයි. ආකිඤ්චඤ්ඤායතනය ආකිඤ්චඤ්ඤායතනය වශයෙන් හැඳින ආකිඤ්චඤ්ඤායතනය (තණ්හාදිමඤ්ඤනායෙන්) හඟියි. ආකිඤ්චඤ්ඤායතනයෙහි (නිත්‍යභාවාදිය පිහිටියේ ය යි) හඟියි. ආකිඤ්චඤ්ඤායතනයෙන් බැහැර (තමා හෝ මෙරමා) වූ සේ හඟියි. 'ආකිඤ්චඤ්ඤායතනය මාගේ ය'යි හඟියි. ආකිඤ්චඤ්ඤායතනය අභිනන්දනය කෙරෙයි. ඒ කවර හෙයින ? යත්: ආකිඤ්චඤ්ඤායතනය (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ)යි කියමි. (15)

18. නෙවසඤ්ඤානාසඤ්ඤායතනය (තද්භූමක වූ චතුර්විධ ස්කන්ධ) නෙවසඤ්ඤානාසඤ්ඤායතනවසයෙන් හඳුනයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනය නෙවසඤ්ඤානාසඤ්ඤායතනවසයෙන් හැඳින නෙවසඤ්ඤානාසඤ්ඤායතනය (තණ්හාදිමඤ්ඤනායෙන්) හඟියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි (නිත්‍යතා-දිය පිහිටියේ ය යි) හඟියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙන් බැහැර (තමා හෝ මෙරමා) පිහිටි සේ හඟියි. 'නෙවසඤ්ඤානාසඤ්ඤායතනය මාගේ ය'යි හඟියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනය අභිනන්දනය කෙරෙයි. ඒ කවර හෙයින ? යත්: නෙවසඤ්ඤානාසඤ්ඤායතනය (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ)යි කියමි. (16)

19. දක්නාලද්ද (රූපායතනය) රූපායතනවසයෙන් හඳුනයි. රූපායතනය රූපායතනවසයෙන් හැඳින රූපායතනය (තණ්හාදිමඤ්ඤනායෙන්) හඟියි. රූපායතනයෙහි (ආත්මය පිහිටියේ ය යි) හඟියි. රූපායතනයෙන් බැහැර (ආත්මය පිහිටියේ ය යි) හඟියි. 'රූපායතනය මාගේ ය'යි හඟියි. රූපායතනය අභිනන්දනය කෙරෙයි. ඒ කවර හෙයින ? යත්: රූපායතනය (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ)යි කියමි. (17)

20. අසනලද්ද (ශබ්දායතනය) ශබ්දායතනවශයෙන් හඳුනයි ශබ්ද-යතනය ශබ්දායතනවශයෙන් හැඳින ශබ්දායතනය (තණ්හාදිමඤ්ඤනායෙන්) හඟියි. ශබ්දායතනයෙහි (ආත්මය පිහිටියේ ය යි) හඟියි. ශබ්දායතනයෙන් බැහැර (ආත්මය පිහිටියේ ය යි) හඟියි. 'ශබ්දායතනය මාගේ ය'යි හඟියි. ශබ්දායතනය අභිනන්දනය කෙරෙයි. ඒ කවර හෙයින ? යත්: ශබ්දායතනය (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ)යි කියමි. (18)

21. මුතය (ස්පර්ශයෙන්=හැපීමෙන් ගත් ගන්ධරසපොට්ඨබ්බායතන) මුත වසයෙන් හඳුනයි. මුතය මුත වසයෙන් හැඳින මුතය (තණ්හාදි-මඤ්ඤනායෙන්) හඟියි. මුතයෙහි (ආත්මය පිහිටියේ ය යි) හඟියි. මුතයෙන් බැහැර (ආත්මය පිහිටියේ ය යි) හඟියි. 'මුතය මාගේ ය'යි හඟියි. මුතය අභිනන්දනය කෙරෙයි. ඒ කවර හෙයින ? යත්: (මුතය පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ)යි කියමි. (19)

22. විඤ්ඤාතය (මනසින් දත් සෙසු ආයතන සත හෝ ධම්මාරම්මණය) විඤ්ඤාතවසයෙන් හඳුනයි. විඤ්ඤාතය විඤ්ඤාතවසයෙන් හැඳින විඤ්ඤාතය (තණ්හාදිමඤ්ඤනායෙන්) හඟියි. (විඤ්ඤාතයෙහි ආත්මය පිහිටියේ ය යි) හඟියි. විඤ්ඤාතයෙන් බැහැර (ආත්මය පිහිටියේ ය යි) හඟියි. 'විඤ්ඤාතය මාගේ ය'යි හඟියි. විඤ්ඤාතය අභිනන්දනය කෙරෙයි. ඒ කවර හෙයින ? යත්: විඤ්ඤාතය (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ)යි කියමි. (20)

23. එකත්තං එකත්තතො සඤ්ජානාති. එකත්තං එකත්තතො සඤ්ඤත්වා එකත්තං මඤ්ඤති. එකත්තස්මිං මඤ්ඤති. එකත්තතො මඤ්ඤති. එකත්තං මෙති මඤ්ඤති. එකත්තං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං තස්සාති වදාමි. (21)

24. නානත්තං නානත්තතො සඤ්ජානාති. නානත්තං නානත්තතො සඤ්ඤත්වා නානත්තං මඤ්ඤති. නානත්තස්මිං මඤ්ඤති. නානත්තතො මඤ්ඤති. නානත්තං මෙති මඤ්ඤති. නානත්තං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං තස්සාති වදාමි. (22)

25. සබ්බං සබ්බතො සඤ්ජානාති. සබ්බං සබ්බතො සඤ්ඤත්වා සබ්බං මඤ්ඤති. සබ්බස්මිං මඤ්ඤති. සබ්බතො මඤ්ඤති. සබ්බං මෙති මඤ්ඤති. සබ්බං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං තස්සාති වදාමි. (23)

26. නිබ්බානං නිබ්බානතො සඤ්ජානාති. නිබ්බානං නිබ්බානතො සඤ්ඤත්වා නිබ්බානං මඤ්ඤති. නිබ්බානස්මිං මඤ්ඤති. නිබ්බානතො මඤ්ඤති. නිබ්බානං මෙති මඤ්ඤති. නිබ්බානං අභිනන්දති. තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං තස්සාති වදාමි. (24)

(අස්සුතවන්තපුථුජ්ජනස්ස වසෙන පඨමකභූමි[1] පරිච්ඡෙදි[2])*

(2)

27. යොපි සො භික්ඛවෙ භික්ඛු සෙඛො[3] අප්පත්තමානසො අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානො විහරති, සොපි පඨවිං පඨවිතො අභිජානාති. පඨවිං පඨවිතො අභිඤ්ඤාය[4] පඨවිං මාමඤ්ඤි[5]. පඨවියා මාමඤ්ඤි. පඨවිතො මාමඤ්ඤි. පඨවිං මෙති මාමඤ්ඤි. පඨවිං මාභිනන්දි.[6] තං කිස්ස හෙතු? පරිඤ්ඤෙය්‍යං[7] තස්සාති වදාමි.

---

1. පුථුජ්ජනවසෙන පඨමනයභූමි, මජසං. සයා. පුථුජ්ජනස්සවසෙන පඨමකභූමි, සී I.
2. පරිච්ඡෙදො, සයා. පරිච්ඡෙදො නිට්ඨිතොති, මජසං
3. සෙක්ඛො, මජසං.
4. අභිඤ්ඤත්වා, සී. I.
5. මා මඤ්ඤති, සී. I.
6. මා අභිනන්දති, සී. I. මාභිනන්දති, මජසං.
7. අපරිඤ්ඤෙය්‍යං, සී. I. සී. II.

* ඉමස්මිං පාඨෙ චෙව ඊදිසෙසු අඤ්ඤෙසු පාඨෙසු ච වෙස්සගිරිසිලාලිපිආදීසු දිස්සමානෙහි පොරාණිකසීහලපදෙහි සදිසානි පදානි දිස්සන්ති. තස්මා එත්ථ පාඨං ලඞ්කායං පොරාණිකෙහි සීහලකණ්ඨෙරෙහි නික්ඛිත්තානීති අනුමාතුං සක්කා.

23. එකත්වය (වේදනා සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණ යන සතර ස්කන්ධ) එකත්වවශයෙන් හඳුනයි. එකත්වය එකත්වවශයෙන් හැඳින එකත්වය ආත්මය යි හඟියි. එකත්වයෙහි (ආත්මය පිහිටියේ ය යි) හඟියි. එකත්වයෙන් බැහැර (ආත්මය පිහිටියේ ය යි) හඟියි. 'එකත්වය මාගේ ය'යි හඟියි. එකත්වය අභිනන්දනය කෙරෙයි. ඒ කවර හෙයින ? යත්: එකත්වය (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ)යි කියමි. (21) *

24. නානාත්වය (පඤ්චස්කන්ධය) නානාත්වවශයෙන් හඳුනයි. නානාත්වය නානාත්වවශයෙන් හැඳින නානාත්වය ආත්මය යි හඟියි. නානාත්වයෙහි (ආත්මය පිහිටියේ ය යි) හඟියි. නානාත්වයෙන් බැහැර (ආත්මය පිහිටියේ ය යි) හඟියි. 'නානාත්වය මාගේ ය'යි හඟියි. නානාත්වය අභිනන්දනය කෙරෙයි. ඒ කවර හෙයින ? යත්: නානාත්වය (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ)යි කියමි. (22) *

25. සර්වය (සියලු සත්කායධර්ම) සර්වවශයෙන් හඳුනයි. සර්වය සර්වවශයෙන් හැඳින සර්වය (තෘෂ්ණාදිමඤ්ඤනායෙන්) හඟියි. සර්වයෙහි (තමාගේ ආත්මය පිහිටියේ ය යි) හඟියි. සර්වයෙන් බැහැර (ආත්මය පිහිටියේ ය යි) හඟියි. 'සර්වය මාගේ ය'යි හඟියි. සර්වය අභිනන්දනය කෙරෙයි. ඒ කවර හෙයින ? යත්: සර්වය (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ)යි කියමි. (23) *

26. නිර්වාණය (පරමදිට්ඨධම්මනිබ්බානය) නිර්වාණවශයෙන් හඳුනයි. නිර්වාණය නිර්වාණවශයෙන් හැඳින නිර්වාණය (තෘෂ්ණාදිමඤ්ඤනායෙන්) හඟියි. නිර්වාණයෙහි (ආත්මය පිහිටියේ ය යන ආදීන්) හඟියි. නිර්වාණයෙන් බැහැර (ආත්මය පිහිටියේ ය යන ආදීන්) හඟියි. 'නිර්වාණය මාගේ ය'යි හඟියි. නිර්වාණය අභිනන්දනය කෙරෙයි. ඒ කවර හෙයින ? යත්: (පරම දෘෂ්ටධර්ම) නිර්වාණය (පිළිබඳ) ඔහුගේ පිරිසිඳ නො දැනීම (හෙයිනැ)යි කියමි. (24)

(අශ්‍රැතවත්පෘථග්ජනයාගේ වශයෙන් දෙසූ ප්‍රථම භූමි පරිච්ඡේදය යි.)

(2)

27. මහණෙනි, ශෛක්‍ෂ වූ නො පැමිණි අර්හත්වය ඇති යම් මහණෙක් නිරුත්තර වූ යොගක්‍ෂෙමසඞ්ඛ්‍යාත රහත්බව පතමින් වෙසේ ද, හෙතෙමේත් පෘථිවිය පෘථිවිවශයෙන් වෙසෙසින් දනියි. පෘථිවිය පෘථිවිවශයෙන් මැනැවින් දැන ('මම පෘථිවිධාතුව වෙමි'යි දෘෂ්ටිවශයෙන්) මඤ්ඤනා නැත්තේ තමුදු (තෘෂ්ණාමානවශයෙන්) මඤ්ඤනා නැත්තේත් නො වෙයි. පෘථිවියෙහි (පිහිටියෙමි යි දෘෂ්ටිවශයෙන්) මඤ්ඤනා නැත්තේ තමුදු (තෘෂ්ණාමානවශයෙන්) මඤ්ඤනා නැත්තේත් නො වෙයි. පෘථිවිධාතුවෙන් බැහැර ආත්මය පිහිටියේ ය යි (දෘෂ්ටිවශයෙන්) මඤ්ඤනා නැත්තේ තමුදු තෘෂ්ණාමානවශයෙන් මඤ්ඤනා නැත්තේත් නො වෙයි. 'පෘථිවිධාතුව මාගේ ය'යි (දෘෂ්ටිවශයෙන්) මඤ්ඤනා නැත්තේ තමුදු (තෘෂ්ණාමාන වශයෙන්) මඤ්ඤනා නැත්තේත් නො වෙයි. පෘථිවිධාතුව (දෘෂ්ටිවශයෙන්) අභිනන්දනය නො කරන්නේ තමුදු (තෘෂ්ණාමානවශයෙන්) අභිනන්දනය නො කරන්නේත් නො වෙයි. ඒ කවර හෙයින ? යත්: ඔහු විසින් (පෘථිවිධාතුව රහත්මඟින්) පිරිසිඳ දත යුතු (හෙයිනැ)යි කියමි.

---

* මෙහි 'එකත්තං, නානත්තං, සබ්බං' යන පදයන්ගේ අර්ථය අර්ථකථාවෙහි සාසනානුලෝම වන සේ ව්‍යාඛ්‍යාන කරණ ලදැයි සිතත්.

Free Distribution www.aathaapi.org

28. ආපං -පෙ- තෙජං -පෙ- වායං -පෙ- භූතෙ -පෙ- දෙවෙ -පෙ- පජාපතිං -පෙ- බ්‍රහ්මං -පෙ- ආභස්සරෙ -පෙ- සුභකිණ්හෙ -පෙ- වෙහප්ඵලෙ -පෙ- අභිභුං -පෙ- ආකාසානඤ්චායතනං -පෙ- විඤ්ඤාණඤ්චායතනං -පෙ- ආකිඤ්චඤ්ඤායතනං -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනං -පෙ- දිට්ඨං -පෙ- සුතං -පෙ- මුතං -පෙ- විඤ්ඤාතං -පෙ- එකත්තං -පෙ- සබ්බං -පෙ- නිබ්බානං නිබ්බානතො අභිජානාති. නිබ්බානං නිබ්බානතො අභිඤ්ඤාය නිබ්බානං මාමඤ්ඤි[1]. නිබ්බානතො මාමඤ්ඤි. නිබ්බානං මෙති මාමඤ්ඤි. නිබ්බානං මාභිනන්දි.[2] තං කිස්ස හෙතු? පරිඤ්ඤෙය්‍යං[3] තස්සාති වදාමි.

(සෙඛහ[4] විවට්ටවසෙනි දුතියකභූමි[5] පරිච්ඡෙදි[6])

(3)

29. යොපි සො භික්ඛවෙ භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො, සොපි පඨවිං පඨවිතො අභිජානාති. පඨවිං පඨවිතො අභිඤ්ඤාය පඨවිං න මඤ්ඤති. පඨවියා න මඤ්ඤති. පඨවිතො න මඤ්ඤති. පඨවිං මෙති න මඤ්ඤති. පඨවිං නාභිනන්දති. තං කිස්ස හෙතු? පරිඤ්ඤාතං තස්සාති වදාමි.

30. ආපං -පෙ- තෙජං--පෙ- නිබ්බානං නිබ්බානතො අභිජානාති. නිබ්බානං නිබ්බානතො අභිඤ්ඤාය නිබ්බානං න මඤ්ඤති. නිබ්බානස්මිං න මඤ්ඤති. නිබ්බානතො න මඤ්ඤති. නිබ්බානං මෙති න මඤ්ඤති. නිබ්බානං නාභිනන්දති. තං කිස්ස හෙතු? පරිඤ්ඤාතං තස්සාති වදාමි.

(ඛීණාසවහ* පඨමකනයෙ තතියකභූමි[7] පරිච්ඡෙදි)

---

1. වා මඤ්ඤති, සී I. 2. වා අභිනන්දති, සී I. මාභිනන්දති, මජසං.
3. අපරිඤ්ඤෙය්‍යං, සී I. සී II. 4. සෙඛහ=සෙඛස්ස.
5. සෙඛවසෙන දුතියනයභූමි, මජසං. ස්‍යා. සෙඛාහ විවට්ටවසෙනි දුතියකා භූමි, සී I.
6. පරිච්ඡෙදො, ස්‍යා. පරිච්ඡෙදො නිට්ඨිතො, මජසං.
7. ඛීණාසවවසෙන තතියනයභූමි, මජසං. ස්‍යා. ඛීණාසවාහපඨමකනයෙ තතියකභූමි, සී. I.
* ඛීණාසවහ=ඛීණාසවස්ස.

Free Distribution www.aathaapi.org

28. ආපොධාතුව... තෙජොධාතුව... වායොධාතුව... භූතයන්... දෙවියන්... පජාපතිහු... බ්‍රහ්මයා... ආභස්සරයන්... සුභකිණ්ණයන් ... වෙහප්ඵලයන්... අභිභූන්... ආකාසානඤ්චායතනය... විඤ්ඤාණඤ්චායතනය... ආකිඤ්චඤ්ඤායතනය... නෙවසඤ්ඤානාසඤ්ඤායතනය... රූපායතනය... සද්දායතනය... ගන්ධ-රස-ඵොට්ඨබ්බායතනය... විඤ්ඤාතය... එකත්තය .. නානත්තය... සබ්බය... දිට්ඨධම්ම නිබ්බානය නිබ්බානවසයෙන් වෙසෙසින් දනී. (දෘෂ්ටධර්ම) නිර්වාණය නිර්වාණවශයෙන් වෙසෙසින් දැන නිර්වාණය ආත්ම ය යි (දිට්ඨි වසයෙන් මඤ්ඤනා නැත්තේ නමුදු තණ්හාමානවසයෙන්) මඤ්ඤනා නැත්තේත් නො වෙයි. නිර්වාණයෙහි ආත්මය පිහිටියේ යි (දිට්ඨිමඤ්ඤනා නැත්තේ නමුදු තණ්හාමාන) මඤ්ඤනා නැත්තේත් නො වෙයි. නිර්වාණයෙන් බැහැර ආත්මය පිහිටියේ ය යි (දිට්ඨිමඤ්ඤනා නැත්තේ නමුදු තණ්හාමාන) මඤ්ඤනා නැත්තේත් නො වෙයි. 'නිර්වාණය මාගේ ය'යි (දිට්ඨිමඤ්ඤනා නැත්තේ නමුදු තණ්හාමාන) මඤ්ඤනා නැත්තේත් නො වෙයි. නිර්වාණය (දිට්ඨිමඤ්ඤනායෙන් අභිනන්දනය නො කරන්නේ නමුදු (තණ්හාමානමඤ්ඤනායෙන්) අභිනන්දනය නො කරන්නේත් නො වෙයි. ඒ කවර හෙයින ? යත්: ඔහු විසින් දෘෂ්ටධර්මනිර්වාණය පිරිසිඳ දත යුතු (හෙයිනැ)යි කියමි.

(ශෛක්ෂයා පිළිබඳ විවට්ටවශයෙන් දෙශිත ද්විතීයභූමි පරිච්ඡේදය යි.)

(3)

29. මහණෙනි, යම් ඒ මහණෙක් රහත් වූයේ ගෙවූ ආස්‍රව ඇත්තේ වැස නිම කළ බඹසර ඇත්තේ කළ සිවුමඟ කිස ඇත්තේ බහා තැබූ කෙලෙස්බර ඇත්තේ පැමිණි ස්වාර්ථ (රහත්ඵල) ඇත්තේ ගෙවුණු භවබන්ධන ඇත්තේ මැනැවින් දැන (කෙලෙසුන් කෙරෙන්) මිදුණේ වේ ද, හෙතෙමේත් පෘථිවිය පෘථිවිවශයෙන් විශිෂ්ටඥානයෙන් දනී. පෘථිවිය පෘථිවිවශයෙන් විශිෂ්ටඥානයෙන් දැන පෘථිවිය ආත්මය යි (තෘෂ්ණාදිවශයෙන්) නො හඟියි. පෘථිවියෙහි (ආත්මය පිහිටියේ ය යි) නො හඟියි. පෘථිවියෙන් බැහැර (ආත්මය පිහිටියේ ය යි) නො හඟියි. 'පෘථිවිය මාගේ ය'යි නො හඟියි. පෘථිවිය අභිනන්දනය නො කෙරෙයි. ඒ කවර හෙයින ? යත්: ඔහු විසින් පිරිසිඳ දන්නා ලද (හෙයිනැ)යි කියමි.

30. අබ්ධාතුව... තෙජස.. (දෘෂ්ටධර්ම)නිර්වාණය (දෘෂ්ටධර්ම) නිර්වාණවශයෙන් විශිෂ්ටඥානයෙන් දැන ගනී. නිර්වාණය නිර්වාණවශයෙන් විශිෂ්ටඥානයෙන් දැන නිර්වාණය (තණ්හාදිමඤ්ඤනායෙන්) නො හඟියි. නිර්වාණයෙහි (ආත්මය පිහිටියේ ය යි) නො හඟියි. නිර්වාණයෙන් (බැහැර ආත්මය පිහිටියේ ය යි) මඤ්ඤනා නො කෙරෙයි. 'නිර්වාණය මාගේ ය'යි මඤ්ඤනා නො කෙරෙයි. නිර්වාණය අභිනන්දනය නො කෙරෙයි. ඒ කවර හෙයින ? යත්: ඔහු විසින් පිරිසිඳ දන්නා ලද (හෙයිනැ)යි කියමි.

(ක්ෂීණාස්‍රවවශයෙන් ප්‍රථමනයයෙහි තෘතීයභූමි පරිච්ඡේදය යි)

Free Distribution www.aathaapi.org

(4)

31. යොපි සො භික්ඛවෙ භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො, සොපි පඨවිං පඨවිතො අභිජානාති. පඨවිං පඨවිතො අභිඤ්ඤාය පඨවිං න මඤ්ඤති. පඨවියා න මඤ්ඤති. පඨවිතො න මඤ්ඤති. පඨවිං මෙති න මඤ්ඤති. පඨවිං නාභිනන්දති. තං කිස්ස හෙතු? ඛයා රාගස්ස වීතරාගත්තා.

31. ආපං -පෙ- තෙජං -පෙ- නිබ්බානං නිබ්බානතො අභිජානාති. නිබ්බානං නිබ්බානතො අභිඤ්ඤාය නිබ්බානං න මඤ්ඤති. නිබ්බානස්මිං න මඤ්ඤති. නිබ්බානතො න මඤ්ඤති. නිබ්බානං මෙති න මඤ්ඤති. නිබ්බානං නාභිනන්දති. තං කිස්ස හෙතු? ඛයා රාගස්ස වීතරාගත්තා.

(ඛීණාසවභ දුතියකනයෙ චතුරවනක*භූමි[1]පරිච්ඡෙදි[2])

(5)

33. යොපි සො භික්ඛවෙ භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කත-කරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො, සොපි පඨවිං පඨවිතො අභිජානාති. පඨවිං පඨවිතො අභිඤ්ඤාය පඨවිං න මඤ්ඤති. පඨවියා න මඤ්ඤති. පඨවිතො න මඤ්ඤති. පඨවිං මෙති න මඤ්ඤති. පඨවිං නාභිනන්දති. තං කිස්ස හෙතු? ඛයා දොසස්ස වීතදොසත්තා.

34. ආපං -පෙ- තෙජං -පෙ- නිබ්බානං නිබ්බානතො අභිජානාති. නිබ්බානං නිබ්බානතො අභිඤ්ඤාය නිබ්බානං න මඤ්ඤති. නිබ්බානස්මිං න මඤ්ඤති. නිබ්බානතො න මඤ්ඤති. නිබ්බානං මෙති න මඤ්ඤති. නිබ්බානං නාභිනන්දති. තං කිස්ස හෙතු? ඛයා දොසස්ස වීතදොසත්තා.

(ඛීණාසවභ තතියකනයෙ පඤ්චවනක*භූමි[3]පරිච්ඡෙදි[2])

---

1. ඛීණාසවවසෙන චතුත්ථනයභූමි, මජ්ඣං. සතං.
2. පරිච්ඡෙදො, සතං. පරිච්ඡෙදො නිට්ඨිතො, මජ්ඣං.
3. ඛීණාසවවසෙන පඤ්චමනය භූමි, මජ්ඣං. සතං.

* 'චත්තාරවානක, පඤ්චවානක' ඉති 'අවානක' සද්දො සබ්බෙසු පොත්ථකෙසු දිස්සති. තථාපි පුරාතන සීහලසිලාලිපිසු 'දෙඅවනක (සිසං IV. 221), තිණවනක (සිසං III. 177), චතරවනක (සිසං V 85), ඉච්චාදිසු 'අවනක' සද්දොව ආගතො.

(4)

31. මහණෙනි, යම් මහණෙක් රහත් වූයේ ගෙවුණු ආස්‍රව ඇත්තේ වැස නිම කළ මගබඹසර ඇත්තේ කළ සිවුමගකිස ඇත්තේ බහා තැබූ කෙලෙස්බර ඇත්තේ පැමිණි රහත්පල ඇත්තේ ගෙවුණු භවබන්ධන ඇත්තේ මැනැවින් දැන මිදුණේ වේ ද, හෙතෙමේත් පෘථිවිය පෘථිවිවශයෙන් විශිෂ්ටඥානයෙන් දනියි. පෘථිවිය පෘථිවිවශයෙන් විශිෂ්ටඥානයෙන් දැන පෘථිවිය (තණ්හාආදීන්) මඤ්ඤනා නො කෙරෙයි. පෘථිවියෙහි (ආත්මය පිහිටියේ ය යි) නො හඟියි. පෘථිවියෙන් (බැහැර) ආත්මය පිහිටියේ ය යි නො හඟියි. 'පෘථිවිය මාගේ ය'යි මඤ්ඤනා නො කෙරෙයි. පෘථිවිය අභිනන්දනය නො කෙරෙයි. ඒ කවර හෙයින ? යත්: රාගය ක්ෂීණ වීමෙන් වීතරාග වූ හෙයිනි.

32. අබ්ධාතුව.... තෙජස.... (දෘෂ්ටධර්ම)නිර්වාණය නිර්වාණවශයෙන් විශිෂ්ට ඥානයෙන් දනී. නිර්වාණය නිර්වාණවශයෙන් විශිෂ්ටඥානයෙන් දැන නිර්වාණය (තෘෂ්ණාදිවශයෙන්) මඤ්ඤනා නො කෙරෙයි. නිර්වාණයෙහි (ආත්මය පිහිටියේ ය යි) මඤ්ඤනා නො කෙරෙයි. නිර්වාණයෙන් (බැහැර) ආත්මය පිහිටියේ ය යි) මඤ්ඤනා නො කෙරෙයි. 'නිර්වාණය මාගේ ය'යි මඤ්ඤනා නො කෙරෙයි. නිර්වාණය අභිනන්දනය නො කෙරෙයි. ඒ කවර හෙයින ? යත්: රාගය ක්ෂීණ වීමෙන් වීතරාග වූ හෙයිනි.

(ක්ෂීණාස්‍රව වශයෙන් ද්විතීයනයයෙහි සතරවැනිභූමි පරිච්ඡේදය යි.)

(5)

33. මහණෙනි, යම් ඒ මහණෙක් රහත් වූයේ ගෙවුණු ආස්‍රව ඇත්තේ වැස නිම කළ මගබඹසර ඇත්තේ කළ සිවුමගකිස ඇත්තේ බහා තැබූ කෙලෙස්බර ඇත්තේ පැමිණි රහත්පල ඇත්තේ ගෙවුණු භවබන්ධන ඇත්තේ මැනවින් දැන (කෙලෙසුන් කෙරෙන්) මිදුණේ වේ ද, හෙතෙමේත් පෘථිවිය පෘථිවිවශයෙන් විශිෂ්ටඥානයෙන් දනී. පෘථිවිය පෘථිවිවශයෙන් විශිෂ්ටඥානයෙන් දැන පෘථිවිය (තණ්හාදිවසයෙන්) මඤ්ඤනා නො කෙරෙයි. පෘථිවියෙහි (ආත්මය පිහිටියේ ය යි) මඤ්ඤනා නො කෙරෙයි. පෘථිවියෙන් බැහැර (ආත්මය පිහිටියේ ය යි මඤ්ඤනා නො කෙරෙයි. 'පෘථිවිය මාගේ ය'යි මඤ්ඤනා නො කෙරෙයි. පෘථිවිය අභිනන්දනය නො කෙරෙයි. ඒ කවර හෙයින ? යත්: ද්වේෂය ක්ෂීණ වීමෙන් වීතද්වෙෂ වූ හෙයිනි.

34. අබ්ධාතුව.... තෙජස.... (දෘෂ්ටධර්ම)නිර්වාණය නිර්වාණවශයෙන් විශිෂ්ටඥානයෙන් දනී. නිර්වාණය නිර්වාණවශයෙන් විශිෂ්ටඥානයෙන් දැන නිර්වාණය තණ්හාදිවසයෙන් මඤ්ඤනා නො කෙරෙයි. නිර්වාණයෙහි (ආත්මය පිහිටියේ ය යි) මඤ්ඤනා නො කෙරෙයි. නිර්වාණයෙන් බැහැර (ආත්මය පිහිටියේ ය යි) මඤ්ඤනා නො කෙරෙයි. 'නිර්වාණය මාගේ ය'යි මඤ්ඤනා නො කෙරෙයි. නිර්වාණය අභිනන්දනය නො කෙරෙයි. ඒ කවර හෙයින ? යත්: ද්වේෂය ක්ෂීණ වීමෙන් වීතද්වෙෂ වූ හෙයිනි.

(ක්ෂීණාස්‍රවවශයෙන් තෘතීයනයයෙහි පස්වැනි භූමිපරිච්ඡේදය යි.)

(6)

35. යොපි සො භික්ඛවෙ භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤාවිමුත්තො, සොපි පඨවිං පඨවිතො අභිජානාති. පඨවිං පඨවිතො අභිඤ්ඤාය පඨවිං න මඤ්ඤති. පඨවියා න මඤ්ඤති. පඨවිතො න මඤ්ඤති. පඨවිං මෙති න මඤ්ඤති. පඨවිං නාභිනන්දති. තං කිස්ස හෙතු? ඛයා මොහස්ස වීතමොහත්තා.

36. ආපං -පෙ- තෙජං -පෙ- නිබ්බානං නිබ්බානතො අභිජානාති. නිබ්බානං නිබ්බානතො අභිඤ්ඤාය නිබ්බානං න මඤ්ඤති. නිබ්බානස්මිං න මඤ්ඤති. නිබ්බානතො න මඤ්ඤති. නිබ්බානං මෙති න මඤ්ඤති. නිබ්බානං නාභිනන්දති. තං කිස්ස හෙතු? ඛයා මොහස්ස වීතමොහත්තා.

(ඛීණාසවහ චතුත්ථනයෙ ජවනක[1]භූමි[2] පරිච්ඡෙදි[3])

(7)

37. තථාගතොපි භික්ඛවෙ අරහං සම්මාසම්බුද්ධො පඨවිං පඨවිතො අභිජානාති. පඨවිං පඨවිතො අභිඤ්ඤාය පඨවිං න මඤ්ඤති. පඨවියා න මඤ්ඤති. පඨවිතො න මඤ්ඤති. පඨවිං මෙති න මඤ්ඤති. පඨවිං නාභිනන්දති. තං කිස්ස හෙතු? පරිඤ්ඤාතං තං[4] තථාගතස්සාති වදමි.

38. ආපං -පෙ- තෙජං -පෙ- නිබ්බානං නිබ්බානතො අභිජානාති. නිබ්බානං නිබ්බානතො අභිඤ්ඤාය නිබ්බානං න මඤ්ඤති. නිබ්බානස්මිං න මඤ්ඤති. නිබ්බානතො න මඤ්ඤති. නිබ්බානං මෙති න මඤ්ඤති. නිබ්බානං නාභිනන්දති. තං කිස්ස හෙතු? පරිඤ්ඤාතං තං[4] තථාගතස්සාති වදමි.

(සත්ථාරහ පඨමනයෙ සත්තවනක[5]භූමි පරිච්ඡෙදි[3])

(8)

39. තථාගතොපි භික්ඛවෙ අරහං සම්මාසම්බුද්ධො පඨවිං පඨවිතො අභිජානාති. පඨවිං පඨවිතො අභිඤ්ඤාය පඨවිං න මඤ්ඤති. පඨවියා න මඤ්ඤති. පඨවිතො න මඤ්ඤති. පඨවිං මෙති න මඤ්ඤති. පඨවිං නාභිනන්දති තං කිස්ස හෙතු? නන්දී[6] දුක්ඛස්ස මූලන්ති ඉති විදිත්වා, භවා ජාති, භූතස්ස ජරාමරණන්ති. තස්මාතිහ භික්ඛවෙ තථාගතො සබ්බසො තණ්හානං ඛයා විරාගා නිරොධා චාගා පටිනිස්සග්ගා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො'ති වදමි.

---

1. ජවානක - බහුසු.
2. ඛීණාසවවසෙන ඡට්ඨනයභූමි, මජසං. ස්‍යා.
3. පරිච්ඡෙදෙ, ස්‍යා පරිච්ඡෙදෙ නිට්ඨිතො, මජසං.
4. පරිඤ්ඤාතං, සී I. සී II. PTS.
5. සත්තවානක - බහුසු. සත්ථුවසෙන සත්තමනය භූමි, මජසං. ස්‍යා
6. නන්දි, මජසං. PTS

(6)

35. මහණෙනි, යම් ඒ මහණෙක් රහත් වූයේ ක්ෂීණ වූ ආස්‍රව ඇත්තේ වුසූ මගබඹසර ඇත්තේ කෘතකෘත්‍ය වූයේ බැහූ කෙලෙස්බර ඇත්තේ පැමිණි රහත් පල ඇත්තේ ගුණු භවබන්ධන ඇත්තේ මැනවින් දැන කෙලෙසුන් කෙරෙන් මිදුණේ වේ ද, හෙ තෙමේත් පෘථිවිය පෘථිවි වශයෙන් විශිෂ්ටඥාන යෙන් දනියි. පෘථිවිය පෘථිවි වශයෙන් විශිෂ්ටඥානයෙන් දැන පෘථිවිය (තණ්හාදියෙන්) මඤ්ඤනා නො කෙරෙයි. පෘථිවියෙහි ආත්මය පිහිටියේ ය යි නො හඟියි. පෘථිවියෙන් බැහැර ආත්මය පිහිටියේ ය යි නො හඟියි. පෘථිවිය මාගේ ය යි මඤ්ඤනා නො කෙරෙයි. පෘථිවිය අභිනන්දනය නො කෙරෙයි. කවර හෙයින ?යත්: මොහය ක්ෂීණ වීමෙන් වීතමොහ වූ හෙයිනි.

36. අප් ..තෙජස්...(පරමදෘෂ්ටධර්මනිර්වාණය) නිර්වාණ වශයෙන් දනියි. නිර්වාණය නිර්වාණ වශයෙන් විශිෂ්ටඥානයෙන් දැන නිර්වාණය ආත්මය යි මඤ්ඤනා නො කෙරෙයි. නිර්වාණයෙහි ආත්මය පිහිටියේ ය යි මඤ්ඤනා නො කෙරෙයි. නිර්වාණයෙන් බැහැර ආත්මය පිහිටියේ ය යි මඤ්ඤනා නො කෙරෙයි නිර්වාණය මාගේ ය යි මඤ්ඤනා නො කෙරෙයි. නිර්වාණය අභිනන්දනය නො කෙරෙයි. ඒ කවර හෙයින ? යත්: මොහය ක්ෂීණ වීමෙන් වීතමොහ වූ හෙයිනි.

ක්ෂීණාස්‍රව වශයෙන් චතුර්ථනයෙහි ෂෂ්ඨභූමි පරිච්ඡෙදය යි.

(7)

37. අතීත් වූ සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයෝ ද පෘථිවිය පෘථිවිය වශයෙන් විශිෂ්ටඥානයෙන් දනිත්. පෘථිවිය පෘථිවිය වශයෙන් විශිෂ්ට-ඥානයෙන් දැන පෘථිවිය (තණ්හාදි වසයෙන්) මඤ්ඤනා නො කෙරෙත්. පෘථිවීධාතුවෙහි ආත්මය පිහිටියේ ය යි මඤ්ඤනා නො කෙරෙත්. පෘථිවී-ධාතුවෙන් බැහැර ආත්මය පිහිටියේ ය යි මඤ්ඤනා නො කෙරෙත්. පෘථිවිය මාගේ ය යි අභිනන්දනය නො කෙරෙත්. ඒ කවර හෙයින ? යත්: තථාගතයන් එය පිරිසිඳ දත් හෙයිනැ යි කියමි.

38. අප්...තෙජස්....පරමදෘෂ්ටධර්මනිර්වාණය නිර්වාණවශයෙන් විශිෂ්ටඥාන යෙන් දනිත්. නිර්වාණය නිර්වාණ වශයෙන් විශිෂ්ටඥානයෙන් දැන නිර්වාණය තණ්හාදීන් මඤ්ඤනා නො කෙරෙත් නිර්වාණයෙහි ආත්මය පිහිටියේ ය යි මඤ්ඤනා නො කෙරෙත්. නිර්වාණයෙන් බැහැර ආත්මය පිහිටියේ ය යි මඤ්ඤනා නො කෙරෙත්. නිර්වාණය මාගේ ය යි මඤ්ඤනා නො කෙරෙත්. නිර්වාණය අභිනන්දනය නො කෙරෙත්. ඒ කවර හෙයින? යත්: තථාගතයන් නිරවශෙෂයෙන් එය පිරිසිඳ දත් හෙයිනැයි කියමි.

ශාස්තෘවශයෙන් ප්‍රථමනයෙහි සප්තමභූමි පරිච්ඡෙදය යි.

(8)

39. මහණෙනි, අතීත් වූ සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයෝ ද පෘථිවිය පෘථිවි වශයෙන් විශිෂ්ටඥානයෙන් දනිත්. පෘථිවිය පෘථිවිය වශයෙන් විශිෂ්ටඥාන-යෙන් දැන පෘථිවිය ආත්මය යි මඤ්ඤනා නො කෙරෙත්. පෘථිවියෙහි ආත්මය පිහිටියේ ය යි මඤ්ඤනා නො කෙරෙත්. පෘථිවියෙන් බැහැර ආත්මය පිහිටියේ ය යි මඤ්ඤනා නො කෙරෙත්. පෘථිවිය මාගේ යයි මඤ්ඤනා නො කෙරෙත්. පෘථිවිය අභිනන්දනය නො කෙරෙත්. ඒ කවර හෙයින ? යත්: “නන්දිසඞ්ඛ්‍යාත තෘෂ්ණාව දුකට මූල වේ. භවයෙන් ඉපැද්ම වෙයි. උපන්නහුට ජරාමරණ වේ”යි මෙසේ (පිළිසසුමුපා) දත් හෙයිනි. මහණෙනි, යම් හෙයෙ-කින් ම තථාගතයන් වහන්සේ (මෙසේ පිළිසසුමුපා දැන) සර්වප්‍රකාරයෙන් තෘෂ්ණාවන් ක්ෂය කිරීමෙන් නිරොධයෙන් ත්‍යාගයෙන් දුරලීමෙන් අනුත්තර සම්‍යක්සම්බොධිය මොනොවට අවබොධ කළසේක් ද එහෙයිනැ යි කියමි.

Free Distribution www.aathaapi.org

40. ආපං[1] -පෙ- තෙජං -පෙ- නිබ්බානං නිබ්බානතො අභිජානාති, නිබ්බානං නිබ්බානතො අභිඤ්ඤාය නිබ්බානං න මඤ්ඤති, නිබ්බානස්මිං න මඤ්ඤති නිබ්බානතො න මඤ්ඤති නිබ්බානං මෙති න මඤ්ඤති, නිබ්බානං නාභිනන්දති. තං කිස්ස හෙතු? "නන්දි[2] දුක්ඛස්ස මූලන්ති ඉති විදිත්වා භවා ජාති, භූතස්ස ජරමරණන්ති." තස්මාතිහ භික්ඛවෙ තථාගතො සබ්බසො තණ්හානං ඛයා විරාගා නිරොධා චාගා පටිනිස්සග්ගා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති වදාමීති.

(සත්ථාරහ දුතියකනයෙ අට්ඨවානකභූමි[3] පරිච්ඡෙදි.)

ඉදමවොච භගවා.[4] න තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.[5]

මූලපරියායසුත්තං පඨමං.[6]

1. 1. 2

සබ්බාසවසුත්තං

1. **එවං** මෙ[7] සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. සබ්බාසවසංවරපරියායං වො භික්ඛවෙ දෙසිස්සාමි,[8] තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

3. ජානතො අහං භික්ඛවෙ පස්සතො ආසවානං ඛයං වදාමි, නො අජානතො, නො අපස්සතො. කිඤ්ච භික්ඛවෙ ජානතො කිං[9] පස්සතො ආසවානං ඛයො හොති?[10] යොනිසො ච මනසිකාරං[11] අයොනිසො ච මනසිකාරං. අයොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නා චෙව ආසවා උප්පජ්ජන්ති, උප්පන්නා ච ආසවා පවඩ්ඪන්ති. යොනිසො[12] ච ඛො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නා චෙව ආසවා න උප්පජ්ජන්ති, උප්පන්නා ච ආසවා පහීයන්ති.[13]

---

1. -පෙ- ආපං, සයා. ආපං -පෙ-, PTS 2. නන්දී, මජසං. PTS.
3. තථාගතවසෙන අට්ඨමනයභූමි - මජසං සයා.
4. න අත්තමනා තෙ භික්ඛූ, සයා. අත්තමනා තෙ භික්ඛූ, PTS.
5. නාභිනන්දුන්ති, කාළුවි.
6. මූලපරියායසුත්තං නිට්ඨිතං පඨමං. මජසං..
7. එවමෙමං, සයා PTS. 8. දෙසෙස්සාමි, සීමු. 9. කිඤ්ච, මජසං.
10. ඛයං වදාමි, මජසං. 11. මනසිකාරො, කාළුවි.
12. යොනිසො ච භික්ඛවෙ, සයා. 13. පහීයන්ති, සයා.

40. අප්...තෙජස්...(පරමදෘෂ්ටධම්) නිර්‍වාණය නිර්‍වාණවශයෙන් විශිෂ්ට-ඥානයෙන් දනිත්. නිර්‍වාණය නිර්‍වාණවශයෙන් විශිෂ්ටඥානයෙන් දැන නිර්‍වාණය ආත්මය යි මඤ්ඤනා නො කෙරෙත්. නිර්‍වාණයෙහි ආත්මය පිහිටියේ ය යි මඤ්ඤනා නො කෙරෙත්. නිර්‍වාණයෙන් බැහැර ආත්මය පිහිටියේ ය යි මඤ්ඤනා නො කෙරෙත්. නිර්‍වාණය මාගේය යි මඤ්ඤනා නො කෙරෙත්. නිර්‍වාණය අභිනන්‍දනය නො කෙරෙත්. ඒ කවර හෙයින ? යත්: "නන්‍දිසඞ්ඛ්‍යාත තෘෂ්ණාව දුකට මූල වේ. භවයෙන් ඉපැද්ම වේ. උපන්නහුට ජරාමරණ වේ" යි මෙසේ (පිළිසඳුමුපා) දත් හෙයිනි. මහණෙනි, යම් හෙයෙකින් ම තථාගතයන් වහන්සේ (මෙසේ පිළිසඳුමුපා දැන) සර්‍වප්‍රකාරයෙන් තෘෂ්ණාවන් ක්‍ෂය කිරීමෙන් විරාගයෙන් නිරොධයෙන් ත්‍යාගයෙන් දුරලීමෙන් අනුත්තර සම්‍යක්සම්බොධිය මොනොවට අවබොධ කළසේක් ද, එහෙයිනැයි කියමි.

(ශාස්තෘවශයෙන් ද්විතීයනයෙහි අෂ්ටමභූමි පරිච්ඡේදය යි.)

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අනුමෝදන් නො වූහු. (එහි අර්‍ථය නොදත් බැවින් තුටු නො වූහ යි යූ සේයි)

පළමුවන මූලපර්‍යාය සූත්‍රය යි.

1. 1. 2

සබ්බාසව සූත්‍රය

1. **මා** විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවත්නුවර සමීපයෙහි **ජෙතවන** නම් වූ **අනේපිඬුසිටුහුගේ** ආරාමයෙහි වැඩවාසය කරන සේක. භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්‍ෂූන් ඇමතූ සේක. ඒ භික්‍ෂූහු වහන්සැයි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළ සේක.

2. මහණෙනි, තොපට සියලු ආශ්‍රවයන්ගේ සංවරකාරණය (අනුත්පාද හෙතුව) දෙශනා කරන්නෙමි. එය අසව. මනා කොට මෙනෙහි කරව. දෙසමි යි වදාළ සේක. 'එසේ ය වහන්සැ'යි ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය වදාළ සේක:

3. මහණෙනි, මම (නුවණින්) දන්නහුට දක්නහුට ආශ්‍රවයන්ගේ ක්‍ෂය කිරීම කියමි. නො දන්නහුට නො දක්නහුට නො කියමි. යළි දූ මහණෙනි, කුමක් දන්නහුට කුමක් දක්නහුට ආශ්‍රවක්‍ෂය වේ ද ? යොනිසොමනසි-කාරය ද අයොනිසොමනසිකාරය ද (දන්නහුට දක්නහුට ආශ්‍රවක්‍ෂය) වේ. මහණෙනි, නුනුවණින් මෙනෙහි කරන්නහුට නූපන්නා වූ ද ආශ්‍රවයෝ උපදිති. උපන්නාවූ ද ආශ්‍රවයෝ වැඩෙති. මහණෙනි, නුවණින් මෙනෙහි කරන්නහුට නූපන්නා වූ ද ආශ්‍රවයෝ නූපදිති. උපන්නා වූ ද ආශ්‍රවයෝ ප්‍රහීණ වෙති.

4. අත්ථි භික්ඛවෙ ආසවා දස්සනා පහාතබ්බා, අත්ථි ආසවා සංවරා පහාතබ්බා, අත්ථි ආසවා පටිසෙවනා පහාතබ්බා, අත්ථි ආසවා අධිවාසනා පහාතබ්බා, අත්ථි ආසවා පරිවජ්ජනා පහාතබ්බා, අත්ථි ආසවා විනොදනා පහාතබ්බා, අත්ථි ආසවා භාවනා පහාතබ්බා.

5. කතමෙ ච භික්ඛවෙ ආසවා දස්සනා පහාතබ්බා? ඉධ භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො මනසිකරණීයෙ ධම්මෙ නප්පජානාති, අමනසිකරණීයෙ ධම්මෙ නප්පජානාති. සො මනසිකරණීයෙ ධම්මෙ අප්පජානන්තො අමනසිකරණීයෙ ධම්මෙ අප්පජානන්තො යෙ ධම්මා න මනසිකරණීයා තෙ ධම්මෙ මනසි කරොති, යෙ ධම්මා මනසිකරණීයා තෙ ධම්මෙ න මනසි කරොති.

6. කතමෙ ච භික්ඛවෙ ධම්මා න මනසිකරණීයා යෙ ධම්මෙ මනසි කරොති? යස්ස භික්ඛවෙ ධම්මෙ මනසි කරොතො අනුප්පන්නො වා කාමාසවො උප්පජ්ජති, උප්පන්නො වා කාමාසවො පවඩ්ඪති, අනුප්පන්නො වා භවාසවො උප්පජ්ජති, උප්පන්නො වා භවාසවො පවඩ්ඪති, අනුප්පන්නො වා අවිජ්ජාසවො උප්පජ්ජති, උප්පන්නො වා අවිජ්ජාසවො පවඩ්ඪති. ඉමෙ ධම්මා න මනසිකරණීයා යෙ ධම්මෙ මනසි කරොති.

7. කතමෙ ච භික්ඛවෙ ධම්මා මනසිකරණීයා යෙ ධම්මෙ න මනසි කරොති? යස්ස භික්ඛවෙ ධම්මෙ මනසි කරොතො අනුප්පන්නො වා කාමාසවො න උප්පජ්ජති, උප්පන්නො වා කාමාසවො පහීයති[1]; අනුප්පන්නො වා භවාසවො න උප්පජ්ජති, උප්පන්නො වා භවාසවො පහීයති; අනුප්පන්නො වා අවිජ්ජාසවො න උප්පජ්ජති, උප්පන්නො වා අවිජ්ජාසවො පහීයති. ඉමෙ ධම්මා මනසිකරණීයා යෙ ධම්මෙ න මනසි කරොති.

8. තස්ස අමනසිකරණීයානං ධම්මානං මනසිකාරා මනසිකරණීයානං ධම්මානං අමනසිකාරා අනුප්පන්නා චෙව ආසවා උප්පජ්ජන්ති, උප්පන්නා ච ආසවා පවඩ්ඪන්ති.

1. පහීයාති, සස.

4. මහණෙනි, සෝවත්මගනුවණින් පහ කළ යුතු ආශ්‍රව ඇත. සමෘතිසඞ්ඛ්‍යාත සංවරයෙන් පහ කළ යුතු ආශ්‍රව ඇත. ශ්‍රුතසංවර-සඞ්ඛ්‍යාත ප්‍රත්‍යවෙක්‍ෂාප්‍රතිසෙවනායෙන් පහ කළ යුතු ආශ්‍රව ඇත. ක්‍ෂාන්තිසංවරසඞ්ඛ්‍යාත අධිවාසනායෙන් පහ කළ යුතු ආශ්‍රව ඇත. ශීලසංවරසඞ්ඛ්‍යාත පරිවර්ජනයෙන් පහ කළ යුතු ආශ්‍රව ඇත. වීර්‍ය්‍ය සංවර සඞ්ඛ්‍යාත විනොදනයෙන් පහ කළ යුතු ආශ්‍රව ඇත. උපරිමාර්ගත්‍රය හා සම්ප්‍රයුක්ත බොධ්‍යඞ්ගයන්ගේ භාවනාවෙන් පහ කළ යුතු ආශ්‍රව ඇත.

5. මහණෙනි, සෝවත්මග නුවණින් පහ කළ යුතු වූ ආශ්‍රවයෝ කවරහ ? යත්: මහණෙනි, මේ ලොකයෙහි බුද්ධාදි ආර්‍ය්‍යයන් නො දක්නා වූ ආර්‍ය්‍යධර්මයෙහි අදක්‍ෂ වූ ආර්‍ය්‍යධර්මයෙහි නො හික්මුණාවූ, බුද්ධාදි සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂධර්මයෙහි අදක්‍ෂ වූ සත්පුරුෂධර්මයෙහි නො හික්-මුණු අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ මෙනෙහි කළ යුතු ධර්මයන් නො දනී. මෙනෙහි නො කළ යුතු ධර්මයන් නො දනී. මෙනෙහි කළ යුතු ධර්මයන් නො දන්නා නො මෙනෙහි කළ යුතු ධර්මයන් නො දන්නා හෙ තෙමේ යම් ධර්ම කෙනෙක් නො මෙනෙහි කළ යුත්තාහු නම්, ඒ ධර්මයන් මෙනෙහි කෙරෙයි. යම් ධර්ම කෙනෙක් මෙනෙහි කළ යුත්තාහු නම්, ඒ ධර්මයන් මෙනෙහි නො කෙරෙයි.

6. මහණෙනි, යම් ධර්ම කෙනකුන් මෙනෙහි කෙරේ නම්,මෙනෙහි නො කළ යුතු ඒ ධර්මයෝ කවරහ ? යත්: මහණෙනි, යම් ධර්මකෙනකුන් මෙනෙහි කරන්නහුට නූපන් කාමාශ්‍රවය හෝ උපදී ද, උපන් කාමාශ්‍රවය හෝ වැඬේ ද, නූපන් භවාශ්‍රවය හෝ උපදී ද, උපන් භවාශ්‍රවය හෝ වැඬේ ද, නූපන් අවිද්‍යාශ්‍රවය හෝ උපදී ද, උපන් අවිද්‍යා-ශ්‍රවය හෝ වැඬේ ද, යම් ධර්ම කෙනකුන් මෙනෙහි කෙරේ නම්, මොහු ඒ මෙනෙහි නො කළ යුතු ධර්මයෝ යි.

7. මහණෙනි, යම් ධර්ම කෙනකුන් මෙනෙහි නො කෙරේ නම්, මෙනෙහි කළ යුතු ඒ ධර්මයෝ කවරහ ? යත්: මහණෙනි, යම් ධර්ම-කෙනකුන් මෙනෙහි කරන්නහුට නූපන් කාමාශ්‍රවය හෝ නූපදී ද, උපන් කාමාශ්‍රවය හෝ ප්‍රහීණ වේ ද, නූපන් භවාශ්‍රවය හෝ නූපදී ද, උපන් භවාශ්‍රවය හෝ ප්‍රහීණ වේ ද, නූපන් අවිද්‍යාශ්‍රවය හෝ නූපදී ද, උපන් අවිද්‍යාශ්‍රවය හෝ ප්‍රහීණ වේ ද, යම් ධර්ම කෙනකුන් මෙනෙහි නො කෙරේ නම්, මොහු ඒ මෙනෙහි කළ යුතු ධර්මයෝ යි.

8. මෙනෙහි නො කළ යුතු ධර්මයන් මෙනෙහි කිරීමෙන් මෙනෙහි කළ යුතු ධර්මයන් නො මෙනෙහි කිරීමෙන් ඔහුට නූපන්නා වූ ද, ආශ්‍රවයෝ උපදිති. උපන්නා වූ ද ආශ්‍රවයෝ වැඬෙති.

9. සො එවං අයොනිසො මනසි කරොති: අහොසිං නු ඛො අහං අතීතමද්ධානං, න නු ඛො අහොසිං අතීතමද්ධානං, කින්නු ඛො අහොසිං අතීතමද්ධානං, කථන්නු ඛො අහොසිං අතීතමද්ධානං, කිං හුත්වා කිං අහොසිං නු ඛො අහං අතීතමද්ධානං. භවිස්සාමි නු ඛො අහං අනාගතමද්ධානං, න නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං, කින්නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං, කථන්නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං, කිං හුත්වා කිං භවිස්සාමි නු ඛො අහං අනාගතමද්ධානන්ති.[1] එතරහි වා පච්චුප්පන්නං[2] අද්ධානං අජ්ඣත්තං කථංකථී හොති: අහං නු ඛොස්මි, නො නු ඛොස්මි, කින්නු ඛොස්මි, කථං නු ඛොස්මි, අයං නු ඛො සත්තො කුතො ආගතො; සො කුහිං ගාමී භවිස්සතීති.

10. තස්ස එවං අයොනිසො මනසි කරොතො ඡන්නං දිට්ඨීනං අඤ්ඤතරා දිට්ඨි උප්පජ්ජති: අත්ථි මෙ අත්තාති වාස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති, නත්ථි මෙ අත්තාති වාස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති, අත්තනාව අත්තානං සඤ්ජානාමීති වාස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති, අත්තනාව අනත්තානං සඤ්ජානාමීති වාස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති, අනත්තනාව අත්තානං සඤ්ජානාමීති වාස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති. අථ වා පනස්ස එවං දිට්ඨි හොති: යො[3] මෙ අයං අත්තා වදෙ වෙදෙය්‍යො[4] තත්‍ර තත්‍ර කල්‍යාණපාපකානං කම්මානං විපාකං පටිසංවෙදෙති, සො ඛො පන මෙ අයං අත්තා නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො සස්සතිසමං තථෙව ඨස්සතීති. ඉදං වුච්චති භික්ඛවෙ දිට්ඨිගතං දිට්ඨිගහනං[5] දිට්ඨිකන්තාරෙ[6] දිට්ඨිවිසූකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසංයොජනං. දිට්ඨිසංයොජනසංයුත්තො භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො න පරිමුච්චති ජාතියා ජරාමරණෙන[7] සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි;[8] න පරිමුච්චති දුක්ඛස්මාති වදාමි.

11. සුතවා ච ඛො භික්ඛවෙ අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො මනසිකරණීයෙ ධම්මෙ පජානාති, අමනසිකරණීයෙ ධම්මෙ පජානාති. සො මනසිකරණීයෙ ධම්මෙ පජානන්තො අමනසිකරණීයෙ ධම්මෙ පජානන්තො යෙ ධම්මා න මනසිකරණීයා තෙ ධම්මෙ න මනසි කරොති, යෙ ධම්මා මනසිකරණීයා තෙ ධම්මෙ මනසි කරොති.

1. අනාගතමද්ධානං, සෑළුවි. 2. පච්චුප්පන්නමද්ධානං, මජසං. 3. සො, සෑළුවි.
4 අත්තාව වෙදෙය්‍යො, සයා. 5. දිට්ඨිගහණං, සයා.
6. දිට්ඨිකන්තාරං, සී. PTS. 7. ජරාය මරණෙන, මජසං. සයා.
8 සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසෙහි, සයා.

Free Distribution www.aathaapi.org

9. හෙ තෙමේ මෙසේ නුනුවණින් මෙනෙහි කරයි: මම අතීත කාලයෙහි වූයෙම් දෝ හෝ, අතීත කාලයෙහි නුවූයෙම් දෝ හෝ, අතීත කාලයෙහි (ජාත්‍යාදි විසින්) කවරෙක් වූයෙම් දෝ හෝ, අතීත කාලයෙහි (සටහන් විසින්) කෙසේ වූයෙම් දෝ හෝ, මම අතීත කාලයෙහි කවරෙක් ව සිට කවරෙක් වූයෙම් දෝ හෝ, මම අනාගත කාලයෙහි වෙම් දෝ හෝ, අනාගත කාලයෙහි නො වෙම් දෝ හෝ, අනාගත කලයෙහි කවරෙක් වෙම් දෝ හෝ, අනාගත කාලයෙහි කෙසේ වෙම් දෝ හෝ, මම අනාගත කාලයෙහි කවරෙක් වැ සිට කවරෙක් වෙම් දෝ හෝයි. දැන් වර්තමානයෙහි ද තමා කෙරෙහි සැක ඇත්තේ වෙයි: මම වෙම් දෝ හෝ, මම නො වෙම් දෝ හෝ, කවරෙක් වෙම් දෝ හෝ, කෙසේ වෙම් දෝ හෝ, මේ සත්ත්වතෙම කොයින් ආයේ දෝ හෝ, හේ කොහි යන්නේ දෝ හෝ යි.

10 මෙසේ නුනුවණින් මෙනෙහි කරණ ඔහුට සවැදෑරුම් දෘෂ්ටීන් අතුරෙන් එක්තරා දෘෂ්ටියෙක් උපදී: මාගේ ආත්මය ඇතැයි සත්‍යවශයෙන් ස්ථිරවශයෙන් ඔහුට (ශාශ්වත) දෘෂ්ටිය උපදී. මාගේ ආත්මය නැතැයි සත්‍යවශයෙන් ස්ථිරවශයෙන් ඔහුට (උච්ඡේද) දෘෂ්ටිය උපදී. (සංඥාස්කන්ධ සඞ්ඛ්‍යාත)මම ම(තදන්‍යස්කන්ධසඞ්ඛ්‍යාත) ආත්මය හැඳින ගනිමියි සත්‍යවශයෙන් ස්ථිරවශයෙන් ඔහුට දෘෂ්ටිය උපදී. (සංඥාස්කන්ධසඞ්ඛ්‍යාත) මම ම (තදන්‍යස්කන්ධසඞ්ඛ්‍යාත) අනාත්මය හැඳින ගනිමි යි සත්‍යවශයෙන් ස්ථිරවශයෙන් ඔහුට දෘෂ්ටිය උපදී. අනාත්ම වූ (සංඥාසඞ්ඛ්‍යාත) මම ම (තදන්‍යස්කන්ධසඞ්ඛ්‍යාත) ආත්මය හැඳින ගනිමියි සත්‍යවශයෙන් ස්ථිරවශයෙන් ඔහුට දෘෂ්ටිය උපදී. යලි දු ඔහුට මෙබඳු දෘෂ්ටියෙක් වෙයි: මාගේ යම් මේ ආත්මයෙක් බණනුයේ (වාක්කර්ම කරන්නේ) සුවදුක් විඳ ගනුයේ ඒ ඒ තැන කුශලාකුශලකර්මවිපාකය විඳී ද, මා සතු ඒ මේ ආත්මය වනාහි නිත්‍ය ය. තහවුරු ය. සාර්වකාලිකය. නො පෙරළෙන ස්වභාව ඇත්තේ ය. ශාශ්වතිකයන් මෙන් නො වෙනස් ව සිටිනේ ය යි කියා යි. මහණෙනි, මෙය දෘෂ්ටිගත යයි ද, දෘෂ්ටිගහන ය යි ද, දෘෂ්ටිකාන්තාර ය යි ද, (සම්දිටු විනිවිදිනා හෙයින්) දෘෂ්ටිවිශූක ය යි ද, දෘෂ්ටිසංයොජන ය යි ද කියනු ලැබේ. මහණෙනි, දෘෂ්ටිසංයොජනයෙන් සංයුක්ත වූ අශ්‍රැතවත් පෘථග්ජන තෙම ජාතියෙන්, ජරාවෙන්, මරණයෙන්, ශොකයෙන්, වැලපීමෙන්, කායිකදුකින්, මානසිකදුකින්, දැඩි ආයාසයෙන් නො මිදේ. සියලු සසර දුකින් නො මිදේ ය යි කියමි.

11. මහණෙනි, ආර්‍යයන් දක්නාසුලු, ආර්‍යධර්මයෙහි දක්ෂ, ආර්‍ය-ධර්මයෙහි මොනවට හික්මුණු, සත්පුරුෂයන් දක්නා සුලු, සත්පුරුෂ-ධර්මයෙහි දක්ෂ, සත්පුරුෂධර්මයෙහි මොනවට හික්මුණු ශ්‍රැතවත් (ආගමාධිගම-සම්පන්න) ආර්‍යශ්‍රාවක තෙමේ මෙනෙහි කළ යුතු ධර්ම දනී. මෙනෙහි නො කළ යුතු ධර්ම දනී. හෙ තෙමේ මෙනෙහි කළ යුතු ධර්ම දන්නේ මෙනෙහි නො කළ යුතු ධර්ම දන්නේ යම් ධර්ම මෙනෙහි නො කළ යුතු නම්, ඒ ධර්ම මෙනෙහි නො කරයි. යම් ධර්ම මෙනෙහි කළ යුතු නම්, ඒ ධර්ම මෙනෙහි කරයි.

12. කතමෙ ච භික්ඛවෙ ධම්මා න මනසිකරණීයා, යෙ ධම්මෙ න මනසි කරොති? යස්ස භික්ඛවෙ ධම්මෙ මනසි කරොතො අනුප්පන්නො වා කාමාසවො උප්පජ්ජති, උප්පන්නො වා කාමාසවො පවඩ්ඪති. අනුප්පන්නො වා භවාසවො[1] -පෙ- අවිජ්ජාසවො උප්පජ්ජති, උප්පන්නො වා අවිජ්ජාසවො පවඩ්ඪති. ඉමෙ ධම්මා න මනසිකරණීයා යෙ ධම්මෙ න මනසි කරොති.

13. කතමෙ ච භික්ඛවෙ ධම්මා මනසිකරණීයා යෙ ධම්මෙ මනසි කරොති? යස්ස භික්ඛවෙ ධම්මෙ මනසි කරොතො අනුප්පන්නො වා කාමාසවො න උප්පජ්ජති, උප්පන්නො වා කාමාසවො පහීයති. අනුප්පන්නො වා භවාසවො[2] -පෙ- අවිජ්ජාසවො න උප්පජ්ජති, උප්පන්නො වා අවිජ්ජාසවො පහීයති. ඉමෙ ධම්මා මනසිකරණීයා යෙ ධම්මෙ මනසි කරොති.

14. තස්ස අමනසිකරණීයානං ධම්මානං අමනසිකාරා මනසිකරණීයානං ධම්මානං මනසිකාරා අනුප්පන්නා චෙව ආසවා න උප්පජ්ජන්ති, උප්පන්නා ච ආසවා පහීයන්ති. සො ඉදං දුක්ඛන්ති යොනිසො මනසි කරොති, අයං දුක්ඛසමුදයොති යොනිසො මනසි කරොති, අයං දුක්ඛනිරොධොති යොනිසො මනසි කරොති, අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති යොනිසො මනසි කරොති. තස්ස එවං යොනිසො මනසිකරොතො තීණි සංයොජනානි පහීයන්ති: සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො[3]. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ආසවා දස්සනා පහාතබ්බා.

15. කතමෙ ච භික්ඛවෙ ආසවා සංවරා පහාතබ්බා? ඉධ භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛා යොනිසො චක්ඛුන්ද්‍රියසංවරසංවුතො විහරති. යං[4] හිස්ස භික්ඛවෙ චක්ඛුන්ද්‍රියසංවරං අසංවුතස්ස විහරතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා, චක්ඛුන්ද්‍රියසංවරසංවුතස්ස විහරතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. පටිසඞ්ඛා යොනිසො සොතින්ද්‍රියසංවරසංවුතො විහරති -පෙ- ඝානින්ද්‍රියසංවරසංවුතො විහරති -පෙ- ජිව්හින්ද්‍රියසංවරසංවුතො විහරති -පෙ- කායින්ද්‍රියසංවරසංවුතො විහරති -පෙ- පටිසඞ්ඛා යොනිසො මනින්ද්‍රියසංවරසංවුතො විහරති. යං හිස්ස භික්ඛවෙ මනින්ද්‍රියසංවරං අසංවුතස්ස විහරතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා, මනින්ද්‍රිය-සංවරසංවුතස්ස විහරතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. යං හිස්ස භික්ඛවෙ සංවරං අසංවුතස්ස විහරතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා, සංවරසංවුතස්ස විහරතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ආසවා සංවරා පහාතබ්බා.

---

1 උප්පජ්ජති, උප්පන්නො වා භවාසවො පවඩ්ඪති, අනුප්පන්නො වා, මජසං. සතා.
2 න උප්පජ්ජති, උප්පන්නො වා භවාසවො පහීයති. අනුප්පන්නො වා, මජසං. සතා
3. සීලබ්බතා, සතා. 4. යඤ්හිස්ස, මජසං. සතා.

Free Distribution www.aathaapi.org

12. මහණෙනි, යම් ධර්ම කෙනකුන් මෙනෙහි නො කෙරේ නම්, මෙනෙහි නො කළ යුතු වූ ඒ ධර්මයෝ කවරහ? යත්: මහණෙනි, යම් ධර්ම කෙනකුන් මෙනෙහි කරන ඔහුට නූපන්නා වූත් කාමාස්‍රවය උපදී ද, උපන්නා වූත් කාමාස්‍රවය වැඩේ ද, නූපන්නා වූත් භවාස්‍රවය උපදී ද, උපන්නා වූත් භවාස්‍රවය වැඩේ ද, නූපන්නා වූත් අවිද්‍යාස්‍රවය උපදී ද, උපන්නා වූත් අවිද්‍යාස්‍රවය වැඩේ ද, මොහු වනාහි, යම් ධර්ම කෙනකුන් මෙනෙහි නො කෙරේ නම්, මෙනෙහි නො කළ යුතු වූ ඒ ධර්මයෝ යි.

13. මහණෙනි, යම් ධර්ම කෙනකුන් මෙනෙහි කෙරේ නම්, මෙනෙහි කළ යුතු වූ ඒ ධර්මයෝ කවරහ? යත්: මහණෙනි, යම් ධර්ම කෙනකුන් මෙනෙහි කරන ඔහුට නූපන්නා වූත් කාමාස්‍රවය නො උපදී ද, උපන්නා වූත් කාමාස්‍රවය ප්‍රහීණ වේ ද, නූපන්නා වූත් භවාස්‍රවය නො උපදී ද, උපන්නා වූත් භවාස්‍රවය ප්‍රහීණ වේ ද, නූපන්නා වූත් අවිද්‍යාස්‍රවය නො උපදී ද, උපන්නා වූත් අවිද්‍යාස්‍රවය ප්‍රහීණ වේ ද, මොහු වනාහි, යම් ධර්ම කෙනකුන් මෙනෙහි කෙරේ නම් මෙනෙහි කළ යුතු ඒ ධර්මයෝ යි.

14. ඔහුට මෙනෙහි නො කළ යුතු ධර්මයන් මෙනෙහි නො කිරීමෙන් මෙනෙහි කළ යුතු ධර්මයන් මෙනෙහි කිරීමෙන් නූපන් ආස්‍රවයෝත් නූපදිත්, උපන් ආස්‍රවයෝත් ප්‍රහීණ වෙත්. හේ මේ දුක්ඛ යි නුවණින් මෙනෙහි කරයි. මේ දුක්ඛසමුදය යි නුවණින් මෙනෙහි කරයි. මේ දුක්ඛනිරොධය යි නුවණින් මෙනෙහි කරයි. මේ දුක්ඛනිරොධගාමිනී-පටිපදාය යි නුවණින් මෙනෙහි කරයි. මෙසේ නුවණින් මෙනෙහි කරන ඔහුගේ සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස යන තුන් සංයොජනයෝ ප්‍රහීණ වෙත්. මහණෙනි, මොහු දර්ශනයෙන් (සෝවත් මගින්) ප්‍රහීණ කළ යුතු ආස්‍රවයෝ යි කියනු ලැබෙත්.

15. මහණෙනි, සංවරයෙන් ප්‍රහීණ කළ යුතු ආස්‍රවයෝ කවරහ? යත්: මහණෙනි, මේ සස්නෙහි මහණ තෙමේ නුවණින් සලකා චක්ෂුරින්ද්‍රිය-සංවරයෙන් සංවෘත ව වෙසේ ද, මහණෙනි, චක්ෂුරින්ද්‍රිය සංවරයෙන් සංවෘත නො වී වසන්නහුට පීඩා කර වූ යම් (කෙලශ විපාක) පරිදාහ කෙනෙක් උපදිත් නම්, චක්ෂුරින්ද්‍රිය සංවර සංවෘත ව වසන ඔහුට මෙසේ ඒ පීඩාකර පරිදාහයෝ නො වෙත්. නුවණින් සලකා ශ්‍රොත්‍රෙන්ද්‍රිය සංවරයෙන් සංවෘත ව වෙසේ ද... නුවණින් සලකා ඝ්‍රාණෙන්ද්‍රියසංවරයෙන් සංවෘත ව වෙසේ ද ..ජිහ්වෙන්ද්‍රියසංවරයෙන්...කායෙන්ද්‍රිය සංවරයෙන්... මනින්ද්‍රියසංවරයෙන් සංවෘත ව වෙසේ ද, මහණෙනි, මනින්ද්‍රිය සංවරයෙන් සංවෘත නො වී වසන්නහුට පීඩාකර වූ යම් පරිදාහ කෙනෙක් උපදිත් නම්, මනින්ද්‍රියසංවරයෙන් සංවෘත ව වෙසෙන ඔහුට මෙසේ ඒ පීඩාකර පරිදාහයෝ නො වෙත්. මහණෙනි, යම් හෙයෙකින් සංවරයක් නැති ව වාසය කරන්නා වූ ඔහුට වෙහෙස හා දැවිලි සහිත ආස්‍රවයෝ උපදිත් ද, සංවරයෙන් යුක්ත ව වාසය කරන්නා වූ ඔහුට මෙසේ ඒ වෙහෙස හා දැවිලි සහිත ආස්‍රවයෝ නො වෙත්. මහණෙනි, මේ ආස්‍රවයෝ සතිසංවරයෙන් පහ කළ යුත්තෝ ය යි කියනු ලැබෙත්.

16. කතමෙ ච භික්ඛවෙ ආසවා පටිසෙවනා පහාතබ්බා? ඉධ භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛා යොනිසො චීවරං පටිසෙවති: යාවදෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං[1] පටිඝාතාය යාවදෙව හිරිකොපීනපටිච්ඡාදනත්ථං. පටිසඞ්ඛා යොනිසො පිණ්ඩපාතං පටිසෙවති: නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා[2] බ්‍රහ්මචරියානුග්ගහාය. ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි, නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති, අනවජ්ජතා ච ඵාසුවිහාරෙ චාති.[3] පටිසඞ්ඛා යොනිසො සෙනාසනං පටිසෙවති, යාවදෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං පටිඝාතාය යාවදෙව උතුපරිස්සයවිනොදනං[4] පටිසල්ලානාරාමත්ථං. පටිසඞ්ඛා යොනිසො ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිසෙවති: යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය අබ්‍යාපජ්ඣපරමතාය.[5] යං හිස්ස භික්ඛවෙ අපටිසෙවතො[6] උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා. පටිසෙවතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ආසවා පටිසෙවනා පහාතබ්බා.

17. කතමෙ ච භික්ඛවෙ ආසවා අධිවාසනා පහාතබ්බා? ඉධ භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛා යොනිසො ඛමො හොති සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං, දුරුත්තානං දුරාගතානං වචනපථානං, උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිප්පානං[7] ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අධිවාසකජාතිකො[8] හොති. යං හිස්ස භික්ඛවෙ අනධිවාසයතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා, අධිවාසයතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ආසවා අධිවාසනා පහාතබ්බා.

18. කතමෙ ච භික්ඛවෙ ආසවා පරිවජ්ජනා පහාතබ්බා? ඉධ භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛා යොනිසො චණ්ඩං හත්ථිං පරිවජ්ජෙති. චණ්ඩං අස්සං පරිවජ්ජෙති. චණ්ඩං ගොණං පරිවජ්ජෙති. චණ්ඩං කුක්කුරං පරිවජ්ජෙති, අහිං ඛාණුං කණ්ටකාධානං[9] සොබ්භං පපාතං චන්දනිකං ඔළිගල්ලං. යථාරූපෙ අනාසනෙ නිසින්නං යථාරූපෙ අගොචරෙ චරන්තං යථාරූපෙ පාපකෙ මිත්තෙ භජන්තං විඤ්ඤූ සබ්‍රහ්මචාරී පාපකෙසු ඨානෙසු ඔකප්පෙය්‍යුං, සො තඤ්ච අනාසනං තඤ්ච අගොචරං තෙ ච පාපකෙ මිත්තෙ පටිසඞ්ඛා යොනිසො පරිවජ්ජෙති. යං හිස්ස භික්ඛවෙ අපරිවජ්ජයතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා. පරිවජ්ජයතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ආසවා පරිවජ්ජනා පහාතබ්බා.

---

1. සරීසප, මජසං. 2. විහිංසුපරතියා, සයා. 3 ඵාසුවිහාරෙ ච, මජසං.
4. විනොදන, මජසං. 5. අබ්‍යාපජ්ජ, කථවි.
6. අප්පටිසෙවතො, මජසං. සයා. 7. තිබ්බානං, මජසං.
8. අධිවාසිකජාතිකො, සයා. 9. කණ්ටකධානං, මජසං, සයා.

16. මහණෙනි, ප්‍රත්‍යවෙක්‍ෂාඥානයෙන් පහ කළ යුතු ආස්‍රවයෝ කවරහ ? යත්: මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ නුවණින් සලකා හුදෙක් ශීත නැති කිරීම පිණිස, උෂ්ණ නැති කිරීම පිණිස, මැසි මදුරු සුළං අවු සපුත්ගේ සපර්ශ නැති කිරීම පිණිස, ලජ්ජාස්ථාන වසා ගැන්ම පිණිස පමණක් සිවුරු පරිභොග කෙරෙ යි. නුවණින් සලකා පිණ්ඩපාතය වළඳයි. (එය) ක්‍රීඩා පිණිස නො වේ ම ය. පුරුෂ මදය වැඩීම පිණිස නො වේ ම ය. සැරසීම පිණිස නො වේ ම ය. අලඞ්කාර පිණිස නො වේ ම ය. හුදෙක් මේ ශරීරයාගේ පැවැත්ම පිණිස ම ය. යැපීම පිණිස ම ය. බඩගිනි වැළැක්වීම පිණිස ම ය. බ්‍රහ්මචර්‍ය්‍ය රැකීමට අනුබලයක් සඳහා ම ය. මෙසේ පැරණි බඩගිනි වෙදනාවත් නැති කරන්නෙමි. අලුත් වෙදනා ද නූපදවන්නෙමි. එයින් මාගේ ජීවිතය පැවැත්ම ද වන්නේ ය. නිවැරැදි බව ද වන්නේ ය. සැප විහරණය ද වන්නේය සි (සලකා පිණ්ඩපාතය වළඳයි). හුදෙක් ශීත නැති කිරීම පිණිස, උෂ්ණය නැති කිරීම පිණිස, මැසි මදුරු සුළං අවු සපුත්ගේ සපර්ශ නැති කිරීම පිණිස, ඍතුපීඩා නැති කිරීම පිණිස විවෙකයෙහි ඇලීම පිණිස පමණක් ය සි නුවණින් සලකා සෙනසුන සෙවනය කරයි. හුදෙක් උපන්නා වූ නොයෙක් ආබාධයන්ගේ වෙදනා නැති කිරීම පිණිස, රොග දුක් නැති ව සිටීම පිණිස පමණක් සෙවනය කරමි සි නුවණින් සලකා ගිලන්පස බෙහෙත් ආදිය සෙවනය කරයි. මහණෙනි, යම් හෙයෙකින් ප්‍රත්‍යවෙක්‍ෂා නො කරන්නා වූ ඔහුට වෙහෙස හා දැවිලි සහිත ආස්‍රවයෝ උපදින් ද, ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නාට මෙසේ ඒ දැවිලි සහිත ආස්‍රවයෝ නො වෙත්. මහණෙනි, මේ ආස්‍රවයෝ ප්‍රත්‍යවෙක්‍ෂාවෙන් පහ කළ යුත්තෝය සි කියනු ලැබෙත්.

17. මහණෙනි, අධිවාසනායෙන් පැහිය යුතු ආස්‍රවයෝ කවරහ ? යත්: මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ නුවණින් සලකා ශීත ඉවසන සුල්ලෙක් වෙයි. උණුසුම ද, බඩගින්න ද, පවස ද, මැසි, මදුරු, සුළං, අවු, සපුත්ගේ සපර්ශ ද, නපුරු කොට කියූ, නපුරු ලෙස පැමිණි වචන ද ඉවසන සුල්ලෙක් වෙයි. උපන් ශාරීරික වූ, තියුණු වූ රළු වූ කටුක වූ අමිහිරි වූ අමනාප වූ දිවි පැහැර ගන්නා වූ වෙදනා ඉවසන සුල්ලෙක් වෙයි. යම් හෙයෙකින් නො ඉවසන්නා වූ ඔහුට වෙහෙසකර දැවිලි සහිත ආස්‍රවයෝ උපදින් ද, මෙසේ ඉවසන්නා වූ ඔහුට වෙහෙසකර දැවිලි සහිත ආස්‍රවයෝ නූපදිත්. මහණෙනි, මේ අධිවාසනායෙන් පහ කළ යුතු ආස්‍රවයෝ යි කියනු ලැබෙත්.

18. මහණෙනි, දුරු කිරීමෙන් පැහිය යුතු ආස්‍රවයෝ කවරහ ? යත්: මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ නුවණින් සලකා නපුරු ඇතු දුරු කෙරෙ යි. නපුරු අසු දුරු කෙරෙ යි. නපුරු ගොනු දුරු කෙරෙ යි. නපුරු බලු දුරු කෙරෙ යි. සපු, කණු, කටුලැහැබ, හෙබ, පවයින්, ගවරවල, මොලඟ දුරු කෙරෙයි. යම් බඳු නුසුදුසු අස්නෙහි හුන්නහු, යම්බඳු නුසුදුසු තන්හි හැසිරෙන්නහු, යම්බඳු පවිටු මිත්‍රයන් සෙවනය කරන්නහු නුවණැත්තා වූ සබ්‍රම්සරහු ලාමක තන්හි ලා සලකන්නාහු ද, ඒ තෙමේ ඒ නො අසුන ද ඒ අගොචරය ද ඒ පාපමිත්‍රයන් ද නුවණින් සලකා දුරු කෙරෙ යි. මහණෙනි, යම් හෙයෙකින් එබඳු දේ දුරු නො කරන්නහුට වෙහෙස හා දැවිලි සහිත ආස්‍රවයෝ උපදින් ද, මෙසේ එබඳු දේ දුරු කරන්නහුට වෙහෙස හා දැවිලි සහිත ආස්‍රවයෝ නො වෙත්. මහණෙනි, මේ ආස්‍රවයෝ දුරු කිරීමෙන් පැහිය යුත්තෝ ය සි කියනු ලැබෙත්.

19. කතමෙ ච භික්ඛවෙ ආසවා විනොදනා පහාතබ්බා? ඉධ භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛා යොනිසො උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති, පජහති, විනොදෙති, බ්‍යන්තීකරෙති,[1] අනභාවං ගමෙති; උප්පන්නං ව්‍යාපාදවිතක්කං[2] නාධිවාසෙති, පජහති, විනොදෙති, බ්‍යන්තීකරෙති, අනභාවං ගමෙති. උප්පන්නං විහිංසාවිතක්කං -පෙ- උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ නාධිවාසෙති, පජහති, විනොදෙති, බ්‍යන්තීකරෙති, අනභාවං ගමෙති. යං හිස්ස භික්ඛවෙ අවිනොදයතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාත-පරිළාහා, විනොදයතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ආසවා විනොදනා පහාතබ්බා.

20. කතමෙ ච භික්ඛවෙ ආසවා භාවනා පහාතබ්බා? ඉධ භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛා යොනිසො සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං.[3] පටිසඞ්ඛා යොනිසො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- විරියසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- සමාධිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- උපෙක්ඛා[4] සම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. යං හිස්ස භික්ඛවෙ අභාවයතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා, භාවයතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ආසවා භාවනා පහාතබ්බා.

21. යතො[5] ච භික්ඛවෙ භික්ඛුනො යෙ ආසවා දස්සනා පහාතබ්බා තෙ දස්සනා පහීනා හොන්ති. යෙ ආසවා සංවරා පහාතබ්බා තෙ සංවරා පහීනා හොන්ති. යෙ ආසවා පටිසෙවනා පහාතබ්බා තෙ පටිසෙවනා පහීනා හොන්ති. යෙ ආසවා අධිවාසනා පහාතබ්බා තෙ අධිවාසනා පහීනා හොන්ති. යෙ ආසවා පරිවජ්ජනා පහාතබ්බා තෙ පරිවජ්ජනා පහීනා හොන්ති. යෙ ආසවා විනොදනා පහාතබ්බා තෙ විනොදනා පහීනා හොන්ති. යෙ ආසවා භාවනා පහාතබ්බා තෙ භාවනා පහීනා හොන්ති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු සබ්බාසවසංවරසංවුතො විහරති, අච්ඡෙච්ඡි තණ්හං, වාවත්තයි සංයොජනං, සම්මා මානාභිසමයා අන්තමකාසි දුක්ඛස්සාති.

22. ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

සබ්බාසවසුත්තං දුතියං.

---

1. බ්‍යන්තිං කරොන්ති කත්ථචි. බ්‍යන්තීකරෙති, PTS.
2. බ්‍යාපාදවිතක්කං, මජසං. PTS. සයා.
3. වොස්සග්ගපරිණාමිං, සං. 4. උපෙක්ඛා, සීමු.
5. යතො ඛො, මජසං. PTS.

19. මහණෙනි, විනොදනයෙන් (දෙෂ සැලකීම් සහිත වීයණීයෙන්) පහ කළ යුතු ආශ්‍රවයෝ කවරහ ? යත්: මහණෙනි, මේ ලොකයෙහි මහණ තෙමේ නුවණින් සලකා උපන් කාමවිතර්කය සිත තබා නො ගනියි, දුරු කරයි, බැහැර කරයි, විනාශ කරයි. නැවත නො ඉපදීමට පමුණුව යි. උපන්නා වූ ව්‍යාපාදවිතර්කය සිත තබා නො ගනියි, දුරු කරයි, බැහැර කරයි, විනාශ කරයි, නැවත නො ඉපදීමට පමුණුවයි. උපන්නා වූ විහිංසා විතර්කය...උපනුපන් ලාමක අකුශල ධර්මයන් සිත තබා නො ගනියි, දුරු කරයි, බැහැර කරයි, විනාශ කරයි, නැවත නො ඉපදීමට පමුණුවයි. මහණෙනි, යම් හෙයකින් එබඳු දේ දුරු නො කරන්නා වූ ඔහුට වෙහෙස හා දැවිලි සහිත ආශ්‍රවයෝ උපදිත් ද, මෙසේ එබඳු දේ දුරු කරන්නහුට වෙහෙස හා දැවිලි සහිත ආශ්‍රවයෝ නො වෙත්. මහණෙනි, මේ ආශ්‍රවයෝ විනොදනයෙන් පැහිය යුත්තෝ ය යි කියනු ලැබෙත්.

20. මහණෙනි, භාවනාවෙන් පැහිය යුතු ආශ්‍රවයෝ කවරහ ? යත්: මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ නුවණින් සලකා විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිර්වාණට නැමුරු සතිසම්බොජ්ඣඞ්ගය වඩයි...නුවණින් සලකා ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය වඩයි .. විරියසම්බොජ්ඣඞ්ගය වඩයි...පීතිසම්බොජ්ඣඞ්ගය වඩයි... පස්සද්ධි-සම්බොජ්ඣඞ්ගය වඩයි...සමාධිසම්බොජ්ඣඞ්ගය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිර්වාණට නැමුරු උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, යම් හෙයකින් බොජ්ඣඞ්ග නො වඩන්නාට වෙහෙස හා දැවිලි සහිත ආශ්‍රවයෝ උපදිත් ද, මහණෙනි, මෙසේ ඒ බොජ්ඣඞ්ග වඩන්නා වූ ඔහුට ඒ වෙහෙස හා දැවිලි සහිත ආශ්‍රවයෝ නො වෙත්. මහණෙනි, මේ ආශ්‍රවයෝ භාවනාවෙන් පැහිය යුත්තෝ ය යි කියනු ලැබෙත්.

21. මහණෙනි, යම් කලෙක භික්ෂුහුගේ යම් ආශ්‍රව කෙනෙක් සෝවත් මඟින් පැහිය යුත්තාහු ද, ඒ ආශ්‍රවයෝ සෝවන් මඟින් පැහුණාහු වෙත්. යම් ආශ්‍රව කෙනෙක් සංවරයෙන් පැහිය යුත්තාහු ද, ඔහු සංවරයෙන් පැහුණාහු වෙත්. යම් ආශ්‍රව කෙනෙක් ප්‍රත්‍යවෙක්ෂාවෙන් පැහිය යුත්තාහු ද, ඔහු ප්‍රත්‍යවෙක්ෂාවෙන් පැහුණාහු වෙත්. යම් ආශ්‍රව කෙනෙක් සිත තබා නො ගැනීමෙන් පැහිය යුත්තාහු ද, ඔහු සිත තබා නො ගැනීමෙන් පැහුණාහු වෙත්. යම් ආශ්‍රව කෙනෙක් දුරු කිරීමෙන් පැහිය යුත්තාහු ද, ඒ ආශ්‍රවයෝ දුරු කිරීමෙන් පැහුණාහු වෙත්. යම් ආශ්‍රව කෙනෙත් විනොදනයෙක් පැහිය යුත්තාහු ද, ඒ ආශ්‍රවයෝ විනොදනයෙන් පැහුණාහු වෙත්. යම් ආශ්‍රව කෙනෙක් භාවනාවෙන් පැහිය යුත්තාහු ද, ඒ ආශ්‍රවයෝ භාවනායෙන් පැහුණාහු වෙත්. මහණෙනි, මේ මහණ තෙමේ සියලු ආශ්‍රවයන්ගෙන් සංවෘතව වෙසේ ය යි ද, තෘෂ්ණාව සින්දේ යයි ද, සංයොජනය උපුටා හළේ යයි ද, මානප්‍රහාණයෙන් දුක් කෙළවර කෙළේ යයි ද කියනු ලැබේ.

22. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ.

සබ්බාසව සූත්‍රය දෙවැනි යි.

1. 1. 3

ධම්මදායාදසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. ධම්මදායාද මෙ භික්ඛවෙ භවථ මා ආමිසදායාද. අත්ථි මෙ තුම්හෙසු අනුකම්පා: 'කින්ති මෙ සාවකා ධම්මදායාද භවෙය්‍යුං, නො ආමිසදායාද'ති. තුම්හෙ ච මෙ භික්ඛවෙ ආමිසදායාද භවෙය්‍යාථ නො ධම්මදායාද, තුම්හෙපි තෙන ආදිස්සා භවෙය්‍යාථ: 'ආමිසදායාද සත්ථුසාවකා විහරන්ති, නො ධම්මදායාද.' අහම්පි තෙන ආදිස්සො භවෙය්‍යං:'ආමිසදායාද සත්ථුසාවකා විහරන්ති නො ධම්මදායාද'ති. තුම්හෙ ච මෙ භික්ඛවෙ ධම්මදායාද භවෙය්‍යාථ නො ආමිසදායාද. තුම්හෙපි තෙන න ආදිස්සා භවෙය්‍යාථ: 'ධම්මදායාද සත්ථුසාවකා විහරන්ති නො ආමිසදායාද'ති. අහම්පි තෙන න ආදිස්සො භවෙය්‍යං: 'ධම්මදායාද සත්ථුසාවකා විහරන්ති නො ආමිසදායාද'ති. තස්මා තිහ මෙ භික්ඛවෙ ධම්මදායාද භවථ මා ආමිසදායාද. අත්ථි මෙ තුම්හෙසු අනුකම්පා: 'කින්ති මෙ සාවකා ධම්මදායාද භවෙය්‍යුං, නො ආමිසදායාද'ති.

3. ඉධාහං භික්ඛවෙ භුත්තාවී අස්සං පවාරිතො පරිපුණ්ණො පරියොසිතො සුහිතො යාවදත්ථො. සියා ච මෙ පිණ්ඩපාතො අතිරෙකධම්මො ඡඩ්ඩියධම්මො. අථ ද්වෙ භික්ඛූ ආගච්ඡෙය්‍යුං ජිඝච්ඡාදුබ්බල්‍යපරෙතා. ත්‍යාහං එවං වදෙය්‍යං: ''අහං ඛොම්හි භික්ඛවෙ භුත්තාවී පවාරිතො පරිපුණ්ණො පරියොසිතො සුහිතො යාවදත්ථො. අත්ථි ච මෙ අයං පිණ්ඩපාතො අතිරෙකධම්මො ඡඩ්ඩියධම්මො. සචෙ ආකඞ්ඛථ භුඤ්ජථ, සචෙ තුම්හෙ න භුඤ්ජිස්සථ, ඉදානාහං අප්පහරිතෙ වා ඡඩ්ඩෙස්සාමි අප්පාණකෙ වං උදකෙ ඔපිලාපෙස්සාමී''ති.

4. තත්‍රෙකස්ස භික්ඛුනො එවමස්ස: ''භගවා ඛො භුත්තාවී පවාරිතො පරිපුණ්ණො පරියොසිතො සුහිතො යාවදත්ථො. අත්ථි චායං භගවතො පිණ්ඩපාතො අතිරෙකධම්මො ඡඩ්ඩියධම්මො, සචෙ මයං න භුඤ්ජිස්සාම ඉදානි භගවා අප්පහරිතෙ වා ඡඩ්ඩෙස්සති අප්පාණකෙ වා උදකෙ ඔපිලාපෙස්සති. වුත්තං ඛො පනෙතං භගවතා ''ධම්මදායාද මෙ භික්ඛවෙ භවථ මා ආමිසදායාද''ති. ආමිසඤ්ඤතරං ඛො පනෙතං යදිදං පිණ්ඩපාතො. යන්නූනාහං ඉමං පිණ්ඩපාතං අභුඤ්ජිත්වා ඉමිනාව ජිඝච්ඡාදුබ්බල්‍යෙන එවං ඉමං රත්තින්දිවං වීතිනාමෙය්‍ය''න්ති. සො තං පිණ්ඩපාතං අභුඤ්ජිත්වා තෙනෙව ජිඝච්ඡාදුබ්බල්‍යෙන එවං තං රත්තින්දිවං වීතිනාමෙය්‍ය.

1 1. 3

ධම්මදායාද සූත්‍රය

1. **මා** විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර සමීපයෙහි වූ **අනේපිඬු** සිටුහුගේ **ජේතවනාරාමයෙහි** වැඩ වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට මහණෙනි යි ආමන්ත්‍රණය කළ සේක. ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට වහන්සැයි පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, මාගේ ධර්මයට දායාද (ධර්ම නැමති දෑවැද්ද ගන්නහු) වවු. ආමිසයට (සිව්පසයට) දායාද නො වවු. 'මාගේ ශ්‍රාවකයෝ කෙසේ නම් ධර්මයට දායාද වන්නාහු ද, ආමිසයට දායාද නො වන්නාහු දැ'යි තොප කෙරෙහි මාගේ අනුකම්පාව ඇත. මහණෙනි, තෙපි ආමිසදායාද ව ධර්මදායාද නො වන්නහු නම්, එයින් 'ශාස්තෘන්වහන්සේගේ ශ්‍රාවකයෝ ආමිසදායාද ව වසත්. ධර්මදායාද ව නො වසත් ය'යි තෙපි ද ගැරහිය යුත්තෝ වන්නහු ය. මම ද එයින් 'ශාස්තෘශ්‍රාවකයෝ ආමිසදායාද ව වසත්, ධර්මදායාද ව නො වසත් ය'යි ගැරහිය යුත්තෙම් වෙමි. මහණෙනි, තෙපිත් මාගේ ධර්මයට දායාද ව ආමිසයට දායාද නො වන්නහු නම්, එයින් තෙපිත් 'ශාස්තෘශ්‍රාවකයෝ ධර්මදායාද ව වසත්, ආමිසදායාද ව නො වසත් ය'යි ගැරහිය යුත්තෝ නො වන්නහුය. මමත් එයින් 'ශාස්තෘශ්‍රාවකයෝ ධර්මදායාද ව වසත්, ආමිසදායාද ව නො වසත් ය'යි ගැරහිය යුත්තෙම් නො වෙමි. මහණෙනි, එහෙයින් මාගේ ධර්මයට දායාද වවු. ආමිසදායාද නො වවු. 'මාගේ ශ්‍රාවකයෝ කෙසේ නම් ධර්මදායාද වන්නාහු ද, ආමිස දායාද නො වන්නාහු දැ'යි තොප කෙරෙහි මාගේ අනුකම්පාව ඇත.

3. මහණෙනි, මම වැළඳුයෙම් වුවමනා පමණ වළඳා අවසන් කෙළෙම්, භෝජනයෙන් සම්පූර්ණ වූයෙම් වළඳා අවසන් කෙළෙම්, බඩගිනි නැති වීමෙන් තෘප්ත වූයෙම්, කැමැති තාක් අහර ගත්තෙම් වෙමි. ඉතිරි ව ඉවත දැමිය යුතු පිණ්ඩපාතයෙක් ද වේ. එකල බඩසයින් හා දුබලබැවින් ද පෙළුණු භික්ෂූහු දෙනමක් එන්නාහුය. මම ඔවුන්ට "මම වැළඳුයෙමි. පැවරුයෙමි පිඬු පිළිකෙව් කෙළෙමි. සම්පූර්ණ වූයෙමි. බොජුන් කිස අවසන් කෙළෙමි. තෘප්ත වූයෙමි. කැමැති තාක් වැළඳුයෙමි. ඉතිරි වූ බැහැර ලිය යුතු මාගේ මේ පිණ්ඩපාතයෙක් ඇත. ඉදින් කැමැත්තහු නම් වළඳවු. ඉදින් තෙපි නො වළඳන්නහු නම්, දැන් මම නිල්තණ නැති බිමක හෝ බහන්නෙමි. පණුවන් නැති ජලයක හෝ පා කොට හරින්නෙමි"යි කියන්නෙමි.

4. ඔවුන් අතුරෙන් එක් භික්ෂු නමකට "භාග්‍යවතුන් වහන්සේ වැළඳු සේක. පැවරූ සේක. සම්පූර්ණ වූ සේක අවසන් කළ සේක. තෘප්ත වූ සේක. කැමැති තාක් වැළඳු සේක. භාග්‍යවතුන් වහන්සේගේ ඉතිරි වූ බැහැර දැමිය යුතු වූ මේ පිණ්ඩපාතයෙක් ද ඇත. ඉදින් අපි නො වළඳන්නමෝ නම් දැන් භාග්‍යවතුන් වහන්සේ නිල් තණ නැති බිමක හෝ බහාලන සේක. පණුවන් නැති ජලයෙහි හෝ පාකර හරින සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, මාගේ ධර්මයට දායාද වවු. ආමිසදායාද නො වවු ය'යි මෙය වදාරණ ලදී. යම් මේ පිණ්ඩපාතයෙක් වෙයි නම්, එය ද ආමිස අතරින් එකකි. මම මේ පිණ්ඩාහාරය නො වළඳා මේ බඩසාදුකින් ම යුක්ත ව මේ රෑදවල් දෙක ඉක්මවන්නෙම් නම් මැනවැ"යි මෙබඳු අදහසක් වෙයි.

5. අථ දුතියස්ස භික්ඛුනො එවමස්ස. "භගවා ඛො භුත්තාවී පවාරිතො පරිපුණ්ණො පරියොසිතො සුහිතො යාවදත්ථො. අත්ථි චායං භගවතො පිණ්ඩපාතො අතිරෙකධම්මො ඡඩ්ඩියධම්මො. සචෙ මයං න භුඤ්ජිස්සාම ඉදානි භගවා අප්පහරිතෙ වා ඡඩ්ඩෙස්සති අප්පාණකෙ වා උදකෙ ඔපිලාපෙස්සති. යන්නූනාහං ඉමං පිණ්ඩපාතං භුඤ්ජිත්වා ජිඝච්ඡා-දුබ්බල්‍යං පටිවිනෙත්වා එවං ඉමං රත්තින්දිවං වීතිනාමෙය්‍ය"න්ති. සො තං පිණ්ඩපාතං භුඤ්ජිත්වා ජිඝච්ඡාදුබ්බල්‍යං පටිවිනෙත්වා එවං රත්තින්දිවං වීතිනාමෙය්‍ය. කිඤ්චාපි සො භික්ඛවෙ භික්ඛු තං පිණ්ඩපාතං භුඤ්ජිත්වා ජිඝච්ඡාදුබ්බල්‍යං පටිවිනෙත්වා එවං තං රත්තින්දිවං වීතිනාමෙය්‍ය, අථ ඛො අසුයෙව මෙ පුරිමො භික්ඛු පුජ්ජතරො ච පාසංසතරො ච. තං කිස්සහෙතු: තං හි තස්ස භික්ඛවෙ භික්ඛුනො දීඝරත්තං අප්පිච්ඡතාය සන්තුට්ඨියා සල්ලෙඛාය සුභරතාය විරියාරම්භාය සංවත්තිස්සති. තස්මාතිහ භික්ඛවෙ ධම්මදායාදා භවථ මා ආමිසදායාදා. අත්ථි මෙ තුම්හෙසු අනුකම්පා: 'කින්ති මෙ සාවකා ධම්මදායාදා භවෙය්‍යුං, නො ආමිසදායාදා'ති.

6. ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො උට්ඨායාසනා විහාරං පාවිසි.

7. තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො අචිරපක්කන්තස්ස භගවතො භික්ඛූ ආමන්තෙසි: 'ආවුසො භික්ඛවො'ති. 'ආවුසො'ති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච.

8. කිත්තාවතා නු ඛො ආවුසො සත්ථු පවිවිත්තස්ස විහරතො සාවකා විවෙකං නානුසික්ඛන්ති, කිත්තාවතා ච පන සත්ථු පවිවිත්තස්ස විහරතො සාවකා විවෙකමනුසික්ඛන්තීති. දූරතො පි ඛො මයං ආවුසො ආගච්ඡෙය්‍යාම ආයස්මතො සරිපුත්තස්ස සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථමඤ්ඤාතුං. සාධු වතායස්මන්තංයෙව සාරිපුත්තං පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො. ආයස්මතො සාරිපුත්තස්ස සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති. "තෙනහාවුසො සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමී ති." එවමාවුසො ති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

5. හෙ තෙමෙ ඒ පිණ්ඩපාතය නො වළඳා ඒ බඩසාදුකින් ම මෙසේ ඒ රෑදවල ගෙවත්තේ ය. යළි දෙවැනි භික්ෂූන් වහන්සේට "භාග්‍යවතුන් වහන්සේ වැළඳූ සේක. පවාරණය කළ සේක. සම්පූර්ණ වූ සේක. අවසන් කළ සේක. තෘප්ත වූ සේක. කැමැති තාක් වැළඳූ සේක. භාග්‍යවතුන් වහන්සේගේ ඉතිරි වූ ඉවත දැමිය යුතු වූ මේ පිණ්ඩපාතයෙක් ද ඇත. ඉදින් අපි නො වළඳන්නමු නම්, දැන් භාග්‍යවතුන් වහන්සේ තිල්තණ නැති බිමෙක හෝ බහාලන සේක. පණුවන් නැති දියෙහි හෝ පා කොට හරින සේක. මම මේ පිණ්ඩපාතය වළඳා බඩසා නැති ව මේ රෑදවල ගෙවන්නෙම් නම් මැනවැ" යි මෙබඳු අදහසෙක් වෙයි. හෙ තෙමේ ඒ පිණ්ඩපාතය වළඳා බඩසා දුබල බව නැති කොට මෙසේ ඒ රෑදවල ගෙවත්තේ ය. මහණෙනි, ඒ මහණ කිසිසේත් ඒ පිණ්ඩාහාරය වළඳා බඩසා දුබල බව නැති කොට මෙසේ ඒ රෑදවල ගෙවත්තේ ය. එසේ ඇති කල මා විසින් තෙල පළමු මහණ ම වඩා පිදිය යුතු ද පැසසිය යුතු ද වෙයි. එය කවර හෙයින යත්: මහණෙනි, එය ඒ මහණහුට බොහෝ කලක් අපිස් බව පිණිස ද සතොස් බව පිණිස ද මනා සේ කෙලෙසුන් සිඳහැරීම පිණිස ද සුපොෂභාවය පිණිස ද වැර ඇරඹුම් පිණිස ද වත්තේ ය. මහණෙනි, ඒ නිසා මාගේ ධර්මයට දායාද වවු. ආමිසයට දායාද නො වවු. 'මාගේ ශ්‍රාවකයෝ කෙසේ නම් ධර්මයට දායාද වන්නාහු ද, ආමිසයට දායාද නො වන්නාහු ද'යි තොප කෙරෙහි මාගේ අනුකම්පාව ඇත.

6. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගතයන් වහන්සේ මෙය වදාරා හුනස්නෙන් නැඟිට විහාරයට වැඩි සේක.

7. එකල්හි ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ වේලාවකින් 'ඇවැත්නි'යි භික්ෂූන් ඇමතූහ. ඒ භික්ෂූහු 'ඇවැත්නි'යි ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේට පිළිවදන් දුන්හ. ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ මෙය වදාළහ:

8. ඇවැත්නි, ශාස්තෲන් වහන්සේ විවේකයෙන් යුක්ත ව වසද්දී ශ්‍රාවකයෝ කොපමණකින් විවේකයෙහි නො හික්මෙත් ද ? ශාස්තෲන් වහන්සේ විවේකයෙන් යුක්ත ව වසද්දී ශ්‍රාවකයෝ කොපමණකින් විවේකයෙහි හික්මෙත් ද ? ඇවැත, අපි ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ වෙතින් මේ භාෂිතයේ අදහස දැනගැනීමට (යොදුන් ගණන්) දුර සිට වුවත් එමු. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට ම මේ භාෂිතයේ අදහස වැටහේවා. ඒ මැනවි. භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේගෙන් ම අසා දරන්නාහුය. "එසේ නම් ඇවැත්නි, අසවු. මැනවින් මෙනෙහි කරවු. දෙසන්නෙමි." ඒ භික්ෂූහු ඇවැත්නි, එසේ ය යි ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේට පිළිවදන් දුන්හ. ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ මෙය වදාළහ:

Free Distribution www.aathaapi.org

9. කිත්තාවතා නු ඛො ආවුසො සත්ථු පවිවිත්තස්ස විහරතො සාවකා විවෙකං නානුසික්ඛන්ති? ඉධාවුසො සත්ථු පවිවිත්තස්ස විහරතො සාවකා විවෙකං නානුසික්ඛන්ති. යෙසඤ්ච ධම්මානං සත්ථා පහානමාහ, තෙ ච ධම්මෙ නප්පජහන්ති. බාහුලිකා ච හොන්ති සාථලිකා ඔක්කමනෙ පුබ්බඞ්ගමා පවිවෙකෙ නික්ඛිත්තධුරා. තත්‍රාවුසො ථෙරා භික්ඛූ තීහි ඨානෙහි ගාරය්හා භවන්ති: 'සත්ථු පවිවිත්තස්ස විහරතො සාවකා විවෙකං නානුසික්ඛන්තී'ති ඉමිනා පඨමෙන ඨානෙන ථෙරා භික්ඛූ ගාරය්හා භවන්ති. 'යෙසඤ්ච ධම්මානං සත්ථා පහානමාහ, තෙ ච ධම්මෙ නප්පජහන්තී'ති ඉමිනා දුතියෙන ඨානෙන ථෙරා භික්ඛූ ගාරය්හා භවන්ති. 'බාහුලිකා ච සාථලිකා ඔක්කමනෙ පුබ්බඞ්ගමා පවිවෙකෙ නික්ඛිත්තධුරා'ති ඉමිනා තතියෙන ඨානෙන ථෙරා භික්ඛූ ගාරය්හා භවන්ති. ථෙරා භාවුසො භික්ඛූ ඉමෙහි තීහි ඨානෙහි ගාරය්හා භවන්ති.

10. තත්‍රාවුසො මජ්ඣිමා භික්ඛූ -පෙ- නවා භික්ඛූ තීහි ඨානෙහි ගාරය්හා භවන්ති: 'සත්ථු පවිවිත්තස්ස විහරතො සාවකා විවෙකං නානුසික්ඛන්තී'ති ඉමිනා පඨමෙන ඨානෙන නවා භික්ඛූ ගාරය්හා භවන්ති. 'යෙසඤ්ච ධම්මානං සත්ථා පහානමාහ, තෙ ච ධම්මෙ නප්පජහන්තී'ති ඉමිනා දුතියෙන ඨානෙන නවා භික්ඛූ ගාරය්හා භවන්ති. 'බාහුලිකා ච සාථලිකා ච ඔක්කමනෙ පුබ්බඞ්ගමා පවිවෙකෙ නික්ඛිත්තධුරා'ති ඉමිනා තතියෙන ඨානෙන නවා භික්ඛූ ගාරය්හා භවන්ති. නවා භාවුසො භික්ඛූ ඉමෙහි තීහි ඨානෙහි ගාරය්හා භවන්ති.

එත්තාවතාවුසො සත්ථු පවිවිත්තස්ස විහරතො සාවකා විවෙකං නානුසික්ඛන්ති.

11. කිත්තාවතා ච පනාවුසො සත්ථු පවිවිත්තස්ස විහරතො සාවකා විවෙකමනුසික්ඛන්ති? ඉධාවුසො සත්ථු පවිවිත්තස්ස විහරතො සාවකා විවෙකමනුසික්ඛන්ති. යෙසඤ්ච ධම්මානං සත්ථා පහානමාහ, තෙ ච ධම්මෙ පජහන්ති. න ච බාහුලිකා හොන්ති න සාථලිකා ඔක්කමනෙ නික්ඛිත්තධුරා පවිවෙකෙ පුබ්බඞ්ගමා. තත්‍රාවුසො ථෙරා භික්ඛූ තීහි ඨානෙහි පාසංසා භවන්ති: 'සත්ථු පවිවිත්තස්ස විහරතො සාවකා විවෙකමනුසික්ඛන්තී'ති ඉමිනා පඨමෙන ඨානෙන ථෙරා භික්ඛූ පාසංසා භවන්ති. 'යෙසඤ්ච ධම්මානං සත්ථා පහානමාහ, තෙ ච ධම්මෙ පජහන්තී'ති. ඉමිනා දුතියෙන ඨානෙන ථෙරා භික්ඛූ පාසංසා භවන්ති. 'න ච බාහුලිකා න සාථලිකා ඔක්කමනෙ නික්ඛිත්තධුරා පවිවෙකෙ පුබ්බඞ්ගමා'ති ඉමිනා තතියෙන ඨානෙන ථෙරා භික්ඛූ පාසංසා භවන්ති. ථෙරා භාවුසො භික්ඛූ ඉමෙහි තීහි ඨානෙහි පාසංසා භවන්ති.

9. ඇවැත්නි, ශාස්තෲන් වහන්සේ විවේකයෙන් යුක්ත ව වසද්දී ශ්‍රාවකයෝ කෙතෙකින් විවේකයෙහි නො හික්මෙත් ද? ඇවැත්නි, මේ ශාසනයෙහි ශාස්තෲන් වහන්සේ උතුම් විවේකයෙන් යුක්ත ව වසද්දී ශ්‍රාවකයෝ විවේකයෙහි නො හික්මෙත්. ශාස්තෲන් වහන්සේ යම් ධර්ම-කෙනකුන්ගේ ප්‍රහාණය වදාළසේක් නම්, ඒ ධර්ම අත් නො හරිත්. චීවරාදිය බහුල කොට ඇත්තාහු ශාසනය ලිහිල් කොට ගත්තාහු, (අවක්‍රමණසඞ්ඛ්‍යාත) පඤ්චනීවරණ පූරණයෙහි පෙරදැරි වූවාහු ද, උතුම් විවේකය (නිවන) පිණිස පිළිවෙත් පිරීමෙහි බහා තැබූ වීර්‍ය්‍ය ඇත්තාහු වෙත්. එසේ කල්හි ඇවැත්නි, ශාසනයෙහි ස්ථවිර භික්ෂූහු කරුණු තුණකින් ගැරහිය යුත්තෝ වෙත්: 'ශාස්තෲන් වහන්සේ උතුම් විවේකයෙන් වසද්දී ශ්‍රාවකයෝ විවේකයෙහි නො හික්මෙති' යන මේ පළමුවැනි කාරණයෙන් ස්ථවිරභික්ෂූහු ගැරහිය යුත්තෝ වෙත්. 'ශාස්තෲන් වහන්සේ යම් ක්ලේශ-ධර්ම කෙනකුන්ගේ ප්‍රහාණය වදාළසේක් නම්, ඒ ක්ලේශධර්මයන් නො හරිති' යන මේ දෙවැනි කාරණයෙන් ස්ථවිරභික්ෂූහු ගැරහිය යුත්තෝ වෙත්. 'බාහුලික ව සාථලික ව නීවරණපූරණයෙහි පූර්වඞ්ගම ව උතුම් විවේක-යෙහි බහා තැබූ වීර්‍ය්‍ය ඇති ව වසති' යන මේ තුන්වැනි කාරණයෙන් ස්ථවිරභික්ෂූහු ගැරහිය යුත්තෝ වෙත්. ඇවැත්නි, ස්ථවිරභික්ෂූහු මේ තුන් කාරණයෙන් ගැරහිය යුත්තෝ වෙත්.

10. ඇවැත්නි, එහි මධ්‍යම භික්ෂූහු -පෙ- නවක භික්ෂූහු කරුණු තුණකින් ගැරහිය යුත්තෝ වෙත්: 'ශාස්තෲන්වහන්සේ උතුම් විවේකයෙන් යුක්ත ව වසද්දී සව්වෝ උතුම් විවේකයෙහි නො හික්මෙත්' යන මේ පළමුවැනි කාරණයෙන් නවකභික්ෂූහු ගැරහිය යුත්තෝ වෙත්. 'ශාස්තෲන් වහන්සේ යම් ධර්ම කෙනකුන්ගේ ප්‍රහාණය වදාළසේක් නම්, ඒ ධර්මයන් නො හරිත්' යන මේ දෙවැනි කාරණයෙන් නවක භික්ෂූහු ගැරහිය යුත්තෝ වෙත්. 'බාහුලික ව සාථලික ව නීවරණ පිරීමෙහි පූර්වඞ්ගම ව උතුම් විවේක යෙහි නිරුත්සාහ ව වසත්' යන මේ තුන්වැනි කාරණයෙන් නවක භික්ෂූහු ගැරහිය යුත්තෝ වෙත්. ඇවැත්නි, නවකභික්ෂූහු මේ තුන් කරුණින් ගැරහිය යුත්තෝ වෙත්.

ඇවැත්නි, මෙතෙකින් ශාස්තෲන් වහන්සේ උතුම් විවේකයෙන් යුක්ත ව වසද්දී සව්වෝ ඒ උතුම් විවේකයෙහි නො හික්මෙත්.

11. ඇවැත්නි, ශාස්තෲන් වහන්සේ උතුම් විවේකයෙන් යුක්ත ව වසද්දී ශ්‍රාවකයෝ කෙතෙකින් විවේකයෙහි හික්මෙත් ද? ඇවැත්නි, මේ ශාසනයෙහි ශාස්තෲන් වහන්සේ විවේකී ව වාසය කරද්දී ශ්‍රාවකයෝ විවේකයෙහි හික්මෙත්. ශාස්තෲන් වහන්සේ යම් ධර්ම කෙනකුන්ගේ ප්‍රහාණිය වදාළසේක් ද, ඒ ධර්මයන් අත්හරිත්. චීවරාදිය බහුල කොට නැත්තාහු ශාසනය ලිහිල් කොට නො ගත්තාහු, නීවරණපූරණයෙහි හළ වීර්‍ය්‍ය ඇත්තාහු උතුම් විවේකය පෙරදැරි කොට ඇත්තෝ වෙත්. ඇවැත්නි, එහි ස්ථවිරභික්ෂූහු කරුණු තුණකින් පැසසිය යුත්තෝ වෙත්: 'ශාස්තෲන් වහන්සේ උතුම් විවේකයෙන් යුක්ත ව වසද්දී ශ්‍රාවකයෝ විවේකයෙහි හික්මෙත්' යන මේ පළමුවන කාරණයෙන් ස්ථවිරභික්ෂූහු පැසසිය යුත්තෝ වෙත්. 'ශාස්තෲන් වහන්සේ යම් ක්ලේශධර්ම කෙනකුන්ගේ ප්‍රහාණිය වදාළසේක් ද, ඒ ක්ලේශධර්මයන් අත්හරිත් ය' යි මේ දෙවෙනි කාරණයෙන් ස්ථවිර භික්ෂූහු පැසසිය යුත්තෝ වෙත්. 'චීවරාදිය බහුල කොට නො ගත්තෝ ය, ශාසනය ලිහිල් කොට නො සලකන්නෝ ය, නීවරණ පූරණයෙහි බහා තැබූ වීර්‍ය්‍ය ඇත්තාහ, උතුම් විවේකය පෙරදැරි කොට ඇත්තාහු ය.' යන මේ තුන්වැනි කාරණයෙන් ස්ථවිරභික්ෂූහු පැසසිය යුත්තෝ වෙත්. ඇවැත්නි, ස්ථවිරභික්ෂූහු මේ තුන් කරුණින් පැසසිය යුත්තෝ වෙත්.

12. තත්‍රාවුසො මජ්ඣිමා භික්ඛූ -පෙ- නවා භික්ඛූ තීහි ඨානෙහි පාසංසා භවන්ති: 'සත්ථු පවිවිත්තස්ස විහරතො සාවකා විවෙකමනුසික්ඛන්තී'ති ඉමිනා පඨමෙන ඨානෙන නවා භික්ඛූ පාසංසා භවන්ති. 'යෙසඤ්ච ධම්මානං සත්ථා පහානමාහ, තෙ ච ධම්මෙ පජහන්තී'ති ඉමිනා දුතියෙන ඨානෙන නවා භික්ඛූ පාසංසා භවන්ති. 'න ච බාහුලිකා න සාථලිකා ඔක්කමනෙ නික්ඛිත්තධුරා පවිවෙකෙ පුබ්බඞ්ගමා'ති ඉමිනා තතියෙන ඨානෙන නවා භික්ඛූ පාසංසා භවන්ති. නවා භාවුසො භික්ඛූ ඉමෙහි තීහි ඨානෙහි පාසංසා භවන්ති.

එත්තාවතා ඛො ආවුසො සත්ථු පවිවිත්තස්ස විහරතො සාවකා විවෙකමනුසික්ඛන්ති.

13. තත්‍රාවුසො ලොභො ච පාපකො, දොසො ච පාපකො. ලොභස්ස ච පහානාය දොසස්ස ච පහානාය අත්ථි මජ්ඣිමා පටිපදා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. කතමා ච සා ආවුසො මජ්ඣිමා පටිපදා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති? අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. අයං ඛො සා ආවුසො මජ්ඣිමා පටිපදා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

14. තත්‍රාවුසො කොධො ච පාපකො. උපනාහො ච පාපකො. -පෙ- මක්ඛො ච පාපකො. පලාසො ච පාපකො. -පෙ- ඉස්සා ච පාපිකා. මච්ඡරියඤ්ච පාපකං. -පෙ- මායා ච පාපිකා. සාඨෙය්‍යඤ්ච පාපකං. -පෙ- ථම්භො ච පාපකො. සාරම්භො ච පාපකො. -පෙ- මානො ච පාපකො. අතිමානො ච පාපකො. -පෙ- මදො ච පාපකො, පමාදො ච පාපකො. මදස්ස ච පහානාය පමාදස්ස ච පහානාය අත්ථි මජ්ඣිමා පටිපදා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. කතමා ච ආවුසො මජ්ඣිමා පටිපදා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. අයං ඛො සා ආවුසො මජ්ඣිමා පටිපදා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තතීති.

15. ඉදමවොච ආයස්මා සාරිපුත්තො අත්තමනා තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දුන්ති.

ධම්මදායාදසුත්තං තතියං.

12. ඇවැත්නි, එහි මධ්‍යමභික්ෂූහු -පෙ- නවකභික්ෂූහු තුන් කරුණකින් පැසසිය යුත්තෝ වෙත්: 'ශාස්තෘන් වහන්සේ උතුම් විවෙකයෙන් යුක්ත ව වාසය කරද්දී, ශ්‍රාවකයෝ විවෙකයෙහි හික්මෙත් ය'යි මේ පළමුවැනි කාරණයෙන් නවක භික්ෂූහු පැසසිය යුත්තෝ වෙත්. 'ශාස්තෘන් වහන්සේ යම් කෙලශධර්ම කෙනකුන්ගේ ප්‍රහාණය වදාළසේක් ද, ඒ කෙලශධර්මයන් අත්හරිත් ය' යන මේ දෙවැනි කාරණයෙන් නවකභික්ෂූහු පැසසිය යුත්තෝ වෙත්. 'චීවරාදිය බහුල කොට නැත්තෝ ය. ශාසනය ලිහිල් කොට නො ගත්තෝ ය. නීවරණයන් ප්‍රහාණය කිරීමෙහි උත්සාහවත් වූවෝ ය. උතුම් විවෙකය පෙරදැරි කොට ඇත්තෝ ය' යන මේ තුන් වැනි කාරණයෙන් නවක භික්ෂූහු පැසසිය යුත්තෝ වෙත්. ඇවැත්නි, නවක භික්ෂූහු වනාහි මේ තුන් කරුණින් පැසසිය යුත්තෝ වෙත්.

ඇවැත්නි, මෙතෙකින් ශාස්තෘන් වහන්සේ ප්‍රකෘති විවෙකයෙන් යුක්ත ව වසද්දී ශ්‍රාවකයෝ විවෙකයෙහි හික්මෙත්.

13. ඇවැත්නි, එහි ලොභය ද ලාමක ය, ද්වෙෂය ද ලාමක ය. ලොභය ප්‍රහාණය කිරීම පිණිසත් ද්වෙෂය ප්‍රහාණය කිරීම පිණිසත් නුවණැස ඇති කරන, ඤාණය ඇති කරන මධ්‍යම ප්‍රතිපදාව රාගාදීන් සංසිඳීම පිණිස, සිවුසස් දැනීම පිණිස, මනා අවබොධය පිණිස, නිවණ පිණිස පවතී යි. ඇවැත්නි රාගාදීන් සංසිඳීම පිණිස, සිවුසස් දැනීම පිණිස, මනා අවබොධය පිණිස, නිවණ පිණිස නුවණැස ඇති කරන, ඤාණය ඇති කරන ඒ මධ්‍යමප්‍රතිපදාව කවරේද යත්: මේ අරිඅටඟිමග ම ය. එනම්: සම්මාදිට්ඨි, සම්මාසංකප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති සම්මාසමාධි යන අට ය. ඇවැත්නි, මේ මධ්‍යමප්‍රතිපදාව වනාහි නුවණැස ඇති කර යි. සත්‍යඥානය ඇති කරයි. රාගාදීන් සංසිඳීම පිණිස පවතියි. සිවුසස් දැනීම පිණිස මනා අවබොධය පිණිස නිවණ පිණිස පවතියි.

14. ඇවැත්නි, එහි ක්‍රොධය ද ලාමක ය, බද්ධවෛරය ද ලාමක ය... ගුණමකු බව ද ලාමක ය ... පලාසය ද ලාමක ය... ඊර්ෂ්‍යාව ද ලාමක ය, මසුරු බව ද ලාමක ය... මායාව ද ලාමක ය, කපටබව ද ලාමක ය... ථම්භය (වැඩිහිටියන්ට නොනැමෙන බව ද) ලාමක ය, සංරම්භය (අනුන් කළ දෙයට වැඩියක් කරන බව) ද ලාමක ය... මානය ද ලාමක ය, අධිකමානය ද ලාමකය ... මදය (මත් බව) ද ලාමක ය, ප්‍රමාදය ද ලාමකය. මදය ප්‍රහාණය කිරීම පිණිස ද, ප්‍රමාදය ප්‍රහාණය කිරීම පිණිස ද, නුවණැස ඇති කරන, ඤාණය ඇති කරන මධ්‍යමප්‍රතිපදාව රාගාදීන් සංසිඳීම පිණිස, සිවුසස් දැනීම පිණිස, මනා අවබොධය පිණිස, නිවණ පිණිස පවතියි. ඇවැත්නි, රාගාදීන් සංසිඳීම පිණිස සිවුසස් දැනීම පිණිස, මනා අවබොධය පිණිස, නිවණ පිණිස පවතින නුවණැස ඇති කරන සත්‍යඥානය ඇති කරන ඒ මධ්‍යමප්‍රතිපදාව කවරේ ද? ඇවැත්නි, මේ අරිඅටඟිමග ම ය. එනම්: සම්මාදිට්ඨි, සම්මාසංකප්ප. සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි යන අට යි. ඇවැත්නි, නුවණැස ඇති කරන සත්‍යඥානය ඇති කරන මෙ මධ්‍යමප්‍රතිපදාව රාගාදිය නැති කිරීම පිණිස සිවුසස් දැනීම පිණිස මනා අවබොධය පිණිස නිවණ පිණිස පවත්නකි.

15. ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ මෙය වදාළහ. සතුටු වූ ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේගේ භාෂිතය මැනැවැයි පිළිගත්තාහු ය.

ධම්දායාද සූත්‍රය තෙවැනියි.

1. 1. 4

භයභෙරවසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ජාණුස්සොණී බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

2. යෙ'මෙ භො ගොතම කුලපුත්තා භවන්තං ගොතමං උද්දිස්ස සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතා, භවං තෙසං ගොතමො පුබ්බඞ්ගමො. භවං තෙසං ගොතමො බහුකාරො භවං තෙසං ගොතමො සමාදපෙතා. භොතො ච ගොතමස්ස සා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජතීති.

3. "එවමෙතං බ්‍රාහ්මණ, එවමෙතං බ්‍රාහ්මණ. යෙ තෙ බ්‍රාහ්මණ, කුලපුත්තා මමං උද්දිස්ස සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතා, අහං තෙසං පුබ්බඞ්ගමො. අහං තෙසං බහුකාරො. අහං තෙසං සමාදපෙතා. මමඤ්ච පන සා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජතීති.

4. දුරභිසම්භවානි හි භො ගොතම, අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි. දුක්කරං පවිවෙකං. දුරභිරමං එකත්තෙ. හරන්ති මඤ්ඤෙ මනො වනානි සමාධිං අලභමානස්ස භික්ඛුනොති.

5. එවමෙතං බ්‍රාහ්මණ, එව මෙතං බ්‍රාහ්මණ. දුරභිසම්භවානි හි බ්‍රාහ්මණ, අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි. දුක්කරං පවිවෙකං. දුරභිරමං එකත්තෙ හරන්ති මඤ්ඤෙ මනො වනානි සමාධිං අලභමානස්ස භික්ඛුනොති. මය්හම්පි ඛො බ්‍රාහ්මණ, පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි: "දුරභිසම්භවානි හි ඛො අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි. දුක්කරං පවිවෙකං. දුරභිරමං එකත්තෙ. හරන්ති මඤ්ඤෙ මනො වනානි සමාධිං අලභමානස්ස භික්ඛුනො"ති.

1. 1. 4

භයභෙරව සූත්‍රය

1. **මා** විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත් නුවර** සමීපයෙහි වූ **ජේතවන** නම් **අනේපිඬු** සිටුහුගේ ආරාමයෙහි වැඩ වාසය කරන සේක. එකල **ජාණුස්සෝණී** බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ හා සතුටු වී ය. සතුටු විය යුතු සිහි කටයුතු.* කථා කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන්නා වූ ම ජාණුස්සෝණී බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය.

2. භවත් ගෞතමයන් වහන්ස, යම් මේ කුලපුත්‍රයෝ භවත් ගෞතමයන් උදෙසා ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම අනගාර්‍යසංඛ්‍යාත ශාසනයෙහි පැවිදි වූවාහු ද, ඔවුන්ට භවත් ගෞතමයන් වහන්සේ පුරෝගාමී වන සේක. ඔවුන්ට භවත් ගෞතමයන් වහන්සේ බොහෝ උපකාරී වන සේක. භවත් ගෞතමයන් වහන්සේ ඔවුන් සමාදන් කරවන සේක. ඒ ජනතාව භවත් ගෞතමයන්ගේ දර්ශනානුගතියට (දෘෂ්ටි, ක්ෂාන්ති, රුචීන් අනුගමනයට) පැමිණේ.

3. බමුණ, එය එසේ ය. බමුණ, එය එසේ ය. බමුණ, යම් ඒ කුලපුත්‍රයෝ මා උදෙසා ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම අනගාර්‍යසංඛ්‍යාත ශාසනයෙහි පැවිදි වූවාහු ද, මම ඔවුන්ට පුරෝගාමී වෙමි. මම ඔවුන්ට බොහෝ උපකාර ඇත්තෙම් වෙමි. මම ඔවුන් සමාදන් කරවන්නෙමි. ඒ ජනතාව මාගේ දිට්ඨානුගතියට පැමිණේ.

4. ගෞතමයන් වහන්ස, වනයෙහි දුර පිහිටි වන ලැහැබ් සෙනසුන්, වනයෙහි ඉතා දුර පිහිටි සෙනසුන් ලැබීම (ඇතුල් ව විසීම) දුෂ්කර ය. ප්‍රකර්ෂවිවේකය දුෂ්කර ය. එකඟබැව්හි ඇලීම දුෂ්කර ය. වනයන් සමාධිය නො ලබන්නා වූ භික්ෂුහුගේ සිත් පැහැර ගනිති යි හඟිමි.

5. බමුණ, එය එසේ. ම ය. බමුණ, එය එසේ ම ය. බමුණ, වනයෙහි දුර පිහිටි සෙනසුන්, වනයෙහි ඉතා දුර පිහිටි සෙනසුන් ලැබීම දුෂ්කර ය. ප්‍රකර්ෂවිවේකය දුෂ්කර ය. එකඟ බැව්හි ඇලීම දුෂ්කර ය. වනයන් සමාධිය නො ලබන්නා වූ භික්ෂුහුගේ සිත පැහැර ගනිතියි හඟිමි. බමුණ, බුදුවන්නට පෙර චතුස්සත්‍යය අවබෝධ නො කළා වූ බෝධිසත්ත්ව වූ ම මට ද මේ අදහස වි ය. වනයෙහි දුර පිහිටි සෙනසුන්, වනයෙහි ඉතා දුර පිහිටි සෙනසුන් ලැබීම දුෂ්කර ය. ප්‍රකර්ෂවිවේකය ලැබීම දුෂ්කර ය. එකඟ බැව්හි ඇලීම දුෂ්කර ය. වනයන් සමාධිය නො ලබන්නා වූ භික්ෂුහුගේ සිත පැහැර ගනිති යි හඟිමි.

---

* බෞද්ධ සංස්කෘතග්‍රන්ථයන්හි "සංරඤ්ජනීයාම්" යි දක්වේ. "සිත් ඇලවිය යුතු" යනු එහි අර්ථයි.

6. තස්ස මය්හං බ්‍රාහ්මණ එතදහොසි: යෙ ඛො කෙචි සමණා වා බ්‍රාහ්මණා වා අපරිසුද්ධකායකම්මන්තා අරඤ්ඤවනපත්ථානි[1] පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, අපරිසුද්ධ[2]කායකම්මන්තසන්දොසහෙතු හවෙ තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අකුසලං භයභෙරවං අව්හායන්ති[3]; න ඛො පනාහං අපරිසුද්ධ[2]කායකම්මන්තො අරඤ්ඤවනපත්ථානි[1] පන්තානි සෙනාසනානි පටිසෙවාමි, පරිසුද්ධකායකම්මන්තොහමස්මි. යෙ හි වො අරියා පරිසුද්ධකායකම්මන්තා අරඤ්ඤවනපත්ථානි[1] පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, තෙසමහං අඤ්ඤතමො[4]. එතමහං බ්‍රාහ්මණ පරිසුද්ධකාය-කම්මන්තතං[5] අත්තනි සම්පස්සමානො භිය්‍යො පල්ලොමමාපාදිං අරඤ්ඤෙ විහාරාය.

7. තස්ස මය්හං බ්‍රාහ්මණ එතදහොසි: යෙ ඛො කෙචි සමණා වා බ්‍රාහ්මණා වා අපරිසුද්ධවචීකම්මන්තා -පෙ- අපරිසුද්ධමනොකම්මන්තා -පෙ අපරිසුද්ධාජීවා අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, අපරිසුද්ධාජීවසන්දොසහෙතු හවෙ තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අකුසලං භයභෙරවං අව්හායන්ති; න ඛො පනාහං අපරිසුද්ධාජීවො අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවාමි, පරිසුද්ධාජීවොහමස්මි. යෙ හි වො අරියා පරිසුද්ධාජීවා අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, තෙසමහං අඤ්ඤතමො. එතමහං බ්‍රාහ්මණ පරිසුද්ධාජීවතං අත්තනි සම්පස්සමානො භිය්‍යො පල්ලොමමාපාදිං අරඤ්ඤෙ විහාරාය.

8. තස්ස මය්හං බ්‍රාහ්මණ එතදහොසි: යෙ ඛො කෙචි සමණා වා බ්‍රාහ්මණා වා අභිජ්ඣාලූ කාමෙසු තිබ්බසාරාගා අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, අභිජ්ඣාලූ කාමෙසු තිබ්බසාරාගසන්දො-සහෙතු හවෙ තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අකුසලං භයභෙරවං අව්හායන්ති.[3] න ඛො පනාහං අභිජ්ඣාලු කාමෙසු තිබ්බසාරාගො අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවාමි, අනභිජ්ඣාලූහමස්මි. යෙ හි වො අරියා අනභිජ්ඣාලූ අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, තෙසමහං අඤ්ඤතමො. එතමහං බ්‍රාහ්මණ අනභිජ්ඣාලුතං අත්තනි සම්පස්සමානො භිය්‍යො පල්ලොමමාපාදිං අරඤ්ඤෙ විහාරාය.

---

1 "අරඤ්ඤවනපත්ථානි" ස්‍යා. මජසං. 2. "අපපරිසුද්ධ" ස්‍යා.
3. "අව්හායන්ති" මජසං. 4. "අඤ්ඤතරො" මජසං. ස්‍යා.
5. "පරිසුද්ධකායකම්මතං" මජසං.

6. බමුණ, ඒ මට මේ අදහස විය: අපිරිසිදු වූ කායකර්ම ඇති යම් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ අරණ්‍යයෙහි වානප්‍රස්ථ සෙනසුන් ද ප්‍රාන්තසෙනසුන් ද සේවනය කෙරෙද්ද, අපිරිසිදු වූ කායකර්ම නමැති ස්වකීය දෝෂය හේතු කොට ගෙන ඒකාන්තයෙන් ඒ පින්වත් මහණ බමුණෝ සාවද්‍ය වූ තැති ගැනුම් හා බිහිසුනු අරමුණු ද කැඳවත්. මම වනාහි පිරිසිදු වූ කායකර්ම ඇත්තෙම් අරණ්‍යයෙහි වානප්‍රස්ථප්‍රාන්තසෙනසුන් සේවනය නො කරමි. මම පිරිසිදු වූ කායකර්ම ඇත්තෙක්මි. යම් ආර්‍ය්‍ය කෙනෙක් පිරිසිදු වූ කායකර්ම ඇත්තාහු අරණ්‍යයෙහි වානප්‍රස්ථප්‍රාන්ත-තපෝභූමින් සේවනය කෙරෙත් ද, මම ඔවුන්ගෙන් එක්තරා එකෙක්මි. බමුණ, මම ඒ පිරිසිදු ක්‍රියා ඇතිබව තමා තුළ දක්නෙම් වනවාසය පිණිස බොහෝ සේ පතිතලොම් ඇති (බිය නැති) බවට පැමිණියෙමි.

7. බමුණ, ඒ මට මේ අදහස විය: අපිරිසිදු වාක්කර්ම ඇති ... අපිරිසිදු මනඃකර්ම ඇති ... අපිරිසිදු ආජීවය ඇති යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ අරණ්‍යයෙහි වානප්‍රස්ථප්‍රාන්තතපෝභූමින් සේවනය කෙරෙත් ද, අපිරිසිදු ආජීවය නමැති ස්වකීය දෝෂය හේතු කොට ගෙන ඒකාන්තයෙන් ඒ පින්වත් මහණබමුණෝ සාවද්‍ය වූ තැති ගැනුම් හා බිහිසුණු අරමුණු ද කැඳවත්. මම වනාහි අපිරිසිදු ආජීවය ඇත්තෙම් අරණ්‍යයෙහි වානප්‍රස්ථප්‍රාන්තතපෝභූමින් සේවනය නො කරමි. මම පිරිසිදු ආජීවය ඇත්තෙක්මි. යම් ආර්‍ය්‍ය කෙනෙක් පිරිසිදු ආජීවය ඇත්තාහු අරණ්‍යයෙහි වානප්‍රස්ථප්‍රාන්තතපෝභූමින් සේවනය කෙරෙත් ද, මම ඔවුන්ගෙන් එක්තරා එකෙක්මි. බමුණ, මම තමා තුළ ඒ පිරිසිදු ආජීවය ඇතිබව දක්නෙම් බොහෝ සෙයින් වනවාසය පිණිස නිර්භය භාවයට පැමිණියෙමි.

8. බමුණ, ඒ මට මේ අදහස විය: යම් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ විෂම ලෝභය බහුල කොට ඇත්තාහු කාමයන්හි තියුණු රාග ඇත්තාහු අරණ්‍යයෙහි වානප්‍රස්ථ ප්‍රාන්ත ආශ්‍රමයන් සේවනය කෙරෙත් ද, විෂමලෝභය හා කාමයන්හි තියුණු රාගය ද යන ස්වකීය දෝෂය හේතු කොට ගෙන ඒ පින්වත් මහණ බමුණෝ ඒකාන්තයෙන් සාවද්‍ය වූ තැතිගැනුම් හා බිහිසුණු අරමුණු ද කැඳවත්. මම වනාහි විෂමලෝභය බහුල කොට ඇත්තෙම් කාමයන්හි තියුණු රාග ඇති ව අරණ්‍යයෙහි වානප්‍රස්ථ ප්‍රාන්ත ආශ්‍රමයන් සේවනය නො කරමි. මම විෂමලෝභය බහුල කොට ඇත්තෙක් නො වෙමි. යම් ඒ ආර්‍ය්‍ය කෙනෙක් විෂමලෝභය බහුල කොට නැත්තාහු අරණ්‍යයෙහි වානප්‍රස්ථ ප්‍රාන්ත ආශ්‍රමයන් සේවනය කෙරෙත් ද, මම ඔවුන්ගෙන් එක්තරා එකෙක්මි. බමුණ, මම තමා තුළ අභිධ්‍යාව බහුල කොට නැති බව දක්නෙම් වනවාසය පිණිස බොහෝ සෙයින් බිය රහිත බවට පැමිණියෙමි.

9. තස්ස මය්හං බ්‍රාහ්මණ, එතදහොසි: යෙ ඛො කෙචි සමණා වා බ්‍රාහ්මණා වා බ්‍යාපන්නචිත්තා පදුට්ඨමනසඞ්කප්පා අරඤ්ඤ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති. ව්‍යාපන්නචිත්තපදුට්ඨමනසඞ්කප්පසන්දොසහෙතු හවෙ තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අකුසලං භයභෙරවං අව්හයන්ති. න ඛො පනාහං බ්‍යාපන්නචිත්තො පදුට්ඨමනසඞ්කප්පො අරඤ්ඤ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවාමි. මෙත්තචිත්තොහමස්මි. යෙ හි වො අරියා මෙත්තචිත්තා අරඤ්ඤ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, තෙසමහං අඤ්ඤතමො. එතමහං බ්‍රාහ්මණ මෙත්තචිත්තතං අත්තනි සම්පස්සමානො භිය්‍යො පල්ලොමමාපාදිං අරඤ්ඤෙ විහාරාය.

10. තස්ස මය්හං බ්‍රාහ්මණ එතදහොසි: යෙ ඛො කෙචි සමණා වා බ්‍රාහ්මණා වා ථීනමිද්ධපරියුට්ඨිතා අරඤ්ඤ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, ථීනමිද්ධපරියුට්ඨානසන්දොසහෙතු හවෙ තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අකුසලං භයභෙරවං අව්හයන්ති. න ඛො පනාහං ථීනමිද්ධපරියුට්ඨිතො අරඤ්ඤ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවාමි, විගතථීනමිද්ධොහමස්මි. යෙ හි වො අරියා විගතථීනමිද්ධා අරඤ්ඤ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, තෙසමහං අඤ්ඤතමො. එතමහං බ්‍රාහ්මණ විගතථීනමිද්ධතං අත්තනි සම්පස්සමානො භිය්‍යො පල්ලොමමාපාදිං අරඤ්ඤෙ විහාරාය.

11. තස්ස මය්හං බ්‍රාහ්මණ එතදහොසි: යෙ ඛො කෙචි සමණා වා බ්‍රාහ්මණා වා උද්ධතා අවූපසන්ත[1]චිත්තා අරඤ්ඤ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, උද්ධතඅවූපසන්තචිත්තසන්දොසහෙතු හවෙ තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අකුසලං භයභෙරවං අව්හයන්ති. න ඛො පනාහං උද්ධතො අවූපසන්තචිත්තො අරඤ්ඤ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවාමි, වූපසන්තචිත්තොහමස්මි. යෙ හි වො අරියා වූපසන්තචිත්තා අරඤ්ඤ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, තෙසමහං අඤ්ඤතමො. එතමහං බ්‍රාහ්මණ වූපසන්තචිත්තතං අත්තනි සම්පස්සමානො භිය්‍යො පල්ලොමමාපාදිං අරඤ්ඤෙ විහාරාය.

12. තස්ස මය්හං බ්‍රාහ්මණ එතදහොසි: යෙ ඛො කෙචි සමණා වා බ්‍රාහ්මණා වා කඞ්ඛී වෙචිකිච්ඡී[2] අරඤ්ඤ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, කඞ්ඛාවිචිකිච්ඡා[3]සන්දොසහෙතු හවෙ තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අකුසලං භයභෙරවං අව්හයන්ති. න ඛො පනාහං කඞ්ඛී වෙචිකිච්ඡී[4] අරඤ්ඤ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවාමි, තිණ්ණවිචිකිච්ඡොහමස්මි. යෙ හි වො අරියා තිණ්ණවිචිකිච්ඡා අරඤ්ඤ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, තෙසමහං අඤ්ඤතමො. එතමහං බ්‍රාහ්මණ තිණ්ණවිචිකිච්ඡතං අත්තනි සම්පස්සමානො භිය්‍යො පල්ලොමමාපාදිං අරඤ්ඤෙ විහාරාය.

1. "උද්ධතාවූපසන්ත" සයා.
2. "විචිකිච්ඡී" මජසං සයා.
3. "කඞ්ඛිවිචිකිච්ඡී" මජසං.
4. "කඞ්ඛිවිචිකිච්ඡී" සයා.

9. බමුණ, ඒ මට මේ අදහස විය: යම් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ (ප්‍රකෘතිය – ස්වභාවය හැරීමෙන්) වෛතසට පැමිණි සිත් ඇත්තාහු ප්‍රදුෂ්ටචිත්තසංකල්පනා ඇත්තාහු අරණ්‍ය වානප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය කෙරෙද්ද, වෛතස් වූ සිතය දූෂිත වූ චිත්තසංකල්පනාය යන ස්වකීය දෝෂහෙතුයෙන් ඒකාන්තයෙන් ඒ පින්වත් මහණ බමුණෝ සාවද්‍ය වූ නැති ගැනුම් හා බිහිසුණු අරමුණු ද කැඳවත්. මම වනාහි වෛතසට පැමිණි සිත් ඇති ව ප්‍රදුෂ්ටචිත්තසංකල්පනා ඇති ව අරණ්‍ය-වානප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය නො කරමි. මම මෙත්සිත් ඇත්තෙක්මි. මෙත්සිත් ඇති යම් ඒ ආර්‍ය්‍යී කෙනෙක් අරණ්‍යවානප්‍රස්ථප්‍රාන්තආශ්‍රමයන් සෙවනය කෙරෙද්ද, මම ඔවුන්ගෙන් එක්තරා එකෙක්මි. බමුණ, මම තමා තුල ඒ මෙත්සිත් ඇතිබව දකින්නෙම් වනවාසය පිණිස බොහෝ සෙයින් නිර්භය භාවයට පැමිණියෙමි.

10. බමුණ ඒ මට මේ අදහස විය. යම් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ පීනමිද්ධයෙන් මඩනා ලද්දාහු අරණ්‍යවානප්‍රස්ථප්‍රාන්තා-ශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, පීනමිද්ධයෙන් මැඩීම නැමැති ස්වකීය දෝෂය හෙතු කොට ගෙන ඒකාන්තයෙන් පින්වත් ඒ මහණ බමුණෝ සාවද්‍ය නැති ගැනුම් හා බිහිසුණු අරමුණු ද කැඳවත්. මම වනාහි පීනමිද්ධයෙන් මඩනා ලදු ව අරණ්‍යවානප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය නො කරමි. මම පහ වූ ථීනමිද්ධ ඇත්තෙක්මි. යම් ඒ ආර්‍ය්‍යී කෙනෙක් පහ වූ පීනමිද්ධ ඇත්තාහු අරණ්‍යවානප්‍රස්ථප්‍රාන්ත ආශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, මම ඔවුන්ගෙන් එක්තරා එකෙක්මි. බමුණ, මම තමා තුල ඒ පීනමිද්ධය නැතිකළබව දකින්නෙම් වනවාසය පිණිස බොහෝ සෙයින් නිර්භය භාවයට පැමිණියෙමි.

11. බමුණ, ඒ මට මෙ අදහස විය: යම් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ඇවිස්සුණු, සැලෙන, සිත් ඇත්තාහු නො සන්සුන් සිත් ඇත්තාහු අරණ්‍යවානප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, ඇවිස්සුණු සැලුනු නො සන්සුන් සිත් ඇති බව නැමැති ස්වකීය දෝෂය හෙතු කොට ගෙන ඒ පින්වත් මහණ බමුණෝ සාවද්‍ය නැති ගැනුම් හා බිහිසුණු අරමුණු ද කැඳවත්. මම ඇවිස්සුණු සැලුනු නො සන්සුන් සිත් ඇති ව අරණ්‍යවානප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය නො කරමි. මම සන්සුන් සිත් ඇත්තෙක්මි. යම් ඒ ආර්‍ය්‍යී කෙනෙක් සන්සුන් සිත් ඇති ව අරණ්‍ය-වානප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, මම ඔවුන්ගෙන් එක්තරා එකෙක්මි. බමුණ, මම තමා තුල පිහිටි ඒ සන්සුන් සිත් ඇතිබව දකින්නෙම් වනවාසය පිණිස බොහෝසෙයින් නිර්භය භාවයට පත් වීමි.

12. බමුණ, ඒ මට මේ අදහස විය: යම් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ සැක ඇත්තාහු විචිකිච්ඡා ඇත්තාහු අරණ්‍යවානප්‍රස්ථ ප්‍රාන්තාශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, සැකය හා විචිකිච්ඡාව නැමැති ස්වකීය දෝෂය හෙතු කොට ගෙන ඒ පින්වත් මහණබමුණෝ ඒකාන්තයෙන් සාවද්‍ය නැති ගැනුම් හා බිහිසුණු අරමුණු ද කැඳවත්. මම වනාහි සැක ඇත්තෙම් විචිකිච්ඡා ඇත්තෙම් අරණ්‍යවානප්‍රස්ථප්‍රාන්තා-ශ්‍රමයන් සෙවනය නො කරමි. මම තරණය කළ සැක ඇත්තෙක්මි. යම් ඒ ආර්‍ය්‍යී කෙනෙක් තරණය කළ සැක ඇති ව අරණ්‍යවානප්‍රස්ථප්‍රාන්තා-ශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, මම ඔවුන්ගෙන් එක්තරා එකෙක්මි. බමුණ, මම තමා තුල වූ තරණය කළ විචිකිච්ඡා ඇතිබව දකින්නෙම් වනවාසය පිණිස බොහෝ සෙයින් නිර්භය භාවයට පැමිණියෙමි.

13. තස්ස මය්හං බ්‍රාහ්මණ එතදහොසි: යෙ ඛො කෙචි සමණා වා බ්‍රාහ්මණා වා අත්තුක්කංසකා[1] පරවම්භී අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, අත්තුක්කංසන[2]පරවම්භනසන්දොසහෙතු හවෙ තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අකුසලං භයභෙරවං අව්හායන්ති. න ඛො පනාහං අත්තුක්කංසකො[3] පරවම්භී අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවාමි, අනත්තුක්කංසකො අපරවම්භීහමස්මි. යෙ හි වො අරියා අනත්තුක්කංසකා[3] අපරවම්භී අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, තෙසමහං අඤ්ඤතමො. එතමහං බ්‍රාහ්මණ අනත්තුක්කංසකතං[4] අපරවම්භිතං අත්තනි සම්පස්සමානො භිය්‍යො පල්ලොමමාපාදිං අරඤ්ඤෙ විහාරාය.

14. තස්ස මය්හං බ්‍රාහ්මණ එතදහොසි: යෙ ඛො කෙචි සමණා වා බ්‍රාහ්මණා වා ජම්භී භිරුක[5]ජාතිකා අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, ජම්භී භිරුකජාතිකසන්දොසහෙතු හවෙ තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අකුසලං භයභෙරවං අව්හායන්ති. න ඛො පනාහං ජම්භී භිරුකජාතිකො අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවාමි, විගතලොමහංසොහමස්මි. යෙ හි වො අරියා විගතලොමහංසා අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, තෙසමහං අඤ්ඤතමො. එතමහං බ්‍රාහ්මණ විගතලොමහංසතං අත්තනි සම්පස්සමානො භිය්‍යො පල්ලොමමාපාදිං අරඤ්ඤෙ විහාරාය.

15. තස්ස මය්හං බ්‍රාහ්මණ එතදහොසි: යෙ ඛො කෙචි සමණා වා බ්‍රාහ්මණා වා ලාභසක්කාරසිලොකං නිකාමයමානා අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, ලාභසක්කාරසිලොකං නිකාමයමාන[6]-සන්දොසහෙතු හවෙ තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අකුසලං භයභෙරවං අව්හායන්ති. න ඛො පනාහං ලාභසක්කාරසිලොකං නිකාමයමානො අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවාමි, අප්පිච්ඡොහමස්මි. යෙ හි වො අරියා අප්පිච්ඡා අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, තෙසමහං අඤ්ඤතමො. එතමහං බ්‍රාහ්මණ අප්පිච්ඡතං අත්තනි සම්පස්සමානො භිය්‍යො පල්ලොමමාපාදිං අරඤ්ඤෙ විහාරාය.

1. අත්තුක්කංසනකා, කත්ථචි 2. අත්තුක්කංසනකා, කත්ථචි
3. අත්තුක්කංසනකො, කත්ථචි. අත්තුක්කංසනකා, කත්ථචි
4. අනත්තුක්කංසනකා, කත්ථචි. අනත්තුක්කංසනකතං, කත්ථචි.
5. ජම්භීභිරුක, සං. 6. නිකාමයමානා, PTS. නිකාමිත, මජසං.

13. බමුණ, මට මේ අදහස වී ය: යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ තමන් හුවා අනුන් හෙළා දක්නාහු අරණ්‍යවනප්‍රස්ථ ප්‍රාන්තාශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, තමා උසස් කොට අනුන් පහත් කොට සැලකීම නමැති ස්වකීය දෝෂය හේතු කොට ගෙන ඒකාන්තයෙන් ඒ පින්වත් මහණබමුණෝ සාවද්‍ය නැති ගැනුම් හා බිහිසුණු අරමුණු ද කැඳවත්. මම වනාහි තමා උසස් කොටත් අනුන් පහත් කොටත් සලකමින් අරණ්‍යවනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය නො කරමි. මම තමා උසස් කොට අනුන් පහත් කොට සලකන්නෙක් නො වෙමි. යම් ඒ ආර්‍ය කෙනෙක් තමා උසස් කොට අනුන් පහත් කොට නො සලකන්නාහු අරණ්‍යවනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, මම ඔවුන්ගෙන් එක්තරා එකෙක්මි. බමුණ, මම තමා උසස් කොට නො සැලකීම හා අනුන් පහත් කොට නො සැලකීම ද තමා තුළ පිහිටිබව දක්නෙමි වනවාසය පිණිස බොහෝසෙයින් නො බියබවට පැමිණියෙමි.

14. බමුණ, ඒ මට මේ අදහස වී ය: යම් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ (කය දලදඬු කරන තද) නැති ගැනුම් ඇත්තාහු බිය සුලුබව ඇත්තාහු අරණ්‍යවනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, තද නැති ගැත්ම හා බියසුලුබව ද නමැති ස්වකීය දෝෂය හේතු කොට ගෙන ඒකාන්තයෙන් ඒ පින්වත් මහණ බමුණෝ සාවද්‍ය නැති ගැනුම් හා බිහිසුණු අරමුණු ද කැඳවත්. මම වනාහි නැති ගත්තෙම් බියසුලු ස්වභාවය ඇත්තෙම් අරණ්‍යවනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය නො කරමි. මම පහ වූ ලොමුදහ ගැනීම් ඇත්තෙක් වෙමි. යම් ඒ ආර්‍ය කෙනෙක් පහ වූ ලොමුදහ ගැනීම් ඇත්තෝ අරණ්‍යවනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, මම ඔවුන්ගෙන් එක්තරා එකෙක්මි. බමුණ, මම ඒ පහ වූ ලොමුදහ ගැනීම තමා තුළ පිහිටිබව (තමා කෙරෙහි ලොමුදහ ගැනුම නැති බව) දක්නෙමි වනවාසය පිණිස බොහෝ සෙයින් නිර්භය භාවයට පැමිණියෙමි.

15. බමුණ, ඒ මට මේ අදහස වී ය: යම් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ලාභ සත්කාර කීර්ති කැමැති වන්නාහු අරණ්‍යයෙහි වනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, ලාභ සත්කාර කීර්ති බලාපොරොත්තු වීම වූ ස්වකීය දෝෂය හේතු කොට ගෙන ඒකාන්තයෙන් ඒ පින්වත් මහණ බමුණෝ සාවද්‍ය නැති ගැනුම් හා බිහිසුණු අරමුණු ද කැඳවත්. මම වනාහි ලාභ සත්කාර කීර්ති බලාපොරොත්තු ව අරණ්‍යයෙහි වනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය නො කරමි. මම ඉච්ඡා නැත්තෙක්මි. යම් ඒ ආර්‍ය කෙනෙක් ආශා නැත්තාහු අරණ්‍යයෙහි වනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, මම ඔවුන්ගෙන් එක්තරා එකෙක්මි. බමුණ, මම ඒ ඉච්ඡාරහිතභාවය තමා තුළ දක්නෙමි වනවාසය පිණිස බොහෝසෙයින් නොබිය බවට පැමිණියෙමි.

16. තස්ස මය්හං බ්‍රාහ්මණ එතදහොසි: යෙ ඛො කෙචි සමණා වා බ්‍රාහ්මණා වා කුසීතා හීනවිරියා[1] අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, කුසීතහීනවිරියසන්දොසහෙතු හවෙ තෙ භොන්තො සමණ-බ්‍රාහ්මණා අකුසලං භයභෙරවං අව්හායන්ති. න ඛො පනාහං කුසීතො හීනවිරියො[2] අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවාමි. ආරද්ධවිරියොහමස්මි. යෙ හි වො අරියා ආරද්ධවිරියා අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, තෙසමහං අඤ්ඤතමො. එතමහං බ්‍රාහ්මණ ආරද්ධවිරියතං අත්තනි සම්පස්සමානො භිය්‍යො පල්ලොම මාපාදිං අරඤ්ඤෙ විහාරාය.

17. තස්ස මය්හං බ්‍රාහ්මණ එතදහොසි: යෙ ඛො කෙචි සමණා වා බ්‍රාහ්මණා වා මුට්ඨස්සතී අසම්පජානා අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, මුට්ඨස්සතිඅසම්පජානසන්දොසහෙතු හවෙ තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අකුසලං භයභෙරවං අව්හායන්ති. න ඛො පනාහං මුට්ඨස්සති අසම්පජානො අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවාමි. උපට්ඨිතසතිහමස්මි[3] යෙ හි වො අරියා උපට්ඨිතසතී අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, තෙසමහං අඤ්ඤතමො. එතමහං බ්‍රාහ්මණ උපට්ඨිතසතිතං අත්තනි සම්පස්සමානො භිය්‍යො පල්ලොමමාපාදිං අරඤ්ඤෙ විහාරාය.

18. තස්ස මය්හං බ්‍රාහ්මණ එතදහොසි: යෙ ඛො කෙචි සමණා වා බ්‍රාහ්මණා වා අසමාහිතා විබ්භන්තචිත්තා අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, අසමාහිතවිබ්භන්තචිත්තසන්දොසහෙතු හවෙ තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අකුසලං භයභෙරවං අව්හායන්ති. න ඛො පනාහං අසමාහිතො විබ්භන්තචිත්තො අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවාමි. සමාධිසම්පන්නොහමස්මි. යෙ හි වො අරියා සමාධි-සම්පන්නා අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, තෙසමහං අඤ්ඤතමො. එතමහං බ්‍රාහ්මණ සමාධිසම්පදං අත්තනි සම්පස්ස-මානො භිය්‍යො පල්ලොම මාපාදිං අරඤ්ඤෙ විහාරාය.

19. තස්ස මය්හං බ්‍රාහ්මණ එතදහොසි: යෙ ඛො කෙචි සමණා වා බ්‍රාහ්මණා වා දුප්පඤ්ඤා එළමූගා[4] අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, දුප්පඤ්ඤඑළමූගසන්දොසහෙතු[3] හවෙ තෙ භොන්තො සමණ-බ්‍රාහ්මණා අකුසලං භයභෙරවං අව්හායන්ති. න ඛො පනාහං දුප්පඤ්ඤො එළමූගො අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවාමි. පඤ්ඤාසම්පන්නොහමස්මි. යෙ හි වො අරියා පඤ්ඤාසම්පන්නා අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, තෙසමහං අඤ්ඤතමො එතමහං බ්‍රාහ්මණ පඤ්ඤාසම්පදං අත්තනි සම්පස්සමානො භිය්‍යො පල්ලොම මාපාදිං අරඤ්ඤෙ විහාරාය.

සොළසපරියායං[5].

---

1. හීනවීරියා - මජසං. 2 හීනවීරියො - මජසං.
3. උපට්ඨිතස්සතිහමස්මි - මජසං. 4. එළමුගා - මජසං
5. සොළසපරියායං නිට්ඨිතං - මජසං. සතා.

16. බමුණ, ඒ මට මේ අදහස වීය: යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ කුසීත වූවාහු වීර්‍ය්‍ය නැත්තාහු අරණ්‍යයෙහි වනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, කායිකචෛතසික වීර්‍ය්‍යරහිතබව නැමැති සවකීය දෝෂය හේතු කොට ගෙන ඒකාන්තයෙන් ඒ පින්වත් මහණ බමුණෝ සාවද්‍ය නැති ගැනුම් හා බිහිසුණු අරමුණු ද කැඳවත්. මම වනාහි මැලි වූයෙම් වීර්‍ය්‍ය නැත්තෙම් (කායික චෛතසික වීර්‍ය්‍ය රහිත ව) අරණ්‍යයෙහි වනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය නො කෙරෙමි. මම පටන් ගත් වීර්‍ය්‍ය ඇත්තෙක්මි. යම් ඒ ආර්‍ය්‍ය කෙනෙක් ඇරඹූ වැර ඇත්තාහු අරණ්‍යයෙහි වනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, මම ඔවුන්ගෙන් එක්තරා එකෙක්මි. බමුණ, මම තමා තුළ පිහිටි ඒ ඇරඹූ වැර ඇතිබව දක්නෙම් වනවාසය පිණිස බොහෝසෙයින් නිර්භය භාවයට පැමිණියෙමි.

17. බමුණ, ඒ මට මේ අදහස වීය: යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ නට සිහි ඇත්තාහු නුවණ නැත්තාහු අරණ්‍යයෙහි වනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, නට සිහිය හා නුවණ නැති බව නැමැති සවකීය දෝෂය හේතු කොට ගෙන ඒකාන්තයෙන් ඒ පින්වත් මහණබමුණෝ සාවද්‍ය නැති ගැනුම් හා බිහිසුණු අරමුණු ද කැඳවත් මම වනාහි නට සිහි ඇති ව නුවණ නැති ව අරණ්‍යයෙහි වනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය නො කරමි. මම එළඹ සිටි සිහි ඇත්තෙක්මි. යම් ඒ ආර්‍ය්‍ය කෙනෙක් එළඹ සිටි සිහි ඇත්තාහු අරණ්‍යයෙහි වනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, මම ඔවුන්ගෙන් එක්තරා එකෙක්මි. බමුණ, මම ඒ තමා තුළ එළඹ සිටි සිහිය ඇතිබව දක්නෙම් වනවාසය පිණිස බොහෝසෙයින් නිර්භය භාවයට පැමිණියෙමි.

18. බමුණ, ඒ මට මේ අදහස වීය: යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ අසමාහිත (එකඟ සිත් නැති) වූවාහු විභ්‍රාන්ත (නොයෙක් අරමුණෙහි දිවූ) සිත් ඇත්තාහු අරණ්‍යවනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, අසමාහිත විභ්‍රාන්ත සිත් ඇති බව නැමැති සවකීය දෝෂය හේතු කොට ගෙන ඒකාන්තයෙන් ඒ පින්වත් මහණබමුණෝ සාවද්‍ය නැති ගැනුම් හා බිහිසුණු අරමුණු ද කැඳවත්. මම වනාහි අසමාහිත ව විභ්‍රාන්ත සිත් ඇති ව අරණ්‍යයෙහි වනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය නො කරමි. මම සමාධිසම්පන්නයෙක්මි. යම් ඒ ආර්‍ය්‍ය කෙනෙක් සමාධිසම්පන්න ව අරණ්‍යයෙහි වනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය කෙරෙත් ද මම ඔවුන්ගෙන් එක්තරා එකෙක්මි. බමුණ, මම මේ සමාධිසම්පදාව තමා තුළ පිහිටිබව දක්නෙම් වනවාසය පිණිස නො බියබවට පැමිණියෙමි.

19. බමුණ, ඒ මට මේ අදහස වීය: යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ නුවණ නැත්තාහු කෙළතොළු වූවාහු අරණ්‍යයෙහි වනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, නුවණ නැතිබව හා කෙළතොළු බව නැමැති සවකීය දෝෂය හේතු කොට ගෙන ඒකාන්තයෙන් ඒ පින්වත් මහණබමුණෝ සාවද්‍ය නැති ගැනුම් හා බිහිසුණු අරමුණු ද කැඳවත්. මම වනාහි නුවණ නැති ව කෙළතොළු ව අරණ්‍යයෙහි වනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය නො කරමි. මම නුවණැත්තෙක් වෙමි. යම් ඒ ආර්‍ය්‍ය කෙනෙක් නුවණැති ව අරණ්‍යයෙහි වනප්‍රස්ථප්‍රාන්තාශ්‍රමයන් සෙවනය කෙරෙත් ද, මම ඔවුන්ගෙන් එක්තරා එකෙක්මි. බමුණ, මම නුවණැති බව තමා තුළ පිහිටිබව දක්නෙම් වනවාසය පිණිස බොහෝසෙයින් නිර්භය භාවයට පැමිණියෙමි.

20. තස්ස මය්හං බ්‍රාහ්මණ එතදහොසි: යන්නූනාහං යා තා රත්තියො අභිඤ්ඤාතා අභිලක්ඛිතා චාතුද්දසී පඤ්චදසී අට්ඨමී ච පක්ඛස්ස, තථාරූපාසු රත්තිසු[1] යානි තානි ආරාමචෙතියානි වනචෙතියානි රුක්ඛචෙතියානි භිංසනකානි[2] සලොමහංසානි, තථාරූපෙසු සෙනාසනෙසු විහරෙය්‍යං, අප්පෙවනාම[3] තං භයභෙරවං පස්සෙය්‍යන්ති. සො ඛො අහං බ්‍රාහ්මණ අපරෙන සමයෙන යා තා රත්තියො අභිඤ්ඤාතා අභිලක්ඛිතා චාතුද්දසී පඤ්චදසී අට්ඨමී ච පක්ඛස්ස, තථාරූපාසු රත්තිසු යානි තානි ආරාමචෙතියානි වනචෙතියානි රුක්ඛචෙතියානි භිංසනකානි සලොමහංසානි, තථාරූපෙසු සෙනාසනෙසු විහරාමි. තත්‍ර ච මෙ[4] බ්‍රාහ්මණ විහරතො මගො[5] වා ආගච්ඡති, මොරො වා කට්ඨං පාතෙති, වාතො වා පණ්ණසටං[6] එරෙති,[7] තස්ස මය්හං[8] එවං හොති:[9] එතං නූන තං භයභෙරවං ආගච්ඡතීති.

21. තස්ස මය්හං බ්‍රාහ්මණ එතදහොසි: කිංනු ඛො අහං අඤ්ඤදත්ථු භයපාටිකඞ්ඛී විහරාමි, යන්නූනාහං යථාභූතයථාභූතස්ස[10] මෙ තං භයභෙරවං ආගච්ඡති, තථාභූතතථාභූතො ච තං භයභෙරවං පටිවිනෙය්‍යන්ති. තස්ස මය්හං බ්‍රාහ්මණ චඞ්කමන්තස්ස තං භයභෙරවං ආගච්ඡති; සො ඛො අහං බ්‍රාහ්මණ නෙව තාව තිට්ඨාමි, න නිසීදාමි, න නිපජ්ජාමි, යාව චඞ්කමන්තොව තං භයභෙරවං පටිවිනෙමි. තස්ස මය්හං බ්‍රාහ්මණ ඨිතස්ස තං භයභෙරවං ආගච්ඡති; සො ඛො අහං බ්‍රාහ්මණ නෙව තාව චඞ්කමාමි, න නිසීදාමි, න නිපජ්ජාමි, යාව ඨිතොව තං භයභෙරවං පටිවිනෙමි. තස්ස මය්හං බ්‍රාහ්මණ නිසින්නස්ස තං භයභෙරවං ආගච්ඡති; සො ඛො අහං බ්‍රාහ්මණ නෙව තාව නිපජ්ජාමි, න තිට්ඨාමි, න චඞ්කමාමි, යාව නිසින්නොව තං භයභෙරවං පටිවිනෙමි. තස්ස මය්හං බ්‍රාහ්මණ නිපන්නස්ස තං භයභෙරවං ආගච්ඡති; සො ඛො අහං බ්‍රාහ්මණ නෙව තාව නිසීදාමි, න තිට්ඨාමි, න චඞ්කමාමි, යාව නිපන්නොව තං භයභෙරවං පටිවිනෙමි.

22. සන්ති ඛො පන බ්‍රාහ්මණ එකෙ සමණබ්‍රාහ්මණා රත්තිංයෙව සමානං දිවාති සඤ්ජානන්ති, දිවායෙව සමානං රත්තීති සඤ්ජානන්ති; ඉදමහං තෙසං සමණබ්‍රාහ්මණානං සම්මොහවිහාරස්මිං වදාමි. අහං ඛො පන බ්‍රාහ්මණ රත්තිංයෙව සමානං රත්තීති සඤ්ජානාමි, දිවායෙව සමානං දිවාති සඤ්ජානාමි. යං ඛො තං බ්‍රාහ්මණ සම්මා වදමානො වදෙය්‍ය අසම්මොහධම්මො සත්තො ලොකෙ උප්පන්නො බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය[12] අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති, මමෙව තං සම්මා වදමානො වදෙය්‍ය අසම්මොහධම්මො සත්තො ලොකෙ උප්පන්නො බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය[12] අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

---

1. රත්තීසු - මජසං. සයා. 2. භිසනකානි - මජසං.
3. අප්පෙවනාමාහං - මජසං. 4. තත්ථ ච මෙ, මජසං. සයා.
5. මිගො වා, සයා. 6. පණ්ණකසටං - මජසං.
7. පාතෙති - කම්බො. 8. තස්ස මය්හං බ්‍රාහ්මණ - මජසං. සයා.
9. එතදහොසි - මජසං.
10. යථාභූතං යථාභූතස්ස - මජසං. PTS. යථාභූතස්ස යථාභූතස්ස - සයා.
11. තථාභූතං තථාභූතොව - මජසං. PTS. තථාභූතො තථාභූතොව - සයා.
12. ලොකානුකම්පකාය - සීමු. PTS.

20. බමුණ, ඒ මට මේ අදහස වී ය: 'පක්‍ෂයෙහි (හඳ නිසා) ප්‍රසිද්ධ වූ (උපොසථසමාදනාදි වශයෙන්) ලකුණු කළ යුතු වූ තුදුස්වක, පසළොස්වක, අටවක යන යම් ඒ රාත්‍රීහු වෙත් ද, එවැනි රාත්‍රීන්හි බිහිසුණු වූ ලොමුදහ ගන්වන්නා වූ යම් ඒ ආරාමචෛත්‍යයෝ (=චෛතිය සම්මත පිදිය යුතු අරම්), වනචෛත්‍යයෝ (=පිදිය යුතු වන), වෘක්‍ෂචෛත්‍යයෝ (පිදිය යුතු රුක්) වෙද්ද, එබඳු සෙනසුන්හි වසන්නෙම් නම් මැනව. ඒ තැති ගැනුම් හා බිහිසුණු අරමුණු ද දක්නෙම් නම් මැනැවැ' යි කියායි. බමුණ, ඒ මම ඉන් මතු කල්හි පක්‍ෂයෙහි ප්‍රසිද්ධ වූ ලකුණු කළ යුතු වූ තුදුස්වක, පසළොස්වක, අටවක යන යම් ඒ රාත්‍රීහු වෙත් ද, එවැනි රාත්‍රීන්හි බිහිසුණු වූ ලොමුදහ ගන්වන්නා වූ යම් ඒ ආරාමචෛත්‍යයෝ වනචෛත්‍යයෝ වෘක්‍ෂචෛත්‍යයෝ වෙත් ද, එබඳු සෙනසුන්හි වාසය කරමි. බමුණ, එහි වාසය කරන්නා වූ මා වෙතට මුවෙක් (සිවුපාවෙක්) හෝ කුර ගා එයි. මොනරෙක් (පක්‍ෂියෙක්) හෝ දරකඩක් හෙළයි. සුළඟ හෝ පරඬලාවක් සලයි. ඒ මට මෙසේ සිතෙයි: 'එකාන්තයෙන් මේ එන්නේ ඒ භයානක අරමුණ ය' කියායි.

21. බමුණ, ඒ මට මේ සිත වී ය: 'කුමක් නිසා මම එකාන්තයෙන් භය කැමැත්තෙම් වාසය කෙරෙම් ද? යම් යම් ඉරියව්වකින් යුක්ත වූ මා වෙත ඒ භයජනක අරමුණ ඒ ද, ඒ ඒ ඉරියව්වෙන් යෙදුනෙම් ම ඒ භයජනක අරමුණ දුර ලන්නෙම් නම්, යෙහෙකැයි කියායි. බමුණ, සක්මන් කරන්නා වූ මා වෙතට ඒ භයභෛරවය එයි ද, බමුණ, මම යම් තාක් සක්මන් කරමින් ම ඒ භයභෛරවය දුරු කෙරෙම් ද, ඒ තාක් නො සිටිමි. නො හිඳිමි. නො නිදමි. බමුණ, සිටියා වූ ඒ මා වෙතට ඒ භය භෛරවය එයි ද, බමුණ, ඒ මම යම් තාක් සිටියෙම් ම ඒ භයභෛරවය දුරු කෙරෙම් ද, ඒ තාක් සක්මන් නො කරමි. නො හිඳිමි. නො නිදමි. බමුණ, හුන්නා වූ මා වෙතට ඒ භයභෛරවය එයි ද, බමුණ, ඒ මම යම් තාක් හුන්නෙම් ම ඒ භයභෛරවය දුරු කෙරෙම් ද, ඒ තාක් නො නිදමි. නො සිටිමි. සක්මන් නො කරමි. බමුණ, හොත්තා වූ මා වෙතට ඒ භයභෛරවය එයි ද, බමුණ, ඒ මම යම් තාක් නිදන්නෙම් ම ඒ භයභෛරවය දුරු කෙරෙම් ද, ඒ තාක් නො හිඳිමි. නො සිටිමි. සක්මන් නො කරමි.

22 බමුණ, රාත්‍රිය ම දහවල් ය යි සිතන දහවල ම රාත්‍රිය යි සිතන ඇතැම් මහණබමුණෝ ඇත්තාහ. මේ ඒ මහණබමුණන්ගේ මුළා වූ විසීමකැ යි මම කියමි. බමුණ, මම රෑය ම රෑය ය යි හඳුනමි. දවල දවල ම ය යි හඳුනමි. බමුණ, මනා කොට කියන්නෙක් 'මුළා නොවන ගති ඇති සත්ත්වයෙක් බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සැප පිණිස ලොවට අනුකම්පා පිණිස දෙවි මිනිසුන්ට වැඩ පිණිස හිත පිණිස සැප පිණිස ලොකයෙහි උපන්නේ ය'යි යම් කෙනකුන් උදෙසා කියා ද, මනා කොට (සත්‍යය) කියන්නෙක් 'මුළා නො වන ගති ඇති සත්ත්වයෙක් බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සැප පිණිස ලොවට අනුකමපා පිණිස දෙවිමිනිසුන්ට වැඩ පිණිස හිත පිණිස සැප පිණිස ලොකයෙහි උපන්නේ ය' යි ඒ මා උදෙසා ම කියන්නේ ය.

Free Distribution www.aathaapi.org

23. ආරද්ධං ඛො පන මෙ බ්‍රාහ්මණ විරියං අහොසි අසල්ලීනං. උපට්ඨිතා සති අසම්මුට්ඨා.[1] පස්සද්ධො කායො අසාරද්ධො. සමාහිතං චිත්තං එකග්ගං. සො ඛො අහං බ්‍රාහ්මණ විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං[2] උපසම්පජ්ජ විහාසිං. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං[3] උපසම්පජ්ජ විහාසිං. පීතියා ච විරාගා උපෙක්ඛකො[4] ච විහාසිං සතො ච සම්පජානො, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙසිං, යං තං අරියා ආචික්ඛන්ති 'උපෙක්ඛකො[4] සතිමා සුඛවිහාරී'ති තතියං ඣානං[5] උපසම්පජ්ජ විහාසිං. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං[6] අසුඛං උපෙක්ඛා[7] සතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං[8] උපසම්පජ්ජ විහාසිං.

24. සො එවං සමාහිතෙ චිත්තෙ - පරිසුද්ධෙ, පරියොදාතෙ, අනඞ්ගණෙ, විගතූපක්කිලෙසෙ, මුදුභූතෙ, කම්මනියෙ, ඨිතෙ, ආනෙඤ්ජප්පත්තෙ[9], පුබ්බෙනිවාසානුස්සතිඤාණාය[10] චිත්තං අභිනින්නාමෙසිං. සො[11] අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි. සෙය්‍යථීදං: එකම්පි ජාතිං, ද්වෙපි ජාතියො, තිස්සොපි ජාතියො, චතස්සොපි ජාතියො, පඤ්චපි ජාතියො, දසපි ජාතියො, වීසම්පි[12] ජාතියො, තිංසම්පි ජාතියො, චත්තාරීසම්පි[13] ජාතියො, පඤ්ඤාසම්පි ජාතියො, ජාතිසතම්පි ජාතිසහස්සම්පි, ජාතිසතසහස්සම්පි; අනෙකෙපි සංවට්ටකප්පෙ, අනෙකෙපි විවට්ටකප්පෙ, අනෙකෙපි සංවට්ට-විවට්ටකප්පෙ, 'අමුත්‍රාසිං එවන්නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො; සො තතො චුතො අමුත්‍ර උදපාදිං.[14] තත්‍රාපාසිං එවන්නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි. අයං ඛො මෙ බ්‍රාහ්මණ රත්තියා පඨමෙ යාමෙ පඨමා විජ්ජා අධිගතා, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

1. අපම්මුට්ඨා - සයා.
2. පඨමජ්ඣානං - සීමු.
3. දුතියජ්ඣානං - සීමු.
4. උපෙක්ඛකො - මජසං. සයා.
5. තතියජ්ඣානං - සීමු.
6. අදුක්ඛමසුඛං - මජසං සයා.
7. උපෙක්ඛා - මජසං. සයා.
8. චතුත්ථජ්ඣානං - සීමු.
9. ආනෙඤ්ජප්පත්තෙ - සීමු.II.
10 පුබ්බෙනිවාසානුස්සතිඤාණාය - මජසං.
11. සොහං, කත්ථචි
12. වීසතිම්පි - සීමු.
13. චත්තාලීසම්පි - සයා. චත්තාලීසම්පි - මජසං
14. උප්පාදිං - කත්ථචි.

23. බමුණ, මා විසින් වීර්‍ය්‍යය පටන් ගන්නා ලද්දේ නො සැඟවුණේ ය. සිහිය එළඹ සිටියේ මුළා නො වූයේ ය. (නාමරූප)කය සන්හිඳුණේ දරථ රහිත වී ය. සිත සමාධියෙහි පිහිටියේ එකඟ වී ය. බමුණ, ඒ මම කාමයන්ගෙන් වෙන් ව ම අකුශලධර්මයන්ගෙන් වෙන් ව ම විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි. විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් ස්වසන්තානයෙහි උපන් සම්ප්‍රසාදන සඞ්ඛ්‍යාත ශ්‍රද්ධාවෙන් යුක්ත වූ සිතේ එකඟබැව් වඩන්නා වූ විතර්ක රහිත වූ විචාර රහිත වූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි. ප්‍රීතිය ද දුරු කිරීමෙන් උපෙක්ෂක ව ද වාසය කෙළෙමි. සිහි ඇත්තෙම් මනානුවණින් යුක්ත වූයෙම් (නාමරූප) කයින් සැපය ද වින්දෙමි. ආර්‍ය්‍යයෝ යම් ඒ ධ්‍යානයක් නිසා ‘උපෙක්ෂක වූයේ සිහි ඇත්තේ සුව සේ වෙසේ’ යයි කියත් ද, ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි. (පූර්වයෙහි ම) කායික සුඛයාගේ ද ප්‍රහාණයෙන් කායිකදුක්ඛයාගේ ද ප්‍රහාණයෙන්, පූර්වයෙහි ම සොම්නස් දොම්නස් දෙදෙනාගේ ද අස්තඞ්ගමයෙන් (=ප්‍රහාණයෙන්) දුක් නො වූ සුඛ නො වූ, උපෙක්ෂාවෙන් හටගත් සතිපාරිශුද්ධි (=සිහිය පිළිබඳ පිරිසිදුබැව්) ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි.

24. ඒ මම මෙසේ සමාධිගත වූ සිත - පිරිසිදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ (කෙලෙස්) නැති වූ කල්හි, උපක්ලේශ පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කාර්‍ය්‍යයට සුදුසු වූ කල්හි, (පිරිසිදු බැව් ආදියෙහි) ස්ථිර ව සිටි කල්හි, නො සැලෙන බවට පත් වූ කල්හි, පෙර විසූ කඳපිළිවෙළ සිහි කරණ නුවණ පිණිස සිත විශේෂයෙන් නතු කෙළෙමි. ඒ මම නොයෙක් ආකාර ඇති පූර්වෙනිවාසය සිහි කරමි. එනම්: එක ජාතියක් ද, ජාති දෙකක් ද, ජාති තුනක් ද, ජාති සතරක් ද, ජාති පහක් ද, ජාති දසයක් ද, ජාති විස්සක් ද, ජාති තිසක් ද, ජාති සතළිසක් ද, ජාති පනසක් ද, ජාති සියයක් ද, ජාති දහසක් ද, ජාති සියදහසක් ද; නොයෙක් සංවර්ත (=නස්නා) කල්පයන් ද, නොයෙක් විවර්ත (=හටගන්නා) කල්පයන් ද, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන් ද සිහි කරමි: “අසුවල් තැන්හි උපන්මි. මෙවැනි නම් ඇත්තෙක් වීමි. මෙවැනි ගොත්‍ර ඇත්තෙක් වීමි. මෙවැනි පැහැ ඇත්තෙක් වීමි. මෙවැනි ආහාර ඇත්තෙක් වීමි. මෙවැනි සැපදුක් වින්දෙක් වීමි. මෙවැනි ආයු කෙළවර කොට ඇත්තෙක් වීමි. ඒ මම එයින් චුත වූයෙම් අසුවල් තැන උපන්මි. එහි දී ද මෙ වැනි නම් ඇත්තෙක් වීමි. මෙ වැනි ගොත්‍ර ඇත්තෙක් වීමි. මෙවැනි පැහැ ඇත්තෙක් වීමි. මෙ වැනි ආහාර ඇත්තෙක් වීමි. මෙ වැනි සැපදුක් වින්දෙක් වීමි. මෙ වැනි ආයු කෙළවර කොට ඇත්තෙක් වීමි. ඒ මම එයින් චුත වූයෙම් මෙහි උපන්නෙම් වෙමි”යි. මෙසේ ආකාර සහිත වූ උද්දේශ සහිත වූ නන් වැදෑරුම් වූ පෙර විසූ කඳපිළිවෙළ සිහි කරමි. බමුණ, මා විසින් රෑයෙහි පෙරයම මේ පළමුවන පූර්වෙනිවාස විද්‍යාව ලබන ලදී. අවිද්‍යාව නැසින. විද්‍යාව උපන. මොහඳුර නැසුණේ ය. විද්‍යාලොකය උපන. නො පමා ව කෙලෙස් තවන වැර ඇති ව මෙහෙයවූ සිත් ඇති ව වසන්නහුට යම් සේ (අවිද්‍යාවිඝාතාදිය වේ) නම් (මට ද) එසේ ම වී ය.

25. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය[1] චිත්තං අභිනින්නාමෙසිං. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ. යථාකම්මූපගෙ සත්තෙ පජානාමි: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා, වචීදුච්චරිතෙන සමන්නාගතා, මනොදුච්චරිතෙන සමන්නාගතා, අරියානං උපවාදකා, මිච්ඡාදිට්ඨිකා, මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා.[2] ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා, වචීසුචරිතෙන සමන්නාගතා, මනොසුචරිතෙන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ. යථාකම්මූපගෙ සත්තෙ පජානාමි. අයං ඛො මෙ බ්‍රාහ්මණ රත්තියා මජ්ඣිමෙ යාමෙ දුතියා විජ්ජා අධිගතා, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

26. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය[3] චිත්තං අභිනින්නාමෙසිං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං අබ්භඤ්ඤාසිං. අයං දුක්ඛසමුදයොති යථාභූතං අබ්භඤ්ඤාසිං. අයං දුක්ඛනිරොධොති යථාභූතං අබ්භඤ්ඤාසිං. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං අබ්භඤ්ඤාසිං: ඉමෙ ආසවාති යථාභූතං. අබ්භඤ්ඤාසිං. අයං ආසවසමුදයොති යථාභූතං අබ්භඤ්ඤාසිං. අයං ආසවනිරොධොති යථාභූතං අබ්භඤ්ඤාසිං. අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං අබ්භඤ්ඤාසිං. තස්ස මෙ එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චිත්ථ. භවාසවාපි චිත්තං විමුච්චිත්ථ. අවිජ්ජාසවාපි චිත්තං විමුච්චිත්ථ. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං අහොසි. 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති අබ්භඤ්ඤාසිං. අයං ඛො මෙ බ්‍රාහ්මණ රත්තියා පච්ඡිමෙ යාමෙ තතියා විජ්ජා අධිගතා, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

1. චුතූපපාතඤ්ඤාණාය - කත්ථචි. 2. උප්පන්නා - කත්ථචි.
3. ඛයඤ්ඤාණාය - කත්ථචි.

Free Distribution www.aathaapi.org

25. ඒ මම මෙසේ සමාධිගත සිත පිරිසිදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, (විෂ්කම්භණවශයෙන්) අඞ්ගණ නැති වූ කල්හි, උපක්ලේශ නැති වූ කල්හි, මෘදු වූ කල්හි, කාර්‍ය්‍යයට සුදුසු වූ කල්හි, ස්ථිර ව සිටි කල්හි, නො සැලෙනබවට පත් වූ කල්හි, සත්ත්වයන්ගේ ච්‍යුතිඋත්පත්ති දනගන්නා නුවණ පිණිස සිත වෙසෙසින් නතු කෙළෙමි. ඒ මම අතික්‍රාන්තමානුෂ පිරිසිදු වූ මිනිස්ඇස ඉක්මවූ දිවැසින් ච්‍යුත වන උපදින හීන ප්‍රණීත මනා පැහැ ඇති නොමනා පැහැ ඇති දුගතියට ගිය සුගතියට ගිය සත්ත්වයන් දක්මි. කර්‍ම වූ පරිදි පරලෝ ගිය සත්ත්වයන් දත්මි. ඒකාන්තයෙන් මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු වාග්දුශ්චරිතයෙන් යුක්ත වූවාහු මනෝදුශ්චරිතයෙන් යුක්ත වූවාහු ආර්‍ය්‍යයන්ට ගැරහුවාහු මිථ්‍යාදෘෂ්ටික වූවාහු මිථ්‍යාදෘෂ්ටිකර්‍ම සමාදන් වූවාහු ය. ඒ මොහු කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස ව වැටෙන නිරයෙහි උපන්නාහු ය. මේ භවත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්ත වූවාහු වාක්සුචරිතයෙන් යුක්ත වූවාහු මනස්සුචරිතයෙන් යුක්ත වූවාහු ආර්‍ය්‍යයන්ට නො ගැරහුවාහු සම්‍යග්දෘෂ්ටිකර්‍ම සමාදන් වූවාහු ය. ඒමොහු කාබුන් මරණින් මතු මනා ගති ඇති ස්වර්ගලොකයෙහි උපන්නාහු ය යි - මෙසේ වෙසෙසින් පිරිසිදු වූ මිනිස් ඇස ඉක්ම පැවැත්තා වූ දිවැසින් ච්‍යුත වන උපදින හීන ප්‍රණීත මනා පැහැ ඇති නොමනා පැහැ ඇති සුගතියට ගිය දුගතියට ගිය සත්ත්වයන් දක්මි. කර්‍ම වූ පරිදි පරලොව ගිය සත්ත්වයන් දත්මි. බමුණ, මා විසින් රැයෙහි මැදුම්යමෙහි මේ දෙවැනි (දිබ්බචක්ඛු) විද්‍යාව ලබන ලදී. (එහි වූ) අවිද්‍යාව නැසින. විද්‍යාව උපන. මොහඳුර නැසින. විදුළිය උපන. නො පමා ව කෙලෙස් තවන වැර ඇති ව දිවැස් නැණ පිණිස මෙහෙයවූ සිත්ඇති ව වසන්නහුට යම් සේ නම් (මට ද) එසේ ම විය.

26. ඒ මම මෙසේ සමාධිගත වූ සිත පිරිසිදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, (විෂ්කම්භණවශයෙන්)කෙලෙස් නැති වූ කල්හි, උපක්ලේශ නැති වූ කල්හි, මෘදු වූ කල්හි, කර්‍මයට සුදුසු වූ කල්හි, ස්ථිර ව සිටි කල්හි, නො සැලෙන බවට පත් වූ කල්හි ආස්‍රවක්ෂයකරඥානය (=කෙලෙස් නැති කරන නුවණ) පිණිස සිත වෙසෙසින් නතු කෙළෙමි. ඒ මම මේ (පඤ්චස්කන්ධය) දුක ය යි තත් වූ පරිදි දැන ගතිමි. මේ (තෘෂ්ණාව) දුක් ඉපදීමේ හෙතුව ය යි තත් වූ පරිදි දැන ගතිමි. මේ (තෘෂ්ණාවගේ නිරොධය) දුඃඛනිරොධ ය යි තත් වූ පරිදි දැන ගතිමි. මේ (අරිඅටඟිමග) දුක් නැති කිරීමේ ප්‍රතිපත්තිය යි තත් වූ පරිදි දැන ගතිමි. මොහු ආස්‍රවයහ යි තත් වූ පරිදි දැන ගතිමි. මේ ආස්‍රවසමුදය යි තත් වූ පරිදි දැන ගතිමි. මේ ආස්‍රවනිරොධ ය යි තත් වූ පරිදි දැන ගතිමි. මේ ආස්‍රවනිරොධගාමිනී ප්‍රතිපත්ති ය යි තත් වූ පරිදි දැන ගතිමි. මෙසේ දන්නා වූ මෙසේ දක්නා වූ ඒ මාගේ සිත කාමාස්‍රවයෙන් ද මිදුණේ ය. භවාස්‍රවයෙන් ද සිත මිදුණේ ය. අවිද්‍යාස්‍රවයෙන් ද සිත මිදුණේ ය. මිදුණු කල්හි මිදුණේ ය යි ප්‍රත්‍යවේක්ෂාඥානය පහළ වී ය. ‘ජාතිය අනුත්පාදවශයෙන් ක්ෂීණ වී ය. මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යය වැස නිමවන ලදී. සිවුමඟකිස කරන ලදී. මේ අර්හත්ත්වය පිණිස කළ යුතු අනෙක් කිසක් නොහොත් මේ වර්තමාන ස්කන්ධසන්තානයෙන් අන්‍ය වූ (අනාගත) පඤ්චස්කන්ධයක් නැතැ’යි දැන ගතිමි. බමුණ, මා විසින් රැයෙහි පැසුළුයමෙහි මේ තුන්වැනි විද්‍යාව ලබන ලදී. අවිද්‍යාව නසන ලදී. විද්‍යාව උපන. මොහඳුර නැසිණ. විද්‍යාලොකය උපන. නො පමා ව කෙලෙස් තවන වැර ඇති ව නිවන් පිණිස මෙහෙය වූ සිත් ඇති ව වසන්නහුට යම් සේ ද, (මට ද) එසේ ම වි ය.

27. සියා ඛො පන තෙ බ්‍රාහ්මණ එවමස්ස: අජ්ජාපි නූන සමණො ගොතමො අවීතරාගො අවීතදොසො අවීතමොහො, තස්මා අරඤ්ඤ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවතීති. න ඛො පනෙතං බ්‍රාහ්මණ එවං දට්ඨබ්බං. ද්වෙ ඛො අහං බ්‍රාහ්මණ අත්ථවසෙ සම්පස්සමානො අරඤ්ඤ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවාමි: අත්තනො ච දිට්ඨධම්මසුඛවිහාරං සම්පස්සමානො, පච්ඡිමඤ්ච ජනතං අනුකම්පමානොති.

28. අනුකම්පිතරූපායං[1] භොතා ගොතමෙන පච්ඡිමා ජනතා, යථා තං අරහතා සම්මාසම්බුද්ධෙන. අභික්කන්තං භො ගොතම. අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති[2] එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං[3] ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං[4] ගතන්ති.

භයභෙරවසුත්තං චතුත්ථං.

1. 1. 5

අනඞ්ගණසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි: ආවුසො භික්ඛවොති.[5] ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

2. චත්තාරො'මෙ ආවුසො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො? ඉධාවුසො එකච්චො පුග්ගලො සාඞ්ගණො' ව[6] සමානො 'අත්ථි මෙ අජ්ඣත්තං අඞ්ගණ'න්ති යථාභූතං නප්පජානාති. ඉධ පනාවුසො එකච්චො පුග්ගලො සාඞ්ගණො'ව[6] සමානො 'අත්ථි මෙ අජ්ඣත්තං අඞ්ගණ'න්ති යථාභූතං පජානාති. -

1. අනුකම්පිතරූපා වතායං - මජසං. සයා. 2. දක්ඛන්තීති - මජසං සයා. 3. භගවන්තං - මජසං. 4. සරණ ගතන්ති - කත්ථචි. 5. භික්ඛවෙති - මජසං. 6. සඞ්ගණොව - සයා.

27. බමුණ, ඔබට කිසිවිටක "ශ්‍රමණ ගෞතම තෙමේ අද දක්වාත් පහ නො වූ රාග ඇත්තේ ය. පහ නො වූ ද්වේෂ ඇත්තේ ය. පහ නො වූ මෝහ ඇත්තේ ය. එහෙයින් අරණ්‍යයෙහි වනප්‍රස්ථ ප්‍රාන්තශයනාසනයන් සේවනය කෙරේ ය"යි මෙවැනි අදහසක් විය හැකි ය. බමුණ, එය එසේ නො දත යුතු ය. බමුණ, මම තමාගේ දිට්ඨධම්මයෙහි ඉරියව්වූ සැප විහරණය දැකීම ය, පශ්චිම ජනතාවට අනුකම්පා කිරීම ය යන මේ කරුණු දෙක දක්නෙමි අරණ්‍යයෙහි වනප්‍රස්ථ ප්‍රාන්තශයනාසනයන් සේවනය කරමි.

28. අර්හත් වූ සම්මා සම්බුදුරජාණන් කෙනකුන් විසින් යම්සේ කටයුතු ද, එසේ භවත් ගෞතමයන් වහන්සේ විසින් මේ පශ්චිම ජනතා තොමෝ අනුකම්පිත ස්වභාව ඇත්තී ය. භවත් ගෞතමයන් වහන්ස, අතිශයින් කාන්ත ය. භවත් ගෞතමයන් වහන්ස, අතිශයින් ඉෂ්ට ය. භවත් ගෞතමයන් වහන්ස, යටිකුරු කළ දැයක් උඩුකුරු කරන්නේ හෝ වැසූ දැයක් විවෘත කරන්නේ හෝ (යා යුතු දෙස) මුළා වූවකුට මඟ කියන්නේ හෝ ඇස් ඇත්තාහු රූප දක්නාහ යි අන්ධකාරයෙහි තෙල් පහනක් දරන්නේ හෝ යම් සේ ද, එපරිද්දෙන් ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් මට දහම් දෙසන ලදී. ඒ මම භවත් ගෞතමයන් වහන්සේත් ධර්මයත් සඞ්ඝයාත් සරණ කොට යමි - පිහිටය යි දනිමි. ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවි හිමි කොට සරණ ගිය උපාසකයකු(කැපකරුවෙකු) ලෙස සලකන සේක්වා.

භයභෙරවසූත්‍රය සිවුවැනි යි.

1. 1. 5

අනඞ්ගණ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ අනේපිඩුසිටුහුගේ ජේතවන නම් ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ 'ඇවැත් මහණෙනි'යි භික්ෂූන් ඇමතූහ. ඒ භික්ෂූහු 'ඇවැත්නි'යි ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේට පිළිවදන් දුන්හ. ආයුෂ්මත් ශාරීපුත්‍ර-ස්ථවිරයන් වහන්සේ මෙය වදාළ සේක:

2. ඇවැත්නි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි වෙති. කවර සතර දෙනෙක යත්: ඇවැත්නි, මේ ලොකයෙහි එක් පුද්ගලයෙක් අඞ්ගණ - දූෂි කෙලෙස් සහිත වූයේ ම 'මා තුළ දූෂි කෙලෙස් ඇතැ'යි තතු සේ නො දනියි. ඇවැත්නි, මේ ලොකයෙහි එක් පුද්ගලයෙක් දූෂි කෙලෙස් සහිත වූයේ ම 'මා තුළ දූෂි කෙලෙස් ඇතැ'යි තතු සේ දනියි.

ඉධාවුසො එකච්චො පුග්ගලො අනඞ්ගණොව සමානො 'නත්ථි මෙ අජ්ඣත්තං අඞ්ගණ'න්ති යථාභූතං නප්පජානාති. ඉධ පනාවුසො එකච්චො පුග්ගලො අනඞ්ගණොව සමානො 'නත්ථි මෙ අජ්ඣත්තං අඞ්ගණ'න්ති යථාභූතං පජානාති. තත්‍රාවුසො ය්වායං පුග්ගලො සාඞ්ගණොව සමානො 'අත්ථි මෙ අජ්ඣත්තං අඞ්ගණ'න්ති යථාභූතං නප්පජානාති, අයං ඉමෙසං ද්වින්නං පුග්ගලානං සාඞ්ගණානංයෙව සතං හීනපුරිසො අක්ඛායති. තත්‍රාවුසො ය්වායං පුග්ගලො සාඞ්ගණොව සමානො 'අත්ථි මෙ අජ්ඣත්තං අඞ්ගණ'න්ති යථාභූතං පජානාති, අයං ඉමෙසං ද්වින්නං පුග්ගලානං සාඞ්ගණානංයෙව සතං සෙට්ඨපුරිසො අක්ඛායති. තත්‍රාවුසො ය්වායං පුග්ගලො අනඞ්ගණොව සමානො 'නත්ථි මෙ අජ්ඣත්තං අඞ්ගණ'න්ති යථාභූතං නප්පජානාති, අයං ඉමෙසං ද්වින්නං පුග්ගලානං අනඞ්ගණානංයෙව සතං හීනපුරිසො අක්ඛායති. තත්‍රාවුසො ය්වායං පුග්ගලො අනඞ්ගණොව සමානො 'නත්ථි මෙ අජ්ඣත්තං අඞ්ගණ'න්ති යථාභූතං පජානාති, අයං ඉමෙසං ද්වින්නං පුග්ගලානං අනඞ්ගණානංයෙව සතං සෙට්ඨපුරිසො අක්ඛායතීති.

3. එවං වුත්තෙ ආයස්මා **මහාමොග්ගල්ලානො** ආයස්මන්තං **සාරිපුත්තං** එතදවොච: කො නු ඛො ආවුසො සාරිපුත්ත හෙතු කො පච්චයො, යෙනිමෙසං ද්වින්නං පුග්ගලානං සාඞ්ගණානංයෙව සතං එකො හීනපුරිසො අක්ඛායති? එකො සෙට්ඨපුරිසො අක්ඛායති? කො පනාවුසො සාරිපුත්ත හෙතු කො පච්චයො, යෙනිමෙසං ද්වින්නං පුග්ගලානං අනඞ්ගණානංයෙව සතං එකො හීනපුරිසො අක්ඛායති? එකො සෙට්ඨපුරිසො අක්ඛායතීති?

4. තත්‍රාවුසො ය්වායං පුග්ගලො සාඞ්ගණොව සමානො 'අත්ථි මෙ අජ්ඣත්තං අඞ්ගණ'න්ති යථාභූතං නප්පජානාති, තස්සෙතං පාටිකඞ්ඛං: න ඡන්දං ජනෙස්සති, න වායමිස්සති, න විරියං[1] ආරභිස්සති තස්සඞ්ගණස්ස පහානාය. සො සරාගො සදොසො සමොහො සාඞ්ගණො සඞ්කිලිට්ඨචිත්තො කාලං කරිස්සති. සෙය්‍යථාපි ආවුසො කංසපාති[2] ආභතා ආපණා වා කම්මාරකුලා වා රජෙන ච මලෙන ච පරියොනද්ධා, තමෙනං සාමිකා න චෙව පරිභුඤ්ජෙය්‍යුං, න ච පරියොදපෙය්‍යුං, රජාපථෙ ච නං නික්ඛිපෙය්‍යුං, එවං හි සා ආවුසො කංසපාති අපරෙන සමයෙන සඞ්කිලිට්ඨතරා අස්ස මලග්ගහිතාති.[3] එවමාවුසොති. එවමෙව ඛො ආවුසො ය්වායං පුග්ගලො සාඞ්ගණොව සමානො 'අත්ථි මෙ අජ්ඣත්තං අඞ්ගණ'න්ති යථාභූතං නප්පජානාති, තස්සෙතං පාටිකඞ්ඛං: න ඡන්දං ජනෙස්සති, න වායමිස්සති, න විරියං ආරභිස්සති තස්සඞ්ගණස්ස පහානාය. සො සරාගො සදොසො සමොහො සාඞ්ගණො සඞ්කිලිට්ඨචිත්තො කාලං කරිස්සති.

---

1. විරියං - මජසං. 2. කංසපාති - PTS.
3. මලග්ගහිතාති - සහා.

ඇවැත්නි, මේ ලෝකයෙහි එක් පුද්ගලයෙක් දූෂි කෙලෙස් රහිත වූයේ ම 'මා තුළ දූෂි කෙලෙස් නැතැ'යි තතු සේ නො දනියි. ඇවැත්නි, මේ ලෝකයෙහි එක් පුද්ගලයෙක් දූෂි කෙලෙස් රහිත වූයේ ම 'මා තුළ දූෂි කෙලෙස් නැතැ'යි තතු සේ දනියි. ඇවැත්නි, එහි ලා යම් මේ පුද්ගලයෙක් දූෂි කෙලෙස් සහිත වූයේ ම 'මා තුළ දූෂි කෙලෙස් ඇතැ'යි තතු සේ නො දනී ද, මේ පුද්ගලයා දූෂි කෙලෙස් සහිත වූ ම පුද්ගලයන් දෙදෙනා අතුරෙන් හීනපුරුෂයා ය යි කියනු ලැබේ. එහි යම් මේ පුද්ගලයෙක් දූෂි කෙලෙස් සහිත වූයේ ම 'මා තුළ දූෂි කෙලෙස් ඇතැ'යි තතු සේ දනී ද, මේ තෙම දූෂි කෙලෙස් සහිත වූ ම මේ පුද්ගලයන් දෙදෙනා අතුරෙන් ශ්‍රේෂ්ඨපුරුෂයා ය යි කියනු ලැබේ. ඇවැත්නි, ඔවුන් අතුරෙන් යම් මේ පුද්ගලයෙක් දූෂි කෙලෙස් රහිත වූයේ ම 'මා තුළ දූෂි කෙලෙස් නැතැ'යි තතු සේ නො දනී ද, මේ තෙම දූෂි කෙලෙස් රහිත වූ ම මේ පුද්ගලයන් දෙදෙනා අතුරෙන් හීන පුරුෂයා ය යි කියනු ලැබේ. ඇවැත්නි, ඔවුන් අතුරෙන් යම් මේ පුද්ගලයෙක් දූෂි කෙලෙස් රහිත වූයේ ම 'මා තුළ දූෂි කෙලෙස් නැතැ'යි තතු සේ දනී ද, මේ තෙම දූෂි කෙලෙස් රහිත වූ ම මේ පුද්ගලයන් දෙදෙනා අතුරෙන් ශ්‍රේෂ්ඨ පුරුෂයා ය යි කියනු ලැබේ.

3. මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් **මහමුගලන්** තෙරුන් වහන්සේ ආයුෂ්මත් **සැරියුත්** තෙරුන් වහන්සේට මෙය වදාළ සේක: ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, යම් හෙතුවකින් දූෂි කෙලෙස් සහිත වූ ම මේ පුද්ගලයන් දෙදෙනා අතුරෙන් එකෙක් හීන පුද්ගලයා යි කියනු ලැබේ ද, එකෙක් ශ්‍රේෂ්ඨ පුද්ගලයා ය යි කියනු ලැබේ ද, ඊට හෙතු කවරේ ද ? ඊට ප්‍රත්‍යය කවරේ ද? ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, දූෂි කෙලෙස් රහිත වූ ම මේ පුද්ගලයන් දෙදෙනා අතුරෙන් යම් හෙයකින් එකෙක් හීන ය යි කියනු ලැබේ ද, එකෙක් ශ්‍රේෂ්ඨ ය යි කියනු ලැබේ ද, ඊට හෙතු කවරේ ද ? ඊට ප්‍රත්‍යය කවරේ ද ?

4. ඇවැත්නි, ඔවුන් අතුරෙන් යම් මේ පුද්ගලයෙක් තෙම දූෂි කෙලෙස් සහිත වූයේ ම 'මා තුළ දූෂි කෙලෙස් ඇතැ'යි තතු සේ නො දනී ද, (හෙතෙමේ) ඒ දූෂි කෙලෙස් නැති කිරීම පිණිස කැමැත්ත නූපදවන්නේ ය. වෑයම් නො කරන්නේ ය. වැර නො අරඹන්නේ ය. හෙතෙම රාග සහිත වූයේ ද්වේෂ සහිත වූයේ මෝහ සහිත වූයේ දූෂි කෙලෙස් සහිත වූයේ කිලුටුසිත් ඇති වූයේ කාලක්‍රියා කරන්නේ ය යන මෙය ඔහු පිළිබඳ ව බලාපොරොත්තු විය යුතුයි. ඇවැත්නි, යම් සේ සල්පිළින් හෝ කඹුරුකුලයකින් හෝ ගෙනෙන ලද ධූලියෙන් හා මලකඩින් ද බැඳුණු කස්ලෝතලියක් වේ ද, එය හිමියෝ පරිභෝග නො කෙරෙත් නම්, පිරිසිදු නො කෙරෙත් නම්, එය ධූලි සහිත තන්හි දමත් නම්, ඇවැත්නි, මෙසේ ඒ කස්ලෝතලිය පසුකාලයෙක ඉතා කිලුටු වූවක් මල බැඳුනක් වන්නේ ද ? ඇවැත්නි, එය එසේ ය. ඇවැත්නි, එපරිද්දෙන් ම යම් මේ පුද්ගලයෙක් දූෂි කෙලෙස් සහිත වූයේ ම 'මා තුළ දූෂි කෙලෙස් ඇතැ'යි තතු සේ නො දනී ද, (හෙතෙමේ) දූෂි කෙලෙස් නැති කිරීම පිණිස කැමැත්ත නූපදවන්නේ ය. වෑයම් නො කරන්නේ ය, වැර නො අරඹන්නේ ය. හෙතෙම රාග සහිත වූයේ ද්වේෂ සහිත වූයේ මෝහ සහිත වූයේ දූෂි කෙලෙස් සහිත වූයේ කිලුටු සිත් ඇත්තේ කළුරිය කරන්නේ ය යන මෙය ඔහු පිළිබඳ ව බලාපොරොත්තු විය යුතුය.

5. තත්‍රාවුසො ය්වායං පුග්ගලො සාඞ්ගණොව සමානො 'අත්ථි මෙ අජ්ඣත්තං අඞ්ගණ'න්ති යථාභූතං පජානාති, තස්සෙතං පාටිකඞ්ඛං: ඡන්දං ජනෙස්සති, වායමිස්සති විරියං ආරභිස්සති තස්සඞ්ගණස්ස පහානාය. සො අරාගො අදොසො අමොහො අනඞ්ගණො අසඞ්කිලිට්ඨචිත්තො කාලං කරිස්සති. සෙය්‍යථාපි ආවුසො කංසපාති[1] ආහතා ආපණා වා කම්මාරකුලා වා රජෙන ච මලෙන ච පරියොනද්ධා, තමෙනං සාමිකා පරිභුඤ්ජෙය්‍යුඤ්චෙව පරියොදපෙය්‍යුඤ්ච, න ච නං[2] රජාපථෙ නික්ඛිපෙය්‍යුං, එවං හි සා ආවුසො කංසපාති අපරෙන සමයෙන පරිසුද්ධා[3] අස්ස පරියොදාතාති. එවමාවුසොති. එවමෙව ඛො ආවුසො ය්වායං පුග්ගලො සාඞ්ගණොව සමානො 'අත්ථි මෙ අජ්ඣත්තං අඞ්ගණ'න්ති යථාභූතං පජානාති, තස්සෙතං පාටිකඞ්ඛං: ඡන්දං ජනෙස්සති, වායමිස්සති, විරියං ආරභිස්සති තස්සඞ්ගණස්ස පහානාය. සො අරාගො අදොසො අමොහො අනඞ්ගණො අසඞ්කිලිට්ඨචිත්තො කාලං කරිස්සති.

6. තත්‍රාවුසො ය්වායං පුග්ගලො අනඞ්ගණොව සමානො 'නත්ථි මෙ අජ්ඣත්තං අඞ්ගණ'න්ති යථාභූතං නප්පජානාති; තස්සෙතං පාටිකඞ්ඛං: සුභනිමිත්තං මනසි කරිස්සති. තස්ස සුභනිමිත්තස්ස මනසිකාරා රාගො චිත්තං අනුද්ධංසෙස්සති. සො සරාගො සදොසො සමොහො සාඞ්ගණො සඞ්කිලිට්ඨචිත්තො කාලං කරිස්සති. සෙය්‍යථාපි ආවුසො කංසපාති ආහතා ආපණා වා කම්මාරකුලා වා පරිසුද්ධා පරියොදාතා, තමෙනං සාමිකා න චෙව පරිභුඤ්ජෙය්‍යුං, න ච පරියොදපෙය්‍යුං, රජාපථෙ ච නං නික්ඛිපෙය්‍යුං, එවං හි සා ආවුසො කංසපාති අපරෙන සමයෙන සඞ්කිලිට්ඨා අස්ස මලග්ගහිතාති. එවමාවුසොති. එවමෙව ඛො ආවුසො ය්වායං පුග්ගලො අනඞ්ගණොව සමානො 'නත්ථි මෙ අජ්ඣත්තං අඞ්ගණ'න්ති යථාභූතං නප්පජානාති, තස්සෙතං පාටිකඞ්ඛං: සුභනිමිත්තං මනසි කරිස්සති. තස්ස සුභනිමිත්තස්ස මනසිකාරා රාගො චිත්තං අනුද්ධංසෙස්සති. සො සරාගො සදොසො සමොහො සාඞ්ගණො සඞ්කිලිට්ඨචිත්තො කාලං කරිස්සති.

7. තත්‍රාවුසො ය්වායං පුග්ගලො අනඞ්ගණොව සමානො 'නත්ථි මෙ අජ්ඣත්තං අඞ්ගණ'න්ති යථාභූතං පජානාති, තස්සෙතං පාටිකඞ්ඛං: සුභනිමිත්තං න මනසි කරිස්සති. තස්ස සුභනිමිත්තස්ස අමනසිකාරා[4] රාගො චිත්තං නානුද්ධංසෙස්සති. සො අරාගො අදොසො අමොහො අනඞ්ගණො අසඞ්කිලිට්ඨචිත්තො කාලං කරිස්සති. සෙය්‍යථාපි ආවුසො කංසපාති ආහතා ආපණා වා කම්මාරකුලා වා පරිසුද්ධා පරියොදාතා, තමෙනං සාමිකා පරිභුඤ්ජෙය්‍යුඤ්චෙව පරියොදපෙය්‍යුඤ්ච, න ච නං රජාපථෙ නික්ඛිපෙය්‍යුං, එවං හි සා ආවුසො කංසපාති අපරෙන සමයෙන පරිසුද්ධතරා අස්ස පරියොදාතාති. එවමාවුසොති.

---

1. කංසපාති - PTS.
2. නෙව නං - කඵචි.
3. පරිසුද්ධතර - මජසං. PTS.
4. න මනසිකරා - සෑ.

Free Distribution www.aathaapi.org

5. ඇවැත්නි, ඔවුන් අතුරෙන් යම් මේ පුද්ගලයෙක් දූෂි කෙලෙස් සහිත වූයේ ම 'මා තුළ දූෂි කෙලෙස් ඇතැ'යි තතු සේ දනී ද, (හෙතෙමේ) ඒ දූෂි කෙලෙස් නැති කිරීම පිණිස කැමැත්ත උපදවන්නේ ය, වෑයම් කරන්නේ ය, වැර අරඹන්නේ ය. හෙතෙමේ රාග රහිත වූයේ ද්වේෂ රහිත වූයේ මෝහ රහිත වූයේ දූෂි කෙලෙස් නැත්තේ නො කිලිටි සිත් ඇත්තේ කලුරිය කරන්නේ ය යන මෙය ඔහු පිළිබඳ ව බලාපොරොත්තු විය යුතුයි. ඇවැත්නි, යම් සේ සල්පිලින් හෝ කඹුරුකුලයකින් හෝ ගෙනෙන ලද ධූලියෙන් හා මලකඩින් ද බැඳුණු කස්ලෝතලියක් වේ ද, හිමියෝ එය පරිභොග කරන්නාහු නම්, පිරිසුදු කරන්නාහු නම්, එය ධූලි සහිත තන්හි නො බහන්නාහු නම්, ඇවැත්නි, මෙසේ ඒ කස්ලෝතලිය පසු කලෙක ඉතා පිරිසුදු වන්නේ ද ? ඉතා ප්‍රභාස්වරත් වන්නේ ද ? ඇවැත්නි, එය එසේ ය. ඇවැත්නි, එපරිද්දෙන් ම යම් මේ පුද්ගලයෙක් දූෂි කෙලෙස් සහිත වූයේ ම 'මා තුළ දූෂි කෙලෙස් ඇතැ'යි තතු සේ දනී ද, (හෙතෙමේ) ඒ දූෂි කෙලෙස් නැති කිරීම පිණිස කැමැත්ත උපදවන්නේ ය, වෑයම් කරන්නේ ය, වැර අරඹන්නේ ය හෙතෙම රාග රහිත වූයේ ද්වේෂ රහිත වූයේ මොහ රහිත වූයේ දූෂි කෙලෙස් නැත්තේ කිලුටු නො වූ සිත් ඇත්තේ කලුරිය කරන්නේ ය යන මෙය ඔහු පිළිබඳව බලාපොරොත්තු විය යුතු ය.

6. ඇවැත්නි, ඔවුන් අතුරෙන් යම් පුද්ගලයෙක් අඞ්ගණ රහිත වූයේ ම 'මා තුළ අඞ්ගණ නැතැ'යි තතු සේ නො දනී ද, හෙතෙමේ ශුභ වූ අරමුණක් මෙනෙහි කරන්නේ ය. ඒ ශුභ වූ අරමුණ මෙනෙහි කිරීම නිසා රාගය (ඔහුගේ) සිත මැඩ ගෙන සිටියි. හෙතෙම රාග සහිත වූයේ ද්වේෂ සහිත වූයේ මොහ සහිත වූයේ දූෂි කෙලෙස් සහිත වූයේ කිලුටු සිත් ඇති වූයේ කලුරිය කරන්නේ ය යන මෙය ඔහු පිළිබඳ ව බලාපොරොත්තු විය යුතු ය. ඇවැත්නි, යම් සේ සල්පිලින් හෝ කඹුරුකුලයකින් හෝ ගෙනෙන ලද පිරිසිදු ප්‍රභාස්වර කස්ලෝතලියක් වේ ද, එය හිමියෝ පරිභොග නො කරන්නාහු නම්, පිරිසුදු නො කරන්නාහු නම්, එය ධූලි සහිත තන්හි බහන්නාහු නම්, ඇවැත්නි, මෙසේ ඒ කස්ලෝතලිය පසු කලෙක කිලුටු වූයේත් මල බැඳුණේත් වේ ද ? ඇවැත්නි, එය එසේ ය. ඇවැත්නි, එපරිද්දෙන් ම යම් මේ පුද්ගලයෙක් අඞ්ගණ රහිත වූයේ ම 'මා තුළ අඞ්ගණ නැතැ'යි තතු සේ නො දනියි ද, හෙතෙමේ ශුභ වූ අරමුණක් මෙනෙහි කරන්නේ ය. ඒ ශුභ වූ අරමුණ මෙනෙහි කිරීම නිසා රාගය සිත මැඩ ගෙන සිටී. හෙතෙම රාග සහිත වූයේ ද්වේෂ සහිත වූයේ මෝහ සහිත වූයේ අඞ්ගණ සහිත වූයේ කිලුටු සිත් ඇති වූයේ කලුරිය කරන්නේ ය යන මෙය ඔහු පිළිබඳ ව බලාපොරොත්තු විය යුතුයි.

7. ඇවැත්නි, ඔවුන් අතුරෙන් යම් පුද්ගලයෙක් තෙම අඞ්ගණ රහිත වූයේ ම 'මං තුළ අඞ්ගණ නැතැ'යි තතු සේ දනී ද, (හෙතෙමේ) ශුභනිමිත්ත මෙනෙහි නො කරන්නේ ය. ඒ ශුභනිමිත්ත මෙනෙහි නො කිරීමෙන් රාගය (ඔහුගේ) සිත නො මඩින්නේ ය. හෙතෙම රාග නැත්තේ ද්වේෂ නැත්තේ මොහ නැත්තේ අඞ්ගණ නැත්තේ නො කිලිටු සිත් ඇත්තේ කලුරිය කරන්නේ ය යන මෙය ඔහු පිළිබඳ ව බලාපොරොත්තු විය යුතු ය. ඇවැත්නි, යම් සේ සල්පිලින් හෝ කඹුරුකුලයකින් හෝ ගෙනෙන ලද පිරිසිදු වූ හාත්පසින් බබලන කස්ලෝතලියක් වේ ද, එය හිමියෝ පරිභොග කරන්නාහු නම්, පිරිසුදු කරන්නාහු නම්, එය ධූලි සහිත තන්හි නො බහන්නාහු නම්, ඇවැත්නි, මෙසේ ඒ කස්ලෝතලිය පසු කලෙක ඉතා පිරිසුදු වූයේත් හාත්පසින් බබලන්නේත් වේ ද ? ඇවැත්නි, එය එසේ ය.

එවමෙව ඛො ආවුසො[1] ය්වායං පුග්ගලො අනඞ්ගණොව සමානො 'නත්ථි මෙ අජ්ඣත්තං අඞ්ගණ'න්ති යථාභූතං පජානාති, තස්සෙතං පාටිකඞ්ඛං: සුභනිමිත්තං න මනසි කරිස්සති, තස්ස සුභනිමිත්තස්ස අමනසිකාරා රාගො චිත්තං නානුද්ධංසෙස්සති, සො අරාගො අදොසො අමොහො අනඞ්ගණො අසඞ්කිලිට්ඨචිත්තො කාලං කරිස්සති.

8. අයං ඛො ආවුසො මොග්ගල්ලාන, හෙතු, අයං පච්චයො, යෙනිමෙසං ද්වින්නං පුග්ගලානං සාඞ්ගණානංයෙව සතං එකො හීනපුරිසො අක්ඛායති, එකො සෙට්ඨපුරිසො අක්ඛායති. අයං පනාවුසො මොග්ගල්ලාන හෙතු, අයං පච්චයො, යෙනිමෙසං ද්වින්නං පුග්ගලානං අනඞ්ගණානංයෙව සතං එකො හීනපුරිසො අක්ඛායති, එකො සෙට්ඨපුරිසො අක්ඛායතීති.

9. අඞ්ගණං අඞ්ගණන්ති ආවුසො වුච්චති. කිස්ස නු ඛො එතං ආවුසො අධිවචනං යදිදං අඞ්ගණන්ති? පාපකානං ඛො එතං ආවුසො අකුසලානං ඉච්ඡාවචරානං අධිවචනං යදිදං අඞ්ගණන්ති.

10. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති - යං ඉධෙකච්චස්ස භික්ඛුනො එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: ආපත්තිඤ්ච වත[2] ආපන්නො අස්සං, න චෙව මං භික්ඛූ ජානෙය්‍යුං: ආපත්තිං ආපන්නොති. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති - යං තං භික්ඛුං භික්ඛූ ජානෙය්‍යුං: ආපත්තිං ආපන්නොති; 'ජානන්ති මං[3] භික්ඛූ ආපත්තිං ආපන්නො'ති, ඉති සො කුපිතො හොති අප්පතීතො. යො චෙව ඛො ආවුසො කොපො යො ච අප්පච්චයො උභයමෙතං අඞ්ගණං.

11. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති - යං ඉධෙකච්චස්ස භික්ඛුනො එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: ආපත්තිඤ්ච වත ආපන්නො අස්සං, අනුරහො මං භික්ඛූ චොදෙය්‍යුං, නො සඞ්ඝමජ්ඣෙති. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති- යං තං භික්ඛුං භික්ඛූ සඞ්ඝමජ්ඣෙ චොදෙය්‍යුං, නො අනුරහො, 'සඞ්ඝමජ්ඣෙ මං භික්ඛූ චොදෙන්ති, නො අනුරහො'ති. ඉති සො කුපිතො හොති අප්පතීතො. යො චෙව ඛො ආවුසො කොපො යො ච අප්පච්චයො උභයමෙතං අඞ්ගණං.

12. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති - යං ඉධෙකච්චස්ස භික්ඛුනො එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: ආපත්තිඤ්ච වත ආපන්නො අස්සං, සප්පටිපුග්ගලො මං චොදෙය්‍ය, නො අප්පටිපුග්ගලොති. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති - යං තං භික්ඛුං අප්පටිපුග්ගලො චොදෙය්‍ය, නො සප්පටිපුග්ගලො, 'අප්පටිපුග්ගලො මං චොදෙති, නො සප්පටිපුග්ගලො'ති, ඉති සො කුපිතො හොති අප්පතීතො. යො චෙව ඛො ආවුසො කොපො යො ච අප්පච්චයො උභයමෙතං අඞ්ගණං.

1. පනාවුසො - සයා. 2. වතාහං - කම්බො.
3. න ච මං - මජසං. සයා

ඇවැත්නි, එපරිද්දෙන් ම යම් ඒ පුද්ගලයෙක් අඞ්ගණ රහිත වූයේ 'මා තුළ අඞ්ගණ නැතැ'යි තතු සේ දනී ද, හෙතෙමේ ශුභනිමිත්ත මෙතෙහි නො කරන්නේ ය, ඒ ශුභනිමිත්ත මෙතෙහි නො කිරීමෙන් රාගය (ඔහුගේ) සිත නො මඩින්නේ ය, හෙතෙම රාගය නැත්තේ ද්වෙෂය නැත්තේ මොහය නැත්තේ අඞ්ගණ නැත්තේ නො කිලිටි සිත් ඇත්තේ කලුරිය කරන්නේ ය යන මෙය ඔහු පිළිබඳ ව බලාපොරොත්තු විය යුතු ය.

8. ඇවැත්නි මුගලන, යම් හෙයකින් අඞ්ගණ සහිත වූ ම මේ පුද්ගලයන් දෙදෙනා අතුරෙන් එකෙක් හීන පුරුෂයා යි කියනු ලැබේ ද, එකෙක් ශ්‍රෙෂ්ඨ පුරුෂයා යි කියනු ලැබේ ද, එයට හෙතුව මෙය යි. ප්‍රත්‍යය මෙය යි. අඞ්ගණ රහිත වූ ම මේ පුද්ගලයන් දෙදෙනා අතුරෙනුත් එකෙක් හීන පුරුෂයා යි කියනු ලබන්නේත් එකෙක් ශ්‍රෙෂ්ඨ පුරුෂයා යි කියනු ලබන්නේත් මේ හෙතුවෙනි. මේ ප්‍රත්‍යයෙනි.

9. ඇවැත්නි, 'අඞ්ගණ ය, අඞ්ගණ ය'යි කියනු ලැබේ. ඇවැත්නි, 'අඞ්ගණ' යන මෙය කුමකට නමක් ද ? ඇවැත්නි, 'අඞ්ගණ' යන මෙය කාමවශයෙන් සිතෙහි හැසිරෙන පාපධර්මයන්ට නමෙකි.

10. ඇවැත්නි, මේ කාරණය විද්‍යමාන වෙයි. එනම් "යම් හෙයකින් මේ ශාසනයෙහි ඇතැම් මහණකුහට මෙබඳු ආශාවක් උපදින්නේ ය: "මම ඇවැතට එකාන්තයෙන් පැමිණියෙම් නමුත් 'මෙතෙමේ ඇවැතට පැමිණියේ ය'යි භික්ෂූහු මා නො දන්නාහු නම් මැනැවැ" යි යනුයි. ඇවැත්නි, භික්ෂූහු ඒ මහණ ඇවැතට පැමිණියේ ය යි දන්නාහු ය" යන යමක් වේ නම් මේ කාරණය විද්‍යමාන වෙයි. 'භික්ෂූහු (මෙතෙමේ) ඇවැතට පැමිණියේය'යි මා දනිතැයි මෙසේ හෙතෙමේ කිපියේ නොසතුටු වූයේ වෙයි. ඇවැත්නි, යම් කොපයෙකුත් වේ ද, යම් නො සතුටුබවෙකුත් වේ ද, මේ දෙක ම අඞ්ගණයි.

11. ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් මහණකුහට 'මම එකාන්තයෙන් ඇවැතට පැමිණියෙම් නමුදු 'භික්ෂූහු මට රහසිගත ව චොදනා කරන්නාහු නම්, සඝමැද චොදනා නො කරන්නාහු නම්, යෙහෙක' යන ආශාව උපදනේ ය" යන යම් මේ කාරණයක් වේ ද, එය විද්‍යමාන වෙයි. ඇවැත්නි, භික්ෂූහු ඒ මහණහට සඝමැද චොදනා කරන්නාහු ද, රහසිගත ව චොදනා නො කරන්නාහු ද යන මේ කරුණ ද විද්‍යමාන වෙයි "භික්ෂූහු මට සඝමැද චොදනා කෙරෙත්. රහසිගත ව චොදනා නො කෙරෙත්"යි මෙසේ හෙතෙම කිපියේ වෙයි. අසතුටු වූයේ වෙයි. ඇවැත්නි, (මෙසේ) යම් කොපයෙකුත් වේ ද, යම් අසතුටෙකුත් වේ ද, මේ දෙක ම අඞ්ගණ යි.

12. ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් මහණකුහට "මම එකාන්තයෙන් ඇවැතට පැමිණියෙම් නමුත් සමාන පුද්ගලයෙක් මට චොදනා කෙරේ නම්, අසමාන පුද්ගලයෙක් චොදනා නො කෙරේ නම්, යෙහෙක යන ආශාව උපදනේ ය" යන යම් මේ කාරණයක් වේ ද, එය විද්‍යමාන වෙයි. ඇවැත්නි, අසමාන පුද්ගලයෙක් ඒ මහණහට චොදනා කෙරේ ද, සමාන පුද්ගලයෙක් චොදනා නො කෙරේ ද යන මේ කාරණය විද්‍යමාන වෙයි. "අසමාන පුද්ගලයෙක් මට චොදනා කෙරෙයි. සමාන පුද්ගලයෙක් චොදනා නො කෙරේ ය"යි හෙතෙම කිපියේ අසතුටු වූයේ වෙයි. ඇවැත්නි, එහි ලා යම් කොපයකුත් වේ ද, යම් නො සතුටෙකුත් වේ ද, මේ දෙක ම අඞ්ගණයි.

13. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති – යං ඉධෙකච්චස්ස භික්ඛුනො එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: "අහො වත මමෙව සත්ථා පටිපුච්ඡිත්වා පටිපුච්ඡිත්වා භික්ඛූනං ධම්මං දෙසෙය්‍ය, න අඤ්ඤං භික්ඛුං සත්ථා පටිපුච්ඡිත්වා පටිපුච්ඡිත්වා භික්ඛූනං ධම්මං දෙසෙය්‍යා''ති. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති – යං අඤ්ඤං භික්ඛුං සත්ථා පටිපුච්ඡිත්වා පටිපුච්ඡිත්වා භික්ඛූනං ධම්මං දෙසෙය්‍ය, න තං භික්ඛුං සත්ථා පටිපුච්ඡිත්වා පටිපුච්ඡිත්වා භික්ඛූනං ධම්මං දෙසෙය්‍ය. "අඤ්ඤං භික්ඛුං සත්ථා පටිපුච්ඡිත්වා පටිපුච්ඡිත්වා භික්ඛූනං ධම්මං දෙසෙති. න මං සත්ථා පටිපුච්ඡිත්වා පටිපුච්ඡිත්වා භික්ඛූනං ධම්මං දෙසෙතී''ති ඉති සො කුපිතො හොති අප්පතීතො. යො චෙව ඛො ආවුසො කොපො යො ච අප්පච්චයො උභයමෙතං අඞ්ගණං.

14. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති – යං ඉධෙකච්චස්ස භික්ඛුනො එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: "අහො වත මමෙව භික්ඛූ පුරක්ඛත්වා පුරක්ඛත්වා ගාමං භත්තාය පවිසෙය්‍යුං, න අඤ්ඤං භික්ඛුං භික්ඛූ පුරක්ඛත්වා පුරක්ඛත්වා ගාමං භත්තාය පවිසෙය්‍යු''න්ති. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති – යං අඤ්ඤං භික්ඛුං භික්ඛූ පුරක්ඛත්වා පුරක්ඛත්වා ගාමං භත්තාය පවිසෙය්‍යුං, න තං භික්ඛුං භික්ඛූ පුරක්ඛත්වා පුරක්ඛත්වා ගාමං භත්තාය පවිසෙය්‍යුං. "අඤ්ඤං භික්ඛුං භික්ඛූ පුරක්ඛත්වා පුරක්ඛත්වා ගාමං භත්තාය පවිසන්ති. න මං භික්ඛූ පුරක්ඛත්වා පුරක්ඛත්වා ගාමං භත්තාය පවිසන්තී''ති ඉති සො කුපිතො හොති අප්පතීතො. යො චෙව ඛො ආවුසො කොපො යො ච අප්පච්චයො උභයමෙතං අඞ්ගණං.

15. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති – යං ඉධෙකච්චස්ස භික්ඛුනො එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: "අහො වත අහමෙව ලභෙය්‍යං භත්තග්ගෙ අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩං. න අඤ්ඤො භික්ඛු ලභෙය්‍ය භත්තග්ගෙ අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩ''න්ති. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති – යං අඤ්ඤො භික්ඛු ලභෙය්‍ය භත්තග්ගෙ අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩං, න සො භික්ඛු ලභෙය්‍ය භත්තග්ගෙ අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩං. "අඤ්ඤො භික්ඛු ලභති භත්තග්ගෙ අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩං. නාහං ලභාමි භත්තග්ගෙ අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩ''න්ති ඉති සො කුපිතො හොති අප්පතීතො. යො චෙව ඛො ආවුසො කොපො යො ච අප්පච්චයො උභයමෙතං අඞ්ගණං.

13. ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් මහණකුට "ශාස්තෘන් වහන්සේ මා ම පිළිවිස පිළිවිස භික්ෂූන්ට දහම් දෙසන සේක් නම්, ශාස්තෘන් වහන්සේ අන් මහණකු පිළිවිස පිළිවිස භික්ෂූන්ට දහම් නො දෙසන සේක් නම් යෙහෙක" යන ආශාව උපදනේ ය යන යම් කාරණයක් වේ ද, එය විද්‍යමාන වෙයි. ඇවැත්නි, ශාස්තෘන් වහන්සේ අන් මහණකු පිළිවිස පිළිවිස භික්ෂූන්ට ධර්ම දේශනා කරන සේක් නම්, ශාස්තෘන් වහන්සේ ඒ මහණහු පිළිවිස පිළිවිස භික්ෂූන්ට ධර්මදේශනා නො කරණ සේක් නම්, "ශාස්තෘන් වහන්සේ අන් මහණකු පිළිවිස පිළිවිස භික්ෂූන්ට ධර්ම දේශනා කරන සේක. ශාස්තෘන් වහන්සේ මා පිළිවිස පිළිවිස භික්ෂූන්ට ධර්ම දේශනා නො කරන සේකැ"යි හෙතෙම කිපියේ අසතුටු වූයේ වෙයි යන යම් කාරණයක් වේ ද, එයත් විද්‍යමාන වෙයි. ඇවැත්නි, එහි යම් කොපයෙකුත් වේ ද, යම් අසතුටෙකුත් වේ ද, ඒ දෙක ම අඞ්ගණ යි.

14. ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් මහණකුහට "භික්ෂූහු මා ම පෙරටු කොට පෙරටු කොට බත් පිණිස ගමට පිවිසෙත් නම්, භික්ෂූහු අන් මහණකු පෙරටු කොට පෙරටු කොට පිඬු පිණිස ගමට නො පිවිසෙත් නම්, ඉතා මැනව" යන ආශාව උපදනේ ය යන යම් කාරණයක් වේ ද, එය විද්‍යමාන වෙයි. ඇවැත්නි, භික්ෂූහු අන් මහණකු පෙරටු කොට පෙරටු කොට බත් පිණිස ගමට පිවිසෙත් නම්, භික්ෂූහු ඒ මහණහු පෙරටු කොට පෙරටු කොට පිඬු පිණිස ගමට නො පිවිසෙත් නම්, "භික්ෂූහු අන් මහණකු පෙරටු කොට පෙරටු කොට පිඬු පිණිස ගමට පිවිසෙත්තාහු ය. භික්ෂූහු මා පෙරටු කොට පෙරටු කොට පිඬු පිණිස ගමට නො පිවිසෙත්තාහු ය"යි හෙතෙම කිපෙයි. නො සතුටු වෙයි යන යම් කාරණයක් වේ ද, (එය) විද්‍යමාන වෙයි. ඇවැත්නි, එහි යම් කොපයෙකුත් වේ ද යම් අසතුටෙකුත් වේ ද, ඒ දෙක ම අඞ්ගණයි.

15. ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් මහණකුහට "බොජුන්හලෙහි අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රපිණ්ඩය මම ම ලබන්නෙම් නම්, බොජුන්හලෙහි අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රපිණ්ඩය අන් මහණෙක් නො ලබන්නේ නම් මැනැවැ" යි ආශාව උපදනේ ය, යන යම් කාරණයෙක් වේ ද, එය විද්‍යමාන වන්නේ යි. ඇවැත්නි, බොජුන්හලෙහි අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රපිණ්ඩය අන් මහණෙක් ලබන්නේ නම්, බොජුන්හලෙහි අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රපිණ්ඩය ඒ මහණ නො ලබන්නේ නම් "බොජුන්හලෙහි අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රපිණ්ඩය අන් මහණෙක් ලබයි. බොජුන්හලෙහි අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රපිණ්ඩය මම නො ලබමි" යි හෙතෙම කිපෙයි. අසතුටු වෙයි යන යම් කාරණයක් වේ ද, එයත් විද්‍යමාන වෙයි. ඇවැත්නි, එහි යම් කොපයෙකුත් වේ ද, යම් නො සතුටෙකුත් වේ ද, ඒ දෙක ම අඞ්ගණයි.

16. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති - යං ඉධෙකච්චස්ස භික්ඛුනො එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: 'අහො වත අහමෙව හත්තග්ගෙ භුත්තාවී අනුමොදෙය්‍යං. න අඤ්ඤො භික්ඛු හත්තග්ගෙ භුත්තාවී අනුමොදෙය්‍යා'ති. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති - යං අඤ්ඤො භික්ඛු හත්තග්ගෙ භුත්තාවී අනුමොදෙය්‍ය, න සො භික්ඛු හත්තග්ගෙ භුත්තාවී අනුමොදෙය්‍ය. 'අඤ්ඤො භික්ඛු හත්තග්ගෙ භුත්තාවී අනුමොදති. නාහං හත්තග්ගෙ භුත්තාවී අනුමොදාමී'ති ඉති සො කුපිතො හොති අප්පතීතො. යො චෙව ඛො ආවුසො කොපො යො ච අප්පච්චයො උභයමෙතං අඞ්ගණං.

17. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති - යං ඉධෙකච්චස්ස භික්ඛුනො එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: 'අහො වත අහමෙව ආරාමගතානං භික්ඛූනං ධම්මං දෙසෙය්‍යං. න අඤ්ඤො භික්ඛු ආරාමගතානං භික්ඛූනං ධම්මං දෙසෙය්‍යා'ති. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති - යං අඤ්ඤො භික්ඛු ආරාමගතානං භික්ඛූනං ධම්මං දෙසෙය්‍ය, න සො භික්ඛු ආරාමගතානං භික්ඛූනං ධම්මං දෙසෙය්‍ය. 'අඤ්ඤො භික්ඛු ආරාමගතානං භික්ඛූනං ධම්මං දෙසෙති. නාහං ආරාමගතානං භික්ඛූනං ධම්මං දෙසෙමී'ති ඉති සො කුපිතො හොති අප්පතීතො. යො චෙව ඛො ආවුසො කොපො යො ච අප්පච්චයො උභයමෙතං අඞ්ගණං.

18. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති - යං ඉධෙකච්චස්ස භික්ඛුනො එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: 'අහො වත අහමෙව ආරාමගතානං භික්ඛුනීනං ධම්මං දෙසෙය්‍යං -පෙ- උපාසකානං ධම්මං දෙසෙය්‍යං -පෙ- උපාසිකානං ධම්මං දෙසෙය්‍යං, න අඤ්ඤො භික්ඛු ආරාමගතානං උපාසිකානං ධම්මං දෙසෙය්‍යා'ති. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති - යං අඤ්ඤො භික්ඛු ආරාමගතානං උපාසිකානං ධම්මං දෙසෙය්‍ය, න සො භික්ඛු ආරාමගතානං උපාසිකානං ධම්මං දෙසෙය්‍ය. 'අඤ්ඤො භික්ඛු ආරාමගතානං උපාසිකානං ධම්මං දෙසෙති. නාහං ආරාමගතානං උපාසිකානං ධම්මං දෙසෙමී'ති ඉති සො කුපිතො හොති අප්පතීතො. යො චෙව ඛො ආවුසො කොපො යො ච අප්පච්චයො උභයමෙතං අඞ්ගණං.

16. ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් මහණකුහට ‘බොජුන්හලෙහි මම ම වළඳා අවසන් කෙළෙම්, අනුමෝදනා කරන්නෙම් නම්, අන් මහණෙක් බොජුන්හලෙහි වළඳා අවසන් කෙළේ අනුමෝදනා නො කරන්නේ නම් යෙහෙකැ’යි කැමැත්ත උපදනේ ය යන යම් මේ කාරණයෙක් වේ ද, එය විද්‍යමාන වෙයි. අන් මහණෙක් බොජුන්හලෙහි වළඳා අවසන් කෙළේ අනුමෝදනා කරන්නේ ය, බොජුන්හලෙහි ඒ මහණ වළඳා අවසන් කෙළේ අනුමෝදනා නො කරන්නේ ය යන මේ කාරණය ද විද්‍යමාන වෙයි, ‘බොජුන්හලෙහි අන් මහණෙක් වළඳා අවසන් කෙළේ අනුමෝදනා කරන්නේ ය. බොජුන්හලෙහි වැළඳීමෙන් පසු මම අනුමෝදනා නො කරමි’ යි හෙතෙම කිපෙයි, අසතුටු වෙයි. ඇවැත්නි, එහි යම් කොපයෙකුත් වේ ද, යම් අසතුටෙකුත් වේ ද, ඒ දෙක ම අඞ්ගණයි.

17. ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් මහණකුහට ‘ආරාමයට පැමිණි භික්‍ෂූන්ට මම ම ධර්මදෙශනා කරන්නෙම් නම්, ආරාමයට පැමිණි භික්‍ෂූන්ට අන් මහණෙක් ධර්මදෙශනා නො කරන්නේ නම්, ඉතා යෙහෙකැ’යි ආශාව උපදනේ ය යන යම් කාරණයක් වේ ද, එ ද විද්‍යමාන වෙයි. ඇවැත්නි, ආරාමයට පැමිණි භික්‍ෂූන්ට අන් මහණෙක් ධර්මදෙශනා කරන්නේ ය. ඒ මහණ තෙමේ ආරාමයට පැමිණි භික්‍ෂූන්ට ධර්මදෙශනා නො කරන්නේ ය යන මේ කාරණය ද ඇති වෙයි. ‘ආරාමයට පැමිණි භික්‍ෂූන්ට අන් මහණෙක් ධර්මදෙශනා කරයි. ආරාමයට පැමිණි භික්‍ෂූන්ට මම ධර්මදෙශනා නො කරමි’යි මෙසේ හෙතෙම කිපියේ අසතුටු වූයේ වෙයි. ඇවැත්නි, එහි යම් කොපයෙකුත් වේ ද, යම් අසතුටෙකුත් වේ ද, ඒ දෙක ම අඞ්ගණයි.

18. ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් මහණකුහට ‘ආරාමයට පැමිණි මෙහෙණන්ට මම ම ධර්මදෙශනා කරන්නෙම් නම් ... උපාසකයන්ට ධර්මදෙශනා කරන්නෙම් නම්... උපාසිකාවන්ට ධර්මදෙශනා කරන්නෙම් නම්, ආරාමයට පැමිණි උපාසිකාවන්ට අන් භික්‍ෂුනමක් ධර්මදෙශනා නො කරන්නේ නම් ඉතා මැනැවැ’යි ආශාව උපදනේ ය යන යම් කාරණයක් වේ ද, එය විද්‍යමාන වෙයි. ඇවැත්නි, ආරාමයට පැමිණි උපාසිකාවන්ට අන් භික්‍ෂුනමක් ධර්මදෙශනා කරන්නේ ය, ඒ භික්‍ෂු තෙමේ ආරාමයට පැමිණි උපාසිකාවන්ට ධර්මදෙශනා නො කරන්නේ ය, යන මේ කාරණය ද ඇති වෙයි. ‘ආරාමයට පැමිණි උපාසිකාවන්ට වෙන භික්‍ෂු නමක් ධර්මදෙශනා කරයි. ආරාමයට පැමිණි උපාසිකාවන්ට මම ධර්මදෙශනා නො කරමි’යි මෙසේ හෙතෙම කිපියේ අසතුටු වූයේ වෙයි. ඇවැත්නි, එහි යම් කොපයෙකුත් වේ ද, යම් අසතුටෙකුත් වේ ද ඒ දෙක ම අඞ්ගණයි.

Free Distribution www.aathaapi.org

19. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති- යං ඉධෙකච්චස්ස භික්ඛුනො එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: 'අහො වත මමෙව භික්ඛූ සක්කරෙය්‍යුං ගරු-කරෙය්‍යුං[1] මානෙය්‍යුං පූජෙය්‍යුං, න අඤ්ඤං භික්ඛුං භික්ඛූ සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යු'න්ති. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති - යං අඤ්ඤං භික්ඛුං භික්ඛූ සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං, න තං භික්ඛුං භික්ඛූ සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං. 'අඤ්ඤං භික්ඛුං භික්ඛූ සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, න මං භික්ඛූ සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්තී'ති ඉති සො කුපිතො හොති අප්පතීතො. යො චෙව ඛො ආවුසො කොපො යො ච අප්පච්චයො, උභයමෙතං අඞ්ගණං.

20. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති - යං ඉධෙකච්චස්ස භික්ඛුනො එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: 'අහො වත මමෙව භික්ඛූ·නියො-පෙ-උපාසකා -පෙ- උපාසිකා සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං, න අඤ්ඤං භික්ඛුං උපාසිකා සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යු'න්ති ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති - යං අඤ්ඤං භික්ඛුං උපාසිකා සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං, න තං භික්ඛුං උපාසිකා සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං. පූජෙය්‍යුං, 'අඤ්ඤං භික්ඛුං උපාසිකා සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, න මං උපාසිකා[2] සක්කරොන්ති ගරු-කරොන්ති මානෙන්ති පූජෙන්තී'ති ඉති සො කුපිතො හොති අප්පතීතො. යො චෙව ඛො ආවුසො කොපො යො ච අප්පච්චයො, උභයමෙතං අඞ්ගණං.

21. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති - යං ඉධෙකච්චස්ස භික්ඛුනො එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: 'අහො වත අහමෙව ලාභී අස්සං[3] පණීතානං චීවරානං, න අඤ්ඤො භික්ඛු ලාභී අස්ස පණීතානං චීවරාන'න්ති. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති - යං අඤ්ඤො භික්ඛු ලාභී අස්ස පණීතානං චීවරානං, න සො භික්ඛු ලාභී අස්ස පණීතානං චීවරානං. 'අඤ්ඤො භික්ඛු ලාභී[3] පණීතානං චීවරානං, නාහං ලාභී පණීතානං චීවරාන'න්ති ඉති සො කුපිතො හොති අප්පතීතො. යො චෙව ඛො ආවුසො කොපො යො ච අප්පච්චයො, උභයමෙතං අඞ්ගණං.

1. ගරුං කරෙය්‍යුං, මජසං. 2. උපාසිකායො, ස්‍යා. 3. ලාභී අස්ස, කම්බො.

19. ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් මහණකුහට ‘භික්ෂූහු මට ම සත්කාර කරන්නාහු නම්, ගරු කරන්නාහු නම්, බුහුමන් කරන්නාහු නම්, පූජා කරන්නාහු නම්, ඉතා මැනැව. භික්ෂූහු අන් භික්ෂු නමකට සත්කාර නො කරන්නාහු නම්, ගරු නො කරන්නාහු නම්, බුහුමන් නො කරන්නාහු නම්, පූජා නො කරන්නාහු නම් ඉතා මැනැවැ’යි යම් හෙයකින් මෙබඳු ආශාවක් උපදී නම් මේ කාරණය විද්‍යමාන වේ. ඇවැත්නි, භික්ෂූහු යම් හෙයකින් අන් භික්ෂු නමකට සත්කාර කරන්නාහුය ගරු කරන්නාහු ය, බුහුමන් කරන්නාහු ය, පූජා කරන්නාහු ය, භික්ෂූහු ඒ භික්ෂු නමට සත්කාර නො කරන්නාහු, ගරු නො කරන්නාහු ය, බුහුමන් නො කරන්නාහු ය, පූජා නො කරන්නාහු ය, යන මේ කරුණ ඇති වෙයි යන මේ කාරණයෙක්ද විද්‍යමාන වෙයි. ‘භික්ෂූහු අන් භික්ෂු නමකට සත්කාර කරත්. ගරු කරත්. බුහුමන් කරත්. පුද කරත්. භික්ෂූහු මට සත්කාර නො කරත්. ගරු නො කරත්. බුහුමන් නො කරත්. පුද නො කරත් ය’යි හෙතෙමේ කිපියේ අසතුටු වූයේ වෙයි. ඇවැත්නි, එහි යම් කොපයෙකුත් යම් අසතුටෙකුත් වේ ද, මේ දෙක ම අඞ්ගණ යි.

20. ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුනමකට ‘භික්ෂුණීහු... උපාසකයෝ... උපාසිකාවෝ මට ම සත්කාර කරන්නාහු නම්, ගරු කරන්නාහු නම්, බුහුමන් කරන්නාහු නම්, පුද කරන්නාහු නම්, උපාසිකාවෝ අන් භික්ෂුනමකට සත්කාර නො කරන්නාහු නම්, ගරු නො කරන්නාහු නම්, බුහුමන් නො කරන්නාහු නම්, පුද නො කරන්නාහු නම් ඉතා මැනවැ’යි යම් හෙයකින් මෙබඳු ආශාවක් උපදී නම් මේ කාරණය විද්‍යමාන වේ. ඇවැත්නි, උපාසිකාවෝ යම්හෙයකින් අන් මහණකුට සත්කාර කරන්නාහු ය, ගරු කරන්නාහු ය, බුහුමන් කරන්නාහු ය, පුද කරන්නාහු ය, උපාසිකාවෝ ඒ භික්ෂුනමට සත්කාර නො කරන්නාහු ය, ගරු නො කරන්නාහු ය, බුහුමන් නො කරන්නාහු ය, පුද නො කරන්නාහු ය, යන මේ කරුණ වෙයි. ‘උපාසිකාවෝ අන් භික්ෂු නමකට සත්කාර කෙරෙත්. ගරු කෙරෙත්. බුහුමන් කෙරෙත්. පුද කෙරෙත්. උපාසිකාවෝ මට සත්කාර නො කෙරෙත්. ගරු නො කෙරෙත්. බුහුමන් නො කෙරෙත්. පුද නො කෙරෙත්’යි හෙතෙම කිපියේ අසතුටු වූයේ වෙයි. ඇවැත්නි, එහි යම් කොපයකුත් යම් අසතුටෙකුත් වේ ද, මේ දෙක ම අඞ්ගණයි.

21. ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුනමකට ‘මම ම අගනා සිවුරු ලබන්නෙම් නම්, අන් මහණෙක් අගනා සිවුරු නො ලබන්නේ නම්, ඉතා මැනැවැ’යි යම් හෙයකින් මෙබඳු ආශාවක් උපදි නම්, මේ කාරණය විද්‍යමාන වේ. ඇවැත්නි, අන් භික්ෂුනමක් අගනා සිවුරු ලබන්නෙක් වන්නේය ය, ඒ භික්ෂු නම අගනා සිවුරු නො ලබන්නේ වන්නේ ය යන මේ කාරණය විද්‍යමාන වේ. ‘අනිත් භික්ෂු නමක් අගනා සිවුරු ලබයි. මම අගනා සිවුරු නො ලබමි’යි හෙතෙම කිපියේ අසතුටු වූයේ වෙයි. ඇවැත්නි, එහි යම් කොපයෙකුත් යම් අසතුටෙකුත් වේ ද, මේ දෙක ම අඞ්ගණ යි.

22. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති - යං ඉධෙකච්චස්ස භික්ඛුනො එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: 'අහො වත අහමෙව ලාභී අස්සං පණීතානං පිණ්ඩපාතානං-පෙ-පණීතානං සෙනාසනානං-පෙ-පණීතානං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං, න අඤ්ඤෙ භික්ඛූ ලාභී අස්සු පණීතානං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන'න්ති. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති යං අඤ්ඤෙ භික්ඛූ ලාභී අස්සු පණීතානං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං, න සො භික්ඛු ලාභී අස්ස පණීතානං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. 'අඤ්ඤෙ භික්ඛූ ලාභී අස්සු පණීතානං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං, නාහං ලාභී අස්සං පණීතානං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන'න්ති ඉති සො කුපිතො හොති අප්පතීතො. යො චෙව ඛො ආවුසො කොපො යො ච අප්පච්චයො, උභයමෙතං අඞ්ගණං.

23. ඉමෙසං ඛො එතං ආවුසො පාපකානං අකුසලානං ඉච්ඡාවචරානං අධිවචනං යදිදං අඞ්ගණන්ති.

24. යස්ස කස්සචි ආවුසො භික්ඛුනො ඉමෙ පාපකා අකුසලා ඉච්ඡාවචරා අප්පහීනා දිස්සන්ති චෙව සූයන්ති ච, කිඤ්චාපි සො හොති ආරඤ්ඤකො පන්තසෙනාසනො, පිණ්ඩපාතිකො සපදානචාරී, පංසුකූලිකො ලූඛචීවරධරො, අථ ඛො නං සබ්‍රහ්මචාරී නෙව සක්කරොන්ති, න ගරුකරොන්ති, න මානෙන්ති, න පූජෙන්ති. තං කිස්ස හෙතු? තෙ හි තස්ස ආයස්මතො පාපකා අකුසලා ඉච්ඡාවචරා අප්පහීනා දිස්සන්ති චෙව සූයන්ති ච. සෙය්‍යථාපි ආවුසො කංසපාති ආභතා ආපණා වා කම්මාරකුලා වා පරිසුද්ධා පරියොදාතා, තමෙනං සාමිකා අහිකුණපං වා කුක්කුරකුණපං වා මනුස්සකුණපං වා රචයිත්වා අඤ්ඤිස්සා කංසපාතියා පටිකුජ්ජිත්වා අන්තරාපණං පටිපජ්ජෙය්‍යුං, තමෙනං ජනො දිස්වා එවං වදෙය්‍ය: අම්භො කිමෙවිදං හරීයති[1] ජඤ්ඤජඤ්ඤං[2] වියාති. තමෙනං උට්ඨහිත්වා අවාපුරිත්වා ඔලොකෙය්‍ය. තස්ස සහදස්සනෙන අමනාපතා ච සණ්ඨහෙය්‍ය. පටිකකූලතා[3] ච සණ්ඨහෙය්‍ය. ජිගුච්ඡතා[4] ච සණ්ඨහෙය්‍ය. ජිඝච්ඡිතානම්පි න භොත්තුකම්‍යතා අස්ස, පගෙව සුහිතානං. එවමෙව ඛො ආවුසො යස්ස කස්සචි භික්ඛුනො ඉමෙ පාපකා අකුසලා ඉච්ඡාවචරා අප්පහීනා දිස්සන්ති චෙව සූයන්ති ච, කිඤ්චාපි සො හොති ආරඤ්ඤකො පන්තසෙනාසනො, පිණ්ඩපාතිකො සපදානචාරී,[5] පංසුකූලිකො ලූඛචීවරධරො, අථ ඛො නං සබ්‍රහ්මචාරී නෙව[6] සක්කරොන්ති, න ගරුකරොන්ති, න මානෙන්ති, න පූජෙන්ති. තං කිස්ස හෙතු? තෙ හි තස්ස ආයස්මතො පාපකා අකුසලා ඉච්ඡාවචරා අප්පහීනා දිස්සන්ති චෙව සූයන්ති ච.

---

1. හරියන්ති, ස්‍යා 2. ජඤ්ඤජඤ්ඤං, ස්‍යා
3. පාටිකුල්‍යතා, ස්‍යා මජසං පටිකුල්‍යතා PTS. 4. ජේගුච්ඡිතා, PTS.
5. සාපදානචාරී, කාළු. 6. න චෙව, මජසං.

22. ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුනමකට 'මම ම ප්‍රණීත පිණ්ඩපාත...මහැඟි සෙනසුන්... ප්‍රණීත ගිලන්පස බෙහෙසත්පිරිකර ලබන්නෙම් නම්, අන් මහණෙක් ප්‍රණීත ගිලන්පස බෙහෙසත්පිරිකර නො ලබන්නේ නම්, ඉතා මැනැවැ'යි මෙබඳු ආශාව උපදී නම් මේ කාරණය ද විද්‍යමාන වෙයි. ඇවැත්නි, වෙන භික්ෂු නමක් ප්‍රණීත ගිලන්පස බෙහෙසත් පිරිකර ලබන්නේ නම්, ඒ භික්ෂු නම... ප්‍රණීත ගිලන්පස බෙහෙසත් පිරිකර නො ලබන්නේ නම්, මෙ කාරණය ද විද්‍යමාන වෙයි. 'වෙන භික්ෂු නමක් ප්‍රණීත ගිලන්පස බෙහෙසත් පිරිකර ලබන්නේ ය. මම ප්‍රණීත ගිලන්පස බෙහෙසත් පිරිකර නො ලබමි'යි කියා මෙසේ හෙතෙමේ කිපියේ අසතුටු වූයේ වෙයි. ඇවැත්නි, එහි යම් කොපයකුත් වේ ද, නොසතුටෙකුත් වේ ද, මේ දෙක ම අඞ්ගණ යි.

23. ඇවැත්නි, අඞ්ගණ යනු ඉච්ඡා (කාම) වසයෙන් පවත්නා වූ මේ ලාමක අකුශලයන්ට නමෙකි.

24. ඇවැත්නි, යම්කිසි භික්ෂු නමකගේ කාමවසයෙන් පවත්නා වූ මේ ලාමක අකුශලයෝ අප්‍රහීණ වූවාහු දක්නා ලැබෙත් ද, අසනු ලැබෙත් ද, හෙතෙමේ ආරණ්‍යක වූයේ ප්‍රාන්තශයනාසන ඇසුරු කරන්නේ පිණ්ඩපාතික වූයේ ගෙපිළිවෙළින් පිඬු සිඟා හැසිරෙන්නේ පාංසුකූලික වූයේ රළු සිවුරු දරන්නේ නමුදු සබ්‍රම්සරහු ඔහුට සත්කාර නො කරත්. ගරු නො කරත්. බුහුමන් නො කරත්. පුද නො කරත්. ඒ කවර හෙයින යත්: ඒ ආයුෂ්මතුන්ගේ ඉච්ඡාවසයෙන් පවත්නා වූ ලාමක වූ ඒ අකුශලයෝ ප්‍රහීණ නො වූවාහු දක්නා ලැබෙත් ද, අසනු ලැබෙත් ද, එහෙයිනි. ඇවැත්නි, සල්පිළින් හෝ කඹුරුකුලයෙන් හෝ ගෙනෙන ලද පිරිසිදු වූ හාත්පසින් බබලන්නා වූ කස් තලියක් වේ ද, හිමියෝ ඒ රන්තලියෙහි නයිකුණක් හෝ බලුකුණක් හෝ මිනීකුණක් හෝ බහා අන් කස්තලියකින් වසා සල්පිල් අතර වීථියට ගෙන යන්නාහු ද, ඒ තලිය ජනයා දැක "පින්වත්නි, ඉතා මනවඩන්නක් මෙන් මේ කුමක් ගෙනයනු ලැබේ ද?"යි මෙසේ කියන්නේ ය. නැගිට ඒ තලිය වසුන් හැර බලන්නේ ය. ඒ කුණප දැකීම සමග ම ඒ ජනයාට අමනාපබව ද නැගී සිටුනේ ය. පිළිකුල්බව ද නැගී සිටුනේ ය. ජුගුප්සාව ද නැගී සිටුනේ ය. කුසගිනි ඇත්තවුන්ට ද කනු කැමැත්ත නො වන්නේ ය. තෘප්ත වූවන්ට කියනු ම කවරේ ද? ඇවැත්නි, එපරිද්දෙන් ම යම්කිසි මහණකුගේ ඉච්ඡාවසයෙන් පවත්නා වූ මේ ලාමක අකුශලයෝ ප්‍රහීණ නො වූවාහු දක්නා ලැබෙත් ද, අසනු ලැබෙත් ද, ඒ මහණ ආරණ්‍යක වූයේ ප්‍රාන්තශයනාසන ඇසුරු කරන්නේ පිණ්ඩපාතික වූයේ ගෙපිළිවෙළින් පිඬු සිඟා හැසිරෙන්නේ පාංසුකූලික වූයේ රළු සිවුරු දරන්නේ නමුදු සබ්‍රහ්මචාරීහු ඔහුට සත්කාර නො කෙරෙත්. ගරු නො කෙරෙත්. බුහුමන් නො කෙරෙත්. පුද නො කෙරෙත්. ඒ කවර හෙයින යත්: ඒ ආයුෂ්මතුන්ගේ ඉච්ඡාවසයෙන් පවත්නා වූ ලාමක වූ ඒ අකුශලයෝ අප්‍රහීණ වූවාහු දක්නා ලැබෙත් ද, අසනු ලැබෙත් ද, එහෙයිනි.

25. යස්ස කස්සචි ආවුසො භික්ඛුනො ඉමෙ පාපකා අකුසලා ඉච්ඡාවචරා පහීනා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, කිඤ්චාපි සො හොති ගාමන්තවිහාරී නෙමන්තනිකො ගහපතිචීවරධරො, අථ ඛො නං සබ්‍රහ්මචාරී සක්කරොන්ති. ගරුකරොන්ති. මානෙන්ති. පූජෙන්ති. තං කිස්ස හෙතු? තෙ හි තස්ස ආයස්මතො පාපකා අකුසලා ඉච්ඡාවචරා පහීනා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච. සෙය්‍යථාපි ආවුසො කංසපාති ආභතා ආපණා වා කම්මාරකුලා වා පරිසුද්ධා පරියොදාතා, තමෙනං සාමිකා සාලීනං ඔදනං විචිතකාළකං[1] අනෙකසූපං අනෙකබ්‍යඤ්ජනං රචයිත්වා අඤ්ඤිස්සා කංසපාතියා පටිකුජ්ජිත්වා අන්තරාපණං පටිපජ්ජෙය්‍යුං, තමෙනං ජනො දිස්වා එවං වදෙය්‍ය: අම්භො කිමෙවිදං හරීයති ජඤ්ඤජඤ්ඤං වියාති. තමෙනං උට්ඨහිත්වා අවාපුරිත්වා ඔලොකෙය්‍ය. තස්ස සහදස්සනෙන මනාපතා ච සණ්ඨහෙය්‍ය. අප්පටිකූලතා[2] ච සණ්ඨහෙය්‍ය. අජෙගුච්ඡතා[3] ච සණ්ඨහෙය්‍ය. සුහිතානම්පි භොත්තුකම්‍යතා අස්ස, පගෙව ජිඝච්ඡිතානං. එවමෙව ඛො ආවුසො යස්ස කස්සචි භික්ඛුනො ඉමෙ පාපකා අකුසලා ඉච්ඡාවචරා පහීනා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, කිඤ්චාපි සො හොති ගාමන්තවිහාරී නෙමන්තනිකො ගහපතිචීවරධරො, අථ ඛො නං සබ්‍රහ්මචාරී සක්කරොන්ති. ගරුකරොන්ති. මානෙන්ති. පූජෙන්ති. තං කිස්ස හෙතු? තෙ හි තස්ස ආයස්මතො පාපකා අකුසලා ඉච්ඡාවචරා පහීනා දිස්සන්ති චෙව සුය්‍යන්ති චාති.

26. එවං වුත්තෙ ආයස්මා මහාමොග්ගල්ලානො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: “උපමා මං ආවුසො සාරිපුත්ත පටිභාති”ති. “පටිභාතු තං ආවුසො මොග්ගල්ලානා”ති.

එකමිදාහං ආවුසො සමයං රාජගහෙ විහරාමි ගිරිබ්බජෙ. අථ ඛ්වාහං ආවුසො පුබ්බන්හසමයං[4] නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පාවිසිං. තෙන ඛො පන සමයෙන සාමිතියානකාරපුත්තො[5] රථස්ස නෙමිං තච්ඡති.[6] තමෙනං පණ්ඩුපුත්තො ආජීවකො[7] පුරාණයානකාරපුත්තො පච්චුපට්ඨිතො හොති. අථ ඛො ආවුසො පණ්ඩුපුත්තස්ස ආජීවකස්ස පුරාණයානකාරපුත්තස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: අහො වතායං සාමිතියානකාරපුත්තො ඉමිස්සා නෙමියා ඉමඤ්ච වඞ්කං ඉමඤ්ච ජිම්හං ඉමඤ්ච දොසං තච්ඡෙය්‍ය, එවායං නෙමි අපගතවඞ්කා අපගතජිම්හා අපගතදොසා සුද්ධාස්ස[8] සාරෙ පතිට්ඨිතාති. යථා යථා ඛො ආවුසො පණ්ඩුපුත්තස්ස ආජීවකස්ස පුරාණයානකාරපුත්තස්ස චෙතසො පරිවිතක්කිතං[9] හොති, තථා තථා සාමිතියානකාරපුත්තො තස්සා නෙමියා තඤ්ච වඞ්කං තඤ්ච ජිම්හං තඤ්ච දොසං තච්ඡති.

1. විචිතිතකාළකං, කළචි. 2. අප්පාටිකූලතා, මජසං,
3 .අජෙගුච්ඡිතා, PTS 4 පුබ්බණ්හසමයං, මජසං. සතා.
5. සමිතියානකාරපුත්තො, මජසං. සතා. 6 තචෙඡති, සතා.
7. ආජීවකො, මජසං. සතා .8 සුද්ධා අස්ස, මජසං. සතා
9 පරිවිතක්කො, මජසං. සතා.

25. ඇවැත්නි, යම්කිසි මහණකුගේ ආශාවශයෙන් පවත්නා වූ ලාමක වූ මේ අකුශලයෝ ප්‍රහීණ වූවාහු දක්නා ලැබෙත් ද, අසනු ලැබෙත් ද, හෙතෙම කිසිසේත් ග්‍රාමාන්තශයනාසනයෙහි වාසය කරත්තේ නිමැතුම්බත් පිළිගන්නේ ගැහැවි සිවුරු දරන්නේ නමුදු ඔහුට සබ්‍රහ්මචාරීහු සත්කාර කරත්. ගරු කරත්. බුහුමන් කරත්. පුද කරත්. ඒ කවර හෙයින යත්: ඒ ආයුෂ්මත්හුගේ ආශාවශයෙන් පවත්නා වූ ලාමක වූ ඒ අකුශලයෝ ප්‍රහීණ වූවාහු දක්නා ලැබෙත් ද, අසනු ලැබෙත් ද, එහෙයිනි. ඇවැත්නි, යම් සේ සල්පිළින් හෝ කම්බුරුකුලයෙන් හෝ ගෙනෙන ලද පිරිසුදු වූ හාත්පසින් බබලන්නා වූ කස්තලියක් යම් සේ වේ ද, හිමියෝ ඒ මේ කස්තලියට කළු ඇට ඉවත් කළ ඇල්හාලේ බත නොයෙක් ව්‍යඤ්ජනයන් නොයෙක් සුපයන් සහිත කොට බහා අන් කස්තලියකින් වසා සල්පිල් අතර වීථියට ගෙන යන්නාහු ය. ජනයා ඒ තලිය දැක ‘පින්වත්නි, ඉතා මන වඩන්නක් ලෙස මේ කුමක් ගෙන යනු ලැබේ දැ?’ යි කියන්නේ ය. නැඟිට ඒ තලිය වසුන් හැර බලන්නේ ය. ඒ දැක්ම හා සමග ම ඔහුට මනාපබව නැඟී සිටුනේ ය. නොපිළිකුල් බව ද නැඟී සිටුනේ ය. ජුගුප්සාරහිත බව ද නැඟී සිටුනේ ය. තෘප්තියට පත් වූවන්ට ද කනු කැමැතිබව ඇති වෙයි. බඩසා ඇත්තවුන් ගැන කියනු ම කවරේ ද? ඇවැත්නි, එපරිද්දෙන් ම යම්කිසි භික්ෂුනමකගේ ආශා වශයෙන් පවත්නා වූ ලමු වූ මේ අකුශලයෝ ප්‍රහීණ වූවාහු දක්නා ලැබෙත් ද, අසනු ලැබෙත් ද, හෙතෙම ග්‍රාමාන්තශයනාසනයෙහි වාසය කරන්නේ නිමැතුම්බත් පිළිගන්නේ ගැහැවිසිවුරු දරන්නේ නමුදු ඔහුට සබ්‍රහ්මචාරීහු සත්කාර කෙරෙත්. ගරු කෙරෙත්. බුහුමන් කෙරෙත්. පුද කෙරෙත්. ඒ කවර හෙයින යත්: ඔහුගේ ආශා වශයෙන් පවත්නා වූ ලාමක අකුසලයෝ ප්‍රහීණ වූවාහු දක්නා ලැබෙත් ද, අසනු ලැබෙත් ද, එහෙයිනි.

26. මෙසේ කීකල්හි ආයුෂ්මත් මහමුගලන් ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේට ‘ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, උපමාවක් මට වැටහේ ය’යි වදාළ සේක. “ඇවැත්නි, මුගලන, එය ඔබ වහන්සේට වැටහේවා.”

ඇවැත්නි, එක් කලෙක මම ගිරිවුජ නම් වූ රජගහ නුවර වාසය කරමි. ඇවැත්නි, ඉක්බිති මම පෙරවරු කාලයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙන රජගහ නුවරට පිඬු පිණිස පිවිසියෙමි. එසමයෙහි සාමිති නම් රියකරුපුත් තෙමේ රථයකට නිම්වලල්ලක් සසියි. ඒ ඔහු වෙත පැරණි රියකරු පුත් වූ පාණ්ඩුපුත්‍ර නම් ආජීවක තෙම එළඹැ සිටියේ වෙයි. ඇවැත්නි, ඉක්බිති, පැරණි රියකරු පුත් වූ පාණ්ඩුපුත්‍ර ආජීවකයාට මෙබඳු අදහසක් ඇති වි ය. ‘මේ සාමිති රියකරුපුත් තෙමේ මේ නිම්වලල්ලෙහි මෙ පසිත් වූ ඇදය ද මේ හැම අයිත් වූ ඇදය ද මේ එලගැට ආදිය ද සසින්නේ නම් මැනැව. මෙසේ මේ නිම්වලල්ල පහ වූ නැම්ම ඇති ව, පහ වූ ඇද ඇති ව, පහ වූ දෙස් ඇති ව පිරිසිදු ව අරටුවෙහි පිහිටියේ වන්නේ ය ‘කියායි. ඇවැත්නි, පුරාණයානකාරපුත්‍ර වූ පාණ්ඩුපුත්‍ර ආජීවකයාට යම් යම් පරිද්දකින් අදහස් වෙයි ද, ඒ ඒ පරිද්දෙන් සාමිති යානකාරපුත්‍ර තෙම ඒ නිම්වලල්ලේ ඒ නැම්ම ද ඒ ඇදය ද ඒ දෝෂය ද සසියි.

අථ ඛො ආවුසො පණ්ඩුපුත්තො ආජීවකො පුරාණයානකාරපුත්තො අත්තමනො අත්තමනවාචං නිච්ඡාරෙසි: 'හදයා හදයං මඤ්ඤෙ අඤ්ඤාය තච්ඡතී'ති. එවමෙව ඛො ආවුසො යෙ තෙ පුග්ගලා අස්සද්ධා ජීවිකත්ථා න සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතා, සඨා මායාවිනො කෙටුභිනො,[1] උද්ධතා උන්නළා චපලා මුඛරා විකිණ්ණවාචා ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරා භොජනෙ අමත්තඤ්ඤුනො ජාගරියං අනනුයුත්තා සාමඤ්ඤෙ අනපෙක්ඛවන්තො[2] සික්ඛාය න තිබ්බගාරවා බාහුලිකා සාථලිකා ඔක්කමනෙ පුබ්බඞ්ගමා පවි-වෙකෙ නික්ඛිත්තධුරා කුසීතා හීනවිරියා මුට්ඨස්සතී අසම්පජානා අසමාහිතා විබ්භන්තචිත්තා දුප්පඤ්ඤා එලමූගා, තෙසං ආයස්මා සාරිපුත්තො ඉමිනා ධම්මපරියායෙන හදයං මඤ්ඤෙ අඤ්ඤාය තච්ඡති.

27. යෙ පන තෙ කුලපුත්තා සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතා අසඨා අමායාවිනො අකෙටුභිනො අනුද්ධතා අනුන්නළා අචපලා අමුඛරා අවිකිණ්ණවාචා ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරා භොජනෙ මත්තඤ්ඤුනො ජාගරියං අනුයුත්තා සාමඤ්ඤෙ අපෙක්ඛවන්තො සික්ඛාය තිබ්බගාරවා න බාහුලිකා න සාථලිකා ඔක්කමනෙ නික්ඛිත්තධුරා පවිවෙකෙ පුබ්බඞ්ගමා ආරද්ධ-විරියා පහිතත්තා උපට්ඨිතසති සම්පජානා සමාහිතා එකග්ගචිත්තා පඤ්ඤ-වන්තො අනෙලමූගා, තෙ ආයස්මතො සාරිපුත්තස්ස ඉමං ධම්මපරියායං සුත්වා පිවන්ති මඤ්ඤෙ ඝසන්ති මඤ්ඤෙ වචසා මනසා ච. සාධු වත භො සබ්‍රහ්මචාරී අකුසලා වුට්ඨාපෙත්වා කුසලෙ පතිට්ඨාපෙතීති.

28. සෙය්‍යථාපි ආවුසො ඉත්ථී වා පුරිසො වා දහරො යුවා මණ්ඩනක-ජාතිකො සීසං නහාතො උප්පලමාලං වා වස්සිකමාලං වා අතිමුත්තකමාලං වා ලභිත්වා උභොහි හත්ථෙහි පටිග්ගහෙත්වා උත්තමඞ්ගෙ සිරස්මිං පතිට්ඨාපෙය්‍ය-

1. කෙතුභිනො, මජ්සං. 2 පුනපෙඛවන්තො, PTS.

ඇවැත්නි, එකල පුරාණයානකාරපුත්‍ර වූ පාණ්ඩුපුත්‍ර ආජීවක තෙම සතුටට පත් වූයේ 'නම හිතීත් (මාගේ) හිත දැනගෙන මෙන් සයිත්තේ ය'යි සතුටු වූයේ සන්තොස්බව පහළ කෙළේ ය. ඇවැත්නි, එපරිද්දෙන් ම ශ්‍රද්ධාවක් නැත්තා වූ ශ්‍රද්ධාවෙන් නො ව ජීවිකාව පිණිස ගිහිගෙයින් නික්ම පැවිද්දට පැමිණියා වූ කෛරාටික වූ මායාසහිත වූ ප්‍රහුණු කළ කෛරාටික-කම් ඇති නොසන්හුන් හිස්මාන නළ ඇති චපල වූ දෙඩමලු වූ සංයත නො වූ වචන ඇති ඉඳුරන්හි නො වැසූ දෙර ඇති භොජනයෙහි පමණ නො දන්නා වූ නිදි වැරීමෙහි නො යෙදුණු, මහණකම්හි බලාපොරොත්තු නැති ශික්ෂාවන්හි දැඩි ගෞරව නැති පිරිකර අංඩිය බහුල කොට ඇති සස්න ලිහිල් කොට ගත් නීවරණයෙහි පෙරදූරි වූ උතුම් විවේකයෙහි හළ වැර ඇත්තා වූ කුසීත වූ වැර නැත්තා වූ මුළා වූ සිහි ඇත්තා වූ, මනා නුවණ නැත්තා වූ එකඟ නො වූ සිත් ඇත්තා වූ ඒ ඒ අරමුණු කරා දිවූ සිත් ඇත්තා වූ නුවණ නැත්තා වූ කෙළතොලු වූ යම් ඒ පුද්ගල කෙනෙක් වෙත් ද, ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ මේ ධර්මාගීයෙන් ඔවුන්ගේ සිත දැන සයිත්තාක් මෙනි.

27. ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම පැවිද්දට පැමිණියාහු කෛරාටික නො වූ මායා රහිත වූ ප්‍රහුණු වූ කෛරාටික කම් නැති සන්හුන් වූ හිස්මානනල නැති චපල නො වූ දෙඩමලු නො වූ සංයත වූ වචන ඇති ඉන්ද්‍රියයන්හි වැසූ දෙර ඇති භොජනයෙහි පමණ දත් නිදි වැරීමෙහි යෙදුණු මහණකම්හි බලාපොරොත්තු ඇති ශික්ෂාවන්හි දැඩි ගෞරව ඇති චීවරාදිප්‍රත්‍යය බහුල කොට නො ගත්තා වූ සස්න ලිහිල් කොට නො ගත්තා වූ නීවරණයෙහි බහා තැබූ වීර්‍ය්‍යධුර ඇති උතුම් විවේකයෙහි පූර්වඞ්ගම වූ ඇරඹූ වැර ඇති නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති එළඹ සිටි සිහි ඇති සමාධි සහගත වූ එකඟ සිත් ඇති ප්‍රඥාවත් වූ කෙළතොලු නො වූ යම් ඒ කුලපුත්‍ර කෙනෙක් වෙත් ද, ඔවුන් ආයුෂ්මත් ශාරීපුත්‍ර-යන්ගේ මේ ධර්මාගීය අසා වචනයෙනුත් සිතිනුත් බොතියි හඟිම්. කතියි හඟිම්. පින්වත, ඉතා මැනවි: සබ්‍රම්සරුන් අකුශලයෙන් නඟා කුශලයෙහි පිහිටුවව යි.

28. ඇවැත්නි, යම් සේ සැරසෙන පුලු තරුණ වූ යොවුන්වියෙහි සිටි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ හිස පටන් ස්නානය කෙළේ උපුල්මල්දමක් හෝ දෑසමන්මල්දමක් හෝ යොහොඹුමල්දමක් හෝ ලැබ දැතින් පිළිගෙන උතුමඟ හිසෙහි පැළඳ ගනී ද–

එවමෙව ඛො ආවුසො යෙ තෙ කුලපුත්තා සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතා, අසඨා අමායාවිනො අකෙටුභිනො අනුද්ධතා අනුන්නළා අචපලා අමුඛරා අවිකිණ්ණවාචා ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරා භොජනෙ මත්තඤ්ඤුනො ජාගරියං අනුයුත්තා සාමඤ්ඤෙ අපෙක්ඛවන්තො සික්ඛාය තිබ්බගාරවා න බාහුලිකා න සාථලිකා ඔක්කමනෙ නික්ඛිත්තධුරා පවිවෙකෙ පුබ්බඞ්ගමා ආරද්ධවිරියා පහිතත්තා උපට්ඨිතස්සතී සම්පජානා සමාහිතා එකග්ගචිත්තා පඤ්ඤාවන්තො අනෙළමූගා, තෙ ආයස්මතො සාරිපුත්තස්ස ඉමං ධම්මපරියායං සුත්වා පිවන්ති මඤ්ඤෙ ඝසන්ති මඤ්ඤෙ වචසා චෙව මනසා ච. සාධු වත භො සබ්‍රහ්මචාරී අකුසලා වුට්ඨාපෙත්වා කුසලෙ පතිට්ඨාපෙතීති.

ඉති හ තෙ උභො මහානාගා අඤ්ඤමඤ්ඤස්ස සුභාසිතං සමනුමොදිංසූති.

අනඞ්ගණසුත්තං පඤ්චමං.

1. 1. 6

ආකඞ්ඛෙය්‍යසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

සම්පන්නසීලා භික්ඛවෙ විහරථ සම්පන්නපාතිමොක්ඛා. පාතිමොක්ඛසංවරසංවුතා විහරථ ආචාරගොචරසම්පන්නා. අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛථ සික්ඛාපදෙසු.

2. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු 'සබ්‍රහ්මචාරීනං පියො චස්සං මනාපො ගරු භාවනීයො චා'ති සීලෙස්වෙවස්ස පරිපූරකාරී අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (1)

ඇවැත්ති, එපරිද්දෙන් ම යම් ඒ කුලපුත්‍ර කෙනෙක් ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම පැවිද්දට පැමිණියාහු කෛරාටික නො වූවාහු අසඨ වූවාහු මායා රහිත වූවාහු පුරුදු නො කළ කෛරාටිකකම් ඇත්තාහු සන්හුන් වූවාහු හිස් මානනල නැත්තාහු චපල නො වූවාහු දෙඩමලු නො වූවාහු සංයත වූ වචන ඇත්තාහු ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇත්තාහු භොජනයෙහි පමණ දත්තාහු නිදි වැරීමෙහි යෙදුණාහු පැවිද්දෙහි බලාපොරොත්තු ඇත්තාහු ශික්ෂාවන්හි දැඩි ගෞරව ඇත්තාහු චීවරාදිප්‍රත්‍යය බහුල කොට නො ගත්තාහු සස්න ලිහිල් කොට නො ගත්තාහු නීවරණ පෙරදූරි කොට නැත්තාහු උතුම් විවේකයෙහි උත්සාහ ඇත්තාහු පටන් ගත් වීය්‍ය ඇත්තාහු නිවන් පිණිස මෙහෙයූ සිත් ඇත්තාහු එළඹසිටි සිහි ඇත්තාහු මනා නුවණ ඇත්තාහු සමාහිත වූවාහු එකඟසිත් ඇත්තාහු නුවණැත්-තාහු කෙළතොළු නො වූවාහු වෙත් ද, ඔවුන් ආයුෂ්මත් ශාරීපුත්‍රයන්ගේ මේ ධර්ම දෙශනාව අසා වචනයෙනුත් සිතිනුත් බොනියි හඟිම්. කනියි හඟිම්. පින්වතුන් වහන්ස, ඉතා මැනැවි: සබ්‍රම්හරුන් අකුශලයෙන් නඟා කුශලයෙහි පිහිටුවන සේක.

මෙසේ මේ මහානාගයෝ (කෙලෙස් නැති උත්තමයෝ) දෙදෙන ඔවු-නොවුන්ගේ සුබැසි සතුටින් අනුමෝදන් වූහු.

අනඞ්ගණසූත්‍රය පස්වැනියි.

1. 1. 6

ආකඞ්ඛෙය්‍ය සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවන නම් අනේපිඬුසිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් අමතා වදාළ සේක. ඒ භික්ෂූහු "වහන්සැ"යි භාග්‍යවතුන් වහන්සේට පිළි-වදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළ සේක:

මහණෙනි, පිරිපුන් සිල් ඇත්තාහු ප්‍රාතිමොක්ෂසංවරයෙන් යුක්ත ව වුසවු. ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවෘත වූවාහු ආචාරයෙන් හා ගොචරයෙන් සමෘද්ධ ව වසවු. ස්වල්පමාත්‍ර වූ වරදෙහි භය දක්නාසුලු ව මොනොවට ගෙන ශික්ෂාපදයන්හි හික්මෙවු.

2. මහණෙනි, මහණෙක් තෙමේ "සබ්‍රම්හරුන්ට ප්‍රිය වූවෙක්, මන වඩන්නෙක්, ගරු කළ යුත්තෙක්, සම්භාවනීයයෙක් වන්නෙමි"යි කැමැති වන්නේ නම්, ශීලය ම සම්පූර්ණ කරන්නේ ස්වකීය චිත්තසමථයෙහි එක්වත් යෙදුනේ බැහැර නො කළ හෝ නො නැසූ ධ්‍යාන ඇත්තේ විදර්ශනාවෙන් යුක්ත වූයේ ශූන්‍යාගාරයන් වඩන්නෙක් (ශූන්‍යාගාරයන්ට පිවිස ශමථ විදර්ශනා භාවනා කරන්නෙක්) වන්නේ ය.

3. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු "ලාභී අස්සං චීවරපිණ්ඩපාත-සෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන"න්ති, සීලෙස්වෙවස්ස පරිපූරකාරී අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නා-ගතො බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (2)

4. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු "යෙසාහං චීවරපිණ්ඩපාත-සෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පරිභුඤ්ජාමි, තෙසං තෙ කාරා මහප්ඵලා අස්සු මහානිසංසා"ති, සීලෙස්වෙවස්ස පරිපූරකාරී -පෙ- බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (3)

5. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු "යෙ මෙ ඤාතිසාලොහිතා පෙතා කාලකතා පසන්නචිත්තා අනුස්සරන්ති, තෙසං තං මහප්ඵලං අස්ස මහානිසං-සන්ති," සීලෙස්වෙවස්ස පරිපූරකාරී -පෙ- බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (4)

6. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු "අරතිරතිසහො අස්සං, න ච මං අරති සහෙය්‍ය, උප්පන්නං අරතිං අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය"න්ති, සීලෙස්වෙවස්ස පරිපූරකාරී -පෙ- බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (5)

7. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු "භයභෙරවසහො අස්සං, න ච මං භයභෙරවං සහෙය්‍ය, උප්පන්නං භයභෙරවං අභිභුය්‍ය අභිභුය්‍ය විහ-රෙය්‍ය"න්ති, සීලෙස්වෙවස්ස පරිපූරකාරී -පෙ- බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (6)

8. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු "චතුන්නං ඣානානං ආභි-චෙතසිකානං[1] දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී අස්සං අකිච්ඡලාභී අකසිර-ලාභී"ති, සීලෙස්වෙවස්ස පරිපූරකාරී -පෙ- බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (7)

9. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු "යෙ තෙ සන්තා විමොක්ඛා[2] අතික්කම්ම රූපෙ ආරුප්පා, තෙ කායෙන ඵස්සිත්වා[3] විහරෙය්‍ය"න්ති, සීලෙ-ස්වෙවස්ස පරිපූරකාරී -පෙ- බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (8)

1. අභිචෙතසිකානං, කත්ථචි, 2. විමොඛා, PTS. 3. ඵුසිත්වා, මජසං, සහ.

3. මහණෙනි, මහණෙක් තෙමේ "චීවර පිණ්ඩපාත සෙනාසන ගිලාන-පච්චය භෙසජ්ජපරික්ඛාරයන් ලබන්නෙම් වන්නෙම්"යි කැමැති වන්නේ නම්, ශීලය ම සම්පූර්ණ කරන්නෙක් වන්නේ ය. ස්වකීය චිත්ත සමථයෙහි එක්වන් යෙදුනේ බැහැර නො කළ හෝ නො නැසූ ධ්‍යාන ඇත්තේ විදර්ශනාවෙන් යුක්ත වූයේ ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේය.

4. මහණෙනි, මහණෙක් තෙමේ "යම් කෙනෙකුන්ගේ චීවර පිණ්ඩපාත ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරයන් වළඳම් ද, ඔවුන්ගේ ඒ ප්‍රත්‍යයදානයෝ මහත්ඵල මහත් ආනිසංස ඇත්තාහු වෙත්වා"යි කැමැති වන්නේ නම්, ශීලය ම සම්පූර්ණ කරන්නේ ... ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේ ය.

5. මහණෙනි, මහණෙක් තෙමේ "පරලොව ගියා වූ කළුරිය කළා වූ නෑ සහලේ නෑ කෙනෙක් පහන් සිත් ඇත්තාහු මා සිහි කරත් ද, ඔවුන්ගේ ඒ සිහි කිරීම මහත්ඵල මහත් ආනිසංස ඇත්තක් වේවා"යි කැමැති වන්නේ නම්, ශීලය ම සම්පූර්ණ කරන්නේ... ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේ ය.

6. මහණෙනි, මහණෙක් තෙමේ "ධ්‍යානාදි අධිකුශල ධර්මයන්හි නො ඇලීම හා කම්සැපෙහි ඇලීම ද මැඩ පවත්වන්නෙම් වන්නෙමි. අරතිය මා නො මඩීවා. උපන් අරතිය මඩිමින් වාසය කරන්නේනම්යි කැමැති වන්නේ නම්, ශීලය ම සම්පූර්ණ කරන්නේ ... ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේ ය.

7. මහණෙනි, මහණෙක් තෙමේ "තැති ගැණුම් හා බිහිසුණු අරමුණු මඩින්නෙම් වන්නෙමි. තැති ගැණුම් හා බිහිසුණු අරමුණු මා නො මඩීවා. උපන් තැති ගැණුම් හා බිහිසුණු අරමුණු මඩිමින් වසන්නෙමි"යි කැමැති වන්නේ නම්, ශීලය ම සම්පූර්ණ කරන්නේ... ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේ ය.

8. මහණෙනි, මහණෙක් තෙමේ "අධිචිත්තයෙහි උපන් දිටුදමියෙහි සැප විහරණය ඇති සිවුදැහැන් කැමැති සේ ලබන්නෙම්, නිදුකින් ලබන්නෙම්, මහත් (වුට්ඨානවසිතාවෙන් යුක්ත) සේ ධ්‍යාන ලබන්නෙම් වන්නෙමි" යි කැමැති වන්නේ නම් ශීලය ම සම්පූර්ණ කරන්නේ... ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේ ය.

9. මහණෙනි, මහණෙක් තෙමේ "රූපාවචරධ්‍යානයන් ඉක්මවා සිටි ආරූප්‍ය වූ යම් ඒ ශාන්තවිමොක්ෂයෝ වෙත් ද, ඒ විමොක්ෂයන් නාම කායයෙන් ස්පර්ශ කොට වාසය කරන්නෙමි"යි කැමැති වන්නේ නම්, ශීලය ම සම්පූර්ණ කරන්නේ ...ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේ ය.

10. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු "තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො අස්සං අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො"ති සීලෙස්වෙවස්ස පරිපූරකාරී -පෙ- බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (9)

11. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු "තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී අස්සං, සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරෙය්‍ය"න්ති සීලෙස්වෙවස්ස පරිපූරකාරී -පෙ- බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (10)

12. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු "පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො අස්සං, තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා"ති සීලෙස්වෙස්ස පරිපූරකාරී -පෙ- බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (11)

13. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු "අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභවෙය්‍යං, එකොපි හුත්වා බහුධා අස්සං, බහුධාපි හුත්වා එකො අස්සං, ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡෙය්‍යං සෙය්‍යථාපි ආකාසෙ, පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං[1] කරෙය්‍යං සෙය්‍යථාපි උදකෙ, උදකෙපි අභිජ්ජමානෙ[2] ගච්ඡෙය්‍යං සෙය්‍යථාපි පඨවියං, ආකාසෙපි පල්ලඞ්කෙන කමෙය්‍යං සෙය්‍යථාපි පක්ඛී සකුණො, ඉමෙපි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ මහානුභාවෙ පාණිනා පරිමසෙය්‍යං[3] පරිමජ්ජෙය්‍යං, යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙය්‍ය"න්ති සීලෙස්වෙවස්ස පරිපූරකාරී -පෙ- බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (12)

14. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු: 'දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසකාය[4] උභො සද්දෙ සුණෙය්‍යං: දිබ්බෙ ච මානුසෙ ච, යෙ දූරෙ සන්තිකෙ චා"ති සීලෙස්වෙවස්ස පරිපූරකාරී -පෙ- බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (13)

15. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු "පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානෙය්‍යං: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානෙය්‍යං, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානෙය්‍යං, සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානෙය්‍යං, වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානෙය්‍යං, සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානෙය්‍යං, වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානෙය්‍යං,

---

1. උම්මුජ්ජනිම්මුජ්ජං, සෳ 2. අභිජ්ජමානො, මජසං.
3. පරාමසෙය්‍යං, මජසං, සෳ. 4. අතික්කන්තමානුසිකාය, මජසං. සෳ, PTS.

10. මහණෙනි, මහණෙක් තෙමේ “මම සංයෝජන තුනක් ක්‍ෂය කිරීමෙන් දුගතියක නො වැටෙන ස්වභාවය ඇති නියත වූ උපරිම මාර්ගත්‍රයත් පිහිට කොට ඇති (-සකෘදාගාමි ආදි මාර්ග තුනට අවශ්‍යයෙන් පැමිණෙන) සෝතාපන්නයෙක් වන්නෙමි”යි කැමැති වන්නේ නම්, ශීලය ම සම්පූර්ණ කරන්නේ... ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේ ය.

11. මහණෙනි, මහණෙක් තෙමේ “සංයෝජන තුනක් ක්‍ෂය කිරීමෙන් රාග ද්වේෂ මෝහයන් තුනී කිරීමෙන් සකෘදාගාමී වන්නෙමි. වරක් මේ මිනිස් ලොවට උත්පත්තිවශයෙන් පැමිණ දුක් කෙළවර කරන්නෙමි” යි කැමැති වන්නේ නම්, ශීලය ම සම්පූර්ණ කරන්නේ... ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේ ය.

12. මහණෙනි මහණෙක් තෙමේ “මම ඔරම්භාගිය සංයෝජන පස ක්‍ෂය කිරීමෙන් ඖපපාතික (-වශයෙන් බඹලොව උපදින්නෙම්) වන්නෙමි. ඒ බඹලොවින් පෙරළා නො එන ස්වභාව ඇත්තෙම් එහි පිරිනිවෙන්නෙමි” යි කැමැති වන්නේ නම්, ශීලය ම සම්පූර්ණ කරන්නේ... ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේ ය.

13. මහණෙනි, මහණෙක් තෙමේ “නන් වැදෑරුම් ඍද්ධිකොට්ඨාසයන්ට පැමිණෙන්නෙමි: එකෙක් ම වී බොහෝ ආකාර වෙමි. විවිධාකාර ද වී එකෙක් වන්නෙමි. ප්‍රකට බවට, අප්‍රකට බවට, භිත්තියෙන් පිටත, පවුරෙන් පිටත, පර්වතෙන් පිටත අහසෙහිමෙන් නො ගැටෙමින් යන්නෙමි. දියෙහි මෙන් පොළොවෙහි ද මතු වීම් ගැලීම් කරන්නෙමි. පොළොවෙහි මෙන් නො බිඳෙන දියෙහි යන්නෙමි. පියාපත් ඇති පක්‍ෂියකු සේ අහසෙහි ද පලඟින් යුක්ත ව (පලක් බැඳ) හැසිරෙමි. මෙබඳු මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා ද අත්ලෙන් ස්පර්ශ කොට පිරිමදින්නෙමි. බඹලොවතෙක් කයින් තමා වශයෙහි පවත්වන්නෙමි” යි කැමැති වන්නේ නම්, ශීලය ම සම්පූර්ණ කරන්නේ... ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේ ය.

14. මහණෙනි, මහණෙක් තෙමේ “මම පිරිසිදු වූ මිනිස්කණ ඉක්මවා සිටි දිවකණින් දුර සිටියා වූත් සමීපයෙහි සිටියා වූත් දෙවියන් පිළිබඳ වූත් මිනිසුන් පිළිබඳ වූත් ශබ්ද අසන්නෙමි” යි කැමැති වන්නේ නම්, ශීලය ම සම්පූර්ණ කරන්නේ... ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේ ය.

15. මහණෙනි, මහණෙක් තෙමේ “මම රාගසහිත වූ හෝ සිත රාග සහිත සිත ය යි දැනගන්නෙමි, පහ වූ රාගය ඇත්තා වූ හෝ සිත පහ වූ රාගය ඇත්තා වූ සිත ය යි දැන ගන්නෙමි, සද්වේෂ වූ හෝ සිත සද්වේෂ සිත ය යි දැන ගන්නෙමි. වීතද්වේෂ වූ හෝ සිත වීතද්වේෂ සිත ය යි දැනගන්නෙමි, මෝහ සහිත හෝ සිත මෝහ සහිත සිත ය යි දැනගන්නෙමි, වීතමෝහ වූ හෝ සිත ය යි වීතමෝහසිත දැනගන්නෙමි,

සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානෙය්‍යං, වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානෙය්‍යං, මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානෙය්‍යං, අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානෙය්‍යං, සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානෙය්‍යං; අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානෙය්‍යං, සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානෙය්‍යං, අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානෙය්‍යං, විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානෙය්‍යං, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානෙය්‍ය''න්ති, සීලෙස්වෙවස්ස පරිපූරකාරී -පෙ- බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (14)

16. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු ''අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරෙය්‍යං, සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසතිම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාලීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි, අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ 'අමුත්‍රාසිං එවන්නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං[1]. තත්‍රාපාසිං එවන්නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො'ති ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරෙය්‍ය''න්ති, සීලෙස්වෙවස්ස පරිපූරකාරී -පෙ- බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (15)

17. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු: ''දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සෙය්‍යං - චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ; යථාකම්මූපගෙ සත්තෙ පජානෙය්‍යං: 'ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා; ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා-

---

1 උදපාදිං, මජසං., සයා, PTS

Free Distribution www.aathaapi.org

ථිනමිද්ධයෙන් හැකුළුණා වූ හෝ සිත හැකුළුණු සිත ය යි දැනගන්නෙමි. (උද්ධච්චයෙන්) විසුරුණා වූ හෝ සිත විසුරුණු සිත ය යි දැනගන්නෙමි. මහද්ගත (රූපාරූපාවචර) වූ හෝ සිත මහද්ගත සිත ය යි දැනගන්නෙමි. අමහද්ගත (කාමාවචර) වූ හෝ සිත අමහද්ගත සිත ය යි දැනගන්නෙමි. ත්‍රෛභූමක වූ හෝ සිත ත්‍රෛභූමක සිත ය යි දැනගන්නෙමි. සඋත්තර (කාමාවචර) වූ හෝ සිත සඋත්තර සිතය යි දැනගන්නෙමි. අනුත්තර (රූපාරූපාවචර) වූ හෝ සිත අනුත්තර සිත ය යි දැනගන්නෙමි. සමාහිත වූ හෝ සිත සමාහිත සිත ය යි දැනගන්නෙමි. අසමාහිත වූ හෝ සිත අසමාහිත සිත ය යි දැනගන්නෙමි. විමුක්ත වූ හෝ සිත විමුක්ත සිත ය යි දැන ගන්නෙමි. අවිමුක්ත වූ හෝ සිත අවිමුක්ත සිත ය යි දැනගන්නෙමි. සෙසු සත්ත්වයන්ගේ සෙසු පුද්ගලයන්ගේ සිත තම සිතින් පිරිසිඳ දැන ගන්නෙමි" යි කැමැති වන්නේ නම්, ශීලය ම සම්පූර්ණ කරන්නේ... ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේ ය.

16. මහණෙනි, මහණෙක් තෙමේ "නන් වැදෑරුම් වූ පූර්වේනිවාසය සිහි කරන්නෙමි - එනම්: එක් ජාතියක් ද ජාති දෙකක් ද ජාති තුනක් ද ජාති හතරක් ද ජාති පහක් ද ජාති දශයක් ද ජාති විස්සක් ද ජාති තිසක් ද ජාති සතළිසක් ද ජාති පණසක් ද ජාති සියයක් ද ජාති දහසක් ද ජාති ලක්ෂයක් ද, නස්නා නොයෙක් කල්පයන් ද හට ගන්නා නොයෙක් කල්පයන් ද නොයෙක් නස්නා හටගන්නා කල්පයන් ද 'අසුවල් තැන මේනම් ඇත්තෙම් වීමි. මේනම් ගොත්‍ර ඇත්තෙම් වීමි. මෙබඳු පැහැ ඇත්තෙම් වීමි. මෙබඳු අහර ඇත්තෙම් වීමි. මෙබඳු සැපදුක් විඳින්දෙම් වීමි. මෙබඳු ආයු කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුත වූයෙම් අසුවල් තැන උපනිමි. එහිදු මෙබඳු නම් ඇත්තෙම් වීමි. මෙබඳු ගොත් ඇත්තෙම් වීමි. මෙබඳු පැහැ ඇත්තෙම් වීමි. මෙබඳු අහර ඇත්තෙම් වීමි. මෙබඳු සැපදුක් විඳින්දෙම් වීමි. මෙබඳු ආයු කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුත වූයෙම් මෙහි උපන්නෙමි.' මෙසේ ආකාර සහිත වූ උද්දෙස සහිත වූ නන් වැදෑරුම් පූර්වේනිවාසය සිහි කරන්නෙමි"යි කැමැති වන්නේ නම්, ශීලය ම සම්පූර්ණ කරන්නේ... ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේ ය.

17. මහණෙනි, මහණෙක් තෙමේ "පිරිසිදු වූ මිනිසැස ඉක්මවා සිටි දිවැසින් චුත වන උපදින හීන වූ ප්‍රණීත වූ මනා පැහැති නො මනා පැහැ ඇති සුගතියට ගිය දුගතියට ගිය සත්ත්වයන් දකින්නෙමි. කම් වූ පරිදි මිය පරලොව ගිය සත්ත්වයන් දැනගන්නෙමි. එකාන්තයෙන් මේ සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු වාග්දුශ්චරිතයෙන් යුක්ත වූවාහු මනොදුශ්චරිතයෙන් යුක්ත වූවාහු ආර්‍ය්‍යොපවාද කළාහු මිසදිටු ගත්තාහු මිසදිටු වශයෙන් සමාදන් වූ නන්වැදෑරුම් කම් ඇත්තාහු ය. ඒ සත්ත්වයෝ කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට පිහිට වූ විවසව පතිත වන්නා වූ නිරයට ප්‍රතිසන්ධි වශයෙන් පැමිණියාහු ය. මේ භවත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්ත වූවාහු වාක්සුචරිතයෙන් යුක්ත වූවාහු මනඃසුචරිතයෙන් යුක්ත වූවාහු ආර්‍ය්‍යොපවාද නො කළාහු සම්දිටු ගත්තාහු සම්දිටු වශයෙන් සමාදන් වූ නන් වැදෑරුම් කම් ඇත්තාහු ය-

Free Distribution www.aathaapi.org

තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති; ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සෙය්‍යං - චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ, සුගතෙ දුග්ගතෙ, යථාකම්මූපගෙ සත්තෙ පජානෙය්‍ය''න්ති සීලෙස්වෙවස්ස පරිපූරකාරි අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (16)

18. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු ''ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා[1] සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍ය''න්ති, සීලෙස්වෙවස්ස පරිපූරකාරී අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (17)

19. ''සම්පන්නසීලා භික්ඛවෙ විහරථ සම්පන්නපාතිමොක්ඛා. පාතිමොක්ඛසංවරසංවුතා විහරථ ආචාරගොචරසම්පන්නා. අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛථ සික්ඛාපදෙසූති'' ඉති යන්තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තන්ති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

ආකඞ්ඛෙය්‍යසුත්තං ඡට්ඨං.

1. 1. 7

වත්ථූපමසුත්තං

1. **එවං** මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. සෙය්‍යථාපි භික්ඛවෙ වත්ථං සඞ්කිලිට්ඨං මලග්ගහිතං, තමෙනං රජකො යස්මිං යස්මිං රඞ්ගජාතෙ උපසංහරෙය්‍ය යදි නීලකාය යදි පීතකාය යදි ලොහිතකාය යදි මඤ්ජෙට්ඨකාය,[2] දුරත්තවණ්ණමෙවස්ස. අපරිසුද්ධවණ්ණමෙවස්ස. තං කිස්ස හෙතු? අපරිසුද්ධත්තා භික්ඛවෙ වත්ථස්ස. එවමෙව ඛො භික්ඛවෙ චිත්තෙ සඞ්කිලිට්ඨෙ දුග්ගති පාටිකඞ්ඛා.

---

1. අභිඤ්ඤාය, PTS.   2. මඤ්ජට්ඨකාය, මජසං.

Free Distribution   www.aathaapi.org

ඒ සත්ත්වයෝ කාබුත් මරණින් මතු මනා ගති ඇති ස්වර්ගලොකයට ප්‍රතිසන්ධි වශයෙන් පැමිණියාහු ය. මෙසේ පිරිසිදු වූ මිනිසැස ඉක්මවා සිටි දිවැසින් ච්‍යුත වන උපදින හීන වූ ප්‍රණීත වූ සුවර්ණ වූ දුර්වර්ණ වූ සුගතිගත වූ දුගතිගත වූ සත්ත්වයන් දකින්නෙම්වා, කම් වූ පරිදි මිය පරලොව ගිය සත්ත්වයන් දැනගන්නෙම්වා” යි කැමැති වන්නේ නම් ශීලයෙහි ම සම්පූර්ණකාරී වන්නේ ය. ස්වකීය චිත්ත සමථයෙහි එක්වන් යෙදුනේ බැහැර නො කළ ධ්‍යාන ඇත්තේ විදර්ශනාවෙන් යුක්ත වූයේ ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේ ය.

18. මහණෙනි, මහණෙක් “ආස්‍රවක්ෂය කිරීමෙන් ආස්‍රව රහිත වූ චිත්තවිමුක්තිය (අර්හත්ඵල සම්ප්‍රයුක්ත සමාධිය) ප්‍රඥාවිමුක්තිය (අර්හත් ඵල සම්ප්‍රයුක්ත ප්‍රඥාව) ඉහාත්මයෙහි දී ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට එයට පැමිණ වාසය කරන්නෙම්වා” යි කැමැති වන්නේ නම් ශීලයෙහි ම සම්පූර්ණකාරී වන්නේ ය. ස්වකීය චිත්ත සමථයෙහි එක්වන් යෙදුනේ බැහැර නො කළ ධ්‍යාන ඇත්තේ විදර්ශනාවෙන් යුක්ත වූයේ ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේ ය.

19. “මහණෙනි, පිරිපුන් සිල් ඇතිව ප්‍රාතිමොක්ෂ සම්පන්න ව වසවු. ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවෘත ව ආචාරයෙන් හා ගොචරයෙන් සමෘද්ධ ව වසවු. ස්වල්පමාත්‍ර වූ වරදෙහි භය දක්නාසුලු ව සමාදන් ව ශික්ෂාපදයන්හි හික්මෙවු” යි මෙසේ යම් ඒ වචනයෙක් කියන ලද ද, එය මේ සඳහා කියන ලදී.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

ආකඞ්ඛෙය්‍ය සූත්‍රය සවැනි යි.

1. 1. 7

වත්ථූපම සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජෙතවන නම් අනේපිඬුසිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි භික්ෂූන් ඇමතූ සේක. භික්ෂූහු ‘වහන්සැ’යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළ සේක.

2. මහණෙනි, කිලිටි වූ මල ගත් වස්ත්‍රයෙක් වේ ද, ඒ වස්ත්‍රය රජකයෙක් නිල්පැහැය පිණිස හෝ රත්වත්පැහැය පිණිස හෝ ලේවත්පැහැය පිණිස හෝ මදටිය(මදරත්)පැහැය පිණිස හෝ යම් යම් රඳනෙක බහා ලන්නේ නම්, එය නො මනා ව රැඳූ පැහැ ඇත්තක් ම වන්නේ ය. අපිරිසිදු පැහැ ඇත්තක් ම වන්නේ ය. ඒ කවර හෙයින යත්: මහණෙනි, වස්ත්‍රය අපිරිසිදුබැවිනි මහණෙනි, එපරිද්දෙන් ම සිත කිලිටි වූ කල්හි දුගතිය කැමැති විය යුතු යි.

3. සෙය්‍යථාපි භික්ඛවෙ වත්ථං පරිසුද්ධං පරියොදාතං, තමෙනං රජකො යස්මිං යස්මිං රඞ්ගජාතෙ උපසංහරෙය්‍ය යදි නීලකාය යදි පීතකාය යදි ලොහිතකාය යදි මඤ්ජෙට්ඨකාය, සුරත්තවණ්ණමෙවස්ස. පරිසුද්ධවණ්ණමෙවස්ස. තං කිස්ස හෙතු? පරිසුද්ධත්තා භික්ඛවෙ වත්ථස්ස. එවමෙව ඛො භික්ඛවෙ චිත්තෙ අසඞ්කිලිට්ඨෙ සුගති පාටිකඞ්ඛා.

4. කතමෙ ච භික්ඛවෙ චිත්තස්ස උපක්කිලෙසා: අභිජ්ඣාවිසමලොභො චිත්තස්ස උපක්කිලෙසො. බ්‍යාපාදො චිත්තස්ස උපක්කිලෙසො. කොධො චිත්තස්ස උපක්කිලෙසො. උපනාහො චිත්තස්ස උපක්කිලෙසො. මක්ඛො චිත්තස්ස උපක්කිලෙසො. පළාසො චිත්තස්ස උපක්කිලෙසො. ඉස්සා චිත්තස්ස උපක්කිලෙසො. මච්ඡරියං චිත්තස්ස උපක්කිලෙසො. මායා චිත්තස්ස උපක්කිලෙසො. සාඨෙය්‍යං චිත්තස්ස උපක්කිලෙසො. ථම්භො චිත්තස්ස උපක්කිලෙසො. සාරම්භො චිත්තස්ස උපක්කිලෙසො. මානො චිත්තස්ස උපක්කිලෙසො. අතිමානො චිත්තස්ස උපක්කිලෙසො. මදො චිත්තස්ස උපක්කිලෙසො. පමාදො චිත්තස්ස උපක්කිලෙසො.

5. ස ඛො සො භික්ඛවෙ භික්ඛු අභිජ්ඣාවිසමලොභො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අභිජ්ඣාවිසමලොභං චිත්තස්ස උපක්කිලෙසං පජහති. බ්‍යාපාදො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා බ්‍යාපාදං චිත්තස්ස උපක්කිලෙසං පජහති. කොධො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා කොධං චිත්තස්ස උපක්කිලෙසං පජහති. උපනාහො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා උපනාහං චිත්තස්ස උපක්කිලෙසං පජහති. මක්ඛො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා මක්ඛං චිත්තස්ස උපක්කිලෙසං පජහති. පළාසො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා පළාසං චිත්තස්ස උපක්කිලෙසං පජහති. ඉස්සා චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා ඉස්සං චිත්තස්ස උපක්කිලෙසං පජහති. මච්ඡරියං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා මච්ඡරියං චිත්තස්ස උපක්කිලෙසං පජහති. මායා චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා මායං චිත්තස්ස උපක්කිලෙසං පජහති. සාඨෙය්‍යං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා සාඨෙය්‍යං චිත්තස්ස උපක්කිලෙසං පජහති. ථම්භො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා ථම්භං චිත්තස්ස උපක්කිලෙසං පජහති. සාරම්භො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා සාරම්භං චිත්තස්ස උපක්කිලෙසං පජහති. මානො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා මානං චිත්තස්ස උපක්කිලෙසං පජහති. අතිමානො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අතිමානං චිත්තස්ස උපක්කිලෙසං පජහති. මදො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා මදං චිත්තස්ස උපක්කිලෙසං පජහති. පමාදො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා පමාදං චිත්තස්ස උපක්කිලෙසං පජහති.

3. මහණෙනි, පිරිසුදු පබසර වතක් වේ ද, එය රජකයෙක් නිල්පැහැය පිණිස හෝ රත්වත්පැහැය පිණිස හෝ ලේවත්පැහැය පිණිස හෝ මදටිය පැහැය පිණිස හෝ යම් යම් රඳතෙක බහා ලත්තේ නම්, එය මනා පැහැ ඇත්තක් ම වත්තේ ය. පිරිසිදු පැහැ ඇත්තක් ම වත්තේ ය. ඒ කවර හෙයින යත්: මහණෙනි, වස්ත්‍රය පිරිසිදු බැවිනි. මහණෙනි, එපරිද්දෙන් ම සිත නො කිලිටි වූ කල්හි සුගතිය ම කැමැති විය යුතු යි.

4. මහණෙනි, චිත්තොපක්ලේශයෝ (සිත කෙලෙසන ධර්මයෝ) කවරහු ද ? අභිධ්‍යා (-ස්වකීය වස්තුවෙහි ඡන්දරාගය) විෂමලොභය (-මෙරමා අයත් වස්තුවෙහි ඡන්දරාගය) සිත කෙලෙසන්නෙකි. ව්‍යාපාදය සිත කෙලෙසන්නෙකි. ක්‍රොධය සිත කෙලෙසන්නෙකි. උපනාහය (බද්ධවෛරය) සිත කෙලෙසන්නෙකි. මක්ඛය (ගුණ මකු බව) සිත කෙලෙසන්නෙකි. පලාසය (යුගග්‍රාහය) සිත කෙලෙසන්නෙකි. ඊර්ෂ්‍යාව සිත කෙලෙසන්නකි. මසුරුබව සිත කෙලෙසන්නෙකි. මායාව සිත කෙලෙසන්නකි. කපටිබව සිත කෙලෙසන්නෙකි. ථම්භය (තදබව) සිත කෙලෙසන්නෙකි. සාරම්භය (එකට වැඩියෙන් එකක් කිරීම) සිත කෙලෙසන්නෙකි මානය සිත කෙලෙසන්නෙකි. අතිමානය සිත කෙලෙසන්නෙකි. මදය සිත කෙලෙසන්නෙකි. ප්‍රමාදය සිත කෙලෙසන්නෙකි.

5. මහණෙනි, ඒ භික්ෂු තෙම අභිධ්‍යාවිෂමලොභය සිත පිළිබඳ උපක්ලේශයෙකැයි මෙසේ දැන සිත පිළිබඳ උපක්ලේශ වූ අභිධ්‍යා විෂම-ලොභය දුරු කරයි. ව්‍යාපාදය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන ව්‍යාපාදය දුරු කරයි. ක්‍රොධය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන ක්‍රොධය දුරු කරයි. උපනාහය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන උපනාහය දුරු කරයි. මක්ඛය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන මක්ඛය දුරු කරයි. පලාසය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන පලාසය දුරු කරයි. ඊර්ෂ්‍යාව සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන ඊර්ෂ්‍යාව දුරු කරයි. මසුරුබව සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන මසුරුබව දුරු කරයි. මායාව සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන මායාව දුරු කරයි. කපටිබව සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන කපටිබව දුරු කරයි. ථම්භය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන ථම්භය දුරු කරයි. සාරම්භය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන සාරම්භය දුරු කරයි. මානය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන මානය දුරු කරයි. අතිමානය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු-කරන අතිමානය දුරු කරයි. මදය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන මදය දුරු කරයි. ප්‍රමාදය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන ප්‍රමාදය දුරු කරයි.

6. යතො ච ඛො භික්ඛවෙ භික්ඛුනො අභිජ්ඣාවිසමලොභො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අභිජ්ඣාවිසමලොභො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, බ්‍යාපාදො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා බ්‍යාපාදො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, කොධො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා කොධො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, උපනාහො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා උපනාහො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, මක්ඛො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා මක්ඛො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, පළාසො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා පළාසො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, ඉස්සා චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා ඉස්සා චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, මච්ඡරියං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා මච්ඡරියං චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, මායා චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා මායා චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, සාඨෙය්‍යං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා සාඨෙය්‍යං චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, ථම්භො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා ථම්භො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, සාරම්භො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා සාරම්භො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, මානො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා මානො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, අතිමානො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අතිමානො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, මදො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා මදො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, පමාදො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා පමාදො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති.

7. සො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති. සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා, එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

6. මහණෙනි, යම් කලෙක මහණකුගේ අභිධ්‍යාවිෂමලොභය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ අභිධ්‍යාවිෂමලොභය ප්‍රහීණ වූයේ වේ ද, ව්‍යාපාදය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ ව්‍යාපාදය ප්‍රහීණ වූයේ වේ ද, ක්‍රොධය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ ක්‍රොධය ප්‍රහීණ වූයේ වේ ද, බද්ධවෛරය (උපනාහය) සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ බද්ධවෛරය ප්‍රහීණ වූයේ වේ ද, ගුණමකුකම (මක්ඛය) සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ ගුණමකුකම ප්‍රහීණ වූයේ වේ ද. පලාසය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ පලාසය ප්‍රහීණ වූයේ වේ ද, ඊර්ෂ්‍යාව සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ ඊර්ෂ්‍යාව ප්‍රහීණ වූයේ වේ ද, මසුරුකම සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ මසුරුකම ප්‍රහීණ වූයේ වේ ද, මායාව සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ මායාව ප්‍රහීණ වූයේ වේ ද, කපටිකම සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ කපටිකම ප්‍රහීණ වූයේ වේ ද, ථම්භය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ ථම්භය ප්‍රහීණ වූයේ වේ ද, සාරම්භය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ සාරම්භය ප්‍රහීණ වූයේ වේ ද, මානය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ මානය ප්‍රහීණ වූයේ වේ ද, අතිමානය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ අතිමානය ප්‍රහීණ වූයේ වේ ද, මදය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ මදය ප්‍රහීණ වූයේ වේ ද, ප්‍රමාදය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ ප්‍රමාදය ප්‍රහීණ වූයේ වේ ද,

7. හෙතෙම බුදුරජානන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වූයේ වෙයි: "ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කාරණයෙන් අර්හත්හ. සම්‍යක්සම්බුද්ධයහ, අෂ්ට විද්‍යාවෙන් හා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තයහ, සුගතයහ, ලොකවිදූහ, අනුත්තර පුරිසදම්මසාරථියහ, දෙව්මිනිසුන්ගේ ශාස්තෘයහ. බුද්ධයහ, භගවත්හ," කියා යි. ධර්මයෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වූයේ වෙයි: "භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනා කොට දෙසන ලද්දේ ය. සන්දිට්ඨික ය (තමා විසින් දක්ක යුතු ඵල ඇත්තේ ය) අකාලික (කල් නො යවා විපාක දෙන්නේ) ය. ඒහිපස්සික 'එව, මෙය බලව' යි දැක්වීමට සුදුසු) ය. ඕපනයික (සිත්හි එළවිය යුතු) ය. නුවණැත්තන් විසින් තමන් තමන් කෙරෙහි ලා දත යුතු ය" කියා යි. සඞ්ඝයා කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වූයේ වෙයි: "භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝයා සුපටිපන්න ය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝයා උජුපටිපන්න ය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝයා ඤායපටිපන්න ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝයා සාමීචිපටිපන්න ය. යම් මේ සොතාපන්නාදි පුරිස යුගල සතරෙක් වේ ද, (සොතාපත්තිමග්ගට්ඨ සොතාපත්තිඵලට්ඨ ආදි) පුරිස පුග්ගලයෝ අට දෙනෙක් වෙත් ද, මේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ දුර සිට ගෙනා සිවුපසය ලැබීමට සුදුසු ය. ආගන්තුකසත්කාරය ලැබීමට සුදුසු ය. දක්ෂිණාවට සුදුසු ය. දොහොත් මුදුන් දී වැඳීමට සුදුසු ය. ලොකයාට උතුම් පින්කෙත ය" කියා යි.

8. යතොපි[1] ඛො පනස්ස චත්තං හොති වන්තං මුත්තං පහීනං පටිනිස්සට්ඨං. සො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතොම්හීති ලභති අත්ථවෙදං. ලභති ධම්මවෙදං. ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතොම්හීති ලභති අත්ථවෙදං. ලභති ධම්මවෙදං. ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති. සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතොම්හීති ලභති අත්ථවෙදං. ලභති ධම්මවෙදං. ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති. 'යතොපි[1] ඛො පන මෙ චත්තං වන්තං පහීනං පටිනිස්සට්ඨ'න්ති ලභති අත්ථවෙදං. ලභති ධම්මවෙදං. ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති.

9. ස ඛො සො භික්ඛවෙ භික්ඛු එවංසීලො එවංධම්මො එවංපඤ්ඤො සාලීනඤ්චෙපි පිණ්ඩපාතං භුඤ්ජති විචිතකාළකං අනෙකසූපං අනෙකබ්‍යඤ්ජනං, නෙවස්ස තං හොති අන්තරායාය. සෙය්‍යථාපි භික්ඛවෙ වත්ථං සඞ්කිලිට්ඨං මලග්ගහිතං අච්ඡං උදකං ආගම්ම පරිසුද්ධං හොති පරියොදාතං, උක්කාමුඛං වා පනාගම්ම ජාතරූපං පරිසුද්ධං හොති පරියොදාතං, එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු එවංසීලො එවංධම්මො එවංපඤ්ඤො සාලීනඤ්චෙපි පිණ්ඩපාතං භුඤ්ජති විචිතකාළකං අනෙකසූපං අනෙකබ්‍යඤ්ජනං, නෙවස්ස තං හොති අන්තරායාය.

10. සො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං. තථා තතියං. තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං. තථා තතියං. තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති.

1. යතොධි - සීමු "අට්ඨකථාය 'යතොධි' ඉති පාඨන්තරවසෙන නිද්දිට්ඨං.

8. යම් හෙයකින් ඒ මහණහු විසින් උපක්ලේශ දුරු කරන ලද්දේ ද, වමනය (නැවත නො ගන්නා සේ බැහැර කරණ ලද්දේ ද), මුදන ලද්දේ ද, ප්‍රහීණ කරණ ලද්දේ ද, දුරු කරණ ලද්දේ ද, ඒ හෙ තෙමේ 'මම බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වෙමි'යි අර්ථවේදය (බුද්ධාදීන් කෙරෙහි අවේත්‍යප්‍රසාදයෙන් ඇති වන සොම්නස) ලබයි. ධර්මවේදය (සොම්නසිත් උපන් ඤාණය) ලබයි. සොම්නසිත් හා ඤාණයෙන් යුක්ත ප්‍රමෝදය ලබයි. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය හටගනියි. ප්‍රීතියෙන් යුත් සිත් ඇත්තහුගේ කය සන්හිඳෙයි. සන්හිඳුනු කය ඇත්තේ සුව විඳියි. සුව ඇත්තහුගේ සිත සමාධිගත වෙයි. 'ධර්මය කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වෙමි'යි අර්ථවේදය ලබයි. ධර්මවේදය ලබයි. සොම්නසින් හා ඤාණයෙන් යුක්ත ප්‍රමෝදය ලබයි. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය හට ගනියි. ප්‍රීතියෙන් යුත් සිත් ඇත්තහුගේ කය සන්හිඳෙයි. සන්හිඳුනු කය ඇත්තේ සැප විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධිගත වෙයි. 'සඞ්ඝයා කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වෙමි'යි අර්ථවේදය (ගුණ දැන පැහැදීම නිසා ඇති වන සොම්නස) ලබයි. ධර්මවේදය (සොම්නසින් උපන් ඤාණය) ලබයි. සොම්නසින් හා ඤාණයෙන් යුක්ත ප්‍රමෝදය ලබයි. ප්‍රමුදිත වූවහුට ප්‍රීති ඇති වෙයි. ප්‍රීතියෙන් යුත් සිත් ඇත්තහුගේ කය සන්හිඳෙයි. සන්හිඳුනු කය ඇත්තේ සුව විඳියි. සුව ඇත්තහුගේ සිත සමාධිගත වෙයි. 'යම් හෙයකින් මා විසින් උපක්ලේශ ත්‍යක්තය, වමිත ය, ප්‍රහීණ ය, ප්‍රතිනිස්සෘෂ්ට ය' යි සිතන්නේ අර්ථවේදය ලබයි. ධර්මවේදය ලබයි. සොම්නසින් හා ඤාණයෙන් යුක්ත ප්‍රමෝදය ලබයි. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය හට ගනියි. ප්‍රීතියෙන් යුත් සිත් ඇත්තහුගේ කය සන්සිඳෙයි. සන්සිඳුනු කය ඇත්තේ සුව විඳියි. සුව ඇත්තහුගේ සිත සමාධිගත වෙයි.

9. මහණෙනි, මෙබඳු සිල් ඇති මෙබඳු දහම් ඇති මෙබඳු නුවණ ඇති ඒ අනගැමි මහණ තෙම බැහැර කළ කළු සහල් ඇති නොයෙක් සූපව්‍යඤ්ජන ඇති ඇල්සාලේ බත වළඳයි ද, ඔහුට එය මාර්ගඵලාන්තරාය පිණිස නො වෙයි. මහණෙනි, යම්සේ කිලුටු වූ මල ගත් වස්ත්‍රයක් පිරිසුදු ජලයට පැමිණ පිරිසුදු වූයේත් පබසර වූයේත් වේ ද, උදුන්මුවට පැමිණ රන් පිරිසිදු වූයේත් බබළන්නේත් වේ ද, මහණෙනි, එපරිද්දෙන් ම මෙබඳු සිල් ඇති මෙබඳු දහම් ඇති මෙබඳු නුවණ ඇති භික්ෂු තෙම බැහැර කළ කළු සහල් ඇති නොයෙක් සූපව්‍යඤ්ජන ඇති ඇල්සහලේ බත වළඳන්නේ නමුත් එය ඔහුට මාර්ගඵලාන්තරාය පිණිස නො වෙයි.

10. හෙතෙම මෛත්‍රී සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේ ම දෙවෙනි දිශාව ද, එසේ ම තෙවෙනි දිශාව ද, එසේ ම සිවු- වැනි දිශාව ද, එසේ ම උඩ යට සරස ද සියලු තන්හි සියල්ලන් තමන් හා සම කොට ගැන්මෙන් සියලු සතුන් ඇති ලොව විශාල වූ මහත්බවට පැමිණි අප්‍රමාණ වූ අවෛරයෙන් අව්‍යාපාදවූ මෛත්‍රීසහගත සිතින් පතුරුවා වාසය කෙරෙයි. කරුණාසහගත සිතින්... මුදිතාසහගත සිතින්... උපෙක්ඛා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේ ම දෙවෙනි දිශාව ද, තෙවෙනි දිශාව ද, එසේ ම සිවුවැනි දිශාව ද, එසේ ම උඩ යට සරස ද සියලු තන්හි සියල්ලන් තමන් හා සම කොට ගැන්මෙන් සියලු සත්ත්වයන්ගෙන් යුක්ත වූ ලොකය විශාල වූ මහත්බවට පැමිණි අප්‍රමාණ වූ අවෛර වූ නිදුක් වූ උපෙක්ෂාසහගත සිතින් පතුරුවා වාසය කරයි.

11. 'සො අත්ථි ඉදං, අත්ථි හීනං, අත්ථි පණීතං, අත්ථි ඉමස්ස සඤ්ඤාගතස්ස උත්තරිං නිස්සරණ'න්ති පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති. භවාසවාපි චිත්තං විමුච්චති. අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති. වුසිතං බ්‍රහ්මචරියං. කතං කරණීයං. නාපරං ඉත්ථත්තායාති පජානාති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු සිනාතො අන්තරෙන සිනානෙනාති.

12. තෙන ඛො පන සමයෙන සුන්දරිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවතො අවිදූරෙ නිසින්නො හොති. අථ ඛො සුන්දරිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: ගච්ඡති පන භවං ගොතමො බාහුකං නදිං සිනායිතුන්ති ?

13. කිං බ්‍රාහ්මණ බාහුකාය නදියා ? කිං බාහුකා නදී කරිස්සතීති ? ලොඛ්‍යසම්මතා හි භො ගොතම බාහුකා නදී බහුජනස්ස. පුඤ්ඤසම්මතා හි භො ගොතම බාහුකා නදී බහුජනස්ස. බාහුකාය ච පන නදියා බහුජනො පාපකං කතං කම්මං පවාහෙතීති.

අථ ඛො භගවා සුන්දරිකභාරද්වාජං බ්‍රාහ්මණං ගාථාහි අජ්ඣභාසි:

බාහුකං අධිකක්කඤ්ච ගයං සුන්දරිකාමපි,
සරස්සතිං පයාගඤ්ච අථො බාහුමතිං නදිං.

නිච්චම්පි බාලො පක්ඛන්නො කණ්හකම්මො න සුජ්ඣති,
කිං සුන්දරිකා කරිස්සති කිං පයාගො කිං බාහුකා නදී,
වෙරිං කතකිබ්බිසං නරං න හි නං සොධයෙ පාපකම්මිනං.

සුද්ධස්ස වෙ සදා ඵග්ගු සුද්ධස්සුපොසථො සදා,
සුද්ධස්ස සුචිකම්මස්ස සදා සම්පජ්ජතෙ වතං,
ඉධෙව සිනාහි බ්‍රාහ්මණ සබ්බභූතෙසු කරොහි ඛෙමතං.

සචෙ මුසා න භණසි සචෙ පාණං න හිංසසි,
සචෙ අදින්නං නාදියසි සද්දහානො අමච්ඡරී,
කිං කාහසි ගයං ගන්ත්වා උදපානොපි තෙ ගයාති.

11. හෙතෙම 'මේ දුඃඛසත්‍යය ඇත. හීන වූ සමුදය සත්‍යය ඇත. උතුම් වූ මාර්ගසත්‍යය ඇත. මේ බ්‍රහ්මවිහාර සංඥාවට වඩා උතුම් නිවනෙක් ඇතැ'යි දැන ගනියි. මමසේ දන්නා වූ මෙසේ දක්නා වූ ඔහුගේ සිත කාමාශ්‍රවයෙන් ද මිදෙයි. භවාශ්‍රවයෙන් ද සිත මිදෙයි. අවිද්‍යාශ්‍රවයෙන් ද සිත මිදෙයි. මිදුණු කල මිදුණේ ය යි ඤාණය ඇති වෙයි. ජාතිය ක්ෂීණ වි ය. බ්‍රහ්මචරියය වැස නිමවන ලදී. සිවුමග කිස කරන ලදී. මෙ අර්හත්ත්වය පිණිස කළ යුතු අනෙකක් නැතැයි දැන ගනියි. මහණෙනි, මෙ භික්ෂු තෙම ඇතුළත නැමෙන් සනාතය කෙළේ ය යි කියනු ලැබේ

12. එකල්හි සුන්දරිකභාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි හුන්නේ වෙයි. ඉක්බිති සුන්දරිකභාරද්වාජ බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතම තෙමේ බාහුකා නදියට නැම පිණිස යේ දැ'යි මෙය කීය.

13. "බමුණ, බාහුකා නදියෙන් කවර ප්‍රයොජනයෙක් ද? බාහුකානදිය කුමක් කරන්නී ද? "භවත් ගෞතමයෙනි, බාහුකානදිය 'විශුද්ධභාවය දෙනැයි නොහොත් ශ්‍රෙෂ්ඨලොකයට පමුණුවනැ'යි බොහෝ දෙනා විසින් සම්මත ය. භවත් ගෞතමයෙනි, බාහුකා නදිය බොහෝ දෙනා විසින් පවිත්‍ර ය (පුණ්‍යතීර්ථයෙකැ) යි සම්මත ය. බාහුකානදියෙහි බොහෝ දෙනා පව්කම් පා කර හරින් ය යි කී ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සුන්දරිකභාරද්වාජ බ්‍රාහ්මණයාට ගාථායෙන් වදාළහ:

බාහුකානදියට ද අධිකක්කා නම් තීර්ථයට ද ගයාතීර්ථයට ද සුන්දරිකා නදියට ද සරස්වතීනදියට ද ප්‍රයාගතීර්ථයට ද යළි බාහුමතී නදියට ද,

කළුපව් ඇති අඥජන තෙමේ නිතර පිවිසියේ නමුත් කෘෂණ (අකුශල) කර්ම ඇති හෙතෙමේ පිරිසිදු නො වෙයි. සුන්දරිකානදිය කුමක් කරන්නී ද? ප්‍රයාගතීර්ථය කිම? බාහුකානදිය කිම? (බාහුකානදී ආදීහු) වෛර ඇත්තා වූ කළ රළුකම් ඇත්තා වූ පාපකර්මයෙන් යුක්ත වූ ඒ නුවණ නැති මිනිසා පිරිසිදු නො කෙරෙත්.

පිරිසිදු වූවහුට (කෙලෙස් නැත්තහුට) හැම කල්හි ම උතුරුපල්ගුන නැකත වේ. පිරිසිදු වූවහුට හැමකල්හි පොහොය වේ. පිරිසිදු වූ පරිශුද්ධ කර්ම ඇත්තහුගේ ව්‍රතය හැම කල්හි සමෘද්ධ වේ. බ්‍රාහ්මණය, මෙහි ම සනාතය කරව. සියලු සතුන් කෙරෙහි මෛත්‍රිය කරව.

බොරුනො කියහි නම්, සතුන්ට හිංසා නො කෙරෙහි නම්, නොදුන් දෙය නො ගනිහි නම්, ශ්‍රද්ධා ඇත්තෙහි මසුරු නොවෙහි නම්, ගයාවට ගොස් කුමක් කරන්නෙහි ද? තාගේ ළිඳ වුව ද ගයාව වේ.

14. එවං වුත්තෙ සුන්දරිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම. අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය; අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය: චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. ලභෙය්‍යාහං භොතො ගොතමස්ස සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පදන්ති.

15. අලත්ථ ඛො සුන්දරිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවතො සන්තිකෙ පබ්බජ්ජං. අලත්ථ උපසම්පදං. අචිරූපසම්පන්නො ඛො පනායස්මා භාරද්වාජො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති. වුසිතං බ්‍රහ්මචරියං. කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ඛො පනායස්මා භාරද්වාජො අරහතං අහොසීති.

වත්ථූපමසුත්තං සත්තමං.

1. 1. 8

සල්ලෙඛසුත්තං

1 එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා මහාචුන්දො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාචුන්දො භගවන්තං එතදවොච:

2. යා ඉමා භන්තෙ අනෙකවිහිතා දිට්ඨියො ලොකෙ උප්පජ්ජන්ති අත්තවාදපටිසංයුත්තා වා ලොකවාදපටිසංයුත්තා වා, ආදිමෙව නු ඛො භන්තෙ භික්ඛුනො මනසි කරොතො එවමෙතාසං දිට්ඨීනං පහානං හොති ? එවමෙතාසං දිට්ඨීනං පටිනිස්සග්ගො හොතීති ?

14. මෙසේ කීකල සුන්දරිකභාරද්වාජ බ්‍රාහ්මණ තෙමේ "භාග්‍යවතුන් වහන්ස, ඉතා මැනව. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනව. භවත් ගෞතමයන් වහන්ස, යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේ යම්සේ ද, වැසුණු දෙයක් වැහුම් හරින්නේ යම්සේ ද, මං මුළා වූවහුට මග කියන්නේ යම්සේ ද, ඇස් ඇත්තාහු රූප දක්නාහු ය යි අන්ධකාරයෙහි තෙල්පහනක් දල්වන්නේ යම්සේ ද, එපරිද්දෙන් ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මදෙශනා කරන ලදී. ඒ මම භවත් ගෞතමයන් වහන්සේත් ධර්මයත් සඞ්ඝයාත් සරණ කොට යමි. මම භවත් ගෞතමයන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙම්වා. උපසම්පදාව ලබන්නෙම්වා"යි කී ය.

15. සුන්දරිකභාරද්වාජ බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලැබී ය. උපසම්පදාව ලැබී ය. ආයුෂ්මත් භාරද්වාජ තෙමේ උපසම්පන්න වී නොබෝකල් ඇත්තේ එකලා වූයේ වෙන් වූයේ එළඹ සිටි සිහි ඇත්තේ කෙලෙස් තවන වැර ඇත්තේ නිවන් පිණිස මෙහෙයන ලද සිත් ඇත්තේ නොබෝ කලකින් ම යම් අර්හත්වයක් සඳහා කුලපුත්‍රයෝ මනා ව ගිහිගෙයින් නික්ම පැවිද්දට පැමිණෙත් ද, මාර්ග-බ්‍රහ්මචර්යයෙහි අවසානය වූ ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයේ දී ම තෙමේ දැන ගෙන ඊට පැමිණ වාසය කෙළේ ය. ජාතිය ක්ෂීණ වි ය. බඹසර වැස නිමවන ලදී. සිවුමග කිස කරන ලදී. මේ රහත්බව පිණිස කළ යුතු අන් කටයුත්තෙක් නැතැයි දැනගත්තේ ය. ආයුෂ්මත් භාරද්වාජයන් වහන්සේ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් වූහ.

වත්ථූපමසූත්‍රය සත්වැනි යි.

1. 1. 8

සල්ලෙඛ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවන නම් අනේපිඬුසිටුහුගේ ආරාම-යෙහි වැඩ වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් මහාචුන්ද ස්ථවිරයන් වහන්සේ සවස්කාලයෙහි පිළිසලනෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන්නා වූ ආයුෂ්මත් මහාචුන්දස්ථවිරයන් වහන්සේ භාග්‍ය-වතුන් වහන්සේට මෙය සැල කළහ:

2. ස්වාමීනි, (විසිවැදෑරුම්) ආත්මවාදයෙන් යුක්ත වූත් (අටවැදෑ-රුම්) ලොකවාදයෙන් යුක්තවූත් යම් මේ නොයෙක් ආකාර මිථ්‍යා-දෘෂ්ටීහු ලොකයෙහි උපදිත් ද, ස්වාමීනි, පළමු කොට ම හෙවත් විදර්ශනාමිශ්‍ර ප්‍රථම(භාවනා)මනස්කාරය මෙනෙහි කරන්නා වූ ම මහණහට මෙසේ ඒ දෘෂ්ටීන්ගේ ප්‍රහාණය වේ ද? මෙසේ මේ දෘෂ්ටීන්ගේ දුරලීම වේ ද?

යා ඉමා චුන්ද අනෙකවිහිතා දිට්ඨියො ලොකෙ උප්පජ්ජන්ති අත්තවාදපටි-සංයුත්තා වා ලොකවාදපටිසංයුත්තා වා, යත්ථ චෙතා දිට්ඨියො උප්පජ්ජන්ති, යත්ථ චෙතා අනුසෙන්ති, යත්ථ චෙතා සමුදාචරන්ති, තං නෙතං මම, නෙසො'හමස්මි, න මෙ'සො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො එවමෙතාසං දිට්ඨීනං පහානං හොති. එවමෙතාසං දිට්ඨීනං පටිනිස්සග්ගො හොති.

3. ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති - යං ඉධෙකච්චො භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරෙය්‍ය. තස්ස එවමස්ස: සල්ලෙඛෙන විහරාමීති. න ඛො පනෙතෙ චුන්ද අරියස්ස විනයෙ සල්ලෙඛා වුච්චන්ති. දිට්ඨධම්මසුඛවිහාරා එතෙ අරියස්ස විනයෙ වුච්චන්ති.

4. ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති - යං ඉධෙකච්චො භික්ඛු විතක්ක-විචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරෙය්‍ය. තස්ස එවමස්ස: සල්ලෙඛෙන විහරාමීති. න ඛො පනෙතෙ චුන්ද අරියස්ස විනයෙ-සල්ලෙඛා වුච්චන්ති. දිට්ඨධම්මසුඛවිහාරා එතෙ අරියස්ස විනයෙ වුච්චන්ති.

5. ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති - යං ඉධෙකච්චො භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරෙය්‍ය, සතො ච සම්පජානො, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙය්‍ය, යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති, තතියං ඣානං උපසම්පජ්ජ විහරෙය්‍ය, තස්ස එවමස්ස: සල්ලෙඛෙන විහරාමීති. න ඛො පනෙතෙ චුන්ද අරියස්ස විනයෙ සල්ලෙඛා වුච්චන්ති. දිට්ඨධම්මසුඛවිහාරා එතෙ අරියස්ස විනයෙ වුච්චන්ති.

6. ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති - යං ඉධෙකච්චො භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරෙය්‍ය, තස්ස එවමස්ස: සල්ලෙඛෙන විහරාමීති. න ඛො පනෙතෙ චුන්ද අරියස්ස විනයෙ සල්ලෙඛා වුච්චන්ති. දිට්ඨධම්මසුඛවිහාරා එතෙ අරියස්ස විනයෙ වුච්චන්ති.

චුන්දය, ආත්මවාදයෙන් යුක්ත වූත් ලෝකවාදයෙන් යුක්ත වූත් යම් මේ නොයෙක් ආකාර දෘෂ්ටීහු ලෝකයෙහි උපදිත් ද, යම් පඤ්චස්කන්ධයෙක්හි දෘෂ්ටීහු උපදිත් ද, යම් පඤ්චස්කන්ධයෙක්හි මේ දෘෂ්ටීහු ලැග සිටිත් ද, යම් තැනෙක මේ දෘෂ්ටීහු හැසිරෙද්ද, ඒ පඤ්චස්කන්ධය "තෙල මා නොගැත්තේ ය. මම තෙල පඤ්චස්කන්ධයෙම් නො වෙමි. මාගේ ඉසුරු පඤ්චස්කන්ධයෙහි නො පවත්නේය යි මෙසේ මෙය තත් වූ පරිදි විවසුන් නුවණින් දක්නහුට මෙසේ මේ දෘෂ්ටීන්ගේ ප්‍රහාණය වෙයි. මෙසේ මේ දෘෂ්ටීන්ගේ දුර ලීම වෙයි.

3. චුන්දය, මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් කාමයන්ගෙන් වෙන් ව අකුශලධර්මයන්ගෙන් වෙන් ව ම විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි යන යම් කාරණයක් වේ ද, එය විද්‍යමාන වෙයි. ඔහට 'සල්ලේඛයෙන් (කෙලෙස් සිඳීමෙන්) යුක්ත ව වාසය කරමි' යි අධිමානය විය හැකි ය. චුන්දය, මේ ධ්‍යානයෝ ආර්‍ය්‍යවිනයයෙහි සල්ලේඛයෝ ය යි කියනු නො ලැබෙත්. මොහු ආර්‍ය්‍යශාසනයෙහි ඉහාත්මභාවසුඛවිහරණයෝ ය යි කියනු ලැබෙත්.

4. චුන්දය, මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් විතර්කවිචාරයන් සන්සිඳීමෙන් තමා තුළ පැහැදීම ඇති සිතේ උතුම් එකඟ බව ඇති විතර්ක රහිත වූ විචාර රහිත වූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි යන යමක් වේ ද, එය විද්‍යමාන වෙයි. ඒ මහණහට 'සල්ලේඛයෙන් වසමි'යි අධිමානය විය හැකි ය. චුන්දය, මේ ධ්‍යානයෝ ආර්‍ය්‍යවිනයයෙහි සල්ලේඛයෝ යයි කියනු නො ලැබෙත්. මොහු ආර්‍ය්‍යවිනයයෙහි දෘෂ්ටධර්ම සුඛවිහරණයෝ ය යි කියනු ලැබෙත්.

5. චුන්දය, මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් ප්‍රීතිය ද හැරපීමෙන් උපෙක්ෂක ව සිහි ඇති ව මනා නුවණින් යුක්ත ව වාසය කෙරෙයි ද, කයින් සැප විඳියි ද, යම් ධ්‍යාන හෙතුවකින් තෘතීයධ්‍යානයෙන් යුක්ත වූවහුට උපෙක්ෂක වූයේ සිහි ඇත්තේ සුවසේ වසනසුළු යි බුද්ධාදි ආර්‍ය්‍යයෝ පසසත් ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරන්නේ ය යන යම් කාරණයෙක් වේ ද, එය විද්‍යමාන වෙයි. ඒ මහණහට 'මම සල්ලේඛයෙන් යුක්ත ව වසමි'යි අධිමානය විය හැකි ය. චුන්දය, මේ ධ්‍යානයෝ ආර්‍ය්‍යවිනයයෙහි සල්ලේඛයෝ ය යි කියනු නො ලැබෙත්. මොහු ආර්‍ය්‍යවිනයයෙහි දෘෂ්ටධර්මසුඛවිහරණයෝ ය යි කියනු ලැබෙත්.

6. චුන්දය, මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් (පළමුකොට ම) සැපය ද නැති කිරීමෙන් දුක ද නැති කිරීමෙන් පළමු කොට ම සොම්නස් දොම්නස් නැති කිරීමෙන් දුක් නැති සැප නැති උපෙක්ෂායෙන් වූ සමෘතිපාරිශුද්ධිය ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි යන යම් කාරණයෙක් වේ ද, එය විද්‍යමාන වෙයි ඒ මහණහට 'මම සල්ලේඛයෙන් වසමි'යි අධිමානය විය හැකි ය චුන්දය, මේ ධ්‍යානයෝ ආර්‍ය්‍යවිනයයෙහි සල්ලේඛයෝ ය යි කියනු නො ලැබෙත්. මොහු ආර්‍ය්‍යශාසනයේ දෘෂ්ටධර්මසුඛවිහරණයෝ ය යි කියනු ලැබෙත්.

7. ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති - යං ඉධෙකච්චො භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරෙය්‍ය. තස්ස එවමස්ස: සල්ලෙඛෙන විහරාමීති. න ඛො පනෙතෙ චුන්ද අරියස්ස විනයෙ සල්ලෙඛා වුච්චන්ති. සන්තා එතෙ විහාරා අරියස්ස විනයෙ වුච්චන්ති.

8. ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති - යං ඉධෙකච්චො භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරෙය්‍ය. තස්ස එවමස්ස: සල්ලෙඛෙන විහරාමීති. න ඛො පනෙතෙ චුන්ද අරියස්ස විනයෙ සල්ලෙඛා වුච්චන්ති. සන්තා එතෙ විහාරා අරියස්ස විනයෙ වුච්චන්ති.

9. ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති - යං ඉධෙකච්චො භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරෙය්‍ය. තස්ස එවමස්ස: සල්ලෙඛෙන විහරාමීති. න ඛො පනෙතෙ චුන්ද අරියස්ස විනයෙ සල්ලෙඛා වුච්චන්ති. සන්තා එතෙ විහාරා අරියස්ස විනයෙ වුච්චන්ති.

10. ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති - යං ඉධෙකච්චො භික්ඛු සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරෙය්‍ය. තස්ස එවමස්ස: සල්ලෙඛෙන විහරාමීති. න ඛො පනෙතෙ චුන්ද අරියස්ස විනයෙ සල්ලෙඛා වුච්චන්ති. සන්තා එතෙ විහාරා අරියස්ස විනයෙ වුච්චන්ති.

[1. සල්ලෙඛපරියායො:]

1. ඉධ ඛො පන වො චුන්ද සල්ලෙඛො කරණීයො: පරෙ විහිංසකා භවිස්සන්ති. මයමෙත්ථ අවිහිංසකා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

2. පරෙ පාණාතිපාතී භවිස්සන්ති, මයමෙත්ථ පාණාතිපාතා පටිවිරතා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

3. පරෙ අදින්නාදායී භවිස්සන්ති; මයමෙත්ථ අදින්නාදානා පටිවිරතා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

4. පරෙ අබ්‍රහ්මචාරී භවිස්සන්ති; මයමෙත්ථ බ්‍රහ්මචාරී භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

5. පරෙ මුසාවාදී භවිස්සන්ති; මයමෙත්ථ මුසාවාදා පටිවිරතා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

6. පරෙ පිසුණාවාචා භවිස්සන්ති: මයමෙත්ථ පිසුණා වාචා පටිවිරතා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

7. චුන්දය, මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන් දුරු කිරීමෙන් නානාත්ව (රූපාදිනානාගොචරයන්හි පවත්නා) සංඥාවන් නො මෙනෙහි කිරීමෙන් ආකාශය අනන්ත ය යි ආකාසානඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරන්නේ ය. යන යම් කාරණයෙක් වේ ද, එය විද්‍යමාන වෙයි. ඒ මහණහට “මම සල්ලෙඛයෙන් වසමි”යි අධිමානයෙක් වෙයි. චුන්දය, මේ ධ්‍යානයෝ ආර්යවිනයෙහි සල්ලෙඛයෝ ය යි කියනු නො ලැබෙත්. මොහු ආර්යවිනයෙහි ශාන්තවිහරණයෝ ය යි කියනු ලැබෙත්.

8. චුන්දය, මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා ‘විඥානය අනන්ත ය’යි විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරන්නේ ය යන යම් කාරණයෙක් වේ ද, එය විද්‍යමාන වෙයි. ඒ මහණහට ‘මම සල්ලෙඛයෙන් වසමි’යි අධිමානයෙක් වෙයි. චුන්දය, මේ ධ්‍යානයෝ ආර්යවිනයෙහි සල්ලෙඛයෝ ය යි කියනු නො ලැබෙත්. මොහු ආර්යවිනයෙහි ශාන්තවිහරණයෝ ය යි කියනු ලැබෙත්.

9. චුන්දය, මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් සර්වප්‍රකාරයෙන් ම විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිත් නැතැයි (මෙනෙහි කරන්නේ) ආකිඤ්චඤ්ඤායතනධ්‍යානයට පැමිණ වාසය කරන්නේ ය යන යම් කාරණයෙක් වේ ද, එය විද්‍යමාන වෙයි. ඒ මහණහට මම සල්ලෙඛයෙන් වසමි’යි. අධිමානය වෙයි. චුන්දය, මේ ධ්‍යානයෝ ආර්යවිනයෙහි සල්ලෙඛයෝ ය යි කියනු නො ලැබෙත්. මොහු ආර්යවිනයෙහි ශාන්ත විහරණයෝ ය යි කියනු ලැබෙත්.

10. චුන්දය, මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් සර්වප්‍රකාරයෙන් ම ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානයට පැමිණ වාසය කරන්නේ ය යන යම් කාරණයෙක් වේ ද, එය විද්‍යමාන වෙයි. ඒ මහණහට “මම සල්ලෙඛයෙන් වසමි’යි අධිමානය වෙයි. චුන්දය, මේ ධ්‍යානයෝ ආර්යවිනයෙහි සල්ලෙඛයෝ ය යි කියනු නො ලැබෙත්. මොහු ආර්යවිනයෙහි ශාන්තවිහරණයෝ ය යි කියනු ලැබෙත්.

[1. සල්ලෙඛ පර්යාය:]

1. චුන්දය, මේ විහිංසාදි සුසාලිස් වස්තූන්හි තොප විසින් සල්ලෙඛය කට යුතු යි. ‘අන්‍යයෝ සතුන්ට හිංසා කරන්නෝ වන්නාහු ය අපි මෙහි (සතුන්ට) හිංසා නො කරන්නමෝ වන්නෙමු’යි සල්ලෙඛය කළ යුතු යි.

2. ‘අන්‍යයෝ සතුන් මරන්නෝ වන්නාහු ය. අපි මෙහි සතුන් මැරීමෙන් වැලකුණමෝ වන්නෙමු’යි සල්ලෙඛය කළ යුතු යි.

3. ‘අන්‍යයෝ නුදුන් දෙය ගන්නෝ වන්නාහු ය. අපි මෙහි නුදුන් දෙය ගැන්මෙන් වැලකුණමෝ වන්නෙමු’යි. සල්ලෙඛය කළ යුතු යි.

4. ‘අන්‍යයෝ අබ්‍රහ්මචාරී වන්නාහු ය. අපි මෙහි බ්‍රහ්මචාරී වන්නෙමු’යි සල්ලෙඛය කළ යුතු යි.

5 ‘අන්‍යයෝ බොරු කියන්නෝ වන්නාහු ය. අපි මෙහි බොරු කීමෙන් වැලකුණමෝ වන්නෙමු’යි සල්ලෙඛය කළ යුතු යි.

6. ‘අන්‍යයෝ පිසුණු බස් කියන්නෝ වන්නාහු ය. අපි පිසුණු බස් කීමෙන් වැලකුණමෝ වන්නෙමු’ යි සල්ලෙඛය කළ යුතුයි.

Free Distribution www.aathaapi.org

7. පරෙ ඵරුසාවාචා[1] භවිස්සන්ති; මයමෙත්ථ ඵරුසාවාචා[2] පටිවිරතා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

8. පරෙ සම්ඵප්පලාපී[3] භවිස්සන්ති; මයමෙත්ථ සම්ඵප්පලාපා පටිවිරතා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

9. පරෙ අභිජ්ඣාලූ භවිස්සන්ති; මයමෙත්ථ අනභිජ්ඣාලූ භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

10. පරෙ බ්‍යාපන්නචිත්තා භවිස්සන්ති; මයමෙත්ථ අබ්‍යාපන්නචිත්තා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො

11. පරෙ මිච්ඡාදිට්ඨී[4] භවිස්සන්ති; මයමෙත්ථ සම්මාදිට්ඨී[5] භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

12. පරෙ මිච්ඡාසඞ්කප්පා භවිස්සන්ති; මයමෙත්ථ සම්මාසඞ්කප්පා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

13. පරෙ මිච්ඡාවාචා භවිස්සන්ති; මයමෙත්ථ සම්මාවාචා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

14. පරෙ මිච්ඡාකම්මන්තා භවිස්සන්ති; මයමෙත්ථ සම්මාකම්මන්තා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

15. පරෙ මිච්ඡාආජීවා භවිස්සන්ති; මයමෙත්ථ සම්මාආජීවා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

16. පරෙ මිච්ඡාවායාමා භවිස්සන්ති; මයමෙත්ථ සම්මාවායාමා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

17. පරෙ මිච්ඡාසතී භවිස්සන්ති; මයමෙත්ථ සම්මාසතී භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

18. පරෙ මිච්ඡාසමාධී භවිස්සන්ති; මයමෙත්ථ සම්මාසමාධී භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

19. පරෙ මිච්ඡාඤාණී භවිස්සන්ති; මයමෙත්ථ සම්මාඤාණී භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

20. පරෙ මිච්ඡාවිමුත්තී භවිස්සන්ති; මයමෙත්ථ සම්මාවිමුත්තී භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

21. පරෙ ථීනමිද්ධපරියුට්ඨිතා භවිස්සන්ති; මයමෙත්ථ විගතථීනමිද්ධා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

22. පරෙ උද්ධතා භවිස්සන්ති; මයමෙත්ථ අනුද්ධතා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

23. පරෙ වෙචිකිච්ඡී[6] භවිස්සන්ති; මයමෙත්ථ තිණ්ණවිචිකිච්ඡා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

---

1. ඵරුසවාචා, මජසං. 2. ඵරුසාය වාචාය, මජසං. සතා.
3. සම්ඵප්පලාපා, කත්ථචි 4. මිච්ඡාදිට්ඨිකා, සතා. 5. සම්මාදිට්ඨිකා, සතා.
6. විචිකිච්ඡී, මජසං.

Free Distribution www.aathaapi.org

7. 'අන්‍යයෝ රළුබස් කියන්නෝ වන්නාහු ය. මෙහි දී අපි රළුබස් කීමෙන් වැළකුණමෝ වන්නෙමු'යි සල්ලේඛය කළ යුතු යි.

8. 'අන්‍යයෝ ප්‍රලාප කියන්නෝ වන්නාහු ය. මෙහි දී අපි ප්‍රලාප කීමෙන් වැළකුණමෝ වන්නෙමු'යි සල්ලේඛය කළ යුතු යි.

9. 'අන්‍යයෝ අභිධ්‍යා බහුල කොට ඇත්තෝ වන්නාහු ය. මෙහි දී අපි අභිධ්‍යා බහුල කොට නැත්තමෝ වන්නෙමු'යි සල්ලේඛය කළ යුතු යි.

10. 'අන්‍යයෝ ව්‍යාපාදයෙන් යුත් සිත් ඇත්තෝ වන්නාහු ය. මෙහි දී අපි ව්‍යාපන්න සිත් නැත්තමෝ වන්නෙමු'යි සල්ලේඛය කළ යුතු යි.

11. 'අන්‍යයෝ මිථ්‍යාදෘෂ්ටිකයෝ වන්නාහු ය. මෙහි දී අපි සම්‍යග්-දෘෂ්ටිකයමෝ වන්නෙමු'යි සල්ලේඛය කළ යුතු යි.

12. 'අන්‍යයෝ මිථ්‍යාසඞ්කල්ප ඇත්තෝ වන්නාහු ය. මෙහි දී අපි සම්‍යක්සඞ්කල්ප ඇත්තමෝ වන්නෙමු'යි සල්ලේඛය කළ යුතු යි.

13. 'අන්‍යයෝ මිථ්‍යාවචන ඇත්තෝ වන්නාහු ය. මෙහි දී අපි සම්‍යග් වචන ඇත්තමෝ වන්නෙමු'යි සල්ලේඛය කළ යුතු යි.

14. 'අන්‍යයෝ මිථ්‍යාකර්මාන්ත ඇත්තෝ වන්නාහු ය. මෙහි දී අපි සම්‍යක්කර්මාන්ත ඇත්තමෝ වන්නෙමු'යි සල්ලේඛය කළ යුතු යි.

15. 'අන්‍යයෝ මිථ්‍යාආජීව ඇත්තෝ වන්නාහු ය. මෙහි දී අපි සම්‍යගා ජීවය ඇත්තමෝ වන්නෙමු'යි සල්ලේඛය කළ යුතු යි.

16. 'අන්‍යයෝ මිථ්‍යාව්‍යායාම ඇත්තෝ වන්නාහු ය. මෙහි දී අපි සම්‍යග්ව්‍යායාම ඇත්තමෝ වන්නෙමු'යි සල්ලේඛය කළ යුතු යි.

17. 'අන්‍යයෝ මිථ්‍යාස්මෘතිය ඇත්තෝ වන්නාහුය. මෙහි දී අපි සම්‍යක්ස්මෘතිය ඇත්තමෝ වන්නෙමු'යි සල්ලේඛය කළ යුතු යි.

18. 'අන්‍යයෝ මිථ්‍යාසමාධිය ඇත්තෝ වන්නාහු ය. මෙහි දී අපි සම්‍යක්සමාධිය ඇත්තමෝ වන්නෙමු'යි සල්ලේඛය කළ යුතු යි.

19. 'අන්‍යයෝ මිථ්‍යාඥාන ඇත්තෝ වන්නාහු ය. මෙහි දී අපි සම්‍යග්-ඥාන ඇත්තමෝ වන්නෙමු'යි සල්ලේඛය කළ යුතු යි.

20. 'අන්‍යයෝ මිථ්‍යාවිමුක්ති ඇත්තෝ වන්නාහු ය. මෙහි දී අපි සම්‍යග්විමුක්ති ඇත්තමෝ වන්නෙමු''යි සල්ලේඛය කළ යුතු යි.

21. 'අන්‍යයෝ ථිනමිද්ධයෙන් මඩනා ලද්දෝ වන්නාහු ය. මෙහි දී අපි පහ වූ ථිනමිද්ධ ඇත්තමෝ වන්නෙමු'යි සල්ලේඛය කළ යුතු යි.

22. 'අන්‍යයෝ උද්ධතයෝ වන්නාහු ය. මෙහි දී අපි අනුද්ධතයමෝ වන්නෙමු'යි සල්ලේඛය කළ යුතු යි.

23. 'අන්‍යයෝ විචිකිච්ඡා ඇත්තෝ වන්නාහු ය. මෙහි දී අපි තරණය කළ විචිකිච්ඡා ඇත්තමෝ වන්නෙමු'යි සල්ලේඛය කළ යුතු යි.

24. පරෙ කොධනා භවිස්සන්ති; මයමෙත්ථ අක්කොධනා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

25. පරෙ උපනාහී භවිස්සන්ති, මයමෙත්ථ අනුපනාහී භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

26. පරෙ මක්ඛී භවිස්සන්ති, මයමෙත්ථ අමක්ඛී භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

27. පරෙ පළාසී භවිස්සන්ති; මයමෙත්ථ අපළාසී භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

28. පරෙ ඉස්සුකී භවිස්සන්ති; මයමෙත්ථ අනිස්සුකී භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

29. පරෙ මච්ඡරී භවිස්සන්ති, මයමෙත්ථ අමච්ඡරී භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

30 පරෙ සඨා භවිස්සන්ති, මයමෙත්ථ අසඨා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

31. පරෙ මායාවී භවිස්සන්ති; මයමෙත්ථ අමායාවී භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

32. පරෙ ථද්ධා භවිස්සන්ති; මයමෙත්ථ අත්ථද්ධා[1] භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

33. පරෙ අතිමානී භවිස්සන්ති, මයමෙත්ථ අනතිමානී භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

34. පරෙ දුබ්බචා භවිස්සන්ති; මයමෙත්ථ සුබ්බචා[2] භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

35. පරෙ පාපමිත්තා භවිස්සන්ති; මයමෙත්ථ කල්‍යාණමිත්තා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

36. පරෙ පමත්තා භවිස්සන්ති; මයමෙත්ථ අප්පමත්තා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

37. පරෙ අස්සද්ධා[3] භවිස්සන්ති; මයමෙත්ථ සද්ධා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

38. පරෙ අහිරිකා භවිස්සන්ති; මයමෙත්ථ හිරිමනා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

39. පරෙ අනොත්තාපී[4] භවිස්සන්ති; මයමෙත්ථ ඔත්තාපී[5] භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

40. පරෙ අප්පස්සුතා[6] භවිස්සන්ති; මයමෙත්ථ බහුස්සුතා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

1. අථද්ධා, සං. 2 සුවචා, මජ්සං. 3. අසද්ධා, සං.
4. අනොත්තප්පී, සං. 5. ඔත්තප්පී, සං. 6. අප්පසුතා, සං.

24. 'අන්‍යයෝ කිපෙනසුල්ලෝ වන්නාහු ය. මෙහි දී අපි නොකිපෙන-සුල්ලමෝ වන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

25 'අන්‍යයෝ බද්ධවෛර ඇත්තෝ වන්නාහු ය. මෙහි දී අපි බද්ධවෛර නැත්තමෝ වන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

26. 'අන්‍යයෝ ගුණමකුවෝ වන්නාහු ය. මෙහි දී අපි ගුණමකුවමෝ නොවන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

27. 'අන්‍යයෝ යුගග්‍රාහ ඇත්තෝ වන්නාහු ය. මෙහි දී අපි යුගග්‍රාහ නැත්තමෝ වන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

28. 'අන්‍යයෝ ඊර්ෂ්‍යා කරන්නෝ වන්නාහු ය. මෙහි දී අපි ඊර්ෂ්‍යා නො කරන්නමෝ වන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

29. 'අන්‍යයෝ මසුරෝ වන්නාහු ය. මෙහි දී අපි මසුරමෝ නො වන්-නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

30. අන්‍යයෝ කෛරාටිකයෝ වන්නාහු ය. මෙහි දී අපි කෛරාටි-කයමෝ නො වන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

31. අන්‍යයෝ මායා ඇත්තෝ වන්නාහු ය, මෙහි දී අපි මායා නැත්තමෝ වන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

32. 'අන්‍යයෝ තදබැව් ඇත්තෝ වන්නාහු ය. මෙහි දී අපි තදබැව් නැත්තමෝ වන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

33. 'අන්‍යයෝ අතිකමාන ඇත්තෝ වන්නාහු ය, මෙහි දී අපි අතිකමාන නැත්තමෝ වන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

34. 'අන්‍යයෝ දුර්වචයෝ වන්නාහු ය. මෙහි දී අපි සුවචයමෝ වන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

35. 'අන්‍යයෝ පාපමිත්‍රයන් ඇත්තෝ වන්නාහු ය. මෙහි දී අපි කල්‍යාණමිත්‍රයන් ඇත්තමෝ වන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

36. 'අන්‍යයෝ ප්‍රමත්තයෝ වන්නාහු ය. මෙහි දී අපි අප්‍රමත්ත වූවමෝ වන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

37. 'අන්‍යයෝ ශ්‍රද්ධා නැත්තෝ වන්නාහු ය. මෙහි දී අපි ශ්‍රද්ධා ඇත්තමෝ වන්නෙමු'යි. සල්ලෙඛය කළ යුතු යි.

38. 'අන්‍යයෝ අහිරිකයෝ වන්නාහු ය. මෙහි දී අපි විළිහිත් ඇත්තමෝ වන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

39. 'අන්‍යයෝ පවට බිය නැත්තෝ වන්නාහු ය. මෙහි දී අපි පවට බිය ඇත්තමෝ වන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

40. 'අන්‍යයෝ ඇසූ පිරූ තැන් නැත්තෝ වන්නාහු ය. මෙහි දී අපි ඇසූ පිරූ තැන් ඇත්තමෝ වන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

41. පරෙ කුසීතා භවිස්සන්ති; මයමෙත්ථ ආරද්ධවිරියා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

42. පරෙ මුට්ඨස්සතී භවිස්සන්ති; මයමෙත්ථ උපට්ඨිතසතී[1] භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

43. පරෙ දුප්පඤ්ඤා භවිස්සන්ති; මයමෙත්ථ පඤ්ඤාසම්පන්නා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

44. පරෙ සන්දිට්ඨිපරාමාසී[2] ආධානගාහී[3] දුප්පටිනිස්සග්ගී භවිස්සන්ති; මයමෙත්ථ අසන්දිට්ඨිපරාමාසී[4] අනාධානගාහී[5] සුප්පටිනිස්සග්ගී භවිස්සාමාති සල්ලෙඛො කරණීයො.

2. [චිත්තුප්පාදපරියායො:]

1. චිත්තුප්පාදම්පි ඛො අහං චුන්ද කුසලෙසු ධම්මෙසු බහුකාරං[6] වදාමි. කො පන වාදො කායෙන වාචාය[7] අනුවිධීයනාසු.[8]

2. තස්මාතිහ චුන්ද පරෙ විහිංසකා භවිස්සන්ති; මයමෙත්ථ අවිහිංසකා භවිස්සාමාති. චිත්තං උප්පාදෙතබ්බං. පරෙ පාණාතිපාතී භවිස්සන්ති; මයමෙත්ථ පාණාතිපාතා පටිවිරතා භවිස්සාමාති චිත්තං උප්පාදෙතබ්බං -පෙ- පරෙ සන්දිට්ඨිපරාමාසී[2] ආධානගාහී[3] දුප්පටිනිස්සග්ගී භවිස්සන්ති; මයමෙත්ථ අසන්දිට්ඨිපරාමාසී අනාධානගාහී සුප්පටිනිස්සග්ගී භවිස්සාමාති චිත්තං උප්පාදෙතබ්බං. (44)

3. [පරික්කමනපරියායො:]

1. සෙය්‍යථාපි චුන්ද විසමො[9] මග්ගො, තස්සාස්ස[10] අඤ්ඤො සමො මග්ගො පරික්කමනාය, සෙය්‍යථාපි[11] පන චුන්ද විසමං තිත්ථං[12], තස්සාස්ස අඤ්ඤං සමං තිත්ථං පරික්කමනාය.

2. එවමෙව ඛො චුන්ද විහිංසකස්ස පුරිසපුග්ගලස්ස අවිහිංසා හොති පරික්කමනාය; පාණාතිපාතිස්ස පුරිසපුග්ගලස්ස පාණාතිපාතා වෙරමණී හොති පරික්කමනාය. අදින්නාදායිස්ස පුරිසපුග්ගලස්ස අදින්නාදානා වෙරමණී හොති පරික්කමනාය. අබ්‍රහ්මචාරිස්ස පුරිසපුග්ගලස්ස අබ්‍රහ්මචරියා වෙරමණී[13] හොති පරික්කමනාය. මුසාවාදිස්ස පුරිසපුග්ගලස්ස මුසාවාදා වෙරමණී හොති පරික්කමනාය. පිසුණවාචස්ස[14] පුරිසපුග්ගලස්ස පිසුණාය වාචාය[15] වෙරමණී හොති පරික්කමනාය. ඵරුසවාචස්ස[16] පුරිසපුග්ගලස්ස ඵරුසාය වාචාය[17] වෙරමණී හොති පරික්කමනාය. සම්ඵප්පලාපිස්ස පුරිසපුග්ගලස්ස සම්ඵප්පලාපා වෙරමණී හොති පරික්කමනාය. අභිජ්ඣාලුස්ස පුරිසපුග්ගලස්ස අනභිජ්ඣා හොති පරික්කමනාය. බ්‍යාපන්නචිත්තස්ස පුරිසපුග්ගලස්ස අබ්‍යාපාදො හොති පරික්කමනාය. (1 - 10)

---

1. උපට්ඨිතස්සති, මජසං. 2. සන්දිට්ඨිපරාමාසි, සතා. PTS.
3. ආධානගාහි, සතා PTS. ආධානග්ගාහී, මජසං. 4. අසන්දිට්ඨිපරාමාසි, සතා. PTS.
5. අනාධානගාහි, සතා 6. බහූපකාරං, කත්ථචි. 7. වාචා, කත්ථචි.
8. අනුවිධීයමානාසු, කත්ථචි. අනුවිධියනාසු, ස ත. 9 මග්ගො අස්ස, මජසං.
10. තස්ස, මජසං. 11. සෙය්‍යථා වා, මජසං. 12. තිත්ථං අස්ස, මජසං.
13. බ්‍රහ්මචරියං, සීමු. 14. පිසුණාවාචස්ස, සීමු. 15. පිසුණාවාචා, සීමු.
16. ඵරුසාවාචස්ස, සීමු. 17. ඵරුසාවාචා සීමු.

41. 'අන්‍යයෝ කුසීතයෝ වන්නාහු ය, මෙහි දී අපි ආරබ්ධවීර්‍ය්‍ය ඇත්තමෝ වන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

42. 'අන්‍යයෝ සිහි මුළා වූවෝ වන්නාහු ය. මෙහි දී අපි එළඹ සිටි සිහි ඇත්තමෝ වන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

43. 'අන්‍යයෝ දුෂ්ප්‍රාඥ වන්නාහු ය. මෙහි දී අපි නුවණැත්තමෝ වන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

44. "අන්‍යයෝ තමන්ගේ දෘෂ්ටිය පරාමර්ශනය කළාහු, දැඩි කොට ගත්තාහු, අත් නො හරින්නෝ වන්නාහු ය. මෙහි දී අපි ස්වදෘෂ්ටිය ම පරාමර්ශනය නො කරන්නමෝ, දැඩි කොට නො ගන්නමෝ, සුවසේ බැහැර කළ හැක්කමෝ වන්නෙමු'යි සල්ලෙඛය කළ යුතු යි.

2. [චිත්තුප්පාද පර්‍ය්‍යාය:]

1. චුන්දය, මම කුශලධර්මයන්හි සිත් ඉපදවීම ද බොහෝ උපකාර ය යි කියමි. කයින් හා වචනයෙන් කිරීම කරවීම්හි (අනුසස්) කියනු ම කවරේ ද ?

2. චුන්දය, එහෙයින් මෙහි ලා 'අන්‍යයෝ හිංසා කරන්නෝ වන්නාහු ය. මෙහි ලා අපි අහිංසකයමෝ වන්නෙමු'යි සිත ඉපදවිය යුතු ය. 'අන්‍යයෝ සතුන් මරන්නෝ වන්නාහු ය. මෙහි ලා අපි සතුන් මැරීමෙන් වෙන් වූවමෝ වන්නෙමු'යි සිත ඉපදවිය යුතු ය......'අන්‍යයෝ ස්වදෘෂ්ටිය පරාමර්ශනය කරන්නාහු දැඩි කොට ගන්නාහු. සුව සේ බැහැර නො කළ නො හෙන්නාහු වන්නාහු ය. මෙහි ලා අපි ස්වදෘෂ්ටිය ම පරාමර්ශනය නො කරන්නමෝ දැඩි කොට නො ගන්නමෝ සුව සේ හළ හෙන්නමෝ නො වන්නෙමු'යි සිත ඉපදවිය යුතු ය. (44)

[3. පරික්කමන පර්‍ය්‍යාය:]

1. චුන්දය, යම් සේ විෂමමාර්ගයෙක් වේ ද, එය හැරපියා යැමට අන්‍ය වූ සමමාර්ගයෙකුත් වේ ද, චුන්දය, යම් සේ විෂම තොටෙක් වේ ද, එය හැර-පියා යැමට අන්‍ය වූ සම තොටෙකුත් වේ ද,

2. චුන්දය, එපරිද්දෙන් ම හිංසා කරන පුද්ගලයාට එයින් දුරු වීම පිණිස අහිංසාව වෙයි. ප්‍රාණඝාත කරන පුද්ගලයාට එයින් දුරු වීම පිණිස ප්‍රාණඝාතවිරමණය වෙයි. නුදුන් දෑ ගන්නා පුද්ගලයාට එයින් දුරු වීම පිණිස අදත්තාදාන විරමණය වෙයි. අබ්‍රහ්මචාරී පුද්ගලයාට එයින් දුරු වීම පිණිස අබ්‍රහ්මචර්‍ය්‍ය විරමණය වෙයි. මුසවා කියන පුද්ගලයාට එයින් දුරු වීම පිණිස මුසාවාදවිරමණය වෙයි. කේලාම් කියන පුද්ගලයාට එයින් දුරු වීම පිණිස පිසුණවාචාවිරමණය වෙයි. පරොස්බස් කියන පුද්ගලයාට එයින් දුරු වීම පිණිස පරුෂවාචාවිරමණය වෙයි. නිෂ්ඵල වචන කියන පුද්ගලයාට එයින් දුරු වීම පිණිස සම්ඵප්පලාපවිරමණය වෙයි. අභිධ්‍යාව බහුල කොට ඇති පුද්ගලයාට එයින් දුරු වීම පිණිස අන-භිධ්‍යාව වෙයි. ව්‍යාපන්න වූ සිත් ඇති පුද්ගලයාට එයින් දුරු වීම පිණිස අව්‍යාපාදය වෙයි. (1 - 10)

3. මිච්ඡාදිට්ඨිස්ස පුරිසපුග්ගලස්ස සම්මාදිට්ඨි හොති පරික්කමනාය. මිච්ඡාසඞ්කප්පස්ස පුරිසපුග්ගලස්ස සම්මාසඞ්කප්පො හොති පරික්කමනාය. මිච්ඡාවාචස්ස පුරිසපුග්ගලස්ස සම්මාවාචා හොති පරික්කමනාය. මිච්ඡාකම්මන්තස්ස පුරිසපුග්ගලස්ස සම්මාකම්මන්තො හොති පරික්කමනාය. මිච්ඡාආජීවස්ස පුරිසපුග්ගලස්ස සම්මාආජීවො හොති පරික්කමනාය. මිච්ඡාවායාමස්ස පුරිසපුග්ගලස්ස සම්මාවායාමො හොති පරික්කමනාය මිච්ඡාසතිස්ස පුරිසපුග්ගලස්ස සම්මාසති හොති පරික්කමනාය මිච්ඡාසමාධිස්ස පුරිසපුග්ගලස්ස සම්මාසමාධි හොති පරික්කමනාය. මිච්ඡාඤාණිස්ස පුරිසපුග්ගලස්ස සම්මාඤාණං හොති පරික්කමනාය. මිච්ඡාවිමුත්තිස්ස පුරිසපුග්ගලස්ස සම්මාවිමුත්ති හොති පරික්කමනාය. (11 - 20)

4. ථිනමිද්ධපරියුට්ඨිතස්ස පුරිසපුග්ගලස්ස විගතථිනමිද්ධතා හොති පරික්කමනාය. උද්ධතස්ස පුරිසපුග්ගලස්ස අනුද්ධච්චං හොති පරික්කමනාය. වෙචිකිච්ඡිස්ස[1] පුරිසපුග්ගලස්ස තිණ්ණවිචිකිච්ඡතා හොති පරික්කමනාය. කොධනස්ස පුරිසපුග්ගලස්ස අක්කොධො හොති පරික්කමනාය. උපනාහිස්ස පුරිසපුග්ගලස්ස අනුපනාහො හොති පරික්කමනාය. මක්ඛිස්ස පුරිසපුග්ගලස්ස අමක්ඛො හොති පරික්කමනාය. පළාසිස්ස පුරිසපුග්ගලස්ස අපළාසො හොති පරික්කමනාය. ඉස්සුකිස්ස පුරිසපුග්ගලස්ස අනිස්සා[2] හොති පරික්කමනාය. මච්ඡරිස්ස පුරිසපුග්ගලස්ස අමච්ඡරියං හොති පරික්කමනාය. සඨස්ස පුරිසපුග්ගලස්ස අසාඨෙය්‍යං හොති පරික්කමනාය. මායාවිස්ස පුරිසපුග්ගලස්ස අමායා හොති පරික්කමනාය. ථද්ධස්ස පුරිසපුග්ගලස්ස අත්ථද්ධියං හොති පරික්කමනාය. අතිමානිස්ස පුරිසපුග්ගලස්ස අනතිමානො හොති පරික්කමනාය. දුබ්බචස්ස පුරිසපුග්ගලස්ස සොවචස්සතා හොති පරික්කමනාය. පාපමිත්තස්ස පුරිසපුග්ගලස්ස කල්‍යාණමිත්තතා හොති පරික්කමනාය. පමත්තස්ස පුරිසපුග්ගලස්ස අප්පමාදො හොති පරික්කමනාය. අස්සද්ධස්ස පුරිසපුග්ගලස්ස සද්ධා හොති පරික්කමනාය. අහිරිකස්ස පුරිසපුග්ගලස්ස හිරි[3] හොති පරික්කමනාය. අනොත්තාපිස්ස පුරිසපුග්ගලස්ස ඔත්තප්පං හොති පරික්කමනාය. අප්පස්සුතස්ස පුරිසපුග්ගලස්ස බාහුසච්චං හොති පරික්කමනාය. කුසීතස්ස පුරිසපුග්ගලස්ස විරියාරම්භො හොති පරික්කමනාය. මුට්ඨස්සතිස්ස පුරිසපුග්ගලස්ස උපට්ඨිතසතිතා හොති පරික්කමනාය. දුප්පඤ්ඤස්ස පුරිසපුග්ගලස්ස පඤ්ඤාසම්පදා හොති පරික්කමනාය. සන්දිට්ඨිපරාමාසිආධානගාහිදුප්පටිනිස්සග්ගිස්ස පුරිසපුග්ගලස්ස අසන්දිට්ඨිපරාමාසිඅනාධානගාහිසුප්පටිනිස්සග්ගිතා හොති පරික්කමනාය. (21 - 44)

[4. උපරිභාවපරියායො:]

1. සෙය්‍යථාපි චුන්ද යෙ කෙචි අකුසලා ධම්මා සබ්බෙ තෙ අධොභාවං ගමනීයා[4] යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ උපරිභාවං[5] ගමනීයා.

2. එවමෙව ඛො චුන්ද විහිංසකස්ස පුරිසපුග්ගලස්ස අවිහිංසා හොති උපරිභාවාය. පාණාතිපාතිස්ස පුරිසපුග්ගලස්ස පාණාතිපාතා වෙරමණී හොති උපරිභාවාය. අදින්නාදායිස්ස -පෙ- සන්දිට්ඨිපරාමාසිආධානගාහිදුප්පටිනිස්සග්ගිස්ස පුරිසපුග්ගලස්ස අසන්දිට්ඨිපරාමාසිඅනාධානගාහිසුප්පටිනිස්සග්ගිතා හොති උපරිභාවාය. (44)

---

1. වෙචිකිච්ඡිස්ස, මජසං. 2. අනිස්සුකිතා, මජසං. 3. හිරී, මජසං. PTS.
4. ගමනියං, සාළුවි. 5 උපරිභාවාය -පෙ- මජසං.

3. මිථ්‍යාදෘෂ්ටිකපුද්ගලයාට එයින් දුරු වීම පිණිස සම්‍යග්දෘෂ්ටිය වෙයි. මිථ්‍යාසංකල්පය ඇති පුද්ගලයාට එයින් දුරු වීම පිණිස සම්‍යක්සංකල්පය වෙයි. මිථ්‍යාවචන ඇති පුද්ගලයාට එයින් දුරු වීම පිණිස සම්‍යග්වචන වෙයි. මිථ්‍යාකර්මාන්ත ඇති පුද්ගලයාට එයින් දුරු වීම පිණිස සම්‍යක්කර්මාන්තය වෙයි. මිථ්‍යාජීවය ඇති පුද්ගලයාට එයින් දුරුවීම පිණිස සම්‍යගාජීවය වෙයි මිථ්‍යාව්‍යායාම ඇති පුද්ගලයාට එයින් දුරු වීම පිණිස සම්‍යග්ව්‍යායාමය වෙයි. මිථ්‍යාස්මෘතිය ඇති පුද්ගලයාට එයින් දුරු වීම පිණිස සම්‍යක්ස්මෘතිය වෙයි. මිථ්‍යාසමාධිය ඇති පුද්ගලයාට එයින් දුරු වීම පිණිස සම්‍යක්සමාධිය වෙයි. මිථ්‍යාඥනය ඇති පුද්ගලයාට එයින් දුරු වීම පිණිස සම්‍යග්ඥනය වෙයි. මිථ්‍යාවිමුක්තිය ඇති පුද්ගලයාට එයින් දුරු වීම පිණිස සම්‍යග්විමුක්තිය වෙයි.

4. ථිනමිද්ධයෙන් මැඩුණු පුද්ගලයාට එයින් දුරු වීම පිණිස විගත ථිනමිද්ධභාවය වෙයි. උද්ධතපුද්ගලයාට එයින් දුරු වීම පිණිස අනෞද්ධත්‍යය වෙයි. විචිකිච්ඡාව ඇති පුද්ගලයාට එයින් දුරු වීම පිණිස තීර්ණවිචිකිච්ඡතාව වෙයි. කිපෙනසුලු පුද්ගලයාට එයින් දුරු වීම පිණිස අක්‍රොධය වෙයි. බද්ධවෛර ඇති පුද්ගලයාට එයින් දුරු වීම පිණිස අබද්ධවෛරය වෙයි. ගුණමකු පුද්ගලයාට එයින් දුරු වීම පිණිස අම්ක්ඛය වෙයි. යුගග්‍රාහය ඇති පුද්ගලයාට එයින් දුරු වීම පිණිස යුගග්‍රාහාභාවය වෙයි. ඊර්ෂ්‍යා කරන පුද්ගලයාට එයින් දුරු වීම පිණිස අනීර්ෂ්‍යාව වෙයි. මසුරු පුද්ගලයාට එයින් දුරු වීම පිණිස නො මසුරු බව වෙයි. ශඨ පුද්ගලයාට එයින් දුරු වීම පිණිස අශඨභාවය වෙයි. මායාවී පුද්ගලයාට එයින් දුරු වීම පිණිස අමායාව වෙයි. තද පුද්ගලයාට එයින් දුරු වීම පිණිස නො තද බව වෙයි. අතිකමාන ඇති පුද්ගලයාට එයින් දුරු වීම පිණිස අනතිමානය වෙයි. දුර්වච පුද්ගලයාට එයින් දුරු වීම පිණිස සුවචභාවය වෙයි. පාපමිත්‍රයන් ඇති පුද්ගලයාට එයින් දුරු වීම පිණිස කල්‍යාණමිත්‍රතාව වෙයි. ප්‍රමත්ත පුද්ගලයාට එයින් දුරු වීම පිණිස අප්‍රමාදය වෙයි. අශ්‍රද්ධපුද්ගලයාට එයින් දුරු වීම පිණිස ශ්‍රද්ධාව වෙයි. අහ්‍රිකපුද්ගලයාට එයින් දුරු වීම පිණිස හ්‍රිය වෙයි. අනපත්‍රපපුද්ගලයාට එයින් දුරු වීම පිණිස අපත්‍රපතාව වෙයි. අල්පශ්‍රැතපුද්ගලයාට එයින් දුරු වීම පිණිස බහුශ්‍රැතතාව වෙයි. කුසීතවූ පුද්ගලයාට එයින් දුරු වීම පිණිස වීර්‍ය්‍යාරම්භය වෙයි. මුළා සිහි ඇති පුද්ගලයාට එයින් දුරු වීම පිණිස එළඹ සිටි සිහිඇති බව වෙයි. නුවණ නැති පුද්ගලයාට එයින් දුරු වීම පිණිස ප්‍රඥසම්පදව වෙයි. සියදිටු පැහැසීම දැඩිව ගැනීම හරනට නො පහසුබව ඇති පුද්ගලයාට එයින් දුරු වීම පිණිස නො සියදිටු පැහැසීම නො දැඩි ගැනීම හරනට පහසු බව වෙයි.

[4. උපරිභාවපර්‍යාය:]

1. චුන්දය, යම්සේ වනාහි යම් කිසි අකුශලධර්ම කෙනෙක් වෙත් නම් ඒ සියල්ලෝ (නොමිහිරිවිපාක ඇති බැවින්) පහත්බවට කරුණු වෙති. යම් කිසි කුශලධර්ම කෙනෙක් වෙත් නම් ඒ සියල්ලෝ මිහිරිවිපාක ඇති බැවින්) උසස් බවට කරුණු වෙති.

2. චුන්දය, එපරිද්දෙන් ම හිංසා කරන පුද්ගලයාගේ උසස්බව පිණිස අවිහිංසාව වෙයි. සතුන් මරන පුද්ගලයාගේ උසස්බව පිණිස ප්‍රාණඝාතවිරමණය වෙයි. සොරකම් කරන...සියදිටු පැහැසීම දැඩිව ගැනීම හරනට නො පහසුබව ඇති පුද්ගලයාගේ උසස්බව පිණිස නො සියදිටු පැහැසීම නො දැඩි ගැනීම හරනට පහසුබව වෙයි.

[5. පරිනිබ්බානපරියායො]

1. සො වත චුන්ද අත්තනා පලිපපලිපන්නො පරං පලිපපලිපන්නං උද්ධරිස්සතීති නෙතං ඨානං විජ්ජති. සො වත චුන්ද, අත්තනා අපලිපපලිපන්නො පරං පලිපපලිපන්නං උද්ධරිස්සතීති ඨානමෙතං විජ්ජති. සො වත චුන්ද අත්තනා අදන්තො අවිනීතො අපරිනිබ්බුතො පරං දමෙස්සති විනෙස්සති පරිනිබ්බාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති. සො වත චුන්ද අත්තනා දන්තො විනීතො පරිනිබ්බුතො පරං දමෙස්සති විනෙස්සති පරිනිබ්බාපෙස්සතීති ඨානමෙතං විජ්ජති.

2. එවමෙව ඛො චුන්ද විහිංසකස්ස පුරිසපුග්ගලස්ස අවිහිංසා හොති පරිනිබ්බානාය. පාණාතිපාතිස්ස පුරිසපුග්ගලස්ස පාණාතිපාතා වෙරමණී හොති පරිනිබ්බානාය. අදින්නාදායිස්ස පුරිසපුග්ගලස්ස අදින්නාදානා වෙරමණී හොති පරිනිබ්බානාය. අබ්‍රහ්මචාරිස්ස පුරිසපුග්ගලස්ස අබ්‍රහ්මචරියා වෙරමණී හොති පරිනිබ්බානාය. මුසාවාදිස්ස පුරිසපුග්ගලස්ස මුසාවාදා වෙරමණී හොති පරිනිබ්බානාය. පිසුණවාචස්ස පුරිසපුග්ගලස්ස පිසුණාය වාචාය වෙරමණී හොති පරිනිබ්බානාය. ඵරුසවාචස්ස පුරිසපුග්ගලස්ස ඵරුසාය වාචාය වෙරමණී හොති පරිනිබ්බානාය. සම්ඵප්පලාපිස්ස පුරිසපුග්ගලස්ස සම්ඵප්පලාපා වෙරමණී හොති පරිනිබ්බානාය. අභිජ්ඣාලුස්ස පුරිසපුග්ගලස්ස අනභිජ්ඣා හොති පරිනිබ්බානාය. බ්‍යාපන්නචිත්තස්ස පුරිසපුග්ගලස්ස අබ්‍යාපාදො හොති පරිනිබ්බානාය. (1 - 10)

3. මිච්ඡාදිට්ඨිස්ස පුරිසපුග්ගලස්ස සම්මාදිට්ඨි හොති පරිනිබ්බානාය. මිච්ඡාසඞ්කප්පස්ස පුරිසපුග්ගලස්ස සම්මාසඞ්කප්පො හොති පරිනිබ්බානාය. මිච්ඡාවාචස්ස පුරිසපුග්ගලස්ස සම්මාවාචා හොති පරිනිබ්බානාය. මිච්ඡාකම්මන්තස්ස පුරිසපුග්ගලස්ස සම්මාකම්මන්තො හොති පරිනිබ්බානාය. මිච්ඡාආජීවස්ස පුරිසපුග්ගලස්ස සම්මාආජීවො හොති පරිනිබ්බානාය. මිච්ඡාවායාමස්ස පුරිසපුග්ගලස්ස සම්මාවායාමො හොති පරිනිබ්බානාය. මිච්ඡාසතිස්ස පුරිසපුග්ගලස්ස සම්මාසති හොති පරිනිබ්බානාය. මිච්ඡාසමාධිස්ස පුරිසපුග්ගලස්ස සම්මාසමාධි හොති පරිනිබ්බානාය. මිච්ඡාඤාණිස්ස පුරිසපුග්ගලස්ස සම්මාඤාණං හොති පරිනිබ්බානාය. මිච්ඡාවිමුත්තිස්ස පුරිසපුග්ගලස්ස සම්මාවිමුත්ති හොති පරිනිබ්බානාය. (11 - 20)

1. චුන්දය, එකාන්තයෙන් (යමෙක්) තෙමේ මඬෙහි එරුණේ ද හෙ තෙමේ මඬෙහි එරුණු අනෙකක්හු නගාලත්තේ යැ යන මෙකරුණ විද්‍යමාන නො වෙයි. චුන්දය, එකාන්තයෙන් (යමෙක්) තෙමේ මඬෙහි නො එරුණේ ද, හෙතෙමේ මඬෙහි එරුණු අනෙකක්හු නගාලත්තේ යැ යන මෙකරුණ විද්‍යමාන වෙයි. චුන්දය, එකාන්තයෙන් (යමෙක්) තෙමේ නො දමුණේ නො හික්මුණේ නො පිරිනිවුණේ වේ ද, හෙතෙමේ අනෙකක්හු දමනය කරන්නේ ය, හික්මවන්නේය, පිරිනිවීමට පමුණුවන්නේයැ යන මෙකරුණ විද්‍යමාන නො වෙයි. චුන්දය, එකාන්තයෙන් (යමෙක්) තෙමේ දමුණේ හික්මුණේ පිරිනිවුණේ වේ ද, හෙතෙමේ අනෙකක්හු දමනය කරන්නේය හික්මවන්නේය පිරිනිවීමට පමුණුවන්නේ යැ යන මෙකරුණ විද්‍යමාන වෙයි.

2. චුන්දය, මෙපරිද්දෙන් ම හිංසා කරන පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස අවිහිංසාව වෙයි. ප්‍රාණඝාතක පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස ප්‍රාණඝාතවිරමණය වෙයි. නො දුන් දෙය ගන්නා පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස අදත්තාදානවිරමණය වෙයි. බඹසර නො රක්නා පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස අබ්‍රහ්මචර්‍යාවිරමණය වෙයි. බොරු කියන පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස මුසාවාදවිරමණය වෙයි. කේලාම් කියන පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස පිසුණවාචාවිරමණය වෙයි. රළුබස් කියන පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස ඵරුසවාචාවිරමණය වෙයි. සම්ඵප්පලාප කියන පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස සම්ඵප්පලාපවිරමණය වෙයි. අභිධ්‍යාව බහුල කොට ඇති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස අනභිධ්‍යාව වෙයි. ව්‍යාපන්න සිත් ඇති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස අව්‍යාපාදය වෙයි. (1 – 10)

3. මිථ්‍යාදෘෂ්ටික පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස සම්‍යග්දෘෂ්ටිය වෙයි. මිථ්‍යාසඞ්කල්පය ඇති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස සම්‍යක්සඞ්කල්පය වෙයි. මිථ්‍යාවචන ඇති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස සම්‍යග්වචනය වෙයි. මිථ්‍යාකර්මාන්තය ඇති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස සම්‍යක්කර්මාන්තය වෙයි. මිථ්‍යාජීවය ඇති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස සම්‍යගාජීවය වෙයි. මිථ්‍යාව්‍යායාමය ඇති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස සම්‍යග්ව්‍යායාමය වෙයි මිථ්‍යාස්මෘතිය ඇති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස සම්‍යක්ස්මෘතිය වෙයි. මිථ්‍යාසමාධිය ඇති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස සම්‍යක්සමාධිය වෙයි. මිථ්‍යාඥානය ඇති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස සම්‍යග්ඥානය වෙයි. මිථ්‍යාවිමුක්තිය ඇති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස සම්‍යග්විමුක්තිය වෙයි. (11 – 20)

4. ථීනමිද්ධපරියුට්ඨිතස්ස පුරිසපුග්ගලස්ස විගතථීනමිද්ධතා හොති පරිනිබ්බානාය. උද්ධතස්ස පුරිසපුග්ගලස්ස අනුද්ධච්චං හොති පරිනිබ්බානාය. වෙචිකිච්ඡිස්ස පුරිසපුග්ගලස්ස තිණ්ණවිචිකිච්ඡතා හොති පරිනිබ්බානාය. කොධනස්ස පුරිසපුග්ගලස්ස අක්කොධො හොති පරිනිබ්බානාය. උපනාහිස්ස පුරිසපුග්ගලස්ස අනුපනාහො හොති පරිනිබ්බානාය. මක්ඛිස්ස පුරිසපුග්ගලස්ස අමක්ඛො හොති පරිනිබ්බානාය. පළාසිස්ස පුරිසපුග්ගලස්ස අපළාසො හොති පරිනිබ්බානාය. ඉස්සුකිස්ස පුරිසපුග්ගලස්ස අනිස්සා හොති පරිනිබ්බානාය. මච්ඡරිස්ස පුරිසපුග්ගලස්ස අමච්ඡරියං හොති පරිනිබ්බානාය. සඨස්ස පුරිසපුග්ගලස්ස අසාඨෙය්‍යං හොති පරිනිබ්බානාය. මායාවිස්ස පුරිසපුග්ගලස්ස අමායා හොති පරිනිබ්බානාය. ථද්ධස්ස පුරිසපුග්ගලස්ස අත්ථද්ධියං හොති පරිනිබ්බානාය. අතිමානිස්ස පුරිසපුග්ගලස්ස අනතිමානො හොති පරිනිබ්බානාය. දුබ්බචස්ස පුරිසපුග්ගලස්ස සොවචස්සතා හොති පරිනිබ්බානාය. පාපමිත්තස්ස පුරිසපුග්ගලස්ස කල්‍යාණමිත්තතා හොති පරිනිබ්බානාය. පමත්තස්ස පුරිසපුග්ගලස්ස අප්පමාදො හොති පරිනිබ්බානාය. අස්සද්ධස්ස පුරිසපුග්ගලස්ස සද්ධා හොති පරිනිබ්බානාය. අහිරිකස්ස පුරිසපුග්ගලස්ස හිරි හොති පරිනිබ්බානාය. අනොත්තාපිස්ස පුරිසපුග්ගලස්ස ඔත්තප්පං හොති පරිනිබ්බානාය. අප්පස්සුතස්ස පුරිසපුග්ගලස්ස බාහුසච්චං හොති පරිනිබ්බානාය. කුසීතස්ස පුරිසපුග්ගලස්ස විරියාරම්භො හොති පරිනිබ්බානාය. මුට්ඨස්සතිස්ස පුරිසපුග්ගලස්ස උපට්ඨිතසතිතා හොති පරිනිබ්බානාය. දුප්පඤ්ඤස්ස පුරිසපුග්ගලස්ස පඤ්ඤාසම්පදා හොති පරිනිබ්බානාය. සන්දිට්ඨිපරාමාසිආධානගාහිදුප්පටිනිස්සග්ගිස්ස පුරිසපුග්ගලස්ස අසන්දිට්ඨිපරාමාසිඅනාධානගාහිසුප්පටිනිස්සග්ගිතා හොති පරිනිබ්බානාය. [21 - 44]

5. ඉති ඛො චුන්ද දෙසිතො මයා සල්ලෙඛපරියායො. දෙසිතො චිත්තුප්පාදපරියායො. දෙසිතො පරික්කමනපරියායො. දෙසිතො උපරිභාවපරියායො. දෙසිතො පරිනිබ්බානපරියායො. යං ඛො චුන්ද සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පකෙන අනුකම්පං උපාදාය, කතං වො තං මයා. එතානි චුන්ද රුක්ඛමූලානි, එතානි සුඤ්ඤාගාරානි. ඣායථ චුන්ද මා පමාදත්ථ. මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ. අයං වො අම්හාකං අනුසාසනීති.

ඉදමවොච භගවා. අත්තමනො අයස්මා මහාචුන්දො භගවතො භාසිතං අභිනන්දීති.

*චතුත්තාරීස[1] පදා වුත්තා සන්ධයො[2] පඤ්ච දෙසිතා
සුත්තන්තො සල්ලෙඛො[3] නාම ගම්භීරො සාගරූපමො.[4]

සල්ලෙඛසුත්තං අට්ඨමං.

---

1. චතුත්තාලීස, මජසං. චතුත්තාළීස, සයා. 2. සන්ධියො, කත්ථචි.
3. සල්ලෙඛො නාම සුත්තන්තො, මජසං. සයා. 4. සාගරූපමො'ති මජසං. සයා.
* (ඉංග්‍රීසිපොත්ථකෙ එසා ගාථා න දිස්සතෙ.)

Free Distribution www.aathaapi.org

4. පීනමිද්ධයෙන් මඩනා ලද සිත් ඇත්තහුගේ කෙලෙස් නැති කිරීම පිණිස විගතපීනමිද්ධතාව වෙයි. උද්ධත පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම් පිණිස අනෞද්ධත්‍යය වෙයි. විචිකිච්ඡා ඇති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස තිණ්ණවිචිකිච්ඡතාව වෙයි. ක්‍රොධ කරනසුලු පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස අක්‍රොධය වෙයි. බද්ධවෛරී පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස අබද්ධවෛරය වෙයි. ගුණමකු පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම් පිණිස අමක්ඛය වෙයි. යුගග්‍රාහය ඇති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස යුගග්‍රාහාභාවය වෙයි ඊර්ෂ්‍යා ඇති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස අනීර්ෂ්‍යාව වෙයි. මසුරු පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස නො මසුරු බව වෙයි. ශඨ පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස අශඨභාවය වෙයි. මායාවී පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස අමායාව වෙයි. තද පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස නොතද බව වෙයි. අතිකමාන ඇති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස අනතිමානය වෙයි. දුර්වච පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස සුවච භාවය වෙයි. පාපමිතුරන් ඇති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස කලණ මිතුරන් ඇති බව වෙයි. ප්‍රමත්ත පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස අප්‍රමත්තභාවය වෙයි. ශ්‍රද්ධාව නැති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණි සශ්‍රද්ධාව වෙයි. හ්‍රීමත් පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස හ්‍රිය වෙයි. අනපත්‍රප පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස අපත්‍රපාව වෙයි. ඇසූ පිරූ තැන් නැති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස ඇසූ පිරූතැන් ඇති බව වෙයි. කුසීත පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස වීර්‍ය්‍යාරම්භය වෙයි. මුළා සිහි ඇති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස එළඹ සිටි සිහිය වෙයි. නුවණ නැති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස නුවණ වෙයි. සියදිටු පැහැසීම දැඩි වැ ගැනීම් හරනට නො පහසුබව ඇති පුද්ගලයාගේ කෙලෙස් නැති කිරීම පිණිස නො සියදිටු පැහැසීම දැඩි ව ගැනීම හරනට පහසුබව වෙයි. [21 – 44]

5. චුන්දය, මෙසේ මා විසින් කෙලෙස් සිඳලන කාරණය දෙසන ලදී. චිත්තොත්පාද කාරණය දෙසන ලදී. කෙලෙසුන්ගෙන් ඉවත්වන කාරණය දෙසන ලදී. උසස් බව නිපදවන කාරණය දෙසන ලදී. (කෙලෙස්) නිවන කාරණය දෙසන ලදී. චුන්දය, ශ්‍රාවකයන්ට හිතවත් වූ අනුකම්පා කරන ශාස්තෘ කෙනකුන් විසින් අනුකම්පායෙන් යමක් කටයුතු ද මා විසින් එය තොපට කරන ලදී. චුන්දය, මෙල රුක්මුල්හු වෙති. මෙල ශූන්‍යාගාරයෝ වෙති. චුන්දය ධ්‍යාන වඩවු. පමා නො වවු. පසුව විපිළිසර ඇතියව්හු නො වවු. මේ තොපට අපගේ අනුශාසනාවයි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු වූ ආයුෂ්මත් මහාචුන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තේ යි.

සිවුසාළිස් පද කෙනෙක් කියන ලදහ. පංචසන්ධිහු දෙසන ලදහ. සල්ලෙඛ සූත්‍රාන්තය මහසයුර මෙන් ගැඹුරු ය.

සල්ලෙඛ සූත්‍රය අටවැනි යි.

1. 1. 9

සම්මාදිට්ඨිසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි: ආවුසො භික්ඛවොති. ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

2. සම්මාදිට්ඨි සම්මාදිට්ඨීති ආවුසො වුච්චති; කිත්තාවතා නු ඛො ආවුසො අරියසාවකො සම්මාදිට්ඨී[1] හොති. උජුගතාස්ස දිට්ඨි. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො ආගතො ඉමං සද්ධම්මන්ති ?[2].

3. දූරතොපි ඛො මයං ආවුසො ආගච්ඡෙය්‍යාම ආයස්මතො සාරිපුත්තස්ස සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථමඤ්ඤාතුං; සාධු වතායස්මන්තංයෙව සාරිපුත්තං පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො; ආයස්මතො සාරිපුත්තස්ස සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති. තෙනහාවුසො[3] සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමීති. එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

4. යතො ඛො ආවුසො අරියසාවකො අකුසලඤ්ච පජානාති, අකුසලමූලඤ්ච පජානාති. කුසලඤ්ච පජානාති, කුසලමූලඤ්ච පජානාති. එත්තාවතාපි ඛො ආවුසො අරියසාවකො සම්මාදිට්ඨි හොති. උජුගතාස්ස දිට්ඨි. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො ආගතො ඉමං සද්ධම්මන්ති.

5. කතමං පනාවුසො අකුසලං ? කතමං අකුසලමූලං? කතමං කුසලං[4] ? කතමං කුසලමූලන්ති[5] ?

6. පාණාතිපාතො ඛො ආවුසො අකුසලං, අදින්නාදානං අකුසලං, කාමෙසුමිච්ඡාචාරො අකුසලං, මුසාවාදො අකුසලං, පිසුණාවාචා අකුසලං, ඵරුසාවාචා අකුසලං, සම්ඵප්පලාපො අකුසලං, අභිජ්ඣා අකුසලං, බ්‍යාපාදො අකුසලං, මිච්ඡාදිට්ඨි අකුසලං. ඉදං වුච්චතාවුසො අකුසලං.

7. කතමඤ්චාවුසො අකුසලමූලං ? ලොභො අකුසලමූලං, දොසො අකුසලමූලං, මොහො අකුසලමූලං. ඉදං වුච්චතාවුසො අකුසලමූලං.

1. සම්මාදිට්ඨි, ස්‍යා. 2. සද්ධම්මං, මජසං. 3. තෙන හි ආවුසො, මජසං. ස්‍යා. 4. කතමං පනාවුසො කුසලං, ස්‍යා. 5. කුසලමූලං, මජසං. T.

Free Distribution www.aathaapi.org

1. 1. 9

සම්මාදිට්ඨි සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ අනාථපිණ්ඩික සිටුහුගේ ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ 'ඇවැත්නි, මහණෙනි'යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු 'ඇවැත්නි'යි ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේට පිළිවදන් දුන්හ. ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ මෙය වදාළ සේක:

2. ඇවැත්නි, 'සම්‍යග්දෘෂ්ටිය, සම්‍යග්දෘෂ්ටිය'යි කියනු ලැබේ. ඇවැත්නි, කොපමණකින් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ සම්‍යග්දෘෂ්ටික වේ ද ? ඔහුගේ දෘෂ්ටි-තොමෝ ඍජුභාවයට පැමිණියා වේ ද ? ධර්මයෙහි ගුණ දත පැහැදීමෙන් යුක්ත වූයේ මේ නිර්වාණධර්මයට පැමිණියේ වේ ද ?

3. ඇවැත්නි, අපි ආයුෂ්මත් සැරියුත් මහතෙරුන් වහන්සේ සමීපයෙහි දී මේ භාෂිතයාගේ අර්ථය දත ගැනීමට දුරසිට වුවත් පැමිණෙන්නෙමු, මෙහි අර්ථය ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේට ම වැටහේ නම් මැනවි. භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේගෙන් අසා දරන්නාහු ය. ඇවැත්නි, එසේ නම් අසව්. මැනැවින් සිතේ තබා ගනිව්. කියන්නෙමි'යි වදාළහ: ඒ භික්ෂූහු එසේ ය, ඇවැත්නි'යි ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ මෙය වදාළ සේක.

4. ඇවැත්නි, යම් කලෙක පටන් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ අකුසලයන් දනී ද අකුසලමූලයන් දනී ද කුසලයන් දනී ද, කුසල මූලයන් දනී ද, ඇවැත්නි, මෙපමණකින් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ සම්‍යග්දෘෂ්ටික වෙයි ඔහුගේ දෘෂ්ටිය ඍජු වෙයි. ධර්මයෙහි ගුණ දත පැහැදීමෙන් යුක්ත වූයේ වෙයි. මේ නිර්වාණධර්මයට පැමිණියේ වෙයි.

5. ඇවැත්නි, අකුශලය කවරේ ද ? අකුශලමූලය කවරේ ද ? කුශලය කවරේ ද ? කුශලමූලය කවරේ ද ?

6. ඇවැත්නි, ප්‍රාණඝාතය අකුශලයෙකි. අදත්තාදානය අකුශලයෙකි. මිථ්‍යාචාරය අකුශලයෙකි. මුසාවාදය අකුශලයෙකි. පිසුණුවචනය අකුශලයෙකි. ඵරුෂවචනය අකුශලයෙකි. සම්ඵප්පලාපය අකුශලයෙකි. අභිධ්‍යාව අකුශලයෙකි. ව්‍යාපාදය අකුශලයෙකි. මිථ්‍යාදෘෂ්ටිය අකුශලයෙකි. ඇවැත්නි, මේ අකුශල ය යි කියනු ලැබේ.

7. ඇවැත්නි, අකුශලමූලය කවරේ ද ? ලෝභය අකුශලමූලයෙකි. ද්වේෂය අකුශලමූලයෙකි. මෝහය අකුශලමූලයෙකි. ඇවැත්නි, මේ අකුශලමූලය යි කියනු ලැබේ.

8. කතමඤ්චාවුසො කුසලං? පාණාතිපාතා වෙරමණී කුසලං, අදින්නාදානා වෙරමණී කුසලං, කාමෙසු මිච්ඡාචාරා වෙරමණී කුසලං, මුසාවාදා වෙරමණී කුසලං, පිසුණාවාචා වෙරමණී කුසලං, ඵරුසාවාචා වෙරමණී කුසලං, සම්ඵප්පලාපා වෙරමණී කුසලං, අනභිජ්ඣා කුසලං, අබ්‍යාපාදො කුසලං, සම්මාදිට්ඨි කුසලං. ඉදං වුච්චතාවුසො කුසලං.

9. කතමඤ්චාවුසො කුසලමූලං? අලොභො කුසලමූලං, අදොසො කුසලමූලං, අමොහො කුසලමූලං. ඉදං වුච්චතාවුසො කුසලමූලං.

10. යතො ඛො ආවුසො අරියසාවකො එවං අකුසලං පජානාති, එවං අකුසලමූලං පජානාති, එවං කුසලං පජානාති, එවං කුසලමූලං පජානාති. සො සබ්බසො රාගානුසයං පහාය පටිඝානුසයං පටිවිනොදෙත්වා අස්මීති දිට්ඨිමානානුසයං සමූහනිත්වා අවිජ්ජං පහාය විජ්ජං උප්පාදෙත්වා දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො[1] හොති. එත්තාවතාපි ඛො ආවුසො අරියසාවකො සම්මාදිට්ඨි හොති; උජුගතාස්ස දිට්ඨි, ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො; ආගතො ඉමං සද්ධම්මන්ති.

11. සාධාවුසොති[2] ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා ආයස්මන්තං සාරිපුත්තං උත්තරිං පඤ්හං ආපුච්ඡුං[3]: සියා පනාවුසො අඤ්ඤොපි පරියායො යථා අරියසාවකො සම්මාදිට්ඨි හොති, උජුගතාස්ස දිට්ඨි, ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො 'ආගතො ඉමං සද්ධම්මන්ති?

12. සියා ආවුසො[4] යතො ඛො ආවුසො අරියසාවකො ආහාරඤ්ච පජානාති, ආහාරසමුදයඤ්ච පජානාති, ආහාරනිරොධඤ්ච පජානාති, ආහාරනිරොධගාමිනිං[5] පටිපදඤ්ච පජානාති. එත්තාවතාපි ඛො ආවුසො අරියසාවකො සම්මාදිට්ඨි හොති; උජුගතාස්ස දිට්ඨි; ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො; ආගතො ඉමං සද්ධම්මන්ති.

13. කතමො පනාවුසො ආහාරො? කතමො ආහාරසමුදයො? කතමො ආහාරනිරොධො? කතමො ආහාරනිරොධගාමිනී පටිපදාති[6]?

14. චත්තාරො මෙ ආවුසො ආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය. කතමෙ චත්තාරො? කබළීකාරො[7] ආහාරො ඔළාරිකො වා සුඛුමො වා, ඵස්සො දුතියො, මනොසඤ්චෙතනා තතියා[8], විඤ්ඤාණං චතුත්ථං[9]. තණ්හාසමුදයා ආහාරසමුදයො; තණ්හානිරොධා ආහාරනිරොධො; අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො ආහාරනිරොධගාමිනී පටිපදා සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි.

1. දුක්ඛස්සන්තකරො, මජසං. සතා. PPS. 2. සාධු ආවුසොති, කත්ථචි.
3. අපුච්ඡුං, මජසං. අපුච්ඡිංසු, සතා.
4. සියාවුසො'ති ආයස්මා සාරිපුත්තො අවොච, සතා. 5. නිරොධගාමිනි, PTS.
6. පටිපදා, මජසං. PTS 7. කබළීකාරො, මජසං. කවළිංකාරො, සතා.
8. තතියො, PTS 9. චතුත්ථො. PTS

Free Distribution www.aathaapi.org

8. ඇවැත්නි, කුශලය කවරේ ය? ප්‍රාණඝාතයෙන් වෙන්වීම කුශලයෙකි. අදත්තාදානයෙන් වෙන් වීම කුශලයෙකි. කාමමිථ්‍යාචාරයෙන් වෙන් වීම කුශලයෙකි. මුසාවාදයෙන් වෙන් වීම කුශලයෙකි පිසුණවචනයෙන් වෙන් වීම කුශලයෙකි. ඵරුසවචනයෙන් වෙන් වීම කුශලයෙකි. සම්ඵප්පලාපයෙන් වෙන් වීම කුශලයෙකි. අනභිධ්‍යාව කුශලයෙකි. අව්‍යාපාදය කුශලයෙකි. සම්‍යග්දෘෂ්ටිය කුශලයෙකි. ඇවැත්නි, මේ කුශලය යි කියනු ලැබේ.

9. ඇවැත්නි, කුශලමූලය කවරේ ය? අලෝභය කුශලමූලයෙකි. අද්වේෂය කුශලමූලයෙකි. අමෝහය කුශලමූලයෙකි. ඇවැත්නි, මේ කුශලමූල ය යි කියනු ලැබේ.

10. ඇවැත්නි, යම් කලෙක පටන් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ මෙසේ අකුශලය දනී ද, මෙසේ අකුශලමූලය දනී ද, මෙසේ කුශලය දනී ද, මෙසේ කුශලමූලය දනී ද, හෙතෙම සර්වප්‍රකාරයෙන් රාගානුශය නැති කොට ප්‍රතිඝානුශය දුරු කොට අස්මි ('මම' ය යන) දෘෂ්ටිය බඳු වූ මානානුශය නසා අවිද්‍යාව හැර විද්‍යාව උපදවා ඉහාත්මයේ දී ම දුක් කෙළවර කරන්නෙක් වෙයි. ඇවැත්නි, මෙතෙකිනුදු ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ සම්‍යග්දෘෂ්ටික වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු වෙයි. ධර්මයෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වූයේ මේ නිර්වාණධර්මයට පැමිණියේ වෙයි.

[1. කම්මපථවාරය යි.]

11. ඒ භික්ෂූහු 'ඇවැත්නි, ඉතා මැනැවැ'යි ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේගේ දෙශනාව බසින් පිළිගෙන සිතින් අනුමෝදන් කොට ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේගෙන් මත්තෙහි අතිරේක ප්‍රශ්නයක් ඇසූහ: ඇවැත්නි, ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ යම් ලෙසකින් සම්‍යග්දෘෂ්ටික වේ නම්, ඔහුගේ දෘෂ්ටිය ඍජු වේ නම්, ධර්මයෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වූයේ මේ නිර්වාණධර්මයට පැමිණියේ වේ නම්, ඊට අන් ක්‍රමයෙකුත් ඇත්තේ ද?

12. ඇවැත්නි, ඇත්තේ ය. ඇවැත්නි, යම් කලෙක පටන් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ ආහාරය (ඵල ආහරණය කරන ප්‍රත්‍යය)ත් දනී ද, ආහාරසමුදයත් දනී ද, ආහාරනිරෝධයත් දනී ද, ආහාරනිරෝධගාමිනී ප්‍රතිපදාවත් දනී ද, ඇවැත්නි, මෙතෙකිනුදු ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ සම්‍යග්දෘෂ්ටික වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු වෙයි. ධර්මයෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වූයේ මෙ නිර්වාණධර්මයට පැමිණියේ වෙයි.

13. ඇවැත්නි, ආහාරය කවරේ ය? ආහාරසමුදය කවරේ ය? ආහාරනිරෝධය කවරේ ය? ආහාරනිරෝධගාමිනීප්‍රතිපදා කවර?

14. ඇවැත්නි, උපන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිස ද අණ්ඩකෝෂ වස්තිකෝෂයන්හි සිටින එහෙයින් ම උත්පත්තිය සොයන සතුන්ට අනුග්‍රහය පිණිස ද පවත්නා මේ ආහාරයෝ සතර දෙනෙක් වෙත්. කවර සතර දෙනෙක යත්: ඖළාරික වූ ද සියුම් වූ ද කබලීකාර ආහාරය (=වළඳනු ලබනදෙය), දෙවැනි වූ ඵස්සාහාරය, තුන්වැනි වූ මනොසඤ්චෙතනාහාරය, සතර වැනි වූ විඤ්ඤාණාහාරය යන සතරයි. තෘෂ්ණාව හටගැනීමෙන් ආහාරයන්ගේ හටගැනීම වේ. තෘෂ්ණා නිරෝධයෙන් ආහාරනිරෝධය වේ. මේ අරිඅටඟිමඟ ම ආහාරනිරෝධගාමිනීප්‍රතිපදාව යි. එනම්: සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි යන මේ යි.

Free Distribution www.aathaapi.org

15. යතො ඛො ආවුසො අරියසාවකො එවං ආහාරං පජානාති, එවං ආහාරසමුදයං පජානාති, එවං ආහාරනිරොධං පජානාති, එවං ආහාරනිරොධගාමිනිං පටිපදං පජානාති, සො සබ්බසො රාගානුසයං පහාය පටිඝානුසයං පටිවිනොදෙත්වා අස්මීති දිට්ඨිමානානුසයං සමූහනිත්වා අවිජ්ජං පහාය විජ්ජං උප්පාදෙත්වා දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. එත්තාවතාපි ඛො ආවුසො අරියසාවකො සම්මාදිට්ඨි හොති. උජුගතාස්ස දිට්ඨි. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො ආගතො ඉමං සද්ධම්මන්ති.

[2. ආහාරවාරෙ.]

1. සාධාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා ආයස්මන්තං සාරිපුත්තං උත්තරිං පඤ්හං ආපුච්ඡුං:[1] "සියා පනාවුසො අඤ්ඤොපි පරියායො යථා අරියසාවකො සම්මාදිට්ඨි හොති -පෙ- ආගතො ඉමං සද්ධම්මන්ති."

2. සියා ආවුසො. යතො ඛො ආවුසො අරියසාවකො දුක්ඛඤ්ච පජානාති, දුක්ඛසමුදයඤ්ච පජානාති, දුක්ඛනිරොධඤ්ච පජානාති, දුක්ඛනිරොධගාමිනිං පටිපදඤ්ච පජානාති, එත්තාවතාපි ඛො ආවුසො අරියසාවකො සම්මාදිට්ඨි හොති. උජුගතාස්ස දිට්ඨි. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො ආගතො ඉමං සද්ධම්මන්ති.

3. කතමං පනාවුසො දුක්ඛං? කතමො දුක්ඛසමුදයො? කතමො දුක්ඛනිරොධො? කතමා දුක්ඛනිරොධගාමිනී පටිපදා?ති.

ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛො, මරණම්පි දුක්ඛං, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාපි දුක්ඛා, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා. ඉදං වුච්චතාවුසො දුක්ඛං.*

කතමො චාවුසො දුක්ඛසමුදයො? යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී - සෙය්‍යථීදං: කාමතණ්හා භවතණ්හා විභවතණ්හා - අයං වුච්චතාවුසො දුක්ඛසමුදයො.

කතමො චාවුසො දුක්ඛනිරොධො? යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො -අයං වුච්චතාවුසො දුක්ඛනිරොධො.

කතමා චාවුසො දුක්ඛනිරොධගාමිනී පටිපදා? අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො දුක්ඛනිරොධගාමිනී පටිපදා - සෙය්‍යථීදං: සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්පො, සම්මාවාචා, සම්මාකම්මන්තො, සම්මාආජීවො, සම්මාවායාමො, සම්මාසති, සම්මාසමාධි.

---

1. ආපුච්ඡිංසු, අට්ඨකථා

* අස්මිං දුක්ඛසච්චනිද්දෙසෙ පරියාය දුක්ඛධම්මාව වුත්තා. තථාපි "අප්පියෙහි සම්පයොගො දුක්ඛො - පියෙහි විප්පයොගො දුක්ඛො"ති අඤ්ඤත්‍ර නිද්දිට්ඨානි පරියාය දුක්ඛානි ඉධ අනිද්දිට්ඨානි. තානිපි ස්‍යාම - මරම්ම පොත්ථකෙසු දිස්සන්ති. තෙසු පන "ව්‍යාධිපි. දුක්ඛො"ති න දිස්සති.

15. ඇවැත්නි, යම් කලෙක පටන් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ මෙසේ ආහාරය දනී ද, මෙසේ ආහාරසමුදය දනී ද, මෙසේ ආහාරනිරෝධය දනී ද, මෙසේ ආහාරනිරෝධයට පමුණුවන පිළිවෙත දනී ද, හෙතෙම සර්‍ව ප්‍රකාරයෙන් ම රාගානුශය හැර ප්‍රතිඝානුශය දුරු කොට 'අස්මි' යන දෘෂ්ටිය හා සම වූ මානානුශය නසා අවිද්‍යාව හැර විද්‍යාව උපදවා දිට්ඨදම්මයෙහි දී ම දුක් කෙළවර කරන්නෙක් වන්නේ ය. ඇවැත්නි, මෙතෙකින්දු ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ සම්‍යග්දෘෂ්ටික වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු වෙයි. ධර්‍මයෙහි අචල වූ පැහැදීමෙන් යුක්ත වූයේ මේ නිර්‍වාණධර්‍මයට පැමිණියේ වෙයි.

[2. ආහාර වාරය යි.]

1. ඒ භික්‍ෂූහු 'ඇවැත්නි, ඉතා මැනැවැ'යි ආයුෂ්මත් ශාරිපුත්‍ර-ස්ථවිරයන් වහන්සේගේ දේශනාව බසින් පිළිගෙණ සිතින් අනුමෝදන් කොට ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේගෙන් මත්තෙහි අතිරේක ප්‍රශ්නයක් පුළුවුත්හ: ඇවැත්නි, ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ යම් ලෙසෙකින් සම්‍යග්දෘෂ්ටික වේ නම්...මේ නිර්‍වාණධර්‍මයට පැමිණියේ වේ නම්, ඊට අන් ක්‍රමයෙකු දු ඇත්තේ ද?

2. ඇවැත්නි, ඇත්තේ ය. ඇවැත්නි, යම් කලෙක පටන් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ දුකත් දනී ද, දුක් හටගැන්මේ හෙතුවත් දනී ද, දුක් නැසීමත් දනී ද, දුක් නැසීමේ පිළිවෙතත් දනී ද, ඇවැත්නි, ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ මෙතෙකින්දු සම්‍යග්දෘෂ්ටික වෙයි. ඔහුගේ දෘෂ්ටි ඍජු වෙයි. ධර්‍මයෙහි ගුණ දන්න පැහැදීමෙන් යුක්ත වූයේ මේ නිර්‍වාණධර්‍මයට පැමිණියේ වෙයි.

3. ඇවැත්නි, දුක කවරේ ය? දුක් හටගැනීමේ හේතුව කවරේ ය? දුක් නැසීම කවරේ ය? දුක් නැසීමේ පිළිවෙත කවර?

ඉපදීමත් දුක ය, දිරීමත් දුක ය, ව්‍යාධියත් දුක ය, මරණයත් දුක ය; ශෝකය, වැලපීම, කයෙහි දුක, හිතෙහි දුක, දැඩි චිත්තදුඃඛයෙන් වූ ප්‍රතිඝය යන මොහු දුක් ය. යමක් කැමැති වන්නේ (එය) නො ලබා නම් එයත් දුක් ය. සැකෙවින් උපාදානස්කන්ධ පස දුක් ය. ඇවැත්නි, මේ දුක ය යි කියනු ලැබේ.

ඇවැත්නි, දුක් හට ගැනීමේ හෙතුව කවරේ ය? පුනර්භවය කරණසුලු නන්දිරාග වූ ඒ ඒ භවයෙහි හෝ අරමුණෙහි තුෂ්ණා වූ යම් මේ තෘෂ්ණාවක් වේ ද, කාමාස්වාද තෘෂ්ණා, භව (ශාශ්වතදෘෂ්ටිසහගත) තෘෂ්ණා, විභව (උච්ඡේදදෘෂ්ටිසහගත) තෘෂ්ණා යි (ත්‍රිවිධ වූ) මේ තෘෂ්ණා තොමෝ - ඇවැත්නි, දුක් හට ගැනීමේ හෙතු ය යි කියනු ලැබේ.

ඇවැත්නි, දුඃඛනිරෝධය කවරේ ය? ආර්‍ය්‍යමාර්‍ගයෙන් ඒ තෘෂ්ණා-වගේ ම යම් අත්‍යන්තප්‍රහාණයෙක්, හැරලීමෙක්, දුරලීමෙක්, මිදීමෙක්, නො ඇල්මෙක් වේ ද, ඇවැත්නි, මේ දුඃඛනිරොධ ය යි කියනු ලැබේ.

ඇවැත්නි, දුක්ඛනිරොධගාමිනීපටිපදා කවර? සම්‍යග්දෘෂ්ටි, සම්‍යක් සඞ්කල්ප, සම්‍යක් වචන, සම්‍යක් කර්‍මාන්ත, සම්‍යග් ආජීව, සම්‍යක් ව්‍යායාම, සම්‍යක් ස්මෘති, සම්‍යක්සමාධි යන මේ අරීඅටඟිමග ම දුඃඛනිරොධ ගාමිනී ප්‍රතිප්‍රදාය.

4. යතො ඛො ආවුසො අරියසාවකො එවං දුක්ඛං පජානාති, එවං දුක්ඛසමුදයං පජානාති, එවං දුක්ඛනිරොධං පජානාති, එවං දුක්ඛනිරොධගාමිනිං පටිපදං පජානාති, සො සබ්බසො රාගානුසයං පහාය පටිඝානුසයං පටිවිනොදෙත්වා අස්මීති දිට්ඨිමානානුසයං සමූහනිත්වා අවිජ්ජං පහාය විජ්ජං උප්පාදෙත්වා දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. එත්තාවතාපි ඛො ආවුසො අරියසාවකො සම්මාදිට්ඨි හොති. උජ්ජුගතාස්ස දිට්ඨි. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො ආගතො ඉමං සද්ධම්මන්ති.

[8. සච්චවාරො.]

1. සාධාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා ආයස්මන්තං සාරිපුත්තං උත්තරිං පඤ්හං ආපුච්ඡුං: "සියා පනාවුසො අඤ්ඤොපි පරියායො යථා අරියසාවකො සම්මාදිට්ඨි හොති -පෙ- ආගතො ඉමං සද්ධම්මන්ති."

2. සියා ආවුසො. යතො ඛො ආවුසො අරියසාවකො ජරාමරණඤ්ච පජානාති, ජරාමරණසමුදයඤ්ච පජානාති, ජරාමරණනිරොධඤ්ච පජානාති, ජරාමරණනිරොධගාමිනිං පටිපදඤ්ච පජානාති, එත්තාවතාපි ඛො ආවුසො අරියසාවකො සම්මාදිට්ඨි හොති. උජ්ජුගතාස්ස දිට්ඨි. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො ආගතො ඉමං සද්ධම්මන්ති.

11. තව ද මහණෙනි, මහණ තෙමේ සොහොනෙහි ලූ නහර බැඳුම් නැති අන් දෙසෙකින් අත්ඇටය ද අන් දෙසෙකින් පාඇටය ද අන් දෙසෙකින් කෙණ්ඩාඇටය ද අන් දෙසෙකින් කළවාඇටය ද අන් දෙසෙකින් කටිඇටය ද අන් දෙසෙකින් පිටකටුව ද අන් දෙසෙකින් හිස් කබල දැයි දිසානුදිසාවන්හි විසුරුණු ඇටසැකිල්ල යම්සේ දක්නේ ද, හෙතෙම මේ කය එය හා එළවා සසඳ බලයි: 'මේ කයත් මෙබඳු ස්වභාව ඇත්තේ ය. මෙසේ වන සුලු ය මේ ස්වභාවය නො ඉක්මවූයේ ය' යි. මෙසේ තමාගේ කයෙහි හෝ කායානුපස්සී ව වාසය කරයි... මහණෙනි, මෙසේත් මහණ තෙමේ කයෙහි කායානුපස්සී ව වාසය කරයි. (6)

12. තවද මහණෙනි, මහණ තෙමේ සොහොනෙහි ලූ සක් පැහැ බඳු සුදු ඇට යුත් ශරීරයක් යම් සේ දක්නේ ද, හෙතෙමේ මේ කය ම ඒ කය හා එළවා සසඳ බලයි: 'මේ ශරීරයත් මෙබඳු ස්වභාව ඇත්තේ ය. මෙසේ වන සුලු ය. මෙබඳු ස්වභාවය නො ඉක්මවූයේ ය'යි මෙසේ තමාගේ කයෙහි හෝ කායානුපස්සී ව වාසය කරයි... මහණෙනි, මෙසේත් මහණ තෙමේ කයෙහි කායානුපස්සී ව වාසය කරයි. (7)

13. පුනචපරං භික්ඛවෙ භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සීවථිකාය ඡඩ්ඩිතං- අට්ඨිකානි පුඤ්ජකිතානි තෙරොවස්සිකානි, සො ඉමමෙව කායං උපසංහරති: 'අයම්පි ඛො කායො එවං ධම්මො එවම්භාවී එතං අනතීතො'ති. ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති -පෙ- එවම්පි භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති. (8)

14. පුනචපරං භික්ඛවෙ භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සීවථිකාය ඡඩ්ඩිතං- අට්ඨිකානි පූතීනි චුණ්ණකජාතානි, සො ඉමමෙව කායං උපසංහරති: 'අයම්පි ඛො කායො එවං ධම්මො එවම්භාවී එතං අනතීතො'ති. ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති. -පෙ- එවම්පි භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති. (9)

එවං ඛො භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති.

[කායානුපස්සනා සතිපට්ඨානං]

(2. වෙදනානුපස්සනාසතිපට්ඨානං:)

කථඤ්ච භික්ඛවෙ භික්ඛු වෙදනාසු වෙදනානුපස්සී විහරති?

1. ඉධ භික්ඛවෙ භික්ඛු සුඛං වෙදනං වෙදියමානො 'සුඛං වෙදනං වෙදියාමී'ති පජානාති. දුක්ඛං වෙදනං වෙදියමානො 'දුක්ඛං වෙදනං වෙදියාමී'ති පජානාති. අදුක්ඛමසුඛං වෙදනං වෙදියමානො 'අදුක්ඛමසුඛං වෙදනං වෙදියාමී'ති පජානාති. සාමිසං වා සුඛං වෙදනං වෙදියමානො 'සාමිසං සුඛං වෙදනං වෙදියාමී'ති පජානාති. නිරාමිසං වා සුඛං වෙදනං වෙදියමානො 'නිරාමිසං සුඛං වෙදනං වෙදියාමී'ති පජානාති. සාමිසං වා දුක්ඛං වෙදනං වෙදියමානො 'සාමිසං දුක්ඛං වෙදනං වෙදියාමී'ති පජානාති. නිරාමිසං වා දුක්ඛං වෙදනං වෙදියමානො 'නිරාමිසං දුක්ඛං වෙදනං වෙදියාමී'ති පජානාති. සාමිසං වා අදුක්ඛමසුඛං වෙදනං වෙදියමානො 'සාමිසං අදුක්ඛමසුඛං වෙදනං වෙදියාමී'ති පජානාති. නිරාමිසං වා අදුක්ඛමසුඛං වෙදනං වෙදියමානො 'නිරාමිසං අදුක්ඛමසුඛං වෙදනං වෙදියාමී'ති පජානාති. (1-9)

ඉති අජ්ඣත්තං වා වෙදනාසු වෙදනානුපස්සී විහරති. බහිද්ධා වා වෙදනාසු වෙදනානුපස්සී විහරති. අජ්ඣත්තබහිද්ධා වා වෙදනාසු වෙදනානුපස්සී විහරති. සමුදයධම්මානුපස්සී වා වෙදනාසු විහරති වයධම්මානුපස්සී වා වෙදනාසු විහරති. සමුදයවයධම්මානුපස්සී වා වෙදනාසු විහරති. අත්ථි වෙදනාති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සතිමත්තාය. අනිස්සිතො ච විහරති. න ච කිඤ්චි ලොකෙ උපාදියති.

එවං ඛො භික්ඛවෙ භික්ඛු වෙදනාසු වෙදනානුපස්සී විහරති.

[වෙදනානුපස්සනාසතිපට්ඨානං.]

13. තවද මහණෙනි, මහණ තෙමේ සොහොනෙහි ලූ අවුරුදු ගණන් ඉක්මගිය පුස්කෑජාත (තැන තැන රැස්) වූ ඇට කැබලි ඇති... ශරීරයක් යම්සේ දක්නේ ද, හෙතෙමේ මේ කය ම ඒ කය හා එළවා සසඳා බලයි: 'මේ ශරීරයත් මෙබඳු සවභාව ඇත්තේ ය. මෙසේ වන සුලු ය මෙබඳු සවභාවය නො ඉක්මවූයේ යැ'යි මෙසේ තමාගේ කයෙහි හෝ කායානුපස්සී ව වාසය කරයි. ... මහණෙනි, මෙසේත් මහණ තෙමේ කයෙහි කායානුපස්සී ව වාසය කරයි. (8)

14. තවද මහණෙනි, මහණ තෙමේ කුණු වූ කුඩු වූ සොහොනෙහි ලූ ඇට ගොඩක් වූ ශරීරයක් යම් සේ දක්නේ ද, හෙතෙමේ මේ කය ම ඒ කය හා එළවා සසඳා බලයි: 'මේ කයත් මේබඳු සවභාව ඇත්තේ ය. මෙසේ වන සුලු ය. මේ සවභාවය නො ඉක්මවූයේ ය' යි මෙසේත් තමාගේ කයෙහි හෝ කායානුපස්සී ව වාසය කරයි... මහණෙනි, මෙසේත් මහණ තෙමේ කයෙහි කායානුපස්සීව වාසය කරයි. (9)

මහණෙනි, මෙසේ මහණතෙම කයෙහි කායානුපස්සී ව වාසය කරයි.

[කායානුපස්සනා සතිපට්ඨාන යි]

(2. වේදනානුපස්සනාසතිපට්ඨානය.)

මහණෙනි, මහණ තෙමේ කෙසේ නම් වේදනාවන්හි වේදනා-වන් නුවණින් බලන සුලු ව වාසස කෙරේ ද ?

1. මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ සැප වේදනාවක් විඳින්නේ සැප වේදනාවක් විඳිමි යි (සම්‍යක් ප්‍රඥාවෙන්) දනී. දුක් වේදනාවක් විඳින්නේ දුක් වේදනාවක් විඳිමි යි දනී. නො දුක් නො සැප වේදනාවක් විඳින්නේ නො දුක් නො සැප වේදනාවක් විඳිමි යි දනී. ආමිස(පස්කම් ගුණ) සහිත සුඛවේදනාවක් විඳින්නේ සාමිසසුඛවේදනාවක් විඳිමි යි දනී. ආමිස-රහිතසුඛවේදනාවක් හෝ විඳින්නේ නිරාමිසසුඛවේදනාවක් විඳිමි යි දනී. සාමිසදුක්ඛවේදනාවක් හෝ විඳින්නේ සාමිසදුක්ඛ වේදනාවක් විඳිමි යි දනී. නිරාමිසදුක්ඛවේදනාවක් හෝ විඳින්නේ නිරාමිසදුක්ඛවේදනාවක් විඳිමි යි දනී සාමිස නො දුක් නො සැප වේදනාවක් හෝ විඳින්නේ සාමිස නො දුක් නො සැප වේදනාවක් විඳිමි යි දනී නිරාමිස නො දුක් නො සැප වේදනාවක් හෝ විඳින්නේ නිරාමිස නො දුක් නො සැප වේදනාවක් විඳිමි යි දනී. (1-9)

මෙසේ තමා පිළිබඳ වේදනාවන්හි වේදනා නුවණින් බලනසුලුව හෝ වාසය කරයි. අනුන් පිළිබඳ වේදනාවන්හි වේදනා නුවණින් බලන සුලු ව වාසය කරයි. තමන් පිළිබඳ වූ හෝ අනුන් පිළිබඳ වූ හෝ වේදනාවන්හි වේදනා නුවණින් බලන සුලුව වාසය කරයි. වේදනාවන්හි හටගැනීම නුවණින් බලන සුලු ව හෝ වාසය කරයි. වේදනාවන්හි විනාශය නුවණින් බලන සුලු ව හෝ වාසය කරයි වේදනාවන්හි හටගැනීම හා නැසීම නුවණින් බලනසුලුව හෝ වාසය කරයි. හුදෙක් වේදනාව පමණක් ඇතැයි ඔහුගේ සිහිය නුවණ වැඩීම පිණිස සිහිය වැඩීම පිණිස එළඹ සිටියේ වෙයි. තෘෂ්ණා දෘෂ්ටි ඇසුරු නො කොට ද වෙසෙයි. වේදනාසංඛ්‍යාත ලොකයෙහි කිසිවක් 'මම ය මාගේ ය' යි නො ගනී යි.

මහණෙනි, මෙසේ මහණ තෙමේ වේදනාවන්හි වේදනානුපස්සී ව වාසය කරයි.

[වේදනානුපස්සනා සතිපට්ඨාන යි.]

(3. චිත්තානුපස්සනාසතිපට්ඨානං:)

කථඤ්ච භික්ඛවෙ භික්ඛු චිත්තෙ චිත්තානුපස්සී විහරති?

1. ඉධ භික්ඛවෙ භික්ඛු සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති. සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති. වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති. වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති. සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති. වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති. මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති. අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති. සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති. අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති. සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති. අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති. විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති. අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති. (1-16)

ඉති අජ්ඣත්තං වා චිත්තෙ චිත්තානුපස්සී විහරති. බහිද්ධා වා චිත්තෙ චිත්තානුපස්සී විහරති. අජ්ඣත්තබහිද්ධා වා චිත්තෙ චිත්තානුපස්සී විහරති. සමුදයධම්මානුපස්සී වා චිත්තස්මිං විහරති. වයධම්මානුපස්සී වා චිත්තස්මිං විහරති. සමුදයවයධම්මානුපස්සී වා චිත්තස්මිං විහරති. අත්ථි චිත්තන්ති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සතිමත්තාය. අනිස්සිතො ච විහරති. න ච කිඤ්චි ලොකෙ උපාදියති.

එවං ඛො භික්ඛවෙ චිත්තෙ චිත්තානුපස්සී විහරති.

[චිත්තානුපස්සනාසතිපට්ඨානං.]

(4. ධම්මානුපස්සනාසතිපට්ඨානං:)

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති?

1. ඉධ භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති පඤ්චසු නීවරණෙසු. කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති පඤ්චසු නීවරණෙසු?

ඉධ භික්ඛවෙ භික්ඛු සන්තං වා අජ්ඣත්තං කාමච්ඡන්දං 'අත්ථි මෙ අජ්ඣත්තං කාමච්ඡන්දො'ති පජානාති. අසන්තං වා අජ්ඣත්තං කාමච්ඡන්දං 'නත්ථි මෙ අජ්ඣත්තං කාමච්ඡන්දො'ති පජානාති. යථා ච අනුප්පන්නස්ස කාමච්ඡන්දස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස කාමච්ඡන්දස්ස පහානං හොති, තඤ්ච පජානාති. යථා ච පහීනස්ස කාමච්ඡන්දස්ස ආයතිං අනුප්පාදො හොති, තඤ්ච පජානාති. (1)

සන්තං වා අජ්ඣත්තං බ්‍යාපාදං 'අත්ථි මෙ අජ්ඣත්තං බ්‍යාපාදො'ති පජානාති. අසන්තං වා අජ්ඣත්තං බ්‍යාපාදං 'නත්ථි මෙ අජ්ඣත්තං බ්‍යාපාදො'ති පජානාති. යථා ච අනුප්පන්නස්ස බ්‍යාපාදස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස බ්‍යාපාදස්ස පහානං හොති, තඤ්ච පජානාති. යථා ච පහීනස්ස බ්‍යාපාදස්ස ආයතිං අනුප්පාදො හොති, තඤ්ච පජානාති. (2)

මහණෙනි, මහණ තෙමේ කෙසේ නම් සිතෙහි සිත නුවණින් බලනසුලු වූයේ වාසය කෙරේ ද ?

1. මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ රාග සහිත වූ හෝ සිත රාග සහිත සිතැයි (සම්‍යක් ප්‍රඥාවෙන්) දනී. රාග රහිත වූ සිත රාග රහිත සිතැයි දනී. ද්වෙෂ සහිත වූ හෝ සිත ද්වෙෂ සහිත සිතැයි දනී. ද්වෙෂ රහිත වූ හෝ සිත ද්වෙෂ රහිත සිතැයි දනී. මොහ සහිත වූ හෝ සිත මොහ සහිත සිතැයි දනී. මොහ රහිත වූ හෝ සිත මෝහ රහිත සිතැයි දනී. (ථිනමිද්ධයෙන්) හැකුළුණු හෝ සිත හැකුළුණු සිතැයි දනී. (උද්ධච්චයෙන් නානාලම්බනයන්හි) විසිර ගියා වූ හෝ සිත විසුරුණු සිතැයි දනී. මහග්ගත (රූපාරූපාවචර) වූ හෝ සිත මහග්ගත සිතැයි දනී. මහග්ගත නො වූ හෝ සිත මහග්ගත නො වූ සිතැයි දනී. සඋත්තර (කාමාවචර)වූ හෝ සිත සඋත්තර සිතැයි දනී. අනුත්තර (රූපාරූපාවචර) වූ හෝ සිත අනුත්තර සිතැයි දනී. සමාහිත (සමාධිගත) වූ හෝ සිත සමාහිත සිතැයි දනී. අසමාහිත වූ හෝ සිත අසමාහිත සිතැයි දනී. (තදඞ්ග වික්ඛම්භන වසයෙන්) මිදුණා වූ හෝ සිත මිදුණා වූ සිතැයි දනී නො මිදුණු හෝ සිත නො මිදුණු සිතැයි දනී. (1-16)

මෙසේ තමාගේ සිතෙහි හෝ චිත්තානුපස්සී ව වාසය කරයි. අනුන්ගේ සිතෙහි හෝ චිත්තානුපස්සී ව වාසය කරයි. තමන්ගේත් අනුන්ගේත් සිත්හි හෝ චිත්තානුපස්සී ව වාසය කරයි. සිතේ හටගැන්ම බලන සුලු ව හෝ වාසය කරයි. සිතේ විනාශය බලන සුලු ව හෝ වාසය කරයි. සිතේ හටගැන්ම හා විනාශය බලන සුලු ව හෝ වාසය කරයි. හුදෙක් සිත පමණක් ඇත්තේය යි ඔහුගේ සිහිය නුවණ වැඩීම පිණිස සිහිය වැඩීම පිණිස එළඹ සිටියේ වෙයි. තෘෂ්ණා දෘෂ්ටි ඇසුරු නො කෙළේ ද වෙසෙයි. චිත්තසඞ්ඛ්‍යාත ලොකයෙහි කිසිවක් 'මමය මාගේ ය' යි නො ගෙන වාසය කරයි.

මහණෙනි, මෙසේ මහණ තෙම චිත්තයෙහි චිත්තානුපස්සී ව වාසය කරයි.

[චිත්තානුපස්සනා සතිපට්ඨාන යි.]

(4 ධම්මානුපස්සනාසතිපට්ඨානය:)

1. මහණෙනි, මහණ තෙමේ කෙසේ නම් ධර්මයන්හි ධර්මය නුවණින් බලන සුලු ව වාසය කෙරේ ද?

මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ පඤ්චනීවරණ ධර්මයන්හි ධර්මය නුවණින් බලන සුලු ව වාසය කෙරේ. මහණෙනි, මහණ තෙමේ කෙසේ නම් පඤ්චනීවරණ ධර්මයන්හි ධර්මය නුවණින් බලන සුලු ව වාසය කෙරේ ද?

මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ තමා තුළ ඇත්තා වූ හෝ කාමච්ඡන්දය 'මා තුළ කාමච්ඡන්දය ඇත්තේ ය' යි (සම්‍යක් ප්‍රඥයෙන්) දැන ගනියි. තමා තුළ නැත්තා වූ හෝ කාමච්ඡන්දය 'මා තුළ කාමච්ඡන්දය නැතැ'යි දැන ගනියි. යම්සේ නූපන් කාමච්ඡන්දයාගේ ඉපදීම වේ ද, එය ද දැන ගනියි. යම්සේ උපන් කාමච්ඡන්දයාගේ ප්‍රහාණය වේ ද, එය ද දැන ගනියි. යම්සේ ප්‍රහීණ වූ කාමච්ඡන්දයාගේ මතු නො ඉපදීම වේ ද, එය ද දැන ගනියි. (1)

තමා තුළ ඇත්තා වූ හෝ ව්‍යාපාදය මා තුළ ව්‍යාපාදය ඇත්තේ ය' යි දැන ගනියි. තමා තුළ නැත්තා වූ හෝ ව්‍යාපාදය 'මා තුළ ව්‍යාපාදය නැත්තේය'යි දැන ගනියි. යම් සේ නූපන් ව්‍යාපාදයාගේ ඉපදීම වේ ද, එය ද දැන ගනියි. යම් සේ උපන් ව්‍යාපාදයාගේ ප්‍රහාණය වේ ද, එය ද දැන ගනියි. යම්සේ ප්‍රහීණ වූ ව්‍යාපාදයාගේ මතු නො ඉපදීම වේ ද, එය ද දැන ගනියි. (2)

Free Distribution www.aathaapi.org

සන්තං වා අජ්ඣත්තං ථීනමිද්ධං 'අත්ථි මෙ අජ්ඣත්තං ථීනමිද්ධන්ති' පජානාති. අසන්තං වා අජ්ඣත්තං ථීනමිද්ධං 'නත්ථි මෙ අජ්ඣත්තං ථීනමිද්ධන්ති, පජානාති. යථා ච අනුප්පන්නස්ස ථීනමිද්ධස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස ථීනමිද්ධස්ස පහානං හොති, තඤ්ච පජානාති. යථා ච පහීනස්ස ථීනමිද්ධස්ස ආයතිං අනුප්පාදො හොති, තඤ්ච පජානාති. (3)

සන්තං වා අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චං 'අත්ථි මෙ අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්ච'න්ති පජානාති. අසන්තං වා අජ්ඣත්තං උද්ධච්ච-කුක්කුච්චං 'නත්ථි මෙ අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්ච'න්ති පජානාති. යථා ච අනුප්පන්නස්ස උද්ධච්චකුක්කුච්චස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස උද්ධච්චකුක්කුච්චස්ස පහානං හොති, තඤ්ච පජානාති. යථා ච පහීනස්ස උද්ධච්චකුක්කුච්චස්ස ආයතිං අනුප්පාදො හොති, තඤ්ච පජානාති. (4)

සන්තං වා අජ්ඣත්තං විචිකිච්ඡං 'අත්ථි මෙ අජ්ඣත්තං විචිකිච්ඡා'ති පජානාති. අසන්තං වා අජ්ඣත්තං විචිකිච්ඡං 'නත්ථි මෙ අජ්ඣත්තං විචිකිච්ඡා'ති පජානාති. යථා ච අනුප්පන්නාය විචිකිච්ඡාය උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නාය විචිකිච්ඡාය පහානං හොති, තඤ්ච පජානාති. යථා ච පහීනාය විචිකිච්ඡාය ආයතිං අනුප්පාදො හොති, තඤ්ච පජානාති. (5)

ඉති අජ්ඣත්තං වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. බහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. අජ්ඣත්තබහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. සමුදයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. වයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. සමුදයවයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. අත්ථි ධම්මාති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සතිමත්තාය. අනිස්සිතො ච විහරති. න ච කිඤ්චි ලොකෙ උපාදියති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති පඤ්චසු නීවරණෙසු.

[නීවරණපබ්බං.]

2. පුන ච පරං භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති පඤ්චසුපාදානක්ඛන්ධෙසු. කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති පඤ්චසුපාදානක්ඛන්ධෙසු.?

ඉධ භික්ඛවෙ භික්ඛු "ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථගමො. ඉති වෙදනා, ඉති වෙදනාය සමුදයො, ඉති වෙදනාය අත්ථගමො. ඉති සඤ්ඤා, ඉති සඤ්ඤාය සමුදයො, ඉති සඤ්ඤාය අත්ථගමො. ඉති සඞ්ඛාරා, ඉති සඞ්ඛාරානං සමුදයො, ඉති සඞ්ඛාරානං අත්ථගමො. ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථගමො"ති [1-5].

ඉති අජ්ඣත්තං වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. බහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති-

තමා තුළ ඇත්තා වූ හෝ ථිනමිද්ධය 'මා තුළ ථිනමිද්ධය ඇතැ'යි දැන ගනියි. තමා තුළ නැත්තා වූ හෝ ථිනමිද්ධය 'මා තුළ ථිනමිද්ධය නැතැ' යි දැන ගනියි. යම්සේ නූපන් ථිනමිද්ධයාගේ ඉපදීම වේ ද, එය ද දැන ගනියි. යම් සේ උපන් ථිනමිද්ධයාගේ ප්‍රහාණය වේ ද, එය ද දැන ගනියි. යම් සේ ප්‍රහීණ වූ ථිනමිද්ධයාගේ මතු නො ඉපදීම වේ ද, එය ද දැන ගනියි. (3)

තමා තුළ ඇත්තා වූ හෝ උද්ධච්චකුක්කුච්චය 'මා තුළ උද්ධච්ච-කුක්කුච්චය ඇතැ'යි දැන ගනියි. තමා තුළ නැත්තා වූ හෝ උද්ධච්ච-කුක්කුච්චය 'මා තුළ උද්ධච්චකුක්කුච්චය නැතැ'යි දැන ගනියි. යම් සේ නූපන් උද්ධච්චකුක්කුච්චයාගේ ඉපදීම වේ ද එය ද, දැන ගනියි. යම්සේ උපන් උද්ධච්චකුක්කුච්චයාගේ ප්‍රහාණය වේ ද, එය ද දැන ගනියි. යම්සේ ප්‍රහීණ වූ උද්ධච්චකුක්කුච්චයාගේ මතු නො ඉපදීම වේ ද, එය ද දැන ගනියි. (4)

තමා තුළ ඇත්තා වූ හෝ විචිකිච්ඡාව 'මා තුළ විචිකිච්ඡාව ඇතැ'යි දැන ගනියි. තමා තුළ නැත්තා වූ හෝ විචිකිච්ඡාව 'මා තුළ විචිකිච්ඡාව නැතැ'යි දැන ගනියි. යම්සේ නූපන් විචිකිච්ඡාවෙහි ඉපදීම වේ ද, එය ද දැන ගනියි. යම්සේ උපන් විචිකිච්ඡාවෙහි ප්‍රහාණය වේ ද, එය ද දැන ගනියි යම්සේ ප්‍රහීණ වූ විචිකිච්ඡාවෙහි මතු නො ඉපදීම වේ ද, එය ද දැන ගනියි. (5)

මෙසේ තමා තුළ වූ ධර්මයන්හි ධර්මය නුවණින් බලනසුලු ව වාසය කරයි. බාහිර වූ ධර්මයන්හි ධර්මය නුවණින් බලනසුලු ව වාසය කරයි. තමන් හා අනුන් පිළිබඳ වූ ධර්මයන්හි ධර්මය නුවණින් බලනසුලු ව වාසය කරයි. නීවරණ ධර්මයන්ගේ හටගැනීම නුවණින් බලනසුලු ව හෝ වාසය කරයි. නීවරණ ධර්මයන්හි විනාශය නුවණින් බලනසුලු ව හෝ වාසය කරයි. නීවරණ ධර්මයන්හි හටගැනීම හා නැසීම නුවණින් බලනසුලුව හෝ වාසය කරයි. ඔහුට (මතුමත්තෙහි) නුවණ වැඩීම පිණිස සිහිය වැඩීම පිණිස හුදෙක් නීවරණ ධර්ම පමණක් ඇත යන සිහිය එළඹ සිටියේ වෙයි. තෘෂ්ණා දෘෂ්ටි ඇසුරු නො කෙළෙ ද වාසය කරයි. නීවරණ (සඞ්ඛ්‍යාත) ලොකයෙහි කිසිවක් 'මම ය, මාගේ ය' යි නො ගනියි. මහණෙනි, මහණ තෙමේ මෙසේ පඤ්චනීවරණ ධර්මයන්හි ධර්මය නුවණින් බලනසුලු වූයේ වාසය කරයි.

[නීවරණපබ්බ යි.]

2. නව ද මහණෙනි, මහණ තෙමේ පඤ්චඋපාදානස්කන්ධ ධර්මයන්හි ධම්මානුපස්සී වූයේ වාසය කරයි. මහණෙනි, මහණ තෙමේ කෙසේ නම් පඤ්ච උපාදානස්කන්ධයන්හි ධම්මානුපස්සී වූයේ වාසය කෙරේ ද ?

මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ "රූපය මෙසේ ය, රූපයෙහි හට ගැන්ම මෙසේ ය, රූපයෙහි විනාශය මෙසේ ය. වේදනාව මෙසේ ය, වේදනාවෙහි හටගැනීම මෙසේ ය, වේදනාවෙහි විනාශය මෙසේය. සංඥාව මෙසේ ය. සංඥාවෙහි හටගැන්ම මෙසේ ය. සංඥාවේ විනාශය මෙසේ ය. සංස්කාරයෝ මෙසේ ය, සංස්කාරයන්ගේ හටගැන්ම මෙසේ ය, සංස්කාරයන්ගේ විනාශය මෙසේ ය. විඥානය මෙසේය, විඥානයෙහි හටගැනීම මෙසේය විඥානයෙහි විනාශය මෙසේය" යි [1-5].

මෙසේ තමා පිළිබඳ වූ හෝ ධර්මයන් කෙරෙහි ධම්මානුපස්සී වූයේ වාසය කරයි. අනුන් පළිබඳ වූ හෝ ධර්මයන්හි ධම්මානුපස්සී වූයේ වාසය කරයි-

අජ්ඣත්තබහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. සමුදයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. වයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. සමුදයවයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. අත්ථි ධම්මාති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සතිමත්තාය. අනිස්සිතො ච විහරති. න ච කිඤ්චි ලොකෙ උපාදියති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති පඤ්චසුපාදානක්ඛන්ධෙසු.

[ඛන්ධපබ්බං.]

3. පුන ච පරං භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති ඡසු අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු. කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති ඡසු අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු?

ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුඤ්ච පජානාති. රූපෙ ච පජානාති. යඤ්ච තදුභයං පටිච්ච උප්පජ්ජති සංයොජනං, තඤ්ච පජානාති. යථා ච අනුප්පන්නස්ස සංයොජනස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස සංයොජනස්ස පහානං හොති, තඤ්ච පජානාති. යථා ච පහීනස්ස සංයොජනස්ස ආයතිං අනුප්පාදො හොති, තඤ්ච පජානාති. සොතඤ්ච පජානාති. සද්දෙ ච පජානාති -පෙ- ඝාණඤ්ච පජානාති. ගන්ධෙ ච පජානාති -පෙ- ජිව්හඤ්ච පජානාති රසෙ ච පජානාති -පෙ- කායඤ්ච පජානාති. ඵොට්ඨබ්බෙ ච පජානාති -පෙ- මනඤ්ච පජානාති. ධම්මෙ ච පජානාති. යඤ්ච තදුභයං පටිච්ච උප්පජ්ජති සංයොජනං, තඤ්ච පජානාති. යථා ච අනුප්පන්නස්ස සංයොජනස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස සංයොජනස්ස පහානං හොති, තඤ්ච, පජානාති. යථා ච පහීනස්ස සංයොජනස්ස ආයතිං අනුප්පාදො හොති තඤ්ච පජානාති (1-6).

ඉති අජ්ඣත්තං වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. බහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති අජ්ඣත්තබහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. සමුදයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. වයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. සමුදයවයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. අත්ථි ධම්මාති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සතිමත්තාය. අනිස්සිතො ච විහරති. න ච කිඤ්චි ලොකෙ උපාදියති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති ඡසු අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු.

[ආයතනපබ්බං.]

4. පුන ච පරං භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති සත්තසු බොජ්ඣඞ්ගෙසු. කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති සත්තසු බොජ්ඣඞ්ගෙසු?

ඉධ භික්ඛවෙ භික්ඛු සන්තං වා අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගං අත්ථි මෙ අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. අසන්තං වා අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගං 'නත්ථි මෙ අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගො'ති පජානාති—

තමන් හා අනුන් ද පිළිබඳ වූ හෝ ධම්මයන්හි ධර්මානුපස්සී වූයේ වාසය කරයි. ධර්මයන්හි හටගැන්ම නුවණින් බලනසුළු වූයේ හෝ වාසය කරයි. ධර්මයන්හි විනාශය නුවණින් බලනසුළු වූයේ හෝ වාසය කරයි. ධර්මයන්හි හටගැනීම හා විනාශය නුවණින් බලනසුළු වූයේ වාසය කරයි. ඒ මහණහට (මතුමත්තෙහි) ඤාණය වැඩීම පිණිස සිහිය වැඩීම පිණිස හුදෙක් පඤ්චඋපාදානස්කන්ධධර්ම පමණක් ඇත යන සිහිය එළඹ සිටියේ වෙයි. තෘෂ්ණා දෘෂ්ටි ඇසුරු නො කෙළේ වාසය කරයි. උපාදානස්කන්ධසංඛ්‍යාත ලොකයෙහි කිසිවක් 'මම ය, මාගේ ය' යි නො ගනියි. මහණෙනි, මෙසේ මහණ තෙමේ පඤ්චඋපාදානස්කන්ධ ධර්මයන්හි ධම්මානුපස්සී වූයේ වාසය කරයි.

[ඛන්ධ පබ්බ යි.]

3. තවද මහණෙනි, මහණ තෙමේ ආධ්‍යාත්මික බාහිර ෂඩායතන ධර්මයන්හි ධම්මානුපස්සී වූයේ වාසය කරයි. මහණෙනි, මහණ තෙමේ කෙසේ නම් ආධ්‍යාත්මික බාහිර ෂඩායතන ධර්මයන්හි ධම්මානුපස්සී වූයේ වාසය කෙරේ ද ?

මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ ඇස ද දනී. රූපය ද දනී. එ දෙක නිසා යම් සංයෝජනයක් උපදී ද, එයත් දනී. යම්සේ නූපන් සංයොජනයාගේ ඉපදීම වේ ද එයත් දනී. යම්සේ උපන් සංයෝජනයාගේ ප්‍රහාණය වේ ද, එයත් දනී. යම්සේ ප්‍රහීණ වූ සංයොජනයා්ගේ මතු නො ඉපදීම වේ ද එයත් දනී, කන ද දනී. ශබ්දය ද දනී. ... නාසය ද දනී. ගඳ ද දනී. ... දිව ද දනී. රස ද දනී. ... ශරීරය ද දනී. සප්‍රෂ්ටව්‍යයත් දනී. ... හිත ද දනී. ධර්මයත් ද දනී. දෙක නිසා යම් සංයොජනයක් උපදී නම්, එයත් දනී. යම්සේ නූපන් සංයෝජනයාගේ නූපදීම වේ ද, එයත් දනී. යම්සේ උපන් සංයොජනයාගේ ප්‍රහාණය වේ ද, එයත් දනී. යම්සේ ප්‍රහීණ සංයොජනයාගේ මතු නො ඉපදීම වේ ද එයත් දනී(1-6).

මෙසේ ආංධ්‍යාත්මික වූ හෝ ධර්මයන්හි ධම්මානුපස්සී වූයේ වාසය කරයි. බාහිර වූ හෝ ධර්මයන්හි ධම්මානුපස්සී වූයේ වාසය කරයි. ආධ්‍යාත්මික බාහිර වූ හෝ ධර්මයන්හි ධම්මානුපස්සි වූයේ වාසය කරයි. ධර්මයන්හි හටගැන්ම නුවණින් බලනසුළු වූයේ හෝ වාසය කරයි. ධර්මයන්හි හටගැනීම හා විනාශයත් නුවණින් බලනසුළු වූයේ හෝ වාසය කරයි. ඔහුට සිහිය වැඩීම පිණිස ඤාණය වැඩීම පිණිස හුදෙක් ආයතන ධර්ම පමණක් ඇත යන සිහිය එළඹ සිටියේ වෙයි. තෘෂ්ණා දෘෂ්ටි නිඃශ්‍රය රහිත ව වාසය කරයි. (ආයතන) සඞ්ඛ්‍යාත ලොකයෙහි කිසිවක් 'මම ය මාගේ ය' යි නො ගනියි. මහණෙනි, මෙසේත් මහණ තෙමේ ආධ්‍යාත්මික බාහිර ආයතන ධර්මයන්හි ධම්මානුපස්සී වූයේ වාසය කරයි.

[ආයතන පබ්බ යි.]

4. තව ද මහණෙනි, මහණ තෙමේ සප්ත බොධ්‍යඞ්ග ධර්මයන්හි ධම්මානුපස්සී වූයේ වාසය කරයි. මහණෙනි, කෙසේ නම් මහණ තෙමේ සප්ත බොංධ්‍යඞ්ග ධර්මයන්හි ධම්මානුපස්සී වූයේ වාසය කෙරේ ද ?

තමා තුළ ඇත්තා වූ හෝ සතිසම්බොජ්ඣඞ්ගය 'මා තුළ සතිසම්බො-ජ්ඣඞ්ගය ඇතැ' යි දැන ගනියි. තමා තුළ නැත්තා වූ හෝ සතිසම්බොජ්ඣඞ්ගය 'මා තුළ සතිසම්බොජ්ඣඞ්ගය නැතැ'යි දැන ගනියි—

යථා ච අනුප්පන්නස්ස සතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස සතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරී හොති, තඤ්ච පජානාති. (1)

සන්තං වා අජ්ඣත්තං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං 'අත්ථි මෙ අජ්ඣත්තං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. අසන්තං වා අජ්ඣත්තං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං 'නත්ථි මෙ අජ්ඣත්තං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. යථා ච අනුප්පන්නස්ස ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරී හොති, තඤ්ච පජානාති. (2)

සන්තං වා අජ්ඣත්තං විරියසම්බොජ්ඣඞ්ගං අත්ථි මෙ 'අජ්ඣත්තං විරියසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. අසන්තං වා අජ්ඣත්තං විරියසම්බොජ්ඣඞ්ගං 'නත්ථි මෙ අජ්ඣත්තං විරියසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. යථා ච අනුප්පන්නස්ස විරියසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස විරියසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරී හොති තඤ්ච පජානාති. (3)

සන්තං වා අජ්ඣත්තං පීතිසම්බොජ්ඣඞ්ගං 'අත්ථි මෙ අජ්ඣත්තං පීතිසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. අසන්තං වා අජ්ඣත්තං පීතිසම්බොජ්ඣඞ්ගං 'නත්ථි මෙ අජ්ඣත්තං පීතිසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. යථා ච අනුප්පන්නස්ස පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස පීතිසම්බොජ්ඣඞ්ගස්ස භාවානාපාරිපාරිහොති, තඤ්ච පජානාති. (4)

සන්තං වා අජ්ඣත්තං පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං 'අත්ථි මෙ අජ්ඣත්තං පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. අසන්තං වා අජ්ඣත්තං පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං 'නත්ථි මෙ අජ්ඣත්තං පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. යථා ච අනුප්පන්නස්ස පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරී හොති, තඤ්ච පජානාති. (5.)

සන්තං වා අජ්ඣත්තං සමාධිසම්බොජ්ඣඞ්ගං 'අත්ථි මෙ අජ්ඣත්තං සමාධිසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. අසන්තං වා අජ්ඣත්තං සමාධිසම්බොජ්ඣඞ්ගං 'නත්ථි මෙ අජ්ඣත්තං සමාධිසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. යථා ච අනුප්පන්නස්ස සමාධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස සමාධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරී හොති, තඤ්ච පජානාති. (6.)

සන්තං වා අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං 'අත්ථි මෙ අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. අසන්තං වා අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං 'නත්ථි මෙ අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. යථා ච අනුප්පන්නස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරී හොති, තඤ්ච පජානාති. (7)

ඉති අජ්ඣත්තං වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. බහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. අජ්ඣත්තබහිද්ධා වා ධම්මෙසු ධම්මානු පස්සී විහරති. සමුදයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. වයධම්මානු පස්සී වා ධම්මෙසු විහරති. සමුදයවයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. අත්ථි ධම්මාති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සතිමත්තාය. අනිස්සිතො ච විහරති. න ච කිඤ්චි ලොකෙ උපාදියති. එවම්පි ඛො භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති සත්තසු බොජ්ඣඞ්ගෙසු.

[බොජ්ඣඞ්ගපබ්බං.]

යම්සේ නූපන්නාවූ හෝ සතිසම්බොජ්ඣඞ්ගයාගේ ඉපදීම වේ ද, එය ද දැන ගනියි. යම්සේ උපන්නා වූ ද සතිසම්බොජ්ඣඞ්ගයාගේ වැඩීමෙත් සම්පූර්ණත්වය වේ ද, එය ද දැන ගනියි. (1)

තමා තුළ ඇත්තා වූ හෝ ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය 'මා තුළ ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය ඇතැ'යි දැන ගනියි. තමා තුළ නැත්තා වූ හෝ ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය 'මා තුළ ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය නැතැ'යි දැන ගනියි. යම්සේ නූපන්නා වූ ද ධම්මවිචය සම්බොජ්ඣඞ්ගයාගේ ඉපදීම වේ ද, එය ද දැන ගනී. යම්සේ උපන්නා වූ ධම්මවිචය සම්බොජ්ඣඞ්ගයාගේ වැඩීමෙත් පරිපූර්ණත්වය වේ ද, එය ද දැන ගනියි (2)

තමා තුළ ඇත්තා වූ හෝ විරිය සම්බොජ්ඣඞ්ගය 'මා තුළ විරිය සම්බොජ්ඣඞ්ගය ඇතැ'යි දැන ගනියි. තමා තුළ නැත්තා වූ හෝ විරිය සම්බොජ්ඣඞ්ගය 'මා තුළ විරිය සම්බොජ්ඣඞ්ගය නැතැ'යි දැන ගනියි. යම්සේ නූපන්නා වූ ද විරිය සම්බොජ්ඣඞ්ගයාගේ වැඩීමෙත් පරිපූර්ණත්වය වේ ද, එය ද දැන ගනියි. (3)

තමා තුළ ඇත්තා වූ හෝ පීති සම්බොජ්ඣඞ්ගය 'මා තුළ පීති සම්බොජ්ඣඞ්ගය ඇතැ'යි දැන ගනියි. තමා තුළ නැත්තා වූ හෝ පීති සම්බොජ්ඣඞ්ගය 'මා තුළ පීතිසම්බොජ්ඣඞ්ගය නැතැ 'යි දැන ගනියි. යම්සේ නූපන්නා වූ ද පීතිසම්බොජ්ඣඞ්ගයාගේ ඉපදීම වේ ද, එය ද දැන ගනියි. යම්සේ උපන්නාවූ ද පීති සම්බොජ්ඣඞ්ගයාගේ වැඩීමෙත් පරිපූර්ණත්වය වේ ද, එය ද දැන ගනියි. (4)

තමා තුළ ඇත්තා වූ හෝ පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය 'මා තුළ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය ඇතැ'යි දැන ගනියි තමා තුළ නැත්තා වූ හෝ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය 'මා තුළ පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය නැතැ'යි දැන ගනියි. යම්සේ නූපන්නා වූ ද පස්සද්ධිසම්බොජ්ඣඞ්ගයාගේ ඉපදීම වේ ද, එය ද දැන ගනියි. යම්සේ උපන්නා වූ ද පස්සද්ධිසම්බොජ්ඣඞ්ගයාගේ වැඩීමෙත් ප රිපූර්ණත්වය වේ ද, එය ද දැන ගනියි. (5)

තමා තුළ ඇත්තා වූ හෝ සමාධි සම්බොජ්ඣඞ්ගය 'මා තුළ සමාධි-සම්බොජ්ඣඞ්ගය ඇතැ'යි දැන ගනියි. තමා තුළ නැත්තා වූ හෝ සමාධි සම්බොජ්ඣඞ්ගය 'මා තුළ සමාධි සම්බොජ්ඣඞ්ගය නැතැ' යි දැන ගනියි. යම්සේ නූපන්නාවූ ද සමාධිසම්බොජ්ඣඞ්ගයාගේ ඉපදීම වේ ද, එය ද දැන ගනී. යම්සේ උපන්නාවූ ද සමාධි සම්බොජ්ඣඞ්ගයාගේ වැඩීමෙත් පරිපූර්ණත්වය වේ ද, එය ද දැනගනී. (6)

තමා තුළ ඇත්තාවූ හෝ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය 'මා තුළ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය ඇතැ'යි දැන ගනී. තමා තුළ නැත්තා වූ හෝ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය 'මා තුළ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය නැතැ'යි දැන ගනී. යම් සේ නූපන්නා වූ ද උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයාගේ ඉපදීම වේ ද, එය ද දැන ගනී. යම්සේ උපන්නාවූ දඋපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයාගේ වැඩීමෙත් පරිපූර්ණත්වය වේ ද, එය ද දැන ගනී (7)

මෙසේ තමා තුළ වූ හෝ ධර්මයන්හි ධම්මානුපස්සී වූයේ වාසය කරයි. බාහිර වූ හෝ ධර්මයන්හි ධම්මානුපස්සී වූයේ වාසය කරයි. තමා තුළ හා බාහි රවූද ධර්මයන්හි හෝ ධම්මානුපස්සී වූයේ වාසය කරයි. ධර්මයන්හි හටගැන්ම නුවණින් බලනසුලු වූයේ හෝ වාසය කරයි. ධර්මයන්හි විනාශය නුවණින් බලනසුලු වූයේ හෝ වාසය කරයි. ධර්මයන්හි හටගැන්ම හා විනාශය නුවණින් බලනසුලු වූයේ හෝ වාසය කරයි. ඒ මහණහට (මතු මත්තෙහි) ඥානය වැඩීම පිණිස සිහිය වැඩීම පිණිස හුදෙක් බොධ්‍යඞ්ගධර්ම පමණක් ඇතැයි යන සිහිය එළඹ සිටියේ වේ. තණ්හා දිට්ඨි නිඃශ්‍රය රහිතවූයේ වාසය කරයි. (බොධ්‍යඞ්ගධර්ම සඞ්ඛ්‍යාත) ලොකයෙහි කිසිවක් 'මම ය මාගේ ය' යි නොගනී. මහණෙනි, මහණ තෙමේ මෙසේත් සප්තබොධ්‍යඞ්ග-ධර්මයන්හි ධර්මානුපස්සී වූයේ වාසය කරයි.

[බොජ්ඣඞ්ග පබ්බ යි.]

5. පුන ච පරං භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති චතූසු අරියසච්චෙසු. කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති චතූසු අරියසච්චෙසු?

ඉධ භික්ඛවෙ භික්ඛු ‘ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති’ අයං දුක්ඛසමුදයො’ති යථාභූතං පජානාති. ‘අයං දුක්ඛනිරොධො’ති යථාභූතං පජානාති. ‘අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා’ති යථාභූතං පජානාති.

ඉති අජ්ඣත්තං වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. බහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. අජ්ඣත්තබහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. සමුදයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති, වයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. සමුදයවයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. අත්ථි ධම්මාති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සතිමත්තාය. අනිස්සිතො ච විහරති. න ච කිඤ්චි ලොකෙ උපාදියති. එවම්පි ඛො භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති චතූසු අරියසච්චෙසු.

[සච්චපබ්බං.]

1. යො හි කොචි භික්ඛවෙ ඉමෙ චත්තාරො සතිපට්ඨානෙ එවං භාවෙය්‍ය සත්ත වස්සානි, තස්ස ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං: දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා. තිට්ඨන්තු භික්ඛවෙ සත්ත වස්සානි, යො හි කොචි භික්ඛවෙ ඉමෙ චත්තාරො සතිපට්ඨානෙ එවං භාවෙය්‍ය ඡබ්බස්සානි[1] -පෙ- පඤ්චවස්සානි -පෙ- චත්තාරි වස්සානි -පෙ- තීණි වස්සානි -පෙ- ද්වෙ වස්සානි -පෙ- එකං වස්සං -පෙ- තිට්ඨතු භික්ඛවෙ එකං වස්සං, යො හි කොචි භික්ඛවෙ ඉමෙ චත්තාරො සතිපට්ඨානෙ එවං භාවෙය්‍ය සත්ත මාසානි, තස්ස ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං: දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා. තිට්ඨන්තු භික්ඛවෙ සත්ත මාසානි, යො හි කොචි භික්ඛවෙ ඉමෙ චත්තාරො සති සතිපට්ඨානෙ එවං භාවෙය්‍ය’ ඡ මාසානි -පෙ- පඤ්ච මාසානි -පෙ- චත්තාරි මාසානි -පෙ- තීණි මාසානි -පෙ- ද්වෙ මාසානි -පෙ- මාසං[2] -පෙ- අඩ්ඪමාසං -පෙ- තිට්ඨතු භික්ඛවෙ අඩ්ඪමාසො, යො හි කොචි භික්ඛවෙ ඉමෙ චත්තාරො සතිපට්ඨානෙ එවං භාවෙය්‍ය සත්තාහං, තස්ස ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං: දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා.

“එකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා සොකපරිදෙවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානා”ති, ඉති යන්තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තන්ති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

සතිපට්ඨානසුත්තං[3] දසමං.

මූලපරියායවග්ගො පඨමො.

1. ඡවස්සානි, PTS. මජසං. 2 එකං මාසං, මජසං.
3. මහාසතිපට්ඨානසුත්තං, මජසං.

Free Distribution www.aathaapi.org

5. තවද මහණෙනි, මහණ තෙමේ චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයන්හි ධම්මානුපස්සී වූයේ වාසය කරයි. මහණෙනි, කෙසේ නම් මහණ තෙමේ චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයන්හි ධම්මානුපස්සී වූයේ වාසය කෙරේ ද?

මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ 'මේ දුක්ඛ ය'යි තතුසේ දැන ගනියි. 'මේ දුක්ඛසමුදය'යි තතුසේ දැන ගනියි. 'මේ දුක්ඛනිරොධ ය' යි තතුසේ දැන ගනියි. 'මේ දුක්ඛනිරොධගාමිනී පටිපදා ය'යි තතුසේ දැන ගනියි.

මෙසේ තමා තුළ වූ හෝ ධර්මයන්හි ධර්මයන් නුවණින් බලනසුලු වූයේ වාසය කරයි. බාහිර වූ හෝ ධර්මයන්හි ධර්මයන් නුවණින් බලනසුලු වූයේ වාසය කරයි. තමන් හා මෙරමා ද පිළිබඳ වූ ධර්මයන්හි ධර්මයන් නුවණින් බලනසුලු වූයේ වාසය කරයි. ධර්මයන්හි හටගැන්ම නුවණින් බලනසුලු වූයේ හෝ වාසය කරයි. ධර්මයන්හි විනාශය නුවණින් බලන-සුලු වූයේ හෝ වාසය කරයි. ධර්මයන්හි හටගැන්ම හා විනාශය නුවණින් බලන සුලු වූයේ හෝ වාසය කරයි. ඒ මහණහට (මතුමත්තෙහි) ඥානය වැඩීම පිණිස සිහිය වැඩීම පිණිස හුදෙක් ආර්‍ය්‍යසත්‍ය ධර්ම පමණක් ඇත යන සිහිය එළඹ සිටියේ වේ. තෘෂ්ණා දෘෂ්ටි නිඃශ්‍රය රහිත වූයේ වාසය කරයි. ආර්‍ය්‍යසත්‍යසඞ්ඛ්‍යාත ලොකයෙහි කිසිවක් 'මම ය මාගේ ය' යි නො ගනියි. මහණෙනි, මහණ තෙමේ මෙසේත් චතුරාර්‍ය්‍ය-සත්‍ය ධර්මයන්හි ධම්මානුපස්සී වූයේ වාසය කරයි.

[සච්ච පබ්බ යි.]

1. මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් මෙසේ (විධි ලෙස) සත් අවුරුද්දක් වඩන්නේ නම් ඔහු දෙපලයන් අතුරෙහි එක්තරා පලයක් - දිට්ඨ ධර්මයෙහි ම රහත්පලය හෝ උපාදානයන් ඉතිරි ව ඇති කල්හි අනාගාමි භාවය හෝ කැමැති විය (එකැතින් ලැබිය) යුතු. මහණෙනි, සත් අවුරුද්දක් තිබියේවා මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් මෙසේ අවුරුදු සයක් ... අවුරුදු පහක් ... අවුරුදු සතරක් ... අවුරුදු තුනක් ... අවුරුදු දෙකක් ... අවුරුදු එකක් ... මහණෙනි, එක අවුරුද්ද තිබියේවා. මහණෙනි, යම් කිසිවෙක් මේ සතර සතිපට්ඨානයන් මෙසේ හත්මසක් වඩන්නේ නම් ඔහු විසින් දෙපලයන් අතුරෙන් එක්තරා පලයක් - ඉහාත්මයෙහි ම රහත්පලය හෝ උපාදාන ඉතිරි ව ඇති කල්හි අනාගාමි භාවය හෝ කැමැති විය යුතු. මහණෙනි, සත්මස තිබියේවා. සමසක් ... පස්මසක් ... සාරමසක් ... තුන්මසක් ... දෙමසක් ... මාසයක් ... අඩමසක් ... මෙසේ මේ සතර සතිපට්ඨානයන් වඩන්නේ නම් ... මහණෙනි, අඩමසක් තිබියේවා. මහණෙනි, යම් කිසිවෙක් මේ සතිපට්ඨානයන් මෙසේ සත්දවසක් වඩන්නේ නම් ඔහු විසින් දෙපලයන් අතුරෙන් එක්තරා පලයක් - ඉහාත්මයෙහි ම රහත්පලය හෝ උපාදාන ඉතිරි ව ඇතිකල්හි අනාගාමිභාවය හෝ කැමති විය යුතු.

"මහණෙනි, සත්ත්වයන්ගේ පිරිසුදු වීම පිණිස, ශොක-පරිදෙවයන් නැතී කිරීම පිණිස, දුක්-දොම්නස් ඉක්මවීම පිණිස, ආර්‍ය්‍යාෂ්ටාඞ්ගික මාර්ගයාගේ අවබොධය පිණිස, නිවන් පසක් කරනු පිණිස, මේ එකායන මාර්ගය - එනම් මේ සතර සතිපට්ඨාන" යි. මා විසින් යමක් කියන ලද නම් එය මේ නිසා කියන ලද්දේ ය.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

සතිපට්ඨාන සූත්‍රය දසවැනි යි.

මූලපරියායවර්ගය පළමුවැනි යි.

[තස්සවග්ගස්ස[1] උද්දානං:]

1. අජරං අමරං අමතාධිගමං ඵලමග්ගනිදස්සන දුක්ඛනුදං,
සගිතත්ථමහාරහහස්සකරබ්භුතපීතිකරං එවතො සුණථ

2. තළකාව සුපූරිතඝම්මපදෙ තිවිධග්ගිපලෙපිතනිබ්බපනා,
භවබ්‍යාධිපනොදනඔසධියො ධුව මජ්ඣිමසුත්තවරට්ඨපිතා.

3. මධුව මන්දරසා අමරාතං බිබ්බරතීජනනං සමරෑතං,
තා සුතවෙය්‍යකරට්ඨපිතාසුං සක්‍යසුතාතමගීරමණත්ථා

4 පඤ්ඤසතත්‍යාදි සතඤ්ච දියඩ්ඪං වෙය්‍යකරාත දුවෙ අපරෙ ච,
තෙසමහං අනුපුබ්බ බ්‍රවීමි එකමනා නිසමෙථ මුදග්ගා.

5. පහවාසවඤායදපුබ්බගමො අගතීගතිඅබ්භණ්ණසබ්භයකො,
පියගාරවපණ්ඩරසලලිබණතො තථදිට්ඨි සතී දසමො පඨමො.*

1. 2. 1.

චූළසීහනාදසුත්තං

1. **එවං මෙ සුතං:** එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. ඉධෙව භික්ඛවෙ සමණො, ඉධ දුතියො සමණො, ඉධ තතියො සමණො, ඉධ චතුත්ථො සමණො, සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙති[2]. එවමෙව[3] භික්ඛවෙ සම්මා සීහනාදං නදථ. ඨානං ඛො පනෙතං භික්ඛවෙ විජ්ජති යං ඉධ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: කො පනායස්මන්තානං අස්සාසො? කිං බලං? යෙන තුම්හෙ ආයස්මන්තො[4] එවං වදෙථ: ඉධෙව සමණො, ඉධ දුතියො සමණො, ඉධ තතියො සමණො, ඉධ චතුත්ථො සමණො සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ'ති.

---

1. තස්සුද්දානං සෑ, මජසං.

* ගාථායො පනෙතා සබ්බත්ථ ව්‍යාකුලා දිස්සන්ති.

2. "අඤ්ඤෙහීති" සෑ, මජසං. 3. 'එවමෙවං' සීමු.

4. 'ආයස්මන්තො අත්තනි සම්පස්සමානා' සෑ.

1. අජරාමර වූ නිවන්සුව එළවන මඟපල දහම් දක්වන පස්කඳ-දුක් දුරලන මහාඝී, භාෂ්‍යකර, (ධම් විස්තර එළවන) අද්භූත වූ ප්‍රීති දනවන නෙවළා අරුත් පසස්නා (මාගේ බස්) අසව.

2. ගිම්මඟැ සිහිල්දිය පිරුණු සරොවරයක් බඳු අවලෙප දුන් (රාගාදි) කුත්ගිනි නිවන සසරවසන් දුරලන මහඹසු වූ බුදුන් වදහල මධ්‍යම්-ප්‍රමාණ වූ යම් සූත්‍ර කෙනෙක් එකැතිත් සඟහා තබනලද්දහු ද-

3. දෙවියනට අමා මීසේ නො මඳ රස වූ සදෙව්ලෝවැසියනට කෙළිලොල් දනවන ඒ සූත්‍රවෙය්‍යාකරණ ධම්යෝ ශාක්‍යපුත්‍රයනට අභිරමණය සඳහා (සඞ්ග්‍රාහකයන් විසින්) සඟහා තබනලද්දහ.

4. ඒ වෙය්‍යාකරණ (සූත්‍රධම්)යෝ මූල පනසෙක, යළි සියයෙකැ සි යෙළසියෙක් හා තදන්‍යසූත්‍රයෝ දෙදෙනෙක් හා ඇත. මම උන්ගේ අනුපූර්‍වී උද්දානය කියමි. ඔද වැඩි වැ එක්සිත් වැ අසව.

5. සත්කායපයීාපන්න සර්‍ව ධම්යන්ගේ ප්‍රභවක්‍රම සඞ්ඛ්‍යාත මූලපයීාය සූත්‍රය, සර්‍වාස්‍රවසංවරපයීාය සඞ්ඛ්‍යාත සබ්බාසවසූත්‍රය, දායාදපූර්‍වඞ්ගම කොට ඇති ධම්මදායාදසූත්‍රය, භයභෙරවසූත්‍රය සහිත වූ අගතිගමන සඞ්ඛ්‍යාත අඞ්ගණප්‍රතිපක්‍ෂ අනඞ්ගණසූත්‍රය, ප්‍රියගෞරවාදිආකාඞ්ක්‍ෂා ප්‍රකාශ වූ ආකඞ්ඛෙය්‍යසූත්‍රය, පරිශුද්ධ වස්ත්‍රොපම කොට වදාළ වත්ථසූත්‍රය, ක්ලෙශසංලිඛන ප්‍රකාශක වූ සල්ලෙඛසූත්‍රය, තථ්‍යදෘෂ්ටි සඞ්ඛ්‍යාත සම්මාදිට්ඨිසූත්‍රය හා සති-පට්ඨානසූත්‍රය දසවනු කොට ඇතියේ ප්‍රථමවග්ග යි.*

1. 2. 1.
චූළසීහනාද සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජෙතවන නම් අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි භික්‍ෂූන් ඇමතූ සේක. ඒ භික්‍ෂූහු "වහන්සැ" යි භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හු. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

2. මහණෙනි, පළමු මහණ (සෝවන්) මේ සස්නෙහි ම ය. දෙවැනි මහණ (සෙදගැමි) මේ සස්නෙහි ම ය. තුන්වැනි මහණ (අනගැමි) මේ සස්නෙහි ම ය. සියුවැනි මහණ (රහත්) මේ සස්නෙහි ම ය. අන්‍යත් ආෂමිවාද සඞ්ඛ්‍යාත පරප්‍රවාදයෝ (සමයාන්තරයෝ) ශ්‍රමණයන් කෙරෙන් ශූන්‍යයහ. මහණෙනි, මෙසේ ම මනා කොට සිංහනාද කරවු. මහණෙනි, මෙ අන්තොටු පිරිවැජියෝ "ආයුෂ්මත්නි, යම් හෙයෙකින් තෙපි යමක් කරණ කොට 'මහණ මේ සස්නෙහි ම ය. දෙවැනි මහණ මේ සස්නෙහි ම ය. තුන්වැනි මහණ මේ සස්නෙහි ම ය. සිවුවැනි මහණ මේ සස්නෙහි ම ය. අන්‍යවූ පරප්‍රවාදයෝ මහණුන් කෙරෙන් ශූන්‍යයහ' යි මෙසේ කියන්නාහු නම් එහිලා ආයුෂ්මතුන්ට ඇති ආශ්වාසය කිමෙක? බලය කිමෙකැ? යි මෙසේ කියන්නාහු ය" යන මෙල කාරුණෙක් ඇති වෙයි.

---

* ත්‍රිපිටක පරිවර්‍තන සංස්කාරක මණ්ඩලයේ පණ්ඩිත ලබුගම ලඞ්කානන්‍ද, පණ්ඩිත කෝදාගොඩ ඤාණාලෝක සථවිර දෙනම විසින් වෘත්තලව තුබූ උද්දානගාථා මෙසේ ව්‍යාඛ්‍යාන කරණ ලදී.

3. එවංවාදිනො භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා: අත්ථි ඛො නො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන චත්තාරො ධම්මා අක්ඛාතා යෙ මයං අත්තනි සම්පස්සමානා එවං වදෙම: 'ඉධෙව සමණො, ඉධ දුතියො සමණො, ඉධ තතියො සමණො, ඉධ චතුත්ථො සමණො, සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ'ති. කතමෙ චත්තාරො? අත්ථි ඛො නො ආවුසො සත්ථරි පසාදො. අත්ථි ධම්මෙ පසාදො. අත්ථි සීලෙසු පරිපූරකාරිතා සහධම්මිකා ඛො පන පියා[1] මනාපා ගහට්ඨා චෙව පබ්බජිතා ච. ඉමෙ ඛො නො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන චත්තාරො ධම්මා අක්ඛාතා යෙ මයං අත්තනි සම්පස්සමානා එවං වදෙම: 'ඉධෙව සමණො, ඉධ දුතියො සමණො, ඉධ තතියො සමණො, ඉධ චතුත්ථො සමණො, සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ'ති.

4. ඨානං ඛො පනෙතං භික්ඛවෙ විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: අම්හාකම්පි ඛො ආවුසො අත්ථි සත්ථරි පසාදො යො අම්හාකං සත්ථා. අම්හාකම්පි අත්ථි ධම්මෙ පසාදො යො අම්හාකං ධම්මො. මයම්පි සීලෙසු පරිපූරකාරිනො යානි අම්හාකං සීලානි. අම්හාකම්පි සහධම්මිකා පියා මනාපා ගහට්ඨා චෙව පබ්බජිතා ච. ඉධ නො ආවුසො කො විසෙසො කො අධිප්පායො[2] කිං නානාකරණං යදිදං තුම්හාකඤ්චෙව අම්හාකඤ්චාති.

5. එවං වාදිනො භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා: කිම්පනාවුසො එකා නිට්ඨා? උදාහු පුථු නිට්ඨා'ති? සම්මා ව්‍යාකරමානා භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං ව්‍යාකරෙය්‍යුං: එකා හාවුසො නිට්ඨා, න පුථු නිට්ඨා'ති.

6. සා පනාවුසො නිට්ඨා සරාගස්ස? උදාහු වීතරාගස්සාති? සම්මා ව්‍යාකරමානා භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං ව්‍යාකරෙය්‍යුං: වීතරාගස්සාවුසො සා නිට්ඨා, න සා නිට්ඨා සරාගස්සාති.

සා පනාවුසො නිට්ඨා සදොසස්ස? උදාහු වීතදොසස්සාති? සම්මා ව්‍යාකරමානා භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං ව්‍යාකරෙය්‍යුං: වීතදොසස්සාවුසො සා නිට්ඨා, න සා නිට්ඨා සදොසස්සාති.

1. කො පියා - PTS. 2. අධිප්පායසො - අට්ඨකථා.

3. මහණෙනි, මෙසේ කියන අන්‍යතොවූ පිරිවැජියෝ මෙසේ කියයුතු වෙති: ඇවැත්නි, අපි යම් ධර්මයෙකකුත් තමා කෙරෙහි මොන-වට දක්නමෝ 'මහණ මේ සස්නෙහි ම ය. දෙවැනි මහණ මේ සස්නෙහි ම ය. තෙවැනි මහණ මේ සස්නෙහි ම ය. සිවුවැනි මහණ මේ සස්නෙහි ම ය. අන්‍යවූ පරප්‍රවාදයෝ ශ්‍රමණයන් කෙරෙන් ශූන්‍යයහ 'යි මෙසේ කියමෝ ද, (එහිලා) සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ ධර්ම සතරෙක් ඇත. කවර සතරෙක යත්: ඇවැත්නි, අපගේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදීම ඇත ධර්මය කෙරෙහි පැහැදීම ඇත. ශීලයෙහි පරිපූර්ණකාරීත්වය ඇත. ගිහියෝ ද පැවිද්දෝ ද යන ආයර්‍යශ්‍රාවක සහධාර්මික පිරිස්හු ද උතුනට ප්‍රිය වෙති. මනාප (කල්) වෙති. ඇවැත්නි, අපි යම් ධර්මයෙකකුත් තමන් තුළ මොනවට දක්නමෝ 'මහණ මේ සස්-නෙහි ම ය. දෙවැනි මහණ මේ සස්නෙහි ම ය තෙවැනි මහණ මේ සස්නෙහි ම ය. සිවුවැනි මහණ මේ සස්නෙහි ම ය. අන්‍ය වූ පරප්‍රවා-දයෝ ශ්‍රමණයන් කෙරෙන් ශූන්‍යයහ' යි මෙසේ කියමෝ ද, (එහිලා) සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ අපගේ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ මේ ධර්මයෝ සතර දෙන වෙති.

4. මහණෙනි, යම් හෙයෙකින් අන්‍යතොවූ පිරිවැජියෝ ''ඇවැත්නි, යමෙක් අපගේ ශාස්තෘ වේ ද, ඒ ශාස්තෘන් වහන්සේ කෙරෙහි අපගේ ද පැහැදීම ඇත. යමක් අපගේ ධර්මය වේ ද, (ඒ) ධර්මය කෙරෙහි අප ද ගේ පැහැදීම ඇත. අපගේ යම් ශීලයෝ වෙත් ද, අපි ද ඒ සිල් පුරන සුල්ලමෝ වම්හ. අප ද ගේ සහධාර්මික වූ ගිහියෝ ද පැවිද් දෝ ද උතුනට ප්‍රිය වෙති. කල් වෙති. ඇවැත්නි, තෙල ප්‍රසා-දයෙහි ලා නොප හා අපගේත් විශෙෂය කවරේය? අධික ප්‍රයොගය කවරේය? වෙනස කවරේය? යි මෙසේ කියන්නාහු ය'' යන මේ කාරණය විද්‍යමාන වෙයි.

5 මහණෙනි, මෙසේ කියන අන්‍යතොවූ පිරිවැජ්ජෝ 'ඇවැත්නි, කිම (ඒ ප්‍රසාදයාගේ) නිෂ්ඨාව එකෙක් ද? නොහොත් බොහෝ නිෂ්ඨා ඇත්දැ?යි' මෙසේ කියයුතු වෙත්. මහණෙනි, අන්‍යතොවූ පිරිවැජියෝ මනා කොට (කරුණු සහිතව) ප්‍රකාශ කරන්නාහු 'ඇවැත්නි, නිෂ්ඨාව එකෙක් ම ය. නිෂ්ඨාවෝ බොහෝ නො වෙති' යි මෙසේ ප්‍රකාශ කරන්නාහු ය.

6 ඇවැත්නි, එ නිෂ්ඨාව රාගසහිතයාහට වේ ද? නොහොත් රාගරහි-තයාහට වේ ද? (මෙසේ කිය යුතු වෙති.) මහණෙනි, මනා කොට ප්‍රකාශ කරන අන්‍යතොවූ පිරිවැජියෝ 'ඇවැත්නි, එ නිෂ්ඨාව වීතරාගයාහට වෙයි. එ නිෂ්ඨාව සරාගයාහට නො වේ'යි මෙසේ ප්‍රකාශ කරන්නාහු ය.

ඇවැත්නි, එ නිෂ්ඨාව ද්වෙෂසහිතයාහට වේ ද? නොහොත් ද්වෙෂ-රහිතයාහට වේ ද? (මෙසේ කිය යුතු වෙති.) මහණෙනි, මනා කොට ප්‍රකාශ කරන අන්‍යතොවූ පිරිවැජියෝ 'ඇවැත්නි, එ නිෂ්ඨාව ද්වෙෂරහිතයාහට වෙයි. එ නිෂ්ඨාව ද්වෙෂසහිතයාහට නො වේ'' යි මෙසේ ප්‍රකාශ කරන්නාහු ය.

සා පනාවුසො නිට්ඨා සමොහස්ස? උදාහු වීතමොහස්සාති? සම්මා ව්‍යාකරමානා භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං ව්‍යාකරෙය්‍යුං: වීතමොහස්සාවුසො සා නිට්ඨා, න සා නිට්ඨා සමොහස්සාති.

සා පනාවුසො නිට්ඨා සතණ්හස්ස? උදාහු වීතතණ්හස්සාති? සම්මා ව්‍යාකරමානා භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං ව්‍යාකරෙය්‍යුං: වීතතණ්හස්සාවුසො සා නිට්ඨා, න සා නිට්ඨා සතණ්හස්සාති.

සා පනාවුසො නිට්ඨා සඋපාදානස්ස? උදාහු අනුපාදානස්සාති? සම්මා ව්‍යාකරමානා භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං ව්‍යාකරෙය්‍යුං: අනුපාදානස්සාවුසො සා නිට්ඨා, න සා නිට්ඨා සඋපාදානස්සාති.

සා පනාවුසො නිට්ඨා විද්දසුනො? උදාහු අවිද්දසුනො'ති? සම්මා ව්‍යාකරමානා භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං ව්‍යාකරෙය්‍යුං: විද්දසුනො ආවුසො සා නිට්ඨා, න සා නිට්ඨා අවිද්දසුනො'ති.

සා පනාවුසො නිට්ඨා අනුරුද්ධපටිවිරුද්ධස්ස? උදාහු අනනුරුද්ධඅප්පටිවිරුද්ධස්සාති? සම්මා ව්‍යාකරමානා භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං ව්‍යාකරෙය්‍යුං: අනනුරුද්ධඅප්පටිවිරුද්ධස්සාවුසො සා නිට්ඨා, න සා නිට්ඨා අනුරුද්ධපටිවිරුද්ධස්සාති.

සා පනාවුසො නිට්ඨා පපඤ්චාරාමස්ස පපඤ්චරතිනො? උදාහු නිප්පපඤ්චාරාමස්ස නිප්පපඤ්චරතිනො'ති. සම්මා ව්‍යාකරමානා භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං ව්‍යාකරෙය්‍යුං: නිප්පපඤ්චාරාමස්සාවුසො සා නිට්ඨා නිප්පපඤ්චරතිනො, න සා නිට්ඨා පපඤ්චාරාමස්ස පපඤ්චරතිනො'ති.

7. ද්වෙමා භික්ඛවෙ දිට්ඨියො: භවදිට්ඨි ච විභවදිට්ඨි ච. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා භවදිට්ඨිං අල්ලීනා භවදිට්ඨිං උපගතා භවදිට්ඨිං අජ්ඣොසිතා, විභවදිට්ඨියා තෙ පටිවිරුද්ධා. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා විභවදිට්ඨිං අල්ලීනා විභවදිට්ඨිං උපගතා විභවදිට්ඨිං අජ්ඣොසිතා, භවදිට්ඨියා තෙ පටිවිරුද්ධා. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ඉමාසං ද්වින්නං දිට්ඨීනං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානන්ති, තෙ සරාගා තෙ සදොසා තෙ සමොහා තෙ සතණ්හා තෙ සඋපාදානා තෙ අවිද්දසුනො තෙ අනුරුද්ධපටිවිරුද්ධා තෙ පපඤ්චරතිනො තෙ න පරිමුච්චන්ති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි[1]. න පරිමුච්චන්ති දුක්ඛස්මාති වදාමි.

1. 'ජරාමරණෙන සොකපරිදෙව දුක්ඛදොමනස්සුපායාසෙහි', ස්‍යා 'ජරාමරණෙන'සී

ඇවැත්නි, එ නිෂ්ඨාව මොහසහිතයාහට වේ ද? නොහොත් මොහ-රහිතයාහට වේ ද? මහණෙනි, මනා කොට ප්‍රකාශ කරන අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි, එ නිෂ්ඨාව මොහරහිතයාහට වෙයි. මොහ-සහිතයාහට නො වේ'යි මෙසේ ප්‍රකාශ කරන්නාහු ය.

ඇවැත්නි, එ නිෂ්ඨාව තෘෂ්ණාසහිතයාහට වේ ද? නොහොත් තෘෂ්ණා-රහිතයාහට වේ ද? මනා කොට ප්‍රකාශ කරන අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි, එ නිෂ්ඨාව තෘෂ්ණාරහිතයාහට වෙයි. තෘෂ්ණාසහිතයාහට නො වේ" යි මෙසේ ප්‍රකාශ කරන්නාහු ය.

ඇවැත්නි, එ නිෂ්ඨාව උපාදානසහිතයාහට වේ ද? නොහොත් උපාදාන-රහිතයාහට වේ ද? මහණෙනි, මනා කොට ප්‍රකාශ කරන අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි, ඒ නිෂ්ඨාව උපාදානරහිතයාහට වෙයි. උපාදානසහිත-යාහට නො වේ" යි මෙසේ ප්‍රකාශ කරන්නාහු ය.

ඇවැත්නි, එ නිෂ්ඨාව පණ්ඩිතයාහට වේ ද? නොහොත් අපණ්ඩිත-යාහට වේද? මහණෙනි, මනා කොට ප්‍රකාශ කරන අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි, එ නිෂ්ඨාව නුවණැත්තහුට වෙයි. නුවණ නැත්තහුට නො වේ"යි මෙසේ ප්‍රකාශ කරන්නාහු ය.

ඇවැත්නි, එ නිෂ්ඨාව (රාග විසින්) අනුරුද්ධ (ක්‍රොධ විසින්) ප්‍රති-විරුද්ධයාහට වේ ද? නොහොත් අනනුරුද්ධ අප්‍රතිවිරුද්ධයාහට වේ ද? මහණෙනි, මනා කොට ප්‍රකාශ කරන අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි, එ නිෂ්ඨාව රාගයෙන් නො බැඳුණු ක්‍රොධයෙන් නො කිපුණාහට වෙයි. රාගයෙන් බැඳුණු ක්‍රොධයෙන් කිපුණාහට නොවේ" යි මෙසේ ප්‍රකාශ කරන්-නාහු ය.

ඇවැත්නි, එ නිෂ්ඨාව තෘෂ්ණාදෘෂ්ටි ප්‍රපඤ්ච අරම් කොට ඇති ප්‍රපඤ්ච-යෙහි ඇලීම් ඇත්තහුට වේ ද? නොහොත් ප්‍රපඤ්ච අරම් කොට නැති ප්‍රපඤ්චයෙහි නො ඇලුණහුට වේ ද? මහණෙනි, මනා කොට ප්‍රකාශ කරන අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි, එ නිෂ්ඨාව ප්‍රපඤ්ච අරම් කොට නැති ප්‍රපඤ්චයෙහි නො ඇලුණහුට වෙයි. ඒ නිෂ්ඨාව ප්‍රපඤ්ච අරම් කොට ඇති ප්‍රපඤ්චයෙහි ඇලුණහුට නො වේ" යි මෙසේ ප්‍රකාශ කරන්-නාහු ය.

7. මහණෙනි, භවදෘෂ්ටිය විභවදෘෂ්ටිය දැයි මේ දෘෂ්ටිහු දෙදෙනෙක් වෙත්. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ භවදෘෂ්ටියෙහි ඇලුණාහු භවදෘෂ්ටියට පැමිණියාහු භවදෘෂ්ටියෙහි ගැලුණාහු වෙත් නම් ඔහු විභවදෘෂ්ටියට ප්‍රතිවිරුද්ධයහ. මහණෙනි, යම් කිසි මහණ කෙණෙක් හෝ බමුණු කෙනෙක් හෝ විභවදෘෂ්ටියෙහි ඇලුණාහු විභව දෘෂ්ටියට පැමිණියාහු විභවදෘෂ්ටියෙහි ගැලුණාහු වෙත් නම් ඔහු භවදෘෂ්ටියට ප්‍රතිවිරුද්ධයහ. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මේ ද්විවිධ දෘෂ්ටියෙහි සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතුසේ නො දනිත් නම් ඔහු රාගසහිත වූවාහු ය. ඔහු ද්වෙෂසහිත වූවාහු ය. ඔහු මොහ සහිත වූවාහු ය. ඔහු තෘෂ්ණාසහිත වූවාහු ය. ඔහු උපාදානසහිත වූවාහුය. ඔහු නුවණ නැත්තාහු ය. ඔහු රාගයෙන් බැඳුණාහු ය. ක්‍රොධයෙන් කිපුණාහු ය. ඔහු ප්‍රපඤ්ච අරම් කොට ඇත්තාහු ප්‍රපඤ්චයෙහි ඇලුණාහු ය. ඔහු ජාතියෙන් ජරායෙන් මරණයෙන් ශොකයෙන් පරිදෙවයෙන් දුකින් දොම්නසින් උපායාසයෙන් නො මිදෙත්. සියලු සසරදුකින් නො මිදෙත් යයි කියමි.

8. යෙ ච ඛො කෙචි[1] භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ඉමාසං ද්වින්නං දිට්ඨීනං සමුදයඤ්ච අත්ථගමඤ්ච[2] අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානන්ති, තෙ වීතරාගා තෙ වීතදොසා තෙ වීතමොහා තෙ වීතතණ්හා තෙ අනුපාදානා තෙ විද්දසුනො තෙ අනනුරුද්ධ-අප්පටිවිරුද්ධා තෙ නිප්පපඤ්චාරාමා නිප්පපඤ්චරතිනො තෙ පරිමුච්චන්ති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. පරිමුච්චන්ති දුක්ඛස්මාති වදාමි.

9. චත්තාරිමානි භික්ඛවෙ උපාදානානි. කතමානි චත්තාරි? කාමුපාදානං දිට්ඨුපාදානං සීලබ්බතුපාදානං අත්තවාදුපාදානං. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා සබ්බුපාදානපරිඤ්ඤාවාදා පටිජානමානා තෙ න සම්මා සබ්බුපාදානපරිඤ්ඤං පඤ්ඤපෙන්ති. කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති න දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති.[3] න සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. න අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. තං කිස්ස හෙතු? ඉමානි හි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා තීණි ඨානානි යථාභූතං නප්පජානන්ති. තස්මා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා සබ්බුපාදානපරිඤ්ඤාවාදා පටිජානමානා තෙ න සම්මා සබ්බුපාදානපරිඤ්ඤං පඤ්ඤපෙන්ති. කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති න දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. න සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. න අත්තවාදුපාදානස්ස පඤ්ඤං පරිඤ්ඤපෙන්ති.

10 සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා සබ්බුපාදානපරිඤ්ඤාවාදා පටිජානමානා තෙ න සම්මා සබ්බුපාදානපරිඤ්ඤං පඤ්ඤපෙන්ති. කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. න සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. න අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. තං කිස්ස හෙතු? ඉමානි හි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා ද්වෙ ඨානානි යථාභූතං නප්පජානන්ති. තස්මා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා සබ්බුපාදානපරිඤ්ඤාවාදා පටිජානමානා තෙ න සම්මා සබ්බුපාදාන[4]පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. න සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. න අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති

11. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා සබ්බුපාදානපරිඤ්ඤාවාදා පටිජානමානා තෙ න සම්මා සබ්බුපාදාන[4]පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. න අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. තං කිස්ස හෙතු? ඉමං හි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා එකං ඨානං යථාභූතං නප්පජානන්ති. තස්මා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා සබ්බුපාදානපරිඤ්ඤාවාදා පටිජානමානා තෙ න සම්මා සබ්බුපාදාන[4] පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. න අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති.

---

1. යෙ ච කෙචි සමණා වා' සී.
2. 'අත්ථඞ්ගමඤ්ච' මජසං, සතා.
3 'පඤ්ඤපෙන්ති' මජසං
4. 'සබ්බුපාදානස්ස' සතා.

Free Distribution www.aathaapi.org

8. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මේ ද්විවිධ දෘෂ්ටියෙහි සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතුසේ දනිත් නම් ඔහු වීතරාගයෝ ය. ඔහු වීතද්වෙෂයෝ ය. ඔහු වීතමොහයෝ ය. ඔහු පහ වූ තෘෂ්ණාව ඇත්තෝ ය. ඔහු උපාදාන රහිතයෝ ය. ඔහු නුවණැත්තාහු ය. ඔහු රාගයෙන් නො බැඳුණාහු ය. ක්‍රොධයෙන් නො කිපුණාහු ය. ඔහු ප්‍රපඤ්ච අරම් කොට නැත්තාහු ය. ප්‍රපඤ්චයෙහි ඇලුම් නැත්තාහු ය. ඔහු ජාතියෙන් ජරායෙන් මරණයෙන් ශොකයෙන් පරිදෙවයෙන් දුකින් දොම්නසින් උපායාසයෙන් මිදෙත්. ඔහු සියලු සසරදුකින් මිදෙත් යයි කියමි.

9 මහණෙනි, මේ උපාදානයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්: කාමූපාදානය දිට්ඨූපාදානය සීලබ්බතූපාදානය අත්තවාදූපාදාන යි. මහණෙනි, සියලු උපාදානයන්ගේ ප්‍රහාණය කියම්හ'යි ප්‍රතිඥා කරන මහණ බමුණු කෙනෙක් ඇත. ඔහු මැනවින් සියලු උපාදානයන්ගේ ප්‍රහාණය නො පනවත්. කාමූපාදානයාගේ ප්‍රහාණය පනවත් දිට්ඨූපාදානයාගේ ප්‍රහාණය නො පනවත්. සීලබ්බතූපාදානයාගේ ප්‍රහාණය නො පනවත්. අත්තවාදූපාදානයාගේ ප්‍රහාණය නො පනවත්. ඒ කවරහෙයින යත්: ඒ භවත් මහණ බමුණෝ මෙ කරුණු තුන තතුසේ නො දනිත්. එහෙයින් ඒ පින්වත් මහණ බමුණෝ 'සියලු උපාදානයන්ගේ ප්‍රහාණය කියම්හ'යි ප්‍රතිඥා කරන්නාහු සියලු උපාදානයන්ගේ ප්‍රහාණය මැනවින් නො පනවත්. කාමූපාදානයාගේ ප්‍රහාණය පනවත්. දිට්ඨූපාදානයාගේ ප්‍රහාණය නො පනවත්. සීලබ්බතූපාදානයාගේ ප්‍රහාණය නො පනවත්. අත්තවාදූපාදානයාගේ ප්‍රහාණය නො පනවත්.

10. මහණෙනි, 'සියලු උපාදානයන්ගේ ප්‍රහාණය කියම්හ'යි පිළිත කරන මහණ බමුණු කෙනෙක් ඇත. ඔහු මැනවින් සියලු උපාදානයන්ගේ ප්‍රහාණය නො පනවත්. කාමූපාදානයාගේ ප්‍රහාණය පනවත්. දිට්ඨූපාදානයාගේ ප්‍රහාණය පනවත්. සීලබ්බතූපාදානයාගේ ප්‍රහාණය නො පනවත්. අත්තවාදූපාදානයාගේ ප්‍රහාණය නො පනවත්. ඒ කවරහෙයින යත්: ඒ භවත් මහණ බමුණෝ මේ කරුණු දෙක තතුසේ නො දනිත්. ඒ හෙයින් ඒ භවත් මහණ බමුණෝ 'සියලු උපාදානයන්ගේ ප්‍රහාණය කියම්හ' යි ප්‍රතිඥා කරන්නාහු මැනවින් සියලු උපාදානයන්ගේ ප්‍රහාණය නො පනවත්. කාමූපාදානයාගේ ප්‍රහාණය පනවත්. දිට්ඨූපාදානයාගේ ප්‍රහාණය පනවත්. සීලබ්බතූපාදානයාගේ ප්‍රහාණය නො පනවත්. අත්තවාදූපාදානයාගේ ප්‍රහාණය නො පනවත්.

11. මහණෙනි, 'සියලු උපාදානයන්ගේ ප්‍රහාණය කියම්හ' යි ප්‍රතිඥා කරන මහණ බමුණු කෙනෙක් ඇත. ඔහු මැනවින් සියලු උපාදානයන්ගේ ප්‍රහාණය නො පනවත්. කාමූපාදානයාගේ ප්‍රහාණය පනවත්. දිට්ඨූපාදානයාගේ ප්‍රහාණය පනවත්. සීලබ්බතූපාදානයාගේ ප්‍රහාණය පනවත්. අත්තවාදූපාදානයාගේ ප්‍රහාණය නො පනවත්. ඒ කවර හෙයින යත්: ඒ භවත් මහණ බමුණෝ මේ එක කරුණ තතුසේ නො දනිත්. ඒ හෙයින් ඒ භවත් මහණ බමුණෝ 'සියලු උපාදානයන්ගේ ප්‍රහාණය කියම්හ' යි ප්‍රතිඥා කරන්නාහු මැනවින් සියලු උපාදානයන්ගේ ප්‍රහාණය නො පනවත්. කාමූපාදානයාගේ ප්‍රහාණය පනවත්. දිට්ඨූපාදානයාගේ ප්‍රහාණය පනවත්. සීලබ්බතූපාදානයාගේ ප්‍රහාණය පනවත්. අත්තවාදූපාදානයාගේ ප්‍රහාණය නො පනවත්.

12. එවරූපෙ ඛො භික්ඛවෙ ධම්මවිනයෙ යො සත්ථරි පසාදො, සො න සම්මග්ගතො අක්ඛායති. යො ධම්මෙ පසාදො, සො න සම්මග්ගතො අක්ඛායති. යා සීලෙසු පරිපූරකාරිතා, සා න සම්මග්ගතා අක්ඛායති. යා සහධම්මිකෙසු පියමනාපතා, සා න සම්මග්ගතා අක්ඛායති. තං කිස්ස හෙතු: එවං හෙතං භික්ඛවෙ හොති යථා තං දුරක්ඛාතෙ ධම්මවිනයෙ දුප්පවෙදිතෙ අනිය්‍යානිකෙ අනුපසමසංවත්තනිකෙ අසම්මාසම්බුද්ධප්පවෙදිතෙ.

13. තථාගතො ච ඛො භික්ඛවෙ අරහං සම්මාසම්බුද්ධො සබ්බුපාදානපරිඤ්ඤාවාදො පටිජානමානො සම්මා සබ්බුපාදානපරිඤ්ඤං පඤ්ඤපෙති. කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙති. දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙති. සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙති. අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙති.

14. එවරූපෙ ඛො භික්ඛවෙ ධම්මවිනයෙ යො සත්ථරි පසාදො, සො සම්මග්ගතො අක්ඛායති. යො ධම්මෙ පසාදො, සො සම්මග්ගතො අක්ඛායති. යා සීලෙසු පරිපූරකාරිතා, සා සම්මග්ගතා අක්ඛායති. යා සහධම්මිකෙසු පියමනාපතා, සා සම්මග්ගතා අක්ඛායති. තං කිස්ස හෙතු: එවං හෙතං භික්ඛවෙ හොති යථා තං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ සුප්පවෙදිතෙ නිය්‍යානිකෙ උපසමසංවත්තනිකෙ සම්මාසම්බුද්ධප්පවෙදිතෙ.

15. ඉමෙ ච භික්ඛවෙ චත්තාරො උපාදානා කිංනිදානා? කිංසමුදයා? කිංජාතිකා? කිංපභවා? ඉමෙ චත්තාරො උපාදානා තණ්හානිදානා තණ්හාසමුදයා තණ්හාජාතිකා තණ්හාපභවා. තණ්හා චායං භික්ඛවෙ කිංනිදානා? කිංසමුදයා? කිංජාතිකා? කිංපභවා? තණ්හා වෙදනානිදානා වෙදනාසමුදයා වෙදනාජාතිකා වෙදනාපභවා. වෙදනා චායං භික්ඛවෙ කිංනිදානා? කිංසමුදයා? කිංජාතිකා? කිංපභවා? වෙදනා ඵස්සනිදානා ඵස්සසමුදයා ඵස්සජාතිකා ඵස්සපභවා. ඵස්සො චායං භික්ඛවෙ කිං නිදානො? කිංසමුදයො? කිංජාතිකො? කිංපභවො? ඵස්සො සළායතනනිදානො සළායතනසමුදයො.–

12. මහණෙනි, මෙබඳු ධර්මවිනයයෙක්හි ශාස්තෘන් කෙරෙහි යම් පැහැදීමෙක් වේ නම්, එය සම්‍යග්ගතය (මනා ව පිහිටියේ - සම්පූර්ණ වූයේ) යි නො කියනු ලැබේ. ධර්මයෙහි යම් පැහැදීමෙක් වේ නම්, එය සම්‍යග්ගතය යි නො කියනු ලැබේ. ශීලයෙහි යම් පරිපූර්ණකාරිත්වයෙක් වේ නම්, එය සම්‍යග්ගතය යි නො කියනු ලැබේ. සහධාර්මිකයන් කෙරෙහි යම් ප්‍රිය මනාප භාවයෙක් වේ නම්, එය සම්‍යග්ගතය යි නො කියනු ලැබේ. එ කවර හෙයින යත්: මහණෙනි, වරදවා කියූ වරදවා ඉගැන්වූ, මඟපල පිණිස නො පවත්නාවූ, කෙලෙස් සන්හිඳීම පිණිස නො පවත්නා වූ, අසම්‍යක් සම්බුද්ධයන් විසින් ප්‍රකාශ කරන ලද ශාසනයෙහි යම්සේ වේ නම්, තෙල එසේ ම ය.

13. මහණෙනි, අර්හත් වූ, සම්‍යක් සම්බුද්ධ වූ, තථාගතයන් වහන්සේ ද 'සියලු උපාදානයන්ගේ ප්‍රහාණය කියම්හ' යි ප්‍රතිඥා කරන්නෝ මැනවින් සියලු උපාදානයන්ගේ ප්‍රහාණය පනවත්. කාමූපාදානයාගේ ප්‍රහාණය පනවත්. දිට්ඨුපාදානයාගේ ප්‍රහාණය පනවත්. සීලබ්බතූපාදානයාගේ ප්‍රහාණය පනවත්. අත්තවාදූපාදානයාගේ ප්‍රහාණය පනවත්.

14. මහණෙනි, මෙබඳු ධර්මවිනයයෙහි ශාස්තෘන් කෙරෙහි යම් පැහැදීමෙක් වේ නම්, එය සම්‍යග්ගතය (මනා ව පිහිටියේ - සම්පූර්ණ වූයේ) යි කියනු ලැබේ. ධර්මයෙහි යම් පැහැදීමෙක් වේ නම්, එය සම්‍යග්ගතය යි කියනු ලැබේ. ශීලයෙහි යම් පරිපූර්ණකාරිත්වයක් වේ නම්, එය සම්‍යග්ගතය යි කියනු ලැබේ. සහධාර්මිකයන් කෙරෙහි යම් ප්‍රිය මනාප භාවයෙක් වේ නම්, එය සම්‍යග්ගතය යි කියනු ලැබේ. එ කවර හෙයින යත්: මහණෙනි, මනා කොට කියූ, මනා කොට ඉගැන්වූ, මඟපල පිණිස පවත්නාවූ, කෙලෙස් සන්හිඳීම පිණිස පවත්නාවූ, සම්‍යක් සම්බුද්ධයන් විසින් ප්‍රකාශ කරන ලද ශාසනයෙහි යම්සේ වේ නම්, තෙල එසේ ම ය.

15. මහණෙනි, මේ සතර උපාදානයෝ කුමක් මූලකාරණ කොට ඇත් ද? කුමක් උත්පත්ති හෙතු කොට ඇත් ද? කුමක් ජාති කොට ඇත් ද? කුමක් ප්‍රභව කොට ඇත් ද? මේ සතර උපාදානයෝ තෘෂ්ණාව මූලකාරණ කොට ඇත. තෘෂ්ණාව උත්පත්ති හෙතු කොට ඇත. තෘෂ්ණාව ජාති කොට ඇත. තෘෂ්ණාව ප්‍රභව කොට ඇත. මහණෙනි, මේ තෘෂ්ණාව කුමක් මූලකාරණ කොට ඇත් ද? කුමක් උත්පත්ති හෙතු කොට ඇත් ද? කුමක් ජාති කොට ඇත් ද? කුමක් ප්‍රභව කොට ඇත් ද? තෘෂ්ණාව වෙදනාව මූලකාරණ කොට ඇත. වෙදනාව උත්පත්තිහෙතු කොට ඇත. වෙදනාව ජාති කොට ඇත. වෙදනාව ප්‍රභව කොට ඇත. මහණෙනි, මේ වෙදනාව කුමක් මූලකාරණ කොට ඇත් ද? කුමක් උත්පත්ති හෙතු කොට ඇත් ද? කුමක් ජාති කොට ඇත් ද? කුමක් ප්‍රභව කොට ඇත් ද? වෙදනාව ස්පර්ශය මූලකාරණ කොට ඇත. ස්පර්ශය උත්පත්ති හෙතු කොට ඇත. ස්පර්ශය ජාති කොට ඇත. ස්පර්ශය ප්‍රභව කොට ඇත. මහණෙනි, මේ ස්පර්ශය කුමක් මූලකාරණ කොට ඇත් ද? කුමක් උත්පත්ති හෙතු කොට ඇත් ද? කුමක් ජාති කොට ඇත් ද? කුමක් ප්‍රභව කොට ඇත් ද? ස්පර්ශය ෂඩායතන මූලකාරණ කොට ඇත. ෂඩායතන උත්පත්ති හෙතු කොට ඇත.-

සළායතනජාතිකො සළායතනපභවො. සළායතනඤ්චිදං භික්ඛවෙ කිංනිදානං? කිංසමුදයං? කිංජාතිකං? කිංපභවං? සළායතනං නාමරූපනිදානං නාමරූපසමුදයං නාමරූපජාතිකං නාමරූපපභවං. නාමරූපඤ්චිදං භික්ඛවෙ කිංනිදානං? කිංසමුදයං? කිංජාතිකං? කිංපභවං? නාමරූපං විඤ්ඤාණනිදානං විඤ්ඤාණසමුදයං විඤ්ඤාණජාතිකං විඤ්ඤාණපභවං. විඤ්ඤාණඤ්චිදං භික්ඛවෙ කිංනිදානං? කිංසමුදයං? කිංජාතිකං? කිංපභවං? විඤ්ඤාණං සඞ්ඛාරනිදානං සඞ්ඛාරසමුදයං සඞ්ඛාරජාතිකං සඞ්ඛාරපභවං. සඞ්ඛාරාචිමෙ භික්ඛවෙ කිංනිදානා? කිංසමුදයා? කිංජාතිකා? කිංපභවා? සඞ්ඛාරා අවිජ්ජානිදානා අවිජ්ජාසමුදයා අවිජ්ජාජාතිකා අවිජ්ජාපභවා.

16. යතො ච ඛො භික්ඛවෙ භික්ඛුනො අවිජ්ජා පහීනා හොති විජ්ජා උප්පන්නා, සො අවිජ්ජාවිරාගා විජ්ජුප්පාදා නෙව කාමුපාදානං උපාදියති. න දිට්ඨුපාදානං උපාදියති. න සීලබ්බතුපාදානං උපාදියති. න අත්තවාදුපාදානං උපාදියති. අනුපාදියං න පරිතස්සති. අපරිතස්සං පච්චත්තංයෙව පරිනිබ්බායති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

චූළසීහනාදසුත්තං පඨමං.

1. 2. 2.

මහාසීහනාදසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **වෙසාලියං** විහරති බහි නගරෙ අවරපුරෙ[1] වනසණ්ඩෙ. තෙන ඛො පන සමයෙන **සුනක්ඛත්තො** ලිච්ඡවිපුත්තො අචිරපක්කන්තො හොති ඉමස්මා ධම්මවිනයා. සො වෙසාලියං පරිසති[2] එවං[3] වාචං භාසති: "නත්ථි සමණස්ස ගොතමස්ස උත්තරි මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො. තක්කපරියාහතං සමණො ගොතමො ධම්මං දෙසෙති වීමංසානුචරිතං සයම්පටිභානං. යස්ස ච ඛ්වාස්ස අත්ථාය ධම්මො දෙසිතො, සො නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායා"ති.

1. අපරපුරෙ, මජසං. 2. පරිසති, මජසං. 3. එකං, STP.

ෂඩායතන ජාති කොට ඇත. ෂඩායතන ප්‍රභව කොට ඇත. මහණෙනි, මේ ෂඩායතන කුමක් මූලකාරණ කොට ඇත් ද? කුමක් උත්පත්ති හෙතු කොට ඇත් ද? කුමක් ජාති කොට ඇත් ද? කුමක් ප්‍රභව කොට ඇත් ද? ෂඩායතන, නාමරූප මූලකාරණ කොට ඇත. නාමරූප උත්පත්ති හෙතු කොට ඇත. නාමරූප ජාති කොට ඇත. නාමරූප ප්‍රභව කොට ඇත. මහණෙනි, මේ නාමරූප කුමක් මූලකාරණ කොට ඇත් ද? කුමක් උත්පත්ති හෙතු කොට ඇත්ද? කුමක් ජාති කොට ඇත් ද? කුමක් ප්‍රභව කොට ඇත් ද? නාමරූප විඥානය මූලකාරණ කොට ඇත. විඥානය උත්පත්ති හෙතු කොට ඇත. විඥානය ජාති කොට ඇත. විඥානය ප්‍රභව කොට ඇත. මහණෙනි, මේ විඥානය කුමක් මූලකාරණ කොට ඇත් ද? කුමක් උත්පත්ති හෙතු කොට ඇත් ද? කුමක් ජාති කොට ඇත් ද? කුමක් ප්‍රභව කොට ඇත් ද? විඥානය, සංස්කාර මූලකාරණ කොට ඇත. සංස්කාර උත්පත්ති හෙතු කොට ඇත. සංස්කාර ජාති කොට ඇත. සංස්කාර ප්‍රභව කොට ඇත. මහණෙනි, මේ සංස්කාරයෝ කුමක් මූලකාරණ කොට ඇත් ද? කුමක් උත්පත්ති හෙතු කොට ඇත් ද? කුමක් ජාති කොට ඇත් ද? කුමක් ප්‍රභව කොට ඇත් ද? සංස්කාරයෝ අවිද්‍යාව මූලකාරණ කොට ඇත. අවිද්‍යාව උත්පත්ති හෙතු කොට ඇත. අවිද්‍යාව ජාති කොට ඇත. අවිද්‍යාව ප්‍රභව කොට ඇත.

16. මහණෙනි, යම් කලෙක පටන් මහණහුගේ අවිද්‍යාව ප්‍රහීණ වූවා ද, අභීත්මාර්ගවිද්‍යාව උපත ද, හේ අවිද්‍යාව දුරු වීමෙන් කාමූපාදානය නො ගනියි. දිට්ඨුපාදානය නො ගනියි. සීලබ්බතුපාදානය නො ගනියි. අත්තවාදූපාදානය නො ගනියි. උපාදාන වශයෙන් නො ගත්තේ (තණ්හා පරිතස්සනායෙන්) තෘෂ්ණාධීන නො වෙයි. තෘෂ්ණා නො උපදවන්නේ තෙමේ ම කෙලෙස් පිරිනිවීමෙන් පිරිනිවෙයි. උත්පත්තිය ක්‍ෂය වූය. බ්‍රහ්සර වැස නිමවන ලදි. කරණී කරන ලදි. මෙ අර්හත්ත්වය පිණිස අනෙක් කටයුත්තෙක් නැතැයි දැන ගනියි.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළ සේක. සතුටු සිත් ඇති නෘපතවූ ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ.

චූලසීහනාද සූත්‍රය පළමුවැනි යි.

1. 2. 2.

මහාසීහනාද සූත්‍රය

1 මා විසින් මෙසේ අසන ලදි. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **විශාලානගර** සමීපයෙහි බිහිනුවර නුවරින් පැළදිග වනලැහැබෙහි වැඩ වසන සේක. **ලිච්ඡවිරාජපුත්‍ර සුනක්ඛත්ත** මහණ මේ ශාසනයෙන් නික්ම ගිය නොබෝකල් ඇති වෙයි. හෙ විශාලාමහනුවර පිරිස් මැද මෙසෙයින් තෙපුල් තෙපලයි: “ශ්‍රමණ ගෞතමයාහට මනුෂ්‍ය ධර්මයෙන් වැඩි ආර්‍ය්‍යභාවය පිණිස සමර්ථවූ ඥානදර්ශන විශෙෂයෙක් නැත. ශ්‍රමණ ගෞතම තෙමේ තර්කයෙන් පර්‍ය්‍යාහත (ගැටුම්) කොට විමසුම් නුවණින් ලුහුබැඳ ගත්, සියවටහනු වූ දහමක් දෙශනා කරයි. (එහෙත්) යම් අර්ථයක් පිණිස ධර්මය දෙසන ලද නම්, ඒ ධර්මය දෙශිත පරිදි කරනුවාගේ දුක් මැනැවින් නස්නා පිණිස වැවේය” කියා යි.

2. අථ ඛො ආයස්මා සාරිපුත්තො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය වෙසාලිං පිණ්ඩාය පාවිසි. අස්සොසි ඛො ආයස්මා සාරිපුත්තො සුනක්ඛත්තස්ස ලිච්ඡවිපුත්තස්ස වෙසාලියං පරිසතිං එවං වාචං භාසමානස්ස: "නත්ථි සමණස්ස ගොතමස්ස උත්තරි මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො. තක්කපරියාහතං සමණො ගොතමො ධම්මං දෙසෙති වීමංසානුචරිතං සයම්පටිභානං. යස්ස ච ඛ්වාස්ස අත්ථාය ධම්මො දෙසිතො, සො නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායා"ති.

3. අථ ඛො ආයස්මා සාරිපුත්තො වෙසාලියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: සුනක්ඛත්තො භන්තෙ ලිච්ඡවිපුත්තො අචිරපක්කන්තො ඉමස්මා ධම්මවිනයා. සො වෙසාලියං පරිසතිං එවං වාචං භාසති: "නත්ථි සමණස්ස ගොතමස්ස උත්තරි මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො. තක්කපරියාහතං සමණො ගොතමො ධම්මං දෙසෙති වීමංසානුචරිතං සයම්පටිභානං. යස්ස ච ඛ්වාස්ස අත්ථාය ධම්මො දෙසිතො, සො නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායා"ති.

4. කොධනො[1] සාරිපුත්ත සුනක්ඛත්තො මොඝපුරිසො. කොධා ච පනස්ස එසා වාචා භාසිතා 'අවණ්ණං භාසිස්සාමී'ති. සො සාරිපුත්ත සුනක්ඛත්තො මොඝපුරිසො වණ්ණංයෙව තථාගතස්ස භාසති. වණ්ණො හෙසො සාරිපුත්ත තථාගතස්ස, යො එවං වදෙය්‍ය: 'යස්ස ච ඛ්වාස්ස අත්ථාය ධම්මො දෙසිතො, සො නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායා'ති.

5. අයම්පි හි නාම සාරිපුත්ත, සුනක්ඛත්තස්ස මොඝපුරිසස්ස මයි ධම්මන්වයො න භවිස්සති: "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති.

6. අයම්පි හි නාම සාරිපුත්ත සුනක්ඛත්තස්ස මොඝපුරිසස්ස මයි ධම්මන්වයො න භවිස්සති: "ඉතිපි සො භගවා අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකොපි හුත්වා බහුධා හොති. බහුධාපි හුත්වා එකො හොති. ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති. සෙය්‍යථාපි ආකාසෙ. පඨවියම්පි[2] උම්මුජ්ජනිමුජ්ජං කරොති. සෙය්‍යථාපි උදකෙ. උදකෙපි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පඨවියං. ආකාසෙපි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛීසකුණො. ඉමෙපි චන්දිමසුරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙතී"ති.

---

1. 'කොධනො හෙසො' - මජසං, 'කොධනො ඛො' - ස්‍යා.
2. පඨවියාපි, ස්‍යා. පථවියාපි, මජසං.

2. එකල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පෙරවරු සිවුරු හැඳ පෙරෙව පාසිවුරු ගෙන විශාලානුවරට පිඬු පිණිස පිවිසියහ. ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ "ශ්‍රමණ ගෞතමයාහට මනුෂ්‍යධර්මයෙන් වැඩි වූ ආර්‍ය්‍යභාවය කිරීමට සමර්ථ වූ ඥානදර්ශන විශෙෂයෙක් නැත. ශ්‍රමණ ගෞතම තෙමේ තර්කයෙන් ගැට්ටුම් කොට, විමසන නුවණින් ලුහුබැඳ ගත් සියවටහනු දහමක් දෙශනා කරයි. යම් අර්ථයක් පිණිස ධර්මය දෙසන ලද නම් ඒ ධර්මය ඒ අනු ව ක්‍රියා කරන්නහුගේ මැනැවින් දුක් කෙළවර කිරීම පිණිස පවත්නේ ය" යි විශාලානුවර පිරිස් මැද මෙබඳු වචන කියන ලිච්ඡවිරාජපුත්‍ර සුනක්ඛත්තයාගේ කථාව ඇසූහ.

3. ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ විසල්පුර පිඬු පිණිස හැසිර බතින් පසු පිණ්ඩපාතයෙන් වැළකියාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කළහ: වහන්ස, ලිච්ඡවි රාජපුත්‍ර සුනක්ඛත්ත මහණ මෙ සස්නෙන් පහවැ ගිය විරූ නොබෝකල් ඇත්තෙක. විශාලා නගරයෙහි පිරිස් මැද "ශ්‍රමණ ගෞතමයාහට මනුෂ්‍ය ධර්මයෙන් වැඩි වූ ආර්‍ය්‍යභාවය කිරීමට සමර්ථ වූ ඥානදර්ශන විශෙෂයෙක් නැත. ශ්‍රමණ ගෞතම තෙමේ තර්කයෙන් ගටා විමසුමෙන් එළවා ගත්, සියවටහනු දහමක් දෙශනා කරයි. යම් අර්ථයක් පිණිස ධර්මය දෙසන ලද නම් ඒ ධර්මය ඒ අනුව ක්‍රියා කරන්නහුගේ මැනැවින් දුක් කෙළවර කිරීම පිණිස පවත්නේ ය " යි මෙබඳු වචනයක් කියයි.

4. ශාරීපුත්‍රය, සුනක්ඛත්ත මොඝපුරුෂ ක්‍රොධ කරනසුලු ය. ක්‍රොධ හෙතුයෙන් තුලුත් විසින් මේ වචනය කියන ලදි. ශාරීපුත්‍රය, ඒ සුනක්ඛත්ත මොඝපුරුෂ 'නුගුණ කියමි' යි තථාගතයන්ගේ ගුණයක් ම කියයි. ශාරීපුත්‍රය, "තථාගතයන් විසින් යම් අර්ථයක් පිණිස යමකුට ධර්මය දෙසන ලද නම්, ඒ ධර්මය ඒ අනුව ක්‍රියා කරන්නහුගේ මැනැවින් දුක් කෙළවර කිරීම පිණිස පවත්නේ ය" යි යමෙක් කියා නම්, එය තථාගතයන්ගේ ගුණයෙක් ම ය.

5. ශාරීපුත්‍රය, සුනක්ඛත්ත මොඝපුරුෂයාහට - "මේ මේ කාරණයෙනුදු ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ. සම්‍යක් සම්බුද්ධයහ. අෂ්ටවිද්‍යාවෙන් හා පසළොස් චරණ ධර්මයෙන් හා යුක්තයහ. සුගතයහ. ලොකවිදූහ. අනුත්තරපුරිසදම්මසාරථිහ. දෙව්මිනිසුන්ගේ ශාස්තෘයහ. බුද්ධයහ. භගවත්හ" යී මා කෙරෙහි මේ (සර්වඥතාඥානසඞ්ඛ්‍යාත උතුරු මිනිස්දම් දැනීමෙහි සමර්ථ ඥානය වූ) ධර්මාන්වය ද නො වෙයි.

6. ශාරීපුත්‍රය, සුනක්ඛත්ත මොඝපුරුෂයාහට - "ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙනු දු නන්වැදෑරුම් ඍද්ධිවිධ වළඳ කෙරෙති: එකෙක් වූහු ම බොහෝ ව මැවෙත්. බොහෝ වූවාහු ම එකෙක් ව මැවෙත් ප්‍රකට භාවයට අප්‍රකට භාවයට පත්වන සේක. බිත්තියෙන් පිටත පවුරෙන් පිටත පර්වතෙන් පිටත අහසෙහි යනුවන් මෙන් නොගැටෙමින් යන සේක. ජලයෙහි සෙයින් පොළොවෙහි ද ඉල්පීම් ගැලීම් කරන සේක. පොළොවෙහි සෙයින් නොබිඳෙන දියෙහි ද යන සේක. අහසෙහි ද පක්ෂිශකුනින් සෙයින් පර්‍ය්‍යඞ්කයෙන් යන සේක. මෙසේ මහත් ඍද්ධි ඇති මහත් අනුභාව ඇති මේ සඳහිරු දෙදෙනා කරතලයෙන් පරාමර්ශන කරන සේක. පිරිමදින සේක. බඹලොව ද තෙක් කයින් විසිය පවත්වන සේකැ" යී මා කෙරෙහි මේ ධර්මාන්වය (ඍද්ධිවිධඥානසඞ්ඛ්‍යාත උතුරුමිනිස්දම් දන්නා ඥානය) ද නො වෙයි.

7. අයම්පි හි නාම සාරිපුත්ත, සුනක්ඛත්තස්ස මොඝපුරිසස්ස මයි ධම්මන්වයො න භවිස්සති: "ඉතිපි සො භගවා දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ චා"ති.

8. අයම්පි හි නාම සාරිපුත්ත, සුනක්ඛත්තස්ස මොඝපුරිසස්ස මයි ධම්මන්වයො න භවිස්සති: "ඉතිපි සො භගවා පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති. සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති. වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති. සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති. වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති. සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති. වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති. මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති. අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති. සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති. අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති. සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති. අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති. විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති. අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති."

9. දස ඛො පනිමානි සාරිපුත්ත තථාගතස්ස තථාගතබලානි යෙහි බලෙහි සමන්නාගතො තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති. කතමානි දස? ඉධ සාරිපුත්ත, තථාගතො ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං පජානාති. යම්පි සාරිපුත්ත, තථාගතො ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං පජානාති, ඉදම්පි සාරිපුත්ත, තථාගතස්ස තථාගතබලං හොති යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

10. පුන ච පරං සාරිපුත්ත තථාගතො අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං පජානාති. යම්පි සාරිපුත්ත, තථාගතො අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං පජානාති, ඉදම්පි සාරිපුත්ත, තථාගතස්ස තථාගතබලං හොති යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

Free Distribution www.aathaapi.org

7. ශාරීපුත්‍රය, සුනක්ඛත්ත මොඝපුරුෂයාහට මා කෙරෙහි මේ ධර්මාන්වය ද (දිව්‍යශ්‍රොත්‍රධාතුඥානසඞ්ඛ්‍යාත උතුරුමිනිස්දම් දැනගන්නා ප්‍රඥා) නො වෙයි. එනම්: "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේත් ඉතා පිරිසිදු මිනිසැස ඉක්ම වූ දිව්‍ය ශ්‍රොත්‍රධාතුවෙන් දෙවියන් පිළිබඳ වූත් මිනිසුන් පිළිබඳ වූත් දුර වූත් සමීප වූත් දුවිවිධ ශබ්දයන් අසන සේක" කියා ය.

8. ශාරීපුත්‍රය, සුනක්ඛත්ත මොඝපුරුෂයාට – "භාග්‍යවතුන් වහන්සේ මෙසේත් අන්‍යසත්ත්වයන්ගේ අන්‍යපුද්ගලයන්ගේ සිත සිය සිතින් පිරිසිඳ දැන ගන්නා සේක රාග සහිත වූ හෝ සිත රාග සහිත සිතැ යි දන්නා සේක. රාග රහිත වූ හෝ සිත රාග රහිත සිතැ යි දන්නා සේක. ද්වෙෂ සහිත වූ හෝ සිත ද්වෙෂ සහිත සිතැ යි දන්නා සේක. ද්වෙෂ රහිත වූ හෝ සිත ද්වෙෂ රහිත සිතැ යි දන්නා සේක. මොහ සහිත වූ හෝ සිත මොහ සහිත සිතැ යි දන්නා සේක. මොහ රහිත වූ හෝ සිත මොහ රහිත සිතැ යි දන්නා සේක. (ථිනමිද්ධයෙන්) සංක්ෂිප්ත වූ හෝ සිත සංක්ෂිප්ත සිතැ යි දන්නා සේක (උද්ධච්චයෙන්) වික්ෂිප්ත වූ හෝ සිත වික්ෂිප්ත සිතැ යි දන්නා සේක. මහග්ගත වූ හෝ සිත මහග්ගත සිතැ යි දන්නා සේක. අමහග්ගත වූ හෝ සිත අමහග්ගත සිතැ යි දන්නා සේක. සඋත්තර වූ හෝ සිත සඋත්තර සිතැ යි දන්නා සේක. නිරුත්තර වූ හෝ සිත නිරුත්තර වූ සිතැ යි දන්නා සේක. සමාහිත වූ හෝ සිත සමාහිත වූ සිතැ යි දන්නා සේක. අසමාහිත වූ හෝ සිත අසමාහිත සිතැ යි දන්නා සේක. විමුක්ත වූ හෝ සිත විමුක්ත සිතැ යි දන්නා සේක. අවිමුක්ත වූ හෝ සිත අවිමුක්ත සිතැ යි දන්නා සේක" යි මෙසේ මා කෙරෙහි ඇති මේ (චෙතොපරියඤාණ සඞ්ඛ්‍යාත උතුරු මිනිස්දම් දන්නා) ඥාන ය ද නො වෙයි.

9. ශාරීපුත්‍රය, යම්බඳු බලයන්ගෙන් යුත් තථාගත තෙම ශ්‍රෙෂ්ඨ ස්ථානය (තමන් වහන්සේ කෙරෙහි ඇතැයි) ප්‍රතිඥා කෙරේ ද, පිරිස්හි සිංහනාද කෙරේ ද, ශ්‍රෙෂ්ඨ ධර්මචක්‍රය පවත්වා ද, මෙ එබඳු තථාගත-බල දසයෙක් වෙයි. කවර දසයෙක් ද යත්: ශාරීපුත්‍රය, මෙහි තථාගත තෙමෙ කාරණය කාරණය වශයෙන් ද අකාරණය අකාරණය වශයෙන් ද තතු ලෙස දැන ගනියි. ශාරීපුත්‍රය, තථාගත තෙමේ කාරණය කාරණය වශයෙනුත් අකාරණය අකාරණය වශයෙනුත් තත් වූ පරිදි දනී යන යමක් ඇද්ද, ශාරීපුත්‍රය, තථාගත තෙමේ යම් බලයකට පැමිණ ශ්‍රෙෂ්ඨ ස්ථානය ප්‍රතිඥා කෙරේ ද, පිරිස්හි සිංහනාද කෙරේ ද, ශ්‍රෙෂ්ඨ ධර්මචක්‍රය පවත්වා ද, මේ ඒ ස්ථානාස්ථානඥානය ද තථාගතයන්ගේ තථාගතබලයෙක් වෙයි.

10. තවද ශාරීපුත්‍රය, අනෙකෙක් ඇත. තථාගත තෙමේ අතීත අනාගත වර්තමාන කර්මසමාදානයන්ගේ විපාක ප්‍රත්‍යය වශයෙන් හෙතු වශයෙන් තත් වූ පරිදි දන්නේ ය. ශාරීපුත්‍රය, යම් ඥානයෙකින් තථාගත තෙමේ අතීතානාගතවර්තමාන කර්මයන්ගේ විපාකය ප්‍රත්‍යය වශයෙන් හෙතු වශයෙන් තතු සේ දන්නේ ද. ශාරීපුත්‍රය, තථාගත තෙමේ යම් බලයකට පැමිණ ශ්‍රෙෂ්ඨස්ථානය ප්‍රතිඥා කෙරේ ද, පිරිස්හි සිංහනාද කෙරේ ද, ශ්‍රෙෂ්ඨ ධර්මචක්‍රය පවත්වා ද, මේ කර්මවිපාකඥානය ද තථාගතයන්ගේ තථාගතබලයෙක් වෙයි.

11. පුන ච පරං සාරිපුත්ත, තථාගතො සබ්බත්ථගාමිනිං පටිපදං යථාභූතං පජානාති. යම්පි සාරිපුත්ත, තථාගතො සබ්බත්ථගාමිනිං පටිපදං යථාභූතං පජානාති, ඉදම්පි සාරිපුත්ත තථාගතස්ස තථාගතබලං හොති යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

12. පුන ච පරං සාරිපුත්ත, තථාගතො අනෙකධාතුනානාධාතුලොකං යථාභූතං පජානාති. යම්පි සාරිපුත්ත, තථාගතො අනෙකධාතුනානාධාතුලොකං යථාභූතං පජානාති, ඉදම්පි සාරිපුත්ත, තථාගතස්ස තථාගතබලං හොති යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

13. පුන ච පරං සාරිපුත්ත, තථාගතො සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං පජානාති. යම්පි සාරිපුත්ත තථාගතො සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං පජානාති, ඉදම්පි සාරිපුත්ත, තථාගතස්ස තථාගතබලං හොති යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

14. පුන ච පරං සාරිපුත්ත, තථාගතො පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රියපරොපරියත්තං යථාභූතං පජානාති. යම්පි සාරිපුත්ත තථාගතො පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රියපරොපරියත්තං යථාභූතං පජානාති, ඉදම්පි සාරිපුත්ත, තථාගතස්ස තථාගතබලං හොති යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

15. පුන ච පරං සාරිපුත්ත, තථාගතො ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සඞ්කිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං පජානාති. යම්පි සාරිපුත්ත, තථාගතො ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සංකිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං පජානාති, ඉදම්පි සාරිපුත්ත, තථාගතස්ස තථාගතබලං, හොති යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

16. පුන ච පරං සාරිපුත්ත, තථාගතො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසතිම්පි[1] ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි, අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ, "අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො, සො තතො චුතො අමුත්‍ර උපපාදිං.

1. වීසම්පි, මජසං.

Free Distribution www.aathaapi.org

11. තවද ශාරීපුත්‍රය, අනෙකෙක් ඇත. තථාගත තෙමේ සර්‍වත්‍රගාමිනී (නිරයාදි හැම තැන් යන) ප්‍රතිපදාව තතුසේ දන්නේ ය. ශාරීපුත්‍රය, යම් ඥානයෙකින් තථාගත තෙමේ සර්‍වත්‍රගාමිනී ප්‍රතිපදාව තතු සේ දන්නේ ද, ශාරීපුත්‍රය, තථාගත තෙමේ යම් බලයකට පැමිණ ශ්‍රෙෂ්ඨස්ථානය ප්‍රතිඥ කෙරේ ද, පිරිස්හි සිංහනාද කෙරේ ද, ශ්‍රෙෂ්ඨධර්‍මචක්‍රය පවත්වා ද, මෙ ද තථාගතයන්ගේ තථාගතබලයෙක් වෙයි.

12. තවද ශාරීපුත්‍රය, අනෙකෙක් ඇත. තථාගත තෙමේ අනෙකධාතු-නානාධාතු ලොකය තතු සේ දන්නේ ය. ශාරීපුත්‍රය, යම් ඥානයෙකින් තථාගත තෙමේ අනෙකධාතු නානාධාතු ලොකය තතුසේ දන්නේ ද, ශාරීපුත්‍රය, තථාගත තෙමේ යම් බලයකට පැමිණ ශ්‍රෙෂ්ඨස්ථානය ප්‍රතිඥ කෙරේ ද, පිරිස්හි සිංහනාද කෙරේ ද, ශ්‍රෙෂ්ඨධර්‍මචක්‍රය පවත්වා ද, මෙ ද තථාගතයන්ගේ තථාගතබලයෙක් වෙයි.

13. තවද ශාරීපුත්‍රය, අනෙකෙක් ඇත. තථාගත තෙමේ සත්ත්‍ව-යන්ගේ නානාධිමුක්තිකත්‍ව දන්නේ ය. ශාරීපුත්‍රය, යම් ඥානයෙකින් තථාගත තෙමේ සත්ත්‍වයන්ගේ නානාධිමුක්තිකත්‍ව දන්නේ ද, ශාරීපුත්‍රය, තථාගත තෙමේ යම් බලයකට පැමිණ ශ්‍රෙෂ්ඨස්ථානය ප්‍රතිඥ කෙරේ ද, පිරිස්හි සිංහනාදය කෙරේ ද, ශ්‍රෙෂ්ඨ ධර්‍මචක්‍රය පවත්වා ද, මෙ ද තථාගතයන්ගේ තථාගතබලයෙක් වෙයි.

14. තවද ශාරීපුත්‍රය, අනෙකෙක් ඇත. තථාගත තෙමේ පරසත්ත්‍ව-යන්ගේ පරපුද්ගලයන්ගේ ශ්‍රද්ධාදි ඉන්‍ද්‍රියයන්ගේ පරාවරතා (වෘද්ධිය හානිය) තතුසේ දන්නේ ය. ශාරීපුත්‍රය, යම් ඥානයෙකින් තථාගත තෙමේ පරසත්ත්‍ව-යන්ගේ පරපුද්ගලයන්ගේ ශ්‍රද්ධාදි ඉන්‍ද්‍රියයන්ගේ පරාවරතා තතුසේ දන්නේ ද, ශාරීපුත්‍රය, තථාගත තෙමේ යම් බලයකට පැමිණ ශ්‍රෙෂ්ඨස්ථානය ප්‍රතිඥ කෙරේ ද, ශ්‍රෙෂ්ඨ ධර්‍මචක්‍රය පවත්වා ද, මෙ ද තථාගතයන්ගේ තථාගත බලයෙක් වෙයි.

15. තවද ශාරීපුත්‍රය, අනෙකෙක් ඇත. තථාගත තෙමේ ධ්‍යාන විමොක්ෂ සමාධි සමාපත්තීන්ගේ කෙලෙසීම ද පිරිසිදු බව ද එයින් නැගී සිටීම ද තතුසේ දන්නේ ය. ශාරීපුත්‍රය, යම් ඥානයෙකින් තථාගත තෙමේ ධ්‍යාන විමොක්ෂ සමාධි සමාපත්තීන්ගේ සංක්ලෙශ ව්‍යවදාන ව්‍යුත්ථාන තතුසේ දන්නේ ද, ශාරීපුත්‍රය, තථාගත තෙමේ යම් බලයකට පැමිණ ශ්‍රෙෂ්ඨ ස්ථානය ප්‍රතිඥ කෙරේ ද, පිරිස්හි සිංහනාද කෙරේ ද, ශ්‍රෙෂ්ඨ ධර්‍මචක්‍රය පවත්වා ද, මෙ ද තථාගතයන්ගේ තථාගතබලයෙක් වෙයි.

16. තවද ශාරීපුත්‍රය, අනෙකෙක් ඇත. තථාගත තෙමේ නන් වැදෑරුම් පූර්‍වෙනිවාසය සිහි කෙරෙයි. එනම්: එකජාතියක් ද ජාති දෙකක් ද ජාති තුනක් ද ජාති සතරක් ද ජාති පසක් ද ජාති දසයක් ද ජාති විස්සක් ද ජාති තිසක් ද ජාති සතළිසක් ද ජාති පණසක් ද ජාති සියයක් ද ජාති දහසක් ද ජාති සියක් දහසක් ද, නොයෙක් නස්නා කල්පයන් ද නොයෙක් හටගන්නා කල්පයන් ද නොයෙක් නස්නා හටගන්නා කල්පයන් ද "අසුවල් තැන උපන්නෙමි. මෙනම් ඇත්තෙම් වීමි. මෙනම් ගොත්‍ර ඇත්තෙම් වීමි. මෙවැනි වර්‍ණ ඇත්තෙම් වීමි. මෙවැනි ආහාර ඇත්තෙම් වීමි. මෙවැනි සැපදුක් වින්දෙම් වීමි. මෙවැනි ආයු කෙළවර කොට ඇත්තෙකිම් වීමි. මම එයින් ච්‍යුත වූයෙම් අසුවල් තැන උපන්නෙමි.

තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො"ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. යම්පි සාරිපුත්ත, තථාගතො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, ඉදම්පි සාරිපුත්ත තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

17. පුන ච පරං සාරිපුත්ත, තථාගතො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති: චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ. යථාකම්මූපගෙ සත්තෙ පජානාති: "ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා; ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා"ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ. යථාකම්මූපගෙ සත්තෙ පජානාති. යම්පි සාරිපුත්ත තථාගතො -පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානාති, ඉදම්පි සාරිපුත්ත තථාගතස්ස තථාගතබලං හොති. යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

18. පුන ච පරං සාරිපුත්ත තථාගතො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. යම්පි සාරිපුත්ත තථාගතො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, ඉදම්පි සාරිපුත්ත තථාගතස්ස තථාගතබලං හොති යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

19. ඉමානි ඛො සාරිපුත්ත දස තථාගතස්ස තථාගතබලානි, යෙහි බලෙහි සමන්නාගතො තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

එහි දී ද මෙනම් ඇත්තෙකිම් මෙනම් ගොත්‍ර ඇත්තෙකිම් මෙවැනි වර්ණ ඇත්තෙකිම් මෙවැනි සැපදුක් වින්දෙකිම් මෙවැනි ආයු කෙළවර කොට ඇත්තෙකිම් වීමි. ඒ මම එයින් චුත වූයෙම් මෙහි උපන්නෙමි.” මෙසේ ආකාර සහිත වූ උදෙසීම් සහිත වූ නන්වැදෑරුම් පූර්වේනිවාසය සිහි කරයි. ශාරීපුත්‍රය, යම් ඥානයෙකින් තථාගත තෙමේ නන්වැදෑරුම් පූර්වේ-නිවාසය සිහි කෙරේ ද, එනම් ජාති එකක් ද ජාති දෙකක් ද... මෙසේ ආකාර සහිත වූ උදෙසීම් සහිත වූ නන්වැදෑරුම් පෙර විසූ කඳපිළිවෙළ සිහි කෙරේ ද, තථාගත තෙමේ යම් බලයකට පැමිණ ශ්‍රේෂ්ඨස්ථානය ප්‍රතිඥ කෙරේ ද, පිරිස්හි සිංහනාද කෙරේ ද, ශ්‍රේෂ්ඨ ධර්මචක්‍රය පවත්වා ද, මෙ ද තථාගතයන්ගේ තථාගතබලයෙක් වෙයි.

17. තවද ශාරීපුත්‍රය, අනෙකෙක් ඇත. තථාගත තෙමේ මිනිසැස ඉක්මවා පැවැති ඉතා පිරිසිදු පහන් උසස් මනා පැහැ ඇති නො මනා පැහැ ඇති සුගතියට ගිය දුගතියට ගිය සත්ත්වයන් දක්නේ ය: “කම් වූ පරිදි මිය පරලොව ගිය සත්ත්වයන් දන්නේ ය. මේ භවත් සත්ත්වයෝ ඒකාන්ත-යෙන් කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු ය. වාග්දුශ්චරිතයෙන් යුක්ත වූවාහු ය. මනොදුශ්චරිතයෙන් යුක්ත වූවාහු ය. ආර්‍යොපවාදය කළාහු ය. මිථ්‍යාදෘෂ්ටිකයෝ ය. මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදාන ඇත්තෝ ය. ඔහු කය බිඳීමෙන් මරණයෙන් මතු අපාය නම් වූ දුර්ගති නම් වූ විනිපාත නම් වූ නරකයට ඉපදීම් වශයෙන් පැමිණියාහු ය. මේ පින්වත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්ත වූවාහු ය. වාක්සුචරිතයෙන් යුක්ත වූවාහු ය. මනසුචරිතයෙන් යුක්ත වූවාහු ය. ආර්‍යයන්ට උපවාද නො කළාහු ය සම්‍යග්දෘෂ්ටිකයෝ ය. සම්‍යග්දෘෂ්ටිකර්මසමාදාන ඇත්තෝ ය. ඔහු කය බිඳීමෙන් මරණයෙන් මතු සුගති නම් වූ ස්වර්ගලොකයට ඉපදීම් වශයෙන් පැමිණියාහු ය.” මෙසේ මිනිසැස ඉක්මවා පැවැති ඉතා පිරිසිදු දිවැසින් මැරෙන උපදින හීන වූ ප්‍රණීත වූ මනා පැහැති නො මනා පැහැති සුගතියට ගිය දුගතියට ගිය සත්ත්වයන් දැන ගනියි. ශාරීපුත්‍රය, තථාගත තෙමේ යම් බලයකට පැමිණ ශ්‍රේෂ්ඨස්ථානය ප්‍රතිඥ කෙරේ ද, පිරිස්හි සිංහනාද කෙරේ ද, ශ්‍රේෂ්ඨ ධර්මචක්‍රය පවත්වා ද, මෙ ද තථාගතයන්ගේ තථාගතබලයෙක් වෙයි.

18. තවද ශාරීපුත්‍රය, අනෙකෙක් ඇත. තථාගත තෙමේ ආශ්‍රවයන් ක්‍ෂය වීමෙන් ආශ්‍රව නැති චෙතොවිමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් ඉහාත්මයේ දී ම තමා විසින් විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට ඊට පැමිණ වාසය කරන්නේ ය. ශාරීපුත්‍රය, යම් ඥානයෙකින් තථාගත තෙමේ ආශ්‍රවයන් නැති වීමෙන් ආශ්‍රව නැති චෙතොවිමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් ඉහාත්මයේ දී ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට ඊට පැමිණ වාසය කෙරේ ද, ශාරීපුත්‍රය, තථාගත තෙමේ යම් බලයකට පැමිණ ශ්‍රේෂ්ඨස්ථානය ප්‍රතිඥ කෙරේ ද, පිරිස්හි සිංහනාද කෙරේ ද, ශ්‍රේෂ්ඨ ධර්මචක්‍රය පවත්වා ද, මෙ ද තථාගතයන්ගේ තථාගතබලයෙක් වෙයි.

19. ශාරීපුත්‍රය, යම් බඳු බලයෙකින් යුක්ත තථාගත තෙමේ ශ්‍රේෂ්ඨ ස්ථානය ප්‍රතිඥ කෙරේ ද, පිරිස්හි සිංහනාද කෙරේ ද, ශ්‍රේෂ්ඨ ධර්මචක්‍රය පවත්වා ද, මේ ඒ තථාගතයන්ගේ දශ තථාගත බලයෝ යි.

20. යො ඛො මං සාරිපුත්ත එවං ජානන්තං එවං පස්සන්තං එවං වදෙය්‍ය: "නත්ථි සමණස්ස ගොතමස්ස උත්තරි මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො, තක්කපරියාහතං සමණො ගොතමො ධම්මං දෙසෙති වීමංසානුචරිතං සයම්පටිභාන"න්ති. තං සාරිපුත්ත වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. සෙය්‍යථාපි සාරිපුත්ත භික්ඛු සීලසම්පන්නො සමාධිසම්පන්නො පඤ්ඤාසම්පන්නො දිට්ඨෙව ධම්මෙ අඤ්ඤං ආරාධෙය්‍ය, එවං සම්පදමිදං සාරිපුත්ත වදාමි: තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

21. චත්තාරිමානි සාරිපුත්ත තථාගතස්ස වෙසාරජ්ජානි යෙහි වෙසාරජ්ජෙහි සමන්නාගතො තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති, කතමානි චත්තාරි?

22. "සම්මාසම්බුද්ධස්ස තෙ පටිජානතො ඉමෙ ධම්මා අනභිසම්බුද්ධා"ති, තත්‍ර වත මං සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං සහධම්මෙන පටිචොදෙස්සතීති නිමිත්තමෙතං සාරිපුත්ත න සමනුපස්සාමි. එතමහං සාරිපුත්ත නිමිත්තං අසමනුපස්සන්තො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරාමි.

23. "ඛීණාසවස්ස තෙ පටිජානතො ඉමෙ ආසවා අපරික්ඛීණා"ති, තත්‍ර වත මං සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං සහධම්මෙන පටිචොදෙස්සතීති නිමිත්තමෙතං සාරිපුත්ත න සමනුපස්සාමි. එතමහං සාරිපුත්ත නිමිත්තං අසමනුපස්සන්තො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරාමි.

24 "යෙ ඛො පන තෙ අන්තරායිකා ධම්මා වුත්තා තෙ පටිසෙවතො නාලං අන්තරායායා"ති, තත්‍ර වත මං සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචිවා ලොකස්මිං සහධම්මෙන පටිචොදෙස්සතීති නිමිත්තමෙතං සාරිපුත්ත න සමනුපස්සාමි. එතමහං සාරිපුත්ත නිමිත්තං අසමනුපස්සන්තො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරාමි.

25. "යස්ස ඛො පන තෙ අත්ථාය ධම්මො දෙසිතො සො න නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායා"ති, තත්‍ර වත මං සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං සහධම්මෙන පටිචොදෙස්සතීති නිමිත්තමෙතං සාරිපුත්ත න සමනුපස්සාමි. එතමහං සාරිපුත්ත නිමිත්තං අසමනුපස්සන්තො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරාමි.

Free Distribution www.aathaapi.org

20, ශාරිපුත්‍රය, යමෙක් මෙසේ දන්නා මෙසේ දක්නා මට "ශ්‍රමණ ගෞතමයාහට මනුෂ්‍යධර්මයට වැඩි ආර්‍ය්‍යභාවය කිරීමට සමර්‍ථවූ ඥාන-දර්ශනයෙක් නැත. ශ්‍රමණ ගෞතම තෙමේ තර්‍කපර්‍ය්‍යාහත කොට විමසන නුවණින් ලුහුබැඳ ගත්, සිය වැටහුනු දහමක් දෙශනා කෙරේ" ය යි කියා නම් ශාරීපුත්‍රය, ඒ කීම නො හැර ඒ සිත නො හැර ඒ දෘෂ්ටිය බැහැර නොකොට (සිටියේ) ගෙන ඇර සිටුවූවකු සෙයින් නිරයෙහි උපදනේ ය. ශාරීපුත්‍රය, සීලසම්පන්න සමාධිසම්පන්න මහණ යම්සේ ගුහාත්මයේ දී ම රහත් බවට පැමිණේ ද, ශාරිපුත්‍රය, මේ කාරණයද මෙසේය යි කියමි: ඒ කීම නොහැර ඒ දෘෂ්ටිය බැහැර නොකොට (සිටියේ) ගෙන ඇර සිටුවූවකු සෙයින් නරකයෙහි උපදනේ වේ.

21. ශාරිපුත්‍රය, යම් බඳු විශාරදභාවයෙන් යුත් තථාගත තෙමේ ශ්‍රෙෂ්ඨස්ථානය ප්‍රතිඥා කෙරේ ද, පිරිස්හි සිංහනාද කෙරේ ද, ශ්‍රෙෂ්ඨධර්ම චක්‍රය පවත්වා ද, තථාගතයන්ගේ ඒ විශාරද භාවයෝ මේ සතර දෙනෙක් වෙත්. ඒ කවර සතර දෙනෙක යත්:

22. "සම්‍යක්සම්බුද්ධයෙමි යි ප්‍රතිඥා කරන්නා වූ තොප විසින් මේතම් ධර්මයෝ අවබොධ නොකරන ලද්දාහු ය,යි එහි ලා එකාන්තයෙන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලොකයෙහි කිසිවෙක් හෝ සකාරණයෙන් මට ප්‍රතිචොදනා කරන්නේ ය යන මේ කාරණය ශාරිපුත්‍රය, මම නොදක්මි. ශාරීපුත්‍රය, "මම මේ කාරණය නො දක්නෙම් ක්‍ෂෙමයට පැමිණියෙම් නිර්භය භාවයට පැමිණියෙම් විශාරද භාවයට පැමිණියෙම් වාසය කරමි.

23. ක්‍ෂීණාස්‍රවයෙමි යි ප්‍රතිඥා කරන්නා වූ තොප විසින් මේ ආස්‍රවයෝ ක්‍ෂය නොකරන ලදහ"යි එහිලා එකාන්තයෙන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලොක-යෙහි කිසිවෙක් හෝ කරුණු සහිත කොට මට ප්‍රතිචොදනා කරන්නේ ය යන මේ කාරණය ශාරීපුත්‍රය, නො දක්මි. ශාරීපුත්‍රය, මම මේ කාරණය නො දක්නෙම් ක්‍ෂෙමයට පැමිණියෙම් නිර්භය භාවයට පැමිණියෙම් වාසය කරමි.

24. "මාර්ගඵලයන්ට අන්තරායකර යම් ධර්ම කෙනෙක් තොප විසින් ප්‍රකාශ කරන ලද්දාහු ද, ඒ ධර්මයන් සෙවනය කරන්නාහුට අන්තරාය පිණිස නො පවත්නාහු ය" යි එහි ලා එකාන්තයෙන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලොකයෙහි කිසිවෙක් හෝ කරුණු සහිත ව මට ප්‍රතිචොදනා කරන්නේ ය යන මේ කාරණය ශාරීපුත්‍රය, නො දක්මි. ශාරීපුත්‍රය, මම මේ කාරණය නො දක්නෙම් ක්‍ෂෙමයට පැමිණියෙම් නිර්භය භාවයට පැමිණියෙම් විශාරද භාවයට පැමිණියෙම් වාසය කරමි.

25. "තොප විසින් යම් අර්ථයක් පිණිස ධර්මය දෙශනා කරන ලද නම් ඒ ධර්මය ඊට අනු ව පිළිපදින්නහුගේ මැනවින් දුක් කෙළවර කිරීම පිණිස නොවන්නේ යැ"යි එහි ලා එකාන්තයෙන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලොක-යෙහි අන් කිසිවෙක් හෝ කරුණු සහිත ව මට ප්‍රතිචොදනා කරන්නේ ය යන මේ කාරණය ශාරීපුත්‍රය, නො දක්මි. ශාරීපුත්‍රය, මම මේ කාරණය නො දක්නෙම් ක්‍ෂෙමයට පැමිණියෙම් නිර්භය භාවයට පැමිණියෙම් විශාරද භාවයට පැමිණියෙම් වාසය කරමි.

26. ඉමානි ඛො සාරිපුත්ත චත්තාරි තථාගතස්ස වෙසාරජ්ජානි යෙහි වෙසාරජ්ජෙහි සමන්නාගතො තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

27. යො ඛො මං සාරිපුත්ත එවං ජානන්තං එවං පස්සන්තං එවං වදෙය්‍ය: "නත්ථි සමණස්ස ගොතමස්ස උත්තරි මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො, තක්කපරියාහතං සමණො ගොතමො ධම්මං දෙසෙති වීමංසානුචරිතං සයම්පටිභාන"න්ති, තං සාරිපුත්ත වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. සෙය්‍යථාපි සාරිපුත්ත භික්ඛු සීලසම්පන්නො සමාධිසම්පන්නො පඤ්ඤාසම්පන්නො දිට්ඨෙව ධම්මෙ අඤ්ඤං ආරාධෙය්‍ය, එවං සම්පදමිදං සාරිපුත්ත වදාමි: තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

28. අට්ඨ ඛො ඉමා සාරිපුත්ත පරිසා: කතමා අට්ඨ? ඛත්තියපරිසා බ්‍රාහ්මණපරිසා ගහපතිපරිසා සමණපරිසා චාතුම්මහාරාජිකපරිසා තාවතිංසපරිසා මාරපරිසා බ්‍රහ්මපරිසා. ඉමා ඛො සාරිපුත්ත අට්ඨ පරිසා. ඉමෙහි ඛො සාරිපුත්ත චතූහි වෙසාරජ්ජෙහි සමන්නාගතො තථාගතො ඉමා අට්ඨ පරිසා උපසඞ්කමති අජ්ඣොගාහති.

29. අභිජානාමි ඛො පනාහං සාරිපුත්ත අනෙකසතං ඛත්තියපරිසං උපසඞ්කමිතා. තත්‍රපි මයා සන්නිසින්නපුබ්බඤ්චෙව සල්ලපිතපුබ්බඤ්ච සාකච්ඡා ච සමාපජ්ජිතපුබ්බා. තත්‍ර වත මං භයං වා සාරජ්ජං වා ඔක්කමිස්සතීති නිමිත්තමෙතං සාරිපුත්ත න සමනුපස්සාමි. එතම්පහං සාරිපුත්ත නිමිත්තං අසමනුපස්සන්තො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරාමි.

30. අභිජානාමි ඛො පනාහං සාරිපුත්ත අනෙකසතං බ්‍රාහ්මණපරිසං -පෙ- ගහපතිපරිසං -පෙ- සමණපරිසං -පෙ- චාතුම්මහාරාජිකපරිසං -පෙ- තාවතිංසපරිසං -පෙ- මාරපරිසං -පෙ- බ්‍රහ්මපරිසං උපසඞ්කමිතා. තත්‍රපි මයා සන්නිසින්න පුබ්බඤ්චෙව සල්ලපිතපුබ්බඤ්ච සාකච්ඡා ච සමාපජ්ජිතපුබ්බා තත්‍ර වත මං භයං වා සාරජ්ජං වා ඔක්කමිස්සතීති නිමිත්තමෙතං සාරිපුත්ත න සමනුපස්සාමි. එතම්පහං සාරිපුත්ත නිමිත්තං අසමනුපස්සන්තො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරාමි.

31. යො ඛො මං සාරිපුත්ත එවං ජානන්තං එවං පස්සන්තං එවං වදෙය්‍ය: "නත්ථි සමණස්ස ගොතමස්ස උත්තරි මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො, තක්කපරියාහතං සමණො ගොතමො ධම්මං දෙසෙති වීමංසානුචරිතං සයම්පටිභාන"න්ති තං සාරිපුත්ත වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. සෙය්‍යථාපි සාරිපුත්ත භික්ඛු සීලසම්පන්නො සමාධිසම්පන්නො පඤ්ඤාසම්පන්නො දිට්ඨෙව ධම්මෙ අඤ්ඤං ආරාධෙය්‍ය, එවං සම්පදමිදං සාරිපුත්ත වදාමි: තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

Free Distribution www.aathaapi.org

26 ශාරීපුත්‍රය, යම් බඳු විශාරදභාවයෙන් යුක්ත තථාගත තෙමේ ශ්‍රේෂ්ඨස්ථානය ප්‍රතිඥා කෙරේ ද, පිරිස්හි සිංහනාද කෙරේ ද, ශ්‍රේෂ්ඨ ධර්මචක්‍රය පවත්වා ද, මේ සතරහු තථාගතයන්ගේ විශාරදභාවයෝ යි.

27. ශාරීපුත්‍රය, යමෙක් මෙසේ දන්නා වූ මෙසේ දක්නා වූ මට "ශ්‍රමණ ගෞතමයාට මනුෂ්‍යධර්මයට වැඩි ආර්‍ය්‍යභාවය කිරීමට සමර්ථවූ ඥානවිශෙෂයෙක් නැත. ශ්‍රමණ ගෞතම තෙමේ තර්කයෙන් ගැටුණු විමසීම අනුව ගිය සිසුවටහනු ධර්මයක් දෙශනා කෙරේ ය" යි මෙසේ කියා නම් ශාරීපුත්‍රය, ඒ කීම නො හැර ඒ සිත නො හැර ඒ දෘෂ්ටිය බැහැර නොකොට සිටියේ ගෙන අවුත් තබන ලද්දක් සෙයින් නරකයෙහි උපදනේ වෙයි. ශාරීපුත්‍රය, ශීලයෙන් යුක්ත වූ සමාධියෙන් යුක්ත වූ ප්‍රඥාවෙන් යුක්ත වූ මහණෙක් ඉහාත්මයේදී ම යම්සේ අර්හත්වය ලබා ද, මේ කාරණයත් එසේ ය යි කියමි: ශාරීපුත්‍රය. ඒ කීම නොහැර ඒ සිත නොහැර ඒ දෘෂ්ටිය බැහැර නොකොට සිටියේ ගෙන එන ලද්දක් බහා තබන්නාක් මෙන් නරකයෙහි උපදනේ වේ.

28. ශාරීපුත්‍රය, මේ පිරිස් අටෙකි. කවර අටෙක් ද යත්: ක්ෂත්‍රිය පිරිස ය, බමුණුපිරිස ය, ගෘහපති පිරිස ය, මහණ පිරිස ය, සිවුමහරජ පිරිස ය, තව්තිසා පිරිස ය, මාරපිරිස ය, බ්‍රහ්ම පිරිස ය. ශාරීපුත්‍රය, මේ සිවු වෛශාරද්‍යයෙන් යුත් තථාගත තෙමේ මේ අටපිරිස ම කරා එළඹෙයි. පිවිසෙයි

29. ශාරීපුත්‍රය, මම නොයෙක් සියගණන් ක්ෂත්‍රියපිරිස් වෙතට පැමිණියෙමි යි දනිමි. එපිරිස්හි මා හුන්විරූ ද කථාකළ විරූ ද සාකච්ඡා කළවිරූ ද වෙයි. ශාරීපුත්‍රය,එහි දී ඒකාන්තයෙන් මට භයක් හෝ තැති ගැන්මක් හෝ පැමිණෙන්නේ යැ යන මේ කාරණය නො දක්මි. ශාරීපුත්‍රය, මම මේ කාරණය නො දක්නෙම් ක්ෂෙමයට පැමිණියෙමි නිර්භය භාවයට පැමිණියෙමි විශාරදභාවයට පැමිණියෙමි වාසය කරමි.

30. ශාරීපුත්‍රය, මම නොයෙක් සිය ගණන් බමුණු පිරිස් වෙත... ගෘහපතිපිරිස් වෙත... මහණ පිරිස් වෙත... සිවුමහරජපිරිස් වෙත... තව්තිසාපිරිස් වෙත ... මාරපිරිස් වෙත ... බ්‍රහ්මපිරිස් වෙත එළඹියෙමි දනිමි. එහි දීත් මා හුන්විරූ ද කථාකළවිරූ ද සාකච්ඡා කළවිරූ ද වෙයි. ශාරීපුත්‍රය, එපිරිස්හි ඒකාන්තයෙන් මට භයක් හෝ තැති ගැන්මක් හෝ පැමිණෙන්නේ යැ යන මේ කාරණය නො දක්මි. ශාරීපුත්‍රය, මම මේ කාරණය නො දක්නෙම් ක්ෂෙමයට පැමිණියෙමි නිර්භය භාවයට පැමිණියෙමි විශාරද භාවයට පැමිණියෙමි වාසය කරමි.

31 ශාරීපුත්‍රය, මෙසේ දන්නා වූ මෙසේ දක්නා වූ මට යමෙක් "ශ්‍රමණගෞතම තෙමේ තර්කයෙන් ගැටුණු විමසීම අනුව ගිය තමාට වැටහුනු සේ ධර්මය දෙශනා කෙරේය යි කියා නම්, ශාරීපුත්‍රය, ඒ කීම නො හැර ඒ සිත නොහැර ඒ දෘෂ්ටිය බැහැර නො කොට සිටියේ ගෙන ඇර සිටුවූවකු සෙයින් නරකයෙහි උපදනේ වේ. ශාරීපුත්‍රය, ශීලයෙන් යුක්ත වූ සමාධියෙන් යුක්ත වූ ප්‍රඥාවෙන් යුක්ත වූ මහණෙක් තෙමේ ඉහාත්මයේ දී ම යම්සේ (මාර්ගයට අනතුරුව ඵලය මෙන්) අර්හත්වයට පැමිණියේ ද, ශාරීපුත්‍රය ඒ කීම නො හැර ඒ සිත නො හැර ඒ දෘෂ්ටිය බැහැර නො කොට (සිටි යේ) ගෙන එන ලද්දක් බහා තබන්නා සේ (චුතියට අනතුරුව පතිසන්ධිය මෙන්) නරකයෙහි උපදිනේ යැ යන මේ කාරණය ද එසේ යැ යි කියමි.

Free Distribution www.aathaapi.org

32. චතස්සො ඛො ඉමා සාරිපුත්ත යොනියො. කතමා චතස්සො? අණ්ඩජා යොනි, ජලාබුජා යොනි, සංසෙදජා යොනි, ඔපපාතිකා යොනි. කතමා ච සාරිපුත්ත අණ්ඩජා යොනි? යෙ ඛො තෙ සාරිපුත්ත සත්තා අණ්ඩකොසං අභිනිබ්භිජ්ජ ජායන්ති, අයං වුච්චති සාරිපුත්ත අණ්ඩජා යොනි. කතමා ච සාරිපුත්ත ජලාබුජා යොනි? යෙ ඛො තෙ සාරිපුත්ත සත්තා වත්ථිකොසං අභිනිබ්භිජ්ජ ජායන්ති, අයං වුච්චති සාරිපුත්ත ජලාබුජා යොනි. කතමා ච සාරිපුත්ත සංසෙදජා යොනි? යෙ ඛො තෙ සාරිපුත්ත සත්තා පූතිමච්ඡෙ වා ජායන්ති පූතිකුණපෙ වා පූතිකුම්මාසෙ වා චන්දනිකාය වා ඔළිගල්ලෙ වා ජායන්ති, අයං වුච්චති සාරිපුත්ත සංසෙදජා යොනි. කතමා ච සාරිපුත්ත ඔපපාතිකා යොනි? දෙවා නෙරයිකා එකච්චෙ ච මනුස්සා එකච්චෙ ච විනිපාතිකා. අයං වුච්චති සාරිපුත්ත ඔපපාතිකා යොනි. ඉමා ඛො සාරිපුත්ත චතස්සො යොනියො.

33. යො ඛො මං සාරිපුත්ත එවං ජානන්තං එවං පස්සන්තං එවං වදෙය්‍ය: නත්ථි සමණස්ස ගොතමස්ස උත්තරි මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො, තක්කපරියාහතං සමණො ගොතමො ධම්මං දෙසෙති වීමංසානුචරිතං සයම්පටිභානන්ති. තං සාරිපුත්ත වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. සෙය්‍යථාපි සාරිපුත්ත භික්ඛු සීලසම්පන්නො සමාධිසම්පන්නො පඤ්ඤාසම්පන්නො දිට්ඨෙව ධම්මෙ අඤ්ඤං ආරාධෙය්‍ය, එවං සම්පදමිදං සාරිපුත්ත වදාමි: තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

34. පඤ්ච ඛො ඉමා සාරිපුත්ත ගතියො. කතමා පඤ්ච? නිරයො තිරච්ඡානයොනි පෙත්තිවිසයො මනුස්සා දෙවා. නිරයඤ්චාහං සාරිපුත්ත පජානාමි, නිරයගාමිඤ්ච මග්ගං, නිරයගාමිනිඤ්ච පටිපදං. යථාපටිපන්නො ච කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තඤ්ච පජානාමි. තිරච්ඡානයොනිඤ්චාහං සාරිපුත්ත පජානාමි තිරච්ඡානයොනිගාමිඤ්ච මග්ගං, තිරච්ඡානයොනිගාමිනිඤ්ච පටිපදං. යථා පටිපන්නො ච කායස්ස භෙදා පරම්මරණා තිරච්ඡානයොනිං උපපජ්ජති, තඤ්ච පජානාමි. පෙත්තිවිසයඤ්චාහං සාරිපුත්ත පජානාමි පෙත්තිවිසයගාමිඤ්ච මග්ගං පෙත්තිවිසයගාමිනිඤ්ච පටිපදං. යථාපටිපන්නො ච කායස්ස භෙදා පරම්මරණා පෙත්තිවිසයං උපපජ්ජති, තඤ්ච පජානාමි. මනුස්සෙචාහං සාරිපුත්ත පජානාමි, මනුස්සලොකගාමිඤ්ච මග්ගං, මනුස්සලොකගාමිනිඤ්ච පටිපදං. යථාපටිපන්නො ච කායස්ස භෙදා පරම්මරණා මනුස්සෙසු උපපජ්ජති, තඤ්ච පජානාමි. දෙවෙ චාහං සාරිපුත්ත පජානාමි. දෙවලොකගාමිඤ්ච මග්ගං, දෙවලොකගාමිනිඤ්ච පටිපදං. යථාපටිපන්නො ච කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, තඤ්ච පජානාමි-

32. ශාරීපුත්‍රය, මේ යෝනීහු සතර දෙනෙක් වෙත්. කවර සතර දෙනෙක් ද යත්: අණ්ඩජයෝනිය, ජලාබුජයෝනිය, සංසෙදජයෝනිය, ඕපපාතිකයෝනිය යි ශාරීපුත්‍රය, අණ්ඩජයෝනිය කවරේ ද? ශාරීපුත්‍රය, යම් ඒ සත්ත්ව කෙනෙක් බිජුවට බිඳ ගෙන උපදිත් ද, ශාරීපුත්‍රය, මේ අණ්ඩජයෝනිය යි කියනු ලැබේ. ශාරීපුත්‍රය, ජලාබුජයෝනිය කවරය? ශාරීපුත්‍රය, යම් ඒ සත්ත්ව කෙනෙක් වස්තිකෝෂය බිඳ ගෙන උපදිත් ද, ශාරීපුත්‍රය, මේ ජලාබුජ යෝනිය යි කියනු ලැබේ. ශාරීපුත්‍රය, සංසෙදජ-යෝනිය කවරය? ශාරීපුත්‍රය, යම් ඒ සත්ත්ව කෙනෙක් දුගඳමසෙහි හෝ උපදිත් ද, දුගඳ සිරුරෙහි හෝ දුගඳ කොමුයෙහි හෝ මොළෙහි (=අපවිත්‍ර දේ ගලාබස්නා තැන) හෝ ගම්දොර ගවරවළෙහි හෝ උපදිත් ද, ශාරීපුත්‍රය, මේ සංසෙදජ යෝනිය යි කියනු ලැබේ. ශාරීපුත්‍රය, ඕපපාතික යෝනිය කවරය? දෙවියෝ ය, නෙරයික සත්ත්වයෝ ය, ඇතැම් මනුෂ්‍යයෝ ය, ඇතැම් වෛමානිකයෝ ය. ශාරීපුත්‍රය, මේ ඕපපාතික යෝනිය යි කියනු ලැබේ. ශාරීපුත්‍රය, මේ වනාහි සතර යෝනීහු ය.

33. ශාරීපුත්‍රය, මෙසේ දන්නා වූ මෙසේ දක්නා වූ මට යමෙක් "ශ්‍රමණ ගෞතමයාහට මනුෂ්‍යධර්මයට වැඩි ආර්‍යඥානදර්ශන විශෙෂයෙක් නැත. ශ්‍රමණගෞතම තෙමේ තර්කය හා ගැටුණු විමසීමෙන් එළවාගත් ධර්මයක් තමාට වැටහුණු සේ දෙශනා කෙරේ ය" යි මෙසේ කියන්නේ නම්, ශාරීපුත්‍රය, ඒ කීම නො හැර ඒ සිත නො හැර ඒ දෘෂ්ටිය බැහැර නො කොට සිටි හේ ගෙනවුත් බහා තැබුවකු සේ නරකයෙහි උපදනේ වේ. ශාරීපුත්‍රය, ශීලයෙන් යුක්ත වූ සමාධියෙන් යුක්ත වූ ප්‍රඥාවෙන් යුක්ත වූ මහණෙක් ඉහාත්මයේ දී ම යම්සේ අර්හත් බවට පැමිණේ ද, ශාරීපුත්‍රය, ඒ කීම නො හැර ඒ සිත නො හැර ඒ දෘෂ්ටිය බැහැර නො කොට සිටි හේ ගෙනවුත් බහා තැබුවකු සේ නරකයෙහි උපදනේ ය යන මේ කාරණය ද එසේ යැයි කියමි.

34 ශාරීපුත්‍රය, මේ ගති පසෙකි. කවර පසෙක් ද යත්: නරකය, තිරිසන් යෝනිය, ප්‍රේතවිෂය ය, මනුෂ්‍යයෝ ය, දෙවියෝ ය. ශාරීපුත්‍රය, මම නිරයත් නිරයගාමී මාර්ගයත් නිරයගාමිනී ප්‍රතිපදාවත් දනිමි. යම්සේ පිළිපන්නේත් කාබුත් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට පිහිට වූ විවශ ව පතිත වන නිරයෙහි උපදී ද, එය ද දනිමි. ශාරීපුත්‍රය, මම තිරිසන් යෝනිය ද තිරිසන් යෝනියට යන මාර්ගය ද තිරිසන් යෝනියට යන ප්‍රතිපදාව ද දනිමි. යම් සේ පිළිපන්නේත් කාබුත් මරණින් මතු තිරිසන් යෝනියෙහි උපදී ද, එය ද දනිමි. ශාරීපුත්‍රය, මම ප්‍රෙතවිෂය ද ප්‍රෙතවිෂයයට යන මාර්ගය ද ප්‍රෙතවිෂයයට යන ප්‍රතිපදාව ද දනිමි· යම් සේ පිළිපන්නේත් කාබුත් මරණින් මතු ප්‍රෙතවිෂයයෙහි උපදී ද, එය ද දනිමි. ශාරීපුත්‍රය, මම මනුෂ්‍යයනුත් මනුෂ්‍යලොකයට යන මාර්ගයත් මනුෂ්‍යලොකයට යන ප්‍රතිපදාවත් දනිමි. යම්සේ පිළිපන්නේත් කාබුත් මරණින් මතු මනුෂ්‍යයන් විෂයයෙහි උපදී ද, එය ද දනිමි. ශාරීපුත්‍රය, මම දෙවියන් ද දෙවලොකයට යන මාර්ගය ද දෙවලොකයට යන ප්‍රතිපදාව ද දනිමි. යම්සේ පිළිපන්නේත් කාබුත් මරණින් මතු සුගති නම් ස්වර්ගලොකයෙහි උපදී ද, එය ද දනිමි.

නිබ්බානඤ්චාහං සාරිපුත්ත පජානාමි නිබ්බානගාමිඤ්ච මග්ගං නිබ්බාන-ගාමිනිඤ්ච පටිපදං. යථාපටිපන්නො ච ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, තඤ්ච පජානාමි.

35. ඉධාහං සාරිපුත්ත එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරියති තඤ්ච මග්ගං සමාරූළ්හො යථා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිස්සතීති. තමෙනං පස්සාමි අපරෙන සමයෙන දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නං එකන්තදුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියමානං. සෙය්‍යථාපි සාරිපුත්ත අඞ්ගාරකාසු සාධිකපොරිසා පූරඞ්ගාරානං වීතච්චිකානං වීතධූමානං, අථ පුරිසො ආගච්ඡෙය්‍ය ඝම්මාභිතත්තො ඝම්මපරෙතො කිලන්තො තසිතො පිපාසිතො එකායනෙන මග්ගෙන තමෙව අඞ්ගාරකාසුං පණිධාය. තමෙනං චක්ඛුමා පුරිසො දිස්වා එවං වදෙය්‍ය: තථායං භවං පුරිසො පටිපන්නො තථා ච ඉරියති තඤ්ච මග්ගං සමාරූළ්හො යථා ඉමං යෙව අඞ්ගාරකාසුං ආගමිස්සතීති. තමෙනං පස්සෙය්‍ය අපරෙන සමයෙන තස්සා අඞ්ගාරකාසුයා පතිතං එකන්ත-දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියමානං. එවමෙව ඛො අහං සාරිපුත්ත ඉධෙකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරියති තඤ්ච මග්ගං සමාරූළ්හො යථා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිස්සතීති. තමෙනං පස්සාමි අපරෙන සමයෙන දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නං එකන්තදුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියමානං.

36 ඉධ පනාහං සාරිපුත්ත එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: 'තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරියති තඤ්ච මග්ගං සමාරූළ්හො යථා කායස්ස භෙදා පරම්මරණා තිරච්ඡානයොනිං උපපජ්ජිස්සතීති. තමෙනං පස්සාමි අපරෙන සමයෙන දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන කායස්ස භෙදා පරම්මරණා තිරච්ඡාන-යොනිං උපපන්නං දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියමානං. සෙය්‍යථාපි සාරිපුත්ත ගූථකූපො සාධිකපොරිසො පූරො ගූථස්ස, අථ පුරිසො ආගච්ඡෙය්‍ය ඝම්මාභිතත්තො ඝම්මපරෙතො කිලන්තො තසිතො පිපාසිතො එකායනෙන මග්ගෙන තමෙව ගූථකූපං පණිධාය. තමෙනං චක්ඛුමා පුරිසො දිස්වා එවං වදෙය්‍ය: තථායං භවං පුරිසො පටිපන්නො තථා ච ඉරියති තඤ්ච මග්ගං සමාරූළ්හො යථා ඉමං යෙව ගූථකූපං ආගමිස්සතීති. තමෙනං පස්සෙය්‍ය අපරෙන සමයෙන තස්මිං ගූථකූපෙ පතිතං දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියමානං-

ශාරීපුත්‍රය, මම ගතිනිස්සරණය වූ නිවන ද නිවනට යන මාර්ගය ද නිවනට යන ප්‍රතිපදාව ද දනිමි. යම්සේ පිළිපන්නේත් ආස්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් නිරාස්‍රව වූ චෙතොවිමුක්තිය ද ප්‍රඥාවිමුක්තිය ද ඉහාත්මයේ දී ම තමා පිසින් විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කෙරේ ද, එය ද දනිමි.

35. ශාරීපුත්‍රය, මම මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයකු මෙසේ මා සිතින් ඔහු සිත පිරිසිඳ දනිමි: කාබුත් මරණින් මතු අපාය වූ දුර්ගති වූ විවස ව පතිත වන නිරයෙහි යම් සේ උපදින්නේ ද, එසේ මේ පුද්ගල තෙමේ පිළිපන්නේ ය. එසේත් ඉරියවු පවත්වයි. ඒ මාර්ගයට ද නැඟී සිටියේ යැ යි. පසු කලෙක මිනිසැස ඉක්ම පිරිසිදු වූ දිවැසින් කාබුත් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට පිහිට වූ විවස ව පතිත වන නිරයෙහි උපන් එකාන්තයෙන් දුක් වූ තියුණු වූ රළු වෙදනා විඳින ඒ මේ පුද්ගලයා දකිමි. ශාරීපුත්‍රය, පහ වූ ගිනිසිළු ඇති පහ වූ දුම් ඇති ගිනිඅඟුරෙන් පිරුණු පුරුෂ ප්‍රමාණයට අධික වූ අඟුරුවළෙක් යම් සේ වේ ද, එකල්හි ග්‍රීෂ්මයෙන් තැවුණු ග්‍රීෂ්මයෙන් පෙළුණු ක්ලාන්ත වූ හටගත් ජලතෘෂ්ණා ඇති හටගත් පවස් ඇති පුරුෂයෙක් ඒ අඟුරුවළ ම උදෙසා ඒට ම වැටී තිබෙන එක ම මඟින් එන්නේ නම්, ඇස් ඇති පුරුෂයෙක් ඒ මොහු දැක යම්සේ මේ අඟුරු වළට ම එන්නේ ද, එසේ මේ පින්වත් පුරුෂ තෙමේ පිළිපන්නේ ය. එසේ ඉරියවු පවත්වයි. ඒ මාර්ගයට ද නැඟී සිටියේ යැ යි මෙසේ කියන්නේ ය. පසු කාලයෙහි ඒ අඟුරුවළට වැටුණු එකාන්තයෙන් දුක් වූ තියුණු වූ රළු වූ වෙදනා විඳින ඒ මොහු දක්නේ ය. ශාරීපුත්‍රය, මම එපරිද්දෙන් ම මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයකු මෙසේ මාගේ සිතින් ඔහුගේ සිත පිරිසිඳ දනිමි: මේ පුද්ගල තෙමේ යම් සේ කාබුත් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට පිහිට වූ විවස ව පතිත වන නිරයෙහි උපදින්නේ ද, එසේ පිළිපන්නේ ය. එසේත් ඉරියවු පවත්වයි. ඒ මාර්ගයට ද නැඟී සිටියේ යැයි. පසු කලෙක මිනිසැස ඉක්ම දිවැසින් කාබුත් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට පිහිට වූ විවස ව පතිත වන නිරයෙහි උපන් එකාන්තයෙන් දුක් වූ තියුණු වූ රළු වූ වෙදනා විඳින ඒ මොහු දකිමි.

36. ශාරීපුත්‍රය, මම මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයකු මෙසේ මාගේ සිතින් ඔහුගේ සිත පිරිසිඳ දනිමි. මේ පුද්ගල තෙමේ යම්සේ කාබුත් මරණින් මතු තිරිසන් යොනියෙහි උපදින්නේ ද, එසේ පිළිපන්නේ ය. එසේ ඉරියවු පවත්වයි. ඒ මාර්ගයට ද නැඟී සිටියේයැ යි. පසු කාලයෙහි පිරිසිදු වූ මිනිසැස ඉක්ම දිවැසින් කාබුත් මරණින් මතු තිරිසන් යොනියෙහි උපන් දුක් වූ තියුණු වූ රළු වූ වෙදනා විඳින ඒ මොහු දකිමි. ශාරීපුත්‍රය, පුරුෂප්‍රමාණයට අධික වූ අසුචියෙන් පිරුණු අසුචිවළෙක් යම්සේ වේ ද, එකල්හි ග්‍රීෂ්මයෙන් තැවුණු ග්‍රීෂ්මයෙන් පෙළුණු ක්ලාන්ත වූ හටගත් ජලතෘෂ්ණා ඇත්තා වූ හටගත් පවස් ඇති පුරුෂයෙක් ඒට ම වැටී තිබෙන එක ම මඟින් එ ම අසුචි වළ ම උදෙසා එන්නේ නම් ඇස් ඇති පුරුෂයෙක් ඒ මොහු දැක මේ පින්වත් පුරුෂ තෙම යම් සේ මේ අසුචිවළට එන්නේ ද, එසේ පිළිපන්නේ ය එසේත් ඉරියවු පවත්වයි. ඒ මාර්ගයට ද නැඟී සිටියේ ය යි මෙසේ කියන්නේ ය. පසු කලෙක ඒ අසුචිවළෙහි වැටුණු දුක් වූ තියුණු වූ රළු වූ වෙදනා විඳින ඒ මොහු දක්නේ ය. -

එවමෙව ඛො අහං සාරිපුත්ත ඉධෙකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරීයති, තඤ්ච මග්ගං සමාරූළ්හො, යථා කායස්ස භෙදා පරම්මරණා තිරච්ඡානයොනිං උපපජ්ජිස්සතීති. තමෙනං පස්සාමි අපරෙන සමයෙන දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන කායස්ස භෙදා පරම්මරණා තිරච්ඡානයොනිං උපපන්නං දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියමානං.

37. ඉධ පනාහං සාරිපුත්ත එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරීයති. තඤ්ච මග්ගං සමාරූළ්හො, යථා කායස්ස භෙදා පරම්මරණා පෙත්තිවිසයං උපපජ්ජිස්සතීති. තමෙනං පස්සාමි අපරෙන සමයෙන දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන කායස්ස භෙදා පරම්මරණා පෙත්තිවිසයං උපපන්නං දුක්ඛබහුලා වෙදනා වෙදියමානං. සෙය්‍යථාපි සාරිපුත්ත රුක්ඛො විසමෙ භූමිභාගෙ ජාතො තනුපත්තපලාසො කබරච්ඡායො, අථ පුරිසො ආගච්ඡෙය්‍ය ඝම්මාභිතත්තො ඝම්මපරෙතො කිලන්තො තසිතො පිපාසිතො එකායනෙන මග්ගෙන තමෙව රුක්ඛං පණිධාය. තමෙනං චක්ඛුමා පුරිසො දිස්වා එවං වදෙය්‍ය: තථායං භවං පුරිසො පටිපන්නො තථා ච ඉරීයති, තඤ්ච මග්ගං සමාරූළ්හො, යථා ඉමං යෙව රුක්ඛං ආගමිස්සතීති. තමෙනං පස්සෙය්‍ය අපරෙන සමයෙන තස්ස රුක්ඛස්ස ඡායාය නිසින්නං වා නිපන්නං වා දුක්ඛබහුලා වෙදනා වෙදියමානං. එවමෙව ඛො අහං සාරිපුත්ත ඉධෙකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරීයති, තඤ්ච මග්ගං සමාරූළ්හො, යථා කායස්ස භෙදා පරම්මරණා පෙත්තිවිසයං උපපජ්ජිස්සතීති. තමෙනං පස්සාමි අපරෙන සමයෙන දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත-මානුසකෙන කායස්ස භෙදා පරම්මරණා පෙත්තිවිසයං උපපන්නං දුක්ඛබහුලා වෙදනා වෙදියමානං.

38. ඉධ පනාහං සාරිපුත්ත එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරීයති, තඤ්ච මග්ගං සමාරූළ්හො, යථා කායස්ස භෙදා පරම්මරණා මනුස්සෙසු උපපජ්ජිස්සතීති. තමෙනං පස්සාමි අපරෙන සමයෙන දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන කායස්ස භෙදා පරම්මරණා මනුස්සෙසු උපපන්නං සුඛබහුලා වෙදනා වෙදියමානං. සෙය්‍යථාපි සාරිපුත්ත රුක්ඛො සමෙ භූමිභාගෙ ජාතො බහලපත්තපලාසො සන්දච්ඡායො, අථ පුරිසො ආගච්ඡෙය්‍ය ඝම්මාභිතත්තො ඝම්මපරෙතො කිලන්තො තසිතො පිපාසිතො එකායනෙන මග්ගෙන තමෙව රුක්ඛං පණිධාය. තමෙනං චක්ඛුමා පුරිසො දිස්වා එවං වදෙය්‍ය: තථායං භවං පුරිසො පටිපන්නො තථා ච ඉරීයති, තඤ්ච මග්ගං සමාරූළ්හො, යථා ඉමං යෙව රුක්ඛං ආගමිස්සතීති. තමෙනං පස්සෙය්‍ය අපරෙන සමයෙන තස්ස රුක්ඛස්ස ඡායාය නිසින්නං වා නිපන්නං වා සුඛබහුලා වෙදනා වෙදියමානං.-

ශාරීපුත්‍රය, එසේ ම මම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයකු මෙසේ මාගේ සිතින් ඔහුගේ සිත පිරිසිඳ දනිමි: මේ පුද්ගල තෙම යම්සේ කාබුන් මරණින් මතු තිරිසන් යොනියෙහි උපදින්නේ ද, එසේ පිළිපන්නේ ය. එසේ ඉරියවු පවත්වයි. ඒ මාර්‍ගයට ද නැඟී සිටියේ ය යි. පසු කලෙක පිරිසිදු වූ මිනිසැස ඉක්මි දිවැසින් කාබුන් මරණින් මතු තිරිසන්යොනියෙහි උපන් දුක් වූ තියුණු වූ රළු වූ වෙදනා විඳින ඒ මොහු දකිමි.

37. ශාරීපුත්‍රය, මම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයකු මෙසේ මාගේ සිතින් ඔහුගේ සිත පිරිසිඳ දනිමි: මේ පුද්ගල තෙම යම්සේ කාබුන් මරණින් මතු ප්‍රෙතවිෂයයෙහි උපදින්නේ ද එසේ පිළිපන්නේ ය. එසේ ඉරියවු පවත්වයි ඒ මාර්‍ගයට ද නැඟී සිටියේ යැ යි. පසු කාලයෙහි පිරිසිදු වූ මිනිසැස ඉක්මි දිවැසින් කාබුන් මරණින් මතු ප්‍රෙතවිෂයයෙහි උපන් දුක් බහුල වෙදනා විඳින ඒ මොහු දකිමි. ශාරීපුත්‍රය, විෂමභූමියෙක හටගත් තුනී කොළ පත් ඇති විරල සෙවණ ඇති රුකෙක් යම් සේ වේ ද, එකල්හි ග්‍රීෂ්මයෙන් ඉතා තැවුණු ග්‍රීෂ්මයෙන් පෙළුණු ක්ලාන්ත වූ හටගත් ජලතෘෂ්ණා ඇති හටගත් පවස් ඇති පුරුෂයෙක් ඊට ම වැටී තිබෙන එක ම මඟින් ඒ රුකම උදෙසා එන්නේ නම්, ඇස් ඇති පුරුෂයෙක් ඒ මොහු දැක "මේ පින්වත් පුරුෂ තෙමේ යම් සේ මේ රුක කරා එන්නේ ද එසේ පිළිපන්නේ ය. එසේත් ඉරියවු පවත්වයි. ඒ මාර්‍ගයට ද නැඟී සිටියේ යැ"යි මෙසේ කියන්නේ ය. පසු කලෙක ඒ රුක් සෙවණෙහි හුන්නා වූ හෝ හොත්තා වූ හෝ දුක් බහුල වෙදනා විඳින ඒ මොහු දක්නේ ය. ශාරීපුත්‍රය, එසේ ම මම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයකු මෙසේ මාගේ සිතින් ඔහුගේ සිත පිරිසිඳ දනිමි. මේ පුද්ගල තෙම කාබුන් මරණින් මතු ප්‍රෙතවිෂයයෙහි උපදින්නේ ද එසේ පිළිපන්නේ ය. එසේ ත් ඉරියවු පවත්වයි. ඒ මාර්‍ගයට ද නැඟී සිටියේ යැයි පිරිසිදු වූ මිනිසැස ඉක්මි දිවැසින් පසු කලෙක කාබුන් මරණින් මතු ප්‍රෙතවිෂයයෙහි උපන් දුක් බහුල වෙදනා විඳින ඒ මොහු දකිමි.

38 ශාරීපුත්‍රය, මම මෙ ලොකයෙහි ඇතැම් පුද්ගලයකු මාගේ සිතින් ඔහුගේ සිත පිරිසිඳ දනිමි: මේ පුද්ගල තෙමේ යම්සේ කාබුන් මරණින් මතු මනුෂ්‍යයන් විෂයයෙහි උපදින්නේ ද එසේ පිළිපන්නේ ය. එසේත් ඉරියවු පවත්වයි. ඒ මාර්‍ගයට ද නැඟී සිටියේ යැයි. පසු කලෙක පිරිසිදු වූ මිනිසැස ඉක්මි දිවැසින් කාබුන් මරණින් මතු මනුෂ්‍යයන් විෂයයෙහි උපන් සැප බහුල වෙදනා විඳින ඒ මොහු දකිමි. ශාරීපුත්‍රය, සමභූමිභාගයෙහි හටගත් බොල් කොළ පත් ඇති ඝන සෙවණැති රුකෙක් යම් සේ වේ ද, එකල්හි ග්‍රීෂ්මයෙන් ඉතා තැවුණු පවස් ඇති පුරුෂයෙක් ඊට ම වැටී තිබෙන එක ම මඟින් ඒ රුක ම උදෙසා එන්නේ නම්, ඇස් ඇති පුරුෂයෙක් ඒ මොහු දැක "මේ පින්වත් පුරුෂ තෙමේ යම්සේ මේ රුක කරා එන්නේ ද, එසේ පිළිපන්නේ ය. එසේත් ඉරියවු පවත්වයි ඒ මාර්‍ගයට ද නැඟී සිටියේ ය" යි මෙසේ කියන්නේ ය. පසු කලෙක ඒ රුක්සෙවණෙහි හුන්නා වූ හෝ හොත්තා වූ හෝ සැප බහුල වෙදනා විඳින ඒ මොහු දක්නේ ය-

එවමෙව ඛො අහං සාරිපුත්ත ඉධෙකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරියති තඤ්ච මග්ගං සමාරූළ්හො යථා කායස්ස භෙදා පරම්මරණා මනුස්සෙසු උපපජ්ජිස්සතීති, තමෙනං පස්සාමි අපරෙන සමයෙන දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන කායස්ස භෙදා පරම්මරණා මනුස්සෙසු උපපන්නං සුඛබහුලා වෙදනා වෙදියමානං.

39. ඉධ පනාහං සාරිපුත්ත එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරියති තඤ්ච මග්ගං සමාරූළ්හො යථා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සතීති. තමෙනං පස්සාමි අපරෙන සමයෙන දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නං එකන්තසුඛා වෙදනා වෙදියමානං. සෙය්‍යථාපි සාරිපුත්ත පාසාදො, තත්‍රස්ස කූටාගාරං උල්ලිත්තාවලිත්තං නිවාතං ඵුසිතග්ගළං පිහිතවාතපානං. තත්‍රස්ස පල්ලඞ්කො ගොනකත්ථතො පටිකත්ථතො පටලිකත්ථතො කාදලිමිගපවරපච්චත්ථරණො සඋත්තරච්ඡදො උභතොලොහිතකූපධානො. අථ පුරිසො ආගච්ඡෙය්‍ය ඝම්මාභිතත්තො ඝම්මපරෙතො කිලන්තො තසිතො පිපාසිතො එකායනෙන මග්ගෙන තමෙව පාසාදං පණිධාය. තමෙනං චක්ඛුමා පුරිසො දිස්වා එවං වදෙය්‍ය: තථායං භවං පුරිසො පටිපන්නො තථා ච ඉරියති තඤ්ච මග්ගං සමාරූළ්හො යථා ඉමංයෙව පාසාදං ආගමිස්සතීති. තමෙනං පස්සෙය්‍ය, අපරෙන සමයෙන තස්මිං පාසාදෙ තස්මිං කූටාගාරෙ තස්මිං පල්ලඞ්කෙ නිසින්නං වා නිපන්නං වා එකන්තසුඛා වෙදනා වෙදියමානං. එවමෙව ඛො අහං සාරිපුත්ත ඉධෙකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරියති. තඤ්ච මග්ගං සමාරූළ්හො යථා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සතීති. තමෙනං පස්සාමි අපරෙන සමයෙන දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත-මානුසකෙන කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නං එකන්තසුඛා වෙදනා වෙදියමානං.

40. ඉධ පනාහං සාරිපුත්ත එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරියති තඤ්ච මග්ගං සමාරූළ්හො යථා ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤා-විමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතීති. තමෙනං පස්සාමි අපරෙන සමයෙන ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තං එකන්තසුඛා වෙදනා වෙදියමානං. –

ශාරිපුත්‍රය, එසේ ම මම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයකු මෙසේ මාගේ සිතින් ඔහුගේ සිත පිරිසිඳ දනිමි: මේ පුද්ගල තෙමෙ යම්සේ කාබුන් මරණින් මතු මනුෂ්‍යයන් විෂයයෙහි උපදින්නේ ද එසේ පිළිපන්නේ ය. එසේ ත් ඉරියවු පවත්වයි. ඒ මාර්ගයට ද නැඟි සිටියේ යයි. පසු කලෙක පිරිසිදු වූ මසැස ඉක්මි දිවැසින් කාබුන් මරණින් මතු මනුෂ්‍යයන් විෂයයෙහි උපන් සැප බහුල වේදනා විඳින ඒ මොහු දකිමි.

39. ශාරිපුත්‍රය, මම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයකු මෙසේ මාගේ සිතින් ඔහුගේ සිත පිරිසිඳ දනිමි: මේ පුද්ගල තෙම යම් සේ කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයෙහි උපදින්නේ ද, එසේ පිළිපන්නේ ය. එසේ ත් ඉරියවු පවත්වයි. ඒ මාර්ගයට ද නැඟි සිටියේ යැයි. පසු කලෙක පිරිසිදු වූ මිනිසැස ඉක්මි දිවැසින් කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයෙහි උපන් ඒකාන්තයෙන් සැප වූ වේදනා විඳින ඒ මොහු දකිමි. ශාරිපුත්‍රය, යම් සේ ප්‍රාසාදයෙක් වේ ද, එහි ඇතුලත පිටත අලෙවු දුන් වැලහු වං ඇති පැහැහු අගුළු ඇති, යෙදූ වාකවුළු ඇති කුළු-ගෙයෙක් වන්නේ ද, එහි අතුල කොඳු පලස් ඇති අතුල සුදු එළලොම්පලස් ඇති අතුල සතපුප් එළලොම් පලස් ඇති අතුල කෙහෙල්මුවසමින් කළ උතුම් පසතුරුණු ඇති බැඳි රතු උඩුවියන් ඇති දෙපස තැබූ ලේවත් කන්වයින් ඇති පලගෙක් වන්නේ ද, එකල්හි ග්‍රීෂ්මයෙන් ඉතා තැවුණු ග්‍රීෂ්මයෙන් පෙළුණු ක්ලාන්ත වූ හටගත් ජලතෘෂ්ණා ඇති හටගත් පවස් ඇති පුරුෂයෙක් ඊට ම වැටුණු එක ම මඟින් ඒ ප්‍රාසාදය ම උදෙසා එන්නේ නම්, ඇස් ඇති පුරුෂයෙක් ඒ මොහු දැක 'මේ පින්වත් පුරුෂ තෙම යම් සේ මේ ප්‍රාසාදය කරා එන්නේ ද, එසේ පිළිපන්නේ ය. එසේත් ඉරියවු පවත්වයි. ඒ මාර්ගයට ද නැඟී යේ යැ'යි මෙසේ කියන්නේ ද, පසු කලෙක ඒ ප්‍රාසාදයෙහි ඒ කුළුගෙහි ඒ පලගෙහි හුන්නා වූ හෝ හොත්තා වූ හෝ ඒකාන්තයෙන් සැප වේදනා විඳින ඒ මොහු දකී ද, ශාරිපුත්‍රය, එසේ ම මම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයකු මෙසේ මාගේ සිතින් ඔහුගේ සිත පිරිසිඳ දනිමි: මේ පුද්ගල තෙමේ යම්සේ කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයෙහි උපදින්නේ ද එසේ පිළිපන්නේ ය. එසේත් ඉරියවු පවත්වයි. ඒ මාර්ගයට ද නැඟී සිටියේ යැ යි. පසු කලෙක පිරිසිදු වූ මිනිසැස ඉක්මි දිවැසින් කාබුන් මරණින් මතු සුගති නම් ස්වර්ගලොකයෙහි උපන් ඒකාන්ත සැප වේදනා විඳින ඒ මොහු දකිමි.

40. ශාරිපුත්‍රය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයකු මෙසේ මාගේ සිතින් ඔහුගේ සිත පිරිසිඳ දනිමි: මේ පුද්ගල තෙමේ යම්සේ ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් ආස්‍රව රහිත වූ අර්හත්ඵලසමාධිය ද අර්හත්ඵල ප්‍රඥාව ද තමා විසින් මෙලොව දී ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කරන්නේ ද, එසේ පිළිපන්නේ ය. එසේත් ඉරියවු පවත්වයි. ඒ මාර්ගයට ද නැඟි සිටියේ යැ යි. පසු කලෙක ආස්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආස්‍රව රහිත වූ අර්හත්ඵල සමාධිය ද අර්හත්ඵල ප්‍රඥාව ද මෙලොවමයේ දීම තමා විසින් විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කරන ඒකාන්ත සැප වේදනා විඳින ඒ මොහු දකිමි.-

සෙය්‍යථාපි සාරිපුත්ත පොක්ඛරණී අච්ඡොදිකා සාතොදිකා සීතොදිකා සෙතකා සුපතිත්ථා රමණීයා, අවිදූරෙ චස්සා තීරෙ වනසණ්ඩො, අථ පුරිසො ආගච්ඡෙය්‍ය ඝම්මාභිතත්තො ඝම්මපරෙතො කිලන්තො තසිතො පිපාසිතො එකායනෙන මග්ගෙන තමෙව පොක්ඛරණිං පණිධාය. තමෙනං චක්ඛුමා පුරිසො දිස්වා එවං වදෙය්‍ය: තථායං භවං පුරිසො පටිපන්නො තථා ච ඉරියති, තඤ්ච මග්ගං සමාරූළ්හො, යථා ඉමංයෙව පොක්ඛරණිං ආගමිස්සතීති. තමෙනං පස්සෙය්‍ය අපරෙන සමයෙන තං පොක්ඛරණිං ඔගාහෙත්වා නහායිත්වා පිවිත්වා ච සබ්බදරථකිලමථපරිළාහං පටිප්පස්සම්භෙත්වා පච්චුත්තරිත්වා තස්මිං වනසණ්ඩෙ නිසින්නං වා නිපන්නං වා එකන්තසුඛා වෙදනා වෙදියමානං. එවමෙව ඛො අහං සාරිපුත්ත ඉධෙකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරියති, තඤ්ච මග්ගං සමාරූළ්හො, යථා ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතීති. තමෙනං පස්සාමි අපරෙන සමයෙන ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තං එකන්තසුඛා වෙදනා වෙදියමානං. ඉමා ඛො සාරිපුත්ත පඤ්ච ගතියො.

41. යො ඛො මං සාරිපුත්ත එවං ජානන්තං එවං පස්සන්තං එවං වදෙය්‍ය: "නත්ථි සමණස්ස ගොතමස්ස උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො. තක්කපරියාහතං සමණො ගොතමො ධම්මං දෙසෙති වීමංසානුචරිතං සයම්පටිභානන්ති." තං සාරිපුත්ත වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. සෙය්‍යථාපි සාරිපුත්ත භික්ඛු සීලසම්පන්නො සමාධිසම්පන්නො පඤ්ඤාසම්පන්නො දිට්ඨෙව ධම්මෙ අඤ්ඤං ආරාධෙය්‍ය, එවං සම්පදමිදං සාරිපුත්ත වදාමි: තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

42. අභිජානාමි ඛො පනාහං සාරිපුත්ත චතුරඞ්ගසමන්නාගතං බ්‍රහ්මචරියං චරිතා: තපස්සිස්සුදං හොමි පරමතපස්සී. ලූඛස්සුදං හොමි පරමලූඛො. ජෙගුච්ඡී සුදං හොමි පරමජෙගුච්ඡී. පවිවිත්තස්සුදං හොමි පරමපවිවිත්තො.

ශාරීපුත්‍රය, පහන් දිය ඇති මිහිරි දිය ඇති සිහිල් දිය ඇති සුදු වැලිතලා ඇති මනා ව පිහිටි තොට ඇති සිත්කලු පොකුණෙක් යම් සේ වේ ද, එයට නුදුරෙහි ඝන වන ලැහැබෙක් වේ ද, එකල්හි ග්‍රීෂ්මයෙන් තැවුණු ග්‍රීෂ්මයෙන් පෙළුණු කලාන්ත වූ හටගත් ජලතෘෂ්ණා ඇති හටගත් පවස් ඇති පුරුෂයෙක් ඒට ම යන එක ම මගින් ඒ පොකුණ ම උදෙසා එන්නේ නම්, ඇස් ඇති පුරුෂයෙක් ඒ මොහු දැක "මේ පින්වත් පුරුෂ තෙම යම් සේ මේ පොකුණ කරා එන්නේ ද, එසේ පිළිපන්නේ ය. එසේ ඉරියවු පවත්වයි. ඒ මාර්ගයට ද නැඟී සිටියේ යැ" යි මෙසේ කියන්නේ ය. පසු කලෙක ඒ පොකුණට බැස ස්නානය කොට පැන් බී සියලු වෙහෙස විඩා දුර්වලි සන්හිඳුවා ඉන් ගොඩ නැඟී ඒ වනලැහැබෙහි හුන්නා වූ හෝ හොත්තා වූ හෝ ඒකාන්ත සැප වේදනා විඳින ඒ මොහු දක්නේ ද, ශාරීපුත්‍රය, එසේ ම මම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයකු මෙසේ මාගේ සිතින් ඔහුගේ සිත පිරිසිඳ දනිමි: "මේ පුද්ගල තෙමේ යම් සේ ආස්‍රවයන් ක්‍ෂය කිරී- මෙන් ආස්‍රව රහිත වූ අර්හත්ඵල සමාධිය ද අර්හත්ඵල ප්‍රඥාව ද ඉහාත්මයේ දී ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට එයට පැමිණ වාසය කරන්නේ ද, එසේ පිළිපන්නේ ය. එසේත් ඉරියවු පවත්වයි. ඒ මාර්ගයට ද නැඟී සිටියේ යැ" යි. පසු කලෙක ආස්‍රව රහිත වූ අර්හත්ඵල සමාධිය ද අර්හත්ඵල ප්‍රඥාව ද ඉහාත්මයේ දී ම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට එයට පැමිණ වාසය කරන ඒකාන්ත සැප වේදනා විඳින ඒ මොහු දකිමි. ශාරීපුත්‍රය, මේ පස් ගතීහු යි.

41. ශාරීපුත්‍රය, යමෙක් මෙසේ දන්නා වූ මෙසේ දක්නා වූ මට "ශ්‍රමණ ගෞතමයාහට මිනිස් දහමින් වැඩි ආර්‍ය්‍යභාවය කිරීමට සමර්ථ ඥානදර්ශන විශෙෂයෙක් නැත. ශ්‍රමණ ගෞතම තෙමේ තර්ක හා ගැටුණු විමසීමෙන් එළවාගත් ධර්මයක් තමාට වැටහුණු සේ දෙශනා කෙරේ ය" යි. මෙසේ කියන්නේ නම්, ශාරීපුත්‍රය, ඒ කීම නො හැර ඒ සිත නො හැර ඒ දෘෂ්ටිය බැහැර නො කොට සිටි සේ ගෙන වුත් තැබුවකු සේ නිරයෙහි උපදනේ වෙයි. ශාරීපුත්‍රය, ශීලයෙන් යුක්ත වූ සමාධියෙන් යුක්ත වූ ප්‍රඥාවෙන් යුක්ත වූ මහණෙක් ඉහාත්මයේදී ම අර්හත්ත්වයට යම් සේ පැමිණෙන්නේ ද, ශාරීපුත්‍රය, ඒ කීම නො හැර ඒ සිත නො හැර ඒ දෘෂ්ටිය බැහැර නො කොට සිටි සේ ගෙන එන ලද්දක් තබන්නා සේ නිරයෙහි උපදනේ යැ යන මේ කාරණය ද එසේ යැ යි කියමි.

42. ශාරීපුත්‍රය, මම අඞ්ග සතරෙකින් යුක්ත වූ බඹසර හැසිරීම වීර්‍ය්‍යය කෙළෙම් සි දනිමි: තපස් ඇත්තෙම් තපස් ඇත්තවුන් අතුරෙන් උතුම් වෙමි. රළු පිළිවෙත් ඇත්තෙම් රළු පිළිවෙත් ඇත්තවුන් අතුරෙන් උතුම් වෙමි. පාපයට පිළිකුල් කරන්නෙම් පාපයට පිළිකුල් කරන්නවුන් අතුරෙන් උතුම් වෙමි. ප්‍රකර්ෂවිවෙක ඇත්තෙම් ප්‍රකර්ෂවිවෙක ඇත්තවුන් අතුරෙන් උතුම් වෙමි.

43. තත්‍රාස්සු මෙ ඉදං සාරිපුත්ත තපස්සිතාය හොති: අචෙලකො හොමි මුත්තාචාරො හත්ථාපලෙඛනො, න එහිභදන්තිකො න තිට්ඨභදන්තිකො. න අභිහටං න උද්දිස්සකටං න නිමන්තනං සාදියාමි. සො න කුම්භිමුඛා පටිග්ගණ්හාමි, න කළොපිමුඛා පටිග්ගණ්හාමි, න එළකමන්තරං න දණ්ඩමන්තරං න මුසලමන්තරං, න ද්වින්නං භුඤ්ජමානානං, න ගබ්භිනියා, න පායමානාය, න පුරිසන්තරගතාය, න සඞ්කිත්තීසු, න යත්ථ සා උපට්ඨිතො හොති, න යත්ථ මක්ඛිකා සණ්ඩසණ්ඩචාරිනී, න මච්ඡං න මංසං. න සුරං න මෙරයං න ථුසොදකං පිවාමි.

සො එකාගාරිකො වා හොමි එකාලොපිකො, ද්වාගාරිකො වා හොමි ද්වාලොපිකො, සත්තාගාරිකො වා හොමි සත්තාලොපිකො. එකිස්සාපි දත්තියා යාපෙමි. ද්වීහිපි දත්තීහි යාපෙමි. සත්තහිපි දත්තීහි යාපෙමි. එකාහිකම්පි ආහාරං ආහාරෙමි. ද්වීහිකම්පි ආහාරං ආහාරෙමි. සත්තාහිකම්පි ආහාරං ආහාරෙමි. ඉති එවරූපං අඩ්ඪමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරාමි.

සො සාකභක්ඛො වා හොමි, සාමාකභක්ඛො වා හොමි, නීවාරභක්ඛො වා හොමි, දද්දුලභක්ඛො වා හොමි, හටභක්ඛො වා හොමි, කණභක්ඛො වා හොමි, ආචාමභක්ඛො වා හොමි, පිඤ්ඤාකභක්ඛො වා හොමි, තිණභක්ඛො වා හොමි, ගොමයභක්ඛො වා හොමි. වනමූලඵලාහාරො වා යාපෙමි පවත්තඵලභොජී.

සො සාණානිපි ධාරෙමි, මසාණානිපි ධාරෙමි, තිරීටානිපි ධාරෙමි, අජිනම්පි ධාරෙමි, අජිනක්ඛිපම්පි ධාරෙමි, කුසචීරම්පි ධාරෙමි, වාකචීරම්පි ධාරෙමි, ඵලකචීරම්පි ධාරෙමි, කෙසකම්බලම්පි ධාරෙමි, වාලකම්බලම්පි ධාරෙමි, උලූකපක්ඛම්පි ධාරෙමි.

සො කෙසමස්සුලොචකොපි හොමි, කෙසමස්සුලොචනානුයොගමනුයුත්තො. උබ්භට්ඨකොපි[1] හොමි ආසනපටික්ඛිත්තො. උක්කුටිකොපි හොමි උක්කුටිකප්පධානමනුයුත්තො. කණ්ටකාපස්සයිකොපි හොමි කණ්ටකාපස්සයෙ සෙය්‍යං කප්පෙමි. සායතතියකම්පි උදකොරොහනානුයොගමනුයුත්තො විහරාමි.

ඉති එවරූපං අනෙකවිහිතං කායස්ස ආතාපනපරිතාපනානුයොගමනුයුත්තො විහරාමි. ඉදං සු මෙ සාරිපුත්ත තපස්සිතාය හොති.

1. උබ්භට්ඨිකො පි, සාරුවි.

43. ශාරීපුත්‍රය, (මේ මතු පැවසෙන අචෙලකබ්බාදිය) මාගේ තපස් බව වෙයි: නග්න වූයෙම් හල ශිෂ්ටකුලාචාර ඇත්තෙම් අත ලොවින්නෙම් තොහොත් මල පහ කොට අතින් පිස දමන්නෙම් වෙමි. ආහාර ගැනීම සඳහා එන්න වහන්සැ යි, සිටින්න වහන්සැ යි කියන ලද්දෙම් නො පිළිගන්නෙමි. පළමු කොට ගෙනෙන ලද්ද උදෙසා කරන ලද්ද නිමැතු භික්‍ෂාව ද නො ඉවසමි. ඒ මම කළමුවින් නගා දෙන දෙය නො පිළිගනිමි. සැළිමුවින් නගා දෙන දෙය, එළිපත අතර කොට සිට දෙන දෙය, දණ්ඩක් අතර කොට සිට දෙන දෙය, මොහොලක් අතර කොට සිට දෙන දෙය, අනුභව කරන්නවුන් දෙදෙනකුන්ගෙන් එකකු අවුත් දෙන දෙය, ගැබිණිය විසින් දෙන දෙය, කිරි පොවන්නිය විසින් දෙන දෙය, නො පිළිගනිමි. පුරුෂයා වෙත ගිය තැනැත්තිය විසින් දෙන දෙය, සම්මාදම් කළ දෙසින් දෙන දෙය, යම් තැනෙක බල්ලෙක් පැමිණ සිටියේ නම්, ඔහුට නො දී දෙන දෙය, යම් තැනෙක මැස්සෝ කැටි කැටි ව හැසිරෙත් ද එහි දී දෙන දෙය නො පිළිගනිමි. දියමස් නො වළඳමි. ගොඩමස් නො වළඳමි. සුරා නො බොමි. පුෂ්පාසවය නො බොමි. ලොණසොවීරක ය (= සියලු සස්‍යාදිය පල්කොට ගත් කාඩිදිය) නො බොමි.

මම පිඩු පිණිස එක ම ගෙයක් පමණ කොට ගත්තෙම් වෙමි. එක ම පිඩෙකින් යැපෙන්නෙම් වෙමි. පිඩු පිණිස ගෙවල් දෙකක් පමණ කොට ගත්තෙම් වෙමි. පිඩු දෙකෙකින් යැපෙන්නෙම් වෙමි. පිඩු පිණිස ගෙවල් සතක් පමණක් කොට ගත්තෙම් පිඩුසතකින් යැපෙන්නෙම් වෙමි. එක් කුඩා බත්තැටියකින් බත්තැටි දෙකෙකින් බත්තැටි සතෙකින් ද යැපෙමි. දවසකට වරක් දෙදවසකට වරක් සත් දවසකට වරක් ආහාර ගනිමි. මෙසේ මෙලෙසින් අඩමසකට වරක් දූයි වාර වශයෙන් බත් බුදීමෙහි යෙදුනෙම් වාසය කරමි.

ඒ මම අමුපලා බුදින්නෙම් හෝ වෙමි. බඩහමු බුදින්නෙම් හෝ වෙමි. උරුහැල් බුදින්නෙම් හෝ කපා හල සම් කසට බුදින්නෙම් හෝ මැලියම් බුදින්නෙම් හෝ වෙමි. සහල් කුඩු බුදින්නෙම් හෝ වෙමි. දඹු බත් බුදින්නෙම් හෝ වෙමි. මුරුවට බුදින්නෙම් හෝ වෙමි. තණකොල බුදින්නෙම් හෝ වෙමි. ගොම බුදින්නෙම් හෝ වෙමි. වනමුල් පල ආහාර කොට ඇත්තෙම් සවයංපතිත ඵල බුදින්නෙම් හෝ යැපෙමි.

ඒ මම හණ වැහැරිත් දරමි. නන්වැදූරුම් හූ මුසු කොට වියූ පිළිත් මිනී එතූ පිළිත් දරමි. පවුල් පිළිත් දරමි. රුක්පතුරෙන් කළ පිළි ද දරමි. අඳුන්දිවිසම් ද දරමි. මැදින් පැළු කුර සහිත අඳුන්මුවසම් ද දරමි. කුසතණවැහැරි ද දරමි. තියදවැහැරි ද දරමි. පුවරුවැහැරි ද දරමි. කෙස්වලින් කළ කම්බිලි ද දරමි. අස්ලොමින් කළ කම්බිලි ද දරමි. බකමුහුණු පියාපතින් කළ වැහැරි ද දරමි.

ඒ මම කෙස් රවුලු ඉදිරීම නමැති අනුයොගයෙහි නැවත නැවත යෙදුනෙම් කෙසමස්සුලොචක වෙමි. අසුන් පිළිකෙවු කෙලෙමි. උඩුකුරු ව සිටින්නෙම් ද වෙමි. උළුයෙන් හිඳීම නමැති උතකුටික වීර්‍යයෙන් යුක්ත වූයෙම් උත්කුටුකයෙන් සිටින්නෙම් ද වෙමි. කටුඇතිරියෙහි සක්මන් ආදිය කරන්නෙම් කටු සවි කළ වැතිරෙණ පුවරුවෙහි ශයනය කරමි. සවස තුන්වැනි කොට දියට බැසීම නමැති අනුයොග යෙහි යෙදුනෙම් වාසය කරමි.

මෙසේ මෙබඳු නන්වැදූරුම් සිරුර තැවීමෙහි පෙළීමෙහි හාත්පසින් තැවීමෙහි එක්වන් යෙදුනෙම් වෙසෙමි. ශාරීපුත්‍රය,මේ මාගේ තපස්බව වෙයි.

44. තත්‍රාස්සු මෙ ඉදං සාරිපුත්ත ලූඛස්මිං හොති: නෙකවස්සගණිකං රජොජල්ලං කායෙ සන්නිචිතං හොති පපටිකජාතං. සෙය්‍යථාපි සාරිපුත්ත තින්දුකඛාණු නෙකවස්සගණිකො සන්නිචිතො හොති පපටිකජාතො, එවමෙවස්සු මෙ සාරිපුත්ත නෙකවස්සගණිකං රජොජල්ලං කායෙ සන්නිචිතං හොති පපටිකජාතං. තස්ස මය්හං සාරිපුත්ත න එවං හොති: අහො වතාහං ඉමං රජොජල්ලං පාණිනා පරිමජ්ජෙය්‍යං, අඤ්ඤෙ වා පන මෙ ඉමං රජොජල්ලං පාණිනා පරිමජ්ජෙය්‍යුන්ති. එවම්පි මෙ සාරිපුත්ත න හොති. ඉදං සු මෙ සාරිපුත්ත ලූඛස්මිං හොති.

45. තත්‍රාස්සු මෙ ඉදං සාරිපුත්ත ජෙගුච්ඡිස්මිං හොති: සො ඛො අහං සාරිපුත්ත සතොව අභික්කමාමි සතො පටික්කමාමි. යාව උදබින්දුම්හිපි මෙ දයා පච්චුපට්ඨිතා හොති: මාහං ඛුද්දකෙ පාණෙ විසමගතෙ සඞ්ඝාතං ආපාදෙස්සන්ති ඉදං සු මෙ සාරිපුත්ත ජෙගුච්ඡිස්මිං හොති.

46. තත්‍රාස්සු මෙ ඉදං සාරිපුත්ත පවිවිත්තස්මිං හොති: සො ඛො අහං සාරිපුත්ත අඤ්ඤතරං අරඤ්ඤායතනං අජ්ඣොගාහෙත්වා විහරාමි, යදා පස්සාමි ගොපාලකං වා පසුපාලකං වා තිණහාරකං වා කට්ඨහාරකං වා වනකම්මිකං වා, වනෙන වනං ගහනෙන ගහනං නින්නෙන නින්නං ථලෙන ථලං පපතාමි. තං කිස්ස හෙතු: මා මං තෙ අද්දසංසු, අහඤ්ච වං තෙ අද්දසන්ති. සෙය්‍යථාපි සාරිපුත්ත ආරඤ්ඤකො මිගො මනුස්සෙ දිස්වා වනෙන වනං ගහනෙන ගහනං නින්නෙන නින්නං ථලෙන ථලං පපතති, එවමෙව ඛො අහං සාරිපුත්ත යදා පස්සාමි ගොපාලකං වා පසුපාලකං වා තිණහාරකං වා කට්ඨහාරකං වා වනකම්මිකං වා, වනෙන වනං ගහනෙන ගහනං නින්නෙන නින්නං ථලෙන ථලං පපතාමි. තං කිස්ස හෙතු: මා මං තෙ අද්දසංසු, අහඤ්ච වා තෙ අද්දසන්ති. ඉදං සු මෙ සාරිපුත්ත පවිවිත්තස්මිං හොති.

47. [තත්‍රාස්සු මෙ ඉදං සාරිපුත්ත මහාවිකට භොජනස්මිං හොති:] සො ඛො අහං සාරිපුත්ත යෙ තෙ ගොට්ඨා පට්ඨිතගාවො අපගත-ගොපාලා තත්ථ චතුක්කුණ්ඩිකො උපසඞ්කමිත්වා යානි තානි වච්ඡකානං තරුණකානං ධෙනුපකානං ගොමයානි, තානි සුදං ආහාරෙමි යාවකීවඤ්ච මෙ සාරිපුත්ත සකං මුත්තකරීසං අපරියාදිණ්ණං හොති, සකං යෙව සුදං මුත්තකරීසං ආහාරෙමි. ඉදං සු මෙ සාරිපුත්ත මහාවිකටභොජනස්මිං හොති.

Free Distribution www.aathaapi.org

44. ශාරීපුත්‍රය, එහි මේ මාගේ රළුබව වෙයි: නොයෙක් අවුරුදු ගණන් මුළුල්ලෙහි හටගත් රජසදූලි සිරුරෙහි රැස් වූයේ හටගත් පැලිවල ඇත්තේ වෙයි. ශාරීපුත්‍රය, නොයෙක් අවුරුදු ගණන් වයසැති හටගත් පතුරු ඇති මහත් වූ තිඹිරි කණුවෙක් යම්සේ වේ ද, ශාරීපුත්‍රය, එපරිද්දෙන් ම මාගේ සිරුරෙහි නොයෙක් අවුරුදු ගණන් වයසැති රජස්දූලි රැස් වූයේ හටගත් පැලිවල ඇත්තේ වෙයි. ශාරීපුත්‍රය, එ මට මෙබඳු අදහසෙක් නො වෙයි: "මම මේ රජස් දූලි අතින් පිරි මදිත්තෙම් නම් හෝ අන්‍යයෝ හෝ මාගේ රජස් දූලි අතින් පිරිමදිත්තාහු නම් අහෝ යෙහෙකැ" යි මෙසේත් මට අදහස් නො වෙයි. ශාරීපුත්‍රය, මේ මාගේ රළු පිලිවෙත වෙයි.

45. ශාරීපුත්‍රය, එහි මේ මාගේ පවට පිළිකුල් බව වෙයි: ශාරීපුත්‍රය, කුඩාපණුවන් (නොමරම්වා යි) ඒ මම සිහි ඇත්තෙම් ම ඉදිරියට යම්. සිහි ඇත්තෙම් ම පෙරළා එම්. "මම විෂමස්ථාන ගත වූ කුඩාදිය බිඳුය යි කියන ප්‍රාණීන් විනාශයට නො පමුණුවම්වා" යි දියබිඳුවෙහි පවා දයාව එළඹ සිටියා වේ. ශාරීපුත්‍රය, මේ මාගේ පවට පිළිකුල් කරණ බව වෙයි.

46. ශාරීපුත්‍රය, එහි මේ මාගේ ප්‍රකෘෂටවිවෙකය වෙයි: ශාරීපුත්‍රය, ඒ මම එක්තරා වනයකට වැද වාසය කරමි. යම් කලෙක ගොපාලයකු හෝ පසුපාලයකු හෝ තණ ගෙනයන්නකු හෝ දර ගෙන යන්නකු හෝ වනකැමියකු හෝ දකිම් ද, එකල මම (සිපි) වනයෙන් (අන්) වනයකට (සිපි) ලැහැබින් (අන්) ලැහැබකට මිපිකිමින් මිපිකිමට උස්කිමින් උස්කිමට යම්. කවර හෙයින යත්: ඔහු මා නො දකිත්වා, මම ද ඔවුන් නො දකිම්වා යි යන අදහසිනි. ශාරීපුත්‍රය, වනමුවෙක් මිනිසුන් දක වනයෙන් වනයට ලැහැබින් ලැහැබට මිපි කිමින් මිපි කිමට උස් කිමින් උස් කිමට යම්සේ යේ ද, ශාරීපුත්‍රය, මමත් එපරිද්දෙන් ම යම් කලෙක ගොපාලයකු හෝ පසුපාලයකු හෝ තණ ගෙන යන්නකු හෝ දර ගෙනයන්නකු හෝ වනකැමියකු හෝ දකිම් ද, එකල මම වනයෙන් වනයට ලැහැබින් ලැහැබට මිපි තැනින් මිපි තැනට උස් තැනින් උස් තැනට යම්. එය කවර හෙයින? යත්: ඔහු මා නො දකිත්වා, මමත් ඔවුන් නො දකිම්වා යන අදහසිනි. ශාරීපුත්‍රය, මේ මාගේ ප්‍රකෘෂටවිවෙකය වෙයි

47. [ශාරීපුත්‍රය එහි මේ මාගේ මහාවිකට භොජනය වෙයි·] ශාරීපුත්‍රය, ඒ මම පිටත්ව ගිය ගෙරින් ඇති පහව ගිය ගොපල්ලන් ඇති යම් ඒ ගොවුදු වේ ද, එහි දෙදණ දෙවැලමිට කිම තැබුවෙක් ව එළඹ දෙනුන් වෙතට කිරි බීමට පැමිණෙන වසු පැටවුන්ගේ යම් ඒ ගොම වේ ද, ඒ ගොම අනුභව කරමි. ශාරීපුත්‍රය, යම්තාක් මාගේ සවකීය මලමූත්‍ර ගීන නො වූයේ ද, ඒ තාක් සවකීය මලමූත්‍ර අනුභව කරමි. ශාරීපුත්‍රය, මේ මාගේ මහාවිකට භොජනය වෙයි.

48. සො ඛො අහං සාරිපුත්ත අඤ්ඤතරං භිංසනකං වනසණ්ඩං අජ්ඣොගාහෙත්වා විහරාමි. තත්‍ර සුදං සාරිපුත්ත භිංසනකස්ස වනසණ්ඩස්ස භිංසනකතස්මිං හොති: යො කො චි අවීතරාගො තං වනසණ්ඩං පවිසති යෙභුය්‍යෙන ලොමානි හංසන්ති. සො ඛො අහං සාරිපුත්ත යා තා රත්තියො සීතා හෙමන්තිකා අන්තරට්ඨකෙ හිමපාතසමයෙ, තථාරූපාසු රත්තිසු රත්තිං අබ්භොකාසෙ විහරාමි දිවා වනසණ්ඩෙ. ගිම්හානං පච්ඡිමෙ මාසෙ දිවා අබ්භොකාසෙ විහරාමි රත්තිං වනසණ්ඩෙ. අපිස්සු මං සාරිපුත්ත අයං අනච්ඡරියා ගාථා පටිභාසි පුබ්බෙ අස්සුතපුබ්බා:

සොතත්තො සොසීනො එකො භිංසනකෙ වනෙ,
නග්ගො න චග්ගිමාසීනො එසනා පසුතො මුනීති.

49. සො ඛො අහං සාරිපුත්ත, සුසානෙ සෙය්‍යං කප්පෙමි ඡවට්ඨිකානි උපධාය. අපිස්සු මං සාරිපුත්ත ගොමණ්ඩලා උපසඞ්කමිත්වා ඔට්ඨුභන්තිපි, ඔමුත්තෙන්තිපි, පංසුකෙනපි ඔකිරන්ති. කණ්ණසොතෙසු'පි සලාකං පවෙසෙන්ති. න ඛො පනාහං සාරිපුත්ත අභිජානාමි තෙසු පාපකං චිත්තං උප්පාදෙතා. ඉදං සු මෙ සාරිපුත්ත උපෙක්ඛාවිහාරස්මිං හොති.

50. සන්ති ඛො පන සාරිපුත්ත එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: ආහාරෙන සුද්ධීති. තෙ එවමාහංසු: කොලෙහි යාපෙමාති. තෙ කොලම්පි ඛාදන්ති, කොලචුණ්ණම්පි ඛාදන්ති, කොලොදකම්පි පිවන්ති, අනෙකවිහිතම්පි කොලවිකතිං පරිභුඤ්ජන්ති. අභිජානාමි ඛො පනාහං සාරිපුත්ත එකංයෙව කොලං ආහාරං ආහරිතා. සියා ඛො පන තෙ සාරිපුත්ත එවමස්ස: මහා නූන තෙන සමයෙන කොලො අහොසීති. න ඛො පනෙතං සාරිපුත්ත එවං දට්ඨබ්බං. තදාපි එත පරමොයෙව කොලො අහොසි, සෙය්‍යථාපි එතරහි. තස්ස මය්හං සාරිපුත්ත එකංයෙව කොලං ආහාරං ආහාරයතො අධිමත්තකසිමානං පත්තො කායො හොති: සෙය්‍යථාපි නාම ආසීතිකපබ්බානි වා කාළපබ්බානි වා, එවමෙවස්සු මෙ අඞ්ගපච්චඞ්ගානි භවන්ති තායෙවප්පාහාරතාය. සෙය්‍යථාපි නාම ඔට්ඨපදං, එවමෙවස්සු මෙ ආනිසදං හොති තායෙවප්පාහාරතාය. සෙය්‍යථාපි නාම වට්ටනාවළී, එවමෙවස්සු මෙ පිට්ඨිකණ්ටකො උන්නතාවනතො හොති තායෙවප්පාහාරතාය. සෙය්‍යථාපි නාම ජරසාලාය ගොපානසියො ඔලුග්ගවිලුග්ගා භවන්ති, එවමෙවස්සු මෙ ඵාසුළියො ඔලුග්ගවිලුග්ගා භවන්ති තායෙවප්පාහාරතාය. සෙය්‍යථාපි නාම ගම්භීරෙ උදපානෙ උදකතාරකා ගම්භීරගතා ඔක්ඛායිකා දිස්සන්ති, එවමෙවස්සු මෙ අක්ඛිකූපෙසු අක්ඛිතාරකා ගම්භීරගතා ඔක්ඛායිකා දිස්සන්ති තායෙවප්පාහාරතාය. සෙය්‍යථාපි නාම තිත්තකාලාබු ආමකච්ඡින්නො වාතාතපෙන සම්ඵුටිතො හොති සම්මිලාතො, එවමෙවස්සු මෙ සීසච්ඡවි සම්ඵුටිතා හොති සම්මිලාතා, තායෙවප්පාහාරතාය.

48. ශාරීපුත්‍රය, ඒ මම එක්තරා බිහිසුණු වනලැහැබකට වැද වාසය කරමි. ශාරීපුත්‍රය, ඒ බිහිසුණු වනලැහැබෙහි මේ (මතු පැවසෙන) භීෂණ භාවය වෙයි: යම් කිසි අවීතරාගයෙක් ඒ වනලැහැබට පිවිසේ නම්, බොහෝ සෙයින් ලොමුදහ ගනී. ශාරීපුත්‍රය, ඒ මම තවම මැදින් දෙමස අතර අවදවසෙහි වූ හිම වැටෙන කාලයෙහි හෙමන්ත ඍතුවට අයත් සීත වූ යම් ඒ රාත්‍රීහු වෙත් ද, එබඳු රාත්‍රීන්හි මුළු රැයෙහි එළිමහනෙහි වෙසෙමි. දවල් වනලැහැබෙහි වෙසෙමි. ග්‍රීෂ්මසමයෙහි පැසුළු මාසයෙහි දවල් එළිමහනෙහි වෙසෙමි. රාත්‍රියෙහි වනලැහැබෙහි වෙසෙමි. ශාරීපුත්‍රය, තව ද මට පෙර නොඇසූ විරූ මතු මතු ආශ්චර්‍ය්‍යය උපදවන මේ ගාථාව වැටහිණි:

"ශුද්ධිය සෙවීමෙහි යෙදුණු මුනි වූ මම ග්‍රීෂ්මයෙන් අතිශයින් තැවුණෙමි හිමයෙන් ඉතා තෙත් වූයෙමි බිහිසුණු වූ වනයෙහි එකලා වූයෙමි නග්න වූයෙමි ද ගිනිත වෙත නො එළඹීමි.

49. ශාරීපුත්‍රය, ඒ මම සොහොනෙහි මිනීඇට කන්වයින් කොට ගෙන ශයනය කරමි. ශාරීපුත්‍රය, එකල මා වෙතට ගොපළුදරුවෝ පැමිණ (මා මත්තෙහි) කෙළ ද ඔවිත්. මුත්‍ර ද කරත්. පස් ද විසුරු වත්. කන්සිදුරුවල ඉරටු ද ගසත්. ශාරීපුත්‍රය, මම ඔවුන් කෙරෙහි පවිටු සිතක් ඉපදවූයෙමැ යි නො දනිමි. ශාරීපුත්‍රය, මෙය මාගේ උපෙක්‍ෂා විහරණය වේ.

50. ශාරීපුත්‍රය, ආහාරයෙන් ශුද්ධිය වේ යි මෙසේ කියන්නා වූ මෙසේ ලබ්ධි ඇත්තා වූ ඇතැම් මහණ බමුණෝ ඇත් ම ය. ඔහු ඩෙබරවලින් යැපෙන්නෙමු යි මෙසේ කියත්. ඔහු ඩෙබරපල ද කත්. ඩෙබරසුණු ද කත්. ඩෙබර මැඩගත් දිය ද බොත්. නන් වැදෑරුම් වූ ඩෙබරින් කළ ආහාර ද අනුභව කරත්. තවද, ශාරීපුත්‍රය, මම එක ම ඩෙබර පලයක් ආහාර වශයෙන් ගත්තෙක්මි යි දනිම ම ය. ශාරීපුත්‍රය, ඒකාන්තයෙන් එසමයෙහි ඩෙබරපල මහත් වූයේ දෝ යි. ඔබට මෙබඳු අදහසෙක් විය හැකි ය. ශාරීපුත්‍රය, මෙය එසේ නො දතයුතු යි. එකල්හි ද ඩෙබරපල මෙකල යම් පමණ මහත් නම් එපමණ ම වූයේ ය. ශාරීපුත්‍රය, එක ම ඩෙබර පලයක් අහර කොට ගන්නා වූ ඒ මාගේ කය අතිශය කෘශතාවයට පැමිණියේ වෙයි. අංසීතික වැල්පුරුක් හෝ කළුවැල්පුරුක් හෝ යම් සේ වෙත් ද, ඒ අල්පාහාරයෙන් මාගේ අඞ්ගප්‍රත්‍යඞ්ගයෝ ද එ බඳු ම වෙත්. ඔටුපිය යම් සේ වේ ද, මාගේ නිසීදනමාංසය ද ඒ අල්පාහාර භාවයෙන් එ බඳු ම වෙයි. වට්ටනාවළිය (කුරුඳු වැලය) යම් සේ වේ ද, මාගේ වසට (=කොඳුඇටය) ඒ අල්පාහාර භාවයෙන් උස් පහත් වූයේ වෙයි. දිරූ ශාලාවෙක ගොනැස්හු යම්සේ උඩුයටි ව නැමුනාහු වෙත් ද, එපරිද්දෙන් මාගේ ඉළ ඇට ඒ නිරාහාරභාවයෙන් ම උඩුයටි ව නැමී ගියාහු වෙත්. ගැඹුරු ළිඳෙක උදක තාරකාවෝ ගැඹුරට ගියාහු ඇතුළට පිවිසියාහු යම් සේ දක්නා ලැබෙත් ද, එපරිද්දෙන් ම මාගේ අක්ෂිකූපයන්හි ඇස්තරු ඒ අල්පාහාර-භාවයෙන් ම ගැඹුරට ගියාහු ඇතුළට පිවිසියාහු දක්නා ලැබෙත්. තිත්ත ලබුවක් අමු කල සිඳිනා ලද්දේ අවු සුළඟින් පැළී ගියේ මැලවී ගියේ යම් සේ වේ ද, එපරිද්දෙන් ම මාගේ මේ හිසෙහි සිවිය ඒ අල්පාහාර-භාවයෙන් ම පැළී ගියේ මැලවී ගියේ වෙයි.

51. සො ඛො අහං සාරිපුත්ත උදරච්ඡවිං පරිමසිස්සාමීති පිට්ඨිකණ්ටකංයෙව පරිගණ්හාමි. පිට්ඨිකණ්ටකං පරිමසිස්සාමීති උදරච්ඡවිංයෙව පරිගණ්හාමි. යාවස්සු මෙ සාරිපුත්ත උදරච්ඡවි පිට්ඨිකණ්ටකං අල්ලීනා හොති තායෙවප්පාහාරතාය. සො ඛො අහං සාරිපුත්ත, වච්චං වා මුත්තං වා කරිස්සාමීති තත්ථෙව අවකුජ්ජො පපතාමි. තායෙවප්පාහාරතාය. සො ඛො අහං සාරිපුත්ත තමෙව කායං අස්සාසෙන්තො පාණිනා ගත්තානි අනොමජ්ජාමි. තස්ස මය්හං සාරිපුත්ත පාණිනා ගත්තානි අනොමජ්ජතො පූතිමූලානි ලොමානි කායස්මා පපතන්ති තායෙවප්පාහාරතාය.

52. සන්ති ඛො පන සාරිපුත්ත එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: ආහාරෙන සුද්ධීති. තෙ එවමාහංසු: මුග්ගෙහි යාපෙම -පෙ- තිලෙහි යාපෙම -පෙ- තණ්ඩුලෙහි යාපෙමාති. තෙ තණ්ඩුලම්පි ඛාදන්ති, තණ්ඩුලචුණ්ණම්පි ඛාදන්ති, තණ්ඩුලොදකම්පි පිවන්ති, අනෙකවිහිතම්පි තණ්ඩුලවිකතිං පරිභුඤ්ජන්ති. අභිජානාමි ඛො පනාහං සාරිපුත්ත එකංයෙව තණ්ඩුලං ආහාරං ආහරිතා. සියා ඛො පන තෙ සාරිපුත්ත එවමස්ස: මහා නූන තෙන සමයෙන තණ්ඩුලො අහොසීති. න ඛො පනෙතං සාරිපුත්ත එවං දට්ඨබ්බං. තදාපි එතපරමොයෙව තණ්ඩුලො අහොසි සෙය්‍යථාපි එතරහි.

53. තස්ස මය්හං සාරිපුත්ත එකංයෙව තණ්ඩුලං ආහාරං ආහාරයතො අධිමත්තකසිමානං පත්තො කායො හොති. සෙය්‍යථාපි නාම ආසීතිකපබ්බානි වා කාළපබ්බානි වා, එවමෙවස්සු මෙ අඞ්ගපච්චඞ්ගානි භවන්ති තායෙවප්පාහාරතාය. සෙය්‍යථාපි නාම ඔට්ඨපදං එවමෙවස්සු මෙ ආනිසදං හොති තායෙවප්පාහාරතාය. සෙය්‍යථාපි නාම වට්ටනාවළී, එවමෙවස්සු මෙ පිට්ඨිකණ්ටකො උන්නතාවනතො හොති තායෙවප්පාහාරතාය. සෙය්‍යථාපි නාම ජරසාලාය ගොපානසියො ඔළුග්ගවිළුග්ගා භවන්ති, එවමෙවස්සු මෙ ඵාසුළියො ඔළුග්ගවිළුග්ගා භවන්ති තායෙවප්පාහාරතාය. සෙය්‍යථාපි නාම ගම්භීරෙ උදපානෙ උදකතාරකා ගම්භීරගතා ඔක්ඛායිකා දිස්සන්ති, එවමෙවස්සු මෙ අක්ඛිකූපෙසු අක්ඛිතාරකා ගම්භීරගතා ඔක්ඛායිකා දිස්සන්ති තායෙවප්පාහාරතාය. සෙය්‍යථාපි නාම තිත්තකාලාබු ආමකච්ඡින්නො වාතාතපෙන සම්ඵුටිතො හොති සම්මිලාතො, එවමෙවස්සු මෙ සීසච්ඡවි සම්ඵුටිතා හොති සම්මිලාතා තායෙවප්පාහාරතාය. සො ඛො අහං සාරිපුත්ත, උදරච්ඡවිං පරිමසිස්සාමීති පිට්ඨිකණ්ටකංයෙව පරිගණ්හාමි. පිට්ඨිකණ්ටකං පරිමසිස්සාමීති උදරච්ඡවිං යෙව පරිගණ්හාමි. යාවස්සු මෙ සාරිපුත්ත උදරච්ඡවි පිට්ඨිකණ්ටකං අල්ලීනා හොති තායෙවප්පාහාරතාය. සො ඛො අහං සාරිපුත්ත, වච්චං වා මුත්තං වා කරිස්සාමීති තත්ථෙව අවකුජ්ජො පපතාමි තායෙවප්පාහාරතාය. සො ඛො අහං සාරිපුත්ත, තමෙව කායං අස්සාසෙන්තො පාණිනා ගත්තානි අනොමජ්ජාමි. තස්ස මය්හං සාරිපුත්ත පාණිනා ගත්තානි අනොමජ්ජතො පූතිමූලානි ලොමානි කායස්මා පපතන්ති තායෙවප්පාහාරතාය.

51. ශාරිපුත්‍රය, ඒ මම උදරසිවිය පිරිමදින්නෙම් යි පිටකටුව ම අල්ලා ගනිමි. පිටකටුව පිරිමදින්නෙමි යි උදරසිවිය ම අල්ලා ගනිමි. ශාරිපුත්‍රය, ඒ අල්පාහාරභාවයෙන් ම උදර සිවිය පිටකටුව හා ඇලුණේ වේ. ශාරිපුත්‍රය, මම මල හෝ මූ හෝ පහ කරන්නෙමියි එහි ම යටිහුරු ව වැටෙමි. ඒ අල්පාහාර භාවයෙනි. ශාරිපුත්‍රය, මම එ ම සිරුර අස්වසන්නෙම් සිරුරු-අවයව අතින් පිරිමදිමි. ශාරිපුත්‍රය, අතින් අවයව පිරිමදින ඒ මාගේ සිරුරෙන් දිරූ මුල් ඇති ලෝමයෝ ගිලිහී වැටෙත්. ඒ අල්පාහාරභාවයෙනි.

52. ශාරිපුත්‍රය, 'ආහාරයෙන් ශුද්ධිය වෙති' යි මෙසේ වාද ඇති මෙබඳු ලබ්ධි ඇති ඇතැම් මහණ බමුණෝ ඇත. ඔහු 'මුඟුවෙන් යැපෙමු' යි ... 'තලයෙන් යැපෙමු' යි ... 'සහලින් යැපෙමු 'යි මෙසේ කීහ. ඔහු සහල් ද කත්. සහල්සුණු ද කත්. හාල්පානුදු බොත්. සහලින් කළ නන්වැදෑරුම් දෑය ද අනුභව කරත්. ශාරිපුත්‍රය, මම එක ම සහල්ඇටයක් ආහාර කොට ගත්තෙම් යි දනිමි. ශාරිපුත්‍රය, තොපට 'ඒ කාලයෙහි සහල්ඇටය මහත් විය හැකි ය' යි මෙබඳු අදහසෙක් විය හැකි ය. ශාරිපුත්‍රය, එය එසේ නො දතයුතු යි. මෙකල යම් සේ ද එකල්හි ද සහල්ඇටය මෙපමණ ම විය.

53. ශාරිපුත්‍රය, සහල්ඇටයක් ආහාර කොට ගන්නා වූ ඒ මාගේ ශරීරය අතිශය කෘශභාවයට පැමිණියේ වෙයි. ආසීතික වැල්පුරුක් හෝ කළුවැල්පුරුක් හෝ යම් සේ වෙත් ද, ඒ අල්පාහාර භාවයෙන්ම මාගේ ශරීරාවයවයෝ එසේ වෙත්. ඔටුපිය යම්සේ වේ නම් ඒ අල්පාහාර භාවයෙන් ම මාගේ ආතිසදය - හිඳීම ද එසේ වෙයි. ඒ අල්පාහාර-භාවයෙන් ම මාගේ වසටද වට්ට නාවළිය (වටඇටවැල) යම්සේ නම් එසේ උස්පහත් වූයේ වෙයි. දිරූ ශාලාවක ගොනැස්හු යම්සේ උඩුයටි ව නැමුණාහු වෙත් ද, ඒ අල්පාහාරභාවයෙන් ම මාගේ ඉලඇට ද එසේ උඩු යටිව නැමුණාහු වෙත්. ගැඹුරු ළිඳක උදකතාරකාවෝ ගැඹුරට ගියාහු ඇතුලට පිවිසියාහු යම්සේ පැනෙත් ද, එසේ මාගේ අක්ෂිකූපයන්හි ඇස්තරු ඒ අල්පාහාරභාවයෙන් ම ගැඹුරට ගියාහු ඇතුලට පිවිසියාහු දක්නා ලැබෙත්. යම්සේ තිත්ත ලබුවක් අමුවෙන් සිඳින ලද්දේ අව්සුළඟින් හැකිළී ගියේ මැලවී ගියේ වේ ද, එසේ ඒ අල්පාහාරභාවයෙන් මාගේ හිසෙහි සිවිය හැකිළී ගියේ මැලවී ගියේ වෙයි. ශාරිපුත්‍රය, මම උදර සිවිය පිරි-මදින්නෙමියි පිටකටුව ම පිරිමැද ගනිමි. පිටකටුව පිරිමදිමි යි උදර සිවිය ම පිරිමැද ගනිමි. ඒ අල්පාහාරභාවයෙන් උදර සිවිය පිටකටුව හා ඇලුණේ වේ. ශාරිපුත්‍රය, මම මල හෝ මූ හෝ පහ කරන්නෙමි යි ඒ අල්පාහාරභාවයෙන් එහි ම යටි හුරු ව වැටෙමි. ශාරිපුත්‍රය, මම එ ම ශරීරය අස් වසන්නෙම අතින් ශරීරාවයව පිරිමදිමි. ශාරිපුත්‍රය, ඒ අතින් ශරීරාවයව පිරිමදින මාගේ සිරුරෙන් ඒ අල්පාහාරභාවයෙන් ම දිරූ මුල් ඇති ලොමයෝ ගිලිහී වැටෙත්.

54. තායපි ඛො අහං සාරිපුත්ත ඉරියාය තාය පටිපදාය තාය දුක්කරකාරිකාය න අජ්ඣගමං උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං. තංකිස්සහෙතු: ඉමිස්සායෙව අරියාය පඤ්ඤාය අනධිගමා යායං අරියා පඤ්ඤා අධිගතා අරියා නිය්‍යානිකා නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයාය.

55. සන්ති ඛො පන සාරිපුත්ත එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: සංසාරෙන සුද්ධීති. න ඛො පනෙසො සාරිපුත්ත සංසාරො සුලභරූපො යො මයා අසංසරිතපුබ්බො ඉමිනා දීඝෙන අද්ධුනා, අඤ්ඤත්‍ර සුද්ධාවාසෙහි දෙවෙහි. සුද්ධාවාසෙ වාහං සාරිපුත්ත දෙවෙ සංසරෙය්‍යං, නයිමං ලොකං පුනරාගච්ඡෙය්‍යං.

56. සන්ති ඛො පන සාරිපුත්ත එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: උපපත්තියා සුද්ධීති. න ඛො පනෙසා සාරිපුත්ත උපපත්ති සුලභරූපා යා මයා අනුපපන්නපුබ්බා ඉමිනා දීඝෙන අද්ධුනා අඤ්ඤත්‍ර සුද්ධාවාසෙහි දෙවෙහි. සුද්ධාවාසෙ වාහං සාරිපුත්ත දෙවෙ උපපජ්ජෙය්‍යං, නයිමං ලොකං පුනරාගච්ඡෙය්‍යං.

57. සන්ති ඛො පන සාරිපුත්ත එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: ආවාසෙන සුද්ධීති. න ඛො පනෙසො සාරිපුත්ත ආවාසො සුලභරූපො යො මයා අනාවුත්ථපුබ්බො ඉමිනා දීඝෙන අද්ධුනා අඤ්ඤත්‍ර සුද්ධාවාසෙහි දෙවෙහි. සුද්ධාවාසෙ වාහං සාරිපුත්ත දෙවෙ වසෙය්‍යං, නයිමං ලොකං පුනරාගච්ඡෙය්‍යං.

58. සන්ති ඛො පන සාරිපුත්ත එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: යඤ්ඤෙන සුද්ධීති. න ඛො පනෙසො සාරිපුත්ත යඤ්ඤො සුලභරූපො යො මයා අයිට්ඨපුබ්බො ඉමිනා දීඝෙන අද්ධුනා, තඤ්ච ඛො රඤ්ඤාව සතා ඛත්තියෙන මුද්ධාවසිත්තෙන, බ්‍රාහ්මණෙන වා මහාසාලෙන.

59 සන්ති ඛො පන සාරිපුත්ත එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: අග්ගිපරිචරියාය සුද්ධීති. න ඛො පනෙසො සාරිපුත්ත අග්ගි සුලභරූපො යො මයා අපරිචිණ්ණපුබ්බො ඉමිනා දීඝෙන අද්ධුනා, තඤ්ච ඛො රඤ්ඤාව සතා ඛත්තියෙන මුද්ධාවසිත්තෙන, බ්‍රාහ්මණෙන වා මහාසාලෙන.

60. සන්ති ඛො පන සාරිපුත්ත එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: යාවදෙවායං භවං පුරිසො දහරො හොති යුවා සුසුකාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා, තාවදෙව පරමෙන පඤ්ඤාවෙය්‍යත්තියෙන සමන්නාගතො හොති. යතො ච ඛො අයං භවං පුරිසො ජිණ්ණො හොති වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො: ආසීතිකො වා නාවුතිකො වා වස්සසතිකො වා ජාතියා, අථ තම්හා පඤ්ඤාවෙය්‍යත්තියා පරිහායතීති. න ඛො පනෙතං සාරිපුත්ත එවං දට්ඨබ්බං. අහං ඛො පන සාරිපුත්ත එතරහි ජිණ්ණො වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො, ආසීතිකො මෙ වයො වත්තති.

54. ශාරීපුත්‍රය, මම ඒ ඉරියව්වෙන් ද ඒ පිළිවෙතින් ද ඒ දුෂ්කර ක්‍රියාවෙන් ද මනුෂ්‍යධර්මයට වැඩි වූ ආර්‍යභාවය කිරීමට සමර්ථ වූ ඥාන දර්ශනවිශෙෂයක් නො ලදිමි. ඒ කවර හෙයින යත්: යම් මේ ආර්‍ය (මාර්ග) ප්‍රඥාවක් (දූත් ම විසින්) ලබන ලද ද, ආර්‍ය වූ නෛර්‍යාණික වූ, ඒ පිළිපදනහුට මනා කොට දුඃඛක්‍ෂය කිරීම පිණිස පමුණුවන් නා වූ, මේ මාර්ග ප්‍රඥාව (එකල මා විසින්) නො ලබන ලදී. එහෙයිනි.

55. ශාරීපුත්‍රය, සංසාරයෙන් (භවසඞ්ක්‍රමණයෙන්) ශුද්ධිය වෙති යි මෙසේ කියනසුලු මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත. ශාරීපුත්‍රය, මේ දීර්ඝකාලයෙහි මා නො සැරිසැරූ මේ භවයෙක් සුලභ නොවේ. ශුද්ධාවාසයන් හැරයි. ශාරීපුත්‍රය, මම ශුද්ධාවාස-දෙව්ලොව හැසුරුණෙම් නම්, යළි මෙලොවට නො එන්නෙමි.

56. ශාරීපුත්‍රය, උත්පත්තියෙන් ශුද්ධිය වෙති යි මෙසේ කියනසුලු මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. ශාරීපුත්‍රය, මේ දීර්ඝකාලයෙහි මා නූපන්විරූ මේ උත්පත්තියක් සුලභ නොවේ. ශුද්ධා-වාසයන් හැරයි. ශාරීපුත්‍රය, මම ශුද්ධාවාස දෙවලොකයෙහි උපන්නෙම් නම්, යළි මේ ලොකයට නො පැමිණෙන්නෙමි.

57. ශාරීපුත්‍රය, (බොහෝ භවයන්හි) විසීමෙන් ශුද්ධිය වෙතැ යි මෙසේ කියනසුලු මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. ශාරීපුත්‍රය, මේ දීර්ඝකාලයෙහි මා නො විසූ විරූ ආවාසයෙක් සුලභ රූප නො වේ. ශුද්ධාවාසයන් හැරයි. ශාරීපුත්‍රය, මම ශුද්ධාවාස දෙව් ලොවෙහි විසුයෙම් නම්, යළි මෙලොවට නො එන්නෙමි.

58. ශාරීපුත්‍රය, යාගයෙන් ශුද්ධිය වෙතැ යි මෙසේ කියනසුලු මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. ශාරීපුත්‍රය, මේ දීර්ඝ-කාලයෙහි මං විසින් නො යැපූ විරූ මේ යාගයෙක් සුලභරූප නො වේ. එ ද අභිෂික්ත ක්‍ෂත්‍රිය රාජ වූ ම හෝ මහාසාරබ්‍රාහ්මණ වූ ම හෝ මා විසින් කරන ලදී.

59. ශාරීපුත්‍රය, ගිනි පිදීමෙන් ශුද්ධිය වෙතැ යි මෙසේ කියනසුලු මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. ශාරීපුත්‍රය, මේ දීර්ඝකාලයෙහි මා විසින් නො පිදූ විරූ ගින්නක් සුලභරූප නො වේ. එ ද අභිෂික්ත ක්‍ෂත්‍රියරාජ වූ ම හෝ මහාසාරබ්‍රාහ්මණ වූ ම හෝ මා විසින් කරන ලදි.

60. ශාරීපුත්‍රය, "යම් තාක් කල් මේ පින්වත් පුරුෂ තෙමේ තරුණ වූයේ මනා කළුකෙස් ඇත්තේ ප්‍රථම වයස වූ සොඳුරු වූ යොවුන් බැවින් යුක්ත වූයේ දහර වූයේ වේ ද, ඒ තාක් කල් උතුම් වූ ප්‍රඥාව පිළිබඳ ව්‍යක්තභාවයෙන් යුක්ත වූයේ වෙයි. යම් තැනෙක පටන් මේ පින්වත් පුරුෂ තෙමේ දිරුණේ වෘද්ධ වූයේ මහලු වූයේ බොහෝ කල් ඉක්ම වූයේ පැසුළුවයසට පැමිණියේ උත්පත්තියෙන් අසූවයස් ඇත්තේ හෝ අනූවයස් ඇත්තේ හෝ සියවස් ඇත්තේ හෝ වේ ද, එකල්හි ප්‍රඥාව පිළිබඳ ව්‍යක්තභාවයෙන් පිරිහේ" යැ යි මෙසේ කියනසුලු මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. ශාරීපුත්‍රය, මේ කාරණය මෙසේ නො දත යුතු යි ශාරීපුත්‍රය, මම දූත් ජරාවෙන් ජීර්ණයෙමි. වැඩි සිටියෙමි. මහලු වෙමි. බොහෝකල් ඉක්ම වූයෙමි. පැසුළුවියසට පැමිණියෙමි මාහට දූත් අසූ හැවිරිදි වියෙක් පවතී.

61. ඉධ මෙ අස්සු සාරිපුත්ත චත්තාරො සාවකා වස්සසතායුකා වස්සසතජීවිනො පරමාය ගතියා සතියා ච ධිතියා ච සමන්නාගතා පරමෙන ච පඤ්ඤාවෙය්‍යත්තියෙන. සෙය්‍යථාපි සාරිපුත්ත දළ්හධම්මො ධනුග්ගහො සික්ඛිතො කතහත්ථො කතූපාසනො ලහුකෙන අසනෙන අප්පකසිරෙනෙව තිරියං තාලච්ඡායං අතිපාතෙය්‍ය, එවං අධිමත්තසති-මන්තො එවං අධිමත්තගතිමන්තො එවං අධිමත්තධිතිමන්තො එවං පරමෙන පඤ්ඤාවෙය්‍යත්තියෙන සමන්නාගතා. තෙ මං චතුන්නං සතිපට්ඨානානං උපාදායුපාදාය පඤ්හං පුච්ඡෙය්‍යුං, පුට්ඨො පුට්ඨො චාහං තෙසං ව්‍යාකරෙය්‍යං. ව්‍යාකතඤ්ච මෙ ව්‍යාකතතො ධාරෙය්‍යුං. න ච මං දුතියකං උත්තරිං පටිපුච්ඡෙය්‍යුං අඤ්ඤත්‍ර අසිතපීතඛායිතසායිතා, අඤ්ඤත්‍ර උච්චාරපස්සාවකම්මා, අඤ්ඤත්‍ර නිද්දාකිලමථපටිවිනොදනා, අපරියාදිණ්ණායෙවස්ස සාරිපුත්ත තථාගතස්ස ධම්මදෙසනා. අපරියාදිණ්ණංයෙවස්ස තථාගතස්ස ධම්මපද බ්‍යඤ්ජනං. අපරියාදිණ්ණංයෙවස්ස තථාගතස්ස පඤ්හපටිභානං. අථ මෙ තෙ චත්තාරො සාවකා වස්සසතායුකා වස්සසතජීවිනො වස්සසතස්ස අච්චයෙන කාලං කරෙය්‍යුං. මඤ්චකෙන චෙපි මං සාරිපුත්ත පරිහරිස්සථ නෙවත්ථි තථාගතස්ස පඤ්ඤාවෙය්‍යත්තියස්ස අඤ්ඤථත්තං.

62. යං ඛො පනෙතං සාරිපුත්ත සම්මා වදමානො වදෙය්‍ය: අසම්මොහධම්මො සත්තො ලොකෙ උප්පන්නො බහුජනහිතාය බහුජන-සුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති, මමෙව තං සම්මා වදමානො වදෙය්‍ය: අසම්මොහධම්මො සත්තො ලොකෙ උප්පන්නො බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

63. තෙන ඛො පන සමයෙන ආයස්මා **නාගසමාලො** භගවතො පිට්ඨිතො ඨිතො හොති භගවන්තං බීජයමානො. අථ ඛො ආයස්මා නාගසමාලො භගවන්තං එතදවොච: "අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ. අපි ච මෙ භන්තෙ ඉමං ධම්මපරියායං සුත්වා ලොමානි හට්ඨානි. කො නාමො අයං භන්තෙ ධම්මපරියායො"ති. තස්මාතිහ ත්වං නාගසමාල ඉමං ධම්මපරියායං **ලොමහංසනපරියායො** ත්වෙව නං ධාරෙහීති.

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා නාගසමාලො භගවතො භාසිතං අභිනන්දීති.

මහාසීහනාදසුත්තං දුතියං.

Free Distribution www.aathaapi.org

61. ශාරීපුත්‍රය, මාගේ මේ ශාසනයෙහි සියක් අවුරුදු ආයු ඇති සියක් අවුරුදු ජීවත් වන, (පද සියදහසකුදු එකවර ඇසූ පමණින් ඉගෙනීමට සමර්‍ථ) උතුම් ස්මෘති ගතියෙන් ද, (උගත් දෙය දරා පවත්වා ගැනීමට සමර්‍ථ) සිහියෙන් ද, (දුරු දෙය වණ පොත් කොට දැරීමට සමර්‍ථ) ධෘතියෙන් ද, උතුම් ප්‍රඥාව පිළිබඳ ව්‍යක්තභාවයෙන් ද යුක්ත වූ ශ්‍රාවකයෝ සතර දෙනෙක් ඇත් ද, ශාරීපුත්‍රය, උගත් සිප් ඇති, කෘතහස්ත වූ, (රාජකුලාදියෙහි) දක්වූ ශිල්ප ඇති දැඩි දුන්නක් ගෙන සිටි දුනුවායෙක් සැහැල්ලු ඊයකින් තිදුකින් ම තල්සෙය සරස යම්සේ ඉක්මවන්නේ ද, මෙසේ අතිකමාත්‍රසමෘති ඇත්තා වූ මෙසේ අතිකමාත්‍ර ගති ඇත්තා වූ මෙසේ අතිකමාත්‍ර ධෘති ඇත්තා වූ මෙසේ උතුම් ප්‍රඥාව පිළිබඳ ව්‍යක්තභාවයෙන් යුක්ත වූ ඒ ශ්‍රාවකයෝ සතර සතිපට්ඨානයන්ගෙන් එකිනෙක ගෙන මා අතින් ප්‍රශ්න විචාරන්නාහු නම් විචාළ විචාළ ප්‍රශ්නය මම ඔවුන්ට විසඳන්නෙමි. මා විසින් විසඳනලද්ද විසඳු සේ ඔහු දරන්නාහු ය. මත්තෙහි දෙවෙනි ප්‍රශ්නයක් මා නො පිළිවිස්නාහු ය. කන බොන රස විඳින කාලය තබා මල මූ පහ කරන කාලය තබා නිදීම් විඩා හැරීම් දුරු කරන කාලය තබා (සෙසු හැම කල්හි ඔහු ප්‍රශ්නවිචාරත්ද,) ශාරීපුත්‍රය, තථාගතයන්ගේ ධර්‍මදෙශනාව පරික්‍ෂීණ නො වේ ම ය. තථාගතයන්ගේ පාළිය පිළිබඳ පද හා අක්‍ෂර පරික්‍ෂීණ නො වේ ම ය. තථාගතයන්ගේ ප්‍රශ්න විසඳීම පරික්‍ෂීණ නො වේ ම ය. එසේ වත්ම, අවුරුදු සියක් ආයු ඇති අවුරුදු සියක් ජීවත් වනසුලු ඒ මාගේ ශ්‍රාවකයෝ සතර දෙන අවුරුදු සියය ඇවෑමෙන් කාලක්‍රියා කරන්නාහු ය. ශාරීපුත්‍රය, ඉදින් මා ඇඳක තබා ගෙන පරිහරණය කරන්නාහු නමුදු තථාගතයන්ගේ ප්‍රඥාව පිළිබඳ ව්‍යක්තභාවයෙහි වෙනසෙක් නො ම ඇත.

62. ශාරීපුත්‍රය, මනා කොට (සැබෑ)කියන්නෙක් "නොමුළා වන සවභාව ඇති සත්ත්වයෙක් ලොකයෙහි බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සැප පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙවිමිනිසුන්ට වැඩ පිණිස, සුව පිණිස උපන්නේ ය," යි යමකු උදෙසා කියන්නේ නම්, මනා කොට කියන ගේ "නොමුළා වන සවභාව ඇති සත්ත්වයෙක් ලොකයෙහි බොහෝ දෙනාට වැඩ පිණිස, බොහෝ දෙනාට සැප පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙවිමිනිසුන්ට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස උපන " යන ඒ වචනය මා උදෙසා ම කියන්නේ ය.

63. එසමයෙහි වතාහි ආයුෂ්මත් නාගසමාල ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට පවන් සලමින් භාග්‍යවතුන් වහන්සේගේ පිටුපසැ සිටියේ වෙයි. එකල්හි නාගසමාල ආයුෂ්මත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය. වහන්ස ආශ්චර්‍යය, වහන්ස අද්භූතය. තව ද වහන්ස, මේ ධර්‍මක්‍රමය අසා මාගේ ලොමයෝ දහ ගත්හ. වහන්ස මේ කිනම් ධර්‍මක්‍රමයෙක් දැ? නාගසමාල, එසේ නම් තෙපි මේ ධර්‍මපර්‍යාය ලොමහංසනපරියාය යි කියා ම දරව යි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු සිත් ඇති ආයුෂ්මත් නාගසමාල තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්තේ ය.

මහාසීහනාද සූත්‍රය දෙවැනියි.

1. 2. 3.

මහාදුක්ඛක්ඛන්ධ සුත්තං

1. **එවං මෙ සුතං:** එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ අථ ඛො සම්බහුලා භික්ඛූ පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථිං පිණ්ඩාය පවිසිංසු. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: අතිප්පගො ඛො තාව සාවත්ථියං පිණ්ඩාය චරිතුං, යන්නූන මයං යෙනඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමෙය්‍යාමාති.

2. අථ ඛො තෙ භික්ඛූ යෙනඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො තෙ භික්ඛූ තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එතදවොචුං: සමණො ආවුසො ගොතමො කාමානං පරිඤ්ඤං පඤ්ඤපෙති. මයම්පි කාමානං පරිඤ්ඤං පඤ්ඤපෙම. සමණො ආවුසො ගොතමො රූපානං පරිඤ්ඤං පඤ්ඤපෙති. මයම්පි රූපානං පරිඤ්ඤං පඤ්ඤපෙම. සමණො ආවුසො ගොතමො වෙදනානං පරිඤ්ඤං පඤ්ඤපෙති. මයම්පි වෙදනානං පරිඤ්ඤං පඤ්ඤපෙම. ඉධ නො ආවුසො කො විසෙසො කො අධිප්පායො කිං නානාකරණං, සමණස්ස වා ගොතමස්ස අම්හාකං වා යදිදං ධම්මදෙසනාය වා ධම්මදෙසනං, අනුසාසනියා වා අනුසාසනින්ති?

3. අථ ඛො තෙ භික්ඛූ තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං භාසිතං නෙව අභිනන්දිංසු. නප්පටික්කොසිංසු. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා උට්ඨායාසනා පක්කමිංසු භගවතො සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමාති.

4. අථ ඛො තෙ භික්ඛූ සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: ඉධ මයං භන්තෙ පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථිං පිණ්ඩාය පවිසිම්හ. තෙසං නො භන්තෙ අම්හාකං එතදහොසි: "අතිප්පගො ඛො තාව සාවත්ථියං පිණ්ඩාය චරිතුං, යන්නූන මයං යෙනඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමෙය්‍යාමා" ති. අථ ඛො මයං භන්තෙ යෙනඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමිම්හ. උපසඞ්කමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදිම්හ. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිම්හ. එකමන්තං නිසින්නෙ ඛො භන්තෙ තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා අම්හෙ එතදවොචුං: සමණො ආවුසො ගොතමො කාමානං පරිඤ්ඤං පඤ්ඤපෙති. මයම්පි කාමානං පරිඤ්ඤං පඤ්ඤපෙම. සමණො ආවුසො ගොතමො රූපානං පරිඤ්ඤං පඤ්ඤපෙති. මයම්පි රූපානං පරිඤ්ඤං පඤ්ඤපෙම.-

1. 2. 3.

මහාදුක්ඛක්ඛන්ධ සූත්‍රය.

1. **මා** විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි වූ **ජේතවන** නම් අනේපිඩුසිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි බොහෝ භික්ෂූහු පෙරවරුයෙහි හැඳ පෙරෙව පා සිවුරු ගෙන සැවැත්නුවර පිඩු පිණිස පිවිසියහ. එකල්හි ඒ භික්ෂූන්ට මෙවැනි අදහසෙක් වීය: 'පිඩු පිණිස හැසිරීමට මෙතෙක් ඉතා අලුයම, අන්තොටු පිරිවැජියන්ගේ අරමට පැමිණෙන්නෙමු නම් මැනැවැ' යි.

2. ඉක්බිති ඒ භික්ෂූහු අන්තොටු පිරිවැජියන්ගේ අරමට එළැඹියහ. එළැඹැ ඒ අන්තොටු පිරිවැජියන් සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ම ඒ භික්ෂූන්ට ඒ අන්තොටු පිරිවැජියෝ මෙය කීහු: 'ඇවැත්නි, ශ්‍රමණගෞතම තෙමේ කාමයන්ගේ ප්‍රහාණිය පනවයි. අපිත් කාමයන්ගේ ප්‍රහාණිය පනවමු. ඇවැත්නි, ශ්‍රමණ ගෞතම තෙමේ රූපයන්ගේ ප්‍රහාණිය පනවයි. අපි ද රූපයන්ගේ ප්‍රහාණිය පනවමු. ඇවැත්නි, ශ්‍රමණ ගෞතම තෙමේ වෙදනාවන්ගේ ප්‍රහාණිය පනවයි. අපිත් වෙදනාවන්ගේ ප්‍රහාණිය පනවමු. ඇවැත්නි, මෙහි ශ්‍රමණගෞතමයන්ගේ හෝ අපගේ හෝ ධර්මදෙශනා සමග ධර්මදෙශනා ද අනුශාසනාව සමග අනුශාසනාව ද ඇරබ වෙනස කවරේ ද? අධික ප්‍රයොග කවරේ ද? නානාකාරණය කුමක් ද?

3. එකල්හි ඒ භික්ෂූහු ඒ අන්තොටු පිරිවැජියන්ගේ භාෂිතය නො ම පිළිගත්හ. පිළිකෙවු ද නො කළහ. නො පිළිගෙන නො පිළිකෙවු කොට "භාග්‍යවතුන් වහන්සේගේ හමුයෙහි දී මෙබසෙහි අදහස දැන ගන්නෙමු"යි හුනස්නෙන් නැගිට ගියාහු ය.

4. ඉක්බිති ඒ භික්ෂූහු සැවැත්නුවර පිඩු පිණිස හැසිර බතින් පසු පිණ්ඩපාතයෙන් වැළැකුණාහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළ කළහ: "වහන්ස, මෙහි අපි පෙරවරු හැඳ පෙරෙව පා සිවුරු ගෙන සැවැත් නුවරට පිඩු පිණිස පිවිසියම්හ. වහන්ස, අපට මෙබඳු අදහසෙක් වී ය: සැවැත්නුවර පිඩු පිණිස හැසිරෙන්නට මෙතෙක් ඉතා අලුයම, අන්තොටු පිරිවැජියන්ගේ ආරාමය වෙත එළඹෙන්නමු නම් මැනැවැ' යි. වහන්ස, එකල්හි අපි අන්තොටු පිරිවැජියන්ගේ ආරාමය වෙත එළැඹියෙමු. එළැඹ ඒ අන්තොටු පිරිවැජියන් සමඟ සතුටු වූයෙමු. සතුටු විය යුතු සිහි කට යුතු කථා කොට නිමවා එකත්පසෙක හුන්නෙමු. වහන්ස, එකත්පසෙක හුන් අපට ඒ අන්තොටු පිරිවැජියෝ මෙය කීහු: 'ඇවැත්නි, ශ්‍රමණ ගෞතම තෙමේ කාමයන්ගේ ප්‍රාහාණය පනවයි. අපි ද කාමයන්ගේ ප්‍රහාණය පනවමු. ඇවැත්නි, ශ්‍රමණ ගෞතම තෙමේ රූපයන්ගේ ප්‍රහාණය පනවයි. අපි ද රූපයන්ගේ ප්‍රාහණිය පනවමු-

සමණො ආවුසො ගොතමො වෙදනානං පරිඤ්ඤං පඤ්ඤපෙති. මයම්පි වෙදනානං පරිඤ්ඤං පඤ්ඤපෙම. ඉධ නො ආවුසො කො විසෙසො කො අධිප්පායො කිං නානාකරණං, සමණස්ස වා ගොතමස්ස අම්හාකං වා යදිදං ධම්මදෙසනාය වා ධම්මදෙසනං, අනුසාසනියා වා අනුසාසනින්ති? අථ ඛො මයං භන්තෙ තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං භාසිතං නෙව අභිනන්දිම්හ නප්පටික්කොසිම්හ. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා උට්ඨායාසනා පක්කමිම්හ "භගවතො සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමා" ති.

5. එවංවාදිනො භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා: කො පනාවුසො කාමානං අස්සාදො? කො ආදීනවො? කිං නිස්සරණං? කො රූපානං අස්සාදො? කො ආදීනවො? කිං නිස්සරණං? කො වෙදනානං අස්සාදො? කො ආදීනවො? කිං නිස්සරණන්ති? එවං පුට්ඨා භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා න චෙව සම්පායිස්සන්ති. උත්තරිඤ්ච විඝාතං ආපජ්ජිස්සන්ති. තං කිස්ස හෙතු? යථා තං භික්ඛවෙ අවිසයස්මිං. නාහං තං භික්ඛවෙ පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යො ඉමෙසං පඤ්හානං වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙය්‍ය, අඤ්ඤත්‍ර තථාගතෙන වා තථාගත-සාවකෙන වා ඉතො වා පන සුත්වා.

6. කො ච භික්ඛවෙ කාමානං අස්සාදො? පඤ්චිමෙ භික්ඛවෙ කාමගුණා. කතමෙ පඤ්ච? චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච කාමගුණා. යං ඛො භික්ඛවෙ ඉමෙ පඤ්ච කාමගුණෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං කාමානං අස්සාදො.

7. කො ච භික්ඛවෙ කාමානං ආදීනවො? ඉධ භික්ඛවෙ කුලපුත්තො යෙන සිප්පට්ඨානෙන[1] ජීවිකං කප්පෙති: යදි මුද්දාය, යදි ගණනාය, යදි සඞ්ඛානෙන, යදි කසියා, යදි ගොරක්ඛෙන, යදි ඉස්සත්ථෙන, යදිරාජ-පොරිසෙන, යදි සිප්පඤ්ඤතරෙන, සීතස්ස පුරක්ඛතො උණ්හස්ස පුරක්ඛතො, ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙහි රිස්සමානො[2], ඛුප්පිපාසාය මීයමානො.[3] අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

1. සිප්පුට්ඨානෙන, සයා, 2. රිරියමානො, කත්ථචි.
3. මීය්‍යමානො, සයා.

ඇවැත්නි, ශ්‍රමණ ගෞතම තෙමේ වේදනාවන්ගේ ප්‍රහාණය පනවයි. අපි ද වේදනාවන්ගේ ප්‍රහාණය පනවමු. ඇවැත්නි, මෙහි ශ්‍රමණ ගෞතමයන්ගේ හෝ අපගේ හෝ ධර්මදේශනාව සමග ධර්මදේශනාව ද අනුශාසනාව සමග අනුශාසනාව ද ඇරබ වෙනස කවරේ ද? අධිකප්‍රයොගය කවරේ ද? නා නා කාරණය කුමක් ද? යි. එකල්හි වහන්ස, ඒ අන්‍යතොථ්‍ය පිරිවැජියන්ගේ භාෂිතය නොම පිළිගතිමු. පිළිකෙවු ද නො කෙළෙමු. නො පිළිගෙන නො පිළිකෙවු කොට "භාග්‍යවතුන් වහන්සේගේ හමුයෙහි මේ බසෙහි අදහස දැන ගනිමු" යි හුනස්නෙන් නැගිට ගියෙමු.

5. මහණෙනි, මෙසේ කියන්නා වූ අන්‍යතොථ්‍ය පිරිවැජියෝ මෙසේ කියයුතු වන්නාහු ය: "ඇවැත්නි, කාමයන්ගේ ආස්වාදය කවරේ ද? ආදීනවය කවරේ ද? නිස්සරණය කුමක් ද? රූපයන්ගේ ආස්වාදය කවරේ ද? ආදීනවය කවරේ ද? නිස්සරණය කුමක් ද? වේදනාවන්ගේ ආස්වාදය කවරේ ද? ආදීනවය කවරේ ද? නිස්සරණය කුමක්ද' යි. මහණෙනි, මෙසේ විචාළා වූ අන්‍යතොථ්‍ය පිරිවැජියෝ මෙය සපයා කිය නොහෙන්නාහ. මත්තෙහි ද වෙහෙසට පැමිණෙන්නාහ. එය කවර හෙයින යත්: එය ඔවුන්ට විෂය නො වූ ප්‍රශ්නයක් වන බැවිනි. මහණෙනි, තථාගතයන්ගෙන් හෝ තථාගත ශ්‍රාවකයාගෙන් හෝ මේ ශාසනයෙන් හෝ නො අසා යමෙක් මේ ප්‍රශ්න විසඳීමෙන් සිත සතුටු කරන්නේ නම් එවැන්නක්හු දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයෙහි, දෙව් මිනිසුන් සහිත මහණබමුණන් සහිත ප්‍රජාවෙහි මම නොදකිමි.

6. මහණෙනි, කාමයන්ගේ ආස්වාදය කවරේ ද? මහණෙනි, මේ කාමගුණ පසෙකි. කවර පසෙක් ද? චක්ෂුර්විඥානයෙන් දතයුතු වූ ඉෂ්ට වූ කාන්තවූ මන වඩන්නා වූ ප්‍රිය රූප වූ රාගය ඉපදීමට කරුණු වූ රූපයෝය. ශ්‍රොත්‍රවිඥානයෙන් දතයුතු වූ... ශබ්දයෝ ය. ඝ්‍රාණවිඥානයෙන් දතයුතු වූ... ගන්ධයෝ ය. ජිහ්වාවිඥානයෙන් දත යුතු වූ... රසයෝ ය. කාය-විඥානයෙන් දතයුතු වූ ඉෂ්ට වූ කාන්තවූ මනවඩන්නාවූ ප්‍රියරූප වූ කාමොපසංහිතවූ රාගය ඉපදීමට කරුණුවූ ස්ප්‍රෂ්ටව්‍යයෝ ය. මහණෙනි, මේ පඤ්ච කාමගුණයෝයි. මහණෙනි, මේ පස්කම් ගුණ නිසා යම් සැපයෙක් සොම්නසෙක් උපදී ද, මේ කාමයන්ගේ ආස්වාදය යි.

7. මහණෙනි, කාමයන්ගේ ආදීනව කවරේ ද? මහණෙනි, මේ ලොකයෙහි කුලපුත්‍රයෙක් යම් ශිල්පයෙකින් හස්තමුද්‍රායෙන් හෝ අච්ඡිද්‍ර ගණනායෙන් හෝ පිණ්ඩගණනායෙන් හෝ සී සෑමෙන් හෝ වෙළෙඳාමෙන් හෝ ගවපාලනයෙන් හෝ අවි ගෙන රජුට කරන උවැටනින් හෝ අවියෙන් තොර ම රාජසේවා කිරීමෙන් හෝ අන්‍යතර ශිල්පයෙකින් හෝ ශීතයෙන් පෙළුණේ උෂ්ණයෙන් පෙළුණේ මැසි මදුරු සුලං අව් සප් යන මොවුන්ගේ පහසින් ගැටෙමින් සාපිපාසායෙන් මැරෙමින් ජීවිකාව කෙරෙයි. මහණෙනි, කාමයන්ගේ උපද්‍රව වූ තමා විසින් ම දැක්ක යුතු වූ මේ දුක්රාස කාමය හෙතු කොට කාමය මූලකාරණය කොට කාමය කරුණු කොට ඇත. කාමයන්ගේ ම හෙතුවෙන් වෙයි.

8. තස්ස චෙ භික්ඛවෙ කුලපුත්තස්ස එවං උට්ඨහතො ඝටතො වායමතො භොගා නාභිනිප්ඵජ්ජන්ති, සො සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජති: "මොඝං වත මෙ උට්ඨානං, අඵලො වත මෙ වායාමොති." අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

9. තස්ස චෙ භික්ඛවෙ කුලපුත්තස්ස එවං උට්ඨහතො ඝටතො වායමතො තෙ භොගා අභිනිප්ඵජ්ජන්ති, සො තෙසං භොගානං ආරක්ඛාධිකරණං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති: "කින්ති මෙ භොගෙ නෙව රාජානො හරෙය්‍යුං න චොරා හරෙය්‍යුං න අග්ගි ඩහෙය්‍ය න උදකං වහෙය්‍ය[1] න අප්පියා දායාදා හරෙය්‍යු"න්ති. තස්ස එවං ආරක්ඛතො ගොපයතො තෙ භොගෙ රාජානො වා හරන්ති, චොරා වා හරන්ති, අග්ගි වා ඩහති, අප්පියා වා දායාදා හරන්ති. සො සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජති: 'යම්පි මෙ අහොසි තම්පි නො නත්ථී'ති. අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

10. පුන ච පරං භික්ඛවෙ කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු රාජානොපි රාජූහි විවදන්ති. ඛත්තියාපි ඛත්තියෙහි විවදන්ති. බ්‍රාහ්මණාපි බ්‍රාහ්මණෙහි විවදන්ති. ගහපතීපි ගහපතීහි විවදන්ති. මාතාපි පුත්තෙන විවදති. පුත්තොපි මාතරා විවදති. පිතාපි පුත්තෙන විවදති. භාතාපි භාතරා විවදති. භාතාපි භගිනියා විවදති. භගිනීපි භාතරා විවදති. සහායොපි සහායෙන විවදති. තෙ තත්ථ කලහවිග්ගහවිවාදාපන්නා අඤ්ඤමඤ්ඤං පාණීහිපි උපක්කමන්ති. ලෙඩ්ඩූහිපි උපක්කමන්ති. දණ්ඩෙහිපි උපක්කමන්ති. සත්ථෙහිපි උපක්කමන්ති. තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති මරණමත්තම්පි දුක්ඛං. අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

1. වාහෙය්‍ය, කත්ථචි.

8. මහණෙනි, මෙසේ උත්ථානවීර්‍ය්‍යය කරන්නා වූ ගටන්නා වූ වෑයම් කරන්නා වූ ඒ කුලපුත්‍රයාහට ඒ භොගයෝ නො නිපැදෙත් නම්, හෙතෙම ‘ඒකාන්තයෙන් මාගේ උත්සාහය හිස් විය මාගේ ව්‍යායාමය නිෂ්ඵලය ’ යි ශොක කරයි. වෙහෙසෙයි. වැලපෙයි. ළෙහි අත් ගසමින් හඬයි. සිහි මුළාබවට පැමිණෙයි, මහණෙනි, කාමයන්ගේ ආදීනවය වූ තමා විසින් ම දක්ක යුතු වූ මේ දුක්රැස ද කාමය හෙතුකොට ඇත්තේ ය. කාමය මූලකාරණය කොට ඇත කාමය කරුණු කොට ඇත. කාමයන්ගේ ම හෙතුවෙන් වෙයි

9. මහණෙනි, මෙසේ උත්ථානවීර්‍ය්‍යය කරන්නා වූ ගටන්නා වූ වෑයම් කරන්නා වූ ඒ කුලපුත්‍රයාහට ඒ භොගයෝ මනා ව නිපැදෙත් නම්, හෙ තෙමේ කෙසේ මාගේ මේ භොගයන් රජවරු පැහැර නො ගන්නාහු ද, හොරු පැහැර නො ගන්නාහු ද, ගින්න නො දවා ද, දිය පා කොට නොහරී ද, අප්‍රිය දායාදයෝ (දුපුත්තු) පැහැර නො ගන්නාහු දැ’ යි ඒ භොගයන්ගේ ආරක්ෂාව කරුණු කොට ඇති දුක් දොම්නස් විඳී. මෙසේ රකින ගොපනය කරන ඔහුගේ ඒ භොගයන් රජවරු හෝ ගනිත්. හොරු හෝ ගනිත්. ගින්න හෝ දවයි. ජලය හෝ පා කොට හරියි. අප්‍රිය දායාදයෝ හෝ ගනිත්. හෙතෙම ‘යමක් මට වී ද, එය ද අපට නැති වී’ ය යි ශොක කරයි. වෙහෙසෙයි. වැලැපෙයි. ළෙහි අත් ගසමින් හඬයි. සිහි මුළාබවට පැමිණෙයි. මහණෙනි, කාමයන්ගේ ආදීනවය වූ තමා විසින් ම දක්කයුතු වූ මේ දුක්රැස ද කාමය හෙතු කොට කාමය මූලකාරණය කොට කාමය කරුණු කොට ඇත. කාමයන්ගේම හෙතුවෙන් වෙයි.

10. නැවත අනෙකක් ද වෙයි: මහණෙනි, කාමයන් හෙතු කොට ගෙන කාමයන් මූලකාරණය කොට ගෙන කාමයන් කරුණු කොට ගෙන කාමයන්ගේ ම හෙතුවෙන් රජ්ජු ද රජුන් සමග විවාද කරත්. ක්‍ෂත්‍රියයෝ ද ක්‍ෂත්‍රියන් සමග විවාද කරත්. බමුණෝ ද බමුණන් සමග විවාද කරත්. ගෘහපතියෝ ද ගෘහපතියන් සමග විවාද කරත්. මව ද පුතු සමග විවාද කරයි. පුතා ද මව සමග විවාද කරයි. පියා ද පුතා සමග විවාද කරයි. පුතා ද පියා සමග විවාද කරයි. සහොදරයා ද සහොදරයා සමග විවාද කරයි. සහොදරයා ද සහොදරිය සමග විවාද කරයි. සහොදරිය ද සහොදරයා සමග විවාද කරයි. ඔහු එහිදී කලහ විග්‍රහ විවාදයනට පැමිණියාහු ඔවුනොවුන්ට අතින් ද පහර දෙති. කැටකැබිලිත්තෙන් ද පහර දෙති. මුගුරුවලින් ද පහර දෙති. සැත්වලින් ද පහර දෙති. ඔහු එහි දී මරණයට ද පැමිණෙති. මරණමාත්‍ර දුකට ද පැමිණෙත්. මහණෙනි, කාමයන්ගේ ආදීනවය වූ තමා විසින් ම දක්ක යුතු වූ මේ දුක් රැස ම කාමය හෙතු කොට ඇත. කාමය මූලකාරණය කොට කාමය කරුණු කොට ඇත. කාමයන්ගේ ම හෙතුවෙන් වෙයි.

11. පුන ච පරං භික්ඛවෙ කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා උභතොවියූළ්හං සඞ්ගාමං පක්ඛන්දන්ති උසූසුපි ඛිප්පමානෙසු සත්තීසුපි ඛිප්පමානාසු අසීසුපි විජ්ජොතලන්තෙසු. තෙ තත්ථ උසූහිපි විජ්ඣන්ති, සත්තියාපි විජ්ඣන්ති, අසිනාපි සීසං ඡින්දන්ති. තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති මරණමත්තම්පි දුක්ඛං අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

12. පුන ච පරං භික්ඛවෙ කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා අද්දාවලෙපනා[1] උපකාරියො පක්ඛන්දන්ති උසූසුපි ඛිප්පමානෙසු සත්තීසුපි ඛිප්පමානාසු අසීසුපි විජ්ජොතලන්තෙසු. තෙ තත්ථ උසූහිපි විජ්ඣන්ති, සත්තියාපි විජ්ඣන්ති, පක්කට්ඨියාපි[2] ඔසිඤ්චන්ති, අභිවග්ගෙනපි ඔමද්දන්ති, අසිනාපි සීසං ඡින්දන්ති. තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති, මරණමත්තම්පි දුක්ඛං. අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

13. පුන ච පරං භික්ඛවෙ කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු සන්ධිම්පි ඡින්දන්ති, නිල්ලොපම්පි හරන්ති, එකාගාරිකම්පි කරොන්ති, පරිපන්ථෙපි තිට්ඨන්ති, පරදාරම්පි ගච්ඡන්ති. තමෙනං රාජානො ගහෙත්වා විවිධා කම්මකාරණා[3] කාරෙන්ති: කසාහිපි තාළෙන්ති, වෙත්තෙහිපි තාළෙන්ති, අඩ්ඪදණ්ඩකෙහිපි තාළෙන්ති, හත්ථම්පි ඡින්දන්ති, පාදම්පි ඡින්දන්ති, හත්ථපාදම්පි ඡින්දන්ති, කණ්ණම්පි ඡින්දන්ති, නාසම්පි ඡින්දන්ති, කණ්ණනාසම්පි ඡින්දන්ති, බිලඞ්ගථාලිකම්පි කරොන්ති, සඞ්ඛමුණ්ඩිකම්පි කරොන්ති, රාහුමුඛම්පි කරොන්ති, ජොතිමාලිකම්පි කරොන්ති, හත්ථපජ්ජොතිකම්පි කරොන්ති, එරකවත්තිකම්පි කරොන්ති, චීරකවාසිකම්පි කරොන්ති, එණෙය්‍යකම්පි කරොන්ති, බළිසමංසිකම්පි කරොන්ති, කහාපණකම්පි කරොන්ති-

1. අච්චාවලෙපනා, සයා; 2. ඡකණකායපි, මජසං.
3. විවිධානි කම්මකාරණානි, සයා.

11. නැවත ද අනෙකෙක් වෙයි. මහණෙනි කාමයන් හෙතු කොට ගෙන කාමයන් මූලකාරණය කොට ගෙන කාමයන් කරුණු කොට ගෙන කාමයන්ගේ ම හෙතුවෙන් ඊතල විදිනු ලබන කල්හි අඩයටි හෙලනු ලබන කල්හි කඩු ඔබමොබ පෙරළෙන කල්හි කඩුව හා පලිහ ගෙන දුනු හියවුරු බැඳගෙන දෙපසින් රැස් වූ රණබිමට වදිත්. ඊවලින් ද විදිති. අඩයටියෙන් ද විදිත්. කඩුවෙන් ද හිස සිඳිති එහි දී ඔහු මරණයට ද පැමිණෙති. මරණමාත්‍ර දුකට ද පැමිණෙත්. මහණෙනි, කාමයන්ගේ ආදීනවය වූ තමා විසින්ම දක්ක යුතුවූ මේ දුක් රැසම කාමය මූලකාරණය කොට කාමය හෙතු කොට ඇත. කාමය කරුණු කොට ඇත. කාමයන්ගේ ම හෙතුවෙන් වෙයි.

12. නැවත ද අනෙකෙක් වෙයි. මහණෙනි, කාමයන් හෙතු කොට ගෙන කාමයන් මූලකාරණය කොට ගෙන කාමයන් කරුණු කොට ගෙන කාමයන්ගේ ම හෙතු වෙන් ඊතල විදිනු ලබන කල්හි අඩ යටි හෙලෙන කල්හි කඩු පෙරළෙන කල්හි කඩු හා පලිහ ගෙන දුනු හියවුරු බැඳ ගෙන තෙත් මඩ අලෙවි කළ පවුරු පදනම්වලට පනිත්. එහිදී ඔහු ඊවලින් ද විදිති. අඩයටියෙන් ද විදිති. කකියන ගොම්න් ද ඉසිති. ශතදන්ත යෙතුදු මඩිති. කඩුවෙන් ද හිස සිඳිති. එහි දී ඔහු මරණයට ද පැමිණෙති. මරණමාත්‍ර දුකට ද පැමිණෙත්. මහණෙනි, කාමයන්ගේ ආදීනවය වූ තමා විසින් ම දක්කයුතු වූ මේ දුක්රැස ද කාමය හෙතු කොට කාමය මූලකාරණය කොට කාමය කරුණු කොට ඇත්තේය. කාමයන්ගේ ම හෙතුවෙන් වෙයි.

13. නැවත ද අනෙකෙක් වෙයි. මහණෙනි, කාමයන් හෙතු කොට ගෙන කාමයන් මූලකාරණය කොට ගෙන කාමයන් ආධාර කොට ගෙන කාමයන්ගේ ම හෙතුවෙන් ගෘහසන්ධි සිඳිති. ගම් පහරති. එක් ගෙයක් වට කොට ගෙවැසියන් දිවියෙන් ගෙන ධනය ගෙන්වා ගනිති. මං පහරති. පරඹුව ද කරු යෙති. රජවරු ඒ මොහු අල්ලා ගෙන නන්වැදෑරුම් කම් කටොලු කරති. කසවලින් ද තළත්. වේවැල්වලින් ද තළත්. මුගුරු වලින්ද තළත්. අත ද සිඳිත්. පා ද සිඳිත්. අත් පා ද සිඳිත්. කන ද සිඳිත්. නාසය ද සිඳිත්. කන්නාසා ද සිඳිත්. බිලඞ්ගථාලිකය (හිස්කබල කැඳසැළියක් මෙන් කරණ කම්ය) කරති. ශඞ්ඛමුණ්ඩිකය (හිස්කබල බොරළු උලා දෙවා හක් මුඩුවක් මෙන් කරන කම්ය) ද කරවති. රාහුමුඛය (අඬුවෙන් මුඛය විවෘත කොට ඇතුළත පහන් දල්වීමෙන් කරන කම්ය)ද කරති. ජොතිමාලිකය සිරුරෙහි තෙල්පිළී ඔතා ගිනි දල්වීමෙන් කරන කම්ය ද කරති හත්ථ-පජ්ජොතිකය (අත් තෙල්පිළියෙන් වෙළා ගිනි දල්වීමෙන් කරන කම්යද කරති. එරකවත්තිකය (ගෙලෙහි යටපටන් සම ගලවා ගොප් ඇටයෙහි හෙළා ගොතින් බැඳ අදිමින් කරන කම්ය ද කරත්. චීරකවාසිකය (ගෙල පටන් සම ගලවා කටියෙහි ද කටියෙහි පටන් සම ගලවා ගොප්ඇටයෙහි තබා වැහැරි වතක් මෙන් කරන කම්ය) ද කරති. එණෙය්‍යකය (දෙදණ දෙවැලමිටෙහි යවුල් ගසා බිමට සවි කොට අවට ගිනි දල්වා කරන කම්ය ද කරති. බළිසමංසික (දෙපස කටු ඇති ඇවුලුම් බිළියෙන් ඇන සම්මස් තහර උපුටා ලන කම්ය) ද කරති. කහාපණකය (මුළු සිරුර තියුණු වෑයෙන් කහවණු පමණ කොට සසින කම්ය ද කරති. –

බාරාපතච්ඡිකම්පි කරොන්ති. පලිසපරිවත්තිකම්පි කරොන්ති. පලාලපීඨකම්පි කරොන්ති. තත්තෙනපි තෙලෙන ඔසිඤ්චන්ති. සුනඛෙහිපි ඛාදාපෙන්ති. ජීවන්තම්පි සූලෙ උත්තාසෙන්ති. අසිනාපි සීසං ඡින්දන්ති. තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති මරණමත්තම්පි දුක්ඛං. අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

14. පුන ච පරං භික්ඛවෙ කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු කායෙන දුච්චරිතං චරන්ති, වාචාය දුච්චරිතං චරන්ති, මනසා දුච්චරිතං චරන්ති. තෙ කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති. අයං[1] භික්ඛවෙ කාමානං ආදීනවො සම්පරායිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

15. කිඤ්ච භික්ඛවෙ කාමානං නිස්සරණං? යො ඛො[2] භික්ඛවෙ කාමෙසු ඡන්දරාගවිනයො, ඡන්දරාගප්පහානං, ඉදං කාමානං නිස්සරණං.

16. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා එවං කාමානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නප්පජානන්ති. තෙ වත සාමං වා කාමෙ පරිජානිස්සන්ති පරං වා තථත්තාය සමාදපෙස්සන්ති යථා පටිපන්නො කාමෙ පරිජානිස්සතීති නෙතං ඨානං විජ්ජති. යෙ ච ඛො කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා එවං කාමානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං පජානන්ති. තෙ වත සාමං වා කාමෙ පරිජානිස්සන්ති, පරං වා තථත්තාය සමාදපෙස්සන්ති යථා පටිපන්නො කාමෙ පරිජානිස්සතීති ඨානමෙතං විජ්ජති.

17. කො ච භික්ඛවෙ රූපානං අස්සාදො? සෙය්‍යථාපි භික්ඛවෙ ඛත්තියකඤ්ඤා වා බ්‍රාහ්මණකඤ්ඤා වා ගහපතිකඤ්ඤා වා පණ්ණරසවස්සුද්දෙසිකා වා සොළස වස්සුද්දෙසිකා වා නාතිදීඝා නාතිරස්සා නාතිකිසා නාතිථූලා නාතිකාළී[3] නාච්චොදාතා, පරමා සා භික්ඛවෙ තස්මිං සමයෙ සුභා වණ්ණනිභාති? එවං භන්තෙ. යං ඛො භික්ඛවෙ සුභං වණ්ණනිභං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං. අයං රූපානං අස්සාදො.

1. අයම්පි, මජසං. 2 යොච ඛො, කත්ථචි 3. නාතිකාළිකා, සගා

ඛාරාපතච්ඡිකය (ඇඟෙන් සිරුරෙහි තත්හි තත්හි පහරා කෑරම් ඉසීමෙන් කරන කර්මය ද කරත්. පලිඝපරිවත්තිකය (එක් ඇලයකින් හොවා කන් සිදුරෙහි යවුලක් ගසා බිම හා සවි කොට පය ගෙන සිසාරවන කර්මය) ද කරති. පලාලපීඨකය (සිරුරෙහි සිවිසම නොසිඳ ඇඹැරුම් ගලින් ඇට බිඳ පිදුරු බිස්සක් මෙන් කරන කර්මය) ද කරති. රත් වූ තෙලිනුදු ඉස්ති. කිණබල්ලන් ලවා ද කවති. දිවිඇතියහු හුල හිඳුවති. කඩුවෙනුදු හිස සිඳති. එහි දී ඔහු මරණයට ද පැමිණෙති. මරණමාත්‍ර දුකට ද පැමිණෙති. මහණෙනි, කාමයන්ගේ ආදීනවය වූ තමා විසින් ම දැකිය යුතු වූ මේ දුක්රැස ද කාමය හෙතු කොට ඇත. කාමය මූලකාරණ කොට ඇත. කාමය කරුණු හෙතු කොට ඇත. කාමයන්ගේ ම හෙතුවෙන් වෙයි.

14. නැවත ද අනෙකෙක් වෙයි. මහණෙනි, කාමයන් හෙතු කොට ගෙන කාමයන් මූලකාරණය කොට ගෙන කාමයන් කරුණු කොට ගෙන කාමයන්ගේ ම හෙතුවෙන් කයින් දුසිරිත් කරති. වචනයෙන් දුසිරිත් කරති. සිතින් දුසිරිත් කරත්. ඔහු කයින් දුසිරිත් කොට වචනයෙන් දුසිරිත් කොට සිතින් දුසිරිත් කොට කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට පිහිට වූ විවශව පතිත වන්නා වූ නිරයෙහි උපදිති. මහණෙනි, කාමයන්ගේ ආදීනවය වූ පරලොවෙහි වන්නා වූ මේ දුක්රැස කාමය හෙතු කොට කාමය මූලකාරණය කොට කාමය කරුණු කොට ඇත්තේ ය. කාමයන්ගේ ම හෙතුවෙන් වෙයි.

15. මහණෙනි, කාමයන්ගේ නිස්සරණය කවරේ ද? මහණෙනි, යම් මේ කාමයන්ගේ ඡන්දරාගවිනයෙක්, ඡන්දරාගප්‍රහාණයෙක් වේ ද, මේ කාමයන්ගේ නිස්සරණය වේ.

16 මහණෙනි; යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මෙසේ කාමයන්ගේ ආස්වාදය ආස්වාද වශයෙන් ද, ආදීනවය ආදීනව වශයෙන් ද නිස්සරණය නිස්සරණය වශයෙන් ද, තතුසේ නොදනිත් ද, "ඔහු එකාන්තයෙන් තුමූ හෝ කාමයන් විඳපුත් විසින් පිරිසිඳ දන්නාහු ය. යම්සේ පිළිපන්නේ කාමයන් පිරිසිඳ දන්නේ නම්, එබඳු බව පිණිස මෙරමා හෝ සමාදන් කරවන්නාහු ය" යන මේ කාරණය විද්‍යමාන නො වේ. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මෙසේ කාමයන්ගේ ආස්වාදය ආස්වාද වශයෙන් ද, ආදීනවය ආදීනව වශයෙන් ද, නිස්සරණය නිස්සරණ වශයෙන් ද, තතුසේ දනිත් ද, "ඔහු එකාන්තයෙන් තුමූ හෝ කාමයන් පිරිසිඳ දන්නාහු ය. යම් සේ පිළිපන්නේ කාමයන් පිරිසිඳ දන්නේ නම් එබඳුබව පිණිස මෙරමා හෝ සමාදන් කරවන්නාහු ය" යන මේ කාරණය විද්‍යමාන වේ.

17 මහණෙනි, රූපයන්ගේ ආස්වාදය කවරේ ද? මහණෙනි, පසළොස් හැවිරිදි වූ හෝ සොළොස් හැවිරිදි වූ හෝ ඉතා උස් නොවූ ඉතා මිටි නොවූ ඉතා කෘශ නො වූ ඉතා මහත් නොවූ ඉතා කළු නොවූ ඉතා සුදු නොවූ ක්‍ෂත්‍රියකන්‍යාවක් හෝ බ්‍රාහ්මණකන්‍යාවක් හෝ ගෘහපති කන්‍යාවක් හෝ වේ ද, මහණෙනි, ඒ කාලයෙහි (ඇගේ) ඒ ශරීර වර්ණය යහපත් වේ ද? වහන්ස, එසේ ය. මහණෙනි, යහපත් පැහැය නිසා සැපයෙක් සොම්නසෙක් උපදී ද, මේ රූපයන්ගේ ආස්වාදය යි.

14

18. කො ච භික්ඛවෙ රූපානං ආදීනවො? ඉධ භික්ඛවෙ තමෙව භගිනිං පස්සෙය්‍ය අපරෙන සමයෙන ආසීතිකං වා නාවුතිකං වා වස්සසතිකං වා ජාතියා, ජිණ්ණං ගොපානසිවඞ්කං භොග්ගං දණ්ඩපරායනං පවෙධමානං ගච්ඡන්තිං ආතුරං ගතයොබ්බනං ඛණ්ඩදන්තං[1] පලිතකෙසං[2] විලූනං ඛලිතංසිරං[3] වලිතං[4] තිලකාහතගත්තං.[5] තං කිං මඤ්ඤථ භික්ඛවෙ යා පුරිමා සුභා වණ්ණනිභා සා අන්තරහිතා, ආදීනවො පාතුභූතො'ති? එවං භන්තෙ. අයම්පි භික්ඛවෙ රූපානං ආදීනවො.

19. පුන ච පරං භික්ඛවෙ තමෙව භගිනිං පස්සෙය්‍ය ආබාධිකං දුක්ඛිතං බාළ්හගිලානං සකෙ මුත්තකරීසෙ පලිපන්නං සෙමානං අඤ්ඤෙහි වුට්ඨාපියමානං අඤ්ඤෙහි සංවෙසියමානං.[6] තං කිං මඤ්ඤථ භික්ඛවෙ යා පුරිමා සුභා වණ්ණනිභා සා අන්තරහිතා, ආදීනවො පාතුභූතො'ති? එවං භන්තෙ. අයම්පි භික්ඛවෙ රූපානං ආදීනවො.

20. පුන ච පරං භික්ඛවෙ තමෙව භගිනිං පස්සෙය්‍ය සරීරං සීවථිකාය ඡඩ්ඩිතං එකාහමතං වා ද්වීහමතං වා තීහමතං වා, උද්ධුමාතකං විනීලකං විපුබ්බකජාතං. තං කිං මඤ්ඤථ භික්ඛවෙ යා පුරිමා සුභා වණ්ණනිභා සා අන්තරහිතා, ආදීනවො පාතුභූතො' ති? එවං භන්තෙ. අයම්පි භික්ඛවෙ රූපානං ආදීනවො.

21. පුන ච පරං භික්ඛවෙ තමෙව භගිනිං පස්සෙය්‍ය සරීරං සීවථිකාය ඡඩ්ඩිතං කාකෙහි වා ඛජ්ජමානං කුලලෙහි වා ඛජ්ජමානං ගිජ්ඣෙහි වා ඛජ්ජමානං[7] සුවාණෙහි වා[8] ඛජ්ජමානං සිගාලෙහි වා[9] ඛජ්ජමානං විවිධෙහි වා පාණකජාතෙහි ඛජ්ජමානං. තං කිං මඤ්ඤථ භික්ඛවෙ යා පුරිමා සුභා වණ්ණනිභා සා අන්තරහිතා, ආදීනවො පාතුභූතො'ති? එවං භන්තෙ. අයම්පි භික්ඛවෙ රූපානං ආදීනවො.

22. පුන ච පරං භික්ඛවෙ තමෙව භගිනිං පස්සෙය්‍ය සරීරං සීවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකසඞ්ඛලිකං සමංසලොහිතං න්හාරුසම්බන්ධං -පෙ- අට්ඨිකසඞ්ඛලිකං නිම්මංසලොහිතමක්ඛිතං න්හාරුසම්බන්ධං -පෙ- අට්ඨිකසඞ්ඛලිකං අපගතමංසලොහිතං න්හාරුසම්බන්ධං -පෙ- අට්ඨිකානි අපගතසම්බන්ධානි දිසාවිදිසා වික්ඛිත්තානි[10] අඤ්ඤෙන හත්ථට්ඨිකං අඤ්ඤෙන පාදට්ඨිකං අඤ්ඤෙන ජඞ්ඝට්ඨිකං අඤ්ඤෙන ඌරුට්ඨිකං[11] අඤ්ඤෙන කටට්ඨිකං[12] අඤ්ඤෙන පිට්ඨිකණ්ටකං[13] අඤ්ඤෙන සීසකටාහං. තං කිං මඤ්ඤථ භික්ඛවෙ යා පුරිමා සුභා වණ්ණනිභා සා අන්තරහිතා, ආදීනවො පාතුභූතො'ති? එවං භන්තෙ. අයම්පි භික්ඛවෙ රූපානං ආදීනවො.

---

1. ඛණ්ඩදන්තිං සීමු: 2. පලිතකෙසිං, සීමු:. 3. ඛලිතසිරං, සීමු. ඛලලිතසිරං, සභා.
4 වලිතං, සීමු' 5. තිලකාහතගත්තිං, සීමු:
6. සම්පවෙසියමානං, සභා 7. කාකෙහි වා ඛජ්ජමානං, මජසං.
8. සුපාණෙහි, සීමු; සුනඛෙහි වා ඛජ්ජමානං
ව්‍යග්ඝෙහි වා ඛජ්ජමානං, දීපීහි වා ඛජ්ජමානං, මජසං.
9· සිඞ්ගාලෙහි, මජසං. 10 දිසාවිදිසාසු වික්ඛිත්තානි, කණ්ඩව්
11. ඌරුට්ඨිකං, මජසං. 12. කටිට්ඨකං, මජසං.
13. පිට්ඨිට්ඨිකං ... දන්තට්ඨිකං, මජසං.

Free Distribution www.aathaapi.org

18. මහණෙනි, රූපයන්ගේ ආදීනවය කවරේ ද? මහණෙනි, මෙහි පසුකලෙක දී, ඉපදීමෙන් අසූ හැවිරිදි වූ හෝ අනූ හැවිරිදි වූ හෝ සියහැවිරිදි වූ හෝ ජරාවෙන් ජීර්ණ වූ ගොනැස්සක් සේ වක් වූ බිඳුණා වූ සැරයටිය පිහිට කොට ඇති වෙව්ලමින් යන රෝගී වූ පහ වූ යොවුන් ඇති කැඩදත් ඇති පැසුණු කෙහෙ ඇති වැටුණු කෙහෙ ඇති පැතැලි වූ වලයිත වූ (හටගත් ඇඟ රැලි ඇති) තලකැලලින් ගැවසුණු ශරීර ඇති, ඒ නැගණියන් ම දක්නේ වේ ද, මහණෙනි, ඒ කිමැයි හඟිනහු ද, පෙර වූ යම් ශුභ වූ වර්ණයෙක් වී ද, එය අතුරුදහන් වී ද, ආදීනවය පහළ වී ද? වහන්ස, එසේය මහණෙනි, මෙද රූපයන්ගේ ආදීනවය යි.

19. නැවත ද අනෙකෙක් වෙයි. මහණෙනි, රෝගී වූ දුඃඛිත වූ දැඩි ගිලන් වූ තමාගේ ම මලමූත්‍රයෙහි ගැලී හොවින මෙරමා විසින් නැගිටුවනු ලබන මෙරමා විසින් හිඳවනු ලබන ඒ නැගණියන් ම දක්නේ ද, මහණෙනි, ඒ කිමැයි හඟනහු ද? පෙර වූ යම් ශුභ වූ වර්ණයෙක් වී ද, එය අතුරුදහන් වී ද, ආදීනවය පහළ වී ද? වහන්ස, එසේ ය. මහණෙනි, මේ රූපයන්ගේ ආදීනවය යි

20. නැවත ද අනෙකෙක් වෙයි. මහණෙනි, මැරී එක දවසක් ගියා වූ හෝ මැරී දෙදවසක් ගියා වූ හෝ මැරී තුන්දවසක් ගියාවූ හෝ ඉදිමුණු නිල් වූ හටගත් පිළිකුල් පූයා ඇති සොහොනෙහි දැමූ සිරුරක් වූ ඒ නැගණියන් ම දක්නේ ද, මහණෙනි, ඒ කිමැයි හඟනහුද? පෙර වූ යම් ශුභවූ වර්ණයෙක් වී ද, එය අතුරුදහන් වී ද, ආදිනව ය පහළ වී ද? වහන්ස, එසේ ය. මහණෙනි, මෙ ද රූපයන්ගේ ආදීනවය යි.

21. නැවත ද අනෙකෙක් වෙයි. මහණෙනි, කවුඩන් විසින් හෝ කනු ලබන්නාවූ උකුස්සන් විසින් හෝ කනු ලබන්නා වූ ගිජුලිහිණියන් විසින් හෝ කනු ලබන්නාවූ බල්ලන් විසින් හෝ කනු ලබන්නාවූ සිවලුන් විසින් හෝ කනු ලබන්නාවූ විවිධ වූ ප්‍රාණීන් විසින් හෝ කනු ලබන්නාවූ සොහොනෙහි දමන ලද සිරුරක්වූ ඒ නැගණියන් ම දක්නේ ද, මහණෙනි, ඒ කිමැයි හඟනහු ද? පෙර වූ යම් ශුභවූ වර්ණයෙක් වී ද එය අතුරුදහන් වී ද? ආදීනවය පහළ වී ද? වහන්ස, එසේ ය. මහණෙනි, මෙ ද රූපයන්ගේ ආදීනවය යි.

22. නැවත ද අනෙකෙක් වෙයි. මහණෙනි, ඇටසැකිල්ලක් වූ මස්ලේ සහිත වූ නහරින් බැඳුණු ... ඇටසැකිල්ලක් වූ මස් නැති ලේ තැවරුණු නහරින් බැඳුණු ... ඇටසැකිල්ලක් වූ මස් ලේ නැති නහරින් බැඳුණු ... අන් තැනෙක අත්ඇට ය, අන් තැනෙක පාඇට ය, අන් තැනෙක දඟඇට ය, අන් තැනෙක කලවා ඇට ය, අන් තැනෙක උකුළු ඇටය, අන් තැනෙක පිටකටුව, අන් තැනෙක හිස්කබල දැයි පහවූ බැඳුම් ඇති දසතුදසෑ විසුරුණු ඇට ඇති සොහොනෙහි දමන ලද සිරුරක් වූ ඒ නැගණියන් ම දක්නේ ද, මහණෙනි, ඒ කිමැයි හඟනහු ද? පෙර වූ යම් ශුභවූ වර්ණයෙක් වී ද, එය අතුරු දහන් වී ද, ආදීනවය පහළ වීද? වහන්ස, එසේ ය. මහණෙනි, මෙ ද රූපයන්ගේ ආදීනවය යි.

23. පුන ච පරං භික්ඛවෙ තමෙව භගිනිං පස්සෙය්‍ය සරීරං සීවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකානි සෙතානි සඞ්ඛවණ්ණූපනිභානි[1] -පෙ- අට්ඨිකානි පුඤ්ජකිතානි තෙරොවස්සිකානි - පෙ - අට්ඨිකානි පූතීනි චුණ්ණකජාතානි. තං කිං මඤ්ඤථ භික්ඛවෙ යා පුරිමා සුභා වණ්ණනිභා සා අන්තරහිතා, ආදීනවො පාතුභූතො'ති? එවං භන්තෙ. අයම්පි භික්ඛවෙ රූපානං ආදීනවො.

24. කිඤ්ච භික්ඛවෙ රූපානං නිස්සරණං? යො භික්ඛවෙ රූපෙසු ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං. ඉදං රූපානං නිස්සරණං.

25. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා එවං රූපානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නප්පජානන්ති, තෙ වත සාමං වා රූපෙ පරිජානිස්සන්ති, පරං වා තථත්තාය සමාදපෙස්සන්ති යථා පටිපන්නො රූපෙ පරිජානිස්සතීති නෙතං ඨානං විජ්ජති. යෙ ච ඛො කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා එවං රූපානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං පජානන්ති, තෙ වත සාමං වා රූපෙ පරිජානිස්සන්ති, පරං වා තථත්තාය සමාදපෙස්සන්ති යථා පටිපන්නො රූපෙ පරිජානිස්සතීති ඨානමෙතං විජ්ජති.

26. කො ච භික්ඛවෙ වෙදනානං අස්සාදො? ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. යස්මිං සමයෙ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමංඣානං උපසම්පජ්ජ විහරති, නෙව තස්මිං සමයෙ අත්තව්‍යාබාධාය චෙතෙති. න පරව්‍යාබාධාය චෙතෙති. න උභයව්‍යාබාධාය චෙතෙති. අබ්‍යාපජ්ඣංයෙව තස්මිං සමයෙ වෙදනං වෙදෙති. අබ්‍යාපජ්ඣපරමාහං භික්ඛවෙ වෙදනානං අස්සාදං වදාමි.

27. පුන ච පරං භික්ඛවෙ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. යස්මිං සමයෙ භික්ඛවෙ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, නෙව තස්මිං සමයෙ අත්තව්‍යාබාධාය චෙතෙති. න පරව්‍යාබාධාය චෙතෙති. න උභයව්‍යාබාධාය චෙතෙති. අබ්‍යාපජ්ඣංයෙව තස්මිං සමයෙ වෙදනං වෙදෙති. අබ්‍යාපජ්ඣපරමාහං භික්ඛවෙ වෙදනානං අස්සාදං වදාමි.

1. සඞ්ඛවණ්ණපටිභාගානි, මජ්ඣං.

23. නැවත ද අනෙකෙක් වෙයි. මහණෙනි, සුදු වූ සක්වන් පැහැ ඇට ඇති... අවුරුදු ගණන් ඉක්ම ගියාවූ රැස් වූ ඇට ඇති...කුණු වූ සුණු වූ ඇට ඇති සොහොනෙහි දමන ලද සිරුරක් වූ ඒ නැගණියන් ම දක්නේ වේ ද, මහණෙනි, ඒ කිමැයි හඟනහු ද, පෙර වූ යම් ශුභ වූ වර්ණයෙක් වී ද එය අතුරුදහන් වී ද, ආදීනවය පහළ වී ද? වහන්ස, එසේ ය මහණෙනි, මේ ද රූපයන්ගේ ආදීනවය යි.

24. මහණෙනි, රූපයන්ගේ නිස්සරණය කුමක් ද? මහණෙනි, රූපයන්හි වූ යම් ඡන්දරාග විනයයෙක් යම් ඡන්දරාගප්‍රහාණයෙක් වේ ද, මේ රූපයන්ගේ නිස්සරණය යි.

25. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මෙසේ රූපයන්ගේ ආස්වාදය ආස්වාද වශයෙන් ද, ආදීනව ආදීනව වශයෙන් ද, නිස්සරණය නිස්සරණ වශයෙන් ද, තතුසේ නොදනිත් ද, ඔහු එකාන්තයෙන් තුමූ හෝ රූපයන් පිරිසිඳ දනිත් ය, යම් සේ පිළිපන්නේ රූපයන් පිරිසිඳ දන්නේ නම් එබඳු බව පිණිස මෙරමා හෝ සමාදන් කරවන්නාහුය යන මේ කාරණය විද්‍යමාන නො වේ. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මෙසේ රූපයන්ගේ ආස්වාදය ආස්වාද වශයෙන් ද, ආදීනවය ආදීනව වශයෙන් ද, නිස්සරණය නිස්සරණ වශයෙන් ද තතු සේ දනිත් ද, ඔහු එකාන්තයෙන් තුමූ හෝ රූපයන් පිරිසිඳ දන්නා හු ය, යම් සේ පිළිපන්නේ රූපයන් පිරිසිඳ දන්නේ නම්, එබඳු බව පිණිස මෙරමා හෝ සමාදන් කරවන්නාහුය යන මේ කාරණය විද්‍යමාන වේ.

26 මහණෙනි, වේදනාවන්ගේ ආස්වාදය කවරේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ කාමයන්ගෙන් වෙන් ව ම අකුශල-ධර්මයන්ගෙන් වෙන් ව ම විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයි. මහණෙනි, යම් කලෙක මහණ තෙමේ කාමයන්ගෙන් වෙන් ව ම අකුශලධර්මයන් ගෙන් වෙන් ව ම විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කෙරේ ද, එසමයෙහි තමහට දුක් පිණිස නො සිතයි. අන්හට දුක් පිණිස නො සිතයි. දෙපසට දුක් පිණිස නො සිතයි. එකල නිදුක් වූ වේදනාවක් ම විඳියි. මහණෙනි, මම වේදනාවන්ගේ ආස්වාදය නිදුක්බව ම පරම කොට ඇතැයි කියමි.

27 නැවත ද අනෙකෙක් වෙයි. මහණෙනි, මහණ තෙමේ විතර්ක විචාරයන් සන්සිඳවීමෙන් තමා තුළ පැහැදීම කරන සිතේ එකඟ බව වූ විතර්ක රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති, ද්විතීය ධ්‍යානයට... තෘතීය ධ්‍යානයට ...චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි. මහණෙනි, යම් කලෙක මහණ තෙමේ සුඛප්‍රහාණියෙන් ද දුඃඛප්‍රහාණියෙන් ද පෙරම සොම්නස් දොම්නස් දෙදෙනාගේ අස්තඞ්ගමයෙන් නිදුක් වූ නො සුව වූ උපෙක්ෂාසමෘති පරිශුද්ධි ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එකල්හි තමාට ද දුක් පිණිස නො සිතා ම ය. අන්හට ද දුක් පිණිස නො සිතා ම ය. දෙපසට දුක් පිණිස නොසිතා ම ය. එකල්හි නිදුක් වූ ම වේදනාව විඳියි. මහණෙනි, මම වේදනාවන්ගේ ආස්වාදය නිදුක් බව ම පරම කොට ඇතැයි කියමි.

28. කො ච භික්ඛවෙ වෙදනානං ආදීනවො? යං[1] භික්ඛවෙ වෙදනා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා, අයං වෙදනානං ආදීනවො.

29. කිඤ්ච භික්ඛවෙ වෙදනානං නිස්සරණං? යො භික්ඛවෙ වෙදනාසු ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං වෙදනානං නිස්සරණං.

30. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා එවං වෙදනානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නප්පජානන්ති, තෙ වත සාමං වා වෙදනා[2] පරිජානිස්සන්ති, පරං වා තථත්තාය සමාදපෙස්සන්ති, යථා පටිපන්නො වෙදනා පරිජානිස්සතීති නෙතං ඨානං විජ්ජති. යෙ ච ඛො කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා එවං වෙදනානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං පජානන්ති, තෙ වත සාමං වා වෙදනං පරිජානිස්සන්ති, පරං වා තථත්තාය සමාදපෙස්සන්ති යථා පටිපන්නො වෙදනාපරිජානිස්සතීති ඨානමෙතං විජ්ජතීති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

මහාදුක්ඛක්ඛන්ධසුත්තං තතියං.

1. 2. 4.

චූළදුක්ඛක්ඛන්ධසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. අථ ඛො මහානාමො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මහානාමො සක්කො භගවන්තං එතදවොච:

2. දීඝරත්තාහං භන්තෙ භගවතා එවං ධම්මං දෙසිතං ආජානාමි: ලොභො චිත්තස්ස උපක්කිලෙසො, දොසො චිත්තස්ස උපක්කිලෙසො, මොහො චිත්තස්ස උපක්කිලෙසො'ති. එවඤ්චාහං භන්තෙ භගවතා ධම්මං දෙසිතං ආජානාමි: ලොභො චිත්තස්ස උපක්කිලෙසො, දොසො චිත්තස්ස උපක්කිලෙසො, මොහො චිත්තස්ස උපක්කිලෙසොති. අථ ච පන මෙ එකදා ලොභධම්මාපි චිත්තං පරියාදාය තිට්ඨන්ති. දොසධම්මාපි චිත්තං පරියාදාය තිට්ඨන්ති. මොහධම්මාපි චිත්තං පරියාදාය තිට්ඨන්ති. තස්ස මය්හං භන්තෙ එවං හොති: කො සු නාම මෙ ධම්මො අජ්ඣත්තං අප්පහීනො යෙන මෙ එකදා ලොභධම්මාපි චිත්තං පරියාදාය තිට්ඨන්ති, දොසධම්මාපි චිත්තං පරියාදාය තිට්ඨන්ති, මොහධම්මාපි චිත්තං පරියාදාය තිට්ඨන්තීති.

---

1. යා, කත්ථචි. 2. වෙදනං, මජ්ඣසං.

28. මහණෙනි, වෙදනාවන්ගේ ආදීනවය කවරේ ද? මහණෙනි, යම් හෙයෙකින් වෙදනාව අනිත්‍ය ද දුක් ද පෙරළෙනසුලු ද, මේ වෙදනාවන්ගේ ආදීනව ය යි.

29. මහණෙනි, වෙදනාවන්ගේ නිස්සරණය කුමක් ද? මහණෙනි, වෙදනාවන්හි යම් ඡන්දරාග විනයයෙක් වේ ද, ඡන්දරාග ප්‍රහාණියෙක් වේ ද, මෙය වෙදනාවන්ගේ නිස්සරණය යි

30. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මෙසේ වෙදනාවන්ගේ ආස්වාදය ආස්වාද වශයෙන් ද, ආදීනවය ආදීනව වශයෙන් ද, නිස්සරණය නිස්සරණ වශයෙන් ද තතුසේ නොදනිත් ද, ඔහු එකාන්තයෙන් තුමූ හෝ වෙදනාවන් පිරිසිද දන්නාහු ය, යම් සේ පිළිපන්නේ වෙදනාවන් පිරිසිද දන්නේ තම් එබඳු බව පිණිස මෙරමා හෝ සමාදන් කරවන්නාහු ය යන මේ කාරණය විද්‍යමාන නො වේ. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මෙසේ වෙදනාවන්ගේ ආස්වාදය ආස්වාද වශයෙන් ද ආදීනවය ආදීනව වශයෙන් ද නිස්සරණය නිස්සරණ වශයෙන් ද තතුසේ දනිත් ද, ඔහු එකාන්තයෙන් තුමූ හෝ වෙදනාවන් පිරිසිඳ දන්නාහු ය, යම් සේ පිළිපන්නේ වෙදනාවන් පිරිසිඳ දන්නේ තම එබඳු බව පිණිස මෙරමා හෝ සමාදන් කරවන්නාහු ය යන මේ කාරණය විද්‍යමාන වේ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාල සේක. සතුටු වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

මහාදුක්ඛක්ඛන්ධ සූත්‍රය තෙවැනි යි.

1. 2. 4.

චූළදුක්ඛක්ඛන්ධ සූත්‍රය.

1. **මා** විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහි කිඹුල්වත්පුර නිග්‍රොධාරාමයෙහි වැඩවසන සේක. එසද **මහානාම** සැහැරජ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හින. එකත්පස් වැහුන් මහානාම සැහැරජ භාග්‍යවතුන් වහන්සේට මෙල සැළ කෙළේ ය.

2. වහන්ස, "ලොභය චිත්තොපක්ලෙශයෙක, ද්වෙෂය චිත්තොපක්ලෙශයෙක, මොහය චිත්තොපක්ලෙශයෙකැ" යි භගවත්හු විසින් දෙසූ දහම මෙසේ මම දීර්ඝරාත්‍රයෙහි දත සිටිමි. වහන්ස, "ලොභය චිත්තොපක්ලෙශයෙක, ද්වෙෂය චිත්තොපක්ලෙශයෙක, මොහය චිත්තොපක්ලෙශයෙකැ" යි භගවත්හු දෙසූ දහම මෙසේ මම දන්නෙම් නමුදු, කලෙක ලොභධර්මයෝ ද මා සිත ගෙවා ගෙන සිටුති. ද්වෙෂධර්මයෝ ද මා සිත ගෙවා ගෙන සිටුති. මොහධර්මයෝ ද මා සිත ගෙවා ගෙන සිටුති. වහන්ස. ඒ මට මෙසේ සිතෙක් වෙයි: "යම් හෙයෙකින් කලෙක ලොභධර්මයෝ ද මා සිත පැහැරැ ගෙන සිටිත් ද, ද්වෙෂධර්මයෝ ද මා සිත පැහැරැ ගෙන සිටිත් ද, මොහධර්මයෝ ද මා සිත පැහැරැ ගෙන සිටිත් ද, එහෙයින් කිනම් කෙලෙස්දහමෙක් මා සතන්හි නොපුහුණ් වී ඇ හෝ (යන සන්දෙහ සහිත සිත) යි.

3. සො එව ඛො තෙ මහානාම ධම්මො අජ්ඣත්තං අප්පහීනො යෙන තෙ එකදා ලොභධම්මාපි චිත්තං පරියාදාය තිට්ඨන්ති, දොසධම්මාපි චිත්තං පරියාදාය තිට්ඨන්ති, මොහධම්මාපි චිත්තං පරියාදාය තිට්ඨන්ති සො ච හි තෙ මහානාම ධම්මො අජ්ඣත්තං පහීනො අභවිස්ස, න ත්වං අගාරං අජ්ඣාවසෙය්‍යාසි, න කාමෙ පරිභුඤ්ජෙය්‍යාසි. යස්මා ච ඛො තෙ මහානාම සො එව ධම්මො අජ්ඣත්තං අප්පහීනො, තස්මා ත්වං අගාරං අජ්ඣාවසසි, කාමෙ පරිභුඤ්ජසි.

4. අප්පස්සාදා කාමා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති ඉති චෙපි මහානාම අරියසාවකස්ස යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං හොති, සො ච අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහි පීතිසුඛං නාධිගච්ඡති අඤ්ඤං වා තතො සන්තතරං, අථ ඛො සො නෙව තාව අනාවට්ටී කාමෙසු හොති.

5. යතො ච ඛො මහානාම අරියසාවකස්ස අප්පස්සාදා කාමා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං හොති, සො ච අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහි පීතිසුඛං අධිගච්ඡති අඤ්ඤං වා තතො සන්තතරං, අථ ඛො සො අනාවට්ටී කාමෙසු හොති.

6. මය්හම්පි ඛො මහානාම පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො: "අප්පස්සාදා කාමා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං අහොසි,[1] සො ච අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහි පීතිසුඛං නාජ්ඣගමං අඤ්ඤං වා තතො සන්තතරං, අථ ඛ්වාහං නෙව තාව අනාවට්ටී කාමෙසු පච්චඤ්ඤාසිං.

1. හොති, මජසං. සහා.

3. මහානාමය, "යම් හෙයෙකින් කලෙක ලෝභධර්මයෝත් තා සිත පැහැරැ ගෙන සිටුනාහු වෙත් ද, ද්වේෂධර්මයෝත් තා සිත පැහැරැ ගෙන සිටුනාහු වෙත් ද, මෝහධර්මයෝත් තා සිත පැහැරැ ගෙන සිටුනාහු වෙත් ද, එහෙයින් ගෙ ම ලොභද්වෙෂමොහාඛ්‍යධර්මය තා සතන්හි නොපුහුත් වෙයි. මහානාමය, ඉදින් එ ලොභාදිධර්මය තා සතන්හි ප්‍රහීණ වී නම්, තෝ ගිහිගෙහි බැසගෙන නො වසන්නෙහි. ද්විවිධකාමසම්පතුදු නො වළඳන්නෙහි. මහානාමය, යම් හෙයෙකින් හෙ ම ලොභාදිධර්මය තා සතන්හි අප්‍රහීණ වේ ද, එහෙයින් තෝ ගෙහි වාස කෙරෙහි. කාමයනුදු වළඳ කෙරෙහි.

4. මහානාමය, ඉදින් ආර්‍ය්‍යශ්‍රාවකයා විසින් "කාමයෝ (පරිත්ත-සුඛ වන බැවින්) අල්පාස්වාදයහ. (ඉහභවයෙහිදු සම්පරායභවයෙහිදු අනන්තදුඃඛදායක වන බැවින්) බහුදුඃඛයහ. ඓහලෞකික පාරලෞකික උපායාසක්ලෙශසාධක වන බැවින්) බහුපායාසයහ. (දෘෂ්ටධාර්මික සාම්ප-රායික උපද්‍රවාධිෂ්ඨාන වන බැවින්) තෙල කාමසම්පතෙහි ආදීනව බෙහෙවැ" යි මෙසෙයින් යථාස්වභාවය මනා නය විසින් ප්‍රඥායෙන් (සොවන් සෙදගැමි දෙමගනැණින්) මනා කොට දක්නා ලදුයේ වෙයි. හෙ අරීසවු දු කාමයන් විනා මැ ලමු අකුසල් දහමුන් විනා මැ ප්‍රීතිසුඛය (සප්‍රීතික දෙ දැහැන) අධිගම නො කෙරේ ද, ඒ වරා, ශාන්තතර අනෙකක් හෝ (මතු දෙදැහැන හා දෙමග හා) අධිගම නො කෙරේ ද, වැළිත් හෙ එතැන් දක්වා කාමයෙහි අනාවර්ති නො ම වන්නේ යැ. (ආවර්තිත ම වන්නේ ය. සෙසු දැහැනින් කරන විෂ්කම්භන ප්‍රහාණය හා මතු දෙමගනැණින් කරන සමුච්ඡේදප්‍රහාණය හා නැති හෙයින.)

5 මහානාමය, යම්කලෙක ආර්‍ය්‍යශ්‍රාවකයා විසින් "කාමයෝ අල්පා-ස්වාදයහ, බහුදුඃඛයහ, තෙල කාමයෙහි උපද්‍රව බහුලයැ" යි මෙසෙයින් තෙල යථාස්වභාවය මනා නයවිසින් විදර්ශනා ප්‍රඥායෙන්. මොනොවට දක්නා ලදුයේ වේ. හෙ ද කාමයන් විනා මැ අකුසල් දහමුන් විනා ම ප්‍රීතිසුඛය අධිගම කෙරේ ද, එ වරා, ශාන්තතර අනෙකක් හෝ අධිගම කෙරේ ද, එකල හෙ කාමයෙහි අනාවර්ති වෙයි (ලලන නැතියේ වෙයි.)

6. මහානාමය, මාර්ගසම්බොධයෙන් පළමු මැ චතුස්සත්‍යාවබොධ නොකළ බෝසත් වැ සිටි මවිසුනු දු "කාමයෝ අල්පාස්වාදයහ, බහුදුඃඛයහ, බහුපායාසයහ, තෙල කාමයෙහි උපද්‍රව බහුලයැ" යි මෙසෙයින් තෙල යථාස්වභාවය මනානයින් (ඇතොරතළුදනා හැරැපියන) ප්‍රඥායෙන් මොනොවට දක්නා ලදුයේ වෙයි. මම ද කාමයන් විනා මැ අකුසල් දහමුන් විනා මැ ප්‍රීතිසුඛය අධිගම නො කෙළෙම් වේ ද, එ වරු, ශාන්තතර අනෙකෙක් හෝ (මතු දෙදැහැන හා සතර මඟ හා) අධිගම නොකෙළෙම් වේද, වැළිත් මම එතැන් දක්වා "කාමයෙහි අනාවර්තීයෙමි" යි නො මැ පිළිත කෙළෙමි.

7. යතො ච ඛො මෙ මහානාම: "අප්පස්සාදා කාමා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං අහොසි, සො ච අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහි පීතිසුඛං අජ්ඣගමං අඤ්ඤඤ්ච තතො සන්තතරං, අථාහං අනාවට්ටි කාමෙසු පච්චඤ්ඤාසිං.

8. කො ච මහානාම කාමානං අස්සාදො? පඤ්චිමෙ මහානාම කාමගුණා. කතමෙ පඤ්ච? චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝාන-විඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා, කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො මහානාම පඤ්ච කාමගුණා. යං ඛො මහානාම ඉමෙ පඤ්ච කාමගුණෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං කාමානං අස්සාදො.

9. කො ච මහානාම කාමානං ආදීනවො? ඉධ මහානාම කුලපුත්තො යෙන සිප්පට්ඨානෙන ජීවිකං කප්පෙති: යදි මුද්දාය යදි ගණනාය යදි සඞ්ඛානෙන යදි කසියා යදි වණිජ්ජාය යදි ගොරක්ඛෙන යදි ඉස්සත්ථෙන යදි රාජපොරිසෙන යදි සිප්පඤ්ඤතරෙන, සීතස්ස පුරක්ඛතො උණ්හස්ස පුරක්ඛතො, ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙහි රිස්සමානො, ඛුප්පිපාසාය මීයමානො. අයම්පි මහානාම කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

10. තස්ස චෙ මහානාම කුලපුත්තස්ස එවං උට්ඨහතො ඝටතො වායමතො තෙ භොගා නාභිනිප්ඵජ්ජන්ති, සො සොචති කිලමති පරිදෙවති, උරත්තාළිං කන්දති, සම්මොහං ආපජ්ජති: "මොඝං වත මෙ උට්ඨානං. අඵලො වත මෙ වායාමොති". අයම්පි මහානාම කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

11. තස්ස චෙ මහානාම කුලපුත්තස්ස එවං උට්ඨහතො ඝටතො වායමතො තෙ භොගා අභිනිප්ඵජ්ජන්ති, සො තෙසං භොගානං ආරක්ඛාධිකරණං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති: "කින්ති මෙ භොගෙ නෙව රාජානො හරෙය්‍යුං, න චොරා හරෙය්‍යුං, න අග්ගි ඩහෙය්‍ය, න උදකං වහෙය්‍ය, න අප්පියා දායාදා හරෙය්‍යුන්ති".

7. මහානාමය, යම්කලෙක "කාමයෝ අල්පාස්වාදයහ, බහුදුඃඛයහ, බහුපායාසයහ, තෙල කාමයෙහි උපද්‍රව බහුල යැ" යි මෙසෙයින් තෙල යථාස්වභාවය මනා නයින් ප්‍රඥයෙන් දක්නා ලදුයේ වී ද, මම ද කාමයන් විනාමැ අකුසල් දහමුන් වීනා මැ ප්‍රීතිසුඛය අධිගම කෙලෙම් වෙම් ද, එ වරා ශාන්තතර අනෙකක් හෝ අධිගම කෙලෙම් වෙම් ද, එකල මම "කාමයෙහි අනාවර්තීයෙමි"යි පිළිත කෙලෙම්·

8. මහානාමය, කාමයන්ගේ ආස්වාද කවරේ ය? මහානාමය, මෙ කාමගුණයෝ පස් දෙනෙකි. කවර පස්දෙනක යත්: ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියජාතික වූ කාමොපසංහෘත වූ සිත්රඳනට නිසි වූ චක්ෂුර් විඥෙය රූපායතනයෝ ය... ශ්‍රොත්‍රවිඥෙය ශබ්දායතනයෝ ය... ඝ්‍රාණවිඥෙය ගන්ධායතනයෝ ය... ජිහ්වාවිඥෙය රසායතනයෝ ය, ඉෂ්ටාරම්මණවූ, මනාපවූ, ප්‍රියරූපවූ, කාමොපසංහෘතවූ, රජනීයවූ, කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යායතනයෝ ය. මහානාමය, මොහු පඤ්චකාමගුණයෝ යි. මහානාමය, මේ පස්කම්ගුණ පිණිස යම් සුඛයෙක් හෝ සොම්නසෙක් හෝ උපදනේ වේ ද මේ කාමයන්ගේ ආස්වාද නම් වෙයි.

9. මහානාමය, කාමයන්ගේ ආදීනව කවරේ ය? මහානාමය, මෙලොවැ කුලපුත්‍රයෙක් හස්තමුද්‍රායෙන් වේව යි, ගණනායෙන් වේව යි, පිණ්ඩ-ගණනායෙන් වේව යි, කෘෂිකර්මයෙන් වේව යි, වෙළෙඳමෙන් වේව යි, ගොරක්ෂායෙන් වේව යි, අවි වටතින් වේව යි, රාජපුරුෂකර්මයෙන් වේව යි, ශීතයට පුරෂ්කෘත වැ (ශීතයට පෙරට වැ) උෂ්ණයට පුරෂ්කෘත වැ, මැසි මදුරු වාසුලහසපු යන මුන්ගේ දලපහසින් ගැටෙමින් සාපවසින් මියමින් යම්මැ ශිල්පයෙකින් දිවිවැටුම කෙරෙයි. මහානාමය, කාමයන් පිළිබඳ මේ ආදීනවය. ප්‍රත්‍යක්ෂ දුක්රැසෙක. කාමයන් ප්‍රත්‍යය කොට ගෙන ඇත. කාමයන් මුල් කොට ගෙන ඇත. කාමයන් කාරණ කොටගෙන ඇත. කාමයන් පිළිබැඳි මැ හෙතු ඇති වෙයි.

10. මහානාමය, ඉදින් මෙසෙයින් (ආජීවසමුත්ථාපක වීර්‍යයෙන්) උසා කරන, (පූර්වාපරවීර්‍යය) ඝටනා කරන, ඵලනිෂ්පත්ති සඳහා පියෝ කරන, ඒ කුලපුත්හට ඒ භොගයෝ පලදැවිසින් අභිනිෂ්පත්ති නො කෙරෙත් නම්, හෙ සොස්නේ ය. කල කිරෙන්නේ ය. වලප්නේ ය. ළම්බියෙහි අත් පුනපුනා පැහැර හඬන්නේ ය. (විසංඥයකු සෙයින්) සම්මොහයට වදනේ ය. කෙසේ ය යත්: "එකැතින් මා උසා සිය් වී. එකැතින් මං උසා අඵල වී" කියා යි. මහානාමය, කාමයන්ගේ මේ ආදීනවය. ප්‍රත්‍යක්ෂ දුක්රැසෙකැ. කාමයන් ප්‍රත්‍යය කොට ගෙන ඇත. කාමයන් මුල් කොට ගෙන ඇත. කාමයන් කාරණ කොටගෙන ඇත. කාමයන් මැ හෙතු කොට ගෙන පවත්නේ ය

11. මහානාමය, ඉදින් මෙසෙයින් උසා කරන, ඝටනා කරන, පියෝ කරන, ඒ කුලපුත්‍රයාහට ඒ භොගයෝ පලදැ විසින් නිපදින් නම්, හෙ ඒ භොගයන්ගේ ආරක්ෂා කාරණ කොට ගෙන දුක් දොම්නස් වළඳ කෙරෙයි. කෙසේය යත්: "කිනම් උපායෙකින් මා අයත් භොගයන් රජදරුවෝ නො ම ගෙන යෙත් ද, සොරු නොගෙන යෙද් ද, ගිනි නො දවා ද, දිය උල්පවා නො වහා ද, අප්‍රියදායාදයෝ නො නෙරත් ද" කියා යි.

12. තස්ස එවං ආරක්ඛතො ගොපයතො තෙ භොගෙ රාජානො වා හරන්ති. චොරා වා හරන්ති. අග්ගි වා ඩහති. උදකං වා වහති. අප්පියා වා දායාදා හරන්ති. සො සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජති: යම්පි මෙ අහොසි තම්පි නො නත්ථීති. අයම්පි මහානාම කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

13. පුන ච පරං මහානාම කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු රාජානොපි රාජූහි විවදන්ති. ඛත්තියාපි ඛත්තියෙහි විවදන්ති. බ්‍රාහ්මණාපි බ්‍රාහ්මණෙහි විවදන්ති. ගහපතීපි ගහපතීහි විවදන්ති. මාතාපි පුත්තෙන විවදති. පුත්තොපි මාතරා විවදති. පිතාපි පුත්තෙන විවදති. පුත්තොපි පිතරා විවදති. භාතාපි භාතරා විවදති. භාතාපි භගිනියා විවදති. භගිනීපි භාතරා විවදති. සහායොපි සහායෙන විවදති. තෙ තත්ථ කලහවිග්ගහවිවාදාපන්නා අඤ්ඤමඤ්ඤං පාණීහිපි උපක්කමන්ති. ලෙඩ්ඩූහිපි උපක්කමන්ති. දණ්ඩෙහිපි උපක්කමන්ති. සත්ථෙහිපි උපක්කමන්ති. තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති මරණමත්තම්පි දුක්ඛං. අයම්පි මහානාම කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු

14. පුන ච පරං මහානාම කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා උභතොව්‍යූළ්හං සඞ්ගාමං පක්ඛන්දන්ති උසූසුපි ඛිප්පමානෙසු සත්තීසුපි ඛිප්පමානාසු අසීසුපි විජ්ජොතලන්තෙසු. තෙ තත්ථ උසූහිපි විජ්ඣන්ති, සත්තියාපි විජ්ඣන්ති, අසිනාපි සීසං ඡින්දන්ති. තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති මරණමත්තම්පි දුක්ඛං. අයම්පි මහානාම කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

15. පුන ච පරං මහානාම කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා අද්දාවලෙපනා[1] උපකාරියො පක්ඛන්දන්ති උසූසුපි ඛිප්පමානෙසු සත්තීසුපි ඛිප්පමානාසු අසීසුපි විජ්ජොතලන්තෙසු. තෙ තත්ථ උසූහිපි විජ්ඣන්ති, සත්තියාපි විජ්ඣන්ති, පක්කට්ඨියාපි[2] ඔසිඤ්චන්ති, අභිවග්ගෙනපි ඔමද්දන්ති, අසිනාපි සීසං ඡින්දන්ති. තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති මරණමත්තම්පි දුක්ඛං. අයම්පි මහානාම කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු

1. අට්ටාවලෙපනා, සයා 2. ඡකණකායපි, මජ්සං.

12. මෙසෙයින් ආරක්‍ෂා කරන, ගොපනා කරන, උහුගේ ඒ භොගයන් රජදරුවෝ ගෙන යෙත්. සොරු හෝ ගෙන යෙත්. ගිනි හෝ දවයි. දිය හෝ පා කෙරෙයි. අප්‍රිය දායාදයෝ හෝ නෙරත්. හෙ සොස්නේ ය, කලකිරෙන්නේ ය, වලප්නේ ය, ළම්ඩියෙහි අත් පැහැර හඩන්නේ ය, සම්මොහයට වදනේ ය. කෙසේය යත්: "යම් ධනයෙක් මට වී ද, එ ද අපට නැති වී" කියා යි. මහානාමය, මෙද කාමයන්ගේ ආදීනවය, ප්‍රත්‍යක්‍ෂ දුක් රැසෙකැ. කාමයන් ප්‍රත්‍යය කොට ගෙන ඇත. කාමයන් මූල්කොට ගෙන ඇත. කාමයන් කාරණ කොට ගෙන ඇත. කාමයන් මැ හෙතු කොට ගෙන පවත්නේ ය.

13. තවද මහානාමය, කාමප්‍රත්‍යයෙන් කාමයන් නිදාන කොට, කාමයන් කරණ කොට, කාමයන් මැ හෙතු කොට රජදරුවෝ ද රජදරුවන් හා විරුද්ධ වාද කෙරෙත්. ක්‍ෂත්‍රියයෝ ද ක්‍ෂත්‍රියයන් හා විවාද කෙරෙත්. බමුණෝ ද බමුණන් හා විවාද කෙරෙත්. ගැහැවියෝ ද ගැහැවියන් හා විවාද කෙරෙත්. මවුදු පුතු හා විවාද කෙරෙයි. පිත් ද මවු හා විවාද කෙරෙයි. සොහොවුරු දු සොහොවුරු හා විවාද කෙරෙයි. සොහොවුරු දු බින්හැඹු හා විවාද කෙරෙයි. බින්හැඹු දු බෑයා හා විවාද කෙරෙයි. යහළු දු යහළු හා විවාද කෙරෙයි. ඔහු එහි කලහවිරුද්ධ-ග්‍රහණ - විරුද්ධවාදයට අවත්නාහු උනුන් අතිනුදු පහරත්. කැටිනුදු පහරත්. දඩියෙනු දු පහරත්. සැතිනුදු පහරත්. ඔහු එහි දී මරණයට ද මරණමාත්‍ර දුඃඛයට ද යෙති. මහානාමය, කාමයන්ගේ මෙද ආදීනවය. ප්‍රත්‍යක්‍ෂ දුක් රැසෙකැ. කාමයන් ප්‍රත්‍යය කොට ගෙන ඇත. කාමයන් මුල් කොට ගෙන ඇත. කාමයන් කාරණ කොට ගෙන ඇත. කාමයන් මැ හෙතු කොට ගෙන පවත්නේ ය.

14 තවද මහානාමය, කාමප්‍රත්‍යයෙන් කාමයන් නිදාන කොට, කාමයන් කරණ කොට, කාමයන් මැ හෙතු කොට සර ද විදුනා ලබන් මැ සිරිය ද වුහුටන් මැ කඩුදු ඔබමොබ පෙරෙලා වැටෙත් මැ කඩුපලිහ ගෙන, දුනු හියොවුරු සකසා බැඳ, දෙපසින් මුළුදුන් සඞ්ග්‍රාමයට පිවිසෙති. ඔහු එහි දි ඊයෙනුදු විදිත්. සිරියෙනුදු විදිත්. කඩුයෙනුදු හිස් සිඳිත්. ඔහු එහි දී මරණයට ද මරණමාත්‍ර දුඃඛයට ද යෙයි. මහානාමය, කාමයන්ගේ මෙද ආදීනවය. ප්‍රත්‍යක්‍ෂ දුක්රැසෙකැ. කාමයන් ප්‍රත්‍යය කොට ගෙන ඇත. කාමයන් මුල් කොට ගෙන ඇත. කාමයන් කාරණ කොටගෙන ඇත. කාමයන් හෙතු කොට ගෙන පවත්නේ ය.

15. තවද මහානාමය, කාමප්‍රත්‍යයෙන් කාමයන් නිදාන කොට, කාමයන් කරණ කොට කාමයන් මැ හෙතු කොට, සර ද විදුනා ලබන් මැ සිරිය ද වුහුටන් මැ කඩුදු ඔබ මොබ පෙරෙලා වැටෙත් මැ කඩුපලිහ ගෙන, දුනු හියොවුරු සකසා බැඳ තෙත්කලල් අලෙවු දුන් පවුරු පදනමට පැන ගනිත්. ඔහු එහි දී ඊයෙනුදු විදිත්. සිරියෙනුදු විදිත්. කකියන ගොම්නු දු තෙමින් ශත දන්තයෙනුදු අවමර්දන කෙරෙත්. කඩුයෙනුදු හිස් සිඳිත්. ඔහු එහි දී මරණයට ද මරණමාත්‍ර දුඃඛයට ද යෙත් මහානාමය, මෙ ද කාමයන්ගේ ආදිනවය වෙයි. සාංදෘෂ්ටික දුක්රැසෙකැ. කාමයන් ප්‍රත්‍යය කොට ඇති වෙයි. කාමයන් කාරණ කොට ඇති වෙයි. කාමයන් පිළිබැඳි මැ හෙතු ඇතියේ වෙයි.

16. පුන ච පරං මහානාම කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු සන්ධිම්පි ඡින්දන්ති, නිල්ලෝපම්පි හරන්ති, එකාගාරිකම්පි කරොන්ති, පරිපන්ථෙපි තිට්ඨන්ති, පරදාරම්පි ගච්ඡන්ති. තමෙනං රාජානො ගහෙත්වා විවිධා[1] කම්මකාරණා[2] කාරෙන්ති: කසාහිපි තාළෙන්ති, වෙත්තෙහිපි තාළෙන්ති, අඩ්ඪදණ්ඩකෙහිපි තාළෙන්ති, හත්ථම්පි ඡින්දන්ති, පාදම්පි ඡින්දන්ති, හත්ථපාදම්පි ඡින්දන්ති, කණ්ණම්පි ඡින්දන්ති, නාසම්පි ඡින්දන්ති, කණ්ණනාසම්පි ඡින්දන්ති, බිලඞ්ගථාලිකම්පි කරොන්ති, සඞ්ඛමුණ්ඩිකම්පි කරොන්ති, රාහුමුඛම්පි කරොන්ති, ජොතිමාලිකම්පි කරොන්ති, හත්ථපජ්ජොතිකම්පි කරොන්ති, එරකවත්තිකම්පි කරොන්ති, චීරකවාසිකම්පි කරොන්ති, එණෙය්‍යකම්පි කරොන්ති, බළිසමංසිකම්පි කරොන්ති, කහාපණකම්පි කරොන්ති, ඛාරාපතච්ඡිකම්පි කරොන්ති, පලිඝපරිවත්තිකම්පි කරොන්ති, පලාලපීඨකම්පි කරොන්ති, තත්තෙනපි තෙලෙන ඔසිඤ්චන්ති, සුනඛෙහිපි ඛාදාපෙන්ති, ජීවන්තම්පි සූලෙ උත්තාසෙන්ති, අසිනාපි සීසං ඡින්දන්ති. තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති මරණමත්තම්පි දුක්ඛං අයම්පි මහානාම කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

17 පුන ච පරං මහානාම කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු කායෙන දුච්චරිතං චරන්ති, වාචාය දුච්චරිතං චරන්ති, මනසා දුච්චරිතං චරන්ති. තෙ කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති. අයං මහානාම කාමානං ආදීනවො සම්පරායිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

18. එකමිදාහං මහානාම සමයං රාජගහෙ විහරාමි ගිජ්ඣකූටෙ පබ්බතෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා නිගණ්ඨා ඉසිගිලිපස්සෙ කාළසිලායං උබ්භට්ඨකා හොන්ති ආසනපටික්ඛිත්තා. ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති. අථ ඛොහං මහානාම සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන ඉසිගිලි පස්සෙ කාළසිලා යෙන තෙ නිගණ්ඨා තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා තෙ නිගණ්ඨෙ එතදවොචං: කින්නු තුම්හෙ ආවුසො නිගණ්ඨා, උබ්භට්ඨකා ආසනපටික්ඛිත්තා ඔපක්කමිකා තිප්පා කටුකා වෙදනා වෙදියථාති? එවං වුත්තෙ මහානාම තෙ නිගණ්ඨා මං එතදවොචුං: නිගණ්ඨො ආවුසො නාතපුත්තො සබ්බඤ්ඤූ සබ්බදස්සාවී අපරිසෙසං ඤාණදස්සනං පටිජානාති: චරතො ච මෙ තිට්ඨතො ච සුත්තස්ස ච ජාගරස්ස ච සතතං සමිතං ඤාණදස්සනං පච්චුපට්ඨිතන්ති -

1. විවිධානි, 2. කම්මකාරණානි, සයා.

16. තවද මහානාමය, කාමප්‍රත්‍යයයෙන් කාමයන් නිදාන කොට, කාමයන් කරණ කොට, කාමයන් මැ හෙතු කොට, උමඟ ද සිඳිත්. නිර්ලොප (ගම්පැහැරිම්) කොට තෙරත්. ජීවග්‍රාහයෙන් ගෙනැ ධන නෙරිම් ද කෙරෙත්. මඟනැඟිමෙහිදු සිටිත් පරඹුත් කරා ද යෙති. රජ-දරුවෝ උහු ගෙන විවිධ කම්කටොලු කෙරෙති: කටුමතිගායෙනු දු තලත්. වේවැලිනුදු තලත්. අත ද සිඳිත්. පය ද සිඳිත්. අත්පා ද සිඳිත්. කන ද සිඳිත්. නැහැය ද සිඳිත්. කන්නැහැ ද සිඳිත්. බිලඞ්ගථාලිකවධ ද කෙරෙත්. සඞ්ඛමුණ්ඩිකවධ ද කෙරෙත්. රාහු-මුඛවධ ද කෙරෙත්. ජොතිමාලිකවධ ද කෙරෙත්. හත්‍ථපජ්ජොතිකවධ ද කෙරෙත්. එරකවත්තිකවධ ද කෙරෙත්. චීරකවාසිකවධ ද කෙරෙත්. එණෙය්‍යකවධ ද කෙරෙත්. බලිසමංසිකවධ ද කෙරෙත්. කහාපණක වධ ද කෙරෙත්. ඛාරාපතච්ඡිකවධ ද කෙරෙත්. පලිඝපරිවත්තිකවධ ද කෙරෙත්. පලාලපීඨකවධ ද කෙරෙත්. තපනතෛලයෙනුදු තෙමත්. කිණබල්ලන් ලවා කවත්. දිවස් හුලැ හිඳුවත්. කඩුයෙනුදු හිස් සිඳිත්. ඔහු එහි දී මරණයට ද වැදගනිත්. මරණමාත්‍රදුඃඛයට ද යෙත්. මහානාමය, මෙද කාමාදීනවය, සාන්දෘෂ්ටික දුඃඛස්කන්ධයෙකැ. කාමයන් ප්‍රත්‍යය කොට ගෙන ඇත. කාමයන් මුල් කොට ගෙන ඇත. කාමයන් කාරණ කොට ගෙන ඇත. කාමයන් පිළිබැඳි මැ හෙතු ඇතියේ වෙයි.

17. තවද මහානාමය, කාමප්‍රත්‍යයයෙන් කාමයන් නිදාන කොට කාමයන් කරණ කොට, කාමයන් මැ හෙතුකොට, කයින් දුසිරිත් කරත්.වචනයෙන් දුසිරිත් කරත්. සිතින් දුසිරිත් කරත්. ඔහු කයින් දුසිරිත් පුරා, වචනයෙන් දුසිරිත් පුරා, සිතින් දුසිරිත් පුරා, කාබුන් මරණින් මතු සැපයෙන් වෙන් ව සිටුනා නපුරුගතියක් වන විවසව වැ වැටෙන තැන් වන නිරයට එළඹෙත්. මහානාමය, මේ කාමාදීනවය සාම්පරායිකදුඃඛ ස්කන්ධයෙකි. කාමයන් ප්‍රත්‍යය කොට ඇත. කාමයන් මුල් කොට ඇත. කාමයන් කාරණ කොට ඇත. කාමයන් පිළිබැඳි මැ හෙතු ඇතියේ වෙයි.

18. මහානාමය, මම එක් කලෙක මේ රජගහ නුවර ගිජුකුළු පව්වෙහි විසීමි. එසමයෙහි නුවටහු බොහෝ දෙනෙක් ඉසිගිලිපව්ව ඇලයෙහි කළුගල් අතලෙහි පියනලද අසුන් ඇති වැ නැඟිට සිටියාහු වෙති. (සප්‍රානාදී)උපක්‍රමයෙන් වන තීව්‍ර කටුක දුඃඛවෙදනාවන් විඳිත්. මහානාමය,මම එසඳ සවස්වරුයෙහි පිළිසලනින් නැගිටියෙමි ඉසිගිලි ඇලයෙහි කළු ගල් අතල වෙත එනුවටුන් කරා එළැඹියෙමි. එළඹ එ නුවටුනට තෙල බස් කියෙමි: ‘ඇවැත්නි, නිගණ්ඨයෙනි, කවර කරුණින් තෙපි පියු අසුන් ඇති වැ නැඟිට සිටිනහු තිව්‍ර කටුක ඖපක්‍රමික දුඃඛවෙදනාවන් විඳුනාංව ? කියා යි. මහානාමය, මෙසේ කී කල, ඒ නුවටහු මට තෙල බස් කී ‘‘ඇවැත්නි, නාතපුත්ත නුවට (අශු අනා වත්මත්) හැම දත්තෙකැ හැම දක්නාසුල්ලෙකැ. අපරිශෙෂ සඞ්ඛ්‍යාත ඥානදර්ශනය පිළිත කෙරෙයි: ඇවිදුනු වූ ද, සිටුනු වූ ද, නිදනු වූ ද, නිදිවරනු වූ ද, මට හැමකල් නිරතුරු ඥානදර්ශනය එළඹ සිටුනේ ය කියා’’ යි.-

සො එවමාහ: ''අත්ථි වො නිගණ්ඨා, පුබ්බෙ පාපං කම්මං කතං. තං ඉමාය කටුකාය දුක්කරකාරිකාය නිජ්ජරෙථ. යං පනෙත්ථ එතරහි කායෙන සංවුතා වාචාය සංවුතා මනසා සංවුතා තං ආයතිං පාපස්ස කම්මස්ස අකරණං. ඉති පුරාණානං කම්මානං තපසා ව්‍යන්තීභාවා, නවානං කම්මානං අකරණා ආයතිං අනවස්සවො. ආයතිං අනවස්සවා කම්මක්ඛයො. කම්මක්ඛයා දුක්ඛක්ඛයො. දුක්ඛක්ඛයා වෙදනාක්ඛයො. වෙදනාක්ඛයා සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතී''ති. තඤ්ච පනම්හාකං රුච්චති චෙව ඛමති ච තෙන චම්හා අත්තමනාති

19. එවං වුත්තෙ අහං මහානාම තෙ නිගණ්ඨෙ එතදවොචං: කිම්පන තුම්හෙ ආවුසො නිගණ්ඨා ජානාථ: 'අහුවම්හෙව මයං පුබ්බෙ න නාහුවම්හාති? නො හිදං ආවුසො. කිම්පන තුම්හෙ ආවුසො නිගණ්ඨා ජානාථ: අකරම්හෙව මයං පුබ්බෙ පාපං කම්මං. නාකරම්හාති? නො හිදං ආවුසො. කිම්පන තුම්හෙ ආවුසො නිගණ්ඨා ජානාථ: එවරූපං වා පාපං කම්මං අකරම්හාති? නො හිදං ආවුසො. කිම්පන තුම්හෙ ආවුසො නිගණ්ඨා ජානාථ: එත්තකං වා දුක්ඛං නිජ්ජිණ්ණං එත්තකං වා දුක්ඛං නිජ්ජරෙතබ්බං, එත්තකම්හි වා දුක්ඛෙ නිජ්ජිණ්ණෙ සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතීති? නො හිදං ආවුසො. කිම්පන තුම්හෙ ආවුසො නිගණ්ඨා ජානාථ: දිට්ඨෙව ධම්මෙ අකුසලානං ධම්මානං පහානං, කුසලානං ධම්මානං උපසම්පදන්ති? නො හිදං ආවුසො. ඉති කිර තුම්හෙ ආවුසො නිගණ්ඨා න ජානාථ: අහුවම්හෙව මයං පුබ්බෙ න නාහුවම්හාති. න ජානාථ: අකරම්හෙව මයං පුබ්බෙ පාපං කම්මං න නාකරම්හාති. න ජානාථ: එවරූපං වා එවරූපං වා පාපං කම්මං අකරම්හාති. න ජානාථ: එත්තකං වා දුක්ඛං නිජ්ජිණ්ණං, එත්තකං වා දුක්ඛං නිජ්ජරෙතබ්බං, එත්තකම්හි වා දුක්ඛෙ නිජ්ජිණ්ණෙ සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතීති. න ජානාථ: දිට්ඨෙව ධම්මෙ අකුසලානං ධම්මානං පහානං කුසලානං ධම්මානං උපසම්පදං. එවං සන්තෙ ආවුසො නිගණ්ඨා යෙ ලොකෙ ලුද්දා ලොහිතපාණිනො කුරූරකම්මන්තා මනුස්සෙසු පච්චාජාතා, තෙ නිගණ්ඨෙසු පබ්බජන්තීති.

20. න ඛො ආවුසො ගොතම සුඛෙන සුඛං අධිගන්තබ්බං, දුක්ඛෙන ඛො සුඛං අධිගන්තබ්බං. සුඛෙන ච හාවුසො ගොතම සුඛං අධිගන්තබ්බං අභවිස්ස, රාජා මාගධො සෙනියො බිම්බිසාරො සුඛං අධිගච්ඡෙය්‍ය. රාජා මාගධො සෙනියො බිම්බිසාරො සුඛවිහාරිතරො ආයස්මතා ගොතමෙනාති.

හෙ මෙසේ කියයි: "නුවටුනි, පෙර තොප කළ පාපකර්ම ඇත. එපව් මේ කටුක දුෂ්කරක්‍රියායෙන් දිරවා ලව. යම් කරුණින් මෙහි දූත් කාවිසිමුනි තුන් තැනින් සංවෘත වව් ද, එකරුණ මතුයෙහි පාපකර්මයාගේ නොකිරීම වෙයි. මෙසේ පුරාණ කර්මයන් තපසින් නැවී අවසන් වීමෙනුදු, නවකර්මයන් නො කිරීමෙනු දු මතුයෙහි ආස්‍රව(කර්ම රැස් කිරීමෙක්) නො වෙයි. මතුයෙහි අනාස්‍රව හෙතුයෙන් කර්මක්‍ෂය වෙයි කර්මක්‍ෂය හෙතුයෙන් දුඃඛක්‍ෂය වෙයි දුඃඛක්‍ෂය හෙතුයෙන් වෙදනාක්‍ෂය වෙයි. වෙදනාක්‍ෂය හෙතුයෙන් හැම දුක් නිර්ජීර්ණ වෙයි." එද වතාහි අපට රුස්නේ යැ. සහතු ද වෙයි. එයිනුදු අපි සතුටු වම්හ යි.

19 මහානාමය, මෙසේ කීකල මම එ නුවටුනට තෙල කීයෙමි: ඇවැත්නි, නුවටුනි, "අපි පෙර වූමෝ ම යැ. නුවූමෝ නො වූම්හ"යි කිම තෙපි දන්නා ව? ඇවැත්නි, මෙසේ අපි නොදනුම්හ. ඇවැත්නි නුවටුනි, "අපි පෙර පව්කම් කළාවමෝ ම යැ. නොකළාවමෝ නො වූම්හ" යි කිම තෙපි දන්නා ව? ඇවැත්නි, මෙ ද නොදනුම්හ. ඇවැත්නි, නුවටුනි, "මෙවත් මෙවත් පව්කම් කළාවමෝ" යි කිම තෙපි දන්නා ව? ඇවැත්නි, මෙ ද නොදනුම්හ. ඇවැත්නි. නුවටුනි, "මෙතෙක් හෝ දුක් දිරිණ. මෙතෙක් හෝ දුක් දිරවිය යුතුය. මෙතෙක් හෝ දුක් දිරුණුකල දුක් හැම නිර්ජීර්ණ වනුයේ" යි කිම තෙපි දන්නා ව? ඇවැත්නි, මෙ ද නොදනුම්හ. ඇවැත්නි, නුවටුනි, "මෙ ලොව්හි මැ අකුශලධර්මයන්ගේ ප්‍රහාණය හා කුශලධර්මයන්ගේ උපසම්පත් හා වෙති "යි කිම තෙපි දන්නා ව? ඇවැත්නි, මෙ ද නොදනුම්හ. ඇවැත්නි, නුවටුනි, මෙසෙයින් තෙපි "පෙර වූවෝ මය, නුවූවෝ නො වූම්හ" යි නො දනුව. "අපි පෙර පව්කම් කළාවමෝ ම යැ, නොකළාවමෝ නො වූම්හ" යි නො දනුව. "මෙවත් මෙවත් පව්කම් කළාවමෝ" යි නො දනුව. "මෙතෙක් හෝ දුක් දිරිණ. මෙතෙක් හෝ දුක් දිරවිය යුතු ය. මෙතෙක් හෝ දුක් දිරුණු කලැ දුක් හැම නිර්ජීර්ණ වනුයේ "යැ යි නො දනුව. "මෙ ලොව්හි මැ අකුශලධර්මයන්ගේ ප්‍රහාණය හා කුශලධර්මයන්ගේ උපසම්පත් හා වෙති" යි නො දනුව. ඇවැත්නි, නුවටුනි, මෙසේ වත් මැ, ලොකයෙහි රෞද්‍ර, ලෙහෙයෙන් වැකුණු අත් ඇති, කැකුළුකම් ඇති, මිනිසුන් කෙරෙහි උපන් යම් කෙනෙක් ඇත් ද, ඔහු නුවටුන් කෙරෙහි පැවිදි වෙති.

20. ඇවැත්නි, ගොයුම් ගොතුවෙනි, සුඛයෙන් සුඛය අධිගන්තව්‍ය (ලැබිය යුතු) නොවේ. දුඃඛයෙන් මැ සුඛය අධිගන්තව්‍ය වේ. ඇවැත්නි, ගොයුම්ගොතුවෙනි, සුඛයෙන් සුඛය අධිගන්තව්‍ය වේ නම්, මගධෙශ්වර වන, සෙනා ඇති, දුකුම්කලු අත් බැව් ඇති බිම්සර රජ සුඛය ලබන්නේ යැ. මහධෙශ්වර වන බිම්බිසාර සෙනිය රජ අංගුෂ්මත් ගොයුම්ගොතුවනට වඩා අත්‍යර්ථයෙන් සුඛවිහාර ඇතියේ යැ.

Free Distribution www.aathaapi.org

21. අද්ධායස්මන්තෙහි නිගණ්ඨෙහි සහසා අප්පටිසඞ්ඛා වාචා භාසිතා: “න ඛො ආවුසො ගොතම, සුඛෙන සුඛං අධිගන්තබ්බං. දුක්ඛෙන ඛො සුඛං අධිගන්තබ්බං. සුඛෙන ච හාවුසො ගොතම, සුඛං අධිගන්තබ්බං අභවිස්ස, රජා මාගධො සෙනියො බිම්බිසාරො සුඛං අධිගච්ඡෙය්‍ය. රජා මාගධො සෙනියො බිම්බිසාරො සුඛවිහාරිතරො ආයස්මතා ගොතමෙනා”ති.

22. අපි ච අහමෙව තත්ථ පටිපුච්ඡිතබ්බො: කො නු ඛො ආයස්මන්තානං සුඛවිහාරිතරො රජා වා මාගධො සෙනියො බිම්බිසාරො ආයස්මා වා ගොතමොති?.

23. අද්ධාවුසො ගොතම අම්හෙහි සහසා අප්පටිසඞ්ඛා වාචා භාසිතා: “න ඛො ආවුසො ගොතම සුඛෙන සුඛං අධිගන්තබ්බං. දුක්ඛෙන ඛො සුඛං අධිගන්තබ්බං සුඛෙන ච හාවුසො ගොතම, සුඛං අධිගන්තබ්බං අභවිස්ස, රාජා මාගධො සෙනියො බිම්බිසාරො සුඛං අධිගච්ඡෙය්‍ය. රාජා මාගධො සෙනියො බිම්බිසාරො සුඛවිහාරිතරො ආයස්මතා ගොතමෙනා”ති. අපි ච තිට්ඨතෙතං, ඉදානිපි මයං ආයස්මන්තං ගොතමං පුච්ඡාම: කො නු ඛො ආයස්මන්තානං සුඛවිහාරිතරො රාජා වා මාගධො සෙනියො බිම්බිසාරො ආයස්මා වා ගොතමොති?

24. තෙන හාවුසො නිගණ්ඨා තුම්හෙව තත්ථ පටිපුච්ඡිස්සාමි. යථා වො ඛමෙය්‍ය, තථා නං බ්‍යාකරෙය්‍යාථ: තං කිං මඤ්ඤථාවුසො නිගණ්ඨා, පහොති රාජා මාගධො සෙනියො බිම්බිසාරො අනිඤ්ජමානො කායෙන අභාසමානො වාචං සත්ත රත්තින්දිවානි එකන්තසුඛපටිසංවෙදී[1] විහරිතුන්ති? නො හිදං ආවුසො. තං කිං මඤ්ඤථාවුසො නිගණ්ඨා, පහොති රාජා මාගධො සෙනියො බිම්බිසාරො අනිඤ්ජමානො කායෙන අභාසමානො වාචං ඡ රත්තින්දිවානි -පෙ- පඤ්ච රත්තින්දිවානි -පෙ- චත්තාරි රත්තින්දිවානි -පෙ- තීණි රත්තින්දිවානි -පෙ- ද්වෙ රත්තින්දිවානි -පෙ- එකං රත්තින්දිවං එකන්තසුඛපටිසංවෙදී විහරිතුන්ති? නො හිදං ආවුසො.

25. අහං ඛො ආවුසො නිගණ්ඨා, පහොමි අනිඤ්ජමානො කායෙන අභාසමානො වාචං එකං රත්තින්දිවං එකන්තසුඛපටිසංවෙදී විහරිතුං. අහං ඛො ආවුසො නිගණ්ඨා, පහොමි අනිඤ්ජමානො කායෙන අභාසමානො වාචං ද්වෙ රත්තින්දිවානි -පෙ- තීණි රත්තින්දිවානි -පෙ- චත්තාරි රත්තින්දිවානි -පෙ- පඤ්ච රත්තින්දිවානි -පෙ- ඡ රත්තින්දිවානි -පෙ- සත්ත රත්තින්දිවානි එකන්තසුඛපටිසංවෙදී විහරිතුං. තං කිං මඤ්ඤථාවුසො නිගණ්ඨා, එවං සන්තෙ කො සුඛවිහාරිතරො රාජා වා මාගධො සෙනියො බිම්බිසාරො අහං වාති? එවං සන්තෙ ආයස්මාව ගොතමො සුඛවිහාරිතරො රඤ්ඤා මාගධෙන සෙනියෙන බිම්බිසාරෙනාති.

ඉදමවොච භගවා. අත්තමනො මහානාමො සක්කො භගවතො භාසිතං අභිනන්දීති.

චූළදුක්ඛක්ඛන්ධසුත්තං චතුත්ථං.

---

1. එකන්තසුඛං පටිසංවෙදී, මජසං

21, “ ඇවැත්නි, ගොයුම්ගොතුවෙනි, සුඛයෙන් සුඛය අධිගන්තව්‍ය නො වේ. දුඃඛයෙන් මැ සුඛය අධිගන්තව්‍ය වේ. ඇවැත්නි, ගොයුම් ගොතුවෙනි, සුඛයෙන් සුඛය අධිගන්තව්‍ය වේ නම්, මගධෙශ්වර වන, දකුම්කලු අත්බැව් ඇති, සෙනියරජ සුඛය ලබත්තේ යැ. මගධෙශ්වර වන බිම්බිසාර සෙනිය රජ ආයුෂ්මත් ගොයුම් ගොතුවනට වඩා අත්‍යර්‍ථයෙන් සුඛවිහාර ඇතියේ යැ” යි ආයුෂ්මත් තුවටුන් විසින් එකාන්තයෙන් මැ ලාහෙළා නුවණින් නොසලකා බසෙක් කියන ලද.

22. වැළිදු මම මැ එකරුණෙහි ලා (තොප විසින්) පිළිවිසිය යුතුයෙමි. කෙසේ ය: “ආයුෂ්මතුන් දෙදෙනා අතුරින් කවරෙක් නම් අධිකතර සුඛවිහරණ ඇතියේ වේ ද, මගධෙශ්වර බිම්බිසාර සෙනියරජ හෝ ආයුෂ්මත් ගොයුම්ගොතු හෝ?” යි.

23. “ඇවැත්නි, ගොයුම්ගොතුවෙනි, සුඛයෙන් සුඛය අධිගන්තව්‍ය නො වේ. දුඃඛයෙන් මැ සුඛය අධිගන්තව්‍ය වේ. ඇවැත්නි, ගොයුම්ගොතුවෙනි, සුඛයෙන් සුඛය අධිගන්තව්‍ය වේ නම් මගධෙශ්වර වන, දකුම්කලු අත්බැව් ඇති, සෙනියරජ සුඛය ලබත්තේ ය. ආයුෂ්මත් ගොයුම් ගොතුවනට වඩා මගධෙශ්වර බිම්බිසාර සෙනියරජ අධිකසුඛවිහරණ ඇතියේ යැ” යි ඇවැත්නි, ගොයුම්ගොතුවෙනි, අප විසින් එකාන්තයෙන් මැ ලාහෙළා නුවණින් නොසලකා බසෙක් කියනලද මැයි. වැළිත් තෙල තිබේවා. දැන් වේව යි අපි ආයුෂ්මත් ගොයුම්ගොතුවන් විචාරම්හ: “ආයුෂ්මතුන් දෙදෙනා අතුරින් කවරෙක් නම් අධිකසුඛවිහරණ ඇතියේ වේ ද, මගධෙශ්වර බිම්බිසාර සෙනියරජ හෝ ආයුෂ්මත් ගොයුම්ගොතු හෝ?” යි.

24. ඇවැත්නි, තුවටුනි එකරුණින් තොප මැ එයිලා පුළුවුසුම්හ: යම් පරිදි තොපට රිසියේ ද, එපරිදි එය පවසව. ඇවැත්නි, ඒ කිමැ යි හඟනාව? මගධෙශ්වර බිම්බිසාර සෙනියරජ කයින් නොසැලෙමින් තෙපුල් නොබෙණෙමින් සත් දවරයක් නරතුරු සුව විඳුනාසුලු වැ විහරණ කරන්නට හැකියේ ද? ඇවැත්නි, මේ නොහැකි යැ. ඇවැත්නි, ඒ කිමැයි හඟනාව? මගධෙශ්වර බිම්බිසාර සෙනියරජ කයින් නොසැලෙමින් තෙපුල් නො බෙණෙමින් දවරය සයක්...විහරණ කරන්නට හැකියේ ද?... දවරය පසක්.. දවරය සතරක් ... දවරය තුනක්... දවරය දෙකක්...එක් දවරයක්... නරතුර සුව විඳුනාසුලු වැ විහරණ කරන්නට හැකියේ ද? ඇවැත්නි, මේ නොහැකි යැ.

25. ඇවැත්නි, තුවටුනි, මම වනාහි කයින් නොසැලෙමින් තෙපුල් නොබෙණෙමින් එක් දවරයක් නරතුරු සුව විඳුනාසුලු වැ විහරණ කරන්නට හැකියෙමි. ඇවැත්නි, තුවටුනි, මම වනාහි කයින් නොසැලෙමින් තෙපුල් නොබෙණෙමින් දවරය දෙකක්... දවරය තුනක්... දවරය සතරක්... දවරය පසක් ... දවරය සයක්... දවරය සතක් නරතුරු සුව විඳුනාසුලු වැ විහරණ කරන්නට හැකියෙමි. ඇවැත්නි තුවටුනි, ඒ කිමැ යි සිතන්නාව? මෙසෙයින් වත් මැ කවරෙක් නම් අධික සුඛවිහරණ ඇතියේ වේ ද, මගධෙශ්වර බිම්බිසාර සෙනියරජ හෝ යැ, මම් හෝ ය? මෙසෙයින් වත් මැ මගධෙශ්වර බිම්බිසාර සෙනියරජුට වඩා ආයුෂ්මත් ගොයුම්ගොතුවෝ අධික සුඛවිහරණ ඇතියහ යි.

භාග්‍යවතුන් වහන්සේ මෙසුත වදාළහ. සතුටුසිත් ඇති මහානාම සැහැරජ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිමුඛ කොට පිළිගත්තේ යැ.

චූළදුක්ඛක්ඛන්ධසූත්‍රය සතරවැනි යි.

1. 2. 5.

අනුමානසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං ආයස්මා මහාමොග්ගල්ලානො භග්ගෙසු විහරති සුංසුමාරගිරෙ[1] භෙසකලාවනෙ[2] මිගදායෙ. තත්‍ර ඛො ආයස්මා මහාමොග්ගල්ලානො භික්ඛූ ආමන්තෙසි: ආවුසො භික්ඛවොති. ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො මහාමොග්ගල්ලානස්ස පච්චස්සොසුං. ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච: පවාරෙති චෙපි ආවුසො භික්ඛු වදන්තු මං ආයස්මන්තො, වචනීයොම්හි ආයස්මන්තෙහීති. සො ච හොති දුබ්බචො දොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතො අක්ඛමො අප්පදක්ඛිණග්ගාහී අනුසාසනිං. අථ ඛො නං සබ්‍රහ්මචාරී න චෙව වත්තබ්බං මඤ්ඤන්ති. න ච අනුසාසිතබ්බං මඤ්ඤන්ති න ච තස්මිං පුග්ගලෙ විස්සාසං ආපජ්ජිතබ්බං මඤ්ඤන්ති.

2. කතමෙ චාවුසො දොවචස්සකරණා ධම්මා?

ඉධාවුසො භික්ඛු පාපිච්ඡො හොති පාපිකානං ඉච්ඡානං වසං ගතො. යම්පාවුසො භික්ඛු පාපිච්ඡො හොති පාපිකානං ඉච්ඡානං වසං ගතො, අයම්පි ධම්මො දොවචස්සකරණො. (1)

3. පුන ච පරං ආවුසො භික්ඛු අත්තුක්කංසකො හොති පරවම්භී. යම්පාවුසො භික්ඛු අත්තුක්කංසකො හොති පරවම්භී, අයම්පි ධම්මො දොවචස්සකරණො. (2.)

4. පුන ච පරං ආවුසො භික්ඛු කොධනො හොති කොධාභිභූතො. යම්පාවුසො භික්ඛු කොධනො හොති කොධාභිභූතො, අයම්පි ධම්මො දොවචස්සකරණො. (3.)

5. පුන ච පරං ආවුසො භික්ඛු කොධනො හොති කොධහෙතු උපනාහී. යම්පාවුසො භික්ඛු කොධනො හොති කොධහෙතු උපනාහී, අයම්පි ධම්මො දොවචස්සකරණො. (4.)

6. පුන ච පරං ආවුසො භික්ඛු කොධනො හොති කොධහෙතු අභිසඞ්ගී. යම්පාවුසො භික්ඛු කොධනො හොති කොධහෙතු අභිසඞ්ගී, අයම්පි ධම්මො දොවචස්සකරණො. (5.)

7. පුන ච පරං ආවුසො භික්ඛු කොධනො හොති කොධසාමන්තා වාචං නිච්ඡාරෙතා. යම්පාවුසො භික්ඛු කොධනො හොති කොධසාමන්තා වාචං නිච්ඡාරෙතා, අයම්පි ධම්මො දොවචස්සකරණො. (6.)

---

1 සුසුමාරගිරෙ, මජසං.

2. භෙසකළාවනෙ, මජසං. සතා. භෙසලාවනෙ - අටඨ.

1. 2. 5.

අනුමාන සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක ආයුෂමත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ භග්ග රට සුංසුමාරගිර නුවර සමීපයෙහි භිසකලාවන නම් මිගදායෙහි වාසය කෙරෙති. එහි දී ආයුෂමත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ "ඇවැත්නි, මහණෙනි," යි භික්ෂූන් ඇමතූහ. ඒ භික්ෂූහු ඇවැත්නි, යි ආයුෂමත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. ආයුෂමත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ මෙය දෙසූහ: ඇවැත්නි, යම් මැ මහණෙක් "මම ආයුෂමතුන් විසින් අවවාද අනුශාසන වශයෙන් කියයුත්තෙම් වෙමි. ආයුෂමත්හු මට අවවාද අනුශාසන වශයෙන් කරුණු කියත්වා" යි පවරතුද්‍ද, හෙ ද, දුර්වච වූයේ, දුර්වචභාවය කරන (මතු එන සොළොස්) ධර්මයෙන් යුක්ත වූයේ, නො ඉවසනුයේ, අනුශාසනය ඇදුරු කොට නොගත්තාසුලු වූයේ වේ නම්, එසේ ඇති කල්හි සබ්‍රහ්මචාරීහු ඔහු කියයුත්තකු කොට නො හඟිත්. අනුශාසනය කළයුත්තකු කොට නො හඟිත්. ඒ පුද්ගලයා කෙරෙහි විශ්වාසය එළවියයුතු කොට නො හඟිත්.

2. ඇවැත්නි, දුර්වචභාවය කරන ධර්මයෝ කවරහ?

ඇවැත්නි, මේ ශාසනයෙහි මහණෙක් පාපෙච්ඡ වූයේ, ලාමකඉච්ඡාවත්යේ වශයට ගියේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් වනාහි මහණ ලමු ඉච්ඡා ඇත්තේ ලාමක ඉච්ඡාවත්යේ වශයට ගියේ වේ ද, මෙ ද දුර්වචභාවය කරන ධර්මයෙකි. (1.)

3. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ තමා හුවා දක්නේ පරා හෙළා දක්නේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ තමා හුවා දක්නේ පරා හෙළා දක්නේ වේ ද, මේ ද දුර්වචභාවය කරන ධර්මයෙකි. (2.)

4. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ ක්‍රොධ කරනසුලු වූයේ, ක්‍රොධයා විසින් මඩනා ලද්දේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ ක්‍රොධ කරනසුලු වූයේ ක්‍රොධයා විසින් මඩනා ලද්දේ වේ ද, මෙ ද දුර්වචභාවය කරන ධර්මයෙකි. (3.)

5. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ ක්‍රොධ කරනසුලු වූයේ, ක්‍රොධය හෙතු කොට ගෙන බද්ධවෛර ඇත්තේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ ක්‍රොධ කරනසුලු වූයේ ක්‍රොධය හෙතු කොට ගෙන බද්ධවෛර ඇත්තේ වේ ද, මෙ ද දුර්වචභාවය කරන ධර්මයෙකි. (4.)

6 තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ ක්‍රොධ කරනසුලු වූයේ ක්‍රොධය හෙතු කොට ගෙන ගැටෙන සුලු වූයේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ ක්‍රොධ කරනසුලු වූයේ ක්‍රොධය හෙතු කොට ගෙන ගැටෙනසුලු වූයේ වේ ද, මෙ ද දුර්වචභාවය කරන ධර්මයෙකි. (5)

7. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ ක්‍රොධ කරනසුලු වූයේ ක්‍රොධයට අසල් වචන පිහිදනුයේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ ක්‍රොධ කරන්නේ ක්‍රොධයට අසල් වචන පිහිදනුයේ වේ ද, මෙ ද දුර්වචභාවය කරන ධර්මයෙකි. (6.)

8. පුන ච පරං ආවුසො භික්ඛු චුදිතො[1] චොදකෙන චොදකං පටිප්ඵරති. යම්පාවුසො භික්ඛු චුදිතො චොදකෙන චොදකං පටිප්ඵරති, අයම්පි ධම්මො දොවචස්සකරණො. (7)

9. පුන ච පරං ආවුසො භික්ඛු චුදිතො චොදකෙන චොදකං අපසාදෙති. යම්පාවුසො භික්ඛු චුදිතො චොදකෙන චොදකං අපසාදෙති, අයම්පි ධම්මො දොවචස්සකරණො. (8)

10. පුන ච පරං ආවුසො භික්ඛු චුදිතො චොදකෙන චොදකස්ස පච්චාරොපෙති. යම්පාවුසො භික්ඛු චුදිතො චොදකෙන චොදකස්ස පච්චාරොපෙති, අයම්පි ධම්මො දොවචස්සකරණො. (9.)

11. පුන ච පරං ආවුසො භික්ඛු චුදිතො චොදකෙන අඤ්ඤෙනඤ්ඤං පටිචරති, බහිද්ධා කථං අපනාමෙති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. යම්පාවුසො භික්ඛු චුදිතො චොදකෙන අඤ්ඤෙනඤ්ඤං පටිචරති, බහිද්ධා කථං අපනාමෙති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති, අයම්පි ධම්මො දොවචස්සකරණො. (10.)

12. පුන ච පරං ආවුසො භික්ඛු චුදිතො චොදකෙන අපදානෙ න සම්පායති. යම්පාවුසො භික්ඛු චුදිතො චොදකෙන අපදානෙ න සම්පායති, අයම්පි ධම්මො දොවචස්සකරණො. (11.)

13. පුන ච පරං ආවුසො භික්ඛු මක්ඛී හොති පළාසී. යම්පාවුසො භික්ඛු මක්ඛී හොති පළාසී, අයම්පි ධම්මො දොවචස්සකරණො. (12)

14. පුන ච පරං ආවුසො භික්ඛු ඉස්සුකී හොති මච්ඡරී. යම්පාවුසො භික්ඛු ඉස්සුකී හොති මච්ඡරී, අයම්පි ධම්මො දොවචස්සකරණො. (13.)

15. පුන ච පරං ආවුසො භික්ඛු සඨො හොති මායාවී. යම්පාවුසො භික්ඛු සඨො හොති මායාවී, අයම්පි ධම්මො දොවචස්සකරණො. (14)

16. පුන ච පරං ආවුසො භික්ඛු ථද්ධො හොති අතිමානී. යම්පාවුසො භික්ඛු ථද්ධො හොති අතිමානී, අයම්පි ධම්මො දොවචස්සකරණො. (15)

17. පුන ච පරං ආවුසො භික්ඛු සන්දිට්ඨිපරාමාසී හොති ආධානගාහී[2] දුප්පටිනිස්සග්ගී. යම්පාවුසො භික්ඛු සන්දිට්ඨිපරාමාසී හොති ආධානගාහී දුප්පටිනිස්සග්ගී, අයම්පි ධම්මො දොවචස්සකරණො. (16.)

---

1. චොදිතො, මජසං. 2. ආධානග්ගාහී, මජසං.

8. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ චෝදකයාට පටහැණි ව සිටුනේ ය. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ චෝදකයාට ප්‍රත්‍යනීක ව සිටී ද, මෙ ද දුර්වචභාවය කරන ධර්මයෙකි. (7.)

9. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ චෝදකයා ගරහයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ චෝදකයා ගටා ද, මෙ ද දුර්වචභාවය කරන ධර්මයෙකි. (8.)

10. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ චෝදකයාට පෙරලා චෝදනා කරයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ චෝදකයාට පෙරලා චෝදනා කෙරේ ද, මෙ ද දුර්වචභාවය කරන ධර්මයෙකි. (9.)

11. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ අනෙකෙකින් අනෙක වසයි. කථාව බැහැර පහ කෙරෙයි. කොපයත් ද්වේෂයත් අප්‍රීතියත් පහළ කෙරෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ අනෙකෙකින් අනෙක පිළිසොයා ද, කථාව බැහැර නතු කෙරේ ද, කොපයත් ද්වේෂයත් අප්‍රීතියත් පහළ කෙරේ ද, මෙ ද දුර්වචභාවය කරන ධර්මයෙකි. (10.)

12. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ ස්වකීය චරිතය සපයා කියන්නට නො හැකි වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ ස්වකීය චරිතය සපයා කියන්නට නො හැකි වේ ද, මෙ ද දුර්වචභාවය කරන ධර්මයෙකි. (11.)

13. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ ගුණමකු වූයේ යුගග්‍රාහ ඇත්තේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ ගුණමකු වූයේ යුගග්‍රාහ ඇත්තේ වේ ද, මෙ ද දුර්වචභාවය කරන ධර්මයෙකි. (12.)

14. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ ඊර්ෂ්‍යා කරනසුලු වූයේ මසුරු වූයේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ ඊර්ෂ්‍යා කරන සුලු වූයේ මසුරු වූයේ වේ ද, මෙ ද දුර්වචභාවය කරන ධර්මයෙකි. (13.)

15. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ කෛරාටික වූයේ මායා ඇත්තේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ කෛරාටික වූයේ මායා ඇත්තේ වේ ද, මෙ ද දුර්වචභාවය කරන ධර්මයෙකි. (14.)

16. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ තදබව ඇත්තේ අධිකමාන ඇත්තේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ තදබව ඇත්තේ අධිකමාන ඇත්තේ වේ ද, මෙ ද දුර්වචභාවය කරන ධර්මයෙකි.(15.)

17. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ ස්වකීය දෘෂ්ටිය පරාමර්ශනය කරන්නේ, එය ම දැඩි කොට ගන්නේ, හරනට නො හැකි වූයේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ ස්වකීය දෘෂ්ටිය පරාමර්ශනය කරන්නේ එය ම දැඩි කොට ගන්නේ බැහැර කිරීමට නො හැකි වූයේ වේ ද, මෙ ද දුර්වචභාවය කරන ධර්මයෙකි. (16.)

ඉමෙ වුච්චන්තාවුසො දොවචස්සකරණා ධම්මා.

18. නො චෙපි ආවුසො භික්ඛු පවාරෙති: වදන්තු මං ආයස්මන්තො, වචනීයොම්හි ආයස්මන්තෙහීති. සො ච හොති සුවචො සොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතො ඛමො පදක්ඛිණග්ගාහී අනුසාසනිං. අථ ඛො නං සබ්‍රහ්මචාරී වත්තබ්බඤ්චෙව මඤ්ඤන්ති. අනුසාසිතබ්බඤ්ච මඤ්ඤන්ති. තස්මිඤ්ච පුග්ගලෙ විස්සාසං ආපජ්ජිතබ්බං මඤ්ඤන්ති.

19. කතමෙ චාවුසො සොවචස්සකරණා ධම්මා?

ඉධාවුසො භික්ඛු න පාපිච්ඡො හොති න පාපිකානං ඉච්ඡානං වසං ගතො. යම්පාවුසො භික්ඛු න පාපිච්ඡො හොති න පාපිකානං ඉච්ඡානං වසං ගතො, අයම්පි ධම්මො සොවචස්සකරණො.

20. පුන ච පරං ආවුසො භික්ඛු අනත්තුක්කංසකො හොති අපරවම්භී. යම්පාවුසො භික්ඛු අනත්තුක්කංසකො හොති අපරවම්භී, අයම්පි ධම්මො සොවචස්සකරණො.

21. පුන ච පරං ආවුසො භික්ඛු න කොධනො හොති න කොධාභිභූතො. යම්පාවුසො භික්ඛු න කොධනො හොති න කොධාභිභූතො, අයම්පි ධම්මො සොවචස්සකරණො.

22. පුන ච පරං ආවුසො භික්ඛු න කොධනො හොති න කොධහෙතු උපනාහී. යම්පාවුසො භික්ඛු න කොධනො හොති න කොධහෙතු උපනාහී, අයම්පි ධම්මො සොවචස්සකරණො.

23. පුන ච පරං ආවුසො භික්ඛු න කොධනො හොති න කොධහෙතු අභිසඞ්ගී. යම්පාවුසො භික්ඛු න කොධනො හොති න කොධහෙතු අභිසඞ්ගී, අයම්පි ධම්මො සොවචස්සකරණො.

24. පුන ච පරං ආවුසො භික්ඛු න කොධනො හොති න කොධසාමන්තා වාචං නිච්ඡාරෙතා. යම්පාවුසො භික්ඛු න කොධනො හොති න කොධසාමන්තා වාචං නිච්ඡාරෙතා, අයම්පි ධම්මො සොවචස්සකරණො.

25. පුන ච පරං ආවුසො භික්ඛු චුදිතො චොදකෙන චොදකං න පටිප්ඵරති. යම්පාවුසො භික්ඛු චුදිතො චොදකෙන චොදකං න පටිප්ඵරති, අයම්පි ධම්මො සොවචස්සකරණො.

ඇවැත්නි, මොහු (සොළස) දුර්වචභාවය කරන ධර්මයෝ යැයි කියනු ලැබෙත්.

18. ඇවැත්නි, මහණ "මම ආයුෂමතුන් විසින් කියයුත්තෙම් වෙමි. ආයුෂ්මත්හු මට (අවවාද වශයෙන්) කියත්වා" යි නො පවරතුදු හෙ ද සුවච වූයේ, සුවචභාවය කරන ධර්මයෙන් යුක්ත වූයේ, ඉවසන්නේ, අනුශාසනය ඇදුරු කොට ගන්නාසුලු වූයේ වේ නම්, එසේ ඇති කල්හි සබ්‍රහ්මචාරීහු ඔහු කියයුත්තකු කොට හඟිත්. අනුශාසනය කළ-යුත්තකු කොට හඟිත්. ඒ පුද්ගලයා කෙරෙහි විශ්වාසය එළඹියයුතු කොට හඟිත්.

19. ඇවැත්නි, සුවචභාවය කරන ධර්මයෝ කවරහ?

ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ පාපෙච්ඡ නො වූයේ ලාමක ඉච්ඡාවන්ගේ වශයට නො ගියේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ පාපෙච්ඡ නො වූයේ ලාමක ඉච්ඡාවන්ගේ වශයට නො ගියේ වේ ද, මෙ ද සුවචභාවය කරන ධර්මයෙකි.

20. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ තමා හුවා නො දක්නේ, පරා හෙළා නො දක්නේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ තමා හුවා නො දක්නේ පරා හෙළා නො දක්නේ වේ ද, මෙ ද සුවචභාවය කරන ධර්මයෙකි.

21. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ ක්‍රොධ නො කරන සුලු වූයේ ක්‍රොධයා විසින් නො මඩනා ලද්දේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ ක්‍රොධ නො කරනසුලු වූයේ ක්‍රොධයා විසින් නො මඩනා ලද්දේ වේ ද, මෙ ද සුවචභාවය කරන ධර්මයෙකි.

22. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ ක්‍රොධ නො කරන සුලු වූයේ ක්‍රොධය හෙතු කොට බද්ධවෛර නැත්තේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ ක්‍රොධ නො කරනසුලු වූයේ ක්‍රොධය හෙතු කොට බද්ධවෛර නැත්තේ වේ ද, මෙ ද සුවභාවය කරන ධර්මයෙකි.

23. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ ක්‍රොධ නො කරන සුලු වූයේ ක්‍රොධය හෙතු කොට නො ගැටෙනසුලු වූයේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ ක්‍රොධ නො කරනසුලු වූයේ, ක්‍රොධය හෙතු කොට නො ගැටෙනසුලු වූයේ වේ ද, මෙ ද සුවචභාවය කරන ධර්මයෙකි.

24. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ ක්‍රොධ නොකරන්නේ ක්‍රොධයට අසල් වචන තිකුත් නො කරන්නේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ ක්‍රොධ නො කරන්නේ ක්‍රොධයට අසල් වචන නො පිහිදනුයේ වේ ද, මෙ ද සුවචභාවය කරන ධර්මයෙකි.

25. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ චොදකයකු විසින් චොදනා කරන ලද්දේ චොදකයාට පටහැනි ව නො සිටියි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ චොදකයකු විසින් චොදනා කරන ලද්දේ චොදකයාට පටහැනි ව නො සිටී ද, මෙ ද සුවචභාවය කරන ධර්මයෙකි.

26. පුන ච පරං ආවුසො භික්ඛු චුදිතො චොදකෙන චොදකං න අපසාදෙති. යම්පාවුසො භික්ඛු චුදිතො චොදකෙන චොදකං න අපසා-දෙති, අයම්පි ධම්මො සොවචස්සකරණො.

27. පුන ච පරං ආවුසො භික්ඛු චුදිතො චොදකෙන චොදකස්ස න පච්චාරොපෙති; යම්පාවුසො භික්ඛු චුදිතො චොදකෙන චොදකස්ස න පච්චාරොපෙති, අයම්පි ධම්මො සොවචස්සකරණො.

28. පුන ච පරං ආවුසො භික්ඛු චුදිතො චොදකෙන න අඤ්ඤෙන-අඤ්ඤං පටිචරති, න බහිද්ධා කථං අපනාමෙති, න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. යම්පාවුසො භික්ඛු චුදිතො චොදකෙන න අඤ්ඤෙනඤ්ඤං පටිචරති, න බහිද්ධා කථං අපනාමෙති, න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති, අයම්පි ධම්මො සොවචස්සකරණො.

29 පුන ච පරං ආවුසො භික්ඛු චුදිතො චොදකෙන අපදානෙ සම්පායති. යම්පාවුසො භික්ඛු චුදිතො චොදකෙන අපදානෙ සම්පායති. අයම්පි ධම්මො සොවචස්සකරණො.

30. පුන ච පරං ආවුසො භික්ඛු අමක්ඛී හොති අපළාසී. යම්පාවුසො භික්ඛු අමක්ඛී හොති අපළාසී. අයම්පි ධම්මො සොවචස්සකරණො.

31. පුන ච පරං ආවුසො භික්ඛු අනිස්සුකී හොති අමච්ඡරී. යම්පාවුසො භික්ඛු අනිස්සුකී හොති අමච්ඡරී, අයම්පි ධම්මො සොවචස්ස-කරණො.

32. පුන ච පරං ආවුසො භික්ඛු අසඨො හොති අමායාවී. යම්පාවුසො භික්ඛු අසඨො හොති අමායාවී අයම්පි ධම්මො සොවචස්සකරණො,

33. පුන ච පරං ආවුසො භික්ඛු අත්ථද්ධො හොති අනතිමානී. යම්පාවුසො භික්ඛු අත්ථද්ධො හොති අනතිමානී, අයම්පි ධම්මො සොවචස්සකරණො.

26. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ චෝදකයාට නො ගටයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ චෝදකයාට නො ගටා ද, මෙ ද සුවචභාවය කරන ධර්මයෙකි.

27. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ චෝදකයාට පෙරලා චෝදනා නො කෙරෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ චෝදකයාට පෙරලා චෝදනා නො කෙරේ ද, මෙ ද සුවචභාවය කරන ධර්මයෙකි.

28. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ අනෙකෙකින් අනෙක නො පිළිසොයයි. කථාව බැහැර නො කෙරෙයි. කෝපයත් ද්වේෂයත් අප්‍රීතියත් පහළ නො කෙරෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ අනෙකෙකින් අනෙක නො වසා ද, කථාව බැහැර නො නෙරා ද, කෝපයත් ද්වේෂයත් අප්‍රීතියත් පහළ නො කෙරේ ද, මෙ ද සුවචභාවය කරන ධර්මයෙකි.

29. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ ස්වකීය චරිතය සපයා කියන්නට හැක්කේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ ස්වකීය චරිතය සපයා කියන්නට හැකි වේ ද, මෙ ද සුවචභාවය කරන ධර්මයෙකි.

30. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ ගුණමකු නො වූයේ යුගග්‍රාහය නැත්තේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ ගුණමකු නො වූයේ යුගග්‍රාහ නැත්තේ වේ ද, මෙ ද සුවචභාවය කරන ධර්මයෙකි.

31. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ ඊර්ෂ්‍යා නො කරන සුලු වූයේ මසුරු නැත්තේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ ඊර්ෂ්‍යා නො කරනසුලු වූයේ මසුරු නැත්තේ වේ ද, මෙ ද සුවචභාවය කරන ධර්මයෙකි.

32. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ කෛරාටික නො වූයේ මායා නැත්තේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ කෛරාටික නො වූයේ මායා නැත්තේ වේ ද, මෙ ද සුවචභාවය කරන ධර්මයෙකි.

33. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ තදබැව් නැත්තේ අධික මාන නැත්තේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ තදබැව් නැත්තේ අධික මාන නැත්තේ වේ ද, මෙ ද සුවචභාවය කරන ධර්මයෙකි.

34. පුන ච පරං ආවුසො භික්ඛු අසන්දිට්ඨිපරාමාසී හොති අනාධානගාහී සුප්පටිනිස්සග්ගී. යම්පාවුසො භික්ඛු අසන්දිට්ඨිපරාමාසී හොති අනාධානගාහී සුප්පටිනිස්සග්ගී, අයම්පි ධම්මො සොවචස්සකරණො

ඉමෙ වුච්චන්තාවුසො සොවචස්සකරණා ධම්මා.

35. තත්‍රාවුසො භික්ඛුනා අත්තනාව අත්තානං එවං අනුමිනිතබ්බං:[1] "යො ඛ්වායං පුග්ගලො පාපිච්ඡො පාපිකානං ඉච්ඡානං වසං ගතො, අයං මෙ පුග්ගලො අප්පියො අමනාපො. අහඤ්චෙව ඛො පනස්සං පාපිච්ඡො පාපිකානං ඉච්ඡානං වසං ගතො, අහම්පස්සං[2] පරෙසං අප්පියො අමනාපො"ති. එවං ජානන්තෙනාවුසො භික්ඛුනා න පාපිච්ඡො භවිස්සාමි න පාපිකානං ඉච්ඡානං වසං ගතොති චිත්තං උප්පාදෙතබ්බං.

36. "යො ඛ්වායං පුග්ගලො අත්තුක්කංසකො පරවම්භී, අයං මෙ පුග්ගලො අප්පියො අමනාපො. අහඤ්චෙව ඛො පනස්සං අත්තුක්කංසකො පරවම්භී, අහම්පස්සං පරෙසං අප්පියො අමනාපො"ති. එවං ජානන්තෙනාවුසො භික්ඛුනා 'අනත්තුක්කංසකො භවිස්සාමි අපරවම්භී' ති චිත්තං උප්පාදෙතබ්බං.

37. "යො ඛ්වායං පුග්ගලො කොධනො කොධාභිභූතො, අයං මෙ පුග්ගලො අප්පියො අමනාපො. අහඤ්චෙව ඛො පනස්සං කොධනො කොධාභිභූතො, අහම්පස්සං පරෙසං අප්පියො අමනාපො"ති එවං ජානන්තෙනාවුසො භික්ඛුනා, න කොධනො භවිස්සාමි න කොධාභිභූතො'ති චිත්තං උප්පාදෙතබ්බං.

38. "යො ඛ්වායං පුග්ගලො කොධනො කොධහෙතු උපනාහී, අයං මෙ පුග්ගලො අප්පියො අමනාපො. අහඤ්චෙව ඛො පනස්සං කොධනො කොධහෙතු උපනාහී, අහම්පස්සං පරෙසං අප්පියො අමනාපො"ති එවං ජානන්තෙනාවුසො භික්ඛුනා 'න කොධනො භවිස්සාමි න කොධහෙතු උපනාහී'ති චිත්තං උප්පාදෙතබ්බං.

39. "යො ඛ්වායං පුග්ගලො කොධනො කොධහෙතු අභිසඞ්ගී, අයං මෙ පුග්ගලො අප්පියො අමනාපො අහඤ්චෙව ඛො පනස්සං කොධනො කොධහෙතු අභිසඞ්ගී, අහම්පස්සං පරෙසං අප්පියො අමනාපො"ති එවං ජානන්තෙනාවුසො භික්ඛුනා 'න කොධනො භවිස්සාමි න කොධහෙතු අභිසඞ්ගී'ති චිත්තං උප්පාදෙතබ්බං.

---

1. අනුමාතිතබ්බං, සතා 2 අහම්පාස්සං, මජසං

Free Distribution www.aathaapi.org

34. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණ සවකීය දෘෂ්ටිය පරාමර්ශිතය නො කරන්නේ, එය ම දැඩි කොට නො ගන්නේ, සුවසේ බැහැර කිරීමට හැකි වූයේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් මහණ සවකීය දෘෂ්ටිය පරාමර්ශිතය නො කරන්නේ, එය දැඩි කොට නො ගන්නේ, සුවසේ බැහැර කිරීමට හැකි වූයේ වේ ද, මේ ද සුවචභාවය කරන ධර්මයෙකි.

ඇවැත්නි, මොහු (සොළස) සුවචභාවය කරන ධර්මයෝ යි කියනු ලැබෙත්.

35 ඇවැත්නි, මේ සොළොස් වැදෑරුම් ධර්මයෙහි ලා මහණහු විසින් තමා ම තමා මෙසේ තුලනා කටයුතුයි: (සසඳා තීරණය කටයුතුයි:) "යම් මේ පුද්ගලයෙක් පාපෙච්ඡා ඇත්තේ ලාමක ඉච්ඡාවන්ගේ වශයට ගියේ වේ ද, මේ පුද්ගල මට අප්‍රිය වෙයි. ඉදින් මමත් පාපෙච්ඡා ඇත්තෙම්, ලාමක ඉච්ඡාවන්ගේ වශයට ගියෙම් නම්, මමත් අනුන්ට අප්‍රිය වන්නෙමි. අමනාප වන්නෙමි" යි ඇවැත්නි, මෙසේ දන්නාවූ මහණහු විසින් "පාපෙච්ඡා නැත්තෙම් ලාමක ඉච්ඡාවන්ගේ වශයට නො ගියෙම් වන්නෙමි" යි සිත ඉපදවිය යුතු ය.

36. "යම් මේ පුද්ගලයෙක් වනාහි තමා හුවා දක්නේ පරා හෙළා දක්නේ වේ ද, මේ පුද්ගල මට අප්‍රිය වෙයි අමනාප වෙයි. ඉදින් මමත් තමා හුවා දක්නෙම්, පරා හෙළා දක්නෙම් වන්නෙම් නම්, මම ද අනුන්ට අප්‍රිය වූයෙම්, අමනාප වූයෙම් වෙමි" යි ඇවැත්නි, මෙසේ දන්නා මහණහු විසින් "තමා හුවා නො දක්නෙම්, පරා හෙළා නො දක්නෙම් වෙමි" යි සිත ඉපදවිය යුතු ය.

37. "යම් මේ පුද්ගලයෙක් වනාහි ක්‍රොධ කරනසුලු වූයේ ක්‍රොධයෙන් මඩනා ලද්දේ වේ ද, මේ පුද්ගල මට අප්‍රිය වෙයි. ඉදින් මමත් ක්‍රොධ කරන සුල්ලෙම්, ක්‍රොධයෙන් මඩනා ලද්දෙම් වෙම් නම්, මම ද අනුනට අප්‍රිය වූයෙම්, අමනාප වූයෙම් වෙමි" යි ඇවැත්නි, මෙසේ දන්නා මහණහු විසින් "ක්‍රොධ නො කරන සුල්ලෙම් ක්‍රොධයෙන් නො මඩනා ලද්දෙම් වෙමි" යි සිත ඉපදවිය යුතු ය.

38. "යම් මේ පුද්ගලයෙක් වනාහි ක්‍රොධ කරනසුලු වූයේ, ක්‍රොධ හෙතු කොට බද්ධවෛර ඇත්තේ වේ ද, මේ පුද්ගල මට අප්‍රිය වෙයි. අමනාප වෙයි. ඉදින් මමත් ක්‍රොධ කරන සුල්ලෙම් ක්‍රොධය හෙතු කොට බද්ධ-වෛර ඇත්තෙම් වෙම් නම්, මම ද අනුන්ට අප්‍රිය වූයෙම්, අමනාප වූයෙම් වෙමි" යි ඇවැත්නි, මෙසේ දන්නා මහණහු විසින් "ක්‍රොධ නො කරන සුල්ලෙම් ක්‍රොධය හෙතු කොට බද්ධවෛර නැත්තෙම් වෙමි" යි සිත ඉපදවිය යුතු ය.

39. "යම් මේ පුද්ගලයෙක් වනාහි ක්‍රොධ කරනසුලු වූයේ ක්‍රොධය හෙතු කොට ගැටෙනසුලු වූයේ වේ ද, මේ පුද්ගල මට අප්‍රිය වෙයි. අමනාප වෙයි. ඉදින් මම ද ක්‍රොධ කරන සුල්ලෙම් වෙම් නම්, මමත් අනුන්ට අප්‍රිය වූයෙම්, අමනාප වූයෙම් වෙමි" යි ඇවැත්නි, මෙසේ දන්නා මහණහු විසින් "ක්‍රොධ නො කරන සුල්ලෙම්, ක්‍රොධය හෙතු කොට නො ගැටෙන සුල්ලෙම් වෙමි" යි සිත ඉපදවිය යුතු ය.

40. "යො ඛ්වායං පුග්ගලො කොධනො කොධසාමන්තා වාචං නිච්ඡාරෙතා, අයං මෙ පුග්ගලො අප්පියො අමනාපො; අහඤ්චෙව ඛො පනස්සං කොධනො කොධසාමන්තා වාචං නිච්ඡාරෙතා, අහම්පස්සං පරෙසං අප්පියො අමනාපො''ති. එවං ජානන්තෙනාවුසො භික්ඛුනා "න කොධනො භවිස්සාමි. න කොධසාමන්තං වාචං නිච්ඡාරෙස්සාමී''ති චිත්තං උප්පාදෙතබ්බං.

41. "යො ඛ්වායං පුග්ගලො චුදිතො චොදකෙන පටිප්ඵරති, අයං මෙ පුග්ගලො අප්පියො අමනාපො; අහඤ්චෙව ඛො පන චුදිතො චොදකෙන චොදකං පටිප්ඵරෙය්‍යං, අහම්පස්සං පරෙසං අප්පියො අමනාපො''ති. එවං ජානන්තෙනාවුසො භික්ඛුනා 'චුදිතො චොදකෙන චොදකං න පටිප්ඵරිස්සාමී''ති චිත්තං උප්පාදෙතබ්බං.

42. "යො ඛ්වායං පුග්ගලො චුදිතො චොදකෙන චොදකං අපසාදෙති, අයං මෙ පුග්ගලො අප්පියො අමනාපො; අහඤ්චෙව ඛො පන චුදිතො චොදකෙන චොදකං අපසාදෙය්‍යං, අහම්පස්සං පරෙසං අප්පියො අමනාපො''ති එවං ජානන්තෙනාවුසො භික්ඛුනා "චුදිතො චොදකෙන චොදකං න අපසාදෙස්සාමී''ති චිත්තං උප්පාදෙතබ්බං.

43. "යො ඛ්වායං පුග්ගලො චුදිතො චොදකෙන චොදකස්ස පච්චාරොපෙති, අයං මෙ පුග්ගලො අප්පියො අමනාපො; අහඤ්චෙව ඛො පන චුදිතො චොදකෙන චොදකස්ස පච්චාරොපෙය්‍යං, අහම්පස්සං පරෙසං අප්පියො අමනාපො''ති එවං ජානන්තෙනාවුසො භික්ඛුනා "චුදිතො චොදකෙන චොදකස්ස න පච්චාරොපෙස්සාමී''ති චිත්තං උප්පාදෙතබ්බං.

44. "යො ඛ්වායං පුග්ගලො චුදිතො චොදකෙන අඤ්ඤෙනඤ්ඤං පටිචරති, බහිද්ධා කථං අපනාමෙති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති, අයං මෙ පුග්ගලො අප්පියො අමනාපො; අහඤ්චෙව ඛො පන චුදිතො චොදකෙන අඤ්ඤෙනඤ්ඤං පටිචරෙය්‍යං බහිද්ධා කථං අපනාමෙය්‍යං කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරෙය්‍යං, අහම්පස්සං පරෙසං අප්පියො අමනාපො''ති එවං ජානන්තෙනාවුසො භික්ඛුනා "චුදිතො චොදකෙන න අඤ්ඤෙනඤ්ඤං පටිචරිස්සාමි. න බහිද්ධා කථං අපනාමෙස්සාමි. න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරිස්සාමී''ති චිත්තං උප්පාදෙතබ්බං.

40. "යම් මේ පුද්ගලයෙක් වනාහි ක්‍රොධ කරනසුලු වූයේ ක්‍රොධයට ලං කොට වචන නිකුත් කරන්නේ වේ ද, මේ පුද්ගල මට අප්‍රිය වෙයි. ඉදින් මමත් ක්‍රොධ කරනසුලු වූයෙම් ක්‍රොධයට ලං කොට වචන නිකුත් කරන්නෙම් වෙම් නම්, මම ද අනුන්ට අප්‍රිය වූයෙම් අමනාප වූයෙම් වෙම්" යි. ඇවැත්නි, මෙසේ දන්නා මහණහු විසින් "ක්‍රොධ නො කරන සුල්ලෙම් වෙම්. ක්‍රොධයට ලං කොට වචන නො නිකුත් කරමි" යි සිත ඉපදවිය යුතු ය.

41. "යම් මේ පුද්ගලයෙක් වනාහි චොදකයකු විසින් චොදනා කරන ලද්දේ චොදකයාට පටහැනි ව සිටී ද, මේ පුද්ගල මට අප්‍රිය වෙයි. ඉදින් මමත් චොදකයකු විසින් චොදනා කරන ලද්දෙම් චොදකයාට පටහැනි ව සිටින්නෙම් නම්, මම ද අනුනට අප්‍රිය වූයෙම්, අමනාප වූයෙම් වෙමි" යි ඇවැත්නි, මෙසේ දන්නා මහණහු විසින් "චොදකයකු විසින් චොදනා කරන ලද්දෙම් චොදකයාට නො පටහැනි ව සිටින්නෙමි" යි සිත ඉපදවිය යුතු ය.

42. "යම් මේ පුද්ගලයෙක් වනාහි චොදකයකු විසින් චොදනා කරන ලද්දේ චොදකයා ගරහා ද, මේ පුද්ගල මට අප්‍රිය වෙයි. අමනාප වෙයි. ඉදින් මමත් චොදකයකු විසින් චොදනා කරන ලද්දෙම් චොදකයා ගරහම් නම් "මම ද අනුන්ට අප්‍රිය වූයෙම්, අමනාප වූයෙම් වෙමි" යි ඇවැත්නි, මෙසේ දන්නා මහණහු විසින් "චොදනා කරන ලද්දෙම් චොදකයාට නො ගරනමි" යි සිත ඉපදවිය යුතු ය.

43. "යම් මේ පුද්ගලයෙක් වනාහි චොදකයකු විසින් චොදනා කරන ලද්දේ චොදකයාට පෙරලා චොදනා කෙරේ ද, මේ පුද්ගල මට අප්‍රිය වෙයි. ඉදින් මමත් චොදකයාට පෙරලා චොදනා කරන්නෙම් නම්, මම ද අනුනට අප්‍රිය වූයෙම් වෙමි" යි ඇවැත්නි, මෙසේ දන්නා මහණහු විසින් "චොදකයකු විසින් චොදනා කරන ලද්දෙම් චොදකයාට පෙරලා චොදනා නො කරමි" යි සිත ඉපදවිය යුතු ය.

44. "යම් මේ පුද්ගලයෙක් වනාගි චොදකයකු විසින් චොදනා කරන ලද්දේ අනෙකෙකින් අනෙක වසා ද, බැහැරට කථාව නතු කෙරේ ද, කොපයත් ද්වෙෂයත් අප්‍රීතියත් පහළ කෙරේ ද, මේ පුද්ගල මට අප්‍රිය වෙයි. අමනාප වෙයි ඉදින් මමත් චොදකයකු විසින් චොදනා කරන ලද්දෙම්, අනෙකෙකින් අනෙක වසම් නම්, බැහැරට කථාව නතු කරම් නම්, කොපයත් ද්වෙෂයත් අප්‍රීතියත් පහළ කෙරෙම් නම්, මම ද අනුනට අප්‍රිය වූයෙම්, අමනාප වූයෙම් වෙමි" යි ඇවැත්නි, මෙසේ දන්නා මහණහු විසින් "චොදකයකු විසින් චොදනා කරන ලද්දෙම්, අනෙකෙකින් අනෙක නො වසමි. බැහැරට කථාව නතු නො කරමි. කොපයත් ද්වෙෂයත් අප්‍රීතියත් පහළ නො කරමි" යි සිත ඉපදවිය යුතු ය.

45. "යො ඛ්වායං පුග්ගලො වුදිතො චොදකෙන අපදානෙ න සම්පායති, අයං මෙ පුග්ගලො අප්පියො අමනාපො. අහඤ්චෙව ඛො පන වුදිතො චොදකෙන අපදානෙ න සම්පායෙය්‍යං, අහම්පස්සං පරෙසං අප්පියො අමනාපො"ති එවං ජානන්තෙනාවුසො භික්ඛුනා "වුදිතො චොදකෙන අපදානෙ සම්පායිස්සාමී"ති චිත්තං උප්පාදෙතබ්බං.

46. "යො ඛ්වායං පුග්ගලො මක්ඛී පලාසී, අයං මෙ පුග්ගලො අප්පියො අමනාපො; අහඤ්චෙව ඛො පනස්සං මක්ඛී පලාසී, අහම්පස්සං පරෙසං අප්පියො අමනාපො"ති එවං ජානන්තෙනාවුසො භික්ඛුනා "අමක්ඛී භවිස්සාමි අපලාසී"ති චිත්තං උප්පාදෙතබ්බං.

47. "යො ඛ්වායං පුග්ගලො ඉස්සුකී මච්ඡරී, අයං මෙ පුග්ගලො අප්පියො අමනාපො අහඤ්චෙව ඛො පනස්සං ඉස්සුකී මච්ඡරී, අහම්පස්සං පරෙසං අප්පියො අමනාපො"ති එවං ජානන්තෙනාවුසො භික්ඛුනා "අනිස්සුකී භවිස්සාමි අමච්ඡරී"ති චිත්තං උප්පාදෙතබ්බං.

48. "යො ඛ්වායං පුග්ගලො සඨො මායාවී, අයං මෙ පුග්ගලො අප්පියො අමනාපො. අහඤ්චෙව ඛො පනස්සං සඨො මායාවී අහම්පස්සං පරෙසං අප්පියො අමනාපො"ති එවං ජානන්තෙනාවුසො භික්ඛුනා "අසඨො භවිස්සාමි අමායාවී" ති චිත්තං උප්පාදෙතබ්බං.

49. "යො ඛ්වායං පුග්ගලො ථද්ධො අතිමානී, අයං මෙ පුග්ගලො අප්පියො අමනාපො. අහඤ්චෙව ඛො පනස්සං ථද්ධො අතිමානී, අහම්පස්සං පරෙසං අප්පියො අමනාපො"ති. එවං ජානන්තෙනාවුසො භික්ඛුනා "අත්ථද්ධො භවිස්සාමි අනතිමානී" ති චිත්තං උප්පාදෙතබ්බං.

50. "යො ඛ්වායං පුග්ගලො සන්දිට්ඨිපරාමාසී ආධානගාහී දුප්පටිනිස්සග්ගී, අයං මෙ පුග්ගලො අප්පියො අමනාපො. අහඤ්චෙව ඛො පනස්සං සන්දිට්ඨිපරාමාසී ආධානගාහී දුප්පටිනිස්සග්ගී, අහම්පස්සං පරෙසං අප්පියො අමනාපො"ති එවං ජානන්තෙනාවුසො භික්ඛුනා "අසන්දිට්ඨිපරාමාසී භවිස්සාමි අනාධානගාහී සුප්පටිනිස්සග්ගීති" චිත්තං උප්පාදෙතබ්බං.

45. "යම් මේ පුද්ගලයෙක් වනාහි චෝදකයකු විසින් චෝදනා කරන ලද්දේ සවකීය චරිත විෂයෙහි සපයා කියන්නට නො හැකි වේ ද, මේ පුද්ගල මට අප්‍රිය වෙයි. අමනාප වෙයි. ඉදින් මමත් චොදකයකු විසින් චොදනා කරන ලද්දෙම්, සවකීය චරිත විෂයෙහි සපයා කියන්නට නො හැක්කෙම් නම්, මම ද අනුනට අප්‍රිය වූයෙම් අමනාප වූයෙම වෙම්" යි ඇවැත්නි, මෙසේ දන්නා මහණහු විසින් චොදකයකු විසින් චොදනා කරන ලද්දෙම්, සවකීය චරිත විෂයෙහි සපයා කියමි" යි සිත ඉපදවිය යුතු ය.

46. "යම් මේ පුද්ගලයෙක් වනාහි ගුණ මකන්නේ යුගග්‍රාහ ඇත්තේ වේ ද, මේ පුද්ගල මට අප්‍රිය වෙයි. අමනාප වෙයි. ඉදින් මමත් ගුණ මකන්නෙම් යුගග්‍රාහ ඇත්තෙම් වෙම් නම්, මම ද අනුනට අප්‍රිය වූයෙම්, අමනාප වූයෙම් වෙම්" යි ඇවැත්නි, මෙසේ දන්නා මහණහු විසින් "ගුණ නො මකන්නෙම් වෙම්" යි සිත ඉපදවිය යුතුය.

47. "යම් මේ පුද්ගලයෙක් වනාහි ඊෂ්‍ර්‍ෂා කරන්නේ මසුරු බැව් ඇත්තේ වේ ද, මට මේ පුද්ගල අප්‍රිය වෙයි. අමනාප වෙයි. ඉදින් මමත් ඊෂ්‍ර්‍ෂා කරන්නෙම්, මසුරු බැව් ඇත්තෙම් වෙම් නම්, මම ද අනුනට අප්‍රිය වූයෙම් අමනාප වූයෙම් වෙම්" යි ඇවැත්නි, මෙසේ දන්නා මහණහු විසින් "ඊෂ්‍ර්‍ෂා නො කරන්නෙම්, නො මසුරු බැව් ඇත්තෙම් වෙම්" යි සිත ඉපදවිය යුතු ය.

48. "යම් මේ පුද්ගලයෙක් වනාහි කෛරාටික වූයේ මායා ඇත්තේ වේ ද, මට මේ පුද්ගල අප්‍රිය වෙයි. අමනාප වෙයි. ඉදින් මමත් කෛරාටික වූයෙම්, මායා ඇත්තෙම් වෙම් නම්, මම ද අනුනට අප්‍රිය වූයෙම්, අමනාප වූයෙම් වෙම්" යි ඇවැත්නි, මෙසේ දන්නා මහණහු විසින් "කෛරාටික නො වූයෙම්, මායා නැත්තෙම් වෙම්" යි සිත ඉපදවිය යුතු ය.

49. "යම් මේ පුද්ගලයෙක් වනාහි තදබැව් ඇත්තේ අධිකමාන ඇත්තේ වේ ද, මේ පුද්ගල මට අප්‍රිය වෙයි. අමනාප වෙයි. ඉදින් මමත් තදබැව් ඇත්තෙම්, අධිකමාන ඇත්තෙම් වෙම් නම්, මම ද අනුනට අප්‍රිය වූයෙම් අමනාප වූයෙම් වෙම්" යි ඇවැත්නි, මෙසේ දන්නා මහණහු විසින් "නො තදබැව් ඇත්තෙම් අධිකමාන නැත්තෙම් වෙම්" යි සිත ඉපදවිය යුතු ය.

50. "යම් මේ පුද්ගලයෙක් වනාහි සවකීය දෘෂ්ටිය පරාමර්ශනය කරන්නේ, එය ම දැඩි කොට ගන්නේ, බැහැර කිරීමට නො හැකි වූයේ වේ ද, මේ පුද්ගල මට අප්‍රිය වෙයි අමනාප වෙයි. ඉදින් මමත් සවකීය දෘෂ්ටිය පරාමර්ශනය කරන්නෙම්, එය ම දැඩි කොට ගන්නෙම් බැහැර කිරීමට නො හැකි වූයෙම් වෙම් නම්, මම ද අනුනට අප්‍රිය වූයෙම් අමනාප වූයෙම් වෙම්" යි ඇවැත්නි, මෙසේ දන්නා මහණහු විසින් "සවකීය දෘෂ්ටිය පරාමර්ශනය නො කරන්නෙම්, එය ම දැඩි කොට නො ගන්නෙම්, සුවසේ බැහැර කිරීමට හැකි වෙම්" යි සිත ඉපදවිය යුතු ය.

51. තත්‍රාවුසො භික්ඛුනා අත්තනාව අත්තානං එවං පච්චවෙක්ඛිතබ්බං: "කින්නු ඛොමහි පාපිච්ඡො පාපිකානං ඉච්ඡානං වසං ගතො"ති. සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "පාපිච්ඡො ඛොමහි පාපිකානං ඉච්ඡානං වසං ගතො"ති. තෙනාවුසො භික්ඛුනා තෙසං යෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං. සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "න ඛොමහි පාපිච්ඡො න පාපිකානං ඉච්ඡානං වසං ගතො"ති, තෙනාවුසො භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු

52. පුන ච පරං ආවුසො භික්ඛුනා අත්තනාව අත්තානං එවං පච්ච-වෙක්ඛිතබ්බං: "කින්නු ඛොමහි අත්තුක්කංසකො පරවම්භී"ති. සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "අත්තුක්කංසකො ඛොමහි පරවම්භී" ති. තෙනාවුසො භික්ඛුනා තෙසං යෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං. සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "අනත්තුක්කංසකො ඛොමහි අපරවම්භී" ති, තෙනාවුසො භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

53. පුන ච පරං ආවුසො භික්ඛුනා අත්තනාව අත්තානං එවං පච්චවෙක්ඛිතබ්බං: "කින්නු ඛොමහි කොධනො කොධාභිභූතො"ති. සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "කොධනො ඛොමහි කොධාභිභූතො"ති. තෙනාවුසො භික්ඛුනා තෙසං යෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං. සචෙ පනාවුසො භික්ඛු පච්ච-වෙක්ඛමානො එවං ජානාති: න ඛොමහි කොධනො න කොධාභිභූතො" ති,[1] තෙනාවුසො භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානු-සික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

54. පුන ච පරං ආවුසො භික්ඛුනා අත්තනාව අත්තානං එවං පච්ච-වෙක්ඛිතබ්බං: "කින්නු ඛොමහි කොධනො කොධහෙතු උපනාහී"ති. සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "කොධනො ඛොමහි කොධහෙතු උපනාහී" ති. තෙනාවුසො භික්ඛුනා තෙසං යෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං. සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "න ඛොමහි කොධනො න කොධහෙතු උපනාහී" ති, තෙනාවුසො භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

1 න ඛොමහි කොධනො කොධාභිභූතොති, සීමු. මජ්ඣං.

51. ඇවැත්නි, එහි ලා මහණහු විසින් "කිම, මම පාපෙච්ඡා ඇත්තෙම් වෙම් ද, ලාමක ඉච්ඡාවන්ගේ වශයට ගියෙම් වෙම් දැ"යි මෙසේ තමා විසින් ම තමා ගැන නුවණින් සැලකිය යුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "පාපෙච්ඡා ඇත්තෙම්, ලාමක ඉච්ඡාවන්ගේ වශයට ගියෙම් වෙමි" යි මෙසේ දනී නම්, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ලාමක අකුශල ධර්මයන්ගේ ම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම පාපෙච්ඡා ඇත්තෙම් නො වෙමි. ලාමක ඉච්ඡාවන්ගේ වශයට නො ගියෙම් වෙමි" යි මෙසේ දනී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් ම කුශලධර්මයෙහි දවරු හික්මෙන්නකු ව විසිය යුතු ය.

52. තවද, අනෙකෙක් වෙයි ඇවැත්නි, මහණහු විසින් "කිම, මම තමා හුවා දක්නෙම්, පරු හෙළා දක්නෙම් වෙමි" ද යි මෙසේ තමා විසින් ම තමා ගැන නුවණින් සැලකිය යුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "තමා හුවා දක්නෙම්, පරු හෙළා දක්නෙම් වෙමි" යි මෙසේ දනී නම්, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ලාමක අකුශලධර්මයන්ගේ ම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතු ය ඉදින් මහණ නුවණින් සලකන්නේ "තමා හුවා නො දක්නෙම්, පරා හෙළා නො දක්නෙම් වෙමි" යි මෙසේ දනී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් ම කුශල-ධර්මයෙහි දවරු හික්මෙන්නකු ව විසිය යුතු ය.

53. තව ද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණහු විසින් "කිම, මම ක්‍රොධ කරන සුල්ලෙම්, ක්‍රොධයෙන් මඩනා ලද්දෙම් වෙමි" දැයි තමා විසින් ම තමා ගැන මෙසේ නුවණින් සැලකිය යුතු ය. ඇවැත්නි, මහණ නුවණින් සලකන්නේ "මම ක්‍රොධ කරන සුල්ලෙම්, ක්‍රොධයෙන් මඩනා ලද්දෙම් වෙමි" යි මෙසේ දනී නම්, ඇවැත්නි, එ මහණහු විසින් ඒ ලාමක අකුශලධර්මයන්ගේ ම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම ක්‍රොධ කරන සුල්ලෙම්, ක්‍රොධයෙන් මඩනා ලද්දෙම් නො වෙමි" යි මෙසේ දනී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් ම කුශලධර්මයෙහි දවරු හික්මෙන්නකු ව විසිය යුතු ය

54. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණහු විසින් "කිම, මම ක්‍රොධ කරන සුල්ලෙම්, ක්‍රොධය හෙතු කොට බද්ධවෛර ඇත්තෙම්, වෙම් දැ" යි තමා විසින් ම තමා ගැන මෙසේ නුවණින් සැලකිය යුතු ය. ඇවැත්නි, මහණ නුවණින් සලකන්නේ "මම ක්‍රොධ කරන සුල්ලෙම්, ක්‍රොධය හෙතු කොට බද්ධවෛර ඇත්තෙම් වෙමි" යි මෙසේ දනී නම්, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ලාමක අකුශල ධර්මයන්ගේ ම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම ක්‍රොධ කරන සුල්ලෙම් නො වෙමි. ක්‍රොධය හෙතු කොට බද්ධවෛර ඇත්තෙම් නො වෙමි" යි මෙසේ දනී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් ම කුශල-ධර්මයෙහි දවරු හික්මෙන්නකු ව විසිය යුතු ය.

55. පුන ච පරං ආවුසො භික්ඛුනා අත්තනාව අත්තානං එවං පච්චවෙක්ඛිතබ්බං: "කින්නු ඛොමහි කොධහෙතු අභිසඞ්ගී"ති. සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "කොධනො ඛොමහි කොධහෙතු අභිසඞ්ගී" ති, තෙනාවුසො භික්ඛුනා තෙසං යෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං. සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "න ඛොමහි කොධනො න කොධහෙතු අභිසඞ්ගී" ති, තෙනාවුසො භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු

56. පුන ච පරං ආවුසො භික්ඛුනා අත්තනාව අත්තානං එවං පච්චවෙක්ඛිතබ්බං: "කින්නු ඛොමහි කොධනො කොධසාමන්තා වාචං නිච්ඡාරෙතා"ති. සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "කොධනො ඛොමහි කොධසාමන්තා වාචං නිච්ඡාරෙතා" ති, තෙනාවුසො භික්ඛුනා තෙසං යෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං. සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති "න ඛොමහි කොධනො න කොධසාමන්තා වාචං නිච්ඡාරෙතා" ති, තෙනාවුසො භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

57. පුන ච පරං ආවුසො භික්ඛුනා අත්තනාව අත්තානං එවං පච්චවෙක්ඛිතබ්බං: "කින්නු ඛොමහි චුදිතො චොදකෙන චොදකං පටිප්ඵරාමී"ති. සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "චුදිතො ඛොමහි චොදකෙන චොදකං පටිප්ඵරාමි" ති, තෙනාවුසො භික්ඛුනා තෙසං යෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං. සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "චුදිතො ඛොමහි චොදකෙන චොදකං න පටිප්ඵරාමි" ති, තෙනාවුසො භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

58. පුන ච පරං ආවුසො භික්ඛුනා අත්තනාව අත්තානං එවං පච්චවෙක්ඛිතබ්බං: "කින්නු ඛොමහි චුදිතො චොදකෙන චොදකං අපසාදෙමී"ති. සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "චුදිතො ඛොමහි චොදකෙන චොදකං අපසාදෙමී" ති, තෙනාවුසො භික්ඛුනා තෙසං යෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං. සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "චුදිතො ඛොමහි චොදකෙන චොදකං න අපසාදෙමී"ති, තෙනාවුසො භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

55. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණහු විසින් "කිම, මම ක්‍රොධ කරන පුල්ලෙම්, ක්‍රොධය හෙතු කොට ගැටෙන්නෙම් වෙම් දැ" යි තමා විසින් ම තමා ගැන මෙසේ නුවණින් සැලකිය යුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම ක්‍රොධ කරන පුල්ලෙම් වෙමි. ක්‍රොධය හෙතු කොට ගැටෙන්නෙම් වෙමි" යි මෙසේ දනී නම්, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ලාමක අකුශලධර්මයන්ගේ ම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම ක්‍රොධ කරන පුල්ලෙම් නො වෙමි. ක්‍රොධය හෙතු කොට නො ගැටෙන්නෙම් වෙමි" යි ඉදින් මෙසේ දනී ද, ඇවැත්නි, එ මහණහු විසින් ඒ ප්‍රීති-ප්‍රාමොද්‍යයෙන් ම කුශලධර්මයෙහි දවරු හික්මෙන්නකු ව විසිය යුතුය.

56. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණහු විසින් "කිම, මම ක්‍රොධ කරන පුල්ලෙම්, ක්‍රොධයට ලං කොට වචන නිකුත් කරන්නෙම් වෙම් දැ" යි තමා විසින් ම තමා ගැන මෙසේ නුවණින් සැලකිය යුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම ක්‍රොධ කරන පුල්ලෙම්, ක්‍රොධයට ලං කොට වචන නිකුත් කරන්නෙම් වෙමි" යි මෙසේ දනී නම් ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ලාමක අකුශලධර්මයන්ගේ ම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම ක්‍රොධ කරන පුල්ලෙම් නො වෙමි. ක්‍රොධයට ලං කොට වචන නිකුත් කරන්නෙම් නො වෙමි" යි මෙසේ දනී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් ම කුශලධර්මයෙහි දවරු හික්මෙන්නකු ව විසිය යුතු ය.

57. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණහු විසින් "කිම, මම චොදකයකු විසින් චොදනා කරන ලද්දෙම්, චොදකයාට පටහැනිව සිටිම් දැ" යි තමා විසින් ම තමා ගැන මෙසේ නුවණින් සැලකිය යුතුය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම චොදකයකු විසින් චොදනා කරන ලද්දෙම්, චොදකයාට පටහැනි ව සිටිමි" යි මෙසේ දනී නම්, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ලාමක අකුශලධර්මයන්ගේ ම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම චොදකයකු විසින් චොදනා කරන ලද්දෙම්, චොදකයාට පටහැනි ව නො සිටිමි" යි මෙසේ දනී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් එ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් ම කුශලධර්මයෙහි දවරු හික්මෙන්නකු ව විසිය යුතු ය

58. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණහු විසින් "කිම මම චොදකයකු විසින් චොදනා කරන ලද්දෙම්, චොදකයා ගරහම් දැ" යි තමා විසින් ම තමා ගැන මෙසේ නුවණින් සැලකිය යුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම චොදකයකු විසින් චොදනා කරන ලද්දෙම්, චොදකයා ගරහමි" යි මෙසේ දනී නම්, ඇවැත්නි, එ මහණහු විසින් ඒ ලාමක අකුශලධර්මයන්ගේ ම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම චොදකයා විසින් චොදනා කරන ලද්දෙම්, චොදකයා නො ගරහමි" යි මෙසේ දනී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් ම කුශලධර්මයෙහි දවරු හික්මෙන්නකු ව විසිය යුතු ය.

59. පුන ච පරං ආවුසො භික්ඛුනා අත්තනාව අත්තානං එවං පච්චවෙක්ඛිතබ්බං: "කින්නු ඛොමහි චුදිතො චොදකෙන චොදකස්ස පච්චාරොපෙමී"ති. සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "චුදිතො ඛොමහි චොදකෙන චොදකස්ස පච්චාරොපෙමී" ති, තෙනාවුසො භික්ඛුනා තෙසංයෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං. සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "චුදිතො ඛොමහි චොදකෙන චොදකස්ස න පච්චාරොපෙමී" ති, තෙනාවුසො භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

60 පුන ච පරං ආවුසො භික්ඛුනා අත්තනාව අත්තානං එවං පච්ච-වෙක්ඛිතබ්බං: "කින්නු ඛොමහි චුදිතො චොදකෙන අඤ්ඤෙනඤ්ඤං පටිචරාමි, බහිද්ධා කථං අපනාමෙමි, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොමී"ති. සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "චුදිතො ඛොමහි චොදකෙන අඤ්ඤෙනඤ්ඤං පටිචරාමි, බහිද්ධා කථං අපනාමෙමි, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොමී" ති, තෙනාවුසො භික්ඛුනා තෙසංයෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං. සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "චුදිතො ඛොමහි චොදකෙන න අඤ්ඤෙනඤ්ඤං පටිචරාමි. න බහිද්ධා කථං අපනාමෙමි. න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොමී" ති, තෙනාවුසො භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

61. පුන ච පරං ආවුසො භික්ඛුනා අත්තනාව අත්තානං එවං පච්ච-වෙක්ඛිතබ්බං: "කින්නු ඛොමහි චුදිතො චොදකෙන අපදානෙ න සම්පායාමී"ති සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "චුදිතො ඛොමහි චොදකෙන අපදානෙ න සම්පායාමි" ති, තෙනාවුසො භික්ඛුනා තෙසංයෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං, සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "චුදිතො ඛොමහි චොදකෙන අපදානෙ සම්පායාමී" ති, තෙනාවුසො භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

59. තව ද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණහු විසින් "කිම, මම චොදකයාට පෙරලා චොදනා කෙරෙම් ද" යි තමා විසින් ම තමා ගැන මෙසේ නුවණින් සැලකිය යුතු ය ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම චොදකයා විසින් චොදනා කරන ලද්දෙම්, චොදකයාට පෙරලා චොදනා කරමි" යි මෙසේ දනී නම්, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ලාමක අකුශලධර්මයන්ගේ ම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම චොදකයා විසින් චොදනා කරන ලද්දෙමි, චොදකයාට පෙරලා චොදනා නො කෙරෙමි" යි මෙසේ දනී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් ම කුශල ධර්මයෙහි දවරෑ හික්මෙන්නකු ව විසිය යුතු ය.

60. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණහු විසින් "කිම, මම චොදකයකු විසින් චොදනා කරන ලද්දෙම්, අනෙකෙකින් අනෙක වසම් ද, බැහැරට කථාව නතු කෙරෙම් ද, කොපයත් ද්වෙෂයත් අප්‍රීතියත් පහළ කෙරෙම් ද" යි තමා විසින් ම තමා ගැන මෙසේ නුවණින් සැලකිය යුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම චොදකයා විසින් චොදනා කරන ලද්දෙම්, අනෙකෙකින් අනෙක වසමි. බැහැරට කථාව නතු කෙරෙමි. කොපයත් ද්වෙෂයත් අප්‍රීතියත් පහළ කරමි" යි මෙසේ දනී නම්, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ලාමක අකුශල ධර්මයන්ගේ ම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම චොදකයකු විසින් චොදනා කරන ලද්දෙම්, අනෙකෙකින් අනෙක නො වසමි. බැහැරට කථාව නතු නො කරමි. කොපයත් ද්වෙෂයත් අප්‍රීතියත් පහළ නො කෙරෙමි" යි මෙසේ දනී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් ම කුශලධර්මයෙහි දවරෑ හික්මෙන්නකු ව විසිය යුතු ය.

61 තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණහු විසින් "කිම මම චොදකයකු විසින් චොදනා කරන ලද්දෙම්, සවකීය චරිත විෂයෙහි සපයා කියන්නට නො හැක්කෙම් ද" යි තමා විසින් ම තමා ගැන මෙසේ නුවණින් සැලකිය යුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම චොදකයකු විසින් චොදනා කරන ලද්දෙම්, සවකීය චරිත විෂයෙහි සපයා කියන්නට නො හැක්කෙම් වෙමි" යි මෙසේ දනී නම්, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ලාමක අකුශල ධර්මයන්ගේ ම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම චොදකයකු විසින් චොදනා කරන ලද්දෙම්, සවකීය චරිත විෂයෙහි සපයා කියන්නට හැක්කෙමි" යි මෙසේ දනී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් ම කුශලධර්මයෙහි දවරෑ හික්මෙන්නකු ව විසිය යුතු ය.

62. පුන ච පරං ආවුසො භික්ඛුනා අත්තනාව අත්තානං එවං පච්චවෙක්ඛිතබ්බං: “කින්නු ඛොම්හි මක්ඛී පළාසී”ති. සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: “මක්ඛී ඛොම්හි පළාසී”ති, තෙනාවුසො භික්ඛුනා තෙසං යෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං. සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: “අමක්ඛී ඛොම්හි අපළාසී”ති, තෙනාවුසො භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

63. පුන ච පරං ආවුසො භික්ඛුනා අත්තනාව අත්තානං එවං පච්චවෙක්ඛිතබ්බං: “කින්නු ඛොම්හි ඉස්සුකී මච්ඡරී”ති. සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති “ඉස්සුකී ඛොම්හි මච්ඡරී” ති, තෙනාවුසො භික්ඛුනා තෙසංයෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං. සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: “අනිස්සුකී ඛොම්හි අමච්ඡරී”ති, තෙනාවුසො භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

64. පුන ච පරං ආවුසො භික්ඛුනා අත්තනාව අත්තානං එවං පච්චවෙක්ඛිතබ්බං: “කින්නු ඛොම්හි සඨො මායාවී”ති. සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: “සඨො ඛොම්හි මායාවී”ති, තෙනාවුසො භික්ඛුනා තෙසං යෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං. සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: “අසඨො ඛොම්හි අමායාවී”ති, තෙනාවුසො භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

65. පුන ච පරං ආවුසො භික්ඛුනා අත්තනාව අත්තානං එවං පච්චවෙක්ඛිතබ්බං: “කින්නු ඛොම්හි ථද්ධො අතිමානීති. සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: “ථද්ධො ඛොම්හි අතිමානී” ති, තෙනාවුසො භික්ඛුනා තෙසං යෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං. සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: “අත්ථද්ධො ඛොම්හි අනතිමානී”ති, තෙනාවුසො භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

62. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණහු විසින් "කිම, මම ගුණ මකත්තෙම්, යුගග්‍රාහ ඇත්තෙම් වෙම් දැ" යි තමා විසින් ම තමා ගැන මෙසේ නුවණින් සැලකිය යුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම ගුණ මකත්තෙම්, යුගග්‍රාහ ඇත්තෙම් වෙමි" යි දනී නම්, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ලාමක අකුශලධර්මයන්ගේ ම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම ගුණ මකත්තෙම්, යුගග්‍රාහ ඇත්තෙම් නො වෙමි" යි මෙසේ දනී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් ම කුශලධර්මයෙහි දවරු හික්මෙන්නකු ව විසිය යුතු ය.

63. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණහු විසින් "කිම, මම ඊර්ෂ්‍යා ඇත්තෙම්, මසුරුබැව් ඇත්තෙම් වෙම් දැ" යි තමා විසින් ම තමා ගැන මෙසේ නුවණින් සැලකිය යුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම ඊර්ෂ්‍යා ඇත්තෙම්, මසුරුබැව් ඇත්තෙම් වෙමි" යි මෙසේ දනී නම්, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ලාමක අකුශල ධර්මයන්ගේ ම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම ඊර්ෂ්‍යා ඇත්තෙම් නො වෙමි. මසුරුබැව් ඇත්තෙම් නො වෙමි" යි මෙසේ දනී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් ම කුශලධර්මයෙහි දවරු හික්මෙන්නකු ව විසිය යුතු ය.

64. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණහු විසින් "කිම, මම කෛරාටිකයෙම්, මායා ඇත්තෙම් වෙම්" දැ යි තමා විසින් ම තමා ගැන මෙසේ නුවණින් සැලකිය යුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම කෛරාටිකයෙමි, මායා ඇත්තෙම් වෙමි" යි මෙසේ දනී නම්, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ලාමක අකුශල ධර්මයන්ගේ ම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම කෛරාටික වූයෙමි, මායා ඇත්තෙම් නො වෙමි" යි මෙසේ දනී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් ම කුශලධර්මයෙහි දවරු හික්මෙන්නකු ව විසිය යුතු ය.

65. තවද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණහු විසින් "කිම, මම තදබැව් ඇත්තෙම්, අධිකමාන ඇත්තෙම් වෙම් දැ" යි තමා විසින් ම තමා ගැන මෙසේ නුවණින් සැලකිය යුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම තදබැව් ඇත්තෙම් වෙමි. අධිකමාන ඇත්තෙම් වෙමි" යි මෙසේ දනී නම්, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ලාමක අකුශල ධර්මයන්ගේ ම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම නො තදබැව් ඇත්තෙම්, අධිකමාන නැත්තෙම් වෙමි" යි මෙසේ දනී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් ම කුශලධර්මයෙහි දවරු හික්මෙන්නකු ව විසිය යුතු ය.

66. පුන ච පරං ආවුසො භික්ඛුනා අත්තනාව අත්තානං එවං පච්චවෙක්ඛිතබ්බං: "කින්නු ඛොම්හි සන්දිට්ඨිපරාමාසී ආධානගාහී දුප්පටිනිස්සග්ගී"ති. සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "සන්දිට්ඨිපරාමාසී ඛොම්හි ආධානගාහී දුප්පටිනිස්සග්ගී"ති, තෙනාවුසො භික්ඛුනා තෙසං යෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං. සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "අසන්දිට්ඨිපරාමාසී ඛොම්හි අනාධානගාහී සුප්පටිනිස්සග්ගී"ති, තෙනාවුසො භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

67. සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො සබ්බෙපිමෙ පාපකෙ අකුසලෙ ධම්මෙ අප්පහීනෙ අත්තනි සමනුපස්සති, තෙනාවුසො භික්ඛුනා සබ්බෙසං යෙව ඉමෙසං පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං. සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො සබ්බෙපිමෙ පාපකෙ අකුසලෙ ධම්මෙ පහීනෙ අත්තනි සමනුපස්සති, තෙනාවුසො භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

68. සෙය්‍යථාපි ආවුසො ඉත්ථී වා පුරිසො වා දහරො යුවා මණ්ඩනකජාතිකො[1] ආදාසෙ වා පරියොදාතෙ අච්ඡෙ වා උදපත්තෙ[2] සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සචෙ තත්ථ පස්සති රජං වා අඞ්ගණං වා, තස්සෙව රජස්ස වා අඞ්ගණස්ස වා පහානාය වායමති. නො චෙ තත්ථ පස්සති රජං වා අඞ්ගණං වා තෙනෙව අත්තමනො හොති: "ලාභා වත මෙ, පරිසුද්ධං වත මෙ"ති. එවමෙව ඛො ආවුසො සචෙ භික්ඛු පච්චවෙක්ඛමානො සබ්බෙපිමෙ පාපකෙ අකුසලෙ ධම්මෙ අප්පහීනෙ අත්තනි සමනුපස්සති, තෙනාවුසො භික්ඛුනා සබ්බෙසං යෙව ඉමෙසං පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං. සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො සබ්බෙපිමෙ පාපකෙ අකුසලෙ ධම්මෙ පහීනෙ අත්තනි සමනුපස්සති, තෙනාවුසො භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසූති.

ඉදමවොචායස්මා මහාමොග්ගල්ලානො. අත්තමනා තෙ භික්ඛූ ආයස්මතො මහාමොග්ගල්ලානස්ස භාසිතං අභිනන්දුන්ති.

අනුමානසුත්තං පඤ්චමං.

---

1. මණ්ඩනජාතිකො, මජසං 2. උදකපත්තෙ, මජසං.

66. තව ද, අනෙකෙක් වෙයි. ඇවැත්නි, මහණහු විසින් "මම ස්වකීය දෘෂ්ටිය පරමර්ශනය කරන්නෙම්, එය ම දැඩි කොට ගන්නෙම් දුකසේත් බැහැර කිරීමට නො හැක්කෙම් වෙම් දැ" යි තමා විසින් ම තමා ගැන මෙසේ නුවණින් සැලකිය යුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම ස්වකීය දෘෂ්ටිය පරමර්ශනය කරන්නෙම්, එය ම දැඩි කොට ගන්නෙම්, දුකසේත් බැහැර කිරීමට නො හැක්කෙම් වෙමි" යි මෙසේ දනී නම්, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ලාමක අකුශලධර්මයන්ගේ ම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ "මම ස්වකීය දෘෂ්ටිය පරමර්ශනය නො කරන්නෙම්, එය ම දැඩි කොට නො ගන්නෙම්, සුවසේ බැහැර කිරීමට හැක්කෙම් වෙමි"යි මෙසේ දනී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් ම කුශලධර්මයෙහි දවරෑ හික්මෙන්නකු ව විසිය යුතු ය.

67. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ තමා තුළ නො පැහූ මේ සියලු ලාමක අකුශල ධර්මයන් දකී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් මේ සියලු ලාමක අකුශල ධර්මයන්ගේ ම ප්‍රහාණය පිණිස වෑයම් කළයුතු ය. ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ තමා තුළ පැහූ මේ සියලු ලාමක අකුශල ධර්මයන් දකී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් ම කුශලධර්මයෙහි දවරෑ හික්මෙන්නකු ව විසිය යුතු ය.

68. ඇවැත්නි, යම්සේ තරුණ වූ යොවුන් විය ඇති සැරසීම සැහැවි කොට ඇත්තා වූ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ පිරිසිදු හාත්පසින් බබලන කැඩපතෙක හෝ පහන් දියබඳුනෙක හෝ සිය මුවනිමිති බලන්නේ ඉදින් එහි රජස් හෝ හටගත් තලකැලැල් ඈ දොසක් හෝ දකී ද, එම රජස් හෝ දොස් හෝ දුරු කිරීම පිණිස වෑයම් කෙරේ ද, ඉදින් එහි රජස් හෝ දොස් හෝ නො දකී නම්, "මට එකාන්තයෙන් ලාභයෙක, මාගේ මුව පිරිසිදු ය" යි එයින් ම සතුටු වේ ද, එසේ ම ඇවැත්නි, ඉදින් මහණ නුවණින් සලකන්නේ නො පැහූ මේ ලාමක අකුශල ධර්මයන් තමා තුළ දකී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් මේ සියලු ලාමක අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස වෑයම් කළයුතු ය. ඇවැත්නි, ඉදින් වනාහි මහණ නුවණින් සලකන්නේ තමා තුළ පැහූ මේ සියලු ලාමක අකුශල ධර්මයන් දකී ද, ඇවැත්නි, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් ම කුශලධර්මයෙහි දවරෑ හික්මෙන්නකු ව විසිය යුතු ය.

ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ මෙය වදාළසේක. සතුටු වූ ඒ භික්ෂූහු ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේගේ දෙශනාව මැනැවැ යි පිළිගත්හ.

අනුමාන සූත්‍රය පස්වැනි යි.

Free Distribution www.aathaapi.org

1. 2. 6.

චෙතොඛිලසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුනො පඤ්ච චෙතොඛිලා[1] අප්පහීනා, පඤ්ච චෙතසො විනිබන්ධා[2] අසමුච්ඡින්නා, සො වතිමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති.

3. කතමස්ස[3] පඤ්ච චෙතොඛිලා අප්පහීනා හොන්ති?

ඉධ භික්ඛවෙ භික්ඛු සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති. යො සො භික්ඛවෙ භික්ඛු සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං පඨමො චෙතොඛිලො අප්පහීනො හොති.

4. පුන ච පරං භික්ඛවෙ භික්ඛු ධම්මෙ කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති. යො සො භික්ඛවෙ භික්ඛු ධම්මෙ කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං දුතියො චෙතොඛිලො අප්පහීනො හොති.

5. පුන ච පරං භික්ඛවෙ භික්ඛු සඞ්ඝෙ කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති. යො සො භික්ඛවෙ භික්ඛු සඞ්ඝෙ කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති, ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං තතියො චෙතොඛිලො අප්පහීනො හොති.

---

1. චෙතොඛිලා, සයා. 2. විනිබද්ධා, සීමු.
3. කතමාස්ස, මජසං.

Free Distribution www.aathaapi.org

1. 2. 6.

චෙතොඛිල සූත්‍රය

1. **මා** විසින් මෙසේ අසන ලදි: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර ජේතවන** නම් **අනේපිඬු** සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු වහන්සැ යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

2 මහණෙනි, යම් කිසි මහණක්හුගේ සිත්කසළහු පස්දෙන නො පහ වූහු ද, සිත පිළිබඳ බැඳුම්හු පස්දෙන නො සිඳුණාහු ද, හෙ ඒකාන්තයෙන් මේ ශාසනයෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වෙයි.

3. ඔහුගේ නො පැහූ සිත්කසළහු පස්දෙන කවරහු ද?

මහණෙනි, මේ ශාසනයෙහි මහණ බුදුන් කෙරෙහි සැක කරයි විචිකිච්ඡා කරයි. නිශ්චයට නො පැමිණෙයි. නො පහදියි. මහණෙනි, යම් ඒ මහණෙක් බුදුන් කෙරෙහි සැක කෙරේ ද, විචිකිච්ඡා කෙරේ ද, නිශ්චයට නො පැමිණේ ද, නො පහදී ද, ඒ මහණහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස නිතර වැර කිරීම පිණිස ප්‍රධන් පිණිස නො නැමෙයි. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස නිතර වැර කිරීම පිණිස ප්‍රධන් පිණිස නො නැමේ නම් මෙසේ මොහුගේ මේ පළමුවන සිත් කසළ ප්‍රහීණ නො වූයේ වෙයි.

4. තවද, අනෙකෙක් වෙයි. මහණෙනි, මහණ ධර්මය කෙරෙහි සැක කරයි. විචිකිච්ඡා කරයි. නිශ්චයට නො පැමිණෙයි නො පහදියි. මහණෙනි, යම් ඒ මහණෙක් ධර්මය කෙරෙහි සැක කෙරේ ද, විචිකිච්ඡා කෙරේ ද, නිශ්චයට නො පැමිණේ ද, නො පහදී ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස නිතර වැර කිරීම පිණිස ප්‍රධන් පිණිස නො නැමෙයි. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස නිතර වැර කිරීම පිණිස ප්‍රධන් පිණිස නො නැමේ නම් මෙසේ මොහුගේ මේ දෙවන සිත්කසළ ප්‍රහීණ නො වූයේ වෙයි.

5. තවද, අනෙකෙක් වෙයි. මහණෙනි, මහණ සඞ්ඝයා කෙරෙහි සැක කෙරෙයි. විචිකිච්ඡා කෙරෙයි. නිශ්චයට නො පැමිණෙයි. නො පහදියි. මහණෙනි, යම් ඒ මහණෙක් සඞ්ඝයා කෙරෙහි සැක කෙරේ ද, විචිකිච්ඡා කෙරේ ද, නිශ්චයට නො පැමිණේද, නො පහදී ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස නිතර වැර කිරීම පිණිස ප්‍රධන් පිණිස නො නැමෙයි. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස නිතර වැර කිරීම පිණිස ප්‍රධන් පිණිස නො නැමේ නම්, මෙසේ මොහුගේ මේ තෙවන සිත්කසළ ප්‍රහීණ නො වූයේ වෙයි.

6. පුන ච පරං භික්ඛවෙ භික්ඛු සික්ඛාය කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති. යො සො භික්ඛවෙ භික්ඛු සික්ඛාය කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං චතුත්ථො චෙතොඛිලො අප්පහීනො හොති.

7. පුන ච පරං භික්ඛවෙ භික්ඛු සබ්‍රහ්මචාරීසු කුපිතො හොති අනත්තමනො ආහතචිත්තො ඛිලජාතො[1]. යො සො භික්ඛවෙ භික්ඛු සබ්‍රහ්මචාරීසු කුපිතො හොති අනත්තමනො ආහතචිත්තො ඛිලජාතො, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං පඤ්චමො චෙතොඛිලො අප්පහීනො හොති.

ඉමස්ස[2] පඤ්ච චෙතොඛිලා අප්පහීනා හොන්ති.

8. කතමස්ස පඤ්ච චෙතසො විනිබන්ධා අසමුච්ඡින්නා හොන්ති?

ඉධ භික්ඛවෙ භික්ඛු කාමෙ අවීතරාගො හොති අවිගතඡන්දො[3] අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො. යො සො භික්ඛවෙ භික්ඛු කාමෙ අවීතරාගො හොති අවිගතඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං පඨමො චෙතසො විනිබන්ධො අසමුච්ඡින්නො හොති.

9. පුන ච පරං භික්ඛවෙ භික්ඛු කායෙ අවීතරාගො හොති අවිගතඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො. යො සො භික්ඛවෙ භික්ඛු කායෙ අවීතරාගො හොති අවිගතඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං දුතියො චෙතසො විනිබන්ධො අසමුච්ඡින්නො හොති.

---

1. ඛිලජාතො, සී. 2 ඉමාස්ස, මජ්සං. 3 අවිගතච්ඡන්දො, මජ්සං.

6. තවද, අනෙකෙක් වෙයි. මහණෙනි, මහණ ශික්‍ෂාව කෙරෙහි සැක කෙරෙයි. විචිකිච්ඡා කෙරෙයි. නිශ්චයට නො පැමිණෙයි· නො පහදියි. මහණෙනි, යම් ඒ මහණෙක් ශික්‍ෂාව කෙරෙහි සැක කෙරේ ද, විචිකිච්ඡා කෙරේ ද, නිශ්චයට නො පැමිණේ ද, නො පහදී ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස නිතර වැර කිරීම පිණිස ප්‍රධන් පිණිස නො නැමෙයි. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සාතත්‍යය පිණිස ප්‍රධන් පිණිස නො නැමේ නම්, මෙසේ මොහුගේ සතරවන සිත්කසල ප්‍රහීණ නො වූයේ වෙයි.

7. තවද, අනෙකෙක් වෙයි. මහණෙනි, මහණ සබ්‍රම්සරුන් කෙරෙහි කිපියේ ප්‍රීතිසෞමනස්‍ය විසින් නොගත්තාලද සිත් ඇතියේ, ගැටුණු සිත් ඇත්තේ, උපන් සිත්කණු ඇත්තේ වෙයි මහණෙනි, යම් ඒ මහණෙක් සබ්‍රම්සරුන් කෙරෙහි කිපියේ නො සතුටු සිත් ඇත්තේ ගැටුණු සිත් ඇත්තේ හටගත් සිත්කණු ඇත්තේ වේ ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස නිතර වැර කිරීම පිණිස ප්‍රධන් පිණිස නො නැමෙයි. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නො නැමේ නම්, මෙසේ මොහුගේ පස්වන සිත්කසල ප්‍රහීණ නො වූයේ වෙයි.

මොහුගේ සිත පිළිබඳ කසලහු පස්දෙනා ප්‍රහීණ නො වූවාහු වෙත්.

8 ඔහුගේ සිත පිළිබඳ නො සිඳුණු බැඳුම් පස්දෙනා කවරහු වෙද්ද?

මහණෙනි, මේ ශාසනයෙහි මහණ කාමයෙහි නො පහ කළ රාග ඇත්තේ නො පහ කළ සඳ ඇත්තේ නො පහ කළ ප්‍රෙම ඇත්තේ නො පහ කළ පිපාසා ඇත්තේ නො පහ කළ දැවිලි ඇත්තේ නො පහ කළ තෘෂ්ණා ඇත්තේ වෙයි. මහණෙනි, යම් ඒ මහණෙක් කාමයෙහි නො පහ කළ රාග ඇත්තේ නො පහ කළ සඳ ඇත්තේ නො පහ කළ ප්‍රෙම ඇත්තේ නො පහ කළ පිපාසා ඇත්තේ නො පහ කළ දැවිලි ඇත්තේ නො පහ කළ තෘෂ්ණා ඇත්තේ වේ ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නො නැමෙයි. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නො නැමේ නම්, මෙසේ මොහුගේ පළමුවන විනිබන්ධය නො සිඳුණේ වෙයි.

9. තවද, මහණෙනි, අනෙකෙක් වෙයි. මහණ කයෙහි නො පැහූ රාග ඇත්තේ නො පැහූ සඳ ඇත්තේ නො පැහූ ප්‍රෙම ඇත්තේ නො පැහූ පිපාසා ඇත්තේ නො පැහූ දැවිලි ඇත්තේ නො පැහූ තෘෂ්ණා ඇත්තේ වෙයි. මහණෙනි, යම් ඒ මහණෙක් කයෙහි නො පැහූ රාග ඇත්තේ නො පැහූ සඳ ඇත්තේ නො පැහූ ප්‍රෙම ඇත්තේ නො පැහූ පිපාසා ඇත්තේ නො පැහූ දැවිලි ඇත්තේ නො පැහූ තෘෂ්ණා ඇත්තේ වේ ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස නො නැමෙයි. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස නිතර නිතර වැර කිරීම පිණිස කෙලෙස් දැවීම පිණිස ප්‍රධන් පිණිස නො නැමේ නම්, මෙසේ ඔහුගේ මේ දෙවන විනිබන්ධය නො සිඳුණේ වෙයි.

10. පුන ච පරං භික්ඛවෙ භික්ඛු රූපෙ අවීතරාගො හොති අවිගතච්ඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො. යො සො භික්ඛවෙ භික්ඛු රූපෙ අවීතරාගො හොති අවිගතච්ඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං තතියො චෙතසො විනිබන්ධො අසමුච්ඡින්නො හොති.

11. පුන ච පරං භික්ඛවෙ භික්ඛු යාවදත්ථං උදරාවදෙහකං භුඤ්ජිත්වා සෙය්‍යසුඛං පස්සසුඛං[1] මිද්ධසුඛං අනුයුත්තො විහරති. යො සො භික්ඛවෙ භික්ඛු යාවදත්ථං උදරාවදෙහකං භුඤ්ජිත්වා සෙය්‍යසුඛං පස්සසුඛං මිද්ධසුඛං අනුයුත්තො විහරති, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං චතුත්ථො චෙතසො විනිබන්ධො අසමුච්ඡින්නො හොති.

12. පුන ච පරං භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති: ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වාති. යො සො භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති: ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වාති, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං පඤ්චමො චෙතසො විනිබන්ධො අසමුච්ඡින්නො හොති.

ඉමස්ස පඤ්ච චෙතසො විනිබන්ධා අසමුච්ඡින්නා හොන්ති.

13. යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුනො ඉමෙ පඤ්ච චෙතොඛිලා අප්පහීනා, ඉමෙ පඤ්ච චෙතසො විනිබන්ධා අසමුච්ඡින්නා, සො වතිමස්මිං ධම්මවිනයෙ වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති.

1. පස්සසුඛං, කත්ථචි

10. තවද, මහණෙනි, අනෙකෙක් වෙයි. මහණ රූපයෙහි නො පහ කළ රාග ඇත්තේ නො පහ කළ සඳ ඇත්තේ නො පහ කළ ප්‍රේම ඇත්තේ නො පහ කළ පිපාසා ඇත්තේ නො පහ කළ දැවිලි ඇත්තේ නො පහ කළ තෘෂ්ණා ඇත්තේ වෙයි. මහණෙනි, යම් ඒ මහණෙක් රූපයෙහි නො පහ කළ රාග ඇත්තේ නො පහ කළ සඳ ඇත්තේ නො පහ කළ ප්‍රේම ඇත්තේ නො පහ කළ පිපාසා ඇත්තේ නො පහ කළ දැවිලි ඇත්තේ නො පහ කළ තෘෂ්ණා ඇත්තේ වේ ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නො නැමෙයි. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිය සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නො නැමේ නම්, මෙසේ ඔහුගේ මේ තෙවන චිත්තවිනිබන්ධය නො සිඳුණේ වෙයි.

11. තවද, මහණෙනි, අනෙකෙක් වෙයි. මහණ හම්මනතාක් කුස් පුරා වළඳා සෙය්‍යසුඛයෙහි (ඇඳ පුටු පහසින් වන සැපයෙහි) පස්සසුඛයෙහි (පෙරළි පෙරළි හෝනාහට වන පාර්ශ්වසුඛයෙහි) මිද්ධසුඛයෙහි (නිදීමෙන් වන සැපයෙහි) යෙදුණේ වෙසෙයි. මහණෙනි, යම් ඒ මහණෙක් කැමැතිතාක් කුස් පුරා වළඳා සෙය්‍යසුඛයෙහි පස්සසුඛයෙහි මිද්ධසුඛයෙහි යුක්තප්‍රයුක්ත ව වෙසේ ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නො නැමෙයි. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නො නැමේ නම්, මෙසේ ඔහුගේ මේ සිවුවන චිත්තවිනිබන්ධය නො සිඳුණේ වෙයි.

12. තවද මහණෙනි, අනෙකෙක් වෙයි. මහණ එක්තරා දෙවනිකායක් පතා මම මේ සීලයෙන් හෝ ව්‍රතින් හෝ තපසින් හෝ බඹසරින් හෝ දෙවියෙකිම් හෝ දෙවියන් අතුරෙන් එක්තරා එකෙකිම් හෝ වන්නෙම්' යි බඹසර පුරයි. මහණෙනි, යම් ඒ මහණෙක් එක්තරා දෙවනිකායක් පතා මම මේ සීලයෙන් හෝ ව්‍රතින් හෝ තපසින් හෝ බඹසරින් හෝ දෙවියෙකිම් හෝ දෙවියන් අතුරෙන් එක්තරා එකෙකිම් හෝ වන්නෙම්' යි බඹසර පුරා නම් ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නො නැමේ. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නො නැමේ නම් මෙසේ ඔහුගේ මේ පස්වන චිත්තවිනිබන්ධය නො සිඳුණේ වෙයි.

ඔහුගේ මේ චිත්තවිනිබන්ධයෝ පස් දෙන නො සිඳුණාහු වෙති.

13. මහණෙනි, යම් කිසි මහණක්හුගේ මේ සිත් කාසළහු පස්දෙන ප්‍රහීණ නො වූවාහු ද, මේ චිත්තවිනිබන්ධයෝ පස්දෙන නො සිඳුණාහු ද, හෙ එකාන්තයෙන් මේ ශාසනයෙහි වැඩීමට ද විරූඪියට ද වෛපුල්‍යයට ද පැමිණෙන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වෙයි.

Free Distribution www.aathaapi.org

14. යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුනො පඤ්ච චෙතොඛිලා පහීනා, පඤ්ච චෙතසො විනිබන්ධා සුසමුච්ඡින්නා, සො ඉමස්මිං ධම්මවිනයෙ වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති ඨානමෙතං විජ්ජති.

15. කතමස්ස පඤ්ච චෙතොඛිලා පහීනා හොන්ති?

ඉධ භික්ඛවෙ භික්ඛු සත්ථරි න කඞ්ඛති න විචිකිච්ඡති අධිමුච්චති සම්පසීදති. යො සො භික්ඛවෙ භික්ඛු සත්ථරි න කඞ්ඛති න විචිකිච්ඡති අධිමුච්චති, සම්පසීදති තස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං පඨමො චෙතොඛිලො පහීනො හොති.

16 පුන ච පරං භික්ඛවෙ භික්ඛු ධම්මෙ න කඞ්ඛති න විචිකිච්ඡති අධිමුච්චති සම්පසීදති. යො සො භික්ඛවෙ භික්ඛු ධම්මෙ න කඞ්ඛති න විචිකිච්ඡති අධිමුච්චති සම්පසීදති, තස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං දුතියො චෙතොඛිලො පහීනො හොති.

17. පුන ච පරං භික්ඛවෙ භික්ඛු සඞ්ඝෙ න කඞ්ඛති න විචිකිච්ඡති අධිමුච්චති සම්පසීදති. යො සො භික්ඛවෙ භික්ඛු සඞ්ඝෙ න කඞ්ඛති න විචිකිච්ඡති අධිමුච්චති සම්පසීදති, තස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං තතියො චෙතොඛිලො පහීනො හොති.

18. පුන ච පරං භික්ඛවෙ භික්ඛු සික්ඛාය න කඞ්ඛති න විචිකිච්ඡති අධිමුච්චති සම්පසීදති. යො සො භික්ඛවෙ භික්ඛු සික්ඛාය න කඞ්ඛති න විචිකිච්ඡති අධිමුච්චති සම්පසීදති, තස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං චතුත්ථො චෙතොඛිලො පහීනො හොති.

14. මහණෙනි, යම් කිසි මහණක්හුගේ සිත් කසළහු පස්දෙන ප්‍රහීණ වූවාහු ද, චිත්තවිනිබන්ධයෝ මොහුවට සිඳුණාහු ද, හෙ එකාන්තයෙන් මේ ශාසනයෙහි වැඩීමට ද විරූඪියට ද වෛපුල්‍යයට ද පැමිණෙන්නේ ය යන මේ කාරණය විද්‍යමාන වෙයි.

15. ඔහුගේ කවර නම් සිත් කසළහු පස් දෙනෙක් ප්‍රහීණ වූවාහු වෙත් ද?

මහණෙනි, මේ ශාසනයෙහි මහණ බුදුන් කෙරෙහි සැක නො කෙරෙයි. විචිකිච්ඡා නො කෙරෙයි. නිශ්චයට පැමිණෙයි. පහදියි. මහණෙනි, යම් ඒ මහණෙක් බුදුන් කෙරෙහි සැක නො කෙරේ ද, විචිකිච්ඡා නො කෙරේ ද, නිශ්චයට පැමිණේ ද, පහදී ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියාව පිණිස ප්‍රධන් පිණිස නැමේ. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නැමේ නම්, මෙසේ ඔහුගේ මේ පළමුවන සිත්කසළ ප්‍රහීණ වූයේ වෙයි.

16. තවද, අනෙකෙක් වෙයි. මහණෙනි, මහණ ධර්මයෙහි සැක නො කෙරෙයි. විචිකිච්ඡා නො කෙරෙයි. නිශ්චයට පැමිණෙයි. පහදියි. මහණෙනි, යම්. ඒ මහණෙක් ධර්මයෙහි සැක නො කෙරේ ද, විචිකිච්ඡා නො කෙරේ ද, නිශ්චයට පැමිණේ ද, පහදී ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නැමෙයි. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නැමේ නම්, මෙසේ ඔහුගේ මේ දෙවන සිත්කසළ ප්‍රහීණ වූයේ වෙයි.

17. තවද, අනෙකෙක් වෙයි. මහණෙනි, මහණ සඞ්ඝයා කෙරෙහි සැක නො කෙරෙයි. විචිකිච්ඡා නො කෙරෙයි. නිශ්චයට පැමිණෙයි. පහදියි. මහණෙනි, යම් ඒ මහණෙක් සඞ්ඝයා කෙරෙහි සැක නො කෙරේ ද, විචිකිච්ඡා නො කෙරේ ද, නිශ්චයට පැමිණේ ද, පහදී ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නැමෙයි. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නැමේ නම්, මෙසේ ඔහුගේ මේ තෙවන සිත්කසළ ප්‍රහීණ වූයේ වෙයි.

18. තවද, අනෙකෙක් වෙයි. මහණෙනි, මහණ ශික්ෂාව කෙරෙහි සැක නො කෙරෙයි. විචිකිච්ඡා නො කෙරෙයි. නිශ්චයට පැමිණෙයි පහදියි. මහණෙනි, යම් ඒ මහණෙක් ශික්ෂාව කෙරෙහි සැක නො කෙරේ ද, විචිකිච්ඡා නො කෙරේ ද, නිශ්චයට පැමිණේ ද, පහදී ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා කිරීම පිණිස ප්‍රධන් පිණිස නැමෙයි. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා කිරීම පිණිස ප්‍රධන් පිණිස නැමේ නම්, මෙසේ ඔහුගේ මේ සතරවන සිත් කසළ ප්‍රහීණ වූයේ වෙයි.

19. පුන ච පරං භික්ඛවෙ භික්ඛු සබ්‍රහ්මචාරීසු න කුපිතො හොති අත්තමනො අනාහතචිත්තො අඛිලජාතො.[1] යො සො භික්ඛවෙ භික්ඛු සබ්‍රහ්මචාරීසු න කුපිතො හොති අත්තමනො අනාහතචිත්තො අඛිල-ජාතො, තස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං පඤ්චමො චෙතොඛිලො පහීනො හොති.

ඉමස්ස පඤ්ච චෙතොඛිලා පහීනා හොන්ති.

20. කතමස්ස පඤ්ච චෙතසො විනිබන්ධා සුසමුච්ඡින්නා හොන්ති?

ඉධ භික්ඛවෙ භික්ඛු කාමෙ වීතරාගො හොති විගතච්ඡන්දො විගතපෙමො විගතපිපාසො විගතපරිළාහො විගතතණ්හො. යො සො භික්ඛවෙ භික්ඛු කාමෙ වීතරාගො හොති විගතච්ඡන්දො විගතපෙමො විගතපිපාසො විගතපරිළාහො විගතතණ්හො, තස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං පඨමො චෙතසො විනිබන්ධො සුසමුච්ඡින්නො හොති.

21. පුන ච පරං භික්ඛවෙ භික්ඛු කායෙ වීතරාගො හොති විගතච්ඡන්දො විගතපෙමො විගතපිපාසො විගතපරිළාහො විගතතණ්හො. යො සො භික්ඛවෙ භික්ඛු කායෙ වීතරාගො හොති විගතච්ඡන්දො විගතපෙමො විගතපිපාසො විගතපරිළාහො විගතතණ්හො, තස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං දුතියො චෙතසො විනිබන්ධො සුසමුච්ඡින්නො හොති.

22. පුන ච පරං භික්ඛවෙ භික්ඛු රූපෙ වීතරාගො හොති විගත-ච්ඡන්දො විගතපෙමො විගතපිපාසො විගතපරිළාහො විගතතණ්හො. යො සො භික්ඛවෙ භික්ඛු රූපෙ වීතරාගො හොති විගතච්ඡන්දො විගතපෙමො විගතපිපාසො විගතපරිළාහො විගතතණ්හො, තස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං තතියො චෙතසො විනිබන්ධො සුසමුච්ඡින්නො හොති.

---

1. න අනත්තමනො අනාහතචිත්තො අඛිලජාතො, මජසං.
න අනත්තමනො න ආහතචිත්තො න ඛිලජාතො" සයා.

19. තවද, අනෙකෙක් වෙයි. මහණෙනි, මහණ සබ්‍රහ්මසරුන් කෙරෙහි නො කිපියේ සතුටු සිත් ඇත්තේ කොපයෙන් නො ගැටුණු සිත් ඇත්තේ හටගත් සිත්කණු නැත්තේ වෙයි. මහණෙනි, යම් ඒ මහණෙක් සබ්‍රහ්මසරුන් කෙරෙහි නො කිපියේ සතුටු සිත් ඇත්තේ කොපයෙන් නො ගැටුණු සිත් ඇත්තේ හටගත් සිත්කණු නැත්තේ වේ ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නැමේ. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නැමේ නම් මෙසේ ඔහුගේ මේ පස්වන සිත්කසල ප්‍රහීණ වූයේ වෙයි.

ඔහුගේ මේ සිත්කසළහු පස් දෙන ප්‍රහීණ වූවාහු වෙත්.

20. ඔහුගේ කවර නම් චිත්තවිනිබන්ධයෝ පස් දෙනෙක් මොනවට සිඳුණාහු වෙත් ද?

මහණෙනි, මේ ශාසනයෙහි මහණ කාමයෙහි පහ වූ රාග ඇත්තේ පහ වූ සඳ ඇත්තේ පහවූ ප්‍රෙම ඇත්තේ පහ වූ පවස් ඇත්තේ පහ වූ දැවිලි ඇත්තේ පහ වූ තෘෂ්ණා ඇත්තේ වෙයි. මහණෙනි, යම් ඒ මහණෙක් කාමයෙහි පහ වූ රාග ඇත්තේ පහ වූ සඳ ඇත්තේ පහ වූ ප්‍රෙම ඇත්තේ පහ වූ පවස් ඇත්තේ පහ වූ තෘෂ්ණා ඇත්තේ වේ ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නැමෙයි. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නැමේ නම්, මෙසේ ඔහුගේ මේ පළමුවන චිත්තවිනිබන්ධය මොනවට සිඳුණේ වෙයි.

21. තවද, අනෙකෙක් වෙයි. මහණෙනි, මහණ කයෙහි පහ වූ රාග ඇත්තේ පහ වූ සඳ ඇත්තේ පහ වූ ප්‍රෙම ඇත්තේ පහ වූ පවස් ඇත්තේ පහ වූ දැවිලි ඇත්තේ පහ වූ තෘෂ්ණා ඇත්තේ වෙයි. මහණෙනි, යම් ඒ මහණෙක් කයෙහි පහ වූ රාග ඇත්තේ පහ වූ සඳ ඇත්තේ පහ වූ ප්‍රෙම ඇත්තේ පහ වූ පවස් ඇත්තේ පහ වූ දැවිලි ඇත්තේ පහ වූ තෘෂ්ණා ඇත්තේ වේ ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නැමෙයි. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නැමේ නම්, මෙසේ ඔහුගේ දෙවන චිත්තවිනිබන්ධය මොනවට සිඳුණේ වෙයි.

22. තවද, අනෙකෙක් වෙයි. මහණෙනි, මහණ රූපයෙහි පහ වූ රාග ඇත්තේ පහ වූ සඳ ඇත්තේ පහ වූ ප්‍රෙම ඇත්තේ පහ වූ පවස් ඇත්තේ පහ වූ දැවිලි ඇත්තේ පහ වූ තෘෂ්ණා ඇත්තේ වෙයි. මහණෙනි, යම් ඒ මහණෙක් රූපයෙහි පහ වූ රාග ඇත්තේ පහ වූ සඳ ඇත්තේ පහ වූ ප්‍රෙම ඇත්තේ පහ වූ පවස් ඇත්තේ පහ වූ දැවිලි ඇත්තේ පහ වූ තෘෂ්ණා ඇත්තේ වේ ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා කිරීම පිණිස ප්‍රධන් පිණිස නැමෙයි. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා කිරීම පිණිස ප්‍රධන් පිණිස නැමේ නම්, මෙසේ ඔහුගේ මේ තුන්වන චිත්තවිනිබන්ධය මොනවට සිඳුණේ වෙයි.

23 පුන ච පරං භික්ඛවෙ භික්ඛු න යාවදත්ථං උදරාවදෙහකං භුඤ්ජිත්වා සෙය්‍යසුඛං පස්සසුඛං මිද්ධසුඛං අනුයුත්තො විහරති යො සො භික්ඛවෙ භික්ඛු න යාවදත්ථං උදරාවදෙහකං භුඤ්ජිත්වා සෙය්‍යසුඛං පස්සසුඛං මිද්ධසුඛං අනුයුත්තො විහරති, තස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං චතුත්ථො චෙතසො විනිබන්ධො සුසමුච්ඡින්නො හොති.

24. පුන ච පරං භික්ඛවෙ භික්ඛු න අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති: ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වාති. යො සො භික්ඛවෙ භික්ඛු න අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති: ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වාති, තස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං පඤ්චමො චෙතසො විනිබන්ධො සුසමුච්ඡින්නො හොති.

ඉමස්ස පඤ්ච චෙතසො විනිබන්ධා සුසමුච්ඡින්නා හොන්ති.

25. යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුනො ඉමෙ පඤ්ච චෙතොඛිලා පහීනා, ඉමෙ පඤ්ච චෙතසො විනිබන්ධා සුසමුච්ඡින්නා, සො වතිමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති ඨානමෙතං විජ්ජති.

26. සො ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. චිත්තසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. උස්සොළ්හියෙව[1] පඤ්චමී.

27. ස ඛො සො භික්ඛවෙ එවං උස්සොළ්හි පන්නරසඞ්ගසමන්නාගතො භික්ඛු භබ්බො අභිනිබ්භිදාය,[2] භබ්බො සම්බොධාය, භබ්බො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය. සෙය්‍යථාපි භික්ඛවෙ කුක්කුටියා අණ්ඩානි අට්ඨ වා දස වා ද්වාදස වා, තානස්සු කුක්කුටියා සම්මා අධිසයිතානි, සම්මා පරිසෙදිතානි, සම්මා පරිභාවිතානි, කිඤ්චාපි තස්සා කුක්කුටියා න එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: අහො වතිමෙ කුක්කුටපොතකා පාදනඛසිඛාය වා මුඛතුණ්ඩකෙන වා අණ්ඩකොසං පදාලෙත්වා සොත්ථිනා අභිනිබ්භිජ්ජෙය්‍යුන්ති. අථ ඛො භබ්බාව තෙ කුක්කුටපොතකා පාදනඛසිඛාය වා මුඛතුණ්ඩකෙන වා අණ්ඩකොසං පදාලෙත්වා සොත්ථිනා අභිනිබ්භිජ්ජිතුං. එවමෙව ඛො භික්ඛවෙ එවං උස්සොළ්හි පන්නරසඞ්ගසමන්නාගතො භික්ඛු භබ්බො සම්බොධාය, භබ්බො අභිනිබ්භිදාය, භබ්බො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමායාති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

චෙතොඛිලසුත්තං ඡට්ඨං.

---

1 උස්සොළ්හීයෙව, මජසං. 2. අභිනිබ්බිදාය, මජසං.

23. තවද, අනෙකෙක් වෙයි. මහණෙනි, මහණ හම්මතතාක් කුස පුරා ආහාර අනුභව කොට සෙය්‍යසුඛයෙහි පස්ස සුඛයෙහි මිද්ධසුඛයෙහි නො යෙදුනේ වෙයි. මහණෙනි, යම් ඒ මහණෙක් කුස පිරෙන සේ හම්මත-තාක් ආහාර අනුභව කොට සෙය්‍යසුඛයෙහි පස්සසුඛයෙහි මිද්ධසුඛයෙහි නො යෙදුණේ ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නැමෙයි. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නැමේ නම්, මෙසේ ඔහුගේ මේ සිවුවන චිත්තවිනිබන්ධය සිඳුණේ වෙයි

24. තවද, අනෙකෙක් වෙයි. මහණෙනි, මහණ එක්තරා දෙව නිකායක් පතා "මේ සීලයෙන් හෝ ව්‍රතින් හෝ තපසින් හෝ බඹසරින් හෝ දෙවියෙකිම් හෝ දෙවියන් අතර එක්තරු එකෙකිම් හෝ වන්නෙමි" යි බඹසර නො හැසිරෙයි. මහණෙනි, යම් ඒ මහණෙක් එක්තරු දෙවනිකායක් පතා "මේ සීලයෙන් හෝ ව්‍රතින් හෝ තපසින් හෝ බඹසරින් හෝ දෙවියෙකිම් හෝ දෙවියන් අතර එක්තරු එකෙකිම් හෝ වන්නෙමි" යි බඹසර නො හැසිරේ ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නැමේ. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස එහි පුන පුනා යෙදීම පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන් පිණිස නැමේ නම්, මෙසේ ඔහුගේ මේ පස්වන චිත්තවිනිබන්ධය සිඳුණේ වෙයි.

ඔහුගේ මේ චිත්තවිනිබන්ධයෝ පස්දෙන මොනවට සිඳුණාහු වෙත්.

25. මහණෙනි, යම් කිසි මහණක්හුගේ මේ සිත්කසළහු පස්දෙන ප්‍රහීණ වූවාහු ද, මේ චිත්තවිනිබන්ධයෝ පස්දෙන මොනවට සිඳුණාහු ද, හෙ ඒකාන්තයෙන් මේ ශාසනයෙහි වැඩීමට ද විරූඪියට ද වෛපුල්‍යයට ද පැමිණෙන්නේ ය යන මේ කාරණය විද්‍යමාන වෙයි.

26. හෙ ඡන්දාධිපති සමාධි හා ප්‍රධාන සංස්කාරයෙන් (උතුම් වීර්‍ය්‍යයෙන්) යුක්ත වූ ඍද්ධි පාදය (ඍද්ධි උපාය) වඩයි. වීර්‍ය්‍යාධිපතිසමාධි හා ප්‍රධාන සංස්කාරයෙන් යුක්ත වූ ඍද්ධිපාදය වඩයි. චිත්තාධිපතිසමාධි හා ප්‍රධාන සංස්කාරයෙන් යුක්ත වූ ඍද්ධිපාදය වඩයි. වීමංසාධිපතිසමාධි හා ප්‍රධාන සංස්කාරයෙන් යුක්ත වූ ඍද්ධිපාදය වඩයි උත්සාහය (හැම තන්හි කටයුතු වීර්‍ය්‍යය) පස්වැනි වෙයි.

27. මහණෙනි, මෙසේ වීර්‍ය්‍යය සහිත පසළොස් අඞ්ගයෙන් යුක්ත වූ මහණ කෙලෙස් බිඳීම පිණිස නිසි වේ. මාර්ගඥානය පිණිස නිසි වේ. ශ්‍රේෂ්ඨ වූ අභීත්ඵලාවබොධය පිණිස නිසි වේ. මහණෙනි, යම්සේ කිකිළියකට බිජ අටෙක් හෝ දසයෙක් හෝ දොළොසෙක් හෝ වේ ද, ඒ බිජයෝ කිකිළිය විසින් මොනවට මතුයෙහි හෝනා ලද්දාහු මොනවට උණුසුම් කිරීමෙන් හිඳවන ලද්දාහු කුකුළුගඳ ගත්වන ලද්දාහු වෙත් ද, හුදෙක් ඒ කිකිළියට මාගේ කුකුළු පැටවු පා නියසිළින් හෝ මුවතුඩින් හෝ බිජුවට පලා ගෙන සුවසේ බිහිවන්නාහු නම් ඉතා යෙහෙකැයි මෙබඳු ඉච්ඡායෙක් නො උපදනේ ය. එනෙකුදු වූවත් ඒ සියලු කුකුළුපැටවු පා නියසිළින් හෝ මුවතුඩින් හෝ බිජුවට පලා ගෙන සුවසේ බිහිවන්නට නිසි වූවාහු ම වෙත්. මහණෙනි, එපරිද්දෙන් ම මෙසේ උත්සාහය සහිත පසළොස් අඞ්ගයෙන් යුක්ත වූ මහණ කෙලෙස් බිඳීම පිණිස නිසි වේ. මාර්ගඥානය පිණිස නිසි වේ. ශ්‍රේෂ්ඨ වූ අභීත්ඵලාවබොධය පිණිස නිසි වේ.

භාග්‍යවතුන් වහන්සේ මෙ සූත්‍රය වදාළ සේක. සතුටු වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව මැනැවැයි පිළිගත්හ.

චෙතොඛිල සූත්‍රය සවැනි යි.

1. 2. 7.

වනපත්ථසුත්තං

1. **එවං** මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. වනපත්ථපරියායං වො භික්ඛවෙ දෙසිස්සාමි. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

3. ඉධ භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං වනපත්ථං උපනිස්සාය විහරති. තස්ස තං වනපත්ථං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති න උපට්ඨාති. අසමාහිතඤ්ච චිත්තං න සමාධියති. අපරික්ඛීණා ච ආසවා න පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං නානුපාපුණාති. යෙ ච ඛො මෙ[1] පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බං: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තෙ කසිරෙන සමුදාගච්ඡන්ති. තෙන භික්ඛවෙ භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං: "අහං ඛො ඉමං වනපත්ථං උපනිස්සාය විහරාමි. තස්ස මෙ ඉමං වනපත්ථං උපනිස්සාය පිහරතො අනුපට්ඨිතා චෙව සති න උපට්ඨාති. අසමාහිතඤ්ච චිත්තං න සමාධියති. අපරික්ඛීණා ච ආසවා න පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං නානුපාපුණාමි. යෙ ච ඛො මෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තෙ කසිරෙන සමුදාගච්ඡන්තී"ති. තෙන භික්ඛවෙ භික්ඛුනා රත්තිභාගං වා දිවසභාගං වා තම්හා වනපත්ථා පක්කමිතබ්බං, න වත්ථබ්බං.

4. ඉධ පන භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං වනපත්ථං උපනිස්සාය විහරති. තස්ස තං වනපත්ථං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති න උපට්ඨාති. අසමාහිතඤ්ච චිත්තං න සමාධියති. අපරික්ඛීණා ච ආසවා න පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං නානුපාපුණාති. යෙ ච ඛො ඉමෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තෙ අප්පකසිරෙන සමුදාගච්ඡන්ති. තෙන භික්ඛවෙ භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං; "අහං ඛො ඉමං වනපත්ථං උපනිස්සාය විහරාමි. තස්ස මෙ ඉමං වනපත්ථං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති න උපට්ඨාති. අසමාහිතඤ්ච චිත්තං න සමාධියති. අපරික්ඛීණා ච ආසවා න පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං නානුපාපුණාමි.-

1. යෙවිමේ, සාළුම.

1. 2. 7.

වනපත්ථ සූත්‍රය

1. **මා** විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, යි භික්ෂූන් ඇමැතූසේක. ඒ භික්ෂූහු වහන්සැ යි භාග්‍යවතුන් වහන්සේ හට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

2. මහණෙනි, තොපට වනපත් දෙසුමක් දෙසමි. එය අසව, මොනවට මෙනෙහි කරව, කියමි යි වදාළ සේක. එසේ ය වහන්සැ යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ හට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

3. මහණෙනි, මේ ශාසනයෙහි මහණ එක්තරා වනපත් සෙනසුනක් ඇසිරි කොට වෙසෙයි. ඒ වනපත ඇසිරි කොට වසන ඒ මහණහට පළමු නො එළඹ සිටි සිහිය වනපෙත් ඇසුරු කළ ද නො එළඹ සිටියි. පළමු එකඟ නො වූ ද සිත වනපෙත් ඇසුරු කළ ද එකඟ නො වෙයි. අපරික්ෂීණ වූ ද ආස්‍රවයෝ පරික්ෂයට නො යෙත්. නො පැමිණියා වූ ද අනුත්තර අර්හත්ත්වයට නො පැමිණෙයි. පැවිද්දහු විසින් දිවිවටනට තිසි යම් මේ සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙසත් පිරිකරහු එළවා ගතයුතු වෙත් නම් ඔහු දුකින් උපදිත්. මහණෙනි, ඒ මහණහු විසින් මෙසේ නුවණින් සැලකිය යුතු යි: "මම වනාහි මේ වනපත ඇසිරි කොට වෙසෙමි. මේ වනපත ඇසිරි කොට වසන මාහට පළමු නො එළඹ සිටියා වූ ම සිහිය නො එළඹ සිටියි. එකඟ නො වූ ද සිත එකඟ නො වෙයි. අපරික්ෂීණ වූ ද ආස්‍රවයෝ පරීක්ෂයට නො යෙත්. නො පැමිණියා වූ ද අනුත්තර අර්හත්ත්වයට නො පැමිණෙමි. පැවිද්දහු විසින් දිවිවටනට තිසි යම් මේ සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරහු එළවා ගතයුතු වෙත් නම් ඔහු දුකින් උපදිත්" යැ යි. මහණෙනි, ඒ මහණහු විසින් රාත්‍රිභාගයෙහි හෝ දිවාභාගයෙහි හෝ ඒ වනපතින් බැහැර යා යුතු යි. නො විසිය යුතු යි.

4. මහණෙනි, මේ ශාසනයෙහි මහණෙක් එක්තරා වනපතක් ඇසිරි කොට වෙසෙයි. ඒ වනපත ඇසිරි කොට වසන ඒ මහණහට නො ද එළඹ සිටියා වූ ම සිහිය නො එළඹ සිටියි. එකඟ නො වූ ද සිත එකඟ නො වෙයි. අපරික්ෂීණ වූ ද ආස්‍රවයෝ පරික්ෂයට නො යෙත්. නො පැමිණියා වූ ද අනුත්තර අර්හත්ත්වයට නො පැමිණෙයි. පැවිද්දහු විසින් දිවිවටනට තිසි යම් මේ සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරහු එළවා ගත යුතු වෙත් නම් ඔහු නිදුකින් උපදිත්. මහණෙනි, ඒ මහණහු විසින් මෙසේ නුවණින් සැලකිය යුතු යි. "මම වනාහි මේ වනපත් ඇසිරි කොට වෙසෙමි. මේ වනපත ඇසිරි කොට වසන මාහට පළමු නො එළඹ සිටියා වූ සිහිය නො එළඹ සිටියි. එකඟ නො වූ සිත ද එකඟ නො වෙයි. අපරික්ෂීණ වූ ද ආස්‍රවයෝ පරික්ෂයට නො යෙත්. නො පැමිණියා වූ ද අනුත්තර අර්හත්ත්වයට නො පැමිණෙමි.-

යෙ ච ඛො ඉමෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තෙ අප්පකසිරෙන සමුදාගච්ඡන්ති. න ඛො පනාහං චීවරහෙතු අගාරස්මා අනගාරියං පබ්බජිතො. න පිණ්ඩපාතහෙතු -පෙ- න සෙනාසනහෙතු -පෙ- න ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරහෙතු අගාරස්මා අනගාරියං පබ්බජිතො. අථ ච පන මෙ ඉමං වනපත්ථං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති න උපට්ඨාති. අසමාහිතඤ්ච චිත්තං න සමාධියති. අපරික්ඛීණා ච ආසවා න පරික්ඛයං ගච්ඡන්ති. නානුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං නානුපාපුණාමී"ති. තෙන භික්ඛවෙ භික්ඛුනා සඞ්ඛාපි තම්හා වනපත්ථා පක්කමිතබ්බං, න වත්ථබ්බං.

5. ඉධ පන භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං වනපත්ථං උපනිස්සාය විහරති. තස්ස තං වනපත්ථං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති උපට්ඨාති. අසමාහිතඤ්ච චිත්තං සමාධියති. අපරික්ඛීණා ච ආසවා පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති යෙ ච ඛො ඉමෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තෙ කසිරෙන සමුදාගච්ඡන්ති. තෙන භික්ඛවෙ භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං: "අහං ඛො ඉමං වනපත්ථං උපනිස්සාය විහරාමි. තස්ස මෙ ඉමං වනපත්ථං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති උපට්ඨාති. අසමාහිතඤ්ච චිත්තං සමාධියති. අපරික්ඛීණා ච ආසවා පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාමි. යෙ ච ඛො ඉමෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තෙ කසිරෙන සමුදාගච්ඡන්ති. න ඛො පනාහං චීවරහෙතු අගාරස්මා අනගාරියං පබ්බජිතො. න පිණ්ඩපාතහෙතු -පෙ- න සෙනාසනහෙතු -පෙ- න ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරහෙතු අගාරස්මා අනගාරියං පබ්බජිතො. අථ ච පන මෙ ඉමං වනපත්ථං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති උපට්ඨාති. අසමාහිතඤ්ච චිත්තං සමාධියති. අපරික්ඛීණා ච ආසවා පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාමී"ති. තෙන භික්ඛවෙ භික්ඛුනා සඞ්ඛාපි තස්මිං වනපත්ථෙ වත්ථබ්බං, න පක්කමිතබ්බං.

6. ඉධ පන භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං වනපත්ථං උපනිස්සාය විහරති. තස්ස තං වනපත්ථං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති උපට්ඨාති. අසමාහිතඤ්ච චිත්තං සමාධියති. අපරික්ඛීණා ච ආසවා පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති. යෙ ච ඛො ඉමෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තෙ අප්පකසිරෙන සමුදාගච්ඡන්ති. තෙන භික්ඛවෙ භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං:

Free Distribution www.aathaapi.org

පැවිද්දහු විසින් දිවිවටනට තිසි යම් මේ සිවුරු, පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරහු එලවා ගතයුතු වෙත් නම්, ඔහු නිදුකින් උපදිත්. මම වනාහි සිවුරු හෙතු කොට ගෙන ගිහිගෙයින් නික්ම පැවිද්දට නො පැමිණියෙම් ම ය. පිඬුවා හෙතුකොට ගෙන... සෙනසුන් හෙතු කොට ගෙන ... ගිලන්පස බෙහෙත් පිරිකර හෙතු කොට ගෙන ගිහිගෙයින් නික්ම පැවිද්දට නො පැමිණියෙම් ම ය. එතෙකුදු වුවත් මේ වනපත ඇසිරි කොට වසන මාහට නො එලඹ සිටියා වූ සිහිය නො එලඹ සිටියි. එකඟ නො වූ ද සිත එකඟ නො වෙයි. අපරික්ෂීණ වූ ද ආශ්‍රවයෝ පරික්ෂයට නො යෙත්. නො පැමිණියා වූ ද අනුත්තර අර්හත්ත්වයට නො පැමිණෙමි'' යි. මහණෙනි, ඒ මහණහු විසින් (මහණුවම් නො නිපැදෙනබව නුවණින්) දැන ඒ වනපතින් බැහැර යා යුතු යි. නො විසිය යුතු යි.

5. මහණෙනි, මේ ශාසනයෙහි මහණෙක් එක්තරා වනපතක් ඇසිරි කොට වෙසෙයි. ඒ වනපත ඇසිරි කොට වසන ඒ මහණහට නො එලඹ සිටියා වූ ම සිහිය එලඹ සිටියි. එකඟ නො වූ ද සිත එකඟ වෙයි. අපරික්ෂීණ වූ ද ආශ්‍රවයෝ පරික්ෂයට යෙත්. නො පැමිණියා වූ ද අනුත්තර අර්හත්ත්වයට පැමිණෙයි. පැවිද්දහු විසින් දිවිවටනට තිසි යම් මේ සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරහු එලවා ගතයුතු වෙත් නම් ඔහු දුකින් උපදිත්. මහණෙනි, ඒ මහණහු විසින් මෙසේ නුවණින් සැලකිය යුතු යි. "මම වනාහි මේ වනපත ඇසිරි කොට වෙසෙමි. මේ වනපත ඇසිරි කොට වසන ඒ මාහට නො එලඹ සිටියා වූ ම සිහිය එලඹ සිටියි. එකඟ නො වූ ද සිත එකඟ වෙයි. අපරික්ෂීණ වූ ද ආශ්‍රවයෝ පරික්ෂයට යෙත්. නො පැමිණියා වූ ද අනුත්තර අර්හත්ත්වයට පැමිණෙමි. පැවිද්දහු විසින් දිවිවටනට තිසි යම් මේ සිවුරු, පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරහු එලවා ගතයුතු වෙත් නම් ඔහු දුකින් උපදිත්. මම වනාහි සිවුරු හෙතු කොට ගෙන ගිහිගෙයින් නික්ම පැවිද්දට නො පැමිණියෙම් ම ය. පිඬුවා හෙතු කොට ගෙන... සෙනසුන් හෙතු කොට ගෙන... ගිලන්පස බෙහෙත් පිරිකර හෙතු කොට ගෙන ගිහිගෙයින් නික්ම පැවිද්දට නො පැමිණියෙම් ම ය. එතෙකුදු-වුවත්, මේ වනපත ඇසිරි කොට වසන්නා වූ මාහට නො එලඹ සිටියා වූ ම සිහිය එලඹ සිටියි. එකඟ නො වූ ද සිත එකඟ වෙයි. අපරික්ෂීණ වූ ද ආශ්‍රවයෝ පරික්ෂයට යෙත්. නො පැමිණියා වූ ද, අනුත්තර අර්හත්ත්වයට පැමිණෙමි.'' මහණෙනි, ඒ මහණහු විසින් (මහණුවම් නිපැදෙනසෙ නුවණින්) දැන ඒ වනපත්හි විසිය යුතු යි. බැහැර නො යායුතු යි.

6. මහණෙනි, මේ ශාසනයෙහි මහණෙක් එක්තරා වනපතක් ඇසිරි කොට වෙසෙයි. ඒ වනපත ඇසිරි කොට වසන ඒ මහණහට නො එලඹ සිටියා වූ ම සිහිය එලඹ සිටියි. එකඟ නො වූ සිත එකඟ වෙයි. අපරික්ෂීණ වූ ද ආශ්‍රවයෝ පරික්ෂයට යෙත්. නො පැමිණියා වූ ද අනුත්තර අර්හත්ත්වයට පැමිණෙයි. පැවිද්දහු විසින් දිවිවටනට තිසි යම් මේ සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරහු එලවා ගත යුතු වෙත් නම් ඔහු නිදුකින් උපදිත්. මහණෙනි ඒ, මහණහු විසින් මෙසේ නුවණින් සැලකිය යුතු යි:

“අහං ඛො ඉමං වනපත්ථං උපනිස්සාය විහරාමි. තස්ස මෙ ඉමං වනපත්ථං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති උපට්ඨාති. අසමාහිතඤ්ච චිත්තං සමාධියති. අපරික්ඛීණා ච ආසවා පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාමි. යෙ ච ඛො ඉමෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා තෙ අප්පකසිරෙන සමුදාගච්ඡන්තී”ති. තෙන භික්ඛවෙ භික්ඛුනා යාවජීවම්පි තස්මිං වනපත්ථෙ වත්ථබ්බං, න පක්කමිතබ්බං.

7. ඉධ පන භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං ගාමං උපනිස්සාය විහරති -පෙ- අඤ්ඤතරං නිගමං උපනිස්සාය විහරති -පෙ- අඤ්ඤතරං නගරං උපනිස්සාය විහරති -පෙ- අඤ්ඤතරං ජනපදං උපනිස්සාය විහරති -පෙ-*

8. [ඉධ පන භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං පුග්ගලං උපනිස්සාය විහරති. තස්ස තං පුග්ගලං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති න උපට්ඨාති. අසමාහිතඤ්ච චිත්තං න සමාධියති. අපරික්ඛීණා ච ආසවා න පරික්ඛයං ගච්ඡන්ති, අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං නානුපාපුණාති. යෙ ච ඛො ඉමෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තෙ කසිරෙන සමුදාගච්ඡන්ති. තෙන භික්ඛවෙ භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං: “අහං ඛො ඉමං පුග්ගලං උපනිස්සාය විහරාමි. තස්ස මෙ ඉමං පුග්ගලං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති න උපට්ඨාති. අසමාහිතඤ්ච චිත්තං න සමාධියති. අපරික්ඛීණා ච ආසවා න පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං නානුපාපුණාමි. යෙ ච ඛො ඉමෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තෙ කසිරෙන සමුදාගච්ඡන්තී”ති. තෙන භික්ඛවෙ භික්ඛුනා රත්තිභාගං වා දිවසභාගං වා පුග්ගලො අනාපුච්ඡා පක්කමිතබ්බං[1] නානුබන්ධිතබ්බො.

9. ඉධ පන භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං පුග්ගලං උපනිස්සාය විහරති. තස්ස තං පුග්ගලං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති න උපට්ඨාති. අසමාහිතඤ්ච චිත්තං න සමාධියති.

අපරික්ඛීණා ච ආසවා න පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං නානුපාපුණාති. යෙ ච ඛො ඉමෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තෙ අප්පකසිරෙන සමුදාගච්ඡන්ති. තෙන භික්ඛවෙ භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං:

---

1 පක්කමිතබ්බො, ස්‍යා පු වි

* ‘අඤ්ඤතරං ගාමං උපනිස්සාය විහරති’ ආදිසු පෙය්‍යාලමුඛෙන සඞ්ඛිත්තා වාරා චතූසු වනපත්ථවාරෙසු ආගතනයෙන වෙදිතබ්බා.

"මම වනාහි මේ වනපත ඇසිරි කොට වෙසෙමි. මේ වනපත ඇසිරි කොට වසන මාහට නො එළඹ සිටියා වූ ම සිහිය එළඹ සිටියි. එකඟ නො වූ සිත එකඟ වෙයි. අපරික්ෂීණ වූ ද ආස්‍රවයෝ පරික්ෂයට යෙත්. නො පැමිණියා වූ ද ඉතා උතුම් අර්හත්ත්වයට පැමිණෙමි. පැවිද්දහු විසින් දිවිවටනට තිසි යම් මෙ සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරහු එළවා ගතයුතු වෙත් නම් ඔහු තිදුකින් උපදිත්" යැයි. මහණෙනි, ඒ මහණහු විසින් දිවිහිමියෙනුදු ඒ වනපත්හි විසිය යුතු යි. බැහැර නො යායුතු යි.

7. මහණෙනි, මෙ ශාසනයෙහි මහණෙක් එක්තරා ගමක් ඇසිරි කොට වෙසෙයි…එක්තරා නියම්ගමක් ඇසිරි කොට වෙසෙයි…එක්තරා නුවරක් ඇසිරි කොට වෙසෙයි…එක්තරා ජනවියක් ඇසිරි කොට වෙසෙයි…*

8. මහණෙනි, මේ ශාසනයෙහි මහණෙක් එක්තරා පුහුලකු ඇසිරි කොට වෙසෙයි. එක්තරා පුහුලකු ඇසිරි කොට වසන ඒ මහණහට නො එළඹ සිටියා වූ ම සිහිය නො එළඹ සිටියි. එකඟ නො වූ සිත එකඟ නො වෙයි අපරික්ෂීණ වූ ද ආස්‍රවයෝ පරික්ෂයට නො යෙත්. නො පැමිණියා වූ ද අනුත්තර අර්හත්ත්වයට නො පැමිණෙයි. පැවිද්දහු විසින් දිවිවටනට තිසි යම් මෙ සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරහු එළවා ගතයුතු වෙත් ද, ඔහු දුකින් උපදිත්. මහණෙනි, ඒ මහණහු විසින් මෙසේ නුවණින් සැලකිය යුතු යි. "මම වනාහි මේ පුහුල්හු ඇසිරි කොට වෙසෙමි. මේ පුහුල්හු ඇසිරි කොට වසන මා හට නො එළඹ සිටියා වූ ම සිහිය නො එළඹ සිටියි. එකඟ නො වූ සිත එකඟ නො වෙයි. අපරික්ෂීණ වූ ද ආස්‍රවයෝ පරික්ෂයට නො යෙත්. නො පැමිණියා වූ ද අනුත්තර අර්හත්ත්වයට නො පැමිණෙමි පැවිද්දහු විසින් දිවිවටනට තිසි යම් මේ සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරහු එළවා ගතයුතු වෙත් නම්, ඔහු දුකින් උපදිත්" යැයි. මහණෙනි, ඒ මහණහු විසින් රාත්‍රිභාගයෙහි හෝ දිවාභාගයෙහි හෝ නො පිළිවිස බැහැර යා යුතු යි. ඒ පුද්ගල නො ලුහුබැඳිය යුත්තේ ය.

9. මහණෙනි, මේ ශාසනයෙහි මහණෙක් එක්තරා පුහුලක්හු ඇසිරි කොට වෙසෙයි. ඒ පුහුල්හු ඇසිරි කොට වසන මහණහට නො එළඹ සිටියා වූ ම සිහිය නො එළඹ සිටියි. එකඟ නො වූ සිත එකඟ නො වෙයි. අපරික්ෂීණ වූ ද ආස්‍රවයෝ පරික්ෂයට නො යෙත්. නො පැමිණියා වූ ද අනුත්තර අර්හත්ත්වයට නො පැමිණෙයි. පැවිද්දහු විසින් දිවිවටනට තිසි යම් මේ සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරහු එළවා ගත යුතු වෙත් නම්, ඔහු තිදුකින් උපදිත්. මහණෙනි, ඒ මහණහු විසින් මෙසේ නුවණින් සැලකිය යුතු යි:

* "එක්තරා ගමක් ඇසිරි කොට වෙසෙයි" ආදියෙහි පෙය්‍යාලයෙන් සංක්ෂිප්ත වූ වාරයෝ වනපත්ථ වාර සතරෙහි ආ නියායෙන් දතයුත්තාහ.

"අහං ඛො ඉමං පුග්ගලං උපනිස්සාය විහරාමි තස්ස මෙ ඉමං පුග්ගලං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති න උපට්ඨාති. අසමාහිතඤ්ච චිත්තං න සමාධියති. අපරික්ඛීණා ච ආසවා න පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං නානුපාපුණාමි. යෙ ච ඛො ඉමෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තෙ අප්පකසිරෙන සමුදාගච්ඡන්ති. න ඛො පනාහං චීවරහෙතු අගාරස්මා අනගාරියං පබ්බජිතො. න පිණ්ඩපාතහෙතු-පෙ- න සෙනාසනහෙතු-පෙ- න ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරහෙතු අගාරස්මා අනගාරියං පබ්බජිතො. අථ ච පන මෙ ඉමං පුග්ගලං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති න උපට්ඨාති. අසමාහිතඤ්ච චිත්තං න සමාධියති. අපරික්ඛීණා ච ආසවා න පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං නානුපාපුණාමී"ති. තෙන භික්ඛවෙ භික්ඛුනා සඞ්ඛාපි සො පුග්ගලො ආපුච්ඡා පක්කමිතබ්බං[1] නානුබන්ධිතබ්බො.

10. ඉධ පන භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං පුග්ගලං උපනිස්සාය විහරති. තස්ස තං පුග්ගලං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති උපට්ඨාති, අසමාහිතඤ්ච චිත්තං සමාධියති. අපරික්ඛීණා ච ආසවා පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති. යෙ ච ඛො ඉමෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තෙ කසිරෙන සමුදාගච්ඡන්ති. තෙන භික්ඛවෙ භික්ඛුනා ඉති පටිසඞ්ඛිකඛිතබ්බං "අහං ඛො ඉමං පුග්ගලං උපනිස්සාය විහරාමි. තස්ස මෙ ඉමං පුග්ගලං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති උපට්ඨාති. අසමාහිතඤ්ච චිත්තං සමාධියති. අපරික්ඛීණා ච ආසවා පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාමි. යෙ ච ඛො ඉමෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තෙ කසිරෙන සමුදාගච්ඡන්ති. න ඛො පනාහං චීවරහෙතු අගාරස්මා අනගාරියං පබ්බජිතො, න පිණ්ඩපාතහෙතු -පෙ- න සෙනාසනහෙතු -පෙ න ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරහෙතු අගාරස්මා අනගාරියං පබ්බජිතො. අථ ච පන මෙ ඉමං පුග්ගලං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති උපට්ඨාති. අසමාහිතඤ්ච චිත්තං සමාධියති. අපරික්ඛීණා ච ආසවා පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාමී"ති. තෙන භික්ඛවෙ භික්ඛුනා සඞ්ඛාපි සො පුග්ගලො අනුබන්ධිතබ්බො, න පක්කමිතබ්බං.

1 අනාපුච්ඡා පක්කමිතබ්බො, ස්‍යා ;

"මම වනායි මේ පුහුල්හු ඇසිරි කොට වෙසෙමි. මේ පුහුල්හු ඇසිරි කොට වසන මාහට නො එළඹ සිටියා වූ ම සිහිය නො එළඹ සිටියි. එකඟ නො වූ සිත එකඟ නො වෙයි. අපරික්ෂීණ වූ ද ආස්‍රවයෝ පරික්ෂයට නො යෙත්. නො පැමිණියා වූ ද අනුත්තර අර්හත්ත්වයට නො පැමිණෙමි. පැවිද්දහු විසින් දිවිවටනට නිසි යම් මේ සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරහු එළවා ගතයුතු වෙත් නම් ඔහු නිදුකින් සැපයෙත්. මම වනාහි සිවුරු හෙතු කොට ගෙන ගිහිගෙන් නික්ම පැවිද්දට නො පැමිණියෙමි ම ය. පිඬුවා හෙතු කොට ගෙන... සෙනසුන් හෙතු කොට ගෙන... ගිලන්පස බෙහෙත් පිරිකර හෙතු කොට ගෙන ගිහිගෙයින් නික්ම පැවිද්දට නො පැමිණියෙමි ම ය. එතෙකුදු වුවත් මේ පුහුල්හු ඇසිරි කොට වසන මාහට නො එළඹ සිටියා වූ ම සිහිය නො එළඹ සිටියි එකඟ නො වූ සිත එකඟ නො වෙයි. අපරික්ෂීණ වූ ද ආස්‍රවයෝ පරික්ෂයට නො යෙත්. නො පැමිණියා වූ ද ඉතා උතුම් අර්හත්ත්වයට නො පැමිණෙමි" යි මහණෙනි, ඒ මහණහු විසින් (මහණුවම් නො නිපැදෙන බව නුවණින්) දැන පිළිවිස බැහැර යා යුතු යි. ඒ පුද්ගල තෙමේ නො නුහුබැඳිය යුත්තේ ය.

9. මහණෙනි, මේ ශාසනයෙහි මහණෙක් එක්තරා පුහුලකු ඇසිරි කොට වෙසෙයි. ඒ පුහුල්හු ඇසිරි කොට වසන මහණහට නො එළඹ සිටියා වූ ම සිහිය එළඹ සිටියි එකඟ නො වූ සිත එකඟ වෙයි. අපරික්ෂීණ වූ ද ආස්‍රවයෝ පරික්ෂයට යෙත්. නො පැමිණියා වූ ද අනුත්තර අර්හත්ත්වයට පැමිණේ. පැවිද්දහු විසින් දිවිවටනට නිසි යම් මේ සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරහු එළවා ගතයුතු වෙත් නම් ඔහු දුකින් උපදිත්. මහණෙනි, ඒ මහණහු විසින් මෙසේ නුවණින් සැලකිය යුතු යි: "මම වනාහි මේ පුහුල්හු ඇසිරි කොට වෙසෙමි. මේ පුහුල්හු ඇසිරි කොට වසන ඒ මාහට නො එළඹ සිටියා වූ ම සිහිය එළඹ සිටියි. එකඟ නො වූ සිත එකඟ වෙයි. අපරික්ෂීණ වූ ද ආස්‍රවයෝ පරික්ෂයට යෙත්. නො පැමිණියා වූ ද අනුත්තර අර්හත්ත්වයට පැමිණෙමි. පැවිද්දහු විසින් දිවිවටනට නිසි යම් මේ සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරහු එළවා ගතයුතු වෙත් නම් ඔහු දුකින් උපදිත්. මම වනාහි සිවුරු හෙතු කොට ගෙන ගිහිගෙයින් නික්ම පැවිද්දට නො පැමිණියෙමි ම ය පිඬුවා හෙතු කොට ගෙන පැවිද්දට නො පැමිණියෙම ම ය...සෙනසුන් හෙතු කොට ගෙන පැවිද්දට නො පැමිණියෙමි ම ය...ගිලන්පස බෙහෙත් පිරිකර හෙතු කොට ගෙන ගිහිගෙයින් නික්ම පැවිද්දට නො පැමිණියෙමි ම ය. එතෙකුදු වුවත් මේ පුහුල්හු ඇසිරි කොට වසන මාහට නො එළඹ සිටියා වූ ම සිහිය එළඹ සිටියි. එකඟ නො වූ සිත එකඟ වෙයි. අපරික්ෂීණ වූ ද ආස්‍රවයෝ පරික්ෂයට යෙත්. නො පැමිණියා වූ ද ඉතා උතුම් අර්හත්ත්වයට පැමිණෙමි" යි මහණෙනි, ඒ මහණහු විසින් මහණුවම් නිපැදෙන බව (නුවණින් දැන) ඒ පුද්ගල තෙමේ නුහුබැඳිය යුත්තේ යි. බැහැර නොයා යුතු යි.

10. ඉධ පන භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං පුග්ගලං උපනිස්සාය විහරති. තස්ස තං පුග්ගලං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති උපට්ඨාති. අසමාහිතඤ්ච චිත්තං සමාධියති. අපරික්ඛීණා ච ආසවා පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති. යෙ ච ඛො ඉමෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තෙ අප්පකසිරෙන සමුදාගච්ඡන්ති. තෙන භික්ඛවෙ භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං: "අහං ඛො ඉමං පුග්ගලං උපනිස්සාය විහරාමි. තස්ස මෙ ඉමං පුග්ගලං උපනිස්සාය විහරතො අනුපට්ඨිතා චෙව සති උපට්ඨාති, අසමාහිතඤ්ච චිත්තං සමාධියති. අපරික්ඛීණා ච ආසවා පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාමි යෙ ච ඛො ඉමෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තෙ අප්පකසිරෙන සමුදාගච්ඡන්ති"ති. තෙන භික්ඛවෙ භික්ඛුනා යාවජීවම්පි සො පුග්ගලො අනුබන්ධිතබ්බො, න පක්කමිතබ්බං අපි පනුජ්ජමානෙනපීති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

වනපත්ථසුත්තං සත්තමං.

1. 2. 8.

මධුපිණ්ඩිකසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සක්කෙසු** විහරති **කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ.** අථ ඛො භගවා පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය කපිලවත්ථුං පිණ්ඩාය පාවිසි, කපිලවත්ථුස්මිං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන මහාවනං තෙනුපසඞ්කමි දිවාවිහාරාය. මහාවනං අජ්ඣොගාහෙත්වා[1] බෙලුවලට්ඨිකාය[2] මූලෙ දිවාවිහාරං නිසීදි. **දණ්ඩපාණිපි** ඛො සක්කො ජඞ්ඝාවිහාරං අනුචඞ්කමමානො අනුවිචරමානො යෙන මහාවනං තෙනුපසඞ්කමි. මහාවනං අජ්ඣොගාහෙත්වා යෙන බෙලුවලට්ඨිකා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා දණ්ඩමොලුබ්භ එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො දණ්ඩපාණි සක්කො භගවන්තං එතදවොච:

1. අජ්ඣොගාහෙත්වා, මජසං. 2. වෙළුවලට්ඨිකාය, සයා.

10. මහණෙනි, මේ ශාසනයෙහි මහණෙක් එක්තරා පුඟුලකු ඇසිරි කොට වෙසෙයි. ඒ පුඟුල්හු ඇසිරි කොට වසන ඒ මහණහට නො එළඹ සිටියා වූ ම සිහිය එළඹ සිටියි. එකඟ නො වූ සිත එකඟ වෙයි. අපරික්ෂීණ වූ ද ආස්‍රවයෝ පරික්ෂයට යෙත්. නො පැමිණියා වූ ද අනුත්තර අර්හත්ත්වයට පැමිණෙයි. පැවිද්දහු විසින් දිවිවටතට නිසි සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරහු එළවා ගතයුතු වෙත් නම්, ඔහු නිදුකින් උපදිත්. මහණෙනි, ඒ මහණහු විසින් මෙසේ නුවණින් සැලකිය යුතු ය. “මම වනාහි මේ පුඟුල්හු ඇසිරි කොට වෙසෙමි. මේ පුඟුල්හු ඇසිරි කොට වසන්නා වූ මාහට නො එළඹ සිටියා වූ ම සිහිය එළඹ සිටියි. එකඟ නො වූ සිත එකඟ වෙයි. අපරික්ෂීණ වූ ද ආස්‍රවයෝ පරික්ෂයට යෙත්. නො පැමිණියා වූ ද අනුත්තර අර්හත්ත්වයට පැමිණෙමි. පැවිද්දහු විසින් යම් මේ සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරහු එළවා ගතයුතු වෙත් නම්, ඔහු නිදුකින් උපදිත්” යැ යි. මහණෙනි, ඒ මහණහු විසින් දිවිහිමි කොට ඒ පුඟුල නුහුබැඳිය යුත්තේ යි. බැහැර කරනු ලබන්නහු විසිනුදු නො යායුතු යි.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළ සේක. සතුටු වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව මැනැවැ යි සතුටින් පිළිගත්හ.

වනපත්‍ථ සූත්‍රය සත්වැනි යි.

1. 2. 8.

මධුපිණ්ඩික සූත්‍රය

1. **මා** විසින් මෙසේ අසන ලදි: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහි **කිඹුල්වත්** නුවර න්‍යග්‍රොධාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි සරහා හැඳ පාසිවුරු ගෙන කිඹුල්වතට පිඬු පිණිස වැඩ වදාළ සේක. කිඹුල්වතෙහි පිඬු පිණිස හැසිර පස්බත පිණ්ඩපාතයෙන් වැළැකුණු සේක් දිවා විහරණය පිණිස **මහාවනයට** එළඹි සේක. මහාවනයට වැද ගෙන තරුණ බෙලිගසක් මුල දිවාවිහරණ කොට වැඩහුන් සේක. **දණ්ඩපාණී** සැහැරජරද ජඞ්ඝාවිහරණය පිණිස (කෙණ්ඩා විඩා දුරු කරණු පිණිස) ඔබමොබ සක්මන් කරන්නේ ඔබමොබ හැසිරෙන්නේ, මහාවනයට එළඹියේ ය. මහාවනයට වැද තරුණ බෙලිගස මුල (වැඩහුන්) භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වී. තුස්නට නිසි සිහි කරණට නිසි කථා කොට නිමවා දඬිහිස එල්බ ගෙන එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි දණ්ඩපාණී ශාක්‍ය භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය:

“කිංවාදී සමණො, කිමක්ඛායී”ති?

“යථාවාදී ඛො ආවුසො සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය න කෙනචි ලොකෙ විග්ගය්හ තිට්ඨති, යථා ච පන කාමෙහි විසංයුත්තං විහරන්තං තං බ්‍රාහ්මණං අකථංකථිං ඡින්නකුක්කුච්චං භවාභවෙ වීතතණ්හං සඤ්ඤා නානුසෙන්ති. එවංවාදී ඛො අහං ආවුසො එවමක්ඛායී”ති. එවං වුත්තෙ දණ්ඩපාණි සක්කො සීසං ඔකම්පෙත්වා ජිව්හං නිල්ලාළෙත්වා[1] තිවිසාඛං නලාටිකං නලාටෙ වුට්ඨාපෙත්වා දණ්ඩමොලුබ්භ පක්කාමි.

2. අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන නිග්‍රොධාරාමො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: ඉධාහං භික්ඛවෙ පුබ්බන්හ-සමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය කපිලවත්ථුං පිණ්ඩාය පාවිසිං. කපිලවත්ථුස්මිං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන මහාවනං තෙනුපසඞ්කමිං දිවාවිහාරාය. මහාවනං අජ්ඣොගාහෙත්වා බෙලුවලට්ඨිකාය මූලෙ දිවාවිහාරං නිසීදිං. දණ්ඩපාණිපි ඛො භික්ඛවෙ සක්කො ජඞ්ඝාවිහාරං අනුචඞ්කමමානො අනුවිචරමානො යෙන මහාවනං තෙනුපසඞ්කමි. මහාවනං අජ්ඣොගාහෙත්වා යෙන බෙලුවලට්ඨිකා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මම සද්ධිං[2] සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා දණ්ඩමොලුබ්භ එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො භික්ඛවෙ දණ්ඩපාණි සක්කො මං එතදවොච: “කිං වාදී සමණො, කිමක්ඛායී”ති?

3. එවං වුත්තෙ අහං භික්ඛවෙ දණ්ඩපාණිං සක්කං එතදවොචං: “යථාවාදී ඛො ආවුසො සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය න කෙනචි ලොකෙ විග්ගය්හ තිට්ඨති, යථා ච පන කාමෙහි විසංයුත්තං විහරන්තං තං බ්‍රාහ්මණං අකථංකථිං ඡින්නකුක්කුච්චං භවාභවෙ වීතතණ්හං සඤ්ඤා නානුසෙන්ති, එවංවාදී ඛො අහං ආවුසො එවමක්ඛායී”ති. එවං වුත්තෙ භික්ඛවෙ දණ්ඩපාණි සක්කො සීසං ඔකම්පෙත්වා ජිව්හං නිල්ලාළෙත්වා තිවිසාඛං නලාටිකං නලාටෙ වුට්ඨාපෙත්වා දණ්ඩමොලුබ්භ පක්කාමීති.

4. එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: “කිංවාදී පන භන්තෙ භගවා සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණ-බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය න කෙනචි ලොකෙ විග්ගය්හ තිට්ඨති? කථඤ්ච පන භන්තෙ භගවන්තං කාමෙහි විසංයුත්තං විහරන්තං තං බ්‍රාහ්මණං අකථංකථිං ඡින්නකුක්කුච්චං භවාභවෙ වීතතණ්හං සඤ්ඤා නානුසෙන්තී”ති?

1. නිල්ලාලෙත්වා, මජසං.
2. මයා සද්ධිං, මජසං.

Free Distribution www.aathaapi.org

"ශ්‍රමණ තෙමේ කිබඳු දිට්ඨි ඇත්තේ ද, කුමක් ප්‍රකාශ කරන්නේ දැ?" යි.

"ඇවැත්නි, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි, මහණබමුණන් සහිත නරදෙව් මිනිසුන් සහිත ප්‍රජාවෙහි යම් බඳු දෘෂ්ටි ඇත්තෙක් ලෝකයෙහි කිසිවකු හා ත් විවාද කොට නො සිටී ද, යම් කරුණකින් කාමයෙන් විසංයුක්ත කොට විහරණ කරණ විචිකිච්ඡා රහිත සුන් කුකුස් ඇති, කුදු මහත් භවයෙහි පහ වූ තෘෂ්ණා ඇති, ඒ ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණයා වෙත සංඥාවෝ (කෙලශයෝ) ලැග නො හොවිත් ද, ඇවැත්නි, මම එබඳු වාද ඇත්තෙක්මි. එසේ ප්‍රකාශ කරන්නෙක්මි" යි වදාල සේක මෙසේ වදාල කල්හි දණ්ඩපාණි ශාක්‍ය හිස සලා දිව නෙරා නලලවා (වෙන් ව පෙණෙන සේ) රැළි තුනක් ඇති නලල් රැළියක් නලලත නංවාගෙන දඬිය හයාගෙන බැස ගියේ ය.

2 එක්බිති, භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි පිළිසලණින් නැගී සිටි සේක් න්‍යග්‍රොධාරාමයට වැඩි සේක. වැඩ පනවන ලද අස්නෙහි වැඩහුන් සේක වැඩ හිඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, මම පෙරවරුයෙහි සරහා හැඳ පාසිවුරු ගෙන කිඹුල්වතට පිඩු පිණිස පිවිසියෙමි. කිඹුල්වත්හි පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළැක්කෙම් දිවාවිහරණ පිණිස මහාවනයට එළඹියෙමි. මහාවනයට වැද තරුණ බෙලිගසක් මුල දිවාවිහරණයෙන් හුන්නෙමි. මහණෙනි, දණ්ඩපාණි ශාක්‍යරජ ද ජඞ්ඝාවිහරණය පිණිස ඔබමොබ සක්මන් කරන්නේ, ඔබමොබ හැසිරෙන්නේ, මහාවනයට එළඹියේ ය. මහාවනයට වැද තරුණ බෙලිගස මුල (හුන්) මා වෙත එළඹියේ ය. එළඹ මා සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා සෝලු දණ්ඩ එල්බ එකත්පසෙක සිටියේ ය. මහණෙනි, එකත්පසෙක සිටි දණ්ඩපාණි ශාක්‍ය මට තෙල සැළ කෙළේ ය: "ශ්‍රමණ තෙමේ කෙබඳු දෘෂ්ටි ඇත්තෙක් ද, කුමක් ප්‍රකාශ කරන්නේ දැ?" යි.

3. මහණෙනි, මෙසේ කී කල්හි දණ්ඩපාණි ශාක්‍යයාට මම තෙල කීමි: "ඇවැත්නි, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි, මහණ බමුණන් සහිත නරදෙව් මිනිසුන් සහිත ප්‍රජාවෙහි යම්බඳු වාද ඇත්තෙක් ලෝකයෙහි කිසිවකුත් හා විවාද කොට නො සිටී ද, යම් කරුණෙකින් කාමයෙන් වෙන් ව වසන්නා වූ විචිකිච්ඡා රහිත වූ සිඳලූ කුකුස් ඇත්තා වූ කුදු මහත් භවයෙහි පහ වූ තෘෂ්ණා ඇති ඒ බමුණා වෙත කෙලශයෝ ලැග නො හොවිත් ද, ඇවැත, මම එවැනි වාද ඇත්තෙක්මි. එසේ ප්‍රකාශ කරන්නෙක්මි" යි. මහණෙනි, මෙසේ කී කල්හි දණ්ඩපාණි ශාක්‍ය හිස සලා දිව නෙරා නලලවා රැළි තුනක් ඇති නලල්රැල්ල නලලෙහි නංවා සෝලු දණ්ඩ සනාගෙන (නල්ලුයෙන් හයා ගෙන) නික්ම ගියේ ය.

4. මෙසේ වදාල කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය: "වහන්ස, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි, මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාවෙහි භාග්‍යවතුන් වහන්සේ කෙබඳු වාද ඇතිසේක්, ලෝකයෙහි කිසිවකුත් හා විරුද්ධවාද නො කොට සිටින සේක් ද, වහන්ස, කෙසේ නම් කාමයෙන් වෙන් ව වාසය කරන විචිකිච්ඡා නැත්තා වූ සිඳලූ කුකුස් ඇති කුදු මහත් භවයෙහි පහ වූ තෘෂ්ණා ඇති බැහැර කල පව් ඇති ඒ භාග්‍යවතුන් වහන්සේ වෙත කෙලශයෝ ලැග නො හොවිත් දැ?" යි.

5. යතොනිදානං භික්ඛු පුරිසා පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති, එත්ථ චෙ නත්ථි අභිනන්දිතබ්බං අභිවදිතබ්බං අජ්ඣොසෙතබ්බං,[1] එසෙවන්තො රාගානුසයානං. එසෙවන්තො පටිඝානුසයානං. එසෙවන්තො දිට්ඨානුසයානං. එසෙවන්තො විචිකිච්ඡානුසයානං. එසෙවන්තො මානානුසයානං. එසෙවන්තො භවරාගානුසයානං. එසෙවන්තො අවිජ්ජානුසයානං. එසෙවන්තො දණ්ඩාදානසත්ථාදානකලහවිග්ගහවිවාදතුවන්තුවම්පෙසුඤ්ඤමුසාවාදානං. එත්ථෙතෙ පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්තීති. ඉදමවොච භගවා, ඉදං වත්වා[2] සුගතො උට්ඨායාසනා විහාරං පාවිසි.

6. අථ ඛො තෙසං භික්ඛූනං අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි: "ඉදං ඛො නො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො: "යතොනිදානං භික්ඛු පුරිසං පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති, එත්ථ චෙ නත්ථි අභිනන්දිතබ්බං අභිවදිතබ්බං අජ්ඣොසෙතබ්බං, එසෙවන්තො රාගානුසයානං. එසෙවන්තො පටිඝානුසයානං. එසෙවන්තො දිට්ඨානුසයානං. එසෙවන්තො විචිකිච්ඡානුසයානං. එසෙවන්තො මානානුසයානං. එසෙවන්තො භවරාගානුසයානං. එසෙවන්තො අවිජ්ජානුසයානං. එසෙවන්තො දණ්ඩාදානසත්ථාදානකලහවිග්ගහවිවාදතුවන්තුවම්පෙසුඤ්ඤමුසාවාදානං. එත්ථෙතෙ පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති'ති. කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යා"ති.

7 අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "අයං ඛො ආයස්මා මහාකච්චානො සත්ථු චෙව සංවණ්ණිතො සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං. පහොති චායස්මා මහාකච්චානො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූන මයං යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමෙය්‍යාම, උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චානං එතමත්ථං පටිපුච්ඡෙය්‍යාමා"ති.

1. අජ්ඣොසිතබ්බං, මජ්සං. 2. වත්වාන, මජ්සං.

5. මහණ, යම් කාරණයෙකින් තෘෂ්ණාදෘෂ්ටි ප්‍රපඤ්ච සඞ්ඛ්‍යාත සංඥා කොටස්‌සයෝ පුරුෂයා සහගත කොට පවතිත් ද, ඉදින් මෙකරුණෙහි (මම ය මාගේ ය යි) සතුටු වියයුත්තෙක් කිවයුත්තෙක් ගැල ගතයුත්තෙක් නැත් නම් මෙය ම රාගානුසයයන්ගේ කෙළවර ය. මෙය ම පටිඝානුසයයන්ගේ කෙළවර ය. මෙය ම දිට්ඨානුසයයන්ගේ කෙළවර ය. මෙය ම විචිකිච්ඡානුසයයන්ගේ කෙළවර ය. මෙය ම මානානුසයයන්ගේ කෙළවර ය. මෙය ම භවරාගානුසයයන්ගේ කෙළවර ය. මෙය ම අවිජ්ජානුසයයන්ගේ කෙළවර ය. මෙය ම දඬු ගැනීම, සැත් ගැනීම, කලහ, විග්‍රහ, විරුද්ධකථා, තෝ තෝ කීම, පිසුනුබස, මුසවා යන මොවුන්ට කරුණු වූ චේතනාවන්ගේ කෙළවර වෙයි. මෙහි මේ ලාමක වූ අකුශලධර්මයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත්. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. වදාරා සුගතයන් වහන්සේ හුනස්නෙන් නැගී විහාරයට වැඩි සේක.

6. එක්බිති භාග්‍යවතුන් වහන්සේ නැගී වැඩි නො බෝ වේලායෙහි ඒ භික්ෂූන්ට මෙබඳු අදහසෙක් වී: "ඇවැත්නි, අපගේ භාග්‍යවතුන් වහන්සේ 'මහණ, යම් කාරණයෙකින් තෘෂ්ණාදෘෂ්ටි ප්‍රපඤ්ච සඞ්ඛ්‍යාත සංඥා කොටස්‌සයෝ පුරුෂයා සහගත කොට පවතිත් ද, ඉදින් මෙහි සතුටු වියයුත්තෙක් කියයුත්තෙක් ගැල ගතයුත්තෙක් නැත් නම් මෙය ම රාගානුසයයන් ගේ කෙළවර ය. මෙය ම පටිඝානුසයයන්ගේ කෙළවර ය. මෙය ම දිට්ඨානුසයයන්ගේ කෙළවර ය. මෙය ම විචිකිච්ඡානුසයයන්ගේ කෙළවර ය. මෙය ම මානානුසයයන්ගේ කෙළවර ය. මෙය ම භවරාගානුසයයන්ගේ කෙළවර ය. මෙය ම අවිජ්ජානුසයයන්ගේ කෙළවර ය. මෙය ම දඬු ගැනීම සැත් ගැනීම කලහ විග්‍රහ විරුද්ධ කථා තෝ තෝ යි කීම පිසුනුබස මුසවා යන මොවුන්ට කරුණු වූ චේතනාවන්ගේ කෙළවර ය. මෙහි මේ ලාමක අකුශලධර්මයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත්' යයි මේ උද්දෙශය සැකෙවින් උදෙසා විස්තර විසින් අරුත් නො බෙදා අසුනෙන් නැගී විහාරයට පිවිසි සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසූ විස්තර විසින් අරුත් නො බෙදූ මේ උද්දෙශයාගේ අර්ථය කවරෙක් විස්තර වශයෙන් බෙදා දක්වන්නේ ද?" යි.

7. යළි ඒ භික්ෂූන්ට මේ අදහස වි: "මේ ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිර තෙමේ ශාස්තෘන් වහන්සේ විසිනුත් සංවර්ණිත ය. නුවණැති සබ්‍රහ්මචාරීනුත් විසිනුත් සම්භාවිත ය. ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසූ විස්තර විසින් අරුත් නො බෙදූ මේ උද්දෙශයාගේ අර්ථය විස්තර වශයෙන් බෙදා දක්වන්නට සමර්ථ වෙයි. අපි ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වෙත එළඹෙන්නමෝ නම් එළඹ ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් ගෙන් මෙහි අර්ථය පිළිවිසින්නමෝ නම් ඉතා මැනැවැ යි.

8. අථ ඛො තෙ භික්ඛූ යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මතා මහාකච්චානෙන සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ ආයස්මන්තං මහාකච්චානං එතදවොචුං: ඉදං ඛො නො ආවුසො කච්චාන භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො. ''යතොනිදානං භික්ඛු පුරිසං පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති, එත්ථ චෙ නත්ථි අභිනන්දිතබ්බං අභිවදිතබ්බං අජ්ඣොසෙතබ්බං, එසෙවන්තො රාගානුසයානං. -පෙ- එත්ථෙතෙ පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්තී''ති. තෙසං නො ආවුසො කච්චාන අම්හාකං අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි: ''ඉදං ඛො නො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො: යතොනිදානං භික්ඛු පුරිසං පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති -පෙ- එත්ථෙතෙ පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්තීති කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස අත්ථං විභජෙය්‍යාති? තෙසං නො ආවුසො කච්චාන අම්හාකං එතදහොසි: අයං ඛො ආයස්මා මහාකච්චානො සත්ථු චෙව සංවණ්ණිතො සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං. පහොති චායස්මා මහාකච්චානො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූන මයං යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමෙය්‍යාම, උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චානං එතමත්ථං පටිපුච්ඡෙය්‍යාමා''ති''. විභජතායස්මා මහාකච්චානොති.

9. සෙය්‍යථාපි ආවුසො පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො අතික්කම්මෙව මූලං අතික්කම්ම ඛන්ධං සාඛාපලාසෙ සාරං පරියෙසිතබ්බං මඤ්ඤෙය්‍ය, එවං සම්පදමිදං, ආයස්මන්තානං සත්ථරි සම්මුඛීභූතෙ තං භගවන්තං අතිසිත්වා අම්හෙ එතමත්ථං පටිපුච්ඡිතබ්බං මඤ්ඤථ. සො හාවුසො භගවා ජානං ජානාති. පස්සං පස්සති, චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො, වත්තා පවත්තා, අත්ථස්ස නින්නෙතා, අමතස්ස දාතා, ධම්මස්සාමී, තථාගතො. සො චෙව පනෙතස්ස කාලො අහොසි යං භගවන්තං යෙව එතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ. යථා නො භගවා ව්‍යාකරෙය්‍ය, තථා නං ධාරෙය්‍යාථාති.

10. අද්ධාවුසො කච්චාන භගවා ජානං ජානාති, පස්සං පස්සති. චක්ඛුභූතො ඤාණභූතො, ධම්මභූතො බ්‍රහ්මභූතො, වත්තා පවත්තා, අත්ථස්ස නින්නෙතා, අමතස්ස දාතා, ධම්මස්සාමී, තථාගතො. සො චෙව පනෙතස්ස කාලො අහොසි යං භගවන්තං යෙව එතමත්ථං පටිපුච්ඡෙය්‍යාම. යථා නො භගවා ව්‍යාකරෙය්‍ය, තථා නං ධාරෙය්‍යාම.

8. ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් සමඟ සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පසෙක හුන්හු. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන්හට මෙය කීහු: ඇවැත කාත්‍යායන තෙරණුවෙනි, අපගේ භාග්‍යවතුන් වහන්සේ ''මහණ, යම් කාරණයෙකින් ප්‍රපඤ්චසංඥා කොට්ඨාසයෝ පුරුෂයා වෙත පවතිද්ද. ඉදින් මෙහි සතුටු විය යුත්තෙක් (මම ය මාගේ යැයි) කියයුත්තෙක් ගිලගත යුත්තෙක් නැති නම්, මෙය ම රාගානුසයයන්ගේ කෙළවර ය ... මෙහි මේ ලාමක අකුශල ධර්මයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත්'' යන මේ උද්දෙශය සැකෙවින් උදෙසා විස්තර විසින් අරුත් නො බෙදූ හුනස්නෙන් නැගිට විහාරයට වැඩි සේක. ඇවැත කාත්‍යායන තෙරණුවෙනි, ඒ අපට භාග්‍යවතුන් වහන්සේ වැඩ වදාළ නො බෝ වේලෙහි මේ අදහස විය: ඇවැත්නි, අපගේ භාග්‍යවතුන් වහන්සේ ''මහණ, යම් කාරණයෙකින් ප්‍රපඤ්චසංඥා කොට්ඨාසයෝ පුරුෂයා සහගතවැ පවතිත් ද... මෙහි මේ ලාමක අකුශල ධර්මයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත් යන මේ උද්දෙශය සැකෙවින් උදෙසා විස්තර විසින් අරුත් නො බෙදූ හුනස්නෙන් නැගී විහාරයට වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසූ විස්තර විසින් අරුත් නො බෙදූ මේ උද්දෙශයාගේ අර්ථය කවරෙක් විස්තර විසින් බෙදා දක්වන්නේ දැ යි. ඇවැත් කාත්‍යායන ස්ථවිර තෙමේ වනාහි ශාස්තෘහු විසිනුදු සංවර්ණිත ය. නුවණැති සබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිත ය භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසූ විස්තර විසින් අරුත් නො බෙදූ මේ උද්දෙශයාගේ අර්ථය විස්තර විසින් අරුත් බෙදා දක්වන්නට ද සමර්ථ වෙයි. යම් හෙයෙකින් අපි ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වෙත එළඹෙන්නමෝ නම් එළඹ ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන්ගෙන් මේ අර්ථය පිළිවිසින්නමෝ නම් ඉතා මැනැවැ යි. ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිර තෙමේ මෙය විභාග කෙරේවා යි.

9. ඇවැත්නි, යම්සේ හරයෙන් ප්‍රයෝජන ඇති හර සොයන හර සොයමින් ඇවිදුනා පුරුෂයෙක් නො වැපී සිටුනා හර ඇති මහරුකෙක මූල ඉක්ම කඳ ඉක්ම අතු කොළෙහි හරය සෙවිය යුතු කොට සලකන්නේ ද, ආයුෂ්මත්නට බුදුන් හමු වූ කල්හි ඒ භාග්‍යවතුන් ඉක්ම අප අතින් මේ අර්ථය පිළිවිසිය යුතු යැයි සලකන්නහු නම් මේ කාරණය ද එබඳු නිපැත් ඇතියේ ය. ඇවැත්නි, ඒ භාග්‍යවත් තෙමේ වනාහි දත යුත්ත දනී. දක්ක යුත්ත දකී. චක්ෂුර්භූත ය, ඥානභූත ය, ධර්මභූත ය, බ්‍රහ්මභූත ය. (ධර්ම) වර්තක ය, ප්‍රවර්තකය, අර්ථනිර්නේතෘ (අර්ථය ගෙණ දෙන්නේ)ය, අමෘතදාතෘ ය, ධර්මස්වාමී ය, තථාගත යැ. යම් කලෙක භාග්‍යවතුන්ගෙන් ම මේ අර්ථය පිළිවිසින්නහු නම් මේ එයට කල්ම ය. යම්සේ අපගේ භාග්‍යවත් තෙමේ ප්‍රකාශ කරන්නේ නම්, එසේ එය දරව යි.

10. ඇවැත් කාත්‍යායන ස්ථවිරයෙනි, එකාන්තයෙන් භාග්‍යවත් තෙමේ දතයුත්ත දනී. දක්ක යුත්ත දකී. චක්ෂුර්භූත ය, ඥානභූත ය, ධර්මභූත ය, බ්‍රහ්මභූත ය, (ධර්ම) වර්තක ය, ප්‍රවර්තක ය, අර්ථනිර්නේතෘ ය, ධර්මස්වාමී ය, තථාගත යැ යම් කලෙක භාග්‍යවතුන්ගෙන් ම මේ අර්ථය පිළිවිසින්නමෝ නම් එයට මෙකල් ම විය. යම් සේ අපගේ භාග්‍යවත් තෙමේ ප්‍රකාශ කරන්නේ නම්, එසේ එය දරන්නමු

අපි චායස්මා මහාකච්චානො සත්ථු චෙව සංවණ්ණිතො සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං. පහොති චායස්මා මහාකච්චානො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. විභජතායස්මා මහාකච්චානො අගරුං කත්වාති.

11. තෙනහාවුසො සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො මහාකච්චානස්ස පච්චස්සොසුං ආයස්මා මහාකච්චානො එතදවොච: යං ඛො නො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො, "යතොනිදානං භික්ඛු පුරිසං පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති -පෙ- එත්ථෙතෙ පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්තීති" ඉමස්ස ඛො අහං ආවුසො භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි:

12. චක්ඛුඤ්චාවුසො පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා. යං වෙදෙති, තං සඤ්ජානාති. යං සඤ්ජානාති තං විතක්කෙති. යං විතක්කෙති තං පපඤ්චෙති. යං පපඤ්චෙති. තතොනිදානං පුරිසං පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති අතීතානාගතපච්චුප්පන්නෙසු චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු. සොතඤ්චාවුසො පටිච්ච සද්දෙ ච උප්පජ්ජති සොතවිඤ්ඤාණං -පෙ- ඝානඤ්චාවුසො පටිච්ච ගන්ධෙ ච උප්පජ්ජති ඝානවිඤ්ඤාණං -පෙ- ජිව්හඤ්චාවුසො පටිච්ච රසෙ ච උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණං. -පෙ- කායඤ්චාවුසො පටිච්ච ඵොට්ඨබ්බෙ ච උප්පජ්ජති කායවිඤ්ඤාණං -පෙ- මනඤ්චාවුසො පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා. යං වෙදෙති තං සඤ්ජානාති. යං සඤ්ජානාති තං විතක්කෙති යං විතක්කෙති තං පපඤ්චෙති. යං පපඤ්චෙති තතොනිදානං පුරිසං පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති අතීතානාගතපච්චුප්පන්නෙසු මනොවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු.

13. සො වතාවුසො චක්ඛුස්මිං සති රූපෙ සති චක්ඛුවිඤ්ඤාණෙ සති ඵස්සපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති ඨානමෙතං විජ්ජති. ඵස්සපඤ්ඤත්තියා සති වෙදනාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති ඨානමෙතං විජ්ජති. වෙදනාපඤ්ඤත්තියා සති සඤ්ඤාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති ඨානමෙතං විජ්ජති. සඤ්ඤාපඤ්ඤත්තියා සති විතක්කපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති ඨානමෙතං විජ්ජති. විතක්කපඤ්ඤත්තියා සති පපඤ්චසඤ්ඤාසඞ්ඛාසමුදාචරණපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති ඨානමෙතං විජ්ජති.

තවද ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිර තෙමේ වනාහි ශාස්තෘහු විසිනුදු සංවර්ණිත ය. නුවණැති සබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිත ය ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිර තෙමේ භාග්‍යවතුන් විසින් සැකෙවින් උදෙසූ විස්තර විසින් අරුත් නො බෙදූ මේ උද්දේශයාගේ අර්ථය විස්තර විසින් බෙදා දක්වන්නට ද සමර්ථ වෙයි. ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිර තෙමේ බර නො කොට අර්ථ විභාග කෙරේවා යි.

11. එසේ නම් ඇවැත්නි, අසව මොනවට මෙනෙහි කරව කියන්නෙමි යි. ඇවැත්නි, එසේ යැයි ඒ භික්ෂූහු ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන්හට පිළිවදන් දුන්හු. ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ මෙය ප්‍රකාශ කළහ: ඇවැත්නි, අපගේ භාග්‍යවතුන් වහන්සේ "මහණ, යම් කාරණයෙකින් ප්‍රපඤ්චසංඥකොට්ඨාසයෝ පුරුෂයා සහගතව පවසිද්ද... මෙහි ඒ ලාමක අකුශල ධර්මයෝ නිරවශේෂයෙන් නිරුද්ධ වෙත්" යන යම් උද්දේශයක් සැකෙවින් උදෙසා විස්තර විසින් අරුත් නො බෙදා හුනස්නෙන් නැගී විහාරයට වැඩි සේක් ද, ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසූ විස්තර විසින් අරුත් නො බෙදූ මේ උද්දේශයාගේ අර්ථය මම මෙසේ විස්තර විසින් දනිමි:

12 ඇවැත්නි, ඇස ද රූපයන් ද නිසා චක්ෂුර්විඥානය උපදී. මේ තුන් දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය වෙයි. ස්පර්ශය නිසා වේදනාව වෙයි. යමක් විඳී ද එය හඳුනයි. යමක් හඳුනා ද එය විතර්කණය කෙරෙයි. යමක් විතර්කණය කෙරේ ද, එය ප්‍රපඤ්චයට පමුණුවයි. යමක් ප්‍රපඤ්චයට පමුණුවා නම් ඒ චක්ෂුරූපාදි කාරණයෙන් (තෘෂ්ණාදෘෂ්ටි) ප්‍රපඤ්චයන්ගෙන් යුක්ත සංඥකොට්ඨාසයෝ අතීතානාගතවර්තමාන වූ ඇසින් බලා දතයුතු වූ රූපයෙහි ලා පුරුෂයා අභිභවනය කෙරෙත්. ඇවැත්නි, කණ ද ශබ්දයන් ද නිසා ශ්‍රොත්‍රවිඥානය උපදී ... ඇවැත්නි, නැහැය ද ගඳ ද නිසා ඝ්‍රාණවිඥානය උපදී ... ඇවැත්නි, දිව ද රසයන් ද නිසා ජිහ්වාවිඥානය උපදී ... ඇවැත්නි, කය ද සප්‍රෂ්ටව්‍යයන් ද නිසා කායවිඥානය උපදී ... ඇවැත්නි, සිත ද ධර්මයන් ද නිසා මනොවිඥානය උපදී. මේ තිදෙනාගේ එක්වීමෙන් ස්පර්ශය වෙයි . ස්පර්ශය නිසා වේදනාව වෙයි. යමක් විඳී ද එය හඳුනයි. යමක් හඳුනා ද එය විතර්කණය කෙරෙයි. යමක් විතර්කණය කෙරේ ද එය ප්‍රපඤ්චයට පමුණුවයි. යමක් ප්‍රපඤ්චයට පමුණුවා නම් ඒ මනොධර්මාදි කාරණයෙන් ප්‍රපඤ්චසංඥ කොට්ඨාසයෝ අතීතානාගතවර්තමාන වූ සිතින් දතයුතු වූ ධර්මයන්හි පුරුෂයා අභිභවනය කෙරෙත්.

13. ඇවැත්නි, එකාන්තයෙන් හෙතෙමේ ඇස ඇති කල්හි රූපය ඇති කල්හි චක්ෂුර්විඥානය ඇති කල්හි ස්පර්ශ යැ යි පැනවීමක් කරන්නේ ය (උපදන්නේය) යන මේ කාරණය විද්‍යමාන වෙයි. ස්පර්ශ යැ යි පැනවීමක් ඇති කල්හි වේදනා යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන වෙයි. වේදනා යැ යි පැනවීමක් ඇති කල්හි සංඥ යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන වෙයි. සංඥ යැ යි පැනවීමක් ඇති කල්හි විතර්කයැ යි පැනවීමක් කරන්නේය යන මේ කාරණය විද්‍යමාන වේ. විතර්ක යැයි පැනවීමක් ඇති කල්හි ප්‍රපඤ්චසංඥ-කොට්ඨාසයන්ගේ පැවැත්ම පිළිබඳ පැනවීමක් කරන්නේය යන මේ කාරණය විද්‍යමාන වේ. විතර්කයැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන වෙයි.

.14. සො වතාවුසො සොතස්මිං සති සද්දෙ සති සොතවිඤ්ඤාණෙ සති -පෙ- ඝානස්මිං සති ගන්ධෙ සති ඝානවිඤ්ඤාණෙ සති -පෙ- ජිව්හාය සති රසෙ සති ජිව්හාවිඤ්ඤාණෙ සති -පෙ- කායස්මිං සති ඵොට්ඨබ්බෙ සති කායවිඤ්ඤාණෙ සති -පෙ- මනස්මිං සති ධම්මෙ සති මනොවිඤ්ඤාණෙ සති ඵස්සපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති ඨානමෙතං විජ්ජති. ඵස්සපඤ්ඤත්තියා සති වෙදනාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති ඨානමෙතං විජ්ජති. වෙදනාපඤ්ඤත්තියා සති සඤ්ඤාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති ඨානමෙතං විජ්ජති සඤ්ඤාපඤ්ඤත්තියා සති විතක්කපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති ඨානමෙතං විජ්ජති. විතක්කපඤ්ඤත්තියා සති පපඤ්චසඤ්ඤාසඞ්ඛාසමුදාචරණපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති ඨානමෙතං විජ්ජති.

15. සො වතාවුසො චක්ඛුස්මිං අසති රූපෙ අසති චක්ඛුවිඤ්ඤාණෙ අසති ඵස්සපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති. ඵස්සපඤ්ඤත්තියා අසති වෙදනාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති. වෙදනාපඤ්ඤත්තියා අසති සඤ්ඤාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති. සඤ්ඤාපඤ්ඤත්තියා අසති විතක්කපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති. විතක්කපඤ්ඤත්තියා අසති පපඤ්චසඤ්ඤාසඞ්ඛාසමුදාචරණපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති.

16. සො වතාවුසො සොතස්මිං අසති සද්දෙ අසති සොතවිඤ්ඤාණෙ අසති -පෙ- ඝානස්මිං අසති ගන්ධෙ අසති ඝානවිඤ්ඤාණෙ අසති -පෙ- ජිව්හාය අසති රසෙ අසති ජිව්හාවිඤ්ඤාණෙ අසති -පෙ- කායස්මිං අසති ඵොට්ඨබ්බෙ අසති කායවිඤ්ඤාණෙ අසති -පෙ- මනස්මිං අසති ධම්මෙ අසති මනොවිඤ්ඤාණෙ අසති ඵස්සපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති. ඵස්සපඤ්ඤත්තියා අසති වෙදනාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති වෙදනාපඤ්ඤත්තියා අසති සඤ්ඤාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති. සඤ්ඤාපඤ්ඤත්තියා අසති විතක්කපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති. විතක්කපඤ්ඤත්තියා අසති පපඤ්චසඤ්ඤාසඞ්ඛාසමුදාචරණපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති.

14. ඇවැත්නි, එකාන්තයෙන් හෙතෙමේ කණ ඇති කල්හි ශබ්දය ඇති කල්හි සොතවිඥානය ඇති කල්හි ...නැහැය ඇති කල්හි ගඳ ඇති කල්හි ඝ්‍රාණවිඥානය ඇති කල්හි... දිව ඇති කල්හි රසය ඇති කල්හි ජිව්හා-විඥානය ඇති කල්හි... කය ඇති කල්හි ස්ප්‍රෂ්ටව්‍යය ඇති කල්හි කාය-විඥානය ඇති කල්හි... සිත ඇති කල්හි ධර්මය ඇති කල්හි මනොවිඥානය ඇති කල්හි ස්පර්ශ යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන වෙයි. ස්පර්ශ යැ යි පැනවීමක් ඇති කල්හි වෙදනා යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන වෙයි. වෙදනා යැ යි පැනවීමක් ඇති කල්හි සංඥා යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන වෙයි. සංඥා යැ යි පැනවීමක් ඇති කල්හි විතර්ක යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන වෙයි. විතර්ක යැයි පැනවීමක් ඇති කල්හි ප්‍රපඤ්චසංඥාකොට්ඨාසයන්ගේ පැවැත්ම පිළිබඳ පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන වෙයි.

15. ඇවැත්නි, එකාන්තයෙන් හෙතෙමේ ඇස නැති කල්හි රූපය නැති කල්හි චක්ෂුර්විඥානය නැති කල්හි ස්පර්ශ යැයි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වෙයි. ස්පර්ශ යැ යි පැනවීමක් නැති කල්හි වෙදනා යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වෙයි. වෙදනා යැයි පැනවීමක් නැති කල්හි සංඥා යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වෙයි. සංඥා යැ යි පැනවීමක් නැති කල්හි විතර්ක යැයි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වෙයි. විතර්ක යැ යි පැනවීමක් නැති කල්හි ප්‍රපඤ්චසංඥාකොට්ඨාසයන්ගේ පැවැත්ම පිළිබඳ පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වෙයි.

16. ඇවැත්නි, එකාන්තයෙන් හෙතෙමේ කණ නැති කල්හි ශබ්දය නැති කල්හි සොතවිඥානය නැති කල්හි ... නැහැය නැති කල්හි ගඳ නැති කල්හි ඝ්‍රාණ විඥානය නැති කල්හි...දිව නැති කල්හි රසය නැති කල්හි ජිව්හාවිඥානය නැති කල්හි ... කය නැති කල්හි ස්ප්‍රෂ්ටව්‍යය නැති කල්හි කායවිඥානය නැති කල්හි... සිත නැති කල්හි ධර්ම නැති කල්හි මනොවිඥානය නැති කල්හි ස්පර්ශ යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වෙයි. ස්පර්ශ යැ යි පැනවීමක් නැති කල්හි වෙදනා යැයි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වෙයි. වෙදනා යැ යි පැනවීමක් නැති කල්හි සංඥා යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වෙයි. සංඥා යැයි පැනවීමක් නැති කල්හි විතර්ක යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වෙයි. විතර්ක යැ යි පැනවීමක් නැති කල්හි ප්‍රපඤ්චසංඥාකොට්ඨාසයන්ගේ පැවැත්ම පිළිබඳ පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වේ.

17. යං ඛො නො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො, "යතොනිදානං භික්ඛු පුරිසං පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති, එත්ථ චෙ නත්ථි අභිනන්දිතබ්බං අභිවදිතබ්බං අජ්ඣොසෙතබ්බං, එසෙවන්තො රාගානුසයානං -පෙ- එත්ථෙතෙ පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්තී'ති. ඉමස්ස ඛො අහං ආවුසො භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි. ආකඞ්ඛමානා ච පන තුම්හෙ ආයස්මන්තො භගවන්තංයෙව උපසඞ්කමිත්වා එතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ. යථා නො භගවා ව්‍යාකරොති තථා නං ධාරෙය්‍යාථාති.

18. අථ ඛො තෙ භික්ඛූ ආයස්මතො මහාකච්චානස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං:

19. "යං ඛො නො භන්තෙ භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො, "යතොනිදානං භික්ඛු පුරිසං පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති, එත්ථ චෙ නත්ථි අභිනන්දිතබ්බං අභිවදිතබ්බං අජ්ඣොසෙතබ්බං. එසෙවන්තො රාගානුසයානං -පෙ- එත්ථෙතෙ පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්තී"ති. තෙසං නො භන්තෙ අම්හාකං අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි: "ඉදං ඛො නො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො, 'යතොනිදානං භික්ඛු පුරිසං පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති, එත්ථ චෙ නත්ථි අභිනන්දිතබ්බං අභිවදිතබ්බං අජ්ඣොසෙතබ්බං, එසෙවන්තො රාගානුසයානං එසෙවන්තො පටිඝානුසයානං. එසෙවන්තො දිට්ඨානුසයානං එසෙවන්තො විචිකිච්ඡානුසයානං. එසෙවන්තො මානානුසයානං. එසෙවන්තො භවරාගානුසයානං. එසෙවන්තො අවිජ්ජානුසයානං· එසෙවන්තො දණ්ඩාදානසත්ථාදානකලහවිග්ගහවිවාද තුවංතුවංපෙසුඤ්ඤමුසාවාදානං. එත්ථෙතෙ පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්තී'ති. කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යා"ති

Free Distribution www.aathaapi.org

17. ඇවැත්නි, අපගේ භාග්‍යවතුන් වහන්සේ "මහණ, යම් කරුණෙකින් ප්‍රපඤ්චසංඥා කොට්ඨාසයෝ පුරුෂයා තුළ පවතිත් ද, ඉදින් මේ කරුණෙහි (ද්වාදශායතනයන්හි) සතුටුවිය යුත්තෙක් කිය යුත්තෙක් ගිල ගතයුත්තෙක් නැත් නම් මෙය ම (අභිනන්දනාදිය නැති බව ම) රාගානුසයයන්ගේ කෙළවර ය ... මේ ද්වාදශායතනයන්හි මේ ලාමක අකුශල ධර්මයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත් යන යම් උද්දෙශයක් සැකෙවින් උදෙසා විස්තර විසින් අරුත් නො බෙදා හුනස්නෙන් නැගිට විහාරයට වැඩි සේක් ද, ඇවැත්නි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසූ විස්තර විසින් අරුත් නො බෙදූ මේ උද්දෙශයාගේ විස්තර විසින් අර්ථය මෙසේ දනිමි. ආයුෂ්මත්නි, නෙපි කැමතියව්හු නම් භාග්‍යවතුන් වහන්සේ වෙත ම එළඹ මේ අර්ථය පුළුවුස්ව. අපගේ භාග්‍යවතුන් වහන්සේ යම් සේ වදරනසේක් නම් එය එසේ ධරව යි.

18. එක්බිති, ඒ භික්ෂූහු ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන්ගේ දෙශනාව අභිමුඛව පිළිගෙන අනුමෝදන් ව හුනස්නෙන් නැගී භාග්‍යවතුන් කරා එළඹියාහු ය. එළඹ භාග්‍යවතුන් වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන්හට මෙල සැළ කළහ:

19. "වහන්ස, අපගේ භාග්‍යවතුන් වහන්සේ 'මහණ, යම් කාරණයෙකින් ප්‍රපඤ්චසංඥාකොට්ඨාසයෝ පුරුෂයාහට පවතිත් ද ඉදින් මෙහි සතුටු විය යුත්තෙක් කිය යුත්තෙක් ගිල ගත යුත්තෙක් නැත් නම් මෙය ම රාගානුසයයන්ගේ කෙළවර ය ... මෙහි මේ ලාමක අකුශල ධර්මයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත්' යන යම් උද්දෙශයක් සැකෙවින් උදෙසා විස්තර විසින් අරුත් නො බෙදා හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක් ද, වහන්ස, අපගේ භාග්‍යවතුන් වහන්සේ වැඩි නො බෝ වේලාවෙකින් ඒ අපට මේ අදහස වී: ඇවැත්නි, අපගේ භාග්‍යවතුන් වහන්සේ 'මහණ, යම් කාරණයෙකින් ප්‍රපඤ්චසංඥා කොට්ඨාසයෝ පුරුෂයා තුළ පවතිත් ද, ඉදින් මෙහි සතුටු වියයුත්තෙක් කියයුත්තෙක් ගිල ගත යුත්තෙක් නැත් නම් මෙය ම රාගානුසයයන්ගේ කෙළවර ය. මෙය ම පටිඝානුසයයන්ගේ කෙළවර ය. මෙය ම දිට්ඨානුසයයන්ගේ කෙළවර ය. මෙය ම විචිකිච්ඡානුසයයන්ගේ කෙළවර ය. මෙය ම මානානුසයයන්ගේ කෙළවර ය. මෙය ම භවරාගානුසයයන්ගේ කෙළවර ය. මෙය ම අවිජ්ජානුසයයන්ගේ කෙළවර ය. මෙය ම දඬු ගැනීම් සැත් ගැනීම කලහ විග්‍රහ විරුද්ධකථා තෝ තෝ යි කීම පිසුනු බස බොරුබස යන මොවුනට කරුණු වූ චේතනාවන්ගේ කෙළවර ය. මෙහි ම මේ ලාමක අකුශල ධර්මයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත්' යන යම් උද්දෙශයක් සැකෙවින් උදෙසා විස්තර විසින් අරුත් නො බෙදා හුනස්නෙන් නැගිට විහාරයට වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසූ විස්තර විසින් අරුත් නො බෙදූ මේ උද්දෙශයාගේ අර්ථය විස්තර විසින් කවරෙක් බෙදා දක්වන්නේ දැ" යි.

20 "තෙසං නො භන්තෙ අම්හාකං එතදහොසි: අයං ඛො ආයස්මා මහාකච්චානො සත්ථු චෙව සංවණ්ණිතො. සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං පහොති චායස්මා මහාකච්චානො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූන මයං යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමෙය්‍යාම, උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චානං එතමත්ථං පටිපුච්ඡෙය්‍යාමා"ති.

21 "අථ ඛො මයං භන්තෙ යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමිම්හ. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චානං එතමත්ථං පටිපුච්ඡිම්හ තෙසං නො භන්තෙ ආයස්මතා මහාකච්චානෙන ඉමෙහි ආකාරෙහි ඉමෙහි පදෙහි බ්‍යඤ්ජනෙහි අත්ථො විභත්තො"ති.

22 පණ්ඩිතො භික්ඛවෙ මහාකච්චානො, මහාපඤ්ඤො භික්ඛවෙ මහාකච්චානො. මඤ්චෙපි තුම්හෙ භික්ඛවෙ එතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ, අහම්පි තං එවමෙවං ව්‍යාකරෙය්‍යං යථා තං මහාකච්චානෙන ව්‍යාකතං එසො චෙවෙතස්ස අත්ථො. එවඤ්ච තං ධාරෙථාති.

23. එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: සෙය්‍යථාපි භන්තෙ පුරිසො ජිඝච්ඡාදුබ්බල්‍යපරෙතො මධුපිණ්ඩිකං අධිගච්ඡෙය්‍ය, සො යතො යතො සායෙය්‍ය ලභෙථෙව සාදුං රසං අසෙචනකං, එවමෙව ඛො භන්තෙ චෙතසො භික්ඛු දබ්බජාතිකො යතො යතො ඉමස්ස ධම්මපරියායස්ස පඤ්ඤාය අත්ථං උපපරික්ඛෙය්‍ය ලභෙථෙව අත්තමනතං ලභෙථ චෙතසො පසාදං. කො නාමො අයං භන්තෙ ධම්මපරියායොති? තස්මාතිහ ත්වං ආනන්ද, ඉමං ධම්මපරියායං මධුපිණ්ඩිකපරියායොත්වෙව තං ධාරෙහීති.

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා ආනන්දො භගවතො භාසිතං අභිනන්දීති.

මධුපිණ්ඩිකසුත්තං අට්ඨමං.

20. "වහන්ස; ඒ අපට මේ අදහස වී යඃ මේ ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිර තෙමේ ශාස්තෘහු විසිනුදු වර්ණිත ය. නුවණැති සබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිතය. භාග්‍යවතුන් වහන්සේ විසින් හැකෙවින් උදෙසන ලද විස්තර විසින් අරුත් නොබෙදූ මේ උද්දේශයාගේ විස්තර විසින් අරුත් බෙදා දක්වන්නට ද සමර්ථ වෙයි. අපි ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වෙත එළඹෙන්නමෝ නම්, එළඹ ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් අතින් මේ අර්ථය පිළිවිසින්නමෝ නම් මැනැවැ"යි.

21. "එක්බිති වහන්ස, අපි ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වෙත එළඹියම්හ. එළඹ ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන්ගෙන් මේ අර්ථය පිළිවිසුම්හ. වහන්ස, ඒ අපට ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් විසින් මේ ආකාරයෙන් මේ පදයන්ගෙන් මේ ව්‍යඤ්ජනයන්ගෙන් අර්ථය බෙදා දක්වන ලද්දේ ය.

22 මහණෙනි, මහාකාත්‍යායන තෙමේ පණ්ඩිත ය. මහණෙනි, මහාකාත්‍යායන තෙමේ මහනුවණැත්තේ ය. මහණෙනි, තෙපි මාගෙන් වුවත් මේ අර්ථය පිළිවිසුවහු නම් මහාකාත්‍යායනයා විසින් යම්සේ එය ප්‍රකාශ කරන ලද නම් මම ද තොපට එය එසේ ම ප්‍රකාශ කරන්නෙමි. මෙහි අර්ථය මේ ම ය. එසේ ම දරව.

23. මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙතෙල සැල කෙළේ යඃ "වහන්ස බඩසා දුබල බැවින් පෙළුණු පුරුෂයෙක් මිහිරි කිරීමට අමුතු රස නො මුසුය යුතු මීපිඬුවක් (බදගත්-වටක්) ලබා ද, හෙතෙමේ යම් යම් පසෙකින් (එය) ආස්වාදනය කෙරේ ද (ඒ ඒ පැත්තෙන්) මිහිරි රසයක් ලබන්නේ ම ය. වහන්ස එ පරිද්දෙන් ම සිතන සැහැවි ඇති පණ්ඩිත සවභාව ඇති මහණෙක් යම් යම් ලෙසෙකින් මේ ධර්මදෙශනාවගේ අර්ථය නුවණින් පරීක්ෂා කරන්නේ ද ඒ ඒ ලෙසින් සතුටුබව ලබන්නේ ම ය සිතේ පැහැදීම ලබන්නේ ම ය වහන්ස, මේ ධර්මපර්යාය ය කිනම් ඇත්තේ දැ? ආනන්දය, එසේ නම් තෝ මෙහි ලා මේ ධර්මදෙශනාව මධුපිණ්ඩිකපර්යාය යැ යි දරව යි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු වූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව මැනැවැ යි සතුටින් පිළිගත්තේ යි.

මධුපිණ්ඩිකසූත්‍රය අටවැනි යි.

1. 2. 9.

ද්වෙධාවිතක්කසුත්තං

1. **එවං** මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. පුබ්බෙව මෙ භික්ඛවෙ සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි: යන්නූනාහං ද්වෙධා[1] කත්වා ද්වෙධා කත්වා විතක්කෙ විහරෙය්‍යන්ති. සො ඛො අහං භික්ඛවෙ යො චායං කාමවිතක්කො යො ච බ්‍යාපාදවිතක්කො යො ච විහිංසාවිතක්කො, ඉමං එකං භාගමකාසිං. යො චායං නෙක්ඛම්මවිතක්කො යො ච අබ්‍යාපාදවිතක්කො යො ච අවිහිංසාවිතක්කො, ඉමං දුතියං භාගමකාසිං.

3. තස්ස මය්හං භික්ඛවෙ එවං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො උප්පජ්ජති කාමවිතක්කො. සො එවං පජානාමි: උප්පන්නො ඛො මෙ අයං කාමවිතක්කො. සො ච ඛො අත්තව්‍යාබාධායපි සංවත්තති, පරව්‍යාබාධායපි සංවත්තති, උභයව්‍යාබාධායපි සංවත්තති, පඤ්ඤානිරොධිකො විඝාතපක්ඛිකො අනිබ්බානසංවත්තනිකො. අත්තව්‍යාබාධාය සංවත්තතීතිපි මෙ භික්ඛවෙ පටිසඤ්චික්ඛතො අබ්භත්ථං ගච්ඡති. පරව්‍යාබාධාය සංවත්තතීතිපි මෙ භික්ඛවෙ පටිසඤ්චික්ඛතො අබ්භත්ථං ගච්ඡති උභයව්‍යාබාධාය සංවත්තතීතිපි මෙ භික්ඛවෙ පටිසඤ්චික්ඛතො අබ්භත්ථං ගච්ඡති පඤ්ඤානිරොධිකො විඝාතපක්ඛිකො අනිබ්බානසංවත්තනිකොතිපි මෙ භික්ඛවෙ පටිසඤ්චික්ඛතො අබ්භත්ථං ගච්ඡති. සො ඛො අහං භික්ඛවෙ උප්පන්නුප්පන්නං කාමවිතක්කං පජහමෙව [2]විනොදමෙව'[3] බ්‍යන්තෙව[4] නං අකාසිං.

4. තස්ස මය්හං භික්ඛවෙ එවං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො උප්පජ්ජති බ්‍යාපාදවිතක්කො -පෙ- උප්පජ්ජති විහිංසාවිතක්කො. සො එවං පජානාමි: උප්පන්නො ඛො මෙ අයං විහිංසාවිතක්කො. සො ච ඛො අත්තව්‍යාබාධායපි සංවත්තති, පරව්‍යාබාධායපි සංවත්තති, උභයව්‍යාබාධායපි සංවත්තති, පඤ්ඤානිරොධිකො විඝාතපක්ඛිකො අනිබ්බානසංවත්තනිකො. අත්තව්‍යාබාධාය සංවත්තතීතිපි මෙ භික්ඛවෙ පටිසඤ්චික්ඛතො අබ්භත්ථං ගච්ඡති පරව්‍යාබාධාය සංවත්තතීතිපි මෙ භික්ඛවෙ පටිසඤ්චික්ඛතො අබ්භත්ථං ගච්ඡති. උභයව්‍යාබාධාය සංවත්තතීතිපි මෙ භික්ඛවෙ පටිසඤ්චික්ඛතො අබ්භත්ථං ගච්ඡති. පඤ්ඤානිරොධිකො විඝාතපක්ඛිකො අනිබ්බානසංවත්තනිකොතිපි මෙ භික්ඛවෙ පටිසඤ්චික්ඛතො අබ්භත්ථං ගච්ඡති. සො ඛො අහං භික්ඛවෙ උප්පන්නුප්පන්නං විහිංසාවිතක්කං පජහමෙව[2] විනොදමෙව,[3] බ්‍යන්තෙව[4] නං අකාසිං.

1. ද්විධා, මජ්ඣං. 2. පජහාමෙව, සීමු. පජ්ජහමෙව, ස්‍යා.
3. විනොදෙමෙව, සීමු. විනොදනමෙව, ස්‍යා. 4. බ්‍යන්තමෙව, මජ්ඣං, ස්‍යා.

1. 2. 9.

ද්වෙධාවිතක්කසූත්‍රය

1. **මා** විසින් මෙසේ අසන ලදි: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර **ජේතවන** නම් වූ **අනේපිඬු** සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු වහන්සැ යි භාග්‍යවතුන් වහන්සේහට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේය වදාළ සේක:

2. මහණෙනි, බුදුවීමට පෙර ම බුදු නො වූ බොධිසත්ත්ව වූ ම මට මේ අදහස වී ය: "ඉදින් මම විතර්කයන් දෙ කොටසක් කොට, දෙ කොටසක් කොට වාසය කරන්නෙම් නම් ඉතා මැනව" යි. මහණෙනි, ඒ මම යම් මේ කාමවිතර්කයකුත් යම් මේ ව්‍යාපාදවිතර්කයකුත් යම් මේ විහිංසා-විතර්කයකුත් වේ ද, මේය එක් කොටසක් කෙළෙමි යම් මේ නෛෂ්ක්‍රම්‍ය-විතර්කයකුත් යම් මේ අව්‍යාපාදවිතර්කයකුත් යම් මේ අවිහිංසාවිතර්කයකුත් වේ ද, මේය දෙවන කොටස කෙළෙමි.

3. මහණෙනි, අප්‍රමත්ත වූ කෙලෙස් තවන වැර ඇත්තා වූ නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වසන්නා වූ ඒ මට කාමවිතර්කය උපදී. ඒ මම මෙසේ දනිමි: "මට මේ කාමවිතර්කය උපන්නේ ය. ඒ කාම-විතර්කය තෙමේ තමාට දුක් පිණිස ද පවතී. අන්හට දුක් පිණිස ද පවතී. දෙපසට දුක් පිණිස ද පවතී. ප්‍රඥාව සිඳ හරින්නෙකි. දුක්-කොටසෙහි වූවෙකි. නිවන සඳහා නො පවතින්නෙකැ"යි. මහණෙනි, තමහට දුක් පිණිස පවතී ය යි සලකන්නා වූ මාගේ ඒ විතර්කය විනාශයට යෙයි. මහණෙනි, අන්හට දුක් පිණිස පවතී ය යි සලකන්නා වූ මාගේ ඒ විතර්කය විනාශයට යෙයි. මහණෙනි, දෙපසට දුක් පිණිස පවතී ය යි සලකන්නා වූ මාගේ ඒ විතර්කය විනාශයට යෙයි. ප්‍රඥාව සිඳ හරින්නෙකි, දුක් කොටසෙහි වූවෙකි, නිවන සඳහා නො පවතින්නෙකි යි සලකන්නා වූ මාගේ ඒ විතර්කය විනාශයට යෙයි. මහණෙනි, ඒ මම උපනුපන් කාමවිතර්කය දුරු කෙළෙම් ම ය. බැහැර කෙළෙම් ම ය. එය අවසන් වූවක් ම කෙළෙමි.

4. මහණෙනි, අප්‍රමත්ත වූ කෙලෙස් තවන වැර ඇත්තා වූ නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වසන්නා වූ ඒ මට ව්‍යාපාදවිතර්කය උපදී... විහිංසාවිතර්කය උපදී. ඒ මම මෙසේ දනිමි: 'මට මේ විහිංසා විතර්කය උපන්නේ ය. ඒ විහිංසා විතර්කය තෙමේ තමාට දුක් පිණිස ද පවතී අන්හට දුක් පිණිස ද පවතී. දෙපසට දුක් පිණිස ද පවතී. ප්‍රඥාව සිඳ හරින්නෙකි. දුක් කොටසෙහි වූවෙකි. නිවන සඳහා නො පවතින්නෙකි යි. මහණෙනි, තමාට දුක් පිණිස පවති යි සලකන්නා වූ මාගේ ඒ විතර්කය විනාශයට යෙයි. මහණෙනි, අන්හට දුක් පිණිස පවතී යි සලකන්නා වූ මාගේ ඒ විතර්කය විනාශයට යෙයි. මහණෙනි, දෙපසට දුක් පිණිස පවතී යි සලකන්නා වූ මාගේ ඒ විතර්කය විනාශයට යෙයි. මහණෙනි, ප්‍රඥාව සිඳ හරින්නෙකි, දුක් කොටසෙහි වූවෙකි, නිවන පිණිස නො පවතින්නෙකැ යි සලකන්නා වූ මාගේ ඒ විතර්කය විනාශයට යෙයි. මහණෙනි, ඒ මම උපනුපන් විහිංසාවිතර්කය දුරු කෙළෙම් ම ය. බැහැර කෙළෙම් ම ය. එය අවසන් වූවක් ම කෙළෙමි.

5. යඤ්ඤදෙව භික්ඛවෙ භික්ඛු බහුලමනුවිතක්කෙති අනුවිචාරෙති තථා තථා නති හොති චෙතසො. කාමවිතක්කඤ්චෙ භික්ඛවෙ භික්ඛු බහුලමනුවිතක්කෙති අනුවිචාරෙති, පහාසි නෙක්ඛම්මවිතක්කං. කාමවිතක්කං බහුලමකාසි. තස්ස තං කාමවිතක්කාය චිත්තං නමති. බ්‍යාපාදවිතක්කඤ්චෙ භික්ඛවෙ භික්ඛු බහුලමනුවිතක්කෙති අනුවිචාරෙති, පහාසි අබ්‍යාපාදවිතක්කං. බ්‍යාපාදවිතක්කං බහුලමකාසි. තස්ස තං බ්‍යාපාදවිතක්කාය චිත්තං නමති. විහිංසාවිතක්කඤ්චෙ භික්ඛවෙ භික්ඛු බහුලමනුවිතක්කෙති අනුවිචාරෙති, පහාසි අවිහිංසාවිතක්කං. විහිංසාවිතක්කං බහුලමකාසි. තස්ස තං විහිංසාවිතක්කාය චිත්තං නමති.

6. සෙය්‍යථාපි භික්ඛවෙ වස්සානං පච්ඡිමෙ මාසෙ සරදසමයෙ කිට්ඨසම්බාධෙ ගොපාලකො ගාවො රක්ඛෙය්‍ය, සො තා ගාවො තතො තතො දණ්ඩෙන ආකොටෙය්‍ය පතිකොටෙය්‍ය[1] සන්නිරුන්ධෙය්‍ය[2] සන්නිවාරෙය්‍ය. තං කිස්ස හෙතු? පස්සති හි සො භික්ඛවෙ ගොපාලකො තතොනිදානං වධං වා බන්ධං[3] වා ජානිං වා ගරහං වා. එවමෙව ඛො අහං භික්ඛවෙ අද්දසං අකුසලානං ධම්මානං ආදීනවං ඔකාරං සංකිලෙසං, කුසලානං ධම්මානං නෙක්ඛම්මෙ ආනිසංසං වොදානපක්ඛං.

7. තස්ස මය්හං භික්ඛවෙ එවං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො උප්පජ්ජති නෙක්ඛම්මවිතක්කො. සො එවං පජානාමි: උප්පන්නො ඛො මෙ අයං නෙක්ඛම්මවිතක්කො. සො ච ඛො නෙවත්තව්‍යාබාධාය සංවත්තති, න පරව්‍යාබාධාය සංවත්තති, න උභයව්‍යාබාධාය සංවත්තති, පඤ්ඤාවුද්ධිකො අවිඝාතපක්ඛිකො නිබ්බානසංවත්තනිකො. රත්තිඤ්චෙපි නං භික්ඛවෙ අනුවිතක්කෙය්‍යං අනුවිචාරෙය්‍යං නෙව තතොනිදානං භයං සමනුපස්සාමි. දිවසඤ්චෙපි නං භික්ඛවෙ අනුවිතක්කෙය්‍යං අනුවිචාරෙය්‍යං නෙව තතෙ නිදානං භයං සමනුපස්සාමි. රත්තින්දිවඤ්චෙපි නං භික්ඛවෙ අනුවිතක්කෙය්‍යං අනුවිචාරෙය්‍යං නෙව තතොනිදානං භයං සමනුපස්සාමි. අපි ච ඛො මෙ අතිචිරං අනුවිතක්කයතො අනුවිචාරයතො කායො කිලමෙය්‍ය. කායෙ කිලන්තෙ[4] චිත්තං ඌහඤ්ඤෙය්‍ය.[5] ඌහතෙ[6] චිත්තෙ ආරා චිත්තං සමාධිම්හාති. සො ඛො අහං භික්ඛවෙ අජ්ඣත්තමෙව චිත්තං සණ්ඨපෙමි සන්නිසාදෙමි[7] එකොදිං[8] කරොමි සමාදහාමි. තං කිස්ස හෙතු: මා මෙ චිත්තං ඌහඤ්ඤීති.[9]

---

1. පටිකොටෙය්‍ය, මජසං. පටිකොචෙචය්‍ය, සයා, 2. සන්නිරුද්ධෙය්‍ය, සයා.
3 බන්ධනං, මජසං 4. කිලම්තෙන, කළුවි 5. ඔහඤ්ඤෙය්‍ය, සයා.
6. ඔහතෙ, සයා 7. සන්නිසීදෙමි, සයා 8 එකොදි, PTS.
9. උග්ඝාටීති, සයා. ඌහනීති, PTS.

5. මහණෙනි, මහණ තෙමේ යම් යම් ම විතර්කයක් බහුල කොට නැවැත නැවැත විතර්කණය කෙරේ ද, නැවැත නැවැත හසුරුවා ද, ඒ ඒ ලෙසින් ම සිත්හි නැඹුරුබව වෙයි. මහණෙනි, ඉදින් මහණ තෙමේ කාමවිතර්කය ම බහුල කොට නැවැත නැවැත විතර්කණය කෙරේ නම් නැවැත නැවැත හසුරුවා නම් නෛෂ්ක්‍රම්‍ය විතර්කය දුරු කෙරෙයි. කාමවිතර්කය බහුල කෙරෙයි. ඔහුගේ ඒ සිත කාමවිතර්කය පිණිස නැමේ. මහණෙනි, ඉදින් මහණ තෙමේ ව්‍යාපාද විතර්කය බහුල කොට නැවැත නැවැත විතර්කණය කෙරේ නම් නැවැත නැවැත හසුරුවා නම් අව්‍යාපාදවිතර්කය දුරු කෙරෙයි. ව්‍යාපාද විතර්කය බහුල කෙරෙයි. ඔහුගේ ඒ සිත ව්‍යාපාද විතර්කය පිණිස නැමේ. මහණෙනි, ඉදින් මහණ තෙමේ විහිංසාවිතර්කය බහුල කොට නැවැත නැවැත විතර්කණය කෙරේ නම් නැවැත නැවැත හසුරුවා නම් අවිහිංසාවිතර්කය දුරු කෙරෙයි· විහිංසාවිතර්කය බහුල කෙරෙයි. ඔහුගේ ඒ සිත විහිංසා විතර්කය පිණිස නැමේ.

6. මහණෙනි, යම් සේ වැසිසමයහ පිළිබඳ පැසුළු මස ගොයමින් සක (සාති) වූ සරකල්හි ගොපල්ලෙක් ගවයන් රක්නේ ද, හෙ තෙමේ ඒ ගවයන්ට ඒ ඒ දෙසින් පිටෙහි දඬුයෙන් (කෙළිත්) පහර දෙන්නේ ය. ඉලඇටෙහි සරසින් පහර දෙන්නේ ය. ඔබමොබ යෑමෙන් අවුරා සිටින්නේ ය. වළක් වන්නේ ය. ඒ කවර හෙයින යත්: මහණෙනි, ඒ ගොපල්ලා ඒ ගවයන් ගොයමින් නො රැක්ම හේතු කොට ගෙන වධයක් හෝ බන්ධනයක් හෝ ධනහානියක් හෝ ගර්හාවක් හෝ දක්නේ ද එහෙයිනි. මහණෙනි, එපරිද්දෙන් ම මම අකුශල ධර්මයන්ගේ දෝෂය ලාමකබව කෙලෙසීම ද කුශල ධර්මයන් පිළිබද නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් ද විශුද්ධිපක්ෂය ද දිටිමි.

7. මහණෙනි, මෙසේ අප්‍රමත්ත වූ කෙලෙස් තවන වැර ඇත්තා වූ නිවනට මෙහෙයූ සිත් ඇති ව වසන්නා වූ ඒ මට නෛෂ්ක්‍රම්‍ය විතර්කය උපදී. ඒ මම මෙසේ දනිමි: මට මේ නෛෂ්ක්‍රම්‍ය විතර්කය උපන්නේ ය. ඒ නෛෂ්ක්‍රම්‍ය විතර්කය තෙමේත් තමාට දුක් පිණිස නො පවතී. අන්හට දුක් පිණිස නො පවතී. දෙපසට දුක් පිණිස නො පවතී. ප්‍රඥාව වඩන්නෙකි දුක් කොටසෙහි නො වූවෙකි. නිවන් සඳහා පවතින්නෙකි. මහණෙනි, රෑ මුළුල්ලෙහිදු ඒ විතර්කය නැවත නැවත විතර්කණය කරන්නෙම් නම් පුන පුනා හසුරුවන්නෙම් නම් ඒ හේතුකොට ගෙන බියක් නො ම දකිමි. මහණෙනි, දහවල මුළුල්ලෙහිදු ඒ විතර්කය නැවත නැවත විතර්කණය කරන්නෙම් නම් පුන පුනා හසුරුවන්නෙම් නම් ඒ හේතුකොට ගෙන බියක් නො ම දකිමි. මහණෙනි, රෑ දවල මුළුල්ලෙහි ඒ විතර්කය නැවත නැවත විතර්කණය කරන්නෙම් නම් පුන පුනා හසුරුවන්නෙම් නම් ඒ හේතුකොට ගෙන බියක් නො ම දකිමි. වැලිදු බොහෝ කලක් නැවත නැවත විතර්කණය කරන්නාවූ පුන පුනා හසුරු වන්නා වූ මාගේ ශරීරය ක්ලාන්ත වන්නේ ය. ශරීරය ක්ලාන්තවූ කල්හි සිත නො සන්හුන් වේ. සිත නොසන්හුන් කල්හි සමාධිය කෙරෙන් සිත දුරෙහි වෙයි. මහණෙනි, ඒ මම සන්තානයෙහි ම සිත මැනැවින් තබමි. මැනැවින් හිඳුවමි. එකඟ කරමි. මැනැවින් පිහිටුවමි. ඒ කවර හෙයින යත්: මාගේ සිත තහමක් නො සන්හුන් වේවා යි. (සිතීමෙනි.)

8. තස්ස මය්හං භික්ඛවෙ එවං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො උප්පජ්ජති අබ්‍යාපාදවිතක්කො -පෙ- උප්පජ්ජති අවිහිංසාවිතක්කො. සො එවං පජානාමි: උප්පන්නො ඛො මෙ අයං අවිහිංසාවිතක්කො. සො ච ඛො නෙවත්තබ්‍යාබාධාය සංවත්තති, න පරබ්‍යාබාධාය සංවත්තති, න උභයබ්‍යාබාධාය සංවත්තති, පඤ්ඤාවුද්ධිකො අවිඝාතපක්ඛිකො නිබ්බානසංවත්තනිකො. රත්තිඤ්චෙපි නං භික්ඛවෙ අනුවිතක්කෙය්‍යං අනුවිචාරෙය්‍යං නෙව තතොනිදානං භයං සමනුපස්සාමි. දිවසඤ්චෙපි නං භික්ඛවෙ අනුවිතක්කෙය්‍යං අනුවිචාරෙය්‍යං නෙව තතොනිදානං භයං සමනුපස්සාමි. රත්තින්දිවඤ්චෙපි නං භික්ඛවෙ අනුවිතක්කෙය්‍යං අනුවිචාරෙය්‍යං නෙව තතොනිදානං භයං සමනුපස්සාමි. අපි ච ඛො මෙ අතිචිරං අනුවිතක්කයතො අනුවිචාරයතො කායො කිලමෙය්‍ය. කායෙ කිලන්තෙ චිත්තං ඌහඤ්ඤෙය්‍ය. ඌහතෙ චිත්තෙ ආරා චිත්තං සමාධිම්හාති. සො ඛො අහං භික්ඛවෙ අජ්ඣත්තමෙව චිත්තං සණ්ඨපෙමි සන්නිසාදෙමි එකොදිං කරොමි සමාදහාමි. තං කිස්ස හෙතු: මා මෙ චිත්තං ඌහඤ්ඤීති.

9. යඤ්ඤදෙව භික්ඛවෙ භික්ඛු බහුලමනුවිතක්කෙති අනුවිචාරෙති තථා තථා නති හොති චෙතසො. නෙක්ඛම්මවිතක්කඤ්චෙ භික්ඛවෙ භික්ඛු බහුලමනුවිතක්කෙති අනුවිචාරෙති, පහාසි කාමවිතක්කං. නෙක්ඛම්මවිතක්කං බහුලමකාසි. තස්ස තං නෙක්ඛම්මවිතක්කාය චිත්තං නමති. අබ්‍යාපාද විතක්කඤ්චෙ භික්ඛවෙ, භික්ඛු බහුලමනුවිතක්කෙති අනුවිචාරෙති, පහාසි බ්‍යාපාදවිතක්ක . අබ්‍යාපාදවිතක්කං බහුලමකාසි. තස්ස තං අබ්‍යාපාදවිතක්කාය චිත්තං නමති. අවිහිංසාවිතක්කඤ්චෙ භික්ඛවෙ භික්ඛු බහුලමනුවිතක්කෙති අනුවිචාරෙති, පහාසි විහිංසාවිතක්කං. අවිහිංසාවිතක්කං බහුලමකාසි. තස්ස තං අවිහිංසාවිතක්කාය චිත්තං නමති. සෙය්‍යථාපි භික්ඛවෙ ගිම්හානං පච්ඡිමෙ මාසෙ සබ්බසස්සෙසු ගාමන්තසම්භතෙසු ගොපාලකො ගාවො රක්ඛෙය්‍ය. තස්ස රුක්ඛමූලගතස්ස වා අබ්භොකාසගතස්ස වා සතිකරණීයමෙව හොති: එතා[1] ගාවොති. එවමෙව[2] ඛො භික්ඛවෙ සතිකරණීයමෙව අහොසි: එතෙ ධම්මාති.

10. ආරද්ධං ඛො පන මෙ භික්ඛවෙ විරියං අහොසි අසල්ලීනං. උපට්ඨිතා සති අසම්මුට්ඨා[3]. පස්සද්ධො කායො අසාරද්ධො. සමාහිතං චිත්තං එකග්ගං. සො ඛො අහං භික්ඛවෙ විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහාසිං. -

---

1. එතෙ, කම්බො. 2. එවමෙව., මජසං 3 අපම්මුට්ඨා, සයා

8. මහණෙනි, අප්‍රමත්ත වූ කෙලෙස් තවන වැර ඇත්තා වූ නිවනට මෙහෙයූ සිත් ඇතිව වසන්නාවූ ඒ මට අව්‍යාපාද විතර්කය උපදී... අවිහිංසා විතර්කය උපදී. ඒ මම මෙසේ දනිමි. මට අවිහිංසා විතර්කය උපන්නේ ය. ඒ අවිහිංසා විතර්කය තෙමේ තමාට දුක් පිණිස නො පවතී. අන්හට දුක් පිණිස නො පවතී. දෙපසට දුක් පිණිස නො පවතී. ප්‍රඥාව වඩන්නෙකි. දුක් කොටසෙහි නොවූවෙකි නිවන් පිණිස පවතින්නෙකි. මහණෙනි, රෑ මුළුල්ලෙහිදු එය නැවත නැවත විතර්කණය කරන්නෙම් නම් පුන පුනා හසුරුවන්නෙම් නමු ඒ හෙතුකොට ගෙන බියක් නො ම දකිමි. මහණෙනි, දහවල මුළුල්ලෙහි දු නැවත නැවත විතර්කණය කරන්නෙම් නම් පුන පුනා හසුරුවන්නෙමි නම් ඒ හෙතුකොට ගෙන බියක් නො ම දකිමි. මහණෙනි, රෑ දහවල මුළුල්ලෙහි දු එය නැවත නැවත විතර්කණය කරන්නෙම් නම් පුන පුනා හසුරුවන්නෙම් නම් ඒ හෙතු කොට ගෙන බියක් නො ම දකිමි. වැලිදු බොහෝ කලක් නැවත නැවත විතර්කණය කරන්නාවූ පුන පුනා හසුරුවන්නා වූ මාගේ ශරීරය ක්ලාන්ත වන්නේ ය. ශරීරය ක්ලාන්ත වූ කල්හි සිත නොසන්හුන් වන්නේ ය. සිත නොසන්හුන් කල්හි සමාධිය කෙරෙන් සිත දුරෙහි වෙයි. මහණෙනි, ඒ මම සියසතන්හි ම සිත මැනැවින් තබමි. මැනැවින් හිඳුවමි. එකඟ කරමි. මැනැවින් පිහිටුවමි. ඒ කවර හෙයින යත්: මාගේ සිත නහමක් නොසන්හුන් වේවා යි. (සිතීමෙනි.)

9. මහණෙනි, මහණ තෙමේ යම් යම් ම විතර්කයක් බහුල කොට නැවත නැවත විතර්කණය කෙරේ ද, පුන පුනා හසුරුවා ද, ඒ ඒ ලෙසින් සිත්හි නැඹුරු බව වේ. මහණෙනි, මහණ තෙමේ නෛෂ්ක්‍රම්‍ය විතර්කය බහුල කොට නැවත නැවත විතර්කණය කෙරේ නම් පුන පුනා හසුරුවා නම් කාමවිතර්කය දුරු කෙරෙයි. නෛෂ්ක්‍රම්‍ය විතර්කය බහුල කෙරෙයි. ඔහුගේ ඒ සිත නෛෂ්ක්‍රම්‍ය විතර්කයට නැමෙයි. මහණෙනි, මහණ තෙමේ අව්‍යාපාද විතර්කය නැවත නැවත විතර්කණය කෙරේ නම් පුන පුනා හසුරුවා නම් ව්‍යාපාද විතර්කය දුරු කෙරෙයි. අව්‍යාපාද විතර්කය බහුල කෙරෙයි. ඔහුගේ ඒ සිත අව්‍යාපාද විතර්කයට නැමෙයි. මහණෙනි, ඉදින් මහණ තෙමේ අවිහිංසා විතර්කය බහුල කොට නැවත නැවත විතර්කණය කෙරේ ද, පුන පුනා හසුරුවා ද, විහිංසා විතර්කය දුරු කෙරෙයි අවිහිංසා විතර්කය බහුල කෙරෙයි. ඔහුගේ ඒ සිත අවිහිංසා විතර්කයට නැමෙයි. මහණෙනි, යම් සේ ග්‍රීෂ්මඍතුවෙහි පශ්චිම මාසයෙහි සියලු ශස්‍යයන් ගමෙහි රැස් කළ කල්හි ගොපොල්ලෙක් ගවයන් රක්නේ ද, රුක්මුලට ගියාවූ හෝ එළිමහනට ගියාවූ හෝ ඔහු විසින් ‘මොහු ගෙරිහු ය’ යි සිහි කිරීම් පමණෙක් ම වේ ද, මහණෙනි, එ පරිද්දෙන් ම ‘මොහු ශමථවිදර්ශනා ධර්මයෝ ය යි සිහිකිරීම් පමණෙක් ම වී ය.

10. මහණෙනි, මා විසින් (සිවුරගින් යුත්) වීර්‍ය්‍ය පටන්ගන්නා ලදී. (එබැවින්) එය නො සැඟුනේ වී. සිහිය එළඹ සිටියා ය (එබැවින්ම එය මුළා නොවූ ය. කය සන්සිඳුණේ ය. (එබැවින් ම) පහවූ දැවිලි ඇත්තේ විය. සිත මැනැවින් පිහිටුවන ලදී. (එබැවින් ම) එකඟ විය. මහණෙනි, ඒ මම කාමයන්ගෙන් වෙන්ව ම අකුශල ධර්මයන්ගෙන් වෙන්ව ම විතර්ක සහිත වූ විචාර සහිත වූ විවෙකයෙන් හටගත් ප්‍රීතිය හා සුව ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි. –

විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහාසිං. පීතියා ච විරාගා උපෙක්ඛකො[1] ච විහාසිං සතො ච සම්පජානො. සුඛඤ්ච කායෙන පටිසංවෙදෙසිං. යං තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියං ඣානං උපසම්පජ්ජ විහාසිං. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහාසිං.

11. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙසිං. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසතිම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි, අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ "අමුත්‍රාසිං එවන්නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛ-දුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං එවන්නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛ-දුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො" ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි. අයං ඛො මෙ භික්ඛවෙ රත්තියා පඨමෙ යාමෙ පඨමා විජ්ජා අධිගතා අවිජ්ජා විහතා. විජ්ජා උප්පන්නා තමො විහතො ආලොකො උප්පන්නො යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

12. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙසිං. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ, යථාකම්මූපගෙ සත්තෙ පජානාමි: –

---

1. උපෙඛකො, සීමු.

විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් තමා තුළ පැහැදීම දනවන සිත්හි එකඟ බව ඇති විතර්ක රහිත වූ විචාර රහිත වූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සුව ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි. ප්‍රීතිය ද දුරු වීමෙන් මැදහත්ව ම වාසය කෙළෙමි. සිහි ඇත්තෙම් මනා නුවණ ඇත්තෙම් කයින් සුවය ද වින්දෙමි. ආර්‍ය්‍යයෝ 'උපෙක්‍ෂා ඇත්තේ සමෘතිමත් වූයේ සුඛවිහරණ ඇත්තේ ය' යි යම් ධ්‍යානයක් වර්‍ණනා කරත් ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි. සුවය ද දුරු කිරීමෙන් දුක ද නැති කිරීමෙන් පෙර ම සොම්නස් දොම්නසුන්ගේ වැනසීමෙන් නො දුක් වූ නො සුව වූ උපෙක්‍ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදු බව ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි.

11. ඒ මම මෙසේ සමාධිගත සිත පිරිසිදු කල්හි, ප්‍රභාස්වර කල්හි, කෙලෙස් රහිත කල්හි, පහ වූ උපක්ලේශ ඇති කල්හි, මොළොක් වූ කල්හි, භාවනා කර්මයට සුදුසු කල්හි, ස්ථිති ප්‍රාප්ත කල්හි, නො සැලෙන බවට පැමිණි කල්හි, පෙර විසූ කඳ පිළිවෙළ සිහි කරන නුවණ පිණිස සිත මෙසෙසින් නැඹුරු කෙළෙමි. ඒ මම නොයෙක් ආකාර වූ පෙර විසූ කඳ පිළිවෙළ සිහි කරමි එනම්- ජාති එකක් ද ජාති දෙකක් ද ජාති තුනක් ද ජාති සතරක් ද ජාති පසක් ද ජාති ද සයක් ද ජාති විස්සක් ද ජාති තිසක් ද ජාති සතළිසක් ද ජාති පණසක් ද ජාති සියයක් ද ජාති දහසක් ද ජාති සියදහසක් ද, නොයෙක් නස්නා කල්පයන් ද නොයෙක් වැඩෙනා කල්පයන් ද නොයෙක් නැසෙන වැඩෙන කල්පයන් ද - "අසුවල් තැන උපනිමි. මෙ නම් ඇත්තෙම් වීමි. මෙනම් ගොත්‍ර ඇත්තෙම් වීමි. මේ වැනි පැහැ ඇත්තෙම් වීමි. මෙ වැනි ආහාර ඇත්තෙම් වීමි. මෙ වැනි සුවදුක් විඳින්නෙකිම් වීමි. මෙ වැනි ආයු කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම ඉන් ච්‍යුතව අසුවල් තැන උපනිමි. එහිදී ද මෙනම් ඇත්තෙම් වීමි. මෙ නම් ගෝත්‍ර ඇත්තෙම් වීමි. මෙ වැනි පැහැ ඇත්තෙම් වීමි. මෙ වැනි ආහාර ඇත්තෙම් වීමි. මෙ වැනි සුවදුක් විඳින්දෙකිම් වීමි. මෙ වැනි ආයු කෙළවර කොට ඇත්තෙම් වීමි. එ මම ඉන් ච්‍යුතව මෙහි උපන්නෙම් වෙමැ"යි මෙසේ ආකාර සහිත වූ උදෙසීම් සහිත වූ නන් වැදෑරුම් වූ පෙර විසූ කඳපිළිවෙළ සිහි කරමි. මහණෙනි, මා විසින් රෑය පිළිබඳ පළමුයම්හි මේ පළමුවන විද්‍යාව ලබන ලදී. අවිද්‍යාව නසන ලදී. විද්‍යාව උපන. මොහඳුරු නැසිණ. නැණළු උපන. අප්‍රමාදව කෙලෙස් තවන වැර ඇතිව නිවනට මෙහෙයූ සිත් ඇතිව වසන්නහුට යම්සේ නම් එසේ ය.

12. ඒ මම මෙසේ සමාධිගත සිත පිරිසිදු කල්හි ප්‍රභාස්වර කල්හි කෙලෙස් රහිත කල්හි පහ වූ උපක්ලේශ ඇති කල්හි මොළොක් වූ කල්හි භාවනා කර්මයට සුදුසු කල්හි ස්ථිති ප්‍රාප්තකල්හි නො සැලෙන බවට පැමිණි කල්හි සත්ත්වයන්ගේ ච්‍යුතිඋත්පත්ති දන්නා නුවණ පිණිස සිත මෙසෙසින් නැඹුරු කෙළෙමි. ඒ මම ඉතා පිරිසිදු වූ මිනිසැස ඉක්ම වූ දිවැසින් - මැරෙන උපදින උසස් පහත් මනා පැහැ ඇති සුගතියට ගිය දුගතියට ගිය සත්ත්වයන් දකිමි. කම් වූ පරිදි මිය පරලොව යන සත්ත්වයන් දනිමි: -

"ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා, වචීදුච්චරිතෙන සමන්නාගතා, මනොදුච්චරිතෙන සමන්නාගතා, අරියානං උපවාදකා, මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා, වචීසුචරිතෙන සමන්නාගතා, මනොසුචරිතෙන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා"ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ, යථාකම්මූපගෙ සත්තෙ පජානාමි. අයං ඛො මෙ භික්ඛවෙ රත්තියා මජ්ඣිමෙ යාමෙ දුතියා විජ්ජා අධිගතා, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

13. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙසිං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං අබ්භඤ්ඤාසිං. අයං දුක්ඛසමුදයොති යථාභූතං අබ්භඤ්ඤාසිං. අයං දුක්ඛනිරොධොති යථාභූතං අබ්භඤ්ඤාසිං. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං අබ්භඤ්ඤාසිං. ඉමෙ ආසවාති යථාභූතං අබ්භඤ්ඤාසිං. අයං ආසවසමුදයොති යථාභූතං අබ්භඤ්ඤාසිං. අයං ආසවනිරොධොති යථාභූතං අබ්භඤ්ඤාසිං. අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං අබ්භඤ්ඤාසිං. තස්ස මෙ එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චිත්ථ. භවාසවාපි චිත්තං විමුත්ථ. අවිජ්ජාසවාපි චිත්තං විමුච්චිත්ථ. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං අහොසි. 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති අබ්භඤ්ඤාසිං. අයං ඛො මෙ භික්ඛවෙ රත්තියා පච්ඡිමෙ යාමෙ තතියා විජ්ජා අධිගතා, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

14. සෙය්‍යථාපි භික්ඛවෙ අරඤ්ඤෙ පවනෙ මහන්තං නින්නං පල්ලලං, තමෙනං මහාමිගසඞ්ඝො උපනිස්සාය විහරෙය්‍ය. තස්ස කොචිදෙව පුරිසො උප්පජ්ජෙය්‍ය අනත්ථකාමො අහිතකාමො අයොගක්ඛෙමකාමො, සො ය්වාස්ස මග්ගො ඛෙමො සොවත්ථිකො පීතිගමනීයො, තං මග්ගං පිදහෙය්‍ය විවරෙය්‍ය කුම්මග්ගං. ඔදහෙය්‍ය ඔකචරං, ඨපෙය්‍ය ඔකචාරිකං. –

"මේ භවත් සත්ත්වයෝ ඒකාන්තයෙන් කායදුශ්චරිතයෙන් යුක්ත වූවෝ ය. වාග්දුශ්චරිතයෙන් යුක්ත වූවෝ ය. මනොදුශ්චරිතයෙන් යුක්ත වූවෝ ය. ආය්‍යෝපවාද කරන්නෝ ය මිසදිටුවෝ ය. මිසදිටුකම් සමාදන් වූවෝ ය. ඔහු කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට පිහිට වන විවසව පතිතවන නරකයෙහි උපන්නාහු ය. මේ භවත් සත්ත්වයෝ වනාහි කායසුචරිතයෙන් යුක්තයෝ ය. වාක්සුචරිතයෙන් යුක්තයෝ ය. මනඃසුචරිතයෙන් යුක්තයෝ ය. ආය්‍යෝපවාද නොකරන්නෝ ය. සම්දිටුවෝ ය. සම්දිටුකම් සමාදන් වූ වෝය. ඔහු කාබුන් මරණින් මතු සුගතිනම් වූ ස්වර්ගලොකයෙහි උපන්නෝය." මෙසේ පිරිසිදු වූ මිනිසැස ඉක්ම වූ දිවැසින්-උපදින මැරෙන උසස් පහත් මනා පැහැ ඇති නො මනා පැහැ ඇති සුගතියට ගිය දුගතියට ගිය සත්ත්වයන් දකිමි. කම් වූ පරිදි මිය පරලොව යන සත්ත්වයන් දනිමි. මහණෙනි, මා විසින් රෑය පිළිබඳ මැදුම්යමෙහි මේ දෙවන විද්‍යාව ලබන ලදී. අවිද්‍යාව නසන ලදී. විද්‍යාව උපන. මොහඳුර නැසිණ. නැණලු උපන. අප්‍රමත්තව කෙලෙස් තවන වැර ඇතිව නිවනට මෙහෙයූ සිතැතිව වසන්නහුට යම්සේ නම් එසේ ය.

13. ඒ මම මෙසේ සමාධිගත සිත පිරිසිදු කල්හි ප්‍රභාස්වර කල්හි කෙලෙස් රහිත කල්හි පහ වූ උපක්ලේශ ඇති කල්හි මොළොක් වූ කල්හි භාවනාකර්මයට සුදුසු කල්හි ස්ථිතිප්‍රාප්ත කල්හි නොසැලෙන-බවට පැමිණි කල්හි ආස්‍රවයන් ක්ෂය කරන ඥානය පිණිස සිත වෙසෙසින් නැඹුරු කෙළෙමි. ඒ මම මේ දුක්ඛ යි තතුලෙස දනිමි. මේ දුක් හට ගැනීමේ හෙතුය යි තතුලෙස දනිමි. මේ දුක් නැති කිරීම ය යි තතුලෙස දනිමි. මේ දුක් නැතිකිරීමේ පිළිවෙතය යි තතුලෙස දනිමි. මේ ආස්‍රවයහ යි තතුලෙස දනිමි. මේ ආස්‍රවයන්ගේ සමුදය යැයි තතුලෙස දනිමි. මේ ආස්‍රවනිරොධ යැ යි තතුලෙස දනිමි. මේ ආස්‍රවනිරොධගාමිනී ප්‍රතිපදා යැ යි තතුලෙස දනිමි. මෙසේ දන්නා වූ මෙසේ දක්නා වූ මාගේ සිත කාමාස්‍ර-වයෙන් ද මිදුණේ ය. භවාස්‍රවයෙන් ද සිත මිදුණේ ය අවිද්‍යාස්‍රවයෙන් ද සිත මිදුණේ ය. මිදුණු කල්හි මිදිණ යි නුවණ විය. 'උපත නැති විය. බඹසර වැස නිමවන ලදි. කළයුතු කිස කරන ලදි. මේ අර්හත්ත්වය පිණිස කළයුතු අනෙකෙක් නැතැ' යි දනිමි. මහණෙනි, මං විසින් රෑය පිළිබඳ පැසුළුයමෙහි මේ තුන්වැනි විද්‍යාව ලබන ලදී. අවිද්‍යාව නසන ලදී. විද්‍යාව උපන. මොහඳුරු නැසිණ. නැණලු උපන. අප්‍රමත්තව කෙලෙස් තවන වැර ඇතිව නිවනට මෙහෙයූ සිත් ඇතිව වසන්නහුට යම්සේ වේ නම් එසේ ය.

14. මහණෙනි, මහවනයෙහි වනලැහැබෙක යම්බඳු මහත් නොගැඹුරු කුඩා දියවිලෙක් වේ ද, මහත් මුවරැළෙක් එය ඇසුරු කොට වසන්නේ ය. ඒ මුවරැළට අවැඩ කැමැති අහිත කැමැති භය කැමැති කිසියම් පුරුෂයෙක් පහළ වන්නේ ය. හෙතෙමේ නිර්භය වූ සුව එළවන ප්‍රීතියෙන් යා හැකි මගෙක් වන්නේ ද, ඒ මග වසන්නේ ය. නොමග විවෘත කරන්නේ ය. සේ මුවකු සිටුවන්නේ ය. සේ මුවදෙනක සිටුු-වන්නේ ය. -

එවං හි සො භික්ඛවෙ මහාමිගසඞ්ඝො අපරෙන සමයෙන අනයව්‍යසනං[1] තනුත්තං[2] ආපජ්ජෙය්‍ය. තස්සෙව ඛො පන භික්ඛවෙ මහතො මිගසඞ්ඝස්ස කොචිදෙව පුරිසො උප්පජ්ජෙය්‍ය අත්ථකාමො හිතකාමො යොගක්ඛෙමකාමො, සො යවාස්ස මග්ගො ඛෙමො සොවත්ථිකො පීතිගමනීයො, තං මග්ගං විවරෙය්‍ය, පිදහෙය්‍ය කුම්මග්ගං, ඌහනෙය්‍ය ඔකචරං, නාසෙය්‍ය ඔකචාරිකං. එවං හි සො භික්ඛවෙ මහාමිගසඞ්ඝො අපරෙන සමයෙන වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍ය.

15. උපමා ඛො මෙ අයං භික්ඛවෙ කතා අත්ථස්ස විඤ්ඤාපනාය. අයඤ්චෙවෙත්ථ අත්ථො: මහන්තං නින්නං පල්ලලන්ති ඛො භික්ඛවෙ කාමානමෙතං අධිවචනං මහාමිගසඞ්ඝොති ඛො භික්ඛවෙ සත්තානමෙතං අධිවචනං. පුරිසො අනත්ථකාමො අහිතකාමො අයොගක්ඛෙමකාමොති ඛො භික්ඛවෙ මාරස්සෙතං පාපිමතො අධිවචනං. කුම්මග්ගොති ඛො භික්ඛවෙ අට්ඨඞ්ගිකස්සෙතං මිච්ඡාමග්ගස්ස අධිවචනං සෙය්‍යථිදං: මිච්ඡාදිට්ඨියා මිච්ඡාසඞ්කප්පස්ස මිච්ඡාවාචාය මිච්ඡාකම්මන්තස්ස මිච්ඡාආජීවස්ස මිච්ඡාවායාමස්ස මිච්ඡාසතියා මිච්ඡාසමාධිස්ස. ඔකචරොති ඛො භික්ඛවෙ නන්දිරාගස්සෙතං අධිවචනං. ඔකචාරිකාති ඛො භික්ඛවෙ අවිජ්ජායෙතං අධිවචනං. පුරිසො අත්ථකාමො යොගක්ඛෙමකාමොති ඛො භික්ඛවෙ තථාගතස්සෙතං අධිවචනං අරහතො සම්මාසම්බුද්ධස්ස. ඛෙමො මග්ගො සොවත්ථිකො පීතිගමනීයොති ඛො භික්ඛවෙ අරියස්සෙතං අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස අධිවචනං. සෙය්‍යථිදං: සම්මාදිට්ඨියා සම්මාසඞ්කප්පස්ස සම්මාවාචාය සම්මාකම්මන්තස්ස සම්මාආජීවස්ස සම්මාවායාමස්ස සම්මාසතියා සම්මාසමාධිස්ස.

16. ඉති ඛො භික්ඛවෙ විවටො මයා ඛෙමො මග්ගො සොවත්ථිකො පීතිගමනීයො, පිහිතො කුම්මග්ගො, ඌහතො ඔකචරො, නාසිතා ඔකචාරිකා. යං භික්ඛවෙ සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පං උපාදාය, කතං වො තං මයා. එතානි භික්ඛවෙ රුක්ඛමූලානි, එතානි සුඤ්ඤාගාරානි. ඣායථ භික්ඛවෙ, මා පමාදත්ථ, මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ. අයං වො අම්හාකං අනුසාසනීති

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

ද්වෙධාවිතක්කසුත්තං නවමං.

---

1. අනයව්‍යසනං, මජසං.
2. තනුත්තන්ති පදං මරම්මඡට්ඨසඞ්ගීති පිටක පොත්ථකෙ න දිස්සති.

මහණෙනි, මෙසේ වනාහි ඒ මහමුවරැල පසුකලෙක අනයව්‍යසනයට පත්වූයේ වෙයි. මහණෙනි, ඒ මහත් මුවරැළට ම වැඩ කැමැති හිත කැමැති අභය කැමැති කිසියම් පුරුෂයෙක් පහළ වන්නේ ය. හෙ තෙමේ නිර්භය වූ සුව එළවන ප්‍රීතියෙන් යා හැකි යම් මාර්ගයෙක් වන්නේ ද, ඒ මග විවෘත කරන්නේ ය. නොමග වසන්නේ ය. සේ මුවා නසන්නේ ය. සේ මුවදෙන නසන්නේ ය. මහණෙනි, මෙසේ වනාහි ඒ මහමුවරැල තෙමේ පසු කලෙක වැඩීමට පැතිරීමට මහත්බවට පැමිණෙන්නේ ය.

15. මහණෙනි, අර්ථය හැඟවීම පිණිස මා විසින් මේ උපමාව කරන ලද්දී ය. මෙහි මේ අදහස වේ: මහණෙනි, "මහන්තං නින්නං පල්ලලං" යන මෙය කාමයනට නමෙකි. මහණෙනි, "මහාමිගසඞ්ඝො" යන මෙය සත්ත්වයනට නමෙකි. මහණෙනි, "පුරිසො අනත්ථකාමො අහිතකාමො අයොගක්ඛෙම-කාමො" යන මෙය පාපී වූ මාරයාට නමෙකි. "කුම්මග්ගො" යන මෙය මිථ්‍යාදෘෂ්ටිය මිථ්‍යාසංකල්පය මිථ්‍යාවචනය මිථ්‍යාකර්මාන්තය මිථ්‍යාආජීවය මිථ්‍යාව්‍යායාමය මිථ්‍යාස්මෘතිය මිථ්‍යාසමාධියැ යි අටඟින් යුක්ත වූ මිථ්‍යා-මාර්ගයට නමෙකි. මහණෙනි, "ඔකචරො" යන මෙය නන්දිරාගයට නමෙකි. මහණෙනි, 'ඔකචාරිකා' යන මෙය අවිද්‍යාවට නමෙකි. මහණෙනි, "පුරිසො අත්ථකාමො යොගක්ඛෙමකාමො" යන මෙය තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමෙකි. මහණෙනි, "ඛෙමො මග්ගො සොවත්ථිකො පීතිගමනීයො" යන මෙය සම්‍යග්දෘෂ්ටිය සම්‍යක්සංකල්පය සම්‍යග්වචනය සම්‍යක්කර්මාන්තය සම්‍යගාජීවය සම්‍යග්ව්‍යායාමය සම්‍යක් ස්මෘතිය සම්‍යක්සමාධි යැයි අටඟින් යුක්ත වූ ආර්‍යමාර්ගයට නමෙකි.

16. මහණෙනි, මෙසේ මා විසින් නිර්භය වූ සුව එළවන ප්‍රීතියෙන් යා හැකි මාර්ගය විවෘත කරන ලද්දේ ය. නොමග වසන ලද්දේ ය. සේ මුවා නසන ලද්දේ ය. සේ මුවදෙන නසන ලද්දේ ය. මහණෙනි, ශ්‍රාවකයනට හිත කැමැති අනුකම්පා ඇති ශාස්තෘවරයකු විසින් අනුකම්පාවෙන් යමක් කළයුතු ද, එය මා විසින් තොපට කරනලදි. මහණෙනි, මෙල වෘක්ෂමූලයෝ ය, මෙල ශූන්‍යාගාරයෝ ය. මහණෙනි, ධ්‍යාන කරවු. නාමක් පමාවවු. පසුව නාමක් විපිළිසරවවු මේ තොපට අපගේ අනුශාසනා යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව මැනැවැ යි පිළිගත්හ.

ද්වෙධාවිතක්ක සූත්‍රය නවවැනි යි.

1. 2. 10.

විතක්කසණ්ඨානසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. අධිචිත්තමනුයුත්තෙන භික්ඛවෙ භික්ඛුනා පඤ්ච නිමිත්තානි කාලෙන කාලං මනසිකාතබ්බානි. කතමානි පඤ්ච?

3. ඉධ භික්ඛවෙ භික්ඛුනො යං නිමිත්තං ආගම්ම යං නිමිත්තං මනසිකරොතො උප්පජ්ජන්ති පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දෙසූපසංහිතාපි මොහූපසංහිතාපි, තෙන භික්ඛවෙ භික්ඛුනා තම්හා නිමිත්තා අඤ්ඤං නිමිත්තං මනසිකාතබ්බං කුසලූපසංහිතං. තස්ස තම්හා නිමිත්තා අඤ්ඤං නිමිත්තං මනසිකරොතො කුසලූපසංහිතං, යෙ පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දෙසූපසංහිතාපි මොහූපසංහිතාපි, තෙ පහීයන්ති. තෙ අබ්භත්ථං ගච්ඡන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති[1], සමාධියති. සෙය්‍යථාපි භික්ඛවෙ දක්ඛො පලගණ්ඩො වා පලගණ්ඩන්තෙවාසී වා සුඛුමාය ආණියා ඔළාරිකං ආණිං අභිනිහනෙය්‍ය[2] අභිනීහරෙය්‍ය අභිනිවජ්ජෙය්‍ය,[3] එවමෙව ඛො භික්ඛවෙ භික්ඛුනො යං නිමිත්තං ආගම්ම යං නිමිත්තං මනසිකරොතො උප්පජ්ජන්ති පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දෙසූපසංහිතාපි මොහූපසංහිතාපි, තෙන භික්ඛවෙ භික්ඛුනා තම්හා නිමිත්තා අඤ්ඤං නිමිත්තං මනසිකාතබ්බං කුසලූපසංහිතං. යෙ පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දෙසූපසංහිතාපි මොහූපසංහිතාපි තෙ පහීයන්ති. තෙ අබ්භත්ථං ගච්ඡන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති. [1. අඤ්ඤනිමිත්තපබ්බං.]

4. තස්ස චෙ භික්ඛවෙ භික්ඛුනො තම්හා නිමිත්තා අඤ්ඤං නිමිත්තං මනසිකරොතො කුසලූපසංහිතං උප්පජ්ජන්තෙව පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දෙසූපසංහිතාපි මොහූපසංහිතාපි, තෙන භික්ඛවෙ භික්ඛුනා තෙසං විතක්කානං ආදීනවො උපපරික්ඛිතබ්බො: ඉතිපිමෙ විතක්කා අකුසලා, ඉතිපිමෙ විතක්කා සාවජ්ජා, ඉතිපිමෙ විතක්කා දුක්ඛවිපාකාති. තස්ස තෙසං විතක්කානං ආදීනවං උපපරික්ඛතො යෙ පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දෙසූපසංහිතාපි මොහූපසංහිතාපි, තෙ පහීයන්ති. තෙ අබ්භත්ථං ගච්ඡන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති. –

---

1. හොසි, මජසං. 2. අභිනිහනෙය්‍ය, මජසං. 3. අභිනිවත්තෙය්‍ය, මජසං.

1. 2. 10.

විතක්කසණ්ඨාන සූත්‍රය

1. **මා** විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු වහන්ස, යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක:

2. මහණෙනි, අධිචිත්තයෙහි (විදර්ශනාපාදක අෂ්ටසමාපත්ති චිත්තයෙහි) යෙදුණු මහණහු විසින් කලින් කල කරුණු පසෙක් මෙනෙහි කළයුතුය. කවර පසෙක් ද යත්:

3. මහණෙනි, මේ ශාසනයෙහි යම් අරමුණකට පැමිණ යම් අරමුණක් මෙනෙහි කරන මහණහුට ලොභසහගත වූත් ද්වෙෂසහගත වූත් මොහසහගත වූත් ලාමක වූ අකුශල විතර්කයෝ උපදිත් ද, මහණෙනි, ඒ මහණහු විසින් ඒ නිමිත්තෙන් අන්‍ය වූ කුශලයෙන් යුක්ත වූ නිමිත්තෙක් මෙනෙහි කළ යුතුය. ඒ නිමිත්තෙන් අන්‍ය වූ කුශලයෙන් යුක්ත වූ නිමිත්තක් මෙනෙහි කරන්නා වූ ඔහුට ලොභසහගත වූත් ද්වෙෂසහගත වූත් මොහ සහගත වූත් ලාමක වූ යම් අකුශලවිතර්කයෝ වෙත් ද, ඔහු ප්‍රහීණ වෙත්. ඔහු විනාශයට යෙත්. ඔවුන් ප්‍රහීණ වීමෙන් සිය සන්තන්හි සිත පිහිටයි. මොනවට තැන්පත් වෙයි. එකඟ වෙයි. සමාධිගත වෙයි. මහණෙනි, යම් සේ දක්‍ෂ වඩුවෙක් හෝ වඩු අතැවැස්සෙක් හෝ සියුම් ඇණයකින් මහ ඇණයකට ගසන්නේ ද, (ගසමින් ප්‍රවරුවෙන්) බැහැර කරන්නේ ද, (අතින්) ඇද දමන්නේ ද, මහණෙනි, එසේ ම යම් අරමුණකට පැමිණ යම් අරමුණක් මෙනෙහි කරන්නා වූ මහණහට ලොභසහගත වූත් ද්වෙෂසහගත වූත් මොහසහගත වූත් ලාමක අකුශලවිතර්කයෝ උපදිත් ද, මහණෙනි, ඒ මහණහු විසින් ඒ නිමිත්තෙන් අන්‍ය වූ කුශලයෙන් යුක්ත වූ නිමිත්තෙක් මෙනෙහි කළයුතු ය. ඒ නිමිත්තෙන් අන්‍ය වූ කුශලයෙන් යුක්ත වූ නිමිත්තක් මෙනෙහි කරන්නා වූ ඔහුට ලොභසහගත වූත් ද්වෙෂසහගත වූත් මොහසහගත වූත් ලාමක වූ යම් අකුශල විතර්කයෝ වෙත් ද, ඔහු ප්‍රහීණ වෙත්. විනාශයට යෙත් ඔවුන් ප්‍රහීණ වීමෙන් සන්තානයෙහි සිත පිහිටයි. මොනවට තැන්පත් වෙයි. එකඟ වෙයි. සමාධිගත වෙයි. (1.)

4. මහණෙනි, ඒ නිමිත්තෙන් අන්‍ය වූ කුශලයෙන් යුක්ත වූ නිමිත්තක් මෙනෙහි කරන ඔහුට ලොභසහගත වූත් ද්වෙෂසහගත වූත් මොහසහගත වූත් ලාමක අකුශල විතර්කයෝ උපදිත් ම නම් මහණෙනි ඒ මහණහු විසින් "මෙයිනුදු මේ විතර්කයෝ අකුශලයහ. මෙයිනුදු මේ විතර්කයෝ සාවද්‍යයහ. මෙයිනුදු මේ විතර්කයෝ දුඃඛ විපාකයහ" යි ඒ විතර්කයන්ගේ දෝෂය පිරික්සිය යුතු යි. ඒ විතර්කයන්ගේ දෝෂය පරීක්ෂා කරන්නා වූ ඔහුට ලොභසහගත වූත් ද්වෙෂසහගත වූත් මොහසහගත වූත් ලාමක වූ යම් අකුශලවිතර්කයෝ වෙත් ද ඔහු ප්‍රහීණ වෙත්. ඔහු විනාශයට යෙත් ඔවුන් ප්‍රහීණ වීමෙන් සියසන්තන්හි ම සිත පිහිටයි. මොනවට තැන්පත් වෙයි. එකඟ වෙයි. සමාධිගත වෙයි.

සෙය්‍යථාපි භික්ඛවෙ ඉත්ථි වා පුරිසො වා දහරො යුවා මණ්ඩනකජාතිකො අහිකුණපෙන වා කුක්කුරකුණපෙන වා මනුස්සකුණපෙන වා කණ්ඨෙ ආසත්තෙන අට්ටීයෙය්‍ය හරායෙය්‍ය ජිගුච්ඡෙය්‍ය, එවමෙව ඛො භික්ඛවෙ තස්ස චෙ භික්ඛුනො තම්හාපි[1] නිමිත්තා අඤ්ඤං නිමිත්තං මනසිකරොතො කුසලූපසංහිතං උප්පජ්ජන්තෙව පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි, තෙන භික්ඛවෙ භික්ඛුනා තෙසං විතක්කානං ආදීනවො උපපරික්ඛිතබ්බො: ඉතිපිමෙ විතක්කා අකුසලා, ඉතිපිමෙ විතක්කා සාවජ්ජා, ඉතිපිමෙ විතක්කා දුක්ඛවිපාකාති. තස්ස තෙසං විතක්කානං ආදීනවං උපපරික්ඛතො යෙ පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි, තෙ පහීයන්ති. තෙ අබ්භත්ථං ගච්ඡන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති. [2. ආදීනවපබ්බං.]

5. තස්ස චෙ භික්ඛවෙ භික්ඛුනො තෙසං[2] විතක්කානං ආදීනවං උපපරික්ඛතො උප්පජ්ජන්තෙව පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි, තෙන භික්ඛවෙ භික්ඛුනා තෙසං[3] විතක්කානං අසති අමනසිකාරො ආපජ්ජිතබ්බො. තස්ස තෙසං විතක්කානං අසති අමනසිකාරං ආපජ්ජතො යෙ පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි, තෙ පහීයන්ති. තෙ අබ්භත්ථං ගච්ඡන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති. සෙය්‍යථාපි භික්ඛවෙ චක්ඛුමා පුරිසො ආපාථගතානං රූපානං අදස්සනකාමො අස්ස, සො නිමීලෙය්‍ය[4] වා අඤ්ඤෙන වා අපලොකෙය්‍ය. එවමෙව ඛො භික්ඛවෙ තස්ස චෙ භික්ඛුනො තෙසම්පි විතක්කානං ආදීනවං උපපරික්ඛතො උප්පජ්ජන්තෙව පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි, තෙන භික්ඛවෙ භික්ඛුනා තෙසං විතක්කානං අසති අමනසිකාරො ආපජ්ජිතබ්බො. තස්ස තෙසං විතක්කානං අසති අමනසිකාරං ආපජ්ජතො යෙ පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි* තෙ පහීයන්ති තෙ අබ්භත්ථං ගච්ඡන්ති, තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති. [3. අසතිපබ්බං.]

6. තස්ස චෙ භික්ඛවෙ භික්ඛුනො තෙසම්පි විතක්කානං අසති අමනසිකාරං ආපජ්ජතො උප්පජ්ජන්තෙව පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි, තෙන භික්ඛවෙ භික්ඛුනා තෙසං විතක්කානං විතක්කසඞ්ඛාරසණ්ඨානං[5] මනසි කාතබ්බං. තස්ස තෙසං විතක්කානං විතක්කසඞ්ඛාරසණ්ඨානං මනසිකරොතො යෙ පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි, තෙ පහීයන්ති තෙ අබ්භත්ථං ගච්ඡන්ති. තෙසං පහානා ජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති.

---

1. තම්හා ච, සයා. 2. තෙසම්පි, මජසං. 3. තෙසං යෙව, අට්.
4. නිමීලෙය්‍ය, සයා. 5. විතක්ක සඞ්ඛාර සණ්ඨානං, සයා. අට්ඨකථා.
* 'තෙන භික්ඛවෙ -පෙ- මොහූපසංහිතාපි' පාඨො ස.
මරම්මඡට්ඨසඞ්ගීතිපිටකපොත්ථකෙ න දිස්සතෙ.

Free Distribution www.aathaapi.org

මහණෙනි, යම් සේ තරුණ වූ සැරසෙන සුළු ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ගෙලෙහි ලැගුණු සප්කුණකින් හෝ බලුකුණකින් හෝ මිනිස්කුණකින් හෝ හටගත් දුක් ඇත්තේ වන්නේ ද, ලජ්ජිත වන්නේ ද හටගත් පිළිකුල් ඇත්තේ වන්නේ ද, මහණෙනි, එ පරිද්දෙන් ම ඒ නිමිත්තයෙන් ද අන්‍ය වූ කුශලයෙන් යුක්ත වූ නිමිත්තක් මෙනෙහි කරන්නා වූ ඒ මහණහට ලෝභසහගත වූත් ද්වේෂසහගත වූත් මෝහසහගත වූත් ලාමක වූ අකුශල විතර්කයෝ උපදිත් ම නම් මහණෙනි, ඒ මහණහු විසින් "මෙසිතුදු මේ විතර්කයෝ අකුශලයහ. මෙසිතුදු මේ විතර්කයෝ සාවද්‍යයහ. මෙසිතුදු මේ විතර්කයෝ දුඃඛවිපාකයහ "යි ඒ විතර්කයන්ගේ දෝෂය පරීක්ෂා කොට බැලිය යුතු ය. ඒ විතර්කයන්ගේ දෝෂය පරීක්ෂා කරන්නා වූ ඔහුට ලෝභසහගත වූත් ද්වේෂසහගත වූත් මෝහසහගත වූත් යම් ලාමක වූ අකුශලවිතර්කයෝ වෙත් ද, ඔහු ප්‍රහීණ වෙත්. ඔහු විනාශයට යෙත්. ඔවුත් ප්‍රහීණ වීමෙන් සන්තානයෙහි ම සිත පිහිටයි. මොනවට තැන්පත් වෙයි. එකඟ වෙයි. සමාධිගත වෙයි. (2)

5. මහණෙනි, ඒ විතර්කයන්ගේ දෝෂය පරීක්ෂා කරන්නා වූ ඒ මහණහට ලෝභසහගත වූත් ද්වේෂසහගත වූත් මෝහසහගත වූත් ලාමක වූ විතර්කයෝ උපදිත් ම නම්, මහණෙනි, ඒ මහණහු විසින් ඒ අකුශලවිතර්කයන් නො සිහි කිරීමට නො මෙනෙහි කිරීමට පැමිණීම මැනැවි. ඒ විතර්කයන් නො සිහි කිරීමට නො මෙනෙහි කිරීමට පැමිණෙන්නා වූ ඔහුට ලෝභසහගත වූත් ද්වේෂසහගත වූත් මෝහසහගත වූත් යම් ලාමක අකුශලවිතර්කයෝ වෙත් ද, ඔහු ප්‍රහීණ වෙත්. ඔහු විනාශයට යෙත්. ඔවුත් ප්‍රහීණ වීමෙන් ඇතුළත ම සිත පිහිටයි. මොනවට තැන්පත් වෙයි. එකඟ වෙයි. සමාධිගත වෙයි. මහණෙනි, යම් සේ ඇස් ඇති පුරුෂයෙක් හමුවට පැමිණි රූපයන් නො දකිනු කැමැත්තේ වන්නේ ද, හෙතෙමේ ඇස් පියා ගන්නේ හෝ වේ ද, අන් දෙසක් බලන්නේ හෝ වේ ද, මහණෙනි, එ පරිද්දෙන් ම ඒ විතර්කයන්ගේ දෝෂය පරීක්ෂා කරන්නා වූ මහණහට ලෝභසහගත වූත් ද්වේෂසහගත වූත් මෝහසහගත වූත් ලාමක අකුශල විතර්කයෝ උපදිත් ම නම් මහණෙනි, ඒ මහණහු විසින් ඒ විතර්කයන් නො සිහි කිරීමට නො මෙනෙහි කිරීමට පැමිණීම මැනැවි. ඒ විතර්කයන් නො සිහි කිරීමට නො මෙනෙහි කිරීමට පැමිණෙන්නා වූ ඔහුට ලෝභසහගත වූත් ද්වේෂසහගත වූත් මෝහසහගත වූත් යම් ලාමක වූ අකුශල විතර්කයෝ වෙත් ද, ඔහු ප්‍රහීණ වෙත්. ඔහු විනාශයට යෙත් ඔවුත් ප්‍රහීණ වීමෙන් සන්තානයෙහි ම සිත පිහිටයි. මොනවට තැන්පත් වෙයි. එකඟ වෙයි. සමාධිගත වෙයි (3)

6. මහණෙනි, ඒ විතර්කයන් ද නො සිහි කිරීමට නො මෙනෙහි කිරීමට පැමිණෙන්නා වූ ඔහුට ලෝභසහගත වූත් ද්වේෂසහගත වූත් මෝහසහගත වූත් ලාමක අකුශල විතර්කයෝ උපදිත් ම නම්, මහණෙනි, ඒ මහණහු විසින් ඒ විතර්කයන්ගේ මූලස්ථානය මෙනෙහි කළයුතු යි. ඒ විතර්කයන්ගේ විතර්කමූලස්ථානය මෙනෙහි කරන්නා වූ ඔහුට ලෝභසහගත වූත් ද්වේෂ-සහගත වූත් මෝහසහගත වූත් යම් ලාමක විතර්කයෝ වෙත් ද, ඔහු ප්‍රහීණ වෙත්. ඔහු විනාශයට යෙත්. ඔවුත් ප්‍රහීණ වීමෙන් සන්තානයෙහි ම සිත පිහිටයි. මොනවට තැන්පත් වෙයි. එකඟ වෙයි. සමාධිගත වෙයි.

සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො සීඝං ගච්ඡෙය්‍ය, තස්ස එවමස්ස: කින්නු ඛො අහං සීඝං ගච්ඡාමි, යන්නූනාහං සණිකං ගච්ඡෙය්‍යන්ති. සො සණිකං ගච්ඡෙය්‍ය. තස්ස එවමස්ස: කින්නු ඛො අහං සණිකං ගච්ඡාමි, යන්නූනාහං තිට්ඨෙය්‍යන්ති. සො තිට්ඨෙය්‍ය. තස්ස එවමස්ස: කින්නු ඛො අහං ඨිතො, යන්නූනාහං නිසීදෙය්‍යන්ති. සො නිසීදෙය්‍ය. තස්ස එවමස්ස: කින්නු ඛො අහං නිසින්නො, යන්නූනාහං නිපජ්ජෙය්‍යන්ති. සො නිපජ්ජෙය්‍ය. එවං හි සො භික්ඛවෙ පුරිසො ඔළාරිකං ඔළාරිකං ඉරියාපථං අභිනිවජ්ජෙත්වා[1] සුඛුමං සුඛුමං ඉරියාපථං කප්පෙය්‍ය. එවමෙව ඛො භික්ඛවෙ තස්ස චෙ භික්ඛුනො තෙසම්පි විතක්කානං අසති අමනසිකාරං ආපජ්ජතො උප්පජ්ජන්තෙව පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිත පි, තෙන භික්ඛවෙ භික්ඛුනා තෙසං විතක්කානං විතක්කසඞ්ඛාරසණ්ඨානං මනසිකාතබ්බං. තස්ස තෙසං විතක්කානං විතක්කසඞ්ඛාරසණ්ඨානං මනසිකරොතො යෙ පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි, තෙ පහීයන්ති තෙ අබ්භත්ථං ගච්ඡන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති. [4. විතක්කමූලභෙදපබ්බං.]

7. තස්ස චෙ භික්ඛවෙ භික්ඛුනො තෙසම්පි විතක්කානං විතක්කසඞ්ඛාරසණ්ඨානං මනසිකරොතො උප්පජ්ජන්තෙව පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි, තෙන භික්ඛවෙ භික්ඛුනා දන්තෙ'භිදන්තමාධාය[2] ජිව්හාය තාලුං ආහච්ච චෙතසා චිත්තං අභිනිග්ගණ්හිතබ්බං අභිනිප්පීළෙතබ්බං අභිසන්තාපෙතබ්බං. තස්ස දන්තෙ'භිදන්තමාධාය ජිව්හාය තාලුං ආහච්ච චෙතසා චිත්තං අභිනිග්ගණ්හතො අභිනිප්පීළයතො අභිසන්තාපයතො යෙ පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි, තෙ පහීයන්ති. තෙ අබ්භත්ථං ගච්ඡන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති. සෙය්‍යථාපි භික්ඛවෙ බලවා පුරිසො දුබ්බලතරං පුරිසං සීසෙ වා ගහෙත්වා ඛන්ධෙ වා ගහෙත්වා අභිනිග්ගණ්හෙය්‍ය අභිනිප්පීළෙය්‍ය අභිසන්තාපෙය්‍ය, එවමෙව ඛො භික්ඛවෙ තස්ස චෙ භික්ඛුනො තෙසම්පි විතක්කානං විතක්කසඞ්ඛාරසණ්ඨානං මනසිකරොතො උප්පජ්ජන්තෙව පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි, තෙන භික්ඛවෙ භික්ඛුනා දන්තෙ'භිදන්තමාධාය ජිව්හාය තාලුං ආහච්ච චෙතසා චිත්තං අභිනිග්ගණ්හතො අභිනිප්පීළයතො අභිසන්තාපයතො යෙ පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි, තෙ පහීයන්ති. තෙ අබ්භත්ථං ගච්ඡන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති. [5. අභිනිග්ගණ්හනපබ්බං.]

---

1. අභිනිස්සජ්ජෙත්වා, සයා

2. දන්තෙභීති දන්තමාධාය, බහූසු. "දන්තෙන + අභිදන්තං + ආධායාති ටීකායං පදච්ඡෙදො. දන්තෙභීති පනෙත්ථ කරණත්ථෙ වුත්තං විය දිස්සති" - මජසං "දන්තෙ'භිදන්තමාධායාති හෙට්ඨා දන්තෙ උපරිදන්තං ඨපෙත්වා" - අට්ඨකථා - සිරිධම්මාරාම මුද්දිත.

Free Distribution www.aathaapi.org

මහණෙනි, යම් සේ පුරුෂයෙක් වහා යන්නේ ද, “කුමක් නිසා මම වහා යෙම් ද, මම සෙමෙන් යෙම් නම් යෙහෙකැ” යි ඔහුට මෙ වැනි අදහසෙක් වන්නේ ය. හෙතෙම සෙමෙන් යන්නේ ය. “කුමක් නිසා මම සෙමෙන් යෙම් ද, මම සිටින්නෙම් නම් යෙහෙකැ” යි ඔහුට මෙ වැනි අදහසෙක් වන්නේ ය. හෙතෙමේ සිටින්නේ ය. “කුමක් නිසා මම සිටියෙම් ද, මම හිඳින්නෙම් නම් යෙහෙකැ” යි ඔහුට මෙවැනි අදහසෙක් වන්නේ ය. හෙතෙමේ හිඳිනේ ය. “කුමක් නිසා මම හුන්නෙම් ද, මම හොවින්නෙම් නම් යෙහෙකැ” යි ඔහුට මෙවැනි අදහසෙක් වන්නේ ය. හෙතෙමේ හොවින්නේ ය. මහණෙනි, මෙසේ ඒ පුරුෂ තෙමේ ඉතා දැඩි ඉරියවු දුරු කොට ඉතා සියුම් ඉරියවු පවත් වන්නේ ය. මහණෙනි, එපරිද්දෙන් ම ඒ විතර්කයන් නො සිහි කිරීමට නො මෙනෙහි කිරීමට පැමිණෙන්නා වූ ඒ මහණහට ලොභසහගත වූත් ද්වෙෂසහගත වූත් මොහසහගත වූත් ලාමක අකුශල විතර්කයෝ උපදිත් ම නම් මහණෙනි, ඒ මහණහු විසින් ඒ විතර්කයන්ගේ විතර්කමූලසංස්ථානය මෙනෙහි කළයුතු ය. ඒ විතර්කයන්ගේ විතර්කමූලසංස්ථානය මෙනෙහි කරන්නා වූ ඔහුට ලොභසහගත වූත් ද්වෙෂසහගත වූත් මොහසහගත වූත් යම් ලාමක අකුශලවිතර්කයෝ වෙත් ද, ඔහු ප්‍රහීණ වෙත්. ඔහු විනාශයට යෙත්. ඔවුන් ප්‍රහීණ වීමෙන් සියසතන්හි ම සිත පිහිටයි. මොනවට තැන්පත් වෙයි. එකඟ වෙයි. සමාධිගත වෙයි. (4.)

7. මහණෙනි, ඒ විතර්කයන්ගේ ද විතර්කමූලසංස්ථානය මෙනෙහි කරන්නා වූ ඒ මහණහට ලොභසහගත වූත් ද්වෙෂසහගත වූත් මොහසහගත වූත් ලාමක අකුශල විතර්කයෝ උපදිත් ම නම් මහණෙනි, ඒ මහණහු විසින් (යට) දතෙහි උඩු දත පිහිටුවා දිවෙන් තලු පෙලා කුසල් සිතින් අකුසල් සිත වෙසෙසින් නිගැනිය යුතු ය. වෙසෙසින් පෙළිය යුතු ය. දතෙහි දත පිහිටුවා දිවෙන් තලු පෙලා කුසල් සිතින් අකුසල් සිත වෙසෙසින් නිගන්නා වූ වෙසෙසින් පෙළන්නා වූ වෙසෙසින් තවන්නාවූ ඔහුට ලොභසහගත වූත් ද්වෙෂසහගත වූත් මොහසහගත වූත් යම් ලාමක අකුශල විතර්කයෝ වෙත් ද, ඔහු ප්‍රහීණ වෙත්. ඔහු විනාශයට යෙත්. ඔවුන් ප්‍රහීණ වීමෙන් සියසතන්හි ම සිත පිහිටයි. මොනවට තැන්පත් වෙයි. එකඟ වෙයි. සමාධිගත වෙයි. මහණෙනි, යම් සේ බලවත් පුරුෂයෙක් ඉතා දුබල වූ පුරුෂයකු හිස හෝ ගෙන කඳ හෝ ගෙන වෙසෙසින් නිගන්නේ ද, වෙසෙසින් පෙළන්නේ ද, වෙසෙසින් තවන්නේ ද, මහණෙනි, එ පරිද්දෙන් ම ඒ විතර්කයන්ගේ විතර්කමූලසංස්ථානය මෙනෙහි කරන්නා වූ ඒ මහණහට ලොභසහගත වූත් ද්වෙෂසහගත වූත් මොහ-සහගත වූත් ලාමක අකුශල විතර්කයෝ උපදිත් ම නම් මහණෙනි, ඒ මහණහු විසින් දතෙහි දත පිහිටුවා දිවෙන් තලු පෙලා කුසල් සිතින් අකුසල් සිත වෙසෙසින් නිගැනිය යුතු ය. වෙසෙසින් පෙළිය යුතු ය. වෙසෙසින් තැවිය යුතු ය. දතෙහි දත පිහිටුවා දිවෙන් තලු පෙලා කුසල් සිතින් අකුසල් සිත වෙසෙසින් නිගන්නා වූ වෙසෙසින් පෙළන්නා වූ වෙසෙසින් තවන්නා වූ ඔහුගේ ලොභසහගත වූත් ද්වෙෂසහගත වූත් මොහසහගත වූත් යම් ලාමක අකුශල විතර්කයෝ වෙත් නම් ඔහු ප්‍රහීණ වෙත්. ඔහු විනාශයට යෙත්. ඔවුන් ප්‍රහීණ වීමෙන් සියසතන්හි ම සිත පිහිටයි. මොනවට තැන්පත් වෙයි. එකඟ වෙයි. සමාධිගත වෙයි. (5.)

20

Free Distribution www.aathaapi.org

7 යතො ඛො භික්ඛවෙ භික්ඛුනො යං නිමිත්තං ආගම්ම යං නිමිත්තං මනසිකරොතො උප්පජ්ජන්ති පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි, තස්ස තම්හා නිමිත්තා අඤ්ඤං නිමිත්තං මනසිකරොතො කුසලූපසංහිතං යෙ පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි තෙ පහීයන්ති. තෙ අබ්භත්ථං ගච්ඡන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති.

තෙසම්පි විතක්කානං ආදීනවං උපපරික්ඛතො යෙ පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි තෙ පහීයන්ති. තෙ අබ්භත්ථං ගච්ඡන්ති තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති.

තෙසම්පි විතක්කානං අසති අමනසිකාරං ආපජ්ජතො යෙ පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි තෙ පහීයන්ති. තෙ අබ්භත්ථං ගච්ඡන්ති තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති.

තෙසම්පි විතක්කානං විතක්කසඞ්ඛාරසණ්ඨානං මනසිකරොතො යෙ පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි තෙ පහීයන්ති තෙ අබ්භත්ථං ගච්ඡන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති.

දන්තෙහි'දන්තමාධාය[1] ජිව්හාය තාලුං ආහච්ච චෙතසා චිත්තං අභිනිග්ගණ්හතො අභිනිප්පීළයතො අභිසන්තාපයතො යෙ පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි තෙ පහීයන්ති තෙ අබ්භත්ථං ගච්ඡන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති.

අයං වුච්චති භික්ඛවෙ භික්ඛු වසී විතක්කපරියායපථෙසු: යං විතක්කං ආකඞ්ඛිස්සති තං විතක්කං විතක්කෙස්සති, යං විතක්කං නාකඞ්ඛිස්සති න තං විතක්කං විතක්කෙස්සති, අච්ඡෙච්ඡි තණ්හං, වාවත්තයි[2] සංයොජනං, සම්මා මානාභිසමයා අන්තමකාසි දුක්ඛස්සාති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

විතක්කසණ්ඨානසුත්තං දසමං.

සීහනාදවග්ගො දුතියො.

1. දන්තෙහි දන්තමාධාය, සයා, මජසං PTS. 2. විවත්තයි. මජසං.

7. මහණෙනි, යම් තැනෙක පවත් යම් අරමුණක් ගෙන යම් අරමුණක් මෙනෙහි කරන මහණහට ලොභසහගත වූත් ද්වෙෂසහගත වූත් මොහසහගත වූත් ලාමක අකුශල විතර්කයෝ උපදිත් ද, ඒ නිමිත්තෙන් අන්‍ය වූ කුශලයෙන් යුක්ත වූ නිමිත්තක් මෙනෙහි කරන්නා වූ ඔහුට ලොභසහගත වූත් ද්වෙෂසහගත වූත් මොහසහගත වූත් යම් ලාමක වූ අකුශල විතර්කයෝ වෙත් ද,ඔහු ප්‍රහීණ වෙත්. ඔහු විනාශයට යෙත්. ඔවුන් ප්‍රහීණ වීමෙන් සියසතන්හි ම සිත පිහිටයි. මොනවම තැන්පත් වෙයි. එකඟ වෙයි. සමාධිගත වෙයි.

ඒ විතර්කයන්ගේ ද දෙෂය පරීක්ෂා කරන්නහුට ලොභසහගත වූත් ද්වෙෂසහගත වූත් මොහ සහගතවූත් යම් ලාමක අකුශල විතර්කයෝ වෙත් ද, ඔහු ප්‍රහීණ වෙත්. ඔහු විනාශයට යෙත්. ඔවුන් ප්‍රහීණ වීමෙන් සියසතන්හි ම සිත පිහිටයි. මොනවට තැන්පත් වෙයි. එකඟ වෙයි. සමාධිගත වෙයි.

ඒ විතර්කයන් ද නො සිහි කිරීමට නො මෙනෙහි කිරීමට පැමිණෙන්නහුට ලොභසහගත වූත් ද්වෙෂසහගත වූත් මොහසහගත වූත් යම් ලාමක අකුශල විතර්කයෝ වෙත් ද, ඔහු ප්‍රහීණ වෙත්. ඔහු විනාශයට යෙත්. ඔවුන් ප්‍රහීණ වීමෙන් සියසතන්හි ම සිත පිහිටයි. මොනවට තැන්පත් වෙයි. එකඟ වෙයි. සමාධිගත වෙයි.

ඒ විතර්කයන්ගේ ද විතර්කමූලසංස්ථානය මෙනෙහි කරන්නහුට ලොභසහගත වූත් ද්වෙෂසහගත වූත් මොහසහගත වූත් යම් ලාමක අකුශල විතර්කයෝ වෙත් ද, ඔහු ප්‍රහීණ වෙත්. ඔහු විනාශයට යෙත්. ඔවුන් ප්‍රහීණ වීමෙන් සියසතන්හි ම සිත පිහිටයි. මොනවට තැන්පත් වෙයි. එකඟ වෙයි. සමාධිගත වෙයි.

යට දතෙහි උඩු දත පිහිටුවා දිවෙන් තලු පෙලා ගෙණ කුසල් සිතින් අකුසල් සිත වෙසෙසින් නිගන්නා වූ වෙසෙසින් පෙලන්නා වූ වෙසෙසින් තවන්නා වූ ඔහුට ලොභසහගත වූත් ද්වෙෂසහගත වූත් මොහසහගත වූත් යම් ලාමක අකුශල විතර්කයෝ වෙත් ද, ඔහු ප්‍රහීණ වෙත්. ඔහු විනාශයට යෙත්. ඔවුන් ප්‍රහීණ වීමෙන් සියසතන්හි ම සිත පිහිටයි. මොනවට තැන්පත් වෙයි. එකඟ වෙයි. සමාධිගත වෙයි.

මහණෙනි, මේ මහණ තෙමේ විතර්කචාරමාර්ගයන්හි පුරුදු කරනලද වශීභාවය ඇත්තේ යයි ද, යම් විතර්කයක් කැමති වන්නේ නම් ඒ විතර්කය විතකන්නේ යයි ද, යම් විතර්කයක් නො කැමැති වන්නේ නම් ඒ විතර්කය නො විතකන්නේ යයි ද, තෘෂ්ණාව සින්දේ යයි ද, සංයොජන උපුටා හලේ යයි ද, මැනැවින් මානය දුරු කිරීමෙන් දුක් කෙලවර කෙළේ යයි ද කියනු ලැබේ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව මැනැවැයි පිළිගත්හ.

විතක්කසණ්ඨාන සූත්‍රය දසවැනි යි.

දෙවෙනි සීහනාද වර්ගය යි.

තස්ස වග්ගස්ස උද්දානං.

චූළම්හාමිගපොපමනාද දුක්ඛ දුවෙ'පි සහත්ථතුමානා
ඛිලපථා මධුපෙද්වධවිතක්කා පඤ්චනිමිත්තකථෙස දුතියො: *

---

3. ඔපම්මවග්ගො

1. 3. 1.

කකචූපමසුත්තං

1. **එවං** මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **මොළියඵග්ගුනො** භික්ඛුනීහි සද්ධිං අතිවෙලං සංසට්ඨො විහරති. එවං සංසට්ඨො ආයස්මා මොළියඵග්ගුනො භික්ඛුනීහි සද්ධිං විහරති. සචෙ කොචි භික්ඛු ආයස්මතො මොළියඵග්ගුනස්ස සම්මුඛා තාසං භික්ඛුනීනං අවණ්ණං භාසති, තෙනායස්මා මොළියඵග්ගුනො කුපිතො අනත්තමනො අධිකරණම්පි කරොති. සචෙ පන කොචි භික්ඛු තාසං භික්ඛුනීනං සම්මුඛා ආයස්මතො මොළියඵග්ගුනස්ස අවණ්ණං භාසති. තෙන තා භික්ඛුනියො කුපිතා අනත්තමනා අධිකරණම්පි කරොන්ති. එවං සංසට්ඨො ආයස්මා මොළියඵග්ගුනො භික්ඛුනීහි සද්ධිං විහරති.

---

* "පොත්ථකාගතා පන උද්දානගාථා සබ්බථා විසදිසා අපරිසුද්ධා ච"
සිරි ධම්මාරාම සුද්ධි - අඩොලිපි:

"චූළසීහනාද ලොමහංස වරො
මහාචූළදුක්ඛක්ඛන්ධඅනුමානිකසුත්තං
ඛිලපත්ථ මධුපිණ්ඩික ද්වෙධාවිතක්ක
පඤ්චනිමිත්තකථා පුන වග්ගො" – මජ්ස. සීමු. 2.

ඒ වර්ගයාගේ උද්දානය:

> චූලමහාමිගසෝපමතාද දුක්ඛදුවේ'පි සඝත්තනුමානා
> ඛීලපථා මධු ද්වේධ විතක්කා පඤ්චනිමිත්තකථේස දුතීයො.

චූලමහා, 'චූල' ශබ්ද හා 'මහා' ශබ්ද හා පූර්ව පද කොට සිටුනා; මිගප- උපමනාද, මෘගාධිපනාදෙපම නාද ඇති සූත්‍රයෝයැ හෙවත් - චූලසීහනාද මහාසීහනාද සූත්‍රයෝ දෙදෙන යැ; සඝත්තනුමානා, (ආත්මප්‍රත්‍යවෙක්‍ෂා හා අනුමාන මාර්ග වදහළ) අත්තානුමාන සූත්‍රය සහගත කොට ඇති; දුවෙ දුක්ඛා අපි, ('චූල' ශබ්ද හා 'මහා' ශබ්ද හා පූර්ව පදකොට සිටුනා) දුක්ඛ සූත්‍රයෝ දෙදෙන ය හෙවත් · චූලදුක්ඛක්ඛන්ධ මහාදුක්ඛක්ඛන්ධ යන උභය සූත්‍රයෝ යැ; ඛීලපථා, ('ඛිල' ශබ්ද හා 'පත්ථ' ශබ්ද හා පරපද කොට සිටුනා) චේතොඛිල වනපත්ථ සූත්‍රයෝ යැ: මධු ද්වේධවිතක්කා, මධුපිණ්ඩික ද්වේධාවිතක්ක සූත්‍රයෝ යැ; පඤ්චනිමිත්තකථා, ("අධිචිත්තමනුයුත්තෙන භික්ඛවෙ භික්ඛුනා පඤ්ච නිමිත්තානි කාලෙන කාලං මනසිකාතබ්බානි" යනාදීන් වදාළ) පඤ්චනිමිත්තකථා සූත්‍ර යැ හෙවත් - විතක්කසණ්ඨාන සූත්‍ර යැ යන මොහු නිමියහ එසෝ දුතියො, තෙල දෙවන වගයි. ("නාමෛකදෙශග්‍රහණෙ නාමග්‍රහණං ස්‍යාත්" යනු න්‍යාය වන හෙයින් 'ඛිලපත්ථ මධු' ආදීන් කී නාමෛකදෙශයෙන් තත් තත් සූත්‍ර සංග්‍රහ කොට ගත්තේ යැ; 'ඛිලපත්ථා' කියුව මනා තැනැ 'ඛී' යන දීර්ඝය හා 'පථා' යන විසංයොගය ගාථාබන්ධ සඳහා වෙයි.)*

3. ඔපම්ම වර්ගය

1. 3. 1.

කකචූපම සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් මොලියඵග්ගුන තෙරණුවෝ ත්‍රිවිධ වෙලා ඉක්ම සිට මෙහෙණන් හා සංසට්‍ඨ වැ (මුසුව) විහරණ කෙරෙති. ආයුෂ්මත් මොලියඵග්ගුන තෙරණුවෝ මෙහෙණන් හා මෙබඳු සසට ඇති වැ වාසය කරති: ඉදින් යම්කිසි මහණෙක් ආයුෂ්මත් මොලියඵග්ගුන තෙරණුවන් හමුවෙහි ඒ මෙහෙණන්ගේ අගුණ කියා ද, එයින් මොලියඵග්ගුන තෙරණුවෝ කිපියාහු නො සතුටු වූවාහු අධිකරණ ද කෙරෙති. ඉදින් යම්කිසි මහණෙක් ඒ මෙහෙණන් ඉදිරියෙහි ආයුෂ්මත් මොලියඵග්ගුන මහණහුගේ අගුණ කියා ද, එයින් ඒ මෙහෙණහු කිපියාහු නො සතුටු වූවාහු නඩු ද පවරති. මොලියඵග්ගුන තෙරණුවෝ භික්ෂුණීන් හා මෙබඳු සසට ඇති වැ වෙසෙති.

---

* කෝදගොඩ ඤාණාලොක ව්‍යාඛ්‍යානයි.

2. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: "ආයස්මා භන්තෙ මොළියඵග්ගුනො භික්ඛුනීහි සද්ධිං අතිවෙලං සංසට්ඨො විහරති. එවං සංසට්ඨො භන්තෙ ආයස්මා මොළියඵග්ගුනො භික්ඛුනීහි සද්ධිං විහරති: සචෙ කො චි භික්ඛු ආයස්මතො මොළියඵග්ගුනස්ස සම්මුඛා තාසං භික්ඛුනීනං අවණ්ණං භාසති, තෙනායස්මා මොළියඵග්ගුනො කුපිතො අනත්තමනො අධිකරණම්පි කරොති. සචෙ පන කො චි භික්ඛු තාසං භික්ඛුනීනං සම්මුඛා ආයස්මතො මොළියඵග්ගුනස්ස අවණ්ණං භාසති, තෙන තා භික්ඛුනියො කුපිතා අනත්තමනා අධිකරණම්පි කරොන්ති. එවං සංසට්ඨො භන්තෙ ආයස්මා මොළියඵග්ගුනො භික්ඛුනීහි සද්ධිං විහරතී"ති.

3. අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි: එහි ත්වං භික්ඛු මම වචනෙන මොළියඵග්ගුනං භික්ඛුං ආමන්තෙහි: 'සත්ථා තං ආවුසො ඵග්ගුන ආමන්තෙතී'ති. 'එවම්භන්තෙ'ති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙනායස්මා මොළියඵග්ගුනො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මොළියඵග්ගුනං එතදවොච: සත්ථා තං ආවුසො ඵග්ගුන ආමන්තෙතීති. එවමාවුසොති ඛො ආයස්මා මොළියඵග්ගුනො තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං මොළියඵග්ගුනං භගවා එතදවොච:

4. සච්චං කිර ත්වං ඵග්ගුන භික්ඛුනීහි සද්ධිං අතිවෙලං සංසට්ඨො විහරසි? එවං සංසට්ඨො කිර ත්වං ඵග්ගුන භික්ඛුනීහි සද්ධිං විහරසි: "සචෙ කො චි භික්ඛු තුය්හං සම්මුඛා තාසං භික්ඛුනීනං අවණ්ණං භාසති, තෙන ත්වං කුපිතො අනත්තමනො අධිකරණම්පි කරොසි. සචෙ පන කොචි භික්ඛු තාසං භික්ඛුනීනං සම්මුඛා තුය්හං අවණ්ණං භාසති, තෙන තා භික්ඛුනියො කුපිතා අනත්තමනා අධිකරණම්පි කරොන්ති. එවං සංසට්ඨො කිර ත්වං ඵග්ගුන භික්ඛුනීහි සද්ධිං විහරසී"ති. 'එවම්භන්තෙ.' නනු ත්වං ඵග්ගුන කුලපුත්තො සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතොති? 'එවම්භන්තෙ'.

5 න ඛො තෙ එතං ඵග්ගුන පතිරූපං, කුලපුත්තස්ස සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතස්ස, යං ත්වං භික්ඛුනීහි සද්ධිං අතිවෙලං සංසට්ඨො විහරෙය්‍යාසි. තස්මාතිහ ඵග්ගුන තව චෙපි කො චි සම්මුඛා තාසං භික්ඛුනීනං අවණ්ණං භාසෙය්‍ය, තත්‍රාපි ත්වං ඵග්ගුන යෙ ගෙහසිතා ඡන්දා යෙ ගෙහසිතා විතක්කා තෙ පජහෙය්‍යාසි. තත්‍රාපි තෙ ඵග්ගුන එවං සික්ඛිතබ්බං: "න චෙව මෙ චිත්තං විපරිණතං භවිස්සති, න ච පාපිකං වාචං නිච්ඡාරෙස්සාමි, හිතානුකම්පී ච විහරිස්සාමි, මෙත්තචිත්තො න දොසන්තරො"ති එවං හි තෙ ඵග්ගුන සික්ඛිතබ්බං.

2. එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හිඳ. එකත්පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය: “වහන්ස, ආයුෂ්මත් මොලියඵග්ගුන තෙරණුවෝ වේලා ඉක්මවා මෙහෙණන් හා මිශ්‍ර වූවාහු වාසය කෙරෙති. වහන්ස, ආයුෂ්මත් මොලියඵග්ගුන තෙරණුවෝ මෙහෙණන් හා මෙබඳු සසට ඇතිව, වෙසෙති: ඉදින් යම්කිසි මහණෙක් ආයුෂ්මත් මොලිය ඵග්ගුන තෙරණුවන් ඉදිරියෙහි ඒ මෙහෙණන් අගුණ කියා ද, එයින් ආයුෂ්මත් මොලියඵග්ගුන තෙරණුවෝ කිපියාහු අසතුටු වූවාහු තඩු ද පවරති. ඉදින් යම් කිසි මහණෙක් ඒ මෙහෙණන් ඉදිරියෙහි ආයුෂ්මත් මොලියඵග්ගුන තෙරණුවන් අගුණ කියා ද, එයින් ඒ මෙහෙණහු කිපියාහු නොසතුටු වූවාහු තඩු ද කියත්. වහන්ස, ආයුෂ්මත් මොලියඵග්ගුන තෙරණුවෝ භික්ෂුණීන් හා මෙබඳු සසට ඇති වැ වෙසෙති”

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එක්තරා මහණකු ඇමතූ සේක: මහණ, තෝ මෙහි එව. මාගේ වචනයෙන් ‘ඇවැත, ඵග්ගුනය, ශාස්තෲන් වහන්සේ ඔබ අමතනසේකැ’යි මොලියඵග්ගුන භික්ෂුහු අමතව. ‘වහන්ස, එසේ ය’ යි ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී මොලියඵග්ගුන ආයුෂ්මත්හු වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් මොලියඵග්ගුන තෙරහුට මෙය කී ය: ‘ඇවැත්, ඵග්ගුනය, ශාස්තෲන් වහන්සේ ඔබ අමතනසේකැ’ යි කියා යි. ආයුෂ්මත් මොලියඵග්ගුන තෙමේ ‘එසේ ය, ඇවැත්නි’ යි ඒ භික්ෂුහට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ආයුෂ්මත් මොලියඵග්ගුන භික්ෂුහට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක.

4. ඵග්ගුනය, තෝ භික්ෂුණීන් සමග වේලා ඉක්මවා වෙසෙහි යනු සැබෑ ද? ඵග්ගුනය, තෝ මෙහෙණන් හා මෙසේ සසට ඇතිව වාසය කෙරෙහි ලු: “කිසි මහණෙක් තා හමුවෙහි ඒ මෙහෙණන්ගේ අගුණ කියා ද, එයින් තෝ කිපියෙහි නො සතුටු වූයෙහි තඩු ද කියහි. ඉදින් කිසි මහණෙක් ඒ මෙහෙණන්ගේ හමුවෙහි තාගේ නුගුණ කියා ද, එයින් ඒ මෙහෙණහු කිපියාහු නො සතුටු වූවාහු තඩු ද පවරත්. ඵග්ගුනය, තෝ මෙහෙණන් හා මෙසේ සසට ඇති වැ වෙසෙහි ද?” ‘එසේ ය, වහන්ස.’ ඵග්ගුනය, තෝ ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම සසුන් වන් කුලපුත්‍ර නො වෙහි ද? ‘වහන්ස, එසේ ය.’

5. “ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම සසුන් වන් තට - වේලා ඉක්මවා මෙහෙණන් හා තෝ ගැනුණක්ව වසන්නෙහි යන යමක් වේ ද, එය නො නිසිය. එහෙයින් ඵග්ගුනය, ඉදින් කිසිවෙක් තා ඉදිරියෙහි ඒ මෙහෙණන්ගේ නුගුණ කියා ද, ඵග්ගුනය, එහි දී තෝ පඤ්චකාමගුණාශ්‍රිත වූ යම් තෘෂ්ණාපේක්ෂ ඡන්දයෝ වෙත් ද, ගෘහාශ්‍රිත විතර්කයෝ වෙත් ද, ඔවුන් දුරු කරව ඵග්ගුනය, ඒ නුගුණ කීමෙහි ලා තා විසින් මෙසේ හික්මිය යුතු ය: ‘මාගේ සිත (රාගාදීන්) පෙරළුණේ නො වන්නේ ම ය. (මම) ලාමක වචන නො ද කියන්නෙමි. හිතානුකම්පා ඇත්තෙම් මෛත්‍රී සිත් ඇත්තෙම් ද්වේෂචිත්ත නැත්තෙම් වසන්නෙම්’යි. ඵග්ගුන තා විසින් මෙසේ ම හික්මිය යුතු.

6. තස්මාතිහ ඵග්ගුන තව චෙපි කොචි සම්මුඛා තාසං භික්ඛුනීනං පාණිනා පහාරං දදෙය්‍ය, ලෙඩ්ඩුනා පහාරං දදෙය්‍ය, දණ්ඩෙන පහාරං දදෙය්‍ය, සත්ථෙන පහාරං දදෙය්‍ය, තත්‍රාපි ත්වං ඵග්ගුන යෙ ගෙහසිතා ඡන්දා යෙ ගෙහසිතා විතක්කා තෙ පජහෙය්‍යාසි. තත්‍රාපි තෙ ඵග්ගුන එවං සික්ඛිතබ්බං: න චෙව මෙ චිත්තං විපරිණතං භවිස්සති න ච පාපිකං වාචං නිච්ඡාරෙස්සාමි. හිතානුකම්පී ච විහරිස්සාමි මෙත්තචිත්තො න දොසන්තරොති. එවං හි තෙ ඵග්ගුන සික්ඛිතබ්බං.

7. තස්මාතිහ ඵග්ගුන තව චෙපි කොචි සම්මුඛා අවණ්ණං භාසෙය්‍ය, තත්‍රාපි ත්වං ඵග්ගුන යෙ ගෙහසිතා ඡන්දා යෙ ගෙහසිතා විතක්කා තෙ පජහෙය්‍යාසි. තත්‍රාපි තෙ ඵග්ගුන එවං සික්ඛිතබ්බං: න චෙව මෙ චිත්තං විපරිණතං භවිස්සති න ච පාපිකං වාචං නිච්ඡාරෙස්සාමි හිතානුකම්පී ච විහරිස්සාමි මෙත්තචිත්තො න දොසන්තරොති, එවං හි තෙ ඵග්ගුන සික්ඛිතබ්බං.

8. තස්මාතිහ ඵග්ගුන තව චෙපි කොචි පාණිනා පහාරං දදෙය්‍ය ලෙඩ්ඩුනා පහාරං දදෙය්‍ය දණ්ඩෙනපහාරං දදෙය්‍ය සත්ථෙන පහාරං දදෙය්‍ය, තත්‍රාපි ත්වං ඵග්ගුන යෙ ගෙහසිතා ඡන්දා යෙ ගෙහසිතා විතක්කා තෙ පජහෙය්‍යාසි තත්‍රාපි තෙ ඵග්ගුන එවං සික්ඛිතබ්බං: න චෙව මෙ චිත්තං විපරිණතං භවිස්සති න ච පාපිකං වාචං නිච්ඡාරෙස්සාමි හිතානුකම්පී ච විහරිස්සාමි මෙත්තචිත්තො න දොසන්තරොති. එවං හි තෙ ඵග්ගුන සික්ඛිතබ්බන්ති.

9. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: ආරාධයිංසු වත මෙ භික්ඛවෙ භික්ඛූ එකං සමයං චිත්තං. ඉධාහං භික්ඛවෙ භික්ඛූ ආමන්තෙසිං: 'අහං ඛො භික්ඛවෙ එකාසනභොජනං භුඤ්ජාමි. එකාසනභොජනං ඛො අහං භික්ඛවෙ භුඤ්ජමානො අප්පාබාධතඤ්ච සඤ්ජානාමි අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානතඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච. එථ තුම්හෙපි භික්ඛවෙ එකාසන-භොජනං භුඤ්ජථ. එකාසනභොජනං ඛො භික්ඛවෙ තුම්හෙපි භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානිස්සථ අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානතඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්චා'ති. න මෙ භික්ඛවෙ තෙසු භික්ඛූසු අනුසාසනී කරණීයා අහොසි. සතුප්පාදකරණීයමෙව මෙ[1] භික්ඛවෙ තෙසු භික්ඛූසු[2] අහොසි.

10 සෙය්‍යථාපි භික්ඛවෙ සුභූමියං චාතුම්මහාපථෙ ආජඤ්ඤරථො යුත්තො[3] අස්ස ඨිතො ඔධස්තපතොදො, තමෙනං දක්ඛො යොග්ගාචරියො අස්සදම්මසාරථී අභිරූහිත්වා වාමෙන හත්ථෙන රස්මියො ගහෙත්වා දක්ඛිණෙන හත්ථෙන පතොදං ගහෙත්වා යෙනිච්ඡකං යදිච්ඡකං සාරෙය්‍යාපි[4] පච්චාසාරෙය්‍යාපි,[5] එවමෙව ඛො භික්ඛවෙ න මෙ තෙසු භික්ඛූසු අනුසාසනී කරණීයා අහොසි. සතුප්පාදකරණීයමෙව මෙ භික්ඛවෙ තෙසු භික්ඛූසු[2] අහොසි. තස්මාතිහ භික්ඛවෙ තුම්හෙපි[6] අකුසලං පජහථ. කුසලෙසු ධම්මෙසු ආයොගං කරොථ. එවං හි තුම්හෙපි ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සථ.

---

1. භික්ඛවෙ, සයා. 2. භික්ඛූසු, මජසං. සයා.
3. සුදන්තො යුත්තො, සයා. 4. සාරෙය්‍යපි, මජසං. PTS.
5. පච්චාසාරෙය්‍යපි, මජසං. PTS. 6. තුම්හෙ, PTS.

Free Distribution www.aathaapi.org

6 එග්ගුනය, එහෙයින් මෙහි තා ඉදිරියෙහි කිසිවෙක් ඒ මෙහෙණට ඉදින් අතින් පහර දෙන්නේ ද, කැටින් පහර දෙන්නේ ද, මුගුරින් පහර දෙන්නේ ද, සැතින් පහර දෙන්නේ ද, එග්ගුනය, ඒ පහර දීමෙහි ද තෝ යම් ගෙහසිත ඡන්දයෝ යම් ගෙහසිත විතක්කයෝ වෙත් ද, ඔවුන් දුරු කරව. එග්ගුනය, එහි දී ද, තා විසින් මෙසේ හික්මිය යුතු ය: 'මාගේ සිත නො පෙරළුණේ වන්නේ ම ය. ලාමක වචන නොම කියන්නෙමි. හිතානුකම්පා ඇත්තෙම් මෛත්‍රී සහගත සිත් ඇත්තෙම් ද්වෙෂචිත්ත නැත්තෙම් වසන්නෙමි' කියා යි. එග්ගුනය, තා විසින් මෙසේ හික්මිය යුතුයි.

7 එග්ගුනය, එහෙයින් මෙහි යම් කිසිවෙක් තා ඉදිරියෙහි දී තාගේ වුවත් නුගුණය කියන්නේ නම්, එග්ගුනය, එහි දී ද තෝ යම් ගෙහසිත ඡන්දයෝ ඇත් ද, යම් ගෙහසිත විතක්කයෝ ඇත් ද, ඔවුන් දුරු කරව. එග්ගුනය, එහි දී ද තා විසින් මෙසේ හික්මිය යුතුයි: 'මාගේ සිත වෙනස් නො වන්නේ ම ය. ලාමක වචන නොම කියන්නෙමි. හිතානුකම්පා ඇති ව මෛත්‍රී සිත් ඇති ව ද්වෙෂ සිත් නැති ව වසන්නෙමි'යි කියා යි. එග්ගුනය, තා විසින් මෙසේ හික්මිය යුතු ය.

8. එග්ගුනය, එහෙයින් මෙහි තට වුවත් ඉදින් කිසිවෙක් අතින් පහර දේ ද, කැටින් පහර දේ ද, මුගුරින් පහර දේ ද, සැතින් පහර දේ ද, එග්ගුනය, එහි දී ද යම් ගෙහසිත ඡන්දයෝ යම් ගෙහසිත විතක්කයෝ වෙත් ද, තෝ ඔවුන් දුරු කරව. එග්ගුනය, එහි දී ද තා විසින් මෙසේ හික්මිය යුතුයි: මාගේ සිත වෙනස් නො වන්නේ ම ය. ලාමක වචනයක් ද ප්‍රකාශ නො කරන්නෙමි. හිතානුකම්පිව මෙත්සිත් ඇති ව ද්වෙෂසිත් නැති ව වාසය කරන්නෙමි'යි කියා යි. එග්ගුනය, තා විසින් මෙසේ ම හික්මිය යුතුයි.

9. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක: මහණෙනි, එක් කලෙක (ප්‍රථම බොධියෙහි) භික්ෂූහු එකාන්තයෙන් මා සිත ගත්හ. මහණෙනි, මම භික්ෂූන් ඇමතීමි: 'මහණෙනි, මම පෙරවරු එක්වේලේ බොජුන් වළඳ කරමි. මහණෙනි, මම එක්වේලේ වැළඳීම කරන්නෙම නිරොගබව ද නිදුක්බව ද සැහැල්ලු බව ද ශරීරශක්තිය ද පහසු විහරණය ද දකිමි. මහණෙනි, එවු, තෙපි ද එකාසනභොජනය වළඳව. මහණෙනි, එකාසන-භොජනය වළඳන තෙපි ද නිරොගි බවත් නිදුක් බවත් සැහැල්ලු බවත් ශරීරශක්තියත් පහසු පැවැත්මත් දකිවු.' මහණෙනි, එකල භික්ෂූන් කෙරෙහි මා විසින් අනුශාසනා කළ යුතු නො වී ය. ඒ භික්ෂූන්ට මා විසින් කළයුතු සිහි ඉපිදවීම පමණක්ම වී ය.

10. මහණෙනි, යම් සේ සමබිමෙක සතර මං සන්දියෙක (සුවසේ ගත හැකි ලෙස) තබතලද කෙවිපි ඇති, හික්මුණු අසුන් යෙදූ, රියක් ගමනට යුතු වැ සිටියේ වේ ද, දමනය කටයුතු අශ්වයන් හික්මවීමෙහි දක්ෂ වූ අශ්වාචාර්‍යයෙක් තෙල රථයට නැගී වමතින් රැහැන් ගෙන දකුණතින් කෙවිට ගෙන කැමැති ගමනක් සඳහා ඉදිරියට මෙහෙයන්නේ ය. ආපසු හෝ මෙහෙයන්නේ ය. මහණෙනි, එපරිද්දෙන් ම මා විසින් ඒ භික්ෂූන් කෙරෙහි ද අනුශාසනාව කටයුතු නො වී ය. කළයුතු අනුශාසනාව සිහි ඉපදවීම පමණක්ම වී ය. මහණෙනි, එහෙයින් මෙහි තෙපි ද අකුසල් දුරු කරවු. කුසල්දහම්හි නැවත නැවත යෙදෙවු. මෙසේ තෙපි ද මේ ශාසනයෙහි වැඩීමට දියුණුවට විපුලත්වයට පැමිණෙන්නහු ය.

11. සෙය්‍යථාපි භික්ඛවෙ ගාමස්ස වා නිගමස්ස අවිදූරෙ මහන්තං සාලවනං, තඤ්චස්ස එලණ්ඩෙහි සඤ්ඡන්නං, තස්ස කොචිදෙව පුරිසො[1] උප්පජ්ජෙය්‍ය අත්ථකාමො හිතකාමො යොගක්ඛෙමකාමො, සො යා තා සාලලට්ඨියො කුටිලා ඔජාපහරණීයො[2] තා තච්ඡෙත්වා[3] බහිද්ධා නීහරෙය්‍ය, අන්තොවනං සුවිසොධිතං[4] විසොධෙය්‍ය, යා පන තා සාලලට්ඨියො උජුකා තා සම්මා[5] පරිහරෙය්‍ය, එවං හෙතං[6] භික්ඛවෙ සාලවනං අපරෙන සමයෙන වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍ය. එවමෙව ඛො භික්ඛවෙ තුම්හෙපි අකුසලං පජහථ. කුසලෙසු ධම්මෙසු ආයොගං කරොථ. එවං හි තුම්හෙපි ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සථ[7].

12. භූතපුබ්බං භික්ඛවෙ ඉමිස්සායෙව සාවත්ථියා වෙදෙහිකා නාම ගහපතානී අහොසි. වෙදෙහිකාය භික්ඛවෙ ගහපතානියා එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: සොරතා වෙදෙහිකා ගහපතානී, නිවාතා වෙදෙහිකා ගහපතානී, උපසන්තා වෙදෙහිකා ගහපතානීති. වෙදෙහිකාය ඛො පන භික්ඛවෙ ගහපතානියා කාළී නාම දාසී අහොසි, දක්ඛා අනලසා සුසංවිහිතකම්මන්තා.

13. අථ ඛො භික්ඛවෙ කාළියා දාසියා එතදහොසි: මය්හං ඛො අය්‍යාය එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: සොරතා වෙදෙහිකා ගහපතානී, නිවාතා වෙදෙහිකා ගහපතානී, උපසන්තා වෙදෙහිකා ගහපතානීති. කින්නු ඛො මෙ අය්‍යා සන්තංයෙව නු ඛො අජ්ඣත්තං කොපං න පාතුකරොති? උදාහු අසන්තං? උදාහු මය්හමෙවෙතෙ[8] කම්මන්තා සුසංවිහිතා, යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති? නො අසන්තං? යන්නූනාහං අය්‍යං වීමංසෙය්‍යන්ති. අථ ඛො භික්ඛවෙ කාළී දාසී දිවා උට්ඨාසි. අථ ඛො භික්ඛවෙ වෙදෙහිකා ගහපතානී කාළිං දාසිං එතදවොච: හෙ ජෙ කාළීති.[9] කිං අය්‍යෙති?[10] කිං ජෙ දිවා උට්ඨාසීති? 'න ඛො අය්‍යෙ[11] කිඤ්චීති.'[12] නො වත රෙ කිඤ්චි පාපි දාසී[13] දිවා උට්ඨාසී'ති කුපිතා අනත්තමනා භාකුටිං[14] අකාසි.

14. අථ ඛො භික්ඛවෙ කාළියා දාසියා එතදහොසි: සන්තංයෙව ඛො මෙ අය්‍යා අජ්ඣත්තං කොපං න පාතුකරොති නො අසන්තං. මය්හමෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා, යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති නො අසන්තං. යන්නූනාහං භිය්‍යොසොමත්තාය අය්‍යං වීමංසෙය්‍යන්ති අථ ඛො භික්ඛවෙ කාළීදාසී දිවාතරං උට්ඨාසි.

1. මනුස්සො, කළුවි. 2. ඔජසාරණීයො, සයා.
3 ජෙත්වා, මජසං. 4. සුසොධිතං, සයා. 5. සම්මා, සයා. 6. හි තං, සයා.
7. ආපජ්ජථ, සයා. 8. මය්හමෙවෙතෙ, මජසං. මය්හංපෙතෙ, සයා.
9. කාළි, PTS සී. 10. අය්‍යෙ, සයා. 11. නඛ්වයෙ, මජසං. සයා.
12. කිඤ්චි, PTS. සී. 13. පාපදාසී, සයා.
14. භකුටිං, අට්ඨකථා භූකුටි, PTS. සීමු. 2 භකුටිමකාසි, සයා

11. "මහණෙනි, යම් සේ ගමක් හෝ නියම්ගමක් හෝ අසල මහත් සල්වනයෙක් වේ ද, හෙ ද සල්පිලිලයෙන් වැසුණේ වේ ද, එයට වැඩ කැමැති අහය කැමැති කිසියම් පුරුෂයෙක් වේ නම්, හෙතෙම වක් වූ ඔජා ගලා බස්නා වූ යම් ඒ තරුණ ශාලයෂ්ටීහු වෙත් ද, ඔවුන් සැස බැහැර කරන්නේ ය. ඇතුළ සල්වනය මැනවින් ශුද්ධ වූවක් කරන්නේ ය. සෘජු ව මැනවින් වැඩුණු යම් ඒ තරුණ ශාලවෘක්ෂයෝ වෙත් නම්, ඔවුන් මැනැවින් පොෂණය කරන්නේ ය. මහණෙනි, මෙසේ ඒ සල්වනය පසුකලෙක වැඩීමට දියුණුවට විපුලත්වයට පැමිණෙන්නේ ය. මහණෙනි, එපරිද්දෙන් ම තෙපිත් අකුසල් දුරු කරවු. කුශලධර්මයන්හි නැවත නැවත යෙදෙවු. මෙසේ තෙපිත් මේ ශාසනයෙහි වැඩීමට දියුණුවට විපුලත්වයට පැමිණෙන්නහු ය.

12. "මහණෙනි, පෙර වූවක් කියමි: මේ **සැවැත්නුවර** ම **වෛදෙහිකා** නම් ගෙහමුවක් වූය. මහණෙනි, වෛදෙහිකා ගැහැවිදුවගේ මෙබඳු කලණ කීර්තිශබ්දයෙක් පැනනැගී. වෛදෙහිකා ගැහැවිදු සුරත ය. වෛදෙහිකා ගැහැවිදු යටත් පැවතුම් ඇත්තී ය. වෛදෙහිකා ගැහැවිදු ශාන්ත ය, කියා යි. මහණෙනි, වෛදෙහිකා ගැහැවිදුවට කාළී නම් දසියක් වූ ය. දක්ෂය. අනලස ය. මනා ව සංවිධාන කල කටයුතු ඇත්තී ය.

13. මහණෙනි, කාළී දසියට – "මාගේ ආර්‍යාව පිළිබඳව, වෛදේහිකා ගෘහැවිදු සුරතභාවයෙන් යුක්ත ය. වෛදේහිකා ගැහැවිදු යටහත් පැවතුම් ඇත්තී ය. වෛදේහිකා ගැහැවිදු උපශාන්ත ය'යි කලණ කීර්ති ශබ්දයෙක් පැන නැගිණ. කිමෙක් දෝ, මාගේ ආර්‍යාව තමා තුළ ඇත්තා වූ කෝපය පහළ නො කෙරේ ද? නොහොත් නැත්තා වූ ම කෝපය පහළ නො කෙරේ ද? එසේත් නැතහොත් යම් හෙයකින් මවිසින් ම තෙල කර්මාන්තයෝ සුසංවිහිත (මැනැවින් කරන ලදහු) ද එහෙයින් මාගේ ආර්‍යා තොමෝ තමා තුළ ඇත්තා වූ ම කෝපය පහළ නො කෙරේ ද නොහොත් නැත්තා වූ ම කෝපය පහල නො කෙරේ දැයි මම ආර්‍යාව විමසා බලන්නෙම් නම් ඉතා මැනැවැ"යි මේ සිත විය. මහණෙනි, ඉක්බිති කාළී දසී තොමෝ දහවල් කොට නැගිට සිටියා ය. මහණෙනි, ඉක්බිති වෛදේහිකා ගෘහිණී තොමෝ කාළී දැසියට මෙය කීවු ය: "එම්බල කාළිය, 'ආර්‍යාවෙනි, කිම?' එම්බල කෙල්ල, කිම, දහවල් කොට නින්දෙන් නැගිට්ටෙහි ද? 'ආර්‍යාවෙනි, කිසිත් නැත.' එම්බල පවිටු දැසිය, කිසිත් නැත් නම් දහවල් කොට නැගි සිටියෙහිදැ" යි කිපියා නො සතුටු වූවා බැම බිඳුම් කළා ය. (මුහුණ හැකිළී ය.)

14. "මහණෙනි, එකල කාළී දැසියට මේ අදහස වි ය: "මාගේ ආර්‍යාව තමා තුළ ඇත්තා වූ ම කොපය පහළ නො කරන්නී ය. නැත්තා වූ ම කෝපය පහළ නො කරන්නී නො වේ. යම් හෙයකින් මා විසින් ම තෙල කර්මාන්තයෝ මැනැවින් සංහිත ද ඒ නිසා ආර්‍යා තොමෝ තමා තුළ ඇත්තා වූ ම කොපය පහල නො කෙරේ ද, නැත්තා වූ ම කොපය පහළ නො කෙරේ දැයි මම ආර්‍යාව බොහෝ සේ විමසා බලන්නෙම් නම් යෙහෙක" කියා යි. මහණෙනි, ඉක්බිති කාළී දසිය වඩාත් දහවල් කොට නින්දෙන් නැගී සිටියා ය.

15. අථ ඛො භික්ඛවෙ වෙදෙහිකා ගහපතානී කාළිං දාසිං එතදවොච: හෙ ජෙ කාළීති. 'කිං අය්‍යෙ'ති? කිං ජෙ දිවාතරං උට්ඨාසීති? 'න ඛො අය්‍යෙ කිඤ්චී'ති. නො වත රෙ කිඤ්චි පාපි දාසි, දිවාතරං[1] උට්ඨාසීති කුපිතා අනත්තමනා අනත්තමනවාචං නිච්ඡාරෙසි. අථ ඛො භික්ඛවෙ කාළියා දාසියා එතදහොසි: සන්තංයෙව ඛො මෙ අය්‍යා අජ්ඣත්තං කොපං න පාතුකරොති නො අසන්තං, මය්හෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති නො අසන්තං; යන්නූනාහං භිය්‍යොසොමත්තාය අය්‍යං වීමංසෙය්‍යන්ති අථ ඛො භික්ඛවෙ කාළී දාසී දිවාතරංයෙව උට්ඨාසි. අථ ඛො භික්ඛවෙ වෙදෙහිකා ගහපතානී කාළිං දාසිං එතදවොච: හෙ ජෙ කාළීති. 'කිං අය්‍යෙති? කිං ජෙ දිවාතරං උට්ඨාසීති? න ඛො අය්‍යෙ කිඤ්චීති. නො වත රෙ කිඤ්චි පාපි දාසි, දිවාතරං උට්ඨාසීති කුපිතා අනත්තමනා අග්ගළසූචිං ගහෙත්වා සීසෙ පහාරං අදාසි. සීසං වොභින්දි.[2] අථ ඛො භික්ඛවෙ කාළී දාසී භින්නෙන සීසෙන ලොහිතෙන ගළන්තෙන[3] පටිවිස්සකානං උජ්ඣාපෙසි: 'පස්සථය්‍යා, සොරතාය කම්මං පස්සථය්‍යා, නිවාතාය කම්මං. පස්සථය්‍යා, උපසන්තාය කම්මං කථං හි නාම එකදාසිකාය 'දිවා උට්ඨාසී'ති කුපිතා අනත්තමනා අග්ගළසූචිං ගහෙත්වා සීසෙ පහාරං දස්සති, සීසං වොභින්දිස්සතීති?

අථ ඛො භික්ඛවෙ වෙදෙහිකාය ගහපතානියා අපරෙන සමයෙන එවං පාපකො කිත්තිසද්දො අබ්භුග්ගඤ්ඡි:[4] චණ්ඩී වෙදෙහිකා ගහපතානී, අනිවාතා වෙදෙහිකා ගහපතානී, අනුපසන්තා වෙදෙහිකා ගහපතානීති.

16. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො භික්ඛු තාවදෙව සොරතසොරතො හොති නිවාතනිවාතො හොති උපසන්තූපසන්තො හොති යාව න තං අමනාපා[5] වචනපථා ඵුසන්ති. යතො ච ඛො භික්ඛවෙ භික්ඛුං අමනාපා වචනපථා ඵුසන්ති, අථ භික්ඛු[6] සොරතොති වෙදිතබ්බො නිවාතොති වෙදිතබ්බො. උපසන්තොති වෙදිතබ්බො. නාහං තං භික්ඛවෙ භික්ඛුං සුවචොති[7] වදාමි, යො චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරහෙතු සුවචො හොති. සොවචස්සතං ආපජ්ජති. තං කිස්ස හෙතු: තං හි සො භික්ඛවෙ භික්ඛු චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං අලභමානො න සුවචො හොති. න සොවචස්සතං ආපජ්ජති. යො ච ඛො භික්ඛවෙ භික්ඛු ධම්මංයෙව සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො[8] ධම්මං අපචායමානො සුවචො හොති සොවචස්සතං ආපජ්ජති, තමහං සුවචොති වදාමි. තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: ධම්මංයෙව සක්කරොන්තා ධම්මං ගරුකරොන්තා ධම්මං අපචායමානා සුවචා භවිස්සාම, සොවචස්සතං ආපජ්ජිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

---

1. දිවා, ස්‍යා PTS. ච.
2. සීසං තෙ භින්දිස්සාමීති, ස්‍යා.
3. ගලන්තෙන, කම්බො.
4. අබ්භුග්ගච්ඡි, ස්‍යා.
5. න අමනාපා, මජ්ඣං ස්‍යා PTS.
6. ඛො භික්ඛු, PTS.
7. සුබ්බචොති, කම්බො.
8. ධම්මං ගරුං කරොන්තො .. මානෙන්තො ... පූජෙන්තො, මජ්ඣං

15. මහණෙනි, ඉක්බිති වේදේහිකා ගෘහපතිනී කාළී දැසියට මෙසේ කීවු ය: එම්බල කෙල්ල, කාළිය, සී 'කිම, ආර්‍යාවෙනි, කෙල්ල, කුමක් නිසා ඉතා දහවල් කොට නැගී සිටිහි ද? 'ආර්‍යාවෙනි, කිසිත් නැත'. "එම්බල පවිටු දැසිය, කිසිවක් නැති ව දවල් කොට නැගිට්ටා ය"යි කිපියා නො සතුටු වූවා නො සතුටු වචන පහළ කළා ය. එකල කාළී දැසියට මේ අදහස ඇති වි ය: 'මාගේ ආර්‍යාව තමා තුළ ඇත්තා වූ ම කෝපය පහළ නො කරන්නී ය. නැත්තා වූ කෝපය පහළ නො කරන්නී නො වෙයි. යම් හෙයෙකින් මා විසින්ම ඒ කර්මාන්තයෝ සුසංවිහිත ද ඒ නිසා ආර්‍යාතොමෝ තමා තුළ ඇත්තා වූ ම කෝපය පහළ නො කෙරේ ද නැත්තා වූ ම කෝපය පහළ නො කෙරේ දැ යි මම ආර්‍යාව තවත් බොහෝ කොට විමසා බලන්නෙම් නම් මැනැවැ'යි කියා යි. මහණෙනි, ඉක්බිති කාළී දැසිය පෙරටත් වඩා දහවල් කොට නැගී සිටියා ය. මහණෙනි, ඉක්බිති වේදේහිකා ගෘහපතිනී තොමෝ කාළී දැසියට මෙසේ කීවා ය: එම්බල කාළිය, 'ආර්‍යාවෙනි, කිම?' 'කෙල්ල, කුමක් නිසා පෙරටත් වඩා දහවල් කොට නැගිසිටියෙහි ද? 'ආර්‍යාවෙනි, කිසිත් නැත. 'එම්බල පවිටු දැසිය, කිසිත් නැත් නම් පෙරටත් වඩා දහවල් කොට නැගිසිටියෙහි දැ යි කිපියා නොසතුටු වූවා අගුලුඉද්ද ගෙන හිසට පහරක් දුන්නා ය. හිස පැළුවා ය. මහණෙනි, ඉක්බිති කාළී දැසිය පැළුණු හිසින් ද ගලන ලෙයින් ද යුතු ව අසල්වැසියනට අඬගා නුගුණ කිවු ය: ආර්‍යයෙනි, සුරත ස්ත්‍රියගේ ක්‍රියාව බලව. යටහත් පැවතුම් ඇත්තියගේ ක්‍රියාව බලව. උපශාන්ත නැනැත්තියගේ ක්‍රියාව බලව. කෙසේ නම් එක ම දැසියට 'දහවල් කොට නැගී සිටියා ය'යි කිපියා නොසතුටු වූවා අගුලු ඉද්ද ගෙන පහර දුන්නී ද, හිස බින්දා දැ' යි කියා යි

ඉක්බිති මහණෙනි, වේදේහිකා ගෘහපතිනීවගේ පසුකාලයෙක මෙවැනි අපකීර්තියෙක් උස් ව නැංගේ ය: වේදේහිකා ගෘහපතිනී චණ්ඩ ය, වේදේහිකා ගෘහපතිනී නොදැමුනා, වේදෙහිකා ගෘහපතිනී නො සන්හුන්ය කියා යි.

16. මහණෙනි, එපරිද්දෙන් ම මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් යම් තාක් අමනාප වූ වචනපථයෝ ඔහු නො පහසත් ද, ඒ තාක් ඉතා සුරතභාවය ඇත්තේ වෙයි. ඉතා යටහත් වූයේ වෙයි. ඉතා සන්හුන් වූයේ වෙයි. මහණෙනි, යම් තැනෙක පටන් ගෙන අමනාප වූ වචනයෝ ඒ මහණහු පවසත් ද, ඒතාක් මහණතෙමේ සුරත ය යි දත යුතු ය. නිහතමාන ය යි දත යුතු ය. ශාන්ත ය යි දත යුතු ය. මහණෙනි, යම් මහණෙක් සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර හෙතු-කොට සුවචෙස් අවවාද විසින් කිය හැකි වේ ද, සුවචබවට පැමිණේ ද, ඒ මහණ සුවච ය යි මම නො කියමි. ඒ කවර හෙයින යත්: මහණෙනි, ඒ මහණ ඒ සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර නො ලබන්නේ සුවච නො වෙයි. සුවචබවට නො පැමිණෙයි. එහෙයිනි. මහණෙනි, යම් මහණෙක් ධර්‍මයට ම සත්කාර කරන්නේ ධර්‍මය ම ගරු කරන්නේ ධර්‍මය පුදන්නේ සුවච වේ ද, සුවචබවට පැමිණේ ද, මම ඔහු සුවචයෙකැයි කියමි. මහණෙනි, එහෙයින් තොප විසින් මෙහි මෙසේ හික්මිය යුතු: ධර්‍මයට ම සත්කාර කරමින් ධර්‍මය ගරු කරමින් ධර්‍මය පුදමින් සුවච වන්නෙමු. සුවචබවට පැමිණෙන්නෙමු'යි කියා යි. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතුයි.

17. පඤ්චිමෙ භික්ඛවෙ වචනපථා යෙහි වො පරෙ වදමානා වදෙය්‍යුං: කාලෙන වා අකාලෙන වා, භූතෙන වා අභූතෙන වා, සණ්හෙන වා ඵරුසෙන වා, අත්ථසංහිතෙන වා අනත්ථසංහිතෙන වා, මෙත්තචිත්තා වා දොසන්තරා වා. කාලෙන වා භික්ඛවෙ පරෙ වදමානා වදෙය්‍යුං අකාලෙන වා. භූතෙන වා භික්ඛවෙ පරෙ වදමානා වදෙය්‍යුං අභූතෙන වා. සණ්හෙන වා භික්ඛවෙ පරෙ වදමානා වදෙය්‍යුං ඵරුසෙන වා. අත්ථසංහිතෙන වා භික්ඛවෙ පරෙ වදමානා, වදෙය්‍යුං අනත්ථසංහිතෙන වා; මෙත්තචිත්තා වා භික්ඛවෙ පරෙ වදමානා. වදෙය්‍යුං දොසන්තරා වා. තත්‍රාපි වො[1] භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: න චෙව නො චිත්තං විපරිණතං භවිස්සති. න ච පාපිකං වාචං නිච්ඡාරෙස්සාම. හිතානුකම්පී ච විහරිස්සාම මෙත්තචිත්තා න දොසන්තරා. තඤ්ච පුග්ගලං මෙත්තාසහගතෙන චෙතසා ඵරිත්වා විහරිස්සාම. තදාරම්මණඤ්ච සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

18. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො ආගච්ඡෙය්‍ය කුද්දාලපිටකං[2] ආදාය, සො එවං වදෙය්‍ය: අහං ඉමං මහාපථවිං අපථවිං කරිස්සාමීති, සො තත්‍ර තත්‍ර ඛණෙය්‍ය,[3] තත්‍ර තත්‍ර විකිරෙය්‍ය, තත්‍ර තත්‍ර ඔට්ඨුභෙය්‍ය, තත්‍ර තත්‍ර ඔමුත්තෙය්‍ය: අපථවී භවසි අපථවී භවසීති. තං කිං මඤ්ඤථ භික්ඛවෙ: අපි නු සො පුරිසො ඉමං මහාපථවිං අපථවිං කරෙය්‍යාති? 'නො හෙතං භන්තෙ.' තං කිස්ස හෙතු? අයං හි භන්තෙ මහාපථවී ගම්භීරා අප්පමෙය්‍යා. සා න සුකරා අපථවී කාතුං. යාවදෙව ච පන සො පුරිසො කිලමථස්ස විඝාතස්ස භාගී අස්සා'ති. එවමෙව ඛො භික්ඛවෙ පඤ්චිමෙ වචනපථා, යෙහි වො පරෙ වදමානා වදෙය්‍යුං: කාලෙන වා අකාලෙන වා, භූතෙන වා අභූතෙන වා සණ්හෙන වා ඵරුසෙන වා, අත්ථසංහිතෙන වා අනත්ථසංහිතෙන වා, මෙත්තචිත්තා වා දොසන්තරා වා. කාලෙන වා භික්ඛවෙ පරෙ වදමානා වදෙය්‍යුං අකාලෙන වා භූතෙන වා භික්ඛවෙ පරෙ වදමානා වදෙය්‍යුං අභූතෙන වා. සණ්හෙන වා භික්ඛවෙ පරෙ වදමානා වදෙය්‍යුං ඵරුසෙන වා. අත්ථසංහිතෙන වා භික්ඛවෙ පරෙ වදමානා වදෙය්‍යුං අනත්ථසංහිතෙන වා. මෙත්තචිත්තා වා භික්ඛවෙ පරෙ වදමානා වදෙය්‍යුං දොසන්තරා වා. තත්‍රාපි වො[1] භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: න චෙව නො චිත්තං විපරිණතං භවිස්සති. න ච පාපිකං වාචං නිච්ඡාරෙස්සාම. හිතානුකම්පී ච විහරිස්සාම මෙත්තචිත්තා න දොසන්තරා. තඤ්ච පුග්ගලං මෙත්තාසහගතෙන චෙතසා ඵරිත්වා විහරිස්සාම -

1. ඛො, PTS 2. කුද්දල පිටකං, මජසං. 3. විඛණෙය්‍ය, මජසං.

17. "මහණෙනි, කාලයෙන් වේව යි අකාලයෙන් වේවයි, විද්‍යමාන වූවෙත් වේව යි අවිද්‍යමාන වූවෙත් වේව යි, මොළොක් වූවෙත් වේව යි රළු වූවෙත් වේවයි, අර්ථසහිත වූවෙත් වේවයි අනර්ථ සහිත වූවෙත් වේ ව යි, මෛත්‍රී සිත් ඇති ව හෝ ද්වේෂසිත් ඇති ව හෝ යම්කිසි වචනයෙකින් අන්‍යයෝ තොපට කියත්තාහු නම්, ඒ වචනමාර්ගයෝ පස් දෙනෙක් වෙති. මහණෙනි, තොපට කියන්නා වූ අන්‍යයෝ කල්හි හෝ නොකල්හි කියත්තාහු ය. මහණෙනි, තොපට කියන්නා වූ අන්‍යයෝ විද්‍යමාන වූවෙකින් හෝ විද්‍යමාන නො වූවෙකින් හෝ කියත්තාහු ය. මහණෙනි, කියන්නා වූ අන්‍යයෝ මොළොක් වූ හෝ රළු වූ හෝ වචනයෙන් කියත්තාහු ය. මහණෙනි, කියන්නා වූ අන්‍යයෝ වැඩෙන් යුක්ත වූ හෝ අවැඩෙන් යුක්ත වූ හෝ වචනයෙන් කියත්තාහු ය. මහණෙනි, කියන්නා වූ අන්‍යයෝ මෙත් සිත් ඇති ව හෝ කිපි සිත් ඇති ව හෝ කියත්තාහු ය. මහණෙනි, එහි දී ද තොප විසින් මෙසේ හික්මිය යුතු ය: 'අපගේ සිත වෙනසකට පත් නො වන්නේ ය. ලාමක වචන නිකුත් නො කරන්නෙමු. හිතානුකම්පා ඇති ව මෙත්සිත් ඇත්තමෝ වාසය කරන්නෙමු. ඒ පුද්ගලයා කෙරෙහි මෛත්‍රිය පතුරුවා වසන්නෙමු. මෙත්සිතට අරමුණු වූ සියලු සත්ත්වයන් ඇති ලෝකය මහත් වූ මහත්බවට ගිය අප්‍රමාණ වූ වෛර නැති ද්වේෂ නැති මහද්ගත සිතින් පතුරුවා වසන්නෙමු' යි කියා යි. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතු ය.

18. මහණෙනි, යම් සේ පුරුෂයෙක් උදැල්ලක් හා පැසක් රැගෙන එන්නේ ද, හෙතෙම මම මේ මහපොළොව නොපොළොව කරන්නෙමි'යි මෙසේ කියන්නේ ය. හෙතෙම ඒ ඒ තැන් සාරන්නේ ය. ඒ ඒ තන්හි පස් විසුරුවන්නේ ය. ඒ ඒ තැන කෙළපියන්නේ ය. ඒ ඒ තැන මුත්‍ර කරන්නේ ය. 'නොපොළොවක් වෙව, නොපොළොවක් වෙව'යි කියා ය. මහණෙනි, ඒ කිමැයි කල්පනා කරන්නහු ද? ඒ පුරුෂ තෙමේ මේ මහපොළොව නොපොළොවක් කරන්නේ ය යි සිතන්නහු ද? 'වහන්ස, එසේ නො සිතන්නෙමු.' එය කවර හෙයින? 'වහන්ස, මේ මහපොළොව, ගැඹුරු ය. පමණ නො කට හැකි ය. නොපොළොවක් කරන්නට නො හැක්කේ ය. හුදෙක් ඒ පුරුෂයා ක්ලාන්ත වන්නේ ය. වෙහෙසට පත් වන්නේ ය. මහණෙනි, එපරිද්දෙන් ම කාලයෙහි හෝ අකාලයෙහි හෝ විද්‍යමාන වූ හෝ අවිද්‍යමාන වූ හෝ මොළොක් වූ හෝ රළු වූ හෝ අර්ථ සහිත වූ හෝ අනර්ථසහිත වූ හෝ යම් වචනපථයෙකින් කියන්නා වූ අන්‍යයෝ මෙත්සිත් ඇති ව හෝ ද්වේෂ සිත් ඇති ව හෝ කියත්තාහු නම්, එහි මේ වචනමාර්ගයෝ පස්දෙනෙක් වෙත්: මහණෙනි, කියන්නා වූ අන්‍යයෝ කල්හි හෝ නොකල්හි හෝ කියත්තාහු ය. මහණෙනි, කියන්නා වූ අන්‍යයෝ විද්‍යමාන වූ හෝ අවිද්‍යමාන වූ හෝ වචනයෙන් කියත්තාහු ය. මහණෙනි, කියන්නා වූ අන්‍යයෝ මොළොක් වූ හෝ රළු වූ හෝ වචනයෙන් කියත්තාහු ය. මහණෙනි, කියන්නා වූ අන්‍යයෝ අර්ථ සහිත වූ හෝ අර්ථ රහිත වූ හෝ වචනයෙන් කියත්තාහු ය. මහණෙනි, කියන්නා වූ අන්‍යයෝ මෙත්සිත් ඇතිව හෝ ද්වේෂ සිත් ඇති ව හෝ කියත්තාහු ය. එහි දී තොප විසින් මෙසේ හික්මිය යුතු ය. 'අපගේ සිත වෙනසකට පත් නො වන්නේ ය. ලාමකවචන නිකුත් නො කරන්නෙමු. හිතානුකම්පා ඇති ව මෙත්සිත් ඇති ව නොකිපි සිත් ඇති ව වාසය කරන්නෙමු. ඒ පුද්ගලයා කෙරෙහි මෛත්‍රිය පතුරුවා වසන්නෙමු.' –

තදාරම්මණඤ්ච සබ්බාවන්තං ලොකං පඨවිසමෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

19. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො ආගච්ඡෙය්‍ය ලාඛං වා හලිද්දිං[1] වා නීලං වා මඤ්ජිට්ඨං[2] වා ආදාය. සො එවං වදෙය්‍ය: අහං ඉමස්මිං ආකාසෙ රූපානි[3] ලිඛිස්සාමි රූපපාතුභාවං කරිස්සාමීති. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, අපි නු සො පුරිසො ඉමස්මිං ආකාසෙ රූපානි ලිඛෙය්‍ය රූපපාතුභාවං කරෙය්‍යාති? 'නො හෙතං භන්තෙ' තං කිස්ස හෙතු? 'අයං හි භන්තෙ ආකාසො අරූපී අනිදස්සනො. තත්‍ථ න සුකරං රූපං ලිඛිතුං රූපපාතුභාවං කාතුං. යාවදෙව ච පන සො පුරිසො කිලමථස්ස විඝාතස්ස භාගී අස්සා'ති. එවමෙව ඛො භික්ඛවෙ පඤ්චිමෙ වචනපථා යෙහි වො පරෙ වදමානා වදෙය්‍යුං: කාලෙන වා අකාලෙන වා -පෙ- තදාරම්මණඤ්ච සබ්බාවන්තං ලොකං ආකාසසමෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරිස්සාමා'ති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

20. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො ආගච්ඡෙය්‍ය ආදිත්තං තිණුක්කං ආදාය, සො එවං වදෙය්‍ය: අහං ඉමාය ආදිත්තාය තිණුක්කාය ගඞ්ගං නදිං සන්තාපෙස්සාමි සම්පරිතාපෙස්සාමීති. තං කිං මඤ්ඤථ භික්ඛවෙ: අපි නු සො පුරිසො ආදිත්තාය තිණුක්කාය ගඞ්ගං නදිං සන්තාපෙය්‍ය සම්පරිතාපෙය්‍යාති? 'නො හෙතං භන්තෙ.' තං කිස්ස හෙතු? 'ගඞ්ගා හි භන්තෙ නදී ගම්භීරා අප්පමෙය්‍යා. සා න සුකරා ආදිත්තාය තිණුක්කාය සන්තාපෙතුං සම්පරිතාපෙතුං. යාවදෙව ච පන සො පුරිසො කිලමථස්ස විඝාතස්ස භාගී අස්සා'ති. එවමෙව ඛො භික්ඛවෙ පඤ්චිමෙ වචනපථා, යෙහි වො පරෙ වදමානා වදෙය්‍යුං කාලෙන වා අකාලෙන වා -පෙ- තදාරම්මණඤ්ච සබ්බාවන්තං ලොකං ගඞ්ගාසමෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරිස්සාමාති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

21. සෙය්‍යථාපි භික්ඛවෙ බිළාරභස්තා මද්දිතා සුමද්දිතා සුපරිමද්දිතා මුදුකා තූලිනී ඡින්නසස්සරා ඡින්නභබ්භරා.[4] අථ පුරිසො ආගච්ඡෙය්‍ය කට්ඨං වා කඨලං වා ආදාය, සො එවං වදෙය්‍ය: අහං ඉමං බිළාරභස්තං මද්දිතං සුමද්දිතං සුපරිමද්දිතං මුදුකං තූලිනිං ඡින්නසස්සරං ඡින්නභබ්භරං කට්ඨෙන වා කඨලෙන වා සරසරං කරිස්සාමි භරභරං කරිස්සාමීති. –

1. හලිද්දං, ස්‍යා. 2 මංජෙට්ඨං, ස්‍යා. 3. රූපං, මජසං.
4 ඡින්නභබ්භරා, කම්බො.

මෙත්සිතට අරමුණු වූ සියලු සත්ත්වයන් ඇති මුළු ලොව විපුල වූ මහත්-බවට ගියා වූ අප්‍රමාණ වූ වෛර නැති නිදුක් වූ පොළොව හා සමාන වූ සිතින් පතුරුවා වසත්තෙමු'යි. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතු ය.

19. මහණෙනි, යම් සේ පුරුෂයෙක් ලතු වණවැටි හෝ කහ වණවැටි හෝ නිල් වණවැටි හෝ මදටි වණවැටි හෝ ගෙන එන්නේ ය. හේ 'මම මේ ආකාශයෙහි රූප ලියන්නෙමි. රූප පහළ කරන්නෙමි 'යි මෙසේ කියන්නේ ය. මහණෙනි, ඒ කුමැයි හඟනහු ද, ඒ පුරුෂ මේ අහසෙහි රූප ලියන්නේ ද, රූප පහල කරන්නේ ද? 'වහන්ස, මේ නො වේ ම ය.' ඒ කවරහෙයින? 'වහන්ස, මේ අහස අරූපී ය. ඇසට නො හමු වන්නේ ය. එහි රූප ඇඳීම නො කට හැක්කේ ය. රූප පහල කරන්නට පුකර නො වේ. හුදෙක් ඒ පුරුෂ තෙමේ කලාන්තයට වෙහෙසට හිමියෙක් වන්නේ ය.' මහණෙනි, එපරිද්දෙන් ම යම් වචනපථයන්ගෙන් තොපට කියන්නා වූ අන්‍යයෝ කියන්නාහු නම්, එහි මේ වාඩිමාගීයෝ පස්දෙනෙක් වෙත්: කල්හි හෝ නොකල්හි හෝ ... ඒ මෛත්‍රීචිත්තයට අරමුණු වූ සියල්ල ඇති ලෝකය ආකාශය හා සම වූ මහත් වූ මහත්බවට ගියාවූ අප්‍රමාණ වූ වෛර නැති සිතින් පතුරුවා වසත්තෙමු,යි මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතු ය.

20. මහණෙනි, යම්සේ පුරුෂයෙක් ඇවිලගත් තණසුලක් ගෙන එන්නේ ද, හේ මෙසේ කියන්නේ ය. 'මම මේ ඇවිලගත් තණසුලින් ගඞ්ගා නදිය තවන්නෙමි. හාත්පසින් තවන්නෙමි'යි කියා යි. මහණෙනි, ඒ කුමැ යි හඟනහු ද, ඒ පුරුෂ ඇවිලගත් තණසුලින් ගඞ්ගානදිය තවන්නේ ද, හාත්පසින් තවන්නේ ද? 'වහන්ස, එය නො වන්නේ ම ය ' ඒ කවරහෙයින? 'වහන්ස, ගඞ්ගානදිය ගැඹුරුය. පමණ නො කට හැකි ය. ඇවිලගත් තණසුලකින් උණු කරන්නට නො හැක්කේ ය. හාත්පසින් තවන්නට නො හැක්කේ ය. හුදෙක් ඒ පුරුෂ තෙමේ වෙහෙසට දුකට හිමි වන්නේ ය.' මහණෙනි, එපරිද්දෙන් ම තොපට යම් වචනපථයන්ගෙන් කියන්නා වූ අන්‍යයෝ කියන්නාහු නම්, මේ ඒ වාඩිමාගී පස්දෙනෙක් වෙත්. කල්හි හෝ නො කල්හි හෝ ...ඒ මෙත්-සිතට අරමුණු වූ සියල්ල ඇති ලෝකය ගඞ්ගානදිය හා සම වූ මහත් වූ මහත් බවට ගියා වූ අප්‍රමාණ වූ වෛර නැති ද්වේෂ නැති සිතින් පතුරුවා වසත්තෙමු'යි මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතු ය.

21. මහණෙනි, මඩිනලද මැනවින් මඩිනලද මොළොක් වූ සිඹුල් පුළුන් වැනි වූ 'සර, සර' යන ශබ්ද නැති, 'බර, බර' යන හඬ නැති බලල්සමින් කළ පසුම්බියක් යම් සේ වේ ද, ඉක්බිති දණ්ඩක් හෝ ගල්කැටයක් හෝ ගෙන පුරුෂයෙක් එන්නේ ය. හෙතෙමේ මෙසේ කියන්නේ ය. මම මේ මඩිනලද මැනවින් මඩිනලද, මොළොක් වූ සිඹුල් පුළුන් වැනි වූ 'සර, සර' යන හඬ නැති, 'බර, බර' යන හඬ නැති බලල්සමින් කළ පසුම්බිය කාෂ්ඨයෙන් හෝ ගල්කැටයෙන් 'සර, සර' යන හඬ ඇත්තක් කරන්නෙමි. 'බර, බර' යන හඬ ඇත්තක් කරන්-නෙ මි' යි කියා යි. –

Free Distribution   www.aathaapi.org

22. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, අපි නු සො පුරිසො අමුං බිළාරභස්තං මද්දිතං සුමද්දිතං සුපරිමද්දිතං මුදුකං තූලිනිං ඡින්නසස්සරං ඡින්නභබ්භරං කට්ඨෙන වා කඨලෙන වා සරසරං කරෙය්‍ය භරභරං කරෙය්‍යාති? 'නො හෙතං භන්තෙ'. තං කිස්ස හෙතු? 'අසු හි[1] භන්තෙ බිළාරභස්තා මද්දිතා සුමද්දිතා සුපරිමද්දිතා මුදුකා තූලිනී ඡින්නසස්සරා ඡින්නභබ්භරා, සා න සුකරා කට්ඨෙන වා කඨලෙන වා සරසරං කාතුං භරභරං කාතුං. යාවදෙව ච පන සො පුරිසො කිලමථස්ස විඝාතස්ස භාගී අස්සා'ති. එවමෙව ඛො භික්ඛවෙ පඤ්චිමෙ වචනපථා යෙහි වො පරෙ වදමානා වදෙය්‍යුං: කාලෙන වා අකාලෙන වා, භූතෙන වා අභූතෙන වා, සණ්හෙන වා ඵරුසෙන වා, අත්ථසංහිතෙන වා අනත්ථසංහිතෙන වා, මෙත්තචිත්තා වා දොසන්තරා වා. කාලෙන වා භික්ඛවෙ පරෙ වදමානා වදෙය්‍යුං අකාලෙන වා. භූතෙන වා භික්ඛවෙ පරෙ වදමානා වදෙය්‍යුං අභූතෙන වා. අත්ථසංහිතෙන වා භික්ඛවෙ පරෙ වදමානා වදෙය්‍යුං අනත්ථසංහිතෙන වා. මෙත්තචිත්තා වා භික්ඛවෙ පරෙ වදමානා වදෙය්‍යුං දොසන්තරා වා. තත්‍රාපි වො භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: "න චෙව නො චිත්තං විපරිණතං භවිස්සති. න ච පාපිකං වාචං නිච්ඡාරෙස්සාම. හිතානුකම්පී ච විහරිස්සාම මෙත්තචිත්තා න දොසන්තරා. තඤ්ච පුග්ගලං මෙත්තාසහගතෙන චෙතසා ඵරිත්වා විහරිස්සාම. තදාරම්මණඤ්ච සබ්බාවන්තං ලොකං බිළාරභස්තාසමෙන[2] චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරිස්සාමා"ති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

23. උභතොදණ්ඩකෙන පි චෙ[3] භික්ඛවෙ කකචෙන චොරා ඔචරකා[4] අඞ්ගමඞ්ගානි ඔක්කන්තෙය්‍යුං, තත්‍රාපි යො මනො පදූසෙය්‍ය, න මෙ සො තෙන සාසනකරො. තත්‍රාපි වො[5] භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: "න චෙව නො චිත්තං විපරිණතං භවිස්සති. න ච පාපිකං වාචං නිච්ඡාරෙස්සාම. හිතානුකම්පී ච විහරිස්සාම මෙත්තචිත්තා න දොසන්තරා. තඤ්ච පුග්ගලං මෙත්තාසහගතෙන චෙතසා ඵරිත්වා විහරිස්සාම. තදාරම්මණඤ්ච සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරිස්සාමා"ති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

24. ඉමඤ්ච තුම්හෙ භික්ඛවෙ කකචූපමං ඔවාදං අභික්ඛණං මනසිකරෙය්‍යාථ. පස්සථ නො තුම්හෙ භික්ඛවෙ තං වචනපථං අණුං වා ථූලං වා යං තුම්හෙ නාධිවාසෙය්‍යාථාති? 'නො හෙතං භන්තෙ.' තස්මාතිහ භික්ඛවෙ ඉමං කකචූපමං ඔවාදං අභික්ඛණං මනසි කරොථ. තං වො භවිස්සති දීඝරත්තං හිතාය සුඛායාති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

කකචූපමසුත්තං පඨමං.

---

1. අමු හි, මජසං. අයඤ්හි, සතා. 2. විළාරභස්තාසමෙන, සතා.
3. චෙ පි, මජසං. PTS. 4. චොචරකා, සතා. 5. ඛො, මජසං. PTS.

Free Distribution www.aathaapi.org

22. මහණෙනි, ඒ කිමැ යි හඟනාහු ද? ඒ පුරුෂ තෙමේ මඩිත ලද හාත්පසින් මඩිත ලද මොලොක් වූ හිඹුල් පුළුන් වැනි, 'සර, සර' යන හඬ නැති, බර බර යනහඬ නැති බලල්සම්න් කළ ඒ පසුම්බිය කාෂ්ඨයෙන් හෝ ගල්කැටයෙන් හෝ 'සර සර' යන හඬ 'බර බර' යන හඬ ඇත්තක් කරන්නේ ද? වහන්ස, එය 'නො වේ ම ය.' ඒ කවර හෙයින: වහන්ස, බිඩාලභස්ත්‍රාව මර්දිත ය. සුමර්දිත ය. සුපරිමර්දිත ය මෘදුක ය, තූලිනී ය. ඡින්නසස්සර ය. ඡින්නභබ්භර ය. ඒ භස්ත්‍රාව කාෂ්ඨයකින් හෝ ගල්කැටයකින් හෝ 'සර, සර' යන හඬ ඇත්තක්, 'බර, බර' යන හඬ ඇත්තක් කරන්නට පහසු නො වන්නී ය. හුදෙක් ඒ පුරුෂ තෙමේ වෙහෙසට දුකට හිමියෙක් වන්නේ ය.' මහණෙනි, එපරිද්දෙන් ම යම් වචනපථයන්ගෙන් තොපට කියන්නා වූ අන්‍යයෝ කාලයෙහි හෝ අකාලයෙහි හෝ, විද්‍යමාන වූ හෝ අවිද්‍යමාන වූ හෝ, මොලොක් වූ හෝ, රළු වූ හෝ අර්ථ සහිත වූ හෝ අර්ථරහිත වූ හෝ, මෙත්සිත් ඇත්තාහු හෝ දොස් සිත් ඇත්තාහු හෝ කියන්නාහු නම්, මේ ඒ වාඩිමාර්ගයෝ පස්දෙනෙක් වෙති. මහණෙනි, කියන්නා වූ අන්‍යයෝ කල්හි හෝ නොකල්හි හෝ කියන්නාහු ය. මහණෙනි, කියන්නා වූ අන්‍යයෝ විද්‍යමාන වූ හෝ අවිද්‍යමාන වූ හෝ වචනයෙන් කියන්නාහු ය. මහණෙනි, කියන්නා වූ අන්‍යයෝ මොලොක් වූ හෝ රළු වූ හෝ වචනයෙන් කියන්නාහු ය. මහණෙනි, කියන්නා වූ අන්‍යයෝ අර්ථයෙන් යුක්ත වූ හෝ අනර්ථයෙන් යුක්ත වූ හෝ වචනයෙන් කියන්නාහු ය. මහණෙනි, කියන්නා වූ අන්‍යයෝ මෙත්සිත් ඇත්තාහු හෝ දොස්සිත් ඇත්තාහු හෝ කියන්නාහු ය මහණෙනි, එහි ලා තොප විසින් මෙසේ හික්මිය යුතු යː "අපගේ සිත වෙනසකට පත් නො වන්නේ ය. ලාමකවචන නො කියන්නෙමු. හිතානුකම්පා ඇති ව මෙත්සිත් ඇති ව දොස්සිත් නැතිව වසන්නෙමු. ඒ පුද්ගලයා කෙරෙහි මෛත්‍රිය පතුරුවා වසන්නෙමු. මෙත් සිතට අරමුණු වූ සියල්ල ඇති ලෝකය විපුල වූ මහත්බවට ගියා වූ අප්‍රමාණ වූ වෛර නැති ද්වේෂ නැති, බලල්සම් පසුම්බිය වැනි සිතින් පතුරුවා වසන්නෙමු" යි කියා යි. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතු ය.

23. මහණෙනි, ඉදින් පහත් හැඩුරුම් ඇති සොරු දෙපස දඬු ඇති කියතකින් ශරීරාවයව කපන්නාහු ද, එහි ද යමෙක් සිත දූෂිත කරන්නේ නම් එයින් හෙතෙමේ මාගේ අනුශාසනය කරන්නෙක් නො වේ. මහණෙනි, එහි දී ද තොප විසින් මෙසේ හික්මිය යුතුයි: "අපේ සිත වෙනස් වූවක් නො වන්නේ ය. ලාමක වචන නො කියන්නෙමු. හිතානුකම්පී ව මෙත්සිත් ඇති ව දොස් සිත් නැතිව වසන්නෙමු. ඒ පුද්ගලයා මෛත්‍රී සහගත සිතින් පතුරුවා වසන්නෙමු. ඒ මෙත් සිතට අරමුණු වූ සියල්ල ඇති ලොව විපුල වූ මහත් බවට ගියා වූ අප්‍රමාණ වූ වෛර නැති ද්වේෂ නැති බලල්සම් පසුම්බිය වැනි (මෘදු) සිතින් පතුරු වා වසන්නෙමු" කියා යි. මහණෙනි, මෙසේ තොප විසින් හික්මිය යුතු ම ය.

24. මහණෙනි, තෙපි මේ කකචූපම අවවාදය නිතර මෙනෙහි කරන්නහු නම්, මහණෙනි, තෙපි යම් වචනපථයක් නො ඉවසන්නහු ද, එබඳු අල්පසාවද්‍ය වූ හෝ මහාසාවද්‍ය වූ හෝ වචනපථයක් දක්නහු ද? 'වහන්ස, මෙය නො වේ ම ය. මහණෙනි, එහෙයින් මෙහි මේ කකචූපම අවවාදය නිතර මෙනෙහි කරවු. මහණෙනි, එය තොපට බොහෝ කාලයක් හිත පිණිස ද සුව පිණිස ද වන්නේ ය."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව මැනැවැ යි පිළිගත්තාහු ය.

කකචූපම සූත්‍රය පළමුවැනි යි.

1. 3. 2.

අලගද්දූපමසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **අරිට්ඨස්ස** නාම භික්ඛුනො ගද්ධබාධි[1]පුබ්බස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හොති: තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි - යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා[2] භගවතා, තෙ පටිසෙවතො නාලං අන්තරායායාති. අස්සොසුං ඛො සම්බහුලා භික්ඛූ: අරිට්ඨස්ස කිර නාම භික්ඛුනො ගද්ධබාධිපුබ්බස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි - යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, තෙ පටිසෙවතො නාලං අන්තරායායාති.

2. අථ ඛො තෙ භික්ඛූ යෙන අරිට්ඨො භික්ඛු ගද්ධබාධිපුබ්බො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං එතද-වොචුං: සච්චං කිර තෙ ආවුසො අරිට්ඨ එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, තෙ පටිසෙවතො නාලං අන්තරායායාති?

3. "එවං ව්‍යා[3] ඛො අහං ආවුසො භගවතා ධම්මං දෙසිතං ආජානාමි - යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, තෙ පටිසෙවතො නාලං අන්තරායායා"ති.

4. අථ ඛො තෙ භික්ඛූ අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙතුකාමා සමනුයුඤ්ජන්ති සමනුගාහන්ති සමනුභාසන්ති: "මා හෙවං[4] ආවුසො අරිට්ඨ අවච,[5] මා හෙවං ආවුසො අරිට්ඨ අවච. මා භගවන්තං අබ්භාචික්ඛි.[6] න හි සාධු භගවතො අබ්භක්ඛානං.[7] න හි භගවා එවං වදෙය්‍ය. අනෙකපරියායෙනාවුසො[8] අරිට්ඨ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා. අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායාය.

---

1. ගණ්ඩබාධි, සයා.
2. ධම්මා වුත්තා, මජසං. සයා. PTS
3. ඛ්‍යා, මජසං, සයා. PTS
4. එවං, PTS. සී.
5. අවච, මා භගවන්තං, මජසං සයා. PTS.
6. අබ්භාචික්ඛ, සයා.
7. අබ්භාචික්ඛනං, මජසං.
8. අනෙකපරියායෙනාවුසො, මජසං.

1. 3. 2.

අලගද්දූපම සූත්‍රය

1. **මා** විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර සමීපයෙහි වූ **ජේතවන** නම් **අනේපිඬුසිටුහුගේ** ආරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි ගද්ධබාධිපුබ්බ (ගිජුලිහිණියන් නසන කුලයෙහි උපන්) **අරිට්ඨ** නම් මහණහට මෙබඳු ලාමක දෘෂ්ටියෙක් උපනා: "භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ අන්තරායකරධර්ම කෙනෙක් (ස්වර්ගමොක්‍ෂ දෙකට) අන්තරායකරයහ යි යම් සේ වදාරන ලද්දාහු ද, ඒ ධර්මයෝ සෙවනය කරන්නාහට අන්තරාය පිණිස අසමර්ථයහ (අන්තරායකර නොවෙති) යි මෙසේ මම තථාගතයන් වහන්සේ විසින් දෙසූ ධර්මය දනිමි යි" කියා යි. බොහෝ භික්‍ෂූහු "ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහට – 'භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ අන්තරායකරධර්ම කෙනෙක් ස්වර්ගමොක්‍ෂ දෙකට අන්තරායකරයහයි යම්සේ වදාරන ලද්දාහු ද, ඒ ධර්මයෝ සෙවුනාහට අන්තරාය පිණිස සමර්ථ නො වෙති යි මෙසේ මම තථාගතයන් වහන්සේ විසින් දෙසූ ධර්මය දනිමි' යි මෙබඳු පාපදෘෂ්ටියක් උපන්නේල" යි ඇසූහ

2. ඉක්බිති ඒ භික්‍ෂූහු ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහු කරා එළඹියාහු ය එළඹ ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහට තෙල කීහ: "ඇවැත් අරිට්ඨයෙනි, තට – 'භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ ධර්ම කෙනෙක් (ස්වර්ගමොක්‍ෂ දෙකට) බාධකයහ' යි යම්සේ වදාරන ලද්දාහු ද, සෙවුනාහට ඒ ධර්මයෝ අන්තරාය පිණිස අසමර්ථයහ' යි මෙසේ මම තථාගතයන් වහන්සේ විසින් දෙසූ ධර්මය දනිමි' යි යන පවිටු දෘෂ්ටියෙක් උපන්නේ සැබෑ ද" යි කියා යි

3. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් පරිද්දකින් යම් මේ අන්තරායකරධර්ම කෙනෙක් (ස්වර්ගමොක්‍ෂ දෙකට) අන්තරායකරයහ යි වදාරන ලද්දාහු ද, සෙවුනාහට ඒ ධර්මයෝ අන්තරාය පිණිස අසමර්ථයහ යි එවැති සේ මම තථාගතයන් වහන්සේ විසින් දෙසූ ධර්මය දනිමි" යි කී ය.

4. ඉක්බිති ඒ භික්‍ෂූහු ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහු ඒ පවිටු දෘෂ්ටියෙන් තොර කරනු කැමැත්තාහු ප්‍රශ්න කරති. ලබ්ධිය පිහිටුවති. කරුණු විචාරමින් බෙණෙත්: "ඇවැත් අරිට්ඨයෙනි, මෙසේ නො කියව. ඇවැත් අරිට්ඨයෙනි, මෙසේ නො කියව භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන නො කරව. භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යානය නො මැනැවි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො ම වදාරන සේක් ම ය. ඇවැත්න අරිට්ඨයෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ලෙසින් අන්තරාය-කර ධර්මයෝ අන්තරායකරයහ යි වදාරන ලදහ. ඒ ධර්මයෝ සෙවුනාහට අන්තරාය පිණිස සමර්ථ වෙත් ම ය

5. අප්පස්සාදා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භිය්‍යො. අට්ඨිකඞ්කලූපමා කාමං වුත්තා භගවතා, -පෙ-* මංසපෙසූපමා කාමා වුත්තා භගවතා, -පෙ- තිණුක්කූපමා කාමා වුත්තා භගවතා, -පෙ- අඞ්ගාරකාසූපමා කාමා වුත්තා භගවතා, -පෙ- සුපිනකූපමා කාමා වුත්තා භගවතා, -පෙ- යාචිතකූපමා කාමා වුත්තා භගවතා, -පෙ- රුක්ඛඵලූපමා කාමා වුත්තා භගවතා, -පෙ- අසිසූනූපමා කාමා වුත්තා භගවතා, -පෙ- සත්තිසූලූපමා කාමා වුත්තා භගවතා, -පෙ- සප්පසිරූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භිය්‍යො"ති.

6. එවම්පි ඛො අරිට්ඨො භික්ඛු ගද්ධබාධිපුබ්බො[1] තෙහි භික්ඛූහි සමනුයුඤ්ජියමානො සමනුගාහියමානො සමනුභාසියමානො තමෙව[2] පාපකං දිට්ඨිගතං ථාමසා පරමස්ස[3] වොහරති: "එවං ව්‍යා[4] ඛො අහං ආවුසො භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායා"ති.

7. යතො ඛො තෙ භික්ඛූ නාසක්ඛිංසු අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙතුං, අථ තෙ භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං:

8. "අරිට්ඨස්ස නාම භන්තෙ භික්ඛුනො ගද්ධබාධිපුබ්බස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති. අස්සුම්හ ඛො මයං භන්තෙ, අරිට්ඨස්ස කිර නාම භික්ඛුනො ගද්ධබාධිපුබ්බස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, තෙ පටිසෙවතො නාලං අන්තරායායා"ති

---

1. ගණ්ඩබාධි, සයා. 2. තදෙව, මජසං. සයා. PTS. 3. පරාමාසා, මජසං. 4. බ්‍යා, මජසං. සයා.

* 'අට්ඨිකඞ්කලූපමා කාමා වුත්තා භගවතා, ඉච්චාදිසු සබ්බත්ථ 'බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති' පාඨසෙසො පෙය්‍යාලමුඛෙන දට්ඨබ්බො. පොත්ථකෙසු පෙය්‍යාලවචනං න දිස්සති.

5. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ අල්පාස්වාද ඇත්තාහු ය යි ද, බොහෝ දුක් ඇත්තාහු ය යි ද, බොහෝ දැඩි වෙහෙස ඇත්තාහු ය යි ද, මෙහි ආදීනව බොහෝ ය යි ද, වදාරන ලද්දාහ.'' - භාග්‍යවතුන් වහන්සේ විසින් 'කාමයෝ ඇටසැකිල්ලකට බඳු උපමා ඇත්තාහ... කාමයෝ මාංශපෙශියකට බඳු උපමා ඇත්තාහ... කාමයෝ තණහුලකට බඳු උපමා ඇත්තාහ... කාමයෝ ගිනිඅඟුරුවළකට බඳු උපමාඇත්තාහ... කාමයෝ සිහිනයකට බඳු උපමා ඇත්තාහ... කාමයෝ පිරුළුවකට බඳු උපමා ඇත්තාහ... කාමයෝ රුක්පලයට බඳු උපමා ඇත්තාහ... කාමයෝ අසිපත හා මස්ලොඹුවට බඳු උපමා ඇත්තාහ... කාමයෝ අඩයටි හුලකට බඳු උපමා ඇත්තාහ... කාමයෝ සර්පහිසකට බඳු උපමා ඇත්තාහ... භාග්‍යවතුන් වහන්සේ විසින් 'කාමයෝ බොහෝ දුක් ඇත්තාහ, බොහෝ උපායාස ඇත්තාහ, මෙහි ආදීනව බොහෝ ය'යි වදාරන ලදහ'' යනු යි.

6. මෙසේ ද, ඒ භික්ෂූන් විසින් ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණ ප්‍රශ්න කරනු ලබනුයේ ලබ්ධිය පිහිටුවනු ලබනුයේ කරුණු විචාරනු ලබනුයේ ඒ පවිටු දෘෂ්ටිය ම දෘෂ්ටිබලයෙන් පරාමර්ශ කොට ගෙන එයට බැසගෙන මෙසේ කියයි: 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ අන්තරායකරධර්ම කෙනෙක් (සග මොක් දෙකට) අන්තරායකරයහ යි. වදාරන ලද්දාහු නම්, ඒ ධර්මයෝ සෙවුනාහට යම්සේ අන්තරාය පිණිස නොවෙත් ද, ඇවැත්නි, එවැනි ලෙසින් ම මම භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසූ ධර්මය දනිමි' යි කීයේ ය.

7. යම් හෙයකින් ඒ භික්ෂූහු ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහු ඒ පවිටු දෘෂ්ටියෙන් තොර කරන්නට නො හැකි වූවාහු ද, ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියාහු ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කළාහු ය:

8. ''වහන්ස, ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහට 'යම් මේ අන්තරායකර-ධර්මකෙනෙක් අන්තරායකරයහ' යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දාහු ද, ඔහු සෙවුනාහට යම්සේ අන්තරාය පිණිස අසමර්ථ වෙත් ද, එසේ මම භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසූ ධර්මය දැනගෙන සිටිමි' යි මෙබඳු ලාමක දෘෂ්ටියක් උපන. වහන්ස, අපි ගද්ධබාධිපුබ්බ අරිට්ඨ නම් මහණහුට 'භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ඒ අන්තරායික ධර්ම කෙනෙක් අන්තරායික ධර්මයහ යි වදාරන ලද්දාහු ද, ඔහු සෙවුනාහට යම් සේ අන්තරාය පිණිස අසමර්ථ වෙත් ද, එසේ මම භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ ධර්මය දැනගෙන සිටිමි' යන මෙබඳු පවිටු දෘෂ්ටියෙක් උපන්නේ ල' යි ඇසුම්හ.

9 අථ ඛො මයං භන්තෙ යෙන අරිට්ඨො භික්ඛු ගද්ධබාධිපුබ්බො තෙනුපසඞ්කමිම්හ. උපසඞ්කමිත්වා අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං එතදවොචුම්හ: සච්චං කිර තෙ ආවුසො අරිට්ඨ එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, තෙ පටිසෙවතො නාලං අන්තරායායාති?

10. එවං වුත්තෙ භන්තෙ අරිට්ඨො භික්ඛු ගද්ධබාධිපුබ්බො අම්හෙ එතදවොච: එවං ව්‍යා[1] ඛො අහං ආවුසො භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, තෙ පටිසෙවතො නාලං අන්තරායායාති

11. අථ ඛො මයං භන්තෙ අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙතුකාමා සමනුයුඤ්ජිම්හ සමනුගාහිම්හ සමනුභාසිම්හ: "මා හෙවං ආවුසො අරිට්ඨ අවච,[2] මා හෙවං ආවුසො අරිට්ඨ අවච, මා භගවන්තං අබ්භාචික්ඛි.[3] න හි සාධු භගවතො අබ්භක්ඛානං. න හි භගවා එවං වදෙය්‍ය. අනෙකපරියායෙන හාවුසො අරිට්ඨ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා. අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායාය. අප්පස්සාදා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යො. අට්ඨිකඞ්කලූපමා කාමා වුත්තා භගවතා -පෙ- සප්පසිරූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා ආදීනවො එත්ථ භිය්‍යො"ති.

12. එවම්පි ඛො භන්තෙ අරිට්ඨො භික්ඛු ගද්ධබාධිපුබ්බො අම්හෙහි සමනුයුඤ්ජියමානො සමනුගාහියමානො සමනුභාසියමානො තදෙව පාපකං දිට්ඨිගතං ථාමසා පරාමස්ස[4] අභිනිවිස්ස වොහරති: එවං ව්‍යා ඛො අහං ආවුසො භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, තෙ පටිසෙවතො නාලං අන්තරායායාති. යතො ඛො මයං භන්තෙ නාසක්ඛිම්හ අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙතුං. අථ මයං එතමත්ථං භගවතො ආරොචෙමාති.

---

1. බ්‍යා, මජසං. PTS. 2. අවච, මා භගවන්තං, මජසං.
3. අබ්භාචික්ඛ, ස්‍යා. 4. පරාමාසා, මජසං.

9. වහන්ස, ඉක්බිති අපි ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහු කරා එළඹියම්හ. එළඹ ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහුට තෙල කීම්හ: "ඇවැත අරිට්ඨය, යම් මේ අන්තරායකරධර්ම කෙනෙක් අන්තරායකරයහ යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දාහු නම්, 'ඒ ධර්මයෝ සෙවුනාහට යම්සේ අන්තරාය පිණිස අසමර්ථ ද, මම ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසූ ධර්මය එසේම දනිමි'' යි කියා පවිටු දෘෂ්ටියක් උපන්නේ ල යනු සැබෑ ද? යනුයි.

10. වහන්ස, මෙසේ කීකල්හි ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණ අපට තෙල කී ය: 'යම් මේ අන්තරායකරධර්ම කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් අන්තරායිකයහ යි වදාරන ලද්දාහු ද, 'ඔහු සෙවුනාහට අන්තරාය පිණිස යම් සේ අසමර්ථ ද, භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසූ ධර්මය එසෙයින් ම දනිමි' යි කියා යි.

11. වහන්ස, ඉක්බිති අපි ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහු ඒ පවිටු දෘෂ්ටියෙන් තොර කරනු කැමැත්තමෝ ප්‍රශ්න කළම්හ. ලබ්ධිය පිහිටුවූම්හ. කරුණු විචාළම්හ: "ඇවැත් අරිට්ඨය, මෙසේ නොකියව. ඇවැත් අරිට්ඨය, මෙසේ නො කියව. භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන නො කරව. භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යානය නො මැනවි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො වදාරති. ඇවැත අරිට්ඨයෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් අනේකප්‍රකාරයෙන් අන්තරායිකධර්මයෝ අන්තරායික ධර්මයහ යි වදාරන ලදහ. ඔහු සෙවුනාහට අන්තරාය පිණිස සමර්ථ ම වෙති. භාග්‍යවතුන් වහන්සේ විසින් 'කාමයෝ අල්පාස්වාදයහ. බොහෝ දුක් ඇත්තාහ බොහෝ දුඃඛ ආයාස ඇත්තාහ. මෙහි ආදීනව ඉතා බොහෝ ය' යි වදාරන ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් 'කාමයෝ ඇටසැකිල්ලකට බඳු උපමා ඇත්තාහ... කාමයෝ සජ්ඣිසකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ දුඃඛ ආයාස ඇත්තාහ, මෙහි ආදීනව ඉතා බොහෝ ය' යි වදාරන ලදහ'' කියායි.

12. වහන්ස, මෙලෙසිනුත් අප විසින් ගද්ධබාධිපුබ්බ අරිට්ඨ භික්ෂු තෙමේ ප්‍රශ්න කරනු ලබනුයේ ලබ්ධිය පිහිටුවනු ලබනුයේ කරුණු විචාරනු ලබනුයේ ඒ පවිටු දෘෂ්ටිය ම දැඩි ලෙසින් ගෙන එයට වැද ව්‍යවහාර කරයි: 'යම් මේ අන්තරායකරධර්මය කෙනෙක් අන්තරායකරයහ යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දාහු ද, ඔහු සෙවුනාහට අන්තරාය පිණිස යම්සේ අසමර්ථයහ යි මම භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසූ ධර්මය එවැනි සේ ම දනිමි' කියා යි. වහන්ස, යම් හෙයකින් අපි ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහු ඒ පවිටු දෘෂ්ටියෙන් තොර කරන්නට අසමර්ථ වූවමෝ ද, අපි මේ කාරණය භාග්‍යවතුන් වහන්සේට සැළ කරම්හ.

13. අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි: එහි ත්වං භික්ඛු, මම වචනෙන අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං ආමන්තෙහි "සත්ථා තං ආවුසො අරිට්ඨ ආමන්තෙතී"ති. 'එවං භන්තෙ'ති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙන අරිට්ඨො භික්ඛු ගද්ධබාධිපුබ්බො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං එතදවොච: 'සත්ථා තං ආවුසො අරිට්ඨ ආමන්තෙතී'ති.

14. 'එවමාවුසො'ති ඛො අරිට්ඨො භික්ඛු ගද්ධබාධිපුබ්බො තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං භගවා එතදවොච: සච්චං කිර තෙ අරිට්ඨ එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං- තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, තෙ පටිසෙවතො නාලං අන්තරායායා'ති?

15. "එවං ව්‍යා ඛො අහං භන්තෙ භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙමෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, තෙ පටිසෙවතො නාලං අන්තරායායා"ති.

16. කස්ස ඛො නාම ත්වං මොඝපුරිස, මයා එවං ධම්මං දෙසිතං ආජානාසි? නනු මයා මොඝපුරිස, අනෙකපරියායෙන අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා. අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායාය? අප්පස්සාදා කාමා වුත්තා මයා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යො. අට්ඨිකඞ්කලූපමා කාමා වුත්තා මයා - මංසපෙසූපමා කාමා වුත්තා මයා - තිණුක්කූපමා කාමා වුත්තා මයා - අඞ්ගාරකාසූපමා කාමා වුත්තා මයා - සුපිනකූපමා කාමා වුත්තා මයා - යාචිතකූපමා කාමා වුත්තා මයා - රුක්ඛඵලූපමා කාමා වුත්තා මයා - අසිසූනූපමා කාමා වුත්තා මයා - සත්තිසූලූපමා කාමා වුත්තා මයා - සප්පසිරූපමා කාමා වුත්තා මයා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යො. අථ ච පන ත්වං මොඝපුරිස, අත්තනා දුග්ගහීතෙන අම්හෙ චෙව අබ්භාචික්ඛසි. අත්තානඤ්ච ඛණසි. බහුඤ්ච අපුඤ්ඤං පසවසි. තං හි තෙ මොඝපුරිස, භවිස්සති දීඝරත්තං අහිතාය දුක්ඛායාති.

13. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එක්තරා මහණකු ඇමැතූසේක: 'මහණ තෝ මෙහි එව, මාගේ බසින් ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහු අමතව: ඇවැත අරිට්ඨය, ශාස්තෘන් වහන්සේ තං අමතන සේක' යි කියා ය එසේ ය, වහන්ස, යි ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් අස්වා ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහු වෙත එළඹියේ ය. එළැඹ ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහුට 'ඇවැත, අරිට්ඨය, ශාස්තෘන් වහන්සේ තා අමතත සේක' යි මෙය කී ය. ඇවැත්නි, එසේ ය යි ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණ ඒ මහණහට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හිත. එකත්පසෙක හුන් ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළසේක:

14. යම් මේ අන්තරායකර ධර්මකෙනෙක් අන්තරායකරහ යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දෑහු ද, ඔහු සෙවුනාහට යම්සේ අන්තරාය පිණිස නො වෙත් ද, එසේ මම භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසූධර්මය දැනගෙන සිටිමි'' යි. අරිට්ඨය, තට මෙබඳු පවිටු දෘෂ්ටියෙක් උපන්නේ ල යනු සැබෑ ද?

15. ''වහන්ස, යම් මේ අන්තරායික ධර්ම කෙනෙක් අන්තරායකරහ යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දෑහු නම්, ඔහු සෙවුනාහට යම් සේ අන්තරාය පිණිස නො වෙත් ද, භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසූ ඒ ධර්මය මම එවැනි සේ ම දනිමි.''

16. මෝඝ පුරුෂය, කවරකුට මා විසින් මෙසේ දෙසූ ධර්මයක් තෝ දැන සිටිනෙහි ද? මෝඝ පුරුෂය, මා විසින් නොයෙක් ලෙසින් අන්තරායකර-ධර්මයෝ අන්තරායකරයහ යි වදාරන ලද්දෑහු නො වෙත් ද? සෙවුනාහට ඒ ධර්මයෝ අන්තරාය පිණිස සමර්ථ නො වෙත් ද ? මා විසින් 'කාමයෝ අල්පාස්වාදයහ. බොහෝ දුක් ඇත්තාහ බොහෝ දැඩි ආයාස ඇත්තාහ. මෙහි ආදීනව ඉතා බොහෝ ය' යි වදාරන ලද නො වේ ද? මා විසින් 'කාමයෝ ඇටසැකිල්ලකට බඳු උපමා ඇත්තාහ... 'කාමයෝ මස්-වැදූල්ලකට බඳු උපමා ඇත්තාහ'... 'කාමයෝ තණහුලකට බඳු උපමා ඇත්තාහ'... 'කාමයෝ ගිනිඅඟුරුවළකට බඳු උපමා ඇත්තාහ'... 'කාමයෝ සිහිනයකට බඳු උපමා ඇත්තාහ'... 'කාමයෝ පිරුළුවකට බඳු උපමා ඇත්තාහ' 'කාමයෝ රුක්පල බඳු උපමා ඇත්තාහ'... 'කාමයෝ අසිපත හා මස්ලොඹුවකට බඳු උපමා ඇත්තාහ'... 'කාමයෝ අඩයටි හුලකට බඳු උපමා ඇත්තාහ'... 'කාමයෝ සජ්හිසකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ දැඩි ආයාස ඇත්තාහ. මෙහි ආදීනව ඉතා බොහෝය' යි වදාරන ලද්දෑහ. වැළිදු, මෝඝපුරුෂය, තෝ තමා වරදවා ගත් දෘෂ්ටියෙන් අපට අභ්‍යාඛ්‍යානය කෙරෙහි. තෝ තමන් ගුණ කණිහි. බොහෝ අකුසල් ද රැස් කෙරෙහි. හිස් පුරුෂය, එය තට බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස පවතියි.

17. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: තං කිං මඤ්ඤථ භික්ඛවෙ අපි නායං අරිට්ඨො භික්ඛු ගද්ධබාධිපුබ්බො උස්මීකතොපි ඉමස්මිං ධම්මවිනයෙති? 'කිං හි සියා භන්තෙ, නො හෙතං භන්තෙ'ති. එවං වුත්තෙ අරිට්ඨො භික්ඛු ගද්ධබාධිපුබ්බො තුණ්හීභූතො මඞ්කුභූතො පත්තක්ඛන්ධො අධොමුඛො පජ්ඣායන්තො අප්පටිභානො නිසීදි. අථ ඛො භගවා අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං තුණ්හීගූතං මඞ්කුභූතං පත්තක්ඛන්ධං අධොමුඛං පජ්ඣායන්තං අප්පටිභානං විදිත්වා අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං එතදවොච: 'පඤ්ඤායිස්සසි ඛො ත්වං මොඝපුරිස එතෙන සකෙන පාපකෙන දිට්ඨිගතෙන. ඉධාහං භික්ඛූ පටිපුච්ඡිස්සාමී'ති.

18. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: තුම්හෙපි මෙ භික්ඛවෙ එවං ධම්මං දෙසිතං ආජානාථ, යථායං අරිට්ඨො භික්ඛු ගද්ධබාධිපුබ්බො අත්තනා දුග්ගහිතෙන අම්හෙ චෙව අබ්භාචික්ඛති. අත්තානඤ්ච ඛණති බහුඤ්ච අපුඤ්ඤං පසවතීති? "නො හෙතං භන්තෙ, අනෙකපරියායෙන හි නො භන්තෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා. අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායාය. අප්පස්සාදා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා ආදීනවො එත්ථ භීයො. අට්ඨිකඞ්කලූපමා කාමා වුත්තා භගවතා -පෙ- සප්පසිරූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා ආදීනවො එත්ථ භීයො',ති

19. සාධු භික්ඛවෙ, සාධු ඛො මෙ තුම්හෙ භික්ඛවෙ එවං ධම්මං දෙසිතං ආජානාථ අනෙකපරියායෙන හි වො භික්ඛවෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා මයා. අලං ච පන තෙ පටිසෙවතො අන්තරායාය. අප්පස්සාදා කාමා වුත්තා මයා බහුදුක්ඛා බහුපායාසා ආදීනවො එත්ථ භීයො, අට්ඨිකඞ්කලූපමා කාමා වුත්තා මයා -පෙ- සප්පසිරූපමා කාමා වුත්තා මයා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භීයො. අථ ච පනායං අරිට්ඨො භික්ඛු ගද්ධබාධිපුබ්බො අත්තනා දුග්ගහිතෙන අම්හෙ චෙව අබ්භාචික්ඛති. අත්තානඤ්ච ඛණති[2]. බහුඤ්ච අපුඤ්ඤං පසවති. තං හි තස්ස මොඝපුරිසස්ස භවිස්සති දීඝරත්තං අහිතාය දුක්ඛාය. සො වත භික්ඛවෙ අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර කාමසඤ්ඤාය අඤ්ඤත්‍ර කාමවිතක්කෙහි කාමෙ පටිසෙවිස්සතීති නෙතං ඨානං විජ්ජති.

17. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක: "මහණෙනි, ඒ කිමැයි හඟිතනු ද? මේ ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණ තෙමේ මේ ශාසනයෙහි ඥාන නමැති උෂ්මයෙන් උණුසුම් කරන ලද්දේ ද? "වහන්ස, ඒ කෙසේ වන්නේ ද, වහන්ස, මේ නො වේ ම ය." මෙසේ කීකල්හි ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණ නිශ්ශබ්ද ව මකු ව නැමූ ගෙල ඇති ව යටිකුරු කළ මුව ඇති ව කල්පනා කරමින් වැටහුම් රහිත ව සිටියේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද වූ මකු වූ නැමූ ගෙල ඇති යටිකුරු කළ මුහුණු ඇති කල්පනා කරමින් වැටහීම් රහිත ව හුන් ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහු දැන වදාරා ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණහුට "හිස් පුරුෂය, මේ සවකීය වූ ලාමක මිථ්‍යාදෘෂ්ටියෙන් තෝ ප්‍රකට වන්නෙහි ය. මෙහි ලා මම භික්ෂූන් විචාරන්නෙමි"යි වදාළසේක.

18. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක: "මහණෙනි, මේ ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණ යම් සේ වරදවා ගත් මිථ්‍යාදෘෂ්ටියෙන් අපටත් අභ්‍යාඛ්‍යානය කෙරේ ද, තමත් ගුණ කණී ද, බොහෝ අකුසලුත් රැස් කෙරේ ද, මා විසින් දෙසනා කළ ධර්මය එලෙසින් තෙපි දු දනිවූ ද? "වහන්ස, මෙය නො වේ ම ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් අපට නොයෙක් ලෙසින් අන්තරායිකධර්මී අන්තරායිකධර්මී යයි වදාරන ලදහ. ඔහු සෙවුනාහට අන්තරාය පිණිස ද සමර්ථයහ භාග්‍යවතුන් වහන්සේ විසින් 'කාමයෝ අල්ප ආස්වාද ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ. බොහෝ දුඹ වෙහෙස ඇත්තාහ. මෙහි ආදීනව ඉතා බොහෝ ය'යි නොයෙක් ලෙසින් අපට වදාරන ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් 'කාමයෝ ඇටසැකිල්ලක් වැනියහ... කාමයෝ සර්පහිසක් වැනියහ, බොහෝ දුක් ඇත්තාහ. බොහෝ දුඹ වෙහෙස ඇත්තාහ, මෙහි ආදීනව ඉතා බොහෝ ය'යි වදාරන ලදහ."

19. මහණෙනි, මැනවි. මා විසින් දෙසූ ධර්මය තෙපි දන්නහු ය. එය මැනවි. මහණෙනි, මා විසින් තොපට නොයෙක් ලෙසින් අන්තරායික ධර්මයෝ අන්තරායිකධර්ම යහ යි දෙසන ලදහ. ඔහු සෙවුනාහට අන්තරාය පිණිස පවතිත්. මා විසින් 'කාමයෝ අල්පවූ ආස්වාද ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ දුඹ වෙහෙස ඇත්තාහ, මෙහි ආදීනව ඉතා බොහෝ ය'යි වදාරන ලදහ. මා විසින් 'කාමයෝ ඇටසැකිල්ලක් වැනියහ'... කාමයෝ සර්පහිසක් වැනියහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ දුඹ වෙහෙස ඇත්තාහ, මෙහි ආදීනව ඉතා බොහෝ ය'යි දෙසන ලදහ. එතෙකුදු වුවත් මේ ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණ තෙමේ තමා වරදවා ගත් මිථ්‍යාදෘෂ්ටියෙන් අපට ද අභ්‍යාඛ්‍යානය කරයි. තමත් ගුණ ද කණියි. බොහෝ අකුසල් ද රැස් කරයි. එය ඒ හිස් පුරුෂයාට බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස පවතින්නේ ය. මහණෙනි, හෙතෙමේ ඒකාන්තයෙන් කෙලෙශකාමයන්ගෙන් වෙන් ව කාමසංඥාවන්ගෙන් වෙන් ව ම කාමවිතර්කයන්ගෙන් වෙන්ව ම කාමයන් සෙවනය කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වේ.

20. ඉධ භික්ඛවෙ එකච්චෙ මොඝපුරිසා ධම්මං පරියාපුණන්ති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. තෙ තං ධම්මං පරියාපුණිත්වා තෙසං ධම්මානං පඤ්ඤාය අත්ථං න උපපරික්ඛන්ති. තෙසං තෙ ධම්මා පඤ්ඤාය අත්ථං අනුපපරික්ඛතං න නිජ්ඣානං ඛමන්ති. තෙ උපාරම්භානිසංසා චෙව ධම්මං පරියාපුණන්ති ඉතිවාදප්පමොක්ඛානිසංසා ච. යස්ස චත්ථාය[1] ධම්මං පරියාපුණන්ති තඤ්චස්ස අත්ථං නානුභොන්ති. තෙසං තෙ ධම්මා දුග්ගහිතා දීඝරත්තං අහිතාය දුක්ඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: දුග්ගහිතත්තා භික්ඛවෙ ධම්මානං.

21. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො අලගද්දත්ථිකො අලගද්දගවෙසී අලගද්දපරියෙසනං චරමානො- සො පස්සෙය්‍ය මහන්තං අලගද්දං, තමෙනං භොගෙ වා නඞ්ගුට්ඨෙ වා ගණ්හෙය්‍ය, තස්ස සො අලගද්දො පටිපරිවත්තිත්වා[2] හත්ථෙ වා බාහාය වා අඤ්ඤතරස්මිං වා අඞ්ගපච්චඞ්ගෙ ඩංසෙය්‍ය,[3] සො තතොනිදානං මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං. තං කිස්ස හෙතු: දුග්ගහිතත්තා භික්ඛවෙ අලගද්දස්ස. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චෙ මොඝපුරිසා ධම්මං පරියාපුණන්ති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. තෙ තං ධම්මං පරියාපුණිත්වා තෙසං ධම්මානං පඤ්ඤාය අත්ථං න උපපරික්ඛන්ති. තෙසං තෙ ධම්මා පඤ්ඤාය අත්ථං අනුපපරික්ඛතං න නිජ්ඣානං ඛමන්ති. තෙ උපාරම්භානිසංසා චෙව ධම්මං පරියාපුණන්ති ඉතිවාදප්පමොක්ඛානිසංසා ච. යස්ස චත්ථාය ධම්මං පරියාපුණන්ති තඤ්චස්ස අත්ථං නානුභොන්ති. තෙසං තෙ ධම්මා දුග්ගහිතා දීඝරත්තං අහිතාය දුක්ඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: දුග්ගහිතත්තා භික්ඛවෙ ධම්මානං.

22. ඉධ පන භික්ඛවෙ එකච්චෙ කුලපුත්තා ධම්මං පරියාපුණන්ති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. තෙ තං ධම්මං පරියාපුණිත්වා තෙසං ධම්මානං පඤ්ඤාය අත්ථං උපපරික්ඛන්ති. තෙසං තෙ ධම්මා පඤ්ඤාය අත්ථං උපපරික්ඛතං නිජ්ඣානං ඛමන්ති. තෙ න චෙව උපාරම්භානිසංසා ධම්මං පරියාපුණන්ති න ඉතිවාදප්පමොක්ඛානිසංසා ච. යස්ස චත්ථාය ධම්මං පරියාපුණන්ති තඤ්චස්ස අත්ථං අනුභොන්ති. තෙසං තෙ ධම්මා සුග්ගහිතා දීඝරත්තං හිතාය සුඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: සුග්ගහිතත්තා භික්ඛවෙ ධම්මානං.

---

1. යස්සත්ථාය, සතා. 2. පටිනිවත්තිත්වා, සතා 3. ඩංසෙය්‍ය, මජසං. සතා.

Free Distribution www.aathaapi.org

20. මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් හිස් පුරුෂයෝ සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වේදල්ල යන ධර්ම උගනිත්. ඔහු ඒ ධර්ම ඉගෙන ඒ ධර්මයන්ගේ අර්ථය ප්‍රඥාවෙන් පරීක්‍ෂා නො කරත්. නුවණින් අදහස මෙනෙහි නො කරන්නා වූ ඔවුන්ට ඒ ධර්මයෝ මැනැවින් නො වැටහෙත්. ඔහු පරවාදයන්හි දොස් නැගීම අනුසස් (ප්‍රයොජන) කොට ඇත්තාහු, 'මෙසේ වාදයෙන් මිදෙමු' යි යන්න අනුසස් කොට ඇත්තාහු ධර්මය උගනිත්. යමක් සඳහා ධර්මය හදාරත් නම්, ඒ ප්‍රයොජන ද නො ලබත්. ඔවුන්ට වරදවා ගත් ඒ ධර්මයෝ බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස පවතිත්. එය කවරහෙයින යත්: මහණෙනි, දහම් වරදවා ගත් හෙයිනි.

21 මහණෙනි, සර්පයන්ගෙන් ප්‍රයොජන ඇත්තා වූ සර්පයන් සොයන්නා වූ සර්පයන් සෙවීමෙහි යෙදුණා වූ පුරුෂයෙක් යම්සේ වෙයි ද- හෙතෙම මහත් සර්පයකු දක්නේ ය. ඒ සර්පයා ශරීරයෙහි හෝ නඟුටෙහි හෝ අල්ලා ගන්නේ ය. ඒ සර්පයා ආපසු හැරී ඔහුගේ අත හෝ බාහුව හෝ අන් අඟපසඟක් හෝ දෂ්ට කරන්නේ ය. හෙතෙමේ ඒ හෙතු කොට යෙන මරණයට හෝ මරණය පමණ වූ දුකට හෝ පැමිණෙයි. ඒ කවරහෙයින යත්: මහණෙනි, සර්පයා වැරදි ලෙසින් අල්ලා ගත් හෙයිනි. මහණෙනි, එපරිද්දෙන් ම මේ ශාසනයෙහි ඇතැම් හිස් පුරුෂයෝ සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වේදල්ල යන ධර්ම හදාරත්. ඔහු ඒ ධර්ම ප්‍රගුණ කොට ඒ ධර්මයන්ගේ අර්ථය නුවණින් පරීක්‍ෂා නො කරත්. නුවණින් අර්ථය පරීක්‍ෂා නො කරන ඔවුන්ට ධර්මයෝ මැනවින් නො වැටහෙත්. ඔහු පරවාදයෙහි දොස් නැගීම අනුසස් කොට ඇත්තාහු ද 'මෙසේ වාදයෙන් මිදෙමු' යි යන්න ප්‍රයෝජන කොට ඇත්තාහු ද ධර්මය උගනිත්. යමක් සඳහා ධර්මය උගනිත් නම්, ඒ අර්ථය ද නො ලබත්. වරදවා ගත් ඒ ධර්මයෝ ඔවුන්ට බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස පවතිත්. ඒ කවරහෙයින යත්: මහණෙනි, ධර්මය වරදවා උගත් බැවිනි.

22. මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් කුලපුත්‍ර කෙනෙක් සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වේදල්ල යන ධර්ම හදාරත්. ඔහු ඒ ධර්ම ඉගෙන ඒ ධර්මයන්ගේ අර්ථය නුවණින් පරී කරත් නුවණින් අර්ථ පරීක්‍ෂා කරන්නා වූ ඔවුන්ට ඒ ධර්මයෝ වැටහෙත්. ඔහු පරවාදයෙහි දොස් නැංවීම අනුසස් කොට ඇත්තාහු ද ධර්මය නො උගනිත්. 'මෙසේ වාදයෙන් මිදෙමු' යි යන්න අනුසස් කොට ඇත්තාහු ද ධර්මය නො උගනිත්. යමක් සඳහා උගනිත් නම් ඒ ධර්මයාගේ ඒ ඵලය ද ලබත්. ඔවුන් විසින් මැනවින් උගත් ඒ ධර්මයෝ ඔවුන්ට දිගුකලක් හිත පිණිස සුව පිණිස පවතිත්. ඒ වර හෙයින යත්: මහණෙනි, ධර්මයන් මැනවින් උගත් බැවිනි.

23. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො අලගද්දත්ථිකො අලගද්දගවෙසී අලගද්දපරියෙසනං චරමානො- සො පස්සෙය්‍ය මහන්තං අලගද්දං, තමෙනං අජපදෙන දණ්ඩෙන සුනිග්ගහිතං නිග්ගණ්හෙය්‍ය, අජපදෙන දණ්ඩෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා[1] ගීවාය[2] සුග්ගහිතං ගණ්හෙය්‍ය; කිඤ්චාපි සො භික්ඛවෙ අලගද්දො තස්ස පුරිසස්ස හත්ථං වා බාහං වා අඤ්ඤතරං වා අඞ්ගපච්චඞ්ගං භොගෙහි පලිවෙඨෙය්‍ය,[3] අථ ඛො සො නෙව තතොනිදානං මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං. තං කිස්ස හෙතු: සුග්ගහිතත්තා භික්ඛවෙ අලගද්දස්ස. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චෙ කුලපුත්තා ධම්මං පරියාපුණන්ති, සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං තෙ තං ධම්මං පරියාපුණිත්වා තෙසං ධම්මානං පඤ්ඤාය අත්ථං උපපරික්ඛන්ති තෙසං තෙ ධම්මා පඤ්ඤාය අත්ථං උපපරික්ඛතං නිජ්ඣානං ඛමන්ති. තෙ න චෙව උපාරම්භානිසංසා ධම්මං පරියාපුණන්ති න ඉතිවාදප්පමොක්ඛානිසංසා ච. යස්ස චත්ථාය ධම්මං පරියාපුණන්ති තඤ්චස්ස අත්ථං අනුභොන්ති තෙසං තෙ ධම්මා සුග්ගහිතා දීඝරත්තං හිතාය සුඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: සුග්ගහිතත්තා භික්ඛවෙ ධම්මානං. තස්මාතිහ භික්ඛවෙ යස්ස මෙ භාසිතස්ස අත්ථං ආජානෙය්‍යාථ තථා නං ධාරෙය්‍යාථ. යස්ස ච පන මෙ භාසිතස්ස අත්ථං න ආජානෙය්‍යාථ අහං වා[4] පටිපුච්ඡිතබ්බො යෙ වා පනස්සු වියත්තා භික්ඛූ.

24. කුල්ලූපමං වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි[5] නිත්ථරණත්ථාය නො ගහණත්ථාය. තං සුණාථ, සාධුකං මනසි කරොථ. භාසිස්සාමීති. එවම්භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

25. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො අද්ධානමග්ගප්පටිපන්නො- සො පස්සෙය්‍ය මහන්තං උදකණ්ණවං, ඔරිමං තීරං[6] සාසඞ්කං සප්පටිභයං, පාරිමං තීරං[7] ඛෙමං අප්පටිභයං, න චස්ස[8] නාවා සන්තාරණී උත්තරසෙතු වා අපාරාපාරං ගමනාය; තස්ස එවමස්ස: "අයං ඛො මහා උදකණ්ණවො ඔරිමං තීරං සාසඞ්කං සප්පටිභයං. පාරිමං තීරං ඛෙමං අප්පටිභයං. නත්ථි ච නාවා සන්තාරණී උත්තරසෙතු වා අපාරාපාරං ගමනාය. යන්නූනාහං තිණකට්ඨසාඛාපලාසං සඞ්කඩ්ඪිත්වා කුල්ලං බන්ධිත්වා තං කුල්ලං නිස්සාය හත්ථෙහි ච පාදෙහි ච වායමමානො සොත්ථිනා පාරං උත්තරෙය්‍යන්ති."

1. නිග්ගහිත්වා, මජසං. 2. ගීවායං, සයා. 3. පලිවෙඨෙය්‍ය, සයා.
4. තථෙව, සයා. 5. දෙසෙස්සාමි, කත්ථචි. 6. ඔරිමතීරං, සයා.
7. පාරිමතීරං, සයා. 8. න වාස්ස, සයා.

23. මහණෙනි, සර්පයක්ගෙන් ප්‍රයොජන කැමැත්තාවූ සර්පයක් සොයන්නා වූ සර්පයක් සෙවීමෙහි හැසිරෙන්නා වූ පුරුෂයෙක් යම්සේ වේ ද- හෙතෙමේ මහත් සර්පයකු දකියි. ඒ මේ සර්පයා එළුකුරයක් වැනි දණ්ඩකින් මැනවින් දඬි ව අල්ලා ගන්නේ ය. එළුකුරදණ්ඩෙන් මැනවින් දඬි ව අල්ලා ගෙන මැනවින් ගෙල අල්ලා ගන්නේ ය. ඒ සර්පයා ඒ පුරුෂයාගේ අත හෝ බාහුව හෝ එක්තරා අඟපසඟක් හෝ දරණයෙන් වෙළා ගන්නේ ය. එසේ වුවත් ඒ හෙතු කොට ගෙන හෙතෙම මරණයට හෝ මරණමාත්‍ර වූ දුකට හෝ නො පැමිණෙන්නේ ය. ඒ කවරහෙයින යත්: මහණෙනි, සර්පයා මැනවින් අල්ලා ගත් බැවිනි. මහණෙනි, එපරිද්දෙන් ම මේ ලෝකයෙහි ඇතැම් කුලපුත්‍රයෝ සූත්‍ර ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල යන ධර්මයන් හදාරත්. ඔහු ඒ ධර්ම හදාරා ඒ ධර්මයන්ගේ අර්ථය නුවණින් පිරික්සත්. නුවණින් පරීක්‍ෂා කරන්නා වූ ඔවුන්ට ඒ ධර්මයෝ වැටහෙත්. ඔහු පරවාදයෙහි දොස් නැගීම අනුසස් කොට ඇත්තාහු ධර්මය නො උගනිත්. 'මෙසේ වාදයෙන් මිදෙමු' යි යන්න අනුසස් කොට ඇත්තාහු ඒ ධර්මය නො උගනිත්. යමක් පිණිස ධර්මය උගනිත් නම්, ඒ ප්‍රයොජන ද ලබත්. ඔවුන් විසින් මැනවින් උගත් ඒ ධර්මයෝ ඔවුන්ට දිගුකලක් හිත පිණිස පවතිත්. ඒ කවරහෙයින යත්: මහණෙනි, දහම් මැනවින් උගත් බැවිනි. මහණෙනි, එහෙයින් මෙහි මා විසින් දෙශනා කළ යම් ධර්මයක්හුගේ අර්ථය දන්නහු නම්, එය එසේ දරවු. මා දේශනා කළ යම් ධර්මයක්හුගේ අර්ථය නො දන්නහු නම්, එහි දී මම හෝ පිළිවිසිය යුත්තෙමි. යම් ව්‍යක්ත භික්‍ෂූහු වෙත් ද, ඔහු හෝ පිළිවිසිය යුත්තාහු ය.

24. මහණෙනි, තොපට මම පහුර උපමා කොට ඇති දහම් දෙසන්නෙමි. එය එතෙර වීම පිණිස ය. ගැනීම පිණිස නො වේ. එය අසවු. මැනැවින් මෙනෙහි කරවු. දෙසන්නෙමි යි වදාළසේක. 'භාග්‍යවතුන් වහන්ස, එසේ ය'යි ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක:

25. මහණෙනි, අධ්වමගට පිළිපන් පුරිස්තෙමේ යම් සේ වේ ද, හෙතෙමේ සැක සහිත වූ බිය සහිතවූ මෙතෙර ඇති, සැක රහිත බිය රහිත එතෙර ඇති, මහත් වූ ජලස්කන්ධයක් දක්නේ ය. ඔහුට මෙතෙරින් එතෙර යාමට තරණ නැවක් හෝ මත්තෙහි බැඳි හෙයක් හෝ නො වන්නේ ය. ඔහුට මෙවැනි අදහසක් වන්නේ ය: "මේ මහාජලස්කන්ධයෙකි. මෙගොඩ සැක සහිත ය. බිය සහිත ය. පරතෙර උවදුරු රහිත ය. ප්‍රතිභය රහිත ය. මෙතෙරින් එතෙර යාම සඳහා තරණ නැවක් හෝ මත්තෙහි බැඳි හෙයක් හෝ නැත. මම තණ, ලීදඬු, අතුකොළ කඩා එකතු කොට පහුරක් බැඳ ඒ පහුර නිසා අතින් හා පයින් උත්සාහ කරමින් සුව සේ එතෙර වන්නෙම් නම් මැනැව" කියා යි.

26. අථ ඛො සො භික්ඛවෙ පුරිසො තිණකට්ඨසාඛාපලාසං සඞ්කඩ්ඪිත්වා කුල්ලං බන්ධිත්වා තං කුල්ලං නිස්සාය හත්ථෙහි ච පාදෙහි ච වායමමානො සොත්ථිනා පාරං උත්තරෙය්‍ය. තස්ස පුරිසස්ස[1] උත්තිණ්ණස්ස[2] පාරං ගතස්ස[3] එවමස්ස: 'බහුකාරො ඛො මෙ අයං කුල්ලො. ඉමාහං කුල්ලං නිස්සාය හත්ථෙහි ච පාදෙහි ච වායමමානො සොත්ථිනා පාරං උත්තිණ්ණො. යන්නූනාහං ඉමං කුල්ලං සීසෙ වා ආරොපෙත්වා ඛන්ධෙ වා උච්චාරෙත්වා යෙන කාමං පක්කමෙය්‍ය'න්ති. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, අපි නු සො පුරිසො එවංකාරී තස්මිං කුල්ලෙ කිච්චකාරී අස්සාති? 'නො හෙතං භන්තෙ.'

27. කථංකාරී ච සො භික්ඛවෙ පුරිසො තස්මිං කුල්ලෙ කිච්චකාරී අස්ස? ඉධ භික්ඛවෙ තස්ස පුරිසස්ස උත්තිණ්ණස්ස පාරං ගතස්ස එවමස්ස: බහුකාරො ඛො මෙ අයං කුල්ලො, ඉමාහං කුල්ලං නිස්සාය හත්ථෙහි ච පාදෙහි ච වායමමානො සොත්ථිනා පාරං උත්තිණ්ණො, යන්නූනාහං ඉමං කුල්ලං ථලෙ වා උස්සාදෙත්වා[4] උදකෙ වා ඔපිලාපෙත්වා යෙන කාමං පක්කමෙය්‍යන්ති. එවංකාරී ඛො සො භික්ඛවෙ පුරිසො තස්මිං කුල්ලෙ කිච්චකාරී අස්ස. එවමෙව ඛො භික්ඛවෙ කුල්ලූපමො මයා ධම්මො දෙසිතො නිත්ථරණත්ථාය නො ගහණත්ථාය. කුල්ලූපමං වො භික්ඛවෙ ධම්මං දෙසිතං ආජානන්තෙහි ධම්මාපි වො පහාතබ්බා, පගෙව අධම්මා.

28. ඡයිමානි භික්ඛවෙ දිට්ඨිට්ඨානානි. කතමානි ඡ? ඉධ භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො-

රූපං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති සමනුපස්සති. වෙදනං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති සමනුපස්සති. සඤ්ඤං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති සමනුපස්සති. සඞ්ඛාරෙ 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති සමනුපස්සති. යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති සමනුපස්සති. යම්පිදං දිට්ඨිට්ඨානං 'සො ලොකො සො අත්තා, සො පෙච්ච භවිස්සාමි: නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො, සස්සතිසමං තථෙව ඨස්සාමී'ති තම්පි 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති සමනුපස්සති.

---

1. තස්ස, ස්‍යා. PTS. සී.
2. තිණ්ණස්ස, PTS සී.
3. පාරගතස්ස, ස්‍යා.
4. උස්සාපෙත්වා, ස්‍යා.

26. ඉක්බිති මහණෙනි, ඒ පුරුෂ තෙම තණ දඬු අතුකොළ කඩා රැස් කොට පසුරක් බැඳ ඒ පසුර නිසා අතින් පයින් වෑයම් කරමින් සුවසේ එතෙර යන්නේ ය. එතෙර වූ පරතෙරට ගිය ඒ පුරුෂයාට – 'මට මේ පසුර බොහෝ උපකාරී වී ය. මම මේ පසුර නිසා අතින් පයින් වෑයම් කරමින් සුවෙන් එතෙර වීමි. මම මේ පසුර හිස තබා ගෙන හෝ කර තබා ගෙන හෝ කැමැති මගකින් යන්නෙම් නම් මැනැවැ' යි මෙබඳු අදහසෙක් වන්නේ නම්, මහණෙනි, ඒ කිමැයි හඟනහු ද, මෙසේ කරන්නා වූ ඒ පුරුෂ තෙමේ ඒ පසුරෙහි කළයුතු දෑ කරන්නෙක් වන්නේ ද? 'වහන්ස, මේ නො වේ ම ය'.

27. මහණෙනි, කෙසේ කරනුයුලු ඒ පුරුෂ තෙමේ ඒ පසුරෙහි කළ යුතු දෑ කරන්නෙක් වන්නේ ද? මහණෙනි, මෙහි එතෙර වූ පරතෙරට පැමිණි ඒ පුරුෂයාහට මෙවැනි අදහසෙක් වන්නේ ය: 'මට මේ පසුර බොහෝ උපකාර ඇත්තේ විය. මම මේ පසුර නිසා අතින් ද පයින් ද වෑයම් කරමින් සුව සේ එතෙර වූයෙමි. මම මේ පසුර ගොඩට පමුණුවා හෝ දියෙහි පා කොට යවා හෝ කැමැති මගකින් යන්නෙම් නම්, මැනැවැ' යි. මහණෙනි, මෙසේ කරන පුලු වූ ඒ පුරුෂ තෙමේ ඒ පසුරෙහි කළ යුතු දෑ කරන්නෙක් වන්නේ ය. මහණෙනි, එපරිද්දෙන් ම මා විසින් පසුර උපමා කොට ඇති ධර්ම දෙශනා කරන ලදී. එය සසරින් එතෙර වීම පිණිස ය. ගැනුම පිණිස නො වේ. මහණෙනි, පසුර උපමං කොට තොපට දෙසන ලද ධර්මය දන්නා වූ තොප විසින් (ශමථවිදර්ශනා)ධර්මයෝ ද හළ යුත්තාහ. අධර්මයෝ කැලමැ යි.

28. මහණෙනි, මේ දෘෂ්ටිස්ථාන (දෘෂ්ටි අරමුණු) සයෙකි. කවර සයෙක යත්: මහණෙනි, මේ ලෝකයෙහි ආර්යයන් නො දක්නාවූ ආර්යධර්මයෙහි අදක්‍ෂ වූ ආර්යධර්මයෙහි නො හික්මුණා වූ, සත්පුරුෂයන් නො දක්නා වූ සත්පුරුෂ ධර්මයෙහි අදක්‍ෂ වූ සත්පුරුෂධර්මයෙහි නො හික්මුණා වූ නූගත් පෘථග්ජන තෙමේ –

'මේ මාගේ ය, මෙය මම වෙමි, මෙය මාගේ ආත්ම ය'යි රූපය තණ්හා මාන දිට්ඨි වශයෙන් දකී. 'මේ මාගේ ය, මෙය මම වෙමි, මෙය මාගේ ආත්ම ය' යි වේදනාව තෘෂ්ණා මාන දෘෂ්ටිවශයෙන් දකී. 'මේ මාගේ ය, මෙය මම වෙමි, මෙය මාගේ ආත්ම ය'යි සංඥාව තෘෂ්ණා මාන දෘෂ්ටි වශයෙන් දකියි. 'මෙ මාගේ ය, මෙය මම වෙමි, මෙය මාගේ ආත්ම ය'යි සංස්කාරයන් තෘෂ්ණාමාන දෘෂ්ටි වශයෙන් දකියි. යම් මේ රූපායතනයක් වේ ද, ශබ්දායතනයකුත් වේ ද, මුත වූ ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යායතනයෝත් වෙත් ද, විඥාත වූ සෙසු ස්ථානායතනයෝත් වෙත් ද, පැමිණෙන ලද සොයන ලද සිතින් අනුගමනය කරන ලද (විඥානාරම්මණයෙහි වූ) තණ්හා මාන දිට්ඨීහු වෙත් ද, එය ද 'මෙය මාගේ ය, මෙය මම වෙමි, මෙය මාගේ ආත්ම ය'යි සලකයි. 'ලෝකය ඒ ය, ආත්මය ඒ ය, ඒ මම පරලොව ගොස් එහි නිත්‍ය, ධ්‍රැව, ශාශ්වත, අවිපරිණාම සවභාව ඇත්තෙම වන්නෙමි. ශාශ්වත ය (මහාමෙරු ආදිය) සේ ම සිටින්නෙමි' යි යම් මේ දෘෂ්ටිස්ථානයකුත් වේ ද, එයත් 'මෙය මාගේ ය. මෙය මම වෙමි. මෙය මාගේ ආත්ම ය'යි දකියි.

29. සුතවා ච ඛො භික්ඛවෙ අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො, සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො –

රූපං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සති. වෙදනං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සති. සඤ්ඤං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සති. සඞ්ඛාරෙ 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සති යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සති. යම්පිදං දිට්ඨිට්ඨානං, සො ලොකො සො අත්තා, සො පෙච්ච භවිස්සාමි: නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො, සස්සතිසමං තථෙව ඨස්සාමී'ති තම්පි 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සති. සො එවං සමනුපස්සන්තො අසති න පරිතස්සතීති.

30. එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: සියා නු ඛො භන්තෙ බහිද්ධා අසති පරිතස්සනාති? සියා භික්ඛූති භගවා අවොච: "ඉධ භික්ඛු එකච්චස්ස එවං හොති අහු[1] වත මෙ, තං වත මෙ නත්ථි, සියා වත මෙ, තං වතාහං න ලභාමීති. සො සොචති කිලමති පරිදෙවති, උරත්තාළිං කන්දති, සම්මොහං ආපජ්ජති. එවං ඛො භික්ඛු බහිද්ධා අසති පරිතස්සනා හොතී"ති.

31. සියා පන භන්තෙ බහිද්ධා අසති අපරිතස්සනාති? සියා භික්ඛූති භගවා අවොච: "ඉධ භික්ඛු එකච්චස්ස න එවං හොති 'අහු වත මෙ, තං වත මෙ නත්ථි, සියා වත මෙ, තං වතාහං න ලභාමී'ති. සො න සොචති න කිලමති න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජති. එවං ඛො භික්ඛු බහිද්ධා අසති අපරිතස්සනා හොතී"ති.

32. සියා නු ඛො භන්තෙ අජ්ඣත්තං අසති පරිතස්සනාති? සියා භික්ඛූති භගවා අවොච: –

1. අහූ, PTS.

Free Distribution www.aathaapi.org

29. මහණෙනි, ආර්‍යයන් දක්නාසුලු වූ, ආර්‍යධර්මයෙහි දක්‍ෂ වූ ආර්‍යධර්මයෙහි හික්මුණා වූ, සත්පුරුෂයන් දක්නාසුලු වූ, සත්පුරුෂධර්මයෙහි දක්‍ෂ වූ සත්පුරුෂධර්මයෙහි හික්මුණා වූ ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක තෙමේ -

'මෙය මාගේ නො වේ. මෙය මම නො වෙමි. මෙය මාගේ ආත්මය නො වේ ය'යි රූපය දකියි. 'මෙය මාගේ නො වෙයි. මෙය මම නො වෙමි. මෙය මාගේ ආත්මය නො වේ ය'යි වෙදනා දකියි. 'මෙය මාගේ නො වේ. මෙය මම නො වෙමි. මෙය මාගේ ආත්මය නො වේ ය'යි සංස්කාරයන් දකියි යම් මේ රූපායතනයක් වේ ද, ශබ්දායතනයකුත් වේ ද, ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යායතනයෝත් වෙත් ද, සෙසු ස්පර්‍ශායතනයෝත් වෙත් ද, සිතින් පැමිණෙනලද සොයන ලද අනුගමනය කරන ලද තෘෂ්ණාමාන දෘෂ්ටීහු වෙත් ද, එය ද 'මාගේ නො වේ. එය මම නො වෙමි. එය මාගේ ආත්මය නො වේ ය'යි දකියි. ලෝකය ඒ ය, ආත්මය ඒ ය, ඒ මම පරලොව ගොස් එහි නිත්‍ය, ධ්‍රැව, ශාශ්වත, අවිපරිණාම (නො පෙරළෙන) ස්වභාව ඇත්තෙම් වන්නෙමි. ශාශ්වතයක් සෙයින් සිටින්නෙමි' යි යම් මේ දෘෂ්ටිස්ථානයකුත් වේ ද, ඒ දෘෂ්ටියත් 'මෙය මාගේ නොවෙයි මේ මම නොවෙමි මෙය මාගේ ආත්මය නො වේය' යි දකියි. හෙතෙමේ මෙසේ නුවණින් දක්නේ (පරමාර්ථ වශයෙන්) රූපාදිය නැති (අවිද්‍යමාන ය යි පෙනෙන) කල්හි තැති නො ගනී යි.

30. මෙසේ වදාළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: "වහන්ස, බැහැරි දේ නැති කල්හි තැති ගැන්මක් වේ ද?" 'මහණ, වන්නේ ය'යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක "මහණ, මේ ලොකයෙහි ඇතැම් කෙනකුන්ට 'මට ධනලාභයක් වීය. දැන් එය මට නැත. මට (ලැබියයුතු) (යම් ධනයක්) වන්නේ නම්, එය මම නො ලබමි යි මෙබඳු අදහසෙක් වෙයි. හෙතෙම ශෝක කරයි. ක්ලාන්ත වෙයි වැලපෙයි. ළය අත්පැහැර හඬයි. මුළාවට පැමිණෙයි. මහණ, මෙසේ බැහැරි දේ නැති කල්හි තැති ගැන්ම වේ ය"යි වදාළසේක.

31. "වහන්ස, බැහැරි දේ නැති කල්හි තැති ගැන්මක් නො වන්නේ ද?" 'මහණ, නො වන්නේ ය' යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක: මහණ, මේ ලොකයෙහි ඇතැම් කෙනෙකුන්ට 'මට (රන් රුවන් ආදී ධනයක්) වීය. එය මට නැත. මට (ලැබිය යුතු ධනයක්) වන්නේ නම්, එය මම නො ලබමි' යි මෙබඳු අදහසක් නො වේ. හෙතෙම ශෝක නො කෙරෙයි. ක්ලාන්ත නො වෙයි. නො වැලපෙයි. ළය අත් පැහැර නො හඬයි. මුළාවට නො පැමිණෙයි. මහණ, මෙසේ බැහැරි දේ නැති කල්හි තැතිගැන්ම නො වේ ය"යි වදාළ සේක.

32 "වහන්ස, තමා පිළිබඳ දේ නැති කල්හි තැති ගැන්මක් වන්නේ ද?" 'මහණ, වන්නේ ය' යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක: -

"ඉධ භික්ඛු එකච්චස්ස එවං දිට්ඨි හොති: 'සො ලොකො සො අත්තා, සො පෙච්ච භවිස්සාමි නිච්චො ධුවො සස්සතො අවිපරිණාම ධම්මො. සස්සතිසමං තථෙව ඨස්සාමී'ති. සො සුණාති තථාගතස්ස වා තථාගත-සාවකස්ස වා සබ්බෙසං දිට්ඨිට්ඨානාධිට්ඨානපරියුට්ඨානාභිනිවෙසානුසයානං සමුග්ඝාතාය සබ්බසඞ්ඛාරසමථාය සබ්බූපධිපටිනිස්සග්ගාය තණ්හක්ඛයාය විරාගාය නිරොධාය නිබ්බානාය ධම්මං දෙසෙන්තස්ස. තස්ස[1] එවං හොති: 'උච්ඡිජ්ජිස්සාමි නාම සු,[2] විනස්සිස්සාමි නාම සු, න සු නාම[3] භවිස්සාමී'ති. සො සොචති කිලමති පරිදෙවති, උරත්තාළිං කන්දති, සම්මොහං ආපජ්ජති. එවං ඛො භික්ඛු අජ්ඣත්තං අසති පරිතස්සනා හොතී''ති.

33. සියා පන භන්තෙ අජ්ඣත්තං අසති අපරිතස්සනාති? සියා භික්ඛූති භගවා අවොච: "ඉධ භික්ඛු එකච්චස්ස න එවං දිට්ඨි හොති: 'සො ලොකො සො අත්තා, සො පෙච්ච භවිස්සාමි නිච්චො ධුවො සස්සතො අවිපරිණාම-ධම්මො. සස්සතිසමං තථෙව ඨස්සාමී'ති. සො සුණාති තථාගතස්ස වා තථාගතසාවකස්ස වා සබ්බෙසං දිට්ඨිට්ඨානාධිට්ඨානපරියුට්ඨානාභි-නිවෙසානුසයානං සමුග්ඝාතාය සබ්බසඞ්ඛාරසමථාය සබ්බූපධිපටිනිස්සග්ගාය තණ්හක්ඛයාය විරාගාය නිරොධාය නිබ්බානාය ධම්මං දෙසෙන්තස්ස. තස්ස න එවං හොති: 'උච්ඡිජ්ජිස්සාමි නාම සු, විනස්සිස්සාමි නාම සු, න සු නාම භවිස්සාමී'ති. සො න සොචති න කිලමති න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජති. එවං ඛො භික්ඛු අජ්ඣත්තං අසති අපරිතස්සනා හොති."

34. තං භික්ඛවෙ පරිග්ගහං පරිග්ගණ්හෙය්‍යාථ ය්වාස්ස පරිග්ගහො නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො, සස්සතිසමං තථෙව තිට්ඨෙය්‍ය. පස්සථ නො තුම්හෙ භික්ඛවෙ තං පරිග්ගහං ය්වාස්ස පරිග්ගහො නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො, සස්සතිසමං තථෙව තිට්ඨෙය්‍යාති? 'නො හෙතං භන්තෙ.' සාධු භික්ඛවෙ, අහම්පි ඛො තං භික්ඛවෙ පරිග්ගහං න සමනුපස්සාමි ය්වාස්ස පරිග්ගහො නිච්චො ධුවො සස්සතො අවිපරිණාම-ධම්මො, සස්සතිසමං තථෙව තිට්ඨෙය්‍ය.

1. තස්සෙවං, ස්‍යා. 2. නාමස්සු, මජසං. සං. 3. නස්සු, මජසං. සං.

Free Distribution www.aathaapi.org

“මහණ, මේ ලොකයෙහි ඇතැම් එකකුට ‘ලෝකය ඒය, ආත්මය ඒය, ඒ මම පරලොව ගොස් නිත්‍ය වන්නෙමි. ස්ථිර වන්නෙමි. සදාකාලික වන්නෙමි. නො පෙරළෙන සවභාව ඇත්තෙම් වන්නෙමි. ශාශ්වතයක් මෙන් එසේ ම සිටින්නෙමි’ යි මෙබඳු දෘෂ්ටිය වේ ද, හෙතෙම සියලු දෘෂ්ටි, දෘෂ්ටි හෙතු, දෘෂ්ටි පිහිටන තැන්, දෘෂ්ටි නැඟී සිටීම්, දෘෂ්ටින්ට බැස ගැනීම්, දෘෂ්ටින් සිතෙහි ලැග පැවතුම් යන මොවුන් මුල් පුන් කිරීමට ද, සියලු සංස්කාරයන් සංසිඳවීම් පිණිස ද, සියලු උපධීන් බැහැර කිරීම පිණිස ද, තෘෂ්ණා ක්‍ෂය කිරීම පිණිස ද, නො ඇලීම පිණිස ද, නිරොධය පිණිස ද, නිර්වාණය පිණිස ද, දහම් දෙසන තථාගතයන් වහන්සේගේ හෝ තථාගතශ්‍රාවකයකුගේ හෝ දෙශනාව අසයි. ඔහුට මෙවැනි අදහසෙක් වෙයි: ‘අනුත්පත්ති වශයෙන් සිඳී යන්නෙම් ල. වැනසී යන්නෙම් ල. උත්පත්තිවශයෙන් නො වන්නෙම් ලයි’ හෙතෙම ශොක කරයි. ක්ලාන්ත වෙයි. වැලපෙයි. ළය අත් පැහැර හඬයි. මූලාවට පැමිණෙයි. මහණ, මෙසේ තමං පිළිබඳ වූවක් නැති කල්හි තැති ගැන්ම වෙයි”

33. “වහන්ස, ආධ්‍යාත්මික ස්කන්ධ නැති කල්හි නො තැති ගැන්ම වන්නේ ද? ‘මහණ, වන්නේ ය’ යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. මහණ, මේ ලොකයෙහි ඇතැම් එකකුට මෙවැනි දෘෂ්ටියෙක් නො වෙයි: ලොකය ඒය. ආත්මය ඒය. ඒ මම පරලොව ගොස් නිත්‍ය වන්නෙමි. ස්ථිර වන්නෙමි. සදාකාලික වන්නෙමි. නොපෙරළෙන සවභාව ඇත්තෙම් වන්නෙමි. හැමදා පවතින දෙයක් මෙන් සිටින්නෙමි’ යි මෙබඳු දෘෂ්ටිය නො වේ ද, හෙතෙම සියලු දෘෂ්ටි, දෘෂ්ටි හෙතු, දෘෂ්ටි පිහිටන තැන්, දෘෂ්ටි නැඟීම්, දෘෂ්ටින්ට බැස ගැනීම්, දෘෂ්ටිය සිතෙහි ලැග ගැනීම් යන මොවුන් මුලුපුන් කිරීම පිණිස ද, සියලු සංස්කාරයන් සංසිඳවීම් පිණිස ද සියලු උපධීන් බැහැර කිරීම් පිණිස ද, තෘෂ්ණාක්‍ෂය කිරීම් පිණිස ද, නො ඇලීම පිණිස ද, නිරෝධය පිණිස ද, නිර්වාණය පිණිස ද දහම් දෙසන තථාගතයන් වහන්සේගේ හෝ තථාගතශ්‍රාවකයකුගේ හෝ දෙශනාව අසයි. ඔහුට මෙ වැනි අදහසෙක් නො වේ: ‘අනුත්පත්ති වශයෙන් සිඳී යන්නෙම් ල. වැනසී යන්නෙම් ල. උත්පත්ති වශයෙන් නො වන්නෙම් ල කියා යි. හෙතෙම ශෝක නො කරයි. ක්ලාන්ත නො වෙයි. නො වැලපෙයි. ළය අත් පැහැර නො හඬයි. මූලාවට නො පැමිණෙයි. මහණ, මෙසේ ආධ්‍යාත්මික ස්කන්ධය නැති කල්හි නොතැති ගැන්ම වේ.

33. “මහණෙනි, නිත්‍ය ධ්‍රැව ශාශ්වත අවිපරිණාමධර්ම වූ පරිග්‍රහයක් (තමා අයත් යම් බැහැරි පිරිකරක්) වන්නේ ද, ශාශ්වත වස්තූන් සම ව එසේ ම (එය) සිටින්නේ නම්, ඒ බැහැරි දෙය පිළිගනිවු. මහණෙනි, තෙපි නිත්‍ය ධ්‍රැව ශාශ්වත අවිපරිණාමධර්ම වූ තමා අයත් යම් බැහැරි දෙයක් ශාශ්වත වස්තූන් සම ව එසේ ම එය සිටින්නේ නම් ඒ බැහැරි දෙය, මහණෙනි, තෙපි දක්නහු ද? ‘වහන්ස, එය නො වේ ම ය.’ මහණෙනි, මැනවි. මහණෙනි, යම් පරිග්‍රහයෙක් නිත්‍ය ද ධ්‍රැව ද සදාකාලික ද අවිපරිණාමධර්ම ද ශාශ්වත දෙයක් මෙන් එසේ ම සිටින්නේ ද එබඳු පරිග්‍රහයක් මම ද නො දකිමි.

35. තං භික්ඛවෙ අත්තවාදුපාදානං උපාදියෙථ යංස අත්තවාදුපාදානං උපාදියතො න උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා. පස්සථ නො තුම්හෙ භික්ඛවෙ තං අත්තවාදුපාදානං යංස[1] අත්තවාදුපාදානං උපාදියතො න උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා'ති? 'නො හෙතං භන්තෙ.' සාධු භික්ඛවෙ, අහම්පි ඛො තං භික්ඛවෙ අත්තවාදුපාදානං න සමනුපස්සාමි යංස අත්තවාදුපාදානං උපාදියතො න උප්පජ්ජෙය්‍යුං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා.

36 තං භික්ඛවෙ දිට්ඨිනිස්සයං නිස්සයෙථ යංස දිට්ඨිනිස්සයං නිස්සයතො න උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා. පස්සථ නො තුම්හෙ භික්ඛවෙ තං දිට්ඨිනිස්සයං යංස දිට්ඨිනිස්සයං නිස්සයතො න උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා'ති? 'නො හෙතං භන්තෙ.' සාධු භික්ඛවෙ, අහම්පි ඛො තං භික්ඛවෙ දිට්ඨිනිස්සයං න සමනුපස්සාමි යංස දිට්ඨිනිස්සයං නිස්සයතො න උප්පජ්ජෙය්‍යුං සොක-පරිදෙවදුක්ඛදොමනස්සුපායාසා.

37. අත්තනි වා භික්ඛවෙ සති 'අත්තනියං මෙ'ති අස්සා'ති? 'එවං භන්තෙ.' අත්තනියෙ වා භික්ඛවෙ සති 'අත්තා මෙ'ති අස්සා'ති? එවං භන්තෙ. අත්තනි ච භික්ඛවෙ අත්තනියෙ ච සච්චතො ථෙතතො අනුපලබ්භමානෙ[2] යම්පිදං[3] දිට්ඨිට්ඨානං 'සො ලොකො සො අත්තා, සො පෙච්ච භවිස්සාමි නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො, සස්සති-සමං තථෙව ඨස්සාමී'ති, නන්වායං භික්ඛවෙ කෙවලො පරිපූරො බාලධම්මො'ති? 'කිං හි නො සියා භන්තෙ, කෙවලො පරිපූරො[4] බාල-ධම්මො'ති.

38. තං කිං මඤ්ඤථ භික්ඛවෙ රූපං නිච්චං වා අනිච්චං වා'ති? 'අනිච්චං භන්තෙ.' යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා'ති? 'දුක්ඛං භන්තෙ.' යම්පනා-නිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං: 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති? 'නො හෙතං භන්තෙ.'

39 තං කිං මඤ්ඤථ භික්ඛවෙ වෙදනා නිච්චා වා අනිච්චා වා'ති? 'අනිච්චා භන්තෙ.' යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා'ති? 'දුක්ඛං භන්තෙ' යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං: 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති? 'නො හෙතං භන්තෙ'

---

1. යස්ස, සෑ. 2. අනුපලබ්භියමානෙ, සෑ. සී.
3. යම්පි තං, මජසං 4 කෙවලො හි භන්තෙ පරිපූරො, මජසං.

Free Distribution www.aathaapi.org

35 මහණෙනි, යම් ආත්මවාදෙපාදානයක් උපාදාන කරන්නා වූ (දැඩි කොට ගන්නා වූ) ඔහුට ශොකය, වැලපීම, කායිකචෛතසික දුක, දැඩි වෙහෙස යන මොහු හුපදින්නාහු නම්, ඒ ආත්මවාදෙපාදානය උපාදාන කරවු. මහණෙනි, තෙපි යම් ආත්මවාදෙපාදානයක් උපාදාන කරන්නාවූ ඔහුට සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ හුපදින්නාහු නම්' එබඳු ආත්මවාදෙපාදානයක් දනිවු ද? 'වහන්ස, එය නො වේ ම ය. මහණෙනි, මැනවි. මහණෙනි, යම් ආත්මවාදෙපාදානයක් උපාදාන කරන්නා වූ ඔහුට ශොකය වැලපීම දුක දෙම්නස දැඩි වෙහෙස යන මොහු නුපදින්නාහු නම්, මහණෙනි, එබඳු ආත්මවාදෙපාදානයක් මම ද නො දකිමි.

36. මහණෙනි, යම දෘෂ්ටිනිඃශ්‍රයයක් ඇසුරු කරන්නා වූ ඔහුට ශොකය වැලපීම දුක දෙම්නස දැඩි වෙහෙස යන මොහු නුපදින්නාහු නම්, එබඳු දෘෂ්ටිනිඃශ්‍රයයක් ඇසුරු කරවු. මහණෙනි, යම් දෘෂ්ටිනිඃශ්‍රයයක් ඇසුරු කරන්නා වූ ඔහුට සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නුපදින්නාහු නම්, එබඳු දෘෂ්ටිනිඃශ්‍රයයක් දකිවු ද? 'වහන්ස, එය නො වේ ම ය.' මහණෙනි, මැනවි. මහණෙනි, යම් දෘෂ්ටිනිඃශ්‍රයයක් ඇසුරු කරන්නා වූ ඔහුට සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නුපදින්නාහු නම්, මහණෙනි, මමත් එබඳු දෘෂ්ටිනිඃශ්‍රයයක් නො දකිමි.

37. මහණෙනි, ආත්මය (මම) ඇතිකල්හි අත්තනිය (මට අයත් දෙය) මාගේ ය'යි යන අදහස වන්නේ ද? "වහන්ස, එසේ ය.' මහණෙනි, අත්තනිය ඇතිකල්හි 'ආත්ම ය මාගේ'යි යන අදහස වන්නේ ද? 'වහන්ස, එසේ ය.' මහණෙනි, ආත්මය ද ආත්මය පිළිබඳ දෙයක් ද සත්‍යවශයෙන් ස්ථිරවශයෙන් නො ලැබෙන කල්හි 'ඒ ලොකය, ඒ ආත්ම ය යි, ඒ මම පරලොව ගොස් නිච්ච ධුව සස්සත අවිපරිණාම ධම්ම වන්නෙමි. ශාශ්වත වස්තූන් වැනි ව එසේ ම සිටින්නෙමි' යි යම් ඒ දෘෂ්ටිකාරණයෙක් වේ ද, මහණෙනි, මෙය හුදු පිරිපුන් බාල(අඥ)ධර්මයක් නො වේ ද? 'වහන්ස, කිම නො වන්නේ ද, හුදු පිරිපුන් බාලධර්මයක් වේ මය.

38. "මහණෙනි, රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද? 'වහන්ස, අනිත්‍ය ය.' යමක් අනිත්‍ය ද, එය දුක් හෝ සැප හෝ වේ ද? 'වහන්ස, දුක ය. 'යමක් අනිත්‍ය ද, දුක් ද, පෙරළෙන සවභාව ඇත්තේ ද, 'මෙය මගේ ය. මෙය මම වෙමි. මේ මාගේ ආත්ම ය'යි දක්මට සුදුසු ද?" 'වහන්ස, එය සුදුසු නො වේ ම ය.'

33. "මහණෙනි, ඒ කිමැයි හඟනහු ද? වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද? 'වහන්ස, අනිත්‍ය ය.' යමක් අනිත්‍ය නම්, එය දුක් ද, සැප ද? 'වහන්ස, දුක් ය. යමක් අනිත්‍ය නම්, දුක නම් වෙනස් වනසුලු නම්, 'මේ මාගේ ය. මෙය මම වෙමි. මේ මාගේ ආත්ම ය'යි එය එසේ දක්නට සුදුසු ද? ' වහන්ස, ඒ නො වේ ම ය.'

40. තං කිං මඤ්ඤථ භික්ඛවෙ සඤ්ඤා නිච්චා වා අනිච්චා වාති? 'අනිච්චා භන්තෙ.' යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? 'දුක්ඛං භන්තෙ.' යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති? 'නො හෙතං භන්තෙ.'

41 තං කිං මඤ්ඤථ භික්ඛවෙ සඞ්ඛාරා නිච්චා වා අනිච්චා වාති? 'අනිච්චා භන්තෙ.' යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? 'දුක්ඛං භන්තෙ.' යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති? 'නො හෙතං භන්තෙ.'

42 තං කිං මඤ්ඤථ භික්ඛවෙ විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? 'අනිච්චං භන්තෙ.' යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? 'දුක්ඛං භන්තෙ.' යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති? 'නො හෙතං භන්තෙ.'

43. තස්මාතිහ භික්ඛවෙ යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං, අජ්ඣත්තං වා බහිද්ධා වා, ඔළාරිකං වා සුඛුමං වා, හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං, අජ්ඣත්තං වා බහිද්ධා වා, ඔළාරිකං වා සුඛුමං වා, හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා, සබ්බං විඤ්ඤාණං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

44. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපස්මිං[1] නිබ්බින්දති, වෙදනාය[2] නිබ්බින්දති, සඤ්ඤාය නිබ්බින්දති, සඞ්ඛාරෙසු නිබ්බින්දති, විඤ්ඤාණස්මිං නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු උක්ඛිත්තපලිඝො ඉතිපි, සඞ්කිණ්ණපරිඛො[3] ඉතිපි, අබ්බූළ්හෙසිකො ඉතිපි, නිරග්ගළො ඉතිපි, අරියො පන්නද්ධජො පන්නභාරො විසංයුත්තො ඉතිපි.

---

1. රූපස්මිම්පි, සයා. 2. වෙදනායපි, සයා.
3. පරික්ඛො, මජසං. සයා.

40 මහණෙනි, ඒ කිමැයි හඟනහු ද, සංඥාව නිත්‍ය ද අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍ය යි.' යමක් අනිත්‍ය නම්, එය දුක් ද සැප ද, 'වහන්ස, එය දුක් ය.' යමක් අනිත්‍ය නම්, දුක් නම්, වෙනස්වනසුලු නම්, 'එය මාගේ ය එය මම වෙමි. එය මාගේ ආත්ම ය'යි එය එසේ දක්නට සුදුසු ද? 'වහන්ස ඒ නො වේ ම ය.'

41. මහණෙනි, ඒ කිමැයි හඟනහු ද, සංස්කාරයෝ නිත්‍ය ද අනිත්‍ය ද? 'වහන්ස, අනිත්‍යයි.' යමක් අනිත්‍ය නම්, එය දුක් ද සැප ද? 'වහන්ස, දුක් ය.' යමක් අනිත්‍ය නම්, දුක් නම්, වෙනස් වනසුලු නම්, 'එය 'මාගේ ය. ඒ මම වෙමි. එය මාගේ ආත්මය'යි එය එසේ දක්නට සුදුසු ද 'වහන්ස, ඒ නො වේ ම ය.'

42. මහණෙනි, ඒ කිමැයි හඟනහු ද, විඥ්ඥාණය නිත්‍ය ද අනිත්‍ය ද? වහන්ස, අනිත්‍ය යි.' යමක් අනිත්‍ය නම්, එය දුක් ද සැප ද? 'වහන්ස, දුක් ය.' යමක් අනිත්‍ය නම්, දුක් නම්, වෙනස් වනසුලු නම්, 'එය මාගේ ය. ඒ මම වෙමි. එය මාගේ ආත්ම ය'යි එය එසේ දක්නට සුදුසු ද? වහන්ස, ඒ නො වේ ම ය.'

43. මහණෙනි, එහෙයින් මෙහි අතීත වූ ද වර්ත්මාන වූ ද, ආධ්‍යාත්මික වූ ද බාහිර වූ ද, ඖදාරික වූ ද සූක්ෂම වූ ද, හීන වූ ද ප්‍රණීත වූ ද, යම් කිසි රූපයක් වේ ද, දුර වූ ද සමීප වූ ද යම් රූපයකුත් වේ ද, ඒ සියලු රූපය 'මෙය මාගේ නො වෙයි. මෙය මම නො වෙමි. මෙය මාගේ ආත්මය නො වෙයි' මෙසේ එය තත් වූ පරිදි මනා නුවණින් දතයුතු ය. යම් කිසි වේදනාවක්... යම් කිසි සංඥාවක් ... යම් කිසි සංස්කාරයෝ ... අතීත වූත් අනාගත වූත් වර්ත්මාන වූත් ආධ්‍යාත්මික වූත් බාහිර වූත් සූක්ෂම වූත් හීන වූත් ප්‍රණීත වූත් යම් කිසි විඥානයක් වේ ද, දුර වූත් ළඟ වූත් යම් විඥානයකුත් වේ ද, ඒ සියලු විඥානය 'මේ මාගේ නො වෙයි. මේ මම නො වෙමි. මේ මාගේ ආත්මය නො වේ ය'යි මෙසේ එය තත් වූ පරිදි මනා නුවණින් දක්ක යුතු ය.

44. මහණෙනි, මෙසේ දක්නා වූ ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ රූපයෙහි කලකිරෙයි... විඥ්ඥාණයෙහි කලකිරෙයි. කලකිරුනේ නො ඇලෙයි. නො ඇලීමෙන් කෙලෙසුන්ගෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුණේ ය යන දැනීම වෙයි. 'ජාතිය ක්ෂීණ වූයේ වෙයි. බඹසර වැස නිමවන ලදී. සිවුමගින් කළ යුත්ත කරන ලදී. අර්හත්ත්වය සඳහා අනෙකක් නැතැ'යි දන ගනී යි. මහණෙනි, මේ මහණ තෙමේ ඉගුළු අවිද්‍යා නැමැති හිදී අගුළ ඇත්තෙකැ යි ද, පිසුරුවන ලද කර්මාභිසංස්කාර නමැති පරිඛා ඇත්තෙකැ යි ද, උපුල තෘෂ්ණා නැමැති ඉන්ද්‍රකීලය ඇත්තෙකැ යි ද, බිඳලූ ඔරම්භාගිය සංයෝජන නමැති අගුල් ඇත්තෙකැ යි ද, ආර්‍ය්‍යයෙකැ යි ද, හෙළූ මානධ්වජ ඇත්තෙකැ යි ද, බහා තැබූ සකත්බහාරාදිය ඇත්තෙකැ යි ද, කෙලෙසුන්ගෙන් වෙන් වූවෙකැ යි ද කියනු ලැබේ.

45. කථඤ්ච භික්ඛවෙ භික්ඛු උක්ඛිත්තපලිඝො හොති? ඉධ භික්ඛවෙ භික්ඛුනො අවිජ්ජා පහීනා හොති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා[1] අනභාවකතා[2] ආයතිං අනුප්පාදධම්මා. එවං ඛො භික්ඛවෙ භික්ඛු උක්ඛිත්තපලිඝො හොති.

46. කථඤ්ච භික්ඛවෙ භික්ඛු සඞ්කිණ්ණපරිඛො[3] හොති? ඉධ භික්ඛවෙ භික්ඛුනො පොනොභවිකො ජාතිසංසාරො පහීනො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො. එවං ඛො භික්ඛවෙ භික්ඛු සඞ්කිණ්ණපරිඛො හොති.

47. කථඤ්ච භික්ඛවෙ භික්ඛු අබ්බූළ්හෙසිකො හොති? ඉධ භික්ඛවෙ භික්ඛුනො තණ්හා පහීනා හොති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. එවං ඛො භික්ඛවෙ භික්ඛු අබ්බූළ්හෙසිකො හොති.

48. කථඤ්ච භික්ඛවෙ භික්ඛු නිරග්ගළො හොති? ඉධ භික්ඛවෙ භික්ඛුනො පඤ්චොරම්භාගියානි සංයොජනානි පහීනානි හොන්ති උච්ඡින්න-මූලානි තාලාවත්ථුකතානි අනභාවකතානි ආයතිං අනුප්පාදධම්මානි. එවං ඛො භික්ඛවෙ භික්ඛු නිරග්ගළො හොති.

49. කථඤ්ච භික්ඛවෙ භික්ඛු අරියො පන්නද්ධජො පන්නභාරො විසංයුත්තො හොති? ඉධ භික්ඛවෙ භික්ඛුනො අස්මිමානො පහීනො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාද-ධම්මො. එවං ඛො භික්ඛවෙ භික්ඛු අරියො පන්නද්ධජො පන්නභාරො විසංයුත්තො හොති.

50. එවං විමුත්තචිත්තං ඛො භික්ඛවෙ භික්ඛුං සඉන්දා දෙවා සබ්‍රහ්මකා[4] සපජාපතිකා අන්වෙසං නාධිගච්ඡන්ති: 'ඉදං නිස්සිතං තථා-ගතස්ස විඤ්ඤාණ'න්ති. තං කිස්ස හෙතු: දිට්ඨෙවාහං භික්ඛවෙ ධම්මෙ තථාගතං අනනුවෙජ්ජොති[5] වදාමි.

1. තාලවත්ථුකතා, සී. 2. අනභාවං කතා, මජසං. අනභාවං ගතා, සතා.
3. පරික්ඛො, මජසං. සතා. 4. සබ්‍රහ්මා, සතා.
5. අනනුවිජ්ජොති, මජසං. සතා. සී.

45. මහණෙනි, මහණ තෙමේ කෙසේ නම උක්ඛිත්තපලිඝ (උපුල හිදි අගුළු ඇත්තේ) වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණහුගේ අවිද්‍යාව ප්‍රහීණ වූවා ද, සුන් වූ මුල් ඇත්තී ද, මුදුන් සුන් තලක් මෙන් කරන ලද ද, නො වැඩීමට පමුණුවන ලද්දී ද, මත්තෙහි නූපදින සවභාව ඇත්තී ද, මහණෙනි, මෙසේ මහණ තෙමේ උක්ඛිත්ත පලිඝ වේ

46. මහණෙනි, කෙසේ නම් මහණ තෙමේ සංකිණ්ණපරිඛ (පිරුවන ලද දිය අගල ඇත්තේ) වේ ද? මහණෙනි, මෙහි මහණහුගේ පුනර්භවය දෙන්නා වූ ජාති සංසාරය ප්‍රහීණ වූයේ ද, සුන් කල මුල් ඇත්තේ ද, සිස් සුන් තලක් මෙන් කරන ලද්දේ ද, නොවැඩීමට පමුණුවන ලද්දේ ද, මතු නූපදින සවභාවය ඇත්තේ ද, මහණෙනි, මෙසේ මහණ තෙමේ සංකිණ්ණපරිඛ වේ.

47. මහණෙනි, මහණ තෙමේ කෙසේ නම් අබ්බූළ්හෙසික (උපුල ඉන්ද්‍රකීලය ඇත්තේ) වේ ද? මහණෙනි, මෙහි මහණහුගේ තෘෂ්ණාව ප්‍රහීණ වූවා ද, සිඳුණු මුල් ඇත්තී ද, සිස් සුන් තලක් මෙන් කරන ලද්දී ද, නැවත නොවැඩීම කරන ලද්දී ද, මත්තෙහි නූපදින සවභාවය ඇත්තී ද, මහණෙනි, මෙසේ මහණ තෙමේ අබ්බූළ්හෙසික වේ.

48. මහණෙනි, කෙසේ නම් මහණ තෙමේ නිරග්ගල (බුන් දොරගුළු ඇත්තේ) වේ ද? මහණෙනි, මෙහි මහණහුගේ පඤ්ච ඔරම්භාගිය සංයොජනයෝ ප්‍රහීණ වූවාහු වෙත් ද, සිඳුණු මුල් ඇත්තාහු සිස් සුන් තලක් මෙන් කරන ලද්දාහු ද, නො වැඩීමට පමුණුවන ලද්දාහු ද, මතු නූපදින සවභාව ඇත්තාහු ද, මහණෙනි, මහණ තෙමේ මෙසේ නිරග්ගල වේ.

49. මහණෙනි, මහණ තෙමේ කෙසේ නම් හෙළූ මානධවජ ඇති බහා තැබූ ස්කන්ධභාර ඇති කෙලෙසුන්ගෙන් වෙන් වූ ආර්යයෙක් වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණහුගේ අස්මිමානය ප්‍රහීණ වූයේ වේ ද, සිඳුනු මුල් ඇත්තේ වේ ද, සිස් සුන් තලක් මෙන් කරන ලද්දේ ද, නොවැඩීමට පමුණුවන ලද්දේ ද, නූපදින සවභාවය ඇත්තේ ද, මහණෙනි, මහණ තෙමේ මෙසේ පතිත වූ මානධවජ ඇති බහා තැබූ ස්කන්ධභාර ඇති කෙලෙසුන්ගෙන් වෙන් වූ ආර්යයෙක් වෙයි.

50 මහණෙනි, මෙසේ මිදුණු, සිත් ඇති මහණහු ශක්‍රයා සහිත බ්‍රහ්මයා සහිත ප්‍රජාපති සහිත දෙවියෝ සොයන්තාහු නමුත් 'තථාගතයාගේ නොහොත් රහතුන් වහන්සේගේ විඥානය මේ අරමුණ ඇසුරු කොට පවතී' ය යි දත නො ගනිත්. ඒ කවර හෙයින යත්: මහණෙනි, මම මේ ආත්මයේ දී ම (ධරමාන) තථාගතයා (ක්ෂීණාස්‍රවයා) (සත්ත්ව ප්‍රඥප්තීත්) අනනුවෙද්‍ය යැ යි- අසංවිද්‍යමාන යයි (නොහොත් ඔහුගේ අප්‍රතිසන්ධික විඥානය නො ලැබිය හැකි යැ යි - දත හැකි නොවේ යයි) කියමි.

51. එවංවාදිං ඛො මං භික්ඛවෙ එවමක්ඛායිං එකෙ සමණබ්‍රාහ්මණා අසතා තුච්ඡා මුසා අභූතෙන අබ්භාචික්ඛන්ති: වෙනයිකො සමණො ගොතමො, සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙතීති. යථා වාහං[1] භික්ඛවෙ න,[2] යථා වාහං න වදාමි, තථා මං තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අසතා තුච්ඡා මුසා අභූතෙන අබ්භාචික්ඛන්ති: වෙනයිකො සමණො ගොතමො, සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙතීති.

52. පුබ්බෙ වාහං භික්ඛවෙ එතරහි ච දුක්ඛඤ්චෙව පඤ්ඤපෙමි දුක්ඛස්ස ච නිරොධං. තත්‍ර චෙ භික්ඛවෙ පරෙ තථාගතං අක්කොසන්ති පරිභාසන්ති රොසෙන්ති, විහෙසෙන්ති, සඝට්ටෙන්ති,[3] තත්‍ර භික්ඛවෙ තථාගතස්ස න හොති ආඝාතො න අප්පච්චයො න චෙතසො අනභිරද්ධි[4] තත්‍ර චෙ භික්ඛවෙ පරෙ තථාගතං සක්කරොන්ති ගරුකරොන්ති[5] මානෙන්ති පූජෙන්ති, තත්‍ර භික්ඛවෙ තථාගතස්ස න හොති ආනන්දො සොමනස්සං න චෙතසො උබ්බිලාවිතත්තං.[6] තත්‍ර චෙ භික්ඛවෙ පරෙ තථාගතං සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, තත්‍ර භික්ඛවෙ තථාගතස්ස එවං හොති: යං ඛො ඉදං පුබ්බෙ පරිඤ්ඤාතං, තත්‍රිමෙ එවරූපා කාරා කරීයන්තීති.

53. තස්මාතිහ භික්ඛවෙ තුම්හෙ චෙපි පරෙ අක්කොසෙය්‍යුං පරිභාසෙය්‍යුං රොසෙය්‍යුං විහෙසෙය්‍යුං, සඝට්ටෙය්‍යුං.[7] තත්‍ර තුම්හෙහිපි[8] න ආඝාතො න අප්පච්චයො න චෙතසො අනභිරද්ධි[9] කරණීයා. තස්මාතිහ භික්ඛවෙ තුම්හෙ චෙපි පරෙ සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං තත්‍ර තුම්හෙහිපි න ආනන්දො න සොමනස්සං න චෙතසො උබ්බිලාවිතත්තං කරණීයං. තස්මාතිහ භික්ඛවෙ තුම්හෙ චෙපි පරෙ සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං තත්‍ර තුම්හෙහි[10] එවමස්ස: යං ඛො ඉදං පුබ්බෙ පරිඤ්ඤාතං, තත්‍රිමෙ එවරූපා කාරා කරීයන්තීති.

54. තස්මාතිහ භික්ඛවෙ යං න තුම්හාකං තං පජහථ. තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති. කිඤ්ච භික්ඛවෙ න තුම්හාකං? රූපං භික්ඛවෙ න තුම්හාකං. තං පජහථ. තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති. වෙදනා භික්ඛවෙ න තුම්හාකං තං පජහථ. සා වො පහීනා දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති. සඤ්ඤා භික්ඛවෙ න තුම්හාකං. තං පජහථ. සා වො පහීනා දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති. සඞ්ඛාරා භික්ඛවෙ න තුම්හාකං. තෙ පජහථ. -

1. වාහං, සයා. 2. න භික්ඛවෙ, මජසං.
3. 'සඝට්ටෙන්ති' ඉති න දිස්සති, සීමු. 4. අනභිනන්දි සයා.
5. ගරු., මජසං. 6. උප්පිලාවිතත්තං, මජසං.
7. 'සඝට්ටෙය්‍යුං' න දිස්සති, සීමු. 8. තුම්හෙහි, සයා. 9. අනභිනන්දි,. සයා.
10. තුම්හාකං, සයා. PTS. මජසං.

51. මහණෙනි, මෙබඳු වාද ඇති මෙසේ කියනසුලු මට "ශ්‍රමණ ගෞතම තෙමේ සත්ත්ව විනාශය කරන්නෙකි. ඇත්තාවූ සත්ත්වයාගේ සිඳීම වැනැසීම හට නො ගැන්ම පනවන්නේ යැ"යි ඇතැම් මහණ බමුණෝ අසත්‍ය වූ හිස් වූ බොරුවෙන්, නො වූයෙන්, දොස් කියත්. මහණෙනි, මම යම්සේ විනාශකයෙකිම් නො වෙම් ද, මම යම් පරිද්දෙකින් හෝ සත්ත්වවිනාශයක් නො පණවම් ද, එසේ වූ මට ඒ භවත් මහණ බමුණෝ "ශ්‍රමණ ගෞතම තෙමේ සත්ත්ව විනාශය කරන්නෙකි. ඇත්තාවූ සත්ත්වයාගේ සිඳීම වැනැසීම හට නො ගැන්ම පනවා "යි අසත්‍යයෙන්, හිස් දෙයින්, බොරුවෙන්, අභූතයෙන් දෝෂාරෝපණය කෙරෙත්.

52. මහණෙනි, මම පෙර (බෝමැඩදී) ද දැනුදු (සිව්සස් පැවසීමෙහි ද) දුකත් දුක්ඛනිරෝධයත් පනවමි. මහණෙනි. මෙහිලා අන්‍යයෝ තථාගත-යනට නින්දා කරත් ද, පරිභව කරත් ද, රොස් බස් කියත් ද, වෙහෙසත් ද, ගටා බෙණෙත් ද, මහණෙනි, එහි තථාගතයන්ගේ වෛරයෙක් නැත. නො සතුටෙක් නැත සිතේ දොම්නසෙක් නැත. මහණෙනි, එහි ලා අන්‍යයෝ තථාගතයනට සත්කාර කෙරෙත් ද, ගරු කෙරෙත් ද, බුහුමන් කෙරෙත් ද, පුදත් ද, මහණෙනි, එහි තථාගතයන්ට සතුටෙක් නො වෙයි. සොම්නසෙක් නො වෙයි. සිතෙහි ඉල්පෙන ප්‍රීතියෙක් නො වෙයි. මහණෙනි, එහි අන්‍යයෝ තථාගතයන්ට සත්කාර කෙරෙත් ද, ගරු කෙරෙත් ද, බුහුමන් කෙරෙත් ද, පුදත් ද, මහණෙනි, එහි ලා තථාගතයන්ට "යම් මේ පඤ්චස්කන්ධයක් බෝමැඩදී පිරිසිඳ දැන ගන්නා ලද්දේ ද, ඒ පඤ්චස්කන්ධයට මෙබඳු වූ සත්කාරයෝ කරනු ලැබෙත් යැ"යි මෙපමණක් ම අදහස් වෙයි.

53. මහණෙනි, එහෙයින් මෙහි අන්‍යයෝ තොපට ද ආක්‍රෝශ කරන්නාහු නම්, පරිභව කරන්නාහු නම්, රොස් උපදවන්නාහු නම්, වෙහෙසන්නාහු නම්, ගටන්නාහු නම්, ඒ කාරණයෙහි තොප විසින් කෝප නො කළ යුතු ය. දොම්නස් නො කළ යුතු ය. සිතෙහි අසතුටක් ඇති කර නො ගත යුතු ය. මහණෙනි, එහෙයින් මෙහි තොපට අන්‍යයෝ සත්කාර කරන්නාහු නම්, ගරු කරන්නාහු නම්, බුහුමන් කරන්නාහු නම්, පුදන්නාහු නම්, මහණෙනි, ඒ කරුණෙහි තොප විසිනුත් සතුටක් නො කට යුතු යි. සොම්නසක් නො කට යුතු යි. සිතෙහි උපුල්වන ප්‍රීතියෙක් නො කට යුතු යි. මහණෙනි, එහෙයින් මෙහි තොපට ද අන්‍යයෝ සත්කාර කෙරෙත් නම්, ගරු කෙරෙත් නම්, බුහුමන් කෙරෙත් නම්, පුදත් නම්, මහණෙනි, එ කරුණෙහි ලා "යම් මේ පඤ්චස්කන්ධයෙක් පෙර පිරිසිඳ දන්නා ලද්දේ ද, ඒ පඤ්චස්කන්ධයට මෙවැනි සත්කාරයෝ කරනු ලැබෙත් යැ"යි. තොපට ද මේ අදහස වන්නේ ය.

54. මහණෙනි එහෙයින් මෙහි යමක් තොපගේ නො වේ නම් එය බැහැර කරවු. එය ප්‍රහීණ කරණ ලද්දේ තොපට බොහෝ කාලයක් හිත පිණිස වන්නේ ය. සුව පිණිස වන්නේ ය. මහණෙනි, කුමක් තොපගේ නො වේ ද? මහණෙනි, රූපය තොපගේ නො වෙයි. එහි ඇල් ම දුරු කරවු. එය දුරු කරන ලද්දේ, තොපට දිගු කලක් හිත පිණිස සැප පිණිස වන්නේ ය මහණෙනි, වේදනාව තොපගේ නො වෙයි. එයි ඇල් ම දුරු කරවු එය දුරු කරන ලද්දේ තොපට දිගු කලක් හිත පිණිස සැප පිණිස වන්නේ ය. මහණෙනි, සංඥාව තොපගේ නො වෙයි. එහි ඇල්ම දුරු කරවු එය දුරු කරන ලද්දේ, තොපට දිගු කලක් හිත පිණිස සැප පිණිස වන්නේ ය මහණෙනි, සංස්කාරයෝ තොපගේ නො වෙත්. ඔවුන් කෙරෙහි ඇල්ම දුරු කරවු. -

තෙ වො පහීනා දීඝරත්තං හිතාය සුඛාය භවිස්සන්ති. විඤ්ඤාණං භික්ඛවෙ න තුම්හාකං. තං පජහථ. තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති.

55. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, යං ඉමස්මිං ජෙතවනෙ තිණකට්ඨ-සාඛාපලාසං, තං ජනො හරෙය්‍ය වා ඩහෙය්‍ය වා යථාපච්චයං වා කරෙය්‍ය, අපි නු තුම්හාකං එවමස්ස: අම්හෙ ජනො හරති වා ඩහති වා යථාපච්චයං කරොතීති? 'නො හෙතං භන්තෙ.' තං කිස්ස හෙතු? 'න හි නො එතං භන්තෙ අත්තා අත්තනියං වා'ති. එවමෙව ඛො භික්ඛවෙ යං න තුම්හාකං තං පජහථ. තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති. කිඤ්ච භික්ඛවෙ න තුම්හාකං? රූපං භික්ඛවෙ න තුම්හාකං. තං පජහථ. තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති. වෙදනා භික්ඛවෙ -පෙ- සඤ්ඤා භික්ඛවෙ -පෙ- සඞ්ඛාරා භික්ඛවෙ -පෙ- විඤ්ඤාණං භික්ඛවෙ න තුම්හාකං. තං පජහථ. තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති.

56. එවං ස්වාක්ඛාතො භික්ඛවෙ මයා ධම්මො උත්තානො විවටො පකාසිතො ඡින්නපිලොතිකො. එවං ස්වාක්ඛාතෙ භික්ඛවෙ මයා ධම්මෙ උත්තානෙ විවටෙ පකාසිතෙ ඡින්නපිලොතිකෙ, යෙ තෙ භික්ඛූ අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනුප්පත්ත-සදත්ථා පරික්ඛීණභවසංයොජනා සම්මදඤ්ඤා විමුත්තා, වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනාය.

57. එවං ස්වාක්ඛාතො භික්ඛවෙ මයා ධම්මො උත්තානො විවටො පකාසිතො ඡින්නපිලොතිකො එවං ස්වාක්ඛාතෙ භික්ඛවෙ මයා ධම්මෙ උත්තානෙ විවටෙ පකාසිතෙ ඡින්නපිලොතිකෙ, යෙසං භික්ඛූනං පඤ්චොරම්භාගියානි සංයොජනානි පහීනානි, සබ්බෙ තෙ ඔපපාතිකා තත්ථ පරිනිබ්බායිනො අනාවත්තිධම්මා තස්මා ලොකා.

58. එවං ස්වාක්ඛාතො භික්ඛවෙ මයා ධම්මො උත්තානො විවටො පකාසිතො ඡින්නපිලොතිකො. එවං ස්වාක්ඛාතෙ භික්ඛවෙ මයා ධම්මෙ උත්තානෙ විවටෙ පකාසිතෙ ඡින්නපිලොතිකෙ, යෙසං භික්ඛූනං තීණි සංයොජනානි පහීනානි රාගදොසමොහා තනුභූතා, සබ්බෙ තෙ සකදාගාමිනො, සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති.

ඔහු දුරු කරන ලද්දෝ තොපට දිගු කලක් හිත පිණිස සැප පිණිස වන්නාහු ය. මහණෙනි, විඥානය තොපගේ නො වෙයි. එහි ඇල්ම දුරු කරවු. එහි ඇල්ම දුරු කරණ ලද්දේ තොපට දිගු කලක් හිත පිණිස සැප පිණිස වන්නේ ය.

55. මහණෙනි, ඒ කිමැයි හඟවහු දැ? මේ ජේතවනයෙහි යම් තෘණ කාෂ්ට ශාඛා පලාශ වේ ද, එය ජන තෙමේ ගෙන යන්නේ හෝ දවන්නේ හෝ කැමැති සේ හෝ කරන්නේ නම්, "ජනතෙමේ අප හැර ගෙන යන්නේ වෙයි. අප දවන්නේ හෝ වෙයි. තමන් කැමැති සේ කරන්නේ හෝ වේ" යි තොපට මෙබඳු අදහසක් වන්නේ දැ? "වහන්ස, එය නො වන්නේ ය. එයට හේතු කිම්? වහන්ස, මේ (තෘණාදිය) අපගේ ආත්මය හෝ තමාට අයත් දේ හෝ නො වෙයි." මහණෙනි, එ පරිද්දෙන් ම යමක් තොපගේ නොවේ නම් එය දුරු කරවු. එය ප්‍රහීණ කරණ ලද්දේ තොපට දිගු කලක් හිත පිණිස සැප පිණිස වන්නේ ය. මහණෙනි, කුමක් තොපගේ නො වේ දැ? මහණෙනි, රූපය තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය ප්‍රහීණ කරණ ලද්දේ තොපට දිගු කලක් හිත පිණිස සැප පිණිස පවත්නේ ය. මහණෙනි, වෙදනාව ... මහණෙනි, සංඥාව ... මහණෙනි, සංස්කාරයෝ... මහණෙනි, විඥානය තොපගේ නො වෙයි. එය ප්‍රහීණ කරවු. එය ප්‍රහීණ කරණ ලද්දේ තොපට දිගු කලක් හිත පිණිස සැප පිණිස වන්නේ ය.

56. මහණෙනි, මා විසින් ධර්මය මොනවට දෙසන ලදී. ප්‍රකට කරණ ලදී. විවෘත කරණ ලදී. පවසන ලදී. සිඳහල (කිලිටි නමැති) මහළුපිළී ඇති (නොහොත් අලුත් සළු හැඳියකු වැනි) කරණ ලදී. මහණෙනි, මා විසින් මෙසේ මොනවට දෙසූ ප්‍රකට කල, විවෘත කල, හෙළි කල, සිඳ හල කසල ඇති, මේ ධර්මයෙහි රහත් වූ ක්ෂීණ වූ ආශ්‍රව ඇති, වැස නිමැ වූ බඹසර ඇති, සිවුමගින් කල කිස ඇති, බහා තැබූ කෙලෙස්බර ඇති, පැමිණි ස්වාර්ථ (රහත්බව) ඇති, සර්වප්‍රකාරයෙන් ක්ෂීණ කල භවසංයොජන ඇති, මොනවට නුවණින් දැන කෙලෙසුන්ගෙන් මිදුණු යම් මහණ කෙනෙක් වෙත් ද, ඔවුනට ඇතැයි දක්වන්නට සසරවටෙක් නැත.

57. මහණෙනි, මෙසේ මා විසින් ධර්මය මොනවට දෙසන ලදී. පැහැදිලි කරණ ලදී. විවෘත කරණ ලදී. පවසන ලදී. සිඳ හල කසල නමැති මහළුපිළී ඇත්තක් කරණ ලදී. මහණෙනි, මෙසේ මා විසින් මොනොවට දෙසූ, ප්‍රකට කල, විවෘත කල, හෙළි කල, සිඳ හල කඩමාලු ඇති, ධර්මයෙහි (සස්නෙහි) යම් මහණ කෙනකුන්ගේ ඔරම්භාගිය සංයොජන පස ප්‍රහීණ ද, ඒ සියල්ලෝ මරණින් මතු ඔපපාතික වූවෝ, ඒ ශුද්ධාවාස බඹලොව්හි දී පිරිනිවෙන්නාහු එයින් පෙරලා මෙහි නොඑන ස්වභාවය ඇත්තෝ වෙත්.

58. මහණෙනි, මෙසේ මා විසින් ධර්මය මොනවට දෙසන ලදී. පැහැදිලි කරණ ලදී. විවෘත කරණ ලදී. පවසන ලදී. සිඳ හල කිලිටි කඩමාලු ඇති කරණ ලදී. මහණෙනි, මෙසේ මා විසින් මොනවට දෙසූ ප්‍රකට කල විවෘත කල, හෙළි කල, පිරිසිදු කල දහම්හි (සස්නෙහි) යම් මහණ කෙනකුන්ගේ තුන් සංයොජනයෝ ප්‍රහීණ ද, රාග ද්වෙෂ මොහයෝ තුනී වූහු ද, ඒ සියල්ලෝ සකෘදාගාමීහු වෙත. එක් වරක් ම උත්පත්ති වශයෙන් මෙ ලොවට අවුත් දුක් කෙළවර කරන්නාහ.

Free Distribution www.aathaapi.org

59. එවං ස්වාක්ඛාතො භික්ඛවෙ මයා ධම්මො උත්තානො විවටො පකාසිතො ඡින්නපිලොතිකො. එවං ස්වාක්ඛාතෙ භික්ඛවෙ මයා ධම්මෙ උත්තානෙ විවටෙ පකාසිතෙ ඡින්නපිලොතිකෙ යෙසං භික්ඛූනං තීණි සංයොජනානි පහීනානි, සබ්බෙ තෙ සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායනා.

60. එවං ස්වාක්ඛාතො භික්ඛවෙ මයා ධම්මො උත්තානො විවටො පකාසිතො ඡින්නපිලොතිකො. එවං ස්වාක්ඛාතෙ භික්ඛවෙ මයා ධම්මෙ උත්තානෙ විවටෙ පකාසිතෙ ඡින්නපිලොතිකෙ යෙ තෙ භික්ඛු ධම්මානුසාරිනො සද්ධානුසාරිනො සබ්බෙ තෙ සම්බොධිපරායනා.

61. එවං ස්වාක්ඛාතො භික්ඛවෙ මයා ධම්මො උත්තානො විවටො පකාසිතො ඡින්නපිලොතිකො. එවං ස්වාක්ඛාතෙ භික්ඛවෙ මයා ධම්මෙ උත්තානෙ විවටෙ පකාසිතෙ ඡින්නපිලොතිකෙ යෙසං මයි සද්ධාමත්තං පෙමමත්තං සබ්බෙ තෙ සග්ගපරායනාති

62. ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛු භගවතො භාසිතං අභිනන්දුන්ති

අලගද්දූපමසුත්තං දුතියං.

1. 3. 3.

වම්මිකසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා කුමාරකස්සපො අන්ධවනෙ විහරති. අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං අන්ධවනං ඔභාසෙත්වා යෙනායස්මා කුමාරකස්සපො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා ආයස්මන්තං කුමාරකස්සපං එතදවොච:

59. මහණෙනි, මෙසේ මා විසින් ධර්මය මොනොවට දෙසන ලදී. ප්‍රකට කරණ ලදී. විවෘත කරණ ලදී හෙළි කරණ ලදී. සිඳහළ කඩමහලු ඇති කරණ ලදී. මහණෙනි, මා විසින් මෙසේ ප්‍රකට කළ විවෘත කළ හෙළි කළ, සිඳ හළ කඩමාලු ඇති කළ, මොනොවට දෙසූ ධර්මයෙහි යම් මහණ කෙනකුන්ගේ තුන් සංයොජන කෙනෙක් ප්‍රහීණ ද, ඒ සියල්ලෝ සිව් අපා දුකට නොවැටෙන සුලු, රහත්බවට නියතවූ, සම්බොධිය (රහත්පල නුවණ) ප්‍රතිෂ්ඨා කොට ඇති සෝවත්හු වෙත්.

60. මහණෙනි, මෙසේ මා විසින් ධර්මය මොනොවට දෙසන ලදී ප්‍රකට කරණ ලදී විවෘත කරණ ලදී. පැහැදිලි කරණ ලදී. සිඳහළ කඩමාලු ඇති කරණ ලදී. මහණෙනි, මෙසේ මා විසින් මොනවට දෙසූ, ප්‍රකට කළ, විවෘත කළ, පැහැදිලි කළ, සිඳ හළ කඩමාලු ඇති කළ, ධර්මයෙහි යම් මහණ කෙනෙක් ධර්මානුසාරීත් ශ්‍රද්ධානුසාරීත් වෙත් ද, ඔහු සියල්ලෝ සම්බොධිය (රහත්පල නුවණ) ප්‍රතිෂ්ඨා කොට ඇත්තෝ වෙත්

61. මහණෙනි, මෙසේ මා විසින් ධර්මය මනාකොට දෙසන ලදී. ප්‍රකට කරණ ලදී. විව.ත කරණ ලදී. හෙළි කරණ ලදී. සිඳහළ කඩමාලු ඇති කරණලදී. මහණෙනි, මෙසේ මොනොවට දෙසූ, ප්‍රකට කළ, විවෘත කළ, හෙළි කළ, සිඳහළ කඩමාලු ඇති කරණ ලද ධර්මයෙහි මා කෙරෙහි යම් මහණ කෙනකුන්ගේ ශ්‍රද්ධාමාත්‍රාවක් ප්‍රෙමමාත්‍රාවක් ඇත් නම් ඔහු සියල්ලෝ ස්වර්ගපරායණ (මරණින් මතු ස්වර්ගය ප්‍රතිෂ්ඨාස්ථාන කොට ඇතියෝ වෙති.

62. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු සිතැති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිගත්හ.

අලගද්දූපමසූත්‍රය දෙවැනි යි.

1. 3. 3.

වම්මික සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ අනේපිඬුසිටුහුගේ ජේතවනාරාම යෙහි වැඩවාසය කරණ සේක. එසමයෙහි ආයුෂ්මත් කුමාරකාශ්‍යප තෙරණුවෝ අන්ධවනයෙහි වාසය කරති. එකල එක්තරා දෙවියෙක් මධ්‍යමරාත්‍රියෙහි විශිෂ්ට වණී ඇත්තේ අන්ධවනය හාත්පස එකාලොක කොට ආයුෂ්මත් කුමාරකාශ්‍යප තෙරණුවන් කරා එළඹියේ ය. එළඹ එකත්පස්ව සිටියේ ය. එකත්පස්ව සිටි ඒ දෙවියා ආයුෂ්මත් කුමාරකාශ්‍යප තෙරණුවන්ට මෙය සැළ කෙළේ ය:

2. "භික්ඛු, භික්ඛු, අයං වම්මිකො[1] රත්තිං ධූපායති[2]. දිවා පජ්ජලති බ්‍රාහ්මණො එවමාහ: 'අභික්ඛණ සුමෙධ සත්ථං ආදායා'ති. අභික්ඛණන්තො සුමෙධො සත්ථං ආදාය අද්දස ලඞ්ගිං[3]. 'ලඞ්ගී භදන්තෙ'ති. බ්‍රාහ්මණො එවමාහ: 'උක්ඛිප ලඞ්ගිං. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායා'ති. අභික්ඛණන්තො සුමෙධො සත්ථං ආදාය අද්දස උද්ධුමායිකං. 'උද්ධුමායිකා භදන්තෙ'ති. බ්‍රාහ්මණො එවමාහ: 'උක්ඛිප උද්ධුමායිකං. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායා'ති. අභික්ඛණන්තො සුමෙධො සත්ථං ආදාය අද්දස ද්විධාපථං. 'ද්විධාපථො භදන්තෙ'ති. බ්‍රාහ්මණො එවමාහ: 'උක්ඛිප ද්විධාපථං. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායා'ති. අභික්ඛණන්තො සුමෙධො සත්ථං ආදාය අද්දස චඞ්ගවාරං.[4] 'චඞ්ගවාරං භදන්තෙ'ති. බ්‍රාහ්මණො එවමාහ: 'උක්ඛිප චඞ්ගවාරං. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායා'ති. අභික්ඛණන්තො සුමෙධො සත්ථා ආදාය අද්දස කුම්මං. 'කුම්මො භදන්තෙ'ති. බ්‍රාහ්මණො එවමාහ: 'උක්ඛිප කුම්මං. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායා'ති. අභික්ඛණන්තො සුමෙධො සත්ථං ආදාය අද්දස අසිසූනං 'අසිසූනා. භදන්තෙ'ති. බ්‍රාහ්මණො එවමාහ. 'උක්ඛිප අසිසූනං. අභික්ඛණ සුමෙධ සත්ථා ආදායා'ති. අභික්ඛණන්තො සුමෙධො සත්ථං ආදාය අද්දස මංසපෙසිං. 'මංසපෙසී භදන්තෙ'ති. බ්‍රාහ්මණො එවමාහ: 'උක්ඛිප මංසපෙසිං. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායා'ති. අභික්ඛණන්තො සුමෙධො සත්ථං ආදාය අද්දස නාගං. 'නාගො භදන්තෙ'ති. බ්‍රාහ්මණො එවමාහ: "තිට්ඨතු නාගො, මා නාගං ඝට්ටෙසි. නමො කරොහි නාගස්සා"ති.

3. ඉමෙ ඛො ත්වං භික්ඛු පඤ්හෙ භගවන්තං උපසඞ්කමිත්වා පුච්ඡෙය්‍යාසි. යථා[5] තෙ භගවා බ්‍යාකරොති, තථා නං ධාරෙය්‍යාසි. නාහං තං භික්ඛු පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යො ඉමෙසං පඤ්හානං වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙය්‍ය අඤ්ඤත්‍ර තථාගතෙන වා තථාගතසාවකෙන වා ඉතො වා පන සුත්වාති. ඉදමවොච සා දෙවතා, ඉදං වත්වා තත්ථෙවන්තරධායි[6]

4. අථ ඛො ආයස්මා කුමාරකස්සපො තස්සා රත්තියා අච්චයෙන යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා කුමාරකස්සපො භගවන්තං එතදවොච: "ඉමං භන්තෙ රත්තිං අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං අන්ධවනං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො භන්තෙ සා දෙවතා මං එතදවොච: -

1. වම්මීකො, සීමු. 1. 2. ධූමායති, මජසං. සයා. PTS 3. පලිඝං, සයා.
4. පඞ්කවාර, සයා. චඞ්කවාරං, කණ්ඩි. 5. යථාව, මජසං
6. තත්ථෙව අන්තරධායි, සයා PTS.

Free Distribution www.aathaapi.org

2. ''මහණ, මහණ, මේ තුඹස රාත්‍රියෙහි දී දුමයි. දවල දිලෙයි බමුණෙක් මෙසේ කියයි: 'සුමෙධය (මනානුවණැත්ත) ශස්ත්‍රය ගෙණ සාරව'. සුමෙධ තෙමේ ශස්ත්‍රය ගෙණ සාරත්තේ හිදිඅගුලක් දුටුවේය. 'වහන්ස, හිදිඅගුලෙකි' යි (හේ කීය). බමුණා මෙසේ කියයි: 'හිදිඅගුල ඔසොවාලව. ශස්ත්‍රය ගෙණ තව සාරව'. සුමෙධ තෙමේ ශස්ත්‍රය ගෙණ සාරත්තේ මැඩියකු දුටුවේ ය. 'වහන්ස, මැඩියෙකැ'යි. බමුණා මෙසේ කියයි: 'මැඩියා ඔසොවා ලව. සුමෙධය, ශස්ත්‍රය ගෙණ තවත් සාරව' යි. සුමෙධ තෙමේ ශස්ත්‍රය ගෙණ සාරත්තේ දෙමංහත්දියක් දුටුවේ ය. 'වහන්ස, දෙමංහත්දියෙකි'යි. බමුණා, මෙසේ කියයි: 'දෙමං හත්දිය ඔසොවාලව. සුමෙධය, ශස්ත්‍රය ගෙණ තවත් සාරව' යි. සුමෙධ තෙමේ ශස්ත්‍රය ගෙණ සාරත්තේ කරපෙරහනක් (අළුපද්දක්) දුටුවේ ය. 'වහන්ස, කරපෙරහනකි' යි. බමුණා මෙසේ කියයි: 'කරපෙරහන ඔසොවාලව. සුමෙධය, ශාස්ත්‍රය ගෙණ තවත් සාරව.' සුමෙධ තෙමේ ශස්ත්‍රය ගෙණ සාරත්තේ ඉදිබුවකු දුටුවේ ය. 'වහන්ස, ඉදිබුවෙකි'යි. බමුණා, මෙසේ කියයි: ඉදිබුවා ඔසොවාලව. සුමෙධය, ශස්ත්‍රය ගෙණ තවත් සාරව.' සුමෙධ තෙමේ ශස්ත්‍රය ගෙණ සාරත්තේ සිපතක් (මස් කපන කැත්තක්) හා මස්ලොඹුවක් දුටුවේ ය. 'වහන්ස, සිපතක් හා මස් ලොඹුවකි' යි. බමුණා මෙසේ කියයි: 'සිපත හා මස්ලොඹුව ඔසොවාලව. සුමෙධය, ශස්ත්‍රය ගෙණ තවත් සාරව.' සුමෙධ තෙමේ ශස්ත්‍රය ගෙණ සාරත්තේ මස් වැදූල්ලක් දුටුවේ ය. 'වහන්ස, මස් වැදූල්ලකි' යි. බමුණා මෙසේ කියයි: 'මස්වැදූල්ල ඔසොවාලව. සුමෙධය, ශස්ත්‍රය ගෙණ තවත් සාරව.' සුමෙධ තෙමේ ශස්ත්‍රය ගෙණ සාරත්තේ නාගයකු දිටී ය. 'වහන්ස, නාගයෙකි'. බමුණා මෙසේ කියයි: 'නාගයා සිටීවා. නාගයා නො ගටව නාගයාට නමස්කාර කරව.''

3. ''මහණ, තෝ මේ ප්‍රශ්න භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ අසව. භාග්‍යවතුන් වහන්සේ යම් ලෙසකින් තව ප්‍රකාශ කරණ සේක් ද, එය එසේ දරව. මහණ, 'භාග්‍යවතුන් වහන්සේ හැර, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයකු හැර, මෙතැනින් හෙවත් මෙසස්නෙන් අසා කියන්නකු හැර, මෙ ප්‍රශ්න විසඳීමෙන් යමෙක් සිත සතුටු කෙරේ ද, එවැනි පුද්ගලයකු දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ ලොකයෙහි, මහණ බමුණන් සහිත වූ දෙවිමිනිසුන් සහිත වූ සත්ත්වප්‍රජාවෙහි නො දක්මි'යි. කියේ ය. ඒ දෙවි තෙමේ මෙය කීය. මෙය කියා එහි ම නො පෙණී ගියේ ය.

4. ඉක්බිති ආයුෂ්මත් කුමරකසුප් තෙරණුවෝ ඒ රාත්‍රිය ඇවෑමෙන් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් කුමරකසුප් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ: ''වහන්ස,, මේ රෑ එක්තරා දෙවියෙක් රාත්‍රිය ඉක්මගිය කල්හි විශිෂ්ටවණී ඇත්තේ අඹවනය හාත්පස එකාලොක කොට මා කරා එළඹියේ ය. එළඹ එකත්පස් ව සිටියේ ය. වහන්ස, එකත්පසෙක සිටියා වූ ඒ දෙවි තෙමේ මට මෙය කී යෘ:

"භික්ඛු භික්ඛු, අයං වම්මිකො රත්තිං ධූපායති දිවා පජ්ජලති. බ්‍රාහ්මණො එවමාහ: අභික්ඛණ සුමෙධ සත්ථං ආදායාති. අභික්ඛණන්තො සුමෙධො සත්ථං ආදාය අද්දස ලඞ්ගිං. 'ලඞ්ගී භදන්තෙ'ති. බ්‍රාහ්මණො එවමාහ: 'උක්ඛිප ලඞ්ගිං. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායා'ති අභික්ඛණන්තො සුමෙධො සත්ථං ආදාය අද්දස උද්ධුමායිකං, 'උද්ධුමායිකා භදන්තෙ'ති බ්‍රාහ්මණො එවමාහ: 'උක්ඛිප උද්ධුමායිකං. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායාති'. අභික්ඛණන්තො සුමෙධො සත්ථං ආදාය අද්දස ද්විධාපථං. 'ද්විධාපථො භදන්තෙ'ති. බ්‍රාහ්මණො එවමාහ: 'උක්ඛිප ද්විධාපථං. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායාති අභික්ඛණන්තො සුමෙධො සත්ථං ආදාය අද්දස චඞ්ගවාරං. 'චඞ්ගවාරං භදන්තෙ'ති. බ්‍රාහ්මණො එවමාහ: 'උක්ඛිප චඞ්ගවාරං. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායා'ති. අභික්ඛණන්තො සුමෙධො සත්ථං ආදාය අද්දස කුම්මං. 'කුම්මො භදන්තෙ'ති. බ්‍රාහ්මණො එවමාහ: 'උක්ඛිප කුම්මං. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායා'ති. අභික්ඛණන්තො සුමෙධො සත්ථං ආදාය අද්දස අසිසූනං. 'අසිසූනා භදන්තෙ'ති. බ්‍රාහ්මණො එවමාහ: 'උක්ඛිප අසිසූනං, අභික්ඛණ සුමෙධ සත්ථං ආදායා'ති. අභික්ඛණන්තො සුමෙධො සත්ථං ආදාය අද්දස මංසපෙසිං. 'මංසපෙසි භදන්තෙ'ති. බ්‍රාහ්මණො එවමාහ: 'උක්ඛිප මංසපෙසිං. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායා'ති. අභික්ඛණන්තො සුමෙධො සත්ථං ආදාය අද්දස නාගං. 'නාගො භදන්තෙ'ති. බ්‍රාහ්මණො එවමාහ: 'තිට්ඨතු නාගො. මා නාගං ඝට්ටෙසි. නමො කරොහි නාගස්සා'ති.

"ඉමෙ ඛො ත්වං භික්ඛු පඤ්හෙ භගවන්තං උපසඞ්කමිත්වා පුච්ඡෙය්‍යාසි. යථා තෙ භගවා ව්‍යාකරොති තථා නං ධාරෙය්‍යාසි. නාහං තං භික්ඛු පස්සාමි සදෙවකෙ ලොකෙ -පෙ- ඉතො වා පන සුත්වාති. ඉදමවොච භන්තෙ සා දෙවතා, ඉදං වත්වා තත්ථෙවන්තරධායී"ති.

5. කො නු ඛො භන්තෙ වම්මිකො? කා රත්තිං ධූපායනා[1]? කා දිවා පජ්ජලනා? කො බ්‍රාහ්මණො? කො සුමෙධො? කිං සත්ථං? කිං අභික්ඛණං? කා ලඞ්ගී? කා උද්ධුමායිකා? කො ද්විධාපථො? කිං චඞ්ගවාරං? කො කුම්මො? කා අසිසූනා? කා මංසපෙසි? කො නාගොති?

6. වම්මිකොති ඛො භික්ඛු ඉමස්සෙතං චාතුම්මහාභූතිකස්ස කායස්ස අධිවචනං මාතාපෙත්තිකසම්භවස්ස ඔදනකුම්මාසූපචයස්ස අනිච්චුච්ඡාදන පරිමද්දනභෙදනවිද්ධංසනධම්මස්ස.

යං ඛො භික්ඛු දිවා කම්මන්තෙ[2] ආරබ්භ රත්තිං අනුවිතක්කෙති අනුවිචාරෙති, අයං රත්තිං ධූපායනා.

යං ඛො භික්ඛු රත්තිං අනුවිතක්කෙත්වා අනුවිචාරෙත්වා දිවා කම්මන්තෙ පයොජෙති කායෙන වාචාය මනසා, අයං දිවා පජ්ජලනා.

1. ධූමායනා - මජසං. ස්‍යා. PTS. 2. කම්මන්තං - කම්බො.

“මහණ, මහණ, මේ තුඹස රාත්‍රියෙ දී දුමයි, දවල් දිලෙයි. බමුණෙක් මෙසේ කියයි: ‘සුමේධය, ශස්ත්‍රයක් ගෙණ සාරාලවයි. සුමෙධ තෙමේ ශස්ත්‍රයක් ගෙණ සාරන්නේ හිදිඅගුලක් දුටුවේ ය. වහන්ස, හිදි-අගුලකි යි, (හේ කීය) බමුණා මෙසේ කියයි: හිදිඅගුල ඔසොවා ලව. ශස්ත්‍රය ගෙණ සාරව’ සුමෙධ තෙමේ ශස්ත්‍රය ගෙණ සාරත්තේ මැඩියකු දුටුවේ ය. ‘වහන්ස, මැඩියෙකැ’යි (හේ කීය) බමුණු මෙසේ කියයි: ‘මැඩියා ඔසොවාලව. සුමෙධය, ශස්ත්‍රය ගෙණ සාරව යි. සුමෙධ තෙමේ ශස්ත්‍රය ගෙණ සාරත්තේ දෙමංසන්ධියක් දුටුවේ ය. දෙමංසන්ධියෙකි යි (හේ කීය) බමුණා මෙසේ කියයි ‘දෙමංහත්දිය ඔසවාලව’ සුමෙධය, ශස්ත්‍රය ගෙණ සාරව. සුමෙධ තෙමේ ශස්ත්‍රය ගෙණ සාරත්තේ කරපෙරහනක් දුටුවේ ය. ‘වහන්ස, කරපෙරහනෙකි’ යි (හේ කීය) බමුණු මෙසේ කියයි: කරපෙරහන ඔසවාලව. සුමෙධය, ශස්ත්‍රය ගෙණ සාරව.’ සුමෙධ තෙමේ ශස්ත්‍රය ගෙණ සාරත්තේ ඉදිබුවකු දුටුවේ ය. ‘වහන්ස, ඉදිබුවෙකි’යි (හේ කීය) බමුණා මෙසේ කියයි: ‘සුමෙධය, ඉදිබුවා ඔසවාලව. සුමෙධය, ශස්ත්‍රය ගෙණ සාරව’ සුමෙධ තෙමේ ශස්ත්‍රය ගෙණ සාරත්තේ සිපතක් හා මස්ලොඹුවක් දුටුවේ ය. ‘වහන්ස, සිපතක් හා මස් ලොඹුවෙකි’යි. (හේකීය) බමුණා මෙසේ කියයි: ‘සිපත හා මස්ලොඹුව ඔසවා ලව, සුමෙධය, ශස්ත්‍රය ගෙණ සාරව යි. සුමෙධ තෙමේ ශස්ත්‍රය ගෙණ සාරත්තේ මස්වැදූල්ලක් දුටුවේ ය. ‘වහන්ස, මස්වැදූල්ලෙකි’ යි. (හේ කීය) බමුණා මෙසේ කියයි: ‘සුමෙධය, මස්වැදූල්ල ඔසවාලව. සුමෙධය, ශස්ත්‍රය ගෙණ සාරව. (හේ කීය.) සුමෙධ තෙමේ ශස්ත්‍රය ගෙණ සාරත්තේ නාගයකු දිටී ය. ‘වහන්ස, නාගයෙකි’යි (හේ කීය) බමුණා මෙසේ කියයි: ‘නාගයා සිටිවා, නගයා නොගටව, නාගයාට නමස්කාර කරව’යි.

“මහණ, තෝ මේ ප්‍රශ්න භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ විචාරව. භාග්‍යවතුන් වහන්සේ යම් ලෙසෙකින් තට ප්‍රකාශ කරණසේක් ද, එය එසේ දරව. “මහණ, භාග්‍යවතුන් වහන්සේ හැර ... නො දක්මි’යි. වහන්ස, ඒ දෙව්තෙමේ මෙය කී ය. මෙය කියා එහි ම අතුරුදහන් වී ය.

5. වහන්ස, තුඹස කුමක් ද? රෑ දුමාලීම කුමක් ද? බමුණා කවරෙක් ද? සුමෙධයා කවරෙක් ද? ශස්ත්‍රය කුමක් ද? සෑරීම කුමක් ද? හිදිඅගුල කුමක් ද? මැඩියා කවරෙක් ද? දෙමංසන්ධිය කුමක් ද? කරපෙරහන කුමක් ද? ඉදිබුවා කවරෙක් ද? මස්කැත්ත හා මස්ලොඹුව කුමක් ද? මස්වැදූල්ල කුමක් ද? නාගයා කවරෙක් ද?.

6. “මහණ, තුඹස යනු දෙමවුපියන් නිසා හටගත්, බතින් හා කොමුයෙන් වැඩුණු, අනිත්‍ය වූ, ඉලීම පිරිමැදීම බිඳීම වැනසීම ස්වභාව කොට ඇති, සතර මහාභූතයන්ගෙන් හටගත් ශරීරයට මේ නමෙකි.

මහණ, ‘දවාලෙහි කළ යුතු කර්මාන්තයන් අරභයා රෑ කල්පනා කරයි. විමසා බලයි’ යන යමක් ඇද්ද, මෙය රෑ දුමාලීම යි.

මහණ, ‘රාත්‍රියෙහි නැවත නැවත කල්පනා කොට, නැවත නැවත සිත හසුරුවා, දවල්හි කයින් වචනයෙන් සිතින් කර්මාන්තයන් යොදයි යන යමක් ඇද්ද, මේ දවල් දිලීම යි.

Free Distribution www.aathaapi.org

'බ්‍රාහ්මණො'ති ඛො භික්ඛු තථාගතස්සෙතං අධිවචනං අරහතො සම්මාසම්බුද්ධස්ස.

'සුමෙධො'ති ඛො භික්ඛු සෙඛස්සෙතං භික්ඛුනො අධිවචනං.

'සත්ථ'න්ති ඛො භික්ඛු අරියායෙතං පඤ්ඤාය අධිවචනං.

'අභික්ඛණ'න්ති ඛො භික්ඛු විරියාරම්භස්සෙතං අධිවචනං.

'ලඞ්ගී'ති ඛො භික්ඛු අවිජ්ජායෙතං අධිවචනං. උක්ඛිප ලඞ්ගිං, පජහ අවිජ්ජං. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායාති අයමෙතස්ස අත්ථො.

'උද්ධුමායිකා'ති ඛො භික්ඛු කොධූපායාසස්සෙතං අධිවචනං. උක්ඛිප 'උද්ධුමායිකං, පජහ කොධූපායාසං. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායාති අයමෙතස්ස අත්ථො.

'ද්විධාපථො'ති ඛො භික්ඛු විචිකිච්ඡායෙතං අධිවචනං. උක්ඛිප ද්විධාපථං, පජහ විචිකිච්ඡං. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායාති අයමෙතස්ස අත්ථො.

'චඞ්ගවාර'න්ති ඛො භික්ඛු පඤ්චන්නෙතං නීවරණානං අධිවචනං: කාමච්ඡන්දනීවරණස්ස බ්‍යාපාදනීවරණස්ස ථිනමිද්ධනීවරණස්ස උද්ධච්චකුක්කුච්චනීවරණස්ස විචිකිච්ඡානීවරණස්ස. උක්ඛිප චඞ්ගවාරං, පජහ පඤ්ච නීවරණෙ. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායාති අයමෙතස්ස අත්ථො.

'කුම්මො'ති ඛො භික්ඛු පඤ්චන්නෙතං උපාදානක්ඛන්ධානං අධිවචනං. සෙය්‍යථීදං: රූපූපාදානක්ඛන්ධස්ස වෙදනූපාදානක්ඛන්ධස්ස සඤ්ඤූපාදානක්ඛන්ධස්ස සඞ්ඛාරූපාදානක්ඛන්ධස්ස විඤ්ඤාණූපාදානක්ඛන්ධස්ස. උක්ඛිප කුම්මං, පජහ පඤ්චුපාදානක්ඛන්ධෙ. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායාති අයමෙතස්ස අත්ථො.

'අසිසූනා'ති ඛො භික්ඛු පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං: චක්ඛුවිඤ්ඤෙය්‍යානං රූපානං ඉට්ඨානං කන්තානං මනාපානං පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, සොතවිඤ්ඤෙය්‍යානං සද්දානං -පෙ- ඝානවිඤ්ඤෙය්‍යානං ගන්ධානං -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යානං රසානං -පෙ- කායවිඤ්ඤෙය්‍යානං ඵොට්ඨබ්බානං ඉට්ඨානං කන්තානං මනාපානං පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. උක්ඛිප අසිසූනං, පජහ පඤ්ච කාමගුණෙ. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායාති අයමෙතස්ස අත්ථො

'මංසපෙසී'ති ඛො භික්ඛු නන්දිරාගස්සෙතං අධිවචනං. උක්ඛිප මංසපෙසිං, පජහ නන්දිරාගං. අභික්ඛණ සුමෙධ සත්ථං ආදායාති අයමෙතස්ස අත්ථො.

'නාගො'ති ඛො භික්ඛු ඛීණාසවස්සෙතං භික්ඛුනො අධිවචනං. තිට්ඨතු නාගො, මා නාගං ඝට්ටෙසි, නමො කරොහි නාගස්සාති අයමෙතස්ස අත්ථොති.

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා කුමාරකස්සපො භගවතො භාසිතං අභිනන්දීති.

වම්මිකසුත්තං තතියං.

Free Distribution www.aathaapi.org

මහණ, 'බමුණා'යනු අතීත් වූ සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේට මේ නමෙකි.

මහණ, 'සුමෙධ' යනු ශෛක්‍ෂ වූ මහණහට මේ නමෙකි.

මහණ, 'ශස්ත්‍රය' යනු ආර්‍ය්‍යප්‍රඥාවට මේ නමෙකි.

මහණ, 'සෑරීම' යනු වීර්‍ය්‍යාරම්භයට මේ නමෙකි.

මහණ, 'හිදිඅගුල' යනු අවිද්‍යාවට මේ නමෙකි. හිදිඅගුල උදුරා ලව' යනු "අවිද්‍යාව දුරු කරව' යනුයි. 'සුමෙධය, ශස්ත්‍රය ගෙණ සාරව' යනු මේ භාෂිතයාගේ අර්‍ථයි.

මහණ, 'මැඩි' යනු බලවත් ක්‍රොධයට මේ නමෙකි. 'මැඩියා ඔසවාලව' යනු 'බලවත් ක්‍රොධය දුරලව' යනුයි. 'සුමෙධය, ශස්ත්‍රය ගෙණ සාරව' යනු මේ භාෂිතයාගේ අර්‍ථයි.

මහණ, 'දෙමංසන්ධිය යනු විචිකිච්ඡාවට මේ නමෙකි. 'දෙමංසන්ධිය ඔසවාලව' යනු 'විචිකිච්ඡාව දුරලව' යනුයි. 'සුමෙධය, ශස්ත්‍රය ගෙණ සාරව' යනු මේ භාෂිතයාගේ අර්‍ථයි.

මහණ, 'කරපෙරහන' යනු කාමච්ඡන්දනීවරණය, ව්‍යාපාදනීවරණය, ථිනමිද්ධනීවරණය, උද්ධච්චකුක්කුච්චනීවරණය, විචිකිච්ඡානීවරණය යන පඤ්චනීවරණයන්ට මේ නමෙකි. 'කරපෙරහන ඔසවාලව' යනු 'පඤ්චනීවරණ යන් දුරු කරව' යනුයි. 'සුමෙධය, ශස්ත්‍රය ගෙණ සාරව' යනු මේ භාෂිතයාගේ අර්‍ථයි. ('හික්මෙන මහණ ආර්‍ය්‍යප්‍රඥාව ගෙණ, වීර්‍ය්‍යාරම්භ කරව' යනු යි.)

මහණ, 'ඉදිබුවා'යනු රූපොපාදානස්කන්ධය, වේදනොපාදානස්කන්ධය, සංඥොපාදානස්කන්ධය, සංස්කාරොපාදානස්කන්ධය, විඥානොපාදානස්කන්ධය. යන උපාදානස්කන්ධ පසට මේ නමෙකි. 'ඉදිබුවා ඔසවාලව' යනු 'පඤ්ච උපාදානස්කන්ධයන් දුරලව' යනුයි. සුමෙධය, ශස්ත්‍රය ගෙණ සාරව' යන මේ භාෂිතයාගේ අර්‍ථයි. (හික්මෙන මහණ ආර්‍ය්‍යප්‍රඥාව ගෙණ වීර්‍ය්‍යාරම්භ කරව' යනුයි.)

මහණ, 'මස් කැත්ත හා මස්ලොඹුව' යනු ඇසින් දත යුතු වූ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රිය වූ කාමනිඃශ්‍රිත වූ ඇලීමට කරුණු වූ රූපය ... කණින් ඇසිය යුතු ශබ්දය ... නැහැයෙන් දතයුතු ගඳය ... දිවෙන් දතයුතු රසය ... කයින් ස්පර්‍ශ කළ යුතු යහපත්, කමනීය, මනවඩන, ප්‍රියස්වරූප වූ කාමය උපදවන සිත් අලවන ස්පර්‍ශය යන පඤ්චකාම ගුණයන්ට මේ නමෙකි. 'මස් කැත්ත හා මස් ලොඹුව ඔසවාලව' යනු පඤ්චකාමගුණයන් දුරු කරව, යනුයි. මෙය 'සුමෙධය, ශස්ත්‍රය ගෙණ සාරව' යන මේ භාෂිතයාගේ අර්‍ථයි. ('හික්මෙන මහණ, ආර්‍ය්‍යප්‍රඥාව ගෙණ වීර්‍ය්‍යාරම්භ කරව' යනුයි.)

මහණ, 'මස්වැදුල්ල' යනු නන්දිරාගයට මේ නමෙකි. මස්වැදුල්ල ඔසොවාලව යනු නන්දිරාගය දුරු කරව' යනුයි. සුමෙධය, ශස්ත්‍රය ගෙණ සාරව' යනු මේ භාෂිතයාගේ අර්‍ථයි. (හික්මෙන මහණ ආර්‍ය්‍යප්‍රඥාව ගෙණ වීර්‍ය්‍යාරම්භ කරව' යනුයි.)

මහණ, 'නාගයා'යනු ක්‍ෂීණාස්‍රව මහණහුට මේ නමෙකි. 'ක්‍ෂීණාස්‍රව තෙමේ සිටීවා. ක්‍ෂීණාස්‍රවතථාගතයන් නො ගටව. ක්‍ෂීණාස්‍රව තථාගතයන් වහන්සේට නමස්කාර කරව' යනු නාගයා සිටීවා. 'නාගයා නොගටව. නාගයාට නමස්කාර කරව' යන මේ භාෂිතයාගේ අර්‍ථයි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු වූ ආයුෂ්මත් කුමාර කාශ්‍යප තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටු විය.

වම්මිකසූත්‍රය තුන්වැනි යි.

1. 3. 4.

රථවිනීතසුත්තං

1 එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. අථ බො සම්බහුලා ජාතිභූමකා භික්ඛූ ජාතිභූමියං වස්සං වුත්ථා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ බො තෙ භික්ඛූ භගවා එතදවොච:

2. “කො නු බො භික්ඛවෙ ජාතිභූමියං ජාතිභූමකානං භික්ඛූනං සබ්‍රහ්මචාරීනං එවං සම්භාවිතො: “අත්තනා ච අප්පිච්ඡො අප්පිච්ඡකථඤ්ච භික්ඛූනං කත්තා, අත්තනා ච සන්තුට්ඨො සන්තුට්ඨිකථඤ්ච භික්ඛූනං කත්තා, අත්තනා ච පවිවිත්තො පවිවෙකකථඤ්ච භික්ඛූනං කත්තා, අත්තනා ච අසංසට්ඨො අසංසග්ගකථඤ්ච භික්ඛූනං කත්තා, අත්තනා ච ආරද්ධවිරියො විරියාරම්භකථඤ්ච භික්ඛූනං කත්තා, අත්තනා ච සීලසම්පන්නො සීලසම්පදාකථඤ්ච භික්ඛූනං කත්තා, අත්තනා ච සමාධිසම්පන්නො සමාධිසම්පදාකථඤ්ච භික්ඛූනං කත්තා, අත්තනා ච පඤ්ඤාසම්පන්නො පඤ්ඤාසම්පදාකථඤ්ච භික්ඛූනං කත්තා, අත්තනා ච විමුත්තිසම්පන්නො විමුත්තිසම්පදාකථඤ්ච භික්ඛූනං කත්තා, අත්තනා ච විමුත්තිඤාණදස්සනසම්පන්නො විමුත්තිඤාණදස්සනසම්පදාකථඤ්ච භික්ඛූනං කත්තා, ඔවාදකො විඤ්ඤාපකො සන්දස්සකො සමාදපකො සමුත්තෙජකො සම්පහංසකො සබ්‍රහ්මචාරීන”න්ති?

3. “පුණ්ණො නාම භන්තෙ ආයස්මා මන්තාණිපුත්තො ජාතිභූමියං ජාතිභූමකානං භික්ඛූනං සබ්‍රහ්මචාරීනං එවං සම්භාවිතො: අත්තනා ච අප්පිච්ඡො අප්පිච්ඡකථඤ්ච භික්ඛූනං කත්තා, අත්තනා ච සන්තුට්ඨො සන්තුට්ඨිකථඤ්ච භික්ඛූනං කත්තා, අත්තනා ච පවිවිත්තො පවිවෙකකථඤ්ච භික්ඛූනං කත්තා, අත්තනා ච අසංසට්ඨො අසංසග්ගකථඤ්ච භික්ඛූනං කත්තා, අත්තනා ච ආරද්ධවිරියො විරියාරම්භකථඤ්ච භික්ඛූනං කත්තා, අත්තනා ච සීලසම්පන්නො සීලසම්පදාකථඤ්ච භික්ඛූනං කත්තා, අත්තනා ච සමාධිසම්පන්නො සමාධිසම්පදාකථඤ්ච භික්ඛූනං කත්තා, අත්තනා ච පඤ්ඤාසම්පන්නො පඤ්ඤාසම්පදාකථඤ්ච භික්ඛූනං කත්තා, අත්තනා ච විමුත්තිසම්පන්නො විමුත්තිසම්පදාකථඤ්ච භික්ඛූනං කත්තා, අත්තනා ච විමුත්තිඤාණදස්සනසම්පන්නො විමුත්තිඤාණදස්සනසම්පදාකථඤ්ච භික්ඛූනං කත්තා, ඔවාදකො විඤ්ඤාපකො සන්දස්සකො සමාදපකො සමුත්තෙජකො සම්පහංසකො සබ්‍රහ්මචාරීන”න්ති.

1. 3. 4.

රථවිනීත සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දකනිවාප නම් වේළුවනාරාමයෙහි වැඩ වාසය කරණ සේක. එකල බොහෝ ජාතිභූමක භික්ෂූහු ජාතිභූමියෙහි වස්වැස පැවරුවාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියාහු ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක:

2. "මහණෙනි, 'තෙමේත් අල්පේච්ඡ වූයේ අල්පේච්ඡකථාව භික්ෂූන්ට කරණසුලු වූයේ යයි ද, තෙමේත් සන්තුෂ්ට වූයේ සන්තුෂ්ටිකථාව භික්ෂූන්ට කරණසුලු වූයේ යයි ද, තෙමේත් ප්‍රකාශ්‍යිවිවෙකයෙන් යුක්ත වූයේ විවෙකකථාව භික්ෂූන්ට කරණසුලු වූයේ යයි ද, තෙමේත් (පංචවිධ-) සංසර්ගය නැති වූයේ අසංසර්ගකථාව භික්ෂූන්ට කරණ සුලු වූයේ යයි ද, තෙමේත් පටන්ගත් වීර්‍ය්‍ය ඇත්තේ වීර්‍ය්‍යාරම්භකථාව භික්ෂූන්ට කරණසුලු වූයේයයි ද. තෙමේත් ශීලසම්පන්න වූයේ ශීලසම්පදකථාව භික්ෂූන්ට කරණසුලු වූයේ යයි ද. තෙමේත් සමාධිසම්පන්න වූයේ සමාධිසම්පද කථාව භික්ෂූන්ට කරණසුලු වූයේ යයි ද, තෙමේත් ප්‍රඥාසම්පන්න වූයේ ප්‍රඥාසම්පදකථාව භික්ෂූන්ට කරණසුලු වූයේ යයි ද, තෙමේත් විමුක්ති (අර්හත්ඵල) සම්පන්න වූයේ විමුක්ති සම්පදකථාව භික්ෂූන්ට කරණසුලු වූයේ යයි ද, තෙමේත් විමුක්තිඥාන දර්ශනයෙන් යුක්ත වූයේ විමුක්තිඥානදර්ශන-සම්පදකථාව භික්ෂූන්ට කරණ සුලු වූයේ යයි ද, සබ්‍රම්සරුන්ට දශකථා-වස්තූන්ගෙන් අවවාද කරන්නේ යයි ද, එය අවබෝධ කරවන්නේ යයි ද, ඒ පිළිබඳ කරුණු දක්වන්නේ යයි ද, එය පිළිගන්වන්නේ යයි ද, එය කරවීම් වශයෙන් තියුණු කරවන්නේ යයි ද, මෙසේ ජාතිභූමියෙහි ජාතිභූමක වූ සබ්‍රහමචාරීභික්ෂූන් විසින් කවරෙක් තෙමේ සම්භාවනා කරණ ලද්දේ ද?

3. "වහන්ස, මන්තාණි බැමිණියගේ පුත්‍ර වූ පූර්ණ නම් ආයුෂ්මත් තෙමේ ජාතිභූමියෙහි ජාතිභූමක සබ්‍රහමචාරී භික්ෂූන් විසින් 'තෙමේත් අල්පේච්ඡ වූයේ අල්පේච්ඡ කථාව භික්ෂූන්ට කරණසුලු වූයේ යයි ද, තෙමේත් සන්තුෂ්ට වූයේ සන්තුෂ්ටි කථාව භික්ෂූන්ට කරණසුලු වූයේ යයි ද, තෙමේත් ප්‍රකාශ්‍ය විවෙකයෙන් යුක්ත වූයේ ප්‍රකාශ්‍යවිවෙකය පිළිබඳ කථාව භික්ෂූන්ට කරණසුලු වූයේ යයි ද, තෙමේත් අසංසෘෂ්ට වූයේ අසංසර්ගකථාව භික්ෂූන්ට කරණසුලු වූයේ යයි ද, තෙමේත් පටන්ගත් වීර්‍ය්‍ය ඇත්තේ වීර්‍ය්‍යාරම්භ කථාව භික්ෂූන්ට කරණසුලු වූයේ යයි ද, තෙමේත් ශීලසම්පන්න වූයේ ශීලසම්පදකථාව භික්ෂූන්ට කරණසුලු වූයේ යයි ද, තෙමේත් සමාධි සම්පන්න වූයේ සමාධිසම්පදකථාව භික්ෂූන්ට කරණසුලු වූයේ යයි ද, තෙමේත් ප්‍රඥාසම්පන්න වූයේ ප්‍රඥාසම්පදකථාව භික්ෂූන්ට කරනසුලු වූයේ යයි ද, තෙමේත් විමුක්තිසම්පන්න වූයේ විමුක්තිසම්පද කථාව භික්ෂූන්ට කරණසුලු වූයේ යයි ද, තෙමේත් විමුක්තිඥානදර්ශනයෙන් යුක්ත වූයේ විමුක්තිඥානදර්ශනසම්පදකථාව භික්ෂූන්ට කරනසුලු වූයේ යයි ද, සබ්‍රම්සරුන්ට දශකථා වස්තූන්ගෙන් අවවාද කරන්නේ යයි ද, එය අවබොධ කරවන්නේ යයි ද, ඒ පිළිබඳ කරුණු දක්වන්නේ යයි ද, එය පිළිගන්වන්නේ යයි ද, එය තියුණු කරවන්නේ යයි ද, එහි සතුටු කරවන්නේ වේ' යයි ද මෙසේ සම්භාවනා කරණ ලද්දේ ය."

4. තෙන ඛො පන සමයෙන ආයස්මා සාරිපුත්තො භගවතො අවිදූරෙ නිසින්නො හොති. අථ ඛො ආයස්මතො සාරිපුත්තස්ස එතද හොසි: "ලාභා ආයස්මතො පුණ්ණස්ස මන්තාණිපුත්තස්ස, සුලද්ධලාභා ආයස්මතො පුණ්ණස්ස මන්තාණිපුත්තස්ස, යස්ස විඤ්ඤූ සබ්‍රහ්මචාරී සත්ථු සම්මුඛා අනුමාස්ස අනුමාස්ස[1] වණ්ණං භාසන්ති, තඤ්ච සත්ථා අබ්භනු-මොදති, අප්පෙව නාම මයං කදාචි කරහචි ආයස්මතා පුණ්ණෙන මන්තාණිපුත්තෙන සද්ධිං සමාගච්ඡෙය්‍යාම, අප්පෙව නාම සියා කොචි දෙව කථාසල්ලාපො"ති.

5. අථ ඛො භගවා රාජගහෙ යථාභිරන්තං විහරිත්වා යෙන සාවත්ථි තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන සාවත්ථි තදවසරි. තත්‍ර සුදං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අස්සොසි ඛො ආයස්මා පුණ්ණො මන්තාණිපුත්තො "භගවා කිර සාවත්ථිං අනුප්පත්තො සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ"ති.

6. අථ ඛො ආයස්මා පුණ්ණො මන්තාණිපුත්තො සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය යෙන සාවත්ථි තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන සාවත්ථි ජෙතවනං අනාථපිණ්ඩිකස්ස ආරාමො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං පුණ්ණං මන්තාණිපුත්තං භගවා ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො ආයස්මා පුණ්ණො මන්තාණිපුත්තො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන අන්ධවනං තෙන පක්කාමි දිවාවිහාරාය.

7. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙනායස්මා සාරිපුත්තො තෙනුප සඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: "යස්ස ඛො ත්වං ආවුසො සාරිපුත්ත පුණ්ණස්ස නාම භික්ඛුනො මන්තාණිපුත්තස්ස අභිණ්හං කිත්තයමානො අහොසි, සො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන අන්ධවනං තෙන පක්කන්තො දිවාවිහාරායා"ති.

1. අනුමස්ස අනුමස්ස, මජසං,

4. එ සමයෙහි ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි හුන්නාහු වෙත්. ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙබඳු අදහසෙක් වි ය: "නුවණ ඇත්තා වූ සබ්‍රහ්මචාරීහු ශාස්තෲන් වහන්සේගේ හමුවෙහි දශකථාවස්තුන්ට පිවිසෙමින් යම් කෙනකුන්ගේ ගුණ කියත් ද, ඒ ගුණකථාව ද ශාස්තෲන් වහන්සේ මනා කොට අනුමොදන් වනසේක් ද, ඒ මන්ත්‍රාණිපුත්‍ර වූ පූර්ණ ආයුෂ්මතුන් වහන්සේට ලාභයෙකි. මන්ත්‍රාණිපුත්‍ර පූර්ණ ස්ථවිරයන්ට සුලබලාභයකි. අපි කිසියම් කලෙක මන්ත්‍රාණිපුත්‍ර ආයුෂ්මත් පූර්ණ තෙරණුවන් හා එක් වන්නමෝ නම් මැනව. කිසියම් කථාසල්ලාපයකුත් වන්නේ නම් මැනව" කියායි.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කැමැති තාක් කල් රජගහනුවර වැඩවාසය කොට පිළිවෙළින් චාරිකාවෙහි හැසිරෙණසේක් සැවැත්නුවරට වැඩිසේක. භාග්‍යවතුන් වහන්සේ ඒ සැවැත්නුවර ජේතවනයෙහි වූ අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වාසය කරණ සේක. "භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවරට වැඩ අනේපිඬු සිටුහුගේ දෙව්රම් වෙහෙර වාසය කරණසේක් ලු" යි මන්ත්‍රාණිපුත්‍ර ආයුෂ්මත් පූර්ණ ස්ථවිරයන් වහන්සේ ඇසූහ.

6 ඉක්බිති මන්ත්‍රාණිපුත්‍ර ආයුෂ්මත් පූර්ණ තෙරණුවෝ සෙනසුන් හැත්පත්කොට තබා පාසිවුරු ගෙණ සැවැත්නුවරට චාරිකාවෙහි වැඩියහ. පිළිවෙළින් චාරිකාවෙහි හැසිරෙන්නාහු, භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත් පසෙක හුන් මන්ත්‍රාණිපුත්‍ර ආයුෂ්මත් පූර්ණ තෙරණුවන්ට භාග්‍යවතුන් වහන්සේ දැහැමි කතාවෙන් කරුණු දක්වූහ. එහි සමාදන් කරවූහ. එහි උත්සාහ කරවූහ එහි සතුටු කරවූහ. ඉක්බිති මන්ත්‍රාණිපුත්‍ර ආයුෂ්මත් පූර්ණ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කථාවෙන් කරුණු දක්වන ලද්දාහු, සමාදන් කරවන ලද්දාහු, උත්සාහවත් කරවන ලද්දාහු, සතුටු කරවන ලද්දාහු, භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතයට සතුටු ව අනුමෝදන්ව අස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට දිවාවිහරණය සඳහා අන්ධවනයට වැඩියහ.

7. ඉක්බිති එක්තරා භික්ෂු නමක් ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙය සැළ කෙළේ ය: "ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, ඔබ වහන්සේ යම් මන්ත්‍රාණි පුත්‍ර ආයුෂ්මත් පූර්ණ තෙර කෙනකුන් ගැණ නිතර කියමින් විසූ සේක් ද, ඒ පූර්ණස්ථවිර තෙමෙ භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කතාවෙන් කරුණු දක්වන ලද්දේ, සමාදන් කරවන ලද්දේ, උත්සාහවත් කරවන ලද්දේ, සතුටු කරවන ලද්දේ, භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවට සතුටු ව අනුමොදන් ව අස්නෙන් නැඟිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට දිවාවිහරණය සඳහා අන්ධවනය කරා ගියේ ය" යි කියා යි.

8. අථ ඛො ආයස්මා සාරිපුත්තො තරමානරූපො නිසීදනං ආදාය ආයස්මන්තං පුණ්ණං මන්තාණිපුත්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධි සීසානුලොකී අථ ඛො ආයස්මා පුණ්ණො මන්තාණිපුත්තො අන්ධවනං අජ්ඣොගහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි. ආයස්මාපි ඛො සාරිපුත්තො අන්ධවනං අජ්ඣොගහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි. අථ ඛො ආයස්මා සාරිපුත්තො සායන්හසමයං පටිසල්ලාණා වුට්ඨිතො යෙනායස්මා පුණ්ණො මන්තාණිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා පුණ්ණෙන මන්තාණිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං පුණ්ණං මන්තාණිපුත්තං එතදවොච:

9. භගවති නො ආවුසො බ්‍රහ්මචරියං වුස්සතීති? 'එවමාවුසො'ති. කින්නු ඛො ආවුසො සීලවිසුද්ධත්ථං භගවති බ්‍රහ්මචරියං වුස්සතීති? 'නො හිදං ආවුසො'. කිම්පනාවුසො චිත්තවිසුද්ධත්ථං භගවති බ්‍රහ්මචරියං වුස්සතීති? 'නො හිදං ආවුසො.' කින්නු ඛො ආවුසො දිට්ඨිවිසුද්ධත්ථං භගවති බ්‍රහ්මචරියං වුස්සතීති? 'නො හිදං ආවුසො' කිම්පනාවුසො කඞ්ඛාවිතරණවිසුද්ධත්ථං භගවති බ්‍රහ්මචරියං වුස්සතීති? 'නො හිදං ආවුසො'. කින්නු ඛො ආවුසො මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධත්ථං භගවති බ්‍රහ්මචරියං වුස්සතීති? 'නො හිදං ආවුසො.' 'කිම්පනාවුසො පටිපදාඤාණදස්සනවිසුද්ධත්ථං භගවති බ්‍රහ්මචරියං වුස්සතීති? 'නො හිදං ආවුසො'. කින්නු ඛො ආවුසො ඤාණදස්සනවිසුද්ධත්ථං භගවති බ්‍රහ්මචරියං වුස්සතීති? 'නො හිදං ආවුසො.'

10. "කින්නු ඛො ආවුසො සීලවිසුද්ධත්ථං භගවති බ්‍රහ්මචරියං වුස්සතී"ති ඉති පුට්ඨො සමානො 'නො හිදං ආවුසො'ති වදෙසි. "කිම්පනාවුසො චිත්තවිසුද්ධත්ථං භගවති බ්‍රහ්මචරියං වුස්සතී"ති ඉති පුට්ඨො සමානො 'නො හිදං ආවුසො'ති වදෙසි "කින්නු ඛො ආවුසො දිට්ඨිවිසුද්ධත්ථං භගවති -පෙ- "කින්නු ඛො ආවුසො ඤාණදස්සනවිසුද්ධත්ථං භගවති බ්‍රහ්මචරියං වුස්සතීති ඉති පුට්ඨො සමානො 'නො හිදං ආවුසො'ති වදෙසි. කිමත්ථං චරහාවුසො භගවති බ්‍රහ්මචරියං වුස්සතීති? 'අනුපාදාපරිනිබ්බානත්ථං ඛො ආවුසො භගවති බ්‍රහ්මචරියං වුස්සතී'ති.

11. කින්නු ඛො ආවුසො සීලවිසුද්ධි අනුපාදාපරිනිබ්බානන්ති? 'නො හිදං ආවුසො.' කිම්පනාවුසො චිත්තවිසුද්ධි අනුපාදාපරිනිබ්බානන්ති? 'නො හිදං ආවුසො.' කින්නු ඛො ආවුසො දිට්ඨිවිසුද්ධි අනුපාදාපරිනිබ්බානන්ති? 'නො හිදං ආවුසො.' කිම්පනාවුසො කඞ්ඛාවිතරණවිසුද්ධි අනුපාදාපරිනිබ්බානන්ති? 'නො හිදං ආවුසො.' කින්නු ඛො ආවුසො මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි අනුපාදාපරිනිබ්බානන්ති?. 'නො හිදං ආවුසො' කිම්පනාවුසො පටිපදාඤාණදස්සනවිසුද්ධි අනුපාදාපරිනිබ්බානන්ති? 'නො හිදං ආවුසො.' කින්නු ඛො ආවුසො ඤාණදස්සනවිසුද්ධි අනුපාදාපරිනිබ්බානන්ති? 'නො හිදං ආවුසො' අඤ්ඤත්‍ර ඉමෙහි ධම්මෙහි අනුපාදාපරිනිබ්බානන්ති? 'නො හිදං ආවුසො.'

8. ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ වෙළෙවිසැහැවි ඇතියාහු හිඳිනාසනය ගෙණ ආයුෂ්මත් මන්ත්‍රාණීපුත්‍ර පුණ්ණ තෙරණුවන් හිස්කෙළිය බලනසුලුව පසු පසින් ලුහුබැන්දේ ය. අනතුරු ව මන්ත්‍රාණීපුත්‍ර පුණ්ණ තෙරණුවෝ අන්ධවනයට වැද එක්තරා ගසක් මුල දිවාවිහරණයට හුන්හ. ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙරණුවෝ ද, අන්ධවනයට පැමිණ එක්තරා ගසක්මුල දිවාවිහරණයට හුන්හ. ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සවස් කාලයෙහි පලසමවතින් නැගී සිටියාහු මන්ත්‍රාණීපුත්‍ර ආයුෂ්මත් පුණ්ණ තෙරණුවන් කරා පැමිණියහ. පැමිණ ආයුෂ්මත් මන්ත්‍රාණීපුත්‍ර පුණ්ණ තෙරණුවන් සමග සතුටු වූහ. සතුටු විය යුතු කථා කොට නිමවා එකත්පසෙක හුන්හ එකත්පසෙක හුන් ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙරණුවෝ මන්ත්‍රාණීපුත්‍ර පුණ්ණ තෙරණුවන්ට මෙය කීහ:

9. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන සේක් ද? 'ඇවැත්නි, එසේය'. කිමෙක් ද, ඇවැත්නි, ශීලවිශුද්ධිය පිණිස භාග්‍ය වතුන් වහන්සේ වෙත බඹසර වසන සේක් ද? "ඇවැත්නි, මෙය නො වෙයි.' කිමෙක් ද, ඇවැත්නි, චිත්තවිශුද්ධිය පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන සේක් ද? 'ඇවැත්නි, මෙය නො වෙයි'. කිමෙක් ද, ඇවැත්නි, දෘෂ්ටිවිශුද්ධිය පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන සේක් ද? 'ඇවැත්නි, මෙය නොවෙයි'. කිමෙක් ද, ඇවැත්නි, කඞ්ඛාවිතරණවිසුද්ධිය පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන සේක් ද? 'ඇවැත්නි, මෙය නො වේ.' කිමෙක් ද, ඇවැත්නි, මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධිය පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන සේක් ද? 'ඇවැත්නි, මෙය නො වේ.' කිමෙක්ද, ඇවැත්නි, පටිපදාඤාණදස්සනවිසුද්ධිය පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන සේක් ද?. 'ඇවැත්නි, මෙය නො වේ.'

10. "කිම, ඇවැත්නි, ශීලවිශුද්ධිය සඳහා භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන සේක් ද"යි මෙසේ විචාරණ ලද්දාහු ම 'ඇවැත්නි, මේ නො වේ ය'යි කියහු. 'කිම ඇවැත්නි, චිත්තවිශුද්ධිය සඳහා භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන සේක් ද" යි විචාරණ ලද්දාහු ම 'ඇවැත්නි, මේ නො වේ ය'යි කියහු. "කිම ඇවැත්නි, දිට්ඨිවිසුද්ධිය සඳහා භාග්‍යවතුන් වහන්සේ වෙත ... කිම ඇවැත්නි, ඤාණදස්සනවිසුද්ධිය සඳහා භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන සේක්ද" යි විචාරණ ලද්දාහු ම 'ඇවැත්නි, නො වේ ය' යි කියහු. ඇවැත්නි, එසේ වී නම්, කුමක් සඳහා භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන සේක් ද.? 'ඇවැත්නි, (මේ තෙමේ) අනුපාද පරිනිර්වාණය සඳහා භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වෙසේ.'

11. ඇවැත්නි, කිම, ශීලවිශුද්ධිය අනුපාදපරිනිර්වාණය වේ ද? 'ඇවැත්නි, මෙය නො වේ' ඇවැත්නි, කිම, චිත්තවිශුද්ධිය අනුපාද පරිනිර්වාණය වේ ද? 'ඇවැත්නි, මෙය නො වේ.' ඇවැත්නි, කිම දිට්ඨිවිසුද්ධිය අනුපාදපරිනිර්වාණය වේ ද? 'ඇවැත්නි, මේ නො වේ' ඇවැත්නි, කිම, කඞ්ඛාවිතරණවිසුද්ධිය අනුපාදපරිනිර්වාණය වේ ද? 'ඇවැත්නි, මේ නො වේ' ඇවැත්නි, කිම, මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධිය අනුපාදපරිනිර්වාණය වේ ද? 'ඇවැත්නි, මේ නො වේ'. ඇවැත්නි, කිම, පටිපදාඤාණදස්සනවිසුද්ධිය අනුපාදපරිනිර්වාණය වේ ද?" ඇවැත්නි, මේ නො වේ' ඇවැත්නි, කිම ඤාණදස්සනවිසුද්ධිය අනුපාදපරිනිර්වාණය වේ ද? 'ඇවැත්නි, මේ නො වේ'. ඇවැත්නි, කිම, මේ ධර්මයන් හැර අනුපාදපරිනිර්වාණය වේ ද?' 'ඇවැත්නි, මේ නොවේ.'

12. "කින්නු ඛො ආවුසො සීලවිසුද්ධි අනුපාදාපරිනිබ්බානත්ථන්ති ඉති පුට්ඨො සමානො 'නො හිදං ආවුසො'ති වදෙසි. කිම්පනාවුසො චිත්තවිසුද්ධි, අනුපාදාපරිනිබ්බානත්ථන්ති ඉති පුට්ඨො සමානො 'නො හිදං ආවුසො'ති වදෙසි. කින්නු ඛො ආවුසො දිට්ඨිවිසුද්ධි, අනුපාදාපරිනිබ්බානත්ථන්ති -පෙ- කින්නු ඛො ආවුසො ඤාණදස්සනවිසුද්ධි, අනුපාදාපරිනිබ්බානත්ථන්ති ඉති පුට්ඨො සමානො 'නො හිදං ආවුසො'ති වදෙසි. කිම්පනාවුසො අඤ්ඤත්‍ර ඉමෙහි ධම්මෙහි අනුපාදාපරිනිබ්බානත්ථන්ති ඉති පුට්ඨො සමානො 'නො හිදං ආවුසො'ති වදෙසි." යථා කථං පනාවුසො ඉමස්ස භාසිතස්ස අත්ථො දට්ඨබ්බොති ?

[පුණ්ණත්ථෙරො:]

13. සීලවිසුද්ධිඤ්චෙ ආවුසො භගවා අනුපාදාපරිනිබ්බානං පඤ්ඤපෙස්ස, සඋපාදානංයෙව සමානං අනුපාදාපරිනිබ්බානං පඤ්ඤපෙස්ස. චිත්තවිසුද්ධිඤ්චෙ ආවුසො භගවා අනුපාදාපරිනිබ්බානං පඤ්ඤපෙස්ස, සඋපා-දානංයෙව සමානං අනුපාදාපරිනිබ්බානං පඤ්ඤපෙස්ස. දිට්ඨිවිසුද්ධිඤ්චෙ ආවුසො භගවා අනුපාදාපරිනිබ්බානං පඤ්ඤපෙස්ස, සඋපාදානංයෙව සමානං අනුපාදාපරිනිබ්බානං පඤ්ඤපෙස්ස. කඞ්ඛාවිතරණවිසුද්ධිඤ්චෙ ආවුසො භගවා අනුපාදාපරිනිබ්බානං පඤ්ඤපෙස්ස. සඋපාදානංයෙව සමානං අනුපාදාපරිනිබ්බානං පඤ්ඤපෙස්ස. මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධිඤ්චෙ ආවුසො භගවා අනුපාදාපරිනිබ්බානං පඤ්ඤපෙස්ස, සඋපාදානංයෙව සමානං අනුපාදාපරිනිබ්බානං පඤ්ඤපෙස්ස. පටිපදාඤාණදස්සනවිසුද්ධිඤ්චෙ ආවුසො භගවා අනුපාදාපරිනිබ්බානං පඤ්ඤපෙස්ස, සඋපාදානංයෙව සමානං අනු-පාදාපරිනිබ්බානං පඤ්ඤපෙස්ස. ඤාණදස්සනවිසුද්ධිඤ්චෙ ආවුසො භගවා අනුපාදාපරිනිබ්බානං පඤ්ඤපෙස්ස, සඋපාදානංයෙව සමානං අනුපාදා-පරිනිබ්බානං පඤ්ඤපෙස්ස. අඤ්ඤත්‍ර චෙ ආවුසො ඉමෙහි ධම්මෙහි අනුපාදා-පරිනිබ්බානං අභවිස්ස, පුථුජ්ජනො පරිනිබ්බායෙය්‍ය. පුථුජ්ජනො හි ආවුසො අඤ්ඤත්‍ර ඉමෙහි ධම්මෙහි.

14. තෙන හාවුසො උපමං තෙ කරිස්සාමි. උපමායපිධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති. සෙය්‍යථාපි ආවුසො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස සාවත්ථියං පටිවසන්තස්ස සාකෙතෙ කිඤ්චිදෙව අච්චායිකං කරණීයං උප්පජ්ජෙය්‍ය, තස්ස අන්තරා ච සාවත්ථිං අන්තරා ච සාකෙතං සත්ත රථවිනීතානි උපට්ඨපෙය්‍යුං. අථ ඛො ආවුසො රාජා පසෙනදි කොසලො සාවත්ථියා නික්ඛමිත්වා අන්තෙපුරද්වාරා පඨමං රථවිනීතං අභිරුහෙය්‍ය පඨමෙන රථවිනීතෙන දුතියං රථවිනීතං පාපු-ණෙය්‍ය, පඨමං රථවිනීතං විස්සජ්ජෙය්‍ය, දුතියං රථවිනීතං අභිරුහෙය්‍ය. දුතියෙන රථවිනීතෙන තතියං රථවිනීතං පාපුණෙය්‍ය, දුතියං රථවිනීතං විස්සජ්ජෙය්‍ය, තතිය රථවිනීතං අභිරුහෙය්‍ය. තතියෙන රථවිනීතෙන චතුත්ථං රථවිනීතං පාපුණෙය්‍ය, තතියං රථවිනීතං විස්සජ්ජෙය්‍ය,

12. "ඇවැත්නි, කිම, ශීලවිශුද්ධිය අනුපාදපරිනිර්වාණය දැ යි මෙසේ අසන ලද්දහු ම 'ඇවැත්නි, මේ නො වේ ය'යි කියහු. ඇවැත්නි, කිම, චිත්තවිශුද්ධිය අනුපාදපරිනිර්වාණය වේ 'දැයි මෙසේ අසන ලද්දහු ම 'ඇවැත්නි, මේ නො වේ ය'යි කියහු. ඇවැත්නි, කිම, දිට්ඨිවිසුද්ධිය අනුපාදපරිනිර්වාණය වේ දැ යි ... ඇවැත්නි, කිම, ඤාණදස්සනවිසුද්ධිය අනුපාදපරිනිර්වාණය වේ දැ'යි මෙසේ අසන ලද්දහු ම 'ඇවැත්නි, මේ නො වේ ය'යි කියහු. ඇවැත්නි, කිම, මේ ධර්මයන් හැර අනුපාදපරිනිර්වාණය වේ දැ යි. මෙසේ අසන ලද්දහු ම 'ඇවැත්නි, මේ නො වේ ය'යි කියහු." ඇවැත්නි, මේ භාෂිතයාගේ අර්ථය කෙසේ දත යුතු දැ යි ඇසූහ.

[පුණ්ණතෙරණුවෝ:]

13. ඇවැත්නි, ඉදින් භාග්‍යවතුන් වහන්සේ 'ශීලවිශුද්ධිය අනුපාදපරිනිර්වාණය වේ ය යි, පනවන සේක් නම්, උපාදාන සහිත වූවක් ම අනුපාදපරිනිර්වාණය වේ ය යි පනවන සේක. ඇවැත්නි, ඉදින් භාග්‍යවතුන් වහන්සේ 'චිත්තවිශුද්ධිය අනුපාදපරිනිර්වාණය වේ ය'යි පනවන සේක් නම් උපාදාන සහිත වූවක් ම අනුපාදපරිනිර්වාණය වේ ය යි පනවන සේක. ඇවැත්නි, ඉදින් භාග්‍යවතුන් වහන්සේ 'දිට්ඨිවිසුද්ධිය අනුපාදපරිනිර්වාණය වේ ය' යි පනවන සේක් නම්, උපාදාන සහිත වූවක් ම අනුපාදපරිනිර්වාණය වේ යයි පනවන සේක. ඇවැත්නි, ඉදින් භාග්‍යවතුන් වහන්සේ 'කඞ්ඛාවිතරණවිසුද්ධිය අනුපාදපරිනිර්වාණය වේ ය'යි පනවන සේක් නම්, උපාදාන සහිත වූවක් ම අනුපාදපරිනිර්වාණය වේ ය යි පනවන සේක. ඇවැත්නි, ඉදින් භාග්‍යවතුන් වහන්සේ මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධිය අනුපාදපරිනිර්වාණය වේ ය' යි. පනවන සේක් නම්, උපාදාන සහිත වූවක් ම අනුපාදපරිනිර්වාණය වේ ය යි පනවන සේක. ඇවැත්නි, ඉදින් භාග්‍යවතුන් වහන්සේ 'පටිපදාඤාණදස්සනවිසුද්ධිය අනුපාදපරිනිර්වාණය වේ ය' යි පනවන සේක් නම්, උපාදාන සහිත වූවක් ම අනුපාදපරිනිර්වාණය වේ ය' යි පනවන සේක. ඇවැත්නි, ඉදින් භාග්‍යවතුන් වහන්සේ 'ඤාණදස්සනවිසුද්ධිය අනුපාදපරිනිර්වාණය වේ ය' යි. පනවන සේක් නම්, උපාදාන සහිත වූවක් ම අනුපාදපරිනිර්වාණය වේ ය' යි පනවන සේක. ඇවැත්නි, ඉදින් මේ ධර්මයන් හැර (අනිකක්) අනුපාදපරිනිර්වාණය වන්නේ නම්, පෘථග්ජන තෙමේ පිරිනිවෙන්නේය. ඇවැත්නි, පෘථග්ජන තෙමේ මේ ධර්මයන්ගෙන් වෙන් වූයේ වෙයි.

14. ඇවැත්නි, එසේ නම් ඔබට උපමාවක් කරන්නෙමි. මේ ලොකයෙහි සමහර නුවණැති පුරුෂයෝ උපමාවෙන් ද අර්ථය දැන ගනිත්. ඇවැත්නි, යම්සේ සැවැත්නුවර වසන පසේනදි කොසොල් රජහට සාකෙත නුවර කිසියම් ඉක්මන් කටයුත්තක් උපදනේ ය. ඔහුට සැවැතටත් සාකෙතයටත් අතර තික්මුණු අනුන් යොදූ රිය හතක් එලවා තබන්නාහු ය. ඇවැත්නි, ඉක්බිති පසේනදි කොසොල් රජ සැවැත් නුවරින් නික්ම ඇතුළු පුරදොරින් පලමුවැනි විනීතරථයට නගින්නේ ය. පලමු වැනි විනීතරථයෙන් දෙවැනි විනීතරථයට පැමිණෙන්නේ ය. පලමුවැනි විනීතරථය අත්හරින්නේ ය. දෙවැනි විනීතරථයට නගින්නේය. දෙවෙනි විනීත රථයෙන් තුන්වැනි විනීතරථයට පැමිණෙන්නේ ය. දෙවෙනි විනීතරථය අත්හරින්නේ ය. තුන්වැනි විනීතරථයට නගින්නේ ය. තුන් වැනි විනීතරථය අත්හරින්නේ ය. තුන් වැනි විනීතරථයෙන් සතරවැනි විනීතරථයට පැමිණෙන්නේ ය. තුන්වැනි විනීතරථය අත් හරින්නේ ය.

Free Distribution www.aathaapi.org

චතුත්ථං රථවිනීතං අභිරුහෙය්‍ය. චතුත්ථෙන රථවිනීතෙන පඤ්චමං රථවිනීතං පාපුණෙය්‍ය, චතුත්ථං රථවිනීතං විස්සජ්ජෙය්‍ය, පඤ්චමං රථවිනීතං අභිරුහෙය්‍ය. පඤ්චමෙන රථවිනීතෙන ඡට්ඨං රථවිනීතං පාපුණෙය්‍ය, පඤ්චමං රථවිනීතං විස්සජ්ජෙය්‍ය, ඡට්ඨං රථවිනීතං අභිරුහෙය්‍ය. ඡට්ඨෙන රථවිනීතෙන සත්තමං රථවිනීතං පාපුණෙය්‍ය, ඡට්ඨං රථවිනීතං විස්සජ්ජෙය්‍ය, සත්තමං රථවිනීතං අභිරුහෙය්‍ය. සත්තමෙන රථවිනීතෙන සාකෙතං අනුපාපුණෙය්‍ය අන්තෙපුරද්වාරං.

15. තමෙනං අන්තෙපුරද්වාරගතං සමානං මිත්තාමච්චා ඤාතිසාලොහිතා එවං පුච්ඡෙය්‍යුං "ඉමිනා ත්වං මහාරාජ රථවිනීතෙන සාවත්ථියා සාකෙතං අනුප්පත්තො අන්තෙපුරද්වාරන්ති?" කථං බ්‍යාකරමානො නු ඛො ආවුසො රාජා පසෙනදි කොසලො සම්මා බ්‍යාකරමානො බ්‍යාකරෙය්‍යාති? එවං බ්‍යාකරමානො ඛො ආවුසො රාජා පසෙනදි කොසලො සම්මා බ්‍යාකරමානො බ්‍යාකරෙය්‍ය: "ඉධ මෙ සාවත්ථියං පටිවසන්තස්ස සාකෙතෙ කිඤ්චිදෙව අච්චායිකං කරණීයං උප්පජ්ජි. තස්ස මෙ අන්තරා ච සාවත්ථිං අන්තරා ච සාකෙතං සත්තරථවිනීතානි උපට්ඨපෙසුං. අථ ඛ්වාහං සාවත්ථියා නික්ඛමිත්වා අන්තෙපුරද්වාරා[1] පඨමං රථවිනීතං අභිරුහිං. පඨමෙන රථවිනීතෙන දුතියං රථවිනීතං පාපුණිං. පඨමං රථවිනීතං නිස්සජ්ජිං[2]. දුතියං රථවිනීතං අභිරුහිං. දුතියෙන රථවිනීතෙන තතියං රථවිනීතං පාපුණිං. දුතියං රථවිනීතං නිස්සජ්ජිං. තතියං රථවිනීතං අභිරුහිං. තතියෙන රථවිනීතෙන චතුත්ථං රථවිනීතං පාපුණිං. තතියං රථවිනීතං නිස්සජ්ජිං. චතුත්ථං රථවිනීතං අභිරුහිං. චතුත්ථෙන රථවිනීතෙන පඤ්චමං රථවිනීතං පාපුණිං. චතුත්ථං රථවිනීතං නිස්සජ්ජිං. පඤ්චමං රථවිනීතං අභිරුහිං. පඤ්චමෙන රථවිනීතෙන ඡට්ඨං රථවිනීතං පාපුණිං. පඤ්චමං රථවිනීතං නිස්සජ්ජිං. ඡට්ඨං රථවිනීතං අභිරුහිං. ඡට්ඨෙන රථවිනීතෙන සත්තමං රථවිනීතං පාපුණිං ඡට්ඨං රථවිනීතං නිස්සජ්ජිං. සත්තමං රථවිනීතං අභිරුහිං. සත්තමෙන හි රථවිනීතෙන[3] සාකෙතං අනුප්පත්තො අන්තෙපුරද්වාරන්ති. එවං බ්‍යාකරමානො ඛො ආවුසො රාජා පසෙනදි කොසලො සම්මා බ්‍යාකරමානො බ්‍යාකරෙය්‍යාති.

16. එවමෙව ඛො ආවුසො සීලවිසුද්ධි යාවදෙව චිත්තවිසුද්ධත්ථා. චිත්තවිසුද්ධි යාවදෙව දිට්ඨිවිසුද්ධත්ථා. දිට්ඨිවිසුද්ධි යාවදෙව කඞ්ඛාවිතරණවිසුද්ධත්ථා. කඞ්ඛාවිතරණවිසුද්ධි යාවදෙව මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධත්ථා. මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි යාවදෙව පටිපදාඤාණදස්සනවිසුද්ධත්ථා. පටිපදාඤාණදස්සනවිසුද්ධි යාවදෙව ඤාණදස්සනවිසුද්ධත්ථා. ඤාණදස්සනවිසුද්ධි යාවදෙව අනුපාදාපරිනිබ්බානත්ථා. අනුපාදාපරිනිබ්බානත්ථං ඛො ආවුසො භගවති බ්‍රහ්මචරියං වුස්සතීති.

---

1. අන්තෙපුරද්වාරෙ, සයා.
2. විස්සජ්ජිං, මජසං. නිස්සජ්ජිං, සතා.
3. සත්තමෙන රථවිනීතෙන, මජසං. PTS.

සතර වන විනීතරථයට නඟින්නේ ය. සතර වන විනීතරථයෙන් පස්වන විනීතරථයට පැමිණෙන්නේ ය. සතර වන විනීතරථය අත්හරින්නේ ය. පස්වන විනීතරථයට නඟින්නේ ය. පස් වන විනීතරථයෙන් සවන විනීතරථයට පැමිණෙන්නේ ය. පස්වන විනීතරථය අත්හරින්නේ ය. සවන විනීතරථයට නඟින්නේ ය. සවන විනීතරථයෙන් සත්වන විනීතරථයට පැමිණෙන්නේ ය. සවන විනීත රථය අත්හරින්නේ ය. සත්වන විනීතරථයෙන් සාකෙතයෙහි ඇතුළුනුවර දෙරටුව කරා පැමිණෙන්නේ ය.

15. ඇතුළුපුර දොරටුවට පැමිණි ඔහුගෙන් මිත්‍රාමාත්‍යයෝ නෑ සහලේ නෑයෝ මෙසේ අසන්නාහු ය: ‘මහරජ, නුඹවහන්සේ මේ විනීත රථයෙන් සැවැත්නුවරින් නික්ම සාකෙතයෙහි ඇතුළුනුවර දොරටුවට පැමිණියාහු දැ?’ කියා යි. ඇවැත්නි පසේනදි කොසොල් රජ කෙසේ ප්‍රකාශ කරන්නේ මැනැවින් ප්‍රකාශ කරන්නේ දැ? ඇවැත්නි, පසේනදි කොසොල්රජ මෙසේ ප්‍රකාශ කරන්නේ මැනැවින් ප්‍රකාශ කරන්නේ ය. (කෙසේ ද) “මේ සැවැත්නුවර වසන මට සාකෙතයෙහි ඉක්මන් කටයුත්තක් උපන. ඒ මට සැවැතටත් සාකෙතයටත් අතර විනීත අසුන් යෙදූ රිය සතක් එලවා තැබූහ. ඉක්බිති මම සැවැත්නුවරින් නික්ම ඇතුළුදොරටුවෙන් පලමුවන විනීතරථයට නැංගෙමි. පලමුවන විනීතරථයෙන් දෙවන විනීත රථයට පැමිණියෙමි. පලමුවන විනීතරථය හලෙමි. දෙවන විනීතරථයට නැංගෙමි. දෙවන විනීතරථයෙන් තුන්වන විනීතරථයට පැමිණියෙමි. දෙවන විනීතරථය හලෙමි. තුන් වන විනීතරථයට නැංගෙමි. තුන්වන විනීතරථයෙන් සතරවන විනීතරථයට පැමිණියෙමි. තුන්වන විනීතරථය හලෙමි. සතරවන විනීත රථයට නැංගෙමි. සතරවන විනීතරථයෙන් පස්වන විනීතරථයට පැමිණියෙමි. සතරවන විනීතරථය හලෙමි. පස්වන විනීත රථයට නැංගෙමි. පස්වන විනීතරථයෙන් සවන විනීතරථයට පැමිණියෙමි. පස්වන විනීතරථය හලෙමි. සවන විනීතරථයට නැංගෙමි. සවන විනීතරථයෙන් සත්වන විනීතරථයට පැමිණියෙමි. සවන විනීතරථය හලෙමි. සත්වන විනීත රථයට නැංගෙමි. සත්වන විනීතරථයෙන් ම සාකෙතයෙහි ඇතුළු නුවර දොරටුවට පැමිණියෙමි” කියායි. ඇවැත්නි, මෙසේ ප්‍රකාශ කරන්නාවූ පසේනදි කොසොල් රජතෙමේ මැනැවින් ප්‍රකාශ කරන්නේ ය.

16. ඇවැත්නි, මෙපරිද්දෙන් ම සීලවිසුද්ධිය චිත්තවිසුද්ධිසඞ්ඛ්‍යාත අර්ථය දක්වා ම වෙයි. චිත්තවිසුද්ධිය දිට්ඨිවිසුද්ධිය දක්වා ම වෙයි. දිට්ඨිවිසුද්ධිය කඞ්ඛාවිතරණවිසුද්ධිය දක්වා ම වෙයි. කඞ්ඛාවිතරණවිසුද්ධිය මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධිය දක්වා ම වෙයි. මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධිය පටිපදාඤාණදස්සනවිසුද්ධිය දක්වා ම වෙයි. පටිපදාඤාණදස්සනවිසුද්ධිය ඤාණදස්සනවිසුද්ධිය දක්වා ම වෙයි. ඤාණදස්සනවිසුද්ධිය අනුපාදාපරිනිර්වාණය දක්වා ම වෙයි. ඇවැත්නි, අනුපාදාපරිනිර්වාණ (ප්‍රත්‍යයෙන් නූපන් අසඞ්ඛත ධාතු) සංඛ්‍යාත අර්ථය පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වෙසෙති.

17. එවං වුත්තෙ ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං පුණ්ණං මන්තාණිපුත්තං එතදවොච: “කො නාමො ආයස්මා? කථඤ්ච පන ආයස්මන්තං[1] සබ්‍රහ්මචාරී ජානන්තී”ති? ‘පුණ්ණො’ති ඛො මෙ ආවුසො නාමං. ‘මන්තාණිපුත්තො’ති ච පන මං සබ්‍රහ්මචාරී ජානන්තීති.

18. “අච්ඡරියං ආවුසො, අබ්භුතං ආවුසො. යථා තං සුතවතා සාවකෙන සම්මදෙව සත්ථුසාසනං ආජානන්තෙන, එවමෙවං[2] ආයස්මතා පුණ්ණෙන මන්තාණිපුත්තෙන ගම්භීරා ගම්භීරා පඤ්හා[3] අනුමාස්ස[4] අනුමාස්ස බ්‍යාකතා. ලාභා සබ්‍රහ්මචාරීනං, සුලද්ධ ලාභා[5] සබ්‍රහ්මචාරීනං, යෙ ආයස්මන්තං පුණ්ණං මන්තාණිපුත්තං ලභන්ති දස්සනාය. ලභන්ති පයිරුපාසනාය. චෙලණ්ඩුකෙන චෙපි[6] සබ්‍රහ්මචාරී ආයස්මන්තං පුණ්ණං මන්තාණිපුත්තං මුද්ධනා පරිහරන්තා ලභෙය්‍යුං දස්සනාය, ලභෙය්‍යුං පයිරුපාසනාය, තෙසම්පි ලාභා. තෙසම්පි සුලද්ධං. අම්හාකම්පි ලාභා, අම්හාකම්පි සුලද්ධං, යෙ මයං ආයස්මන්තං පුණ්ණං මන්තාණිපුත්තං ලභාම දස්සනාය, ලභාම පයිරුපාසනායා”ති.

19. එවං වුත්තෙ ආයස්මා පුණ්ණො මන්තාණිපුත්තො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: කො නාමො ආයස්මා? කථඤ්ච පන ආයස්මන්තං සබ්‍රහ්මචාරී ජානන්තීති? ‘උපතිස්සො’ති ඛො මෙ ආවුසො නාමං. ‘සාරිපුත්තො’ති ච පන මං සබ්‍රහ්මචාරී ජානන්තීති.

20. “සත්ථුකප්පෙන වත කිර භො සාවකෙන සද්ධිං මන්තයමානා න ජානිම්හ ‘ආයස්මා සාරිපුත්තො’ති. සචෙ හි මයං ජානෙය්‍යාම ‘ආයස්මා සාරිපුත්තො’සි එත්තකම්පි නො නප්පටිභාසෙය්‍ය. අච්ඡරියං ආවුසො, අබ්භුතං ආවුසො, යථා තං සුතවතා සාවකෙන සම්මදෙව සත්ථුසාසනං ආජානන්තෙන, එවමෙවං ආයස්මතා සාරිපුත්තෙන ගම්භීරා ගම්භීරා පඤ්හා අනුමාස්ස අනුමාස්ස පුච්ඡිතා. ලාභා සබ්‍රහ්මචාරීනං, සුලද්ධලාභා සබ්‍රහ්මචාරීනං, යෙ ආයස්මන්තං සාරිපුත්තං ලභන්ති දස්සනාය. ලභන්ති පයිරුපාසනාය. චෙලණ්ඩුකෙන චෙපි[6] සබ්‍රහ්මචාරී ආයස්මන්තං සාරිපුත්තං මුද්ධනා පරිහරන්තා ලභෙය්‍යුං දස්සනාය, ලභෙය්‍යුං පයිරුපාසනාය, තෙසම්පි ලාභා, තෙසම්පි සුලද්ධං. අම්හාකම්පි ලාභා, අම්හාකම්පි සුලද්ධං, යෙ මයං ආයස්මන්තං සාරිපුත්තං ලභාම දස්සනාය, ලභාම පයිරුපාසනායා”ති.

ඉතිහ තෙ උභො මහානාගා අඤ්ඤමඤ්ඤස්ස සුභාසිතං සමනුමොදිංසූති.

රථවිනීතසුත්තං චතුත්ථං.

1. පනායස්මන්තා, මජසං. සං. PTS 2. එවමෙව, මජසං..
3. ගම්භීර ගම්භීරපඤ්හා, මජසං සී. කාළව්. 4 අනුමස්ස, මජසං.
5. සුලද්ධං සබ්‍රහ්මචාරීනං, සං. 6. චෙලණ්ඩුකෙන, සං.

Free Distribution www.aathaapi.org

17. මෙසේ කී කල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් මන්තානිපුත්‍ර පූර්ණතෙරණුවන්ට මෙය කීහ: "ආයුෂ්මත් තෙමේ කිනම් ඇත්තේ ද? සබ්‍රම්සරහු ආයුෂ්මතුන් කෙසේ දනිත් ද?" කියා යි. ඇවැත්නි, මගේ නම 'පූර්ණ ය.' සබ්‍රහ්මචාරීහු මා 'මන්තානිපුත්‍රය'යි ද දනිති.

18. "ඇවැත්නි, ආශ්චර්ය යි, ඇවැත්නි, අද්භූත යි. මනා කොට ශාස්තෘ ශාසනය දන්නා වූ ශ්‍රාවකයකු විසින් යම්සේ නම්, එපරිද්දෙන් මන්තානි පුත්‍ර පූර්ණ ආයුෂ්මතුන් විසින් ඉතා ගැඹුරු ප්‍රශ්නයෝ දශකථාවස්තූන්ට පිවිසෙමින් ප්‍රකාශ කරණ ලද්දාහ, යම් කෙනෙක් ආයුෂ්මත් මන්තානි පුත්‍රපූර්ණයන් දක්මට ලබත් ද, සේවනයට ලබත් ද, ඒ සබ්‍රම්සරුන්ට ලාභය. ඒ සබ්‍රම්සරුන්ට මනා සේ ලැබුණු ලාභය. සබ්‍රම්සරහු දුහුල් හුඹුළුවකින් ද ආයුෂ්මත් මන්තානි පුත්‍ර පූර්ණයන් මුදුනෙන් පරිහරණය කරමින් දක්මට ලබන්නාහු නම්, සෙවනයට ලබන්නාහු නම්, ඔවුන්ටත් ලාභ ය. ඔවුන්ටත් මනා ලැබුමකි. යම්බඳු අපි ආයුෂ්මත් මන්තානිපුත්‍ර පූර්ණයන් දක්නට ලබමු ද, සෙවනයට ලබමු ද, ඒ අපට ද ලාභය. අපට ද මනා ලැබුමකි."

19. මෙසේ කී කල්හි ආයුෂ්මත් මන්තානි පුත්‍ර පූර්ණ තෙරණුවෝ ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන්ට මෙය කීහ: "ආයුෂ්මත් තෙමේ කිනම් ඇත්තේ ද? සබ්‍රම්සරහු ආයුෂ්මතුන් කෙසේ දනිත් ද?" යනුයි. ඇවැත්නි, මගේ නම 'උපතිස්ස' ය. සබ්‍රම්සරහු මා 'ශාරිපුත්‍ර' ය යි දනිත්.

20. "බෙහෙවින් බුදුරදුන් වැනි වූ ශ්‍රාවකයකු සමග සාකච්ඡා කරන්නාවූ අපි 'මේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ' යයි නො දතුම්හ. ඉදින් අපි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ය යි දන්නෙමු නම්, මේ පමණකුත් (මේ උපමාවත්) අපට නො වැටහෙන්නේ ය. ඇවැත්නි, ආශ්චර්යය, ඇවැත්නි, අද්භූතය. මැනවින් ශාස්තෘශාසනය දන්නා වූ ශ්‍රාවකයකු යම් සේ ද, එපරිද්දෙන් ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ විසින් දශකථාවස්තූන්ට වදිමින් ඉතා ගැඹුරු ප්‍රශ්නයෝ විචාරණ ලදහ. යම් කෙනෙක් ආයුෂ්මත් ශාරිපුත්‍රයන් දර්ශනයට ලබත් නම්, සෙවනයට ලබත් නම්, ඒ සබ්‍රම්සරුන්ට ලාභ ය. ඒ සබ්‍රම්සරුන්ට මනා සේ ලැබුණු ලාභ ය. සබ්‍රම්සරහු දුහුල්හුඹුළුවකින් ද ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන් මුදුනෙන් පරිහරණය කරන්නාහු, දක්මට ලබන්නාහු නම්, සෙවනයට ලබන්නාහු නම්, ඔවුන්ටත් ලාභ ය. ඔවුන්ටත් මනා ලැබුමකි. යම්බඳු අපි ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන් දක්මට ලබමු ද, සේවනයට ලබමු ද, ඒ අපට ද ලාභ ය. අපටත් මනා ලැබුමකි."

මෙසේ ඒ මහා(නාග)ශ්‍රේෂ්ඨයෝ දෙදෙන ඔවුනොවුන්ගේ යහපත් වචන සතුටින් අනුමෝදන් වූහ.

රථවිනීත සූත්‍රය සතරවැනි යි.

1. 3. 5.

නිවාපසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර බො භගවා භික්ඛූ ආමන්තෙසි 'භික්ඛවො'ති. 'භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. න භික්ඛවෙ නෙවාපිකො නිවාපං නිවපති මිගජාතානං "ඉමං මෙ නිවාපං නිවුත්තං මිගජාතා පරිභුඤ්ජන්තා දීඝායුකා වණ්ණවන්තො චිරං දීඝමද්ධානං යාපෙන්තූ"ති. එවඤ්ච බො භික්ඛවෙ නෙවාපිකො නිවාපං නිවපති මිගජාතානං "ඉමං මෙ නිවාපං නිවුත්තං මිගජාතා අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජිස්සන්ති. අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජමානා මදං ආපජ්ජිස්සන්ති. මත්තා සමානා පමාදං ආපජ්ජිස්සන්ති. පමත්තා සමානා යථාකාමකරණීයා භවිස්සන්ති ඉමස්මිං නිවාපෙ"ති.

3. තත්‍ර භික්ඛවෙ පඨමා මිගජාතා අමුං නිවාපං නිවුත්තං නෙවාපිකස්ස අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු. තෙ තත්ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජමානා මදං ආපජ්ජිංසු. මත්තා සමානා පමාදං ආපජ්ජිංසු. පමත්තා සමානා යථාකාමකරණීයා අහෙසුං නෙවාපිකස්ස අමුස්මිං නිවාපෙ. එවං හි තෙ භික්ඛවෙ පඨමා මිගජාතා න පරිමුච්චිංසු නෙවාපිකස්ස ඉද්ධානුභාවා.

4. තත්‍ර භික්ඛවෙ දුතියා මිගජාතා එවං සමචින්තෙසුං: "යෙ බො තෙ පඨමා මිගජාතා අමුං නිවාපං නිවුත්තං නෙවාපිකස්ස අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු. තෙ තත්ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජමානා මදං ආපජ්ජිංසු. මත්තා සමානා පමාදං ආපජ්ජිංසු. පමත්තා සමානා යථාකාමකරණීයා අහෙසුං නෙවාපිකස්ස අමුස්මිං නිවාපෙ. එවං හි තෙ පඨමා මිගජාතා න පරිමුච්චිංසු නෙවාපිකස්ස ඉද්ධානුභාවා. යන්නූන මයං සබ්බසො නිවාපභොජනා පටිවිරමෙය්‍යාම, භයභොගා පටිවිරතා අරඤ්ඤායතනානි අජ්ඣොගහෙත්වා[1] විහරෙය්‍යාමා"ති. තෙ සබ්බසො නිවාපභොජනා පටිවිරමිංසු. භයභොගා පටිවිරතා අරඤ්ඤායතනානි අජ්ඣොගහෙත්වා[1] විහරිංසු. තෙසං ගිම්හානං පච්ඡිමෙ මාසෙ තිණොදකසඞ්ඛයෙ අධිමත්තකසිමානං පත්තො කායො හොති. තෙසං අධිමත්තකසිමානං පත්තකායානං බලවීරියං පරිහායි. බලවීරියෙ පරිහීනෙ තමෙව නිවාපං නිවුත්තං නෙවාපිකස්ස පච්චාගමිංසු. තෙ තත්ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු. තෙ තත්ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජමානා මදං ආපජ්ජිංසු. මත්තා සමානා පමාදං ආපජ්ජිංසු. පමත්තා සමානා යථාකාමකරණීයා අහෙසුං නෙවාපිකස්ස අමුස්මිං නිවාපෙ. එවං හි තෙ භුක්ඛවෙ දුතියාපි මිගජාතා න පරිමුච්චිංසු නෙවාපිකස්ස ඉද්ධානුභාවා.

---

1. අජ්ඣොගාහෙත්වා, මජසං. අජ්ඣොගාහිත්වා, PTS.

Free Distribution www.aathaapi.org

1. 3. 5.

නිවාප සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වසනසේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු 'වහන්සැ' යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

2. මහණෙනි, නිමවැද්දෙක් (තෘණාදි ගොදුරු කරණ වැද්දෙක්) "මා විසින් වපුල මේ ගොදුරු අනුභව කරන්නා වූ මුවසමූහයෝ දිගා ඇත්තෝ පැහැපත් වූවෝ බොහෝ කලක් යැපෙත්වා"යි (සිතා) මුවසමූහයකට තණ (ඇට) නො වපුර යි. මහණෙනි, නෛවාපික තෙමේ මුවන් සඳහා "මා විසින් වපුල මේ කෙතට මුවසමූහයෝ වැද ගෙන මුසපත් ව බොජුන් අනුභව කෙරෙත්. වැද ගෙන මුසපත් ව බොජුන් අනුභව කරන්නෝ මදයට පැමිණෙන්නාහු ය. මත් වූවෝ ප්‍රමාදයට පැමිණෙන්නාහු ය. ප්‍රමත්ත වූවෝ මේ නිවාපයෙහි කැමැති සේ කට යුත්තෝ වන්නාහු ය"යි මෙසේ (සිතා) ම තණ වපුරයි.

3. මහණෙනි, ඒ මුවසමූහයන් අතර පළමුවන මුවසමූහයෝ නෛවාපිකයා විසින් වපුල මේ තණකෙතට වැද මුසපත් වූවෝ තණ කෑවෝ ය. ඔහු එහි වැද මුසපත් ව තණ කන්නාහු මදයට පැමිණියාහු ය. මත් වූවෝ සිහි නැති වීමට පත් වූහ. සිහි නැති වූවාහු නෛවාපිකයාගේ මේ තණකොටුවෙහි කැමැති සේ කට යුත්තෝ වූහ. මහණෙනි, මෙසේ ඒ පළමුවන මුවසමූහයෝ නෛවාපිකයාගේ සෘද්ධිඅනුභාවයෙන් (වසඟයෙන්) නො මිදුණාහු ය.

4. මහණෙනි, එහි දී දෙවන මුවසමූහයෝ මෙසේ සිතූහ: "යම් ඒ පළමුවන මුවසමූහයෝ නෛවාපිකයා විසින් වපුල මේ තණකෙතට වැද මුසපත් වූවෝ තණ කෑවාහු ය. ඔහු එහි වැද මුසපත් ව තණ කන්නාහු මත් වූවාහු ය. මත් වූවාහු සිහි නැති වූවාහු නෛවාපිකයාගේ මේ තණකොටුවෙහි දී කැමති සේ කට යුත්තෝ වූහ. මෙසේ ඒ පළමුවන මුව සමූහයෝ නෛවාපිකයාට වසඟ වීමෙන් නො මිදුණාහු ය. අපි සර්වප්‍රකාරයෙන් නිවාපභෝජනයෙන් වැළකෙන්නමු නම්, භය සහිත තණ කෑමෙන් වැළකුණමෝ කැලයට වැද වාසය කරන්නෙමු නම්, යෙහෙකැ" යි සිතූහ. ඔහු සර්වප්‍රකාරයෙන් ම නිවාපභෝජනයෙන් වැළකුණාහ. භය සහිත වූ පරිභෝගයෙන් වැළකුණෝ වනලැහැබට වැද වාසය කළහ. ග්‍රීෂ්මයාතයේ පශ්චිමමාසයෙහි තණ හා ජලය වියළී ගිය කල්හි ඔවුන්ගේ ශරීරය ඉතා කෘශබවට පැමිණියේ ය. ඉතා කෘශබවට පැමිණි ඔවුන්ගේ ශක්තිය පිරිහුණේ ය. ශක්තිය පිරිහුණු කල්හි නෛවාපිකයාගේ වපුල ඒ තණ කොටුවට ම පෙරළා ආහ. ඔහු එහි වැද මුසපත් ව තණ කෑහ. ඔහු එහි වැද මුසපත් ව තණ කන්නාහු මත් වූහ. මත් වූවාහු සිහි මුළාවට පැමිණියාහු ය. සිහි මුළා වූවාහු නෛවාපිකයාගේ මේ තණ කොටුවේ දී කැමැති සේ කටයුතු බවට පැමිණියාහු ය. මහණෙනි, මෙසේ ඒ දෙවැනි මුවරැළ ද නිවාපිකයාගේ වසඟයෙන් නො මිදුණාහ.

5. තත්‍ර භික්ඛවෙ තතියා මිගජාතා එවං සමචින්තෙසුං: "යෙ ඛො තෙ පඨමා මිගජාතා අමුං නිවාපං නිවුත්තං නෙවාපිකස්ස අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු. තෙ තත්ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජමානා මදං ආපජ්ජිංසු. මත්තා සමානා පමාදං ආපජ්ජිංසු. පමත්තා සමානා යථාකාමකරණීයා අහෙසුං නෙවාපිකස්ස අමුස්මිං නිවාපෙ. එවං හි තෙ පඨමා මිගජාතා න පරිමුච්චිංසු නෙවාපිකස්ස ඉද්ධානුභාවා. -

"යෙපි තෙ දුතියා මිගජාතා එවං සමචින්තෙසුං: 'යෙ ඛො තෙ පඨමා මිගජාතා අමුං නිවාපං නිවුත්තං නෙවාපිකස්ස අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු. තෙ තත්ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජමානා මදං ආපජ්ජිංසු. මත්තා සමානා පමාදං ආපජ්ජිංසු. පමත්තා සමානා යථාකාමකරණීයා අහෙසුං නෙවාපිකස්ස ඉමුස්මිං නිවාපෙ. එවං තෙ පඨමා මිගජාතා න පරිමුච්චිංසු නෙවාපිකස්ස ඉද්ධානුභාවා. යන්නූන මයං සබ්බසො නිවාපභොජනා පටිවිරමෙය්‍යාම, භයභොගා පටිවිරතා අරඤ්ඤායතනානි අජ්ඣොගාහෙත්වා විහරෙය්‍යාමා'ති. තෙ සබ්බසො නිවාපභොජනා පටිවිරමිංසු. භයභොගා පටිවිරතා අරඤ්ඤායතනානි අජ්ඣොගාහෙත්වා විහරිංසු. තෙසං ගිම්හානං පච්ඡිමෙ මාසෙ තිණොදක-සඞ්ඛයෙ අධිමත්තකසිමානං පත්තො කායො හොති. තෙසං අධිමත්තකසිමානං පත්තකායානං බලවිරියං පරිහායි. බලවිරියෙ පරිහීනෙ තමෙව නිවාපං නිවුත්තං නෙවාපිකස්ස පච්චාගමිංසු. තෙ තත්ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු. තෙ තත්ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජමානා මදං ආපජ්ජිංසු. මත්තා සමානා පමාදං ආපජ්ජිංසු. පමත්තා සමානා යථාකාමකරණීයා අහෙසුං නෙවාපිකස්ස අමුස්මිං නිවාපෙ. එවං හි තෙ දුතියාපි මිගජාතා න පරිමුච්චිංසු නෙවාපිකස්ස ඉද්ධානුභාවා. -

"යන්නූන මයං අමුං නිවාපං නිවුත්තං නෙවාපිකස්ස උපනිස්සාය ආසයං කප්පෙය්‍යාම, තත්‍රාසයං කප්පෙත්වා අමුං නිවාපං නිවුත්තං නෙවාපිකස්ස අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජිස්සාම, අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි. භුඤ්ජමානා න මදං ආපජ්ජිස්සාම, අමත්තා සමානා නප්පමාදං ආපජ්ජිස්සාම, අප්පමත්තා සමානා න යථාකාමකරණීයා භවිස්සාම නෙවාපිකස්ස අමුස්මිං නිවාපෙ"ති. තෙ අමුං නිවාපං නිවුත්තං නෙවාපිකස්ස උපනිස්සාය ආසයං කප්පයිංසු. තත්‍රාසයං කප්පෙත්වා අමුං නිවාපං නිවුත්තං නෙවාපිකස්ස අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු. තෙ තත්ථ අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජමානා න මදං ආපජ්ජිංසු. අමත්තා සමානා නප්පමාදං ආපජ්ජිංසු. අප්පමත්තා සමානා න යථාකාම-කරණීයා අහෙසුං නෙවාපිකස්ස අමුස්මිං නිවාපෙ.

6. තත්‍ර භික්ඛවෙ නෙවාපිකස්ස ච නෙවාපිකපරිසාය ච එතදහොසි: 'සඨස්සු නාමිමෙ තතියා මිගජාතා කෙටුභිනො, ඉද්ධිමන්තාස්සු[1] නාමිමෙ තතියා මිගජාතා පරජනා. ඉමඤ්ච නාම නිවාපං නිවුත්තං පරිභුඤ්ජන්ති. න ච නෙසං ජානාම ආගතිං වා ගතිං වා. -

1. ඉද්ධිමන්තාසු, මජසං. ස්‍යා.

5. මහණෙනි, එහි තුන්වන මුවසමූහයෝ මෙසේ සිතූහ: "යම් ඒ පළමුවන මුවසමූහයෝ නෙවාපිකයා වපුළ ඒ තණකොටුවට වැද මුසපත් වූවාහු ගොදුරු කෑවෝ ද, ඔහු එහි වැද මුසපත් ව තණ කන්නාහු මත් වූහ. මත් වූවාහු සිහි මුළාවට පැමිණියාහු ය. සිහි මුළා වූවාහු මේ තණකොටුවේ දී නෙවාපිකයා විසින් කැමැති සේ කට යුත්තෝ වූහ. මෙසේ ඒ පළමුවන මුව සමූහයෝ නෙවාපිකයාගේ සෘද්ධ්‍යනුභාවයෙන් නො මිදුණාහු ය. -

"යම් ඒ දෙවන මුවසමූහ කෙනෙක් මෙසේ සිතූහු ද- 'යම් ඒ පළමුවන මුවසමූහ කෙනෙක් නෙවාපිකයාගේ මේ තණකොටුවට වැද මුසපත් ව තණ කෑවාහු ද, ඔහු එහි වැද මුසපත් ව තණ කන්නාහු මත් වූවාහු ය. මත් වූවාහු සිහි නැති වූවාහුය. සිහි නැති වූවාහු නෙවාපිකයාගේ මේ තණකොටුවෙහි කැමැති සේ කට යුත්තෝ වූහ. මෙසේ ඒ පළමුවන මුවසමූහයෝ නෙවාපිකයාගේ සෘද්ධ්‍යනුභාවයෙන් නො මිදුණාහු ය. අපි තෘණභෝජනයෙන් සර්වප්‍රකාරයෙන් වැළකෙන්නමු නම්, භය සහිත තණ කෑමෙන් වැළකුණමෝ කැලයට වැද වාසය කරන්නෙමු නම්, යෙහෙකැ' යි. ඔහු සම්පූර්ණයෙන් තෘණභෝජනයෙන් වෙන් වූහ. භයජනක කෑමෙන් වැළකුණාහු වනයට වැද වාසය කළහ. ගිම්හානයේ අන්තිම මාසයේ තණ හා දිය වියළී ගිය කල්හි ඔවුන්ගේ ශරීරය ඉතා කෘශබවට පැමිණියේ ය. කෘශබවට පැමිණි ඔවුන්ගේ ශක්තිය පිරිහුණේ ය. ශක්තිය පිරිහුණු කල්හි ඒ නෙවාපිකයාගේ ඒ තණකොටුවට ම පෙරළා ආහ. ඔහු එහි වැද මුසපත් ව තණ කෑහ. ඔහු එහි වැද මුසපත් ව තණ කන්නාහු මත් වූහ. මත් වූවාහු සිහි මුළාබවට පැමිණියාහු ය. සිහි මුළා වූවාහු මේ තණකොටුවෙහි දී නෙවාපිකයා විසින් කැමැති සේ කට යුත්තෝ වූහ. මෙසේ ඒ දෙවන මුවසමූහයෝ ද නෙවාපිකයාගේ සෘද්ධ්‍යනුභාවයෙන් නොමිදුණාහ.

"එහෙයින් අපි නෙවාපිකයාගේ වපුළ මේ තණකොටුව ඇසුරු කොට ලගින තැනක් පිළියෙල කර ගනිමු නම් යෙහෙකැයි එහි ලගින තැනක් කොට නෙවාපිකයා විසින් වපුළ මේ තණකොටුවට නො වැද මුසපත් නො වී තණ කමු. වැද මුසපත් නො වී තණ කමින් මදයට නො පැමිණෙන්නෙමු. මත් නො වූවමෝ සිහිමුළාබවට නො පැමිණෙන්නමු, සිහි මුළාබවට නො පැමිණියමෝ නෙවාපිකයාගේ මේ තණකොටුවේ දී කැමැති සේ කට යුත්තමෝ නො වන්නෙමුයි". ඔහු නෙවාපිකයා විසින් වපුළ මේ තණකොටුව ඇසුරු කොට එහි ලගින තැනක් කොට විසූහ නෙවාපිකයාගේ මේ තණකොටුව ඇසුරු කොට ලගින තැනක් කොට වැස ඊට නො වැද නො මුසපත්ව තණ කෑහ. ඔහු එහි නො වැද මුසපත් නොවී තණ කන්නාහු මත් නො වූහ. මත් නො වූවාහු සිහිමුළාබවට නො පැමිණියහ. සිහිමුළා නො වූවාහු මේ තණ කොටුවෙහි නෙවාපිකයා විසින් කැමැති සේ කට යුත්තෝ නො වූහ.

6. මහණෙනි, එහි දී නෙවාපිකයාටත් නෙවාපිකයාගේ පිරිසටත් මෙවැනි අදහසෙක් විය: මේ තුන්වන මුවසමූහයෝ නම් කපටියෝ ය. පුහුණු වූ කෛරාටික කම් ඇත්තෝ ය. සෘද්ධි ඇත්තා වූ මේ තුන්වැනි මුවසමූහයෝ යක්කු ය. මොහු වපුළ තණ ද කත් ඔවුන්ගේ ඊමත් යාමත් නො ද දනිමු. -

යන්නූන මයං ඉමං නිවාපං නිවුත්තං මහතීහි දණ්ඩවාකරාහි[1] සමන්තා සප්පදෙසං අනුපරිවාරෙය්‍යාම, අප්පෙවනාම තතියානං මිගජාතානං ආසයං පස්සෙය්‍යාම යත්‍ථ තෙ ගාහං[2] ගච්ඡෙය්‍යුන්ති. තෙ අමුං නිවාපං නිවුත්තං මහතීහි දණ්ඩවාකරාහි සමන්තා සප්පදෙසං අනුපරිවාරෙසුං. අද්දසාසුං ඛො භික්ඛවෙ නෙවාපිකො ච නෙවාපිකපරිසා ච තතියානං මිගජාතානං ආසයං යත්‍ථ තෙ ගාහං අගමිංසු. එවං හි තෙ භික්ඛවෙ තතියාපි මිගජාතා න පරිමුච්චිංසු නෙවාපිකස්ස ඉද්ධානුභාවා.

7. තත්‍ර භික්ඛවෙ චතුත්‍ථා මිගජාතා එවං සමචින්තෙසුං: "යෙ ඛො තෙ පඨමා මිගජාතා අමුං නිවාපං නිවුත්තං නෙවාපිකස්ස අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු. තෙ තත්‍ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජමානා මදං ආපජ්ජිංසු මත්තා සමානා පමාදං ආපජ්ජිංසු. පමත්තා සමානා යථාකාමකරණීයා අහෙසුං නෙවාපිකස්ස අමුස්මිං නිවාපෙ. එවං හි තෙ පඨමා මිගජාතා න පරිමුච්චිංසු නෙවාපිකස්ස ඉද්ධානුභාවා. –

"යෙපි තෙ දුතියා මිගජාතා එවං සමචින්තෙසුං: 'යෙ ඛො තෙ පඨමා මිගජාතා අමුං නිවාපං නිවුත්තං නෙවාපිකස්ස අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු. තෙ තත්‍ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජමානා මදං ආපජ්ජිංසු. මත්තා සමානා පමාදං ආපජ්ජිංසු. පමත්තාසමානා යථාකාමකරණීයා අහෙසුං නෙවාපිකස්ස අමුස්මිං නිවාපෙ. එවං හි තෙ පඨමා මිගජාතා න පරිමුච්චිංසු නෙවාපිකස්ස ඉද්ධානුභාවා යෙ පි තෙ දුතියා –පෙ– යන්නූන මයං සබ්බසො නිවාපභොජනා පටිවිරමෙය්‍යාම භයභොගා පටිවිරතා අරඤ්ඤායතනානි අජ්ඣොගාහෙත්වා විහරෙය්‍යාමා'ති තෙ සබ්බසො නිවාපභොජනා පටිවිරමිංසු. භයභොගා පටිවිරතා අරඤ්ඤායතනානි අජ්ඣොගාහෙත්වා විහරිංසු. තෙසං ගිම්හානං පච්ඡිමෙ මාසෙ තිණොදකසඞ්ඛයෙ අධිමත්තකසිමානං පත්තො කායො හොති. තෙසං අධිමත්තකසිමානං පත්තකායානං බලවිරියං පරිහායි. බලවිරියෙ පරිහීනෙ තමෙව නිවාපං නිවුත්තං නෙවාපිකස්ස පච්චාගමිංසු. තෙ තත්‍ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු. තෙ තත්‍ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජමානා මදං ආපජ්ජිංසු. මත්තා සමානා පමාදං ආපජ්ජිංසු. පමත්තා සමානා යථාකාමකරණීයා අහෙසුං නෙවාපිකස්ස අමුස්මිං නිවාපෙ. එවං හි තෙ දුතියාපි මිගජාතා න පරිමුච්චිංසු නෙවාපිකස්ස ඉද්ධානුභාවා. –

1. දණ්ඩවාගුරාහි, සයා. 2. ගාහා, සයා.

අපි වපුල මේ තණකොටුව මහත් වූ දඬු වරදැලින් මහත් ප්‍රදේශයක් සහිත කොට වට කරන්නෙමු නම්, මැනව, යම් තැනෙක ඔහු ග්‍රාහයට (අල්ලා ගැනීමට) පැමිණෙන්නාහු ද, තුන්වන මෘගසමූහයන්ගේ ඒ ආශ්‍රයස්ථානය යම් තැනෙක දක්නෙමු නම් යෙහෙකැයි කියා යි. ඔහු වපුල ඒ තණකොටුව මහත් දඬු වරදැලින් හාත්පස මහත් ප්‍රදේශයක් සහිත කොට වට කළාහු ය. මහණෙනි, මුවවැද්දාත් ඔහුගේ පිරිසත් ඒ තුන්වන මුවරැළ යම් තැනක ග්‍රාහයට පැමිණියාහු ද, ඒ තුන්වන මුවසමූහයාගේ ආශ්‍රයස්ථානය දුටුවාහු ය. මහණෙනි, මෙසේ ඒ තුන්වන මුවසමූහයෝ මුවවැද්දාගේ ඍද්ධ්‍යනුභාවයෙන් නො මිදුණාහු ය.

7. මහණෙනි, එහි දී සතරවන මුවසමූහයෝ මෙසේ කල්පනා කළාහුය: "යම් ඒ පළමුවන මුවසමූහයෝ මුවවැද්දා විසින් වපුල මේ තණකොටුවට වැද මුසපත් වූවාහු තණ කෑවාහු ද, ඔහු එහි වැද මුසපත් ව තණ කන්නාහු මත් වූහ. මත් වූවාහු සිහිමුළාවට පැමිණියාහු ය. සිහිමුළා වූවාහු ඒ තණකොටුවෙහි දී නෙවාපිකයා විසින් කැමැති සේ කට යුත්තෝ වූහ. මෙසේ ඒ පළමුවන මුවසමූහයෝ මුවවැද්දාගේ ඍද්ධ්‍යනුභාවයෙන් නො මිදුණාහු ය. -

"යම් ඒ දෙවන මුවසමූහයෝ මෙසේ සිතුවාහු ද 'යම් ඒ පළමුවන මුවසමූහයෝ නෙවාපිකයා විසින් වපුල මේ තණකොටුවට වැද මුසපත් ව තණ කෑවාහු නම් ඔහු එහි වැද මුසපත් ව තණ කෑවාහු මත් වූවාහු ය. මත් වූවාහු සිහි නැති වූහ. සිහි නැති වූවාහු මේ තණ කොටුවෙහි වැද්දා විසින් කැමැති සේ කටයුත්තෝ වූහ. මෙසේ ඒ පළමුවන මුව සමූහයෝ මුවවැද්දාගේ ඍද්ධ්‍යනුභාවයෙන් නො මිදුණාහු ය. යම් ඒ දෙවන මුව-සමූහයෝ... 'අපි මේ තණ කෑමෙන් සම්පූර්ණයෙන් වළකින්නෙමු නම්, භයජනක තෘණපරිභෝගයෙන් වැළකුණමෝ වනයට වැදී වාසය කරමු නම්, යෙහෙකැ'යි සිතූහ. ඔහු නිවාපභෝජනයෙන් සම්පූර්ණයෙන් වැළකුණාහු ය. භය ජනක තෘණපරිභෝගයෙන් වැළකුණාහු වනයට වැදී විසූහ. ගිමන් සාරමස පිළිබඳ පැසුළුමස්හි තණ හා දිය වියළී ගිය කල්හි ඔවුන්ගේ ශරීරය ඉතා කෘශබවට පැමිණියේ ය. කෘශබවට පැමිණි ඔවුන්ගේ ශක්තිය පිරිහුණේ ය. ශක්තිය පිරිහුණු කල්හි ඒ මුවවැද්දාගේ තණකොටුවට ම පෙරළා ආහ. ඔහු එහි වැද මුසපත් ව තණ කෑහ. ඔහු එහි වැද මුසපත් ව තණ කන්නාහු මත් වූහ. මත් වූවාහු සිහි-මුළාබවට පැමිණියාහු ය. සිහිමුළා වූවාහු මේ තණකොටුවේ දී නෙවාපිකයා විසින් කැමැති සේ කට යුත්තෝ වූහ. මෙසේ ඒ දෙවන මුවසමූහයෝ ද නෙවාපිකයාගේ ඍද්ධ්‍යනුභාවයෙන් නො මිදුණාහ. -

"යෙපි තෙ තතියා මිගජාතා එවං සමචින්තෙසුං: 'යෙ ඛො තෙ පඨමා මිගජාතා අමුං නිවාපං නිවුත්තං නෙවාපිකස්ස අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු, තෙ තත්ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජමානා මදං ආපජ්ජිංසු. මත්තා සමානා පමාදං ආපජ්ජිංසු. පමත්තා සමානා යථාකාමකරණීයා අහෙසුං. නෙවාපිකස්ස අමුස්මිං නිවාපෙ. එවං හි තෙ පඨමා මිගජාතා න පරිමුච්චිංසු නෙවාපිකස්ස ඉද්ධානුභාවා. යෙපි තෙ දුතියා මිගජාතා එවං සමචින්තෙසුං: යෙ ඛො තෙ පඨමා මිගජාතා අමුං නිවාපං නිවුත්තං නෙවාපිකස්ස අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු, තෙ තත්ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජමානා මදං ආපජ්ජිංසු. මත්තා සමානා පමාදං ආපජ්ජිංසු. පමත්තා සමානා යථාකාමකරණීයා අහෙසුං නෙවාපිකස්ස අමුස්මිං නිවාපෙ. එවං හි තෙ පඨමා මිගජාතා න පරිමුච්චිංසු නෙවාපිකස්ස ඉද්ධානුභාවා. යන්නූන මයං සබ්බසො නිවාපභොජනා පටිවිරමෙය්‍යාම, භයභොගා පටිවිරතා අරඤ්ඤායතනානි අජ්ඣොගාහෙත්වා විහරෙය්‍යාමාති. තෙ සබ්බසො නිවාපභොජනා පටිවිරමිංසු. භයභොගා පටිවිරතා අරඤ්ඤායතනානි අජ්ඣොගාහෙත්වා විහරිංසු. තෙසං ගිම්හානං පච්ඡිමෙ මාසෙ තිණොදකසඞ්ඛයෙ අධිමත්තකසිමානං පත්තො කායො හොති. තෙසං අධිමත්තකසිමානං පත්තකායානං බලවීරියං පරිහායි. බලවීරියෙ පරිහීනෙ තමෙව නිවාපං නිවුත්තං නෙවාපිකස්ස පච්චාගමිංසු. තෙ තත්ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු. තෙ තත්ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජමානා මදං ආපජ්ජිංසු. මත්තා සමානා පමාදං ආපජ්ජිංසු පමත්තා සමානා යථාකාමකරණීයා අහෙසුං නෙවාපිකස්ස අමුස්මිං නිවාපෙ. එවං හි තෙ දුතියාපි මිගජාතා න පරිමුච්චිංසු නෙවාපිකස්ස ඉද්ධානුභාවා. 'යන්නූන මයං අමුං නිවාපං නිවුත්තං නෙවාපිකස්ස උපනිස්සාය ආසයං කප්පෙය්‍යාම. තත්‍රාසයං කප්පෙත්වා අමුං නිවාපං නිවුත්තං නෙවාපිකස්ස අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජිස්සාම. අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජමානා න මදං ආපජ්ජිස්සාම. අමත්තා සමානා නප්පමාදං ආපජ්ජිස්සාම අප්පමත්තා සමානා, න යථාකාමකරණීයා භවිස්සාම නෙවාපිකස්ස අමුස්මිං නිවාපෙ'ති. තෙ අමුං නිවාපං නිවුත්තං නෙවාපිකස්ස උපනිස්සාය ආසයං කප්පයිංසු. තත්‍රාසයං කප්පෙත්වා අමුං නිවාපං නිවුත්තං නෙවාපිකස්ස අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජමානා න මදං ආපජ්ජිංසු. අමත්තා සමානා නප්පමාදං ආපජ්ජිංසු. අප්පමත්තා සමානා න යථාකාමකරණීයා අහෙසුං නෙවාපිකස්ස අමුස්මිං නිවාපෙ. තත්‍ර නෙවාපිකස්ස ච නෙවාපිකපරිසාය ච එතදහොසි. 'සඨාස්සු නාමිමෙ තතියා මිගජාතා කෙටුභිනො. ඉද්ධිමන්තස්සු නාමිමෙ තතියා මිගජාතා පරජනා. ඉමඤ්ච නාම නිවාපං නිවුත්තං පරිභුඤ්ජන්ති. න ච නෙසං ජානාම ආගතිං වා ගතිං වා. යන්නූන මයං ඉමං නිවාපං නිවුත්තං මහතීහි දණ්ඩවාකරාහි සමන්තා සප්පදෙසං අනුපරිවාරෙය්‍යාම, අප්පෙව නාම තතියානං මිගජාතානං ආසයං පස්සෙය්‍යාම යත්ථ තෙ ගාහං ගච්ඡෙය්‍යු'න්ති. තෙ අමුං නිවාපං නිවුත්තං මහතීහි දණ්ඩවාකරාහි සමන්තා සප්පදෙසං අනුපරිවාරෙසුං. අද්දසාසුං ඛො නෙවාපිකො ච නෙවාපිකපරිසා ච තතියානං මිගජාතානං ආසයං යත්ථ තෙ ගාහං අගමිංසු. එවං හි තෙ තතියාපි මිගජාතා න පරිමුච්චිංසු නෙවාපිකස්ස ඉද්ධානුභාවා. -

* කෙතබිනො, මජසං.

Free Distribution www.aathaapi.org

"යම් ඒ තෙවන මුවසමූහයෝ වූවාහු ද, ඔහු මෙසේ සිතූහ: යම් ඒ පළමුවන මුවසමූහයෝ නෙවාපිකයා විසින් වපුළ මේ තණකොටුවට වැද මුසපත් වූවාහු තණ කෑවාහු ද, ඔහු එහි වැද මුසපත්ව තණ කත්නාහු මදයට පැමිණියාහු ය. මත් වූවාහු සිහි මුළා වූවාහු මේ තණ-කොටුවේ දී නෙවාපිකයා විසින් කැමැති සේ කට යුත්තෝ වූහ. මෙසේ ඒ පළමුවන මුවසමූහයෝ නෙවාපිකයාගේ වශයට යාමෙන් නො මිදුණාහ. -යම් ඒ දෙවන මුවසමූහයෝ... අපි මේ තණ කෑමෙන් සම්පූර්ණයෙන් වැළකෙන්නෙමු නම්, භයජනක තෘණපරිභොගයෙන් වැලකුණමෝ වනයට වැදී වාසය කරන්නෙමු නම්, යෙහෙකැයි ඔහු තණ කෑමෙන් සම්පූර්ණ-යෙන් වැලකුණාහ. භයජනක තෘණපරිභෝගයෙන් වැලකුණාහු වනයට වැද විසූහ. ගිමන් සාරමස පිළිබඳ පැසුළුමස්හි තණ හා දිය වියළී ගිය කල්හි ඔවුන්ගේ ශරීරය ඉතා කෘශ බවට පැමිණියේ ය. කෘශබවට පැමිණි ඔවුන්ගේ ශක්තිය පිරිහුණේ ය. ශක්තිය පිරිහුණු කල්හි නෙවාපිකයා විසින් වපුල ඒ තණකොටුවට ම පෙරලා ආහ. ඔහු එහි වැද මුසපත් ව තණ කෑහ. ඔහු එහි වැද මුසපත් ව තණ කන්නාහු මදයට පැමිණියාහු ය. මත් වූවාහු සිහිමුළාබවට පැමිණියාහු ය. සිහිමුළාවූවාහු මේ තණ-කොටුවේ දී නෙවාපිකයා විසින් කැමැති සේ කට යුත්තෝ වූහ. මෙසේ ඒ දෙවන මුවසමූහයෝ නෙවාපිකයාගේ සෘද්ධ්‍යනුභාවයෙන් නො මිදුණාහ. - අපි නෙවාපිකයා විසින් වපුල ඒ තණකොටුව ඇසුරු කොට ආශයස්ථානයක් කරන්නෙමු නම්, යෙහෙකැ යි එහි ආශයස්ථානයක් කොට නෙවාපිකයා විසින් වපුල ඒ තණකොටුවට නො වැද මුසපත් නො වූවාහු තණ කන්නෙමු. නො වැද නො මුසපත් ව තණ කන්නමෝ මදයට නො පැමිණෙන්නෙමු. මදයට නො පැමිණියමෝ සිහිමුළාබවට නො පැමිණෙන්නෙමු. එහි මුළාබවට නො පැමිණියමෝ ඒ තණ කොටුවේ දී නෙවාපිකයා විසින් කැමැති සේ කට යුත්තමෝ නො වන්නෙමු" කියා යි. ඔහු නෙවාපිකයා විසින් වපුල ඒ තණකොටුව ඇසුරු කොට ආශයස්ථානයක් කළහ. එහි ආශයස්ථානයක් කොට නෙවාපිකයා විසින් වපුල ඒ තණකොටුවට නො වැද මුසපත් නො වී තණ කන්නාහු මත් නො වූහ මත් නො වූවාහු සිහිමුළාබවට නො පැමිණියහ. සිහි මුළාබවට නො පැමිණියාහු මේ තණකොටුවෙහි දී නෙවාපිකයා විසින් කැමැති සේ කට යුත්තෝ නො වූහ. එහිදී නෙවාපිකයා-වත් ඔහුගේ පිරිසටත් මේ අදහස වී ය: 'මේ තුන්වැනි මුව සමූහයෝ කපටියෝ ය. හික්මුණු කෛරාපිකයෝ ය සෘද්ධිමතුන් වැනි මේ තුන්වැනි මුවසමූහයෝ යක්කු ය. මොහු මේ වපුල තණකොටුව කත්. ඔවුන්ගේ ඊමක් හෝ යැමක් නො දනිමු. අපි වපුල මේ කොටුව මහත් දඹු වරදැලින් හාත්පස මහත් ප්‍රදෙශයක් සහිත කොට වට කරන්නෙමු නම් ඉතා යෙහෙක. ඒ තුන්වන මුවසමූහයෝ යම් තැනක අසු කර ගැනීමට පැමිණෙන්නාහු ද, ඒ තුන්වන මෘගසමූහයන්ගේ ආශයස්ථානය දකින්නෙමු නම් යෙහෙකැ'යි කියා යි. ඔහු වපුල ඒ තණබිම හාත්පස මහත් ප්‍රදෙශයක් සහිත කොට මහත් වූ දඹු වරදැලින් වට කළාහු ය. නෙවාපිකයා ද නෙවාපික පිරිස ද තුන්වන ඒ මුවසමූහයෝ යම් තැනක දී අසු කර ගැනීමට පැමිණියාහු ද, එ තුන්වන මුවසමූහයන්ගේ ආශය ස්ථානය දුටහ මෙසේ ඒ තුන්වන මුවසමූහයෝ නෙවාපිකයාගේ සෘද්ධ්‍යනුභාවයෙන් නො මිදුණාහ -

"යන්නූන මයං යත්ථ අගති නෙවාපිකස්ස ච නෙවාපිකපරිසාය ච, තත්‍රාසයං කප්පෙය්‍යාම, තත්‍රාසයං කප්පෙත්වා අමුං නිවාපං නිවුත්තං නෙවාපිකස්ස අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජිස්සාම, අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජමානා න මදං ආපජ්ජිස්සාම, අමත්තා සමානා නප්පමාදං ආපජ්ජිස්සාම, අප්පමත්තා සමානා න යථාකාමකරණීයා භවිස්සාම නෙවාපිකස්ස අමුං නිවාපෙ"ති. තෙ යත්ථ අගති නෙවාපිකස්ස ච නෙවාපිකපරිසාය ච තත්‍රාසයං කප්පයිංසු. තත්‍රාසයං කප්පෙත්වා අමුං නිවාපං නිවුත්තං නෙවාපිකස්ස අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු. තෙ තත්ථ අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජමානා න මදං ආජ්ජිංසු. අමත්තා සමානා නප්පමාදං ආපජ්ජිංසු. අප්පමත්තා සමානා න යථාකාමකරණීයා අහෙසුං නෙවාපිකස්ස අමුස්මිං නිවාපෙ.

8 තත්‍ර භික්ඛවෙ නෙවාපිකස්ස ච නෙවාපිකපරිසාය ච එතදහොසි: "සඨාස්සු නාමිමෙ චතුත්ථා මිගජාතා කෙටුභිනො. ඉද්ධිමන්තාස්සු නාමිමෙ චතුත්ථා මිගජාතා පරජනා. ඉමඤ්ච නාම නිවාපං නිවුත්තං පරිභුඤ්ජන්ති. න ච නෙසං ජානාම ආගතිං වා ගතිං වා. යන්නූන මයං ඉමං නිවාපං නිවුත්තං මහතීහි දණ්ඩවාකරාහි සමන්තා සප්පදෙසං අනුපරිවාරෙය්‍යාම අප්පෙව නාම චතුත්ථානං මිගජාතානං ආසයං පස්සෙය්‍යාම යත්ථ තෙ ගාහං ගච්ඡෙය්‍යු"න්ති. තෙ අමුං නිවාපං නිවුත්තං මහතීහි දණ්ඩවාකරාහි සමන්තා සප්පදෙසං අනුපරිවාරෙසුං. නෙව ඛො භික්ඛවෙ අද්දසාසුං නෙවාපිකො ච නෙවාපිකපරිසා ච චතුත්ථානං මිගජාතානං ආසයං යත්ථ තෙ ගාහං ගච්ඡෙය්‍යුං.

තත්‍ර භික්ඛවෙ නෙවාපිකස්ස ච නෙවාපිකපරිසාය ච එතදහොසි: "සචෙ ඛො මයං චතුත්ථෙ මිගජාතෙ ඝට්ටෙස්සාම, තෙ ඝට්ටිතා අඤ්ඤෙ ඝට්ටෙස්සන්ති. තෙපි ඝට්ටිතා අඤ්ඤෙ ඝට්ටෙස්සන්ති. එවං ඉමං නිවාපං නිවුත්තං සබ්බසො මිගජාතා රිඤ්චිස්සන්ති. යන්නූන මයං චතුත්ථෙ මිගජාතෙ අජ්ඣුපෙක්ඛෙය්‍යාමා"ති. අජ්ඣුපෙක්ඛිංසු ඛො භික්ඛවෙ නෙවාපිකො ච නෙවාපිකපරිසා ච චතුත්ථෙ මිගජාතෙ. එවං හි තෙ භික්ඛවෙ චතුත්ථා මිගජාතා පරිමුච්චිංසු නෙවාපිකස්ස ඉද්ධානුභාවා.

9. උපමා ඛො මෙ අයං භික්ඛවෙ කතා අත්ථස්ස විඤ්ඤාපනාය. අයඤ්චෙත්ථ[1] අත්ථො: නිවාපොති ඛො භික්ඛවෙ පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං. නෙවාපිකොති ඛො භික්ඛවෙ මාරස්සෙතං පාපිමතො අධිවචනං. නෙවාපිකපරිසාති ඛො භික්ඛවෙ මාරපරිසායෙතං අධිවචනං. මිගජාතාති ඛො භික්ඛවෙ සමණබ්‍රාහ්මණානෙතං අධිවචනං.

10. තත්‍ර භික්ඛවෙ පඨමා සමණබ්‍රාහ්මණා අමුං නිවාපං නිවුත්තං මාරස්ස අමූනි ච ලොකාමිසානි අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු. තෙ තත්ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජමානා මදං ආපජ්ජිංසු –

1. අයඤ්චෙවෙත්ථ, ස්‍යා. PTS.

Free Distribution www.aathaapi.org

“යම් තැනෙක්හි නෙවාපිකයාගේ ද නෙවාපිකපිරිසගේ ද ගමන් නො වේ ද, අපි එහි ආශයස්ථානයක් කරන්නෙමු. එහි ආශයස්ථානයක් කොට නෙවාපිකයා වපුළ මේ තණකොටුවට නො වැද මුසපත් නො වී තණ කන්නෙමු. නො වැද මුසපත් නො වී තණ කන්නමෝ මදයට පත් නො වන්නෙමු. මත් නො වූවමෝ සිහිමුළාබවට නො පැමිණෙන්නෙමු. සිහි මුළා නො වූවාහු මේ තණ කොටුවේ දී නෙවාපිකයා විසින් කැමැති සේ කට යුත්තමෝ නො වන්නෙමු නම් යෙහෙකැ”යි සිතා යම් තැනෙක නෙවාපිකයාගේත් නෙවාපිකපිරිසේත් ගමන් නො වේ ද, ඔහු එහි ආශය-ස්ථානයක් කළාහු ය. එහි ආශය ස්ථානයක් කොට නෙවාපිකයා වපුළ මේ කොටුවට නො වැද නො මුසපත් ව ගොදුරු කැහ. ඔහු එහි නො වැද නො මුසපත් ව ගොදුරු කන්නාහු මදයට පත් නො වූහ. මත් නො වූවාහු සිහිමුළාබවට පත් නො වූහ. නො මුළා වූවාහු මේ නිවාපයෙහි නෙවාපිකයා විසින් කැමැති සේ කට යුත්තෝ නො වූහ.

8. මහණෙනි, එහි දී නෙවාපිකයාටත් නෙවාපික පිරිසටත් මේ අදහස විය: “මේ සතර වැනි මුවසමූහයෝ කපටියෝ ය. හික්මුණු කෛරාටිකයෝ ය. මේ සතර වන මුව සමූහයෝ ඍද්ධිමතුන් වැනි යක්ඛු ය. වපුළ මේ තණකොටුව කත්. ඔවුන්ගේ ඒම හෝ යාම නො ද දනිමු. අපි වපුළ මේ තණකොටුව මහත් වූ දඬු වරදැලින් හාත්පස මහත් ප්‍රදෙශයක් සහිත කොට වට කරන්නෙමු නම් යෙහෙක. යම් තැනෙක්හි ඒ මෘගසමූහයෝ අනු කර ගැනීමට පැමිණෙන්නාහු ද, මේ සතර වන මුව සමූහයන්ගේ ඒ ආශයස්ථානය දක්නෙමු නම් ඉතා මැනැවි” කියා යි. ඔහු ඒ වපුළ තණකොටුව මහත් වූ දඬු වරදැලින් හාත්පස මහත් ප්‍රදෙශයක් සහිත කොට වට කළහ. මහණෙනි, ඒ නෙවාපිකයාත් නෙවාපික පිරිසත් යම් තැනක ඒ මුවසමූහයෝ ග්‍රාහයට පැමිණෙන්නාහු නම්, සතර වැනි මෘගසමූහයන්ගේ ඒ ආශයස්ථානය නො ම දුටුහ.

මහණෙනි, එහි නෙවාපිකයාට ද නෙවාපික පිරිසට ද මේ අදහස විය: “ඉදින් වනාහි අපි සතර වන මුවසමූහයන් ගටන්නෙමු නම්, ගටන ලද ඔහු අන්‍යයන් ගටන්නාහ. ගටන ලද ඔහු ද අන්‍යයන් ගටන්නාහ. එසේ ඇති කල්හි මුවසමූහයෝ වපුළා වූ මේ තණකොටුව හිස් කෙරෙත්. අපි සතර වන මුවසමූහයන් කෙරෙහි මැදහත් වෙමු නම් යෙහෙක” යනු යි. මහණෙනි, නෙවාපිකයාත් නෙවාපිකපිරිසත් සතර වන මුවසමූහයන් කෙරෙහි මධ්‍යස්ථ වූවාහු ය. මහණෙනි, මෙසේ වනාහි සතරවැනි මුවසමූහයෝ නෙවාපිකයාගේ ඍද්ධ්‍යනුභාවයෙන් මිදුණාහු ය.

9. මහණෙනි, අර්ථය හැඟවීම පිණිස මා විසින් මේ උපමාව කරණ ලදු. මේ මෙහි අර්ථ යි: මහණෙනි, ‘නිවාප’ යනු පස්කම්ගුණයන්ට මේ නමෙකි. මහණෙනි, ‘නෙවාපික’ යනු පවිටු මාරයාට මේ නමෙකි. මහණෙනි, ‘නෙවාපිකපිරිස’ යනු මාරපිරිසට මේ නමෙකි· මහණෙනි, ‘මුව සමූහය’ යනු ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට මේ නමෙකි.

මහණෙනි, පළමුවන මහණ බමුණෝ මාරයා විසින් වපුළ ඒ තණකොටුව වූ පඤ්චකාමයන්ට වැදී මුසපත් වූවාහු කාමගුණ නමැති බොජුන් අනුභව කළහ. ඔහු එහි පිවිස මුසපත්ව පස්කම් බොජුන් අනුභවකළාහු මත් වූහ.

මත්තා සමානා පමාදං ආපජ්ජිංසු. පමත්තා සමානා යථාකාමකරණීයා අහෙසුං මාරස්ස අමුස්මිං නිවාපෙ අමුස්මිං ච ලොකාමිසෙ. එවං හි තෙ භික්ඛවෙ පඨමා සමණබ්‍රාහ්මණා න පරිමුච්චිංසු මාරස්ස ඉද්ධානුභාවා. සෙය්‍යථාපි තෙ භික්ඛවෙ පඨමා මිගජාතා, තථූපමෙ අහං ඉමෙ පඨමෙ සමණබ්‍රාහ්මණෙ වදාමි.

10. තත්‍ර භික්ඛවෙ දුතියා සමණබ්‍රාහ්මණා එවං සමචින්තෙසුං: "යෙ ඛො තෙ පඨමා සමණබ්‍රාහ්මණා අමුං නිවාපං නිවුත්තං මාරස්ස අමූනි ච ලොකාමිසානි අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු, තෙ තත්ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජමානා මදං ආපජ්ජිංසු. මත්තා සමානා පමාදං ආපජ්ජිංසු. පමත්තා සමානා යථාකාමකරණීයා අහෙසුං මාරස්ස අමුස්මිං නිවාපෙ අමුස්මිං ච ලොකාමිසෙ. එවං හි තෙ පඨමා සමණබ්‍රාහ්මණා න පරිමුච්චිංසු මාරස්ස ඉද්ධානුභාවා. යන්නූන මයං සබ්බසො නිවාපභොජනා ලොකාමිසා පටිවිරමෙය්‍යාම, භයභොගා පටිවිරතා අරඤ්ඤායතනානි අජ්ඣොගාහෙත්වා[1] විහරෙය්‍යාමා"ති. තෙ සබ්බසො නිවාපභොජනා ලොකාමිසා පටිවිරමිංසු. භයභොගා පටිවිරතා අරඤ්ඤායතනානි අජ්ඣොගාහෙත්වා[1] විහරිංසු. තෙ තත්ථ සාකභක්ඛාපි අහෙසුං, සාමාකභක්ඛාපි අහෙසුං, නීවාරභක්ඛාපි අහෙසුං, දද්දුලභක්ඛාපි අහෙසුං, හටභක්ඛාපි අහෙසුං, කණභක්ඛාපි අහෙසුං, ආචාමභක්ඛාපි අහෙසුං, පිඤ්ඤාකභක්ඛාපි අහෙසුං, තිණභක්ඛාපි අහෙසුං, ගොමයභක්ඛාපි අහෙසුං, වනමූලඵලාහාරා යාපෙසුං පවත්තඵලභොජී. තෙසං ගිම්හානං පච්ඡිමෙ මාසෙ තිණොදකසඞ්ඛයෙ අධිමත්තකසිමානං පත්තො කායො හොති. තෙසං අධිමත්තකසිමානං පත්තකායානං බලවීරියං පරිහායි. බලවීරියෙ පරිහීනෙ චෙතොවිමුත්ති පරිහායි. චෙතොවිමුත්තියා පරිහීනාය තමෙව නිවාපං නිවුත්තං මාරස්ස පච්චාගමිංසු තානි ච ලොකාමිසානි. තෙ තත්ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු. තෙ තත්ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජමානා මදං ආපජ්ජිංසු. මත්තා සමානා පමාදං ආපජ්ජිංසු. පමත්තා සමානා යථාකාමකරණීයා අහෙසුං මාරස්ස අමුස්මිං නිවාපෙ අමුස්මිං ච ලොකාමිසෙ. එවං හි තෙ භික්ඛවෙ දුතියාපි සමණබ්‍රාහ්මණා න පරිමුච්චිංසු මාරස්ස ඉද්ධානුභාවා. සෙය්‍යථාපි තෙ භික්ඛවෙ දුතියා මිගජාතා තථූපමෙ අහං ඉමෙ දුතියෙ සමණබ්‍රාහ්මණෙ වදාමි.

11. තත්‍ර භික්ඛවෙ තතියා සමණබ්‍රාහ්මණා එවං සමචින්තෙසුං: "යෙ ඛො තෙ පඨමා සමණබ්‍රාහ්මණා අමුං නිවාපං නිවුත්තං මාරස්ස අමූනි ච ලොකාමිසානි -පෙ- එවං හි තෙ පඨමා සමණබ්‍රාහ්මණා න පරිමුච්චිංසු මාරස්ස ඉද්ධානුභාවා. යෙපි තෙ දුතියා සමණබ්‍රාහ්මණා එවං සමචින්තෙසුං-

---

1. අජ්ඣාගාහෙත්වා,. මජසං. සයා. අජ්ඣාගාහිත්වා, PTS.

මත් වූවාහු සිහි නැති බවට පැමිණියාහු මාරයාගේ මේ තණ කෙතෙහි මේ ලෝකාමිසයෙහි මාරයා විසින් කැමති පරිදි කළ යුත්තෝ වූහ. මහණෙනි, මෙසේ ඒ පළමුවන මහණ බමුණෝ මාරයාගේ සෘද්ධ්‍යනුභාවයෙන් නො මිදුණාහ. මහණෙනි, පළමුවන මුව සමූහයෝ යම්සේ ද, මේ පළමුවන මහණ බමුණන් එබඳු උපමා ඇත්තවුනැ යි කියමි.

10. මහණෙනි, එහි දී දෙවන මහණ බමුණෝ මෙසේ සිතූහ: "යම් ඒ පළමුවන මහණ බමුණු කෙනෙක් මාරයා විසින් වපුළ මේ පඤ්චකාම ගුණ නමැති නිවාපයට වැද මූඪපත් වූවාහු පස්කම් බොජුන් වැළඳුවාහු නම් ඔහු එහි වැද මූඪපත් වූවාහු පස්කම්බොජුන් වළඳත්නාහු මදයට පැමිණියහ. මත් වූවාහු සිහි නැති බවට පැමිණියහ. සිහි නැති බවට පැමිණියාහු මාරයාගේ තණකොටුව වූ මේ පඤ්චකාමයෙහි මාරයා විසින් කැමැති සේ කට යුත්තෝ වූහ. මෙසේ ඒ පළමුවන මහණ බමුණෝ මාරයාගේ සෘද්ධ්‍යනුභාවයෙන් නො මිදුණාහ. අපි මේ පස්කම් ගුණ නැමැති ලෝකාමිස නිවාපභෝජනයෙන් හැම අතින් ම වෙන් වන්නෙමු නම්, භයජනක පඤ්චකාම භෝගයෙන් වෙන් වූවමෝ වනයන්ට වැද වාසය කරන්නෙමු නම් මැනව" කියා යි. ඔහු නිවාපභොජනය වූ ලොකාමිසයෙන් හැමලෙසින් වෙන් වූවාහු භයජනක පඤ්චකාමපරිභොග-යෙන් වෙන් වූවාහු වනයන්ට වැද විසූහ. ඔහු එහි දී පලා කන්නෝ ද වූහ. අමු බුදින්නෝ ද වූහ. හුරුහැල් අනුභව කරන්නෝ ද වූහ. සම්සාසට අනුභව කරන්නෝ ද වූහ. ලාටු අනුභව කරන්නෝ ද වූහ. කුඩු අනුභව කරන්නෝ ද වූහ. දඹුබත් කන්නෝ ද වූහ. පුනක්කු අනුභව කරන්නෝ ද වූහ. තණ අනුභව කරන්නෝ ද වූහ. ගොම අනුභව කරන්නෝ ද වූහ. වනමුල්පල ආහාර කොට ඇත්තාහු සවයංපතිතඵල අනුභව කරන්නෝ කය පැවැත්වූහ. ගිම්හසාරමස පිළිබඳ පැසුළු මසෙහි තණ දිය නැති වූ කල්හි ඔවුන්ගේ ශරීරය ඉතා කෘශ බවට පැමිණියේ වේ. ඉතා වැරැණු බවට පැමිණි කය ඇති ඔවුන්ගේ ශක්තිය පිරිහුණේ ය. ශක්තිය පිරිහුණු කල්හි 'චෙතොවිමුක්තිය පිරිහුණේ ය' යි උපන් අදහස පිරිහුණේ ය. චිත්තවිමුක්තිය පිරිහුණු කල්හි මාරයා විසින් වපුළ තණකොටුව වැනි ඒ පඤ්චකාමගුණයන්ට පෙරළා ආහ. ඔහු එහි වැද මූඪපත් ව පස්කම් බොජුන් අනුභව කළහ. ඔහු එහි වැද මූඪපත් ව පස්කම්බොජුන් අනුභව කරන්නාහු මදයට පැමිණියාහු ය. මදයට පැමිණියාහු සිහි නැති බවට පැමිණියහ සිහි නැති බවට පැමිණියාහු මාරයාගේ මේ තණකොටුව වූ පඤ්චකාමගුණිකනිවාපයෙහි මාරයා විසින් කැමැති සේ කළ යුත්තෝ වූහ. මහණෙනි, මෙසේ වනාහි ඒ දෙවන මහණ බමුණෝ මාරයාගේ සෘද්ධ්‍යනුභාවයෙන් නො මිදුණාහ. මහණෙනි, දෙවන මුවසමූහයෝ යම් සේ ද, මේ දෙවන මහණබමුණන් එබඳු උපමා ඇත්තවුනැයි කියමි.

11. මහණෙනි, එහි දී තුන් වන මහණ බමුණෝ මෙසේ සිතූහ: "යම් ඒ පළමුවන මහණ බමුණෝ මාරයා විසින් වපුළා වූ මේ තණ කොටුව වූ මේ ලොකාමිසයන්ට ... මෙසේ ඒ පළමුවන මහණ බමුණෝ මාරයාගේ සෘද්ධ්‍යනුභාවයෙන් නො මිදුණාහ. යම් ඒ දෙවන මහණබමුණෝ වූහු ද, ඔහු මෙසේ සිතූහ: –

Free Distribution www.aathaapi.org

“යෙ ඛො තෙ පඨමා සමණබ්‍රාහ්මණා අමුං නිවාපං නිවුත්තං මාරස්ස අමූනි ච ලොකාමිසානි අනුපඛජ්ජ -පෙ- එවං හි තෙ පඨමා සමණබ්‍රාහ්මණා න පරිමුච්චිංසු මාරස්ස ඉද්ධානුභාවා. යන්නූන මයං සබ්බසො නිවාපභොජනා ලොකාමිසා පටිවිරමෙය්‍යාම, භයභොගා පටිවිරතා අරඤ්ඤායතනානි අජ්ඣොගාහෙත්වා විහරෙය්‍යාමා’ති. තෙ සබ්බසො නිවාපභොජනා ලොකාමිසා පටිවිරමිංසු. තෙ තත්‍ථ සාකභක්ඛාපි අහෙසුං, සාමාකභක්ඛාපි අහෙසුං, නීවාරභක්ඛාපි අහෙසුං, දද්දුලභක්ඛාපි අහෙසුං. හටභක්ඛාපි අහෙසුං, කණභක්ඛාපි අහෙසුං, ආචාමභක්ඛාපි අහෙසුං, පිඤ්ඤාකභක්ඛාපි අහෙසුං, තිණභක්ඛාපි අහෙසුං, ගොමයභක්ඛාපි අහෙසුං, වනමූලඵලාහාරා යාපෙසුං පවත්තඵලභොජී. තෙසං ගිම්හානං පච්ඡිමෙ මාසෙ තිණොදක-සඞ්ඛයෙ අධිමත්තකසිමානං පත්තො කායො හොති. තෙසං අධිමත්ත-කසිමානං පත්තකායානං බලවීරියං පරිහායි. බලවීරියෙ පරිහීනෙ චෙතොවිමුත්තියා පරිහීනාය තමෙව නිවාපං නිවුත්තං මාරස්ස පච්චාගමිංසු තානි ච ලොකාමිසානි. තෙ තත්‍ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු. තෙ තත්‍ථ අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජමානා මදං ආපජ්ජිංසු. මත්තා සමානා පමාදං ආපජ්ජිංසු. පමත්තා සමානා යථාකාමකරණීයා අහෙසුං මාරස්ස අමුස්මිං නිවාපෙ අමුස්මිඤ්ච ලොකාමිසෙ. එවං හි තෙ දුතියාපි සමණබ්‍රාහ්මණා න පරිමුච්චිංසු මාරස්ස ඉද්ධානුභාවා. ‘යන්නූන මයං අමුං නිවාපං නිවුත්තං මාරස්ස අමූනි ච ලොකාමිසානි උපනිස්සාය ආසයං කප්පෙය්‍යාම, තත්‍රාසයං කප්පෙත්වා අමුං නිවාපං නිවුත්තං මාරස්ස අමූනි ච ලොකාමිසානි අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජිස්සාම, අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජමානා න මදං ආපජ්ජිස්සාම, අමත්තා සමානා නප්පමාදං ආපජ්ජිස්සාම, අප්පමත්තා සමානා න යථාකාමකරණීයා භවිස්සාම මාරස්ස අමුස්මිං නිවාපෙ අමුස්මිඤ්ච ලොකාමිසෙ’ති. තෙ අමුං නිවාපං නිවුත්තං මාරස්ස අමූනි ච ලොකාමිසානි උපනිස්සාය ආසයං කප්පයිංසු. තත්‍රාසයං කප්පෙත්වා අමුං නිවාපං නිවුත්තං මාරස්ස අමූනි ච ලොකාමිසානි අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු. තෙ තත්‍ථ අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජමානා න මදං ආපජ්ජිංසු. අමත්තා සමානා නප්පමාදං ආපජ්ජිංසු. අප්පමත්තා සමානා න යථාකාමකරණීයා අහෙසුං මාරස්ස අමුස්මිං නිවාපෙ අමුස්මිඤ්ච ලොකාමිසෙ. අපි ච ඛො එවං දිට්ඨිකා අහෙසුං: ‘සස්සතො ලොකො ඉතිපි, අසස්සතො ලොකො ඉතිපි; අන්තවා ලොකො ඉතිපි, අනන්තවා ලොකො ඉතිපි; තං ජීවං තං සරීරං ඉතිපි, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං ඉතිපි, හොති තථාගතො පරම්මරණා ඉතිපි, න හොති තථාගතො පරම්මරණා ඉතිපි, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉතිපි –

“යම් සේ පළමුවන මහණබමුණෝ මාරයා විසින් වපුළ ඒ නිවාපය වූ පඤ්චකාමගුණයන්ට වැද... මෙසේ ඒ පළමුවන මහණබමුණෝ මාරයාගේ සෘද්ධ්‍යනුභාවයෙන් නො මිදුණහ අපි හැම අයින් ම ලෝකාමිසනිවාප භෝජනයෙන් වෙන් වන්නෙමු නම්, භයජනක පඤ්චකාමපරිභෝගයෙන් වෙන් වී වනයන්ට වැද වාසය කරන්නෙමු නම් යෙහෙක’ කියා සි. ඔහු ලෝකාමිසනිවාපභෝජනයෙන් වෙන් වූහ. භයජනක පඤ්චකාම පරිභෝගයෙන් වෙන් වූවාහු වනයට වැදී වාසය කළහ ඔහු එහි දී පලා කන්නෝත් වූහ. අමු බුදින්නෝත් වූහ. හුරුහැල් අනුභව කරන්නෝත් වූහ. සම්කසට අනුභව කරන්නෝත් වූහ. ලහවු අනුභව කරන්නෝත් වූහ. කුඩු අනුභවකරන්නෝත් වූහ. දඹුබත් අනුභව කරන්නෝත් වූහ. මුරුවට අනුභව කරන්නෝත් වූහ. තණ අනුභව කරන්නෝත් වූහ. ගොම අනුභව කරන්නෝත් වූහ. වනමුල් පල අහර කොට ඇත්තාහු ස්වයංපතිතඵල අනුභව කරණසුලු ව කය පැවැත්වූහ. ගිමන්සාරමස පිළිබඳ පැසුළුම්ස්හි තණ දිය සිඳුණු කල්හි ඔවුන්ගේ ශරීර ඉතා කෘශබවට පැමිණියේ වේ. ඉතා කෘශ බවට පැමිණි කය ඇති ඔවුන්ගේ ශක්තිය පිරිහුණේ ය. ශක්තිය පිරිහුණු කල්හි ‘වෙනෙහි වෙසෙමු’ යි යන අදහස පිරිහුණේ ය. චිත්තවිමුක්තිය පිරිහුණු කල්හි මාරයා විසින් වපුළ තණ කොටුව වූ ඒ ලෝකාමිස නිවාපයට පෙරලා ආහ. ඔහු එහි වැද මුසපත් ව පස්කම්බොජුන් අනුභව කළහ. ඔහු එහි වැද මුසපත් ව ලොකාමිසය අනුභව කරන්නාහු මත් වූහ. මත් වූවාහු සිහි නැතිබවට පැමිණියහ. සිහි නැති බවට පැමිණියාහු මාරයාගේ මේ ලොකාමිසනිවාපයෙහි කැමැති සේ කළ යුත්තෝ වූහ. මෙසේ ඒ දෙවන මහණබමුණෝ මාරයාගේ සෘද්ධ්‍යනුභාවයෙන් නො මිදුණහ. ‘අපි මාරයා වපුළ මේ නිවාපය වූ ලෝකාමිසයන් ඇසුරු කොට ආශ්‍රයස්ථානයක් කරන්නෙමු නම්, එහි ආශ්‍රයස්ථානයක් කොට වැස මාරයා විසින් වපුළ නිවාපය වූ ඒ ලෝකාමිසයන් ට නො වැද නො මුසපත් ව ලෝකාමිසභෝජන අනුභව කරන්නෙමු නම්, නො වැද මුසපත් නො වී පස්කම් බොජුන් වළඳන්නමෝ මත් නොවන්නෙමු නම්, නො මත්වූවමෝ ප්‍රමාදයට නො පැමිණෙන්නෙමු නම්, සිහි නැති බවට නො පැමිණෙන්නෙමු නම්, සිහි නැති බවට නො පැමිණියමෝ නිවාපය වූ මේ ලෝකාමිසයෙහි මාරයා විසින් කැමැති සේ කට යුත්තමෝ නො වන්නමෝ නම් යෙහෙකැ’යි කියා යි. ඔහු මාරයා වපුළ මේ නිවාපය වූ මේ ලෝකාමිසයන් ඇසුරු කොට ආශ්‍රයස්ථානයක් කළාහුය. එහි ආශ්‍රය ස්ථානයක් කොට මාරයා විසින් වපුළ නිවාප වූ මේ ලෝකාමිසයන්ට නො වැද මුසපත් නො වූවාහු පස්කම් බොජුන් අනුභව කළහ. ඔහු එහි නො වැද මුසපත් නො වී පස්කම්ගුණ බොජුන් බුදින්නාහු මත් නො වූහ. මත් නො වූවාහු සිහි නැති බවට නො පැමිණියාහු ය. නො පමා වූවාහු මාරයාගේ මේ නිවාපය වූ මේ ලෝකාමිසයෙහි කැමැති සේ කට යුත්තෝ නො වූහ. එතෙකුදු වුවත් ‘ලෝකය ශාශ්වතය කියා ද, ලෝකය අශාශ්වත ය යි කියා ද, ලෝකය කෙළවරක් ඇත්තේ ය කියා ද, ලෝකය කෙළවරක් නැත්තේ ය කියා ද, ඒ ජීවය, ඒ ශරීරය යි කියා ද, ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ යි කියා ද, සත්ත්වයා මරණින් මතු වන්නේ ය කියා ද, සත්ත්වයා මරණින් මතු වන්නේත් වේ, නො වන්නේත් වේ කියා ද, සත්ත්වයා මරණින් මතු නොම වෙයි, නො වන්නේත් නො වෙයි කියා ද, මෙවැනි දෘෂ්ටි ඇත්තෝ වූහ.

එවං හි තෙ භික්ඛවෙ තතියාපි සමණබ්‍රාහ්මණා න පරිමුච්චිංසු මාරස්ස ඉද්ධානුභාවා. සෙය්‍යථාපි තෙ භික්ඛවෙ තතියා මිගජාතා තථූපමෙ අහං ඉමෙ තතියෙ සමණබ්‍රාහ්මණෙ වදාමි.

12. තත්‍ර භික්ඛවෙ චතුත්ථා සමණබ්‍රාහ්මණා එවං සමචින්තෙසුං: "යෙ ඛො තෙ පඨමා සමණබ්‍රාහ්මණා අමුං නිවාපං නිවුත්තං මාරස්ස [අමූනි ච ලොකාමිසානි අනුපඛජ්ජ] -පෙ- එවං හි තෙ පඨමා සමණබ්‍රාහ්මණා න පරිමුච්චිංසු මාරස්ස ඉද්ධානුභාවා. යෙපි තෙ දුතියා සමණබ්‍රාහ්මණා එවං සමචින්තෙසුං: "යෙ ඛො තෙ පඨමා සමණබ්‍රාහ්මණා අමුං නිවාපං නිවුත්තං මාරස්ස [අමූනිච ලොකාමිසානි අනුපඛජ්ජ] -පෙ- එවං හි තෙ පඨමා සමණබ්‍රාහ්මණා න පරිමුච්චිංසු මාරස්ස ඉද්ධානුභාවා. 'යන්නූන මයං සබ්බසො නිවාපභොජනා ලොකාමිසා පටිවිරමෙය්‍යාම -පෙ- එවං හි තෙ දුතියාපි සමණබ්‍රාහ්මණා න පරිමුච්චිංසු මාරස්ස ඉද්ධානුභාවා. යෙපි තෙ තතියා සමණබ්‍රාහ්මණා එවං සමචින්තෙසුං: "යෙ ඛො තෙ පඨමා සමණබ්‍රාහ්මණා අමුං නිවාපං නිවුත්තං මාරස්ස [අමූනි ච ලොකාමිසානි] [අනුපඛජ්ජ] -පෙ- එවං හි තෙ පඨමා සමණබ්‍රාහ්මණා න පරිමුච්චිංසු මාරස්ස ඉද්ධානුභාවා. යෙපි තෙ දුතියා සමණබ්‍රාහ්මණා එවං සමචින්තෙසුං: යෙ තෙ පඨමා සමණබ්‍රාහ්මණා අමුං නිවාපං නිවුත්තං මාරස්ස [අමූනි ච ලොකාමිසානි අනුපඛජ්ජ] -පෙ- එවං හි තෙ පඨමා සමණබ්‍රාහ්මණා න පරිමුච්චිංසු මාරස්ස ඉද්ධානුභාවා. 'යන්නූන මයං සබ්බසො නිවාපභොජනා ලොකාමිසා පටිවිරමෙය්‍යාම -පෙ- එවං හි තෙ දුතියාපි සමණබ්‍රාහ්මණා න පරිමුච්චිංසු මාරස්ස ඉද්ධානුභාවා. [යෙපි තෙ තතියා සමණබ්‍රාහ්මණා එවං සමචින්තෙසුං -පෙ- 'යන්නූන මයං අමුං නිවාපං නිවුත්තං මාරස්ස අමූනි ච ලොකාමිසානි උපනිස්සාය ආසයං කප්පෙය්‍යාම, තත්‍රාසයං කප්පෙත්වා අමුං නිවාපං නිවුත්තං මාරස්ස අමූනි ච ලොකාමිසානි අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජිස්සාම, අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජමානා න මදං ආපජ්ජිස්සාම, අමත්තා සමානා නප්පමාදං ආපජ්ජිස්සාම, අප්පමත්තා සමානා න යථාකාමකරණීයා භවිස්සාම මාරස්ස අමුස්මිං නිවාපෙ අමුස්මිඤ්ච ලොකාමිසෙ'ති. තෙ අමුං නිවාපං නිවුත්තං මාරස්ස අමූනි ච ලොකාමිසානි උපනිස්සාය ආසයං කප්පයිංසු. තත්‍රාසයං කප්පෙත්වා අමුං නිවාපං නිවුත්තං මාරස්ස අමූනි ච ලොකාමිසානි අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු. තෙ තත්ථ අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජමානා න මදං ආපජ්ජිංසු. අමත්තා සමානා නප්පමාදං ආපජ්ජිංසු. අප්පමත්තා සමානා න යථාකාමකරණීයා අහෙසුං මාරස්ස අමුස්මිං නිවාපෙ අමුස්මිඤ්ච ලොකාමිසෙ. අපි ච ඛො එවංදිට්ඨිකා අහෙසුං: සස්සතො ලොකො ඉතිපි -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉතිපි. එවං හි තෙ තතියාපි සමණබ්‍රාහ්මණා න පරිමුච්චිංසු මාරස්ස ඉද්ධානුභාවා. -

මහණෙනි, මෙසේ ඒ තුන්වැනි මහණබමුණෝ මාරයාගේ ඍද්ධ්‍යනුභාවයෙන් නො මිදුණහ. මහණෙනි, ඒ තුන්වන මුවසමූහයෝ යම්සේ ද, මේ තුන්වන මහණබමුණන් එබඳු උපමා ඇත්තවුනැ යි කියමි.

12. මහණෙනි, එහි දී සතර වන මහණ බමුණෝ මෙසේ සිතූහ: "යම් මේ පළමු වන මහණ බමුණෝ වූ ද, ඔහු මාරයා විසින් වපුළ මේ නිවාපය වූ මේ ලෝකාමිසයන්ට වැද ... මෙසේ ඒ පළමුවන මහණබමුණෝ මාරයාගේ ඍද්ධ්‍යනුභාවයෙන් නොමිදුණහ. යම් මේ දෙවන මහණබමුණෝ මෙසේ සිතුවාහු ද, "යම් මේ පළමුවන මහණ-බමුණෝ මාරයා විසින් වපුළ මේ නිවාපය වූ මේ ලොකාමිසයන්ට වැද ... මෙසේ ඒ පළමුවන මහණබමුණෝ මාරයාගේ ඍද්ධ්‍යනුභාවයෙන් නො මිදුණහ. 'අපි සම්පූර්ණයෙන් ලොකාමිසනිවාපභොජනය වූ පඤ්චකාමගුණයෙන් වෙන් වන්නෙමු නම් යෙහෙකි... මෙසේ වනාහි මේ දෙවන මහණබමුණෝ මාරයාගේ ඍද්ධ්‍යනුභාවයෙන් නො මිදුණහ. යම් මේ තුන්වන මහණබමුණෝ වූ ද, ඔහු මෙසේ සිතුවාහු ය: "යම් ඒ පළමුවන මහණබමුණෝ මාරයා විසින් වපුළ මේ නිවාපය වූ මේ ලෝකාමිසයන්ට වැද ... මෙසේ ඒ පළමුවන මහණබමුණෝ මාරයාගේ ඍද්ධ්‍යනුභාවයෙන් නො මිදුණහ. යම් ඒ දෙවන මහණබමුණෝ වූ ද ඔහු මෙසේ සිතුවාහු ය: යම් ඒ පළමුවන මහණබමුණෝ මාරයා විසින් වපුළ මේ නිවාපය වූ මේ ලෝකාමිසයන්ට වැද ... මෙසේ වනාහි ඒ පළමුවන මහණබමුණෝ මාරයාගේ ඍද්ධ්‍යනුභාවයෙන් නො මිදුණහ. 'අපි නිවාප භොජන වූ ලෝකාමිසයෙන් හැම අයින් ම වෙන් වන්නෙමු නම් යෙහෙකැ'යි ... මෙසේ ඒ දෙවන මහණබමුණෝත් මාරයාගේ ඍද්ධ්‍යනුභාවයෙන් නො මිදුණහ. යම් මේ තෙවන මහණබමුණෝ 'අපි මේ මාරයා විසින් වපුළ නිවාපය වූ මේ ලෝකාමිසයන් ඇසුරු කොට ආශයස්ථානයක් කරන්නෙමු නම්, එහි ආශයස්ථානයක් කොට මාරයා විසින් වපුළ මේ නිවාපය වූ මේ ලෝකාමිසයන්ට නො වැද මුසපත් නො වී පඤ්චකාම භෝජන අනුභව කරන්නෙමු නම්, නො වැද මුසපත් නො වී පඤ්චකාමභෝජන අනුභව කරන්නමෝ මත් නො වන්නෙමු නම්, මත් නො වූවමෝ සිහි නැති බවට නො පැමිණෙන්නෙමු නම්, සිහි නැති බවට නො පැමිණියමෝ මේ මාරයාගේ නිවාපය වූ මේ පඤ්චකාමගුණයෙහි මාරයා විසින් කැමැති සේ කටයුත්තමෝ නො වන්නෙමු නම් යෙහෙකැ' යි මෙසේ සිතුවාහු ද, ඔහු මාරයා වපුළ මේ නිවාපය වූ මේ ලෝකාමිසයන් ඇසුරු කොට ආශයස්ථානයක් කළහ. එහි ආශයස්ථානයක් කොට මාරයා විසින් වපුළ මේ නිවාපය වූ මේ පඤ්චකාමයන්ට නො වැද මුසපත් නො වූවාහු පඤ්චකාමභෝජන අනුභව කළහ. ඔහු එහි නො වැද නො මුසපත් ව පඤ්චකාමභෝජනයන් බුදින්නාහු මත් නො වූහ. මත් නො වූවාහු සිහි නැති බවට නො පැමිණියහ. සිහි නැති බවට නොපැමිණියාහු මාරයාගේ මේ නිවාපය වූ මේ ලොකාමිසයෙහි මාරයා විසින් කැමැති සේ කට යුත්තෝ නො වූහ. එසේ වුවත් ලොකය ශාශ්වතය කියා ද, ... තථාගතයා මරණින් මතු නො ම වෙයි. නො වන්නේත් නො වෙයි කියා ද, මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වූහ. මෙසේ ඒ තුන්වන මහණබමුණෝත් මාරයාගේ ඍද්ධ්‍යනුභාවයෙන් නො මිදුණහ. -

'යන්නූන මයං යත්ථ අගති මාරස්ස ච මාරපරිසාය ච තත්‍රාසයං කප්පෙය්‍යාම, තත්‍රාසයං කප්පෙත්වා අමුං නිවාපං නිවුත්තං මාරස්ස අමූනි ච ලොකාමිසානි අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජමානා න මදං ආපජ්ජිස්සාම, අමත්තා සමානා න පමාදං ආපජ්ජිස්සාම, අප්පමත්තා සමානා න යථාකාමකරණීයා භවිස්සාම මාරස්ස අමුස්මිං නිවාපෙ අමුස්මිඤ්ච ලොකාමිසෙ'ති. තෙ යත්ථ අගති මාරස්ස ච මාරපරිසාය ච තත්‍රාසයං කප්පයිංසු. තත්‍රාසයං කප්පෙත්වා අමුං නිවාපං නිවුත්තං මාරස්ස අමූනි ච ලොකාමිසානි අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජිංසු. තෙ තත්ථ අනනුපඛජ්ජ අමුච්ඡිතා භොජනානි භුඤ්ජමානා න මදං ආපජ්ජිංසු. අමත්තා සමානා න පමාදං ආපජ්ජිංසු. අප්පමත්තා සමානා න යථාකාම-කරණීයා අහෙසුං මාරස්ස අමුස්මිං නිවාපෙ අමුස්මිඤ්ච ලොකාමිසෙ. එවං හි තෙ භික්ඛවෙ චතුත්ථා[1] සමණබ්‍රාහ්මණා පමුච්චිංසු මාරස්ස ඉද්ධානුභාවා. සෙය්‍යථාපි තෙ භික්ඛවෙ චතුත්ථා මිගජාතා තථූපමෙ අහං ඉමෙ චතුත්ථෙ සමණබ්‍රාහ්මණෙ වදාමි.

13. කථඤ්ච භික්ඛවෙ අගති මාරස්ස ච මාරපරිසාය ච? ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං[2] උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු "අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො."

14. පුන ච පරං භික්ඛවෙ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු "අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො."

15. පුන ච පරං භික්ඛවෙ භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යන්තං අරියා ආචික්ඛන්ති 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තතියං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු, "අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො."

16. පුන ච පරං භික්ඛවෙ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා[3] අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු "අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො."

1. චතුත්ථාපි, සයා. 2. පඨමංඣානං, මජසං. සයා. PTS.
3. අත්ථඞ්ගමා, මජසං. සී. කත්ථචි.

යම් තැනක අපි මාරයාගේත් මාරපිරිසේත් ගමන් නැත් ද, එහි ආශයස්ථානයක් කරන්නෙමු නම් ආශයස්ථානයක් කොට මාරයා විසින් වපුල මේ නිවාපය වූ පඤ්චකාමගුණයන්ට නො වැද නො මුසපත් ව පස්කම්බොජුන් බුදින්නෙමු නම්, නො වැද නො මුසපත් ව පස්කම්බොජුන් අනුභව කරන්නමෝ මත් නො වන්නෙමු නම්, මත් නො වූවමෝ සිහි නැති බවට නො පැමිණෙන්නෙමු නම්, සිහි නැතිබවට නො පැමිණියමෝ මාරයාගේ මේ නිවාපය වූ මේ ලොකාමිසයෙහි මාරයා විසින් කැමැති සේ කළ යුත්තෝ නො වන්නෙමු නම් යෙහෙකැ යි කියා ය. ඔහු යම් තැනක මාරයාගේත් මරපිරිසේත් ගමන් නැත් ද, එහි ආශය-ස්ථානයක් කළහ. එහි ආශයස්ථානයක් කොට මාරයා වපුල නිවාපය වූ මේ ලොකාමිසයන්ට නො වැද නො මුසපත් ව පඤ්චකාම භොජන අනුභව කළහ. ඔහු තුමූ එහි නො වැද නො මූසපත් ව පඤ්චකාම-භොජනයන් අනුභව කරන්නාහු මත් නො වූවාහු සිහි නැති බවට නො පැමිණියාහු ය. සිහි නැති බවට නො පැමිණියාහු මාරයාගේ නිවාපය වූ මේ ලෝකාමිසයෙහි මාරයා විසින් කැමති සේ කළ යුත්තෝ නො වූහ. මෙසේ වනාහි ඒ සතරවන මහණ බමුණෝ මාරයාගේ සෘද්ධ්‍යනුභාවයෙන් මිදුණහ. මහණෙනි, ඒ සතර වැනි මුවසමූහයෝ යම්බඳු ද, මෙ සතර වැනි මහණ බමුණන් එබඳු උපමා ඇත්තවුනැ යි මම කියමි.

13. මහණෙනි, මාරයාගේත් මාරපිරිසේත් අගතිය (විෂය නැති තැන) කෙසේ ද? මහණෙනි, මෙ ශාසනයෙහි මහණ තෙමේ කාමයන්ගෙන් වෙන් ව අකුශල ධර්මයන්ගෙන් වෙන් ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි. මහණෙනි, මේ මහණ තෙමේ "මාරයා අන්ධ කෙළේ ය යි ද, මරු ඇස අපද කොට (පිහිට නැති සේ නසා) පවිටු මාරයාගේ නොදක්මට ගියේ ය යි ද" කියනු ලැබේ.

14. මහණෙනි, නැවත අනෙකක් වෙයි. මහණ තෙමේ විතර්ක විචාරයන් සංසිඳවීමෙන් ඇතුළත පැහැදීම වූ සිතේ එකඟබව ඇති විතර්ක නැති විචාර නැති සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි. මහණෙනි, මෙ මහණ තෙමේ "මාරයා අන්ධ කෙළේ යයි ද, මරු ඇස පිහිට නැති සේ නසා පවිටු මාරයාගේ නො දක්මට ගියේ" යයි ද කියනු ලැබේ.

15. මහණෙනි, නැවත ද අනෙකක් වෙයි. මහණ තෙමේ ප්‍රීතියෙන් ද වෙන් වීමෙන් උපේක්‍ෂා ඇත්තේ සිහි ඇත්තේ මනා නුවණින් යුක්ත වූයේ වාසය කරයි. කයින් සැපය ද විඳී. ආර්‍ය්‍යයෝ යම් ඒ ධ්‍යානයක් උදෙසා 'උපේක්‍ෂා ඇත්තේ සිහි ඇත්තේ සැප විහරණ ඇත්තේ ය' යි ගුණ වර්ණනා වශයෙන් කියත් ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. මහණෙනි, මෙ මහණ "මාරයා අන්ධ කෙළේ යයි ද, පිහිටක් නැති සේ මාරයාගේ ඇස නසා පවිටු මාරයාගේ නොදක්මට ගියේ" යයි ද කියනු ලැබේ.

16. මහණෙනි, නැවත ද අනෙකක් වෙයි. මහණ තෙමේ සැපත් පහවීමෙන් දුකත් පහවීමෙන් පළමු ම සොම්නස් දොම්නස් දුරු වීමෙන් දුක් නැති සැප නැති උපේක්‍ෂාව හා සිහිය පිළිබඳ පිරිසුදුබව ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයි. මහණෙනි, මෙ මහණ "මාරයා අන්ධ කෙළේය යි ද, පිහිටක් නැති ලෙස මාරයාගේ ඇස නසා පවිටු මාරයාගේ නො දක්මට ගියේ" යයි ද කියනු ලැබේ.

17. පුන ච පරං භික්ඛවෙ භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථංගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු "අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො."

18. පුන ච පරං භික්ඛවෙ භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම 'අනන්තං විඤ්ඤාණන්ති' විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු "අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො."

19. පුන ච පරං භික්ඛවෙ භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු "අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො."

20. පුන ච පරං භික්ඛවෙ භික්ඛු සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු "අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො."

21. පුන ච පරං භික්ඛවෙ භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු "අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො, තිණ්ණො ලොකෙ[1] විසත්තිකන්ති."

22. ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

නිවාපසුත්තං පඨමං.

1. ලොකො, සෳ

17. මහණෙනි, නැවැත ද අනෙකක් වෙයි. මහණ තෙමේ හැම ලෙසින් ම රූපසංඥාවන් ඉක්මවීමෙන් ප්‍රතිඝ සංඥාවන් අපවත් කිරීමෙන් නානාත්වසංඥා මෙනෙහි නො කිරීමෙන් 'ආකාශය අනන්තය' යි ආකාශානඤ්චායතනයට පැමිණ වාසය කරයි. මහණෙනි, මේ මහණ "මාරයා අන්ධ කෙළේ යයි ද, පිහිටක් නැති ලෙස මාරයාගේ ඇස නසා පවිටු මාරයාගේ නො දැක්මට ගියේ"යයි ද කියනු ලැබේ.

18. මහණෙනි, නැවත ද අනෙකක් වෙයි. මහණ තෙමේ හැම ලෙසින් ම ආකාශානඤ්චායතනය ඉක්මවා 'විඤ්ඤාණය අනන්ත ය' යි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරයි. මහණෙනි, මේ මහණ "මාරයා අන්ධ කෙළේ යයි ද, පිහිටක් නැති ලෙස මාරයාගේ ඇස නසා පවිටු මාරයාගේ නො දැක්මට ගියේ" යයි ද කියනු ලැබේ.

19. මහණෙනි, නැවත ද, අනෙකක් වෙයි. මහණ තෙමේ හැම ලෙසින් ම විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා 'කිසිත් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. මහණෙනි, මේ මහණ "මාරයා අන්ධ කෙළේ ය යි ද, මාරයාගේ ඇස පිහිට නැති සේ නසා පවිටු මාරයාගේ නො දැක්මට ගියේ" යයි ද කියනු ලැබේ.

20. මහණෙනි, නැවත ද අනෙකක් වෙයි. මහණ තෙමේ හැම ලෙසින් ම ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. මහණෙනි, මේ මහණ "මාරයා අන්ධ කෙළේ යයි ද, මාරයාගේ ඇස පිහිට නැති සේ නසා පවිටු මාරයාගේ නො දැක්මට ගියේ" යයි ද කියනු ලැබේ.

21. මහණෙනි, නැවත ද අනෙකක් වෙයි. මහණ තෙමේ හැම ලෙසින් ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවේදයිතනිරෝධයට පැමිණ වාසය කරයි. ඔහු විසින් මාර්ගප්‍රඥාවෙන් (චතුරාර්‍ය සත්‍යයන්) දැක ආශ්‍රවයෝ ක්‍ෂය කරණ ලද්දහු වෙත් ද, මහණෙනි, මේ මහණ, "මාරයා අන්ධ කෙළේ ය යි ද, මාරයාගේ ඇස පිහිට නැති සේ නසා පවිටු මාරයාගේ නො දැක්මට ගියේ ය යි ද, ලෝකයෙහි විසත්තිකා නම් වූ තෘෂ්ණාව තරණය කෙළේ" යයි ද කියනු ලැබේ.

22. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇති ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළි ගත්හ.

නිවාප සූත්‍රය පස්වැනි යි.

Free Distribution www.aathaapi.org

1. 3. 6.

අරියපරියෙසසුත්තන්තං*

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමිංසු උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතදවොචුං: “චිරස්සුතා නො ආවුසො ආනන්ද භගවතො සම්මුඛා ධම්මී කථා. සාධු මයං ආවුසො ආනන්ද ලභෙය්‍යාම භගවතො සම්මුඛා ධම්මිං කථං සවණායා”ති. තෙනහායස්මන්තො යෙන රම්මකස්ස බ්‍රාහ්මණස්ස අස්සමො තෙනුපසඞ්කමථ. අප්පෙවනාම ලභෙය්‍යාථ භගවතො සම්මුඛා ධම්මිං කථං සවණායාති. එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසුං.

2. අථ ඛො භගවා සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ආයාමානන්ද යෙන පුබ්බාරාමො මිගාරමාතු පාසාදො තෙනුපසඞ්කමිස්සාම දිවාවිහාරායාති. එවම්භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ ඛො භගවා ආයස්මතා ආනන්දෙන සද්ධිං යෙන පුබ්බාරාමො මිගාරමාතු පාසාදො තෙනුපසඞ්කමි දිවාවිහාරාය. අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලාණා වුට්ඨිතො ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ආයාමානන්ද යෙන පුබ්බකොට්ඨකො තෙනුපසඞ්කමිස්සාම ගත්තානි පරිසිඤ්චිතුන්ති. එවම්භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි.

3. අථ ඛො භගවා ආයස්මතා ආනන්දෙන සද්ධිං යෙන පුබ්බකොට්ඨකො තෙනුපසඞ්කමි ගත්තානි පරිසිඤ්චිතුං. පුබ්බකොට්ඨකෙ ගත්තානි පරිසිඤ්චිත්වා පච්චුත්තරිත්වා එකචීවරො අට්ඨාසි ගත්තානි පුබ්බාපයමානො.

4. අථ ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: අයං භන්තෙ රම්මකස්ස බ්‍රාහ්මණස්ස අස්සමො අවිදූරෙ. රමණීයො භන්තෙ රම්මකස්ස බ්‍රාහ්මණස්ස අස්සමො, පාසාදිකො භන්තෙ රම්මකස්ස බ්‍රාහ්මණස්ස අස්සමො. සාධු භන්තෙ භගවා යෙන රම්මකස්ස බ්‍රාහ්මණස්ස අස්සමො තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායාති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

* පාසරාසි සුත්තං, අට්ඨකථා; මජ්ඣං.

1. 3. 6.

අරියපරියෙසන සූත්‍රය

1. **මා** විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර සමීපයෙහි වූ **ජේතවන** නම් **අනේපිඬු** සිටුහුගේ ආරාමයෙහි වැඩ වාසය කරණසේක. එකල භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳපෙරව පාසිවුරු ගෙණ සැවැත් නුවරට පිඬු පිණිස පිවිසිසේක. එකල්හි බොහෝ භික්ෂූහු ආයුෂ්මත් අනඳ තෙරුන් කරා පැමිණියහ. පැමිණ ආයුෂ්මත් අනඳ තෙරුන්ට මෙසේ කීහ: "ඇවැත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, අප භාග්‍යවතුන් වහන්සේගේ හමුයෙහි ධර්ම කථාව ඇසුවිරූ බොහෝකල් වෙයි. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, අපි භාග්‍යවතුන් වහන්සේගේ සම්මුඛයෙහි ධර්ම කථාවක් අසන්ට ලබන්නමෝ නම් මැනැවි" යනුයි. ඇවැත්නි, එසේ නම් රම්මක බමුණාගේ අසපුව කරා එළඹෙව. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි දැහැමි කථාවක් අසවූ නම් මනා මය. ඒ භික්ෂූහු 'එසේය ඇවැත්නි' යි ආයුෂ්මත් අනඳ තෙරුන්ට පිළිතුරු දුන්හ.

2. භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර පිඬු පිණිස හැසිර බතෙන් පසු පිණ්ඩපාතයෙන් නැවතුනු සේක් ආයුෂ්මත් අනඳ තෙරුන් ඇමතූසේක: "ආනන්දය, දිවාවිහාරය සඳහා පුබ්බාරාම නම් වූ මිගාරමාතු ප්‍රාසාදය කරා යම්හ". 'එසේ ය, වහන්සැ'යි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් .. වහන්සේට පිළිවදන් දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳ තෙරුන් සමග දිවාවිහාරය සඳහා මිගාරමාතු ප්‍රාසාදය කරා වැඩියහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි ඵලසමවතින් නැගිසිටි සේක් ආයුෂ්මත් අනඳ තෙරුන්ට මෙසේ වදාළසේක. "ආනන්දය, ගාත්‍රපරිෂේකය සඳහා නැගෙන හිර නාන කොටුවට යම්හ." "එසේ ය වහන්සැ"යි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ.

3 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳ තෙරුන් සමග නැගෙනහිර නානකොටුවට වැඩියහ. සිරුරුඅවයව සනහා ගැත්ම සඳහාය. නැගෙනහිර නානකොටුවෙන් සිරුරුඅවයව සනහා ගෙන ගොඩනැඟී එක් (අඳනා) සිවුරු ඇතිව සිරුරුඅවයව පූර්ව අවස්ථාවට පමුණුවමින් (=වියළවමින්) සිටිසේක.

4. ඉක්බිති ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළහ. 'වහන්ස, රම්මකබමුණාගේ මේ අසපුව රමණීය ය. රම්මකබමුණාගේ අසපුව සිත්කලු ය. වහන්ස භාග්‍යවතුන් වහන්සේ, අනුකම්පා උපදවා රම්මකබමුණාගේ අසපුව කරා පැමිණෙනසේක් නම් මැනවි. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසූ සේක.

5. අථ ඛො භගවා යෙන රම්මකස්ස බ්‍රාහ්මණස්ස අස්සමො තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ රම්මකස්ස බ්‍රාහ්මණස්ස අස්සමෙ ධම්මියා කථාය සන්නිසින්නා හොන්ති. අථ ඛො භගවා බහිද්වාරකොට්ඨකෙ අට්ඨාසි කථාපරියොසානං ආගමයමානො. අථ ඛො භගවා කථාපරියොසානං විදිත්වා උක්කාසිත්වා අග්ගළං ආකොටෙසි. විවරිංසු ඛො තෙ භික්ඛූ භගවතො ද්වාරං.

6. අථ ඛො භගවා රම්මකස්ස බ්‍රාහ්මණස්ස අස්සමං පවිසිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "කායනුත්ථ භික්ඛවෙ එතරහි කථාය සන්නිසින්නා, කා ච පන වො අන්තරා කථා විප්පකතා'ති. 'භගවන්තමෙව ඛො නො භන්තෙ ආරබ්භ ධම්මී කථා විප්පකතා, අථ භගවා අනුප්පත්තො'ති. සාධු භික්ඛවෙ, එතං ඛො භික්ඛවෙ තුම්හාකං පතිරූපං කුලපුත්තානං සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතානං යං තුම්හෙ ධම්මියා කථාය සන්නිසීදෙය්‍යාථ. සන්නිපතිතානං වො භික්ඛවෙ ද්වයං කරණීයං: ධම්මී වා කථා, අරියො වා තුණ්හීභාවො.

7. ද්වෙමා භික්ඛවෙ පරියෙසනා: අරියා ච පරියෙසනා අනරියා ච පරියෙසනා.

කතමා ච භික්ඛවෙ අනරියා පරියෙසනා? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ජාතිධම්මො සමානො ජාතිධම්මඤ්ඤෙව පරියෙසති, අත්තනා ජරාධම්මො සමානො ජරාධම්මඤ්ඤෙව පරියෙසති, අත්තනා බ්‍යාධිධම්මො සමානො බ්‍යාධිධම්මඤ්ඤෙව පරියෙසති, අත්තනා මරණධම්මො සමානො මරණධම්මඤ්ඤෙව පරියෙසති, අත්තනා සොකධම්මො සමානො සොකධම්මඤ්ඤෙව පරියෙසති, අත්තනා සඞ්කිලෙසධම්මො සමානො සඞ්කිලෙසධම්මඤ්ඤෙව පරියෙසති.

8. කිඤ්ච භික්ඛවෙ ජාතිධම්මං වදෙථ? පුත්තභරියං භික්ඛවෙ ජාතිධම්මං, දාසිදාසං ජාතිධම්මං, අජෙළකං ජාතිධම්මං, කුක්කුටසූකරං ජාතිධම්මං, හත්ථිගවාස්සවළවං ජාතිධම්මං, ජාතරූපරජතං ජාතිධම්මං. ජාතිධම්මා හෙතෙ භික්ඛවෙ උපධයො. එත්ථායං ගථිතො මුච්ඡිතො අජ්ඣාපන්නො අත්තනා ජාතිධම්මො සමානො ජාතිධම්මඤ්ඤෙව පරියෙසති.

9. කිඤ්ච භික්ඛවෙ ජරාධම්මං වදෙථ? පුත්තභරියං භික්ඛවෙ ජරාධම්මං, දාසිදාසං ජරාධම්මං, අජෙළකං ජරාධම්මං, කුක්කුටසූකරං ජරාධම්මං, හත්ථිගවාස්සවළවං ජරාධම්මං, ජාතරූපරජතං ජරාධම්මං. ජරාධම්මා හෙතෙ භික්ඛවෙ උපධයො. එත්ථායං ගථිතො මුච්ඡිතො අජ්ඣාපන්නො අත්තනා ජරාධම්මො සමානො ජරාධම්මඤ්ඤෙව පරියෙසති.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රම්මකබමුණාගේ අසපුව කරා පැමිණි සේක. එසමයෙහි බොහෝ භික්ෂූහු රම්මකබමුණාගේ අසපුවෙහි දැහැමි කථාවෙන් යුතුව රැස්ව හුන්නාහු වෙත්. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කථා අවසානය බලතුවෝ තිහිඬෙදොරටුවෙහි වැඩ සිටි සේක. අනතුරු ව භාග්‍යවවතුන් වහන්සේ කථාව අවසන්සේ දැන කැස දොර කවුළුව පහළහ. ඒ භික්ෂූහුභාග්‍යවතුන් වහන්සේට දොර විවර කළහ.

6. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රම්මකබමුණාගේ අසපුවට පිවිස පනවනලද අස්නෙහි වැඩහුන් සේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක: "මහණෙනි, දැන් කිනම් කථාවකින් යුක්ත ව හුන්හු දැ? තොපගේ කවර අතුරුකතාවක් අඩාල කරණ ලද දැ?" "වහන්ස, අප විසින් භාග්‍යවතුන් වහන්සේ ම අරභයාවූ දැහැමි කථාව අඩාල කරණ ලදී. එකල භාග්‍යවතුන් වහන්සේ වැඩිසේකැ"යි සැළ කළහ. "මහණෙනි, මැනවි. මහණෙනි, යම් ලෙසකින් තෙපි දැහැමි කථාවෙන් යුක්ත ව හුන්හුද, එය ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම සසුන්වන් කුලපුත්‍ර වූ තොපට නිසිය. මහණෙනි, රැස්වූ තොප විසින් දැහැමි කථාව හෝ ආර්‍ය්‍යතුෂණීම්භාවය (ද්විතීයධ්‍යානය හෝ මූලකම්ස්ථානය මෙනෙහි කිරීම) යන දෙක කළ යුතුය."

7. මහණෙනි, ආර්‍ය්‍යපර්‍ය්‍යෙෂණය ය, අනාර්‍ය්‍යපර්‍ය්‍යෙෂණායයි මේ සෙවීම් දෙකෙකි.

මහණෙනි, අනාර්‍ය්‍යපර්‍ය්‍යෙෂණ කුමක් දැ? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුහුලෙක් තෙමේ ජාතිය සවභාව කොට ඇත්තේ ජාතිධර්මයක් (ජාතිය සවභාව කොට ඇත්තක්) ම සොයයි. තෙමේ ජරාව සවභාව කොට ඇත්තේ ජරා ධර්මයක් (ජරාව සවභාව, කොට ඇත්තක් ම සොයයි. තෙමේ ව්‍යාධිය සවභාව කොට ඇත්තේ ව්‍යාධිධර්මයක් (ව්‍යාධිය සවභාව කොට ඇත්තක්) ම සොයයි. තෙමේ මරණය සවභාව කොට ඇත්තේ මරණ ධර්මයක් (මරණය සවභාවකොට ඇත්තක්) ම සොයයි. තෙමේ ශෝකය සවභාවකොට ඇත්තේ ශෝක ධර්මයක් (ශෝකය සවභාව කොට ඇත්තක්) ම සොයයි. තෙමේ කෙලෙසන සවභාව ඇත්තේ කෙලෙසන සවභාව ඇත්තක් ම සොයයි.

8. මහණෙනි, කුමක් ජාතිධර්ම යයි කියන්නේ දැ? පුත්‍රදාරාවෝ ජාති ධර්මයෝයි දැසි දස්හු ජාතිධර්මයෝයි. එළුබැටළුවෝ ජාතිධර්මයෝ යි. කුකුළන් හා ඌරෝ ජාතිධර්මයෝ ය. ඇත් ගව අස් වෙළඹහු ජාතිධර්මයෝ ය. රන් රිදී ජාතිධර්මය. මහණෙනි, මේ පඤ්චකාමගුණ උපධීහු ජාතිධර්මයෝ ය. මෙහි තෘෂ්ණාවෙන් බැඳුණා වූ මුසපත් වූ බැසගත්තා වූ මේ ලෝ වැසි තෙමේ ජාතිය සවභාව කොට ඇත්තේ ජාතිධර්මයක් ම සොයයි.

9. මහණෙනි, කුමක් ජරාධර්මයයි කියන්නේ දැ? පුත්‍රභාර්‍ය්‍යාවෝ ජරාධර්මයෝ ය. දැසිදස්හු ජරාධර්මයෝ ය එළු බැටළුවෝ ජරාධර්මයෝ ය. කුකුළන් හා ඌරෝ ජරාධර්මයෝය. ඇත් ගව අස් වෙළඹහු ජරා-ධර්මයෝය. රන්රිදී ජරාධර්මය. මහණෙනි, මේ පඤ්චකාමගුණ ජරාධර්ම වෙති. මේ ලෝවැසි, තෙමේ මෙහි ගැට ගැසුණේ මුසපත් වූයේ බැසගත්තේ තෙමේ ජරාව සවභාව කොට ඇත්තේ ජරාධර්මයක් ම සොයයි.

10. කිඤ්ච භික්ඛවෙ බ්‍යාධිධම්මං වදෙථ? පුත්තභරියං භික්ඛවෙ බ්‍යාධිධම්මං, දාසිදාසං බ්‍යාධිධම්මං, අජෙළකං බ්‍යාධිධම්මං, කුක්කුටසූකරං බ්‍යාධිධම්මං, හත්ථිගවාස්සවළවං බ්‍යාධිධම්මං. බ්‍යාධිධම්මා හෙතෙ භික්ඛවෙ උපධයො. එත්ථායං ගථිතො මුච්ඡිතො අජ්ඣාපන්නො අත්තනා බ්‍යාධිධම්මො සමානො බ්‍යාධිධම්මඤ්ඤෙව පරියෙසති.

11 කිඤ්ච භික්ඛවෙ මරණධම්මං වදෙථ? පුත්තභරියං භික්ඛවෙ මරණධම්මං, දාසිදාසං මරණධම්මං, අජෙළකං මරණධම්මං, කුක්කුටසූකරං මරණධම්මං, හත්ථිගවාස්සවළවං මරණධම්මං. මරණධම්මා හෙතෙ භික්ඛවෙ උපධයො. එත්ථායං ගථිතො මුච්ඡිතො අජ්ඣාපන්නො අත්තනා මරණධම්මො සමානො මරණධම්මඤ්ඤෙව පරියෙසති.

12. කිඤ්ච භික්ඛවෙ සොකධම්මං වදෙථ? පුත්තභරියං භික්ඛවෙ සොකධම්මං, දාසිදාසං සොකධම්මං, අජෙළකං සොකධම්මං, කුක්කුටසූකරං සොකධම්මං, හත්ථිගවාස්සවළවං සොකධම්මං. සොකධම්මා හෙතෙ භික්ඛවෙ උපධයො. එත්ථායං ගථිතො මුච්ඡිතො අජ්ඣාපන්නො අත්තනා සොකධම්මො සමානො සොකධම්මඤ්ඤෙව පරියෙසති.

13. කිඤ්ච භික්ඛවෙ සඞ්කිලෙසධම්මං වදෙථ? පුත්තභරියං භික්ඛවෙ සඞ්කිලෙසධම්මං, දාසිදාසං සඞ්කිලෙසධම්මං, අජෙළකං සඞ්කිලෙසධම්මං, කුක්කුටසූකරං සඞ්කිලෙසධම්මං, හත්ථිගවාස්සවළවං සඞ්කිලෙසධම්මං, ජාතරූපරජතං සඞ්කිලෙසධම්මං. සඞ්කිලෙසධම්මා හෙතෙ භික්ඛවෙ උපධයො. එත්ථායං ගථිතො මුච්ඡිතො අජ්ඣාපන්නො අත්තනා සඞ්කිලෙසධම්මො සමානො සඞ්කිලෙසධම්මඤ්ඤෙව පරියෙසති. අයං භික්ඛවෙ අනරියා පරියෙසනා.

13. කතමා ච භික්ඛවෙ අරියා පරියෙසනා? ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ජාතිධම්මො සමානො ජාතිධම්මෙ ආදීනවං විදිත්වා අජාතං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසති, අත්තනා ජරාධම්මො සමානො ජරාධම්මෙ ආදීනවං විදිත්වා අජරං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසති, අත්තනා බ්‍යාධිධම්මො සමානො බ්‍යාධිධම්මෙ ආදීනවං විදිත්වා අබ්‍යාධිං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසති, අත්තනා මරණධම්මො සමානො මරණධම්මෙ ආදීනවං විදිත්වා අමතං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසති, අත්තනා සොකධම්මො සමානො සොකධම්මෙ ආදීනවං විදිත්වා අසොකං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසති, අත්තනා සඞ්කිලෙසධම්මො සමානො සඞ්කිලෙසධම්මෙ ආදීනවං විදිත්වා අසඞ්කිලිට්ඨං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසති. අයං භික්ඛවෙ අරියා පරියෙසනා.

Free Distribution www.aathaapi.org

10. මහණෙනි, කුමක් ව්‍යාධිධර්මයයි කියත්තේ ද? පුත්‍ර භාර්‍ය්‍යාවෝ ව්‍යාධිධර්මයෝ ය. දාසිදාස්හු ව්‍යාධිධර්මයෝ ය. එළු බැටළුවෝ ව්‍යාධිධර්මයෝය. කුකුළන් හා ඌරෝ ව්‍යාධිධර්මයෝ ය. ඇත් ගව අස් වෙළඹහු ව්‍යාධිධර්මයෝ ය මහණෙනි, මේ පඤ්චකාමගුණ උපධීහු ව්‍යාධිධර්මයෝ ය. මේ ලෝවැසි තෙම මෙහි ගැවගැහුණේ මුසපත් වූයේ බැසගත්තේ තෙමේ ව්‍යාධිය සවභාව කොට ඇත්තේ ව්‍යාධිධර්මයක් ම සොයයි.

11. මහණෙනි, කුමක් මරණධර්මයයි කියත්තේද? මහණෙනි, පුත්‍ර භාර්‍ය්‍යාවෝ මරණධර්මයෝ ය. දාසිදාස්හු මරණධර්මයෝ ය. එළුබැටළුවෝ මරණධර්මයෝ ය. කුකුළන් හා ඌරෝ මරණධර්මයෝ ය. ඇත් ගව අස් වෙළඹහු මරණධර්මයෝ ය. මහණෙනි, මේ උපධීහු මරණධර්මයෝ ය. මේ ලෝ වැසි තෙමේ මෙහි ගෙතුණේ මුසපත් වූයේ බැසගත්තේ තෙමේ මරණය සවභාව කොට ඇත්තේ මරණධර්මයක් ම සොයයි.

12. මහණෙනි, කුමක් ශෝකධර්මයයි කියත්තේද? මහණෙනි පුත්‍රභාර්‍ය්‍යාවෝ ශෝකධර්මයෝ ය දාසිදාස්හු ශෝකධර්මයෝ ය. එළුබැටළුවෝ ශෝකධර්මයෝ ය කුකුළන් හා ඌරෝ ශෝකධර්මයෝ ය. ඇත් ගව අස් වෙළඹහු ශෝකධර්මයෝ ය. මහණෙනි, මේ උපධීහුය. මේ ලෝවැසි තෙම මෙහි වෙළුණේ මුසපත් වූයේ බැසගත්තේ තෙමේ ශෝකය සවභාව කොට ඇත්තේ ශෝකධර්මයක් ම සොයයි.

13. මහණෙනි, කුමක් සංක්ලෙශධර්මයයි කියත්තේද? අඹුදරුවෝ සංක්ලෙශධර්මයෝ ය. දාසිදාස්හු සංක්ලෙශධර්මයෝ ය. එළුබැටළුවෝ සංක්ලෙශධර්මයෝ ය. කුකුළන් හා ඌරෝ සංක්ලෙශධර්මයෝ ය. ඇත් ගව අස් වෙළඹහු සංක්ලෙශධර්මයෝ ය. රන්රිදී සංක්ලෙශධර්මයෝ ය. මහණෙනි, මේ උපධීහු සංක්ලෙශධර්ම වෙත්. මේ ලෝවැසි තෙම මෙහි ගෙතුණේ මුසපත් වූයේ බැසගත්තේ තෙමේ සංක්ලෙශධර්ම වූයේ සංක්ලෙශධර්මයක් ම සොයයි. මහණෙනි, මේ අනාර්‍ය්‍යපර්‍ය්‍යෙෂණයි

14. මහණෙනි, ආර්‍ය්‍යවූ සෙවීම කුමක් ද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැමෙක් තෙමේ ජාතිධර්ම වූයේ ජාතිධර්මයෙහි ආදීනව දැන ජාතියක් නැති නිරුත්තරවූ යොගක්ෂෙම සංඛ්‍යාත නිර්‍වාණය සොයයි. තෙමේ ජරාධර්ම වූයේ ජරාධර්මයෙහි ආදීනව දැන ජරාවක් නැති නිරුත්තර වූ යොගක්ෂෙම වූ නිවන සොයයි. තෙමේ ව්‍යාධිධර්ම වූයේ ව්‍යාධිධර්මයෙහි ආදීනව දැන ව්‍යාධියක් නැති නිරුත්තර යොගක්ෂෙම වූ නිවන සොයයි. තෙමේ මරණධර්ම වූයේ මරණධර්මයෙහි ආදීනව දැන මරණයක් නැති නිරුත්තර යොගක්ෂෙම වූ නිවන සොයයි. තෙමේ ශෝකධර්ම වූයේ ශෝකධර්මයෙහි ආදීනව දැන ශෝකයක් නැති නිරුත්තර යොගක්ෂෙම වූ නිවන සොයයි. තෙමේ සංක්ලෙශධර්ම වූයේ සංක්ලෙශධර්මයෙහි ආදීනව දැන කෙලෙසීමක් නැති නිරුත්තර යොගක්ෂෙම වූ නිවන සොයයි. මහණෙනි, මේ ආර්‍ය්‍යපර්‍ය්‍යෙෂණයි.

15 අහම්පි සුදං භික්ඛවෙ පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධො බොධිසත්තොව සමානො අත්තනා ජාතිධම්මො සමානො ජාතිධම්මඤ්ඤෙව පරියෙසාමි, අත්තනා ජරාධම්මො සමානො ජරාධම්මඤ්ඤෙව පරියෙසාමි, අත්තනා බ්‍යාධිධම්මො සමානො බ්‍යාධිධම්මඤ්ඤෙව පරියෙසාමි, අත්තනා මරණධම්මො සමානො මරණධම්මඤ්ඤෙව පරියෙසාමි, අත්තනා සොකධම්මො සමානො සොකධම්මඤ්ඤෙව පරියෙසාමි, අත්තනා සඞ්කිලෙසධම්මො සමානො සඞ්කිලෙසධම්මඤ්ඤෙව පරියෙසාමි.

16. තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: "කින්නු ඛො අහං අත්තනා ජාතිධම්මො සමානො ජාතිධම්මඤ්ඤෙව පරියෙසාමි, අත්තනා ජරාධම්මො සමානො ජරාධම්මඤ්ඤෙව පරියෙසාමි, අත්තනා බ්‍යාධිධම්මො සමානො බ්‍යාධිධම්මඤ්ඤෙව පරියෙසාමි, අත්තනා මරණධම්මො සමානො මරණධම්මඤ්ඤෙව පරියෙසාමි, අත්තනා සොකධම්මො සමානො සොකධම්මඤ්ඤෙව පරියෙසාමි, අත්තනා සඞ්කිලෙසධම්මො සමානො සඞ්කිලෙසධම්මඤ්ඤෙව පරියෙසාමි, යන්නූනාහං අත්තනා ජාතිධම්මො සමානො ජාතිධම්මෙ ආදීනවං විදිත්වා අජාතං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසෙය්‍යං, අත්තනා ජරාධම්මො සමානො ජරාධම්මෙ ආදීනවං විදිත්වා අජරං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසෙය්‍යං, අත්තනා බ්‍යාධිධම්මො සමානො බ්‍යාධිධම්මෙ ආදීනවං විදිත්වා අබ්‍යාධිං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසෙය්‍යං, අත්තනා මරණධම්මො සමානො මරණධම්මෙ ආදීනවං විදිත්වා අමතං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසෙය්‍යං, අත්තනා සොකධම්මො සමානො සොකධම්මෙ ආදීනවං විදිත්වා අසොකං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසෙය්‍යං, අත්තනා සඞ්කිලෙසධම්මො සමානො සඞ්කිලෙසධම්මෙ ආදීනවං විදිත්වා අසඞ්කිලිට්ඨං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසෙය්‍ය"න්ති.

17. සො ඛො අහං භික්ඛවෙ අපරෙන සමයෙන දහරොව සමානො සුසුකාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා, අකාමකානං මාතාපිතූනං අස්සුමුඛානං රුදන්තානං, කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිං. සො එවං පබ්බජිතො සමානො කිංකුසලගවෙසී අනුත්තරං සන්තිවරපදං පරියෙසමානො යෙන ආළාරො කාලාමො තෙනුපසඞ්කමිං, උපසඞ්කමිත්වා ආළාරං කාලාමං එතදවොචං: 'ඉච්ඡාමහං ආවුසො කාලාම ඉමස්මිං ධම්මවිනයෙ බ්‍රහ්මචරියං චරිතු'න්ති.

18. එවං වුත්තෙ භික්ඛවෙ ආළාරො කාලාමො මං එතදවොච: "විහරතායස්මා, තාදිසො අයං ධම්මො යත්ථ විඤ්ඤූ පුරිසො නචිරස්සෙව සකං ආචරියකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යා"ති. සො ඛො අහං භික්ඛවෙ නචිරස්සෙව ඛිප්පමෙව තං ධම්මං පරියාපුණිං. සො ඛො අහං භික්ඛවෙ තාවතකෙනෙව ඔට්ඨපහතමත්තෙන ලපිතලාපනමත්තෙන ඤාණවාදඤ්ච වදාමි ථෙරවාදඤ්ච. 'ජානාමි පස්සාමී'ති ච පටිජානාමි අහඤ්චෙව අඤ්ඤෙ ච. තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි:

15. මහණෙනි, මම බුදු වීමට පෙර බෝසත් වූයෙම් ම තෙමේ ජාතිධර්මී වූයෙම් ජාතිධර්මියක් ම සෙවීමි. තෙමේ ජරාධර්මී වූයෙම් ජරාධර්මියක් ම සෙවීමි. තෙමේ ව්‍යාධිධර්මී වූයෙම් ව්‍යාධිධර්මියක් ම සෙවීමි. තෙමේ මරණධර්මී වූයෙම් මරණධර්මියක් ම සෙවීමි. තෙමේ ශොකධර්මී වූයෙම් ශොකධර්මියක් ම සෙවීමි. තෙමේ සංක්ලෙශධර්මී වූයෙම් සංක්ලෙශධර්මියක් ම සෙවීමි.

16. මහණෙනි, ඒ මට මේ අදහස විය: "කුමක් නිසා මම තෙමේ ජාතිධර්මී වූයෙම් ජාතිධර්මියක් ම සොයම් ද, තෙමේ ජරාධර්මී වූයෙම් ජරාධර්මියක් ම සොයම් ද, තෙමේ ව්‍යාධිධර්මී වූයෙම් ව්‍යාධිධර්මියක් ම සොයම් ද, තෙමේ මරණධර්මී වූයෙම් මරණධර්මියක් ම සොයම් ද, තෙමේ ශොකධර්මී වූයෙම් ශොකධර්මියක් ම සොයම් ද, තෙමේ සංක්ලෙශධර්මී වූයෙම් සංක්ලෙශධර්මියක් ම සොයම් ද? 'මම ජාතිධර්මී වූයෙම් ජාතිධර්මියෙහි ආදීනව දුන ජාතියක් නැති නිරුත්තර වූ යොගක්ෂෙම වූ නිවන සොයත්තෙම් නම් මැනව. ජරාධර්මී වූයෙම් ජරාධර්මියෙහි ආදීනව දුන ජරාවක් නැති නිරුත්තර වූ යෝගක්ෂේම වූ නිවන සොයත්තෙම් නම් මැනව. තෙමේ ව්‍යාධිධර්මී වූයෙම් ව්‍යාධිධර්මියෙහි ආදීනව දුන ව්‍යාධියක් නැති නිරුත්තර වූ යොගක්ෂෙම වූ නිවන සොයත්තෙම් නම් මැනව. තෙමේ මරණධර්මී වූයෙම් මරණධර්මියෙහි ආදීනව දුන මරණයක් නැති නිරුත්තර වූ යොගක්ෂෙම වූ නිවන සොයත්තෙම් නම් මැනව තෙමේ ශොකධර්මී වූයෙම් ශොකධර්මියෙහි ආදීනව දුන ශෝකයක් නැති නිරුත්තර වූ යෝගක්ෂේම වූ නිවන සොයත්තෙම් නම් මැනව. තෙමේ සංක්ලෙශධර්මී වූයෙම් සංක්ලෙශධර්මියෙහි ආදීනව දුන සංක්ලිෂ්ට නො වූ නිරුත්තර වූ යෝගක්ෂේම වූ නිවන සොයත්තෙම් නම් මැනව"යි කියායි.

17. මහණෙනි, ඒ මම පසුකාලයෙහි ළදරු වූයෙම් ම ඉතා කළුකෙස් ඇත්තෙම් පළමුවන වයස වූ සොඳුරුයොවුනෙන් යුක්ත වූයෙම්, නො කැමැති වූ කඳුළු පිරුණු මුහුණු ඇති මවුපියන් හඬද්දී, කෙස්රැවුළු බා කහවත් හැඳ ගිහි ගෙයින් නික්ම පැවිද්දට පැමිණියෙමි. ඒ මම මෙසේ පැවිදි වූයෙම් 'කුසලය කුමක්දැ'යි සොයනු පිළිවූයෙම් නිරුත්තර වූ උතුම් වූ ශාන්තිපදය සොයමින් ආළාරකාලාම කරා පැමිණියෙමි. පැමිණ ආළාර කාලාමට මෙය කීමි: 'ඇවැත්නි කාලාම, මේ ශාසනයෙහි බඹසර කරන්නට කැමැත්තෙමි.'

18. මහණෙනි, මෙසේ කී කල්හි ආළාර කාලාම මට මෙසේ කීය.: "ආයුෂ්මත් තෙමේ බඹසර වෙසෙවා. යම් තැනක නුවණැති පුරුෂයෙක් නොබෝකලකින් ම සවකීය ආචාර්යවරයන්ගේ ධර්මය තෙමේ දුන ප්‍රත්‍යක්ෂ කොට වෙසේ ද, මේ ධර්මය එබඳු ය". මහණෙනි, ඒ මම නොබෝදිනකින් ම ඒ ධර්මය ප්‍රගුණ කෙළෙමි. (ඒ මම උන් කී දුය පිළිගැනුමට) තොල් පහළ පමණින් ම, උන් කියූ දුය නැවත කීම් පමණෙකින්ම 'දනිමි'යි යන කථාවත්, 'මම එහි ස්ථිරයෙමි' යන කථාවත් කිවෙමි. 'දනිමි'යි ද, 'දකිමි'යි ද මම පිළින කෙළෙමි. අන්‍යයෝ ද මා ගැන එසේ කීහ. මහණෙනි, ඒ මට මේ අදහස වී ය:—

26

"න ඛො ආළාරො කාලාමො ඉමං ධම්මං කෙවලං සද්ධාමත්තකෙන සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමීති පවෙදෙති. අද්ධා ආළාරො කාලාමො ඉමං ධම්මං ජානං පස්සං විහරතී"ති. අථ ඛ්වාහං භික්ඛවෙ යෙන ආළාරො කාලාමො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා ආළාරං කාලාමං එතදවොචං: "කිත්තාවතා නො ආවුසො කාලාම ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසී"ති. එවං වුත්තෙ භික්ඛවෙ ආළාරො කාලාමො ආකිඤ්චඤ්ඤායතනං පවෙදෙසි. තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: "න ඛො ආළාරස්සෙව කාලාමස්ස අත්ථි සද්ධා, මය්හම්පත්ථි සද්ධා. න ඛො ආළාරස්සෙව කාලාමස්ස අත්ථි විරියං, මය්හම්පත්ථි විරියං. න ඛො ආළාරස්සෙව කාලාමස්ස අත්ථි සති, මය්හම්පත්ථි සති. න ඛො ආළාරස්සෙව කාලාමස්ස අත්ථි සමාධි, මය්හම්පත්ථි සමාධි. න ඛො ආළාරස්සෙව කාලාමස්ස අත්ථි පඤ්ඤා, මය්හම්පත්ථි පඤ්ඤා. යන්නූනාහං යං ධම්මං ආළාරො කාලාමො 'සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී'ති පවෙදෙති. තස්ස ධම්මස්ස සච්ඡිකිරියාය පදහෙය්‍ය"න්ති. සො ඛො අහං භික්ඛවෙ නචිරස්සෙව ඛිප්පමෙව තං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසිං.

19. අථ ඛ්වාහං භික්ඛවෙ යෙන ආළාරො කාලාමො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා ආළාරං කාලාමං එතදවොචං: "එත්තාවතා නො ආවුසො කාලාම ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසී"ති. 'එත්තාවතා ඛො අහං ආවුසො ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙමී'ති. "අහම්පි ඛො ආවුසො එත්තාවතා ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී"ති 'ලාභා නො ආවුසො, සුලද්ධං නො ආවුසො, යෙ මයං ආයස්මන්තං තාදිසං සබ්‍රහ්මචාරිං පස්සාම, ඉති යාහං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙමි, තං ත්වං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරසි, යං ත්වං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරසි, තමහං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙමි. ඉති යාහං ධම්මං ජානාමි, තං ත්වං ධම්මං ජානාසි. යං ත්වං ධම්මං ජානාසි, තමහං ධම්මං ජානාමි. ඉති යාදිසො අහං, තාදිසො ත්වං, යාදිසො ත්වං, තාදිසො අහං. එහිදානි ආවුසො, උභොව සන්තා ඉමං ගණං පරිහරාමා'ති. ඉති ඛො භික්ඛවෙ ආළාරො කාලාමො ආචරියො මෙ සමානො අන්තෙවාසිං මං සමානං අත්තනො[1] සමසමං ඨපෙසි, උළාරාය ච මං පූජාය පූජෙසි තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: "නායං ධම්මො නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති, යාවදෙව ආකිඤ්චඤ්ඤායතනූපපත්තියා"ති. සො ඛො අහං භික්ඛවෙ තං ධම්මං අනලංකරිත්වා තස්මා ධම්මා නිබ්බිජ්ජ අපක්කමිං.

1. අත්තතා, මජසං.

“ආලාරකාලාම තෙමේ මේ ධර්මය හුදෙක් ඇදහීම් පමණෙකින් තමන් ‘විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරමි’යි ප්‍රකාශ නොකරයි. ඒකාන්තයෙන් ආලාරකාලාම මේ ධර්මය දත්තේ, දක්තේ වාසය කෙරේය”යි කියායි. මහණෙනි, ඉක්බිති මම ආලාරකාලාම කරා පැමිණියෙමි. පැමිණ ආලාරකාලාමහට මෙය කීමි. “ඇවැත් කාලාමය, කොපමණෙකින් මේ ධර්මය තමන් ප්‍රත්‍යක්ෂ කොට දැන ඊට පැමිණ ප්‍රකාශ කෙරෙහි ද?” මහණෙනි, මෙසේ කී කල්හි ආලාරකාලාම තෙමේ ආකිඤ්චඤ්ඤායතනය ප්‍රකාශ කෙළේය. ඒ මට මේ අදහස විය: “ශ්‍රද්ධාව ඇත්තේ ආලාරකාලාමහට පමණක් නො වේ. මට ද ශ්‍රද්ධාව ඇත. ආලාරකාලාමහට පමණක් ම වීර්‍ය්‍ය ඇත්තේ නො වේ. මට ද වීර්‍ය්‍ය ඇත. ආලාරකාලාමහට පමණක් ම සිහිය ඇත්තේ නො වේ මට ද සිහිය ඇත. ආලාරකාලාමහට පමණක් ම සමාධිය ඇත්තේ නො වේ. මට ද සමාධිය ඇත. ආලාරකාලාමහට පමණක් ම ප්‍රඥාව ඇත්තේ නො වේ. මට ද ප්‍රඥාව ඇත. ආලාරකාලාම තෙමේ ‘යම් ධර්මයක් තමන් විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වෙසෙමි’ යි කියා නම්, මම ඒ ධර්මය ප්‍රත්‍යක්ෂ කිරීමට උත්සාහ කෙරෙම් නම් මැනැවැ”යි කියා යි. මහණෙනි, ඒ මම නොබෝ කලෙකින් ම වහා ම ඒ ධර්මය තමන් විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙළෙමි.

19. මහණෙනි, ඉක්බිති මම ආලාරකාලාම කරා පැමිණියෙමි. පැමිණ ආලාරකාලාමහට “ඇවැත් කාලාමය, මේ පමණෙකින් ම මේ ධර්මය තමන් වෙසෙසින් දැන සාක්ෂාත් කොට ඊට පැමිණ ප්‍රකාශ කෙරෙහිදැ”යි මෙය කීමි. “ඇවත, මම මෙපමණෙකින් ම මේ ධර්මය තමන් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ ප්‍රකාශ කෙරෙමි”යි කී ය. “ඇවත, මම ද මෙපමණෙකින් මේ ධර්මය තමන් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කෙරෙමි” යි කීමි. “ඇවත, යම්බඳු වූ අපි තොප වැනි සබ්‍රහ්මචාරි ආයුෂ්මතකු දක්නමෝ ද, ඒ අපට ලාභය, අපට මනා ලැබුමෙකි. මෙසේ මම යම් ධර්මයක් තමන් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ ප්‍රකාශ කෙරෙම් ද, තෙපි ඒ ධර්මය තමන් ප්‍රත්‍යක්ෂ කොට වෙසෙසින් දැන ඊට පැමිණ වාසය කරව. තෙපි යම් ධර්මයක් තමන් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරන්නහු නම්, මම ඒ ධර්මය තමන් ම වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ ප්‍රකාශ කරමි. මෙසේ යම් ධර්මයක් මම දනිම් ද, ඒ ධර්මය තෙපි දනුව. යම් ධර්මයක් තෙපි දනිහු නම් ඒ ධර්මය මම දනිමි. මෙසේ මම යම්බඳුයෙම් නම්, තෙපි ද එබඳු ව. තෙපි යම්බඳුහු නම්, මම ද එබඳුයෙමි. ඇවැත, දැන් එව. දෙදෙන ම එකතු ව මේ පිරිස පරිහරණය කරමු”යි කියායි. මහණෙනි, මෙසේ ආලාරකාලාම තෙමේ මට ආචාර්‍ය්‍ය වූයේ ම අතවැසි වූ මා තමාට සමතැන තැබී ය. උසස් පූජාවෙතුදු මා පිදී ය. මහණෙනි, ඒ මට මේ අදහස විය: “මේ ධර්මය සසර කලකිරීම සඳහා නො වේ. නො ඇලීම සඳහා නො වේ. නිවන සඳහා නො වේ. කෙලෙස් සන්හිඳුවීම සඳහා නො වේ. විශේෂ දැනීම සඳහා නො වේ. සම්බෝධිය සඳහා නො වේ. නිවන් සඳහා නො පවතියි. මේ ධර්මය ආකිඤ්චඤ්ඤායතනයෙහි ඉපදීමට ම වෙයි.” මහණෙනි, ඒ මම ඒ ධර්මය (ශාන්තපදයට) ප්‍රමාණ නො කොට (මෙයින් කම් නැතැයි සිතා එයින් තෘප්ත නොවී) ඒ ධර්මයෙන් කලකිරී වෙන්ව ගියෙමි

20. සො ඛො අහං භික්ඛවෙ කිංකුසලගවෙසී අනුත්තරං සන්තිවරපදං පරියෙසමානො යෙන උද්දකො[1] රාමපුත්තො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා උද්දකං රාමපුත්තං එතදවොචං: "ඉච්ඡාමහං ආවුසො ඉමස්මිං ධම්මවිනයෙ බ්‍රහ්මචරියං චරිතු"න්ති. එවං වුත්තෙ භික්ඛවෙ උද්දකො රාමපුත්තො මං එතදවොච 'විහරතායස්මා, තාදිසො අයං ධම්මො යත්ථ විඤ්ඤූ පුරිසො නචිරස්සෙව සකං ආචරියකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යා'ති. සො ඛො අහං භික්ඛවෙ නචිරස්සෙව ඛිප්පමෙව තං ධම්මං පරියාපුණිං. සො ඛො අහං භික්ඛවෙ තාවතකෙනෙව ඔට්ඨපහතමත්තෙන ලපිතලාපනමත්තෙන ඤාණවාදඤ්ච වදාමි ථෙරවාදඤ්ච. 'ජානාමි, පස්සාමී'ති ච පටිජානාමි අහඤ්චෙව අඤ්ඤෙ ච.

21. තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: "න ඛො රාමො ඉමං ධම්මං කෙවලං සද්ධාමත්තකෙන සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමීති පවෙදෙසි. අද්ධා රාමො ඉමං ධම්මං ජානං පස්සං විහාසී"ති. අථ ඛ්වාහං භික්ඛවෙ යෙන උද්දකො රාමපුත්තො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා උද්දකං රාමපුත්තං එතදවොචං: "කිත්තාවතා නො ආවුසො රාමො ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසී"ති. එවං වුත්තෙ භික්ඛවෙ උද්දකො රාමපුත්තො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං පවෙදෙසි. තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: "න ඛො රාමස්සෙව අහොසි සද්ධා, මය්හම්පත්ථි සද්ධා. න ඛො රාමස්සෙව අහොසි විරියං, මය්හම්පත්ථි විරියං. න ඛො රාමස්සෙව අහොසි සති, මය්හම්පත්ථි සති. න ඛො රාමස්සෙව අහොසි සමාධි., මය්හම්පත්ථි සමාධි. න ඛො රාමස්සෙව අහොසි පඤ්ඤා, මය්හම්පත්ථි පඤ්ඤා. යන්නූනාහං යං ධම්මං රාමො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමීති පවෙදෙසි, තස්ස ධම්මස්ස සච්ඡිකිරියාය පදහෙය්‍ය"න්ති. සො ඛො අහං භික්ඛවෙ නචිරස්සෙව ඛිප්පමෙව තං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසිං.

22. අථ ඛ්වාහං භික්ඛවෙ යෙන උද්දකො රාමපුත්තො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා උද්දකං රාමපුත්තං එතදවොචං: "එත්තාවතා නො ආවුසො රාමො ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසීති? 'එත්තාවතා ඛො රාමො ආවුසො ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසී'ති අහම්පි ඛො ආවුසො එත්තාවතා ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී"ති.

1. උදකො, මජ්සං.

21. මහණෙනි, ඒ මම 'කිංකුසලගවෙසී' වූයෙම් අනුත්තර වූ උතුම් ශාන්තිපදය සොයන්නෙම් උද්දක රාමපුත්‍රයා කරා පැමිණියෙමි. පැමිණ උද්දක රාමපුත්‍රහට මෙය කීමි: "ඇවැත්නි, මම මේ ශාසනයෙහි බඹසර සරන්නට කැමැත්තෙමි. මහණෙනි මෙසේ කී කල්හි උද්දක රාමපුත්‍ර තෙමේ "ආයුෂ්මත් තෙමේ වෙසේවා. යම් ශාසනයෙක්හි නුවණැති පුරුෂයෙක් නොබෝකලෙකින් ම සවකීය ආචාර්යවරයාගේ ධර්මය තමන් ම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කරන්නේ ද, මේ ධර්මය එබඳු ය" යි මෙය මට කී ය. මහණෙනි, ඒ මම නොබෝකලෙකින් ම ඒ ධර්මය වහා ම ප්‍රගුණ කෙළෙමි. එපමණින් ම (පිළිගැනුමට) තොල් පහළ පමණින් ම, කියන ලද්ද නැවත කීම් පමණෙකින් ම 'දනිමි'යි යන කථාව හා 'එහි ස්ථිර වෙමි' යන කථාව ද කියමි. 'දනිමි'යි, 'දකිමි'යි ද මමත් ප්‍රතිඥ කරමි. අන්‍යයෝ ද මා ගැන එසේ කියති.

21. මහණෙනි, ඒ මට මේ අදහස ඇති විය: "රාම තෙමේ මේ ධර්මය හුදෙක් ශ්‍රද්ධා මාත්‍රයෙන් තමන් ම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කරමි යි ප්‍රකාශ නො කෙළේ ය. රාම තෙමේ මේ ධර්මය ඒකාන්තයෙන් දනිමින් දක්මින් වාසය කෙළේය"යි කියායි. මහණෙනි, ඉක්බිති මම උද්දක රාමපුත්‍රයා වෙත පැමිණියෙමි. පැමිණ රාමපුත්‍ර උද්දකහට මෙය කීමි: "ඇවැත, (ඔබගේ පිතෘ වූ) රාම තෙමේ කොපමණෙකින් මේ ධර්මය තමන් විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට එළඹ ප්‍රකාශ කෙළේද?"යි. මහණෙනි, මෙසේ කී කල්හි රාමපුත්‍ර උද්දක තෙමේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ප්‍රකාශ කෙළේ ය. මහණෙනි, ඒ මට මේ අදහස ඇතිවිය: "ශ්‍රද්ධාව රාමයාට පමණක් නො වී ය. මට ද ශ්‍රද්ධාව ඇත. වීර්‍යය රාමයාට පමණක් නො වී ය. මට ද වීර්‍යය ඇත. සිහිය රාමයාට පමණක් නො වී ය. මට ද සිහිය ඇත. සමාධිය රාමයාට පමණක් නො වී ය. මට ද සමාධිය ඇත. ප්‍රඥව රාමයාට පමණක් නො වී ය. මට ද ප්‍රඥව ඇත. යම් ධර්මයක් රාම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කෙරෙමි යි කීයේ ද, මම ද ඒ ධර්මය ප්‍රත්‍යක්ෂ කිරීමට උත්සාහ කෙරෙම් නම්, යෙහෙකැ"යි කියායි. මහණෙනි, ඒ මම නොබෝකලෙකින් ම වහා ම ඒ ධර්මය තමන් විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ විසීමි.

22. මහණෙනි, ඉක්බිති මම රාමපුත්‍ර උද්දක වෙත එළඹියෙමි. එළඹ උද්දක රාමපුත්‍රහට මෙය කීයෙමි: "ඇවැත්නි, (ඔබ පියාවූ) රාම තෙමේ මේ ධර්මය මෙපමණෙකින් තමන් විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ ප්‍රකාශ කෙළේ ද? ඇවැත්නි (මාගේ පිය වූ) රාම තෙමේ මෙ මතුයෙකින් මේ ධර්මය තමන් විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ ප්‍රකාශ කෙළේය"යි (උද්දක තෙමේ කීය). "ඇවැත්නි, මම ද මෙපමණෙකින් මේ ධර්මය තමන් විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙරෙමි" යි කීමි.

"ලාභා නො ආවුසො, සුලද්ධං නො ආවුසො, යෙ මයං ආයස්මන්තං තාදිසං සබ්‍රහ්මචාරිං පස්සාම. ඉති යං ධම්මං රාමො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසි, තං ත්වං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරසි. යං ත්වං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරසි, තං ධම්මං රාමො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසි. ඉති යං ධම්මං රාමො අඤ්ඤාසි, තං ත්වං ධම්මං ජානාසි. යං ත්වං ධම්මං ජානාසි, තං ධම්මං රාමො අඤ්ඤාසි ඉති යාදිසො රාමො අහොසි. තාදිසො ත්වං, යාදිසො ත්වං, තාදිසො රාමො අහොසි. එහිදානි ආවුසො, ත්වං ඉමං ගණං පරිහරා"ති. ඉති ඛො භික්ඛවෙ උදකො රාමපුත්තො සබ්‍රහ්මචාරී මෙ සමානො ආචරියට්ඨානෙ ච මං ඨපෙසි. උළාරාය ච මං පූජාය පූජෙසි. තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: නායං ධම්මො නිබ්බිදාය න විරාගාය න නිරොධාය න නිබ්බානාය සංවත්තති, යාවදෙව නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපපත්තියාති. සො ඛො අහං භික්ඛවෙ තං ධම්මං අනලංකරිත්වා තස්මා ධම්මා නිබ්බිජ්ජ අපක්කමිං.

23 සො ඛො අහං භික්ඛවෙ කිංකුසලගවෙසී අනුත්තරං සන්තිවරපදං පරියෙසමානො මගධෙසු අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන උරුවෙලා සෙනානිගමො තදවසරිං. තත්ථද්දසං රමණීයං භූමිභාගං, පාසාදිකඤ්ච වනසණ්ඩං, නදිඤ්ච සන්දන්තිං[1] සෙතකං සුපතිත්ථං රමණීයං, සමන්තා ච ගොචරගාමං. තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: "රමණීයො වත[2] භූමිභාගො පාසාදිකො ච වනසණ්ඩො, නදී ච සන්දති සෙතකා සුපතිත්ථා රමණීයා, සමන්තා ච ගොචරගාමො. අලං වතිදං කුලපුත්තස්ස පධානත්ථිකස්ස පධානායා"ති. සො ඛො අහං භික්ඛවෙ තත්ථෙව නිසීදිං "අලමිදං පධානායා"ති.

24 සො ඛො අහං භික්ඛවෙ අත්තනා ජාතිධම්මො සමානො ජාතිධම්මෙ ආදීනවං විදිත්වා අජාතං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසමානො අජාතං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං අජ්ඣගමං. අත්තනා ජරාධම්මො සමානො ජරාධම්මෙ ආදීනවං විදිත්වා අජරං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසමානො අජරං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං අජ්ඣගමං. අත්තනා බ්‍යාධිධම්මො සමානො බ්‍යාධිධම්මෙ ආදීනවං විදිත්වා අබ්‍යාධිං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසමානො අබ්‍යාධිං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං අජ්ඣගමං. අත්තනා මරණධම්මො සමානො මරණධම්මෙ ආදීනවං විදිත්වා අමතං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසමානො අමතං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං අජ්ඣගමං.-

1. සන්දතිං, මජසං. 2. වත භො, මජසං.

"ඇවැත්නි, යම් බඳු වූ අපි තොප වැනි සබ්‍රහ්මචාරි ආයුෂ්මතකු දක්නමෝ ද ඒ අපට ලාභය. අපට මනා ලැබීමෙකි. මෙසේ රාම යම් ධර්මයක් තමත් විශිෂ්ට ඥනයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයම පැමිණ ප්‍රකාශ කෙළේ ද, තෙපින් ඒ ධර්මය තමත් විශිෂ්ට ඥනයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කරව. තෙපි යම් ධර්මයක් තමත් විශිෂ්ට ඥනයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කරවූ ද, (මාගේ පිය වූ) රාම තෙමේත් ඒ ධර්මය තමත් විශිෂ්ට ඥනයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ ප්‍රකාශ කළේ ය. මෙසේ යම් ධර්මයක් (මාගේ පිතෘවූ) රාම තෙමේ දැනගත්තේ ද, ඒ ධර්මය තෙපි දන්නහුය. යම් ධර්මයක් තෙපි දන්නහු ද, ඒ ධර්මය රාම තෙමේ දත්තේ ය. මෙසේ රාම යම්බඳු වූයේ ද, තෙපි එබඳු ව. තෙපි යම්බඳු ද, රාම තෙමේ එබඳු වී ය. ඇවැත්නි, මෙහි එව. දැන් තෙපි මේ පිරිස පරිහරණය කරව." මෙසේ රාම පුත්‍ර උද්දක තෙමේ මාගේ සබ්‍රහ්මචාරී වූයේ ම මා ඇදුරු තනතුරෙහි තැබී ය. මහත් පූජායෙකින් මා පිදිය. මහණෙනි, ඒ මට "මේ ධර්මය සසර කළකිරීම පිණිස නො වෙයි. විරාගය පිණිස නො වෙයි. නිරෝධය පිණිස නො වෙයි. ක්ලෙශව්‍යුපශමය පිණිස නො වෙයි. අභිඥව පිණිස නො වෙයි. සම්බොධිය පිණිස නො වෙයි. නිවන පිණිස නො පවතී. එය හුදෙක් නේවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි ඉපදීම පිණිස පමණක් ම වෙයි" යන මේ අදහස වී ය. මහණෙනි, ඒ මම ඒ ධර්මය (ශාන්තපදයට) ප්‍රමාණ නො වන්නක් කොට මෙයින් කම් නැතැයි සිතා ඒ ධර්මයෙන් කළකිරී බැහැරගියෙමි.

23. මහණෙනි, ඒ මම 'කුසලය කුමක් දැ'යි සොයනසුළු වූයෙම් අනුත්තර උතුම් නිර්වාණපදය සොයමින් මගධ දනව්වෙහි පිළිවෙළින් සැරිසරන්නෙම් උරුවෙලායෙහි සේනානිගමය කරා පැමිණියෙමි. එහි සිත්කලු භූමි භාගය ද, පහදවන වනලැහැබ ද, වැලිතලා ඇති මනා තොටු ඇති සිත්කලු ගලාබස්නා නදිය ද, හාත්පස ගොදුරුගම් ද, දිටිමි. මහණෙනි, ඒ මට මේ අදහස වී ය: භූමිභාගය රමණීය ය. වන ලැහැබ ප්‍රසාද ජනක ය සුදුවැලි තලා ඇති මනා තොටු ඇති සිත්කලු නදිය ද ගලා බස්නී ය. හාත්පස ගොදුරුගම ද වෙයි. ප්‍රධන් කරනු කැමැති කුලපුත්‍රයකුට ප්‍රධන්වීර්‍යය සඳහා මෙය සුදුසු ම ය." මහණෙනි, ඒ මම ප්‍රධන්වීර්‍යය පිණිස "මෙය සුදුසු ම ය" යි සිතා එහි ම (බෝමැඩ) හුන්නෙමි.

24. මහණෙනි, ඒ මම ජාතිධර්ම වූයෙම් ජාති ධර්මයෙහි ආදීනව දැන ඉපදීමක් නැති නිරුත්තර වූ යොගක්ෂෙම වූ නිවන සොයමින් අජාත වූ අනුත්තර වූ යෝගක්ෂේම වූ නිර්වාණය අවබෝධ කෙළෙමි. ජරාධර්ම වූයෙම් ජරාධර්මයෙහි ආදීනව දැන දිරීමක් නැති නිරුත්තර වූ යොගක්ෂෙම වූ නිවන සොයන්නෙම් අජර වූ අනුත්තර වූ යොගක්ෂෙම වූ නිවන අවබෝධ කෙළෙමි. ව්‍යාධිධර්ම වූයෙම් ව්‍යාධිධර්මයෙහි ආදීනව දැන ව්‍යාධියක් නැති නිරුත්තර වූ යොගක්ෂෙම වූ නිර්වාණය සොයමින් අව්‍යාධික වූ අනුත්තර වූ යෝගක්ෂේම වූ නිර්වාණය අවබෝධ කෙළෙමි. මරණධර්ම වූයෙම් මරණධර්මයෙහි ආදීනව දැන මරණයක් නැති නිරුත්තර වූ යෝගක්ෂේම වූ නිවන සොයනෙම් මරණයක් නැති නිරුත්තර වූ යොගක්ෂෙම වූ නිවණට පැමිණියෙමි. –

අත්තනා සොකධම්මො සමානො සොකධම්මෙ ආදීනවං විදිත්වා අසොකං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසමානො අසොකං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං අජ්ඣගමං. අත්තනා සඞ්කිලෙසධම්මො සමානො සඞ්කිලෙසධම්මෙ ආදීනවං විදිත්වා අසඞ්කිලිට්ඨං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසමානො අසඞ්කිලිට්ඨං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං අජ්ඣගමං. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි: 'අකුප්පා මෙ විමුත්ති. අයමන්තිමා ජාති. නත්ථිදානි පුනබ්භවො'ති.

25. තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: අධිගතො ඛො ම්‍යායං ධම්මො ගම්භීරො දුද්දසො දුරනුබොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිතවෙදනීයො. ආලයරාමා ඛො පනායං පජා ආලයරතා ආලයසම්මුදිතා. ආලයරාමාය ඛො පන පජාය ආලයරතාය ආලයසම්මුදිතාය දුද්දසං ඉදං ඨානං යදිදං ඉදප්පච්චයතාපටිච්චසමුප්පාදො. ඉදම්පි ඛො ඨානං දුද්දසං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. අහඤ්චෙව ඛො පන ධම්මං දෙසෙය්‍යං පරෙ ච මෙ න ආජානෙය්‍යුං, සො මමස්ස කිලමථො, සා මමස්ස විහෙසාති. අපිස්සු මං භික්ඛවෙ ඉමා අනච්ඡරියා ගාථා පටිභංසු පුබ්බෙ අස්සුතපුබ්බා:

කිච්ඡෙන මෙ අධිගතං හලං දානි පකාසිතුං,
රාගදොසපරෙතෙහි නායං ධම්මො සුසම්බුධො.
පටිසොතගාමිං නිපුණං ගම්භීරං දුද්දසං අණුං
රාගරත්තා න දක්ඛින්ති[1] තමොක්ඛන්ධෙන ආවටාති[2].

26. ඉතිහ මෙ භික්ඛවෙ පටිසඤ්චික්ඛතො අප්පොස්සුක්කතාය චිත්තං නමති, නො ධම්මදෙසනාය. අථ ඛො භික්ඛවෙ බ්‍රහ්මුනො සහම්පතිස්ස මම චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය එතදහොසි: නස්සති වත භො ලොකො, විනස්සති වත භො ලොකො, යත්‍ර හි නාම තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස අප්පොස්සුක්කතාය චිත්තං නමති, නො ධම්මදෙසනායාති. අථ ඛො භික්ඛවෙ බ්‍රහ්මා සහම්පති සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙවං[3] බ්‍රහ්මලොකෙ අන්තරහිතො මම පුරතො පාතුරහොසි.

1. න දක්ඛන්ති, මජ්ඣං. සයා 2. ආවුටාති, මජ්ඣ. ආවුතා, සයා.
3. එවංමෙව, මජ්ඣං, එවමෙව බො, සයා.

ශොකධර්ම වූයෙම් ශෝකධර්මයෙහි ආදීනව දැන ශෝක රහිත වූ නිරුත්තර වූ යෝගක්ෂේම වූ නිවන සොයන්නෙම් ශෝක රහිත නිරුත්තර යෝගක්ෂේම වූ නිවන අවබෝධ කෙළෙමි. තෙමේ සංක්ලෙශධර්ම වූයෙම් සංක්ලෙශධර්මයෙහි ආදීනව දැන නො කිලිටි වූ නිරුත්තර වූ යෝගක්ෂේම වූ නිවන සොයන්නෙම් අසංක්ලිෂ්ට වූ නිරුත්තර වූ යෝගක්ෂේම වූ නිර්වාණය අවබොධ කෙළෙමි. මාගේ අර්හත් ඵලවිමුක්තිය අකොප්‍ය (ස්ථිර) විය. 'මේ මාගේ අන්තිම උත්පත්තියයි. දැන් පුනර්භවයක් නැතැයි මට ඥනදර්ශනය (සියලු දෙය දන්නා වූ සර්වඥතාඥනය) පහළ විය.

25. මහණෙනි, ඒ මට මේ අදහස විය: "මා අවබොධ කළ මේ ධර්මය ගැඹුරු ය. දැක්මට අවබෝධයට නොපහසු ය. ශාන්තය. ප්‍රණීත ය. තර්කයෙන් බැසගත නො හෙන්නේ ය. නිපුණ ය. පණ්ඩිතයන් විසින් දත යුතු ය. මේ ප්‍රජාතොමෝ පඤ්චකාමගුණ සංඛ්‍යාත ආලයන්හි රමණය කරන්නීය. ආලයන්හි ඇලුණීය පඤ්චකාමගුණයෙහි සතුටු වන්නී ය. පඤ්චකාමගුණ ආලයන්හි රමණය කරණ ආලයන්හි ඇලුණු ආලයන්හි සතුටු ප්‍රජාව විසින්, යම් මේ ඉදප්පච්චයතා (සංස්කාරාදීන්ට ප්‍රත්‍යය වූ අවිද්‍යාදි) පටිච්චසමුප්පාදයක් වේ ද, මේ කාරණය දක්නට නොපහසුය. සියලු සංස්කාරයන්ගේ සංහිඳීම වූ සියලු උපධීන්ගේ දුර ලීම වූ ආශාව නැති කිරීම වූ විරාගය වූ නිරොධය වූ යම් මේ නිවනක් වේ ද, මේ කාරණය ද දැක්මට නොහැකිය. මම දහම් දෙසන්නෙම් නම් අන්‍යයෝ එය දැන නො ගන්නාහු නම්, එය මට ක්ලාන්තියකි. එය මට වෙහෙසකි." කියායි. මහණෙනි, තවද මට නො ඇසූ විරූ අත්‍යාශ්චර්ය වූ මේ ගාථාවෝ වැටහුණාහ:

"මා විසින් දුක සේ අවබොධ කරණ ලද මේ ධර්මය දැන් ප්‍රකාශ කිරීම කම් නැත. රාග ද්වෙෂයන්ගෙන් මැඩුනවුන් විසින් මේ ධර්මය අවබොධ කිරීම පහසු නො වේ. උඩුහොය (චතුස්සත්‍යධර්මය) කරා යන සුලු මෘදු වූ ගැඹුරු වූ අවබොධයට අපහසු වූ සියුම් වූ මේ ධර්මය රාගයෙන් රත් වූ මොහරාශියෙන් වෙළුණු මේ සත්වයෝ නො දක්නාහ

26. මහණෙනි, මෙසේ නුවණින් සලකන්නා වූ මාගේ සිත මන්දෝත්සාහ භාවයට නැමේ. දහම් දෙසීමට නො නැමේ. මහණෙනි, ඉක්බිති සහම්පති මහාබ්‍රහ්මයාට සිය සිතින් මා සිත්හි වූ විතර්කය දැනීමෙන් මේ අදහස විය: "යම් ලෝකයෙක්හි තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේගේ සිත අල්පොත්සාහභාවයට නැමේ ද, දහම් දෙසීමට නො නැමේ ද, පිත්වත්නි, ඒ ලොකය නැසේ. ඒකාන්තයෙන් වැනැසේ." මහණෙනි, ඉක්බිති සහම්පතී බ්‍රහ්ම තෙමේ යම් සේ ශක්තිමත් පුරුෂයෙක් හැකුළු අත දිගු කෙරේ ද, දිගු කළ අත හකුළු වන්නේ ද, එසේ ම බඹලොවින් අතුරුදහන් වූයේ (ක්ෂණයෙන්) මා ඉදිරියෙහි පහළ විය.

27. අථ ඛො භික්ඛවෙ බ්‍රහ්මා සහම්පති එකංසං උත්තරාසඞ්ගං කරිත්වා* යෙනාහං තෙනඤ්ජලිං පණාමෙත්වා මං එතදවොච: "දෙසෙතු භන්තෙ භගවා ධම්මං. දෙසෙතු සුගතො ධම්මං. සන්ති සත්තා අප්පරජක්ඛජාතිකා, අස්සවණතා ධම්මස්ස පරිහායන්ති. භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො"ති ඉදමවොච භික්ඛවෙ බ්‍රහ්මා සහම්පති. ඉදං වත්වා අථාපරං එතදවොච:

"පාතුරහොසි මගධෙසු පුබ්බෙ,
ධම්මො අසුද්ධො සමලෙහි චින්තිතො.
අවාපුරෙතං[1] අමතස්ස ද්වාරං,
සුණන්තු ධම්මං විමලෙනානුබුද්ධං.

සෙලෙ යථා පබ්බතමුද්ධනිට්ඨිතො,
යථාපි පස්සෙ ජනතං සමන්තතො;
තථූපමං ධම්මමයං සුමෙධ,
පාසාදමාරුය්හ සමන්තචක්ඛු;

සොකාවතිණ්ණං[2] ජනතමපෙතසොකො,
අවෙක්ඛස්සු[3] ජාතිජරාභිභූතං

උට්ඨෙහි වීර විජිතසඞ්ගාම සත්ථවාහ අනණ විචර ලොකෙ,
දෙසස්සු[4] භගවා ධම්මං අඤ්ඤාතාරො භවිස්සන්තී"ති.

28. අථ ඛ්වාහං භික්ඛවෙ බ්‍රහ්මුනො ච අජ්ඣෙසනං විදිත්වා සත්තෙසු ච කාරුඤ්ඤතං පටිච්ච බුද්ධචක්ඛුනා ලොකං වොලොකෙසිං. අද්දසං ඛො අහං භික්ඛවෙ බුද්ධචක්ඛුනා ලොකං වොලොකෙන්තො සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ, තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ, ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ [දුවිඤ්ඤාපයෙ], අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනෙ[5] විහරන්තෙ, [අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනෙ විහරන්තෙ]

සෙය්‍යථාපි නාම උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකානුග්ගතානි අන්තොනිමුග්ගපොසීනි, අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි සමොදකං ඨිතානි, අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකා අච්චුග්ගම්ම තිට්ඨන්ති[6] අනුපලිත්තානි උදකෙන. එවමෙව ඛො අහං භික්ඛවෙ බුද්ධචක්ඛුනා ලොකං වොලොකෙන්තො අද්දසං සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ, තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ, ස්වාකාරෙ [ද්වාකාරෙ], සුවිඤ්ඤාපයෙ [දුවිඤ්ඤාපයෙ], අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනෙ විහරන්තෙ, [අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනෙ විහරන්තෙ]* අථ ඛ්වාහං භික්ඛවෙ බ්‍රහ්මානං සහම්පතිං ගාථාය පච්චභාසිං:

*. දක්ඛිණං ජාණුමණ්ඩලං පථවියං නිහන්ත්වා යෙනාහං, මහාවග්ගපාළි.
1. අපාපුරෙත, මජ්ඣං. 2 සොකාවකිණ්ණං, ස්‍යා. 3. අවෙක්ඛසු, ස්‍යා.
4. දෙසෙතු, ස්‍යා. පරලොකාවජ්ජදස්සාවිනො, ස්‍යා. 6. ඨිතානි, මජ්ඣං.
* [-] අන්තරිත පදානි සීමු. පොත්ථකෙසු න දිස්සන්ති.

27. මහණෙනි, ඉක්බිති සහම්පතී මහා බ්‍රහ්ම තෙමේ උතුරුසළුව එකාංස කොට මා වෙත ඇඳිලි බැඳ මට මෙය කීයේ ය: "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසන සේක්වා. මඳකෙලෙස්රජස් සහිත සවභාව ඇති සත්ත්වයෝ ඇත. ධර්මය නො ඇසීමෙන් ඔහු පිරිහෙත්. ධර්මය අවබෝධ කරන්නෝ ඇතැ"යි මහණෙනි, සහම්පතිබ්‍රහ්ම තෙමේ මෙය කිය මෙස කියා යළිත් මේ ගාථා කීය:

"පෙර මගධ දනව්හි කෙලෙස් මල සහිත ශාස්තෲවරයන් විසින් සිතන ලද අශුද්ධ ධර්මයෙක් පහළ විය. මේ නිර්වාණද්වාර විවෘත කරණු මැනැවි. නිර්මල වූ මුඹ වහන්සේ විසින් අවබෝධ කළ ධර්මය සත්ත්වයෝ අසත්වා.

යහපත් ප්‍රඥ ඇති සර්වඥයන් වහන්ස, ශෛලමයපර්වතයක් මුදුනෙහි සිටියෙක් හාත්පස ජන සමූහයා යම්සේ දකී ද, එබඳු උපමා ඇති ධර්මප්‍රාසාදයට නැඟ තමන්වහන්සේ පහ වූ ශොක ඇති සේක් ශොකයෙන් (ජාති ජරාදියෙන්) මැඩුණු සත්ත්ව සමූහයා බලන සේක්වා. මාරසංග්‍රාමය දිනූ වීරයන් වහන්ස, සාර්ථවාහකයන් වහන්ස, කාමච්ඡන්ද සංඛ්‍යාත ණය නැතියාණන් වහන්ස, නැගිසිටිනු මැනව. ලෝකයෙහි හැසිරෙනු මැනව භාග්‍යවතුන් වහන්සේ ධර්මය දේශනා කරණ සේක්වා. අවබෝධ කරන්නෝ ඇතිවන්නාහ."

28. මහණෙනි, ඉක්බිති බ්‍රහ්මයාගේ ආරාධනාවත් ලැබ, සත්ත්වයන් කෙරෙහි කරුණාවත් නිසා බුදුඇසින් (ආසයානුසය ඉන්ද්‍රියපරොපරියත්ත-ඤාණයෙන්) ලොව බලන්නා වූ මම අල්පරජස්ක වූ ද, මහාරජස්ක වූ ද, තීක්ෂණ වූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් ඇත්තා වූ ද, මෘදු ඉන්ද්‍රියයන් ඇත්තා වූ ද, යහපත් වූ ශ්‍රද්ධාදි ආකාර ඇත්තා වූ ද, අයහපත් ශ්‍රද්ධාදි ආකාර ඇත්තා වූ ද, පහසුවෙන් අවබෝධ කරවිය හැක්කා වූ ද, පහසුවෙන් අවබෝධ කරවිය නොහැක්කා වූ ද, සත්ත්වයන් - පරලොව හා වරද (කෙලෙස්) බිය වසයෙන් දක්නාසුලු ව වසන්නා වූ ඇතැමුන් ද, පරලොව හා කෙලෙස් වරද බිය වසයෙන් නොදක්නාසුලු ව වසන්නා වූ ඇතැමුන් ද දිටිමි.

මහණෙනි, යම්සේ උපුල්විලෙක හෝ පියුම් විලෙක හෝ හෙලපියුම්විලෙක හෝ දියෙහි හටගත්තා වූ දියෙහි වැඩුණා වූ දියෙන් උඩට නො නැඟුණා වූ දියෙහි ගැලී පොෂණය වන්නා වූ ඇතැම් උපුල් හෝ රත්පියුම් හෝ හෙලපියුම් හෝ වේද, ජලයෙහි හටගත්තා වූ ජලයෙහි වැඩුණා වූ ජලය හා සම ව සිටියා වූ ඇතැම් උපුල් හෝ රත්පියුම් හෝ හෙලපියුම් හෝ වේ ද, ජලයෙහි හටගත්තා වූ ජලයෙහි වැඩුණා වූ ජලය ඉක්මවා සිටියා වූ ජලයෙන් නො තැවරුණා වූ ඇතැම් උපුල් හෝ රත්පියුම් හෝ හෙලපියුම් හෝ වේ ද, එසේ ම, මහණෙනි, බුදු ඇසින් ලොව බලන්නා වූ මම කෙලෙස් අඩු, කෙලෙස් වැඩි, තියුණු ඉන්ද්‍රියයන් ඇති, මෘදු ඉන්ද්‍රියයන් ඇති, යහපත් ආකාර ඇති, අයහපත් ආකාර ඇති පහසුවෙන් අවබොධ කරවිය හැකි, පහසුවෙන් අවබොධ කරවිය නොහැකි සත්ත්වයන් ද, පරලොව හා කෙලෙස් බිය වශයෙන් දක්නා සුලු ව වසන ඇතැම් සත්ත්වයන් ද, පරලොව හා කෙලෙස් බිය වසයෙන් නො දක්නාසුලු ව වසන්නාවූ ඇතැම් සත්ත්වයන් ද දිටිමි. මහණෙනි, ඉක්බිති මම සහම්පතී බ්‍රහ්මයාට ගාථාවෙන් පිළිවදන් දිනිමි.

අපාරුතා තෙසං අමතස්ස ද්වාරා
යෙ සොතවන්තො පමුඤ්චන්තු සද්ධං.
විහිංසසඤ්ඤී පගුණං නභාසිං,
ධම්මං පණීතං මනුජෙසු බ්‍රහ්මෙති.

29. අථ ඛො භික්ඛවෙ බ්‍රහ්මා සහම්පති 'කතාවකාසො ඛොම්හි භගවතා ධම්මදෙසනායා'ති මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

30. තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: කස්ස නු ඛො අහං පඨමං ධම්මං දෙසෙය්‍යං, කො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතීති? තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: 'අයං ඛො ආළාරො කාලාමො පණ්ඩිතො බ්‍යත්තො මෙධාවී, දීඝරත්තං අප්පරජක්ඛජාතිකො. යන්නූනාහං ආළාරස්ස කාලාමස්ස පඨමං ධම්මං දෙසෙය්‍යං, සො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතී'ති. අථ ඛො මං භික්ඛවෙ දෙවතා උපසඞ්කමිත්වා එතදවොච: 'සත්තාහකාලකතො[1] භන්තෙ ආළාරො කාලාමො'ති. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි: 'සත්තාහකාලකතො[1] ආළාරො කාලාමො'ති. තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: 'මහාජානියො ඛො ආළාරො කාලාමො. සචෙ හි සො ඉමං ධම්මං සුණෙය්‍ය ඛිප්පමෙව ආජානෙය්‍යා'ති

31. තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: කස්ස නු ඛො අහං පඨමං ධම්මං දෙසෙය්‍යං, කො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතීති? තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: 'අයං ඛො උද්දකො[2] රාමපුත්තො පණ්ඩිතො බ්‍යත්තො මෙධාවී, දීඝරත්තං අප්පරජක්ඛජාතිකො. යන්නූනාහං උද්දකස්ස රාමපුත්තස්ස පඨමං ධම්මං දෙසෙය්‍යං, සො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතී'ති. අථ ඛො මං භික්ඛවෙ දෙවතා උපසඞ්කමිත්වා එතදවොච: 'අභිදොසකාලකතො[3] භන්තෙ උද්දකො රාමපුත්තො'ති. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි: 'අභිදොසකාලකතො[3] උද්දකො රාමපුත්තො'ති. තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: 'මහාජානියො ඛො උද්දකො රාමපුත්තො. සචෙ හි සො ඉමං ධම්මං සුණෙය්‍ය ඛිප්පමෙව ආජානෙය්‍යා'ති.

32 තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: කස්ස නු ඛො අහං පඨමං ධම්මං දෙසෙය්‍යං, කො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතීති? තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි:

1. සත්තාහකාලඞ්කතො, මජසං. 2. උදකො, මජසං.
3. අභිදොසකාලඞ්කතො, මජසං.

"යම් කෙනෙක් කන් ඇත්තාහු නම් ඔහු (දූත්) ශ්‍රද්ධාව මුදත්වා (ඉදිරිපත් කෙරෙත්වා). ඔවුනට නිවන් දොර (ම විසින්) විවෘත කරණ ලදී. බ්‍රහ්මය, 'වෙහෙසකි' යන කල්පනා ඇත්තෙම් ප්‍රගුණ වූ උතුම් ධර්මය මිනිසුන් කෙරෙහි නො දෙසීමි.

29. ඉක්බිති සහම්පතීබ්‍රහ්ම තෙම 'භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මදෙශනාවට කරණ ලද අවකාශ ඇත්තෙම් වෙමි' යි මා වැඳ පැදකුණු කොට එහි ම අතුරුදහන් විය.

30. මහණෙනි, ඒ මට "මම පළමු කොට කවරකුට දහම් දෙසන්නෙම් ද, කවරෙක් මේ දහම් වහා අවබොධ කරන්නේ දැ"යි මෙ ධර්මවිතර්කය විය. මහණෙනි, ඒ මට මේ සිත විය: මේ ආලාරකාලාම තෙමේ පණ්ඩිත ය, ව්‍යක්ත ය, නුවණැත්තේ ය. බොහෝ කලක් අල්ප රජසකසවභාව (නිකෙලෙස් පියවි) ඇත්තෙක. මම ආලාරකලාම තවුසාට පළමු කොට දහම් දෙසන්නෙම් නම් මැනව. හෙතෙම මේ ධර්මය වහා ම දැන ගන්නේ ය"යි කියායි. මහණෙනි, අනතුරු ව දෙවියෙක් මා වෙත පැමිණ "වහන්ස, ආලාරකාලාම තෙමේ මින් සත් දවසකට පෙර කලුරිය කළේ ය" යි මෙය කීයේ ය. "ආලාරකාලාම තෙමේ මින් සත් දිනකට පෙර කාලක්‍රියා කෙළේය." යන ඥානදර්ශනය මට ද පහළ විය. මහණෙනි, ඒ මට "ආලාරකාලාම තෙමෙ මහත් පිරිහීම් ඇත්තෙක් විය. ඉදින් හෙතෙම මේ ධර්මය ඇසුයේ නම්, වහා ම දැනගන්නේ ය (මගපල ලබයි)"යි මේ සිත විය.

31. මහණෙනි, ඒ මට "මම කවරකුට පළමුකොට දහම් දෙසම් ද, කවරෙක් මේ ධර්මය වහා ම අවබොධ කරගන්නේ ද" මේ සිත විය. මේ රාම පුත්‍ර උද්දක තෙමේ පණ්ඩිත ය, ව්‍යක්ත ය, නුවණැත්තේ ය. බොහෝ කලක් අල්පරජසකසවභාව ඇත්තේ ය. මම රාම පුත්‍ර උද්දකහට පළමු කොට දහම් දෙසන්නෙම් නම් මැනව. හෙතෙම මේ ධර්මය වහා ම දැනගන්නේ ය" යන අදහස විය. මහණෙනි, ඉක්බිති දෙවියෙක් මා කරා පැමිණ "වහන්ස, රාමපුත්‍ර උද්දක තෙමේ ඊයේ මධ්‍යමරාත්‍රියෙහි කාලක්‍රියා කෙළේ ය"යි කීයේ ය "රාමපුත්‍ර උද්දක තෙමේ ඊයේ රෑ කාලක්‍රියා කෙළේ ය"යි මට ද ඥානදර්ශනය පහළ විය. මහණෙනි, "රාමපුත්‍ර උද්දකහට වූයේ මහත් පිරිහීමෙක. ඉදින් හෙතෙම මේ ධර්මය ඇසුයේ නම්, වහා ම මාර්ගඵල අවබොධ කරන්නේ යයි" මට මේ අදහස වී ය.

32. මහණෙනි, ඒ මට "කවරකුට මම පළමු කොට දහම් දෙසන්නෙම් ද, කවරෙක් මේ ධර්මය වහා ම අවබොධ කරන්නේ ද?" යන අදහස විය.

"බහුකාරා ඛො මෙ පඤ්චවග්ගියා භික්ඛූ යෙ මං පධානපහිතත්තං උපට්ඨහිංසු. යන්නූනාහං පඤ්චවග්ගියානං භික්ඛූනං පඨමං ධම්මං දෙසෙය්‍ය"න්ති. තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: කහං නු ඛො එතරහි පඤ්චවග්ගියා භික්ඛූ විහරන්තීති. අද්දසං ඛො අහං භික්ඛවෙ දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන පඤ්චවග්ගියෙ භික්ඛූ බාරාණසියං විහරන්තෙ ඉසිපතනෙ මිගදායෙ.

33. අථ ඛ්වාහං භික්ඛවෙ උරුවෙලායං යථාභිරන්තං විහරිත්වා යෙන බාරාණසී තෙන චාරිකං පක්කමිං[1]. අද්දසා ඛො මං භික්ඛවෙ උපකො ආජීවකො[2] අන්තරා ච ගයං අන්තරා ච බොධිං අද්ධානමග්ගපටිපන්නං. දිස්වාන මං එතදවොච: විප්පසන්නානි ඛො තෙ ආවුසො ඉන්ද්‍රියානි, පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො. කංසි ත්වං ආවුසො උද්දිස්ස පබ්බජිතො? කො වා තෙ සත්ථා? කස්ස වා ත්වං ධම්මං රොචෙසීති? එවං වුත්තෙ අහං භික්ඛවෙ උපකං ආජීවකං ගාථාහි[3] අජ්ඣභාසිං:

සබ්බාභිභූ සබ්බවිදූහමස්මි
සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො,
සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො
සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං?

න මෙ ආචරියො අත්ථි සදිසො මෙ න විජ්ජති,
සදෙවකස්මිං ලොකස්මිං නත්ථි මෙ පටිපුග්ගලො.

අහං හි අරහා ලොකෙ අහං සත්ථා අනුත්තරො,
එකොම්හි සම්මාසම්බුද්ධො සීතිභූතොස්මි නිබ්බුතො.

ධම්මචක්කං පවත්තෙතුං ගච්ඡාමි කාසිනං පුරං,
අන්ධභූතස්මිං[4] ලොකස්මිං ආහඤ්ඡං[5] අමතදුන්දුභින්ති.

34. 'යථා ඛො ත්වං ආවුසො පටිජානාසි අනන්තජිනො'ති?

"මාදිසා වෙ ජිනා හොන්ති යෙ පත්තා ආසවක්ඛයං,
ජිතා මෙ පාපකා ධම්මා තස්මාහං උපක ජිනො"ති.

එවං වුත්තෙ භික්ඛවෙ උපකො ආජීවකො 'හුවෙය්‍යපාවුසො'ති[6] වත්වා සීසං ඔකම්පෙත්වා උම්මග්ගං ගහෙත්වා පක්කාමි.

1. පක්කාමි, සතා. 2. ආජීවිකො, සීමු. PTS
3. ගාථාය, සතා. 4. අන්ධීභූතස්මිං, මජසං.
5. ආහඤ්ඤිං, සතා. 6. හුපෙය්‍යපාවුසොති, මජසං. හුවෙය්‍යාවුසො, සතා.

මහණෙනි, ඒ මට "යම් පස්වග මහණ කෙනෙක් ප්‍රධන්වීර්‍යයෙහි මෙහෙයූ සිත් ඇති මට උවටන් කළාහු ද, ඒ පස්වග මහණහු මට බොහෝ උපකාර ඇත්තාහ. මම පස්වග මහණුන්ට පළමු ව දහම් දෙසන්නෙම් නම් මැනව යි" මේ අදහස වී ය. මහණෙනි, ඒ මට "දැන් ඒ පස්වග මහණහු කොහි වෙසෙත් දෝ හෝ"යි මේ සිත වී ය. මහණෙනි, මම මිනිසැස ඉක්ම සිටි පිරිසුදු වූ දිවැසින් පස්වග-මහණුන් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයෙහි වසන්නවුන් දිටිමි.

33. මහණෙනි, ඉක්බිති උරුවෙල්දනව්වෙහි කැමැතිතාක් වාසය කොට බරණැස චාරිකාවෙහි ගියෙමි. මහණෙනි, ගයාවටත් බොධියටත් අතර අද්දමගට පිළිපන් උපක නම් ආජීවකයා මා දුටුයේ ය. දැක මට මෙසේ කී ය: "ඇවැත්නි, මුඹවහන්සේගේ චක්ෂුරාදි ඉන්ද්‍රියයෝ විශෙෂයෙන් ප්‍රසන්නයහ. ඡවිවර්ණය පිරිසුදු ය ප්‍රභාස්වර ය. ඇවැත්නි, මුඹවහන්සේ කවරකු උදෙසා පැවිදි වූ සේක් ද? මුඹවහන්සේගේ ශාස්තෘවරයා හෝ කවරේ ද? මුඹවහන්සේ කාගේ ධර්‍මයකට රුචි කරන සේක් ද?" යනුයි. මහණෙනි, මෙසේ කී කල්හි මම උපකආජීවකයාහට ගාථාවෙන් කීමි:

"මම සියල්ල අබිබවා සිටියෙමි. දත යුතු සියල්ල දත්තෙම වෙමි. සියලු ධර්‍මයන්හි නො ඇලුණෙමි. සියලු කෙලෙස් හැර සිටියෙමි. තෘෂ්ණාක්‍ෂය සංඛ්‍යාත නිර්‍වාණයෙහි අරමුණු කිරීමෙන් කෙලෙසුන්ගෙන් මිදුණෙමි. මෙසේ තමන් ම සියල්ල දැන අන් කවරකු ආචාර්‍යවශයෙන් උදෙසන්නෙම් ද?

"මට ලෝකෝත්තරධර්‍මයෙහි ගුරුවරයෙක් නැත. මට සමානයෙක් නැත. දෙවියන් සහිත ලෝකයෙහි මා හට සම පුද්ගලයෙක් නැත.

"ලෝකයෙහි මම ම රහත් වෙමි. මම ම නිරුත්තර වූ ශාස්තෘ වෙමි. මම එක ම සම්මාසම්බුද්ධ වෙමි. සියලු කෙලෙස්ගිනි නිවීමෙන් සිසිල් වූයෙමි. එහෙයින් ම නිවුනෙම් වෙමි.

"මම දම්සක් පැවැත්වීමට කසීරට බරණැස් නුවර බලා යමි. අවිද්‍යාවෙන් අන්ධ වූ ලෝකයෙහි අමාදහම්බෙරය ගසන්නෙමි."

34. 'ඇවැත්නි, මුඹ "අනන්තජින" ය යි පිළින කරණ සේය.' (උපක කීය)

"ආස්‍රවක්‍ෂය සංඛ්‍යාත නිර්‍වාණයට පැමිණියා වූ මා වැනියෝ ඒකාන්තයෙන් 'ජින' නම් වෙති. උපකය, මා විසින් පාපධර්‍මයෝ දිනන ලදහ එහෙයින් මම 'ජින' වෙමි."යි

මෙසේ වදළ කල්හි උපක ආජීවක තෙමේ "ඇවැත්නි, එසේත් වන්නේ වනැ"යි හිස සලා සරස් මඟක් ගෙණ ගියේ ය.

35. අථ ඛ්වාහං භික්ඛවෙ අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන බාරාණසී ඉසිපතනං මිගදායො යෙන පඤ්චවග්ගියා භික්ඛූ තෙනුපසඞ්කමිං. අද්දසාසුං ඛො මං භික්ඛවෙ පඤ්චවග්ගියා භික්ඛූ දූරතොව ආගච්ඡන්තං. දිස්වාන අඤ්ඤමඤ්ඤං සණ්ඨපෙසුං: "අයං ඛො ආවුසො සමණො ගොතමො ආගච්ඡති බාහුලිකො[1] පධානවිබ්භන්තො ආවත්තො බාහුල්ලාය. සො නෙව අභිවාදෙතබ්බො, න පච්චුට්ඨාතබ්බො. නාස්ස පත්තචීවරං පටිග්ගහෙතබ්බං. අපි ච ඛො ආසනං ඨපෙතබ්බං සචෙ ආකඞ්ඛිස්සති නිසීදිස්සතී"ති. යථා යථා ඛො අහං භික්ඛවෙ උපසඞ්කමාමි, තථා තථා පඤ්චවග්ගියා භික්ඛූ නාසක්ඛිංසු සකාය කතිකාය සණ්ඨාතුං. අප්පෙකච්චෙ මං පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙසුං. අප්පෙකච්චෙ ආසනං පඤ්ඤපෙසුං. අප්පෙකච්චෙ පාදොදකං උපට්ඨපෙසුං. අපි ච ඛො මං නාමෙන ච ආවුසොවාදෙන ච සමුදාචරන්ති.

36. එවං වුත්තෙ අහං භික්ඛවෙ පඤ්චවග්ගියෙ භික්ඛූ එතදවොචං: "මා භික්ඛවෙ තථාගතං නාමෙන ච ආවුසොවාදෙන ච සමුදාචරිත්ථ.[2] අරහං භික්ඛවෙ තථාගතො සම්මාසම්බුද්ධො. ඔදහථ භික්ඛවෙ සොතං. අමතමධිගතං. අහමනුසාසාමි. අහං ධම්මං දෙසෙමි. යථානුසිට්ඨං තථා පටිපජ්ජමානා[3] නචිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා"ති.

37. එවං වුත්තෙ භික්ඛවෙ පඤ්චවග්ගියා භික්ඛූ මං එතදවොචුං: "තායපි ඛො ත්වං ආවුසො ගොතම ඉරියාය තාය පටිපදාය තාය දුක්කර-කාරිකාය නාජ්ඣගමා උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං. කිම්පන ත්වං එතරහි බාහුලිකො පධානවිබ්භන්තො ආවත්තො බාහුල්ලාය අධිගමිස්සසි උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසන්ති." එවං වුත්තෙ අහං භික්ඛවෙ පඤ්චවග්ගියෙ භික්ඛූ එතදවොචං: "න භික්ඛවෙ තථාගතො බාහුලිකො, න පධානවිබ්භන්තො, න ආවත්තො බාහුල්ලාය. අරහං භික්ඛවෙ තථාගතො සම්මාසම්බුද්ධො. ඔදහථ භික්ඛවෙ සොතං. අමතමධිගතං. අහමනුසාසාමි. අහං ධම්මං දෙසෙමි. යථානුසිට්ඨං තථා පටිපජ්ජමානා නචිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා"ති.

---

1. බාහුල්ලිකො, මජසං. 2. සමුදාචරථ මජසං.
3. යථානුසිට්ඨං පටිපජ්ජමානා, සතා.

35. මහණෙනි, ඉක්බිති මම පිළිවෙළින් චාරිකා කරන්නෙම් බරණැස ඉසිපතන නම් වූ මිගදායෙහි පස්වගමහණුන් වෙත එළඹියෙමි. මහණෙනි, පස්වග මහණහු එන මා දුර දී ම දුටහ. දැක ඔවුනොවුන් කතිකා කළහ: "ඇවැත්නි, ප්‍රත්‍යය බහුල කොට ඇති බවට පැමිණ ප්‍රධන් වීර්‍යයෙන් පිරිහුණු, ප්‍රත්‍යය බහුල කොට ඇති බවට පෙරළුණු මේ ශ්‍රමණ ගෞතම තෙමෙ එයි. නො ම වැඳිය යුතුය. පෙර ගමන් නො කළ යුතුය. ඔහුගේ පා සිවුරු නො පිළිගත යුතු ය. වැලි, ඉඳින් කැමැත්තේ නම් හිඳින්නේ යයි ආසනයක් තැබිය යුතු"ය කියායි. මහණෙනි, මා ලං ලං වත් ම පස්වග මහණහු තම කතිකායෙහි පිහිටා සිටින්නට නොහැකි වූහ. ඇතැම්හු මට පෙර ගමන් කොට පාසිවුරු ගත්හ. ඇතැම්හු අසුන් පැනවූහ. ඇතැම්හු පාදෙවුන්දිය එළවූහ. එසේ වුවත් මට නාමයෙන් හා 'ආවුසො' වාදයෙන් ව්‍යවහාර කෙරෙති.

36. මහණෙනි, මෙසේ කී කල්හි මම පස්වග මහණුන්ට මේය කීමි "මහණෙනි, තථාගතයන්ට නමිනුත් 'ආවුසො' වාදයෙනුත් ව්‍යවහාර නො කරවු. මහණෙනි, තථාගත තෙමේ රහත් ය. සම්‍යක්සම්බුද්ධ ය. මහණෙනි, කන් යොමු කරවු. අමෘතය අවබොධ කරණ ලදී. මම දහම් දෙසමි. අනුශාසනයට අනුව පිළිපදනාහු - කුලපුත්‍රයෝ යම් නිවනක් සඳහා ගිහිගෙයින් නික්ම පැවිද්දට පැමිණෙද් ද, මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යය අවසන් කොට ඇති නිරුත්තර වූ ඒ නිර්‍වාණය ඉහාත්මයේදී ම තුමූ විශිෂ්ටඥානයෙන් දැන ඊට පැමිණ වාසය කරවු"යි

37. මහණෙනි, මෙසේ කී කල්හි පස්වග මහණහු මට මේය කීහ: "ඇවත ගෞතමයෙනි, මුඹ වහන්සේ ඒ දුෂ්කර වූ ඉරියව්වෙනුත් දුෂ්කර ප්‍රතිපදායෙනුත් දුෂ්කර ක්‍රියායෙනුත්, මනුෂ්‍යධර්මයට වැඩි වූ ආර්‍ය්‍යභාවය ඇති කිරීමට සමර්ථ වූ ඥානදර්ශනවිශෙෂය නො ලැබූ සේක මුඹ වහන්සේ දැන් පිරිකර බහුල කොට ඇති සෙක්, ප්‍රධන්වීර්‍යයෙන් ගිලිහුණු සේක්, පිරිකර බහුල කොට ඇතිබවට පෙරළුණුසේක්, දශකුශලධර්මයට වැඩි වූ ආර්‍ය්‍යභාවය සිදු කිරීමට සමර්ථ වූ ඥානදර්ශන විශෙෂය කිසෙයින් ලැබූ සේක් ද?" මහණෙනි, මෙසේ කී කල්හි මම පස්වග මහණුන්ට මෙය කීමි: "මහණෙනි, තථාගත තෙමේ බාහුලික වූයේ නො වේ. ප්‍රධන්වීර්‍යයෙන් ගිලිහුණේ නො වේ. බාහුලිකත්වයට පෙරළුණේ නො වේ. මහණෙනි, තථාගත තෙමේ රහත් ය සම්‍යක් සම්බුද්ධ ය. මහණෙනි, කන් යොමු කරවු. අමෘතය මා විසින් ලබන ලදී. මම අනුශාසනා කරමි. මම දහම් දෙසමි. අනුශාසනාව යම් සේ ද, එසේ පිළිපදනා වූ තෙපි නො බෝකලෙකින් ම යම් අර්හත්ඵලයක් පිණිස කුලපුත්‍රයෝ මැනවින් ම ගිහිගෙයින් නික්ම පැවිද්දට පැමිණෙද්ද, නිරුත්තර වූ බ්‍රහ්මචර්‍ය්‍යය කෙළවර කොට ඇත්තා වූ ඒ අර්හත්ඵලය තුමූ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරන්නාහුය."

38. දුතියම්පි ඛො භික්ඛවෙ පඤ්චවග්ගියා භික්ඛූ මං එතදවොචුං: "තායපි ඛො ත්වං ආවුසො ගොතම ඉරියාය තාය පටිපදාය තාය දුක්කරකාරිකාය නාජ්ඣගමා උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං. කිම්පන ත්වං එතරහි බාහුලිකො[1] පධානවිබ්භන්තො ආවත්තො බාහුල්ලාය අධිගමිස්සසි උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසන්ති?"

39. දුතියම්පි ඛො අහං භික්ඛවෙ පඤ්චවග්ගියෙ භික්ඛූ එතදවොචං: "න භික්ඛවෙ තථාගතො බාහුලිකො[1] න පධානවිබ්භන්තො, න ආවත්තො බාහුල්ලාය. අරහං භික්ඛවෙ තථාගතො සම්මාසම්බුද්ධො. ඔදහථ භික්ඛවෙ සොතං. අමතමධිගතං. අහමනුසාසාමි. අහං ධම්මං දෙසෙමි. යථානුසිට්ඨං තථා පටිපජ්ජමානා නචිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා"ති.

40. තතියම්පි ඛො භික්ඛවෙ පඤ්චවග්ගියා භික්ඛූ මං එතදවොචුං: "තායපි ඛො ත්වං ආවුසො ගොතම ඉරියාය තාය පටිපදාය තාය දුක්කරකාරිකාය නාජ්ඣගමා උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං. කිම්පන ත්වං එතරහි බාහුලිකො පධානවිබ්භන්තො ආවත්තො බාහුල්ලාය අධිගමිස්සසි උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසන්ති?"

41. එවං වුත්තෙ අහං භික්ඛවෙ පඤ්චවග්ගියෙ භික්ඛූ එතදවොචං "අභිජානාථ මෙ නො තුම්හෙ භික්ඛවෙ ඉතො පුබ්බෙ එවරූපං වබ්භාවිතමෙතන්ති[2] නො හෙතං භන්තෙ. න භික්ඛවෙ තථාගතො බාහුලිකො, න පධානවිබ්භන්තො, න ආවත්තො බාහුල්ලාය. අරහං භික්ඛවෙ තථාගතො සම්මාසම්බුද්ධො. ඔදහථ භික්ඛවෙ සොතං. අමතමධිගතං. අහමනුසාසාමි. අහං ධම්මං දෙසෙමි. යථානුසිට්ඨං තථා පටිපජ්ජමානා නචිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා"ති

---

1. බාහුල්ලිකො, මජසං.
2. භාසිතමෙතන්ති, සීමු, භාවිතමෙතන්ති, කාළුවි, පභාවිතමෙතන්ති, මජසං.

38. මහණෙනි, දෙවනු ද පස්වග මහණහු මට මෙසේ කීහ: "ඇවැත්නි, ගෞතමයෙනි, මුබවහන්සේ ඒ ඉරියව්වෙන් ඒ ප්‍රතිපදාවෙන් ඒ දුෂ්කරක්‍රියාවෙන් මනුෂ්‍ය ධර්මයට වැඩි ආර්ය්‍යභාවය සිදු කිරීමට සමර්ථ වූ ඥනදර්ශන විශෙෂයක් අවබොධ නො කළ සේක. කිම, මුබවහන්සේ දැන් ප්‍රත්‍යය බහුල කොට ඇතිසේක් ප්‍රධන්වීර්යයෙන් ගිලිහුණුසේක් ප්‍රත්‍යය බහුල කොට ඇතිබව පිණිස පෙරළුණු සේක් මනුෂ්‍යධර්මයට වැඩි වූ ආර්ය්‍යභාවය සිදු කිරීමට සමර්ථ වූ ඥනදර්ශනය අවබෝධ කළසේක් ද?"

39. මහණෙනි, දෙවනු ද මම පස්වග මහණන්ට මෙය කීමි: "මහණෙනි, තථාගත තෙමේ බහුලික වූයේ නො වේ. ප්‍රධන්වීර්යයෙන් ගිලිහුණේ නො වේ. ප්‍රත්‍යය බහුලභාවය පිණිස පෙරළුණේ නො වේ. මහණෙනි, තථාගත තෙමේ රහත් ය. සම්‍යක් සම්බුද්ධ ය. මහණෙනි, කන් යොමු කරවු. (මා විසින්) නිවන් අවබෝධ කරණ ලදී. මම අනුශාසනා කරමි. මම දහම් දෙසමි. අනුශාසනාව යම්සේ ද, එසේ පිළිපදනාවූ තෙපි නො බෝකලෙකින් ම යම් අර්ථයක් පිණිස කුලපුත්‍රයෝ මැනවින් ම ගිහි ගෙන් නික්ම පැවිද්දට පැමිණෙද් ද, නිරුත්තර වූ බඹසර කෙළවර කොට ඇති ඒ අර්ථය තුමූ ඉහාත්මයේදී ම අභිඥනයෙන් ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කරන්නහුය."

40 මහණෙනි, තෙවැනිවටත් පස්වග මහණහු මට මෙසේ කීහ: "ඇවැත් ගෞතමයෙනි, මුබ වහන්සේ ඒ ඉරියව්වෙන් ඒ ප්‍රතිපදාවෙන් ඒ දුෂ්කරක්‍රියාවෙන් මිනිස් දහමට වැඩි ආර්ය්‍යභාවය සිදු කිරීමට සමර්ථ වූ ඥනදර්ශනවිශෙෂයක් අවබොධ නො කළසේක. මුබ වහන්සේ දැන් ප්‍රත්‍යය බහුල කොට ඇතිසේක් ප්‍රධන්වීර්‍යයෙන් ගිලිහුණුසේක් ප්‍රත්‍යය බහුල භාවය පිණිස පෙරළුණු සේක් මිනිස්දහමට වැඩි ආර්ය්‍යභාවය සිදු කිරීමට සමර්ථ වූ ඥනදර්ශනය අවබොධ කළසේකැ යනු කිම?"

41 මහණෙනි, මෙසේ කී කල්හි මම පස්වග මහණුන්ට මෙය කීමි: "මහණෙනි, තෙපි මින් පෙර මාගේ මෙබඳු වූ වාග්භෙදයක් (=වචන කිමක් ගැන) දන්නහු ද?" "වහන්ස, එය නො වේ ම ය." මහණෙනි, තථාගත තෙමේ ප්‍රත්‍යය බාහුලික වූයේ නො වේ. ප්‍රධන්-වීර්යයෙන් ගිලිහුණේ නො වේ. ප්‍රත්‍යය විසින් බහුලභාවය පිණිස පෙරළුණේ නො වේ. මහණෙනි, තථාගත තෙමේ රහත් ය. සම්‍යක්සම්බුද්ධය. මහණෙනි, කන් යොමු කරවු. (මා විසින්) නිවන ලබන ලදී. මම අනුශාසනා කරමි. මම දහම් දෙසමි. අනුශාසනාව යම්සේ ද, එසේ පිළිපදිනා වූ තෙපි නොබෝකලකින් ම යම් අර්ථයක් පිණිස කුලපුත්‍රයෝ මනා කොට ම ගිහි ගෙන් නික්ම අනගාරික ශාසනයට පැමිණෙද් ද, ඒ නිරුත්තර වූ බඹසර කෙළවර කොට ඇති රහත්බව ඉහාත්මයේදී ම තුමූ විශිෂ්ටඥනයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කරන්නහු ය."

42. අසක්ඛිං ඛො අහං භික්ඛවෙ පඤ්චවග්ගියෙ භික්ඛූ සඤ්ඤාපෙතුං. ද්වෙපි සුදං භික්ඛවෙ ඔවදමි. තයො භික්ඛූ පිණ්ඩාය චරන්ති. යං තයො භික්ඛූ පිණ්ඩාය චරිත්වා ආහරන්ති, තෙන ඡබ්බග්ගා[1] යාපෙම. තයොපි සුදං භික්ඛවෙ භික්ඛූ ඔවදමි. ද්වෙ භික්ඛූ පිණ්ඩාය චරන්ති. යං ද්වෙ භික්ඛූ පිණ්ඩාය චරිත්වා ආහරන්ති, තෙන ඡබ්බග්ගා යාපෙම.

43. අථ ඛො භික්ඛවෙ පඤ්චවග්ගියා භික්ඛූ මයා එවං ඔවදියමානා එවං අනුසාසියමානා අත්තනා ජාතිධම්මා සමානා ජාතිධම්මෙ ආදීනවං විදිත්වා අජාතං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසමානා අජාතං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං අජ්ඣගමංසු. අත්තනා ජරාධම්මා සමානා ජරාධම්මෙ ආදීනවං විදිත්වා අජරං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසමානා අජරං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං අජ්ඣගමංසු. අත්තනා බ්‍යාධිධම්මා සමානා බ්‍යාධිධම්මෙ ආදීනවං විදිත්වා අබ්‍යාධිං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසමානා අබ්‍යාධිං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං අජ්ඣගමංසු. අත්තනා මරණධම්මා සමානා මරණධම්මෙ ආදීනවං විදිත්වා අමතං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසමානා අමතං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං අජ්ඣගමංසු. අත්තනා සොකධම්මා සමානා සොකධම්මෙ ආදීනවං විදිත්වා අසොකං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසමානා අසොකං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං අජ්ඣගමංසු. අත්තනා සඞ්කිලෙසධම්මා සමානා සඞ්කිලෙසධම්මෙ ආදීනවං විදිත්වා අසඞ්කිලිට්ඨං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසමානා අසඞ්කිලිට්ඨං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං අජ්ඣගමංසු. ඤාණඤ්ච පන නෙසං[3] දස්සනං උදපාදි: "අකුප්පා නො විමුත්ති, අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවො"ති.

44. පඤ්චිමෙ භික්ඛවෙ කාමගුණා. කතමෙ පඤ්ච? චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා - -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච කාමගුණා.

45. යෙ හි කෙචි[4] භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙ පඤ්ච කාමගුණෙ ගථිතා[5] මුච්ඡිතා අජ්ඣාපන්නා[6] අනාදීනවදස්සාවිනො අනිස්සරණපඤ්ඤා පරිභුඤ්ජන්ති, තෙ එවමස්සු වෙදිතබ්බා: අනයමාපන්නා ව්‍යසනමාපන්නා යථාකාමකරණීයා පාපිමතො.

---

1. ඡබ්බග්ගියා, මජසං· ඡබ්බග්ගො, PTS.
2. එවං යාපෙම, මජසං.
3. තෙසං, කත්ථචි.
4. යෙ කෙචි, සයා
5. ගධිතා සයා.
6. අජ්ඣොපන්නා, මජසං· PTS.

Free Distribution www.aathaapi.org

42 මහණෙනි, මම මා බුදුවූබව පස්වග මහණුන් අඟවන්නට හැකිවීමි. මහණෙනි, මම භික්ෂූන් දෙනමකට අවවාද කරමි. භික්ෂූහු තෙනමක් පිඩු පිණිස හැසිරෙත් භික්ෂූහු තිදෙන පිඩුපිණිස හැසිර යමක් ගෙනෙත් ද, එයින් සවග වූ අපි යැපෙමු. මහණෙනි, මම භික්ෂූන් තුන් නමකට අවවාද කරමි භික්ෂූහු දෙ නමක් පිඩු පිණිස හැසිරෙත්. භික්ෂූහු දෙනම පිඩු පිණිස හැසිර යමක් ගෙනෙත් ද, එයින් සවග වූ අපි යැපෙමු.

43 මහණෙනි, මෙසේ මා විසින් අවවාද කරණු ලබන අනුශාසනා කරණු ලබන පස්වග මහණහු තුමූ ඉපදීම සවභාව කොට ඇත්තාහු ජාතිධර්මයෙහි ආදීනව දැන ඉපදීමක් නැති නිරුත්තර වූ යොගක්ෂෙම නම් වූ නිවන සොයන්නාහු ඉපදීමක් නැති නිරුත්තර වූ යොගක්ෂෙම නම් වූ නිවන අවබොධ කළාහු ය තුමූ ජරාව සවභාව කොට ඇත්තාහු ජරාධර්මයෙහි ආදීනව දැන ජරාවක් නැති නිරුත්තර වූ යෝගක්ෂේම නම් වූ නිවන සොයන්නාහු ජරාවක් නැති නිරුත්තර වූ යෝගක්ෂේම නම් වූ නිවන අවබෝධ කළාහුය. තුමූ ව්‍යාධිය සවභාව කොට ඇත්තාහු ව්‍යාධිසවභාවයෙහි දෙස් දැන ව්‍යාධි රහිත වූ නිරුත්තර වූ යොගක්ෂෙම නම් වූ නිවන සොයන්නාහු ව්‍යාධි රහිත වූ නිරුත්තර වූ යොගක්ෂෙම නම් වූ නිවන අවබොධ කළාහුය. තුමූ මරණය සවභාව කොට ඇත්තාහු මරණයෙහි ආදීනව දැන මරණ රහිත වූ නිරුත්තර වූ යොගක්ෂෙම නම් වූ නිවන සොයන්නාහු මරණ රහිත වූ නිරුත්තර වූ යොගක්ෂෙම නම් වූ නිවන අවබෝධ කළාහුය තුමූ ශෝකය සවභාව කොට ඇත්තාහු ශෝකයෙහි ආදීනව දැන ශෝක රහිත වූ නිරුත්තර වූ යෝගක්ෂෙම නම් වූ නිවන සොයන්නාහු ශෝක රහිත වූ නිරුත්තර වූ යෝගක්ෂෙම නම නිවන අවබෝධ කළාහුය. තුමූ කෙලෙසීම සවභාව කොට ඇත්තාහු සංකෙලශධර්මයෙහි ආදීනව දැන නො කිලිටි වූ නිරුත්තර වූ යොගක්ෂෙම නම් වූ නිවන සොයන්නාහු නො කිලිටි වූ නිරුත්තර වූ යොගක්ෂෙම නම් වූ නිවන අවබෝධ කළාහුය. ඔවුන්ට 'අපගේ චිත්ත-විමුක්තිය නිශ්චල ය. මේ අන්තිම ජාතිය යි දැන් පුනර්භවයෙක් නැත' යන ඥානදර්ශනය ද පහළ විය.

44. මහණෙනි, මේ කාමගුණයෝ පස් දෙනකි. කවර පස් දෙනෙක යත්: චක්ෂුර්විඥානයෙන් දත යුතු වූ ඉෂ්ට වූ කාන්ත වූ මන වඩන්නා වූ ප්‍රියසවභාව ඇති කාමරාගයෙන් යුක්ත වූ රාගොත්පත්තියට කාරණ වූ රූපයෝ ය, ශ්‍රොත්‍රවිඥානයෙන් දත යුතු වූ ... ශබ්දයෝ ය, ඝ්‍රාණවිඥානයෙන් දත යුතු වූ... ගන්ධයෝ ය, ජිහ්වාවිඥානයෙන් දත යුතු වූ... රසයෝ ය, කායවිඥානයෙන් දත යුතු වූ ඉෂ්ට වූ කමනීය වූ මන වඩන්නා වූ ප්‍රියසවරූප වූ කාමරාගයෙන් යුක්ත වූ රාගොත්පත්තියට කාරණ වූ ස්ප්‍රෂ්ටව්‍යයෝ ය, යන මොහුයි. මහණෙනි, මොහු පස්කම් ගුණයෝ ය.

45. මහණෙනි, යම් මහණකෙනෙක් හෝ බමුණුකෙනෙක් (මේ පස්කම් ගුණයන්හි) වෙළුනාහු මූසපත් වූවාහු බැසගත්තාහු දෙස් නොදක්නාසුලූ වූවාහු ප්‍රත්‍යවෙක්ෂාඥානයෙන් තොර වූවාහු මේ පස්කම්-ගුණයන් පරිභොග කෙරෙද් ද, ඔහු අනභිවෘද්ධියට පැමිණියාහු ව්‍යසනයට පැමිණියාහු පවිටු මරහු විසින් කැමැති සේ කට යුත්තාහු යි මෙසේ දත යුත්තාහු ය.

46. සෙය්‍යථාපි භික්ඛවෙ ආරඤ්ඤකො මිගො[1] බද්ධො පාසරාසිං අධිසයෙය්‍ය, සො එවමස්ස වෙදිතබ්බො: අනයමාපන්නො බ්‍යසනමාපන්නො යථාකාමකරණීයො ලුද්දස්ස, ආගච්ඡන්තෙ ච පන ලුද්දෙ[2] න යෙන කාමං පක්කමිස්සතීති. එවමෙව ඛො භික්ඛවෙ යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙ පඤ්ච කාමගුණෙ ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා අනාදීනවදස්සාවිනො අනිස්සරණපඤ්ඤා පරිභුඤ්ජන්ති, තෙ එවමස්සු වෙදිතබ්බා: අනයමාපන්නා බ්‍යසනමාපන්නා යථාකාමකරණීයා පාපිමතො.

47. යෙ ච[3] ඛො කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙ පඤ්ච කාමගුණෙ අගථිතා අමුච්ඡිතා අනජ්ඣොපන්නා ආදීනවදස්සාවිනො නිස්සරණපඤ්ඤා පරිභුඤ්ජන්ති, තෙ එවමස්සු වෙදිතබ්බා: න අනයමාපන්නා න බ්‍යසනමාපන්නා න යථාකාමකරණීයා පාපිමතො.

48. සෙය්‍යථාපි භික්ඛවෙ ආරඤ්ඤකො මිගො අබද්ධො පාසරාසිං අධිසයෙය්‍ය, සො එවමස්ස වෙදිතබ්බො: න අනයමාපන්නො න බ්‍යසනමාපන්නො න යථාකාමකරණීයො ලුද්දස්ස, ආගච්ඡන්තෙ ච පන ලුද්දෙ යෙන කාමං පක්කමිස්සතීති. එවමෙව ඛො භික්ඛවෙ යෙ කෙචි සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙ පඤ්ච කාමගුණෙ අගථිතා අමුච්ඡිතා අනජ්ඣොපන්නා ආදීනවදස්සාවිනො නිස්සරණපඤ්ඤා පරිභුඤ්ජන්ති, තෙ එවමස්සු වෙදිතබ්බා: න අනයමාපන්නා න බ්‍යසනමාපන්නා න යථාකාමකරණීයා පාපිමතො.

49. සෙය්‍යථාපි භික්ඛවෙ ආරඤ්ඤකො මිගො අරඤ්ඤෙ පවනෙ විස්සත්ථො ගච්ඡති විස්සත්ථො තිට්ඨති විස්සත්ථො නිසීදති විස්සත්ථො සෙය්‍යං කප්පෙති, තං කිස්ස හෙතු? අනාපාථගතො භික්ඛවෙ ලුද්දස්ස. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු 'අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො'.

1. මගො, මජ්ඣං. PTS. 2. ආගච්ඡන්තෙව ලුද්දෙ, ස්‍යා. PTS.
3. යෙහිච, මජ්ඣං.

Free Distribution www.aathaapi.org

46. මහණෙනි, ආරණ්‍යකමෘගයෙක් මල පුඩුරැස මත යම්සේ ශයනය කරන්නේ නම්, හෙතෙමේ අනභිවෘධියට පැමිණියේ ව්‍යසනයට පැමිණියේ වැද්දා විසින් කැමැති සේ කට යුත්තේ ය. වැද්දා එන කල්හි කැමැති මගකින් නො යන්නේ ය යි මෙසේ දතයුතු වන්නේ ය. මහණෙනි, එපරිද්දෙන් ම යම්කිසි මහණකෙනෙක් හෝ බමුණුකෙනෙක් හෝ පස්කම්ගුණයන්හි ගෙතුනාහු මුසපත් වූවාහු බැසගත්තාහු දෙස් නො දක්නාහුලූ වූවාහු ප්‍රත්‍යවෙක්‍ෂාඥනයෙන් තොර වූවාහු මේ පස්කම්ගුණයන් පරිභොග කෙරෙත් ද, ඔහු විපතට පැමිණියාහු වැසනට පැමිණියාහු පවිටු මරහු විසින් කැමැති සේ කට යුත්තාහු ය යි මෙසේ දත යුතු වන්නාහු ය.

47. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ පස්කම්ගුණයන්හි නො ගෙතුනාහු මුසපත් නො වූවාහු බැස නොගත්තාහු දෙස් දක්නාසුලූ වූවාහු ප්‍රත්‍යවෙක්‍ෂාඥනයෙන් යුක්ත වූවාහු මේ පස්කම්ගුණයන් පරිභොග කෙරෙත් ද, ඔහු විපතට නො පැමිණියාහු ය. ඔහු වැසනට නො පැමිණියාහු ය. පවිටු වූ මරහු විසින් කැමැති සේ කට යුතු නො වන්නාහුය යි මෙසේ දත යුතු වන්නාහු ය

48. මහණෙනි, යම් සේ වනමුවෙක් නො බැඳුනේ මලපුඩු රැස මත හෝනේ ද, හෙතෙමේ විපතට නො පැමිණියේ ය. වැසනට නො පැමිණියේ ය. වැද්දා විසින් කැමැති සේ කට යුතු නොවන්නේ ය. වැද්දා එන කල්හි කැමැති මගකින් පලායන්නේ ය යි මෙසේ දත යුතු වන්නේ ය. මහණෙනි, මේ පරිද්දෙන් ම යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ පස්කම්ගුණයන්හි නො ගෙතුනාහු මුසපත් නො වූවාහු බැස නො ගත්තාහු දෙස් දක්නාසුලූ වූවාහු ප්‍රත්‍යවෙක්‍ෂා-ඥනයෙන් යුක්ත වූවාහු මේ පස්කම්ගුණයන් පරිභොග කෙරෙත් ද, ඔහු විපතට නො පැමිණියෝ ය. වැසනට නො පැමිණියෝ ය. පවිටු මරහු විසින් කැමැති සේ කටයුතු නො වන්නෝ ය යි මෙසේ දත යුතු වන්නාහු ය.

49. මහණෙනි, යම්සේ වනමුවෙක් මහ වනයෙහි හැසිරෙන්නේ බියරහිත වූයේ යේ නම්, බියරහිත වූයේ සිටි නම්, බියරහිත වූයේ හිඳී නම්, බියරහිත වූයේ හොවී නම්, මහණෙනි, ඒ කවරහෙයින යත්: වැද්දාට හමු නො වූ හෙයිනි. මහණෙනි, එපරිද්දෙන් ම මහණ තෙමේ කාමයන්ගෙන් වෙන් ව ම අකුශල ධර්මයන්ගෙන් වෙන් ව ම විතර්ක සහිත විචාර සහිත විවෙකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ද ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි ද, මහණෙනි, මේ භික්‍ෂු තෙමේ මාරයා අන්ධ කෙළේ යයි ද, මාරයාගේ ඇස පිහිටක් නැති සේ නසා පාපී මාරයාගේ නො දක්මට පැමිණියේ යයි ද කියනු ලැබේ.

50. පුන ච පරං භික්ඛවෙ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු 'අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො.'

51. පුන ච පරං භික්ඛවෙ භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යන්තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියං ඣානං උපසම්පජ්ජ විහරති අයං වුච්චති භික්ඛවෙ භික්ඛු 'අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො.'

52. පුන ච පරං භික්ඛවෙ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු 'අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො.'

53. පුන ච පරං භික්ඛවෙ භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු 'අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො'. පුන ච පරං භික්ඛවෙ භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති -පෙ- සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති [ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති -පෙ-] සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම [නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති -පෙ- පුනචපරං භික්ඛවෙ භික්ඛු සබ්බසො] නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො, තිණ්ණො ලොකෙ විසත්තිකං. සො විස්සත්ථො ගච්ඡති, විස්සත්ථො තිට්ඨති, විස්සත්ථො නිසීදති, විස්සත්ථො සෙය්‍යං කප්පෙති. තං කිස්ස හෙතු? අනාපාථගතො භික්ඛවෙ පාපිමතොති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

අරියපරියෙසනසුත්තං ඡට්ඨං.

50 මහණෙනි, නැවත ද අනිකක් වෙයි. මහණ තෙමේ විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් සිය සතන්හි පැහැදීම වූ සිතේ එකඟබව ඇති විතර්ක නැති විචාර නැති සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ද ඇති දෙවැනි ධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි. මේ මහණ තෙමේ 'මාරයා අන්ධ කෙළේ යයි ද, පිහිටක් නැති සේ මරඇස නසා පාපී මාරයාගේ නො දක්මට පැමිණියේ' යයි ද කියනු ලැබේ.

51. මහණෙනි, නැවත ද අනිකක් වෙයි. මහණ තෙමේ ප්‍රීති විරාගයෙන් උපෙක්‍ෂා ඇත්තේ ද සමෘතිමත් වූයේ සම්‍යක්ප්‍රඥා ඇත්තේ ද වාසය කරයි. කයින් සැප ද විඳියි. ආර්‍යයෝ ඒ යමක් 'උපෙක්‍ෂා ඇත්තේ ය. සිහි ඇත්තේ ය. සැප විහරණ ඇත්තේ ය'යි වර්ණනා කරත් ද, ඒ තෙවැනි ධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි. මහණෙනි, මේ මහණ තෙම 'මාරයා අන්ධ කෙළේ ය යි ද, මාරයාගේ ඇස පිහිටක් නැති සේ නසා පාපී මාරයාගේ නො දක්මට පැමිණියේ' ය යි ද කියනු ලැබේ.

52. මහණෙනි, නැවත ද අනිකක් වෙයි. මහණ තෙමේ සැපය නැසීමෙන් ද දුක නැසීමෙන් ද පලමු කොට ම සොම්නස් දොම්නස් වැනසීමෙන් දුක් රහිත වූ සැප රහිත වූ උපෙක්‍ෂා විසින් කල සමෘති-පරිශුද්ධභාව ඇති සිවුවැනි ධ්‍යානට පැමිණ වාසය කෙරෙයි. මහණෙනි, මේ මහණ තෙමේ මාරයා අන්ධ කෙළේ ය යි ද මාරයාගේ ඇස පිහිටක් නැති සේ වනසා පාපී මාරයාගේ නො දක්මට පැමිණියේ' ය යි ද කියනු ලැබේ.

53. මහණෙනි, නැවත ද අනිකක් වෙයි. මහණ තෙමේ සර්‍වප්‍රකාරයෙන් රූපසංඥාවන් ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන් නැසීමෙන් නානාත්වසංඥාවන් නො මෙනෙහි කිරීමෙන් ආකාශය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කෙරෙයි. මහණෙනි, මේ මහණ තෙමේ 'මාරයා අන්ධ කෙළේ ය යි ද, මරඇස පිහිටක් නැති සේ වනසා පාපී මාරයාගේ නො දක්මට පැමිණියේ' ය යි ද කියනු ලැබේ. මහණෙනි, නැවත ද අනිකක් වෙයි. මහණ තෙමේ සර්‍වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චා-යතනයට පැමිණ වාසය කෙරෙයි ... සර්‍වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා ඖදාරික කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කෙරෙයි. ... සර්‍වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤා-නාසඤ්ඤායතනයට පැමිණ වාසය කෙරෙයි.... මහණෙනි, නැවත ද අනිකක් වෙයි. මහණ තෙමේ සර්‍වප්‍රකාරයෙන් නේවසඤ්ඤානාසඤ්ඤා-යතනය ඉක්මවා සඤ්ඤාවෙදයිතනිරෝධයට පැමිණ වාසය කෙරෙයි. ප්‍රඥාවෙන් දැක ඔහුගේ ආස්‍රවයෝ ක්‍ෂීණ වූවාහු වෙත්. මහණෙනි, මේ තෙම 'මාරයා අන්ධ කෙළේ ය. මරඇස පිහිටක් නැති සේ නසා පවිටු මාරයාගේ නො දක්මට පැමිණියේ' ය යි ද කියනු ලැබේ. ලොකයෙහි විසත්තිකා සංඛ්‍යාත තෘෂ්ණාවෙන් එතෙර වූයේ ය. හෙතෙම නිර්භය වූයේ නිර්භය ව සිටියි. නිර්භය ව හිඳියි. නිර්භය ව හොවියි. කවර හෙයින යත්: මහණෙනි, පවිටු මාරයාට හමු නොවූ හෙයිනි.

බුදුරජාණන් වහන්සේ මෙය වදාළසේක. සතුටු වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ.

අරියපරියෙසන සූත්‍රය සමැණියි.

1. 3. 7.

චූළහත්ථිපදොපමසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ජාණුස්සොණි බ්‍රාහ්මණො සබ්බසෙතෙන වළභිරථෙන[1] සාවත්ථියා නිය්‍යාති දිවා දිවස්ස.

2. අද්දසා ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො පිලොතිකං පරිබ්බාජකං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන පිලොතිකං පරිබ්බාජකං එතදවොච:

“හන්ද කුතො නු භවං වච්ඡායනො ආගච්ඡති දිවා දිවස්සා”ති.

ඉතො හි ඛො අහං භො ආගච්ඡාමි සමණස්ස ගොතමස්ස සන්තිකාති

“තං කිං මඤ්ඤති භවං වච්ඡායනො සමණස්ස ගොතමස්ස පඤ්ඤාවෙය්‍යත්තියං, පණ්ඩිතො මඤ්ඤෙ”ති.

කො චාහං භො, කො ච සමණස්ස ගොතමස්ස පඤ්ඤාවෙය්‍යත්තියං ජානිස්සාමි. සොපි නූනස්ස තාදිසොව යො සමණස්ස ගොතමස්ස පඤ්ඤාවෙය්‍යත්තියං ජානෙය්‍යාති.

‘උළාරාය ඛලු භවං වච්ඡායනො සමණං ගොතමං පසංසාය පසංසතී”ති.

කො චාහං භො, කො ච සමණං ගොතමං පසංසිස්සාමි. පසත්ථපසත්ථොව සො භවං ගොතමො, සෙට්ඨො දෙවමනුස්සානන්ති.

“කම්පන භවං වච්ඡායනො අත්ථවසං සම්පස්සමානො සමණෙ ගොතමෙ එවං අභිප්පසන්නො”ති.[2]

3. සෙය්‍යථාපි භො කුසලො නාගවනිකො නාගවනං පවිසෙය්‍ය, සො පස්සෙය්‍ය නාගවනෙ මහන්තං හත්ථිපදං දීඝතො ච ආයතං තිරියඤ්ච විත්ථතං. සො නිට්ඨං ගච්ඡෙය්‍ය: ‘මහා වත භො නාගො’ති. එවමෙව ඛො අහං භො යතො[3] අද්දසං සමණෙ ගොතමෙ චත්තාරි පදානි, අථාහං නිට්ඨමගමං: “සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො”ති.

---

1. වළවාභිරථෙන, මජසං. 2. අභිප්පසන්නො හොතීති, සතා.
3. අහං යතො, සතා. 4. සුප්පටිපන්නො, මජසං.

Free Distribution www.aathaapi.org

1. 3. 7.

චූළහත්ථිපදොපම සූත්‍රය

1. **මා** විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි වූ **ජේතවන** නම් **අනේපිඬු** සිටුහුගේ ආරාමයෙහි වැඩ වාසය කරණ සේක. එසමයෙහි **ජාණුස්සොණි** බ්‍රාහ්මණ තෙමේ සම්සුදු වෙළෙඹුන් යෙදූ රියකින් දෙවෙන්දුවල් සැවැත්නුවර පැදකුණු කරයි.

2. ජාණුස්සොණි බ්‍රාහ්මණ තෙමේ එන්නා වූ පිලොතිකා පරිව්‍රාජකයා දුර දී ම දුටුයේ ය. දුටු පිලොතිකා පරිව්‍රාජකයාහට මෙය කීයේ ය:

"භවත් වාත්ස්‍යායන තෙමේ දුන් දෙවෙන්දුවල් කොහි සිට එන්නේ ද"

"පින්වත, මම මෙහි ශ්‍රමණ ගෞතමයන්ගේ සමීපයෙහි සිට එමි.

"භවත් වාත්ස්‍යායන තෙමේ ශ්‍රමණගෞතමයන්ගේ ප්‍රඥාව හා වියත්බව කිමැයි හඟනේ ද? පණ්ඩිතයෙකැ යි සිතන්නේ ද"

භවත, මම කවරෙකිම් ද, ශ්‍රමණගෞතමයන්ගේ නුවණ හා වියත්බව දැනීමෙහි මම කවරෙකිම් වෙමි ද, යමෙක් ශ්‍රමණගෞතමයන්ගේ නුවණ හා වියත්බව දන්නේ නම්, හෙතෙමේත් ඒකාන්තයෙන් එබඳු (බුදුවරයෙක්) වන්නේ ම ය.

"පින්වත් වාත්ස්‍යායන තෙමේ උදාර වූ ප්‍රශංසාවෙන් ශ්‍රමණගෞතමයන් පසසයි"

පින්වත, මම කවරෙකිම් ද, ශ්‍රමණගෞතමයන් පැසසීමෙහි මම කවරෙකිම් වෙම් ද, ඒ භවත් ගෞතම තෙමේ ප්‍රශස්තගුණයෙන් ප්‍රශස්ත ය, තොහොත් ප්‍රශස්තයන් විසින් ප්‍රශස්ත ය. දෙව් මිනිසුන් අතර ශ්‍රේෂ්ඨ ය.

"පින්වත් වාත්ස්‍යායන තෙමේ කවර කරුණක් දක්නේ ශ්‍රමණ-ගෞතමයන් කෙරෙහි මෙසේ වෙසෙසින් පැහැදුණේ ද"

3. පින්වත, යම් සේ නාගවනවාසී (ඇතුන් වසන වනයෙහි වසන) දක්ෂ පුරුෂයෙක් ඇත්වනයට ඇතුළු වේ ද, හෙතෙම නාගවනයෙහි දිගිනුදු දික් වූ සරසිනුදු පුළුල් වූ මහඇත්පියක් දක්නේ ද, හෙතෙමේ 'පින්වත, මහ ඇතෙකැ'යි නිශ්චයට පැමිණෙන්නේ ය. පින්වත, එසේ ම මම යම් තැනක පටන් ශ්‍රමණගෞතමයන් වෙත ඥානපද සතරක් දිටිම් ද, ඉක්බිති මම භාග්‍යවතුන් වහන්සේ 'සම්‍යක්සම්බුද්ධයහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාඛ්‍යාත ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුප්‍රතිපන්නය'යි නිෂ්ඨාවට පැමිණියෙමි.

4. කතමානි චත්තාරි?

ඉධාහං භො පස්සාමි එකච්චෙ ඛත්තියපණ්ඩිතෙ නිපුණෙ කතපරප්පවාදෙ වාලවෙධිරූපෙ, වොභින්දන්තා[1] මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි. තෙ සුණන්ති: සමණො ඛලු භො ගොතමො අමුකං නාම ගාමං වා නිගමං වා ඔසරිස්සතීති. තෙ පඤ්හං අභිසඞ්ඛරොන්ති: ඉමං මයං පඤ්හං සමණං ගොතමං උපසඞ්කමිත්වා පුච්ඡිස්සාම, එවඤ්චෙ නො පුට්ඨො එවං ව්‍යාකරිස්සති, එවමස්ස මයං වාදං ආරොපෙස්සාම. එවඤ්චෙපි නො පුට්ඨො එවං ව්‍යාකරිස්සති, එවම්පිස්ස මයං වාදං ආරොපෙස්සාමාති.

තෙ සුණන්ති: සමණො ඛලු භො ගොතමො අමුකං නාම ගාමං වා නිගමං වා ඔසටොති. තෙ යෙන සමණො ගොතමො තෙනුපසඞ්කමන්ති. තෙ සමණො ගොතමො ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. තෙ සමණෙන ගොතමෙන ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා න චෙව සමණං ගොතමං පඤ්හං පුච්ඡන්ති, කුතස්ස වාදං ආරොපෙස්සන්ති, අඤ්ඤදත්ථු සමණස්සෙව ගොතමස්ස සාවකා සම්පජ්ජන්ති. යදාහං භො සමණෙ ගොතමෙ ඉමං පඨමං පදං අද්දසං, අථාහං නිට්ඨමගමං: සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝොති [පඨමං ඤාණපදං.]

5. පුන ච පරාහං භො පස්සාමි ඉධෙකච්චෙ බ්‍රාහ්මණපණ්ඩිතෙ නිපුණෙ කතපරප්පවාදෙ වාලවෙධිරූපෙ, වොභින්දන්තා මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි. තෙ සුණන්ති: සමණො ඛලු භො ගොතමො අමුකං නාම ගාමං වා නිගමං වා ඔසරිස්සතීති. තෙ පඤ්හං අභිසඞ්ඛරොන්ති: ඉමං මයං පඤ්හං සමණං ගොතමං උපසඞ්කමිත්වා පුච්ඡිස්සාම, එවඤ්චෙ නො පුට්ඨො එවං ව්‍යාකරිස්සති, එවමස්ස මයං වාදං ආරොපෙස්සාම, එවඤ්චෙපි නො පුට්ඨො එවං ව්‍යාකරිස්සති එවම්පිස්ස මයං වාදං ආරොපෙස්සාමාති.

තෙ සුණන්ති: සමණො ඛලු භො ගොතමො අමුකං නාම ගාමං වා නිගමං වා ඔසටොති; තෙ යෙන සමණො ගොතමො තෙනුපසඞ්කමන්ති. තෙ සමණො ගොතමො ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. -

1. තෙ භින්දන්තා, මජසං. සයා.

4. කවර ඤාණපද සතරෙක් ද යත්:

පින්වත, මම මේ ලොකයෙහි යම් කෙනෙක් සවකීය ප්‍රඥාවෙන් අනුන්ගේ දෘෂ්ටීන් බිඳින්නාක් මෙන් හැසිරෙද්ද, එබඳු වූ සියුම් බුද්ධි ඇති අනුන් හා කලවිරූ වාද ඇති වාලවෙධි දුනුවායන් වැනි වූ ඇතැම් ක්ෂත්‍රියපණ්ඩිත කෙනෙකුන් දකිමි. ඔහු ශ්‍රමණ භවත් ගෞතම තෙමේ 'අසුවල් ගමට හෝ නියම්ගමට හෝ පැමිණේ ය'යි අසත්. ඔහු ප්‍රශ්න අභිසංස්කරණ කරත්: 'අපි මේ ප්‍රශ්න ශ්‍රමණ ගෞතමයන් කරා පැමිණ විචාරන්නෙමු. ඉදින් මෙසේ අප විසින් විචාරණ ලද්දේ මෙසේ විසඳන්නේ නම්, මෙසේ අපි ඔබට වාදාරොපණය කරන්නෙමු. මෙසේත් අප විසින් විචාරණ ලද්දේ මෙසේ විසඳන්නේ නම්, ඔබට මෙසේත් අපි වාදාරොපණය කරන්නෙමු'යි කියා යි.

ඔහු 'ශ්‍රමණ භවත් ගෞතම තෙමේ අසුවල් ගමට හෝ නියම්ගමට හෝ පැමිණියේය'යි අසත්. ඔහු ශ්‍රමණ භවත් ගෞතමයන් වෙත පැමිණෙත්. ශ්‍රමණ භවත් ගෞතමයෝ ඔවුන්ට දැහැමි කථාවෙන් කරුණු දක්වති. සමාදන් කරවති. තියුණු කරවති. සතුටු කරවති. ඔහු ශ්‍රමණ භවත් ගෞතමයන් විසින් දැහැමි කථාවෙන් කරුණු දක්වන ලද්දාහු සමාදන් කරවන ලද්දාහු තෙද ගන්වන ලද්දාහු සතුටු කරවන ලද්දාහු ශ්‍රමණගෞතමයන් අතින් ප්‍රශ්න නො විචාරන්නම ය. කොයින් උන්වහන්සේට වාදාරෝපණය කරන්නාහු ද? ඒකාන්තයෙන් ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ම ශ්‍රාවකයෝ වෙත්. පින්වත, යම් දිනෙක මම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කෙරෙහි මේ පළමුවන පදය දිටිම් ද, ඉක්බිති මම භාග්‍යවතුන් වහන්සේ සම්‍යක්සම්බුද්ධයහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාඛ්‍යාත ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසංඝ තෙමේ සුප්‍රතිපන්නය'යි නිශ්චයට ගියෙමි. [පළමුවැනි ඥානපදය.]

5 නැවත අනිකක් ද වෙයි. පින්වත, මම මේ ලෝකයෙහි යම් කෙනෙක් සවකීයප්‍රඥාවෙන් අනුන්ගේ දෘෂ්ටීන් බිඳිමින් මෙන් හැසිරෙත් ද, එබඳු වූ සියුම් බුද්ධි ඇති අනුන් හා කළවිරූ වාද ඇති වාලවෙධි දුනුවායන් වැනි වූ ඇතැම් බමුණුපඬිවරුන් දකිමි. ඔහු 'ශ්‍රමණභවත්ගෞතම තෙමේ අසුවල් ගමට හෝ නියම්ගමට හෝ පැමිණේය 'යි අසත්. ඔහු ප්‍රශ්න සකස් කරත්: 'අපි මේ ප්‍රශ්න ශ්‍රමණ ගෞතමයන් වෙත එළඹ විචාරන්නෙමු ඉදින් අප විසින් මෙසේ විචාරණ ලද්දේ මෙසේ විසඳන සේක. අපි මෙසේ උන්වහන්සේට වාදාරෝපණය කරන්නෙමු. ඉදින් අප විසින් මෙසේ විචාරණ ලද උන්වහන්සේ මෙසේ විසඳන්නේ ය. අපි මෙසේත් ඔහුට වාදාරෝපණය කරන්නෙමු යි කියාහි.

ඔහු 'ශ්‍රමණ ගෞතමයෝ අසුවල් ගමට හෝ නියම්ගමට හෝ පැමිණියහ'යි අසත්. ඔහු ශ්‍රමණ භවත් ගෞණමයන් වෙත පැමිණෙත්. ශ්‍රමණ ගෞතම තෙමේ ඔවුන්ට දැහැමි කථාවෙන් කරුණු දක්ව යි. සමාදන් කරව යි. තෙද ගන්වයි සතුටු කරවයි. -

තෙ සමණෙන ගොතමෙන ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා න චෙව සමණං ගොතමං පඤ්හං පුච්ඡන්ති කුතස්ස වාදං ආරොපෙස්සන්ති. අඤ්ඤදත්ථු සමණස්සෙව ගොතමස්ස සාවකා සම්පජ්ජන්ති. යදාහං භො සමණෙ ගොතමෙ ඉමං දුතියං පදං අද්දසං, අථාහං නිට්ඨමගමං: සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝොති. [දුතියං ඤාණපදං.]

6 පුන ච පරාහං භො පස්සාමි ඉධෙකච්චෙ ගහපතිපණ්ඩිතෙ නිපුණෙ කතපරප්පවාදෙ වාලවෙධිරූපෙ, වොභින්දන්තා මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි. තෙ සුණන්ති: සමණො ඛලු භො ගොතමො අමුකං නාම ගාමං වා නිගමං වා ඔසරිස්සතීති. තෙ පඤ්හං අභිසංඛරොන්ති: ‘‘ඉමං මයං පඤ්හං සමණං ගොතමං උපසඞ්කමිත්වා පුච්ඡිස්සාම. එවඤ්චෙ නො පුට්ඨො එවං ව්‍යාකරිස්සති. එවමස්ස මයං වාදං ආරොපෙස්සාම. එවඤ්චෙපි නො පුට්ඨො එවං ව්‍යාකරිස්සති. එවම්පිස්ස මයං වාදං ආරොපෙස්සාමා’’ති.

තෙ සුණන්ති: සමණො ඛලු භො ගොතමො අමුකං නාම ගාමං වා නිගමං වා ඔසටොති තෙ යෙන සමණො ගොතමො තෙනුපසඞ්කමන්ති. තෙ සමණො ගොතමො ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. තෙ සමණෙන ගොතමෙන ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා න චෙව සමණං ගොතමං පඤ්හං පුච්ඡන්ති. කුතස්ස වාදං ආරොපෙස්සන්ති. අඤ්ඤදත්ථු සමණස්සෙව ගොතමස්ස සාවකා සම්පජ්ජන්ති. යදාහං භො සමණෙ ගොතමෙ ඉමං තතියං පදං අද්දසං, අථාහං නිට්ඨමගමං: සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝොති. [තතියං ඤාණපදං.]

7. පුන ච පරාහං භො පස්සාමි ඉධෙකච්චෙ සමණපණ්ඩිතෙ නිපුණෙ කතපරප්පවාදෙ වාලවෙධිරූපෙ, වොභින්දන්තා මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි. තෙ සුණන්ති: සමණො ඛලු භො ගොතමො අමුකං නාම ගාමං වා නිගමං වා ඔසරිස්සතීති. තෙ පඤ්හං අභිසංඛරොන්ති: ‘‘ඉමං මයං පඤ්හං සමණං ගොතමං උපසඞ්කමිත්වා පුච්ඡිස්සාම. එවඤ්චෙ නො පුට්ඨො එවං ව්‍යාකරිස්සති. එවමස්ස මයං වාදං ආරොපෙස්සාම එවඤ්චෙපි නො පුට්ඨො එවං ව්‍යාකරිස්සති. එවම්පිස්ස මයං වාදං ආරොපෙස්සාමා’’ති.

ශ්‍රමණ ගෞතමයන් විසින් දැහැමි කථාවෙන් කරුණු දක්වනු ලැබූ, සමාදන් කරවනු ලැබූ, තියුණු කරවනු ලැබූ, සතුටු කරවනු ලැබූ, ඔහු ශ්‍රමණ ගෞතමයන් වහන්සේගෙන් ප්‍රශ්න නො විචාරන්නේ ම ය. කොයින් ඔබට වාදාරෝපණය කෙරෙත් ද? ඒකාන්තයෙන් ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ම ශ්‍රාවකයෝ වෙත්. පින්වත, යම් දිනෙක මම ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි මේ දෙවැනි ඥානපදය දිටිම් ද, ඉක්බිති මම 'භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධ යහ. ධර්මය භාග්‍යවතුන් වහන්සේ විසින් ස්වාඛ්‍යාත ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුප්‍රතිපන්නය'යි නිශ්චයට පැමිණියෙමි. [දෙවැනි ඥානපදය.]

6. නැවත අනිකක් ද වෙයි. පින්වත, මම මේ ලෝකයෙහි යම් කෙනෙක් සවකීය ප්‍රඥාවෙන් අනුන්ගේ දෘෂ්ටීන් බිඳිමින් මෙන් හැසිරෙත් ද, එබඳු වූ සියුම් වූ බුද්ධි ඇති අනුන් හා කලවිරූ වාද ඇති වාලවෙධි දුනුවාවන් වැනි වූ ඇතැම් ගෘහපතිපණ්ඩිතයන් දකිමි. ඔහු ශ්‍රමණ භවත් ගෞතමයෝ අසුවල් ගමට හෝ නියම්ගමට හෝ එන්ල යි අසත්. ඔහු ප්‍රශ්න සකස් කරත්: 'අපි මේ ප්‍රශ්න ශ්‍රමණ ගෞතමයන් කරා එළඹ විචාරන්නෙමු. මෙසේ අප විසින් විචාරණ ලද්දේ මෙසේ ප්‍රකාශ කරන්නේය. අපි මෙසේ ඔහුට වාදාරෝපණය කරන්නෙමු. ඉදින් අප විසින් මෙසේත් විචාරණ ලද්දේ මෙසේ ප්‍රකාශ කරන්නේය. අපි මෙසේත් ඔහුට වාදාරෝපණය කරන්නෙමු' කියායි.

ඔහු 'ශ්‍රමණ භවත් ගෞතමයෝ අසුවල් ගමට හෝ නියම්ගමට පැමිණියහ'යි අසත්. ඔහු ශ්‍රමණ ගෞතමයන් වෙත එළඹෙත්. ශ්‍රමණ ගෞතමයෝ ඔවුන්ට දැහැමි කථාවෙන් කරුණු දක්වති. සමාදන් කරවති. තෙදගන්වති. සතුටු කරවති ශ්‍රමණ ගෞතමයන් විසින් දැහැමි කථාවෙන් කරුණු දක්වනු ලැබූ, සමාදන් කරවනු ලැබූ, තෙදගන්වනු ලැබූ, සතුටු කරවනු ලැබූ, ඔහු ශ්‍රමණ ගෞතමයන් ප්‍රශ්න නො විචාරත් ම ය. කොයින් ඔබට වාදාරෝපණය කෙරෙත් ද? ඒකාන්තයෙන් ශ්‍රමණ ගෞතමයන්ගේ ම ශ්‍රාවකයෝ වෙත්. පින්වත, මම යම් දිනෙක ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි මේ තුන්වන ඥාන පදය දිටිම් ද, ඉක්බිති මම 'භාග්‍යවතුන් වහන්සේ සම්‍යක්සම්බුද්ධයහ ධර්මය භාග්‍යවතුන් වහන්සේ විසින් ස්වාඛ්‍යාත ය. භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න ය'යි නිශ්චයට පැමිණියෙමි. [තෙවැනි ඥානපදය]

7. නැවත ද අනිකක් වෙයි. පින්වත, මම මේ ලෝකයෙහි යම් කෙනෙක් සවකීය ප්‍රඥාවෙන් අනුන්ගේ දෘෂ්ටීන් බිඳිමින් මෙන් හැසිරෙත් ද, එබඳු වූ සියුම් බුද්ධි ඇති අනුන් හා කලවිරූ වාද ඇති වාලවෙධි දුනුවාවන් වැනි වූ ඇතැම් ශ්‍රමණ පණ්ඩිතයන් දකිමි. ඔහු 'ශ්‍රමණ භවත් ගෞතමයෝ අසුවල් ගමට හෝ නියම් ගමට එන්ල යි අසත්. ඔහු ප්‍රශ්න සකස් කරත්: 'අපි මේ ප්‍රශ්න ශ්‍රමණ ගෞතමයන් වෙත එළඹ විචාරන්නෙමු. ඉදින් මෙසේ අප විසින් විචාරණ ලද්දේ මෙසේ විසඳන්නේ ය. අපි මෙසේ ඔහුට වාදාරෝපණය කරන්නෙමු. ඉදින් මෙසේත් විචාරණ ලද්දේ මෙසේ විසඳන්නේ ය. අපි මෙසේත් ඔහුට වාදාරෝපණය කරන්නෙමු' කියා යි.

8. තෙ සුණන්ති: සමණො ඛලු භො ගොතමො අමුකං නාම ගාමං වා නිගමං වා ඔසටොති තෙ යෙන සමණො ගොතමො තෙනුපසඞ්කමන්ති. තෙ සමණො ගොතමො ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. තෙ සමණෙන ගොතමෙන ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා න චෙව සමණං ගොතමං පඤ්හං පුච්ඡන්ති, කුතස්ස වාදං ආරොපෙස්සන්ති. අඤ්ඤදත්ථු සමණඤ්ඤෙව ගොතමං ඔකාසං යාචන්ති අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය. තෙ සමණො ගොතමො පබ්බාජෙති උපසම්පාදෙති. තෙ තත්ථ පබ්බජිතා සමානා එකෙ වූපකට්ඨා අප්පමත්තා. නචිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති. තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති. තෙ එවමාහංසු: මනං වත භො අනස්සාම, මනං වත භො පනස්සාම, මයං හි පුබ්බෙ අස්සමණාව සමානා සමණම්හාති පටිජානිම්හ, අබ්‍රාහ්මණාව සමානා බ්‍රාහ්මණම්හාති පටිජානිම්හ, අනරහන්තාව සමානා අරහන්තම්හාති පටිජානිම්හ. ඉදානි ඛොම්හ සමණා. ඉදානි ඛොම්හ බ්‍රාහ්මණා. ඉදානි ඛොම්හ අරහන්තොති. යදාහං භො සමණෙ ගොතමෙ ඉමං චතුත්ථං පදං අද්දසං, අථාහං නිට්ඨමගමං: සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුප්පටිපන්නො භගවතො සාවකසඞ්ඝොති. [චතුත්ථං ඤාණපදං]

9. යතො ඛො අහං භො සමණෙ ගොතමෙ ඉමානි චත්තාරි පදානි අද්දසං, අථාහං නිට්ඨමගමං: සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුප්පටිපන්නො භගවතො සාවකසඞ්ඝොති.

10. එවං වුත්තෙ ජාණුස්සොණි බ්‍රාහ්මණො සබ්බසෙතා වළභීරථා ඔරොහිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා තික්ඛත්තුං උදානං උදානෙසි. "නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස, නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස, නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස" අප්පෙවනාම මයං කදාචි කරහචි තෙන භොතා ගොතමෙන සද්ධිං සමාගච්ඡෙය්‍යාම, අප්පෙවනාම සියා කොචිදෙව කථාසල්ලාපොති.

8. ඔහු 'ශ්‍රමණ ගෞතමයෝ අසුවල් ගමට හෝ නියම් ගමට පැමිණියහ'යි අසත්. ඔහු ශ්‍රමණ ගෞතමයන් කරාපැමිණෙත්. ශ්‍රමණ ගෞතමයෝ ඔවුන්ට දැහැමි කථාවෙන් කරුණු දක්වති. සමාදන් කරවති. තෙදගන්වති. සතුටු කරවති. ශ්‍රමණ ගෞතමයන් විසින් දැහැමි කථාවෙන් කරුණු දක්වන ලද සමාදන් කරවන ලද තෙද ගන්වන ලද සතුටු කරවන ලද ඔහු ශ්‍රමණ ගෞතමයන් ප්‍රශ්න නො විචාරත් ම ය. කොයිත් ඔබට වාදාරෝපණය කෙරෙත් ද, ඒකාන්තයෙන් ගිහි ගෙයින් නික්ම පැවිද්දට පැමිණීම පිණිස ශ්‍රමණ ගෞතමයන්ගෙන් අවසර යදිත්. ශ්‍රමණ ගෞතමයෝ ඔවුන් මහණ කරවති. උපසපත් කරවති. එහි පැවිදි වූ ඔහු එකලා වූවාහු (ගණයා කෙරෙන්) වෙන් වූවාහු සිහියෙන් යුක්ත වූවාහු කෙලෙස් තවන වැර ඇත්තාහු තිවන් පිණිස මෙහෙයන ලද සිත් ඇති ව වාසය කරන්නාහු නොබෝකලකින් ම - යම් අර්ථයක් පිණිස කුලපුත්‍රයෝ මැනවින් ම ගිහිගෙයින් නික් ම පැවිද්දට පැමිණෙද් ද - නිරුත්තර වූ මගබඹසර කෙළවර කොට ඇති ඒ අර්හත්වය ඉහාත්මයේදී ම තුමූ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කෙරෙත්. ඔහු මෙසේ කීහ: 'පින්වත, අපි ඒකාන්තයෙන් මඳකින් (නොපැමිණීම් මතුයෙන්) නැසුණම්හ. පින්වත, ලේසයකින් වැනසුණම්හ. අපි පෙර නොමහණ ව 'මහණම්හ' යි පිළිත කෙළෙමු. නොබමුණු ව බමුණම්හ'යි පිළිත කෙළෙමු. නො රහත්ව 'රහතම්හ'යි පිළිත කෙළෙමු. දැන් මහණමෝ වම්හ. දැන් බමුණමෝ වම්හ. දැන් රහත්මෝ වම්හ'යි කියාසි. පින්වත, යම් කලෙක පටන් ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි මේ සිවුවැනි ඥානපදය දිටිම් ද, ඉක්බිති මම 'භාග්‍යවතුන්වහන්සේ සම්‍යක්සම්බුද්ධ යහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාඛ්‍යාත ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුප්‍රතිපන්නාය'යි නිශ්චයට පැමිණියෙමි. [සිවුවැනි ඥානපදය]

9. පින්වත, යම් තැනෙක පටන් මම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කෙරෙහි මේ ඥානපද සතර දිටිම් ද, එකල්හි මම 'භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධයහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාක්ඛ්‍යාත ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න ය'යි නිශ්චයට පැමිණියෙමියි

10. මෙසේ කී කල්හි ජාණුසොණි බ්‍රාහ්මණ තෙමේ සව්සුදු වෙළෙඹ රියෙන් බැස උතුරුසළුව එකස් කොට භාග්‍යවතුන් වහන්සේ දෙස ඇඳිලි බැඳ "ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා. "ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා. ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා"යි තුන් යලක් උදන් ඇනී ය. 'අපි කිසියම් කලෙක්හි ඒ භවත් ගෞතමයන් වහන්සේ සමග එක් වන්නමෝ නම්, මැනව. කිසියම් කථාසල්ලාපයෙක් වන්නේ නම්, මැනැවැ'යි ද කීය.

Free Distribution www.aathaapi.org

අථ ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො යාවතකො අහොසි පිලොතිකාය පරිබ්බාජකෙන සද්ධිං කථාසල්ලාපො, තං සබ්බං භගවතො ආරොචෙසි

14. එවං වුත්තෙ භගවා ජාණුස්සොණිං බ්‍රාහ්මණං එතදවොච: 'න ඛො බ්‍රාහ්මණ, එත්තාවතා හත්ථිපදොපමො විත්ථාරෙන පරිපූරො හොති. අපි ච බ්‍රාහ්මණ, යථා හත්ථිපදොපමො විත්ථාරෙන පරිපූරො හොති, තං සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමී'ති. එවං හොති ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

15. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, නාගවනිකො නාගවනං පවිසෙය්‍ය, සො පස්සෙය්‍ය නාගවනෙ මහන්තං හත්ථිපදං දීඝතො ච ආයතං තිරියඤ්ච විත්ථතං; යො හොති කුසලො නාගවනිකො නෙව තාව නිට්ඨං ගච්ඡති: 'මහා වත භො නාගො'ති තං කිස්ස හෙතු: සන්ති හි බ්‍රාහ්මණ, නාගවනෙ වාමනිකා නාම හත්ථිනියො මහාපදා, තාසමෙපතං පදං අස්සාති. සො තමනුගච්ඡති. තමනුගච්ඡන්තො පස්සති නාගවනෙ මහන්තං හත්ථිපදං දීඝතො ච ආයතං තිරියඤ්ච විත්ථතං උච්චා ච නිසෙවිතං; යො හොති කුසලො නාගවනිකො නෙව තාව නිට්ඨං ගච්ඡති 'මහා වත භො නාගො'ති. තං කිස්ස හෙතු: සන්ති හි බ්‍රාහ්මණ, නාගවනෙ උච්චා කාළාරිකා නාම හත්ථිනියො මහාපදා, තාසමෙපතං පදං අස්සාති සො තමනුගච්ඡති, තමනුගච්ඡන්තො පස්සති නාගවනෙ මහන්තං හත්ථිපදං දීඝතො ච ආයතං තිරියඤ්ච විත්ථතං උච්චාච නිසෙවිතං උච්චාච දන්තෙහි ආරඤ්ජිතානි; යො හොති කුසලො නාගවනිකො නෙව තාව නිට්ඨං ගච්ඡති 'මහා වත භො නාගො'ති. තං කිස්ස හෙතු: සන්ති හි බ්‍රාහ්මණ, නාගවනෙ උච්චා කණෙරුකා නාම හත්ථිනියො මහාපදා, තාසමෙපතං පදං අස්සාති. සො තමනුගච්ඡති, තමනුගච්ඡන්තො පස්සති නාගවනෙ මහන්තං හත්ථිපදං දීඝතො ච ආයතං, තිරියඤ්ච විත්ථතං, උච්චා ච නිසෙවිතං, උච්චා ච දන්තෙහි ආරඤ්ජිතානි, උච්චා ච සාඛාභඞ්ගං. තඤ්ච නාගං පස්සති රුක්ඛමූලගතං වා අබ්භොකාසගතං වා ගච්ඡන්තං වා ඨිතං වා නිසින්නං වා නිපන්නං වා, සො නිට්ඨං ගච්ඡති: අයමෙව[1] සො මහානාගොති.

1. අයංව - PTS.

ඉක්බිති ජාණුස්සෝණි බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වී ය. සතුටු විය යුතු සිත් ඇලවිය යුතු කථාව කොට එකත් පසෙක හුන්නේ ය. එකත් පසෙක හුන් ජාණුස්සෝණි බ්‍රාහ්මණ තෙමේ පිලෝතිකා පරිව්‍රාජකයා සමඟ යම් පමණ කථාසල්ලාපයෙක් වී ද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැළ කෙළේ ය.

14. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ ජාණුස්සෝණි බ්‍රාහ්මණහට මෙය වදාළ සේක: "බමුණ, මෙපමණෙකින් හස්තිපදෝපමය විස්තර වශයෙන් සම්පූර්ණ වූයේ නො වේ. බමුණ, යම්සේ හස්තිපදෝපමය විස්තර වශයෙන් සම්පූර්ණ වේ ද, එය ශ්‍රවණය කරව, මනා කොට මෙනෙහි කරව. කියන්නෙමි." "පින්වතුන් වහන්ස, එසේ ය"යි කියා ජානුස්සෝණි බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

15. බමුණ, යම්සේ ඇත්වනයෙහි වංසග කරන්නෙක් ඇත්වනයට පිවිසෙන්නේ ද, හෙතෙම ඇත්වනයෙහි දිගිනු දු දික් වූ, සරසිනදු පුළුල් වූ මහත් ඇත්පියක් දක්නේ නම් දක්ෂ වූ යම් නාගවනිකයෙක් වේ ද, හෙතෙම 'පින්වත, මහත් වූ ඇතෙකැ'යි එපමණකින් නිෂ්ඨාවට නො පැමිණෙයි. එ කවරහෙයින යත්: බමුණ, නාගවනයෙහි මහපිය ඇති වාමනිකා නම් (මිටි වූ) ඇතින්නෝ ඇතියහ. 'මේ ඔවුන්ගේ පියක් වන්නේ ය'යි (සිතීමෙනි.) හෙතෙම එය අනුව යයි. එය අනුව යන්නේ ඇත් වනයෙහි දිගින් දික් වූ සරසින් පුළුල් වූ මහත් ඇත්පියක් ද (ගස්වල සතවරියන් පෙදෙසෙහි) පිට ඉලූ තැන් ද දකියි. යමෙක් දක්ෂ වූ නාගවනිකයෙක් වේ ද, හෙතෙමේ 'පින්වත, ඒකාන්තයෙන් මහත් වූ ඇතෙකැ'යි නිශ්චයට නො ම පැමිණෙයි. ඒ කවර හෙයින යත්: බමුණ, නාගවනයෙහි මහත් පිය ඇති (උස් පහත් දල ඇති) උච්චා කාළාරිකා නම් ඇතින්නෝ ද ඇත්තාහු ම ය. 'මේ ඔවුන්ගේ පියක් වන්නේය'යි (සිතීමෙනි.) හෙතෙම එය අනුව යයි. එය අනුව යන්නේ ඇත්වනයෙහි දිගින් ද දික් වූ සරසින් ද පුළුල් වූ ඇත්පියක් ද (ගස්වල සතවරියන් පෙදෙසෙහි) පිට ඉලූ තැන් හා දළින් සිඳි තැන් හා දකියි. යමෙක් දක්ෂ වූ නාගවනිකයෙක් වේ නම්, හෙතෙමේ 'පින්වත, මහත් වූ ඇතෙකැ'යි එ පමණකින් නිශ්චයට නො යේ ම ය. ඒ කවර හෙයින යත්: බමුණ, ඇත්වනයෙහි (යටි වැනි උස් වූ පාද ඇති) උච්චා කණේරුකා නම් මහ පිය ඇති ඇතින්නෝ ඇතියහ. 'මේ ඔවුන්ගේ පියක් වන්නේ ය'යි (සිතීමෙනි.) හෙතෙම එය අනුව යයි. එය අනුව යන්නේ ඇත්වනයෙහි දිගින් දික් වූ සරසින් පුළුල් වූ මහත් ඇත්පියක් ද (ගස්වල උස් පෙදෙසෙහි) පිට ඉලූ තැන් හා දළින් සිඳි තැන් හා උස් තැන්හි බිත් අතු හා දකියි. ගසක් මුලට ගියා වූ හෝ අභ්‍යවකාශයට ගියා වූ හෝ ඇවිදිනා වූ හෝ සිටියා වූ හෝ හුන්නා වූ හෝ වැද හොත්තා වූ හෝ ඒ ඇතු ද දකියි. 'මේ ඒ මහා ඇතා ම ය'යි හේ නිශ්චයට යෙයි.

16. එවමෙව ඛො බ්‍රාහ්මණ, ඉධ තථාගතො ලොකෙ උප්පජ්ජති: අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං, සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති: ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවල-පරිපුණ්ණං පරිසුද්ධං, බ්‍රහ්මචරියං පකාසෙති.

17. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චාජාතො. සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසඤ්චික්ඛති: සම්බාධො ඝරාවාසො රජාපථො, අබ්භොකාසො පබ්බජ්ජා, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං, යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති.

18. සො එවං පබ්බජිතො සමානො භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති. නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති. දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා. මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. පිසුනං වාචං පහාය පිසුනා වාචා[1] පටිවිරතො හොති: ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය, ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඵරුසං වාචං පහාය ඵරුසා වාචා[2] පටිවිරතො හොති: යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හොති. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති: කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං.

---

1. පිසුණාය වාචාය - මජසං, ස්‍යා, PTS. 2. ඵරුසාය වාචාය - මජසං ස්‍යා, PTS.

16. බමුණ, මෙ පරිද්දෙන් ම මේ ලෝකයෙහි අර්හත් වූ, සම්‍යක්-සම්බුද්ධ වූ, විද්‍යාචරණයෙන් යුක්ත වූ, සුගත වූ, ලෝකය දන්නා වූ, නිරුත්තර පුරුෂදම්‍යසාරථි වූ, දෙව් මිනිසුන්ට ශාස්තෘ වූ, බුද්ධ වූ, භාග්‍යවත් වූ, තථාගත තෙමේ පහළ වෙයි. හෙ දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ මේ ලොකය ද, මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාව ද තෙමේ විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට ප්‍රකාශ කෙරෙයි. හෙ ආදිකල්‍යාණ කොට මධ්‍යකල්‍යාණ කොට පර්යවසානකල්‍යාණ කොට අර්ථසහිත කොට ව්‍යඤ්ජන සහිත කොට කේවල සම්පූර්ණ කොට පිරිසුදු කොට ධර්මය වදාරයි, ශාසනබ්‍රහ්මචර්යය ප්‍රකාශ කෙරෙයි.

17. ඒ ධර්මය ගැහැවියෙක් හෝ ගැහැවිපිතෙක් හෝ එක්තරා කුලයෙක උපන්නෙක් හෝ අසයි. හෙතෙම ඒ ධර්මය අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව උපදවයි. හෙතෙම ඒ ශ්‍රද්ධාව ලැබීමෙන් යුක්ත වූයේ මෙසේ සිතයි: "ගෘහවාසය සම්බාධ ය, රාගාදි රජසුන්ට මාර්ගයෙකි. පැවිද්ද එළිමහනක් වැන්න, ඒකාන්තයෙන් පරිපූර්ණ වූ ඒකාන්තයෙන් පිරිසුදු වූ මේ ශඞ්ඛලිඛිත බ්‍රහ්මචර්යය පුරන්නට ගිහිගෙහි වසන්නහු විසින් පහසු නො වෙයි. මම කෙස්රවුළු බහා කසාවත් ඇඳ ගිහිගෙන් නික්ම අනගාරිකසඞ්ඛ්‍යාත පැවිද්දට පැමිණෙන්නෙම් නම් යෙහෙකැ"යි. හෙතෙම පසුකාලයෙක ස්වල්ප වූ හෝ භෝගරාශිය හැර මහත් වූ හෝ භෝගරාශිය හැර ස්වල්ප වූ හෝ නෑපිරිවර හැර මහත් වූ හෝ නෑපිරිවර හැර කෙස්රවුළු බහා කසාවත් හැඳ පෙරෙව ගිහිගෙන් නික්ම අනගාරිකසඞ්ඛ්‍යාත පැවිද්දට පැමිණෙයි

18. හෙතෙමේ මෙසේ පැවිදි වූයේ භික්ෂූන්ගේ ශික්ෂාපද සඞ්ඛ්‍යාත සාජීවයට පැමිණියේ සතුන් මැරීම හැර සතුන් මැරීමෙන් වැළකුණේ වෙයි. බහා තැබූ දඬු ඇත්තේ වෙයි. බහා තැබූ ශස්ත්‍ර ඇත්තේ වෙයි. ලජ්ජායෙන් යුක්ත වූයේ දයාවට පැමිණියේ සියලු සත්ත්වයන් කෙරෙහි හිතානුකම්පා ඇති ව වාසය කෙරෙයි. නුදුන් දෙය ගැන්ම හැර නුදුන් දෙය ගැන්මෙන් වැළකුණේ වෙයි. දුන් දෙය ගන්නාසුලු වූයේ දුන් දෙය කැමැති වනසුලු වූයේ සොර නො වූ පිරිසුදු වූ සිතින් යුතු ව වාසය කෙරෙයි. අශ්‍රේෂ්ඨචර්යාව හැර ශ්‍රේෂ්ඨචර්යා ඇත්තේ අයහපත් හැසිරීමෙන් දුරු වූයේ වෙයි. ග්‍රාමධර්ම යයි කියන ලද මෛථුනයෙන් වැළකුණේ වෙයි. මුසාවාදය හැර මුසාවාදයෙන් වැළකුණේ වෙයි, සත්‍යය කියනසුලු වූයේ සත්‍යයෙන් සත්‍යය ගළපනුයේ ස්ථිරකථා ඇත්තේ ඇදහිය යුතු බස් ඇත්තේ ලෝකයා බොරුවෙන් නො රවටන්නේ වෙයි. පිසුනුබස් හැර පිසුනුබසින් තොර වූයේ වෙයි. මෙතැනින් අසා මොවුන්ගේ භේදය පිණිස එතැන කියන්නේ නො වෙයි. එතැනින් අසා ඔවුන්ගේ භේදය පිණිස මෙතැන කියන්නේ නො වෙයි. මෙසේ බිඳුණවුන් සමගි කරන්නේ සමගි වූවන්ට අනුබල දෙන්නේ සමගියට කැමැත්තේ සමගියෙහි ඇලුණේ සමගි වූවන් දැක සතුටු වනසුලු වූයේ සමගි කරණ වචන කියන්නේ වෙයි රළුබස් හැර රළුබස් කීමෙන් වැළකුණේ වෙයි. යම් ඒ වචනයක් නිදොස් ද, කනට සුව ද, ප්‍රේමණීය ද, ළ ගන්නාසුලු ද, නාගරික ද, බොහෝ දෙනා කැමැති ද, බොහෝ දෙනාගේ මන වඩන්නේ ද, එබඳු වචන කියන්නේ වෙයි. හිස් බස් තෙපලීම හැර හිස්බස් තෙපලීමෙන් වෙන් වූයේ වෙයි. කල් බලා කියනසුලු වූයේ වූවක් කියනසුලු වූයේ අර්ථයක් ම කියනසුලු වූයේ ධර්මයක් ම කියනසුලු වූයේ විනයක් ම කියනසුලු වූයේ වෙයි. ලෙහි තැන්පත් කර ගත යුතු කරුණු සහිත වූ පිරිසිඳීම් ඇති අර්ථයෙන් යුත් වචන නිසි කල්හි කියන්නේ වෙයි.

19. සො බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති. එකභත්තිකො හොති රත්තූපරතො විරතො විකාලභොජනා. නච්චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජතපටිග්ගහණා පටිවිරතො හොති. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති. අජෙළකපටිග්ගහණා පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතො හොති. හත්ථිගවාස්සවළවාපටිග්ගහණා පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතො හොති දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති තුලාකූටකංසකූටමානකූටා පටිවිරතො හොති. උක්කොටනවඤ්චනනිකතිසාචියොගා පටිවිරතො හොති. ඡෙදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා පටිවිරතො හොති.

20 සො සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව[1] පක්කමති සමාදායෙව පක්කමති. සෙය්‍යථාපි නාම පක්ඛීසකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරොව ඩෙති, එවමෙව ඛො භික්ඛු[2] සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති.

21 සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං. තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙති

1. යෙන - සෑ, PTS. 2 එවමෙව භික්ඛු - මජසං, සෑ, PTS.

19. හේ බීජසමූහ (පැලවන දෑ) ද, භූතසමූහ (පැලවුනු දෑ)ද, සමාරම්භයෙන් (නැසීමෙන්) වෙන් වූයේ වෙයි. එක වේලේ වළඳන්නේ රාත්‍රිභොජනයෙන් වැලක්කේ විකල් බොජුනෙන් වෙන් වූයේ වෙයි. නටනු ගනු වයනු විසුලු දස්නෙන් දුරු වූයේ වෙයි. මල්ගඳ විලෙවුන් ඇඟ දෑරීම, අඩුතැන් පිරවීම,සැරසීම යන මෙයින් වෙන් වූයේ වෙයි. උස්යහනින් මහයහනින් දුරු වූයේ වෙයි. රන්රිදී මසු කහවණු පිළිගැන්මෙන් දුරු වූයේ වෙයි. අමු ධාන්‍යවර්ග පිළිගැන්මෙන් දුරු වූයේ වෙයි. අමුමස් පිළිගැන්මෙන් දුරු වූයේ වෙයි. ස්ත්‍රීන් කුමරියන් පිළිගැන්මෙන් දුරු වූයේ වෙයි. දාසිදාසුන් පිළිගැන්මෙන් දුරු වූයේ වෙයි. එළු බැටළුවන් පිළිගැන්මෙන් දුරු වූයේ වෙයි. කුකුළන් ඌරන් පිළිගැන්මෙන් දුරු වූයේ වෙයි. ඇත් ගව අස් වෙළඹුන් පිළිගැන්මෙන් දුරු වූයේ වෙයි. ගිහීන්ගේ පණිවුඩ හා ගෙන් ගෙට හසුන් ගෙනයාමෙන් දුරු වූයේ වෙයි. වෙළඳ ගනුදෙනුවෙන් දුරු වූයේ වෙයි. හොර තරාදියෙන් කිරුම, නොරන් බඩු රන් බඩු සේ දක්වා දීම, හොර මිනුම යන මෙයින් දුරු වූයේ වෙයි. අල්ලස් ගැනීම, රැවටීම, සමාන දේ දක්වා කරණ මායාව යන කුටිල (වඞ්ක) ප්‍රයොගයන්ගෙන් වැළකුනේ වෙයි. අත් පා කැපීම, මැරීම, විලංගු ආදිය ලා බැඳීම, මංපැහැරීම, ගම් පැහැරීම, සැහැසිකම යන මෙයින් වැළකුනේ වෙයි.

20. හෙතෙම කය පරිහරණය කිරීමට ප්‍රමාණ වූ සිවුරෙන් ද, කුස පරිහරණය කිරීමට ප්‍රමාණ වූ පිණ්ඩපාතයෙන් ද, සතුටු වූයේ වෙයි. හෙතෙම යම් යම් තැන යේ ද, පාසිවුරු රැගෙන ම යෙයි. යම් සේ පියාපත් ඇති ලිහිණියෙක් යම් යම් දිගෙක පියාඹයි ද, පියාපත් බර සහිත ව ම පියාඹයි. මෙපරිද්දෙන් ම භික්ෂු තෙමේ කය පරිහරණය කිරීමට ප්‍රමාණවත් සිවුරෙන් ද කුස පරිහරණය කිරීමට ප්‍රමාණවත් පිණ්ඩපාතයෙන් ද සතුටු වූයේ වෙයි. හෙ තෙම යම් යම් තැන යේ නම්, පාසිවුරු රැගෙන ම යෙයි. හෙ තෙම මේ ආර්‍ය්‍යශීල-ස්කන්ධයෙන් යුක්ත වූයේ ස්වසන්තානයෙහි නිරවද්‍ය වූ සැපය විඳියි.

21. හෙ තෙම ඇසින් රූප දැක ස්ත්‍රී පුරුෂාදි වශයෙන් නිමිති ගන්නේ නො වේ. හස්තපාදදි අවයවයන්ගේ ආකාරය නො ගන්නාසුලු වේ. යම් කාරණයකින් චක්ෂුරින්ද්‍රිය සංවරණය නො කොට වාසය කරන ඒ පුද්ගලයා ලාමක අකුශලධර්ම වූ අභිධ්‍යාදෞර්මනස්‍යයෝ අනු බඳනාහු ද, ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරණය පිණිස පිළිපදියි. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරණයට පැමිණේ කණින් ශබ්ද අසා .... නාසයෙන් ගඳ අසා .... දිවින් රස විඳ ... කයින් ස්ප්‍රෂ්ටව්‍යය ස්පර්ශ කොට ... සිතින් ධර්මාලම්බනය දැන නිමිති නො ගන්නාසුලු වේ. අනුව්‍යඤ්ජන නො ගන්නාසුලු වේ. යම් කරුණකින් මනින්ද්‍රිය සංවරණය නො කොට වාසය කරන ඒ පුද්ගලයා ලාමක අකුශලධර්ම වූ අභිධ්‍යාදෞර්මනස්‍යයෝ අනුබඳනාහු ද, ඒ මනින්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදියි. මනින්ද්‍රිය රකියි. මනින්ද්‍රියෙහි සංවරණයට පැමිණේ. හෙ තෙම මේ ආර්‍ය්‍ය වූ ඉන්ද්‍රියසංවරයෙන් යුක්ත වූයේ සිය සිත්සතන්හි කෙලෙසුන් නො වැගුරුණු නො කිළිටි සැපය විඳියි.

22. සො අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති, සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති, සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති, අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති, උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති, ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති.

23 සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං.

24. සො පච්ඡාභත්තං පිණ්ඩපාත පටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතහිතානුකම්පී. බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො. ථීනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු. විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

25. සො ඉමෙ පඤ්ච නීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ, විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං[1] උපසම්පජ්ජ විහරති. ඉදම්පි වුච්චති බ්‍රාහ්මණ, තථාගතපදං ඉතිපි, තථාගතනිසෙවිතං ඉතිපි, තථාගතාරඤ්ජිතං[2] ඉතිපි. න ත්වෙව තාව අරියසාවකො නිට්ඨං ගච්ඡති: 'සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො'ති.

---

1. පඨමජ්ඣානං - සීමු. 2. තථාගතරඤ්ජිතං - සීමු. 1-2.

Free Distribution www.aathaapi.org

22. හෙ තෙම ඉදිරියට යාමෙහි පෙරළා ඒමෙහි සම්පජානකාරී (මැනැවින් දැන කරනසුලු) වෙයි. ඉදිරි බැලීමෙහි ආපසු බැලීමෙහි සම්පජානකාරී වෙයි. අත් පා හැකිළීමෙහි දිග හැරීමෙහි සම්පජානකාරී වෙයි. අනුභවයෙහි පානයෙහි කෑමෙහි රස විඳීමෙහි සම්පජානකාරී වෙයි. මල මූ පහකිරීමෙහි සම්පජානකාරී වෙයි. යාමෙහි සිටීමෙහි හිඳීමෙහි නිදීමෙහි නිදි වැරීමෙහි කීමෙහි නිහඬ වීමෙහි සම්පජානකාරී වෙයි.

23. හෙ තෙම මේ ආර්‍ය්‍යවූ ශීලස්කන්ධයෙන් ද යුක්ත වූයේ මේ ආර්‍ය්‍යවූ ඉන්ද්‍රියසංවරයෙන් ද යුක්ත වූයේ මේ ආර්‍ය්‍යවූ සමෘතිසම්ප්‍රජ්ඤනයෙන් ද යුක්ත වූයේ ජනයාගෙන් තොර අරණ්‍යය, වෘක්ෂමූලය, පර්වතය, කඳුරැලිය, පර්වතගුහාව, සොහොන, වනලැහැබ, අබ්බස, පිදුරුකුටි යන සෙනසුනක් භජනය කරයි.

24. හෙ තෙම පසුබත්හි පිණ්ඩපාතයෙන් වැළැක්කේ පලක් බැඳ කය සෘජු කොට තබා සිහිය කර්මස්ථානාභිමුඛ කොට හිඳියි. හෙ තෙම ස්කන්ධලෝකයෙහි අභිධ්‍යාව දුරු කොට පහ වූ අභිධ්‍යා ඇති සිතින් යුක්ත ව වාසය කෙරෙයි. අභිධ්‍යාවෙන් සිත පිරිසිදු කරයි. ව්‍යාපාදයට නො පැමිණ ව්‍යාපාද සඞ්ඛ්‍යාත වූ ප්‍රකෘති ද්වේෂය හැර විරුද්ධයට නො පැමිණි සිතැත්තේ වාසය කරයි. සියලු ප්‍රාණභූතයන් කෙරෙහි හිතවත්ව අනුකම්පා කරණසුලු වූයේ ව්‍යාපාදසඞ්ඛ්‍යාත ප්‍රකෘතිද්වේෂය කෙරෙන් සිත පිරිසිදු කරයි. ථීනමිද්ධය හැර පහ වූ ථිනමිද්ධ ඇති ව වාසය කරයි. රාත්‍රියෙහි ද ආලෝක සංඥව ඇත්තේ සිහි ඇත්තේ යහපත් නුවණ ඇත්තේ ථීනමිද්ධය කෙරෙන් සිත පිරිසිදු කරයි. උද්ධච්චකුක්කුච්චය දුරු කොට උද්ධත නො වූයේ තමා තුල සන්හුන් සිත් ඇත්තේ වාසය කෙරෙයි. උද්ධච්චකුක්කුච්චය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. විචිකිච්ඡාව දුරු කොට පහ වූ විචිකිච්ඡා ඇත්තේ කුශලධර්මයන්හි කෙසේ කෙසේද’යි පැවැති සැක නැත්තේ වාසය කෙරෙයි. විචිකිච්ඡාව කෙරෙන් සිත පිරිසිදු කෙරේ.

25. හෙතෙම මේ චිත්තය පිළිබඳ උපක්ලේශ වූ ප්‍රඥව දුර්වල කරණ පඤ්චනීවරණයන් දුරු කොට කාමයන්ගෙන් වෙන් ව ම අකුශල ධර්මයන්ගෙන් වෙන් ව ම විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සුඛය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි. බ්‍රාහ්මණය, මෙය ද තථාගතයන් වහන්සේගේ ක්ෂුණපද යයි කියා ද තථාගතයන් වහන්සේගේ නුවණ නැමැති ඉලඇට ඉලූ තැන යයි ද, තථාගතයන් වහන්සේගේ නුවණ නමැති දළයෙන් සිඳි තැන යයි ද කියනු ලැබේ. ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ එපමණෙකින් ‘භාග්‍යවතුන් වහන්සේ සම්‍යක්සම්බුද්ධයහ, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාක්ඛ්‍යාත ය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න යයි නිශ්චයට නො පැමිණේ ම ය.

26. පුන ච පරං බ්‍රාහ්මණ, භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං[1] උපසම්පජ්ජ විහරති. ඉදම්පි වුච්චති බ්‍රාහ්මණ, තථාගතපදං ඉතිපි, තථාගතනිසෙවිතං ඉතිපි, තථාගතාරඤ්ජිතං ඉතිපි. න ත්වෙව තාව අරියසාවකො නිට්ඨං ගච්ඡති: 'සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො'ති.

27 පුන ච පරං බ්‍රාහ්මණ, භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යං තං අරියා ආචික්ඛන්ති: 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තතියං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදම්පි වුච්චති බ්‍රාහ්මණ, තථාගතපදං ඉතිපි, තථාගතනිසෙවිතං ඉතිපි, තථාගතාරඤ්ජිතං ඉතිපි. න ත්වෙව තාව අරියසාවකො නිට්ඨං ගච්ඡති: 'සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො'ති.

28. පුන ච පරං බ්‍රාහ්මණ, භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා[2] අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදම්පි වුච්චති බ්‍රාහ්මණ තථාගතපදං ඉතිපි, තථාගතනිසෙවිතං ඉතිපි, තථාගතාරඤ්ජිතං ඉතිපි. න ත්වෙව තාව අරියසාවකො නිට්ඨං ගච්ඡති: 'සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො භගවතො සාවක-සඞ්ඝො'ති.

29. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[3] පුබ්බෙනි-වාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති: සෙය්‍යථීදං-එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසතිම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි, අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ; 'අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛ-දුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො, -

---

1. දුතියජ්ඣානං - සීමු. 2. අත්ථගමා - සීමු. 3 ආනෙඤ්ජප්පත්තෙ - සීමු.

26 බ්‍රාහ්මණය, නැවත අනෙකෙක් ද වෙයි. මහණ තෙමේ විතර්ක විචාරයන් සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති චිත්තයාගේ එකොදිභාවය ඇති විතර්ක නැති විචාර නැති සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සුඛය ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි. බමුණ, මෙය ද තථාගතපද යයි ද, තථාගතනිසේවිත යයි ද, තථාගතාරඤ්ජිත යයි ද, කියනු ලැබේ. ආර්‍යශ්‍රාවක තෙමේ 'භාග්‍යවතුන් වහන්සේ සම්‍යක්-සම්බුද්ධයහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාක්‍ඛ්‍යාත ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න ය'යි එපමණෙකින් නිශ්චයට නො පැමිණේ ම ය.

27. බ්‍රාහ්මණය, නැවත අනෙකෙක් ද වෙයි. මහණ තෙමේ ප්‍රීතිය ද ඉක්මවීමෙන් උපෙක්‍ෂා ඇත්තේ සමෘතිමත් වූයේ සම්‍යක් ප්‍රඥ ඇත්තේ වාසය කෙරෙයි. කයින් සුව ද විඳියි. ආර්‍යයෝ ඒ යමක් 'උපෙක්‍ෂා ඇත්තේ සිහි ඇත්තේ සුඛවිහරණ ඇත්තේ ය'යි (ගුණවර්ණනාවශයෙන්) කියත් ද, ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි. බමුණ, මෙය ද තථාගතපදය යි කියා ද, තථාගතනිසේවිත යයි ද, තථාගතාරඤ්ජිත යයි ද, කියනු ලැබේ. ආර්‍යශ්‍රාවක තෙමේ 'තථාගතයන් වහන්සේ සම්‍යක්සම්බුද්ධයහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාක්‍ඛ්‍යාත ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුප්‍රතිපන්නය'යි එ පමණෙකින් නිශ්චයට නො පැමිණේ ම ය.

28. බ්‍රාහ්මණය, නැවත අනෙකෙක් ද වෙයි. මහණ තෙමේ සුඛ-ප්‍රහාණයෙන් ද, දුඃඛප්‍රහාණයෙන් ද, පළමු කොට ම සොම්නස් දොම්නස් නැති කිරීමෙන් දුක් නැති සුව නැති උපෙක්‍ෂාසමෘති දෙදෙනාගේ පිරිසිදුබව ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි. බමුණ, මෙය ද තථාගතපද යයි කියා ද, තථාගතනිසේවිත යයි ද, තථාගතා-රඤ්ජිත යයි ද, කියනු ලැබේ. ආර්‍යශ්‍රාවක තෙමේ 'භාග්‍යවතුන් වහන්සේ සම්‍යක්සම්බුද්ධයහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනා ව දෙසන ලද. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න ය'යි එපමණෙකින් නිශ්චයට නො පැමිණේ යි.

29. හෙ තෙම මෙසේ පිරිසිදු වූ ප්‍රභාස්වර වූ අඞ්ගණ රහිත වූ පහ වූ කෙලෙස් ඇති මොළොක් වූ කර්මයට යෝග්‍ය වූ ස්ථිතිප්‍රාප්ත වූ නො සැලෙන-බවට පත් වූ සමාහිත සිත ඇති කල්හි පෙර වුසූ කඳපිළිවෙළ දන්නා නුවණ පිණිස සිත නැඹුරු කෙරෙයි. හෙතෙම නන් වැදෑරුම් පෙර විසූ කඳපිළිවෙළ සිහි කෙරෙයි. එනම්: එක් ජාතියක් ද, ජාති දෙකක් ද, ජාති තුනක් ද, ජාති සතරක් ද, ජාති පසක් ද, ජාති දසයක් ද, ජාති විස්සක් ද, ජාති තිසක් ද, ජාති සතළිසක් ද, ජාති පනසක් ද, ජාති සියයක් ද, ජාති දහසක් ද, ජාති ලක්‍ෂයක් ද, නොයෙක් නස්නා කල්පයන් ද, නොයෙක් හටගන්නා කල්පයන් ද, නොයෙක් නස්නා හටගන්නා කල්පයන් ද සිහි කරයි: 'අසුවල් තැන මෙ නම් ඇත්තෙම් වීමි. මෙ නම් ගෝත්‍ර ඇත්තෙම් වීමි. මෙවැනි පැහැ ඇත්තෙම් වීමි. මෙවැනි ආහාර ඇත්තෙම් වීමි. මෙබඳු සුවදුක් විඳිනසුලු වූයෙම් වීමි. මෙබඳු ආයු කෙළවර කොට ඇත්තෙම වීමි, -

සො තතො චුතො අමුත්‍ර උදපාදිං, තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො, සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති; ඉදම්පි වුච්චති බ්‍රාහ්මණ, තථාගතපදං ඉතිපි, තථාගතනිසෙවිතං ඉතිපි, තථාගතාරඤ්ජිතං ඉතිපි. න ත්වෙව තාව අරියසාවකො නිට්ඨං ගච්ඡති: 'සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො'ති.

30. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ, හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: 'ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා; ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ, යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ඉදම්පි වුච්චති බ්‍රාහ්මණ, තථාගතපදං ඉතිපි, තථාගතනිසෙවිතං ඉතිපි, තථාගතාරඤ්ජිතං ඉතිපි. න ත්වෙව තාව අරියසාවකො නිට්ඨං ගච්ඡති: 'සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො'ති

31. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙති.

Free Distribution www.aathaapi.org

ඒ මම ඉන් චුත ව අසුවල් තැන උපන්නෙමි, එහිදී ද, මෙනම් ඇත්තෙම් වීමි, මෙ නම් ගොත්‍ර ඇත්තෙම් වීමි, මෙවැනි පැහැ ඇත්තෙම් වීමි, මෙවැනි ආහාර ඇත්තෙම් වීමි, මෙබඳු සුවදුක් විඳිනසුලු වූයෙම් වීමි, මෙපමණ ආයු කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම ඉන් චුත ව මෙහි උපන්නෙමි.”යි මෙසේ ආකාර සහිත වූ උදෙසීම් සහිත වූ නන් වැදෑරුම් පෙර විසූ කඳපිළිවෙළ සිහි කෙරෙයි. බ්‍රාහ්මණ ය, මෙ ද තථාගතපද යයි ද, තථාගතනිසේවිත යයි ද, තථාගතාරඤ්ජිත ය යි ද කියනු ලැබේ. ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ එ පමණෙකින් ‘භාග්‍යවතුන් වහන්සේ සම්‍යක්සම්බුද්ධ-යහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්‍මය ස්වාඛ්‍යාත ය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න ය’යි නිශ්චයට නො පැමිණේ ම ය.

30. හෙ තෙම මෙසේ පිරිසිදු වූ ප්‍රභාස්වර වූ අඞ්ගණ රහිත වූ පහ වූ කෙලෙස් ඇති මොළොක් වූ කර්‍මයට යෝග්‍ය වූ ස්ථිතිප්‍රාප්ත වූ සමාහිත සිත ඇති කල්හි සත්ත්වයන්ගේ ච්‍යුති උත්පත්ති දන්නා නුවණ පිණිස සිත නැඹුරු කෙරෙ යි. හෙතෙම පිරිසිදු වූ මිනිස් ඇස ඉක්ම සිටියා වූ දිව්‍යැසින් චුත වන්නා වූ උපදින්නා වූ හීන ප්‍රණීත සුවර්‍ණ දුර්වර්‍ණ වූ සුගතිගත වූ දුර්ගතිගත වූ සත්ත්වයන් දකියි. කම් වූ පරිදි මිය පරලොව යන සත්ත්වයන් බලයි. ‘මේ භවත් සත්ත්වයෝ එකාන්තයෙන් කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු ය. වාග්දුශ්චරිතයෙන් යුක්ත වූවාහු ය. මනොදුශ්චරිතයෙන් යුක්ත වූවාහු ය. ආර්‍ය්‍යයන්ට උපවාද කළාහු ය. මිසදිටුවෝ ය. මිසදිටුකම් ගැනුම් ඇත්තෝ ය. ඔහු කාබුන් මරණින් මතු අපාය නම් වූ දුගති නම් වූ විනිපාත නම් වූ නරකයට උත්පත්ති වශයෙන් පැමිණියාහු ය. මේ භවත් සත්ත්වයෝ වනාහි කායසුචරිතයෙන් යුක්ත වූවාහු වාක්සුචරිතයෙන් යුක්ත වූවාහු මනඃසුචරිතයෙන් යුක්ත වූවාහු ආර්‍ය්‍යයන්ට නො උපවාද කළාහු සම්දිටු වූ වාහු සම්දිටුකම් ගැනුම් ඇත්තාහු ය. ඔහු කාබුන් මරණින් මතු මනා ගති ඇති ස්වර්‍ග ලෝකයට උත්පත්ති වශයෙන් පැමිණියාහු’ යයි කම් වූ පරිදි මිය පරලොව යන සත්ත්වයන් දකියි. මෙසේ පිරිසිදු වූ මිනිස් ඇස ඉක්මවා පැවැති දිව්‍යැසින් චුත වන උපදින හීන ප්‍රණීත සුවර්‍ණ දුර්වර්‍ණ සුගතිගත දුර්ගතිගත සත්ත්වයන් දකියි. කම් වූ පරිදි මිය පරලොව යන සත්ත්වයන් දැනගනියි. බමුණ, මෙ ද තථාගතපද යයි ද තථාගතනිසෙවිත යයි ද, තථාගතා-රඤ්ජිත යයි ද කියනු ලැබේ. ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ එ පමණෙකින් ‘භාග්‍යවතුන් වහන්සේ සම්‍යක්සම්බුද්ධයහ, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්‍මය ස්වාඛ්‍යාත ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න ය’යි නිශ්චයට නො පැමිණේ ම ය.

31. හෙ තෙමේ මෙසේ පිරිසුදු වූ ප්‍රභාස්වර වූ අඞ්ගණ රහිත වූ පහ වූ කෙලෙස් ඇති මොළොක් වූ භාවනාකර්‍මයට යොග්‍ය වූ ස්ථිතිප්‍රාප්ත වූ නො සැලෙන බව්ට පත් වූ සමාහිත සිත ඇති කල්හි ආස්‍රවක්ෂයකර-ඥානය පිණිස සිත නැඹුරු කරයි.

සො ඉදං **දුක්ඛන්ති** යථාභූතං පජානාති, අයං **දුක්ඛසමුදයොති** යථාභූතං පජානාති, අයං **දුක්ඛනිරොධොති** යථාභූතං පජානාති, අයං **දුක්ඛනිරොධගාමිනී** පටිපදාති යථාභූතං පජානාති; ඉමෙ ආසවාති යථාභූතං පජානාති, අයං ආසවසමුදයොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. ඉදම්පි වුච්චති බ්‍රාහ්මණ, තථාගතපදං ඉතිපි, තථාගතනිසෙවිතං ඉතිපි, තථාගතාරඤ්ජිතං ඉතිපි. න ත්වෙව තාව අරියසාවකො නිට්ඨං ගතො හොති. අපි ච ඛො නිට්ඨං ගච්ඡති: සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝොති.

32. තස්ස එවං ජානතො එවං පස්සතො **කාමාසවාපි** චිත්තං විමුච්චති, **භවාසවාපි** චිත්තං විමුච්චති, **අවිජ්ජාසවාපි** චිත්තං විමුච්චති, විමුත්තස්මිං **විමුත්තමිති** ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති. ඉදම්පි වුච්චති බ්‍රාහ්මණ, තථාගතපදං ඉතිපි, තථාගතනිසෙවිතං ඉතිපි, තථාගතාරඤ්ජිතං ඉතිපි. එත්තාවතා ඛො බ්‍රාහ්මණ, අරියසාවකො නිට්ඨං ගතො හොති: 'සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො'ති. එත්තාවතා බ්‍රාහ්මණ, **හත්ථිපදොපමො** විත්ථාරෙන පරිපූරො හොතීති.

33. එවං වුත්තෙ ජාණුස්සොණී බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: 'අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය: 'චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී'ති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං[1] ගොතමං සරණං ගච්ඡාමි, ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති[2].

චූළහත්ථිපදොපමසුත්තං සත්තමං.[3]

1. භගවන්තං - සයා. 2. සරණංගතන්ති - PTS. 3. නිට්ඨිතං සත්තමං - සයා.

Free Distribution www.aathaapi.org

හෙ තෙම මෙය දුකය යි තත් වූ පරිදි දැනගනියි. මේ දුක්ඛසමුදය යයි තත් වූ පරිදි දැනගනියි. මේ දුඃඛනිරොධ ය යි තත් වූ පරිදි දැන ගනියි. මේ දුක්ඛනිරොධගාමිනීප්‍රතිපදාව යයි තත් වූ පරිදි දැනගනියි. මේ ආස්‍රව යයි තත් වූ පරිදි දැනගනියි. මේ ආස්‍රවසමුදය යයි තත් වූ පරිදි දැනගනියි මේ ආස්‍රවනිරොධ ය යි තත් වූ පරිදි දැනගනියි. මේ ආස්‍රවනිරොධගාමිනීප්‍රතිපදාව යයි තත් වූ පරිදි දැනගනියි. බ්‍රාහ්මණය, මෙ ද තථාගතපද යයි ද තථාගතනිසෙවිත යයි ද තථාගතාරඤ්ජිත යයි ද කියනු ලැබේ. බමුණ, ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ මෙපමණෙකින් 'භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධයහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්‍මය ස්වාක්ඛ්‍යාත ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න ය'යි නිශ්චයට නො පැමිණියේ ම වෙයි. එහෙත් 'භාග්‍යවතුන් වහන්සේ සම්‍යක්සම්බුද්ධයහ, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්‍මය ස්වාක්ඛ්‍යාත ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න ය'යි නිශ්චයට පැමිණෙයි.

32. මෙසේ දන්නා වූ මෙසේ දක්නා වූ ඔහුගේ සිත කාමාස්‍රවයෙන් ද මිදෙයි. භවාස්‍රවයෙන් ද සිත මිදෙයි. අවිද්‍යාස්‍රවයෙන් ද සිත මිදෙයි. මිදුණු කල්හි මිදිණැයි ඥානය වෙයි. ජාතිය ගෙවී ගියා ය. බඹසර වැස නිමවන ලද. කළ යුතු දේ කරන ලද මින්පසු මේ අර්හත්ත්වය පිණිස කටයුතු අනිකක් නැතැයි දැන ගනියි. බ්‍රාහ්මණය, මෙ ද තථාගතපදය යි ද තථාගතනිසෙවිත යයි ද තථාගතාරඤ්ජිත යයි ද කියනු ලැබේ. බමුණ, ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ මෙ පමණෙකින් 'භාග්‍යවතුන් වහන්සේ සම්‍යක්සම්බුද්ධයහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්‍මය ස්වාක්ඛ්‍යාත ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න ය'යි නිශ්චයට පැමිණියේ වෙයි. බ්‍රාහ්මණය, මෙ පමණෙකින් වනාහි ඇත්පියඋපමාව පරිපූර්ණ වූයේ වේ.

33. මෙසේ වදාළ කල්හි ජාණුස්සොණි බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: 'භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති. භවත් ගෞතමයන් වහන්ස යම් සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වේ ද, පිළිසන් වූවක් විවෘත කරන්නේ හෝ වේ ද, මං මුළා වූවහුට මග කියන්නේ හෝ වේ ද, ඇස් ඇත්තාහු රූප දක්නාහු යයි අන්ධකාරයෙහි තෙල්පහනක් දරන්නේ හෝ වේ ද, එ පරිද්දෙන් භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්‍මය දේශනා කරන ලදී. ඒ මම භවත් ගෞතමයන් වහන්සේ ද ධර්‍මය ද සඞ්ඝයා ද සරණ යෙමි. භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවි හිමි කොට සරණ ගිය උපාසකයකු කොට දරණ සේක්වායි.

චූළහත්ථිපදොපම සූත්‍රය සත්වැනි යි.

1. 3. 8.

මහාහත්ථිපදොපමසුත්තං

1. **එවං** මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො ආයස්මා **සාරිපුත්තො** භික්ඛූ ආමන්තෙසි: 'ආවුසො භික්ඛවො'ති. ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො **සාරිපුත්තස්ස** පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච.

2. සෙය්‍යථාපි ආවුසො යානි කානිචි ජඞ්ගලානං[1] පාණානං පදජාතානි සබ්බානි තානි හත්ථිපදෙ සමොධානං ගච්ඡන්ති, හත්ථිපදං තෙසං අග්ගමක්ඛායති යදිදං මහන්තත්තෙන[2], එවමෙව ඛො ආවුසො යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ චතූසු අරියසච්චෙසු සඞ්ගහං ගච්ඡන්ති. කතමෙසු චතූසු: දුක්ඛෙ අරියසච්චෙ, දුක්ඛසමුදයෙ අරියසච්චෙ, දුක්ඛනිරොධෙ අරියසච්චෙ, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අරියසච්චෙ.

3. කතමඤ්චාවුසො දුක්ඛං අරියසච්චං: ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, මරණම්පි දුක්ඛං, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාපි දුක්ඛා, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා

4. කතමෙ චාවුසො පඤ්චුපාදානක්ඛන්ධා: සෙය්‍යථීදං[3] රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො.

5. කතමො චාවුසො රූපූපාදානක්ඛන්ධො: චත්තාරි ච මහාභූතානි චතුන්නඤ්ච මහාභූතානං උපාදාය[4] රූපං. කතමෙ චාවුසො චත්තාරො මහාභූතා: පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු.

6. කතමා චාවුසො පඨවිධාතු: පඨවිධාතු සියා අජ්ඣත්තිකා සියා බාහිරා. කතමා චාවුසො අජ්ඣත්තිකා පඨවිධාතු: යං අජ්ඣත්තං පච්චත්තං කක්ඛළං ඛරිගතං උපාදින්නං: සෙය්‍යථීදං කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරූ[5] අට්ඨි අට්ඨිමිඤ්ජං[6] වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං, යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං කක්ඛළං ඛරිගතං උපාදින්නං, අයං වුච්චතාවුසො අජ්ඣත්තිකා පඨවිධාතු.

1. ජඞ්ගමානං - අ 1. PTS. 2. මහන්තත්තෙන - සීමු 1-2. මජසං 3. සෙය්‍යථිදං - මජසං
4. උපාදා - ස්‍යා. 5 නහාරූ - මජසං. 6. අට්ඨිමිඤ්ජා - සීමු.

Free Distribution www.aathaapi.org

1. 3. 8.

මහාහත්ථිපදෝපමසූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ 'ඇවැත්නි, මහණෙනි' යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු 'ඇවැත්නි'යි ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට පිළිවදන් දුන්හ. ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය වදාළ සේක:

2. ඇවැත්නි, යම්සේ පොළොව මතුපිට හැසිරෙන්නා වූ පා සහිත වූ සතුන්ගේ යම්කිසි පාදයෝ වෙත් ද, ඒ සියලු පාදයෝ ඇත්පියෙහි ඇතුළත් වීමට පැමිණෙත්. ඇත්පිය මහත්බැවින් ඒ සියලු පාදයන් අතුරෙහි අග්‍රය යි කියනු ලැබේ. ඇවැත්නි, එපරිද්දෙන් ම යම් මේ කුශලධර්ම කෙනෙක් වෙත් ද, ඒ සියල්ල චතුරාර්‍යසත්‍යධර්මයෙහි සංග්‍රහයට යෙත්. කවර සතරෙක්හි ද යත්: දුඃඛාර්‍යසත්‍යයෙහි, දුඃඛසමුදයාර්‍යසත්‍යයෙහි දුඃඛනිරෝධාර්‍යසත්‍යයෙහි දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදාර්‍යසත්‍යයෙහි ය.

3. ඇවැත්නි, දුඃඛාර්‍යසත්‍යය කවරේ ද? ජාතිය ද දුක ය, ජරාව ද දුක ය, මරණය ද දුක ය, ශෝකය වැලපීම කායිකදුක මානසික දොම්නස දැඩි ආයාස යන මොහු ද දුක් ය. කැමැති වූ යමක් නො ලබා නම්, එ ද දුක් ය. සංක්‍ෂෙපයෙන් උපාදනස්කන්ධ පස ම දුක ය.

4 ඇවැත්නි, උපාදනස්කන්ධ පස කවරහු ද? එනම්: රූපූපාදනස්කන්ධ ය, වේදනූපාදනස්කන්ධ ය, සඤ්ඤූපාදනස්කන්ධ ය, සඞ්ඛාරූපාදනස්කන්ධ ය, විඤ්ඤාණූපාදනස්කන්ධ ය යන මොහු ය.

5. ඇවැත්නි, රූපූපාදනස්කන්ධ ය කවරේ ද? සතර මහාභූතයෝ ද සතර මහාභූතයන්ගේ උපාදයරූප ද යන මේ යි. ඇවැත්නි සතර මහාභූතයෝ කවරහු ද? පඨවිධාතුව, ආපෝධාතුව, තේජෝධාතුව වායෝධාතුව යන මොහු ය.

6. ඇවැත්නි, පෘථිවිධාතුව කවරේ ද? පෘථිවිධාතුව ආධ්‍යාත්මික ද වන්නේ ය. බාහිර ද වන්නේ ය. ඇවැත්නි, ආධ්‍යාත්මිකපෘථිවිධාතුව කවරේ ද? තමා පිළිබඳ තමා නිසා පවත්නා තද වූ පරුෂ වූ සතර, මහාභූතයන්ගෙන් හටගත් යම් ද්‍රව්‍යයෙක් වේද, එනම් - කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර, ඇට, ඇටමිදුළු, වකුගඩුව, හදවත, අක්මාව, දලබුව, බඩදිව, පපුමස, අතුනු, අතුනුබහන්, නො පැසුණු ආහාර, මල යන මේ ද, තමා තුළ වූ කර්කශ වූ තද වූ මහාභූතයන් නිසා හටගත් අන්‍ය වූ යම් කිසිවකුත් වේ ද, ඇවැත්නි, මේ ආධ්‍යාත්මිකපෘථිවිධාතුව යයි කියනු ලැබේ.

Free Distribution www.aathaapi.org

යා චෙව ඛො පන අජ්ඣත්තිකා පඨවිධාතු යා ච බාහිරා පඨවිධාතු පඨවිධාතුරෙවෙසා. 'තං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා පඨවිධාතුයා නිබ්බින්දති. පඨවිධාතුයා චිත්තං විරාජෙති.

7 හොති ඛො සො ආවුසො සමයො යං බාහිරා ආපොධාතු පකුප්පති. අන්තරහිතා තස්මිං සමයෙ බාහිරා පඨවිධාතු හොති. තස්සා හි නාම ආවුසො බාහිරාය පඨවිධාතුයා තාව මහල්ලිකාය අනිච්චතා පඤ්ඤායිස්සති, ඛයධම්මතා පඤ්ඤායිස්සති, වයධම්මතා පඤ්ඤායිස්සති, විපරිනාමධම්මතා පඤ්ඤායිස්සති. කිම්පනිමස්ස මත්තට්ඨකස්ස කායස්ස තණ්හුපාදින්නස්ස 'අහන්ති වා, මමන්ති වා, අස්මීති වා'. අථ ඛ්වස්ස[1] නො තෙවෙත්ථ[2] හොති.

8 තඤ්චෙ ආවුසො භික්ඛුං පරෙ අක්කොසන්ති පරිභාසන්ති රොසෙන්ති විහෙසෙන්ති, සො එවං පජානාති: උප්පන්නා ඛො මෙ අයං සොතසම්ඵස්සජා දුක්ඛා වෙදනා. සා ච ඛො පටිච්ච නො අප්පටිච්ච. කිං පටිච්ච? ඵස්සං පටිච්ච. සො ඵස්සො[3] අනිච්චොති පස්සති. වෙදනා අනිච්චාති පස්සති. සඤ්ඤා අනිච්චාති පස්සති. සඞ්ඛාරා අනිච්චාති පස්සති. විඤ්ඤාණං අනිච්චන්ති පස්සති. තස්ස ධාතාරම්මණමෙව චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති.[4]

9. තඤ්චෙ ආවුසො භික්ඛුං පරෙ අනිට්ඨෙහි අකන්තෙහි අමනාපෙහි සමුදාචරන්ති: පාණිසම්ඵස්සෙනපි, ලෙඩ්ඩුසම්ඵස්සෙනපි, දණ්ඩසම්ඵස්සෙනපි, සත්ථසම්ඵස්සෙනපි, සො එවං පජානාති: "තථාභූතො ඛො අයං කායො යථාභූතස්මිං කායෙ පාණිසම්ඵස්සාපි කමන්ති, ලෙඩ්ඩුසම්ඵස්සාපි කමන්ති, දණ්ඩසම්ඵස්සාපි කමන්ති, සත්ථසම්ඵස්සාපි කමන්ති. වුත්තං ඛො පනෙතං භගවතා කකචූපමොවාදෙ:[5] 'උභතො දණ්ඩකෙන චෙපි භික්ඛවෙ කකචෙන චොරා ඔචරකා අඞ්ගමඞ්ගානි ඔකන්තෙය්‍යුං,[6] තත්‍රාපි යො මනො පදොසෙය්‍ය න මෙ සො තෙන සාසනකරො'ති. ආරද්ධං ඛො පන මෙ විරියං භවිස්සති අසල්ලීනං. උපට්ඨිතා සති අපම්මුට්ඨා.[7] පස්සද්ධො කායො අසාරද්ධො. සමාහිතං චිත්තං එකග්ගං. කාමං දානි ඉමස්මිං කායෙ පාණිසම්ඵස්සාපි කමන්තු, ලෙඩ්ඩුසම්ඵස්සාපි කමන්තු, දණ්ඩසම්ඵස්සාපි කමන්තු, සත්ථසම්ඵස්සාපි කමන්තු, කරීයති හිදං බුද්ධානං සාසන''න්ති

---

1. අථඛ්වාස්ස - මජසං, 2. නො තෙවෙත්ථ - මජසං, සයා. නොපෙත්ථ - PTS.
3. සොපි ඛො ඵස්සො - සයා 4 විමුච්චති - සයා. 5 කකචූපමෙ ඔවාදෙ - සයා.
6. ඔක්කන්තෙය්‍යුං - සයා. 7. අසම්මුට්ඨා - සිමු. මජසං.

යම් මේ ආධ්‍යාත්මික පෘථිවිධාතුවකුත් වේ ද, යම් බාහිර පෘථිවිධාතුවකුත් වේ ද, ඒ සියල්ල පෘථිවිධාතු ම ය. 'මේ පෘථිවිධාතුව මගේ නො වෙයි. මම තෙල පෘථිවිධාතුයෙම් නො වෙමි. පෘථිවි ධාතුව මාගේ ආත්මය නො වේ'යි මෙසේ මෙය සම්‍යක්ප්‍රඥාවෙන් තත් වූ පරිදි දක්ක යුතු ය. මෙසේ මෙය තත් වූ පරිදි සම්‍යක්ප්‍රඥාවෙන් දුක පෘථිවිධාතුවෙහි උකැටි වෙයි. පෘථිවිධාතුවෙන් සිත බැහැර කෙරෙයි.

7. යම් හෙයෙකින් බාහිර ආපොධාතුව කිපේ ද, එබඳු කාලයෙක් වේ ම ය. එකල්හි බාහිර පඨවිධාතුව අතුරු දහන් වූයේ වෙයි. ඇවැත්නි, බහලත්වයෙන් ඒසා (කෙළ සියදහසක් පමණ) මහත් වූ ඒ බාහිර පඨවිධාතුවේ ද අනිත්‍යභාවය පෙනෙයි. ක්ෂයස්වභාවය පෙනෙයි. ව්‍යයස්වභාවය පෙනෙයි. වෙනස්වන ස්වභාවය ඇති බව පෙනෙයි. කිම, ඔහුට මේ මඳ කලක් පවත්නා වූ තෘෂ්ණාවෙන් දැඩි ව ගන්නා ලද්දා වූ ආධ්‍යාත්මික ශරීරය පිළිබඳ ව 'මම ය' කියා හෝ 'මාගේ ය' කියා හෝ 'මම වෙමි'යි කියා හෝ ගැනීමෙක් වේ ද? තිලකුණු නගා බලන ඒ මහණහට මෙහි තෘෂ්ණාදෘෂ්ටිමානවශයෙන් ගැනීමෙක් නො වේ ම ය.

8. ඇවැත්නි, ඒ මහණහට අන්‍යයෝ ආක්‍රෝශ කෙරෙත් ද, පරිභව කෙරෙත් ද, ගටත් ද, වෙහෙසත් ද, හෙතෙම මෙසේ දනියි: 'මට මේ ශ්‍රොත්‍රසංස්පර්ශයෙන් හටගත් දුඃඛවේදනාව උපන්නී ය. ඕ වනාහි හේතුවක් නිසා උපන්නී ය. හේතුරහිත ව නො උපන්නී ය. කුමක් හේතුකොට ද යත්: ස්පර්ශය හේතු කොට ය. හෙතෙම ස්පර්ශය අනිත්‍ය යයි දකි යි. වේදනාව අනිත්‍යය යි දකියි. සංඥාව අනිත්‍යය යි දකියි. සංස්කාරයෝ අනිත්‍යයහ යි දකියි. විඥානය අනිත්‍යය යි දකියි. ඔහුගේ සිත ධාතුසඞ්ඛ්‍යාත ආලම්බනයට ම බසී. ඒ අරමුණෙහි ම පහදියි. ඒ අරමුණෙහි ම සිටියි. ඒ අරමුණෙහි ධාතුවශයෙන් ම නිශ්චයට පැමිණෙයි.

9. ඇවැත්නි, ඉදින් ඒ මහණහට අන්‍යයෝ අනිටු වූ නො කැමැති වූ මන නො වඩන්නා වූ අතුල්පහරින් ද, කැටකැබිලිතිපහරින් ද, දඬු පහරින් ද, සැත්පහරින් ද ගසත් නම් හෙතෙම මෙසේ දනියි: "යම්බඳු කයක අත් පහර වදී ද, කැට පහර වදී ද, දඬු පහර වදී ද, සැත් පහර වදී ද, මේ කය එසේ වූයේ ය. භාග්‍යවතුන් වහන්සේ විසින් කකචූපම ඔවාදයෙහි දී මෙය වදාරණ ලදී: 'මහණෙනි, ලමුකම් ඇති සොරු දෙපස මිටි ඇති කියතකින් අඟ පසඟ කපත් ද, ඒ සොරුන් කෙරෙහි ද යමෙක් සිත ප්‍රදුෂ්‍ය කරන්නේ නම් හෙතෙම එයින් මාගේ අනුශාසනය කරන්නෙක් නො වේ ය' කියා යි. මා විසින් වීර්‍ය්‍යය පටන්ගන්නා ලද්දේ නො හැකුළුණේ වන්නේ ය. සිහිය එළඹ සිටියේ නො මුළා ය. කය සන්හිඳුණේ පහ වූ දරථ ඇත්තේ ය. සිත සමාහිත වූයේ එකඟ ය. දැන් කැමැති සේ මේ ශරීරයෙහි අතුල්පහස්හු ද වදිත්වා. කැට පහස්හු ද වදිත්වා. දඬුපහස්හු ද වදිත්වා. සැත්පහස්හු ද වදිත්වා. එහෙත් බුදුන්ගේ මේ ශාසනාය කරනු ලැබේ ම ය.

10. තස්ස චෙ ආවුසො භික්ඛුනො එවං බුද්ධං අනුස්සරතො එවං ධම්මං අනුස්සරතො එවං සඞ්ඝං අනුස්සරතො උපෙක්ඛා කුසලනිස්සිතා න සණ්ඨාති. සො තෙන සංවිජ්ජති, සංවෙගං ආපජ්ජති: 'අලාභා වත මෙ, න වත මෙ ලාභා, දුල්ලද්ධං වත මෙ, න වත මෙ සුලද්ධං, යස්ස මෙ එවං බුද්ධං අනුස්සරතො එවං ධම්මං අනුස්සරතො එවං සඞ්ඝං අනුස්සරතො උපෙක්ඛා කුසලනිස්සිතා න සණ්ඨාතී'ති.

11. සෙය්‍යථාපි ආවුසො සුණිසා සසුරං[1] දිස්වා සංවිජ්ජති සංවෙගං ආපජ්ජති, එවමෙව ඛො ආවුසො තස්ස චෙ භික්ඛුනො එවං බුද්ධං අනුස්සරතො එවං ධම්මං අනුස්සරතො එවං සඞ්ඝං අනුස්සරතො උපෙක්ඛා[2] කුසලනිස්සිතා න සණ්ඨාති, සො තෙන සංවිජ්ජති, සංවෙගං ආපජ්ජති: 'අලාභා වත මෙ, න වත මෙ ලාභා, දුල්ලද්ධං වත මෙ, න වත මෙ සුලද්ධං, යස්ස මෙ එවං බුද්ධං අනුස්සරතො එවං ධම්මං අනුස්සරතො එවං සඞ්ඝං අනුස්සරතො උපෙක්ඛා[2] කුසලනිස්සිතා න සණ්ඨාතී'ති.

12. තස්ස චෙ ආවුසො භික්ඛුනො එවං බුද්ධං අනුස්සරතො එවං ධම්මං අනුස්සරතො එවං සඞ්ඝං අනුස්සරතො උපෙක්ඛා කුසලනිස්සිතා සණ්ඨාති, සො තෙන අත්තමනො හොති. එත්තාවතාපි ඛො ආවුසො භික්ඛුනො බහුකතං හොති.

13. කතමා චාවුසො ආපොධාතු? ආපොධාතු සියා අජ්ඣත්තිකා සියා බාහිරා. කතමා චාවුසො අජ්ඣත්තිකා ආපොධාතු? යං අජ්ඣත්තං පච්චත්තං ආපො ආපොගතං උපාදින්නං: සෙය්‍යථීදං- පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිංඝාණිකා ලසිකා මුත්තං, යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං ආපො ආපොගතං උපාදින්නං - අයං වුච්චතාවුසො අජ්ඣත්තිකා ආපොධාතු. යා චෙව ඛො පන අජ්ඣත්තිකා ආපොධාතු යා ච බාහිරා ආපොධාතු ආපොධාතුරෙවෙසා. තං 'නෙතං මම, නෙසොහමස්මි න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා ආපොධාතුයා නිබ්බින්දති, ආපොධාතුයා චිත්තං විරාජෙති.

14 හොති ඛො සො ආවුසො සමයො යං බාහිරා ආපොධාතු පකුප්පති. සා ගාමම්පි වහති, නිගමම්පි වහති, නගරම්පි වහති, ජනපදම්පි වහති, ජනපදපදෙසම්පි වහති. හොති ඛො සො ආවුසො සමයො යං මහාසමුද්දෙ යොජනසතිකානිපි උදකානි ඔගච්ඡන්ති, ද්වියොජනසතිකානිපි උදකානි ඔගච්ඡන්ති, තියොජනසතිකානිපි උදකානි ඔගච්ඡන්ති, චතුයොජනසතිකානිපි උදකානි ඔගච්ඡන්ති, පඤ්චයොජනසතිකානිපි උදකානි ඔගච්ඡන්ති, ඡයොජනසතිකානිපි උදකානි ඔගච්ඡන්ති, සත්තයොජනසතිකානිපි උදකානි ඔගච්ඡන්ති. -

---

1. සසුරං - ස්‍යා, 2. උපෙඛා - PTS.

10. ඇවැත්නි, ඉදින් මෙසේ බුදුන් සිහි කරන මෙසේ ධර්මය සිහි කරන මෙසේ සංඝයා සිහි කරන මහණහට කුශලනිඃශ්‍රිත වූ විදර්ශනෝපේක්ෂාව නො පිහිටා ද, හෙතෙම එයින් සංවිග්න (කම්පිත) වෙයි. සංවෙගයට පැමිණෙයි: 'මෙසේ බුදුන් සිහි කරන මෙසේ ධර්මය සිහි කරන මෙසේ සඞ්ඝයා සිහි කරන යම් බඳු වූ මට කුශලනිඃශ්‍රිත වූ උපේක්ෂාව නො පිහිටා ද, එය ඒකාන්තයෙන් මට අලාභ ය. ඒකාන්තයෙන් මට ලාභ නො වෙයි. මාගේ ලැබීම නොමනා ය. මාගේ ලැබීම යහපත් නො වේ'යි කියායි.

11. ඇවැත්නි, යම් සේ ලේලිය මයිලණුවන් දැක සංවිග්න වෙයි ද, සංවෙගයට පැමිණෙයි ද, ඇවැත්නි, මෙසේ බුදුන් සිහි කරන මෙසේ ධර්මය සිහි කරන මෙසේ සඞ්ඝයා සිහි කරන ඒ මහණහට කුශලනිඃශ්‍රිත උපෙක්ෂාව නො පිහිටා ද, හෙතෙම එයින් සංවිග්න වෙයි. සංවෙගයට පැමිණෙයි: මෙසේ බුදුන් සිහි කරන මෙසේ ධර්මය සිහි කරන මෙසේ සඞ්ඝයා සිහි කරන යම් බඳු වූ මට කුශලනිඃශ්‍රිත උපෙක්ෂාව නො පිහිටා ද, ඒ මට ඒකාන්තයෙන් අලාභ ය. මට ඒකාන්තයෙන් ලාභ නො වෙයි. මාගේ ලැබීම නොමනා ය. මාගේ ලැබීම යහපත් නො වේ.

12 ඇවැත්නි, මෙසේ බුදුන් සිහි කරන මෙසේ ධර්මය සිහි කරන මෙසේ සඞ්ඝයා සිහි කරන ඒ මහණහට ඉදින් කුශලනිඃශ්‍රිත උපෙක්ෂාව පිහිටා නම්, හෙතෙම එයින් සතුටු වෙයි. ඇවැත්නි, මෙ පමණකින් ඒ මහණහු විසින් බුද්ධශාසනය බොහෝ කොට කරන ලද වෙයි.

13 ඇවැත්නි, ආපොධාතුව කවර? ආපොධාතුව ආධ්‍යාත්මික ද වන්නේ ය. බාහිර ද වන්නේ ය. ඇවැත්නි, ආධ්‍යාත්මික ආපො ධාතුව කවර යත්: අධ්‍යාත්ම වූ ප්‍රත්‍යාත්ම වූ භූතයන් නිසා හටගත් යම් (ආබන්ධන ලක්ෂණ) ආපයෙක් ආපොගතයෙක් වේ ද – ඒ මෙසේ ය: පිත, සෙම, සැරව, ලේ, ඩහදිය, මේදතෙල්, කඳුළු, වුරුණුතෙල්, කෙළ, සොටු, සඳමිදුල, මුත්‍ර, යන මොහු ය. තමා තුළ පිහිටි ආබන්ධන ලක්ෂණ වූ ආපො බවට ගිය මහාභූතයන් නිසා හටගත් යම් අන් කිසිවකුත් වේ ද, ඇවැත්නි, මෙය අජ්ඣත්තික ආපොධාතුවය යි කියනු ලැබේ. ඇවැත්නි, යම් මේ ආධ්‍යාත්මික ආපොධාතුවක් වේ ද, යම් බාහිර ආපොධාතුවකුත් වේ ද, මේ සියල්ල ආපොධාතු ම ය 'මේ මාගේ නො වේ. මේ මම නො වෙමි. මේ මාගේ ආත්මය නො වේය'යි මෙය මෙසේ තත් වූ පරිදි සම්‍යක්ප්‍රඥාවෙන් දැක්ක යුතු ය. මෙසේ එය තත් වූ පරිදි සම්‍යක්ප්‍රඥාවෙන් දැක ආපොධාතුවෙහි කලකිරෙයි. ආපොධාතුවෙහි සිත නො රඳවයි.

14 ඇවැත්නි, යම් හෙයෙකින් බාහිර ආපොධාතුව කිපේ ද, එබඳු වූ කාලයෙක් වේ ම ය. එය ගම් ද ගලා යයි. නියම්ගම් ද ගලා යයි නගර ද ගලා යයි. දනවු ද ගලා යයි. දනවු පෙදෙස් ද ගලා යයි. ඇවැත්නි, මහමුහුද යොදුන් සියක් පමණ තැන් ජලය සිඳී යේ ද, යොදුන් දෙසියකුත් ජලය සිඳී යේ ද, යොදුන් තුන්සියකුත් ජලය සිඳී යේ ද, යොදුන් හාරසියකුත් ජලය සිඳී යේ ද, යොදුන් පන්සියකුත් ජලය සිඳී යේ ද, යොදුන් හයසියකුත් ජලය සිඳී යේ ද, යොදුන් සත්සියකුත් ජලය සිඳී යේ ද එබඳු කාලයෙක් වෙයි.

හොති ඛො සො ආවුසො සමයො යං මහාසමුද්දෙ සත්තතාලම්පි උදකං සණ්ඨාති, ඡතාලම්පි උදකං සණ්ඨාති, පඤ්චතාලම්පි උදකං සණ්ඨාති, චතුතාලම්පි උදකං සණ්ඨාති, තිතාලම්පි උදකං සණ්ඨාති, ද්විතාලම්පි උදකං සණ්ඨාති, තාලම්පි[1] උදකං සණ්ඨාති. හොති ඛො සො ආවුසො සමයො යං මහාසමුද්දෙ සත්තපොරිසම්පි උදකං සණ්ඨාති, ඡපොරිසම්පි උදකං සණ්ඨාති, පඤ්චපොරිසම්පි උදකං සණ්ඨාති, චතුපොරිසම්පි උදකං සණ්ඨාති, තිපොරිසම්පි උදකං සණ්ඨාති, ද්විපොරිසම්පි උදකං සණ්ඨාති, පොරිසම්පි[2] උදකං සණ්ඨාති. හොති ඛො සො ආවුසො සමයො යං මහාසමුද්දෙ අඩ්ඪපොරිසම්පි උදකං සණ්ඨාති, කටිමත්තම්පි උදකං සණ්ඨාති, ජණ්ණුමත්තම්පි[3] උදකං සණ්ඨාති, ගොප්ඵකමත්තම්පි උදකං සණ්ඨාති. හොති ඛො සො ආවුසො සමයො යං මහාසමුද්දෙ අඞ්ගුලිපබ්බතෙමනමත්තම්පි උදකං න හොති. තස්සා හි නාම ආවුසො බාහිරාය ආපොධාතුයා තාව මහල්ලිකාය අනිච්චතා පඤ්ඤායිස්සති -පෙ-*

15. තස්ස චෙ ආවුසො භික්ඛුනො [එවං බුද්ධං අනුස්සරතො එවං ධම්මං අනුස්සරතො] එවං සඞ්ඝං අනුස්සරතො උපෙක්ඛා කුසලනිස්සිතා සණ්ඨාති, සො තෙන අත්තමනො හොති. එත්තාවතාපි ඛො ආවුසො භික්ඛුනො බහුකතං හොති.

16. කතමා චාවුසො තෙජොධාතු? තෙජොධාතු සියා අජ්ඣත්තිකා සියා බාහිරා. කතමා චාවුසො අජ්ඣත්තිකා තෙජොධාතු? යං අජ්ඣත්තං පච්චත්තං තෙජො තෙජොගතං උපාදින්නං-සෙය්‍යථීදං: යෙන ච සන්තප්පති, යෙන ච ජරීයති[4], යෙන ච පරිඩය්හති, යෙන ච අසිතපීතඛායිතසායිතං සම්මා පරිණාමං ගච්ඡති, යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං තෙජො තෙජොගතං උපාදින්නං - අයං වුච්චතාවුසො අජ්ඣත්තිකා තෙජොධාතු. යා චෙව ඛො පන අජ්ඣත්තිකා තෙජොධාතු යා ච බාහිරා තෙජොධාතු තෙජොධාතුරෙවෙසා. තං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා තෙජොධාතුයා නිබ්බින්දති. තෙජොධාතුයා චිත්තං විරාජෙති.

17 හොති ඛො සො ආවුසො සමයො යං බාහිරා තෙජොධාතු පකුප්පති. සා ගාමම්පි ඩහති,[5] නිගමම්පි ඩහති, නගරම්පි ඩහති, ජනපදම්පි ඩහති, ජනපදපදෙසම්පි ඩහති. සා හරිතන්තං වා පන්ථන්තං වා සෙලන්තං වා උදකන්තං වා රමණීයං වා භූමිභාගං ආගම්ම අනාහාරා නිබ්බායති. හොති ඛො සො ආවුසො සමයො යං කුක්කුටපත්තෙනපි න්හාරුදද්දුලෙනපි[6] අග්ගිං ගවෙසන්ති. තස්සා හි නාම ආවුසො බාහිරාය තෙජොධාතුයා තාව මහල්ලිකාය අනිච්චතා පඤ්ඤායිස්සති -පෙ-

1. තාලමත්තම්පි - මජසං, සයා, PTS. 2. පොරිසමත්තම්පි - මජසං. සයා. PTS.
3. ජාණුකමත්ත - මජසං. ජනනුමත්තම්පි - සයා.
4. ජීරියති - මජසං. ජීරති - සයා. ජීරියති - PTS. 5. දහති - මජසං.
6. නහාරුදද්දුලෙනපි - මජසං. න්හාරුදද්දලෙපි - සයා.
* පෙය්‍යාලෙන සඞ්ඛිත්තං පඨවීධාතුවාරෙ වුත්තනයෙනෙව වෙදිතබ්බං.

ඇවැත්නි, යම් කලෙක මහ මුහුදෙහි ජලය සත්තලක් පමණ සිටී ද, සතලක් පමණ සිටී ද, පස්තලක් පමණ සිටී ද සිවුතලක් පමණ සිටී ද තුන්තලක් පමණ සිටී ද, දෙතලක් පමණ සිටී ද, එක්තලක් පමණ සිටී ද එවැනි කාලයෙක් වෙයි. ඇවැත්නි, යම් කලෙක මහ මුහුදෙහි පුරුෂ ප්‍රමාණ සතක් ජලය සිටී ද, පුරුෂ ප්‍රමාණ සයක්... පුරුෂ ප්‍රමාණ පසක් ජලය සිටි ද, පුරුෂ ප්‍රමාණ සතරක් ජලය සිටී ද, පුරුෂ ප්‍රමාණ තුනක් ජලය සිටී ද, පුරුෂ ප්‍රමාණ දෙකක් ජලය සිටී ද, පුරුෂ ප්‍රමාණයක් ජලය සිටී ද, එබඳු වූ කාලයෙක් වේ ම ය. ඇවැත්නි, යම් කලෙක මහ මුහුදෙහි අඩපුරුෂ ප්‍රමාණයක් ජලය සිටී ද, කටිය පමණ ජලය සිටී ද, දණ පමණ ජලය සිටී ද, ගොප් ඇටය පමණ ජලය සිටී ද, එබඳු වූ කාලයෙක් වේ ම ය. ඇවැත්නි, යම් කලෙක මහ මුහුදෙහි ඇඟිලි පුරුක තෙමෙන පමණ ජලය නො වේ ද, එබඳු වූ කාලයෙක් වේ ම ය. ඇවැත්නි, එපමණ මහත් වූ ඒ බාහිර ආපොධාතුවගේ අනිත්‍යතා පෙනෙන්නේ ය...*

15 ඇවැත්නි, මෙසේ බුදුන් සිහි කරණ, ධර්මය සිහි කරණ, සඞ්ඝයා සිහි කරණ ඒ මහණහට ඉදින් කුශල නිඃශ්‍රිත වූ උපෙක්‍ෂාව පිහිටා ද, හෙතෙම එයින් සතුටු වෙයි 'ඇවැත්නි, මෙපමණෙකිනුත් මහණහු විසින් බුද්ධශාසනය බොහෝ කොට කරණ ලද්දේ වෙයි.

16. ඇවැත්නි, තේජෝධාතු කවර? තේජෝධාතුව අජ්ඣත්තික ද වන්නේ ය. බාහිර ද වන්නේ ය. ඇවැත්නි, අජ්ඣත්තික තේජෝධාතුව කවර ? තමා පිළිබඳ තේජස වූ තේජස් බවට ගියා වූ (මම ය මාගේ යයි) තරව ගන්නා ලද්දී යමක් වේ ද- එනම්: යමෙකින් තැවේ ද, යමෙකින් දිරු ද යමෙකින් දැවේ ද, අනුභව කරණ ලද පානය කරණ ලද කඩා කන ලද රස විඳින ලද දේ යමෙකින් මැනැවින් පැසවීමට යේ ද, එයින් අන්‍ය වූ ද, තමා නිසා පවත්නා වූ තෙජස වූ තෙජස් බවට ගියා වූ තරව ගන්නා ලද්දූ වූ යම් කිසිවකුත් වේ ද - ඇවැත්නි, මෙය ආධ්‍යාත්මික තේජෝධාතු යයි කියනු ලැබේ. ඇවැත්නි, යම් ඒ ආධ්‍යාත්මික තේජෝධාතුවක් වේ ද, යම් බාහිර තේජෝධාතුවක් වේ ද, එය තේජෝධාතු ම ය. 'එය මාගේ නො වෙයි. මම තෙල නො වෙමි. එය මාගේ ආත්මය නො වෙ'යි- මේ මෙසේ තත් වූ පරිදි සම්‍යක්ප්‍රඥාවෙන් දක්ක යුතු ය මෙසේ මෙය තත් වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දුක තේජෝධාතුවෙහි කලකිරෙයි. තේජෝ ධාතුවෙහි සිත නො ඇලවයි

17. ඇවැත්නි, යම් කලෙක බාහිර තේජෝධාතුව කිපේ ද, එබඳු කාලයෙක් වේ ම ය. එය ගම් ද දවයි. නියම්ගම් ද දවයි. නගර ද දවයි. ජනපද ද දවයි. දනවුපෙදෙස් ද දවයි. ඒ තේජෝධාතුව නිල් තෙත් තණ වෙතට හෝ මහමගට හෝ පව්වකට හෝ දියකට හෝ එළිමහත් බිම්පෙදෙසකට හෝ පැමිණ ආහාර රහිත වූයේ නිවෙයි. ඇවැත්නි, යම් කලෙක කුකුළු පියාපතෙකින් ද සම්වැරලියෙන් ද ගිනි සොයත් නම් එබඳු කාලයෙක් වේ ම ය. ඇවැත්නි, එපමණ මහත් වූ බාහිර තේජෝධාතුවෙහි අනිත්‍ය භාවයක් පෙනෙන්නේ ය ...

* මෙහි පෙයඝලයෙන් වැසුනු කොටස පඨවිධාතුවාරයෙහි කී නයින් දතයුතු.
§ මෙහි සෙ සු වාරයන්හි ද 'උපාදින්නං' - පදයට මේ අර්ථය ගතයුතු.

Free Distribution www.aathaapi.org

18. තස්ස චෙ ආවුසො භික්ඛුනො එවං බුද්ධං අනුස්සරතො එවං ධම්මං අනුස්සරතො එවං සඞ්ඝං අනුස්සරතො උපෙක්ඛා කුසලනිස්සිතා සණ්ඨාති, සො තෙන අත්තමනො හොති. එත්තාවතාපි ඛො ආවුසො භික්ඛුනො බහුකතං හොති.

19. කතමා චාවුසො වායොධාතු? වායොධාතු සියා අජ්ඣත්තිකා සියා බාහිරා. කතමා චාවුසො අජ්ඣත්තිකා වායොධාතු? යං අජ්ඣත්තං, පච්චත්තං වායො වායොගතං උපාදින්නං - සෙය්‍යථීදං: උද්ධඞ්ගමා වාතා, අධොගමා වාතා, කුච්ඡිසයා වාතා, කොට්ඨසයා[1] වාතා, අඞ්ගමඞ්ගානුසාරිනො වාතා, අස්සාසො පස්සාසො ඉති වා, යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං වායො වායොගතං උපාදින්නං - අයං වුච්චතාවුසො අජ්ඣත්තිකා වායොධාතු. යා චෙව ඛො පන අජ්ඣත්තිකා වායොධාතු යා ච බාහිරා වායොධාතු වායොධාතුරෙවෙසා. තං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා වායොධාතුයා නිබ්බින්දති, වායොධාතුයා චිත්තං විරාජෙති.

20 හොති ඛො සො ආවුසො සමයො යං බාහිරා වායොධාතු පකුප්පති, සා ගාමම්පි වහති, නිගමම්පි වහති, නගරම්පි වහති, ජනපදම්පි වහති, ජනපදපදෙසම්පි වහති. හොති ඛො සො ආවුසො සමයො යං ගිම්හානං පච්ඡිමෙ මාසෙ තාලවණ්ටෙනපි විධූපනෙනපි වාතං පරියෙසන්ති, ඔස්සාවනෙපි[2] තිණානි න ඉඤ්ජන්ති.[3] තස්සා හි නාම ආවුසො බාහිරාය වායොධාතුයා තාව මහල්ලිකාය අනිච්චතා පඤ්ඤායිස්සති, ඛයධම්මතා පඤ්ඤායිස්සති, වයධම්මතා පඤ්ඤායිස්සති, විපරිණාමධම්මතා පඤ්ඤායිස්සති. කිම්පනිමස්ස මත්තට්ඨකස්ස කායස්ස තණ්හුපාදින්නස්ස 'අහන්ති වා මමන්ති වා අස්මීති වා,' අථ ඛ්වස්ස[4] නො චෙවෙත්ථ[5] හොති.

21. තඤ්චෙ ආවුසො භික්ඛුං පරෙ අක්කොසන්ති පරිභාසන්ති රොසෙන්ති විහෙසෙන්ති, සො එවං පජානාති: උප්පන්නා ඛො මෙ අයං සොතසම්ඵස්සජා දුක්ඛා වෙදනා, සා ච ඛො පටිච්ච නො අප්පටිච්ච. කිං පටිච්ච? ඵස්සං පටිච්ච. සො ඵස්සො[6] අනිච්චොති පස්සති, වෙදනා අනිච්චාති පස්සති, සඤ්ඤා අනිච්චාති පස්සති, සඞ්ඛාරා අනිච්චා පස්සති, විඤ්ඤාණං අනිච්චන්ති පස්සති. තස්ස ධාතාරම්මණමෙව චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති.[7]

1. කොට්ඨායයා - මජස. 2. ඔස්සවනෙපි - මජසං. සතා. PTS.
3 ඉච්ජන්ති - මජසං, PTS. 4. ඛ්වාස්ස - මජසං.
5. නො නෙවෙත්ථ - මජසං. සතා. නො චෙත්ථ - PTS.
6. සොපි ඛො ඵස්සො - සතා. සොපි ඵස්සො මජසං. 7. විමුච්චති - සතා.

18. ඇවැත්නි, මෙසේ බුදුන් සිහිකරණ, මෙසේ ධර්මය සිහිකරණ, මෙසේ සඞ්ඝයා සිහිකරණ ඒ මහණහට ඉදින් කුශල නිඃශ්‍රිත වූ උපේක්‍ෂාව පිහිටා ද, හෙතෙම එයින් සතුටු වෙයි. ඇවැත්නි, මෙපමණකින්නුත් භික්‍ෂූහු විසින් බුද්ධශාසනය බොහෝ කොට කරන ලද්දේ වෙයි.

19. ඇවැත්නි, වායෝධාතු කවරි? ආධ්‍යාත්මික වායෝ ධාතුවත් බාහිර වායෝ ධාතුවත් ඇත. ඇවැත්නි' අජ්ඣත්තිකවායොධාතුව කවරි? තමා තුළ පවත්නා වූ වාතය වූ වාත සවභාවයට ගියා වූ මහා භූතයන් නිසා හටගත්තා වූ යමක් වේ ද - එනම්: නැලිනැගීම් හික්කා ආදිය පවත්වන, උඩට නගින වාතයෝ ද, මල මූ ආදිය පවත්වන යට බස්නා වාතයෝ ද, අතුනු පිටත පවත්නා වාතයෝ ද, අතුනු තුළ පවත්නා වාතයෝ ද, අඟ පසඟ හැසිරෙන වාතයෝ ද, ආශ්වාසය, ප්‍රශ්වාසය යන වාතයෝ ද, මෙයින් අන්‍ය වූ තමා තුළ පවත්නා වූ වාතය වූ වාත සවභාවයට ගියා වූ භූතයන් නිසා හටගත්තා වූ යම් කිසිවකුත් වේ ද - ඇවැත්නි, මෙය අජ්ඣත්තිකවායෝධාතු ය යි කියනු ලැබේ. යම් ආධ්‍යාත්මික වායොධාතුවක් වේ ද, යම් බාහිර වායොධාතුවකුත් වේ ද, මේ වායොධාතු ම ය. 'මේ මාගේ නො වෙයි. මම නොල නො වෙමි. මේ මගේ ආත්මය නො වෙයි'. මෙසේ මෙය තත් වූ පරිදි සම්‍යක්ප්‍රඥාවෙන් දක්ක යුතු වෙයි. මෙය මෙසේ තත් වූ පරිදි සම්‍යක්ප්‍රඥාවෙන් දක වායො ධාතුවෙහි කළකිරෙයි වායො ධාතුවෙහි සිත නො අලවයි.

20. ඇවැත්නි, යම් කලෙක බාහිර වායෝ ධාතුව කිපේ ද, එබඳු කාලයෙක් වේ ම ය. එය ගම් ද නගාලයි. නියම් ගම් ද නගාලයි. නගරද නගාලයි. ජනපද ද නගාලයි. ජනපද ප්‍රදෙශයන් ද නගාලයි. ඇවැත්නි, යම් කලෙක්හි ගිම්හානයේ අන්තිම මාසයේ දී තල්වැටිනුත් විජිනිපත්නුත් වාතය සොයත් ද, සෙවෙනිඅගත් තණ නො සැලේ ද, එබඳු වූ කාලයෙක් වේ ම ය. ඇවැත්නි, එපමණ මහත් වූ වායොධාතුවෙහි අනිත්‍යභාවය ප්‍රකට වන්නේ ය. ක්‍ෂය සවභාවය ප්‍රකට වන්නේ ය. විනාශසවභාව ය ප්‍රකට වන්නේ ය. විපරිණාම සවභාවය ප්‍රකට වන්නේ ය. සවල්පකාලයක් පවත්නා වූ තණ්හාවෙන් අල්ලා ගත්තා ලද්දා වූ මේ ශරීරය පිළිබඳව 'මේ මම ය කියා හෝ, මාගේ ය කියා හෝ, මම වෙමි' යි කියා හෝ ගැනීමෙක් කිම, ඔහට වන්නේද? ඒ මහණහට මෙහි තණ්හා මානදිට්ඨි වසයෙන් ගැනීමෙක් නො වෙ ම ය.

21. ඇවැත්නි, ඉදින් අන්‍යයෝ ඒ මහණහට ආක්‍රොශ කෙරෙත් ද, පරිභව කෙරෙත් ද, ගටත් ද, වෙහෙසත් ද, හෙතෙම මෙසේ දනී යි: "මට මේ ශ්‍රොත්‍රසංස්පර්ශයෙන් හටගත් දුක් වේදනාවක් උපන්නී ය. මේ වනාහි හේතුවක් නිසා උපන්නී ය. හේතු රහිතව නො උපන්නී ය. කුමක් හේතු කොට ගෙන ද යත්: ස්පර්ශය හේතු කොට ගෙන ය." හෙතෙමේ ස්පර්ශ ය අනිත්‍ය ය යි දකී යි. වේදනාව අනිත්‍ය ය යි දකියි. සංඥාව අනිත්‍ය ය යි දකී යි. සංස්කාර අනිත්‍ය ය යි දකී යි. විඥානය අනිත්‍ය ය යි දකී යි. ඔහුගේ සිත ධාතු සඞ්ඛ්‍යාත ඒ අරමුණෙහි ම බසී. ඒ අරමුණෙහි ම පහදී යි. ඒ අරමුණෙහි ම සිටී යි. ඒ අරමුණෙහි ම 'ධාතු වසයෙන් මෙසේය' යි නිශ්චයට පැමිණෙයි.

22. තඤ්චෙ ආවුසො භික්ඛුං පරෙ අනිට්ඨෙහි අකන්තෙහි අමනාපෙහි සමුදාචරන්ති: පාණිසම්ඵස්සෙනපි ලෙඩ්ඩුසම්ඵස්සෙනපි දණ්ඩසම්ඵස්සෙනපි සත්ථසම්ඵස්සෙනපි. සො එවං පජානාති: තථාභූතො ඛො අයං කායො යථාභූතස්මිං කායෙ පාණිසම්ඵස්සාපි කමන්ති, ලෙඩ්ඩුසම්ඵස්සාපි කමන්ති, දණ්ඩසම්ඵස්සාපි කමන්ති, සත්ථසම්ඵස්සාපි කමන්ති. වුත්තං ඛො පනෙතං භගවතා කකචූපමොවාදෙ: "උභතොදණ්ඩකෙන චෙපි භික්ඛවෙ කකචෙන චොරා ඔචරකා අඞ්ගමඞ්ගානි ඔක්කන්තෙය්‍යුං,[1] තත්‍රාපි යො මනො පදොසෙය්‍ය න මෙ සො තෙන සාසනකරො"ති. ආරද්ධං ඛො පන මෙ විරියං භවිස්සති අසල්ලීනං, උපට්ඨිතා සති අපම්මුට්ඨා,[2] පස්සද්ධො කායො අසාරද්ධො, සමාහිතං චිත්තං එකග්ගං. කාමං දානි ඉමස්මිං කායෙ පාණිසම්ඵස්සාපි කමන්තු, ලෙඩ්ඩුසම්ඵස්සාපි කමන්තු, දණ්ඩසම්ඵස්සාපි කමන්තු, සත්ථසම්ඵස්සාපි කමන්තු, කරීයති හිදං බුද්ධානං සාසනන්ති.

23. තස්ස චෙ ආවුසො භික්ඛුනො එවං බුද්ධං අනුස්සරතො එවං ධම්මං අනුස්සරතො එවං සඞ්ඝං අනුස්සරතො උපෙක්ඛා කුසලනිස්සිතා න සණ්ඨාති, සො තෙන සංවිජ්ජති සංවෙගං ආපජ්ජති: 'අලාභා වත මෙ න වත මෙ ලාභා, දුල්ලද්ධං වත මෙ න වත මෙ සුලද්ධං, යස්ස මෙ එවං බුද්ධං අනුස්සරතො එවං ධම්මං අනුස්සරතො එවං සඞ්ඝං අනුස්සරතො උපෙක්ඛා කුසලනිස්සිතා න සණ්ඨාතී'ති.

24. සෙය්‍යථාපි ආවුසො සුණිසා සසුරං[3] දිස්වා සංවිජ්ජති සංවෙගං ආපජ්ජති, එවමෙව ඛො ආවුසො තස්ස චෙ භික්ඛුනො එවං බුද්ධං අනුස්සරතො එවං ධම්මං අනුස්සරතො එවං සඞ්ඝං අනුස්සරතො උපෙක්ඛා කුසලනිස්සිතා න සණ්ඨාති, සො තෙන සංවිජ්ජති සංවෙගං ආපජ්ජති: 'අලාභා වත මෙ න වත මෙ ලාභා, දුල්ලද්ධං වත මෙ න වත මෙ සුලද්ධං, යස්ස මෙ එවං බුද්ධං අනුස්සරතො එවං ධම්මං අනුස්සරතො එවං සඞ්ඝං අනුස්සරතො උපෙක්ඛා කුසලනිස්සිතා න සණ්ඨාතී'ති.

25. තස්ස චෙ ආවුසො භික්ඛුනො එවං බුද්ධං අනුස්සරතො එවං ධම්මං අනුස්සරතො එවං සඞ්ඝං අනුස්සරතො උපෙක්ඛා කුසලනිස්සිතා සණ්ඨාති, සො තෙන අත්තමනො හොති. එත්තාවතාපි ඛො ආවුසො භික්ඛුනො බහුකතං හොති.

26. සෙය්‍යථාපි ආවුසො කට්ඨඤ්ච පටිච්ච වල්ලිඤ්ච පටිච්ච තිණඤ්ච පටිච්ච මත්තිකඤ්ච පටිච්ච ආකාසො පරිවාරිතො අගාරන්තෙව[4] සඞ්ඛං[5] ගච්ඡති, එවමෙව ඛො ආවුසො අට්ඨිඤ්ච පටිච්ච න්හාරුඤ්ච පටිච්ච මංසඤ්ච පටිච්ච චම්මඤ්ච පටිච්ච ආකාසො පරිවාරිතො රූපන්තෙව[6] සඞ්ඛං ගච්ඡති. –

---

1. ඔක්කන්තෙය්‍යුං - සයා. 2. අපම්මුට්ඨා - සීමු, මජසං. 3. සස්සුරං - සයා.
4. අගාරන්තෙව්ව - මජසං, සයා. 5. සඞ්ඛ්‍යං - සයා. 6. රූපන්තෙව්ව - මජසං. සයා.

22. ඇවැත්නි, අන්‍යයෝ ඒ මහණහට අනිටු වූ නො කැමැති වූ මන නො වඩන්නා වූ අත්පහරින් ද කැටකැබලිතිපහරින් ද දඬුපහරින් ද සැත් පහරින් ද ගසත් නම්, හෙතෙම මෙසේ දනියි: යම්බඳු ශරීරයෙක අත්පහර වදී ද, කැටපහර වදී ද, දඬුපහර වදී ද, සැත් පහර වදී ද, මෙ ශරීරය එසේ වූයේ ය. භාග්‍යවතුන් වහන්සේ විසින් කකචූපමොවාදයෙහි දී මෙය වදාරණ ලදී— "මහණෙනි, ලමුකම් ඇති සොරු දෙපස මිටි ඇති කියතකින් අඟ පසඟ කපත් ද, ඒ සොරුන් කෙරෙහි ද යමෙක් සිත ප්‍රදූෂිත කරන්නේ නම්, හෙතෙම එයින් මාගේ අනුශාසනය කරන්නේ නො වේ"යි කියා ය. මාගේ වීර්‍ය්‍යය පටන් ගන්නා ලද්දේ නො හැකුළුණේ වන්නේ ය. සිහිය එළඹ සිටියේ නො මුළා ය. කය සන්හිඳුණේ පහ වූ දරථ ඇත්තේ ය. සිත සමාහිත වූයේ එකඟ ය. දැන් කැමැති සේ මේ ශරීරයෙහි අත්පහස්හු ද වදිත්වා. කැටපහස්හු ද වදිත්වා. දඬුපහස්හු ද වදිත්වා. සැත් පහස්හු ද වදිත් වා. එහෙත් බුදුන්ගේ මේ අනුශාසනය කරනු ලැබේ ම ය.

23. ඇවැත්නි, මෙසේ බුදුන් සිහි කරන මෙසේ දහම් සිහි කරන මෙසේ සඞ්ඝයා සිහි කරන ඒ මහණහට කුශලනිඃශ්‍රිත වූ විදර්ශනෝ-පෙක්‍ෂාව නො පිහිටා ද, හෙතෙම එයින් කලකිරෙ යි, සංවේගයට පැමිණෙ යි: 'මෙසේ බුදුන් සිහි කරන දහම් සිහි කරන සඞ්ඝයා සිහි කරන යම් බඳු වූ මට කුශලනිඃශ්‍රිත වූ උපෙක්‍ෂාව නො පිහිටා ද, එය ඒකාන්තයෙන් මට අලාභ ය. මට ඒකාන්තයෙන් ලාභය නො වෙයි මාගේ ලැබීම නො මැනවි. මාගේ ලැබීම යහපත් නො වෙයි' කියා ය.

24. ඇවැත්නි, යම් සේ ලේලිය මයිලණුවන් දැක බියපත් වේද, සංවේගයට පැමිණේ ද, ඇවැත්නි, මෙසේ බුදුන් සිහි කරන මෙසේ දහම් සිහි කරන මෙසේ සඞ්ඝයා සිහි කරන ඒ මහණහට කුශලනිඃශ්‍රිත වූ උපේක්‍ෂාව නො පිහිටා ද, හෙතෙම එයින් කල කිරෙයි, සංවේගයට පැමිණෙ යි: 'මෙසේ බුදුන් සිහි කරන, මෙසේ දහම් සිහි කරන මෙසේ සඞ්ඝයා සිහි කරන යම් බඳු වූ මට කුශලනිඃශ්‍රිත වූ උපේක්‍ෂාව නො පිහිටා ද, එය ඒකාන්තයෙන් මට අලාභය. මට ලාභය නො වෙයි. මාගේ ලැබීම නොමැනවි. මාගේ ලැබීම යහපත් නො වේ'යි කියායි.

25. ඇවැත්නි, ඉදින් මෙසේ බුදුන් සිහි කරන, මෙසේ දහම් සිහි කරන, මෙසේ සඞ්ඝයා සිහි කරන, ඔහුට කුශලනිඃශ්‍රිත වීර්‍ය්‍ය බල භාවනා සිද්ධ ෂඩඞ්ග උපේක්‍ෂාව පිහිටා නම්, හෙතෙම එයින් සතුටු වූයේ වෙයි. ඇවැත්නි, මෙ පමණෙකින් ද ඒ මහණහු විසින් බුද්ධශාසනය බොහෝ කොට කරන ලද්දේ වෙයි.

26. ඇවැත්නි, යම් සේ දැව නිසා ද වැල් නිසා ද තණ නිසා ද මැටි නිසා ද ඇවිරී සිටි අහස 'ගෙය'යි ව්‍යවහාරයට යේ ද, ඇවැත්නි, මෙ පරිද්දෙන් ම ඇට නිසා නහර නිසා මස් නිසා සම් නිසා ඇවිරී සිටි අහස 'රූපය' යි ව්‍යවහාරයට යේ. –

අජ්ඣත්තිකඤ්චෙ[1] ආවුසො චක්ඛුං අපරිභින්නං හොති, බාහිරා ච රූපා න ආපාථං ආගච්ඡන්ති, නො ච තජ්ජො සමන්නාහාරො හොති, නෙව තාව තජ්ජස්ස විඤ්ඤාණභාගස්ස පාතුභාවො හොති. අජ්ඣත්තිකඤ්චෙ[1] ආවුසො චක්ඛුං අපරිභින්නං හොති, බාහිරා ච රූපා ආපාථං ආගච්ඡන්ති, නො ච තජ්ජො සමන්නාහාරො හොති, නෙව තාව තජ්ජස්ස විඤ්ඤාණභාගස්ස පාතුභාවො හොති. යතො ච ඛො ආවුසො අජ්ඣත්තිකඤ්චෙ[2] චක්ඛුං අපරිභින්නං හොති. බාහිරා ච රූපා ආපාථං ආගච්ඡන්ති, තජ්ජො ච සමන්නාහාරො හොති, එවං තජ්ජස්ස විඤ්ඤාණභාගස්ස පාතුභාවො හොති. යං තථාභූතස්ස රූපං, තං රූපුපාදානක්ඛන්ධෙ සඞ්ගහං ගච්ඡති. යා තථාභූතස්ස වෙදනා, සා වෙදනුපාදානක්ඛන්ධෙ සඞ්ගහං ගච්ඡති. යා තථාභූතස්ස සඤ්ඤා, සා සඤ්ඤුපාදානක්ඛන්ධෙ සඞ්ගහං ගච්ඡති. යෙ තථාභූතස්ස සඞ්ඛාරා, තෙ සඞ්ඛාරුපාදානක්ඛන්ධෙ සඞ්ගහං ගච්ඡන්ති. යං තථාභූතස්ස විඤ්ඤාණං, තං විඤ්ඤාණුපාදානක්ඛන්ධෙ සඞ්ගහං ගච්ඡති. සො එවං පජානාති: "එවං කිරමෙසං[3] පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සඞ්ගහො සන්නිපාතො සමවායො හොති. වුත්තං ඛො පනෙතං භගවතා: 'යො පටිච්චසමුප්පාදං පස්සති. සො ධම්මං පස්සති. යො ධම්මං පස්සති. සො පටිච්චසමුප්පාදං පස්සතී'ති. පටිච්චසමුප්පන්නා ඛො පනිමෙ යදිදං පඤ්චුපාදානක්ඛන්ධා. යො ඉමෙසු පඤ්චසුපාදානක්ඛන්ධෙසු ඡන්දො ආලයො අනුනයො අජ්ඣොසානං, සො දුක්ඛසමුදයො. යො ඉමෙසු පඤ්චසුපාදානක්ඛන්ධෙසු ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, සො දුක්ඛනිරොධො"ති. එත්තාවතාපි ඛො ආවුසො භික්ඛුනො බහුකතං හොති

27 අජ්ඣත්තිකඤ්චෙ ආවුසො සොතං අපරිභින්නං හොති [බාහිරා ච සද්දා න ආපාථං ආගච්ඡන්ති] -පෙ- [අජ්ඣත්තිකඤ්චෙ ආවුසො] ඝානං අපරිභින්නං හොති. [බාහිරා ච ගන්ධා න ආපාථං ආගච්ඡන්ති [-පෙ- [අජ්ඣත්තිකා චෙ ආවුසො] ජිව්හා අපරිභින්නා හොති [බාහිරා ච රසා න ආපාථං ආගච්ඡන්ති -පෙ- [අජ්ඣත්තිකො චෙ ආවුසො] කායො අපරිභින්නො හොති. [බාහිරා ච ඵොට්ඨබ්බා න ආපාථං ආගච්ඡන්ති [පෙ- [අජ්ඣත්තිකො චෙ ආවුසො] මනො අපරිභින්නො හොති. බාහිරා ච ධම්මා න ආපාථං ආගච්ඡන්ති, නො ච තජ්ජො සමන්නාහාරො හොති, නෙව තාව තජ්ජස්ස විඤ්ඤාණභාගස්ස පාතුභාවො හොති. අජ්ඣත්තිකො චෙ ආවුසො මනො අපරිභින්නො හොති, බාහිරා ච ධම්මා ආපාථං ආගච්ඡන්ති, නො ච තජ්ජො සමන්නාහාරො හොති, නෙව තාව තජ්ජස්ස විඤ්ඤාණභාගස්ස පාතුභාවො හොති. -

1. අජ්ඣත්තිකඤ්චෙව - මජ්ඣං. 2. අජ්ඣත්තිකඤ්චෙව - සීමු.
3. එවං හි කිර ඉමෙසං - මජ්ඣං. එවං කිරිමෙසං - ස්‍යා.

Free Distribution www.aathaapi.org

ඇවැත්නි, ඉදින් ආධ්‍යාත්මික වූ ඇස නො බිඳුණේ වේ නම්, බාහිර රූපයෝත් ඇස්හමුවට නො පැමිණෙත් නම්, එයින් උපදනා (ඇසත් රූපයත් නිසා) මනසිකාරය (මෙනෙහි කිරීම) නො වේ නම්, ඒ තාක් ඊට අනුරූප වූ විඥාන භාගයාගේ පහළවීම නො වෙයි. ඇවැත්නි, ආධ්‍යාත්මිකවූ චක්ෂුඃප්‍රසාදය නො බිඳුණේ වේ ද, බාහිර රූපයෝත් ඇස්හමුවට පැමිණෙත් ද, (එහෙත්) ඊට අනුරූප වූ මෙනෙහි කිරීම නොවේ නම්, ඒ තාක් තදනුරූප වූ චක්ෂුර්විඥානයාගේ පහළවීම නො වේ ම ය. ඇවැත්නි, යම් හෙයකින් ආධ්‍යාත්මික වූ චක්ෂුඃප්‍රසාදය නො බිඳුණේ වේ ද, බාහිර රූපයෝත් ඇස්හමුවට පැමිණෙත් ද, ඊට අනුරූප වූ මෙනෙහි කිරීමත් වේ ද, මෙසේ ඊට සුදුසු විඥානභාගයාගේ පහළවීම වෙයි. ඒ චක්ෂුර්විඥානය සමග වූවහුගේ (ඒ විඥානවිෂය වූ) යම් රූපයෙක් වේ ද, එය රූපොපාදානස්කන්ධයෙහි ඇතුළත් බවට යෙයි. ඒ විඥාන සමංගී වූවහුගේ (ඒ විඥාන සම්ප්‍රයුක්ත) යම් වේදනාවක් වේ ද, එය වේදනෝපාදානස්කන්ධයෙහි ඇතුළත් බවට යෙයි. එබඳු වූවහුගේ (ඒ විඥාන සම්ප්‍රයුක්ත) යම් සංඥාවක් වේ දා එය සංඥොපාදානස්කන්ධයෙහි ඇතුළත් බවට යෙයි. එබඳු වූවහුගේ (ඒ විඥානසම්ප්‍රයුක්ත) යම් චේතනා සංස්කාරයෝ වෙද් ද, ඔහු සංස්කාරොපාදානස්කන්ධයෙහි ඇතුළත් බවට යෙත්. එබඳු වූවහුගේ යම් විඥානයෙක් වේ ද (ඒ චක්ෂුර් විඥානය) විඥානෝපාදානස්කන්ධයෙහි ඇතුළත් බවට යෙයි. හෙතෙම මෙසේ දනියි: "මෙසේ මේ පස්මැදූරුම් වූ උපාදානස්කන්ධයන්ගේ සංග්‍රහය සන්නිපාතය එක් රැස්වීම වෙයි. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් ද වදාරණ ලදී: 'යමෙක් පටිච්චසමුප්පාදය දකී ද, හෙතෙම (පටිච්චසමුප්පන්න වූ) ධර්මය දකියි යමෙක් ධර්මය දකී ද, හෙතෙම පටිච්චසමුප්පාදය දකී'යි කියා ය. මේ උපාදානස්කන්ධයෝ පස්දෙන පටිච්ච සමුප්පන්නයෝ වෙති. මේ උපාදානස්කන්ධ පසෙහි යම් ඡන්දයෙක් ආලයෙක් සෙනහයෙක් ගැලීසිටීමෙක් වේ ද, එය දුක්ඛසමුදයයි. මේ උපාදානස්කන්ධ පසෙහි යම් ඡන්දරාගවිනයෙක් වේ ද, ඡන්දරාගප්‍රහාණියෙක් වේ ද, එය දුක්ඛනිරොධය"යි කියයි ඇවැත්නි, මෙ පමණෙකිනුත් මහණහු විසින් බුද්ධශාසනය බොහෝ කොට කරන ලද්දේ වෙයි.

27. ඇවැත්නි, ආධ්‍යාත්මික වූ ශ්‍රොත්‍ර ප්‍රසාදය නො බිඳුණේ වේ නම්, බාහිර ශබ්දයෝත් ආපාථයට පැමිණෙත් නම් ... ඇවැත්නි, ආධ්‍යාත්මික ඝ්‍රාණප්‍රසාදය නො බිඳුණේ වේ නම්, බාහිර ගන්ධයොත් ආපාථයට නොපැමිණෙත් නම් .. ඇවැත්නි, ආධ්‍යාත්මික ජිහ්වාප්‍රසාදය නො බිඳුණේ වේ නම්, බාහිර රසයෝත් ආපාථයට නො පැමිණෙත් නම් ... ඇවැත්නි, ආධ්‍යාත්මික කායප්‍රසාදය නො බිඳුණේ වේ නම්, බාහිර ස්ප්‍රෂ්ටව්‍යයෝත් ආපාථයට නො පැමිණෙත් නම්... ඇවැත්නි, ආධ්‍යාත්මික වූ මනස නො බිඳුණේ වේ නම්, බාහිර ධර්මයෝත් ආපාථයට නො පැමිණෙත් නම්, ඊට අනුරූප වූ මෙනෙහි කිරීමත් නො වේ නම්, ඒ තාක් ඊට අනුරූප වූ විඥානභාගයාගේ පහළ වීම නො වේ. ඇවැත්නි, ඉදින් ආධ්‍යාත්මික වූ සිත නො බිඳුණේ වේ ද, බාහිර ධර්මයෝත් ආපාථයට පැමිණෙත් ද, එහෙත් ඊට අනුරූප වූ මෙනෙහි කිරීම නො වේ නම්, ඒ තාක් ඊට අනුරූප වූ විඥානභාගයාගේ පහළවීම නො වේ. –

යතො ච ඛො ආවුසො අජ්ඣත්තිකො චෙ[1] මනො අපරිභින්නො හොති, බාහිරා ච ධම්මා ආපාථං ආගච්ඡන්ති, තජ්ජො ච සමන්නාහාරො හොති, එවං තජ්ජස්ස විඤ්ඤාණභාගස්ස පාතුභාවො හොති. යං තථාභූතස්ස රූපං, තං රූපූපාදානක්ඛන්ධෙ සඞ්ගහං ගච්ඡති. යා තථාභූතස්ස වෙදනා, සා වෙදනූපාදානක්ඛන්ධෙ සඞ්ගහං ගච්ඡති. යා තථාභූතස්ස සඤ්ඤා, සා සඤ්ඤූපාදානක්ඛන්ධෙ සඞ්ගහං ගච්ඡති. යෙ තථාභූතස්ස සඞ්ඛාරා, තෙ සඞ්ඛාරූපාදානක්ඛන්ධෙ සඞ්ගහං ගච්ඡන්ති. යං තථාභූතස්ස විඤ්ඤාණං, තං විඤ්ඤාණූපාදානක්ඛන්ධෙ සඞ්ගහං ගච්ඡති. සො එවං පජානාති: "එවං කිරමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සඞ්ගහො සන්නිපාතො සමවායො හොති. වුත්තං ඛො පනෙතං භගවතා: 'යො පටිච්චසමුප්පාදං පස්සති සො ධම්මං පස්සති. යො ධම්මං පස්සති සො පටිච්චසමුප්පාදං පස්සතී'ති. පටිච්චසමුප්පන්නා ඛො පනිමෙ යදිදං පඤ්චුපාදානක්ඛන්ධා. යො ඉමෙසු පඤ්චසුපාදානක්ඛන්ධෙසු ඡන්දො ආලයො අනුනයො අජ්ඣොසානං සො දුක්ඛසමුදයො, යො ඉමෙසු පඤ්චසු පාදානක්ඛන්ධෙසු ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං සො දුක්ඛනිරොධො"ති. එත්තාවතාපි ඛො ආවුසො භික්ඛුනො බහුකතං හොතීති.

ඉදමවොචායස්මා සාරිපුත්තො. අත්තමනා තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දුන්ති.

මහාහත්ථිපදොපමසුත්තං අට්ඨමං.

1. 3. 9.

මහාසාරොපමසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ අචිරපක්කන්තෙ දෙවදත්තෙ. තත්‍ර ඛො භගවා දෙවදත්තං ආරබ්භ භික්ඛූ ආමන්තෙසි.

2. ඉධ භික්ඛවෙ එකච්චො කුලපුත්තො සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති: 'ඔතිණ්ණොම්හි ජාතියා ජරාමරණෙන[2] සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි,[3] දුක්ඛොතිණ්ණො දුක්ඛපරෙතො. අප්පෙව නාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථා'ති.

---

1. චෙව - මජසං. සයා. PTS
2. ජරාය මරණෙන - මජසං. සයා.
3. සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසෙහි - සයා.

Free Distribution www.aathaapi.org

ඇවැත්නි, ඉදින් යම් හෙයෙකින් ආධ්‍යාත්මික වූ සිත නො බිඳුණේ වේ නම්, බාහිර ධර්මයෝත් ආපාථයට එත් නම්, එයින් උපදනා වූ හෝ ඊට අනුරූප වූ මෙනෙහි කිරීමත් වේ නම්, මෙසේ ඊට අනුරූප වූ විඥානභාගයාගේ පහළ වීම වේ. එබඳු වූවහුගේ යම් රූපයෙක් වේ ද, එය රූපොපාදනස්කන්ධයෙහි සඞ්ග්‍රහයට යේ. එබඳු වූවහුගේ යම් වෙදනාවක් වේ ද, එය වෙදනොපාදනස්කන්ධයෙහි සඞ්ග්‍රහයට යේ. එබඳු වූවහුගේ යම් සංඥාවක් වේ ද, එය සංඥොපාදනස්කන්ධයෙහි සංග්‍රහයට යේ. එබඳු වූවහුගේ යම් සංස්කාරයෝ වෙත් ද, ඔහු සංස්කාරොපදනස්කන්ධයෙහි සංග්‍රහයට යෙත්. එබඳු වූවහුගේ යම් විඥානයෙක් වේ ද, එය විඥානොපාදනස්කන්ධයෙහි සංග්‍රහයට යේ. හෙතෙම මෙසේ දනියි "මෙසේ වනාහි මේ පස් වැදෑරුම් වූ උපාදනස්කන්ධයන්ගේ සංග්‍රහය සන්නිපාතය එක්රැස් වීම වෙයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලදී: 'යමෙක් පටිච්චසමුප්පාදය දකියි ද, හෙතෙම ධර්මය දකියි. යමෙක් ධර්මය දකියි ද, හෙතෙම පටිච්චසමුප්පාදය දකී'යි කියා ය. මේ උපාදනස්කන්ධ පස්දෙන ප්‍රත්‍යයෙන් උපන්නාහු ය. මේ පඤ්චොපාදනස්කන්ධයන්හි යම් කැමැත්තෙක්, ආලයෙක්, සෙනහයෙක් ගැලීසිටීමෙක් වේ ද, එය දුක්ඛසමුදය යයි. මේ උපාදනස්කන්ධ' පසෙහි යම් ඡන්දරාගය නැති වීමෙක් ඡන්දරාගය දුරු කිරීමෙක් වේ ද, එය දුක්ඛනිරොධ ය"යි කියයි. ඇවැත්නි, මහණහු විසින් මෙ පමණෙකින් ද බුද්ධශාසනය බොහෝ කොට කරන ලද්දේ වේ යයි.

ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය වදාළහ. සතුටු වූ ඒ භික්ෂූහු ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

මහාහත්ථිපදොපම සූත්‍රය අටවැනියි.

1. 3. 9.

මහාසාරොපම සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ දෙව්දත්තෙරුන් සස්නෙන් ගිය නො බෝ කලෙකින් රජගහනුවර සමීපයෙහි වූ ගිජුකුළුපව්වෙහි වසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ දෙව්දත්තෙරුන් අරභයා භික්ෂූන් ඇමතූ සේක:

2. මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් කුලපුත්‍රයෙක් 'ඉපදීමෙන් ජරා මරණයෙන් ශෝකයෙන් වැලපීමෙන් කායිකදුඃඛයෙන් දෞර්මනස්‍යයෙන් උපායාසයෙන් මඩනා ලද්දෙම් වෙමි. දුකට බැස ගත්තෙම් වෙමි. දුකින් පීඩිත වූයෙම් වෙමි. මේ සියලු දුක් රැස කෙළවර කිරීමක් පෙණෙන්නේ නම් යෙහෙකැ'යි ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම සස්නට පැමිණියේ වෙයි.

3 සො එවං පබ්බජිතො සමානො ලාභසක්කාරසිලොකං අභිනිබ්බත්තෙති. සො තෙන ලාභසක්කාරසිලොකෙන අත්තමනො හොති පරිපුණ්ණසඞ්කප්පො. සො තෙන ලාභසක්කාරසිලොකෙන අත්තානුක්කංසෙති පරං වම්භෙති: 'අහමස්මි ලාභී සිලොකවා.[1] ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ අප්පඤ්ඤාතා අප්පෙසක්ඛා'ති. සො තෙන ලාභසක්කාරසිලොකෙන මජ්ජති, පමජ්ජති, පමාදං ආපජ්ජති. පමත්තො සමානො දුක්ඛං විහරති

ඉධ බ්‍රාහ්මණ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො බ්‍රාහ්මණ ධම්මො ඤාණදස්සනෙන උත්තරිතරො ච පණීතතරො ච.

13. බමුණ, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් ‘ජාතියෙන් ජරාමරණයෙන් ශෝකයෙන් වැලපීමෙන් දුකින් දොම්නසින් දැඩි ආයාසයෙන් මැඩුනෙම් දුකට බටුයෙම් දුකින් පෙළුනෙම් වෙමි. මේ හුදු දුක්රැස කෙළවර කිරීම පෙණේ නම් ඉතා යෙහෙකැ’ යි ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියේ වෙයි. මෙසේ හෙතෙම පැවිදි වූයේ ලාභසත්කාරකීර්තිප්‍රශංසාවන් උපදවයි. හෙතෙම ඒ ලාභසත්කාරකීර්ති-ප්‍රශංසාවෙන් සතුටු නො වූයේ පරිපූර්ණසඞ්කල්පනා ඇත්තේ නො වෙයි. හෙතෙම ඒ ලාභසත්කාරකීර්තිප්‍රශංසාවෙන් තමන් හුවා නො දක්වයි. මෙරමා හෙළා නො දක්වයි. ලාභසත්කාරකීර්තිප්‍රශංසායෙන් ද අන්‍ය වූ උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද යම් ධර්මයෝ වෙත් ද, ඒ ධර්මයන් ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස කත්තුකම්‍යතා ඡන්දය උපදවයි. වෑයම් කරයි. නො පසුබස්නා පැවතුම් ඇත්තේ සලුත ලිහිල් කොට නො ගත්තේ ද වෙයි. හෙතෙම ශීලසම්පත්තිය සම්පූර්ණ කෙරෙයි. හෙතෙම ඒ ශීලසම්පත්තියෙන් සතුටු වූයේ ද පරිපූර්ණසඞ්කල්පනා ඇත්තේ නො වෙයි. හෙතෙමේ ඒ ශීලසම්පත්තියෙන් තමන් හුවා නො දක්වයි. පරා හෙළා නො දක්වයි. ශීලසම්පත්තියෙන් ද අන්‍ය වූ උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද යම් ධර්මයෝ වෙත් නම්, ඒ ධර්මයන් ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස කත්තුකම්‍යතා ඡන්දය උපදවයි. වෑයම් කරයි. නො පසුබට පැවතුම් ඇත්තේ සලුත ලිහිල් කොට නො ගත්තේ ද වෙයි. හෙතෙම සමාධිසම්පත්තිය සම්පූර්ණ කරයි. හෙතෙම ඒ සමාධිසම්පත්තියෙන් සතුටු වූයේ ද පරිපූර්ණසඞ්කල්පනා ඇත්තේ නො වෙයි. හෙතෙම ඒ සමාධිසම්පත්තියෙන් තමන් හුවා නො දක්වයි. මෙරමා හෙළා නො දක්මයි. සමාධිසම්පත්තියෙන් ද අන්‍ය වූ උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද යම් ධර්මයෝ වෙත් නම්, ඒ ධර්මයන් ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස කත්තුකම්‍යතා ඡන්දය උපදයි. වෑයම් කෙරෙයි. නො පසුබස්නා පැවතුම් ඇත්තේ සලුත ලිහිල් කොට නො ගත්තේ ද වෙයි. හෙතෙම ඥානදර්ශනය ලබයි. හෙතෙම ඒ ඥානදර්ශනයෙන් සතුටු වූයේ ද පරිපූර්ණසඞ්කල්පනා ඇත්තේ නො වෙයි. හෙතෙම ඒ ඥානදර්ශනයෙන් තමා හුවා නො දක්වයි. මෙරමා හෙළා නො දක්වයි. ඥානදර්ශනයෙන් ද අන්‍ය වූ උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද යම් ධර්මයෝ වෙත් ද, ඒ ධර්මයන් ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස කත්තුකම්‍යතා ඡන්දය උපදවයි. වෑයම් කෙරෙයි. නො පසුබස්නා පැවතුම් ඇත්තේ සලුත ලිහිල් කොට නො ගත්තේ ද වෙයි.

14. බමුණ, ඥානදර්ශනයට වඩා උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද ධර්මයෝ කවරහු ද?

බමුණ, මේ ශාසනයෙහි මහණ තෙමේ කාමයන්ගෙන් වෙන්ව ම අකුශලයන්ගෙන් වෙන්ව ම විතර්ක සහිත වූ විචාර සහිත වූ විවෙකයෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමධ්‍යානය උපදවා වාසය කෙරෙයි. බමුණ, මේ ද ඥානදර්ශනයට වඩා (නිරොධපාදක බැවින්) උත්තරිතර වූ ද, ප්‍රණීතතර වූ ද ධර්මයෙකි.

15. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො බ්‍රාහ්මණ ධම්මො ඤාණදස්සනෙන උත්තරිතරො ච පණීතතරො ච.

16. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො. සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යන්තං අරියා ආචික්ඛන්ති: 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තතියං ඣානං උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො බ්‍රාහ්මණ ධම්මො ඤාණදස්සනෙන උත්තරිතරො ච පණීතතරො ච.

17. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථගමා[1] අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො බ්‍රාහ්මණ ධම්මො ඤාණදස්සනෙන උත්තරිතරො ච පණීතතරො ච.

18. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො බ්‍රාහ්මණ ධම්මො ඤාණදස්සනෙන උත්තරිතරො ච පණීතතරො ච

19. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම 'අනන්තං විඤ්ඤාණන්ති' විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො බ්‍රාහ්මණ ධම්මො ඤාණදස්සනෙන උත්තරිතරො ච පණීතතරො ච

20 පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො බ්‍රාහ්මණ ධම්මො ඤාණදස්සනෙන උත්තරිතරො ච පණීතතරො ච.

21. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො බ්‍රාහ්මණ ධම්මො ඤාණදස්සනෙන උත්තරිතරො ච පණීතතරො ච.

---

1. අත්ථඞ්ගමා, මජසං. සතා.

Free Distribution www.aathaapi.org

15. බමුණ, නැවත ද අතිකක් වෙයි. මහණ තෙමේ විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි උපන් පැහැදීමෙන් යුත් සිතේ එකොදිසඛ්‍යාත සමාධිය වඩන විතර්ක රහිත වූ විචාර රහිත වූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කෙරෙ යි. බමුණ, මෙද ඥානදර්ශනයට වඩා උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද ධර්මයෙකි.

16. බමුණ, නැවත ද අතිකක් වෙයි. මහණ තෙමේ ප්‍රීතියගේ ද විරාගයෙන් උපෙක්ෂකව සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥා ඇත්තේ වෙසෙයි. සැපය ද කයින් විඳියි. යම් ඒ ධ්‍යානයක් හෙතු කොට ගෙණ ඒ පුද්ගලයා 'උපෙක්ෂා ඇත්තේ ය සිහි ඇත්තේ ය. සැපවිහරණ ඇත්තේ' යයි ආර්‍යයෝ කියද් ද, ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කෙරෙ යි. බමුණ, මෙ ද ඥානදර්ශනයට වඩා උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද ධර්මයෙකි

17. බමුණ, නැවත ද අතිකක් වෙයි. මහණ තෙමේ සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් පෙරම සොම්නස් දොම්නස්හුගේ නැසීමෙන් නිදුක් වූ නො සැප වූ උපෙක්ෂාවෙන් කළ සමෘති පාරිශුද්ධිය ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කෙරෙ යි. බමුණ, මෙ ද ඥානදර්ශනයට වඩා උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද ධර්මයෙකි.

18. බමුණ, නැවැත ද අතිකක් වෙයි. මහණ තෙමේ සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් නැසීමෙන් ප්‍රතිඝසංඥාවන්ගේ ප්‍රහාණයෙන් නානාත්වසංඥාවන් මෙනෙහි නො කිරීමෙන් 'ආකාසය අනන්ත ය'යි ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කෙරෙ යි. බමුණ මෙ ද ඥානදර්ශනයට වඩා උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද ධර්මයෙකි.

19. බමුණ, නැවත ද අතිකක් වෙයි. මහණ තෙමේ සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා 'විඤ්ඤාණය අනන්ත ය'යි. විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරයි. බමුණ, මෙ ද ඥානදර්ශනයට වඩා උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද ධර්මයෙකි.

20. බමුණ නැවත ද, අතිකක් වෙයි. මහණ තෙමේ සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා 'කිසිවක් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. බමුණ, මෙ ද ඥානදර්ශනයට වඩා උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද ධර්මයෙකි.

21. බමුණ, නැවත ද අතිකක් වෙයි. මහණ තෙමේ සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. බමුණ මෙ ද ඥානදර්ශනයට වඩා උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද ධර්මයෙකි.

Free Distribution www.aathaapi.org

22. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. අයම්පි ඛො බ්‍රාහ්මණ ධම්මො ඤාණදස්සනෙන උත්තරිතරො ච පණීතතරො ච.

ඉමෙ ඛො බ්‍රාහ්මණ ධම්මා ඤාණදස්සනෙන උත්තරිතරා ච පණීතතරා ච.

සෙය්‍යථාපි සො බ්‍රාහ්මණ පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො සාරඤ්ඤෙව ඡෙත්වා ආදාය පක්කන්තො සාරන්ති ජානමානො, යඤ්චස්ස සාරෙන සාරකරණීයං තඤ්චස්ස අත්ථං අනුභවිස්සති. තථූපමාහං බ්‍රාහ්මණ ඉමං පුග්ගලං වදාමි.

23. ඉති ඛො බ්‍රාහ්මණ නයිදං බ්‍රහ්මචරියං ලාභසක්කාරසිලොකානිසංසං, න සීලසම්පදානිසංසං, න සමාධිසම්පදානිසංසං, න ඤාණදස්සනානිසංසං. යා ච ඛො අයං බ්‍රාහ්මණ අකුප්පා චෙතොවිමුත්ති, එතදත්ථමිදං බ්‍රාහ්මණ බ්‍රහ්මචරියං, එතං සාරං, එතං පරියොසානන්ති.

24. එවං වුත්තෙ පිඞ්ගලකොච්ඡො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම[1] සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය: චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

චූළසාරොපමසුත්තං දසමං.

ඕපම්මවග්ගො තතියො.

තස්ස වග්ගස්ස උද්දානං:

මොළියඵග්ගුනරිට්ඨ ච නාමො අන්ධවනෙ කථි පුණ්ණනිවාපො
රාසි කණෙරු මහාගජනාමා සාරූපමො[2] පුන පිඞ්ගලකොච්ඡො,
එස වරො ඨපිතො අසමොයං චාරුතරො තතියො වරවග්ගොති*.

1. ගොතම -පෙ- උපාසකං, මජසං. සහ. 2. සාරවරො, සීමු සහ.
* පාදෙයං මජසං පොත්ථකෙ න දිස්සති

Free Distribution www.aathaapi.org

22. බමුණ, නැවත ද අනිකක් වෙයි. මහණ තෙමේ සර්වප්‍රකාරයෙන් නෛවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවේදයිතනිරෝධයට පැමිණ වාසය කරයි. ප්‍රඥාවෙන් දැකීම් හෙතුවෙන් ඔහුගේ ආස්‍රවයෝ ක්‍ෂය වූ වාහු වෙත්. බමුණ මේ ද ඥානදර්ශනයට වඩා උත්තරීතර වූ ද ප්‍රණීතතර වූ ද ධර්මයකි.

බමුණ, මේ ධර්මයෝ ඥානදර්ශනයට වඩා උත්තරීතර ද ප්‍රණීතතර ද වෙත්.

බමුණ, යම් සේ හර ප්‍රයෝජන කොට ඇති හර සෙවීමෙහි හැසිරෙන්නා වූ ඒ පුරුෂ තෙමේ යම් සේ නො වැපී පවත්නා වූ හර ඇති මහ රුකෙක හර යයි දනිමින් හරයම කපා ගෙණ ගියේ ද, ඔහුට හරයෙන් කට යුතු වූ යමක් වී නම් හරය පිළිබඳ ඒ ප්‍රයොජන ය ද ලබන්නේ ය. බමුණ, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තෙකැ යි කියමි.

23. බමුණ, මෙසේ වනාහි මේ බඹසර ලාභසත්කාරකීර්තිප්‍රශංසා අනුසස් කොට ඇත්තේ නො වේ. ශීලසම්පත්තිය අනුසස් කොට ඇත්තේ නො වේ. සමාධිසම්පත්තිය අනුසස් කොට ඇත්තේ නො වේ. ඥානදර්ශනය අනුසස් කොට ඇත්තේ නො වේ. බමුණ, යම් මේ අකොප්‍ය වූ චිත්තවිමුක්තියෙක් වේ ද, බමුණ මේ බඹසර එය ප්‍රයොජනය කොට සිටියේ ය. ඒ සාරය යි. ඒ කෙළවර යි.

24. මෙසේ වදාළ කල්හි පිඞ්ගලකොච්ඡ බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනව. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනව. භවත් ගෞතමයන් වහන්ස, යම් සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේ ද, වැසූ දෙයක් විවෘත කරන්නේ ද, මං මුළා වූවකුට මග කියන්නේ හෝ වේ ද, ඇස් ඇත්තෝ රූප දක්නාහුය යි අන්ධකාරයෙහි තෙල් පහනක් දල්වන්නේ ද, එපරිද්දෙන් ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ලෙසින් ධර්මය දෙශනා කරන ලද්දේ ය. ඒ මම භවත් ගෞතමයන් වහන්සේ ද ධර්මය ද භික්‍ෂු සඞ්ඝයා ද සරණ කොට යෙමි. භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිම් කොට සරණ ගිය උපාසකයෙකු කොට දරණ සේක් වා.

චූලසාරොපම සූත්‍රය දසවැනි යි.

තුන්වැනි ඔපම්ම වර්ගය යි.

ඒ වර්ගයෙහි උද්දානය.

මොළියඵග්ගුණය අරිට්ඨය යි භික්‍ෂු නාමයෙන් කී කකචූපම - අලගද්දූපම දෙසූත්‍ර ය, 'අන්ධවනෙ'යි ස්ථාන නිර්දිෂ්ට වම්මික සූත්‍රය, දසකථා ඇති පුණ්‍ණ සවු නමින් කී රථවිනීත සූත්‍රය, නිවාප සූත්‍රය, 'රාසි' යී නාමෛකදෙශග්‍රහණයෙන් කී පාසරාසි හෙවත් අරියපරියෙසන සූත්‍රය, කණේරු - මහාගජ නාමයෙන් කී චූලහත්ථිපදොපම - මහාහත්ථිපදොපම් දෙ සූත්‍රය, මහාසාරොපම සූත්‍රය, යලි පිඞ්ගලකොච්ඡ නම් දුන් චූලසාරොපම සූත්‍රය යි - මෙතෙකින් තැබූ මේ උතුම තෙවන වග අසම ය. අතිශයින් මනොඥ ය.

1. 4. 1.

4. මහායමකවග්ගො

චූළගොසිඞ්ගසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා නාදිකෙ[1] විහරති ගිඤ්ජකාවසථෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා ච අනුරුද්ධො ආයස්මා ච නන්දියො ආයස්මා ච කිම්බිලො[2] ගොසිඞ්ගසාලවනදායෙ විහරන්ති. අථ ඛො භගවා සායන්හසමයං පතිසල්ලානා[3] වුට්ඨිතො යෙන ගොසිඞ්ගසාලවනදායො තෙනුපසඞ්කමි.

2. අද්දසා ඛො දායපාලො භගවන්තං දූරතොව ආගච්ඡන්තං දිස්වාන භගවන්තං එතදවොච: "මා සමණ, එතං දායං පාවිසි. සන්තෙත්ථ තයො කුලපුත්තා අත්තකාමරූපා විහරන්ති මා තෙසං අඵාසුමකාසී"ති.

3. අස්සොසි ඛො ආයස්මා අනුරුද්ධො දායපාලස්ස භගවතා සද්ධිං මන්තයමානස්ස. සුත්වාන දායපාලං එතදවොච: 'මා ආවුසො දායපාල, භගවන්තං වාරෙසි. සත්ථා නො භගවා අනුප්පත්තො'ති.

4. අථ ඛො ආයස්මා අනුරුද්ධො යෙනායස්මා ච නන්දියො ආයස්මා ච කිම්බිලො තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා ආයස්මන්තඤ්ච නන්දියං ආයස්මන්තඤ්ච කිම්බිලං එතදවොච: 'අභික්කමථායස්මන්තො, අභික්කමථායස්මන්තො, සත්ථා නො භගවා අනුප්පත්තො'ති.

5. අථ ඛො ආයස්මා ච අනුරුද්ධො ආයස්මා ච නන්දියො ආයස්මා ච කිම්බිලො භගවන්තං පච්චුග්ගන්ත්වා එකො භගවතො පත්තචීවරං පටිග්ගහෙසි. එකො ආසනං පඤ්ඤාපෙසි. එකො පාදොදකං උපට්ඨපෙසි. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ[4] ඛො භගවා පාදෙ පක්ඛාලෙසි. තෙපි ඛො ආයස්මන්තො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.

6. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං අනුරුද්ධං භගවා එතදවොච: කච්චි වො අනුරුද්ධා ඛමනියං? කච්චි යාපනීයං? කච්චි පිණ්ඩකෙන න කිලමථාති?[5]

7. "ඛමනීයං භගවා, යාපනීයං භගවා. න ච මයං භන්තෙ පිණ්ඩකෙ න කිලමාමා"ති.

---

1 නාතිකෙ, මජසං. 2 කිම්බිලො, මජසං සයා. 3. පටිසල්ලාණා, මජසං. සයා.
4. නිසජ්ජ පාදෙ, සයා. 5. කිලම්ථාති, සයා. 6. කිලම්මහ, සයා.

Free Distribution www.aathaapi.org

1. 4. 1.

4. මහායමකවර්ගය
චූලගොසිඞ්ග සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ නාදික ගම්හි ගෙඩිගෙහි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ ද ආයුෂ්මත් නන්දිය තෙරණුවෝ ද ආයුෂ්මත් කිම්බිල තෙරණුවෝ ද ගොසිඞ්ගසාලවනලැහැබෙහි වාස කරත්. එකල භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි පලසමවතින් නැඟී ගොසිඞ්ගසාලවනළැහැබ කරා වැඩිසේක.

2. අරණ්‍ය පාලකයා භාග්‍යවතුන් වහන්සේ වඩනවුන් දුර දී ම දිට. දැක භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය: "මහණ තෙල වනයට නො පිවිසෙනු මැනව. මෙහි කුලපුත්‍රයෝ තිදෙනෙක් ඇත. තමන්ට හිත කැමැති සැහැවි ඇතිව වසත්. ඔවුන්ට නො පහසු නො කරන්නේ මැනව" කියායි.

3. ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ හා මන්ත්‍රණ කරණ අරණ්‍යපාලකයාගේ කථාව ඇසූහ.. අසා අරණ්‍යපාලකයාට තෙල කී හ: "කියග වනපාලය, භාග්‍යවතුන් වහන්සේ නො වළහව. අප ශාස්තෘ වූ භාග්‍යවතුන් වහන්සේ පැමිණි සේකැ"යි.

4. එක්බිති ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ ආයුෂ්මත් නන්දිය තෙරුන් හා ආයුෂ්මත් කිම්බිල තෙරුන් වෙත ගියහ. ගොස් ආයුෂ්මත් නන්දිය තෙරුන්ට හා ආයුෂ්මත් කිම්බිල තෙරුන්ට ද තෙල කී හ: "ආයුෂ්මත්නි, වරෙව. ආයුෂ්මත්නි, වරෙව. අප ශාස්තෘ වූ භාග්‍යවතුන් වහන්සේ වැඩි සේක"කියා යි.

5. ඉක්බිති, ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ ද ආයුෂ්මත් නන්දිය තෙරණුවෝ ද ආයුෂ්මත් කිම්බිල තෙරණුවෝ ද භාග්‍යවතුන් වහන්සේ පෙරමගට ගියහ. පෙරගමන් කොට එක් තමෙක් භාග්‍යවතුන් වහන්සේගේ පා සිවුරු ගත්තේ ය. එක් තමෙක් අසුනක් පැණවී ය. එක් තමෙක් පා දෝනා දිය එළවී ය. භාග්‍යවතුන් වහන්සේ පැන වූ අස්නෙහි වැඩ හුන් සේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ පා දෙවූහ. ඒ ආයුෂ්මත්හු භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්හ.

6. එකත්පසෙක හුන් ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් ට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාල සේක: "අනුරුද්ධයෙනි, කිම, සිහිය හැකි ද? යැපිය හැකි ද? කිම, පිණ්ඩපාතයෙන් ක්ලාන්ත නො වවු ද?"

7. භාග්‍යවතුන් වහන්ස, සිහිය හැකි ය. භාග්‍යවතුන් වහන්ස, යැපිය හැකි ය. නො කලකුළු වම්හ."

8. කච්චි පන වො අනුරුද්ධා සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරථාති?

9. "තග්ඝ මයං භන්තෙ සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරාමා"ති

10. යථාකථං පන තුම්හෙ අනුරුද්ධා සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරථාති?

11. "ඉධ මය්හං භන්තෙ එවං හොති: 'ලාභා වත මෙ සුලද්ධං වත මෙ, යොහං එවරූපෙහි සබ්‍රහ්මචාරීහි සද්ධිං විහරාමී'ති. තස්ස මය්හං භන්තෙ ඉමෙසු ආයස්මන්තෙසු මෙත්තං කායකම්මං පච්චුපට්ඨිතං ආවි චෙව රහො ච. මෙත්තං වචීකම්මං පච්චුපට්ඨිතං ආවි චෙව රහො ච. මෙත්තං මනොකම්මං පච්චුපට්ඨිතං ආවි චෙව රහො ච. තස්ස මය්හං භන්තෙ එවං හොති: 'යන්නූනාහං සකං චිත්තං නික්ඛිපිත්වා ඉමෙසංයෙව ආයස්මන්තානං චිත්තස්ස වසෙන වත්තෙය්‍ය'න්ති. සො ඛො අහං භන්තෙ සකං චිත්තං නික්ඛිපිත්වා ඉමෙසංයෙව ආයස්මන්තානං චිත්තස්ස වසෙන වත්තාමි. නානා හි ඛො නො භන්තෙ කායා. . එකඤ්ච පන මඤ්ඤෙ චිත්ත"න්ති.

12. ආයස්මාපි ඛො නන්දියො -පෙ- ආයස්මාපි ඛො කිම්බිලො භගවන්තං එතදවොච: මය්හම්පි ඛො භන්තෙ එවං හොති: 'ලාභා වත මෙ, සුලද්ධං වත මෙ, යොහං එවරූපෙහි සබ්‍රහ්මචාරීහි සද්ධිං විහරාමී'ති තස්ස මය්හං භන්තෙ ඉමෙසු ආයස්මන්තෙසු මෙත්තං කායකම්මං පච්චුපට්ඨිතං ආවි චෙව රහො ච. මෙත්තං වචීකම්මං පච්චුපට්ඨිතං ආවි චෙව රහො ච. තස්ස මය්හං භන්තෙ එවං හොති: 'යන්නූනාහං සකං චිත්තං නික්ඛිපිත්වා ඉමෙසංයෙව ආයස්මන්තානං චිත්තස්ස වසෙන වත්තෙය්‍යන්ති. සො ඛො අහං භන්තෙ සකං චිත්තං නික්ඛිපිත්වා ඉමෙසංයෙව ආයස්මන්තානං චිත්තස්ස වසෙන වත්තාමි. නානා හි ඛො නො භන්තෙ කායා. එකඤ්ච පන මඤ්ඤෙ චිත්ත'න්ති. එවං ඛො මයං භන්තෙ සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරාමා"ති.

13. සාධු, සාධු, අනුරුද්ධා. කච්චි පන වො අනුරුද්ධා, අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරථාති?

14. "තග්ඝ මයං භන්තෙ අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරාමා"ති.

15. යථාකථම්පන තුම්හෙ අනුරුද්ධා අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරථාති?

---

1. ආවිං, සෳා. ආවි, ඉ.

Free Distribution www.aathaapi.org

8. අනුරුද්ධයෙනි, කිම තෙපි සමග ව සතුටු ව විවාද නො කරමින් කිරි හා දිය වැනි ව ඔවුනොවුන් පියඇසින් බලමින් වාස කරවු ද?

9. "වහන්ස, අපි එකාන්තයෙන් සමගිව සතුටුව විවාද නො කරමින් කිරි හා දිය මෙන් එක්ව ඔවුනොවුන් පියඇසින් බලමින් වාස කරම්හ."

10. අනුරුද්ධයෙනි, තෙපි, කෙසේ නම්, සමග ව සතුටු වෙමින් විවාද නො කරමින් කිරි හා දිය වැනි ව ඔවුනොවුන් පියඇසින් බලමින් වාස කරන්නහු ද?

11. "වහන්ස, මෙහි දී මට මෙ වැනි අදහසෙක් වෙයි: යම් බඳු මම මෙ වැනි සබ්‍රම්සරුන් සමග වාස කරම් ද, ඒ මට එකාන්තයෙන් ලාභ ය. එකාන්තයෙන් මට යහපත් ලැබීමෙකි. වහන්ස, ඒ මට මේ ආයුෂ්මතුන් කෙරෙහි හමුවෙහිත් නොහමුවෙහිත් මෛත්‍රී සහගත කායකර්මය එළඹ සිටියේ ය. හමුවෙහිත් නොහමුවෙහිත් මෛත්‍රීසහගත වාක්කර්මය එළඹ සිටියේ ය. හමුවෙහිත් නොහමුවෙහිත් මෛත්‍රීසහගත මනඃකර්මය එළඹ සිටියේ ය. වහන්ස, ඒ මට 'මම මාගේ සිත තබා මේ ආයුෂ්මතුන්ගේ සිත්විසින් වාස කරන්නෙම් නම් මැනව'යි සිත් ඇති වෙයි. වහන්ස, මම මාගේ සිත තබා මේ ආයුෂ්මතුන්ගේ ම සිත්විසින් වැටෙමි. වහන්ස, අප සිරුර වෙන් වෙයි. සිත එකකු වනැ"යි.

12. ආයුෂ්මත් නන්දිය තෙරණුවෝ ද ... ආයුෂ්මත් කිම්බිල තෙරණුවෝ ද භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ:-

"වහන්ස, මට ද මෙ වැනි අදහසෙක් වෙයි: යම් බඳු මම මෙවැනි සබ්‍රම්සරුන් සමග වෙසෙම් ද, ඒ මට එකාන්තයෙන් ලාභය. මට යහපත් ලැබුමෙකි. වහන්ස. ඒ මට මේ ආයුෂ්මතුන් විෂයෙහි හමුවෙහිත් නොහමුවෙහිත් මෛත්‍රීසහගත කායකර්මය එළඹ සිටියේ ය. හමුවෙහිත් නොහමුවෙහිත් මෛත්‍රීසහගත වාක්කර්මය එළඹ සිටියේ ය. හමුවෙහිත් නොහමුවෙහිත් මෛත්‍රීසහගත මනඃකර්මය එළඹ සිටියේ ය. වහන්ස මට 'මම මාගේ සිත තබා මේ ආයුෂ්මතුන්ගේ සිත්විසින් වාස කරන්නෙම් නම් මැනැවැ'යි මෙසේ අදහස ඇති වේ. වහන්ස, මම මාගේ සිත බහා මේ ආයුෂ්මතුන්ගේ සිත්විසින් වැටෙමි. ශරීර වෙන් වෙයි. සිත එකකුම වනැ'යි.

මෙසේ අපි සමග ව සතුටු වෙමින් විවාද නො කරමින් කිරි හා දිය වැනියමෝ ඔවුනොවුන් පියඇසින් බලමින් වාස කරම්හ.

13. අනුරුද්ධයෙනි, සාධු, සාධු, අනුරුද්ධයෙනි, කිම තෙපි අප්‍රමත්තව කෙලෙස් තවන වැර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වාස කරන්නහු ද?

14. "වහන්ස, අපි ඒකාන්තයෙන් අප්‍රමත්ත ව කෙලෙස් තවන වැර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වාස කරම්හ."

15. අනුරුද්ධයෙනි, තෙපි කෙසේ වනාහි අප්‍රමත්ත ව කෙලෙස් තවන වැර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වසන්නහු ද?

Free Distribution www.aathaapi.org

16. "ඉධ පන භන්තෙ අම්හාකං යො පඨමං ගාමතො පිණ්ඩාය පටික්කමති, සො ආසනානි පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨපෙති[1]. අවක්කාරපාතිං උපට්ඨපෙති යො පච්ඡා ගාමතො පිණ්ඩාය පටික්කමති, සචෙ හොති භුත්තාවසෙසො, සචෙ ආකඞ්ඛති, භුඤ්ජති. නො චෙ ආකඞ්ඛති, අප්පහරිතෙ වා ඡඩ්ඩෙති. අප්පාණකෙ වා උදකෙ ඔපිලාපෙති. සො ආසනානි පටිසාමෙති. පානීයං පරිභොජනීයං පටිසාමෙති. අවක්කාරපාතිං පටිසාමෙති. භත්තග්ගං සම්මජ්ජති. යො පස්සති පානීයඝටං වා පරිභොජනීයඝටං වා වච්චඝටං වා රිත්තං තුච්ඡං, සො උපට්ඨපෙති. සචස්ස[2] හොති අවිසය්හං, හත්ථවිකාරෙන දුතියං ආමන්තෙත්වා හත්ථවිලඞ්ඝකෙන උපට්ඨපෙම. නත්වෙව මයං භන්තෙ තප්පච්චයා වාචං භින්දාම. පඤ්චාහිකං ඛො පන මයං භන්තෙ සබ්බරත්තිකං[3] ධම්මියා කථාය සන්නිසීදාම. එවං ඛො මයං භන්තෙ අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරාමා"ති.

17. සාධු, සාධු, අනුරුද්ධා. අත්ථි පන වො අනුරුද්ධා, එවං අප්පමත්තානං ආතාපීනං පහිතත්තානං විහරතං[4] උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරොති?

18. "කිං හි නො සියා භන්තෙ. ඉධ මයං භන්තෙ යාවදෙව ආකඞ්ඛාම, විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං[5] උපසම්පජ්ජ විහරාම. අයං ඛො නො භන්තෙ අම්හාකං අප්පමත්තානං ආතාපීනං පහිතත්තානං විහරතං උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරො"ති

19. සාධු, සාධු, අනුරුද්ධා. එතස්ස පන වො අනුරුද්ධා විහාරස්ස සමතික්කමාය එතස්ස විහාරස්ස පටිප්පස්සද්ධියා අත්ථඤ්ඤො උත්තරි මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරොති?

20. "කිං හි නො සියා භන්තෙ, ඉධ මයං භන්තෙ යාවදෙව ආකඞ්ඛාම, විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං[6] උපසම්පජ්ජ විහරාම. එතස්ස භන්තෙ විහාරස්ස සමතික්කමාය එතස්ස විහාරස්ස පටිප්පස්සද්ධියා අයමඤ්ඤො උත්තරි මනුස්සධම්මා අලමරියඤාණ-දස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරො"ති.

1. උපට්ඨාපෙති, PTS. 2. සචාස්ස, මජසං. සතා. 3 සබ්බරත්තියා, PTS.
4. විහරන්තානං, මජසං 5. පඨමජ්ඣානං, සී. 6. දුතියජ්ඣානං, සී.

16. වහන්ස, මෙහි අප අතුරෙන් යමෙක් පළමු කොට ගමෙන්
පිණ්ඩපාතයෙන් පෙරළා ඒ ද, හේ අසුන් පණවයි. පිය යුතු පැන් හා
පරිභොග කට යුතු දිය ද එළවා තබයි. ඉතිරි පිඬු බහන සුමුගු එළවා
තබයි. යමෙක් පසු ව ගමෙහි පිඬු පිණිස සැරැ වටාලා ඒ ද, ඉදින්
කෑ ඉතිරි වූවක් ඇත් නම්, ඉදින් කැමැති වේ නම්, වළඳයි.
නො කැමැති වේ නම්, නොතිලන තැනෙක හෝ දමයි. (එසින් මියන)
සතුන් නැති දියෙහි හෝ උල්පවා හරියි. හෙ අසුන් සඟවං තබයි.
පැන් හා පිරිබෝදිය සඟවා තබයි. අවකරබඳුන සඟවං තබයි.
භක්තාග්‍රය හමදියි. යමෙක් හිස් වූ දිය රහිත වූ පැන් කළය හෝ,
පරිභොග දියකළය හෝ, වැසිකිළිකළය හෝ දකී ද හෙ එළවං තබයි.
ඉදින් ඔහුට නො එසැවිය හැකි නම් හස්තසංඥයෙන් දෙවැන්නකු
කැඳවා ගිවු (බැඳි) අතින් එළවම්හ. වහන්ස, අපි ඒ හෙතු කොට වාග්භෙද
නො කරම්හ. වහන්ස, අපි පස්දිනකට වරක් මුළුරැය දැහැමිකථායෙන් එක්ව
හිඳුම්හ. වහන්ස, මෙසේ වනාහි අපි අප්‍රමාද ව කෙලෙස් තවන වැර
ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වාස කරම්හ''

17. අනුරුද්ධයෙනි, මැනව, මැනව. අනුරුද්ධයෙනි, මෙසේ අප්‍රමාද
ව කෙලෙස් තවන වැර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව
වාස කරණ තොප විසින් මිනිස්දහමින් ඉතිරි ආර්‍ය්‍යභාවය සිදු කිරීමට
සමර්ථ ආර්‍ය්‍යඥානවිශේෂයක් වන ඵාසුවිහරණයෙක් අධිගත (ලැබනලද)
වේ ද?

18. ''වහන්ස, කිම අධිගත නොවන්නේ ද? (අධිගත වන්නේ ම ය.)
වහන්ස, අපි යම් තාක් ම කැමැති වමෝ නම් ඒ තාක් කාමයන්ගෙන්
වෙන් ව අකුශලයන්ගෙන් වෙන් ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන්
හටගත් ප්‍රීතිය හා සැප ද ඇති ප්‍රථමධ්‍යානය උපදවා වාසය කරම්හ.
වහන්ස, අප්‍රමාද ව කෙලෙස් තවන වැර ඇති ව නිවන් පිණිස මෙහෙයූ
සිත් ඇතිව වසන අප විසින් මිනිස්දහමින් වැඩි ආර්‍ය්‍යභාවය සිදු කිරීමට
සමර්ථ විශිෂ්ටඥානදර්ශනයක් වූ මේ ඵාසුවිහරණය ලබන ලද්දේ ය.''

19. අනුරුද්ධයෙනි, මැනව, මැනව. අනුරුද්ධයෙනි, මේ විහරණය
ඉක්ම යාම පිණිස, මේ විහරණය සන්හිඳීම පිණිස, මනුෂ්‍යධර්මයෙන් වැඩි
ආර්‍ය්‍යභාවය සිදු කිරීමට සමර්ථ විශිෂ්ටඥානදර්ශනයක් වූ අන්‍ය
ඵාසුවිහරණයෙක් තොප විසින් ලබන ලද්දේ ඇත් ද?

20. ''වහන්ස, කිම නො වන්නේ ද? වහන්ස, අපි යම් තාක්
කැමැති වමෝ ද, ඒ තාක් විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් හිය සතන්හි
පැහැදීම ඇති සිතේ එකඟබව වඩන විතර්කරහිත විචාරරහිත සමාධියෙන්
හටගත් ප්‍රීතිය හා සැප ඇති ද්විතීයධ්‍යානය උපදවා වාස කරම්හ.
වහන්ස, මේ විහරණය ඉක්මයාම පිණිස මේ විහරණය සන්හිඳීම
පිණිස මිනිස්දහමින් වැඩි වූ ආර්‍ය්‍යභාවය සිදුකිරීමට සමර්ථ විශිෂ්ටඥානයක් වූ
මේ අන්‍ය වූ ඵාසුවිහරණය ලබන ලද්දේ ය.''

21. සාධු, සාධු, අනුරුද්ධා. එතස්ස පන වො අනුරුද්ධා විහාරස්ස සමතික්කමාය එතස්ස විහාරස්ස පටිප්පස්සද්ධියා අත්ථඤ්ඤො උත්තරිමනුස්සධම්මො අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරොති?

22. "කිං හි නො සියා භන්තෙ, ඉධ මයං භන්තෙ යාවදෙව ආකඞ්ඛාම පීතියා ච විරාගා උපෙක්ඛකා ච විහරාම සතා ච සම්පජානා. සුඛඤ්ච කායෙන පටිසංවෙදෙම. යන්තං අරියා ආචික්ඛන්ති: 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තතියං ඣානං උපසම්පජ්ජ විහරාම. එතස්ස භන්තෙ විහාරස්ස සමතික්කමාය එතස්ස විහාරස්ස පටිප්පස්සද්ධියා අයමඤ්ඤො උත්තරිමනුස්සධම්මො අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරො"ති.

23. සාධු, සාධු, අනුරුද්ධා, එතස්ස පන වො අනුරුද්ධා විහාරස්ස සමතික්කමාය එතස්ස විහාරස්ස පටිප්පස්සද්ධියා අත්ථඤ්ඤො උත්තරිමනුස්සධම්මො අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරොති?

24. "කිං හි නො සියා භන්තෙ, ඉධ මයං භන්තෙ යාවදෙව ආකඞ්ඛාම සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරාම. එතස්ස භන්තෙ විහාරස්ස සමතික්කමාය එතස්ස විහාරස්ස පටිප්පස්සද්ධියා අයමඤ්ඤො උත්තරි මනුස්සධම්මො අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරො"ති.

25 සාධු, සාධු, අනුරුද්ධා. එතස්ස පන වො අනුරුද්ධා විහාරස්ස සමතික්කමාය එතස්ස විහාරස්ස පටිප්පස්සද්ධියා අත්ථඤ්ඤො උත්තරිමනුස්සධම්මො අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරොති?

26. "කිං හි නො සියා භන්තෙ. ඉධ මයං භන්තෙ යාවදෙව ආකඞ්ඛාම සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරාම. එතස්ස භන්තෙ විහාරස්ස සමතික්කමාය එතස්ස විහාරස්ස පටිප්පස්සද්ධියා අයමඤ්ඤො උත්තරිමනුස්සධම්මො අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරො"ති.

27. සාධු, සාධු, අනුරුද්ධා. එතස්ස පන වො අනුරුද්ධා විහාරස්ස සමතික්කමාය එතස්ස විහාරස්ස පටිප්පස්සද්ධියා අත්ථඤ්ඤො උත්තරිමනුස්සධම්මො අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරොති?

21. අනුරුද්ධයෙනි, මැනැව, මැනැව. අනුරුද්ධයෙනි, තෙල විහරණය ඉක්ම යාම පිණිස තෙල විහරණය සන්හිඳීම පිණිස මනුෂ්‍ය ධර්මයෙන් වැඩි ආර්‍ය්‍යභාවය සිදු කිරිමට සමර්ථ විශිෂ්ටඥානදර්‍ශනයක් වූ සැපවිහරණයෙක් තොප විසින් ලබන ලද්දේ ඇත් ද?

22. "කිම වහන්ස, නො වන්නේ ද? වහන්ස, අපි යම් තාක් ම කැමැත්තමෝ ද ඒ තාක් ප්‍රීතිය නැති වීමෙන් උපේක්‍ෂා ඇති ව සිහි ඇති ව සම්‍යක්ප්‍රඥ ඇති ව වාස කරම්හ. කයින් සැප ද විඳුම්හ යම් ධ්‍යානයක් උදෙසා ඒ ධ්‍යානලාභී පුද්ගලයා 'උපේක්‍ෂා ඇත්තේ සිහි ඇත්තේ සැප විහරණ ඇත්තේ ය'යි ආර්‍ය්‍යයෝ කියද් ද, ඒ තෘතීයධ්‍යානය උපදවා වාස කරම්හ. වහන්ස, මේ විහරණය ඉක්මයාම පිණිස මේ විහරණය සන්හිඳීම පිණිස මනුෂ්‍යධර්මයෙන් වැඩි ආර්‍ය්‍යභාවය සිදු කිරිමට සමර්ථ විශිෂ්ටඥානදර්‍ශනයක් වූ මේ අන්‍යඑාසුවිහරණය ලබන ලද්දේ ය."

23. අනුරුද්ධයෙනි, මැනැව, මැනැව. අනුරුද්ධයෙනි, තෙල විහරණය ඉක්ම යාම පිණිස, තෙල විහරණය සන්හිඳීම පිණිස මනුෂ්‍ය-ධර්මයෙන් වැඩි ආර්‍ය්‍යභාවය සිදු කිරිමට සමර්ථ විශිෂ්ටඥානදර්‍ශනයක් වූ අන්‍යඑාසුවිහරණයෙක් තොප විසින් ලබන ලද්දේ ඇත් ද?

24. "වහන්ස, කිම නො වන්නේ ද? වහන්ස, අපි යම් තාක් කැමැත්තමෝ ද, ඒ තාක් සුඛප්‍රහාණයෙන් ද, දුඃඛප්‍රහාණයෙන් ද පළමු ම සෞමනස්දෞර්මනස් නැසීමෙන් නිදුක් වූ නොසැප වූ උපෙක්‍ෂා විසින් ජනිත සමෘතිපාරිශුද්ධිය ඇති චතුර්ථධ්‍යානය උපදවා වාසය කරම්හ. වහන්ස, මේ විහරණය ඉක්ම යාම පිණිස මේ විහරණය සන්හිඳීම පිණිස මිනිස්දහමින් වැඩි ආර්‍ය්‍යභාවය සිදු කිරිමට සමර්ථ විශිෂ්ටඥාන-දර්‍ශනයක් වූ මේ අන්‍යඑාසුවිහරණය ලබන ලද්දේ ය."

25. අනුරුද්ධයෙනි, මැනැව, මැනැව. අනුරුද්ධයෙනි, තෙල විහරණය ඉක්මයාම පිණිස තෙල විහරණය සන්හිඳීම පිණිස මනුෂ්‍ය ධර්මයෙන් වැඩි ආර්‍ය්‍යභාවය සිදු කිරිමට සමර්ථ විශිෂ්ට ඥානදර්‍ශනයක් වූ අන්‍යඑාසුවිහරණයෙක් තොප විසින් ලබන ලද්දේ ඇත් ද?

26. "වහන්ස, කිම නො වන්නේ ද, වහන්ස, අපි යම් තාක් ම කැමැති වමෝ ද, ඒ තාක් සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් ඉක්මීමෙන් ප්‍රතිඝසංඥාවන් පහවීමෙන් නානාත්වසංඥාවන් නො මෙනෙහි කිරීමෙන් ආකාශය අනන්ත යයි ආකාසානඤ්චායතනයට පැමිණ වාස කරම්හ. වහන්ස, තෙල විහරණය ඉක්මීම පිණිස තෙල විහරණය සන්හිඳීම පිණිස මනුෂ්‍යධර්මයෙන් වැඩි ආර්‍ය්‍යභාවය සිදු කිරීමට සමර්ථ විශිෂ්ටඥාන-දර්‍ශනයක් වූ මෙ අන්‍යඑාසුවිහරණය ලබන ලද්දේ ය."

27. අනුරුද්ධයෙනි, මැනැව, මැනැව. අනුරුද්ධයෙනි, තෙල විහරණය ඉක්මීම පිණිස තෙල විහරණය සන්හිඳීම පිණිස මනුෂ්‍යධර්මයෙන් වැඩි ආර්‍ය්‍යභාවය සිදු කිරීමට සමර්ථ විශිෂ්ටඥානදර්‍ශනයක් වූ අන්‍යඑාසුවිහරණයෙක් තොප විසින් ලබන ලද්දේ ඇත් ද?

28. "කිං හි නො සියා භන්තෙ, ඉධ මයං භන්තෙ යාවදෙව ආකඞ්ඛාම, සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරාම -පෙ- සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරාම -පෙ- සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරාම. එතස්ස භන්තෙ විහාරස්ස සමතික්කමාය එතස්ස විහාරස්ස පටිප්පස්සද්ධියා අයමඤ්ඤො උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරො"ති.

29. සාධු සාධු, අනුරුද්ධා, එතස්ස පන වො අනුරුද්ධා විහාරස්ස සමතික්කමාය එතස්ස විහාරස්ස පටිප්පස්සද්ධියා අත්ථඤ්ඤො උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරොති?

30. "කිං හි නො සියා භන්තෙ, ඉධ මයං භන්තෙ යාවදෙව ආකඞ්ඛාම, සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරාම. පඤ්ඤාය ච නො දිස්වා ආසවා පරික්ඛීණා.[1] එතස්ස භන්තෙ විහාරස්ස සමතික්කමාය එතස්ස විහාරස්ස පටිප්පස්සද්ධියා අයමඤ්ඤො උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරො.[2] ඉමස්මා ච[3] මයං භන්තෙ ඵාසුවිහාරා අඤ්ඤං ඵාසුවිහාරං උත්තරිතරං වා පණීතතරං වා න සමනුපස්සාමා"ති.

31. සාධු, සාධු, අනුරුද්ධා, එතස්මා අනුරුද්ධා ඵාසුවිහාරා අඤ්ඤො ඵාසුවිහාරො උත්තරිතරො වා පණීතතරො වා නත්ථීති.

32. අථ ඛො භගවා ආයස්මන්තඤ්ච අනුරුද්ධං ආයස්මන්තඤ්ච නන්දියං ආයස්මන්තඤ්ච කිම්බිලං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.[4]

33. අථ ඛො ආයස්මා ච අනුරුද්ධො ආයස්මා ච නන්දියො ආයස්මා ච කිම්බිලො භගවන්තං අනුසංසාවෙත්වා[5] තතො පටිනිවත්තිත්වා ආයස්මා ච නන්දියො ආයස්මා ච කිම්බිලො ආයස්මන්තං අනුරුද්ධං එතදවොචුං:

"කින්නු[6] මයං ආයස්මතො අනුරුද්ධස්ස එවමාරොචිම්හ:[7] 'ඉමාසඤ්ච ඉමාසඤ්ච විහාරසමාපත්තීනං මයං ලාභිනො'ති යං නො ආයස්මා අනුරුද්ධො භගවතො සම්මුඛා යාව ආසවානං ඛයා පකාසෙසී"ති?

---

1. පරික්ඛීණා හොන්ති, සයා. 2. ඵාසුවිහාරොති, සයා. 3. ඉමස්මා, මජසං.
4. පක්කමි, මජසං. 5. අනුසංයායිත්වා, සයා. මජසං.
6. කින්නු ඛො මයං, මජසං සයා. PTS. සීමු. 7. එවමාරොචිම්හා, සයා.

Free Distribution www.aathaapi.org

28. "වහන්ස, කිම් නො වන්නේ ද? වහන්ස, අපි මෙහි යම් තාක් ම කැමැත්තමෝ ද, ඒ තාක් සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා 'විඤ්ඤාණය අනන්ත ය'යි විඤ්ඤාණඤ්චායතනය උපදවා වාස කරම්හ ... සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා 'කිසිවක් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනය උපදවා වාස කරම්හ. ... සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනය උපදවා වාස කරම්හ. වහන්ස, තෙල විහරණය ඉක්මීම පිණිස තෙල විහරණය සන්හිඳීම පිණිස මනුෂ්‍යධර්මයෙන් වැඩි ආර්යභාවය සිදු කිරීමට සමර්ථ විශිෂ්ටඥානදර්ශනයක් වූ මේ අන්‍යඵාසුවිහරණය ලබන ලද්දේ ය."

29. අනුරුද්ධයෙනි, මැනැව. මැනැව, අනුරුද්ධයෙනි, තෙල විහරණය ඉක්මවීම පිණිස තෙලවිහරණය සන්හිඳුවීම පිණිස මනුෂ්‍යධර්මයෙන් වැඩි ආර්යභාවය සිදු කිරීමට සමර්ථ විශිෂ්ටඥානදර්ශනයක් වූ අන්‍ය ඵාසුවිහරණයෙක් තොප විසින් ලබන ලද්දේ ඇත් ද?

30 "වහන්ස, කිම් නො වන්නේ ද? වහන්ස, යම් තාක් ම අපි, කැමැත්තමෝ ද, ඒ තාක් සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිතනිරොධයට පැමිණ වාසය කරම්හ. අප විසින් ප්‍රඥායෙන් දැක ආශ්‍රවයෝ ක්ෂය කරණ ලදහ. වහන්ස, තෙල විහරණය ඉක්මීම පිණිස තෙල විහරණය සන්හිඳීම පිණිස මනුෂ්‍යධර්මයෙන් වැඩි ආර්යභාවය සිදු කිරීමට සමර්ථ විශිෂ්ටඥානදර්ශනයක් වූ මේ අන්‍ය ඵාසු-විහරණය ලබන ලද්දේ ය. වහන්ස, අපි මේ සැපවිහරණයෙන් වඩා සිපි උත්තරීතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ අන්‍ය සැපවිහරණයක් නො දකුම්හ."

31 අනුරුද්ධයෙනි, මැනැව, මැනැව. අනුරුද්ධයෙනි, මේ සැප විහරණයෙන් වඩා සිපි උත්තරීතර වූ හෝ පණීතතර වූ හෝ අන්‍ය සැප විහරණයෙක් නැත.

32. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් හා ආයුෂමත් නන්දිය තෙරුන් හා ආයුෂමත් කිම්බිල තෙරුන් දැහැමි කථායෙන් කරුණු දක්වා සමාදන් කරවා තියුණු කරවා පහදවා හුනස්නෙන් නැඟී වැඩි සේක.

33. ඉක්බිති ආයුෂමත් අනුරුද්ධ තෙරණුවෝ ද ආයුෂමත් නන්දිය තෙරණුවෝ ද ආයුෂමත් කිම්බිල තෙරණුවෝ ද භාග්‍යවතුන් වහන්සේට පසු ගමන් කොට එයින් වචලා අවුත් ආයුෂමත් නන්දිය තෙරණුවෝ ද ආයුෂමත් කිම්බිල තෙරණුවෝ ද ආයුෂමත් අනුරුද්ධ තෙරණුවන්ට තෙල කීහ:

"යම් හෙයෙකින් ආයුෂමත් අනුරුද්ධ තෙමේ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි අපගේ ආස්‍රවක්ෂය කිරීම තෙක් ගුණ පැවසී ද, (එසේ පැවසීමට) කිම, 'අපි මම මේ (ලෞකික ලොකොත්තර) විහාරසමාපත්ති ලැබුවමෝ වෙමු'යි අපි අනුරුද්ධ ආයුෂමතුන්ට මෙසේ සැල කලමෝ දැයි?" [අධිගම අපරිවජ්ජතායෙන් මෙසේ කීහු.]

34. න ඛො මෙ ආයස්මන්තො එවමාරොචෙසුං: ඉමාසඤ්ච ඉමාසඤ්ච විහාරසමාපත්තීනං මයං ලාභිනොති; අපි ච[1] මෙ ආයස්මන්තානං චෙතසා චෙතො පරිච්ච විදිතො: ඉමාසඤ්ච ඉමාසඤ්ච විහාරසමාපත්තීනං ඉමෙ ආයස්මන්තො ලාභිනොති. දෙවතාපි මෙ එතමත්ථං ආරොචෙසුං: ඉමාසඤ්ච ඉමාසඤ්ච විහාරසමාපත්තීනං ආයස්මන්තො ලාභිනොති. තං[2] මෙ භගවතා පඤ්හාභිපුට්ඨෙන බ්‍යාකතන්ති.

35. අථ ඛො **දීඝො පරජනො** යක්ඛො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො දීඝො පරජනො යක්ඛො භගවන්තං එතදවොච: "ලාභා භන්තෙ[3] වජ්ජීනං, සුලද්ධලාභා වජ්ජිපජාය,[4] යත්ථ තථාගතො විහරති අරහං සම්මාසම්බුද්ධො, ඉමෙ ච තයො කුලපුත්තා, ආයස්මා ච අනුරුද්ධො ආයස්මා ච නන්දියො ආයස්මා ච කිම්බිලො"ති.

36. දීඝස්ස පරජනස්ස යක්ඛස්ස සද්දං සුත්වා භුම්මා දෙවා සද්දමනුස්සාවෙසුං: "ලාභා වත භො වජ්ජීනං, සුලද්ධලාභා වජ්ජිපජාය, යත්ථ තථාගතො විහරති අරහං සම්මාසම්බුද්ධො, ඉමෙ ච තයො කුලපුත්තා ආයස්මා ච අනුරුද්ධො ආයස්මා ච නන්දියො ආයස්මා ච කිම්බිලො"ති. භුම්මානං දෙවානං සද්දං සුත්වා **චාතුම්මහාරාජිකා** දෙවා -පෙ- **තාවතිංසා** දෙවා -පෙ- **යාමා** දෙවා -පෙ- **තුසිතා** දෙවා -පෙ- **නිම්මානරතී** දෙවා -පෙ- **පරනිම්මිතවසවත්තිනො** දෙවා[5] -පෙ- **බ්‍රහ්මකායිකා** දෙවා සද්දමනුස්සාවෙසුං: ලාභා වත භො වජ්ජීනං, සුලද්ධලාභා වජ්ජිපජාය, යත්ථ තථාගතො විහරති අරහං සම්මාසම්බුද්ධො, ඉමෙ ච තයො කුලපුත්තා, ආයස්මා ච අනුරුද්ධො ආයස්මා ච නන්දියො ආයස්මා ච කිම්බිලොති ඉතිහ තෙ ආයස්මන්තො තෙන ඛණෙන තෙන මුහුත්තෙන යාව බ්‍රහ්මලොකා විදිතා අහෙසුං.

37. එවමෙතං දීඝ, එවමෙතං දීඝ යස්මාපි දීඝ, කුලා එතෙ තයො කුලපුත්තා අගාරස්මා අනගාරියං පබ්බජිතා, තඤ්චෙපි කුලං එතෙ තයො කුලපුත්තෙ පසන්නචිත්තං අනුස්සරෙය්‍ය, තස්සපස්ස[6] කුලස්ස දීඝරත්තං හිතාය සුඛාය.

38. දීඝ, යස්මාපි කුලපරිවට්ටා එතෙ තයො කුලපුත්තා අගාරස්මා අනගාරියං පබ්බජිතා, සො චෙපි කුලපරිවට්ටො එතෙ තයො කුලපුත්තෙ පසන්නචිත්තො අනුස්සරෙය්‍ය, තස්සපස්ස කුලපරිවට්ටස්ස දීඝරත්තං හිතාය සුඛාය.

---

1. අපි ඛො, සෳා. 2 තමෙතං, මජසං. PTS. සී.
3 ලාභාවත භන්තෙ, මජසං. 4. සුලද්ධ ලාභා වත භො වජ්ජීනං පජාය, සෳා.
5. පරනිම්මිතවසවත්ති දෙවා, මජසං සෳා. 6.. තස්සපාස්ස, මජසං.

34. ආයුෂ්මත්හු 'අපි මේ මේ විහාරසමාපත්තීන් ලැබුවෙමු'යි මට මෙසේ නො කීහ. එහෙත් මේ ආයුෂ්මත්හු 'මේ මේ විහාරසමාපත්තීන් ලැබුවාහු ය'යි මාගේ සිතින් ආයුෂ්මතුන්ගේ සිත් පිරිසිඳ දක්නා ලදී. ආයුෂ්මත්හු 'මේ මේ විහාරසමාපත්තීන් ලැබුවාහු ය' යි දෙවියෝ ද මට මෙ කරුණ සැල කළහ. භාග්‍යවතුන් වහන්සේ විසින් විචාරණ ලද මා විසින් මේ කාරණය ප්‍රකාශ කරණ ලදී.

35. ඉක්බිති දීඝ පරජන නම් (යක් සෙනෙවි) දෙව් රජ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි දීඝ පරජන දෙව්රජ භාග්‍යවතුන් වහන්සේට මෙල සැළ කෙළේ ය: වහන්ස, යම් වජ්ජිජනපදයෙක තථාගත අර්හත් සම්මාසම්බුද්ධරජාතන් වහන්සේ වැඩ වසනසේක් ද, ආයුෂ්මත් අනුරුද්ධ ආයුෂ්මත් නන්දිය ආයුෂ්මත් කිම්බිල යන මේ කුලපුත්‍රයෝ තිදෙනත් වෙසෙත් ද, එය ඒ වජ්ජීන්ට ලාභ ය. වජ්ජීප්‍රජාව විසින් යහපත් සේ ලද ලාභ ය.

36. දීඝ පරජන දෙව්රජුගේ ශබ්දය අසා භූමාටු දෙවියෝ "පින්වත්නි, යම් වජ්ජිජනපදයෙක තථාගත අර්හත් සම්මාසම්බුද්ධ රජාතන් වහන්සේ වැඩ වසන සේක් ද, ආයුෂ්මත් අනුරුද්ධ ආයුෂ්මත් නන්දිය ආයුෂ්මත් කිම්බිල යන කුලපුත්‍රයෝ තිදෙනත් වෙසෙද් ද, පින්වත්නි, එකාන්තයෙන් ඒ වජ්ජීන්ට ලාභ ය. වජ්ජීප්‍රජාව විසින් යහපත් සේ ලද ලාභ ය" යි ශබ්ද ඇස්වූහ. භූමාටු දෙවියන්ගේ ශබ්දය අසා චාතුර්මහාරාජිකා දෙවියෝ ... තව්තිසා දෙවියෝ ... යාම දෙවියෝ ... තුසිත දෙවියෝ ... නිර්මාණරති දෙවියෝ ... පරනිර්මිත-වශවර්ති දෙවියෝ ... බ්‍රහ්මකායිකා දෙවියෝ "පින්වත්නි, යම් වැදූරපෙක තථාගත අර්හත් සම්මාසම්බුද්ධරජාතන් වහන්සේ වැඩ වසන සේක් ද, ආයුෂ්මත් අනුරුද්ධ ආයුෂ්මත් නන්දිය ආයුෂ්මත් කිම්බිල, යන මේ කුලපුත්‍රයෝ තිදෙනත් වෙසෙත් ද, එය ඒකාන්තයෙන් වජ්ජීන්ට ලාභ ය. වජ්ජීප්‍රජාව විසින් යහපත් සේ ලද ලාභ ය"යි ශබ්ද ඇස්වූහ. මෙසේ ඒ ආයුෂ්මත්හු එකෙණෙහි ඒ මොහොතෙහි බඹලොව තෙක් ප්‍රසිද්ධ වූහ.

37. දීඝය, ඒ එසේ ය. දීඝය, ඒ එසේ ය. දීඝය, යම් කුලයෙකින් මෙ කුලපුත්‍රයෝ තිදෙන ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියාහු ද, ඉදින් ඒ කුලයත් මේ කුලපුතුන් පහන්සිතැති ව සිහි කරන්නේ නම්, ඒ කුලයට ද දීඝකාලයෙහි හිතසැප පිණිස වන්නේ ය.

38. දීඝය, යම් කුලපරපුරෙකින් මේ කුලපුත්‍රයෝ තිදෙන ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියාහු ද, ඒ කුලපරපුරත් මේ කුලපුත්‍රයන් තිදෙන පහන් සිතැති ව සිහි කරන්නේ නම් ඒ කුලපරපුරට ද බොහෝ කලක් හිත සැප පිණිස වන්නේ ය.

39. යස්මාපි දීඝ, ගාමා එතෙ තයො කුලපුත්තා අගාරස්මා අනගාරියං පබ්බජිතා, සො චෙපි ගාමො එතෙ තයො කුලපුත්තෙ පසන්නචිත්තො අනුස්සරෙය්‍ය, තස්සපස්ස[1] ගාමස්ස දීඝරත්තං හිතාය සුඛාය.

40. යස්මාපි දීඝ, නිගමා එතෙ තයො කුලපුත්තා අගාරස්මා අනගාරියං පබ්බජිතා සො චෙපි නිගමො එතෙ තයො කුලපුත්තෙ පසන්නචිත්තො අනුස්සරෙය්‍ය, තස්සපස්ස නිගමස්ස දීඝරත්තං හිතාය සුඛාය.

41. යස්මාපි දීඝ, නගරා එතෙ තයො කුලපුත්තා අගාරස්මා අනගාරියං පබ්බජිතා, තඤ්චෙපි නගරං එතෙ තයො කුලපුත්තෙ පසන්නචිත්තං අනුස්සරෙය්‍ය, තස්සපස්ස නගරස්ස දීඝරත්තං හිතාය සුඛාය.

42. යස්මාපි දීඝ, ජනපදා එතෙ තයො කුලපුත්තා අගාරස්මා අනගාරියං පබ්බජිතා, සො චෙපි ජනපදො එතෙ තයො කුලපුත්තෙ පසන්නචිත්තො අනුස්සරෙය්‍ය, තස්සපස්ස ජනපදස්ස දීඝරත්තං හිතාය සුඛාය.

43. සබ්බෙ චෙපි දීඝ, ඛත්තියා එතෙ තයො කුලපුත්තෙ පසන්නචිත්තා අනුස්සරෙය්‍යුං, සබ්බෙසානම්පස්ස[2] ඛත්තියානං දීඝරත්තං හිතාය සුඛාය.

44. සබ්බෙ චෙපි දීඝ, බ්‍රාහ්මණා[3] එතෙ තයො කුලපුත්තෙ පසන්නචිත්තා අනුස්සරෙය්‍යුං, සබ්බෙසානම්පස්ස බ්‍රාහ්මණානං දීඝරත්තං හිතාය සුඛාය.

45. සබ්බෙ චෙපි දීඝ, වෙස්සා[3] එතෙ තයො කුලපුත්තෙ පසන්නචිත්තා අනුස්සරෙය්‍යුං, සබ්බෙසානම්පස්ස වෙස්සානං දීඝරත්තං හිතාය සුඛාය.

46. සබ්බෙ චෙපි දීඝ, සුද්දා එතෙ තයො කුලපුත්තෙ පසන්නචිත්තා අනුස්සරෙය්‍යුං, සබ්බෙසානම්පස්ස සුද්දානං දීඝරත්තං, හිතාය සුඛාය.

47. සදෙවකො චෙපි දීඝ, ලොකො සමාරකො සබ්‍රහ්මකො, සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා එතෙ තයො කුලපුත්තෙ පසන්නචිත්තා අනුස්සරෙය්‍ය, සදෙවකස්ස . පස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දීඝරත්තං හිතාය සුඛාය.

48. පස්ස දීඝ, යාවඤ්චෙතෙ තයො කුලපුත්තා බහුජනහිතාය පටිපන්නා බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

ඉදමවොච භගවා. අත්තමනො දීඝො පරජනො යක්ඛො භගවතො භාසිතං අභිනන්දීති.

චූළගොසිඞ්ගසුත්තං පඨමං.

---

1. පාස්ස, මජසං. 2. සබ්බසානං පාස්ස, මජසං. සබ්බෙසං පස්ස, සතා.
3. සබ්බෙ චෙපි දීඝ බ්‍රාහ්මණා -පෙ-, සබ්බෙ චෙපි දීඝ වෙස්සා -පෙ- මජසං. සතා.

Free Distribution www.aathaapi.org

39. දීඝය, යම් ගමෙකින් මේ කුලපුත්‍රයෝ තිදෙන ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියාහු ද, ඒ ගමත් මේ කුලපුත්‍රයන් තිදෙන පහන් සිතැති ව සිහි කරන්නේ නම් ඒ ගමට ද බොහෝ කලක් හිතසැප පිණිස වන්නේ ය.

40. දීඝය, යම් නියම්ගමෙකින් මේ කුලපුත්‍රයෝ තිදෙන ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියාහු ද, ඉදින් ඒ නියම්ගමත් මේ කුලපුත්‍රයන් තිදෙන පහන් සිතැති ව සිහි කරන්නේ නම් ඒ නියම් ගමට ද බොහෝ කලක් හිත සැප පිණිස වන්නේ ය.

41. දීඝය, යම් නගරයෙකින් මේ කුලපුත්‍රයෝ තිදෙන ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියාහු ද, ඉදින් ඒ නගරයත් මේ කුලපුත්‍රයන් තිදෙන පහන් සිතැති ව සිහි කරන්නේ නම් ඒ නගරයට ද බොහෝ කලක් හිත සැප පිණිස වන්නේ ය.

42. දීඝය, යම් ජනපදයෙකින් මේ කුලපුත්‍රයෝ තිදෙන ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියාහු ද, ඉදින් ඒ ජනපදයත් මේ කුලපුත්‍රයන් තිදෙන පහන් සිතැති ව සිහි කරන්නේ නම් ඒ ජනපදයට ද බොහෝ කලක් හිත සැප පිණිස වන්නේ ය.

43. දීඝය, ඉදින් සියලු ක්‍ෂත්‍රියයෝ ද මේ කුලපුත්‍රයන් තිදෙන පහන් සිතැති ව සිහි කරන්නාහු නම් සියලු ක්‍ෂත්‍රියයන්ට ද දිගුකලක් හිත සැප පිණිස වන්නේ ය.

44. දීඝය, ඉදින් සියලු බ්‍රාහ්මණයෝ ද මේ කුලපුත්‍රයන් තිදෙන පහන් සිතැත්තාහු සිහි කරන්නාහු නම් සියලු බ්‍රාහ්මණයන්ට ද දිගු කලක් හිත සැප පිණිස වන්නේ ය.

45. දීඝය, ඉදින් සියලු වෛශ්‍යයෝ ද මේ කුලපුත්‍රයන් තිදෙන පහන් සිතැත්තාහු සිහි කරන්නාහු නම් සියලු වෛශ්‍යයන්ට ද දිගු කලක් හිත සැප පිණිස වන්නේ ය.

46. දීඝය, ඉදින් සියලු ශුද්‍රයෝ ද මේ කුලපුතුන් තිදෙන පහන් සිතැත්තාහු සිහි කරන්නාහු නම් සියලු ශුද්‍රයන්ට ද දිගුකලක් හිත සැප පිණිස වන්නේ ය.

47. දීඝය, ඉදින් දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකය ද, දෙවි මිනිසුන් සහිත මහණ බමුණන් සහිත ප්‍රජාව ද මේ කුලපුත්‍රයන් තිදෙන පහන් සිතැත්තාහු සිහිකරන්නාහු ද... බොහෝ කලක් හිත සැප පිණිස වන්නේ ය.

48. දීඝය, මේ කුලපුත්‍රයෝ තිදෙන යම් තාක් බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සැප පිණිස ලොවට අනුකම්පා පිණිස දෙවිමිනිසුන්ට වැඩ පිණිස හිත පිණිස සැප පිණිස පිළිපන්නාහු යයි දකුව.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාල සේක. සතුටු සිත් ඇති දීඝ පරජන දෙවිරජ තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළි ගත්තේ ය.

චූලගොසිඞ්ග සූත්‍රය පළමුවැනි යි.

1. 4. 2.

මහාගොසිඞ්ගසුත්තං

1. **එවං** මෙ සුතං: එකං සමයං භගවා **ගොසිඞ්ගසාලවනදායෙ** විහරති සම්බහුලෙහි අභිඤ්ඤාතෙහි අභිඤ්ඤාතෙහි ථෙරෙහි සාවකෙහි සද්ධිං: ආයස්මතා ච **සාරිපුත්තෙන** ආයස්මතා ච **මහාමොග්ගල්ලානෙන** ආයස්මතා ච **අනුරුද්ධෙන** ආයස්මතා ච **රෙවතෙන** ආයස්මතා ච **ආනන්දෙන** - අඤ්ඤෙහි ච අභිඤ්ඤාතෙහි අභිඤ්ඤාතෙහි ථෙරෙහි සාවකෙහි සද්ධිං.

2. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො සායන්හසමයං පටිසල්ලාණා වුට්ඨිතො යෙනායස්මා මහාකස්සපො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකස්සපං එතදවොච: ආයාමාවුසො කස්සප යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමිස්සාම ධම්මසවණායාති. එවමාවුසොති ඛො ආයස්මා මහාකස්සපො ආයස්මතො මහාමොග්ගල්ලානස්ස පච්චස්සොසි.

3. අථ ඛො ආයස්මා ච මහාමොග්ගල්ලානො ආයස්මා ච මහාකස්සපො ආයස්මා ච අනුරුද්ධො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමිංසු ධම්මසවණාය. අද්දසා ඛො ආයස්මා ආනන්දො ආයස්මන්තඤ්ච මහාමොග්ගල්ලානං ආයස්මන්තඤ්ච මහාකස්සපං ආයස්මන්තඤ්ච අනුරුද්ධං යෙනායස්මා සාපිපුත්තො තෙනුපසඞ්කමන්තෙ ධම්මසවණාය. දිස්වාන යෙනායස්මා රෙවතො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං රෙවතං එතදවොච: උපසඞ්කමන්තා ඛො අමූ ආවුසො රෙවත සප්පුරිසා යෙනායස්මා සාරිපුත්තො තෙන ධම්මසවණාය. ආයාමාවුසො රෙවත යෙනායස්මා සාරිපුත්තො තෙනුසඞ්කමිස්සාම ධම්ම-සවණායාති. එවමාවුසොති ඛො ආයස්මා රෙවතො ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසි. අථ ඛො ආයස්මා ච රෙවතො ආයස්මා ච ආනන්දො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමිංසු ධම්මසවණාය.

4. අද්දසා ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තඤ්ච රෙවතං ආයස්මන්තඤ්ච ආනන්දං දූරතොව ආගච්ඡන්තෙ. දිස්වාන ආයස්මන්තං ආනන්දං එතදවොච: "එතු ඛො ආයස්මා ආනන්දො, සාගතං ආයස්මතො ආනන්දස්ස භගවතො උපට්ඨාකස්ස භගවතො සන්තිකාවචරස්ස. රමණීයං ආවුසො ආනන්ද ගොසිඞ්ගසාලවනං, දොසිනා රත්ති, සබ්බපාලිඵුල්ලා[1] සාලා, දිබ්බා මඤ්ඤෙ ගන්ධා සම්පවන්ති. කථංරූපෙන ආවුසො ආනන්ද භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා"ති?

---

1. සබ්බඵාලිඵුල්ලා PTS.

1. 4. 2.

මහාගොසිඞ්ග සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **ගොසිඞ්ගසාලවන** ලැව්හි ආයුෂ්මත් **ශාරීපුත්‍ර**, ආයුෂ්මත් **මහාමෞද්ගල්‍යායන**, ආයුෂ්මත් **මහාකාශ්‍යප**, ආයුෂ්මත් **අනුරුද්ධ**, ආයුෂ්මත් **රේවත**, ආයුෂ්මත් **ආනන්ද** යන ඉපහල සථවිර ශ්‍රාවකයන් හා - අන්‍ය වූ ඉපහල සථවිර ශ්‍රාවකයන් හා ද සමග වැඩ වසන සේක.

2. ඉක්බිති ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන තෙරණුවෝ සවස්වරුයෙහි එළසමවතින් නැගී සිටියාහු ආයුෂ්මත් මහාකාශ්‍යප තෙරණුවන් කරා එළඹියහ. එළඹ ආයුෂ්මත් මහාකාශ්‍යප තෙරණුවන්ට තෙල සැළ කළහ. "ආයුෂ්මත් කාශ්‍යපයෙනි ආයුෂ්මත් සැරියුත්තෙරණුවන් වෙත ධර්මශ්‍රවණය සඳහා යම්හ"කියා යි. "ඇවැත්නි, එසේ යැ"යි මහාකාශ්‍යප තෙරණුවෝ මහමුගලන් තෙරණුවන්ට පිළිවදන් දුන්හ.

3. ඉක්බිති ආයුෂමත් මහමුගලන් තෙරණුවෝ ද, ආයුෂමත් මහසුප් තෙරණුවෝ ද, ආයුෂමත් අනුරුත් තෙරණුවෝ ද ධර්මශ්‍රවණය පිණිස සැරියුත් තෙරණුවන් වෙත එළඹියාහු ය. ආයුෂමත් ආනන්ද තෙරණුවෝ ආයුෂමත් සැරියුත් තෙරණුවන් වෙත ධර්මශ්‍රවණය පිණිස එළඹෙන ආයුෂමත් මහමුගලන් තෙරුන් ද, ආයුෂ්මත් මහසුප් තෙරුන් ද, ආයුෂමත් අනුරුත් තෙරුන් ද දුටහ. දැක ආයුෂමත් රේවත තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂමත් රේවත තෙරණුවන්ට තෙල සැළ කෙළේ ය: "ආයුෂමත් රේවතයෙනි, මේ සත්පුරුෂයෝ ආයුෂමත් ශාරීපුත්‍ර තෙරණුවන් කරා ධර්මශ්‍රවණය කරණු පිණිස එළඹෙත්. ඇවැත් රේවතයෙනි, ආයුෂමත් ශාරීපුත්‍රයන් වහන්සේ කරා ධර්මශ්‍රවණය පිණිස යම්හ"යි කියා යි. 'එසේ ය'යි ආයුෂමත් රේවත තෙරණුවෝ ආයුෂමත් ආනන්ද තෙරණුවන්ට පිළිවදන් දුන්හ. ඉක්බිති ආයුෂමත් රේවත තෙරණුවෝ ද, ආයුෂමත් ආනන්ද තෙරණුවෝ ද ආයුෂමත් ශාරීපුත්‍ර තෙරණුවන් වෙත ධර්මශ්‍රවණය පිණිස එළඹියාහු ය.

4. ආයුෂමත් සැරියුත් තෙරණුවෝ ආයුෂමත් ආනන්ද තෙරණුවන් ද, ආයුෂමත් රේවත තෙරණුවන් ද එනුවන් දුර ම දුටහ. දැක ආයුෂමත් ආනන්ද තෙරණුවන්ට තෙල කීහ: "ආයුෂමත් ආනන්දතෙමේ ඒවා. භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායක වූ ඔබගේ සන්තිකාවචර වූ ආනන්දයහට ස්වාගත වේවා. ඇවැත් ආනන්දයෙනි, ගොසිඞ්ගසාලවනය සිත්කලු ය. රාත්‍රිය (අනුමඟිකාදී) දෙස්රහිත ය. (පහන් ය). වෘක්‍ෂයෝ සවාරෙන් (මුලපටන් අග තෙක්) පිපී ගියහ. දිව්සුවඳ වැනි සුවඳ හමයි. ඇවැත් ආනන්දයෙනි, කෙබඳු භික්‍ෂුනමකගෙන් ගොසිඞ්ගසාලවනය හොබනේ වේ ද?

[ආයස්මා ආනන්දො:]

5. "ඉධාවුසො සාරිපුත්ත භික්ඛු බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො. යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති, ධතා, වචසා පරිචිතා, මනසානුපෙක්ඛිතා, දිට්ඨියා සුප්පටිවිද්ධා. සො චතස්සන්නං[1] පරිසානං ධම්මං දෙසෙති පරිමණ්ඩලෙහි පදබ්‍යඤ්ජනෙහි අප්පබද්ධෙහි[2] අනුසයසමුග්ඝාතාය. එවරූපෙන ඛො ආවුසො සාරිපුත්ත භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා"ති.

6. එවං වුත්තෙ ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං රෙවතං එතදවොච: බ්‍යාකතං ඛො ආවුසො රෙවත ආයස්මතා ආනන්දෙන යථා සකං පටිභානං. තත්ථදානි මයං ආයස්මන්තං රෙවතං පුච්ඡාම. රමණීයං ආවුසො රෙවත ගොසිඞ්ගසාලවනං, දොසිනා රත්ති, සබ්බපාලිඵුල්ලා සාලා, දිබ්බා මඤ්ඤෙ ගන්ධා සම්පවන්ති. කථංරූපෙන ආවුසො රෙවත භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යාති?

[ආයස්මා රෙවතො:]

7. "ඉධාවුසො සාරිපුත්ත, භික්ඛු පටිසල්ලානාරාමො හොති පටිසල්ලානරතො, අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො, අනිරාකතජ්ඣානො, විපස්සනාය සමන්නාගතො, බ්‍රූහෙතා සුඤ්ඤාගාරානං. එවරූපෙන ඛො ආවුසො සාරිපුත්ත භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා"ති.

8. එවං වුත්තෙ ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං අනුරුද්ධං එතදවොච: බ්‍යාකතං ඛො ආවුසො අනුරුද්ධ ආයස්මතා රෙවතෙන යථා සකං පටිභානං. තත්ථදානි මයං ආයස්මන්තං අනුරුද්ධං පුච්ඡාම: රමණීයං ආවුසො අනුරුද්ධ ගොසිඞ්ගසාලවනං, දොසිනා රත්ති, සබ්බපාලිඵුල්ලා සාලා, දිබ්බා මඤ්ඤෙ ගන්ධා සම්පවන්ති. කථං රූපෙන ආවුසො අනුරුද්ධ භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යාති.?

[ආයස්මා අනුරුද්ධො:]

9. "ඉධාවුසො සාරිපුත්ත, භික්ඛු දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සහස්සං ලොකානං ඔලොකෙති[3]. සෙය්‍යථාපි ආවුසො සාරිපුත්ත චක්ඛුමා පුරිසො උපරිපාසාදවරගතො සහස්සං නෙමිමණ්ඩලානං ඔලොකෙය්‍ය, එවමෙව ඛො ආවුසො සාරිපුත්ත භික්ඛු දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සහස්සං ලොකානං ඔලොකෙති. එවරූපෙන ඛො ආවුසො සාරිපුත්ත භික්ඛුනා ගොසිඞ්ග-සාලවනං සොභෙය්‍යා"ති.

---

1. චතුන්නං, මජසං. ඉ. 2. අනුප්පබද්ධෙහි, මජසං. සතා.
3. වොලොකෙති, මජසං. සතා.

[ආයුෂ්මත් ආනන්ද:]

5. "ශාරීපුත්‍රයන් වහන්ස, මෙහි (යම්) මහණෙක් බහුශ්‍රැත වේ ද, ඇසූ දැය දරන්නේ වේ ද, ඇසූ දැය රැස් වූ තැනෙක් වේ ද, යම් ඒ ධර්මයෝ ආදිකල්‍යාණ වෙත් ද, මධ්‍යකල්‍යාණ වෙත් ද, පරියොසාන කල්‍යාණ වෙත් ද, සාර්ථ වෙත් ද, සව්‍යඤ්ජන වෙත් ද, කේවල පරිපූර්ණ කොට පිරිසිදු කොට බඹසර පවසත් ද, ඔහු විසින් එබඳු ධර්මයෝ බොහෝ කොට අසන ලද්දාහු වචනයෙන් පුරුදු කරන ලද්දාහු, සිතින් නැවත නැවත පරීක්ෂා කරන ලද්දාහු, ප්‍රඥාවෙන් මනා ව අවබොධ කරන ලද්දාහු වෙද් ද, හේ සප්ත අනුශයයන් නැසීම පිණිස සිවුපිරිසට පිරිමඬුලු වූ ප්‍රබන්ධ නො වූ (අතර නැති ව පවත්නා) පද ව්‍යඤ්ජනයෙන් යුක්ත ව දහම් දෙසා ද, ඇවැත් ශාරීපුත්‍රයන් වහන්ස, මෙවැනි මහණහුගෙන් ගොසිඞ්ගසාලවනය හොබනේ ය."

6. මෙසේ කී කල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් රේවත තෙරණුවන්ට මෙය කීහ: ඇවැත් රේවතයෙනි, ආයුෂ්මත් ආනන්ද තෙරුන් විසින් සිය වටහනු පරිදි ප්‍රකාශ කරන ලදී. එහි දැන් අපි ආයුෂ්මත් රේවත තෙරණුවන් විචාරම්හ: ඇවැත් රේවතයෙනි, ගොසිඞ්ගසාලවනය සිත්කලු ය. රාත්‍රිය පහන් ය. වෘක්ෂයෝ හැමතැන මලින් සැදියහ. දිවසුවඳ වැනි සුවඳ හමයි. ඇවැත් රේවතයෙනි, කෙබඳු ස්වභාව ඇති භික්ෂුනමක් නිසා ගොසිඞ්ගසාලවනය හොබනේ වේ ද?

[ආයුෂ්මත් රේවත:]

7. "ඇවැත් ශාරීපුත්‍රයන් වහන්ස, මෙහි යම් මහණෙක් පල සමවත් අරම් කොට ඇත්තේ පලසමවතෙහි ඇලුණේ වේ ද, තමා තුළ චිත්තසමාධියෙන් යුක්ත වූයේ ද, බැහැර නො කළ ධ්‍යාන ඇත්තේ වේ ද, විදර්ශනාවෙන් යුක්ත වූයේ වේ ද, ශූන්‍යාගාර (විදර්ශනා) වඩන්නේ වේ ද, ඇවැත් ශාරීපුත්‍රයෙනි, මෙබඳු භික්ෂු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ වෙයි".

8. මෙසේ කී කල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් අනුරුත් තෙරණුවන්ට තෙල කීහ: ඇවැත් අනුරුද්ධයෙනි, ආයුෂ්මත් රේවත තෙරණුවන් විසින් සිය වටහනු පරිදි ප්‍රකාශ කරන ලදී. එහි දැන් අපි ආයුෂ්මත් අනුරුද්ධයන් විචාරම්හ: ඇවැත් අනුරුද්ධයෙනි, ගොසිඞ්ගසාලවනය සිත්කලු ය. රාත්‍රිය පහන් ය. වෘක්ෂයෝ සර්වාකාරයෙන් පිපී ගියහ. දිවසුවඳ වැනි සුවඳ හමයි. ඇවැත් අනුරුද්ධයෙනි, කෙබඳු ස්වරූප ඇති භික්ෂු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ වේ ද?"

[ආයුෂ්මත් අනුරුද්ධ:]

9. "ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, මේ ශාසනයෙහි යම් මහණෙක් ඉතා පිරිසිදු (කෙලෙස්මල පුන්) මිනිසැස ඉක්ම සිටි දිවඇසින් සහස්‍රලොකධාතුව බලා ද, ඇවැත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්ස, යම් සේ ඇස් ඇති පුරුෂයෙක් වරපහාතලමතට ගියේ (පහාපිරිවෙන්හි තැබ පිහිටි) නිම්මඬුලු දහස් යම් සේ බලන්නේ වේ ද, ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, ඒ මහණ එපරිද්දෙන් ම මිනිසැස ඉක්ම සිටි පිරිසිදු දිවඇසින් සහස්‍රලොකධාතුව බලයි. ඇවැත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්ස, මෙබඳු ස්වරූප ඇති භික්ෂු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ ය."

10. එවං වුත්තෙ ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං මහාකස්සපං එතදවොච: බ්‍යාකතං ඛො ආවුසො කස්සප ආයස්මතා අනුරුද්ධෙන යථා සකං පටිභානං. තත්‍ථදානි මයං ආයස්මන්තං මහාකස්සපං පුච්ඡාම: රමණීයං ආවුසො කස්සප ගොසිඞ්ගසාලවනං, දොසිනා රත්ති, සබ්බඵාලිඵුල්ලා සාලා, දිබ්බා මඤ්ඤෙ ගන්ධා සම්පවන්ති. කථංරූපෙන ආවුසො කස්සප භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යාති?

[ආයස්මා මහාකස්සපො:]

11. "ඉධාවුසො සාරිපුත්ත භික්ඛු අත්තනා ච ආරඤ්ඤකො හොති ආරඤ්ඤකත්තස්ස ච වණ්ණවාදී. අත්තනා ච පිණ්ඩපාතිකො හොති පිණ්ඩපාතිකත්තස්ස ච වණ්ණවාදී. අත්තනා ච පංසුකූලිකො හොති පංසුකූලිකත්තස්ස ච වණ්ණවාදී. අත්තනා ච තෙචීවරිකො හොති තෙචීවරිකත්තස්ස ච වණ්ණවාදී අත්තනා ච අප්පිච්ඡො හොති අප්පිච්ඡතාය ච වණ්ණවාදී. අත්තනා ච සන්තුට්ඨො හොති සන්තුට්ඨියා ච වණ්ණවාදී. අත්තනා ච පවිවිත්තො හොති පවිවෙකස්ස ච වණ්ණවාදී. අත්තනා ච අසංසට්ඨො හොති අසංසග්ගස්ස ච වණ්ණවාදී. අත්තනා ච ආරද්ධවිරියො[1] හොති විරියාරම්භස්ස ච වණ්ණවාදී. අත්තනා ච සීලසම්පන්නො හොති සීලසම්පදාය ච වණ්ණවාදී. අත්තනා ච සමාධිසම්පන්නො හොති සමාධිසම්පදාය ච වණ්ණවාදී. අත්තනා ච පඤ්ඤාසම්පන්නො හොති පඤ්ඤාසම්පදාය ච වණ්ණවාදී. අත්තනා ච විමුත්තිසම්පන්නො හොති විමුත්තිසම්පදාය ච වණ්ණවාදී. අත්තනා ච විමුත්තිඤාණදස්සනසම්පන්නො හොති විමුත්තිඤාණදස්සනසම්පදාය ච වණ්ණවාදී. එවරූපෙන ඛො ආවුසො සාරිපුත්ත භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා"ති.

12. එවං වුත්තෙ ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච: බ්‍යාකතං ඛො ආවුසො මොග්ගල්ලාන ආයස්මතා මහාකස්සපෙන යථා සකං පටිභානං. තත්‍ථදානි මයං ආයස්මන්තං මහාමොග්ගල්ලානං පුච්ඡාම: රමණීයං ආවුසො මොග්ගල්ලාන ගොසිඞ්ගසාලවනං, දොසිනා රත්ති, සබ්බඵාලිඵුල්ලා සාලා, දිබ්බා මඤ්ඤෙ ගන්ධා සම්පවන්ති. කථංරූපෙන ආවුසො මොග්ගල්ලාන භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යාති?

[ආයස්මා මහාමොග්ගල්ලානො:]

13. "ඉධාවුසො සාරිපුත්ත ද්වෙ භික්ඛු අභිධම්මකථං කථෙන්ති. තෙ අඤ්ඤමඤ්ඤං පඤ්හං පුච්ඡන්ති.[2] අඤ්ඤමඤ්ඤස්ස පඤ්හං පුට්ඨා විස්සජ්ජෙන්ති නො ච සංසාදෙන්ති.[3] ධම්මී ච නෙසං කථා පවත්තති හොති. එවරූපෙන ඛො ආවුසො සාරිපුත්ත භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා"ති.

1. විරියො - විරියාරම්භො, මජසං. 2 අඤ්ඤමඤ්ඤං පුච්ඡන්ති, සතා.
3. සංසාරෙන්ති, මජසං.

10. මෙසේ කී කල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේට මෙසේ කීහ: ඇවැත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්ස, ආයුෂ්මත් අනුරුද්ධයන් විසින් තමාගේ වැටහීම පරිදි ප්‍රකාශ කරණ ලදී. එහි ලා අපි දැන් ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ විචාරම්හ: ඇවැත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්ස, ගොසිඞ්ගසාලවනය සිත්කලු ය. රාත්‍රිය පහන් ය. වෘක්ෂයෝ හැමලෙසින් පිපී ගියහ. දිව්‍යසුවඳ වැනි සුවඳ හමයි. ඇවැත් කාශ්‍යප ස්ථවිරයන් වහන්ස, කෙබඳු ස්වරූප ඇති භික්ෂු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ වේ ද?

[ආයුෂ්මත් මහාකාශ්‍යප:]

11. "ඇවැත් ශාරීපුත්‍රයෙනි, මේ ශාසනයෙහි යම් මහණෙක් තෙමේත් ආරණ්‍යක වූයේ ආරණ්‍යකධුතාඞ්ගධාරීභාවයෙහි ගුණ කියනසුලු වේ ද. තෙමේත් පිණ්ඩපාතික වූයේ පිණ්ඩපාතිකධුතාඞ්ගධාරීභාවයෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් පාංශුකූලික වූයේ පාංශුකූලිකධුතාඞ්ගධාරී භාවයෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් තෛචීවරික වූයේ තෛචීවරික ධුතාඞ්ගධාරීභාවයෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් අල්පේච්ඡ වූයේ අල්පේච්ඡභාවයෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් සන්තුෂ්ට වූයේ දශවිධ සන්තොෂයෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් ප්‍රවිවේක ඇත්තේ ප්‍රවිවේකයෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් කුලය කෙරෙහි ගණයා කෙරෙහි නො ඇලුණේ අසංසර්ගයෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් රුකුළුවැර ඇත්තේ වැර ඇරඹුමෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් ශීලසම්පන්න වූයේ ශීලසම්පත්තියෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් සමාධිසම්පන්න වූයේ සමාධිසම්පත්තියෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් ප්‍රඥසම්පන්න වූයේ ප්‍රඥසම්පත්තියෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් විමුක්තිසම්පන්න වූයේ විමුක්තිසම්පත්තියෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් විමුක්තිඥනදර්ශනසම්පන්න වූයේ විමුක්තිඥන-දර්ශනසම්පත්තියෙහි ගුණ කියනසුලු වූයේ වේ ද, ඇවැත් ශාරීපුත්‍රයෙනි, මෙ වැනි භික්ෂු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ ය."

12. මෙසේ ප්‍රකාශ කළ කල්හි ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේට මෙසේ කීහ: ඇවැත් මෞද්ගල්‍යායනයෙනි, ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ විසින් ස්වකීය වැටහීම පරිදි ප්‍රකාශ කරණ ලදී. දැන් අපි මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ විචාරම්හ. "ඇවැත් මොග්ගල්ලානයෙනි, ගොසිඞ්ගසාලවනය සිත්කලු ය. රාත්‍රිය දෙණාපහන ය. ශාලවෘක්ෂයෝ හැමලෙසින් පිපී ගියහ. දිව්‍යසුවඳ වැනි සුවඳ හමයි. ඇවැත් මොග්ගල්ලානයෙනි, කෙබඳු ස්වරූප ඇති භික්ෂු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ වේ ද?

[ආයුෂ්මත් මහමුගලන්:]

13. "ඇවැත් ශාරීපුත්‍රයෙනි, මේ ශාසනයෙහි භික්ෂූහු දෙදෙනෙක් අභිධර්මකථා කෙරෙද් ද, ඔහු ඔවුනොවුන් ප්‍රශ්න අසත් ද, ඔවුනොවුන් ඇසූ ප්‍රශ්න විසඳත් ද, කරුණු යටපත් නො කරත් ද, ඔවුන්ගේ ධර්මකථා නො කඩවා පවත්නාසුලු වේ ද, ඇවැත්නි, මෙබඳු ස්වරූප ඇති භික්ෂූනමයෙන් ගොසිඞ්ගසාලවනය හොබනේ වෙයි."

14. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: "බ්‍යාකතං ඛො ආවුසො සාරිපුත්ත අම්හෙහි සබ්බෙහෙව යථා සකං පටිභානං. තත්‍ථදානි මයං ආයස්මන්තං සාරිපුත්තං පුච්ඡාම: රමණීයං ආවුසො සාරිපුත්ත ගොසිඞ්ගසාලවනං. දොසිනා රත්ති. සබ්බපාලිඵුල්ලා සාලා. දිබ්බා මඤ්ඤෙ ගන්ධා සම්පවන්ති. කථංරූපෙන ආවුසො සාරිපුත්ත භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා"ති.

[ආයස්මා සාරිපුත්තො:]

15. "ඉධාවුසො මොග්ගල්ලාන භික්ඛු චිත්තං වසං වත්තෙති, නො ච භික්ඛු චිත්තස්ස වසෙන වත්තති. සො යාය විහාරසමාපත්තියා ආකඞ්ඛති පුබ්බන්හසමයං විහරිතුං තාය විහාරසමාපත්තියා පුබ්බන්හසමයං විහරති. යාය විහාරසමාපත්තියා ආකඞ්ඛති මජ්ඣන්තිකං[1] සමයං විහරිතුං තාය විහාරසමාපත්තියා මජ්ඣන්තිකං සමයං විහරති. යාය විහාරසමාපත්තියා ආකඞ්ඛති සායන්හසමයං විහරිතුං තාය විහාරසමාපත්තියා සායන්හසමයං විහරති. සෙය්‍යථාපි ආවුසො මොග්ගල්ලාන රඤ්ඤො වා රාජමහාමත්තස්ස වා නානාරත්තානං දුස්සානං දුස්සකරණ්ඩකො පූරො අස්ස, සො යඤ්ඤදෙව දුස්සයුගං ආකඞ්ඛෙය්‍ය පුබ්බන්හසමයං පාරුපිතුං තං තදෙව දුස්සයුගං පුබ්බන්හසමයං පාරුපෙය්‍ය, යඤ්ඤදෙව දුස්සයුගං ආකඞ්ඛෙය්‍ය මජ්ඣන්තිකං සමයං පාරුපිතුං තං තදෙව දුස්සයුගං මජ්ඣන්තිකං සමයං පාරුපෙය්‍ය, යඤ්ඤදෙව දුස්සයුගං ආකඞ්ඛෙය්‍ය සායන්හසමයං පාරුපිතුං තං තදෙව දුස්සයුගං සායන්හසමයං පාරුපෙය්‍ය, එවමෙව ඛො ආවුසො මොග්ගල්ලාන භික්ඛු චිත්තං වසං වත්තෙති, නො ච භික්ඛු චිත්තස්ස වසෙන වත්තති. සො යාය විහාරසමාපත්තියා ආකඞ්ඛති පුබ්බන්හසමයං විහරිතුං තාය විහාරසමාපත්තියා පුබ්බන්හසමයං විහරති. යාය විහාරසමාපත්තියා ආකඞ්ඛති මජ්ඣන්තිකං සමයං විහරිතුං තාය විහාරසමාපත්තියා මජ්ඣන්තිකං සමයං විහරති. යාය විහාරසමාපත්තියා ආකඞ්ඛති සායන්හසමයං විහරිතුං තාය විහාරසමාපත්තියා සායන්හසමයං විහරති. එවරූපෙන ඛො ආවුසො මොග්ගල්ලාන භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා"ති.

16 අථ ඛො ආයස්මා සාරිපුත්තො තෙ ආයස්මන්තෙ එතදවොච: බ්‍යාකතං ඛො ආවුසො අම්හෙහි සබ්බෙහෙව යථා සකං පටිභානං. ආයාමාවුසො යෙන භගවා තෙනුපසඞ්කමිස්සාම, එතමත්‍ථං භගවතො ආරොචෙස්සාම, යථා නො භගවා බ්‍යාකරිස්සති තථා නං ධාරෙස්සාමා'ති. එවමාවුසො'ති ඛො තෙ ආයස්මන්තො ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං.

1. මජ්ඣන්තිකසමයං - මජ්සං.

14. ඉක්බිති ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේට තෙල සැල කළහ: "ඇවැත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්ස, අප සියල්ලන් විසින් ම සිය වැටහීම පරිදි ප්‍රකාශ කරණ ලදි. එහි දුන් අපි ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ විචාරම්හ. ඇවැත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්ස, ගොසිඞ්ගසාලවනය සිත්කලු ය. රාත්‍රිය දෙෂරහිත වෙයි. වෘක්ෂයෝ හැමලෙසින් පිපී ගියහ. දිව්‍යසුවඳ වැනි සුවඳ හමයි. ඇවැත් ශාරීපුත්‍රයන් වහන්ස, කෙබඳු ස්වරූප ඇති භික්ෂු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ වේ ද?"

[ආයුෂ්මත් සැරියුත්:]

15. "ඇවැත් මෞද්ගල්‍යායනයෙනි, මේ ශාසනයෙහි යම් මහණෙක් සියසිත තමා වසයෙහි පවත්වා ද, යම් මහණෙක් චිත්තයාගේ වශයෙන් නො පවත්නේ වේ ද, හෙතෙමේ යම් විහාරසමාපත්තියෙකින් පෙරවරුකාලයෙහි වසන්නට කැමැති වේ නම් ඒ විහාරසමාපත්තියෙන් පෙරවරුකාලයෙහි වසයි. යම් විහාරසමාපත්තියෙකින් මධ්‍යාහ්නකාලයෙහි වාස කරන්ට කැමැති වේ නම්, ඒ විහාරසමාපත්තියෙන් මධ්‍යාහ්නකාලයෙහි වසයි. යම් විහාරසමාපත්තියෙකින් සවස් කාලය ගත කරන්ට කැමැති වේ නම්, ඒ විහාරසමාපත්තියෙන් සවස් කාලය ගත කරයි. ඇවැත් මෞද්ගල්‍යායනයෙනි, යම් සේ රජකුගේ හෝ රජමහාමාත්‍යයකුගේ හෝ සළුපෙට්ටිය නොයෙක් පැහැයෙන් රඳනා ලද වස්ත්‍රයන්ගෙන් පිරුණේ වේ ද, හේ යම් යම් සළුසඟලක් පෙරවරුයෙහි පෙරවීමට සතුටු වේ නම් පෙරවරුයෙහි ඒ සළුසඟල ම පොරවන්නේ වෙයි. යම් යම් සළුසඟලක් මධ්‍යාහ්නවේලාවෙහි පෙරවීමට සතුටු වේ නම් ඒ සළුසඟල ම මධ්‍යාහ්න-වේලාවෙහි පොරවන්නේ වෙයි. යම් යම් සළුසඟලක් සවස්කාලයෙහි පෙරවීමට සතුටු වේ නම් ඒ සළුසඟල ම සවස්කාලයෙහි පොරොවයි. ඇවැත් මොග්ගල්ලානයෙනි, එපරිද්දෙන් ම යම් මහණෙක් සිත සියවසයෙහි පවත්වා ද, යම් මහණෙක් චිත්තයාගේ වශයෙන් නො වෙසෙයි ද, හෙ යම් විහාරසමාපත්තියෙකින් පෙරවරුකාලයෙහි වසන්නට කැමැති වේ නම් ඒ විහාරසමාපත්තියෙන් පෙරවරුකාලයෙහි වස යි. යම් විහාරසමාපත්ති-යෙකින් මධ්‍යාහ්නකාලයෙහි වසන්නට කැමැති වේ නම් ඒ විහාර සමාපත්තියෙන් මධ්‍යාහ්නකාලයෙහි වසයි. යම් විහාරසමාපත්තියෙකින් සවස්කාලයෙහි වාස කරන්ට කැමැති වේ නම් ඒ විහාරසමාපත්තියෙන් සවස්කාලයෙහි වසයි. ඇවැත් මෞද්ගල්‍යායනයෙනි, මෙබඳු ස්වරූප ඇති භික්ෂු විසින් ගොසිඞ්ගසාලවනය ශොභන වන්නේ ය."

16. ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ ඒ ආයුෂ්මත්නට තෙල කීහ: "ඇවැත්නි, අප හැම විසින් ම තමාගේ වැටහීම පරිදි ප්‍රකාශ කරණ ලදි. ඇවැත්නි, යම්හ, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක වෙසෙත් නම් එතැනට පැමිණ තෙල කරුණ භාග්‍යවතුන් වහන්සේට සැළ කරම්හ. භාග්‍යවතුන් වහන්සේ අපට යම් ලෙසෙකින් වදරණ සේක් නම් එසේ එය දරම්හ යි. ඒ ආයුෂ්මත්හු 'එසේ ය, ඇවැත්නි යි ආයුෂ්මත් ශාරීපුත්‍රයන් වහන්සේට පිළිවදන් දුන්හ.

Free Distribution www.aathaapi.org

17 අථ ඛො තෙ ආයස්මන්තො යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: “ඉධ භන්තෙ ආයස්මා ච රෙවතො ආයස්මා ච ආනන්දො යෙනාහං තෙනුපසඞ්කමිංසු ධම්මසවණාය. අද්දසං ඛො අහං භන්තෙ ආයස්මන්තඤ්ච රෙවතං ආයස්මන්තඤ්ච ආනන්දං දූරතොව ආගච්ඡන්තෙ. දිස්වාන ආයස්මන්තං ආනන්දං එතදවොචං: එතු ඛො ආයස්මා ආනන්දො. සාගතං ආයස්මතො ආනන්දස්ස භගවතො උපට්ඨාකස්ස භගවතො සන්තිකාවචරස්ස. රමණීයං ආවුසො ආනන්ද ගොසිඞ්ගසාලවනං. දොසිනා රත්ති. සබ්බපාලිඵුල්ලා සාලා. දිබ්බා මඤ්ඤෙ ගන්ධා සම්පවන්ති. කථංරූපෙන ආවුසො ආනන්ද භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා”ති.

18. එවං වුත්තෙ භන්තෙ ආයස්මා ආනන්දො මං එතදවොච: “ඉධාවුසො සාරිපුත්ත භික්ඛු බහුස්සුතො හොති සුතධරො* සුතසන්නිචයො. යෙ* තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා[1] වචසා පරිචිතා, මනසානුපෙක්ඛිතා, දිට්ඨියා සුප්පටිවිද්ධා. සො චතස්සන්නං පරිසානං ධම්මං දෙසෙති පරිමණ්ඩලෙහි පදබ්‍යඤ්ජනෙහි අප්පබද්ධෙහි අනුසයසමුග්ඝාතාය. එවරූපෙන ඛො ආවුසො සාරිපුත්ත භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා”ති.

19 “සාධු සාධු සාරිපුත්ත, යථා තං ආනන්දොව සම්මා බ්‍යාකරමානො බ්‍යාකරෙය්‍ය. ආනන්දො හි සාරිපුත්ත බහුස්සුතො සුතධරො සුතසන්නිචයො. යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති, ධතා,[3] වචසා පරිචිතා, මනසානුපෙක්ඛිතා, දිට්ඨියා සුප්පටිවිද්ධා. සො චතස්සන්නං පරිසානං ධම්මං දෙසෙති පරිමණ්ඩලෙහි පදබ්‍යඤ්ජනෙහි අප්පබද්ධෙහි අනුසයසමුග්ඝාතායා”ති.

20. එවං වුත්තෙ අහං භන්තෙ ආයස්මන්තං රෙවතං එතදවොචං: “බ්‍යාකතං ඛො ආවුසො රෙවත ආයස්මතා ආනන්දෙන යථා සකං පටිභානං. තත්ථදානි මයං ආයස්මන්තං රෙවතං පුච්ඡාම: රමණීයං ආවුසො රෙවත ගොසිඞ්ගසාලවනං. දොසිනා රත්ති. සබ්බපාලිඵුල්ලා සාලා. දිබ්බා මඤ්ඤෙ ගන්ධා සම්පවන්ති. කථංරූපෙන ආවුසො රෙවත භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා”ති

---

*. සුතධරො -පෙ- අනුසයසමුග්ඝාතාය, මජ්සං.

*. යෙ -පෙ- අනුසයසමුග්ඝාතා, ස්‍යා 1. ධාතා - මජ්සං.

17. ඉක්බිති ඒ ආයුෂ්මත්හු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියාහු ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හු. එකත්පසෙක හුන් ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ: "වහන්ස, මෙහි ආයුෂ්මත් රෙවත තෙරණුවෝ ද ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ද මා කරා බණ අසනු සඳහා පැමිණියාහු ය. වහන්ස, මම ආයුෂ්මත් රේවතතෙරුන් හා ආයුෂ්මත් ආනන්ද තෙරුන් ද දුර ම එන්නවුන් දුක ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට තෙල කීමි: 'ආයුෂ්මත් ආනන්දයෝ එත්වා. භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායක වූ භාග්‍යවතුන් වහන්සේගේ සන්තිකාවචර වූ ආයුෂ්මත් ආනන්දයන්ගේ යහපත් පැමිණීමෙකි. ආයුෂ්මත් ආනන්දයෙනි, ගොසිඞ්ගසාල-වනය සිත්කලු ය. රාත්‍රිය පහන් වෙයි. වෘක්ෂයෝ හැමලෙසින් පිපී ගියහ. දිව්‍යසුවඳ වැනි සුවඳ හමයි. ඇවැත් ආනන්දයෙනි, කෙබඳු ස්වරූප ඇති මහණකු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ වේ ද?"

18. වහන්ස, මෙසේ කී කල්හි ආයුෂ්මත් ආනන්දතෙරණුවෝ මට මෙසේ කීහ: ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, මේ ශාසනයෙහි මහණෙක් බහුශ්‍රැත වූයේ ඇසූ දැය දරන්නේ ඇසූ දෙය රැස් කළ තැනෙක් වේ ද, යම් ඒ ධර්ම කෙනෙක් ආදිකල්‍යාණ වෙද් ද, මධ්‍යකල්‍යාණ වෙද් ද, පර්‍යවසාන කල්‍යාණ වෙද් ද, අර්ථ සහිත වෙද් ද, ව්‍යඤ්ජනසහිත වෙද් ද, කෙවල පරිපූර්ණ කොට පිරිසිදු කොට බඹසර ප්‍රකාශ කෙරෙත් ද, එ ධර්මයෝ ඔහු විසින් බොහෝ කොට අසන ලද්දහු, දරණ ලද්දහු, වචනයෙන් පුරුදු කරණ ලද්දහු, සිතින් නැවැත නැවැත පරීක්ෂා කරණ ලද්දහු, නුවණින් මනා කොට අවබොධ කරණ ලද්දහු වෙත් ද, හෙතෙමේ පිරිමඬුලු වූ අප්‍රබද්ධ වූ (මනාසේ ගැළපීම් ඇති) පදව්‍යඤ්ජනයෙන් අනුසය නස්නා පිණිස සිවුපිරිසට දහම් දෙසා ද, ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, මෙබඳු ස්වරූප ඇති මහණහු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ"යි.

19. "ශාරීපුත්‍රය, මැනැව, මැනැව. ආනන්ද තෙමේ ම තම අදහස මැනැවින් පවසනුයේ යම් සේ පවසන්නේ ද, ආනන්ද විසින් එය එසේ ම පවසන ලදි. (බහුශ්‍රැතභාවය වූ තම අදහස පරිදි ම කියන ලදි.) ආනන්ද තෙමේ බහුශ්‍රැත ය. ශ්‍රැතධර ය. ඇසූ දෙය රැස් වූ තැනෙකි. යම් ඒ ධර්මයෝ ආදිකල්‍යාණ මධ්‍යකල්‍යාණ පර්‍යවසානකල්‍යාණ වෙද්ද, සාර්ථ වෙද්ද, සව්‍යඤ්ජන වෙද්ද, කෙවලපරිපූර්ණ කොට පිරිසිදු කොට බඹසර ප්‍රකාශ කෙරෙත් ද, එවැනි ධර්මයෝ ඔහු විසින් බොහෝ කොට අසන ලද්දහු ය. දරණ ලද්දහු ය. වචනයෙන් පුරුදු කරණ ලද්දහු ය. සිතින් නැවැත නැවැත පරීක්ෂා කරණ ලද්දහු ය. ප්‍රඥායෙන් අවබොධ කරණ ලද්දහු ය. හෙ අප්‍රබද්ධ (විශද) වූ පිරිමඬුලු වූ පදව්‍යඤ්ජනයෙන් අනුසය (කෙලෙස්) නැති කිරීම පිණිස සිවුපිරිසට ධර්මදෙශනා කෙරේ."

20. වහන්ස, (ආයුෂ්මත් ආනන්ද) මෙසේ කී කල්හි මම ආයුෂ්මත් රේවතතෙරණුවන්ට තෙල කීමි: "ඇවැත් රේවතයෙනි, ආනන්ද තෙරුන් විසින් තම වැටහීම අනුව ප්‍රකාශ කරණ ලදි. එහි දැන් අපි ආයුෂ්මත් රෙවත තෙරුන් විචාරම්හ: ඇවැත් රේවතයෙනි, ගොසිඞ්ග-සාලවනය සිත්කලු ය. රාත්‍රිය දොෂවිරහිත ය. වෘක්ෂයෝ සර්වප්‍රකාරයෙන් පිපී ගියහ. දිව්‍යසුවඳ වැනි සුවඳ හමයි. ඇවැත් රෙවතයෙනි, කෙබඳු ස්වරූප ඇති භික්ෂු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ වේ ද?"

21. එවං වුත්තෙ භන්තෙ ආයස්මා රෙවතො මං එතදවොච: "ඉධාවුසො සාරිපුත්ත භික්ඛු පටිසල්ලාණාරමො හොති, පටිසල්ලාණරතො, අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො, විපස්සනාය සමන්නාගතො බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. එවරූපෙන ඛො ආවුසො සාරිපුත්ත භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා"ති.

22. "සාධු සාධු සාරිපුත්ත, යථා තං රෙවතොව සම්මා බ්‍යාකරමානො බ්‍යාකරෙය්‍ය. රෙවතො හි සාරිපුත්ත පටිසල්ලාණාරාමො පටිසල්ලාණ-රතො, අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො, විපස්සනාය සමන්නාගතො බ්‍රෑහෙතා සුඤ්ඤාගාරාන"න්ති.

23. එවං වුත්තෙ අහං භන්තෙ ආයස්මන්තං අනුරුද්ධං එතදවොචං: "බ්‍යාකතං ඛො ආවුසො අනුරුද්ධ ආයස්මතා රෙවතෙන* යථා සකං පටිභානං. තත්‍රදානි මයං ආයස්මන්තං අනුරුද්ධං පුච්ඡාම: රමණීයං ආවුසො අනුරුද්ධ ගොසිඞ්ගසාලවනං. දොසිනා රත්ති. සබ්බපාලිඵුල්ලා සාලා. දිබ්බා මඤ්ඤෙ ගන්ධා සම්පවන්ති. කථංරූපෙන ආවුසො අනුරුද්ධ භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා"ති.

24. එවං වුත්තෙ භන්තෙ ආයස්මා අනුරුද්ධො මං එතදවොච: "ඉධාවුසො සාරිපුත්ත භික්ඛු දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුස-කෙන සහස්සං ලොකානං ඔලොකෙති.[1] සෙය්‍යථාපි ආවුසො සාරිපුත්ත චක්ඛුමා පුරිසො* උපරිපාසාදවරගතො සහස්සං නෙමිමණ්ඩලානං ඔලොකෙය්‍ය[2], එවමෙව ඛො ආවුසො සාරිපුත්ත භික්ඛු විසුද්ධෙන අතික්කන්තමානුස-කෙන සහස්සං ලොකානං ඔලොකෙති. එවරූපෙන ඛො ආවුසො සාරිපුත්ත භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා"ති.

25. "සාධු සාධු සාරිපුත්ත, යථා තං අනුරුද්ධොව සම්මා බ්‍යාකරමානො බ්‍යාකරෙය්‍ය. අනුරුද්ධො හි සාරිපුත්ත දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සහස්සං ලොකානං ඔලොකෙතී"ති.

26. එවං වුත්තෙ අහං භන්තෙ ආයස්මන්තං මහාකස්සපං එතදවොචං: "බ්‍යාකතං ඛො ආවුසො කස්සප ආයස්මතා අනුරුද්ධෙන යථා සකං පටිභානං. තත්‍රදානි මයං ආයස්මන්තං මහාකස්සපං පුච්ඡාම: රමණීයං ආවුසො කස්සප ගොසිඞ්ගසාලවනං. දොසිනා රත්ති. සබ්බපාලිඵුල්ලා සාලා. දිබ්බා මඤ්ඤෙ ගන්ධා සම්පවන්ති. කථංරූපෙන ආවුසො කස්සප භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා"ති?

---

*. රෙවතෙන -පෙ- කථංරූපෙන, මජ්ඣං. ස්‍යා
*. චක්ඛුමා පුරිසො -පෙ- එවරූපෙන, මජ්ඣං.

1. වොලොකෙති, සීමු.
2. වොලොකෙය්‍ය, සීමු.

21 වච්ඡත්ස, මෙසේ කී කල්හි ආයුෂ්මත් රේවත තෙරණුවෝ මට මෙසේ කීහ: "ඇවැත් ශාරීපුත්‍රයෙනි, මේ ශාසනයෙහි යම් මහණෙක් පලසමවත් අරම් කොට ඇත්තේ පලසමවත්හි ඇලුණේ වේ ද, තමන් තුළ චිත්තසමාධියෙන් යුක්ත වූයේ බැහැර නො කළ ධ්‍යාන ඇත්තේ වේ ද, විදර්ශනාවෙන් යුක්ත වූයේ ශූන්‍යාගාර වඩන්නේ වේ ද, ඇවැත් ශාරීපුත්‍රයෙනි, මෙබඳු භික්ෂු විසින් ගොසිඞ්ගසාලවනය ශෝභන වන්නේ ය"යි.

22. "ශාරීපුත්‍රය, මැනැව, මැනැව. රේවත තෙමේ ම තම අදහස මනාකොට පවසනුයේ යම් සේ පවසන්නේ ද, එසෙයින් රේවත විසින් එය (ධ්‍යානාභිරතිය) පවසන ලදී. ශාරීපුත්‍රය, රේවත තෙමේ පලසමවත අරම් කොට ඇත්තේ ය. පලසමවත්හි ඇලුණේ ය. තමා තුළ සිත සමාධිගත කිරීමෙහි යෙදුණේ තොර නො කළ ධ්‍යාන ඇත්තේ ය. විදර්ශනායෙහි යෙදුණේ ශූන්‍යාගාර වඩන්නේ ය."

23. වච්ඡත්ස, (ආයුෂ්මත් රේවත) මෙසේ කී කල්හි මම ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන්ට මෙසේ කීමි: "ඇවැත් අනුරුද්ධයෙනි, ආයුෂ්මත් රේවත තෙරුන් විසින් තමාගේ වැටහීම අනුව ප්‍රකාශ කරණ ලදී. එහි දූත් අපි ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් විචාරම්හ: ඇවැත් අනුරුද්ධයෙනි, ගොසිඞ්ගසාලවනය සිත්කලු ය. රාත්‍රිය දෙෂවිරහිත වෙයි. වෘක්ෂයෝ හැමඅතින් පිපී ගියහ. දිව්‍යසුවඳ වැනි සුවඳ හමයි. ඇවැත් අනුරුද්ධයෙනි, කෙබඳු භික්ෂු කෙනකු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ වේ ද?"

24. වච්ඡත්ස, මෙසේ කී කල්හි ආයුෂ්මත් අනුරුද්ධතෙරණුවෝ මට මෙසේ කීහ: ඇවැත් ශාරීපුත්‍රයෙනි, මේ ශාසනයෙහි මහණෙක් පිරිසිදු, මිනිසැස ඉක්ම සිටි දිව්‍යඇසින් සහස්‍රීලොකධාතුව බලයි. ඇවැත් ශාරීපුත්‍රයන් වච්ඡත්ස, ඇස් ඇති පුරුෂයෙක් ප්‍රාසාදයෙක්හි මතුතලයට ගියේ (පහ පිරිවෙත්හි) දහසක් නිම්මඬුලු යම් සේ බලන්නේ ද, ඇවැත් ශාරීපුත්‍රයන් වච්ඡත්ස, එ පරිද්දෙන් ම මහණ තෙමේ මිනිසැස ඉක්ම සිටි පිරිසුදු දිව්‍යැසින් සහස්‍රීලොකධාතුව බලයි. ඇවැත් ශාරීපුත්‍රයන් වච්ඡත්ස, මෙ වැනි භික්ෂු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ ය යි."

25 "ශාරීපුත්‍රය, මැනැව, මැනැව. අනුරුද්ධ තෙමේ ම තම අදහස පවසනුයේ යම් සේ පවසන්නේ ද, අනුරුද්ධ විසින් එය (දිබ්බචක්ඛුඤාණය) එසේ ම පවසන ලදී. ශාරීපුත්‍රය, අනුරුද්ධ තෙමේ පිරිසිදු, මිනිසැස ඉක්ම සිටි දිව්‍යැසින් සහස්‍රීලොකධාතුව බලන්නේ ය."

26. වච්ඡත්ස, (ආයුෂ්මත් අනුරුද්ධ) මෙසේ කී කල්හි මම ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වච්ඡත්සේට මෙසේ කීමි: "ඇවැත් කාශ්‍යප ස්ථවිරයන් වච්ඡත්ස, ආයුෂ්මත් අනුරුද්ධයන් විසින් ස්වකීය වැටහීම පරිදි ප්‍රකාශ කරණ ලදී. එහි දූත් අපි ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වච්ඡත්සේ විචාරම්හ: ඇවැත් කාශ්‍යපස්ථවිරයන් වච්ඡත්ස, ගොසිඞ්ගසාලවනය සිත්කලු ය. රාත්‍රිය දෙෂාපගත ය. වෘක්ෂයෝ සර්වප්‍රකාරයෙන් පිපී ගියහ. දිව්‍යසුවඳ වැනි සුවඳ හමයි. ඇවැත් කාශ්‍යපස්ථවිරයන් වච්ඡත්ස, කෙබඳු ස්වරූප ඇති භික්ෂු කෙනකු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ වේ ද?".

එවං වුත්තෙ භන්තෙ ආයස්මා මහාකස්සපො මං එතදවොච: "ඉධාවුසො සාරිපුත්ත භික්ඛු අත්තනා ච ආරඤ්ඤකො හොති ආරඤ්ඤකත්තස්ස ච වණ්ණවාදී. අත්තනා ච පිණ්ඩපාතිකො හොති පිණ්ඩපාතිකත්තස්ස ච වණ්ණවාදී. අත්තනා ච පංසුකූලිකො හොති පංසුකූලිකත්තස්ස ච වණ්ණවාදී. අත්තනා ච තෙචීවරිකො හොති තෙචීවරිකත්තස්ස ච වණ්ණවාදී. අත්තනා ච අප්පිච්ඡො හොති අප්පිච්ඡතාය ච වණ්ණවාදී. අත්තනා ච සන්තුට්ඨො හොති සන්තුට්ඨියා ච වණ්ණවාදී. අත්තනා ච පවිවිත්තො හොති පවිවෙකස්ස ච වණ්ණවාදී. අත්තනා ච අසංසට්ඨො හොති අසංසග්ගස්ස ච වණ්ණවාදී. අත්තනා ච ආරද්ධවිරියො හොති විරියාරම්භස්ස ච වණ්ණවාදී. අත්තනා ච සීලසම්පන්නො හොති සීලසම්පදාය ච වණ්ණවාදී. අත්තනා ච සමාධිසම්පන්නො හොති සමාධිසම්පදාය ච වණ්ණවාදී. අත්තනා ච පඤ්ඤාසම්පන්නො හොති පඤ්ඤාසම්පදාය ච වණ්ණවාදී. අත්තනා ච විමුත්තිසම්පන්නො හොති විමුත්තිසම්පදාය ච වණ්ණවාදී. අත්තනා ච විමුත්තිඤාණදස්සනසම්පන්නො හොති විමුත්තිඤාණදස්සනසම්පදාය ච වණ්ණවාදී. එවරූපෙන ඛො ආවුසො සාරිපුත්ත භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා"ති.

27. "සාධු සාධු සාරිපුත්ත, යථා තං කස්සපොව සම්මා බ්‍යාකරමානො බ්‍යාකරෙය්‍ය. කස්සපො හි සාරිපුත්ත අත්තනා ච ආරඤ්ඤකො ආරඤ්ඤකත්තස්ස ච වණ්ණවාදී. අත්තනා ච පිණ්ඩපාතිකො පිණ්ඩපාතිකත්තස්ස ච වණ්ණවාදී. අත්තනා ච පංසුකූලිකො පංසුකූලිකත්තස්ස ච වණ්ණවාදී. අත්තනා ච තෙචීවරිකො තෙචීවරිකත්තස්ස ච වණ්ණවාදී. අත්තනා ච අප්පිච්ඡො අප්පිච්ඡතාය ච වණ්ණවාදී. අත්තනා ච සන්තුට්ඨො සන්තුට්ඨියා ච වණ්ණවාදී. අත්තනා ච පවිවිත්තො පවිවෙකස්ස ච වණ්ණවාදී. අත්තනා ච අසංසට්ඨො අසංසග්ගස්ස ච වණ්ණවාදී. අත්තනා ච ආරද්ධවිරියො විරියාරම්භස්ස ච වණ්ණවාදී. අත්තනා ච සීලසම්පන්නො සීලසම්පදාය ච වණ්ණවාදී, අත්තනා ච සමාධිසම්පන්නො සමාධිසම්පදාය ච වණ්ණවාදී. අත්තනා ච පඤ්ඤාසම්පන්නො පඤ්ඤාසම්පදාය ච වණ්ණවාදී. අත්තනා ච විමුත්තිසම්පන්නො විමුත්තිසම්පදාය ච වණ්ණවාදී. අත්තනා ච විමුත්තිඤාණදස්සනසම්පන්නො විමුත්තිඤාණදස්සනසම්පදාය ච වණ්ණවාදී"ති.

වහන්ස, මෙසේ කී කල්හි ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ මට මෙසේ කීහ: 'ඇවැත් ශාරීපුත්‍රයෙනි, මේ ශාසනයෙහි මහණෙක් තෙමේත් ආරණ්‍යක වූයේ ආරණ්‍යකධුතාඞ්ගධාරී-භාවයෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් පිණ්ඩපාතික වූයේ පිණ්ඩපාතික ධුතාඞ්ගධාරීභාවයෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් පාංශුකූලික වූයේ පාංශුකූලිකධුතාඞ්ගධාරීභාවයෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් තෛචීවරික වූයේ තෛචීවරිකධුතාඞ්ගධාරීභාවයෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් අල්පේච්ඡ වූයේ අල්පේච්ඡභාවයෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් සන්තුෂ්ට වූයේ සන්තොෂයෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් ප්‍රවිවේක ඇත්තේ ප්‍රවිවේකයෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් සංසෘෂ්ට නො වූයේ (කුලයෙහි ද ගෙණෙහිදු නො හැසුණේ) අසංසෘෂ්ට-භාවයෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් පටන්ගත් වීර්‍ය්‍ය ඇත්තේ වැර ඇරඹුමෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් ශීලසම්පන්න වූයේ ශීලසම්පත්තියෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් සමාධිසම්පන්න වූයේ සමාධිසම්පදාවෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් ප්‍රඥාසම්පන්න වූයේ ප්‍රඥාසම්පත්තියෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් විමුක්තිසම්පන්න වූයේ විමුක්තිසම්පත්තියෙහි ගුණ කියනසුලු වේ ද, තෙමේත් විමුක්තිඥාන-දර්ශනසම්පන්න වූයේ විමුක්තිඥානදර්ශනසම්පත්තියෙහි ගුණ කියනසුලු වේ ද - ඇවැත් ශාරීපුත්‍රයෙනි, මෙබඳු මහණකු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ ය."

27. "ශාරීපුත්‍රයෙනි, මැනැව, මැනැව. කාශ්‍යප තෙමේ ම මොනවට තම අදහස පවසනුයේ යම් සේ පවසන්නේ ද, එසෙයින් ම කාශ්‍යපයන් විසින් එය (ධුතවාදය) පවසන ලදී. ශාරීපුත්‍රය, කාශ්‍යප තෙමේ තෙමේත් ආරණ්‍යක වූයේ ආරණ්‍යකධුතාඞ්ගධාරීභාවයෙහි ගුණ කියනසුලු ද වෙයි. තෙමේත් පිණ්ඩපාතික වූයේ පිණ්ඩපාතිකධුතාඞ්ගධාරීභාවයෙහි ගුණ කියනසුලු ද වෙයි. තෙමේත් පාංශුකූලික වූයේ පාංශුකූලිකධුතාඞ්ගධාරීභාව-යෙහි ගුණ කියනසුලු ද වෙයි. තෙමේත් තෛචීවරික වූයේ තෛචීවරික-ධුතාඞ්ගධාරීභාවයෙහි ගුණ කියනසුලු ද වෙයි තෙමේත් අල්පේච්ඡ වූයේ අල්පේච්ඡභාවයෙහි ගුණ කියනසුලු ද වෙයි. තෙමේත් සන්තුෂ්ට වූයේ සන්තුෂ්ටතාවෙහි ගුණ කියනසුලු ද වෙයි. තෙමේත් ප්‍රවිවේකයෙන් යුක්ත වූයේ ප්‍රවිවේකයෙහි ගුණ කියනසුලු ද වෙයි. තෙමේත් අසංසෘෂ්ට වූයේ අසංසෘෂ්ටතාවෙහි ගුණ කියනසුලු ද වෙයි. තෙමේත් ඇරඹූ වැර ඇත්තේ වැර ඇරඹුමෙහි ගුණ කියනසුලු ද වෙයි. තෙමේත් ශීලසම්පන්න වූයේ ශීලසම්පත්තියෙහි ගුණ කියනසුලු ද වෙයි. තෙමේත් සමාධිසම්පන්න වූයේ සමාධිසම්පත්තියෙහි ගුණ කියනසුලු ද වෙයි. තෙමේත් ප්‍රඥාවෙන් යුක්ත වූයේ ප්‍රඥාසම්පත්තියෙහි ගුණ කියනසුලු ද වෙයි. තෙමේත් විමුක්තිසම්පන්න වූයේ විමුක්තිසම්පත්තියෙහි ගුණ කියනසුලු ද වෙයි. තෙමේත් විමුක්තිඥානදර්ශනසම්පන්න වූයේ විමුක්තිඥාන-දර්ශනසම්පත්තියෙහි ගුණ කියනසුලු ද වෙයි."

28. එවං වුත්තෙ අහං භන්තෙ ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොචං: "බ්‍යාකතං ඛො ආවුසො මොග්ගල්ලාන ආයස්මතා මහාකස්සපෙන යථා සකං පටිභානං. තත්‍ථදානි මයං ආයස්මන්තං මහාමොග්ගල්ලානං පුච්ඡාම: රමණීයං ආවුසො මොග්ගල්ලාන ගොසිඞ්ගසාලවනං. දොසිනා රත්ති. සබ්බපාලිඵුල්ලා සාලා. දිබ්බා මඤ්ඤෙ ගන්ධා සම්පවන්ති. කථංරූපෙන ආවුසො මොග්ගල්ලාන භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා"ති.?

29. එවං වුත්තෙ භන්තෙ ආයස්මා මහාමොග්ගල්ලානො මං එතදවොච: "ඉධාවුසො සාරිපුත්ත ද්වෙ භික්ඛූ අභිධම්මකථං කථෙන්ති, තෙ අඤ්ඤමඤ්ඤං පඤ්හං පුච්ඡන්ති, අඤ්ඤමඤ්ඤස්ස පඤ්හං පුට්ඨා විස්සජ්ජෙන්ති නො ච සංසාදෙන්ති,[1] ධම්මී ච නෙසං කථා පවත්තිනී හොති. එවරූපෙන ඛො ආවුසො සාරිපුත්ත භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා"ති.

30. "සාධු සාධු සාරිපුත්ත, යථා තං මොග්ගල්ලානොව සම්මා බ්‍යාකරමානො බ්‍යාකරෙය්‍ය. මොග්ගල්ලානො හි සාරිපුත්ත ධම්මකථිකො"ති.

31. එවං වුත්තෙ ආයස්මා මහාමොග්ගල්ලානො භගවන්තං එතදවොච: අථ ඛ්වාහං භන්තෙ ආයස්මන්තං සාරිපුත්තං එතදවොචං: "බ්‍යාකතං ඛො ආවුසො සාරිපුත්ත අම්හෙහි සබ්බෙහෙව යථා සකං පටිභානං. තත්‍ථදානි මයං ආයස්මන්තං සාරිපුත්තං පුච්ඡාම: රමණීයං ආවුසො සාරිපුත්ත ගොසිඞ්ගසාලවනං. දොසිනා රත්ති. සබ්බපාලිඵුල්ලා සාලා. දිබ්බා මඤ්ඤෙ ගන්ධා සම්පවන්ති. කථංරූපෙන ආවුසො සාරිපුත්ත භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා"ති?

32. එවං වුත්තෙ භන්තෙ ආයස්මා සාරිපුත්තො මං එතදවොච: "ඉධාවුසො මොග්ගල්ලාන භික්ඛු චිත්තං වසං වත්තෙති, නො ච භික්ඛු චිත්තස්ස වසෙන වත්තති. සො යාය විහාරසමාපත්තියා ආකඞ්ඛති පුබ්බණ්හසමයං විහරිතුං තාය විහාරසමාපත්තියා පුබ්බණ්හසමයං විහරති. යාය විහාරසමාපත්තියා ආකඞ්ඛති මජ්ඣන්තිකං සමයං විහරිතුං තාය විහාරසමාපත්තියා මජ්ඣන්තිකං සමයං විහරති. යාය විහාරසමාපත්තියා ආකඞ්ඛති සායන්හසමයං විහරිතුං තාය විහාරසමාපත්තියා සායන්හසමයං විහරති. -

1. සංසාරෙන්ති, මජසං.

28. වහන්ස, (ආයුෂ්මත් මහාකාශ්‍යප) මෙසේ කී කල්හි මම ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් හට තෙල කීමි: ඇවැත් මොග්ගල්ලානයෙනි, ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් විසින් සිය වැටහීම පරිදි ප්‍රකාශ කරණ ලදි. එහි දූත් අපි ආයුෂ්මත් මහාමොග්ගල්ලානයන් විචාරම්හ: ඇවැත් මොග්ගල්ලානයෙනි, ගොසිඞ්ග-සාලවනය සිත්කලු ය. රාත්‍රිය පහන් ය. වෘක්ෂයෝ හැමලෙසින් පිපි ගියහ. දිව්‍යසුවඳ වැනි සුවඳ හමයි. ඇවැත් මොග්ගල්ලානයෙනි, කෙබඳු ස්වරූප ඇති භික්ෂු කෙනකු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ වේ දැ?”

29. වහන්ස, මෙසේ කී කල්හි ආයුෂ්මත් මහාමොග්ගල්ලායන තෙරණුවෝ මට තෙල කීහ. “ඇවැත් ශාරීපුත්‍රයෙනි, මේ ශාසනයෙහි භික්ෂූහු දෙදෙනෙක් අභිධර්ම කථා කෙරෙත්. ඔහු ඔවුනොවුන් ප්‍රශ්න අසත්. ඔවුනොවුන් විසින් ප්‍රශ්න අසන ලද්දාහු විසඳත්. කරුණු යටපත් නො කරත්. ඔවුන්ගේ දහම් කථාව ද පවත්නාසුලු වේ. ඇවැත් ශාරීපුත්‍රයෙනි, මෙබඳු ස්වරූප ඇති භික්ෂු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ ය”යි.

30. ශාරීපුත්‍රයෙනි, මැනැව, මැනැව මොග්ගල්ලාන තෙමේ ම තම අදහස (අභිධර්මකථිකත්වය) මොනොවට පවසනුයේ යම් සේ පවසන්නේ ද, එසෙයින් ම මොග්ගල්ලාන විසින් එය පවසන ලදි. ශාරීපුත්‍රය, මොග්ගල්ලාන තෙමේ ධර්මකථිකයෙකි.”

31. මෙසේ කී කල්හි ආයුෂ්මත් මොග්ගල්ලාන තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල කීහ: වහන්ස, මම ආයුෂ්මත් ශාරීපුත්‍ර-ස්ථවිරයන් තෙල කීමි: ඇවැත් ශාරීපුත්‍රයෙනි, අප සියලු දෙනං විසින් ම සිය වැටහීම පරිදි ප්‍රකාශ කරණ ලදි. එහි දූත් අපි ආයුෂ්මත් ශාරීපුත්‍රයන් විචාරම්හ. “ඇවැත් ශාරීපුත්‍රයෙනි, ගොසිඞ්ගසාලවනය සිත්කලු ය. රාත්‍රිය දොෂාපගත ය. වෘක්ෂයෝ සර්වාකාරයෙන් පිපී ගියහ. දිව්‍යසුවඳ වැනිසුවඳ හමයි. ඇවැත් ශාරීපුත්‍රයෙනි, කෙබඳු ස්වරූප ඇති භික්ෂු කෙනකු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ වේ දැ?”

32. වහන්ස, මෙසේ කී කල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙරණුවෝ මට තෙල කීහ: “ඇවැත් මොග්ගල්ලානයෙනි, මේ ශාසනයෙහි මහණෙක් සිත තමා වශයෙහි පවත්වයි. මහණ තෙමේ චිත්තවශයෙහි නො පවත්නේ වෙයි. හෙ යම් විහාරසමාපත්තියෙකින් පෙරවරුකාලය වාස කරන්නට කැමැති වේ නම්, ඒ විහාරසමාපත්තියෙන් පෙරවරුකාලයෙහි වාස කරයි. යම් විහාරසමාපත්තියෙකින් මධ්‍යාහනකාලයෙහි වාස කරන්නට කැමැති වේ නම්, ඒ විහාරසමාපත්තියෙන් මධ්‍යාහ්නකාලයෙහි වාස කරයි. යම් විහාරසමාපත්තියෙකින් සවස්කාලයෙහි වාස කරන්නට කැමැති වේ නම්, ඒ විහාරසමාපත්තියෙන් සවස්කාලයෙහි වාස කරයි. -

සෙය්‍යථාපි ආවුසො මොග්ගල්ලාන, රඤ්ඤො වා රාජමහාමත්තස්ස වා නානාරත්තානං දුස්සානං දුස්සකරණ්ඩකො පූරො අස්ස, සො යඤ්ඤදෙව දුස්සයුගං ආකඞ්ඛෙය්‍ය පුබ්බණ්හසමයං පාරුපිතුං තං තදෙව දුස්සයුගං පුබ්බණ්හසමයං පාරුපෙය්‍ය, යඤ්ඤදෙව දුස්සයුගං ආකඞ්ඛෙය්‍ය මජ්ඣන්තිකං සමයං පාරුපිතුං තං තදෙව දුස්සයුගං මජ්ඣන්තිකං සමයං පාරුපෙය්‍ය, යඤ්ඤදෙව දුස්සයුගං ආකඞ්ඛෙය්‍ය සායණ්හසමයං පාරුපිතුං තං තදෙව දුස්සයුගං සායණ්හසමයං පාරුපෙය්‍ය; එවමෙව ඛො ආවුසො මොග්ගල්ලාන භික්ඛු චිත්තං වසං වත්තෙති, නො ච භික්ඛු චිත්තස්ස වසෙන වත්තති. සො යාය විහාරසමාපත්තියා ආකඞ්ඛති පුබ්බණ්හසමයං විහරිතුං තාය විහාරසමාපත්තියා පුබ්බණ්හසමයං විහරති. යාය විහාරසමාපත්තියා ආකඞ්ඛති මජ්ඣන්තිකං සමයං විහරිතුං තාය විහාරසමාපත්තියා මජ්ඣන්තිකං සමයං විහරති. යාය විහාරසමාපත්තියා ආකඞ්ඛති සායණ්හසමයං විහරිතුං, තාය විහාරසමාපත්තියා සායණ්හසමයං විහරති. එවරූපෙන ඛො ආවුසො මොග්ගල්ලාන භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යා”ති.

32. “සාධු සාධු මොග්ගල්ලාන, යථා තං සාරිපුත්තොව සම්මා බ්‍යාකරමානො බ්‍යාකරෙය්‍ය. සාරිපුත්තො හි මොග්ගල්ලාන චිත්තං වසං වත්තෙති. නො ච සාරිපුත්තො චිත්තස්ස වසෙන වත්තති. සො යාය විහාරසමාපත්තියා ආකඞ්ඛති පුබ්බණ්හසමයං විහරිතුං තාය විහාරසමාපත්තියා පුබ්බණ්හසමයං විහරති. යාය විහාරසමාපත්තියා ආකඞ්ඛති මජ්ඣන්තිකං සමයං විහරිතුං තාය විහාරසමාපත්තියා මජ්ඣන්තිකං සමයං විහරති යාය විහාරසමාපත්තියා ආකඞ්ඛති සායණ්හසමයං විහරිතුං තාය විහාරසමාපත්තියා සායණ්හසමයං විහරතී”ති.

33. එවං වුත්තෙ ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: කස්ස නු ඛො භන්තෙ සුභාසිතන්ති?

34. සබ්බෙසං වො සාරිපුත්ත සුභාසිතං පරියායෙන. අපි ච මමපි[1] සුණාථ යථාරූපෙන භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍ය.[2] ඉධ සාරිපුත්ත භික්ඛු පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා ‘න තාවාහං ඉමං පල්ලඞ්කං භින්දිස්සාමි යාව මෙ නානුපාදාය ආසවෙහි චිත්තං විමුච්චිස්සතී’ති. එවරූපෙන ඛො සාරිපුත්ත භික්ඛුනා ගොසිඞ්ගසාලවනං සොභෙය්‍යාති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ ආයස්මන්තො භගවතො භාසිතං අභිනන්දුන්ති.

මහාගොසිඞ්ගසුත්තං දුතියං.

---

1. මම වචනං, ස්‍යා. 2. සොභෙය්‍යාති, ස්‍යා.

Free Distribution www.aathaapi.org

ඇවැත් මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්ස, යම් සේ රජකුගේ හෝ රාජමහාමාත්‍රයකුගේ හෝ සළුපෙට්ටිය නොයෙක් පැහැයෙන් රඳනා ලද වස්ත්‍රයෙන් පිරුණේ ද, හෙ යම් යම් සළුසඟලක් පෙරවරුවේ පෙරවීමට සතුටු වේ නම්, පෙරවරුවේ ඒ සළුසඟල ම පොරවන්නේ ද, යම් යම් සළුසඟලක් මධ්‍යාහ්න වේලාවේ පෙරවීමට සතුටු වේ නම්, ඒ සළුසඟල ම මධ්‍යාහ්න වේලාවේ පොරවන්නේද, යම් යම් සළුසඟලක් සවස්කාලයෙහි පෙරවීමට සතුටු වේ නම්, ඒ සළුසඟල ම සවස්කාලයෙහි පොරවන්නේ ද, ඇවැත් මොග්ගල්ලානයෙනි මෙපරිද්දෙන් ම මහණෙක් සිත සියවසයෙහි පවත්වයි. මහණෙක් චිත්තයාගේ වශයෙන් නො පවතියි. හේ යම් විහාරසමාපත්තියෙකින් පෙරවරුකාලය වාස කරන්ට කැමැති වේ නම්, ඒ විහාරසමාපත්තියෙන් පෙරවරුකාලයෙහි වාස කරයි. යම් විහාරසමාපත්තියෙකින් මධ්‍යාහ්නකාලය වාස කරන්ට කැමැති වේ නම්, ඒ විහාරසමාපත්තියෙන් මධ්‍යාහ්නකාලයෙහි වාස කරයි. යම් විහාරසමාපත්තියෙකින් සවස්කාලයෙහි වාස කරන්ට කැමැති වේ නම්, ඒ විහාරසමවතින් සවස් කාලයෙහි වාස කරයි. ඇවැත් මොග්ගල්ලානයෙනි, මෙ බඳු ස්වරූප ඇති භික්ෂු විසින් ගොසිඞ්ගසාලවනය ශොභන වන්නේ ය.”

32. “මොග්ගල්ලායනය, මැනැව, මැනැව. ශාරීපුත්‍ර තෙමේ ම තම අදහස මොනොවට පවසනුයේ යම් සේ පවසන්නේ ද, එසෙයින් ම ශාරීපුත්‍ර විසින් එය (අවිත්තවසිකභාවය) පවසන ලදි. මොග්ගල්ලායනය, ශාරීපුත්‍ර තෙමේ සිත වසඟ කොට වසයි. ශාරීපුත්‍ර තෙමේ ඒකාන්තයෙන් චිත්තයාගේ වශයෙන් නො පවතියි. හෙතෙම යම් විහාරසමාපත්තියෙකින් පෙරවරුකාලයෙහි වාස කරන්ට කැමැති වේ නම්, ඒ විහාරසමාපත්තියෙන් පෙරවරුකාලයෙහි වාස කරයි යම් විහාරසමාපත්තියෙකින් මැදිකාලයෙහි වාස කරන්ට කැමැති වේ නම්, ඒ විහාරසමාපත්තියෙන් මැදිකාලයෙහි වාස කරයි. යම් විහාරසමවතෙකින් සවස්කාලයෙහි වාස කරන්ට කැමැති වේ නම්, ඒ විහාරසමවතින් සවස්කාලයෙහි වාස කරයි.”

33. මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙතෙල සැළ කළහ: භාග්‍යවතුන් වහන්ස, සුභාසිතය කවරකුගේ වේ ද?

34. ශාරීපුත්‍රය, තොප හැමගේ භාසිතයෝ ඒ ඒ ක්‍රමයෙන් සුභාසිත වෙති. එසේ ද වුවත් යම්බඳු භික්ෂු කෙනකු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ වේ නම්, එ පිළිබැඳි මබස ද අසව. ශාරීපුත්‍රය, මේ ශාසනයෙහි යම් මහණෙක් බතින් පසු පිණ්ඩපාතයෙන් වැළැක්කේ පලක් බැඳ කය සෘජු කොට තබා සිහිය කම්ස්ථානයට අභිමුඛ කොට ‘යම් තාක් මගේ සිත උපාදාන විසින් නො ගෙණ ආස්‍රවයන් කෙරෙන් මිදේ ද, ඒ තාක් මේ පලග නො බිඳින්නෙමි’යි සිතා හිඳගණී ද, ශාරීපුත්‍රය, මෙ වැනි භික්ෂු කෙනකු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ ය යි. (මෙයින් බුදුහු ජනතානුකම්පාවෙන් පිළිවෙත්සරු කලණ පුහුදුන්ට රහත්බැව් පිණිස තමන් වහන්සේ බෝමැඩදී ඉටූ පරිදි චතුරඞ්ගවීරියාධිෂ්ඨානය දක්වූ සේ යි.)

භාග්‍යවතුන් වහන්සේ මෙතෙල වදාළ සේක. සතුටු වූ ඒ ආයුෂ්මත්හු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිනන්දන කළහ.

මහාගොසිඞ්ග සූත්‍රය දෙවැනි යි.

1. 4. 3.

මහාගොපාලකසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: භික්ඛවොති. භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. එකාදසහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො ගොපාලකො අභබ්බො ගොගණං පරිහරිතුං ඵාතිකත්තුං.[1] කතමෙහි එකාදසහි?

ඉධ භික්ඛවෙ ගොපාලකො න රූපඤ්ඤූ හොති. න ලක්ඛණකුසලො හොති. න ආසාටිකං සාටෙතා හොති. න වණං පටිච්ඡාදෙතා හොති. න ධූමං කත්තා හොති. න තිත්ථං ජානාති. න පීතං ජානාති න වීථිං ජානාති. න ගොචරකුසලො හොති. අනවසෙසදොහී ච හොති. යෙ තෙ උසභා ගොපිතරො ගොපරිණායකා තෙ න අතිරෙකපූජාය පූජෙතා හොති. ඉමෙහි ඛො භික්ඛවෙ එකාදසහි අඞ්ගෙහි සමන්නාගතො ගොපාලකො අභබ්බො ගොගණං පරිහරිතුං ඵාතීකත්තුං.

3. එවමෙව ඛො භික්ඛවෙ එකාදසහි ධම්මෙහි[2] සමන්නාගතො භික්ඛු අභබ්බො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිතුං. කතමෙහි එකාදසහි?

ඉධ භික්ඛවෙ භික්ඛු න රූපඤ්ඤූ හොති. න ලක්ඛණකුසලො හොති. න ආසාටිකං සාටෙතා හොති. න වණං පටිච්ඡාදෙතා හොති. න ධූමං කත්තා හොති. න තිත්ථං ජානාති. න පීතං ජානාති. න වීථිං ජානාති. න ගොචරකුසලො හොති. අනවසෙසදොහී ච හොති. යෙ තෙ භික්ඛූ ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිණායකා තෙ න අතිරෙකපූජාය පූජෙතා හොති.

(1.) කථඤ්ච භික්ඛවෙ භික්ඛු න රූපඤ්ඤූ හොති? ඉධ භික්ඛවෙ භික්ඛු "යං කිඤ්චි රූපං සබ්බං රූපං චත්තාරි මහාභූතානි චතුන්නඤ්ච මහාභූතානං උපාදය රූපන්ති" යථාභූතං නප්පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු න රූපඤ්ඤූ හොති.

(2.) කථඤ්ච භික්ඛවෙ භික්ඛු න ලක්ඛණකුසලො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු "කම්මලක්ඛණො බාලො, කම්මලක්ඛණො පණ්ඩිතො"ති යථාභූතං නප්පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු න ලක්ඛණකුසලො හොති.

---

1. ඵාතිං කාතුං, මජසං. ඵාතිකාතුං - සයා. 2. අඞ්ගෙහි, සයා.

1. 4. 3.

මහාගොපාලක සූත්‍රය

1 මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් අනේපිඩු සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක. එ කල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි භික්ෂූන් ආමන්ත්‍රණය කළ සේක. ඒ භික්ෂූහු 'වහන්සැ'යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

2 මහණෙනි, අඞ්ග (අඟුණු කොටස්) එකොළොසෙකින් සමන්නාගත ගොපලු ගෙරිමුළ රක්නට වෘද්ධි කරන්නට අභව්‍ය වෙයි. කවර එකොළොසෙකින යත්:

මහණෙනි, මේ ලෝකයෙහි ගොපලු (ගෙරිරැළ ගණිනින් හෝ සුදු රතු පැහැයෙන්) ගොරූප නො දන්නේ වේ ද, (ගෙරි සිරුරෙහි දුනු-සිරි-තිසුල් ආදි) ලකුණෙහි දක්‍ෂ නො වේ ද, (මැසි කණුකටුයෙන් සම්බුන් තැන තිලමැස්සන් ලූ) මැසිබිජු නො හරනේ වේ ද, (ගෙරි ඇඟ හටගත්) වණ (බෙහෙත් ලා) නො වසන්නේ වේ ද, (මැසිමදුරු වළහනු සඳහා ගොවදෙහි) දුම් නො කරන්නේ වේ ද, (ගෙරින් බැසිය යුතු) තොටුපල නො දනී ද, (ගෙරින්) පානය කළ නො කළ බව නො දනී ද, ගමන්මඟ නො දනී ද, ගෙරින් හැසිරවිය යුතු තැන්හි (තණබිම්හි) අදක්‍ෂ වේ ද, (වසු පිණිස) ඉතිරි නො කොට කිරි දොවනසුලු වේ ද, ගොපිතෘ වූ ගොපරිණායක වූ යම් වැහැප්හු ඇද්ද, උනට විශේෂ සැලකිලි නො දක්වන්නේ වේ ද, මහණෙනි, මේ එකොළොස් අඞ්ගයෙන් යුක්ත ගොපලු ගෙරිමුළ පාලනය කරන්නට වැඩි කරන්නට නො හිසි වෙයි.

3. මහණෙනි, මෙ පරිද්දෙන් ම එකොළොස් අඞ්ගයෙකින් යුක්ත මහණ මේ ශාසනයෙහි වෘද්ධියට විරූඪියට විපුලත්වයට පැමිණීමට අභව්‍ය වෙයි. කවර එකොළොසෙකින යත්:

මහණෙනි, මේ ශාසනයෙහි මහණ රූපඥ නො වේ ද, ලක්‍ෂණකුශල නො වේ ද, ආසාටිකාපහරණ නො කරන්නේ වේ ද, වණ නො වසන්නේ වේ ද, දුම් නො කරන්නේ වේ ද, තොටුපල නො දනී ද, පීතය නො දනී ද, වීථිය නො දනී ද, ගෝචරයෙහි අදක්‍ෂ වේ ද, අනවශෙෂදොහන කරන්නේ වේ ද, රාත්‍රඥ වූ බොහෝ කල් ඉක්මවූ සඞ්ඝපිතෘ වූ සඞ්ඝපරිණායක වූ යම් ස්ථවිරභික්ෂූහු වෙත් නම්, ඔවුන් අතිරේකපූජාවෙන් නො පුදන්නේ වේ ද යන කරුණු එකොළොසිනි.

(1) මහණෙනි, මහණ කෙසේ නම් රූපඥ නො වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණෙක් "යම් කිසි රූපයෙක් වේ නම්, එ හැම රූප (මෙතෙක්) සතරමහාභූතයෝ ය. (මෙතෙක්) සතරමහාභූතයන්ගේ උපාදාය රූපය" යි තත් වූ පරිදි නො දනී ද, මහණෙනි, මෙසේ මහණ රූපඥ නො වේ.

(2.) මහණෙනි, මහණ කෙසේ නම් ලක්‍ෂණකුශල නො වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණෙක් "අඥනයා ක්‍රියාව ලක්‍ෂණ කොට ඇත, පණ්ඩිතයා ක්‍රියාව ලක්‍ෂණ කොට ඇතැ" යි තත් වූ පරිදි නො දනී ද, මහණෙනි, මෙසේ මහණ ලක්‍ෂණයෙහි අදක්‍ෂ වෙයි.

(3) කථඤ්ච භික්ඛවෙ භික්ඛු න ආසාටිකං සාටෙතා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු උප්පන්නං කාමවිතක්කං අධිවාසෙති නප්පජහති න විනොදෙති න බ්‍යන්තිකරෙති න අනභාවං ගමෙති. උප්පන්නං බ්‍යාපාදවිතක්කං -පෙ- උප්පන්නං විහිංසාවිතක්කං -පෙ- උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ අධිවාසෙති නප්පජහති න විනොදෙති න බ්‍යන්තීකරෙති න අනභාවං ගමෙති. එවං ඛො භික්ඛවෙ භික්ඛු න ආසාටිකං සාටෙතා හොති.

(4.) කථඤ්ච භික්ඛවෙ භික්ඛු න වණං පටිච්ඡාදෙතා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සං පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය න පටිපජ්ජති, න රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ න සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය න පටිපජ්ජති, න රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ න සංවරං ආපජ්ජති. එවං ඛො භික්ඛවෙ භික්ඛු න වණං පටිච්ඡාදෙතා හොති.

(5.) කථඤ්ච භික්ඛවෙ භික්ඛු න ධූමං කත්තා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං න විත්ථාරෙන පරෙසං දෙසෙතා හොති. එවං ඛො භික්ඛවෙ භික්ඛු න ධූමං කත්තා හොති.

(6) කථඤ්ච භික්ඛවෙ භික්ඛු න තිත්ථං ජානාති? ඉධ භික්ඛවෙ භික්ඛු යෙ තෙ භික්ඛු බහුස්සුතං ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා, තෙ කාලෙන කාලං උපසඞ්කමිත්වා න පරිපුච්ඡති න පරිපඤ්හති: ඉදං භන්තෙ කථං, ඉමස්ස කො අත්ථොති? තස්ස තෙ ආයස්මන්තො අවිවටඤ්චෙව න විවරන්ති, අනුත්තානීකතඤ්ච න උත්තානීකරොන්ති,[1] අනෙකවිහිතෙසු ච කඞ්ඛාඨානීයෙසු ධම්මෙසු කඞ්ඛං න පටිවිනොදෙන්ති. එවං ඛො භික්ඛවෙ භික්ඛු න තිත්ථං ජානාති.

(7.) කථඤ්ච භික්ඛවෙ භික්ඛු න පීතං ජානාති? ඉධ භික්ඛවෙ භික්ඛු තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ දෙසියමානෙ න ලභති අත්ථවෙදං, න ලභති ධම්මවෙදං, න ලභති ධම්මූපසංහිතං පාමොජ්ජං.[2] එවං ඛො භික්ඛවෙ භික්ඛු න පීතං ජානාති.

1. උත්තානි කරොන්ති, මජසං. උත්තානි PTS. 2. පාමුජ්ජං - සීමු.

(3.) මහණෙනි, මහණ කෙසේ නම් ආසාටිකාපහරණ නො කරන්නේ (පිතකී නමැති ඉහඬ නොහරණේ) වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ උපන් කාමවිතර්ක සිත්හි වාස කරවයි. දුරු නො කෙරේ. කෙළවර නො කරයි. අභාවයට (විනාශයට) නො පමුණුවයි. උපන් ව්‍යාපාදවිතර්ක… උපන් විහිංසාවිතර්ක… උපනුපන් ලාමක වූ අකුශලධර්ම සිත්හි වාස කරවයි. දුරු නො කෙරේ. කෙළවර නො කෙරේ. අභාවයට නො පමුණුවයි. මහණෙනි, මෙසේ මහණ ආසාටිකාපහරණ (මැසිබිජු බඳු කාමාදි විතර්ක නෙරීම) නො කරන්නේ වේ.

(4.) මහණෙනි, කෙසේ නම් මහණ වණ නො වසන්නේ (ඉන්ද්‍රිය සංවර නො කරන්නේ) වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ ඇසින් රූපයක් දැක නිමිති (ස්ත්‍රීපුරුෂආකාරාදිය) සිතට ගන්නේ වේ. (හස්තපාදාදි) අනුව්‍යඤ්ජනයන් සිතට ගන්නේ වේ. යම් කාරණයෙකින් චක්ෂුරින්ද්‍රියය සංවර නො කොට වාස කරන්නා වූ මේ පුගුලා අභිධ්‍යා-දෞර්මනස්‍ය වූ පාපකඅකුශලධර්මයෝ අනුබඳනාහු ද, ඒ චක්ෂුරින්ද්‍රිය පිළිබඳ සංවරය පිණිස නො පිළිපදියි. චක්ෂුරින්ද්‍රිය නො රකියි. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට නො පැමිණෙයි. කණින් ශබ්දයක් අසා … නාසායෙන් ගඳක් ආඝ්‍රාණය කොට … දිවෙන් රසයක් විඳ … කයින් පැහැසිය යුත්තක් පහසා … සිතින් ධර්මයක් දැන නිමිති ගන්නේ වේ. අනුව්‍යඤ්ජන ගන්නේ වේ. යම් කාරණයෙකින් මනින්ද්‍රිය සංවරය නො කොට වාස කරන්නා වූ ඒ පුගුලා අභිධ්‍යාදෞර්මනස්‍ය වූ පාපකඅකුශලධර්මයෝ ලුහු බඳනාහු ද, ඒ මනින්ද්‍රියයාගේ සංවරය පිණිස නො පිළිපදියි. මනින්ද්‍රිය නො රකියි. මනින්ද්‍රියයෙහි සංවරයට නො පැමිණෙයි. මහණෙනි, මහණ මෙසේ වණ නො වසන්නේ වෙයි.

(5.) මහණෙනි, කෙසේ නම් මහණ දුම් නො කරන්නේ වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ ඇසූ පරිදි පුහුණු කළ පරිදි ධර්මය විස්තරවශයෙන් අනුන්ට නො දෙසන්නේ වේ. මහණෙනි, මෙසේ මහණ දුම් නො කරන්නේ වෙයි.

(6.) මහණෙනි, කෙසේ නම් මහණ තොටුපල (ගුරුපාසනය) නො දනී ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ බහුශ්‍රුත වූ දත් ආගම ඇති ධර්මධර වූ විනයධර වූ මාතෘකාධර වූ යම් ඒ භික්ෂුහු වෙත් ද, ඒ භික්ෂූන් වෙත කලින් කල එළඹ 'වහන්ස, මෙය කෙසේ ද, මේ භාෂිතයාගේ අර්ථය කවරේ ද'යි නො අසයි. ප්‍රශ්න නො කෙරේ ඔහුට ඒ ආයුෂ්මත්හු විවෘත නො වූවක් විවෘත නො කෙරෙත්. පැහැදිලි නො වූවක් පැහැදිලි නො කෙරෙත්. ප්‍රකට නො වූවක් ප්‍රකට නො කෙරෙත්. නන්වැදෑරුම් නොයෙක් සැක සහිත ධර්මයන්හි සැක දුරු නො කෙරෙත්. මහණෙනි, මෙසේ මහණ තොටුපල නො දන්නේ වේ.

(7.) මහණෙනි, කෙසේ නම් මහණ පානය (ධර්මප්‍රීතිය) නො දන්නේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ බුදුන් වදාළ ධර්මය දෙසනු ලබන කල්හි අර්ථය දැන ප්‍රීතිය නො ලබයි. ධර්මය දැන ප්‍රීතිය නො ලබයි. ධර්මය ඇසුරු කළ ප්‍රමෝදය නො ලබයි. මහණෙනි, මෙසේ මහණ පානය නො දන්නේ වේ.

Free Distribution www.aathaapi.org

(8) කථඤ්ච භික්ඛවෙ භික්ඛු න වීථිං ජානාති? ඉධ භික්ඛවෙ භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං යථාභූතං නප්පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු න වීථිං ජානාති.

(9) කථඤ්ච භික්ඛවෙ භික්ඛු න ගොචරකුසලො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු චත්තාරො සතිපට්ඨානෙ යථාභූතං නප්පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු න ගොචරකුසලො හොති.

(10.) කථඤ්ච භික්ඛවෙ භික්ඛු අනවසෙසදොහී[1] හොති? ඉධ භික්ඛවෙ භික්ඛුං සද්ධා ගහපතිකා අභිහට්ඨුං පවාරෙන්ති චීවරපිණ්ඩපාත-සෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි. තත්‍ර භික්ඛු න මත්තං ජානාති[2] පටිග්ගහණාය. එවං ඛො භික්ඛවෙ භික්ඛු අනවසෙසදොහී හොති.

(11.) කථඤ්ච භික්ඛවෙ භික්ඛු යෙ තෙ භික්ඛූ ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිණායකා, තෙ න අතිරෙකපූජාය පූජෙතා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු යෙ තෙ භික්ඛූ ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිණායකා, තෙසු න මෙත්තං කායකම්මං පච්චුපට්ඨාපෙති ආවී[3] චෙව රහො ච, න මෙත්තං වචීකම්මං පච්චුපට්ඨාපෙති ආවී චෙව රහො ච, න මෙත්තං මනොකම්මං පච්චුපට්ඨාපෙති ආවී චෙව රහො ච එවං ඛො භික්ඛවෙ භික්ඛු යෙ තෙ භික්ඛූ ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිණායකා, තෙ න අතිරෙකපූජාය පූජෙතා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ එකාදසහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිතුං.

4. එකාදසහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො ගොපාලකො භබ්බො ගොගණං පරිහරිතුං ඵාතිකත්තුං. කතමෙහි එකාදසහි?

ඉධ භික්ඛවෙ ගොපාලකො රූපඤ්ඤූ හොති, ලක්ඛණකුසලො හොති, ආසාටිකං සාටෙතා[4] හොති, වණං පටිච්ඡාදෙතා හොති, ධූමං කත්තා හොති, තිත්ථං ජානාති, පිතං ජානාති, වීථිං ජානාති, ගොචරකුසලො හොති, සාවසෙසදොහී ච හොති, යෙ තෙ උසභා ගොපිතරො ගොපරිණායකා, තෙ අතිරෙකපූජාය පූජෙතා හොති. ඉමෙහි ඛො භික්ඛවෙ එකාදසහි අඞ්ගෙහි සමන්නාගතො ගොපාලකො භබ්බො ගොගණං පරිහරිතුං ඵාතිකත්තුං.

---

1. අනවසෙසදොහී ච, සයා. 2. මත්තං න ජානාති, PTS.
3. ආවි, සීමු 4. හාරෙතා, මජසං.

(8.) මහණෙනි, මහණ කෙසේ නම් වීථිය - මාර්ගය නො දන්නේ වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය තත් වූ පරිදි නො දනී මහණෙනි, මෙසේ මහණ වීථිය නො දන්නේ වෙයි.

(9.) මහණෙනි, මහණ කෙසේ නම් ගෝචරයෙහි අදක්ෂ වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ සතර සිව්වටන් තත් වූ පරිදි නො දනී. මහණෙනි, මෙසේ මහණ ගෝචරයෙහි අදක්ෂ වෙයි.

(10.) මහණෙනි, මහණ කෙසේ නම් ඉතිරි නො කොට දොවන්නේ වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණකු ශ්‍රද්ධාවත් ගෘහපතියෝ චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාර යන මෙයින් ලඟට ගෙන ගොස් පවරත්. මහණ තෙමේ එහිදී පිළිගැනීමේ ප්‍රමාණය නො දනී (සියල්ලම ගනී). මහණෙනි, මෙසේ මහණ ඉතිරි නො කොට දොවන්නේ වේ.

(11.) මහණෙනි, මහණ කෙසේ නම් රාත්‍රඥ වූ පැවිදි ව බොහෝ කල් ඇති සඞ්ඝපිතෘ වූ සඞ්ඝපරිණායක වූ යම් ඒ ස්ථවිර භික්ෂූහු වෙත් නම්, ඔවුන් අතිරේකපූජාවෙන් නො පුදන්නේ වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ චිරරාත්‍රඥ වූ පැවිදි ව බොහෝ කල් ඇති සඞ්ඝපිතෘ වූ සඞ්ඝපරිණායක වූ යම් ස්ථවිර භික්ෂු කෙනෙක් වෙත් නම්, ඔවුන් කෙරෙහි හමුවෙහි ද නො හමුවෙහි ද මෛත්‍රීසහගත කායකර්මය නො එළවයි. මෛත්‍රී වාක්කර්මය හමුවෙහි ද නො හමුවෙහි ද නො එළවයි. මෛත්‍රීමනඃකර්මය හමුවෙහි ද නො හමුවෙහි ද නො එළවයි. මහණෙනි, මෙසේ මහණ චිරරාත්‍රඥ වූ පැවිදි ව බොහෝ කල් ඇති සඞ්ඝපිතෘ වූ සඞ්ඝපරිණායක වූ යම් ඒ ස්ථවිරභික්ෂුකෙනෙක් වෙත් නම්, ඔවුන් අතිරේකපූජාවෙන් නො පුදන්නේ වෙයි.

මහණෙනි, මේ එකොළොස් අඞ්ගයෙන් යුක්ත මහණ මේ ශාසනයෙහි දියුණුවට වැඩීමට විපුලත්වයට පැමිණීමට සුදුස්සෙක් නො වේ.

4. මහණෙනි, එකොළොස් කරුණෙකින් යුක්ත ගොපලු තෙමේ ගෝසමූහය පරිහරණය කරන්නට දියුණු කරන්නට සුදුස්සෙක් වෙයි. කවර එකොළොසෙකින් ද?

මහණෙනි, මේ ලෝකයෙහි ගොපලු තෙමේ රූපඥ වේ. ලක්ෂණයෙහි දක්ෂ වේ. මැසිබිජු ඉවත ලන්නේ වේ. වණ වසන්නේ වේ දුම් කරන්නේ වේ. තොටුපල දනී. පීතය දනී. මාර්ගය දනී තණබිම්හි දක්ෂ වේ. ඉතිරි කොට දොවන්නේ වේ. ගොපිතෘ වූ ගොපරිණායක වූ යම් ඒ වෘෂභයෝ වෙත් නම්, ඔවුන් අතිරේකපූජාවෙන් පුදන්නේ වේ. මහණෙනි, මේ එකොළොස් අඞ්ගයෙන් යුක්ත ගොපලු තෙමේ ගොසමූහය පරිහරණය කරන්නට දියුණු කරන්නට සුදුස්සෙක් වෙයි.

5. එවමෙව ඛො භික්ඛවෙ එකාදසහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිතුං. කතමෙහි එකාදසහි?

ඉධ භික්ඛවෙ භික්ඛු රූපඤ්ඤූ හොති, ලක්ඛණකුසලො හොති, ආසාටිකං සාටෙතා හොති, වණං පටිච්ඡාදෙතා හොති, ධූමං කත්තා හොති, තිත්ථං ජානාති, පීතං ජානාති, වීථිං ජානාති, ගොචරකුසලො හොති, සාවසෙසදොහී ච හොති, යෙ තෙ භික්ඛූ ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිණායකා තෙ අතිරෙකපූජාය පූජෙතා හොති.

(1.) කථඤ්ච භික්ඛවෙ භික්ඛු රූපඤ්ඤූ හොති? ඉධ භික්ඛවෙ භික්ඛු යං කිඤ්චි රූපං, සබ්බං රූපං චත්තාරි මහාභූතානි චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපන්ති යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු රූපඤ්ඤූ හොති.

(2.) කථඤ්ච භික්ඛුවෙ භික්ඛු ලක්ඛණකුසලො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු 'කම්මලක්ඛණො බාලො, කම්මලක්ඛණො පණ්ඩිතො'ති යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ලක්ඛණකුසලො හොති.

(3.) කථඤ්ච භික්ඛවෙ භික්ඛු ආසාටිකං සාටෙතා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. උප්පන්නං බ්‍යාපාදවිතක්කං -පෙ- උප්පන්නං විහිංසාවිතක්කං -පෙ- උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ආසාටිකං සාටෙතා හොති.

(4) කථඤ්ච භික්ඛවෙ භික්ඛු වණං පටිච්ඡාදෙතා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. එවං ඛො භික්ඛවෙ භික්ඛු වණං පටිච්ඡාදෙතා හොති.

(5.) කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධූමං කත්තා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙතා හොති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ධූමං කත්තා හොති.

Free Distribution www.aathaapi.org

5. මහණෙනි, එපරිද්දෙන් ම එකොළොස් අඞ්ගයෙකින් යුක්ත මහණ මේ ශාසනයෙහි දියුණුවට වැඩීමට විපුලත්‍වයට සුදුස්සෙක් වෙයි. කවර එකොළොසෙකින් ද?

මහණෙනි, මේ ශාසනයෙහි මහණ රූපඥ වේ. ලක්‍ෂණයෙහි දක්‍ෂ වේ. මැසිබිජු ඉවත් කරන්නේ වේ. වණ වසන්නේ වේ. දුම් කරන්නේ වේ. තොටුපල දනී. පීතය දනී. ගමන් මග දනී. ගොචරයෙහි දක්‍ෂ වේ. ඉතිරි කොට දොවන්නේ වේ. රත්‍රඥ වූ පැවිදි ව බොහෝ කල් ඇති සඞ්ඝපිතෘ වූ සඞ්ඝපරිණායක වූ යම් ඒ ස්‍ථවිර භික්‍ෂු කෙනෙක් වෙත් නම්, ඔවුන් අතිරෙකපූජාවෙන් පුදන්නේ වේ. (මේ අඞ්ග එකොළොසිනි.)

(1.) මහණෙනි, මහණ කෙසේ රූපඥ වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ යම් කිසි රූපයෙක් වේ නම්, 'ඒ සියලු රූපය සතර මහා භූතයෝ ය, සතර මහා භූතයන්ගේ උපාදාය රූප ය'යි තත් වූ පරිදි දනී. මහණෙනි, මෙසේ මහණ රූපඥ වේ.

(2.) මහණෙනි, මහණ කෙසේ නම් ලක්‍ෂණයෙහි දක්‍ෂ වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ 'බාලයා ක්‍රියාව ලක්‍ෂණ කොට ඇත්තේ ය. පණ්ඩිතයා ක්‍රියාව ලක්‍ෂණ කොට ඇත්තේ ය'යි තත් වූ පරිදි දනී. මහණෙනි, මෙසේ මහණ ලක්‍ෂණයෙහි දක්‍ෂ වේ.

(3.) මහණෙනි, මහණ කෙසේ නම මැසිබිජු ඉවත් කරන්නේ වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ උපන් කාමවිතර්ක සිත්හි නො වස්වයි, දුරු කෙරේ, පෙලයි, කෙලවර කෙරේ, පිළිවෙළින් අභාවයට පමුණුවයි. උපන් ව්‍යාපාදවිතර්කය ... උපන් විහිංසා විතර්කය ... උපනුපන් ලාමක අකුශලධර්මයන් සිත්හි නො වස්වයි. දුරු කෙරේ, පෙලයි, කෙලවර කෙරේ, පිළිවෙළින් අභාවයට පමුණුවයි. මහණෙනි, මෙසේ මහණ ඉහඩ ඉවත් කරන්නේ වේ.

(4.) මහණෙනි, මහණ තෙමේ කෙසේ නම වණ වසන්නේ වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ ඇසින් රූප දැක නිමිති නො ගන්නේ වේ. අනුව්‍යඤ්ජන නො ගන්නේ වේ. යම් කාරණයෙකින් චක්‍ෂුරින්‍ද්‍රිය සංවර නො කොට වසන්නා වූ මේ පුඟුලා අභිධ්‍යාදෞර්මනස්‍ය වූ පවිටු අකුශලධර්මයෝ ලුහුබඳනාහු නම්, ඒ චක්‍ෂුරින්‍ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදී යි. චක්‍ෂුරින්‍ද්‍රියය රකියි. චක්‍ෂුරින්‍ද්‍රියයෙහි සංවරයට පැමිණේ යි. ... කණින් ශබ්දයක් අසා ... නාසායෙන් ගඳ අසා ... දිවෙන් රස විඳ ... කයින් පැහැසිය යුක්ත පහසා ... සිතින් ධර්මය දැන නිමිති නො ගන්නේ වෙයි. අනුව්‍යඤ්ජන් නො ගන්නේ වෙයි. යම් කාරණයෙකින් මනින්‍ද්‍රිය සංවර නො කොට වසන්නා වූ ඒ පුඟුලා අභිධ්‍යාදෞර්මනස්‍ය වූ ලාමක අකුශල ධර්මයෝ ලුහුබඳනාහු ද, ඒ මනින්‍ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදියි. මනින්‍ද්‍රිය රකියි. මනින්‍ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. මහණෙනි, මෙසේ මහණ වණය වසන්නේ වේ.

5. මහණෙනි, මහණ කෙසේ නම් දුම් කරන්නේ වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ ඇසූ පරිදි ප්‍රගුණ කළ පරිදි ධර්මය විස්තර වශයෙන් අනුනට දෙශනා කරන්නේ වේ. මහණෙනි, මෙසේ මහණ දුම් කරන්නේ වේ.

(6.) කථඤ්ච භික්ඛවෙ භික්ඛු තිත්ථං ජානාති? ඉධ භික්ඛවෙ භික්ඛු යෙ තෙ භික්ඛූ බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා, තෙ කාලෙන කාලං උපසඞ්කමිත්වා පරිපුච්ඡති පරිපඤ්හති: ඉදං භන්තෙ කථං, ඉමස්ස කො අත්ථො?ති. තස්ස තෙ ආයස්මන්තො අවිවටඤ්චෙව විවරන්ති, අනුත්තානීකතඤ්ච උත්තානීකරොන්ති, අනෙකවිහිතෙසු ච කඞ්ඛාට්ඨානියෙසු ධම්මෙසු කඞ්ඛං පටිවිනොදෙන්ති. එවං ඛො භික්ඛවෙ භික්ඛු තිත්ථං ජානාති.

(7.) කථඤ්ච භික්ඛවෙ භික්ඛු පීතං ජානාති? ඉධ භික්ඛවෙ භික්ඛු තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ දෙසියමානෙ ලභති අත්ථවෙදං, ලභති ධම්මවෙදං, ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං. එවං ඛො භික්ඛවෙ භික්ඛු පීතං ජානාති.

(8.) කථඤ්ච භික්ඛවෙ භික්ඛු වීථිං ජානාති? ඉධ භික්ඛවෙ භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු වීථිං ජානාති.

(9.) කථඤ්ච භික්ඛවෙ භික්ඛු ගොචරකුසලො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු චත්තාරො සතිපට්ඨානෙ යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ගොචරකුසලො හොති.

(10.) කථඤ්ච භික්ඛවෙ භික්ඛු සාවසෙසදොහී හොති? ඉධ භික්ඛවෙ භික්ඛුං සද්ධා ගහපතිකා අභිහට්ඨුං පවාරෙන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි. තත්‍ර භික්ඛු මත්තං ජානාති පටිග්ගහණාය. එවං ඛො භික්ඛවෙ භික්ඛු සාවසෙසදොහී හොති.

(11.) කථඤ්ච භික්ඛවෙ භික්ඛු යෙ තෙ භික්ඛූ ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිණායකා, තෙ අතිරෙකපූජාය පූජෙතා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු යෙ තෙ භික්ඛූ ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිණායකා තෙසු මෙත්තං කායකම්මං පච්චුපට්ඨාපෙති ආවී චෙව රහො ච, මෙත්තං වචීකම්මං පච්චුපට්ඨාපෙති ආවී චෙව රහො ච, මෙත්තං මනොකම්මං පච්චුපට්ඨාපෙති ආවී චෙව රහො ච. එවං ඛො භික්ඛවෙ භික්ඛු යෙ තෙ භික්ඛූ ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිණායකා, තෙ අතිරෙකපූජාය පූජෙතා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ එකාදසහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිතුන්ති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

මහාගොපාලකසුත්තං තතියං.

(6.) මහණෙනි, මහණ කෙසේ නම් තොටුපල දත්තේ වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ බහුශ්‍රැත වූ දත් ආගම ඇති ධර්මධර වූ විනයධර වූ මාතෘකාධර වූ යම් ඒ ස්ථවිර භික්ෂූහු වෙත් ද, කලින් කල ඔවුන් වෙත එළඹ 'වහන්ස, මෙය කෙසේ ද, මෙහි අර්ථය කවරේද'යි විචාරයි. ප්‍රශ්න කරයි. ඒ ආයුෂ්මත්හු ඔහුට විවෘත නොවූවක් විවෘත කෙරෙත්. ප්‍රකට නොවූවක් ප්‍රකට කෙරෙත්. නොයෙක් සැක සහිත වූ ධර්මයන්හි සැකය දුරු කෙරෙත්. මහණෙනි, මෙසේ මහණ තොටුපල දනියි.

(7.) මහණෙනි, මහණ කෙසේ නම් පානය කිරීම දනී ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ බුදුන් වදාළ ධර්මවිනය දෙසනු ලබන කල්හි අර්ථය දැන සතුට ලබයි. ධර්මය දැන සතුට ලබයි. ධර්මාශ්‍රිතප්‍රමෝදය ලබයි. මහණෙනි, මෙසේ මහණ පානය කිරීම දත්තේ වේ

(8.) මහණෙනි, කෙසේ නම් මහණ තෙමේ මාර්ගය දත්තේ වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ ආර්ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය තත් වූ පරිදි දනී. මහණෙනි, මෙසේ මහණ තෙමේ මාර්ගය දත්තේ වේ.

(9.) මහණෙනි, කෙසේ නම් මහණ ගොචරයෙහි දක්ෂ වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ සිවුසිවටන් තතු සේ දත්තේ වේ. මහණෙනි, මෙසේ මහණ ගොචරයෙහි දක්ෂ වේ.

(10.) මහණෙනි, මහණ කෙසේ නම් ඉතිරි කොට දෙවත්තේ වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණකු සැදැහැවත් ගැහැවියෝ සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙසත් පිරිකරින් එය එළවා පවරත්. එහිදී මහණ පිළිගැනීමේ ප්‍රමාණය දත්තේ වේ. මහණෙනි, මහණ මෙසේ ඉතිරි කොට දෙවත්තේ වේ.

(11) මහණෙනි, මහණ කෙසේ නම් චිරරාත්‍රඥ වූ පැවිදි වී බොහෝ කල් ඇති සඞ්ඝපිතෘ වූ සඞ්ඝපරිණායක වූ යම් ඒ ස්ථවිරභික්ෂූහු වෙත් නම්, ඔවුන් අතිරේකපූජාවෙන් පුදන්නේ වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ චිරරාත්‍රඥ වූ පැවිදි වී බොහෝ කල් ඇති සඞ්ඝපිතෘ වූ සඞ්ඝපරිණායක වූ යම් ඒ ස්ථවිරභික්ෂූහු වෙත් නම්, ඒ භික්ෂූන් කෙරෙහි මෛත්‍රීකායකර්මය හමුවෙහිත් නො හමුවෙහිත් එළවයි මෛත්‍රීවාක්කර්මය හමුවෙහිත් නො හමුවෙහිත් එළවයි. මෛත්‍රී මනඃකර්මය හමුවෙහිත් නො හමුවෙහිත් එළවයි. මහණෙනි, මෙසේ මහණ චිරරාත්‍රඥ වූ පැවිදි වී බොහෝ කල් ඇති සඞ්ඝපිතෘ වූ සඞ්ඝපරිණායක වූ යම් ඒ ස්ථවිරභික්ෂූහු වෙත් නම්, ඔවුන් අතිරේක පූජාවෙන් පුදන්නේ වේ.

මහණෙනි, මේ එකොළොස් අඞ්ගයෙන් යුක්ත මහණ මේ ශාසනයෙහි දියුණුවට වැඩීමට විපුලත්වයට පැමිණීමට සුදුසු වෙයි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය මැනැවැ යි පිළිගත්හ.

මහාගොපාලකසූත්‍රය තුන්වැනි යි.

Free Distribution www.aathaapi.org

1. 4. 4.

චූළගොපාලකසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **වජ්ජීසු** විහරති **උක්කාචෙලායං**[1] ගඞ්ගාය නදියා තීරෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවො'ති. 'භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. භූතපුබ්බං භික්ඛවෙ මාගධකො ගොපාලකො දුප්පඤ්ඤජාතිකො වස්සානං පච්ඡිමෙ මාසෙ සරදසමයෙ අසමවෙක්ඛිත්වා ගඞ්ගාය නදියා ඔරිමං තීරං අසමවෙක්ඛිත්වා පාරිමං තීරං අතිත්ථෙනෙව ගාවො පතාරෙසි උත්තරං තීරං සුවිදෙහානං.[2] අථ ඛො භික්ඛවෙ ගාවො මජ්ඣෙ ගඞ්ගාය නදියා සොතෙ ආමණ්ඩලියං[3] කරිත්වා තත්ථෙව අනයබ්‍යසනං ආපජ්ජිංසු. තං කිස්ස හෙතු? තථා හි සො භික්ඛවෙ මාගධකො ගොපාලකො දුප්පඤ්ඤජාතිකො වස්සානං පච්ඡිමෙ මාසෙ සරදසමයෙ අසමවෙක්ඛිත්වා ගඞ්ගාය නදියා ඔරිමං තීරං අසමවෙක්ඛිත්වා පාරිමං තීරං අතිත්ථෙනෙව ගාවො පතාරෙසි උත්තරං තීරං සුවිදෙහානං.

3 එවමෙව ඛො භික්ඛවෙ යෙ කෙචි[4] සමණා වා බ්‍රාහ්මණා වා අකුසලා ඉමස්ස ලොකස්ස, අකුසලා පරස්ස ලොකස්ස, අකුසලා මාරධෙය්‍යස්ස, අකුසලා අමාරධෙය්‍යස්ස, අකුසලා මච්චුධෙය්‍යස්ස, අකුසලා අමච්චුධෙය්‍යස්ස, තෙසං යෙ සොතබ්බං සද්දහාතබ්බං මඤ්ඤිස්සන්ති, තෙසං තං භවිස්සති දීඝරත්තං අහිතාය දුක්ඛාය.

4. භූතපුබ්බං භික්ඛවෙ මාගධකො ගොපාලකො සප්පඤ්ඤජාතිකො වස්සානං පච්ඡිමෙ මාසෙ සරදසමයෙ සමවෙක්ඛිත්වා ගඞ්ගාය නදියා ඔරිමං තීරං සමවෙක්ඛිත්වා පාරිමං තීරං තිත්ථෙනෙව ගාවො පතාරෙසි උත්තරං තීරං සුවිදෙහානං. සො පඨමං පතාරෙසි යෙ තෙ උසභා ගොපිතරො ගොපරිණායකා. තෙ තිරියං ගඞ්ගාය සොතං ඡෙත්වා සොත්ථිනා පාරං අගමංසු. අථාපරෙ පතාරෙසි බලවගාවො, දම්මගාවො.[5] තෙපි තිරියං ගඞ්ගාය සොතං ඡෙත්වා සොත්ථිනා පාරං අගමංසු. අථාපරෙ පතාරෙසි වච්ඡතරෙ[6] වච්ඡතරියො. තෙපි තිරියං ගඞ්ගාය සොතං ඡෙත්වා සොත්ථිනා පාරං අගමංසු. අථාපරෙ පතාරෙසි වච්ඡකෙ කිසබලකෙ.[7] තෙපි තිරියං ගඞ්ගාය සොතං ඡෙත්වා සොත්ථිනා පාරං අගමංසු. –

---

1. උක්කාචෙලාය, මජසං PTS. 2. විදෙහානං, සයා. 3. ආමණ්ඩලිකං, සයා
4 යෙ හි කෙචි, මජසං. PTS. 5. බලවගාවෙ දම්මගාවෙ, සයා. PTS
6. වච්ඡතරෙ ච, සී 7. කිසාබලකෙ, මජසං.

Free Distribution www.aathaapi.org

1. 4. 4.

චූලගොපාලක සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ වැදූරට ගඞ්ගා හෝතෙර උක්කචෙලා නම් නුවර වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු පින්වතුන් වහන්සැ යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන්වහන්සේ මෙතෙල වදාළ සේක:

2. මහණෙනි, පෙර වූවෙකි: මගධරට වැසි දුෂ්ප්‍රාඥ සවභාව ඇති ගොපල්ලෙක් වර්ෂා සෘතුවෙහි පැසුළුමස ශරත්කාලයෙහි ගඞ්ගානදියෙහි මෙතෙර නො සලකා එ තෙර නො සලකා නුසුදුසු තොටින් විදෙහයන් සතු උතුරු තෙරට ගවයන් තැරැවී. මහණෙනි, එකල්හි ගවයෝ ගඞ්ගානදිය මැද සළාවැටුණෙක මැඩිලි කොට එහි ම අවැඩවනසට පත්වූහ. (මුහුදට වත්හ.) ඒ කවර හෙයින යත්: මහණෙනි, නුනුවණ පියවි ඇති ගොපල්ලා වසත් පැසුළුමස ශරත්කාලයෙහි ගඞ්ගානදියෙහි මෙ තෙර නො සලකා එ තෙර නො සලකා විදේහයන් සතු උතුරුඉවුරට නුසුදුසු තොටින් ගවයන් තැරැවී. (එහෙයිනි.)

3. මහණෙනි, එ පරිදි ම යම් ම ශ්‍රමණයෝ වෙත් වයි බ්‍රාහමණයෝ වෙත් වයි මේ ලෝකයෙහි (සකන්ධ - ධාතු - ආයතනයන්හි) අදක්ෂ වෙද්ද, පරලොකයෙහි (සකන්ධ - ධාතු - ආයාතනයන්හි) අදක්ෂ වෙද්ද, මාරධෙය්‍ය-සඞ්ඛ්‍යාත (මරුනිවස වූ) ත්‍රෛභූමික ධර්මයෙහි අදක්ෂ වෙද්ද, අමාරධෙය්‍ය සඞ්ඛ්‍යාත නවලොකොත්තරධර්මයෙහි අදක්ෂ වෙද්ද, මච්චුධෙය්‍ය සඞ්ඛ්‍යාත ත්‍රෛභූමික ධර්මයෙහි අදක්ෂ වෙද්ද, අමච්චුධෙය්‍ය සඞ්ඛ්‍යාත නවලොකොත්තර ධර්මයෙහි අදක්ෂ වෙද්ද, යම් කෙනෙක් ඔවුන්ගේ වචනය ඇසිය යුතු කොට හැදහිය යුතු කොට හගින්නාහු ද එය ඔවුන්ට අහොරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වන්නේය.

4 මහණෙනි, වූවිරූ දයෙකි: මගධරටවැසි සප්‍රාඥ සවභාව ඇති ගොපල්ලෙක් වර්ෂාසෘතුයෙහි පැසුළු මස ශරත්කාලයෙහි ගඞ්ගානදියෙහි මෙ තෙර සලකා එ තෙර සලකා විදෙහයන් සතු උතුරුඉවුරට සුදුසු තොටින් ම ගවයන් තරණය කරවීය. හේ ගොපිතෘ ගොපරිනායක යම් වෘෂභ කෙනෙක් වූහු නම්, පලමු උන් එතෙර කරවී. ඔහු ගඟ සරස ස්‍රොතස් සිඳ ගෙණ සුවසේ පර තෙරට ගියාහු ය. ඉක්බිති අදාන්ත ගවයනුදු දම්‍ය ගවයනුදු එතෙර කරවීය. ඔහු ද ගඟ සරස සැඩ සලා සිඳ ගෙණ සුවසේ පරතෙරට ගියාහු ය. ඉක්බිති තහඹු වස්සන් හා වැස්සන් එතෙර කරවීය. ඔවුහු ද ගඟ සරස සැඩසලා සිඳ ගෙණ සුවසේ පරතෙරට ගියාහු ය. ඉක්බිති කෘශබල ඇති සෙසු (දුබල) වස්සන් එතෙර කරවීය. ඔහුදු ගඟ සරස ස්‍රොතස් බිඳ සුවසේ පරතෙර වත්හ. -

භූතපුබ්බං භික්ඛවෙ වච්ඡකො තරුණකො තාවදෙව ජාතකො මාතුගොරවකෙන වුය්හමානො, සොපි තිරියං ගඞ්ගාය සොතං ඡෙත්වා සොත්ථිනා පාරං අගමාසි. තං කිස්ස හෙතු? තථා හි සො භික්ඛවෙ මාගධකො ගොපාලකො සප්පඤ්ඤජාතිකො වස්සානං පච්ඡිමෙ මාසෙ සරදසමයෙ සමවෙක්ඛිත්වා ගඞ්ගාය නදියා ඔරිමං තීරං සමවෙක්ඛිත්වා පාරිමං තීරං තිත්ථෙනෙව ගාවො පතාරෙසි උත්තරං තීරං සුවිදෙහානං.

5. එවමෙව ඛො භික්ඛවෙ යෙ කෙචි සමණා වා බ්‍රාහ්මණා වා කුසලා ඉමස්ස ලොකස්ස, කුසලා පරස්ස ලොකස්ස, කුසලා මාරධෙය්‍යස්ස, කුසලා අමාරධෙය්‍යස්ස, කුසලා මච්චුධෙය්‍යස්ස, කුසලා අමච්චුධෙය්‍යස්ස, තෙසං යෙ සොතබ්බං සද්දහාතබ්බං මඤ්ඤිස්සන්ති, තෙසං තං භවිස්සති දීඝරත්තං හිතාය සුඛාය.

6. සෙය්‍යථාපි භික්ඛවෙ යෙ තෙ උසභා ගොපිතරො ගොපරිණායකා තිරියං ගඞ්ගාය සොතං ඡෙත්වා සොත්ථිනා පාරං අගමංසු, එවමෙව ඛො භික්ඛවෙ යෙ තෙ භික්ඛූ අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනුප්පත්තසදත්ථා පරික්ඛීණභවසංයොජනා සම්මදඤ්ඤා විමුත්තා, තෙ[1] තිරියං මාරස්ස සොතං ඡෙත්වා සොත්ථිනා පාරං ගතා.[2]

7 සෙය්‍යථාපි තෙ භික්ඛවෙ බලවගාවො දම්මගාවො තිරියං ගඞ්ගාය සොතං ඡෙත්වා සොත්ථිනා පාරං අගමංසු, එවමෙව ඛො භික්ඛවෙ යෙ තෙ භික්ඛූ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්ථ පරිනිබ්බායිනො අනාවත්තිධම්මා තස්මා ලොකා, තෙපි තිරියං මාරස්ස සොතං ඡෙත්වා සොත්ථිනා පාරං ගමිස්සන්ති.

8. සෙය්‍යථාපි තෙ භික්ඛවෙ වච්ඡතරා වච්ඡතරියො තිරියං ගඞ්ගාය සොතං ඡෙත්වා සොත්ථිනා පාරං අගමංසු, එවමෙව ඛො භික්ඛවෙ යෙ තෙ භික්ඛූ තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමිනො සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති, තෙපි තිරියං මාරස්ස සොතං ඡෙත්වා සොත්ථිනා පාරං ගමිස්සන්ති.

9. සෙය්‍යථාපි තෙ භික්ඛවෙ වච්ඡකා කිසබලකා තිරියං ගඞ්ගාය සොතං ඡෙත්වා සොත්ථිනා පාරං අගමංසු, එවමෙව ඛො භික්ඛවෙ යෙ තෙ භික්ඛූ තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නා අවිනිපාතධම්මා සම්බොධිපරායනා, තෙපි තිරියං මාරස්ස සොතං ඡෙත්වා සොත්ථිනා පාරං ගමිස්සන්ති.

1. තෙපි, සතා PTS 2. ගමිස්සන්ති, සීමු.

Free Distribution www.aathaapi.org

මහණෙනි, පෙර වූවෙකි: එ දවස උපන් මවගේ 'හුං හුං' ගොරැවිත් ගෙණයනු ලබන ළදරුවස්සෙක් වී ද, ඒ වසු ද ගඟ සරස සැඩ වතුරු සිඳ ගෙණ සුවසේ පරතෙරට ගියේ ය. ඒ කවර හෙයින යත්: මහණෙනි, එපරිද්දෙන් මගධරටවැසි සප්‍රාඥ ස්වභාව ඇති ඒ ගොපලු වර්‍ෂාමාසය පිළිබඳ පැසුළුමස්හි ශරත්කාලයෙහි ගඞ්ගා නදියෙහි මෙ තෙර සලකා එ තෙර සලකා විදේහ රට සතු උතුරුඉවුරට සුදුසු තොටින් ම ගවයන් තැරැවීය.

5. මහණෙනි, එ පරිද්දෙන් ම යම් ම ශ්‍රමණයෝ වෙත් වයි බ්‍රාහ්මණයෝ වෙත් වයි මෙ ලෝකය පිළිබඳ දක්‍ෂ වෙත් ද, පරලොව පිළිබඳ දක්‍ෂ වෙත් ද, මාරධෙය්‍යය පිළිබඳ දක්‍ෂ වෙත් ද, අමාරධෙය්‍යය පිළිබඳ දක්‍ෂ වෙත් ද, මච්චුධෙය්‍යය පිළිබඳ දක්‍ෂ වෙත් ද, අමච්චුධෙය්‍යය පිළිබඳ දක්‍ෂ වෙත් ද, යමෙක් ඔවුන්ගේ වචනය ඇසිය යුතු කොට ඇදහිය යුතු කොට හඟිද්ද, එය ඔවුනට බොහෝකල් හිත පිණිස සුව පිණිස වන්නේ ය.

6. මහණෙනි, යම් සේ යම් ඒ ගොපිතෘ වූ ගොපරිණායක වූ වෘෂභයෝ ගඞ්ගානදිය සරස සැඩ වතුරු සිඳ ගෙණ සුවසේ පරතෙරට ගියාහු ද, මහණෙනි, එ පරිද්දෙන් ම ක්‍ෂීණාස්‍රව වූ වැස නිම වූ බඹසරවස් ඇති, සතර මඟින් කළ (සිවුසස් පිළිබඳ) සොළොස් කරණී ඇති, බහා තැබූ කෙලෙස් බර ඇති, පැමිණි රහත් ඵල ඇති, ක්‍ෂීණ භවසංයොජන ඇති, ඥනයෙන් මැනැවින් දැන පඤ්ඤාවිමුක්තීන් මිදුනු යම් ඒ රහත් භික්‍ෂූහු වෙත් ද, ඔහු මාරයාගේ තණ්හා නැමැති සැඩවතුරු සරස සිඳ සුවසේ සංසාරපාරයට (නිවනට) ගියාහුය.

7 මහණෙනි, යම් සේ ඒ බලවත් දැනතගවයෝ දැමියයුතු ගවයෝ ගඞ්ගානදිය සරස සැඩවතුරු සිඳ ගෙණ සුවසේ පරතෙර ගියාහු ද, මහණෙනි, එ පරිද්දෙත් ම යම් ඒ භික්‍ෂු කෙනෙක් ඔරම්භාගිය සංයෝජන පස නැති කිරීමෙන් බඹලොව උපපාදක වශයෙන් උපන්නාහු එහි පිරිනිවන්නාහු ඒ බ්‍රහ්මලෝකයෙන් පෙරළා නො එන ස්වභාව ඇත්තාහු වෙත් ද, ඔහු ද මාරයාගේ සැඩවතුරු සරස සිඳ සුවසේ සසර පරතෙරට හෙවත් නිවනට යන්නාහුය.

8. මහණෙනි, යම් සේ ඒ තනඟු වස්සෝ ද වැස්සෝ ද ගඞ්ගා නදියෙහි සරස සැඩවතුරු සිඳ ගෙන සුවසේ පරතෙරට ගියාහු ද, මහණෙනි, එ පරිද්දෙත් ම යම් ඒ භික්‍ෂු කෙනෙක් ත්‍රිවිධ සංයොජනයන්ගේ පරික්‍ෂයයෙන් රාගද්වෙෂමොහයන් තුනු බැවින් සකෘදාගාමි වූවාහු වරක් ම මේ ලොකයට අවුත් දුක් කෙළවර කරන්නාහු ද, ඔහු ද මාරයාගේ ස්‍රොතස් සරස සිඳ සුවසේ සසරපරතෙරට යන්නාහ.

9. මහණෙනි, යම් සේ දුබල වස්සෝ ගඞ්ගානදියෙහි සැඩ-වතුරු සරස සිඳ ගෙණ සුවසේ පරතෙර ගියාහු ද, මහණෙනි, එපරිද්දෙත් ම යම් ඒ භික්‍ෂු කෙනෙක් තුන් සංයොජන ක්‍ෂය කිරීමෙන් සෝවත් වූවාහු අවිනිපාතස්වභාව ඇත්තාහු, ගතිනියත වූවාහු, සම්බොධිපරායණ වූවාහු වෙත් ද, ඔහු ද මාරයාගේ ස්‍රොතස් සරස සිඳ සුවසේ සසරපරතෙරට යන්නාහ.

10. සෙය්‍යථාපි සො භික්ඛවෙ වච්ඡකො තරුණකො තාවදෙව ජාතකො මාතුගොරවකෙන වුය්හමානො තිරියං ගඞ්ගාය සොතං ඡෙත්වා සොත්ථිනා පාරං අගමාසි, එවමෙව ඛො භික්ඛවෙ යෙ තෙ භික්ඛූ ධම්මානුසාරිනො සද්ධානුසාරිනො, තෙපි තිරියං මාරස්ස සොතං ඡෙත්වා සොත්ථිනා පාරං ගමිස්සන්ති.

11. අහං ඛො පන භික්ඛවෙ කුසලො ඉමස්ස ලොකස්ස, කුසලො පරස්ස ලොකස්ස, කුසලො මාරධෙය්‍යස්ස, කුසලො අමාරධෙය්‍යස්ස, කුසලො මච්චුධෙය්‍යස්ස, කුසලො අමච්චුධෙය්‍යස්ස. තස්ස මය්හං භික්ඛවෙ යෙ සොතබ්බං සද්දහාතබ්බං මඤ්ඤිස්සන්ති, තෙසං තං භවිස්සති දීඝරත්තං හිතාය සුඛායාති.

12. ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

“අයං ලොකො පරො ලොකො[1] ජානතා සුප්පකාසිතො,
යඤ්ච මාරෙන සම්පත්තං අප්පත්තං යඤ්ච මච්චුනා,
සබ්බං ලොකං අභිඤ්ඤාය සම්බුද්ධෙන පජානතා,
විවටං අමතද්වාරං ඛෙමං නිබ්බානපත්තියා.
ඡින්නං පාපිමතො සොතං විද්ධස්තං විනළීකතං,[2]
පාමුජ්ජබහුලා හොථ ඛෙමං පත්ථෙථ[3] භික්ඛවො”ති.

චූළගොපාලකසුත්තං චතුත්ථං.

1. 4. 5.

චූළසච්චකසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන සච්චකො නිගණ්ඨපුත්තො වෙසාලියං පටිවසති භස්සප්පවාදිකො[4] පණ්ඩිතවාදො සාධුසම්මතො බහුජනස්ස. සො වෙසාලියං පරිසතිං[5] එවං වාචං භාසති: “නාහං තං පස්සාමි සමණං වා බ්‍රාහ්මණං වා සඞ්ඝිං ගණිං ගණාචරියං, අපි[6] අරහන්තං සම්මාසම්බුද්ධං පටිජානමානං, යො මයා වාදෙන වාදං සමාරද්ධො න සඞ්කම්පෙය්‍ය න සම්පකම්පෙය්‍ය න සම්පවෙධෙය්‍ය, යස්ස න කච්ඡෙහි සෙදා මුච්චෙය්‍යුං.–

1. පරලොකො සීමු. PTS 2. විනළීකතං, මජසං.
3. පත්ථෙථා තිපි පාඨො - අට්ඨකථා, පත්ථෙථ, මජසං. PTS
4. භස්සප්පවාදකො, මජසං 5 පරිසති, මජසං. 6 අපි ච, මජසං. සසං.

10. මහණෙනි, යම් සේ එ දවස උපන් මවගේ ගොරවිත් ගෙණයනු ලබන ළදරු වසුපැටියෙක් ගඞ්ගානදියෙහි සැඩවතුරු සරස සිඳ ගෙණ සුවසේ පරතෙර ගියේ ද, මහණෙනි, එ පරිද්දෙන් ම ධම්මානුසාරි (ප්‍රඥාධික) වූ ද සද්ධානුසාරි (ශ්‍රද්ධාධික) වූ ද යම් ඒ (ප්‍රථම මාර්‍ග සමඞ්ගී) භික්ෂු කෙනෙක් වෙත් ද, ඔහු ද මාරයාගේ ස්‍රොතස් සරස සිඳ ගෙණ සුවසේ පරතෙර යත්තාහ

11. මහණෙනි, මම වනාහි මේ ලොකය පිළිබඳව දක්ෂ වෙමි. පරලොව පිළිබඳව දක්ෂ වෙමි. මාරධෙය්‍යය පිළිබඳව දක්ෂ වෙමි. අමාරධෙය්‍යය පිළිබඳව දක්ෂ වෙමි. මච්චුධෙය්‍යය පිළිබඳව දක්ෂ වෙමි. අමච්චුධෙය්‍යය පිළිබඳව දක්ෂ වෙමි. මහණෙනි, ඒ මාගේ වචනය යම් කෙනෙක් ඇසිය යුතු කොට ඇදහිය යුතු කොට හඟිත් ද, ඔවුනට එය බොහෝ කල් හිත පිණිස සුව පිණිස පවත්නේ ය.

12. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක. තෙල වදරා සුගත වූ ශාස්තෘන් වහන්සේ ඉක්බිතිව අන්‍ය වූ මේ ගාථා වදාළ සේක:

"හැම දහම් දත්තා බුදුරජුන් විසින් මෙලොව හා පරලොව මනාව වදරණ ලදී. මාරයා විසින් යමෙක් පැමිණෙන ලද ද, මාරයා විසින් යමෙක් නො පැමිණෙන ලද ද, සියල්ල දත්නා බුදුරජුන් විසින් ඒ සියලු ලෝකය විශිෂ්ටඥානයෙන් දැන නිවනට පැමිණීම පිණිස නිර්භය වූ ආර්‍ය්‍යමාර්‍ගය විවෘත කරණ ලදී. පාපී මාරයාගේ තෘෂ්ණා නැමැති සැඩ වතුරු සිඳින ලදී. විනාශ කරණ ලදී. මාන නළ දුරු කරණ ලදී. මහණෙනි, ප්‍රමොද බහුල කොට ඇත්තෝ වවු. නිවන පතවු."

සිවුවන චූලගොපාලකසූත්‍රය යි.

1. 4. 5.

චූලසච්චක සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර නිසා මහවනයෙහි කූටාගාරශාලා නම් ගඳකිළියෙහි වැඩ වසන සේක. එ කල්හි කථාමාර්‍ග කියන පණ්ඩිතවාද ඇති, 'සාධු' ය යි බොහෝ දෙනා විසින් සම්මත සච්චක නම් නුවටපුත් විශාලා මහනුවර වෙසේ. හෙ විශාලා මහනුවර පිරිස්හි මෙසේ බෙණේ: මා විසින් කථාමාර්‍ගයෙන් දෙස් ඇරුවූ යම් කිසිවෙක් කම්පිත නො වන්නේ ද, ප්‍රකම්පිත නො වන්නේ ද, වෙව්ලා නො යන්නේ ද, යමකුගේ කක්ෂයෙන් සොවද නො සිලියේ ද, එබඳු වූ, ශිෂ්‍යසඞ්ඝ ඇති, ශිෂ්‍යගණ ඇති, ගණාචාර්‍ය්‍ය, ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයකු හෝ - 'රහත්මි'යි 'බුදුමි'යි පිළිණ කරනුවකු පවා නො දකිමි. -

ථූණඤ්චෙව පහං[1] අචෙතනං වාදෙන වාදං සමාරභෙය්‍යං, සාපි මයා වාදෙන වාදං සමාරද්ධා[2] සකම්පෙය්‍ය සම්පකම්පෙය්‍ය සම්පවෙධෙය්‍ය. කො පන වාදො මනුස්සභූතස්සා''ති.

2. අථ ඛො ආයස්මා අස්සජි පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය වෙසාලිං පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො සච්චකො නිගණ්ඨපුත්තො වෙසාලියං ජඞ්ඝාවිහාරං අනුචඞ්කමමානො අනුවිචරමානො ආයස්මන්තං අස්සජිං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන යෙනායස්මා අස්සජි තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා අස්සජිනා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං[3] වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සච්චකො නිගණ්ඨපුත්තො ආයස්මන්තං අස්සජිං එතදවොච:

''කථං පන භො අස්සජි සමණො ගොතමො සාවකෙ විනෙති, කථම්භාගා ච පන සමණස්ස ගොතමස්ස සාවකෙසු අනුසාසනී බහුලා පවත්තතී''ති.

එවං ඛො අග්ගිවෙස්සන භගවා සාවකෙ විනෙති, එවම්භාගා ච පන භගවතො සාවකෙසු අනුසාසනී බහුලා පවත්තති:

''රූපං භික්ඛවෙ අනිච්චං, වෙදනා අනිච්චා, සඤ්ඤා අනිච්චා, සඞ්ඛාරා අනිච්චා, විඤ්ඤාණං අනිච්චං. රූපං භික්ඛවෙ අනත්තා, වෙදනා අනත්තා, සඤ්ඤා අනත්තා, සඞ්ඛාරා අනත්තා, විඤ්ඤාණං අනත්තා. සබ්බෙ සඞ්ඛාරා අනිච්චා, සබ්බෙ ධම්මා අනත්තා''ති.

එවං ඛො අග්ගිවෙස්සන භගවා සාවකෙ විනෙති. එවම්භාගා ච පන භගවතො සාවකෙසු අනුසාසනී බහුලා පවත්තතීති.

''දුස්සුතං වත භො අස්සජි අස්සුම්හ, යෙ මයං එවංවාදිං සමණං ගොතමං අස්සුම්හ. අප්පෙව නාම මයං කදාචි කරහචි තෙන භොතා ගොතමෙන සද්ධිං සමාගච්ඡෙය්‍යාම, අප්පෙව නාම සියා කොචිදෙව කථාසල්ලාපො, අප්පෙව නාම තස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙය්‍යාමා''ති.

3. තෙන ඛො පන සමයෙන පඤ්චමත්තානි ලිච්ඡවිසතානි සන්ථාගාරෙ සන්නිපතිතානි හොන්ති කෙනචිදෙව කරණීයෙන. අථ ඛො සච්චකො නිගණ්ඨපුත්තො යෙන තෙ ලිච්ඡවී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ ලිච්ඡවී එතදවොච:

''අභික්කමන්තු භොන්තො ලිච්ඡවී! අභික්කමන්තු භොන්තො ලිච්ඡවී! අජ්ජ මෙ සමණෙන ගොතමෙන සද්ධිං කථාසල්ලාපො භවිස්සති. සචෙ මෙ සමණො ගොතමො තථා පතිට්ඨිස්සති, යථාස්ස[4] මෙ ඤාතඤ්ඤතරෙන සාවකෙන අස්සජිනා නාම භික්ඛුනා පතිට්ඨිතං, සෙය්‍යථාපි නාම බලවා පුරිසො දීඝලොමිකං එළකං ලොමෙසු ගහෙත්වා ආකඩ්ඪෙය්‍ය පරිකඩ්ඪෙය්‍ය සම්පරිකඩ්ඪෙය්‍ය, එවමෙවාහං සමණං ගොතමං වාදෙන වාදං ආකඩ්ඪිස්සාමි පරිකඩ්ඪිස්සාමි සම්පරිකඩ්ඪිස්සාමි. -

---

1. ථූනං පාහං, මජසං. 2 සොපි මයා වාදෙන වාදං සමාරද්ධො, මජසං.
3 සාරණීයං, මජසං. 4 යථාච මෙ, මජසං. - සයා.

ඉදින් මම අචේතනික වූ ටඹට වාදයෙන් වාදාරෝපණය කරන්නෙම් නම්, මා විසින් වාදාරෝපණ කරණ ලද ඒ ටඹ ද කම්පිත වන්නේ ය. ප්‍රකම්පයෙත් කම්පිත වන්නේ ය. වෙව්ලා යන්නේ ය. මිනිසකුට වාදාරෝපණ කෙළෙම් නම් කවර කථා ය''.

2. ඉක්බිති ආයුෂ්මත් අස්සජි තෙරණුවෝ පෙරවරුයෙහි හැඳ පෙරෙව පා සිවුරු ගෙණ විශාලානුවර පිඬු පිණිස පිවිසියහ. සච්චක නිර්ග්‍රන්ථ පුත්‍රද විශාලා නුවර ජඞ්ඝාවිහාර පිණිස සක්මන් කරනුයේ (රජගෙන් රජගෙට පයින් වැදූ) ඇවිදුනේ අස්සජි තෙරණුවන් දුරදී ම එනුවන් දුටුවේ ය. දැක ආයුෂ්මත් අස්සජි තෙරණුවන් කරා පැමිණියේ ය. පැමිණ ආයුෂ්මත් අස්සජි තෙරණුවන් හා සතුටු වී තුස්නට. නිසි සිහි කරනුවට නිසි කථා කොට නිමවා එකත්පස්සක සිටියේ ය. එකත්පසෙක සිටි සච්චක නුවට පුත් ආයුෂ්මත් අස්සජි තෙරුන්හට තෙල කී ය:

“කියග අස්සජිය, මහණ ගොයුම් සව්වන් කෙසේ හික්මවයි ද, මහණ ගොයුම්හුගේ සව්වන් කෙරෙහි කෙබඳු අනුශාසනා බහුලව පවත්නී ද?”

ගිනිවෙස්න, මෙසේ භාග්‍යවතුන් වහන්සේ සව්වන් හික්මවන සේක. ශ්‍රාවකයන් කෙරෙහි භාග්‍යවතුන් වහන්සේගේ මෙබඳු අනුශාසනා බහුලව පවත්නී ය:

“මහණෙනි, රූප අනිත්‍ය ය, වේදනා අනිත්‍ය ය, සංඥා අනිත්‍ය ය, සංස්කාරයෝ අනිත්‍යයහ, විඥාන අනිත්‍ය ය. මහණෙනි, රූප අනාත්ම ය, වේදනා අනාත්ම ය, සංඥා අනාත්ම ය, සංස්කාරයෝ අනාත්මයහ, විඥානය, අනාත්මය. සියලු සංස්කාරයෝ අනිත්‍යයහ. සියලු ධර්මයෝ අනාත්මයහ” කියා යි.

ගිනිවෙස්න, මේ අයුරින් භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන් හික්මවන සේක. භාග්‍යවතුන් වහන්සේගේ මෙබඳු අනුශාසනා සව්වන් කෙරෙහි බහුලව පවත්නීය.

“භවත් අස්සජිය, අපි ශ්‍රමණ ගෞතමයන් මෙවැනි වාද ඇතියවූන් ඇසුමෝ ද, නො ඇසුව යුතු දෑයක් ම ඇසුම්හ. අපි යම් කිසි දවසෙක ඒ භවත් ගෞතමයන් හා හමුවට යන්නමෝ නම් මනා මැනු. කිසියම් කථා බිණීමෙක් උපන් නම් මනා මැනු. ඒ පවිටු මිථ්‍යාදෘෂ්ටියෙන් ගලවා පියන්නමෝ නම් මනා මැනු” යි සච්චක කී.

3. ඒ කල පන්සියක් පමණ ලිච්ඡවීහු කිසි කාර්යයක් සඳහා සන්ථාගාරයෙහි රැස්වූහු. එකල්හි සච්චක නිගණ්ඨපුත් ඒ ලිච්ඡවීන් වෙත එළඹියේ ය. එළඹ ඒ ලිච්ඡවීන්ට තෙල කී:

භවත් ලිච්ඡවීනි, එන්වා! භවත් ලිච්ඡවීනි එන්වා! අද මහණ ගොයුම් හා මාගේ කථාසල්ලාප වෙයි. යම් සේ ඔහුගේ විඛ්‍යාත – ප්‍රසිද්ධ (පස්වග ශ්‍රාවකයන් කෙරෙහි) එක්තරා ශ්‍රාවකයකු වූ අස්සජි නම් මහණහු විසින් මට යම්සේ (වචනයෙන්) පිහිටන ලද ද, ඉදින් මහණ ගොයුම් මට එසේ පිහිටා සිටින්නේ නම්, යම් සේ බල ඇති පුරුෂයෙක් දික් ලොම් ඇති එළුවකු ලොමැ ගෙණ (ඔබට මොබට ලා) ආකර්ෂණ පරිකර්ෂණ සම්පරිකර්ෂණ කෙරේ ද, එසෙයින් ම මම් මහණ ගොයුම්හු වාදයෙන් වාද කොට ආකර්ෂණ පරිකර්ෂණ සම්පරිකර්ෂණ කරම්. –

සෙය්‍යථාපි නාම බලවා සොණ්ඩිකාකම්මකරො මහන්තං සොණ්ඩිකාකිලඤ්ජං ගම්භීරෙ උදකරහදෙ පක්ඛිපිත්වා කණ්ණෙ ගහෙත්වා ආකඩ්ඪෙය්‍ය පරිකඩ්ඪෙය්‍ය සම්පරිකඩ්ඪෙය්‍ය, එවමෙවාහං සමණං ගොතමං වාදෙන වාදං ආකඩ්ඪිස්සාමි පරිකඩ්ඪිස්සාමි සම්පරිකඩ්ඪිස්සාමි. සෙය්‍යථාපි නාම බලවා සොණ්ඩිකාධුත්තො වාලං කණ්ණෙ ගහෙත්වා ඔධුනෙය්‍ය නිද්ධුනෙය්‍ය නිච්ඡාදෙය්‍ය,[1] එවමෙවාහං සමණං ගොතමං වාදෙන වාදං ඔධුනිස්සාමි නිද්ධුනිස්සාමි නිච්ඡාදෙස්සාමි. සෙය්‍යථාපි නාම කුඤ්ජරො සට්ඨිහායනො ගම්භීරං පොක්ඛරණිං ඔගහෙත්වා[2]. සණධොවිකං[3] නාම කීළිතජාතං කීළති, එවමෙවාහං සමණං ගොතමං සණධොවිකං මඤ්ඤෙ කීළිතජාතං කීළිස්සාමි. අභික්කමන්තු භොන්තො ලිච්ඡවී! අභික්කමන්තු භොන්තො ලිච්ඡවී! අජ්ජ මෙ සමණෙන ගොතමෙන සද්ධිං කථාසල්ලාපො භවිස්සතී''ති.

4. තත්‍රෙකච්චෙ ලිච්ඡවී එවමාහංසු: "කිං සමණො ගොතමො සච්චකස්ස නිගණ්ඨපුත්තස්ස වාදං ආරොපෙස්සති, අථ ඛො සච්චකො නිගණ්ඨපුත්තො සමණස්ස ගොතමස්ස වාදං ආරොපෙස්සතී''ති. එකච්චෙ ලිච්ඡවී එවමාහංසු: "කිං සො භවමානො සච්චකො නිගණ්ඨපුත්තො[4] භගවතො වාදං ආරොපෙස්සති, අථ ඛො භගවා සච්චකස්ස නිගණ්ඨපුත්තස්ස වාදං ආරොපෙස්සතී''ති.

5. අථ ඛො සච්චකො නිගණ්ඨපුත්තො පඤ්චමත්තෙහි ලිච්ඡවිසතෙහි පරිවුතො යෙන මහාවනං කූටාගාරසාලා තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ අබ්භොකාසෙ චඞ්කමන්ති. අථ ඛො සච්චකො නිගණ්ඨපුත්තො යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: කහං නු ඛො භො එතරහි සො භවං ගොතමො විහරති? දස්සනකාමා හි මයං තං භවන්තං ගොතමන්ති. "එසග්ගිවෙස්සන භගවා මහාවනං අජ්ඣොගහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසින්නො''ති.

6. අථ ඛො සච්චකො නිගණ්ඨපුත්තො මහතියා ලිච්ඡවිපරිසාය සද්ධිං මහාවනං අජ්ඣොගහෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. තෙපි ඛො ලිච්ඡවී අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ යෙන භගවා තෙනඤ්ජලිං පනාමෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ භගවතො සන්තිකෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො සච්චකො නිගණ්ඨපුත්තො භගවන්තං එතදවොච: පුච්ඡෙය්‍යාහං භවන්තං ගොතමං කඤ්චිදෙව දෙසං, සචෙ මෙ භවං ගොතමො ඔකාසං කරොති පඤ්හස්ස වෙය්‍යාකරණායාති. "පුච්ඡග්ගිවෙස්සන යදාකඞ්ඛසී''ති.

---

1 නිප්පොඨෙය්‍ය මජසං - නිප්පොඨෙය්‍ය, සයා. - නිච්ඡාදෙය්‍ය, PTS.
2. ඔගාහෙත්වා, මජසං. ඔගයිත්වා, PTS.   3. සණධොපිකං, සී.
4. කිං සො භවමානො සච්චකො නිගණ්ඨපුත්තො යො, මජසං. - සයා.
කිං සො භවමානො සච්චකො නිගණ්ඨපුත්තො සො. සී.

Free Distribution www.aathaapi.org

යම් සේ බලවත් සුරාකම්කරුවෙක් මහත් වූ පිපි පැදුරු ගැඹුරු විලෙක බහා දෙකන ගෙන ආකර්ෂණ පරිකර්ෂණ සම්පරිකර්ෂණ කෙරේ ද, එ පරිද්දෙන් ම මම ශ්‍රමණ ගෞතමයන් වාදයෙන් වාද කොට ආකර්ෂණ, පරිකර්ෂණ, සම්පරිකර්ෂණ කරමි. යම් සේ ශක්තිමත් සුරා බූතීයෙක් රහපරහන (මට්ටුලුකස්ස) දෙකන ගෙන යටිකුරු කොට සලා පියා ද, උඩුකුරු කොට සලා පියා ද, නැවැත නැවැත ගසාපියාද, එසේම මම ශ්‍රමණ ගෞතමයන් වාදයෙන් වාද කොට අවධූනන නිර්ධූනන කරමි. නිෂ්ඵොටනය (පොලාලීම) ද කරමි. යම් සේ සැටවයස් පිරුණු ඇතෙක් ගැඹුරු පොකුණකට බැස සණදෙවුන්කෙළි කෙළී ද මෙ පරිද්දෙන් ම මම ශ්‍රමණගෞතමයන් සමඟ සණදෙවුන්කෙළි වැනි වාදකෙළියක් කෙළිමි. භවත් ලිච්ඡවීනි, එන්වා. භවත් ලිච්ඡවීනි, එන්වා. අද ශ්‍රමණ ගෞතමයන් සමඟ මාගේ කථාසල්ලාපයෙක් වන්නේ ය"යි.

4. එහි ඇතැම් ලිච්ඡවි කෙනෙක් මෙසේ කීහ: "ශ්‍රමණගෞතම සච්චක නිගණ්ඨපුත්‍රහට කුමන වාදාරෝපණයක් කරන්නේ ද, සච්චක නිගණ්ඨපුත්‍ර ශ්‍රමණගෞතමයන්ට වාදාරෝපණය කරනු මිස" කියා යි ඇතැම් ලිච්ඡවීහු මෙසේ කීහ: "සච්චකනිගණ්ඨපුත්‍ර හෙ (යක්, දෙවි, බඹ) ඇ කවරක්ව සිටිමින් භාග්‍යවතුන් වහන්සේට වාදාරෝපණය කරන්නේ ද, වැලි භාග්‍යවතුන් වහන්සේ සච්චකනිගණ්ඨපුත්‍රහට වාදාරෝපණය කරනු මිස"යි.

5. එකල්හි සච්චකනිගණ්ඨපුත්‍ර පන්සියක් පමණ ලිච්ඡවීන් පිරිවරා ගෙන මහවනවෙහෙර කූටාගාරශාලාව වෙත පැමිණියේ ය. එසමයෙහි බොහෝ මහණහු අභ්‍යවකාශයෙහි සක්මන් කෙරෙත්. ඉක්බිති සච්චකනිගණ්ඨපුත්‍ර ඒ භික්ෂූන් වෙත එළඹියේ ය. එළඹ ඒ භික්ෂූන්ට තෙල කී: භවත්නි, ඒ භවත් ගෞතම දැන් කොහි වෙසෙයි ද? අපි ඒ භවත් ගෞතමයන් දක්නා කැමැත්තම්හ. "ගිහිවෙස්ත, භාග්‍යවතුන් වහන්සේ මහාවනයට වැද එක්තරා රුක්මුලෙක දිවාවිහාර පිණිස හුන් සේක"යි කීහු.

6. එසඳ සච්චකනිගණ්ඨපුත්‍ර මහත් ලිච්ඡවී පිරිස් සමඟ මහවන වැද භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ හා සමඟ සතුටු විය. තුස්නට නිසි සිහි කරනුවට නිසි කථා කොට නිමවා එකත්පසෙක හිඳ. ඒ ලිච්ඡවීහු ද - ඇතැම්හු භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්හ. ඇතැම්හු භාග්‍යවතුන් වහන්සේ සමඟ සතුටු වූහ. සමෙමාදනීය සාරාණීය කථා කොට නිමවා එකත්පසෙක හුන්හ. ඇතැම්හු භාග්‍යවතුන් වහන්සේ දෙසට ඇඳිලි බැඳ එකත්පසෙක හුන්හ. ඇතැම්හු භාග්‍යවතුන් වහන්සේ පෙරට නම් ගොත් අස්වා එකත්පසෙක හුන්හ. ඇතැම්හු තුෂ්ණීම්භූත වූවාහු එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් සච්චක නුවටදරු භාග්‍යවතුන් වහන්සේට තෙල කී: "මම භවත් ගොයුම්හු කිසි දෙසක් පිළිවිසියැටියෙමි. භවත් ගොයුම්හාණන් ප්‍රශ්න විසඳනු සඳහා මට අවකාශයක් කළ හොතිනැ"කියායි. "ගිහිවෙස්ත, රිසියෙන දැයක් පුළුවුස"යි පවරා වදාළහ.

Free Distribution www.aathaapi.org

7. "කථං පන භවං ගොතමො සාවකෙ විනෙති, කථම්භාගා ච පන භොතො ගොතමස්ස සාවකෙසු අනුසාසනී බහුලා පවත්තතී"ති.

එවං ඛො අහං අග්ගිවෙස්සන සාවකෙ විනෙමි, එවම්භාගා ච පන මෙ සාවකෙසු අනුසාසනී බහුලා පවත්තති: රූපං භික්ඛවෙ අනිච්චං, වෙදනා අනිච්චා, සඤ්ඤා අනිච්චා, සඞ්ඛාරා අනිච්චා, විඤ්ඤාණං අනිච්චං. රූපං භික්ඛවෙ අනත්තා, වෙදනා අනත්තා, සඤ්ඤා අනත්තා, සඞ්ඛාරා අනත්තා, විඤ්ඤාණං අනත්තා. සබ්බෙ සඞ්ඛාරා අනිච්චා, සබ්බෙ ධම්මා අනත්තාති. එවං ඛො අහං අග්ගිවෙස්සන සාවකෙ විනෙමි, එවම්භාගා ච පන මෙ සාවකෙසු අනුසාසනී බහුලා පවත්තතීති.

8. "උපමා මං භො ගොතම පටිභාතී"ති. "පටිභාතු තං අග්ගිවෙස්සනා"ති භගවා අවොච.

"සෙය්‍යථාපි භො ගොතම යෙ කෙචිමෙ බීජගාමභූතගාමා වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති, සබ්බෙ තෙ පඨවිං නිස්සාය පඨවියං පතිට්ඨාය එවමෙතෙ බීජගාමභූතගාමා වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති. සෙය්‍යථාපි වා පන භො ගොතම යෙ කෙචිමෙ බලකරණීයා කම්මන්තා කරීයන්ති, සබ්බෙ තෙ පඨවිං නිස්සාය පඨවියං පතිට්ඨාය එවමෙතෙ බලකරණීයා කම්මන්තා කරීයන්ති. එවමෙව ඛො භො ගොතම රූපත්තායං පුරිසපුග්ගලො රූපෙ පතිට්ඨාය පුඤ්ඤං වා අපුඤ්ඤං වා පසවති. වෙදනත්තායං පුරිසපුග්ගලො වෙදනායං පතිට්ඨාය පුඤ්ඤං වා අපුඤ්ඤං වා පසවති. සඤ්ඤත්තායං පුරිසපුග්ගලො සඤ්ඤායං පතිට්ඨාය පුඤ්ඤං වා අපුඤ්ඤං වා පසවති. සඞ්ඛාරත්තායං පුරිසපුග්ගලො සඞ්ඛාරෙසු පතිට්ඨාය පුඤ්ඤං වා අපුඤ්ඤං වා පසවති. විඤ්ඤාණත්තායං පුරිසපුග්ගලො විඤ්ඤාණෙ පතිට්ඨාය පුඤ්ඤං වා අපුඤ්ඤං වා පසවතී"ති.

9. නනු ත්වං අග්ගිවෙස්සන එවං වදෙසි: "රූපං මෙ අත්තා, වෙදනා මෙ අත්තා, සඤ්ඤා මෙ අත්තා, සඞ්ඛාරා මෙ අත්තා, විඤ්ඤාණං මෙ අත්තා"ති.

"අහං හි භො ගොතම එවං වදාමි: රූපං මෙ අත්තා, වෙදනා මෙ අත්තා, සඤ්ඤා මෙ අත්තා, සඞ්ඛාරා මෙ අත්තා, විඤ්ඤාණං මෙ අත්තාති. අයඤ්ච මහතී ජනතා"ති.

කිං හි තෙ අග්ගිවෙස්සන මහතී ජනතා කරිස්සති ඉඞ්ඝ ත්වං අග්ගිවෙස්සන සකංයෙව වාදං නිබ්බෙඨෙහී"ති.

"අහං හි භො ගොතම එවං වදාමි: රූපං මෙ අත්තා, වෙදනා මෙ අත්තා, සඤ්ඤා මෙ අත්තා, සඞ්ඛාරා මෙ අත්තා, විඤ්ඤාණං මෙ අත්තා"ති.

7. "භවත් ගෞතමයෝ කෙසේ ශ්‍රාවකයන් හික්මවත් ද? ශ්‍රමණ ගෞතමයන්ගේ කෙබඳු අනුශාසනා ශ්‍රාවකයන් කෙරෙහි බහුලව පවත්නී ද?"

ගිහිවෙස්න, මම මෙසේ ශ්‍රාවකයන් හික්මවමි. මාගේ මෙබඳු අනුශාසනා ශ්‍රාවකයන් කෙරෙහි බහුල වශයෙන් ඇත: මහණෙනි, රූප අනිත්‍ය ය, වේදනා අනිත්‍ය ය, සංඥා අනිත්‍ය ය, සංස්කාරයෝ අනිත්‍යයහ, විඥාන අනිත්‍ය ය. මහණෙනි, රූප අනාත්ම ය, වේදනා අනාත්ම ය, සංඥා අනාත්ම ය, සංස්කාරයෝ අනාත්මයහ, විඥාන අනාත්ම ය. සියලු සංස්කාරයෝ අනිත්‍යයහ. සියලු ධර්මයෝ අනාත්මයහ. ගිහිවෙස්න, මෙසේ වනාහි මම ශ්‍රාවකයන් හික්මවමි. ශ්‍රාවකයන් කෙරෙහි බහුල වශයෙන් මාගේ මෙබඳු අනුශාසනා ඇතැයි.

8. "භවත් ගෞතමයෙනි, මට උපමායෙක් වටහයි". "එ කියා, ගිහිවෙස්න"යි භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

"භවත් ගොයුම්ගොතුව, යම් මේ බීජගාමභූතගාම කෙනෙක් වෘද්ධියට විරූඪියට විපුලත්‍වයට පැමිණෙත් ද, ඒ සියලු බීජගාමභූතගාමයෝ පොළොව නිසා පොළොවෙහි පිහිටා වෘද්ධියට විරූඪියට විපුලත්‍වයට පැමිණෙත්. භවත් ගෞතමයෙනි, යම් සේ බාහුබලයෙන් කළ යුතු කර්මාන්ත කෙනෙක් වෙත් ද, ඒ හැමයෝ පොළොව නිසා පොළොවෙහි පිහිටා කරනු ලැබෙත්. භවත් ගෞතමයෙනි, එ පරිද්දෙන් ම රූප ආත්ම කොට ඇති මෙ පුරුෂපුද්ගල රූපයෙහි පිහිටා පින් හෝ පව් හෝ ප්‍රසව (රැස්) කෙරෙයි. වේදනා ආත්ම කොට ඇති මෙ පුරුෂපුද්ගල වේදනායෙහි පිහිටා පින් හෝ පව් හෝ ප්‍රසව කෙරෙයි. සංඥා ආත්ම කොට ඇති මේ පුරුෂපුද්ගල සංඥායෙහි පිහිටා පින් හෝ පව් හෝ ප්‍රසව කෙරෙයි. සංස්කාර ආත්ම කොට ඇති මේ පුරුෂපුද්ගල සංස්කාරයෙහි පිහිටා පින් හෝ පව් හෝ ප්‍රසව කෙරෙයි. විඥාණ ආත්ම කොට ඇති මේ පුරුෂ පුද්ගල විඥාණයෙහි පිහිටා පින් හෝ පව් හෝ ප්‍රසව කෙරෙයි."

9 කියග ගිහිවෙස්න, තෝ 'රූප මාගේ ආත්ම' ය, 'වේදනා මාගේ ආත්ම' ය, 'සංඥා මාගේ ආත්ම' ය, 'සංස්කාර මාගේ ආත්ම' ය, 'විඥාණ මාගේ ආත්ම' ය යෙහි නු?

"භවත් ගෞතමයෙනි, මම 'රූප මාගේ ආත්මය, වේදනා මාගේ ආත්ම ය, සංඥා මාගේ ආත්ම' ය, සංස්කාර මාගේ ආත්ම ය, විඥාණ මාගේ ආත්ම'ය යි යෙමි. මෙ මහාජනයෝ ද එ පරිදි කියති "

ගිහිවෙස්න, මහාජනයෝ තට කුම් කෙරෙද් ද? එබැවින් ගිහිවෙස්න, තො ම තාගේ වාද අවුල් බිඳ කියා'යි වදාළහ.

"භවත් ගෞතමයෙනි, මම වනාහි 'රූප මාගේ ආත්ම ය, වේදනා මාගේ ආත්ම ය, සංඥා මාගේ ආත්ම ය, සංස්කාර මාගේ ආත්ම ය, විඥාණ මාගේ ආත්මය' යි කියමි."

10. තෙන හි අග්ගිවෙස්සන තං යෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි. යථා තෙ ඛමෙය්‍ය, තථා නං බ්‍යාකරෙය්‍යාසි. තං කිං මඤ්ඤසි අග්ගිවෙස්සන, වත්තෙය්‍ය රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස[1] සකස්මිං විජිතෙ වසො: ඝාතෙතායං වා ඝාතෙතුං, ජාපෙතායං වා ජාපෙතුං, පබ්බාජෙතායං වා පබ්බාජෙතුං - සෙය්‍යථාපි රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස, සෙය්‍යථාපි වා පන රඤ්ඤො මාගධස්ස අජාතසත්තුස්ස වෙදෙහිපුත්තස්සාති?

"වත්තෙය්‍ය භො ගොතම රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස සකස්මිං විජිතෙ වසො: ඝාතෙතායං වා ඝාතෙතුං, ජාපෙතායං වා ජාපෙතුං, පබ්බාජෙතායං වා පබ්බාජෙතුං - සෙය්‍යථාපි රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස, සෙය්‍යථාපි වා පන රඤ්ඤො මාගධස්ස අජාතසත්තුස්ස වෙදෙහිපුත්තස්ස. ඉමෙසම්පි හි භො ගොතම සඞ්ඝානං ගණානං - සෙය්‍යථිදං: වජ්ජීනං, මල්ලානං වත්තති සකස්මිං විජිතෙ වසො: ඝාතෙතායං වා ඝාතෙතුං, ජාපෙතායං වා ජාපෙතුං, පබ්බාජෙතායං වා පබ්බාජෙතුං. කිං පන රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස සෙය්‍යථාපි රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස, සෙය්‍යථාපි වා පන රඤ්ඤො මාගධස්ස අජාතසත්තුස්ස වෙදෙහි පුත්තස්ස? වත්තෙය්‍ය භො ගොතම, වත්තිතුඤ්ච මරහතී"ති.

11. තං කිං මඤ්ඤසි අග්ගිවෙස්සන, යං ත්වං එවං වදෙසි: රූපං මෙ අත්තාති, වත්තති තෙ තස්මිං රූපෙ වසො: එවං මෙ රූපං හොතු, එවං මෙ රූපං මා අහොසීති? එවං වුත්තෙ සච්චකො නිගණ්ඨපුත්තො තුණ්හී අහොසි.

දුතියම්පි ඛො භගවා සච්චකං නිගණ්ඨපුත්තං එතදවොච: තං කිං මඤ්ඤසි අග්ගිවෙස්සන, යං ත්වං එවං වදෙසි: රූපං මෙ අත්තාති, වත්තති තෙ තස්මිං රූපෙ වසො: එවං මෙ රූපං හොතු, එවං මෙ රූපං මා අහොසීති? දුතියම්පි ඛො සච්චකො නිගණ්ඨපුත්තො තුණ්හී අහොසි.

අථ ඛො භගවා සච්චකං නිගණ්ඨපුත්තං එතදවොච: බ්‍යාකරොහි'දානි අග්ගිවෙස්සන, නදානි තෙ තුණ්හීභාවස්ස කාලො. යො කොචි අග්ගිවෙස්සන තථාගතෙන යාවතතියං සහධම්මිකං පඤ්හං පුට්ඨො න බ්‍යාකරොති, එත්ථෙවස්ස සත්තධා මුද්ධා ඵලතීති.

12. තෙන ඛො පන සමයෙන වජිරපාණී යක්ඛො ආයසං වජිරං ආදාය ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං සච්චකස්ස නිගණ්ඨපුත්තස්ස උපරිවෙහාසං ඨිතො හොති: "සචායං සච්චකො නිගණ්ඨපුත්තො භගවතා යාවතතියං සහධම්මිකං පඤ්හං පුට්ඨො න බ්‍යාකරිස්සති, එත්ථෙවස්ස සත්තධා මුද්ධං ඵාලෙස්සාමී"ති.

1. මුද්ධාභිසිත්තස්ස, මජසං.

10. ගිනිවෙස්න, (පස්කඳ ආත්ම ය යි පිළිගත කෙරෙහි ද) එකරුණින් මෙහිලා තා ම පිළිවිසිමි. යම් සේ තට රුස්නේ නම්, එසේ එය ප්‍රකාශ කරව. කියග ගිනිවෙස්න, ඒ කිමැයි හඟනුව? කැත්කුලෙහි උපන් මුදුනෙහි අභිෂික්ත රජක්හට – පසේනදි කොසොල් රජහට සෙයින්, නොහොත් මගධාධිපති වෙදෙහී පුත්‍ර අජාසත් රජහට සෙයින්, මරවත්නට නිසියන් මරවත්නට, ධනහානියට නිසියන් දිළිඳු කරන්නට, රටින් නෙරනට නිසියන් රටින් නෙරවන්නට සියරට ඉසුරු (බල) පවත්නේ ද?

"භවත් ගොයුම් ගොතුවෙනි, කැත්කුල උපන් මුදුනෙහි බිසෙස් කළ – රජක්හට පසෙනදි කොසොල් රජහට නොහොත් මගධාධිපති වෙදෙහිපුත්‍ර අජාසත් රජහට සෙයින්, මරවත්නට නිස්සත් මරවත්නට ධනහානියට නිස්සත් දිළිඳු කරවන්නට රටින් නඟනට නිස්සත් රටින් නංවන්නට සියරට ඉසුරු පවත්නේ ය. භවත් ගෞතමයෙනි, මේ සඞ්ඝයා ඇති ගණයා ඇති - එනම්, වැදූරට රජුන්හට ද මලරට රජුන්හට ද මරවත්නට නිස්සත් මරවන්නට ධනහානියට නිස්සත් දිළිඳු කරවන්නට රටින් නංවන්නට නිස්සත් රටින් නංවන්නට සියරට ඉසුරු පවත්නේ ය. පසේනදි කොසොල් රජුන් වැනි මගධාධිපති වෙදෙහිපුත්‍ර අජාසත් රජුන්වැනි කැත්කුල උපන් මුර්ධාභිෂික්ත රජහට කියනු කිම? භවත් ගෞතමයෙනි, උනට ඉසුරු ඇත් ම ය, පවත්නට ද නිසි ම යැයි" කී.

11. ගිනිවෙස්න, ඒ කිමැයි හඟනුව? 'රූප මාගේ ආත්මය' යි මෙසේ යමක් තෝ කීහි ද, 'මාගේ රූප මෙසේ වේවා. මාගේ රූප මෙසේ නො වේවා 'යි තාගේ ඉසුරු එ රූපයෙහි පවත්නේ ද? මෙසේ වදාළ කල්හි සච්චක තුවටදරු නො බිණී.

දෙවැනි වට ද භාග්‍යවතුන් වහන්සේ සච්චක නිගණ්ඨපුත්‍රයා තෙල පුළුවුත්හ. ගිනිවෙස්න, ඒ කිමැයි හඟනුව? 'රූප මාගේ ආත්මය' යන යමක් තෝ කීහි ද? 'මාගේ රූප මෙසේ වේවා. මාගේ රූප මෙසේ නො වේවා' යි ඒ රූපයෙහි තාගේ වසය පවත්නේ ද? සච්චක නිගණ්ඨපුත්‍ර දෙවැනි වට ද නො බිණී.

එක්බිති භාග්‍යවතුන් වහන්සේ සච්චක නිගණ්ඨපුත්‍රයාට තෙල වදාළහ: කියග ගිනිවෙස්න, දැන් කලි බණව, දැන් තා නො බණන්නට කාලය නො වේ. ගිනිවෙස්න, යම් කිසිවෙක් තථාගත විසින් සකාරණ කොට තුන්යලක් පැණ අසන ලද්දේ පිළිතුරු නො දේ නම්, මෙහි ම ඔහුගේ හිස සත්කඩව පැළෙන්නේ ය

12. එකල්හි වජ්‍රපාණි යක්ෂ (සක් දෙව් තෙම) ගිනිකඳ බඳු, ගිනි ගෙන දිලියෙන, හාත්පස වහනිජ්වාල වූ යමුවා වජ්‍රායුධ ගෙන සච්චක තුවටදරුවා හිස් මතුයෙහි අහස "ඉදින් මේ සච්චක තුවටපුත් භාග්‍යවතුන් වහන්සේ විසින් තුන්යලක් සකාරණ කොට පැන පුළුවුත්නා ලදුදු ප්‍රකාශ නො කරන්නේ වී නම් මෙහි ම ඔහුගේ මුදුන සත් කඩ කොට පලම්"යි සිටියේ යි.

තං ඛො පන වජිරපාණිං යක්ඛං භගවා චෙව පස්සති, සච්චකො ච නිගණ්ඨපුත්තො. අථ ඛො සච්චකො නිගණ්ඨපුත්තො භීතො සංවිග්ගො ලොමහට්ඨජාතො භගවන්තංයෙව තාණං ගවෙසී, භගවන්තංයෙව ලෙණං ගවෙසී, භගවන්තංයෙව සරණං ගවෙසී, භගවන්තං එතදවොච: පුච්ඡතු මං භවං ගොතමො, බ්‍යාකරිස්සාමීති.

13. තං කිං මඤ්ඤසි අග්ගිවෙස්සන, යං ත්වං එවං වදෙසි: රූපං මෙ අත්තාති, වත්තති තෙ තස්මිං රූපෙ වසො "එවං මේ රූපං හොතු. එවං මෙ රූපං මා අහොසී"ති. "නො හිදං භො ගොතම." මනසි කරොහි අග්ගිවෙස්සන, මනසි කරිත්වා ඛො අග්ගිවෙස්සන බ්‍යාකරොහි. න ඛො තෙ සන්ධියති පුරිමෙන වා පච්ඡිමං, පච්ඡිමෙන වා පුරිමං.

තං කිං මඤ්ඤසි අග්ගිවෙස්සන, යං ත්වං එවං වදෙසි: වෙදනා මෙ අත්තාති, වත්තති තෙ තායං වෙදනායං වසො "එවං මෙ වෙදනා හොතු. එවං මේ වෙදනා මා අහොසී"ති. "නො හිදං භො ගොතම." මනසි කරොහි අග්ගිවෙස්සන, මනසි කරිත්වා ඛො අග්ගිවෙස්සන බ්‍යාකරොහි. න ඛො තෙ සන්ධියති පුරිමෙන වා පච්ඡිමං, පච්ඡිමෙන වා පුරිමං.

තං කිං මඤ්ඤසි අග්ගිවෙස්සන, යං ත්වං එවං වදෙසි: සඤ්ඤා මෙ අත්තාති, වත්තති තෙ තායං සඤ්ඤායං වසො "එවං මෙ සඤ්ඤා හොතු. එවං මෙ සඤ්ඤා මා අහොසී"ති. "නො හිදං භො ගොතම." මනසි කරොහි අග්ගිවෙස්සන, මනසිකරිත්වා ඛො අග්ගිවෙස්සන බ්‍යාකරොහි. න ඛො තෙ සන්ධියති පුරිමෙන වා පච්ඡිමං, පච්ඡිමෙන වා පුරිමං.

තං කිං මඤ්ඤසි අග්ගිවෙස්සන, යං ත්වං එවං වදෙසි: සඞ්ඛාරා මෙ අත්තාති, වත්තති තෙ තෙසු සඞ්ඛාරෙසු වසො "එවං මෙ සඞ්ඛාරා හොන්තු. එවං මෙ සඞ්ඛාරා මා අහෙසු"න්ති. "නො හිදං භො ගොතම." මනසි කරොහි අග්ගිවෙස්සන, මනසි කරිත්වා ඛො අග්ගිවෙස්සන බ්‍යාකරොහි. න ඛො තෙ සන්ධියති පුරිමෙන වා පච්ඡිමං, පච්ඡිමෙන වා පුරිමං.

තං කිං මඤ්ඤසි අග්ගිවෙස්සන, යං ත්වං එවං වදෙසි: විඤ්ඤාණං මෙ අත්තාති, වත්තති තෙ තස්මිං විඤ්ඤාණෙ වසො "එවං මෙ විඤ්ඤාණං හොතු. එවං මෙ විඤ්ඤාණං මා අහොසී"ති. "නො හිදං භො ගොතම." මනසි කරොහි අග්ගිවෙස්සන, මනසි කරිත්වා ඛො අග්ගිවෙස්සන, බ්‍යාකරොහි. න ඛො තෙ සන්ධියති පුරිමෙන වා පච්ඡිමං, පච්ඡිමෙන වා පුරිමං.

භාග්‍යවතුන් වහන්සේ ද ඒ වජ්‍රපාණියක්‍ෂයා දක්නාහ. සච්චක නුවටදරු ද දකි යි. ඉක්බිති සච්චක නුවට උත්‍රස්ත විය, උද්වෙග ඇති විය, රෝමහර්‍ෂ ඇති විය. භාග්‍යවතුන් වහන්සේ මරුකවරණ කොට සොයනුයේ, භාග්‍යවතුන් වහන්සේ ම ගැලෙන තැන් කොට සොයනුයේ, භාග්‍යවතුන් වහන්සේ ම පිහිට කොට සොයනුයේ භාග්‍යවතුන් වහන්සේට මෙල කී ය: "භවත් ගොයුම්, මා පිළිවිසිවා. කියමි"යි.

13. ගිනිවෙස්සන, ඒ කිමැයි හඟනුව? "රූප මාගේ ආත්ම ය"යි මෙසේ යමක් තෝ කීහි ද? "මාගේ රූප මෙසේ වේවා. මාගේ රූප මෙසේ නො වේවා"යි තාගේ ඉසුරු ඒ රූපයෙහි පවත්නේ වේ ද? "නො පවත්නේ ය, ගොයුම්ගොතුව"යි ගේ කිය. ගිනිවෙස්සන, සිහි එළව. ගිනිවෙස්සන, සිහි එළවා කියා. තා පළමු කී දූය හා පසුව කියන දූය හා නො ගැළපෙයි. පසුව කියන දූය හා පළමු කී දූය හා නො ගැළපෙයි.

ගිනිවෙස්සන, ඒ කිමැයි හඟනුව? "වේදනා මාගේ ආත්මය"යි මෙසේ යමක් තෝ කීහි ද? "මාගේ වේදනා මෙසේ වේවා. මාගේ වේදනා මෙසේ නො වේවා"යි තාගේ ඉසුරු ඒ වේදනායෙහි පවත්නේ වේද? "නො පවත්නේ ය, ගොයුම් ගොතුව"යි කීය. ගිනිවෙස්සන, සිහි එළව. ගිනිවෙස්සන, සිහි එළවා කියව. තාගේ පළමු ප්‍රකාශය හා පසු ප්‍රකාශය හා නො ගැළපෙයි. පසු ප්‍රකාශය හා පළමු ප්‍රකාශය හා නො ගැළපෙයි.

ගිනිවෙස්සන, ඒ කිමැ යි හඟනුව? "සංඥා මාගේ ආත්මය"යි මෙසේ තෝ යමක් කීහි ද? "මාගේ සංඥා මෙසේ වේවා. මාගේ සංඥා මෙසේ නො වේවා"යි තාගේ ඉසුරු ඒ සංඥා කෙරෙහි පවත්නේ වේ ද? "නො පවත්නේ ය, ගොයුම් ගොතුව"යි කී ය. ගිනිවෙස්සන, සිහි එළව. ගිනිවෙස්සන, සිහි එළවා කියව. තාගේ පළමු බස හා පසු බස හා නො ගැළපෙයි. පසු බස හා පළමු බස හා නො ගැළපෙයි.

ගිනිවෙස්සන, ඒ කිමැ යි හඟනුව? "සංස්කාර මාගේ ආත්මය" යි මෙසේ තෝ යමක් කීහි ද? "මාගේ සංස්කාරයෝ මෙසේ වෙත්වා. මාගේ සංස්කාරයෝ මෙසේ නො වෙත්වා"යි තාගේ ඉසුරු ඒ සංස්කාරයන් කෙරෙහි පවත්නේ වේ ද? "නො පවත්නේ ය, ගොයුම්ගොතුව"යි කී ය. ගිනිවෙස්සන, සිහි එළව. ගිනිවෙස්සන, සිහි එළවා කියව. තාගේ පළමු ප්‍රකාශය හා පසු ප්‍රකාශය හා නො ගැළපෙ යි. පසු ප්‍රකාශය හා පළමු ප්‍රකාශය හා නො ගැළපෙයි.

ගිනිවෙස්සන, ඒ කිමැයි හඟනුව? "විඥාන මාගේ ආත්මය"යි මෙසේ තෝ යමක් කීහි ද? "මාගේ විඥාන මෙසේ වේවා. මාගේ විඥාන මෙසේ නො වේවා"යි තාගේ ඉසුරු ඒ විඥාන කෙරෙහි පවත්නේ වේ ද? "නො පවත්නේ ය, ගොයුම් ගොතුව"යි කී. ගිනිවෙස්සන, සිහි එළව. ගිනිවෙස්සන, සිහි එළවා කියව. තාගේ පළමු ප්‍රකාශය හා පසු ප්‍රකාශය හා නො ගැළපෙයි. පසු ප්‍රකාශය හා පළමු ප්‍රකාශය හා නො ගැළපෙයි.

14. තං කිං මඤ්ඤසි අග්ගිවෙස්සන, රූපං නිච්චං වා අනිච්චං වාති 'අනිච්චං භො ගොතම.' යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති. 'දුක්ඛං භො ගොතම.' යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං: එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තාති. 'නො හිදං භො ගොතම.' තං කිං මඤ්ඤසි අග්ගිවෙස්සන, වෙදනා -පෙ- සඤ්ඤා-පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති. 'අනිච්චං භො ගොතම'. යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති. 'දුක්ඛං භො ගොතම.' යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං: එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තාති. 'නො හිදං භො ගොතම.'

15. තං කිං මඤ්ඤසි අග්ගිවෙස්සන, යො නු ඛො දුක්ඛං අල්ලීනො දුක්ඛං උපගතො දුක්ඛං අජ්ඣොසිතො, දුක්ඛං "එතං මම, එසො හමස්මි, එසො මෙ අත්තා"ති සමනුපස්සති, අපි නු ඛො සො සාමං වා දුක්ඛං පරිජානෙය්‍ය, දුක්ඛං වා පරික්ඛෙපෙත්වා විහරෙය්‍යාති. "කිං හි සියා භො ගොතම, නො හිදං භො ගොතමා"ති. තං කිං මඤ්ඤසි අග්ගිවෙස්සන, න නු ත්වං එවං සන්තෙ දුක්ඛං අල්ලීනො දුක්ඛං උපගතො දුක්ඛං අජ්ඣොසිතො, දුක්ඛං "එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා"ති සමනුපස්සසීති? "කිං හි නො සියා භො ගොතම, එවමිදං භො ගොතමා"ති.[1]

16. සෙය්‍යථාපි අග්ගිවෙස්සන, පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො තිඛිණං[2] කුඨාරිං ආදාය වනං පවිසෙය්‍ය, සො තත්ථ පස්සෙය්‍ය මහන්තං කදලික්ඛන්ධං උජුං නවං අකුක්කුකජාතං,[3] තමෙනං මූලෙ ඡින්දෙය්‍ය, මූලෙ ඡෙත්වා අග්ගෙ ඡින්දෙය්‍ය, අග්ගෙ ඡෙත්වා පත්තවට්ටිං විනිබ්භුජෙය්‍ය, සො තත්ථ පත්තවට්ටිං විනිබ්භුජන්තො, ඵෙග්ගුම්පි නාධිගච්ඡෙය්‍ය, කුතො සාරං. එවමෙව ඛො ත්වං අග්ගිවෙස්සන මයා සකස්මිං වාදෙ සමනුයුඤ්ජියමානො සමනුගාහියමානො[4] සමනුභාසියමානො රිත්තො තුච්ඡො අපරද්ධො.

17. භාසිතා ඛො පන තෙ එසා අග්ගිවෙස්සන වෙසාලියං පරිසතිං[5] වාචා "නාහන්තං පස්සාමි සමණං වා බ්‍රාහ්මණං වා සඞ්ඝිං ගණිං ගණාචරියං අපි[6] අරහන්තං සම්මාසම්බුද්ධං පටිජානමානං, යො මයා වාදෙන වාදං සමාරද්ධො න සඞ්කම්පෙය්‍ය න සම්පකම්පෙය්‍ය න සම්පවෙධෙය්‍ය, යස්ස න කච්ඡෙහි සෙදා මුච්චෙය්‍යුං. ථූණංචෙපාහං[7] අචෙතනං වාදෙන වාදං සමාරභෙය්‍යං; සාපි මයා වාදෙන වාදං සමාරද්ධා සඞ්කම්පෙය්‍ය සම්පකම්පෙය්‍ය සම්පවෙධෙය්‍ය, කො පන වාදො මනුස්සභූතස්සා"ති

---

1. කිං හි සියා භො ගොතම නොහිදං භො ගොතමාති, සී.
2. තිණ්හං, මජසං - ස්‍යා. - PTS.
3. අකුක්කුටජාතං - ස්‍යා.
4. සමනුගාසියමානො, - ස්‍යා
5. පරිසති, මජසං. - ස්‍යා
6. අපිච, මජසං - ස්‍යා.
7. ථූණං පාහං, මජසං. - ථූණංසොවපාහං - ස්‍යා.

Free Distribution www.aathaapi.org

14. කියග ගිනිවෙස්න, ඒ කිමැ යි හඟනුව? රූප නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද? "භවත් ගෞතමයෙනි, අනිත්‍යය." යමෙක් අනිත්‍ය වේ නම් එ දුක් ද, සුව ද? "භවත් ගෞතමයෙනි, දුක් ය." යමෙක් අනිත්‍ය වේ නම් දුක් වේ නම්, පෙරළෙන සැහැවි ඇත්තේ නම්, "මේ මා ගැත්තේ ය, මම මේ ය, මේ මාගේ ආත්මය"යි (තෘෂ්ණා මාන දෘෂ්ටි විසින්) දක්නේ සුතු වේ ද? "යුතු නො වෙයි භවත් ගෞතමයෙනි". ගිනිවෙස්න, ඒ කිමැයි හඟනුව? වේදනා ... සංඥ ... සංස්කාර... විඥන නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද? "භවත් ගෞතමයෙනි, අනිත්‍යය." යමෙක් අනිත්‍ය වේ නම් එය දුක් ද, සුව ද? "භවත් ගෞතමයෙනි, දුක් ය" යමෙක් අනිත්‍ය වේ නම්, දුක් වේ නම්, වෙනස් වන සුලු වේ නම්, එය "මේ මා ගැත්තේ ය. මම මේ ය, මේ මාගේ ආත්මයැ"යි දක්නේ සුතු වේ ද? "යුතු නො වෙ, ගොයුම් ගොතුව".

15. ගිනිවෙස්න, ඒ කිමැයි හඟනුව? දුකෙහි ඇලුණ, දුකට පැමිණි, දුකට බැසගත් යමෙක් ඒ දුක "මේ මා ගැත්තේ ය, මම මේ ය, මේ මාගේ ආත්ම" යැ යි දක්නේ වේ නම්, හේ තෙමේ පඤ්චස්කන්ධදුඃඛය (අනිත්‍යාදීන්) තීරණ පරිඥයෙන් දන්නේ හෝ වේ ද? දුක හෝ (ක්‍ෂයව්‍යය අනුත්පාද විසින්) ගෙවා පිහරණ කරන්නේ වේ ද? "භවත් ගෞතමයෙනි, කිසේ වන්නේ ද, භවත් ගෞතමයෙනි, නො වන්නේ ම ය." ගිනිවෙස්න ඒ කිමැයි හඟනුව? මෙසේ ඇති කල්හි තෝ දුකෙහි ඇලුණෙහි, දුකට පැමිණියෙහි, දුකට බැස ගත්තෙහි, ඒ දුක "මේ මා ගැත්තේ ය, මම මේ ය, මෙය මාගේ ආත්මය"යි දක්නේ නොවෙහි? "භවත් ගෞතමයෙනි, කිසෙයින් නො වන්නේ ද, භවත් ගෞතමයෙනි, තෙල එසේ ම වෙයි."

16. යම් සේ ගිනිවෙස්න, හර කැමැති, හර සොයන හර පිරියෙස්මින් ඇවිදිනා පුරුෂයෙක් තියුණු පොරවක් ගෙන වනයට පිවිසෙන්නේ වේ ද, හෙ එහි ඉදි, ළද, නො හැපිගැජ්දඹු ඇසි - නොපුදුනු මහත් කෙසෙල් කඳක් දක්නේ වේ ද, හෙ ඒ කෙසෙල්කඳ මුල කපා ද, මුල කපා අග කපා ද, අග කපා පත්වැටි නඟාලන්නේ වේ ද, පත්වැටි නඟාලන්නේ හෙ බොරුදුත් නො ලබන්නේ ය. හරක් කොයින් ලබා ද? ගිනිවෙස්න, එ පරිද්දෙන් ම තෝ මා විසින් තාගේ වාදයෙහි ලා ලබ්ධි විචාරනු ලබන්නෙහි ලබ්ධි ගත්වනු ලබන්නෙහි කරුණු අසනු ලබන්නෙහි රික්ත (හර රහිත) විහි, හිස් විහි, පරජිත විහි"යි වදාළො.

17. ගිනිවෙස්න, "මා විසින් කථාමාර්ගයෙන් දොස් ඇරැවූ යමෙක් කම්පිත නො වේ ද, ප්‍රකම්පිත නො වේ ද, වෙවුලා නො යේ ද, යමකුගේ කක්‍ෂයෙන් සෙවද නො සිලියේ ද, එවන් සඟ ඇති, ගණ ඇති, ගණාදුරු මහණෙක් වේ ව යි, බමුණෙක් වේවයි, නොහොත් 'රහත්මි'යි 'බුදුමි'යි පිළිත කරනුයෙක් වේ ව යි, නො දක්මි. ඉදින් මම අචෙතන ටඹව ද වාදයෙන් වාද අරඹන්නෙම් වේ ද, මා විසින් වාදමාර්ගයෙන් දොස් ගෙණ වාද ඇරැඹූ ඒ ටඹ ද කම්පිත වෙයි. ප්‍රකම්පිත වෙයි, වෙවුලායයි. කවර කථා ය මිනිසක්හට" යැ යි තා විසින් විශාලානුවර පිරිස්හි තෙල කියන ලද වෙයි.

තුය්හං ඛො පන අග්ගිවෙස්සන අප්පෙකච්චානි සෙදඵුසිතානි නලාටා මුත්තානි[1] උත්තරාසඞ්ගං විනිභින්දිත්වා[2] භූමියං පතිට්ඨිතානි. "මය්හං ඛො පන අග්ගිවෙස්සන, නත්ථි එතරහි කායස්මිං සෙදො"ති. - ඉති භගවා තස්මිං පරිසතිං සුවණ්ණවණ්ණං කායං විවරි.

එවං වුත්තෙ සච්චකො නිගණ්ඨපුත්තො තුණ්හීභූතො මඞ්කුභූතො පත්තක්ඛන්ධො අධොමුඛො පජ්ඣායන්තො අප්පටිභානො නිසීදි.

18 අථ ඛො දුම්මුඛො ලිච්ඡවිපුත්තො සච්චකං නිගණ්ඨපුත්තං තුණ්හීභූතං මඞ්කුභූතං පත්තක්ඛන්ධං අධොමුඛං පජ්ඣායන්තං අප්පටිභානං විදිත්වා භගවන්තං එතදවොච: උපමා මං භගවා පටිභාතීති. 'පටිභාතු තං දුම්මුඛා'ති භගවා අවොච:

"සෙය්‍යථාපි භන්තෙ ගාමස්ස වා නිගමස්ස වා අවිදූරෙ පොක්ඛරණී, තත්‍රස්ස කක්කටකො, අථ ඛො භන්තෙ සම්බහුලා කුමාරකා වා කුමාරිකා වා තම්හා ගාමා වා නිගමා වා නික්ඛමිත්වා යෙන සා පොක්ඛරණී තෙනුපසඞ්කමෙය්‍යුං, උපසඞ්කමිත්වා තං පොක්ඛරණිං ඔගාහෙත්වා තං කක්කටකං උදකා උද්ධරිත්වා ථලෙ පතිට්ඨාපෙය්‍යුං, යඤ්ඤදෙව හි සො භන්තෙ කක්කටකො අළං අභිනින්නාමෙය්‍ය, තන්තදෙව තෙ කුමාරකා වා කුමාරිකා වා කට්ඨෙන වා කඨලෙන වා සංඡින්දෙය්‍යුං සම්භඤ්ජෙය්‍යුං සම්පලිභඤ්ජෙය්‍යුං, එවං හි සො භන්තෙ කක්කටකො සබ්බෙහි අළෙහි සංඡින්නෙහි සම්භග්ගෙහි සම්පලිභග්ගෙහි අභබ්බො තං පොක්ඛරණිං පුන ඔතරිතුං සෙය්‍යථාපි පුබ්බෙ. එවමෙව ඛො භන්තෙ යානි සච්චකස්ස නිගණ්ඨපුත්තස්ස විසූකායිතානි විසෙවිතානි විප්ඵන්දිතානි කානිචි කානිචි, තානි භගවතා සංඡින්නානි සම්භග්ගානි සම්පලිභග්ගානි. අභබ්බොදානි භන්තෙ සච්චකො නිගණ්ඨපුත්තො පුන භගවන්තං උපසඞ්කමිතුං යදිදං වාදාධිප්පායො"ති.

19. එවං වුත්තෙ සච්චකො නිගණ්ඨපුත්තො දුම්මුඛං ලිච්ඡවිපුත්තං එතදවොච: "ආගමෙහි ත්වං දුම්මුඛ. මුඛරොසි ත්වං දුම්මුඛ.[3] න මයං තයා සද්ධිං මන්තෙම. ඉධ මයං භොතා ගොතමෙන සද්ධිං මන්තෙම."

"තිට්ඨතෙසා භො ගොතම, අම්හාකඤ්චෙව අඤ්ඤෙසඤ්ච පුථුසමණබ්‍රාහ්මණානං වාචා. විලාපං විලපිතං මඤ්ඤෙ. කිත්තාවතා නු ඛො භොතො ගොතමස්ස සාවකො සාසනකරො හොති ඔවාදපතිකරො තිණ්ණවිචිකිච්ඡො විගතකථංකථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ විහරතී"ති?

1. නලාටාමුත්තානි, සයා. 2. විනිබ්භින්දිත්වා, සයා.
3. ආගමෙහි ත්වං දුම්මුඛ, ආගමෙහි ත්වං දුම්මුඛ - සීමු.

"ගිහිවෙස්ත, තා තලලතින් ගුළු ඇතැම් සෙවද පොදහු උතුරුසළු විනිවිද ගෙණ බිම සිටියහ. ගිහිවෙස්ත, දූන් මාගේ ශරීරයෙහි වූ කලි සෙව ද ඇත්තේ නො වෙයි" වදුරා - බුදුහු එ පිරිස්හි (ගලවළුයෙන් සිවුර උනා සතරඟුල් පමණ බහා පිළිසත්) රත්වන් සිරිරි විවර කොට දක්වූහු.

මෙසේ වදල කල සච්චකනුවවටදරු නිසබ වූයේ, නිතෙජ වූයේ කර බැහුයේ, යට හෙළු මුවැතියේ, නත් අරමුණු සිතනුයේ, උතතර නො වටහනුයේ, (පටැඟිල්ලෙන් බිම කණිමින්) හුන්නේ ය.

18. එකල දුර්මුඛ නම් ලිච්ජවිදරුයෙක් සච්චකනුවවටදරුවා තුෂණිම්භූත වැ නිසොපසකා වැ පතිතසකන්ධ වැ අධොමුඛ වැ සිතිවිලි සිතනු වැ ප්‍රතිභානවිරහිත වැ හුන්නහු දූක භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය: "භාග්‍යවතුන් වහන්ස, මට උපමායෙක් වටහයි" කී ය. "දුර්මුඛය, තට එය වටහාව"යි භාග්‍යවතුන් වහන්සේ වදලහ.

"වහන්ස, යම් පරිදි ගමකට හෝ නියම්ගමකට නුදුරුතන්හි පොකුණෙක් වී ද, එහි කකුළුයෙක් වී ද, වහන්ස, එකල එහි වැසි බොහෝ දරුවෝ හෝ දූරියෝ හෝ ඒ ගමින් හෝ නියම්ගමින් හෝ නික්ම ඒ පොකුණට එලබෙද් ද, එළඹ පොකුණට බැස, ඒ කකුළුවා දියෙන් නගා ගොඩ බහද්ද, වහන්ස, ඒ කකුළු යම් යම් අලක්(අඬුවක්) නගා ද, උහුගේ ඒ නැඟූ නැඟූ අල ඒ දරුවෝ හෝ දූරියෝ දඬුකඩෙකින් හෝ කබල්කඩෙකින් හෝ සිඳපියද් ද, බිඳපියද් ද, නො තබා බිඳපියද් ද, වහන්ස, මෙසේ ඒ කකුළු හුන්, බුන්, පිළිබුන්, එ හැම අලින් ඒ පොකුණට පෙර මෙන් යළි බස්නට (ගමන් පසුන් බැවින්) නො හැකි ය. වහන්ස, එ පරිදි ම සච්චකනුවවදරුවාගේ යම් කවර හෝ විසූකායාර දෘෂටීහු ඇද්ද, දෘෂටිසඥාරිත කෙනෙක් ඇද්ද, උන්මාගීයෙහි වැටුණු මිසදිටුහු ඇද්ද, වහන්ස, එ හැම දෘෂටීහු භගවත්හු විසින් සිඳපියන ලදහ. බිඳපියන ලදහ. නො තබා බිඳපියන ලදහ. වහන්ස, සච්චකනුවවටදරු දූන් වාදාභිප්‍රාය ඇති වැ වවා ලා භගවත්හු කරා එලඹෙන්නට අභව්‍ය යැ" යි කී.

19. මෙසෙයින් උපමා කීකල සච්චකනුවවටදරු දුර්මුඛලිච්ඡවී දරුට කියනුයේ: "දුර්මුඛය, තෝ සිටුව. දුර්මුඛය, තෝ මුඛරයෙහි. අපි තා හා සැසැඳිලි නො කරම්හ. මෙහි අපි භවත් ගොයුම්හු හා සැසැඳිලි කරම්හ"යි කී ය.

"භවත් ගොයුම්ගොතුව, අපගේ ද, සෙස්සන්ගේ දූයි බොහෝ මහණ බමුණන්ගේ කථා තිබියේවා. (උන්ගේ තෙල) වචන විලාපමාත්‍රයක් වැන්න භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයෙක් කොපමණෙකින් සහුන් කරණුයේ ඔවා පිළිපදනේ වේද, තිණුවිචිකිත්සා ඇති ව පැහැසැක ඇති ව තැණ පත් ව ශාස්තෲශාසනයෙහි පරප්‍රත්‍යය (පරශ්‍රද්ධා) රහිත ව වසනු නම් වේ දූයි පිළිවිසි.

20. ඉධ අග්ගිවෙස්සන මම සාවකො යං කිඤ්චි රූපං අතීතානාගත පච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං "නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං විඤ්ඤාණං "නෙතං මම, නෙසො හමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති; එත්තාවතා ඛො අග්ගිවෙස්සන මම සාවකො සාසනකරො හොති ඔවාදපතිකරො. තිණ්ණවිචිකිච්ඡො විගතකථඞ්කථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ විහරතීති.

21. "කිත්තාවතා පන භො ගොතම භික්ඛු අරහං හොති ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභව-සඤ්ඤොජනො සම්මදඤ්ඤා විමුත්තො"ති?

ඉධ අග්ගිවෙස්සන භික්ඛු යං කිඤ්චි රූපං අතීතානාගත පච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං 'නෙතං මම, නෙසො හමස්මි, න මෙසො අත්තා'ති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා අනුපාදා විමුත්තො හොති. යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං විඤ්ඤාණං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා අනුපාදාවිමුත්තො හොති. එත්තාවතා ඛො අග්ගිවෙස්සන භික්ඛු අරහං හොති ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභව-සඤ්ඤොජනො සම්මදඤ්ඤා විමුත්තො.

22. එවං විමුත්තචිත්තො[1] ඛො අග්ගිවෙස්සන භික්ඛු තීහි අනුත්තරියෙහි සමන්නාගතො හොති: දස්සනානුත්තරියෙන පටිපදානුත්තරියෙන විමුත්තා-නුත්තරියෙන. -

---

1. විමුත්තො, සිමු.

20. ගිනිවෙස්ස, මේ සස්නෙහි මාගේ ශ්‍රාවකයෙක් “අතීත, අනාගත, පච්චුප්පන්න, අජ්ඣත්ත, බහිද්ධා, ඖළාරික, සුඛුම, හීන, පණීත, දූර සන්තික විසින් භේදභින්න යම් රූපයෙක් ඇද්ද, එ හැම (එකොළොස් වැදෑරුම්) රූප ගෙන “තෙල රූප මා ගැත්තේ නො වෙයි, මම තෙල රූපයෙම් නො වෙමි. මාගේ ඉපුරු රූපයෙහි නො පවත්නේ යැ”යි මෙසෙයින් තෙල යථා ස්වභාවය මනා කොට නුවණින් දක්නේ වේ ද, යම් කිසි වෙදනායෙක් ඇද්ද ... යම්කිසි සංඥයෙක් ඇද්ද ... යම්කිසි සංස්කාරයෝ ඇද්ද ... යම්කිසි අතීත, අනාගත, පච්චුප්පන්න, අජ්ඣත්ත, බහිද්ධා, ඖළාරික, සුඛුම, හීන, පණීත, දූර, සන්තික විසින් භෙදභින්න විඥනයෙක් ඇද්ද, එ හැම (එකොළොස් වැදෑරුම්) විඥන ගෙන “තෙල මා ගැත්තේ නො වෙයි, මම තෙල විඥනයෙම් නො වෙමි, මාගේ ඉපුරු විඥනයෙහි නො පවත්තේ යැ”යි මෙසෙයින් තෙල යථාභූතය මනා කොට නුවණින් දක්නේ වේ ද. ගිනිවෙස්ස, මෙපමණෙකින් මාගේ ශ්‍රාවක සසුන් කරන්නේ ඕවා පිළිපදනේ වෙයි. තීර්ණවිචිකිත්සා ඇතිවැ පැහූසැක ඇති වැ ඥනප්‍රජා වූයේ ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යය රහිත වැ (ස්වතන්ත්‍රවැ)වා සකෙරේ ය යි (ශෛක්ෂභූමි) වදළහ.

21. “භවත් ගොයුම් ගොතුව, කොපමණෙකින් මහණ ක්ෂීණ අස්වන් ඇති, වුසු බඹසර ඇති, කළ සොළොස් කරණී ඇති, බැහු කෙලෙස්බර ඇති, ලැබූ ස්වාර්ථ ඇති, භවසංයොජනක්ෂය කොට සිටි, මනා නුවණින් දැන මිදී සිටි රහත් නම් වේ දැ”යි පිළිවිසී.

ගිනිවෙස්ස, මේ සස්නෙහි මහණ “අතීත, අනාගත, පච්චුප්පන්න, අජ්ඣත්ත, බහිද්ධා, ඖළාරික, සුඛුම, හීන, පණීත, දූර, සන්තික විසින් භෙදභින්න යම් රූකඳෙක් ඇද්ද, එ හැම (එකොළොස් වැදෑරුම්) රූප ගෙන ‘තෙල රූප මා ගැත්තේ නො වෙයි, මම තෙල රූපයෙම් නො වෙමි, මාගේ ඉපුරු තෙල රූපයෙහි නො පවත්තේ යැ”යි මෙසේ තෙල යථාභූතය මනා කොට නුවණින් දැක අනුපාදාවිමොක්ෂයෙන් විමුක්ත වේ ද, යම්කිසි වේදනාස්කන්ධයෙක් ඇද්ද ... යම්කිසි සංඥස්කන්ධ-යෙක් ඇද්ද, ... යම්කිසි සංස්කාරස්කන්ධයෙක් ඇද්ද, ... අතීත, අනාගත, පච්චුප්පන්න, අජ්ඣත්ත, බහිද්ධා, ඖළාරික, සුඛුම, හීන, පණීත, දූර, සන්තික විසින් භෙදභින්න යම්කිසි විඥනස්කන්ධයෙක් ඇද්ද, එ හැම (එකොළොස් වැදෑරුම්) විඥන ගෙන “තෙල විඥන මා ගැත්තේ නො වෙයි, මම තෙල විඥනයෙම් නො වෙමි, මාගේ ඉපුරු තෙල විඥනයෙහි නො පවත්තේ යැ”යි මෙසේ තෙල යථාභූතය මනා කොට නුවණින් දැක සතර උපාදාන විසින් කිසිවක් නො ගෙන විමුක්ත වේ ද, ගිනිවෙස්ස, මෙපමණෙකින් මහණ ක්ෂීණාස්‍රව වූ බ්‍රහ්මචර්යාවාස නිම කළ සිවුමගින් කළ ෂෝඩශවිධඥනකෘත්‍ය ඇති, අපහෘතකෙලශභාර ඇති අග්‍රඵල සංඛ්‍යාත ස්වාර්ථය පත්, පරික්ෂීණවූ භවබන්ධන ඇති, මනා කොට නුවණින් දැන නිස්සරණවිමුක්තීන් විමුක්ත වූ රහත් නම් වේ යයි වදළෝ.

22. ගිනිවෙස්ස, මෙසේ විමුක්ත වූ සිත් ඇති මහණ දස්සනානුත්තරියෙ-නුදු (ලොවී ලොවුතුරා නුවණිනුදු, නොහොත් රහත්මග සම්දිටුයෙනුදු), පටිපදානුත්තරියෙනුදු (ලොවී ලොවුතුරා පිළිවෙතිනුදු, නොහොත් රහත්මග සම්දිටුතබා සෙසු මාර්ගාඞ්ගයෙනුදු) විමුත්තානුත්තරියෙනුදු - (ලොවී ලොවු-තුරා විමුක්තීනුදු නොහොත් මාර්ගඵල විමුක්තියෙනුදු) තුන් අනුත්තරිය ගුණයෙන් සමන්වාගත වෙයි.

Free Distribution www.aathaapi.org

එවං විමුත්තචිත්තො ඛො අග්ගිවෙස්සන භික්ඛු තථාගතඤ්ඤෙව සක්කරෙති, ගරුකරොති, මානෙති, පූජෙති "බුද්ධො සො භගවා බොධාය ධම්මං දෙසෙති. දන්තො සො භගවා දමථාය ධම්මං දෙසෙති. සන්තො සො භගවා සමථාය ධම්මං දෙසෙති. තිණ්ණො සො භගවා තරණාය ධම්මං දෙසෙති. පරිනිබ්බුතො සො භගවා පරිනිබ්බානාය ධම්මං දෙසෙතී"ති.

23. එවං වුත්තෙ සච්චකො නිගණ්ඨපුත්තො භගවන්තං එතදවොච: "මයමෙව භො ගොතම ධංසී, මයං පගබ්භා, යෙ මයං භවන්තං ගොතමං වාදෙන වාදං ආසාදෙතබ්බං අමඤ්ඤිම්හ. සියා හි භො ගොතම හත්ථිප්පභින්නං ආසජ්ජ පුරිසස්ස සොත්ථිභාවො, න ත්වෙව භවන්තං ගොතමං ආසජ්ජ සියා පුරිසස්ස සොත්ථිභාවො. සියා හි භො ගොතම පජ්ජලිතං අග්ගික්ඛන්ධං ආසජ්ජ පුරිසස්ස සොත්ථිභාවො, න ත්වෙව භවන්තං ගොතමං ආසජ්ජ සියා පුරිසස්ස සොත්ථිභාවො. සියා හි භො ගොතම ආසිවිසං ඝොරවිසං ආසජ්ජ පුරිසස්ස සොත්ථිභාවො, න ත්වෙව භවන්තං ගොතමං ආසජ්ජ සියා පුරිසස්ස සොත්ථිභාවො. මයමෙව භො ගොතම ධංසී, මයං පගබ්භා, යෙ මයං භවන්තං ගොතමං වාදෙන වාදං ආසාදෙතබ්බං අමඤ්ඤිම්හ. අධිවාසෙතු මෙ භවං ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා"ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

24. අථ ඛො සච්චකො නිගණ්ඨපුත්තො භගවතො අධිවාසනං විදිත්වා තෙ ලිච්ඡවී ආමන්තෙසි: "සුණන්තු මෙ භොන්තො ලිච්ඡවී, සමණො මෙ ගොතමො නිමන්තිතො ස්වාතනාය භත්තෙන සද්ධිං භික්ඛුසඞ්ඝෙන. තෙන මෙ අභිහරෙය්‍යාථ යමස්ස පතිරූපං මඤ්ඤෙය්‍යාථා"ති. අථ ඛො තෙ ලිච්ඡවී තස්සා රත්තියා අච්චයෙන සච්චකස්ස නිගණ්ඨපුත්තස්ස පඤ්චමත්තානි ථාලිපාකසතානි භත්තාභිහාරං අභිහරිංසු. අථ ඛො සච්චකො නිගණ්ඨපුත්තො සකෙ ආරාමෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි: කාලො භො ගොතම, නිට්ඨිතං භත්තන්ති.

25. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන සච්චකස්ස නිගණ්ඨපුත්තස්ස ආරාමො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන. අථ ඛො සච්චකො නිගණ්ඨපුත්තො බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි. අථ ඛො සච්චකො නිගණ්ඨපුත්තො භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සච්චකො නිගණ්ඨපුත්තො භගවන්තං එතදවොච: යමිදං භො ගොතම දානෙ පුඤ්ඤං පුඤ්ඤමහී ච, තං දායකානං සුඛාය හොතූති. "යං ඛො අග්ගිවෙස්සන තාදිසං දක්ඛිණෙය්‍යං ආගම්ම අවීතරාගං අවීතදොසං අවීතමොහං, තං දායකානං භවිස්සති. යං ඛො අග්ගිවෙස්සන මාදිසං දක්ඛිණෙය්‍යං ආගම්ම වීතරාගං වීතදොසං වීතමොහං, තං තුය්හං භවිස්සතී"ති.

චූළසච්චකසුත්තං පඤ්චමං.

Free Distribution www.aathaapi.org

ගිහිවෙස්න, මෙසේ විමුක්ත සිත් ඇති මහණ “ඒ භාග්‍යවතුන් වහන්සේ තුමූ සියුසස් දත්තාහු අනුන් දන්වනු සඳහා දහම් දෙසති. ඒ භාග්‍යවතුන් වහන්සේ තුමූ ඉන්ද්‍රියදමනයෙන් දැමුණුහු අනුන් දමනු සඳහා දහම් දෙසති. ඒ භාග්‍යවතුන් වහන්සේ තුමූ කෙලෙසුන්ගේ ක්ෂොභ සන්හිඳුවා ලූවාහු අනුන්ගේ කෙලශක්ෂොභ සන්හිඳුවනු සඳහා දහම් දෙසති. ඒ භාග්‍යවතුන් වහන්සේ තුමූ තැරුසසරසයුරු ඇත්තාහු අනුන් සසරසයුරින් තරනු සඳහා දහම් දෙසති. ඒ භාග්‍යවතුන් වහන්සේ තුමූ කෙලෙස් පිරිනිවෙතින් පිරිනිවියාහු අනුන්ගේ කෙලෙස් ගිනි නිවනු සඳහා දහම් දෙසති” යි භගවත්හට ම සත්කාර ගරුකාර මානන පූජන කෙරෙයි වදාළහ.

24 මෙසේ වදාල කල්හි සච්චක නුවටදරු භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකෙළේය: “භවත් ගොයුම් ගොතුව, භවත් ගෞතමයන් වාදයෙන් වාදනගා ඝට්ටනට නිසියවූන් කොට සිතුවමෝ වේද, ඒ අපි ම (ගුණවිසින්) නටුවම්හ. අපි ම වාක්ප්‍රගල්භ ඇතියම්හ. භවත් ගෞතම-යාණෙනි, ත්‍රිමදගලිත ඇතකු පැහැර වැදගත් පුරුෂයකුට සෙත් වන්නේය. භවත් ගෞතමයන් ඝටාගෙන පුරුෂයකුට සෙත් නොවන්නේ මැය. භවත් ගෞතමයෙනි, දිලියෙන ගිනිකඳ සිපගත් පුරුෂයකුට සෙත් වන්නේය. භවත් ගෞතමයන් ඝටාගෙන පුරුෂයකුට සෙත් නොවන්නේ මැය. භවත් ගෞතමයෙනි, ඝොරවිෂ ඇති ආශිවිෂයකු පැහැර සිපගත් පුරුෂයකුට සෙත් වන්නේය. භවත් ගෞතමයන් ගැහැට සිපි පුරුෂයකුට සෙත් නොවන්නේ මැය. භවත් ගොයුම් ගොතුවෙනි, භවත් ගෞතමයන් වාදයෙන් වාදනගා ඝට්ටනට නිසියවූන් කොට සිතුවමෝ වේද, ඒ අපි ම නටුවම්හ. අපි ම ප්‍රගල්භයම්හ. භවත් ගෞතමයෝ සෙට මා බත පිළිගන්නාසේක්වා, භික්සඟුන් හා යයි” කීය. භාග්‍යවතුන් වහන්සේ නො බැණ (සිතින්) ඉවසූ දූය.

23. එක්බිති සච්චක නුවට දරු බුදුන් ඉවසූසෙ දැන ඒ ලිච්ඡවී රජ්පුරුවන් ඇමතීය: “භවත් ලිච්ඡවීනි, මබස අසන්වා. මා විසින් මහණ ගොයුම් සෙට බතින් නිමන්ත්‍රණය කරන ලදී, භික් සඟුන් හා ය. එහෙයින් යම් දැයක් උහුට නිසි කොට සිතවූ ද, ඒ දැය මා වෙත එළවා ලව”යි. එසඳ ඒ ලිච්ඡවී රජදරුවෝ එ රැය ඇවෑමෙන් සච්චකනුවටහට පන්සියක් මුළුබත් භක්තාභිහාර කොට දී යවූහ. එක්බිති සච්චක නුවටදරු සිය අරමෙහි පිණී කන - බොන දෑ පිළියෙල කරවා භගවත්හට කල් දැන්වීය: භවත් ගෞතමයෙනි කල්වෙයි. බත නිමියේ යයි.

24. එක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පාසිවුරු ගෙන සච්චක නුවටපුත්හුගේ අරම් කරා වැඩියහ වැඩ පැන්වූ අස්නෙහි භික් සඟුන් පිරිවරාගෙන වැඩහුන්හ. එසඳ සච්චක නුවටපුත් බුදුපාමොක් භික්සඟුන් ප්‍රණීත ඛාද්‍යයෙන් භෝජනයෙන් සියතින් මනා කොට සැතැපිය. මනා කොට පැවැරිය. එක්බිති සච්චක නුවටමදරු වළඳා නිමකළ, පාත්‍රයෙන් බැහැරකළ අත් ඇති (අත ද පාත්‍රය ද දෙවා හුන්) භාග්‍යවතුන් වහන්සේ දැන අන්‍යතර මිටි අස්නක් ගෙන එකත්පස් වැ හින. එකත්පස්ව හුන් සච්චක නුවට පුත් භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේය: “භවත් ගොයුම ගොතුව, මේදනයෙහි යම් පුණ්‍යවිපාකස්කන්ධයෙක් ඇද්ද, එයට පරිවාරයෙක් ඇද්ද, එය දායකයනට සුවයට වැවේව” යි කීය. “ගිහිවෙස්න, අවීතරාග වූ අවීතදෙස වූ අවීතමොහ වූ තාබදු යම් දක්ෂිණාගීයකු ලැබගෙන යම් දනෙක් දින් ද, එය (තටදුන්) දායකයනට වෙයි. ගිහිවෙස්න, වීතරාග වූ වීතදෙය වූ වීතමොග වූ මා වැනි දක්ෂිණාගීයකු ලැබ යම් දනෙක් දින් ද, එ පුණ්‍යඵලය මට දුන් නට වේය” යි වදාළහ.

චූලසච්චකසූත්‍රය පස්වැනියි.

Free Distribution www.aathaapi.org

1. 4. 6.

මහාසච්චක සුත්තං

එවම්මෙ සුතං: එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය වෙසාලිං පිණ්ඩාය පවිසිතුකාමො හොති. අථ ඛො සච්චකො නිගණ්ඨපුත්තො ජඞ්ඝාවිහාරං අනුචඞ්කමමානො අනුවිචරමානො යෙන මහාවනං කූටාගාරසාලා තෙනුපසඞ්කමි. අද්දසා ඛො ආයස්මා ආනන්දො සච්චකං නිගණ්ඨපුත්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන භගවන්තං එතදවොච: "අයං භන්තෙ සච්චකො නිගණ්ඨපුත්තො ආගච්ඡති භස්සප්පවාදිකො පණ්ඩිතවාදො සාධුසම්මතො බහුජනස්ස. එසො ඛො භන්තෙ අවණ්ණකාමො බුද්ධස්ස, අවණ්ණකාමො ධම්මස්ස, අවණ්ණකාමො සඞ්ඝස්ස. සාධු භන්තෙ භගවා මුහුත්තං නිසීදතු අනුකම්පං උපාදායා"ති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. අථ ඛො සච්චකො නිගණ්ඨපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සච්චකො නිගණ්ඨපුත්තො භගවන්තං එතදවොච:

2. සන්ති භො ගොතම එකෙ සමණබ්‍රාහ්මණා කායභාවනානුයොගමනුයුත්තා විහරන්ති. නො චිත්තභාවනං. ඵුසන්ති හි තෙ භො ගොතම සාරීරිකං දුක්ඛං වෙදනං. භූතපුබ්බං භො ගොතම සාරීරිකාය දුක්ඛාය වෙදනාය ඵුට්ඨස්ස සතො ඌරුක්ඛම්භොපි නාම භවිස්සති, හදයම්පි නාම ඵලිස්සති, උණ්හම්පි ලොහිතං මුඛතො උග්ගමිස්සති, උම්මාදම්පි පාපුණිස්සති චිත්තක්ඛෙපං. තස්ස ඛො එතං භො ගොතම කායන්වයං චිත්තං හොති, කායස්ස වසෙන වත්තති. තං කිස්ස හෙතු? අභාවිතත්තා චිත්තස්ස. සන්ති පන භො ගොතම එකෙ සමණබ්‍රාහ්මණා චිත්තභාවනානුයොගමනුයුත්තා විහරන්ති, නො කායභාවනං. ඵුසන්ති හි තෙ භො ගොතම චෙතසිකං දුක්ඛං වෙදනං. භූතපුබ්බං භො ගොතම චෙතසිකාය දුක්ඛාය වෙදනාය ඵුට්ඨස්ස සතො ඌරුක්ඛම්භොපි නාම භවිස්සති, හදයම්පි නාම ඵලිස්සති, උණ්හම්පි ලොහිතං මුඛතො උග්ගමිස්සති, උම්මාදම්පි පාපුණිස්සති චිත්තක්ඛෙපං. තස්ස ඛො එසො භො ගොතම චිත්තන්වයො කායො හොති, චිත්තස්ස වසෙන වත්තති. තං කිස්ස හෙතු? අභාවිතත්තා කායස්ස. තස්ස මය්හං භො ගොතම එවං හොති: අද්ධා භොතො ගොතමස්ස සාවකා චිත්තභාවනානුයොගමනුයුත්තා විහරන්ති, නො කායභාවනන්ති.

Free Distribution www.aathaapi.org

1. 4. 6.

මහාසච්චක සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ විසල්පුර මහාවනයෙහි (කැණිමඬුලු දී තැනූ) කූලාරපහා ගදකිළියෙහි වැඩවසන සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැදපෙරෙව පා සිවුරු ගෙන විසල්පුරට පිඬු පිණිස වදනු කැමැත්තාහු වෙති. එකල්හි සච්චක නුවටදරු ජඞ්ඝාවිහාර තකා එතැනින් එතැනට පයින් වැද ඇවිදුනේ මහවනකූටාගාරසාලා ගඳකිළියට ගියේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සච්චක නුවටපුතු දුරින් ම එන්නහු දුටුහ. දැක භගවත්හට තෙල සැලකළහ: ''වහන්ස, මේ සච්චක නුවටපුත් එයි. භාෂ්‍යවිසින් කථාමාගී බණන්නෙක, 'පණ්ඩිතයෙමි'යි කියන්නෙක, බොහෝදෙනා විසින් සාධුසම්මතය. වහන්ස, හෙතෙම බුදුන්ගේ අගුණ කැමැති වෙයි දහම්හි අගුණ කැමැති වෙයි. සඟුන්ගේ අගුණ කැමැති වෙයි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මොහොතක් වැඩ හිඳුනේ මැනැව, අනුකම්පා පිණිස යැ''යි. භාග්‍යවත්හුදු පැන්වූ අස්නෙහි වැඩහුන්හු. එසඳ සච්චක නුවටදරු බුදුන් කරා ගියේ. ගොස් බුදුන් හා සමඟ සතුටු වී. තුන්නට නිසි සිහිකරනුවට නිසි තෙපුල් බැණ නිමවා එකත්පස්ව හිත එකත්පස්ව හුන් සච්චක නුවටදරු භාග්‍යවතුන්වහන් සේට තෙල කී:

2. භවත් ගොයුම්ගොතුව, කායභාවනානුයුක්තව වාස කරන, චිත්ත-භාවනානුයුක්ත ව වාස නොකරන, කිසි මහණබමුණු කෙනෙක් ඇත. ගොයුම්ගොතුව, ඔහු ශාරීරික දුඃඛ වේදනා වළඳ කෙරෙත් මැය. ගොයුම් ගොතුව, වූ විරිදූයක් කියමි: ආශ්වසියෙකි - ශරීරයෙහි සන්හිඳින දුඃඛ වේදනායෙන් පහරන ලදුවහුගේ ඌරුස්තම්භතා (දෙකලවේ දැඩිසෙය) ද වෙයි. ළය ද පැලෙයි. උණු ලෙය ද මුවින් නැගෙයි. චිත්තක්ෂෙප නම් උන්මාදයට ද පැමිණෙයි. ගොයුම්ගොතුව, උහුගේ තෙල සිත කායානු ගත වෙයි, කායවශවර්තී වෙයි. ඒ කවර හෙයින යත්: චිත්තය අභාවිත බැවින. ගොයුම්ගොතුව, චිත්තභාවනානුයුක්ත ව වාස කරන, කාය භාවනානුයුක්ත ව වාස නොකරන කිසි මහණබමුණ කෙනෙක් ඇත. ගොයුම්ගොතුව, ඔහු චෛතසික දුඃඛවේදනා වළඳ කෙරෙත් මය. ගොයුම් ගොතුව, වූ විරිදූයක් කියමි: ආශ්වසියෙකි - චිත්තයෙහි සන්හිඳින දුඃඛවේදනායෙන් පහරන ලදුවහුගේ ඌරුස්තම්භතා ද වෙයි. ළය ද පැලෙයි. උණු ලෙය ද මුවින් නැගෙයි. සිත්විකෙවු නම් උන්මාදයට ද පැමිණෙයි. ගොයුම්ගොතුව, උහුගේ තෙල කය චිත්තානුගත වෙයි, චිත්තවශවර්තී වෙයි. ඒ කවරහෙයින යත්: කය අභාවිත බැවින. ගොයුම් ගොතුව මට මෙසේ සිතෙක් වෙයි: ''භවත් ගෞතමයන්ගේ සව්වෝ චිත්තභාවනානුයුක්ත ව වාස කෙරෙති. කායභාවනානුයුක්තව වාස නොකෙරෙත් ම ය'' කියායි.

Free Distribution   www.aathaapi.org

3. කින්ති පන තෙ අග්ගිවෙස්සන කායභාවනා සුතාති?

“සෙය්‍යථීදං: නන්දො වච්ඡො, කිසො සංකිච්චො, මක්ඛලි ගොසාලො- එතෙ හි භො ගොතම අචෙලකා මුත්තාචාරා හත්ථාපලෙඛනා,[1] න එහි භදන්තිකා, න තිට්ඨ භදන්තිකා, න අභිහටං න උද්දිස්සකටං න නිමන්තණං සාදියන්ති. තෙ න කුම්භිමුඛා පතිගණ්හන්ති, න කළොපිමුඛා පතිගණ්හන්ති, න එළකමන්තරං, න දණ්ඩමන්තරං, න මුසලමන්තරං, න ද්වින්නං භුඤ්ජමානානං, න ගබ්භිනියා, න පායමානාය, න පුරිසන්තරගතාය, න සඞ්කිත්තිසු, න යත්ථ සා උපට්ඨිතො හොති, න යත්ථ මක්ඛිකා සණ්ඩසණ්ඩචාරිනී, න මච්ඡං, න මංසං. න සුරං න මෙරයං න ථුසොදකං පිවන්ති. තෙ එකාගාරිකා වා හොන්ති එකාලොපිකා, ද්වාගාරිකා වා හොන්ති ද්වාලොපිකා,[2] සත්තාගාරිකා වා හොන්ති සත්තාලොපිකා. එකිස්සාපි දත්තියා යාපෙන්ති, ද්වීහිපි දත්තීහි යාපෙන්ති,[3] සත්තහිපි දත්තීහි යාපෙන්ති. එකාහිකම්පි ආහාරං ආහාරෙන්ති, ද්වීහිකම්පි ආහාරං ආහාරෙන්ති,[4] සත්තාහිකම්පි ආහාරං ආහාරෙන්ති. ඉති එවරූපං අඩ්ඪමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තා විහරන්තී”ති.

4. කිං පන තෙ අග්ගිවෙස්සන තාවතකෙනෙව යාපෙන්තීති?

“නො හිදං භො ගොතම. අප්පෙකදා භො ගොතම උළාරානි උළාරානි ඛාදනීයානි ඛාදන්ති. උළාරානි උළාරානි භොජනීයානි භුඤ්ජන්ති. උළාරානි උළාරානි සායනීයානි සායන්ති. උළාරානි උළාරානි පානානි පිවන්ති. තෙ ඉමං[5] කායං ගාහෙන්ති නාම, බ්‍රූහෙන්ති නාම, මෙදෙන්ති නාමා”ති.

යං ඛො තෙ අග්ගිවෙස්සන පුරිමං පහාය පච්ඡා උපචිනන්ති, එවං ඉමස්ස කායස්ස ආචයාපචයො හොති.

5. කින්ති පන තෙ අග්ගිවෙස්සන චිත්ත භාවනා සුතාති? චිත්තභාවනාය ඛො සච්චකො නිගණ්ඨපුත්තො භගවතා පුට්ඨො සමානො න සම්පායාසි.

1. හත්ථාවලෙඛනා, සයා. 2. ද්වාලොපිකා -පෙ-, මජසං. සයා
3. යාපෙන්ති පෙ-, මජසං. සයා
4. ආහරෙන්ති -පෙ-, මජසං. සයා. 5. ඉමෙහි, PTS.

3. ගිහිවෙස්න, තා විසින් කෙසේ කායභාවනා අසන ලද දැ?

"ඒ මෙසේයිත් ඇසීම්: වාත්ස්‍යායන නන්‍දය, සාංකෘත්‍යායන කිසය, මක්ඛලිගොසාලය - ගොයුම්ගොතුව, තුළුහු තුන්දෙනා සෙලුහ. (බැහැර කළ පිළි ඇතියහ.) හළ ආචාර ඇතියහ. පිඬු තිම් කල අත ලෙව්නාහු වෙති. 'එව මහත්සැ'යි කීකල නො එනු සිල්කොට ඇතියාහ. 'සිටුව, මහත්සැ'යි කීකල නොසිටිනු සිල්කොට ඇතියාහ. පළමු එළවූ අහර නොපිළිගන්නාහ. උදෙසා කළ අහර නොපිළිගන්නාහ. නිමන්ත්‍රණ නො පිළිගනිති ඔහු කලමුවින් උදුරා අල අහර නොපිළිගනිති. ඔහු සැළමුවින් අල අහර නොපිළිගනිති. එළිපත අතර කොට දෙන අහර නොපිළිගනිති දඬු අතර කොට දෙන අහර නොපිළිගනිති. මොහොල අතර කොට දෙන අහර නොපිළිගනිති. අහර වළඳ කරන දෙදෙනකුන් අතුරින් එකකු නැඟී දෙන අහර නොපිළිගනිති. ගැබිණිලිය දෙන අහර නොපිළිගනිති. කිරිපොවනුලිය දෙන අහර නොපිළිගනිති. පුරුෂාන්තරගත ස්ත්‍රිය දෙන අහර නොපිළිගනිති. සමාදන් කොට පිසූ කල දෙන අහර නොපිළිගනිති. යම් ම තැනෙක බලු එළඹ සිටියේ වේ නම් එහි දී දෙන අහර නොපිළිගනිති. යම් ම තැනෙක මැසිමුළු ගලගල ව හැසිරෙත් නම් එහිදී දෙන අහර නොපිළිගනිති. මත්ස්‍ය නොපිළිගනිති. මාංශ නොපිළි-ගනිති. රහ නො බොති. මේර නො බොති. කලකැඳ නො බොති ඔහු එක්ගෙයෙකින් පිඬු ලැබ නවත්නාහු හෝ වෙති. එක් ආලෝපයකින් යැපෙන්නාහු හෝ වෙති. දෙගෙයෙකින් පිඬු ලැබ නවත්නාහු හෝ වෙති. ආලෝප දෙකෙකින් යැපෙන්නාහු හෝ වෙති සත්ගෙයෙකින් පිඬු ලැබ නවත්නාහු හෝ වෙති. ආලොප සතෙකින් යැපෙන්නාහු හෝ වෙති. එක් දත්තෙකිනුදු යැපෙති. දෙදත්තෙකිනුදු යැපෙති. සත් දත්තෙකිනුදු යැපෙති. එක් දවසක් අතර කොට ගන්නා අහර ද වළඳ කෙරෙති. දෙදවසක් අතර කොට ගන්නා අහරද වළඳ කෙරෙති. සත්දවසක් අතර කොට ගන්නා අහර ද වළඳ කෙරෙති. මෙසේයිත් මෙබඳු අඩමසක් අතර කොට ගන්නා අහර දූයි වාරභක්ත භොජනයෙහි ආශක්ත වූවාහු වාස කෙරෙති"යි කී.

4. කිම ගිහිවෙස්න, උහු එතෙකින් ම යැපෙත් දැ? යි (වදාළහ.)

"භවත් ගොයුම්ගොතුව, එතෙක් ම නොද වෙයි. භවත් ගොයුම්ගොතුව, කිසි දවසෙක උතුම් උතුම් (පිට්ඨඛජ්ජකාදි) ඛාද්‍ය කති. උතුම් උතුම් (නානපායාසාදි) භොජ්‍යය වළඳ කෙරෙති. උතුම් උතුම් ආස්වාද්‍යය ආස්වාද කෙරෙති. උතුම් උතුම් (අඹපැන් ඈ) පැනුදු බොති. (මෙසේයිත්) උහු මේ කය බල ගන්වන්නාහු නම් වෙති, වඩන්නාහු නම් වෙති, මේදෙබහුල කෙරෙතියි" කී.

ගිහිවෙස්න සම්හෙයෙකින් ඔහු මුලැ කී දුෂ්කරක්‍රියා හැර පියා පැසුළු ඉපිණි ඛාද්‍යාදීන් සතපත් ද, මෙසේයින් මේ කය පිළිබඳ (කලින් කල වන) වෘද්ධිපරිහාණිමාත්‍රයෙක් ම ඇත. (කායභාවනායෙක් නම් නැත.)

5. ගිහිවෙස්න, කෙසේ නම් තා විසින් චිත්තභාවනා අසනලද දැ? යි (භගවත්හු අනුයොග කළසේක) භගවත්හු විසින් සච්චක නුවටදරු චිත්තභාවනායෙන් පුළුවුස්නා ලදුයේ පිළිතුරු සපයා බණන්නට අශක්ත වී.

6. අථ ඛො භගවා සච්චකං නිගණ්ඨපුත්තං එතදවොච: යාපි ඛො තෙ එසා අග්ගිවෙස්සන පුරිමා කායභාවනා භාසිතා, සාපි අරියස්ස විනයෙ නො ධම්මිකා කායභාවනා. කායභාවනං හි[1] ඛො ත්වං අග්ගිවෙස්සන න අඤ්ඤාසි, කුතො පන ත්වං චිත්තභාවනං ජානිස්සසි? අපි ච අග්ගිවෙස්සන යථා අභාවිතකායො ච හොති අභාවිතචිත්තො ච, භාවිතකායො ච භාවිතචිත්තො ච, තං සුණාහි, සාධුකං මනසිකරොහි, භාසිස්සාමීති. එවං භො'ති ඛො සච්චකො නිගණ්ඨපුත්තො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

7. කථඤ්ච අග්ගිවෙස්සන අභාවිතකායො ච හොති අභාවිතචිත්තො ච?

ඉධ අග්ගිවෙස්සන අස්සුතවතො පුථුජ්ජනස්ස උප්පජ්ජති සුඛා වෙදනා. සො සුඛාය වෙදනාය ඵුට්ඨො සමානො සුඛසාරාගී ච හොති, සුඛසාරාගිතඤ්ච ආපජ්ජති. තස්ස සා සුඛා වෙදනා නිරුජ්ඣති. සුඛාය වෙදනාය නිරොධා උප්පජ්ජති දුක්ඛා වෙදනා. සො දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති, සම්මොහං ආපජ්ජති. තස්ස ඛො එසා අග්ගිවෙස්සන උප්පන්නාපි සුඛා වෙදනා චිත්තං පරියාදය තිට්ඨති අභාවිතත්තා කායස්ස. උප්පන්නාපි දුක්ඛා වෙදනා චිත්තං පරියාදය තිට්ඨති අභාවිතත්තා චිත්තස්ස. යස්ස කස්සචි අග්ගිවෙස්සන එවං උභතොපක්ඛං උප්පන්නාපි සුඛා වෙදනා චිත්තං පරියාදය තිට්ඨති අභාවිතත්තා කායස්ස, උප්පන්නාපි දුක්ඛා වෙදනා චිත්තං පරියාදය තිට්ඨති අභාවිතත්තා චිත්තස්ස, එවං ඛො අග්ගිවෙස්සන අභාවිතකායො ච හොති අභාවිතචිත්තො ච.

8. කථඤ්ච අග්ගිවෙස්සන භාවිතකායො ච හොති භාවිතචිත්තො ච?

ඉධ අග්ගිවෙස්සන සුතවතො අරියසාවකස්ස උප්පජ්ජති සුඛා වෙදනා. සො සුඛාය වෙදනාය ඵුට්ඨො සමානො න සුඛසාරාගී ච[2] හොති, න සුඛසාරාගිතඤ්ච[3] ආපජ්ජති. තස්ස සා සුඛා වෙදනා නිරුජ්ඣති. සුඛාය වෙදනාය නිරොධා උප්පජ්ජති දුක්ඛා වෙදනා. සො දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො න සොචති න කිලමති න පරිදෙවති න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජති. තස්ස ඛො එසා[4] අග්ගිවෙස්සන උප්පන්නාපි සුඛා වෙදනා චිත්තං න පරියාදය තිට්ඨති භාවිතත්තා කායස්ස. උප්පන්නාපි දුක්ඛා වෙදනා චිත්තං න පරියාදය තිට්ඨති භාවිතත්තා චිත්තස්ස. යස්ස කස්සචි අග්ගිවෙස්සන එවං උභතොපක්ඛං උප්පන්නාපි සුඛා වෙදනා චිත්තං න පරියාදය තිට්ඨති භාවිතත්තා කායස්ස, උප්පන්නාපි දුක්ඛා වෙදනා චිත්තං න පරියාදය තිට්ඨති භාවිතත්තා චිත්තස්ස, එවං ඛො අග්ගිවෙස්සන භාවිතකායො ච හොති භාවිතචිත්තො චාති.

---

1. කායභාවනම්පි, මජසං. 2. සුඛසාරාගී හොති, සයා. PTS. 3. සුඛසාරාගිතං, සයා. 4 එවං සා, සයා.

6. එකල භාග්‍යවතුන් වහන්සේ සච්චක නුවටදරුහට තෙල වදාළහ: ගිනිවෙස්න, තා විසින් යම් තෙල පළමු කායභාවනාවෙක් කියන ලද ද, එ ද අරිවිනයෙහි දැහැමි කායභාවනාවෙක් නො වේ. ගිනිවෙස්න, නො කායභාවනා මතු දු නො දනිහි, තෝ කොයින් චිත්ත භාවනා දනිහි? තවද ගිනිවෙස්න, යම්පරිදි අභාවිතකාය හා අභාවිතචිත්ත හා භාවිතකාය හා භාවිතචිත්ත හා වේ ද, ඒ අසව, මනාකොට මෙනෙහි කරව, කියමියි වදාළහ. 'එසේ යැ භවතැ' යි සච්චක නුවටදරු භගවත්හට පිළිවදන් දින. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළහ:

7. ගිනිවෙස්න, කෙසේ නම් අභාවිතකාය හා අභාවිතචිත්ත හා වේද යත්:

ගිනිවෙස්න, මෙ ලොව අශ්‍රුතවත් පෘථග්ජනයාහට සුඛවේදනා උපදී. හේ සුඛවේදනා විසින් ස්පර්ශ කරන ලදුයේ සුඛසංරාග ඇති වෙයි. සුඛ-සංරාගසමන්වාගත සෙයට ද පැමිණේ. උහුගේ ඒ සුඛවේදනා නිරුද්ධ වෙයි. සුඛවේදනානිරෝධයෙන් කයෙහි දුඃඛ වේදනා උපදී. හේ දුඃඛ වේදනා විසින් ස්පර්ශකරන ලදුයේ ම සොස්නේ වෙයි, කලකුළුවෙයි, වලප්නේ වෙයි, ළමැඩියෙහි අතින් පැහැර හඬනේ වෙයි, සිහිමුළාවට වදනේ වෙයි. ගිනිවෙස්න, උහුට තෙල උපන් සුඛවේදනා ද සිත ගෙවා ගෙන සිටුනීය, කය අභාවිත (නොවැඩූ) වන බැවින. උපන් දුඃඛවේදනා ද සිත ගෙන සිටුනීය, සිත අභාවිත වන බැවින. ගිනිවෙස්න, යම්කිසිවක්හට කය අභාවිත වන බැවින් මෙසේ (සුඛය එක්පසෙකැ, දුඃඛය එක්පසෙකැයි) උභයතඃපක්‍ෂව උපන් සුඛ වේදනා ද සිත ගෙවා ගෙන සිටුනී ද, චිත්ත අභාවිත වන බැවින් උපන් දුඃඛවේදනා ද සිත ගෙවා ගෙන සිටුනී ද, ගිනිවෙස්න, මෙසේ අභාවිතකාය ද අභාවිතචිත්ත ද වෙයි.

8. ගිනිවෙස්න, කෙසේ නම් භාවිතකාය හා භාවිතචිත්ත හා වේද යත්:

ගිනිවෙස්න, මෙලොව ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවකයාහට සුඛවේදනා උපදී. හේ සුඛවේදනා විසින් ස්පර්ශ කරන ලදුයේ ම සුඛසංරාගයෙන් සමන්වාගත ද නො වෙයි. සුඛසංරාගයෙන් සමන්වාගත සෙයට ද නො පැමිණෙයි. උහුගේ ඒ සුඛවේදනා නිරුද්ධ වෙයි. සුඛවේදනානිරෝධයෙන් මතුයෙහි දුඃඛවේදනා උපදී. හේ දුඃඛවේදනා විසින් පහස්නා ලදුයේ ම නොසොස්නේය, කලකුළු නොවන්නේ ය, නොවලප්නේ ය, ළෙහි අත් පැහැර නොහඬන්නේ ය, සිහි මුළාවට නොවදනේය. ගිනිවෙස්න, උහුගේ තෙල උපන් සුඛවේදනාත් සිත ගෙවා ගෙන නොසිටුනේ ය, කය භාවිත වන බැවින. උපන් දුඃඛවේදනාත් සිත ගෙවා ගෙන නොසිටුනේ ය, සිත භාවිත වන බැවින. ගිනිවෙස්න, යම් කිසිවක්හට මෙසෙයින් උභයතඃපක්‍ෂව උපන් සුඛවේදනාත් කය භාවිත වන බැවින් සිත ගෙවා ගෙන නොසිටුනේ වේද, උපන් දුඃඛවේදනාත් සිත භාවිත වන බැවින් සිතගෙවා ගෙන නොසිටුනේ වේද, ගිනිවෙස්න, මෙසෙයින් භාවිතකාය වෙයි. භාවිතචිත්ත ද වෙයි.

9. "එවං පසන්නා අහං භොතො ගොතමස්ස: භවං හි ගොතමො භාවිතකායො ච භාවිතචිත්තො චා"ති. අද්ධා ඛො තෙ අයං අග්ගිවෙස්සන ආසජ්ජ උපනීය වාචා භාසිතා. අපි ච තෙ අහං බ්‍යාකරිස්සාමි: යතො ඛො අහං අග්ගිවෙස්සන කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො, තං වත මෙ උප්පන්නා වා සුඛා වෙදනා චිත්තං පරියාදාය ඨස්සති, උප්පන්නා වා දුක්ඛා වෙදනා චිත්තං පරියාදාය ඨස්සතීති නෙතං ඛො ඨානං[1] විජ්ජතීති. "තථාභූතස්ස[2] භොතො ගොතමස්ස උප්පජ්ජති තථාරූපා සුඛා වෙදනා යථාරූපා උප්පන්නා සුඛා වෙදනා චිත්තං පරියාදාය තිට්ඨෙය්‍ය, තථාභූතස්ස[2] භොතො ගොතමස්ස උප්පජ්ජති තථාරූපා දුක්ඛා වෙදනා, යථාරූපා උප්පන්නා දුක්ඛා වෙදනා චිත්තං පරියාදාය තිට්ඨෙය්‍යාති." කිං හි නො සියා අග්ගිවෙස්සන?

10. ඉධ මෙ අග්ගිවෙස්සන පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි: සම්බාධො ඝරාවාසො රජාපථො, අබ්භොකාසො පබ්බජ්ජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්ත-පරිපුණ්ණං එකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති. සො ඛො අහං අග්ගිවෙස්සන අපරෙන සමයෙන දහරොව සමානො සුසුකාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා අකාමකානං මාතාපිතුන්නං අස්සුමුඛානං රුදන්තානං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිං.

11. සො එවං පබ්බජිතො[3] සමානො කිංකුසලගවෙසී අනුත්තරං සන්තිවරපදං පරියෙසමානො යෙන ආළාරො කාලාමො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා ආළාරං කාලාමං එතදවොචං:[4] ඉච්ඡාමහං ආවුසො කාලාම ඉමස්මිං ධම්මවිනයෙ බ්‍රහ්මචරියං චරිතුන්ති. එවං වුත්තෙ අග්ගිවෙස්සන ආළාරො කාලාමො මං එතදවොච: 'විහරතායස්මා, තාදිසො අයං ධම්මො යත්ථ විඤ්ඤූ පුරිසො නචිරස්සෙව සකං ආචරියකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යා'ති. සො ඛො අහං අග්ගිවෙස්සන නචිරස්සෙව ඛිප්පමෙව තං ධම්මං පරියාපුණිං. සො ඛො අහං අග්ගිවෙස්සන තාවත-කෙනෙව ඔට්ඨපහතමත්තෙන ලපිතලාපනමත්තෙන ඤාණවාදඤ්ච වදාමි, ථෙරවාදඤ්ච. 'ජානාමි පස්සාමී'ති ච පටිජානාමි, අහඤ්චෙව අඤ්ඤෙ ච.

12. තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: න ඛො ආළාරො කාලාමො ඉමං ධම්මං කෙවලං සද්ධාමත්තකෙන සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමීති පවෙදෙති. අද්ධා ආළාරො කාලාමො ඉමං ධම්මං ජානං පස්සං විහරතීති. අථ ඛ්වාහං අග්ගිවෙස්සන යෙන ආළාරො කාලාමො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා ආළාරං කාලාමං එතදවොචං: කිත්තාවතා නො ආවුසො කාලාම ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසීති? එවං වුත්තෙ අග්ගිවෙස්සන ආළාරො කාලාමො ආකිඤ්චඤ්ඤායතනං පවෙදෙසි.

---

1. නෙතං ඨානං, මජසං සහා. 2. තථාභූතං. මජසං. 3. සො පබ්බජිතො, සහා.
4. එතදවොච, සහා.

9. "භවත් ගෞතමයන් වහන්සේ භාවිතකාය වෙති. භාවිතචිත්ත ද වෙති" යි මම භවත් ගෞතමගෝත්‍රයාට මෙසේ පහදිමි" යි කී. අග්ගිවෙස්සන, තා විසින් ගුණ සටාගෙන ද එලවාගෙන ද මෙබස් කියනලද මැයි. එතෙකුදු වුව තට මම කියමි: අග්ගිවෙස්සන, යම් දවසෙක මම කෙහෙරවුළු බහා කසාවත් හැඳ පෙරෙව ගෙන් නික්ම පැවිද්දට වැදුනෙම් වේ ද, උපන් සුඛවේදනා වේවයි ඒ මා සිත ගෙවා ගෙන සිටුනේ යැ හෝ, උපන් දුඃඛ වේදනා වේවයි ඒ මා සිත ගෙවාගෙන සිටුනේ යැ හෝ යි තෙල කරුණ නොවේ මැ යැයි (වදාලහ). "යම් උපන් සුඛවේදනායෙක් භවත්හුගේ සිත ගෙවා ගෙන සිටුනේ වේ ද, එවන් සුඛවේදනායෙක් භවත් ගෞතමගෝත්‍රයාට නොඋපද්දී හෝ, යම් උපන් දුඃඛවේදනායෙක් භවත්හුගේ සිත ගෙවා ගෙන සිටුනේ වේද, එවන් දුඃඛවේදනායෙක් භවත් ගෞතම-ගෝත්‍රයාට නො උපද්දී හෝ යි" (නුවට කී). 'කුමැයි නොවේ ද? (උපන) අග්ගිවෙස්සනැ'යි වදාලහ.

10. අග්ගිවෙස්සන, සම්‍යක්සම්බෝධියෙන් පළමු ම අනභිසම්බුද්ධ බෝසතක් ව සිටියදී ම මට තෙල සිත් විය: "ගෘහවාස සම්බාධ ය. කෙලශධූලි මාර්ගයෙක. ප්‍රව්‍රජ්‍යා නම් අභ්‍යවකාශස්ථානයෙක. ගිහිගෙහි වසනුවහු විසින් ඒකාන්ත පරිපූර්ණ, ඒකාන්ත පරිශුද්ධ, ලිඛිත (ධෞත) ශඞ්ඛසදෘශ මේ බ්‍රහ්මචර්‍ය්‍යය සරත්නට නොහැකි ය. මම් කෙහෙරවුළු බහා කසාවත් හැඳ පෙරෙව ගිහිගෙන් නික්ම පැවිද්දට වදනෙම් නම් මනා මැනූ"යි. අග්ගිවෙස්සන, මම පසු කලෙක හදුවූ යොවුනින් යුත්, ප්‍රථම වයසින් සමන්වාගත, කළු කෙහෙ ඇති තරුණයෙක්ව සිටියෙම් ම, වගුළ කඳුලින් තෙත් මුව ඇති නොකැමැති දෙමාපියන් හඬනවුනට අනදර කොට කෙහෙරවුළු බහා කසාවත් හැඳ පෙරෙව ගිහිගෙන් නික්ම පැවිද්දට වැදිණිමි.

11. මම මෙසේ පැවිදි වූයෙම් කුසල කිමැයි සොයනුයෙම්, උතුම් ශාන්තිසඞ්ඛ්‍යාතනි වන පිරියෙස්නෙම්, ආළාර කාලාම තවුසන් කරා එළඹියෙමි. එළඹ ආළාරකාලාමයනට තෙල කීමි: "ඇවත කාලාම, මම මේ ධර්මවිනයෙහි බඹසර සරන්නට කැමැතියෙමි"යි. අග්ගිවෙස්සන, මෙසේ කියත්ම කලම්ගොතු ආළාරතවුස් මට තෙල බස් කී: "ආයුෂ්මත් විහරණ කරන්නේ මැනැව. යම් ධර්මයෙක පණ්ඩිත පුරුෂයෙක් මඳකලෙකින් සිය ඇදුරුසමයනමා විසින් දැන පසක් කොට සපයා වෙසේ ද, මේ දහම එබඳු ය"යි. අග්ගිවෙස්සන, මම (උන්ගේ) ඒ ධර්මය මඳ කලෙකින් ම වහා ප්‍රගුණ කෙළෙමි. අග්ගිවෙස්සන, මම තොල ගැටීම් මතුයෙන්, උන් කීවා කීම් මතුයෙන් 'මම දත්මි, දක්මි' යන ඥනවාදය ද, 'මෙහි මම ස්ථිර යෙමි' යන ස්ථිරවාදය ද කියම්. මම් මතු නොවෙමි. සෙස්සෝ ද කියති.

12. අග්ගිවෙස්සන, මට මේ සිත් වී: "ආළාර කාලාම් මේ දහම සුදු සැදැහැ මතුයෙන් තමා විසින් දැන පසක් කොට සපයා වෙසෙමි යි පහළ නොකෙරෙයි. ඒකාන්තයෙන් ආළාර කාලාම මේ දහම් දන්නේ, දක්නේ, විහරණ කෙරෙති"යි කියායි. අග්ගිවෙස්සන, එක්බිති මම ආළාර කාලාමයන් කරා එළඹියෙමි එළඹ ආළාරකාලාමයන්හට තෙල බස් කීමි." කියග කාලාම්, කිපමණෙකින් මේ දහම් තමා විසින් දැන පසක් කොට සපයා පහළ කෙරෙහිදැ?'යි. අග්ගිවෙස්සන, මෙසේ කී කල ආළාර කාලාම ආකිඤ්චඤ්ඤායතනය (නොක් සත්සම්වත්) මා දන්වාලීය.

13. තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: “න ඛො ආළාරස්සෙව කාලාමස්ස අත්ථි සද්ධා, මය්හම්පත්ථි සද්ධා; න ඛො ආළාරස්සෙව කාලාමස්ස අත්ථි විරියං, මය්හම්පත්ථි විරියං; න ඛො ආළාරස්සෙව කාලාමස්ස අත්ථි සති, මය්හම්පත්ථි සති; න ඛො ආළාරස්සෙව කාලාමස්ස අත්ථි සමාධි, මය්හම්පත්ථි සමාධි; න ඛො ආළාරස්සෙව කාලාමස්ස අත්ථි පඤ්ඤා, මය්හම්පත්ථි පඤ්ඤා. යන්නූනාහං යං ධම්මං ආළාරො කාලාමො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමීති පවෙදෙති, තස්ස ධම්මස්ස සච්ඡිකිරියාය පදහෙය්‍යන්ති.” සො ඛො අහං අග්ගිවෙස්සන න චිරස්සෙව ඛිප්පමෙව තං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසිං.

14. අථ ඛ්වාහං අග්ගිවෙස්සන යෙන ආළාරො කාලාමො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා ආළාරං කාලාමං එතදවොචං: එත්තාවතා නො ආවුසො කාලාම ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසීති. “එත්තාවතා ඛො අහං ආවුසො ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙමී”ති. “අහම්පි ඛො ආවුසො එත්තාවතා ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී”ති.

15. “ලාභා නො ආවුසො, සුලද්ධා නො ආවුසො, යෙ මයං ආයස්මන්තං තාදිසං සබ්‍රහ්මචාරිං පස්සාම: ඉති යාහං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙමි, තං ත්වං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරසි. යං ත්වං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරසි, තමහං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙමි. ඉති යාහං ධම්මං ජානාමි, තං ත්වං ධම්මං ජානාසි. යං ත්වං ධම්මං ජානාසි, තමහං ධම්මං ජානාමි. ඉති යාදිසො අහං, තාදිසො ත්වං. යාදිසො ත්වං, තාදිසො අහං. එහිදානි ආවුසො, උභොව සන්තා ඉමං ගණං පරිහරාමා”ති.

16. ඉති ඛො අග්ගිවෙස්සන ආළාරො කාලාමො ආචරියො මෙ සමානො අන්තෙවාසිං[1] මං සමානං අත්තනො[2] සමසමං ඨපෙසි. උළාරාය ච මං පූජාය පූජෙසි. තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: නායං ධම්මො නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති, යාවදෙව ආකිඤ්චඤ්ඤායතනූපපත්තියාති. සො ඛො අහං අග්ගිවෙස්සන තං ධම්මං අනලඞ්කරිත්වා තස්මා ධම්මා නිබ්බිජ්ජ අපක්කමිං.

1. අත්තනො අන්තෙවාසිං, මජසං. 2. අත්තනා, මජසං.

13. ගිනිවෙස්න, මට මෙසේ සිත්විය: "ආළාරකාලාම තවුස්හට ම ශ්‍රද්ධා ඇතියේ නොවෙයි, මට ද ශ්‍රද්ධා ඇත. ආළාරකාලාම තවුස්හට ම වීර්‍ය ඇතියේ නොවෙයි, මට ද වීර්‍ය ඇත. ආළාරකාලාම තවුස්හට ම සිහි ඇතියේ නොවෙයි, මට ද සිහි ඇත. ආළාරකාලාම තවුස්හට ම සමාධි ඇතියේ නොවෙයි. මට ද සමාධි ඇත. ආළාරකාලාම තවුස්හට ම පැන ඇතියේ නොවෙයි, මට ද පැන ඇත. ආළාරකාලාම තවුස් යම් දහමක් තමා විසින් දැන පසක් කොට සපයා වාස කෙරෙමි යි පහළ කෙරේ ද, ඒ දහම පසක් කරනු පිණිස පියෝ කෙරෙම් නම් මනා මැනැ" යි කියාසි. ගිනිවෙස්න, මම මඳකලෙකින් ම වහාම ඒ දහම තමන් විසින් දැන පසක් කොට සපයා විසීමි.

14. ගිනිවෙස්න, එක්බිති මම් ආළාරකාලාම තවුස් කරා එළඹියෙමි. එළඹ ආළාරකාලාම තවුසාට මෙසේ බස් කීමි: "කියග කාලාම, මෙතෙකින් මේ දහම තමා විසින් දැන පසක් කොට සපයා දන්වහි?"යි. "ඇවැත්නි, මෙතෙකින් මම මේ දහම තමා විසින් දැන පසක් කොට සපයා පවසමි"යි හේ කීය. 'මම ද ඇවැත්නි, මෙතෙකින් මේ දහම තමා විසින් දැන පසක් කොට සපයා වෙසෙමි"යි කීමි.

15. "ඇවැත්නි, අපට ලාභයෙකි. ඇවැත්නි, අපට මනා ලැබීමෙකි. ඒ අපි එවන් සබ්‍රහ්මචාරී ආයුෂ්මතුන් දක්නමෝ ද - මෙසේ මම් යම් දහමක් තමා විසින් දැන පසක් කොට සපයා පහළ කෙරෙම් නම්, තෝ සිදු ඒ දහම තමා විසින් දැන පසක් කොට සපයා වාස කෙරෙහි. තෝ යම් දහමක් තමා විසින් දැන පසක් කොට සපයා වෙසෙහි නම්, මමත් ඒ දහම තමා විසින් දැන පසක් කොට සපයා පවසමි. මෙසෙයින් මම යම් සමවත් දහමක් දනිම් නම්, තෝ සිදු ඒ දහම් දන්හි. තෝ යම් දහමක් දන්හි නම් මම ඒ දහම දනිමි. මෙසෙයින් මම යම් බඳුයෙම් වෙම් ද, තෝ එබඳුයෙහි. තෝ යම් බඳුයෙහි ද, මම එබඳුයෙමි. ඇවැත්නි, එව, දැන් අපි දෙදෙනමෝ ම මේ ශිෂ්‍ය ගණයා පරිහරණ කරම්හ"යි කීය.

16. ගිනිවෙස්න, මෙසෙයින් ආළාර කාලාම තවුස් මට ඇදුරු වූයේ, මා අතැවැසියහු තමහට සමසම කොට තැබී ය. උතුම් පූජාසෙදුනු මා පිදී ය. ගිනිවෙස්න, මට මෙසේ සිත්විය: මේ දහම් සසර කලකිරීම පිණිස නො වැටෙයි, නො ඇලීම් පිණිස, රාගාදීන්ගේ නිරෝධය පිණිස, උපශම පිණිස, අභිඥෙය ධර්මයන් අභිජානනය පිණිස, චතුමාර්ගසම්බෝධය පිණිස, නිවන් පසක් කරනු පිණිස නො වැටෙයි. (සැටදහස් කප් ආයු ඇති) ආකිඤ්චඤ්ඤායතන භවයෙහි උපපත්ති මතුවක් පිණිස වැටෙයි. ගිනිවෙස්න, මම ඒ දහම් පමණ නො කොට (මෙයින් කම් නැතැයි) ඒ දහමින් නිබ්ද (උකටලීව) නික්මුණිමි.

17. සො ඛො අහං අග්ගිවෙස්සන කිංකුසලගවෙසී අනුත්තරං සන්තිවරපදං පරියෙසමානො යෙන උද්දකො[1] රාමපුත්තො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා උද්දකං[2] රාමපුත්තං එතදවොචං: ඉච්ඡාමහං ආවුසො ඉමස්මිං ධම්මවිනයෙ බ්‍රහ්මචරියං චරිතුන්ති. එවං වුත්තෙ අග්ගිවෙස්සන උද්දකො[3] රාමපුත්තො මං එතදවොච: "විහරතායස්මා. තාදිසො අයං ධම්මො යත්ථ විඤ්ඤූ පුරිසො[4] න චිරස්සෙව සකං ආචරියකං සයං අභිඤ්ඤා[5] සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යා"ති. සො ඛො අහං අග්ගිවෙස්සන න චිරස්සෙව ඛිප්පමෙව තං ධම්මං පරියාපුණිං. සො ඛො අහං අග්ගිවෙස්සන තාවතකෙනෙව ඔට්ඨපහතමත්තෙන ලපිතලාපනමත්තෙන ඤාණවාදඤ්ච වදාමි ථෙරවාදඤ්ච. 'ජානාමි පස්සාමී'ති ච පටිජානාමි, අහඤ්චෙව අඤ්ඤෙ ච

18. තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: න ඛො රාමො ඉමං ධම්මං කෙවලං සද්ධාමත්තකෙන සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමීති[6] පවෙදෙසි. අද්ධා රාමො ඉමං ධම්මං ජානං පස්සං විහාසීති. අථ ඛ්වාහං අග්ගිවෙස්සන යෙන උද්දකො[7] රාමපුත්තො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා උද්දකං රාමපුත්තං එතදවොචං: කිත්තාවතා නො ආවුසො රාමො ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමීති පවෙදෙසීති. එවං වුත්තෙ අග්ගිවෙස්සන උද්දකො රාමපුත්තො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං පවෙදෙසි.

19. තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: න ඛො රාමස්සෙව අහොසි සද්ධා, මය්හම්පත්ථි සද්ධා; න ඛො රාමස්සෙව අහොසි විරියං, මය්හම්පත්ථි විරියං; න ඛො රාමස්සෙව අහොසි සති, මය්හම්පත්ථි සති; න ඛො රාමස්සෙව අහොසි සමාධි, මය්හම්පත්ථි සමාධි; න ඛො රාමස්සෙව අහොසි පඤ්ඤා, මය්හම්පත්ථි පඤ්ඤා. යන්නූනාහං යං ධම්මං රාමො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමීති පවෙදෙසි,[8] තස්ස ධම්මස්ස සච්ඡිකිරියාය පදහෙය්‍යන්ති. සො ඛො අහං අග්ගිවෙස්සන න චිරස්සෙව ඛිප්පමෙව තං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසිං.

20. අථ ඛ්වාහං අග්ගිවෙස්සන යෙන උද්දකො රාමපුත්තො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා උද්දකං රාමපුත්තං එතදවොචං: එත්තාවතා[9] නො ආවුසො රාමො ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසීති. "එත්තාවතා ඛො ආවුසො රාමො ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසී"ති.[10] අහම්පි ඛො ආවුසො එත්තාවතා ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමීති.

---

1. උදකො, මජසං 2. උදකං, මජසං. 3. උදකො මජසං.
4 විඤ්ඤූපුරිසො ස්‍යා. 5. අභිඤ්ඤාය, සබ්බත්ථ. 6. විහරතීති, ස්‍යා.
7 උදකො, මජසං. 8. පවෙදෙති, ස්‍යා.
9. කිත්තාවතා, ස්‍යා. 10. පවෙදෙමීති, ස්‍යා. සීමු.

17 ගිනිවෙස්න, මම කුසල කිමැයි සොයනුයෙම්, උතුම් ශාන්ති පදය පිරියෙස්නෙනම්, උද්දක රාමපුත්‍රයන් කරා එළඹියෙමි. එළඹ රාම-පුත්‍ර උද්දක තවුස්හට මෙල බස් කීමි: "ඇවැත්නි, මම මේ ධම්විනයෙහි බඹසර සරන්නට කැමැතියෙමි"යි. ගිනිවෙස්න, මෙසේ කී කල රාමපුත්‍ර උද්දක තවුස් මට මෙල බස් කී: "ආයුෂ්මත් විහරණ කරත්තේ මැනැව. යම් ධර්මයෙක නුවණැති පුරුෂයෙක් මඳ කලෙකින් සිය ඇදුරු සමය තමා විසින් දැන පසක් කොට සපයා වෙසේ ද, මේ දහම එබඳු ය"යි. ගිනිවෙස්න, මම (උත්ගේ) ඒ ධර්මය මඳකලෙකින් ම වහාම පුහුණු කෙළෙමි. ගිනිවෙස්න, මම තොලගැටුම් මතුයෙකින්, උත්කිවා වචාලා කිම් මතුයෙකින් 'දනිමි, දකිමි' යන ඥානවාදය ද, 'මෙහි මම ස්ථිරයෙමි' යන ස්ථිරවාදය ද පිළිත කරමි. මම් මතු නොවෙමි. සෙස්සෝ ද පිළිත කෙරෙති.

18. ගිනිවෙස්න, මට මෙසිත් වී; "(උද්දකපිතා) රම්තවුස් මේ සමවත් දහම හුදු සැදැහැමතුයෙන් තමා විසින් දැනැ පසක් කොට ශවසෙමි යි පහල නො කෙළේය. ඒකාන්තයෙන් රම්තවුස් මේ දහම දත්තේ, දක්තේ වාස කෙළේ ය" කියා යි. ගිනිවෙස්න, එක්බිති මම උදරම් පුතු කරා එළඹියෙමි. එළඹ උදරම්පුත්හට මෙල බස් කීමි: "කියග උද්දකය, කිපමණෙකින් රාම තෙමේ මේ දහම තමා විසින් දැනැ පසක් කොට සපයා වාස කෙරෙම්යි පහළ කෙළේ දැ?"යි ගිනිවෙස්න මෙසේ කිකල උදරම්පුත් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය (තෙක් අවසමවත්) දත්වාළීය.

19 ගිනිවෙස්න, මට මෙසිත් වී: "සැදැහැ රාමයාහට මතු (පමණක්) නොවී, මට ද සැදැහැ ඇත. රාමයාහට මතු වැර නොවී, මට ද වැර ඇත. රාමයාහට මතු සිහිය නො වී, මට ද සිහිය ඇත. රාමයාහට මතු සමාධි නොවී, මට ද සමාධි ඇත. රාමයාහට මතු ප්‍රඥ නො වූ, මට ද ප්‍රඥ ඇත. රාම තෙමේ යම් දහමක් තමා විසින් දැන පසක් කොට සපයා වාස කෙරෙම්යි පහල කෙළේ නම්, මම ද ඒ දහම පසක් කරනු පිණිස ප්‍රබත්වැර කෙරෙම් නම් මනා මැනු" යි කියා යි. ගිනිවෙස්න, මම මඳ කලෙකින් ම වහාම ඒ දහම තමා විසින් දැනැ පසක් කොට සපයා වාස කෙළෙමි.

20. ගිනිවෙස්න, එක්බිති මම උදරම්පුතු කරා එළඹියෙමි. එළඹ උදරම්පුත්හට මෙල බස් කීමි: "කියග උද්දකය, මෙපමණෙකින් රාම තෙමේ මේ දහම තමා විසින් දැන පසක් කොට සපයා පහල කෙළේදැ? යි. "ඇවැත්නි, රාම මෙපමණෙකින් මේ දහම් තමා විසින් දැනැ පසක් කොට සපයා පහළ කෙළේය"යි කිය. ඇවත්නි, මම ද මෙපමණෙකින් මේ දහම් තමා විසින් දැනැ පසක් කොට සපයා වාස කෙරෙම් කීමි.

21 “ලාභා නො ආවුසො, සුලද්ධං නො ආවුසො, යෙ මයං ආයස්මන්තං තාදිසං සබ්‍රහ්මචාරිං පස්සාම: ඉති යං ධම්මං රාමො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසි, තං ත්වං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරසි. යං ත්වං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරසි, තං ධම්මං රාමො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසි. ඉති යං ධම්මං රාමො අඤ්ඤාසි, තං ත්වං ධම්මං ජානාසි. යං ත්වං ධම්මං ජානාසි, තං ධම්මං රාමො අඤ්ඤාසි. ඉති යාදිසො රාමො අහොසි, තාදිසො ත්වං. යාදිසො ත්වං, තාදිසො රාමො අහොසි එහිදානි ආවුසො, ත්වං ඉමං ගණං පරිහරා[1]”ති. ඉති ඛො අග්ගිවෙස්සන උදකො රාමපුත්තො සබ්‍රහ්මචාරී මෙ සමානො ආචරියට්ඨානෙ ච මං ඨපෙසි, උළාරාය ච මං පූජාය පූජෙසි. තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: නායං ධම්මො නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති, යාවදෙව නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපපත්තියාති. සො ඛො අහං අග්ගිවෙස්සන තං ධම්මං අනලඞ්කරිත්වා තස්මා ධම්මා නිබ්බිජ්ජ අපක්කමිං.

22. සො ඛො අහං අග්ගිවෙස්සන කිංකුසලගවෙසී අනුත්තරං සන්තිවරපදං පරියෙසමානො මගධෙසු අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන උරුවෙලා සෙනානිගමො තදවසරිං. තත්ථද්දසං රමණීයං[2] භූමිභාගං පාසාදිකඤ්ච වනසණ්ඩං, නදිඤ්ච සන්දන්තිං සෙතකං සුපතිත්ථං රමණීයං, සමන්තා ච ගොචරගාමං.[3] තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: රමණීයො[4] වත භූමිභාගො, පාසාදිකො ච වනසණ්ඩො. නදී ච සන්දති සෙතකා සුපතිත්ථා රමණීයා,[5] සමන්තා ච ගොචරගාමො. අලං[6] වතිදං කුලපුත්තස්ස පධානත්ථිකස්ස[7] පධානායාති. සො ඛො අහං අග්ගිවෙස්සන තත්ථෙව නිසීදිං අලමිදං පධානායාති.

23. අපිස්සු මං අග්ගිවෙස්සන තිස්සො උපමා[8] පටිභංසු අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා:

සෙය්‍යථාපි අග්ගිවෙස්සන අල්ලං කට්ඨං සස්නෙහං උදකෙ නික්ඛිත්තං, අථ පුරිසො ආගච්ඡෙය්‍ය උත්තරාරණිං ආදාය ‘අග්ගිං අභිනිබ්බත්තෙස්සාමි, තෙජො පාතුකරිස්සාමී’ති. තං කිං මඤ්ඤසි අග්ගිවෙස්සන, අපි නු සො පුරිසො අමුං අල්ලං කට්ඨං සස්නෙහං උදකෙ නික්ඛිත්තං උත්තරාරණිං ආදාය අභිමථෙන්තො[9] අග්ගිං අභිනිබ්බත්තෙය්‍ය, තෙජො පාතු කරෙය්‍යාති? “නො හිදං භො ගොතම.” තං කිස්ස හෙතු? “අදුං හි භො ගොතම අල්ලං කට්ඨං සස්නෙහං. තඤ්ච පන උදකෙ නික්ඛිත්තං. යාවදෙව ච පන සො පුරිසො කිලමථස්ස විඝාතස්ස භාගී අස්සා”ති.

1. උභො වසන්තා ඉමං ගණං පරිහරමාති, සයා. 2. රමණීයකං, කත්ථචි.
3. සමන්තා ගොචරගාමං, සයා. 4. රමණීයකො, කත්ථචි.
5. රමණීයකා, කත්ථචි 6. අලමිදං, සයා. 7. පධානිකස්ස, සයා.
8 උපමායො, සයා. 9. අභිමන්ථෙන්තො, සයා.

Free Distribution www.aathaapi.org

21. "ඇවැත්නි, අපට ලාභයෙක ඇවැත්නි, අපට මනා ලැබුමෙක. ඒ අපි එබඳු සබ්‍රම්සර ආයුෂ්මතුන් දක්නමෝ ද - මෙසේ රාමතෙමේ යම් දහමක් තමා විසින් දැන, පසක් කොට සපයා වාස කෙළේද, තොයි ද ඒ දහම තමා විසින් දැන, පසක් කොට සපයා වාස කෙරෙහි. තෝ යම් දහමක් තමා විසින් දැන පසක් කොට සපයා වාස කෙරෙහි ද, රාම තෙමේ ද ඒ දහම තමා විසින් දැන, පසක් කොට සපයා පවසා ලීය. මෙසේ රාම තෙමේ යම් දහමක් දතු නම්, තොයිදු ඒ දහම දන්හි. තෝ යම් දහමක් දන්හි නම්, රාම තෙමේ ඒ දහම දත්තේය. මෙසේ රාම යම්බඳු වී ද, තෝ එබඳුයෙහි ය. තෝ යම්බන්දෙහි නම්, රාම එබඳු වී. ඇවැත්නි, එව, දැන් තෝ මේ ගණය පරිහරණය කරව" යි කීය. ගිනිවෙස්න, මෙසෙයින් උදරම්පුත් මට සබ්‍රම්සර වූයේ මා ඇදුරුතන්හිදු තැබීය. උතුම් පූජායෙනුදු මා පිදී. ගිනිවෙස්න මට තෙල සිත් පහළවී: මේ අට සමවත් දහම කලකිරීම පිණිස නො වැටෙයි. නො ඇලීම් පිණිස, රාගාදීන්ගේ නිරෝධය පිණිස, උපශම පිණිස, අභිඥෙය ධර්මයන් අභිජානනය පිණිස, චතුර්මාර්ගසම්බොධය පිණිස, නිවන් පසක් කරනු පිණිස නො වැටෙයි. නේවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි උපපත්ති මතුවක් පිණිස වැටෙයි. ගිනිවෙස්න, මම ඒ අටසමවත් දහම 'මෙයින් කම් නැතැ'යි පුන පුනා පිළිකෙව් කොට ඒ දහමින් නිබ්ද නික්මිණිමි.

22. ගිනිවෙස්න, මම කුසල කිමැයි සොයනුයෙම්, උත්තමශාන්ති සඞ්ඛ්‍යාත නිවන පිරියෙස්නෙම් මගධ රටෙහි පිළිවෙළින් සැරි සරනුයෙම්, උරුවෙල් දනව්යෙහි සේනානිගම නම් නියම්ගමට පැමිණියෙමි. එහි රමණී බිම් කොටස හා ප්‍රසාදකර වන ලැහැබ හා, සැය වූ මඩ ඇති (පිරිසිදු) මනාව පිහිටි ප්‍රතීර්ථ (පිළිවෙළින් ගැඹුරු තොටව) ඇති, රමණී, ගලන හොය හා හාත්පස සියාල ගොදුරුගම් හා දිටිමි. ගිනිවෙස්න, මට තෙල සිත් වී: භූමිභාගය ඒකාන්තයෙන් රමණීය වෙයි. වන ලැහැබ ප්‍රසාදකර වෙයි. සුදු සුතොට ඇති රමණී හොය ද ගලා බසී. හාත්පස ගොදුරුගම ද වෙයි. ප්‍රධන් කටැපි කුල දරුවක්හට ප්‍රධන්හි යෝග කරනු පිණිස මෙ තැන ඒකාන්තයෙන් සඹනු වෙයි (සමත් වෙයි) කියායි. ගිනිවෙස්න මම "ප්‍රධන්හි යොග කරන්නට මෙතැන යොග්‍ය වෙති" යි එහිම (ප්‍රධන් කරනු සඳහා) හිඳ ගතිමි.

23. තවද ගිනිවෙස්න, පෙර නො ඇසූවිරූ ආශ්චර්‍ය්‍ය එළවන උපමාවෝ තුන් දෙනෙක් මට වැටහුණ හ. ඒ කෙසේ ය යත්:

ගිනිවෙස්න, දියෙහි බැහු සෙනහ සහිත නෙත් කැටෙක් (උදුම්බර-කාෂ්ඨයෙක්) ඇති ද, එසඳ 'ගිනි දල්වා නිපදවමි, තෙජස් පහළ කරමි' යි පුරුෂයෙක් උතුරුඅරිණි (මතුයෙහි සිටුනා ගිනිගානං දණ්ඩෙක්) ගෙන එන්නේ වේ ද, ගිනිවෙස්න, එ කිසේ හඟිහි? ඒ පුරිස දියෙහි බැහු සහසනා තෙල නෙත් කට උතුරඅරිණි ගෙන මඹනේ ගිනි නිපදවන්නේ වේද? තෙද පහළ කරන්නේ වේදැ?යි. "භවත් ගොයුම් ගොතුම, නොවන්නේ මැ ය" ඒ කවර හෙයින? "භවත් ගොයුම් ගොතුව, තෙල නෙත් කට සහසනා වෙයි. එ ද දියෙහි බැහුනේ වෙයි ඒ පුරුෂ කලකුළුවට (කලාන්තයට) පැළදුකට (පීඩ දුඃඛයට) හිමි වනු ම වෙයි."

එවමෙව ඛො අග්ගිවෙස්සන යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා කායෙන[1] චෙව කාමෙහි අවූපකට්ඨා විහරන්ති, යො ච නෙසං කාමෙසු කාමච්ඡන්දො කාමස්නෙහො[2] කාමමුච්ඡා කාමපිපාසා කාම පරිළාහො, සො ච අජ්ඣත්තං න සුප්පහීනො හොති න සුප්පටිප්පස්සද්ධො. ඔපක්කමිකා චෙපි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා දුක්ඛා තිප්පා[3] කටුකා[4] වෙදනා වෙදියන්ති. අභබ්බා'ව තෙ ඤාණාය දස්සනාය අනුත්තරාය සම්බොධාය. නො චෙපි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති, අභබ්බාව තෙ ඤාණාය දස්සනාය අනුත්තරාය සම්බොධාය. අයං ඛො මං අග්ගිවෙස්සන පඨමා උපමා පටිභාසි අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා.

24. අපරාපි ඛො මං අග්ගිවෙස්සන දුතියා උපමා පටිභාසි අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා: සෙය්‍යථාපි අග්ගිවෙස්සන අල්ලං කට්ඨං සස්නෙහං ආරකා උදකා ථලෙ නික්ඛිත්තං, අථ පුරිසො ආගච්ඡෙය්‍ය උත්තරාරණිං ආදාය 'අග්ගිං අභිනිබ්බත්තෙස්සාමි, තෙජො පාතු කරිස්සාමී'ති. තං කිං මඤ්ඤසි අග්ගිවෙස්සන, අපි නු සො පුරිසො අමුං අල්ලං කට්ඨං සස්නෙහං ආරකා උදකා ථලෙ නික්ඛිත්තං උත්තරාරණිං ආදාය අභිමන්ථෙන්තො අග්ගිං අභිනිබ්බත්තෙය්‍ය, තෙජො පාතු කරෙය්‍යාති? "නො හිදං භො ගොතම" තං කිස්ස හෙතු? "අදුං හි භො ගොතම අල්ලං කට්ඨං සස්නෙහං කිඤ්චාපි ආරකා උදකා ථලෙ නික්ඛිත්තං, යාවදෙව ච පන සො පුරිසො කිලමථස්ස විඝාතස්ස භාගී අස්සා"ති. එවමෙව ඛො අග්ගිවෙස්සන යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා කායෙන[5] ඛො කාමෙහි වූපකට්ඨා[6] විහරන්ති, යො ච නෙසං කාමෙසු කාමච්ඡන්දො කාමස්නෙහො[7] කාමමුච්ඡා කාමපිපාසා කාමපරිළාහො සො ච අජ්ඣත්තං න සුප්පහීනො හොති න සුප්පටිප්පස්සද්ධො. ඔපක්කමිකා චෙපි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති. අභබ්බාව තෙ ඤාණාය දස්සනාය අනුත්තරාය සම්බොධාය. නො චෙපි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති, අභබ්බාව තෙ ඤාණාය දස්සනාය අනුත්තරාය සම්බොධාය. අයං ඛො මං අග්ගි වෙස්සන දුතියා උපමා පටිභාසි අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා.

25. අපරාපි ඛො මං අග්ගිවෙස්සන තතියා උපමා පටිභාසි අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා: සෙය්‍යථාපි අග්ගිවෙස්සන සුක්ඛං කට්ඨං කොළාපං[8] ආරකා උදකා ථලෙ නික්ඛිත්තං, අථ පුරිසො ආගච්ඡෙය්‍ය උත්තරාරණිං ආදාය 'අග්ගිං අභිනිබ්බත්තෙස්සාමි, තෙජො පාතු කරිස්සාමී'ති. තං කිං මඤ්ඤසි අග්ගිවෙස්සන, අපි නු[9] සො පුරිසො අමුං සුක්ඛං කට්ඨං කොළාපං ආරකා උදකා ථලෙ නික්ඛිත්තං උත්තරාරණිං ආදාය අභිමන්ථෙන්තො[10] අග්ගිං අභිනිබ්බත්තෙය්‍ය, තෙජො පාතු කරෙය්‍යාති? "එවං භො ගොතම" තං කිස්ස හෙතු? "අදුං හි භො ගොතම සුක්ඛං කට්ඨං කොළාපං, තඤ්ච පන ආරකා උදකා ථලෙ නික්ඛිත්තන්ති." –

---

1. කායෙන චෙව චිත්තෙන ච, මජසං. 2 කාමසිනෙහො, කණ්වි.
3. තිබ්බා, මජසං. 4. ඛරා කටුකා, මජසං
5. කායෙන චෙව චිත්තෙන ච, කාමෙහි, මජසං. කායෙන චෙව කාමෙහි, සයා. PTS.
6. අවූපකට්ඨා, PTS 7 කාමසිනෙහො, සීමු. කණ්වි.
8. කොළාරං, සීමු. 9. අපි නු ඛො, සයා. 10. අභිමත්ථෙන්තො, සයා.

ගිනිවෙස්න, එසෙයින් ම යම් කිසි මහණ කෙනෙක් වෙත්වයි, බමුණු කෙනෙක් වෙත්වයි, කයිනුදු කාමයෙන් දුරු නො වූවාහු වාස කෙරෙත්ද, කම්සපුයෙහි උන්ගේ යම් කාමච්ඡන්දයෙක් කාමස්නෙහයෙක් කාම මූර්ඡායෙක් කාමපිපාසායෙක් කාමපරිදාහයෙක් ඇත් ද, එ ද සියසතන්හි නො පැහුණේ වේ ද, නො සන්හිඳුණේ වේ ද, ඒ හවත් මහණ බමුණෝ ඖපක්‍රමිකවූ ද (උපක්‍රමයෙන් හටගත්) තීව්‍ර කටුක දුඃඛ වේදනා විඳිති. ඔහු ලොකොත්තර මාර්‍ගඥනය පිණිස අභව්‍ය ම වෙති. ඒ හවත් මහණ බමුණෝ උවකමින් නිපන් තිව්‍ර කටුක දුක් වෙදනා නො විඳුනාහු නමුදු, ඔහු ලෝකෝත්තර මාර්‍ගඥනය පිණිස අභව්‍යම වෙති. ගිනිවෙස්න, පෙර නො ඇසූවිරූ මතු මතු විසමය උපදවන මේ පළමුවන උවමාව මට වැටහිණි.

24. ගිනිවෙස්න, පෙර නො ඇසූ විරූ විස්මයජනක දෙවන උපමා- යෙක් ද මට වැටහිණ. කෙසේය යත්: ගිනිවෙස්න, දියෙන් දුරුව ගිය ගොඩ- බිමෙහි තගාලූ, සක්ෂීර, සස්නෙහ, (උදුම්බර) කාෂ්ඨයෙක් ඇත්ද, එක්බිති පුරුෂයෙක් ‘ගිනි මොලොවා ලමි. තෙද නගා ගනිමි’යි උතුරුඅරණි ගෙන එන්නේ වේ ද, ඒ පුරුෂ දියෙන් දුරු ව ගිය, ගොඩබිම තගාලූ, කිරිසහිත හෙයින් තෙත් වූ, එහෙයින් ම සස්නෙහ වූ, තෙල දිඹුල්දඬු උතුරුඅරණි ගෙන මඩනේ ගිනි මොලොවන්නේ වේ ද, තෙද නගා ගන්නේ වේදැයි. “හවත් ගොයුම් ගොතුව, නොවන්නේ මැ ය.” ඒ කවර හෙයින: “හවත් ගොයුම්ගොතුව, දියෙන් දුරු ව සිටිය ද, ගොඩ තගාලූව ද, තෙල කාෂ්ඨය තෙත් වෙයි. ස්නෙහ සහිත වෙයි ඒ පුරුෂ කලමතුවට විඝාතයට හිමි වනු ම වෙයි” කිය. ගිනිවෙස්න, එසෙයින් ම යම් කිසි මහණ කෙනෙක් වෙත්වයි, බමුණු කෙනෙක් වෙත්වයි, කයින් කම්සපුවෙන් මෙසෙයින් දුරුවූවාහු වාස කෙරෙත් ද, උන්ගේ කම්සපුයෙහි යම් කාමච්ඡන්දයෙක් කාමස්නෙහයෙක් කාමමූර්ඡායෙක් කාමපිපාසයෙක් කාමපරිදාහයෙක් ඇත් ද, එද සියසතන නො පැහුණේ වේද, මොනොවට නො සන්හිඳුණේ වේ ද, ඒ හවත් මහණ බමුණෝ ඖපක්‍රමිකවූත් තීව්‍ර කටුක දුඃඛ වේදනා විඳිති. ඔහු ලොකොත්තර මාර්‍ගඥනය පිණිස අභව්‍ය වෙත් මැ ය. ඒ හවත් මහණ බමුණෝ ඖපක්‍රමික තීව්‍ර කටුක දුඃඛවේදනා නොවිඳුතු දු ඔහු ලොකොත්තර මාර්‍ගඥනය පිණිස අභව්‍ය වෙත් මය. ගිනිවෙස්න, ඇඟිලි පොළන්නට නිසි පෙර නො ඇසූවිරූ මේ දෙවන උපමාව මට වැටහිණ.

25. ගිනිවෙස්න, පෙර නොං ඇසූ විරූ මතු මතු ආශ්චර්‍ය උපදවන අන් තුන්වන උපමා ද මට වැටහිණ. ඒ කෙසේය යත්: ගිනිවෙස්න, දියෙන් බැහැර වැ ගිය ගොඩබිම තගාලූ ස්නෙහ රහිත වියැළී පවනින් හඩනා (කොළපු) උදුම්බර කාෂ්ඨයෙක් ඇත් ද, එක්බිති පුරුෂයෙක් ‘ගිනි මොළොවමි, තෙජො ධාතු පහළ කොට ගනිමි’ උතුරුඅරණි ගෙන එන්නේ වේද, ගිනිවෙස්න, ඒ කිමැයි හඟිහි? ඒ පුරුෂ දියෙන් වෙන් ව ගිය, ගොඩබිම තගාලූ, නොතෙත්, පවනින් හඩන, තෙල කාෂ්ඨය උතුරුඅරණි ගෙන මඩනේ ගිනි මොළොවන්නේ වේ ද? තේජෝ ධාතු පහළ කරන්නේ වේදැ?යි “හවත් ගොයුම් ගොතුව, එය වන්නේ මැය.” ඒ කවර හෙයින? “හවත් ගොයුම් ගොතුව, තෙල කාෂ්ඨය, ශුෂ්කය, කොළාපය, එ ද දියෙන් වෙන් වන, ගොඩබිම තගාලන ලදැ” යි.

එවමෙව ඛො අග්ගිවෙස්සන යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා කායෙන[1] චෙව කාමෙහි වූපකට්ඨා විහරන්ති, යො ච නෙසං කාමෙසු කාමච්ඡන්දො කාමස්නෙහො[2] කාමමුච්ඡා කාමපිපාසා කාමපරිළාහො සො ච අජ්ඣත්තං සුප්පහීනො හොති සුප්පටිප්පස්සද්ධො. ඔපක්කමිකා චෙ පි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා දුක්ඛා තිප්පා[3] කටුකා[4] වෙදනා වෙදියන්ති, භබ්බාව තෙ ඤාණාය දස්සනාය අනුත්තරාය සම්බොධාය. නො චෙපි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති, භබ්බාව තෙ ඤාණාය දස්සනාය අනුත්තරාය සම්බොධාය. අයං ඛො මං අග්ගිවෙස්සන තතියා උපමා පටිභාසි අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා.

ඉමා ඛො මං අග්ගිවෙස්සන තිස්සො උපමා[5] පටිභංසු අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා.

26 තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: යන්නූනාහං දන්තෙ'භිදන්තමාධාය[6] ජිව්හාය තාලුං ආහච්ච චෙතසා චිත්තං අභිනිග්ගණ්හෙය්‍යං අභිනිප්පීළෙය්‍යං අභිසන්තාපෙය්‍යන්ති. සො ඛො අහං අග්ගිවෙස්සන දන්තෙ'භිදන්තමාධාය ජිව්හාය තාලුං ආහච්ච චෙතසා චිත්තං අභිනිග්ගණ්හාමි අභිනිප්පීළෙමි අභිසන්තාපෙමි. තස්ස මය්හං අග්ගිවෙස්සන දන්තෙ'භිදන්තමාධාය ජිව්හාය තාලුං ආහච්ච චෙතසා චිත්තං අභිනිග්ගණ්හයතො[7] අභිනිප්පීළයතො අභිසන්තාපයතො කච්ඡෙහි සෙදා මුච්චන්ති. සෙය්‍යථාපි අග්ගිවෙස්සන බලවා පුරිසො දුබ්බලතරං පුරිසං සීසෙ වා ගහෙත්වා ඛන්ධෙ වා ගහෙත්වා අභිනිග්ගණ්හෙය්‍ය අභිනිප්පීළෙය්‍ය අභිසන්තාපෙය්‍ය, එවමෙව ඛො මෙ අග්ගිවෙස්සන දන්තෙ'භිදන්තමාධාය ජිව්හාය තාලුං ආහච්ච චෙතසා චිත්තං අභිනිග්ගණ්හයතො අභිනිප්පීළයතො අභිසන්තාපයතො කච්ඡෙහි සෙදා මුච්චන්ති. ආරද්ධං ඛො පන මෙ අග්ගිවෙස්සන විරියං හොති අසල්ලීනං. උපට්ඨිතා සති අසම්මුට්ඨා.[8] සාරද්ධො ච පන මෙ කායො හොති අප්පටිප්පස්සද්ධො තෙනෙව දුක්ඛප්පධානෙන පධානාභිතුන්නස්ස සතො. එවරූපාපි ඛො මෙ අග්ගිවෙස්සන උප්පන්නා දුක්ඛා වෙදනා චිත්තං න පරියාදාය තිට්ඨති.

27. තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: යන්නූනාහං අප්පාණකං[9] ඣානං ඣායෙය්‍යන්ති. සො ඛො අහං අග්ගිවෙස්සන මුඛතො ච නාසතො ච අස්සාසපස්සාසෙ උපරුන්ධිං. තස්ස මය්හං අග්ගිවෙස්සන මුඛතො ච නාසතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු[10] කණ්ණසොතෙහි වාතානං නික්ඛමන්තානං අධිමත්තො සද්දො හොති. සෙය්‍යථාපි නාම කම්මාරගග්ගරියා ධමමානාය අධිමත්තො සද්දො හොති, එවමෙව ඛො මෙ අග්ගිවෙස්සන මුඛතො ච නාසතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු කණ්ණසොතෙහි වාතානං නික්ඛමන්තානං අධිමත්තො සද්දො හොති. ආරද්ධං ඛො පන මෙ අග්ගිවෙස්සන විරියං හොති අසල්ලීනං. උපට්ඨිතා සති අසම්මුට්ඨා.[11] සාරද්ධො ච පන මෙ කායො හොති අප්පටිප්පස්සද්ධො තෙනෙව දුක්ඛප්පධානෙන පධානාභිතුන්නස්ස සතො. එවරූපාපි ඛො මෙ අග්ගිවෙස්සන උප්පන්නා දුක්ඛා වෙදනා චිත්තං න පරියාදාය තිට්ඨති.

---

1. කායෙන චෙව චිත්තෙන ච, මජසං. 2. කාමසිනෙහො, සාළුවි.
3. තිබ්බා, මජසං. 4 ඛරා කටුකා, මජසං. සතා. 5. උපමායො, සතා.
6. දන්තෙහි දන්තමාධාය, සීමු. සාළුවි 7 අභිනිග්ගණ්හතො, මජසං. PTS. සීමු. සාළුවි.
8. අප්පම්මුට්ඨා, සතා 9 අප්පාණකං යෙව මජසං. සතා. අප්පානකං PTS සී සාළුවි
10 උපරුන්ධෙසු, මජසං. 11 අප්පමුට්ඨා, සතා.

Free Distribution www.aathaapi.org

ගිහිවෙස්න, එසෙයින් ම යම්කිසි මහණ කෙනෙක් හෝ වේවයි, බමුණු කෙනෙක් වේවයි, කයින්ද කාමයන්ගෙන් වෙසෙසින් දුරු වූ වාසය කෙරෙත්ද, කාමයෙහි උන්ගේ යම් කාමච්ඡන්දයෙක් කාමස්නේහයෙක් කාමමූර්ඡායෙක් කාමපිපාසායෙක් කාමපරිදාහයෙක් ඇත් ද, එ ද සියසතන මොනොවට ප්‍රහීණ වෙයි. මොනොවට සන්හිඳුණේ වෙයි ඒ භවත් මහණ බමුණෝ ඖපක්‍රමිකවූත් තීව්‍ර, කටුක, දුඃඛ වේදනා විඳුතුදු ඥානදර්ශන-අනුත්තර සම්බෝධ-සංඛ්‍යාත ලෝකෝත්තර මාර්ගඥානය පිණිස භව්‍ය වෙත් මැ ය. ඉදින් ඒ භවත් මහණ බමුණෝ ඖපක්‍රමික, තීව්‍ර, කටුක, දුඃඛවේදනා නොවිඳුතු දු ලෝකෝත්තරමාර්ග ඥානය පිණිස භව්‍ය වෙත් මැ ය. ගිහිවෙස්න, පුන පුනා ආශ්චර්යයට කරුණු වූ පෙර නො ඇසූ විරූ මේ තුන්වන උපමා මට වැටහිණ.

ගිහිවෙස්න, පෙර නොඇසූ විරූ අභ්‍යාශ්චර්ය වූ මේ ත්‍රිවිධ උපමාවෝ මට වැටහුණාහ.

26. ගිහිවෙස්න, මට මෙසේ සිතෙක් වී, “මම යටිඹිණිය දතෙහි උඩිඹිණිය දත තබා (යටි දතෙහි උඩු දත තබා), දිවින් තල්ල මැඩගෙන, කුසල් සිතින් අකුසල් සිත නිගන්නෙම් නම්, පෙළන්නෙම් නම්, (කෙලෙස් තවන වැරින්) තවන්නෙම් නම් මනා මැනැ”යි. ගිහිවෙස්න, මම යටදතෙහි උඩුදත තබා දිවින් තල්ල මැඩගෙන, කුසල් සිතින් අකුසල් සිත නිගත්මි, පෙළමි, තවමි. ගිහිවෙස්න, යටි දතෙහි උඩු දත තබා දිවින් තල්ල මැඩගෙන කුසල්සිතින් අකුසල් සිත නිගන්නා, පෙළනා, තවනා මාගේ කැසිලින් (කිසිල්ලෙන්) සෝදයෝ සිලියෙති. ගිහිවෙස්න යම්සේ බලවත් පුරුෂයෙක් දුර්වලතර පුරුෂයකු හිසැ හෝ ගෙන භුජශිරසැ හෝ ගෙන නිගන්නේ, පෙළන්නේ තවන්නේ වේ ද, ගිහිවෙස්න, එසෙයින් ම යටදතෙහි උඩුදත තබා දිවින් තල්ල මැඩගෙන, කුසල් සිතින් අකුසල් සිත නිගන්නා, පෙළනා, තවනා මාගේ කැසිලින් සෝදයෝ සිලියෙති. ගිහිවෙස්න, මා විසින් කෙලෙස් තවන වැර රුකළේ වෙයි. (එහෙයින් ම) අසංලීන (නො හැකුළුනේ) වෙයි. සිහි එළැඹියේ අසම්මුෂිත වෙයි ඒ දුක් සහගිය ප්‍රධන් වැර කිරීමෙන් ප්‍රධන් වීර්‍යයෙන් පින් කෑ මගේ කය දරථ සහිත වෙයි. නො සන්හුන් වෙයි. ගිහිවෙස්න, මට උපන් මෙබඳු දුඃඛවේදනාත් සිත් නො නෙවා ගෙන සිටී.

27. ගිහිවෙස්න, මට මෙසේ සිත් වී: මම් අප්‍රාණක (නිරාශ්වාස) ධ්‍යාන කරන්නෙම් නම් මනා මැනැයි. ගිහිවෙස්න, මම මුවින්දු නැහැයින්දු ආශ්වාස ප්‍රශ්වාස වැරිමි. ගිහිවෙස්න, මුවින්දු නැහැයින්දු අසස් පසස් වැළලු කල, දෙකන් සිලින් නික්මෙන වාතයන්ගේ අධිමාත්‍ර ශබ්දයෙක් මට ඇත. පුඹුනා කඹුරු හසන්‍රායෙක යම්බඳු අධිමාත්‍ර ශබ්දයෙක් ඇත් ද, ගිහිවෙස්න, එ පරිදි ම මුවින්දු නැහැයින්දු අසස් පසස් වැළලු කල, දෙකන් සිලින් නික්මෙන වාතයන්ගේ අධිමාත්‍ර ශබ්දයෙක් වෙයි. ගිහිවෙස්න, මා විසින් කෙලෙස් තවන වැර රුකළේ වෙයි. (එ හෙයින්) අසංලීන වෙයි. සිහි එළඹියේ වෙයි. සම්මුෂිත නො වෙයි. ඒ දුක් සහගිය ප්‍රධන් වීර්‍යයෙන් වින්කෑ මාගේ කය දරථ සහිත වෙයි. නො සන්හුන් වෙයි. ගිහිවෙස්න, මට උපන් මෙබඳු දුඃඛවේදනාත් සිත් නො ගෙවා ගෙන සිටී

28. තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: යන්නූනාහං අප්පාණකංයෙව ඣානං ඣායෙය්‍යන්ති. සො ඛො අහං අග්ගිවෙස්සන මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙ උපරුන්ධිං. තස්ස මය්හං අග්ගිවෙස්සන මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තා වාතා මුද්ධානි ඌහනන්ති.[1] සෙය්‍යථාපි අග්ගිවෙස්සන බලවා පුරිසො තිණ්හෙන සිඛරෙන මුද්ධානි[2] අභිමත්ථෙය්‍ය,[3] එවමෙව ඛො මෙ අග්ගිවෙස්සන මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තා වාතා මුද්ධානි ඌහනන්ති. ආරද්ධං ඛො පන මෙ අග්ගිවෙස්සන විරියං හොති අසල්ලීනං. උපට්ඨිතා සති අසම්මුට්ඨා. සාරද්ධො ච පන මෙ කායො හොති අප්පටිප්පස්සද්ධො තෙනෙව දුක්ඛප්පධානෙන පධානාභිතුන්නස්ස සතො. එවරූපාපි ඛො මෙ අග්ගිවෙස්සන උප්පන්නා දුක්ඛා වෙදනා චිත්තං න පරියාදාය තිට්ඨති.

29. තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: යන්නූනාහං අප්පාණකංයෙව ඣානං ඣායෙය්‍යන්ති. සො ඛො අහං අග්ගිවෙස්සන මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙ උපරුන්ධිං. තස්ස මය්හං අග්ගිවෙස්සන මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තා සීසෙ සීසවෙදනා හොන්ති. සෙය්‍යථාපි අග්ගිවෙස්සන බලවා පුරිසො දළ්හෙන වරත්තකබන්ධනෙන[4] සීසෙ සීසවෙඨං දදෙය්‍ය, එවමෙව ඛො මෙ අග්ගිවෙස්සන මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තා සීසෙ සීසවෙදනා හොන්ති. ආරද්ධං ඛො පන මෙ අග්ගිවෙස්සන විරියං හොති අසල්ලීනං. උපට්ඨිතා සති අසම්මුට්ඨා. සාරද්ධො ච පන මෙ කායො හොති අප්පටිප්පස්සද්ධො තෙනෙව දුක්ඛප්පධානෙන පධානාභිතුන්නස්ස සතො. එවරූපාපි ඛො මෙ අග්ගිවෙස්සන උප්පන්නා දුක්ඛා වෙදනා චිත්තං න පරියාදාය තිට්ඨති.

30. තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: යන්නූනාහං අප්පාණකංයෙව ඣානං ඣායෙය්‍යන්ති. සො ඛො අහං අග්ගිවෙස්සන මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙ උපරුන්ධිං. තස්ස මය්හං අග්ගිවෙස්සන මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තා වාතා කුච්ඡිං පරිකන්තන්ති. සෙය්‍යථාපි අග්ගිවෙස්සන දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා තිණ්හෙන ගොවිකන්තනෙන කුච්ඡිං පරිකන්තෙය්‍ය, එවමෙව ඛො මෙ අග්ගිවෙස්සන මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තා වාතා කුච්ඡිං පරිකන්තන්ති. ආරද්ධං ඛො පන මෙ අග්ගිවෙස්සන විරියං හොති අසල්ලීනං. උපට්ඨිතා සති අසම්මුට්ඨා. සාරද්ධො ච පන මෙ කායො හොති අප්පටිප්පස්සද්ධො තෙනෙව දුක්ඛප්පධානෙන පධානාභිතුන්නස්ස සතො. එවරූපාපි ඛො මෙ අග්ගිවෙස්සන උප්පන්නා දුක්ඛා වෙදනා චිත්තං න පරියාදාය තිට්ඨති.

---

1. මුද්ධානං ඌහනන්ති - සිමු. මුද්ධනි ඌහනන්ති, මජසං.
2. මුද්ධානං - සිමු. සතා. PTS.
3. මුද්ධනි අභිමත්ථෙය්‍ය - මජසං.
4. වරත්තක්ඛණ්ඩෙන - මජසං.

28. ගිනිවෙස්න, මට මෙ සිත්වී: "මම අප්‍රාණක වූ ම ධ්‍යානය කරන්නෙම් නම් මනා මැනැ"යි. ගිනිවෙස්න, මම මුවිනුදු නැහැයිනුදු කනිනුදු අසස් පසස් වැරීම්. ගිනිවෙස්න, මුවිනුදු නැහැයිනුදු කනිනුදු අසස් පසස් වැලැහු කල අධිමාත්‍ර වාතයෝ මා හිස මැඩගෙන පෙළත්. ගිනිවෙස්න, බලවත් පුරුෂයෙක් තියුණු තුඩෙකින් යම්සේ හිස මඩතේ වේ ද, ගිනිවෙස්න, එපරිදිම මුවිනුදු නැහැයිනුදු කනිනුදු අසස් පසස් වැලැහු කල අධිමාත්‍ර වාතයෝ මා හිස පෙළා ගතිත්. ගිනිවෙස්න මා විසින් කෙලෙස් තවන වැර ඇරැඹුනේ අසංලීන (නො හැඟවුනේ) වෙයි. (මට) සිහි එළැඹියේ සම්මුෂිත (නටුයේ) නො වෙයි. ඒ දුක් සහගිය ප්‍රධන්වැරකරණින් ප්‍රබතින් විත් කැ මාගේ කය දරථ සහිත වෙයි. නො සන්හුන් වෙයි. ගිනිවෙස්න, මට උපන් මෙවන් දුඃඛවෙදනා ද සිත් නො ගෙන සිටී.

29. ගිනිවෙස්න, මට මෙ සිත්වී: "මම අප්‍රාණක වූ ම ධ්‍යානය කරන්නෙම් නම් මනා මැනැ"යි ගිනිවෙස්න, මම මුවිනුදු නැහැයිනුදු කනිනුදු අසස් පසස් වැරීම්. ගිනිවෙස්න, මුවිනුදු නැහැයිනුදු කනිනුදු අසස් පසස් වැලැහු කල මාගේ හිසෙහි අධිමාත්‍ර ශිරෝවෙදනාවෝ වෙති. ගිනිවෙස්න, යම් සේ බල ඇති පුරුෂයෙක් දළවරබහතින් හිසැ හිස් වෙළුම් දෙන්නේ වේද, ගිනිවෙස්න, එසෙයින් ම මුවිනුදු නැහැයිනුදු කනිනුදු අසස් පසස් වැලැහු කල මා හිසැ අධිමාත්‍ර ශිරඃශූලවෙදනාවෝ වෙති. ගිනිවෙස්න, මා විසින් කෙලෙස් තවන වැර රැකුළේ අසංලීන වෙයි. සිහි එළැඹියේ සම්මුෂිත නො වෙයි. ඒ දුක් සහගිය ප්‍රධන්වැරකරණින් ප්‍රබතින් විත් කැ මාගේ කය දරථ සහිත වෙයි. නො සන්හුන් වෙයි. ගිනිවෙස්න, මට උපන් මෙවන් දුඃඛවෙදනා ද සිත් නො ගෙන සිටී.

30. ගිනිවෙස්න, මට මෙ සිත් වී: මම අප්‍රාණක වූ ම ධ්‍යානය කරන්නෙම් නම් මනා මැනැ"යි ගිනිවෙස්න, මම මුවිනුදු නැහැයිනුදු කනිනුදු අසස් පසස් වැරීම්. ගිනිවෙස්න, මුවිනුදු නැහැයිනුදු කනිනුදු අසස් පසස් වැලැහු කල අධිමාත්‍ර වාතයෝ මාගේ කුස සිඳිත්. ගිනිවෙස්න, දක්‍ෂ ගෝඝාතකයෙක් හෝ ගෝඝාතකයකුගේ අතැවැස්සෙක් හෝ තියුණු ගෙරිකපන කැත්තෙන් යම් පරිදි කුස කපන්නේ වේ ද, ගිනිවෙස්න, එ පරිදි ම මුවිනුදු නැහැයිනුදු කනිනුදු අසස් පසස් වැලැහු කල අධිමාත්‍ර වාතයෝ මා කුස කපති. ගිනිවෙස්න, මා විසින් කෙලෙස් තවන වැර රැකුළේ අසංලීන වෙයි. සිහි එළැඹියේ සම්මුෂිත නො වෙයි. ඒ දුක් සහගිය ප්‍රධන්වැරකරණින් විදුනු මාගේ කය දරථ සහිත වෙයි. නො සන්හුන් වෙයි. ගිනිවෙස්න, මට උපන් මෙවන් දුඃඛවෙදනා ද සිත් නොගෙන සිටී.

31. තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: යන්නූනාහං අප්පාණකඤ්ඤෙව ඣානං ඣායෙය්‍යන්ති. සො ඛො අහං අග්ගිවෙස්සන මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙ උපරුන්ධිං. තස්ස මය්හං අග්ගිවෙස්සන මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තො කායස්මිං ඩාහො හොති. සෙය්‍යථාපි අග්ගිවෙස්සන, ද්වෙ බලවන්තො පුරිසා දුබ්බලතරං පුරිසං නානාබාහාසු ගහෙත්වා අඞ්ගාරකාසුයා සන්තාපෙය්‍යුං සම්පරිතාපෙය්‍යුං, එවමෙව ඛො මෙ අග්ගිවෙස්සන මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තො කායස්මිං ඩාහො හොති. ආරද්ධං ඛො පන මෙ අග්ගිවෙස්සන විරියං හොති අසල්ලීනං. උපට්ඨිතා සති අසම්මුට්ඨා. සාරද්ධො ච පන මෙ කායො හොති අප්පටිප්පස්සද්ධො තෙනෙව දුක්ඛප්පධානෙන පධානාභිතුන්නස්ස සතො. එවරූපාපි ඛො මෙ අග්ගිවෙස්සන උප්පන්නා දුක්ඛා වෙදනා චිත්තං න පරියාදාය තිට්ඨති. අපිස්සු මං අග්ගිවෙස්සන දෙවතා දිස්වා එවමාහංසු: කාලකතො සමණො ගොතමොති. එකච්චා දෙවතා එවමාහංසු: න කාලකතො සමණො ගොතමො, අපි ච කාලං කරොතී'ති. එකච්චා දෙවතා එවමාහංසු: 'න කාලකතො සමණො ගොතමො, නපි කාලං කරොති. අරහං සමණො ගොතමො. විහාරොත්වෙවෙසො[1] අරහතො එවරූපො හොතී'ති.

32. තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: යන්නූනාහං සබ්බසො ආහාරූපච්ඡෙදාය පටිපජ්ජෙය්‍යන්ති. අථ ඛො මං අග්ගිවෙස්සන දෙවතා උපසඞ්කමිත්වා එතදවොචුං: මා ඛො ත්වං මාරිස සබ්බසො ආහාරූපච්ඡෙදාය පටිපජ්ජි. සචෙ ඛො ත්වං මාරිස සබ්බසො ආහාරූපච්ඡෙදාය පටිපජ්ජිස්සසි, තස්ස තෙ මයං දිබ්බං ඔජං[2] ලොමකූපෙහි අජ්ඣොහාරෙස්සාම තාය ත්වං යාපෙස්සසීති. තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: අහඤ්චෙව ඛො පන සබ්බසො අජද්ධුකං[3] පටිජානෙය්‍යං, ඉමා ච මෙ දෙවතා දිබ්බං ඔජං ලොමකූපෙහි අජ්ඣොහාරෙය්‍යුං, තාය චාහං යාපෙය්‍යං, තං මම අස්ස මුසාති. සො ඛො අහං අග්ගිවෙස්සන තා දෙවතා පච්චාචික්ඛාමි, හලන්ති වදාමි.

33. තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: යන්නූනාහං ථොකං ථොකං ආහාරං ආහාරෙය්‍යං පසතං පසතං- යදි වා මුග්ගයූසං යදි වා කුලත්ථයූසං යදි වා කළායයූසං යදි වා හරෙණුකයූසන්ති. සො ඛො අහං අග්ගිවෙස්සන ථොකං ථොකං ආහාරං ආහාරෙසිං පසතං පසතං- යදි වා මුග්ගයූසං යදි වා කුලත්ථයූසං යදි වා කළායයූසං යදි වා හරෙණුකයූසං. තස්ස මය්හං අග්ගිවෙස්සන ථොකං ථොකං ආහාරං ආහාරයතො පසතං පසතං- යදි වා මුග්ගයූසං යදි වා කුලත්ථයූසං යදි වා කළායයූසං යදි වා හරෙණුකයූසං, අධිමත්තකසිමානං පත්තො කායො හොති. සෙය්‍යථාපිනාම ආසීතිකපබ්බානි වා කාළපබ්බානි වා, එවමෙවස්සු මෙ අඞ්ගපච්චඞ්ගානි භවන්ති තායෙවප්පාහාරතාය. සෙය්‍යථාපි නාම ඔට්ඨපදං, එවමෙවස්සු මෙ ආනිසදං හොති තායෙවප්පාහාරතාය. සෙය්‍යථාපි නාම වට්ටනාවළී, එවමෙවස්සු මෙ පිට්ඨිකණ්ටකො උන්නතාවනතො හොති, තායෙවප්පාහාරතාය. සෙය්‍යථාපි නාම ජරසාලාය ගොපානසියො ඔලුග්ගවිලුග්ගා භවන්ති, එවමෙවස්සු මෙ ඵාසුළියො ඔලුග්ගවිලුග්ගා භවන්ති තායෙවප්පාහාරතාය. -

1. විහාරොත්වෙව සො - මජසං. 2. දිබ්බොජං - මජසං. 3. අජජ්ජිතං - මජසං.

Free Distribution www.aathaapi.org

31. ගිහිවෙස්න, මට මෙ සිත්වී: "මම අප්‍රාණක වූ ම ධ්‍යානය කරන්නෙම් නම් මනා මැනැ"යි. ගිහිවෙස්න, මම මුවිනුදු නැහැයිනුදු කනිනුදු අසස් පසස් වැරීම්. ගිහිවෙස්න, මුවිනුදු නැහැයිනුදු කනිනුදු අසස් පසස් වැළැහු කල මා කයෙහි අධිමාත්‍ර දාහ වෙයි. ගිහිවෙස්න, බල ඇති දෙපුරිස් කෙනෙක් දුර්වලතර පුරුෂයකු වෙන වෙන අත්හි ලාගෙන අඟුරු වළෙක ලා යම්පරිදි තවන්නාහු වෙත් ද, වෙසෙසින් තවන්නාහු වෙත් ද, ගිහිවෙස්න, එ පරිදි ම මුවිනුදු නැහැයිනුදු කනිනුදු අසස් පසස් වැළැහු කල මාගේ කයෙහි අධිමාත්‍ර දාහ වෙයි. ගිහිවෙස්න, මා විසින් වැර අරඹන ලද්දේ අසංලීන වෙයි. සිහි එළඹියේ සම්මූෂිත නොවෙයි. ඒ දුක් සහගිය ප්‍රධන්වැරකරණින් ප්‍රධනින් විත් කෑ මාගේ කය දරථ සහිත වෙයි. නො සන්හුන් වෙයි. ගිහිවෙස්න, මට උපන් මෙවන් දුඃඛ වෙදනාත් සිත් නොගෙන සිටී. තවද ගිහිවෙස්න, දෙවිකෙනෙක් මා දැක මෙසේ කීහ: "මහණ ගොයුම් කළුරිය කළහ"යි. කිසි දෙවිකෙනෙක් මෙසේ කීහ: "මහණ ගොයුම් කළුරිය නො කෙළේ. එතෙකුදු වුව, (මදෙකින්) කළුරිය කළ හෙති" යි. කිසි දෙවි කෙනෙක් මෙසේ කීහ: "මහණ ගොයුම් කළුරිය නො කෙළේ ය. (මදෙකින්) නොද කළුරිය කෙරෙයි. මහණ ගොයුම් රහතෙක. රහත්හුගේ නෙල විහාරය මෙබඳු ම (මළා මෙන්) වෙති යි.

32. ගිහිවෙස්න, මට මෙ සිත්වී: මම හැම ලෙසින් අහර නො වළඳනු පිණිස පිළිපදනෙම් නම් මනා මැනැ"යි. ඉක්බිති ගිහිවෙස්න, දෙවියෝ මා කරා අවුත් නෙල බස් කීහු: "නිදුකාණෙනි, තොප හැමසෙ ආහාරෝපච්ඡේදය පිණිස නොපිළිපදනේ මැනැව. නිදුකාණෙනි, ඉදින් තෙපි හැමසෙ අහර වළඳන්නට පිළිපදනහු නම් අපි තොපට දිව්‍යඕජස් ලොමකූපයෙන් කවම්හ, එයින් තෙපි යැපෙව" යි. ගිහිවෙස්න, මට මෙසේ සිත් වී "මම වනාහි හැම ලෙසින් අභොජනය ප්‍රතිඥ කෙරෙම් නම්, මේ දෙවියෝ ද මට ලොමකූපයෙන් දිව්‍ය ඕජා බහන් නම්, එයිනුදු මම යපෙම් නම්, ඒ මාගේ මුසාවා වෙයි." ගිහිවෙස්න, මම ඒ දෙවියන් වළකම්. මෙයින් කම් නැති යයි කියම්.

33. ගිහිවෙස්න, මට මෙසිත් වී; "මම මුං යුස හෝ ය, කොල්ලු යුස හෝ ය, මහ මැහැ (කඩල) යුස හෝය, කුඩා මැහැ යුස හෝ ය යි පත පත බැගින් මඳ මඳ අහර වළඳ කෙරෙම් නම් මනා මැනැ"යි. ගිහිවෙස්න, මම, මුංයුස හෝ ය, කොල්ලුයුස හෝ ය, මහමැයුස හෝ ය කුඩාමැයුස හෝ ය යි පත පත කොට මඳ මඳ අහර වළඳ කෙළෙම්. ගිහිවෙස්න, මුංයුස හෝ ය, කොල්ලුයුස හෝ ය, මහමැයුස හෝ ය සුළුමැයුස හෝ යයි පත පත කොට මඳ මඳ අහර වළඳ කරන මාගේ කය වැඩියක්ම වැහැළි බවට ගියේ වෙයි. 'ආසීතික' වැල්පුරුක් හෝ කළුවැල් පුරුක් හෝ යම්බඳු වේ ද, එම අල්පාහාරතායෙන් මාගේ (හස්තාදි) අඟ හා (අඞ්ගුලයාදි) පසඟ හා එබඳු වෙයි. ඔටුපිය යම්බඳු වේ ද, එම අල්පාහාරතායෙන් මාගේ හිද්ම එබඳු වෙයි. වටන්වැළ යම්බඳු වේ ද, එම අල්පාහාරතායෙන් මාගේ වසටවැළ උන්නතාවනත (හිවිඑබිපියෙවි) වෙයි. දිරූහලෙක ගවනැස්හු යම්පරිදි ඔබ මොබ බිඳහැළුණුහු වෙත් ද, එ පරිදි එම අල්පාහාරතායෙන් මාගේ ඇල ඇට ඔලුගඟවිලුගඟ (තැන තැන නතු මතු) වෙයි. -

සෙය්‍යථාපි නාම ගම්භීරෙ උදපානෙ උදකතාරකා ගම්භීරගතා ඔක්ඛායිකා දිස්සන්ති, එවමෙවස්සු මෙ අක්ඛිකූපෙසු අක්ඛිතාරකා ගම්භීරගතා ඔක්ඛායිකා දිස්සන්ති තායෙවප්පාහාරතාය. සෙය්‍යථාපි නාම තිත්තකාලාපු[1] ආමකච්ඡින්නො වාතාතපෙන සම්ඵුටිතො[2] හොති සම්මිලාතො, එවමෙවස්සු මෙ සීසච්ඡවි සම්ඵුටිතා හොති සම්මිලාතා තායෙවප්පාහාරතාය.

34. සො ඛො අහං අග්ගිවෙස්සන උදරච්ඡවිං පරාමසිස්සාමීති පිට්ඨිකණ්ටකංයෙව පරිග්ගණ්හාමි. පිට්ඨිකණ්ටකං පරාමසිස්සාමීති උදරච්ඡවිංයෙව පරිග්ගණ්හාමි. යාවස්සු මෙ අග්ගිවෙස්සන උදරච්ඡවි පිට්ඨිකණ්ටකං අල්ලීනා හොති තායෙවප්පාහාරතාය. සො ඛො අහං අග්ගිවෙස්සන වච්චං වා මුත්තං වා කරිස්සාමීති තත්ථෙව අවකුජ්ජො පපතාමි තායෙවප්පාහාරතාය. සො ඛො අහං අග්ගිවෙස්සන ඉමමෙව කායං අස්සාසෙන්තො පාණිනා ගත්තානි අනුමජ්ජාමි. තස්ස මය්හං අග්ගිවෙස්සන පාණිනා ගත්තානි අනුමජ්ජතො පූතිමූලානි ලොමානි කායස්මා පපතන්ති තායෙවප්පාහාරතාය. අපිස්සු මං අග්ගිවෙස්සන මනුස්සා දිස්වා එවමාහංසු: කාළො සමණො ගොතමොති. එකච්චෙ මනුස්සා එවමාහංසු: න කාළො සමණො ගොතමො, සාමො සමණො ගොතමොති. එකච්චෙ මනුස්සා එවමාහංසු: න කාළො සමණො ගොතමො නපි සාමො, මඞ්ගුරච්ඡවි සමණො ගොතමොති. යාවස්සු මෙ අග්ගිවෙස්සන තාව පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො උපහතො හොති තායෙවප්පාහාරතාය.

35. තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: "යෙ ඛො කෙචි අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා ඔපක්කමිකා දුක්ඛා තිප්පා[3] කටුකා[4] වෙදනා වෙදියිංසු, එතාවපරමං, නයිතො භිය්‍යො. යෙපි හි කෙචි අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියිස්සන්ති, එතාවපරමං, නයිතො භිය්‍යො. යෙපි හි කෙචි එතරහි සමණා වා බ්‍රාහ්මණා වා ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති, එතාවපරමං, නයිතො භිය්‍යො. න ඛො පනාහං ඉමාය කටුකාය දුක්කරකාරිකාය අධිගච්ඡාමි උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං. සියා නු ඛො අඤ්ඤො මග්ගො බොධායා"ති.

36. තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: අභිජානාමි ඛො පනාහං පිතුසක්කස්ස කම්මන්තෙ සීතාය ජම්බුච්ඡායාය නිසින්නො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතා. සියා නු ඛො එසො මග්ගො බොධායාති. තස්ස මය්හං අග්ගිවෙස්සන සතානුසාරිවිඤ්ඤාණං අහොසි: එසොව මග්ගො බොධායාති. -

1. තිත්තකාලාබු - මජසං.
2. සම්ඵුසිතො - මජසං.
3. තිබ්බා - මජසං.
4. ඛරා, කටුකා - මජසං.

යම්පරිදි ගැඹුරු ළිඳෙහි දියතරු ගැඹුරට ගියාහු, යට ගැලුණුහු පැනෙත් ද, එපරිදි ම එම අල්පාහාරතායෙන් මාගේ අක්ෂිකූපයෙහි ඇස්තරු (කනීනිකාවෝ) ගැඹුරට ගියාහු, යට ගැලුණුහු පැනෙති. යම් පරිදි අමුව තිලමින් සිඳිය දී සුන් තිතුලබු අවුසුළඟින් හැකුළුණේ මිලියේ වේ ද, එපරිදි එම අල්පාහාරතායෙන් මාගේ හිස සිවිය හැකුළුණේ, මැලැවුණේ වෙයි.

34. ගිනිවෙස්සන, මම බඩසිවිය පිරිමදිමී යි බඩසිව්සහගිය වසට ම අත්ලා ගනිමි. වසට පිරිමදිමි යි වසටසහගිය බඩසිවිය ම අත්ලා ගනිමි. ගිනිවෙස්සන, මාගේ දුෂ්කරක්‍රියාව කොතරම් වී ද යත්: එම අල්පාහාර-තායෙන් මාගේ උදරච්ඡවිය පිටිකටුව පැහැර ඇලී සිටියා වෙයි. ගිනිවෙස්සන, මම එම අල්පහාරතායෙන් මල මූ හෝ කරමි ද එතැන ම යටිහුරු ව ඇද වැටෙමි ගිනිවෙස්සන, මම මේ (පශ්චිමභවික) කය ම අස්වසනුයෙමි අතින් ගාත්‍රයන් පිරිමදිමි. ගිනිවෙස්සන, එම අල්පාහාරතායෙන් අතින් ගාත්‍ර පිරිමදනා මාගේ කයින් (මස් ලේ නැතියෙන්) දුගඳ මුලසුන් ලෝමයෝ ගිලිහී වැටෙති. තවද ගිනිවෙස්සන, මිනිස්හු මා දැක මෙසේ කිහ: "මහණ ගොයුම් කළුවත් වෙති"යි ඇතැම් මිනිස්හු මෙසේ කිහ: "මහණ ගොයුම් කළුවත් නොවෙයි. මහණ ගොයුම් රත්වත් වෙති"යි. ඇතැම් මිනිස්සු මෙසේ කිහ: "මහණ ගොයුම් කළුවත් නො වෙයි. නො ද රත්වත් වෙයි. මහණ ගොයුම් මඟුරුමසුපැහැ බඳු පැහැ ඇතියෙකැ"යි. ගිනිවෙස්සන, එතරම් පරිශුද්ධ වූ පර්‍යවදාත වූ මාගේ ඡවිවර්ණය එම අල්පාහාරතායෙන් මෙපමණට නටුයේ වෙයි.

35. ගිනිවෙස්සන, මට මෙසේ සිත් වී: "යටගිය දවස මහණ කෙනෙක් වෙත්වයි, බමුණු කෙනෙක් වෙත්වයි, යම්කිසි කෙනෙක් ඖපක්‍රමික වූ තීව්‍ර, කටුක, දුඃඛ වේදනා වින්දාහු ද, (ඒ වේදනාවනට ද මා වින්ද)තෙල දුක් ම පරම වෙයි. මෙයින් වැඩි වූයේ නො වෙයි. මතු අනායෙහි මහණ කෙනෙක් වෙත්වයි, බමුණු කෙනෙක් වෙත්වයි, යම්කිසි කෙනෙක් ඖපක්‍රමික වූ තීව්‍ර, කටුක, දුඃඛවේදනා විඳිත් ද, (ඒ වේදනාවනට) තෙල දුක් ම පරම වෙයි. මෙයින් වැඩි වන්නේ නො වෙයි. මෙ දවස මහණ කෙනෙක් වෙත්වයි, බමුණු කෙනෙක් වෙත්වයි, යම් ම කෙනෙක් ඖපක්‍රමික වූ තීව්‍ර, කටුක, දුඃඛවේදනා විඳිත් ද, (ඒ වේදනාවනට ද) තෙල දුක් ම පරම වෙයි. මෙයින් වැඩියෙක් නොවෙයි. මම මේ කුළු දුෂ්කරක්‍රියායෙන් මිනිස් දහමින් උතුම් අරිබව කරන්නට සමත් ලොවුතුරා මඟ නැණවෙසෙසක් නො පිළිවිදුමි. සම්බොධය පිණිස අන් මඟෙක් විය හේ නු"යි.

36. ගිනිවෙස්සන, මට මෙසේ සිත්වී: "පියසැහැ මහරජාණන් කමතෙහි සිහිල් දඹරුක් සෙවනෙහි (පලඟ බැඳ) හුන්නේ, කාමයෙන් වෙන් ව ම අකුසල් දහමින් වෙන් ව ම සවිතර්ක වූ සවිචාර වූ විවේකජප්‍රීති සුඛ ඇති, ප්‍රථමධ්‍යානය සපයාගෙන වාස කෙළෙමි මම දනිමිම ය. සම්බොධය පිණිස මේ මාර්ග විය හෙනී දෝ"යි. ගිනිවෙස්සන, සම්බොධය පිණිස තෙල (ආනාපානසති ධ්‍යානය) ම මාර්ගය වේ"ය කියා මට සතානු-සාරිවිඥානය ('මේ ම මාර්ගය වේ ය'යි වරක් දෙවරක් උපන් සමාපත්තියට අනතුරුව උපදනා) විඥානය ඇති වී-

තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: කින්නු ඛො අහං තස්ස සුඛස්ස භායාමි යන්තං සුඛං අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහීති.

37. තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: න ඛො අහං තස්ස සුඛස්ස භායාමි යන්තං සුඛං අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහීති. තස්ස මය්හං අග්ගිවෙස්සන එතදහොසි: න තං සුකරං සුඛං අධිගන්තුං එවං අධිමත්තකසිමානං පත්තකායෙන, යන්නූනාහං ඔළාරිකං ආහාරං ආහාරෙය්‍යං ඔදනකුම්මාසන්ති. සො ඛො අහං අග්ගිවෙස්සන ඔළාරිකං ආහාරං ආහාරෙසිං ඔදනකුම්මාසං. තෙන ඛො පන මං අග්ගිවෙස්සන සමයෙන පඤ්ච භික්ඛූ පච්චුපට්ඨිතා හොන්ති: "යං ඛො සමණො ගොතමො ධම්මං අධිගමිස්සති තං නො ආරොචෙස්සතී" ති. යතො ඛො අහං අග්ගිවෙස්සන ඔළාරිකං ආහාරං ආහාරෙසිං ඔදනකුම්මාසං, අථ ඛො තෙ[1] පඤ්ච භික්ඛූ නිබ්බිජ්ජ පක්කමිංසු: 'බාහුලිකො සමණො ගොතමො පධානවිබ්භන්තො ආවත්තො බාහුල්ලායා'ති.

38. සො ඛො අහං අග්ගිවෙස්සන ඔළාරිකං ආහාරං ආහාරිත්වා[2] බලං ගහෙත්වා විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහාසිං. එවරූපාපි ඛො මෙ අග්ගිවෙස්සන උප්පන්නා සුඛා වෙදනා චිත්තං න පරියාදාය තිට්ඨති.

39. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහාසිං. එවරූපාපි ඛො මෙ අග්ගිවෙස්සන උප්පන්නා සුඛා වෙදනා චිත්තං න පරියාදාය තිට්ඨති.

40. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහාසිං සතො ච සම්පජානො. සුඛඤ්ච කායෙන පටිසංවෙදෙසිං. යං තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියං ඣානං උපසම්පජ්ජ විහාසිං. එවරූපාපි ඛො මෙ අග්ගිවෙස්සන උප්පන්නා සුඛා වෙදනා චිත්තං න පරියාදාය තිට්ඨති.

41. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහාසිං. එවරූපාපි ඛො මෙ අග්ගිවෙස්සන උප්පන්නා සුඛා වෙදනා චිත්තං න පරියාදාය තිට්ඨති.

42. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[3] පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙසිං. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි සෙය්‍යථීදං:-

1. අථ මෙතෙ - මජසං. 2. ආහාරෙත්වා - මජසං. 3. ආනෙජ්ජප්පත්තෙ - සීමු.

Free Distribution www.aathaapi.org

ගිහිවෙස්න, මට මෙසේ සිත් වී: “කාමයන් හැරපියා සිටි, අකුසල් දහම් හැරපියා සිටි, යම් ඒ (ආනාපානසමාධියෙන් ලත් ප්‍රථමධ්‍යාන) සුඛයෙක් වේද, කිම, මම ඒ සුඛයට බියපත් වෙම් දෝ හෝ”යි.

37. ගිහිවෙස්න මට මෙසේ සිත් වී: “කාමයන් හැරපියා සිටි, අකුශල ධර්ම හැරපියා සිටි, යම් ඒ සුවයෙක් ඇත් ද, මම ඒ සුවයට බියපත් නොවෙමි”යි. ගිහිවෙස්න, මට මෙසේ සිත්වී: “මෙසේ අතිශයෙන් මැහැලි පත් කයින් ඒ සුවය ලැබගන්නට සුකර නොවේ. මම දළ බත්කොමු අහර වළඳ කෙරෙම් නම් මනා මැනැ”යි කියායි. ගිහිවෙස්න, මම දළ බත්කොමු අහර වළඳ කෙළෙමි. ගිහිවෙස්න, එ දවස “මහණ ගොයුම් යම් දහමක් අධිගම කෙරේ ද, එ දහම අපට කියති” යි භික්‍ෂූහු පස්දෙනෙක් මා උවටනෙහි යෙදුනාහු වෙති. ගිහිවෙස්න, මම දළ බත්කොමු අහර වළඳ කෙළෙම් ද, එ හෙයින් ඒ පස් මහණහු “මහණ ගොයුම්හු ප්‍රත්‍යයබාහුලිකයහ. ප්‍රධනින් ගිළිහුණ හ. බාහුල්‍යයට (ප්‍රණීත භොජනාදියට) නැවත වැටුණාහ”යි උකැටි ව මා පියා ගිය හ.

38. ගිහිවෙස්න, මම ඖදාරික ආහාර වැළඳුයෙම් කායබල ලැබ-කාමයෙන් වෙන් ව අකුසල් දහමින් වෙන් ව විතර්ක සහිත, විචාර සහිත විවෙකයෙන් උපන් ප්‍රීති සුඛ ඇති, ප්‍රථමධ්‍යානයට පැමිණ වාස කෙළෙමි. ගිහිවෙස්න මෙබඳු වූත් උපන් සුඛවෙදනාව මා සිත් ගෙන නො සිටී.

39. විතර්කවිචාරයන් සන්හිඳීමෙන් සිය සතන්හි සම්ප්‍රසාදන ඇති, සිත්හුගේ එකොදි (උතුම් ව උපදනා) සමාධිය වඩනා, විතර්කරහිත, විචාර-රහිත, (ප්‍රථම ධ්‍යාන) සමාධියෙන් උපන් ප්‍රීති සුඛ ඇති ද්විතීය ධ්‍යානයට එළඹ වාස කෙළෙමි. ගිහිවෙස්න, මෙබඳු වූත් උපන් සුඛවෙදනා මා සිත් ගෙන නො සිටී.

40. ප්‍රීතියගේ ද විරාගයෙන් උපෙක්‍ෂක ද වූයෙමි, සමෘතිමත් ද වූයෙමි, සම්‍යග්ඥාන ඇත්තෙම් වාස කෙළෙමි. සුඛය ද නාමකයින් වළඳ කෙළෙමි. යම් ධ්‍යානයක් සඳහා “හේ උපෙක්‍ෂකය, සමෘතිමත් ය, සුඛවිහරණ ඇතියෙකැ”යි ආර්‍ය්‍යයෝ කියත් ද, ඒ තෘතීය ධ්‍යානය උපයා වාස කෙළෙමි. ගිහිවෙස්න, මෙබඳු වූත් උපන් සුඛවෙදනාව මා සිත් ගෙන නො සිටී

41. සුඛප්‍රහාණයෙනුදු, දුඃඛප්‍රහාණයෙනු දු, පළමු ම සොම්නස් දොම්නස්හුගේ ප්‍රහාණයෙන් දුක් නැති, සුඛ නැති, උපෙක්‍ෂායෙන් උපන් පිරිසිදු සිහි ඇති, චතුර්ථධ්‍යානය ලැබ ගෙන වාස කෙළෙමි. ගිහිවෙස්න, මෙබඳු වූත් උපන් සුඛවෙදනාව මා සිත් ගෙන නො සිටී.

42. මම මෙසෙයින් මොනොවට එකඟ වූ සිත පිරිසිදු ව පර්‍ය්‍යවදාත ව අනඞ්ගණ ව විගතොපක්ලෙශ ව මෘදුභූත ව කර්මණ්‍ය ව ස්ථිත ව නිශ්චල-ප්‍රාප්ත ව සිටි කල ඒ සිත පූර්වෙනිවාසානුස්මෘතිඥානය පිණිස නතු කෙළෙමි. මම නන්වැදෑරුම් වූ පූර්වෙනිවාසය සිහිකරමි. එ කෙසේය යත්:-

“එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසතිම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරිසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි, අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ, ‘‘අමුත්‍රාසිං එවංනාමො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො”ති - ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි. අයං ඛො පන මෙ[1] අග්ගිවෙස්සන රත්තියා පඨමෙ යාමෙ පඨමා විජ්ජා අධිගතා, අවිජ්ජා විහතා විජ්ජා උප්පන්නා, තමො විහතො ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො. එවරූපාපි ඛො මෙ අග්ගිවෙස්සන උප්පන්නා සුඛා වෙදනා චිත්තං න පරියාදාය තිට්ඨති.

43. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[2] සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙසිං. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි: චවමානෙ, උප්පජ්ජමානෙ[3] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාමි: ‘ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා; ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා’ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උප්පජ්ජමානෙ. හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාමි: -පෙ- අයං ඛො පන මෙ අග්ගිවෙස්සන රත්තියා මජ්ඣිමෙ යාමෙ දුතියා විජ්ජා අධිගතා, අවිජ්ජං විහතා විජ්ජා උප්පන්නා, තමො විහතො ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො. එවරූපාපි ඛො මෙ අග්ගිවෙස්සන උප්පන්නා සුඛා වෙදනා චිත්තං න පරියාදාය තිට්ඨති.

1. අයං ඛො මෙ - මජසං. 2. ආනෙජ්ජප්පත්තෙ - සීමු.
3. උපපජ්ජමානෙ - මජසං, සතා PTS.

එක්දූයකුදු, දෙදූයකුදු, තුන්දූයකුදු, සිවුදූයකුදු, පස්දූයකුදු, දසදූයකුදු, විසිදූයකුදු, තිස්දූයකුදු, සාලිස්දූයකුදු, පනස්දූයකුදු, සියක්දූයකුදු, දහස්දූයකුදු, සුවහස්දූයකුදු- අනේකසංවර්තකල්පයනුදු, අනේකවිවර්ත-කල්පයනුදු, අනේකසංවර්ත විවර්තකල්පයනුදු, සිහි කෙරෙමි: "අසෝ තන්හි උපන්මි. "මෙබඳු නම් ඇතියෙමි, මෙබඳු ගොත්‍ර ඇති යෙමි, මෙබඳු වර්ණ ඇතියෙමි, මෙබඳු ආහාර ඇතියෙමි, මෙබඳු සුවදුක් විඳියෙමි, මෙබඳු ආයුකාල අවසන් කෙළෙම් වීමි. මම එයින් ච්‍යුතව අසෝ තැන (තුෂිතභවනයෙහි) පහළවීමි. එහි (තුෂිතභවනයෙහි)දු මෙ බඳු (සෙතකෙතු නම්) නම් ඇති වීමි. මෙබඳු ගොත්‍ර (දෙවියන් හා එකගොත්‍ර) ඇති වීමි. මෙබඳු (සුවණ්‍ණ) වර්ණ ඇතිවීමි. මෙබඳු (සුධාභොජන) ආහාර ඇති වීමි. මෙබඳු දිව්‍යසැප හා සකරදුක් විඳියෙම් වීමි. මෙබඳු (සත්පනස්කෙළසැටසුවහස්වා) ආයුකාල කෙළවර කෙළෙම් වීමි. මම එයින් සැව මෙහි (මහාමායාවන් කුස) උපන්මි"යි මෙසෙයින් (වර්ණාදිවිසින්) ආකාර සහිත (නාමගොත්‍රාදිවිසින්) උද්දෙශසහිත බහුප්‍රකාර පූර්වේනිවාසය සිහිකරමි. ගිනිවෙස්න, මා විසින් රෑය පළමු යමෙහි මේ (පූර්වේනිවාසය දත් හෙයින්) ප්‍රථම වූ විද්‍යාව අධිගත වූය. මට (එම පූර්වේනිවාසය අවිදිත කරමින් සිටි) අවිද්‍යාව විනෂ්ට වූ ය. විද්‍යාව උපන. (යම් හෙයෙකින් විද්‍යාව උපන් ද, එ හෙයින්) මෝහතමස විගත වී. විද්‍යාලොකය උපන. (ස්මෘතිඅවිප්‍රවාසයෙන්) අප්‍රමත්තව (වීර්‍ය්‍යාතාපයෙන්) ආතාප ඇතිව (කායජීවිත දෙක්හි අනපෙක්‍ෂතායෙන්) ප්‍රහිතාත්ම ව වාස කරන්නක්හට (විද්‍යාව උපදනා) සෙයින. ගිනිවෙස්න, මෙ බඳු වූත් උපන් සුඛවේදනාව මා සිත් ගෙන නො සිටී.

43. මම මෙසේ සමාහිත වූ සිත පරිශුද්ධ ව පර්‍ය්‍යවදාත ව අනඞ්ගණ ව විගතොපක්ලෙශ ව මෘදුභූත ව කර්මණ්‍ය ව ස්ථිත ව නිශ්චලභාවප්‍රාප්ත ව සිටි කල ඒ සිත සත්ත්වයන්ගේ චුතූපපාතඥාණය (රූපාරම්මණ අලු කරන දිව්‍යසක් නැණ) පිණිස නතු කෙළෙමි. ඒ මම මිනිස් ඇස ඉක්ම සිටි පිරිසිදු දිවැසින් මැරෙන උපදනා සතුන් දකිමි. හීන ප්‍රණීත සුවර්ණ දුර්වර්ණ සුගත දුර්ගත වූ කම් වූ පරිදි ගිය සතුන් දනිමි: "මේ භවත් සත්ත්වයෝ එකාන්තයෙන් කායදුශ්චරිතයෙන් සමන්වාගතයහ, වාග්දුශ්චරිතයෙන් සමන්වාගතයහ, මනොදුශ්චරිතයෙන් සමන්වාගතයහ, ආර්‍ය්‍යයනට උපවාද කරන්නාහ, මිථ්‍යාදෘෂ්ටිකයහ, මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදාන ඇතියහ. ඔහු කාබුන් මරණින් මතුයෙහි සුවෙන් පහ ව සිටි, නපුරුගති ඇති, විවශ ව හෙන නිරයට පැමිණියහ. මේ භවත් සත්ත්වයෝ ද කායසුචරිතයෙන් සමන්වාගතයහ, වාක්සුචරිතයෙන් සමන්වාගතයහ, මනඃසුචරිතයෙන් සමන්වාගතයහ, ආර්‍ය්‍යයනට උපවාද නො කරන්නාහ, සම්‍යග්දෘෂ්ටිකයහ, සම්‍යග්දෘෂ්ටිකර්මසමාදාන ඇතියහ. ඔහු කාබුන් මරණින් මතුයෙහි ශොභන ගති ඇති ස්වර්ගලෝකයට පැමිණියහ"යි. මෙසේ මිනිසැස ඉක්ම සිටි පිරිසිදු දිවැසින් මැරෙන උපදනා සතුන් දක්මි. හීන ප්‍රණීත සුවර්ණ දුර්වර්ණ සුගත දුර්ගත යථාකර්මොපග සත්ත්වයන් දනිමි:... ගිනිවෙස්න, රෑය මැදුම් යමෙහි මා විසින් මෙ දෙවන විද්‍යාව (දිව්‍යසක්නැණ) අධිගත වූය. අවිද්‍යා විනෂ්ට වූය. විද්‍යා උපන. තමස විනෂ්ට විය. ආලොකය උපන. නොපමා ව වැර ඇතිව අරමුණ කරා ගිය සිත් ඇති ව විහාර කරනුවක්හට (විද්‍යා උපදනාක්) සෙයින. ගිනිවෙස්න, මෙබඳු වූත් උපන් සුඛවේදනා මා සිත් ගෙන නො සිටි.

44. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙසිං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං දුක්ඛසමුදයොති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං දුක්ඛනිරොධොති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං අබ්භඤ්ඤාසිං. ඉමෙ ආසවාති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං ආසවසමුදයොති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං ආසවනිරොධොති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං අබ්භඤ්ඤාසිං. තස්ස මෙ එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චිත්ථ. භවාසවාපි චිත්තං විමුච්චිත්ථ. අවිජ්ජාසවාපි චිත්තං විමුච්චිත්ථ. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං අහොසි: 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං නාපරං ඉත්ථත්තායා'ති අබ්භඤ්ඤාසිං. අයං ඛො පන මෙ අග්ගිවෙස්සන රත්තියා පච්ඡිමෙ යාමෙ තතියා විජ්ජා අධිගතා. අවිජ්ජා විහතා විජ්ජා උප්පන්නා, තමො විහතො ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො. එවරූපාපි ඛො මෙ අග්ගිවෙස්සන උප්පන්නා සුඛා වෙදනා චිත්තං න පරියාදාය තිට්ඨති.

45. අභිජානාමි ඛො පනාහං අග්ගිවෙස්සන අනෙකසතාය පරිසාය ධම්මං දෙසෙතා. අපිස්සු මං එකමෙකො එවං මඤ්ඤති: මමෙව ආරබ්භ සමණො ගොතමො ධම්මං දෙසෙතීති. න ඛො පනෙතං අග්ගිවෙස්සන එවං දට්ඨබ්බං. යාවදෙව විඤ්ඤාපනත්ථාය තථාගතො පරෙසං ධම්මං දෙසෙති. සො ඛො අහං අග්ගිවෙස්සන තස්සායෙව කථාය පරියොසානෙ තස්මිංයෙව පුරිමස්මිං සමාධිනිමිත්තෙ අජ්ඣත්තමෙව චිත්තං සණ්ඨපෙමි සන්නිසීදපෙමි[1] එකොදිං කරොමි සමාදහාමි, යෙන සුදං නිච්චකප්පං විහරාමීති.

46. "ඔකප්පනියමෙතං භොතො ගොතමස්ස යථාතං අරහතො සම්මාසම්බුද්ධස්ස. අභිජානාති පන[2] භවං ගොතමො දිවා සුපිතා''ති. අභිජානාමහං අග්ගිවෙස්සන ගිම්හානං පච්ඡිමෙ මාසෙ පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤපෙත්වා[3] දක්ඛිණෙන පස්සෙන සතො සම්පජානො නිද්දං ඔක්කමිතාති. "එතං ඛො භො ගොතම එකෙ සමණබ්‍රාහ්මණා සම්මොහවිහාරස්මිං වදන්තී''ති. න ඛො අග්ගිවෙස්සන එත්තාවතා සම්මූළ්හො වා හොති අසම්මූළ්හො වා. අපි ච අග්ගිවෙස්සන යථා ච සම්මූළ්හො හොති අසම්මූළ්හො ච, තං සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමීති. එවං භො ගොතමාති ඛො[4] සච්චකො නිගණ්ඨපුත්තො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච: -

1. සන්නිසාදෙමි - මජසං. 2. ඛො පන - මජසං. 3. පඤ්ඤපෙත්වා - මජසං.
4. එවං භොති ඛො - මජසං.

44. මම මෙසේ සමාහිත වූ සිත (චතුර්ථධ්‍යාන පාදක විදර්ශනා සිත) පරිශුද්ධ ව පර්‍යවදාත ව අනඞ්ගණ ව විගතොපක්ලේශ ව මෘදුභූත ව කර්මණ්‍ය ව ස්ථිත ව නිශ්චලභාවප්‍රාප්ත ව සිටිකල ඒ චිත්තසන්තතිය රහත් මගනැණ පිණිස නතු කෙළෙමි. මම 'දුක මේයැ'යි ඇතිසැටි පිළිවිදිමි. 'දුඃඛසමුදය මේ යැ' යි ඇතිසැටි පිළිවිදිමි. 'දුඃඛනිරොධය මේයැ' යි (දුඃඛ දුඃඛ සමුදය දෙදෙනාගේ අප්‍රවෘත්ති සඞ්ඛ්‍යාත නිර්වාණය) ඇති සැටි පිළිවිදිමි. 'දුඃඛනිරොධගාමිනීප්‍රතිපද් මෝයැ'යි (නිවන් කරා යන අරිමඟ) ඇති සැටි පිළිවිදිමි. 'ආස්‍රවයෝ මූ යැ' යි යථාභූතය දත්මි. 'ආස්‍රව සමුදය මේ යැ' යි යථාභූතය දත්මි. ආස්‍රවනිරොධය මේ ය යි යථාභූතය දත්මි. "ආස්‍රවනිරොධගාමිනී ප්‍රතිපද් මෝ යැ'යි යථාභූතය දත්මි. මෙසේ දන්නා මෙසේ දක්නා මාගේ සිත කාමාස්‍රවයෙනුදු මිදිණ භවාස්‍රවයෙනුදු සිත මිදිණ. අවිද්‍යාස්‍රවයෙනුදු සිත මිදිණ. විමුක්ත වත් ම විමුක්ත යැ යි (පස්විකුත්) නැණ පහළ වී: 'ජාතිය ක්‍ෂීණ විය. මගබ්‍රහ්මචරියවස් වසන ලදී. (සතර මඟින් කටයුතු ෂොඩශවිධ) කරණී කරන ලදී. ඉත්ථම්භාවය (මෙසේ ෂොඩශාකාරයෙන් සත්‍යාවබොධ) පිණිස අන්‍ය (මාර්ගභාවනා) කෘත්‍යයෙක් නැති යි දත්මි. ගිනිවෙස්න, රැය පැසිම්යමෙහි මේ තුන්වන (අර්හත්මාර්ගඥාන සඞ්ඛ්‍යාත) විද්‍යාව මා විසින් අධිගත වූ ය. අවිද්‍යා විහත ය. විද්‍යා උපන. මොහය විගත විය. ආලොකය උපන අප්‍රමත්ත ව ආතාපී ව ප්‍රහිතාත්ම ව විහාර කරනුවක්හට (විද්‍යාව උපදනාක්) සෙයින. ගිනිවෙස්න, මෙබඳු වූත් උපන් සුඛවෙදනාව මා සිත් ගෙන නො සිටී.

45 ගිනිවෙස්න, මම නොයෙක් සිය ගණන් පිරිස්හි දහම් දෙසුවෙමි දැනිමි ම ය. එහිදු එකෙක් එකෙක් මා මෙසේ හඟනේ ය: "මහණගොයුම් මා ම ඇරැබ දහම් දෙසති" යි. ගිනිවෙස්න, තෙල මෙසේ නො දත යුතුය. තථාගත පරාහට (දනහෙන හැමට ම) විඥාපනය පිණිස දහම් දෙසයි. ගිනිවෙස්න, මම ඒ කථාවසානයෙහි (කථා සන්ධියක් පාසා) ම යම් ඵලසමාධියෙකින් තිතිකල් වෙසෙමි නම්, එම පූර්වසමාධිනිමිත්තයෙහි (එකාග්‍රතායෙන් යෙදී) සියසතන්හි ම සිත තබමි, හිඳුවමි, එකඟ කරමි, නාවාලමි.

46. "අහිත් සම්‍යක් සම්බුද්ධ කෙනෙකුන්ගේ චිත්තෙනකාග්‍රතා සෙයින් භවත් ගොයුම් ගොතුවන්ගේ තෙල එකාග්‍රතා ඇදහිය යුතු වෙයි. භවත් ගෞතමයන් වහන්සේ දවහල නිදිගත්සේක් ද?" ගිනිවෙස්න, ගිමන් පැසිම්මස පසුබත පිඩුවායෙන් වැළකුණෙම් සිවුර සිවුගුණ කොට පත්වා දකුණු ඇළයෙන් සිහි ඇතියෙම්, නුවණින් දත්තෙම්, නිද්‍රාවට (කෙලෙස් රහිත කායවිනතදරථයට) බැස ගත්තෙමි දත්මි. 'භවත් ගොයුම් ගොතුව, ඇතැම් මහණබමුණු කෙනෙක් තෙල නින්ද සමෙමාහවිහාරය (සිහිමුළාව විසීම)'යි කියත් මැනූ'යි ගිනිවෙස්න, මෙතෙකින් සම්මූළ් වෙති යි හෝ අසම්මූළ්වෙති යි හෝ නො කියමි. වැලිදු ගිනිවෙස්න, යම් පරිදි සිහි නටුයේත් වේ ද, සිහි නොනටුයේත් වේ ද ඒ අසව, මනාකොට මෙනෙහි කරව, වදරමි යි. එසේය, භවත් ගොයුම් ගොතුව යි සච්චක නුවට දරු භගවත්හට පිළිවදන් දිත භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළහ:-

47. යස්ස කස්සචි අග්ගිවෙස්සන යෙ ආසවා සඞ්කිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා අප්පහීනා, තමහං සම්මූළ්හොති වදාමි. ආසවානං හි අග්ගිවෙස්සන අප්පහානා සම්මූළ්හො හොති. යස්ස කස්සචි අග්ගිවෙස්සන යෙ ආසවා සඞ්කිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා පහීනා, තමහං අසම්මූළ්හොති වදාමි. ආසවානං හි අග්ගිවෙස්සන පහානා අසම්මූළ්හො හොති. තථාගතස්ස ඛො අග්ගිවෙස්සන යෙ ආසවා සඞ්කිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[1] ආයතිං අනුප්පාදධම්මා. සෙය්‍යථාපි අග්ගිවෙස්සන තාලො මත්ථකච්ඡින්නො අභබ්බො පුන විරූළ්හියා, එවමෙව ඛො අග්ගිවෙස්සන තථාගතස්ස යෙ ආසවා සඞ්කිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මාති.

48. එවං වුත්තෙ සච්චකො නිගණ්ඨපුත්තො භගවන්තං එතදවොච: "අච්ඡරියං භො ගොතම, අබ්භුතං භො ගොතම, යාවඤ්චිදං භොතො ගොතමස්ස එවං ආසජ්ජ ආසජ්ජ වුච්චමානස්ස උපනීතෙහි උපනීතෙහි[2] වචනපථෙහි සමුදාචරියමානස්ස ඡවිවණ්ණො චෙව පරියොදායති, මුඛවණ්ණො ච විප්පසීදති, යථා තං අරහතො සම්මා සම්බුද්ධස්ස."

49. "අභිජානාමහං භො ගොතම පූරණං කස්සපං වාදෙන වාදං සමාරභිතා. සොපි මයා වාදෙන වාදං සමාරද්ධො අඤ්ඤෙනඤ්ඤං පටිචරි, බහිද්ධා කථං අපනාමෙසි, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාත්වාකාසි. භොතො ඛො පන[3] ගොතමස්ස එවං ආසජ්ජ ආසජ්ජ වුච්චමානස්ස උපනීතෙහි උපනීතෙහි වචනපථෙහි සමුදාචරියමානස්ස ඡවිවණ්ණො චෙව පරියොදායති, මුඛවණ්ණො ච විප්පසීදති, යථා තං අරහතො සම්මාසම්බුද්ධස්ස.

50 අභිජානාමහං භො ගොතම මක්ඛලිං ගොසාලං -පෙ- අජිතං කෙසකම්බලං -පෙ- පකුධං කච්චායනං -පෙ- සඤ්ජයං බෙලට්ඨිපුත්තං[4] -පෙ- නිගණ්ඨං නාතපුත්තං[5] වාදෙන වාදං සමාරභිතා. සොපි මයා වාදෙන වාදං සමාරද්ධො අඤ්ඤෙනඤ්ඤං පටිචරි, බහිද්ධා කථං අපනාමෙසි, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාත්වාකාසි. භොතො ඛො පන ගොතමස්ස එවං ආසජ්ජ ආසජ්ජ වුච්චමානස්ස උපනීතෙහි උපනීතෙහි වචනපථෙහි සමුදාචරියමානස්ස ඡවිවණ්ණො චෙව පරියොදායති, මුඛවණ්ණො ච විප්පසීදති, යථා තං අරහතො සම්මාසම්බුද්ධස්ස.

---

1. අනභාවංකතා මජසං 2 උපනීතෙහි වචනපථෙහි - සීමු. මජසං.
3. භොතො පන - මජසං. 4. බෙලට්ඨපුත්තං මජසං. 5 නාටපුත්තං - මජසං.

Free Distribution www.aathaapi.org

47. ගිනිවෙස්සන, යම්කිසිවක්හට සිත කිලුටු කරන, පුනර්භවය පිණිස වැටෙන, කායචිත්තදරථ සහිත, දුඃඛ විපාක ඇති, මතුයෙහි ජාතිජරා මරණයට හිත, යම් ආස්‍රව කෙනෙක් අප්‍රහීණ ව ඇත් ද, මම ඔහු සම්මූඪ ය යි කියමි. ගිනිවෙස්සන, ආස්‍රවයන්ගේ අප්‍රහාණියෙන් සම්මූඪ වෙයි. ගිනිවෙස්සන, යම් කිසිවක් හට සිත කිලිටි කරන, පුනර්භවය පිණිස වැටෙන, කාය චිත්ත දරථ සහිත, දුඃඛ විපාක ඇති, මතුයෙහි ජාතිජරා මරණයට හිත, යම් ආස්‍රව කෙනෙක් ප්‍රහීණව ඇත්ද, මම ඔහු අසම්මූඪ යයි කියමි. ගිනිවෙස්සන, ආස්‍රව ධර්මයන්ගේ ප්‍රහාණියෙන් අසම්මූඪ වෙයි ගිනිවෙස්සන, තථාගතයන්හට සිත කිලිටි කරන පුනර්භවය පිණිස වැටෙන, කායචිත්තදරථ සහිත, දුඃඛ විපාක ඇති, මතුයෙහි ජාතිජරාමරණයට හිත, යම් ආස්‍රව කෙනෙක් වෙත් නම් ඔහු පුහුණ් හ. උදුරන ලද මුල් ඇත්තාහ. මුදුන් සුන් තලක් සෙයින් අවාස්තුකෘතයහ. යළි නො හට ගන්නා සෙයින් කළ අභාව ඇතියහ. මතු නූපදනා සැහැවි ඇතියහ. ගිනිවෙස්සන, යම්සේ මුදුන් සුන් තලෙක් යළි වඩනට අභව්‍ය වේ ද, ගිනිවෙස්සන, එසෙයින් ම යම් ආස්‍රව කෙනෙක් සිත කිලිටි කෙරෙත් ද, පුනර්භවය පිණිස වැටෙත් ද, දරථ සහිත වෙත් ද, දුඃඛ විපාක ඇත් ද, මතු ජාති ජරා මරණයට හිතකර වෙත් ද, තථාගතයන් හට ඔහු ප්‍රහීණය හ. උදුරන ලද මුල් ඇත්තාහ. මුදුන්සුන් තලක් සෙයින් අවාස්තුකෘතයහ. නැවත නො හටගන්නා සේ විනාශවරයහ. මතුයෙහි නූපදනා සැහැවි ඇතියහ යි.

48. මෙසේ වදාළ කල්හි සච්චක නුවට දරු භාගවත් හට මෙය කී: භවත් ගොයුම් ගොතුව, අසිරිය. භවත් ගොයුම් ගොතුව, අද්භූත ය. මෙසේ ඝට ඝටා කියනු ලබන එළව එළවා කී වචනයෙන් බණනු ලබන භවත් ගෞතමයන්ගේ ඡවිවර්ණය බබලන්නේ ම ය. මුඛ වර්ණය වෙසෙසින් පහදනේ ම ය. එය අර්හත් සම්‍යක් සම්බුද්ධ කෙනෙකුන්ගේ සෙයින.

49. භවත් ගොයුම් ගොතුව, මම පූරණ කාශ්‍යපයන්ට වාදයෙන් වාදාරෝපණ කෙළෙමි දනිමි. හෙද මා විසින් වාදයෙන් වාදාරෝපණ කරන ලද්දේ අනෙකෙකින් අනෙකක් කියේ ය. (එකෙක නො පිහිටියේ ය.) කථාව බැහැර කෙළේ ය. කෝපය ද ද්වේෂය ද නො සතුට ද පහළ කෙළේ ය. මෙසේ ඝට ඝටා කියනු ලබන එළව එළවා කී වචනයෙන් බණනු ලබන භවත් ගෞතමයන්ගේ ඡවිවර්ණය ඔප් ඇති වෙයි. මුඛ වර්ණය ද පහන් වෙයි. එය අර්හත් සම්‍යක් සම්බුද්ධ කෙනෙකුන්ගේ සෙයින.

50. භවත් ගොයුම් ගොතුව, මම මක්ඛලි ගොසාලයන්ට... අජිත කෙසකම්බලයන්ට ... පකුධ කච්චායනයන්ට... සඤ්ජය බෙලට්ඨිපුත්තහට... නිගණ්ඨ නාතපුත්ත හට වාදයෙන් වාද සමාරම්භ කෙළෙම් දන්මි. හෙද මා විසින් වාදයෙන් වාදාරෝපණ කරන ලද්දේ අනෙකෙකින් අනෙකක් කියේ ය. කථාව බැහැර කෙළේ ය. කෝපය ද ද්වේෂය ද නොසතුට ද පහළ කෙළේ ය. මෙසේ ඝට ඝටා කියනු ලබන, එළව එළවා කී වචනයෙන් බණනු ලබන භවත් ගෞතමයන්ගේ ඡවිවර්ණය ඔප් ඇති වෙයි. මුඛ වර්ණය ද පහන් වෙයි. එය සම්‍යක් සම්බුද්ධ කෙනෙකුන්ගේ සෙයින.

51. හන්ද ච දානි මයං භො ගොතම ගච්ඡාම, බහුකිච්චා මයං බහුකරණීයාති.

"යස්සදානි ත්වං අග්ගිවෙස්සන කාලං මඤ්ඤසී"ති.

අථ ඛො සච්චකො නිගණ්ඨපුත්තො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමීති.

මහාසච්චකසුත්තං ඡට්ඨං.

1. 4. 7.

චූළතණ්හාසඞ්ඛයසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ. අථ ඛො සක්කො දෙවානමින්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සක්කො දෙවානමින්දො භගවන්තං එතදවොච:

2 "කිත්තාවතා නු ඛො භන්තෙ භික්ඛු සඞ්ඛිත්තෙන තණ්හාසඞ්ඛයවිමුත්තො හොති අච්චන්තනිට්ඨො අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානන්ති."

3. ඉධ දෙවානමින්ද භික්ඛුනො සුතං හොති: සබ්බෙ ධම්මා නාලං අභිනිවෙසායාති. එවඤ්ච තං දෙවානමින්ද භික්ඛුනො සුතං හොති: සබ්බෙ ධම්මා නාලං අභිනිවෙසායාති, සො සබ්බං ධම්මං අභිජානාති. සබ්බං ධම්මං අභිඤ්ඤාය සබ්බං ධම්මං පරිජානාති. සබ්බං ධම්මං පරිඤ්ඤාය යං කිඤ්චි වෙදනං වෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සො තාසු වෙදනාසු අනිච්චානුපස්සී විහරති, විරාගානුපස්සී විහරති, නිරොධානුපස්සී විහරති, පටිනිස්සග්ගානුපස්සී විහරති. සො තාසු වෙදනාසු අනිච්චානුපස්සී විහරන්තො, විරාගානුපස්සී විහරන්තො, නිරොධානුපස්සී විහරන්තො, පටිනිස්සග්ගානුපස්සී විහරන්තො න ච කිඤ්චි[1] ලොකෙ උපාදියති. අනුපාදියං න පරිතස්සති. අපරිතස්සං පච්චත්තඤ්ඤෙව පරිනිබ්බායති. 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාති. එත්තාවතා ඛො දෙවානමින්ද භික්ඛු සඞ්ඛිත්තෙන තණ්හාසඞ්ඛයවිමුත්තො හොති අච්චන්තනිට්ඨො අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානන්ති.

1. න කිඤ්චි, මජසං. සයා. PTS.

37. 'භවත් ගොයුම් ගොතුව, අපි බොහෝ කෘත්‍ය ඇතියම් හ. බොහෝ කටයුතු ඇතියම් හ. එබැවින් දැන් අපි යම්හ'යි.

"තෝ එයට දැන් කල් දනු, ගිනිවෙස්නැ" යි වදාළහ.

එක්බිති සච්චක නුවටදරු භගවත්හුගේ භාෂිතය සතුටින් පිළිගෙන (සිතින් නොව වචනයෙන්) අනුමෝදන් ව හුනස්නෙන් නැගී නික්ම ගියේ ය.

මහාසච්චක සූත්‍රය සවැනියි.

1. 4. 7.

චූලතණ්හාසඞ්ඛය සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි පුවරම්මගවෙහෙර මුවරමාපහයෙහි වැඩ වෙසෙති. එක්බිති **සක්දෙව් රජ** භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් වැ සිටියේ. එකත්පස් ව සිටි සක්දෙව්රජ භාග්‍යවතුන් වහන්සේට මෙල සැළ කෙළේ:

2. "වහන්ස, කීපමණෙකින් මහණ තෙමේ සැකෙවින් තණ්හාසඞ්ඛය විමුක්ත (තෘෂ්ණා නිරෝධ නම් වූ නිවන් අරමුණු කොට රහත්) වූයේ, ඒකාන්තනිෂ්ඨා ඇතියේ, නිත්‍යයොගක්ෂෙම ඇතියේ, නිත්‍ය බ්‍රම්සර ඇතියේ, අත්‍යන්තපර්‍යවසාන ඇතියේ, දෙව්මිනිස්නට උතුම් වූයේ වේ දැ"යි (රහත්හුගේ පූර්වභාගප්‍රතිපද් සැකෙවින් වදාළ මැනැවැයි සැළකෙළේය).

3. දේවෙන්ද්‍රය, මෙසස්නෙහි මහණහු විසින් (ස්කන්ධායතනධාතු-සඞ්ඛ්‍යාත) හැම දහම්හු අභිනිවෙශය (තෘෂ්ණාදීන් බැසගැණීම) පිණිස නො යෙදෙතියි අසන ලද වෙයි. දේවෙන්ද්‍රය, මහණහු විසින් 'සර්වධර්මයෝ අභිනිවෙශය පිණිස යුතු නො වෙති' යි එකරුණ මෙසෙසින් අසන ලද වේද, හේ ස්කන්ධාදිසර්වධර්ම (ඥානපරිඥයෙන් අනිත්‍යාදි විසින්) වෙසෙසින් දන්නේ ය. සර්වධර්ම වෙසෙසින් දැන සර්වධර්ම (තීරණපරිඥයෙන්) පිරිසිඳ දන්නේ ය. සර්වධර්ම පිරිසිඳ දැන සුඛ වේවයි, දුඃඛ වේවයි, අදුඃඛ අසුඛ වේවයි යම් ම වේදනාවක් විඳුනේ වේ ද, හේ ඒ වේදනාවන්හි අනිත්‍ය විසින් දක්නා නුවණින් යුක්ත ව වාස කෙරෙයි. විරාග විසින් දක්නා නුවණින් යුක්ත ව වාස කෙරෙයි. නිරෝධ විසින් දක්නා නුවණින් යුක්ත ව වෙසෙයි. පටිනිස්සග්ග විසින් කෙලෙස් හැරලන නිවන් වදනා මගනැණින් යුක්ත ව වෙසෙයි. හේ ඒ වේදනාවන්හි අනිච්චානුපස්සී ව විරාගානුපස්සී ව නිරොධානුපස්සී ව පටිනිස්සග්ගානුපස්සී ව වසනුයේ, පඤ්චස්කන්ධලොකයෙහි කිසිදු සංස්කාරයක් (තෘෂ්ණා විසින්) නො ගන්නේය. නොගන්මින් තෘෂිත (තෘෂ්ණාන්විත) නො වෙයි. (තණ්හා පරිතස්සන විසින්) පිපාසිත නො වන්නේ සිය සතන්හි ම (කෙලෙස් පිරිනිවනින්) පිරිනිවෙයි. 'ජාතිය ක්ෂීණ විය. බඹසරවස් වසන ලදී. (සොළොස්) කරණී කරන ලදී. නැවත මෙබවට නො එමි' දනී. දේවෙන්ද්‍රය, මෙතෙකින් මහණ සංක්ෂිප්ත විසින් නිවන් අරමුණු කොට රහත් වූයේ, ඒකාන්තනිෂ්ඨා ඇතියේ, නිත්‍යයොගක්ෂේම ඇතියේ, නිත්‍යබ්‍රම්සර ඇතියේ, අත්‍යන්තපර්‍යවසාන ඇතියේ, දෙව්මිනිස්නට උතුම් වූයේ වේ යි. (මේ රහත්හුගේ පූර්වභාග ප්‍රතිපද් සැකෙවින් වදාළ නියා යි.)

Free Distribution www.aathaapi.org

අථ ඛො සක්කො[1] දෙවානමින්දො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

4. තෙන ඛො පන සමයෙන ආයස්මා මහාමොග්ගල්ලානො භගවතො අවිදූරෙ නිසින්නො හොති. අථ ඛො ආයස්මතො මහාමොග්ගල්ලානස්ස එතදහොසි: 'කින්නු ඛො සො යක්ඛො භගවතො භාසිතං අභිසමෙච්ච අනුමොදි,[2] උදාහු නො. යන්නූනාහං තං යක්ඛං ජානෙය්‍යං: යදි වා සො යක්ඛො භගවතො භාසිතං අභිසමෙච්ච අනුමොදි, යදි වා නො'ති. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙවං[3] පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ අන්තරහිතො දෙවෙසු තාවතිංසෙසු පාතුරහොසි.

5. තෙන ඛො පන සමයෙන සක්කො දෙවානමින්දො එකපුණ්ඩරීකෙ උය්‍යානෙ දිබ්බෙහි පඤ්චහි තූරියසතෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙති. අද්දසා ඛො සක්කො දෙවානමින්දො ආයස්මන්තං මහාමොග්ගල්ලානං දූරතො ච ආගච්ඡන්තං. දිස්වාන තානි දිබ්බානි පඤ්ච තූරියසතානි පටිප්පණාමෙත්වා යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච: එහි ඛො මාරිස මොග්ගල්ලාන, සාගතං[4] මාරිස මොග්ගල්ලාන. චිරස්සං ඛො මාරිස මොග්ගල්ලාන, ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීද මාරිස මොග්ගල්ලාන, ඉදමාසනං පඤ්ඤත්තන්ති. නිසීදි ඛො ආයස්මා මහාමොග්ගල්ලානො පඤ්ඤත්තෙ ආසනෙ. සක්කොපි ඛො දෙවානමින්දො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො සක්කං දෙවානමින්දං ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච: යථාකථං පන තෙ කොසිය භගවා සඞ්ඛිත්තෙන තණ්හාසඞ්ඛයවිමුත්තිං අභාසි? සාධු මයම්පි එතිස්සා කථාය භාගිනො අස්සාම සවණායාති.

6. "මයං ඛො මාරිස මොග්ගල්ලාන බහුකිච්චා, මයං බහුකරණීයා,[5] අප්පෙව[6] සකෙන කරණීයෙන, අපි ච දෙවානංයෙව තාවතිංසානං කරණීයෙන. අපි ච මාරිස මොග්ගල්ලාන, සුස්සුතංයෙව හොති සුග්ගහිතං සුමනසිකතං සූපධාරිතං යං නො[7] ඛිප්පමෙව අන්තරධායති. භූතපුබ්බං මාරිස මොග්ගල්ලාන, දෙවාසුරසඞ්ගාමො සමුපබ්බූළ්හො[8] අහොසි. තස්මිං ඛො පන මාරිස මොග්ගල්ලාන සඞ්ගාමෙ දෙවා විජිනිංසු.[9] අසුරා පරාජිනිංසු. සො ඛො අහං මාරිස මොග්ගල්ලාන තං සඞ්ගාමං[10] අභිවිජිනිත්වා විජිතසඞ්ගාමො තතො පටිනිවත්තිත්වා වෙජයන්තං නාම පාසාදං මාපෙසිං. වෙජයන්තස්ස ඛො පන මාරිස මොග්ගල්ලාන පාසාදස්ස නිය්‍යූහසතං. එකමෙකස්මිං නිය්‍යූහෙ සත්ත සත්ත කූටාගාරසතානි.[11] එකමෙකස්මිං කූටාගාරෙ සත්ත සත්ත අච්ඡරායො. එකමෙකිස්සා අච්ඡරාය සත්ත සත්ත පරිචාරිකායො. ඉච්ඡෙය්‍යාසි නො ත්වං මාරිස මොග්ගල්ලාන වෙජයන්තස්ස පාසාදස්ස රාමණෙය්‍යකං දට්ඨුන්ති. අධිවාසෙසි ඛො ආයස්මා මහාමොග්ගල්ලානො තුණ්හීභාවෙන.

---

1 අථ ඛො පන සක්කො, සයා. අථ සක්කො, කත්ථචි.
2. අනුමොදති, සයා. 3 එවමෙව, කත්ථචි.
4. ස්වාගතං, මජසං සයා 5. බහුකිච්චා බහුකරණීයා, මජසං සයා.
6. අප්පෙපවනාම, සයා. අප්පෙපන, PTS. මු. සී 7. යතො ඛො, සයා.
8. සමුපබ්‍යූළ්හො, මජසං. සමුපබ්‍යූළ්හො, සයා 9. දෙවා ජිනිංසු, මජසං. සයා PTS.
10. දෙවාසුරසඞ්ගාමං, සයා 11. කූටාගාරසතානි, සීමු.

Free Distribution www.aathaapi.org

එක්බිති සක්දෙව්රජ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිනන්දනය කොට අනුමෝ ව භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට එහි ම අතුරුදහන් කෙළේ.

4. එකල ආයුෂමත් මහමුගලන් මහතෙරහු භාග්‍යවතුන් වහන්සේගේ නුදුරු හුන්හ. එසඳ මහමුගලන් මහතෙරහට තෙල සිත් වී: "කිම ඒ යක් භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය දැන අනුමෝදන් වීද, නොහොත් නොදැන අනුමෝදන් වීදැයි. 'භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය දැන අනුමෝදන් වීද නොහොත් නොදැන අනුමෝදන් වීදැ'යි මම ඒ යක් පිළිවිස දනිම් නම් මැනැවැ"යි. එක්බිති ආයුෂමත් මහමුගලන් මහතෙරහු බලවත් පුරුෂයෙක් වක් කළ අතක් හෝ දික් කරන්නේත්, දික් කළ අතක් හෝ වක් කරන්නේත් යම් සේ ද, එසේ පුවරම් මහවෙහෙරැ මුවරමාපායෙහි අතුරුබන් වූවෝ තවුතිසා වැසි දෙවියන් කෙරෙහි පෙනුණාහු

5. එසඳ සක්දෙව්රජ එකපුණ්ඩරීක නම් උයන්හි (නමා පිරිවරා වයන) පන්සියක් දෙව්පනඟතුරු රැවින් සමර්පිත ව සමඞ්ගිතව ඉඳුරන් පිණවා වාස කෙරෙයි. සක්දෙව්රජ ආයුෂමත් මහමුගලන් මහතෙරහු වඩනවුත් දුරින් ම දිට. දැක (වයමින් සිටි) පන්සියක් දිව්පනඟතුරු බැහැර කරවා මහමුගලන් මහතෙරුන් කරා එළඹියේ ය. එළඹ මුගලන් මහතෙරහට තෙල සැළ කෙළේ: "නිදුක, මුගලන් තෙරණුවනි, වඩනේ මැනැව. නිදුක මුගලන් තෙරණුවනි, තොපට සවාගත කරමි. නිදුක, මුගලන් තෙරණුවනි, මෙහි අපකරා වඩනට බොහෝ කලෙකින් මේ වාරය කළදූ යයි (බොහෝ කලෙකින් වැඩිදූ ය යි ප්‍රියකථා බැණ) නිදුක, මුගලන් තෙරණුවනි, මේ අසුන් පැනවිණ, වැඩහිඳුනේ යැ" යි කී. මුගලන් මහතෙරහු පැන්වූ අස්නෙහි හුන්හ. සක්දෙව්රජ ද මිටි අස්නක් ගෙන එකත්පස් ව හින. එකත්පස් ව හුන් සක්දෙව්රජහට ආයුෂමත් මුගලන් මහතෙරහු තෙල බස් කීහ: "දෙව්රජිනි, අප බුදුහු තොපට සැකෙවින් තණ්හා සඞ්ඛය විමුත්තිය (නිවන අරමුණ කොට මිදීම) කියෙයින් නම් වදාළ සේක් ද? අයදුම්හ, අපිදු තෙල සූත්‍රදේශනා කථා අසනුවට භාගී වම්හයි.

6. "නිදුක, මුගලන, අපි බොහෝ කටයුතු ඇතියම්හ. අපගේ ම කාය්‍යී මද වෙයි. වැලිදු තව්තිසාවැසි දෙවියන්ගේ කාය්‍යී බෙහෙව. තව ද, නිදුක, මුගලන, අප මනා කොට ඇසූ, මනා කොට උගත්, මොනොවට මෙනෙහි කළ, මොනොවට බැරූ යම් දැයෙකුදු වීනම්, එය වහා ම අතුරුබන් වෙයි. නිදුක, මුගලන, වූවිරිදැයක් කියමි: දෙවාසුරසඞ්ග්‍රාමයෙක් රාශිභූත වී. මුගලන් තෙරණුවනි, ඒ සඞ්ග්‍රාමයෙහි දී දේවයෝ දිනූහු. අසුරයෝ පැරැදුනුහු. නිදුක, මුගලන් තෙරණුවනි, මම ඒ සඞ්ග්‍රාමය දිනා දිනූ සඞ්ග්‍රාම ඇති ව එයින් නැවති වෛජයන්ත නම් පහය මැවීමි. නිදුක, මුගලන් තෙරණුවනි, විජයන් පහය සියක් නිර්යූහ (මුදුන්තල) ඇත. එකෙකි නිර්යූහයෙහි සත්සිය සත්සිය කූටාගාරය. එකෙකි කූටාගාරයෙහි සත් සත් අප්සරාවෝ ය. එකෙකි අප්සරාවට සත් සත් (උවටන් කරන) පරිචාරිකා දෙව්දූහ. මාරිෂ, මෞද්ගල්‍යායනයෙනි, තෙපි කැමැතියා ව විජයන්පහය රමණී සේ දක්නව යැ යි (දෙව්රජ කී.) මුගලන් මහතෙරහු නොබැණ ඉවසූහ.

7. අථ ඛො සක්කො ච දෙවානමින්දො වෙස්සවණො ච මහාරාජා ආයස්මන්තං මහාමොග්ගල්ලානං පුරක්ඛත්වා යෙන වෙජයන්තො පාසාදො තෙනුපසඞ්කමිංසු අද්දසංසු[1] ඛො සක්කස්ස දෙවානමින්දස්ස පරිචාරිකායො ආයස්මන්තං මහාමොග්ගල්ලානං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන[2] ඔත්තප්පමානා හිරීයමානා[3] සකසකං[4] ඔවරකං පවිසිංසු. සෙය්‍යථාපි නාම සුණිසා සසුරං[5] දිස්වා ඔත්තප්පති හිරීයති,[6] එවමෙවං[7] සක්කස්ස දෙවානමින්දස්ස පරිචාරිකායො ආයස්මන්තං මහා මොග්ගල්ලානං දිස්වා ඔත්තප්පමානා හිරීයමානා සකසකං ඔවරකං පවිසිංසු අථ ඛො සක්කො ච දෙවානමින්දො වෙස්සවණො ච මහාරාජා ආයස්මන්තං මහාමොග්ගල්ලානං වෙජයන්තෙ පාසාදෙ අනුචඞ්කමාපෙන්ති අනුවිචරාපෙන්ති: ඉදම්පි මාරිස මොග්ගල්ලාන පස්ස වෙජයන්තස්ස පාසාදස්ස රාමණෙය්‍යකං, ඉදම්පි මාරිස මොග්ගල්ලාන පස්ස වෙජයන්තස්ස පාසාදස්ස රාමණෙය්‍යකන්ති. "සොභතීවතිදං[8] ආයස්මතො කොසියස්ස යථාතං පුබ්බෙ කතපුඤ්ඤස්ස. මනුස්සාපි කිඤ්චිදෙව රාමණෙය්‍යකං දට්ඨා[9] එවමාහංසු: සොභති වත භො දෙවානං තාවතිංසානන්ති. තයිදං ආයස්මතො කොසියස්ස සොභති යථාතං පුබ්බෙ කතපුඤ්ඤස්සා"ති.

8. අථ ඛො ආයස්මතො මහාමොග්ගල්ලානස්ස එතදහොසි: අතිබාළ්හං ඛො අයං යක්ඛො පමත්තො විහරති. යන්නූනාහං ඉමං යක්ඛං සංවෙජෙය්‍යන්ති. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො තථාරූපං ඉද්ධාභිසංඛාරං අභිසංඛාසි[10] යථා වෙජයන්තං පාසාදං පාදඞ්ගුට්ඨකෙන සඞ්කම්පෙසි සම්පකම්පෙසි සම්පවෙධෙසි. අථ ඛො සක්කො ච[11] දෙවානමින්දො වෙස්සවණො ච මහාරාජා දෙවා ච තාවතිංසා අච්ඡරියබ්භුතචිත්තා[12] අහෙසුං: අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, සමණස්ස මහිද්ධිකතා මහානුභාවතා, යත්‍ර හි නාම දිබ්බං භවනං[13] පාදඞ්ගුට්ඨකෙන සඞ්කම්පෙස්සති සම්පකම්පෙස්සති සම්පවෙධෙස්සතීති.

9. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො සක්කං දෙවානමින්දං සංවිග්ගං ලොමහට්ඨජාතං විදිත්වා සක්කං දෙවානමින්දං එතදවොච: "යථාකථං පන තෙ කොසිය[14] භගවා සඞ්ඛිත්තෙන තණ්හාසංඛයවිමුත්තිං අභාසි? සාධු. මයම්පි එතිස්සා කථාය භාගිනො අස්සාම සවණායා"ති

10. "ඉධාහං මාරිස මොග්ගල්ලාන, යෙන භගවා තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසිං. එකමන්තං ඨිතො ඛො අහං මාරිස මොග්ගල්ලාන භගවන්තං එතදවොචං: කිත්තාවතා නු ඛො භන්තෙ භික්ඛු සඞ්ඛිත්තෙන තණ්හාසඞ්ඛයවිමුත්තො හොති අච්චන්තනිට්ඨො අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානන්ති. එවං වුත්තෙ මාරිස මොග්ගල්ලාන භගවා මං එතදවොච:-

---

1. අද්දසාසුං, කාළුවි. 2. දිස්වා, මජසං. 3. හිරියමානා, කාළුවි
4. සකං සකං, මජසං ස්‍යා. PTS. මු. සී. 5. සස්සුරං, ස්‍යා. 6. හිරියති, කාළුවි.
7. එවමෙව, කාළුවි. 8. සොභති ඉදං, මජසං. සොභතිදං ස්‍යා PTS.
9. දිට්ඨා, සීමු, දිස්වා, මජසං. ස්‍යා. 10. අභිඛාරෙති, ස්‍යා. 11. සක්කො. සීමු.
12. අච්ඡරියබ්භුත චිත්තජාතා, මජසං. ස්‍යා. 13 දිබ්බභවනං, මජසං. ස්‍යා PTS.
14 පන ඛො කොසිය, මජසං. පන කොසිය, ස්‍යා.

7. එකල්හි සක්දෙව්රජ ද වෙසවුණු රජ ද ආයුෂ්මත් මහමුගලන් තෙරුන් පෙරට කොට ගෙන විජයන්පහයට ගියහ. එසඳ සක්දෙව්රජහුගේ පරිචාරිකාවෝ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වඩනුවන් දුරින් ම දුටහ. දැක බිය ඇති ව විළි ඇති ව තමන් තමන්ගේ ඔවරකයට පිවිසියහ. යම් පරිදි ලේලියක් (ලේලි) සුහුරකු දැක විලිබිය ගන්නී වේ ද, එපරිදි ම දෙව්රජහුගේ පරිචාරිකාවෝ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් දැක විලිබිය ඇති ව තමන් තමන් ඔවරකයට ගියෝ. එක්බිති, සක්දෙව්රජ හා වෙසවුණුමහරජ හා දෙදෙන ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් විජයන් පහය ඔබ මොබ ඇවිදුවන්: "ආයුෂ්ය, මුගලන් තෙරණුවනි, විජයන් පහය මෙද රමණී සේ බලව. වහන්ස, මුගලන් තෙරණුවනි, මෙද වෛජයන්ත ප්‍රාසාදයාගේ රමණී සේ බලව"යි කීහු. "පෙර පින් කළ පරිදි ආයුෂ්මත් ශක්‍රදේවේන්ද්‍රයනට මේ පහා හොබනේ ම ය. මිනිස්හුදු කිසියම් රමණී දෑයක් දැක මෙසේ කියති: "භවත්නි, තෙල දෑය තව්තිසා වැසි දෙවියනට හොබනේ මය" කියායි. පෙරපින් කළ කෙනෙකුන්ට හොබනාක් සෙයින් ආයුෂ්මත් දෙවෙන්ද්‍රයනට මේ පහා හොබනේ මැ ය.

8. එසඳ ආයුෂ්මත් මහ මුගලන් මහතෙරණුවන්ට මේ සිත්වී: "මේ යක් (තමා පහයෙහි තළුවන් හා සම්පත් යශසින්) ඉතා මත් ව දවස් යවයි. මම මෙ යක් සංවිග්න (බියපත්) කෙරෙම් නම් මනා මැනැ" යි. ඉක්බිති ආයුෂ්මත් මුගලන් මහතෙරහු යම්සේ විජ්යන් පහය පාදාඞ්ගුෂ්ඨයෙන් පහළේ බමා ද, සැලේ ද, නොසිටි ද, එසේ (අප්කිසිණු සමවත් සම වැද) ඍද්ධියක් කළහ. එසඳ සක්දෙවු රජ ද වෙසවුණු මහරජ ද තව්තිසා වැසි දෙවියෝ ද විස්මයප්‍රාප්ත සිතැති වූහු: 'යම්හෙයෙකින් දිව්‍යභවනය පාදාඞ්ගුෂ්ඨයෙන් බැමී ද, සැලී ද, නොසිටුවී ද, එහෙයින් මහණහුගේ මහ ඉඳුහ ඇති බව මහානුභාව ඇති සේ බලව. භවත්නි, එකාන්තයෙන් අසිරිය, අද්භූතය' යි (ශිහිපි කොළෙෘ.)

9. එකල්හි ආයුෂ්මත් මහමුගලන් මහතෙරහු සක්දෙව් රජු සංවිග්න වූවහු පිපිලොමින් ගැවැසි සිරුරැ ඇතියහු දැක සක්දෙව් රජහට තෙල බස් කීහ: "දේවේන්ද්‍රය, අප බුදුහු තොපට තණ්හාසඞ්ඛය විමුක්ති කෙසේ වදාළ සේක් ද? යදිමු, අපිදු තෙල දෙශනාකථා එසේ අසනු පිණිස සහභාගී වම්හ" යි.

10. "වහන්ස, මුගලන් තෙරණුවනි, මෙහි මම භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියෙමි. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැදැ එකත්පස්ව සිටියෙමි. භවත් මුගලන, එකත්පස් ව සිටි මම භාග්‍යවතුන් වහන්සේට තෙල බස් සැලකෙළෙමි. "වහන්ස, කිපමණෙකින් (කවර ප්‍රතිපදාවකින්) මහණ නිවන් අරමුණු කොට රහත් වූයේ, එකාන්තනිෂ්ඨා ඇතියේ, නිත්‍යයොගක්ෂෙම ඇතියේ, නිත්‍යබ්‍රම්සර ඇතියේ, අත්‍යන්තපයර්‍යවසාන ඇතියේ, දෙව් මිනිස්නට උතුම් වූයේ වේදැ" යි හැකෙවින් (ඒ පූර්‍වභාග ප්‍රතිපදාව) වදාළ මැනැවැ යි සැළ කෙළෙමි. වහන්ස, මුගලන් තෙරණුවනි, මෙසේ සැල කළ කල්හි භාග්‍යවතුන් වහන්සේ මට තෙල බණ වදාළහ:

'ඉධ දෙවානමින්ද භික්ඛුනො සුතං හොති: සබ්බෙ ධම්මා නාලං අභිනිවෙසායාති. එවඤ්චෙතං දෙවානමින්ද භික්ඛුනො සුතං හොති: සබ්බෙ ධම්මා නාලං අභිනිවෙසායාති. සො සබ්බං ධම්මං අභිජානාති. සබ්බං ධම්මං අභිඤ්ඤාය සබ්බං ධම්මං පරිජානාති. සබ්බං ධම්මං පරිඤ්ඤාය යං කිඤ්චි වෙදනං වෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සො තාසු වෙදනාසු අනිච්චානුපස්සී විහරති, විරාගානුපස්සී විහරති, නිරොධානුපස්සී විහරති, පටිනිස්සග්ගානුපස්සී විහරති. සො තාසු වෙදනාසු අනිච්චානුපස්සී විහරන්තො, විරාගානුපස්සී විහරන්තො, නිරොධානුපස්සී විහරන්තො, පටිනිස්සග්ගානුපස්සී විහරන්තො න ච[1] කිඤ්චි ලොකෙ උපාදියති. අනුපාදියං න පරිතස්සති. අපරිතස්සං පච්චත්තඤ්ඤෙව පරිනිබ්බායති. 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං නාපරං ඉත්ථත්තායා'ති පජානාති. එත්තාවතා ඛො දෙවානමින්ද භික්ඛු සඞ්ඛිත්තෙන තණ්හාසඞ්ඛයවිමුත්තො හොති අච්චන්තනිට්ඨො අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානන්ති.' එවං[2] ඛො මෙ මාරිස මොග්ගල්ලාන භගවා සඞ්ඛිත්තෙන තණ්හාසඞ්ඛයවිමුත්තිං අභාසී"ති.

11. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො සක්කස්ස දෙවානමින්දස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සමිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සමිඤ්ජෙය්‍ය, එවමෙව[3] දෙවෙසු තාවතිංසෙසු අන්තරහිතො පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ පාතුරහොසි.

12. අථ ඛො සක්කස්ස දෙවානමින්දස්ස පරිචාරිකායො අචිරපක්කන්තෙ ආයස්මන්තෙ මහාමොග්ගල්ලානෙ සක්කං දෙවානමින්දං එතදවොචුං: එසො නු ඛො තෙ මාරිස සො භගවා සත්ථාති. න ඛො මෙ මාරිසා[4] සො භගවා සත්ථා, සබ්‍රහ්මචාරී මෙ එසො ආයස්මා මහාමොග්ගල්ලානොති. ලාභා තෙ මාරිස, යස්ස[5] තෙ සබ්‍රහ්මචාරී එවංමහිද්ධිකො මහානුභාවො,[6] අහො නූන[7] තෙ සො භගවා සත්ථාති.

13. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාමොග්ගල්ලානො භගවන්තං එතදවොච:

---

1. න කිඤ්චි, මජසං. ස්‍යා. PTS. 2. එවමෙව ඛො, සී - කඡථි.
3. එවමෙවං, සීමු 4. මාරිස, කඡථි. මාරිස, මජසං. ස්‍යා PTS.
5. ලාභා තෙ මාරිස, සුලද්ධං තෙ මාරිස, ස්‍යා.
6. එවංමහානුභාවො, මජසං. ස්‍යා. PTS. 7. ආභු නූන, සී. කඡථි.

'දෙවේන්‍ද්‍රය, මෙ සස්නෙහි මහණහු විසින් 'හැම දහම්හු අභිනිවේශය පිණිස නො යෙදෙති' යි අසන ලද වෙයි. දෙවේන්‍ද්‍රය, මහණහු විසින් "සර්වධර්මයෝ අභිනිවේශය පිණිස යුතු නොවෙති" යි තෙල කරුණ මෙසෙයින් අසන ලද වේද, හේ සකන්‍ධාදි සර්වධර්ම (ඥාතපරිඥායෙන්) වෙසෙසින් දන්නේය. සර්වධර්ම වෙසෙසින් දැන සර්වධර්ම (තීරණපරිඥායෙන්) පිරිසිඳ දන්නේය. සර්වධර්ම පිරිසිඳ දැන සුඛ වේවයි, දුඃඛ වේවයි, අදුඃඛ අසුඛ වේවයි යම් ම වෙදනාවක් විඳුනේ වේද, හේ ඒ වෙදනාවෙහි අනිත්‍ය විසින් දක්නා නුවණ ඇති ව දවස් යවයි. විරාග විසින් දක්නා නුවණ ඇති ව දවස් යවයි. නිරෝධ විසින් දක්නා නුවණ ඇති ව දවස් යවයි. පටිනිස්සග්ග විසින් දක්නා නුවණ ඇති ව වසයි. හේ ඒ වෙදනායෙහි අනිච්චානුපස්සී ව විරාගානුපස්සී ව නිරොධානුපස්සී ව පටිනිස්සග්ගානුපස්සී ව වසනුයේ ලෝකයෙහි කිසිදු සංස්කාරගතයක් (තෘෂ්ණා විසින්) නොගන්නේය. නොගන්මින් තෘෂ්ණාජිත නොවෙයි. (තණ්හාපරිතස්සනා විසින්) පිරිතැසි නොකරනුයේ ස්වසන්තානයෙහි ම (කෙලෙස් පිරිනිවියෙන්) පිරිනිවෙයි. 'ජාතිය ක්ෂීණ විය, බ්‍රහ්මසරවස් වසන ලදී, කරණී කරන ලදී. නැවත මෙ බවට එනු පිණිස කිසිත් නැතැ'යි දනී. දෙවේන්‍ද්‍රය, මෙතෙකින් සැකෙවින් මහණ නිවන් අරමුණු කොට රහත් වූයේ, ඒකාන්තනිෂ්ඨා ඇතියේ, නිත්‍යයෝගක්ෂෙම ඇතියේ, නිත්‍යබ්‍රහ්මසර ඇතියේ, අත්‍යන්තපර්‍ය්‍යවසාන ඇතියේ, දෙව්මිනිස්නට උතුම් වූයේ වේ යැ'යි මෙසේ මට භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් නිවන් අරමුණු කොට රහත් වූවහු පිළිබඳ පූර්වභාග ප්‍රතිපද් වදාළහ යි සැලකෙළේ ය.

11. එසඳ ආයුෂ්මත් මහමුගලන් මහතෙරහු සක්දෙව් රජහුගේ තෙපුල් අභිනන්‍දනයෙන් පිළිගෙන අනුමෝදන් ව යම්සේ බලවත් පුරුෂයෙක් වක් කළ අත් හෝ දික් කරන්නේත්, දික් කළ අත් හෝ වක් කරන්නේත් වේ ද, එ සේ තව්තිසැ දෙව්යන් කෙරෙහි අතුරුදන් ව පූර්වාරාම මහවෙහෙර මුවරමා පහයෙහි පහළවූහු.

12. ඉක්බිති සක්දෙව්රජහුගේ පිරිවර සුරවමියෝ ආයුෂ්මත් මුගලන් මහතෙරුන් වඩනා හා ම සක්දෙව්රජහට තෙල බස් කීහු. "වහන්ස, මුහු තොපගේ ඒ භගවත් ශාස්තෘහු වෙත්ද?"යි. "ප්‍රියාවෙති, මුහු මාගේ ශාස්තෘහු නොවෙති. මාගේ සබඳ සබ්‍රහ්මසර කෙනෙක. මුහු ආයුෂ්මත් මහමුගලන්හ"යි. වහන්ස, තොපගේ සබඳ සඟ කෙනෙක් මෙබඳු මහඉර්ධිහ ඇතියහ, මෙබඳු මහානුභාව ඇතියහ. වහන්ස, තොපට ලාභයෙක. අහො, තොපගේ ඒ භගවත් ශාස්තෘහු කිසේ වෙති හො යි. (සුරවමියො කීහු.)

13 එක්බිති ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන මහතෙරහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හුන්හ. එකත් පස් ව හුන් ආයුෂ්මත් මහමුගලන් මහතෙරහු භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කළහ: -

"අභිජානාති නො භන්තෙ භගවා අහු ඤාතඤ්ඤතරස්ස[1] මහෙසක්ඛස්ස යක්ඛස්ස සංඛිත්තෙන තණ්හාසඞ්ඛයවිමුත්තිං භාසිතා".

14. "අභිජානාමහං මොග්ගල්ලාන: ඉධ සක්කො දෙවානමින්දො යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො මොග්ගල්ලාන සක්කො දෙවානමින්දො මං එතදවොච: කිත්තාවතා නු ඛො භන්තෙ භික්ඛු සංඛිත්තෙන තණ්හාසඞ්ඛයවිමුත්තො හොති අච්චන්තනිට්ඨො අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානන්ති. එවං වුත්තෙ අහං මොග්ගල්ලාන සක්කං දෙවානමින්දං එතදවොචං: ඉධ දෙවානමින්ද භික්ඛුනො සුතං හොති: සබ්බෙ ධම්මා නාලං අභිනිවෙසායාති. එවඤ්චෙතං දෙවානමින්ද භික්ඛුනො සුතං හොති සබ්බෙ ධම්මා නාලං අභිනිවෙසායාති, සො සබ්බං ධම්මං අභිජානාති, සබ්බං ධම්මං අභිඤ්ඤාය සබ්බං ධම්මං පරිජානාති. සබ්බං ධම්මං පරිඤ්ඤාය යං කිඤ්චි වෙදනං වෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා. සො තාසු වෙදනාසු අනිච්චානුපස්සී විහරති, විරාගානුපස්සී විහරති, නිරොධානුපස්සී විහරති, පටිනිස්සග්ගානුපස්සී විහරති. සො තාසු වෙදනාසු අනිච්චානුපස්සී විහරන්තො, විරාගානුපස්සී විහරන්තො, නිරොධානුපස්සී විහරන්තො, පටිනිස්සග්ගානුපස්සී විහරන්තො න ච කිඤ්චි[2] ලොකෙ උපාදියති. අනුපාදියං න පරිතස්සති. අපරිතස්සං පච්චත්තඤ්ඤෙව[3] පරිනිබ්බායති. 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාති. එත්තාවතා ඛො දෙවානමින්ද භික්ඛු සංඛිත්තෙන තණ්හාසඞ්ඛයවිමුත්තො හොති අච්චන්තනිට්ඨො අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානන්ති. එවං ඛො අහං මොග්ගල්ලාන අභිජානාමි සක්කස්ස දෙවානමින්දස්ස සංඛිත්තෙන තණ්හාසඞ්ඛයවිමුත්තිං භාසිතා"ති.[4]

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා මහාමොග්ගල්ලානො භගවතො භාසිතං අභිනන්දීති.

චූළතණ්හාසඞ්ඛයසුත්තං සත්තමං.

1. අහුඤ්ඤාතඤ්ඤතරස්ස ' මජසං. ආහු ඤාතඤ්ඤෙව අඤ්ඤතරස්ස, සී-කාළුවි. අහු නඤ්ඤෙව අඤ්ඤතරස්ස, සීමු. PTS. අඤ්ඤාතඤ්ඤතරස්ස, සීමු. අට්ඨකථා
2. න කිඤ්චි මජසං. සයා. PTS. 3. පච්චත්තං යෙව, සී. - කාළුවි.
4. අභාසිත්ථාති, සී-කාළුවි.

“වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ප්‍රසිද්ධ එක්තරා මහේශාඛ්‍ය දෙවියකුට තෘෂ්ණානිරොධ සඞ්ඛ්‍යාත නිවන් අරමුණු කොට කෙලෙසුන්ගෙන් මිදීම සැකෙවින් වදාළ දෑ දන්නා සේක්දෝ” යි.

14 “මුගලන, මම දනිමි: සක්දෙව්රජ මා කරා එළඹියේ ය. එළඹ මා සකසා වැඳ එකත්පස් ව සිටගත. මුගලන, එකත්පස් ව සිටි සක්දෙව්රජ මට මෙසේ සැළකෙළේ: වහන්ස, කිපමණෙකින් මහණ නිවන් අරමුණු කොට රහත් වූයේ, එකාන්තනිෂ්ඨා ඇතියේ, නිත්‍යයොගක්ෂෙම ඇතියේ, නිත්‍යබ්‍රහ්මචය්‍ර්‍ය ඇතියේ, අත්‍යන්තපය්‍ර්‍යවසාන ඇතියේ දෙව්මිනිස්නට උතුම් වූයේ වේදැ යි සැකෙවින් (ඔහුගේ පූර්වභාග ප්‍රතිපද්) වදාළ මැනවැයි. මුගලන මෙසේ සැළකළ කල මම සක් දෙව්රජුට මෙසේ කීමි: දෙවෙන්ද්‍රය, මෙසස්නෙහි මහණහු විසින් ‘ඡන්දගම්හු අභිනිවෙශය පිණිස නො යෙදෙති’ යි අසන ලද වෙයි. දෙවෙන්ද්‍රය, මහණහු විසින් ‘සර්වධර්මයෝ අභිනිවෙශය පිණිස යුතු නොවෙති’ යි මෙසේ කරුණ මෙසෙයින් අසන ලද වේ ද, හේ ස්කන්ධාදි සර්වධර්ම ඥාතපරිඥායෙන් (අනිත්‍යාදි විසින්) වෙසෙසින් දන්නේ ය. සර්වධර්ම වෙසෙසින් දැන සර්වධර්ම (තීරණ පරිඥායෙන්) පිරිසිඳ දන්නේය. සර්වධර්ම පිරිසිඳ දැන සුඛ වේවයි, දුඃඛ වේවයි, අදුඃඛ අසුඛ වේවයි යම් ම වෙදනාවක් විඳුනේ වේ ද, හේ ඒ වෙදනායෙහි අනිත්‍ය විසින් දක්නා නුවණ ඇති ව වාස කෙරෙයි. විරාග විසින් දක්නා නුවණ ඇති ව වාස කෙරෙයි. නිරොධ විසින් දක්නා නුවණ ඇති ව වෙසෙයි. පටිනිස්සග්ග විසින් දක්නා නුවණින් නුවණැති ව වාස කෙරෙයි. හේ ඒ වෙදනායෙහි අනිච්චානුපස්සී ව විරාගානුපස්සී ව නිරොධානුපස්සී ව පටිනිස්සග්ගානුපස්සී ව වසනුයේ පඤ්චස්කන්ධ ලෝකයෙහි කිසිදු සංස්කාරගතයක් (තෘෂ්ණා විසින්) නො ගන්නේ ය. නො ගන්මින් (තණ්හාපරිතස්සනා විසින්) තෘෂ්ණාන්විත නො වන්නේ තමා විසින් ම පිරිනිවෙයි. ‘ජාතිය ක්ෂීණ විය. බ්‍රහ්මසරවස් වසන ලද. කරණී කරන ලද. මෙ බව පිණිස අන් කිසිවක් නැතැ’යි දනී. දෙවෙන්ද්‍රය, මෙතෙකින් මහණ සැකෙවින් නිවන් අරමුණු කොට රහත් වූයේ, එකාන්තනිෂ්ඨා ඇතියේ, නිත්‍යයොගක්ෂෙම ඇතියේ, නිත්‍යබ්‍රහ්මචය්‍ර්‍ය ඇතියේ අත්‍යන්ත පය්‍ර්‍යවසාන ඇතියේ, දෙව්මිනිස්නට උතුම් වූයේ වේයයි වදාළෙමි. මුගලන, මම සක්දෙව්රජුට තණ්හාසඞ්ඛය විමුක්තිය (නිවන් අරමුණු කොට කෙලෙසුන්ගෙන් මිදීම පිළිබඳ ප්‍රතිපද්) මෙසේ සැකෙවින් වදාළෙම් දනිමි”යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. ප්‍රීතිසෞමනස්‍ය විසින් ගත් සිතැති ආයුෂ්මත් මහමුගලන් මහතෙරහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිනන්දනා කළහ

චූලතණ්හාසඞ්ඛය සූත්‍රය සත්වැනි යි.

1. 4. 8.

මහාතණ්හාසඞ්ඛයසුත්තං

එවම්මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන සාතිස්ස නාම භික්ඛුනො කෙවට්ටපුත්තස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හොති: තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤන්ති.

2. අස්සොසුං ඛො සම්බහුලා භික්ඛූ: සාතිස්ස කිර නාම[1] භික්ඛුනො කෙවට්ටපුත්තස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: "තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤන්ති." අථ ඛො තෙ භික්ඛූ යෙන සාති භික්ඛු කෙවට්ටපුත්තො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සාතිං භික්ඛුං කෙවට්ටපුත්තං එතදවොචුං: "සච්චං කිර තෙ ආවුසො සාති එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤන්ති." "එවං බ්‍යා ඛො අහං ආවුසො භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤන්ති."

3. අථ ඛො තෙ භික්ඛූ සාතිං භික්ඛුං කෙවට්ටපුත්තං එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙතුකාමා සමනුයුඤ්ජන්ති සමනුගාහන්ති සමනුභාසන්ති: මා එවං ආවුසො[2] සාති අවච, මා භගවන්තං අබ්භාචික්ඛි[3]. න හි සාධු භගවතො අබ්භක්ඛානං න හි භගවා එවං වදෙය්‍ය. අනෙකපරියායෙන හාවුසො[4] සාති පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං වුත්තං භගවතා අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවොති. එවම්පි ඛො සාති භික්ඛු කෙවට්ටපුත්තො තෙහි භික්ඛූහි සමනුයුඤ්ජියමානො සමනුගාහිය[5]මානො සමනුභාසියමානො තදෙව පාපකං දිට්ඨිගතං ථාමසා පරාමස්ස[6] අභිනිවිස්ස වොහරති: එවං බ්‍යා ඛො අහං ආවුසො භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤන්ති. යතො ඛො තෙ භික්ඛූ නාසක්ඛිංසු සාතිං භික්ඛුං කෙවට්ටපුත්තං එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙතුං, අථ[7] යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං:

---

1. සාතිස්ස නාම, සෳා. මජසං 2. එවමාවුසො, සෳා 3. අබ්භාචික්ඛ, සෳා.
4. අනෙකපරියායෙනාවුසො මජසං. අනෙකපරියායෙන ආවුසො, සෳා.
5. සමනුග්ගාහියමානො, සෳා. 6. පරාමාසා, මජසං.
7. අථ ඛො තෙ භික්ඛූ, මජසං. සෳා.

1. 4. 8.

මහාතණ්හාසඞ්ඛය සූත්‍රය

මා විසින් මෙසේ අසනලදි: එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඩු මහසිටුහු කළ ජේතවන මහවෙහෙරෙහි වැඩවසන සේක. එසමයෙහි කෙවට්ටපුත්‍ර සාති නම් මහණහට මෙබඳු ලාමක දර්‍ශනයෙක් උපන: "එ විඥානය ම (භවයෙන් භවයට) දිවෙයි, සැරිසරයි, අන් විඥානයෙක් නොවේ යි භාග්‍යවතුන් වහන්සේ විසින් යම් පරිදි දෙසූසේක් ද, එපරිදි දෙසූ දහම මම දන සිටිමි"යි.

2. "කෙවුළුපුතු සාති නම් මහණහට මෙබඳු පවිටු දිටු උපන: 'එ විඥානය ම (භවයෙන් භවයට) දිවෙයි, සෙරෙයි, අන් විඥානයෙක් නැති'යි භාග්‍යවතුන් වහන්සේ විසින් යම් පරිදි දෙසූසේක් ද, එපරිදි දෙසූ දහම මම දන සිටිමි"යි යනු බොහෝ (දනවුවැසි) මහණහු ඇසූහ. එසඳ ඒ මහණහු කෙවුළුපුතු සාති මහණ කරා ගියහ. ගොස් කෙවුළුපුතු සාති මහණහට මෙල කීහු: ඇවැත, සාතියෙනි, "එ විඥානය ම දිවෙයි, සෙරෙයි, අන් විඥානයෙක් නොවේ යි භාග්‍යවතුන් වහන්සේ විසින් යම් පරිදි දෙසූසේක් ද, එපරිදි දෙසූ දහම මම දනසිටිමි" යි තොපට මෙබඳු දිටු උපන යනු සැබෑ වේද? කියායි. ඇවැත්නි, "එම විඥානය ම දිවෙයි, සෙරෙයි, අන් විඥානයෙක් නොවේ' යි භාග්‍යවතුන් වහන්සේ විසින් යම් පරිදි දෙසූසේක් ද, එපරිදි දෙසූ දහම එසේ විය හෙති"යි මම දන සිටිමි.

3. ඉක්බිති ඒ මහණහු කෙවුළුපුතු සාතිමහණ මෙල පවිටු දිටුයෙන් මුදවනු කැමැත්තාහු ලබ්ධි පුළුවුසින්, ලබ්ධියෙහි පිහිටුවත්, කරුණු පිවාරත්: "ඇවත, සාතියෙනි, තගමක් මෙසේ කියා. භාග්‍යවතුන්හට අභ්‍යාඛ්‍යාන (අභිභවා කීම) නො කරව. භාග්‍යවතුන්හට අභ්‍යාඛ්‍යාන නො මැනැවි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො වදාරති. ඇවත සාතියෙනි, භාග්‍යවතුන් භවත්යේ විසින් නන් නියරින් විඥාන ප්‍රත්‍යයොත්පන්න යයි වදාරන ලදි. ප්‍රත්‍යය විනා විඥානසම්භවයෙක් නැතියි කීහු. මෙසෙයිනුදු කෙවුළුපුතු සාතිමහණ ඒ මහණන් විසින් පැත පුළුවුස්නා ලබනුයේ, ලබ්ධි ගත්වනු ලබනුයේ, කරුණු විවරනු ලබනුයේ එම පවිටු දිටු වැරයෙන් පරාමර්‍ශ කොට එහි පිහිටා බෙණෙයි: "එ ම විඥාන දිවෙයි, සෙරෙයි, අන් විඥානයෙක් නැති යි භාග්‍යවතුන් වහන්සේ විසින් යම්පරිදි දෙසූසේක් ද, එපරිදි දෙසූ දහම එසේ විය හෙති යි මම දන සිටිමි" කියායි. යම්හෙයෙකින් ඒ මහණහු කෙවුළුපුතු සාතිමහණ මෙල පවිටු දිටුයෙන් වෙන් කරන්නට නොහැකි වූහු ද, එහෙයින් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හුන්නාහ. එකත්පස් ව හුන් ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කළහ:

4. සාතිස්ස නාම භන්තෙ භික්ඛුනො කෙවට්ටපුත්තස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: 'තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤන්ති.' අස්සුම්හ* ඛො මයං භන්තෙ: සාතිස්ස කිර නාම භික්ඛුනො කෙවට්ටපුත්තස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤන්ති. අථ ඛො මයං භන්තෙ යෙන සාති භික්ඛු කෙවට්ටපුත්තො තෙනුපසඞ්කමිම්හ. උපසඞ්කමිත්වා සාතිං භික්ඛුං කෙවපුට්ටත්තං එතදවොචුම්හ: සච්චං කිර තෙ ආවුසො සාති එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤන්ති. එවං වුත්තෙ භන්තෙ සාති භික්ඛු කෙවට්ටපුත්තො අම්හෙ එතදවොච: එවං ඛ්‍යා ඛො අහං ආවුසො භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤන්ති. අථ ඛො මයං භන්තෙ සාතිං භික්ඛුං කෙවට්ටපුත්තං එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙතුකාමා සමනුයුඤ්ජිම්හ සමනුගාහිම්හ[1] සමනුභාසිම්හ: මා එවං ආවුසො සාති අවච. මා භගවන්තං අබ්භාචික්ඛි.[2] න හි සාධු භගවතො අබ්භක්ඛානං. න හි භගවා එවං වදෙය්‍ය. අනෙකපරියායෙන හාවුසො[3] සාති පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං වුත්තං භගවතා, අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවොති. එවම්පි ඛො භන්තෙ සාති භික්ඛු කෙවට්ටපුත්තො අම්හෙහි සමනුයුඤ්ජියමානො සමනුගාහියමානො[4] සමනුභාසියමානො තදෙව පාපකං දිට්ඨිගතං ථාමසා පරාමස්ස[5] අභිනිවිස්ස වොහරති: "එවං ඛ්‍යා ඛො අහං ආවුසො භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤන්ති." යතො ඛො මයං භන්තෙ නාසක්ඛිම්හ[6] සාතිං භික්ඛුං කෙවට්ටපුත්තං එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙතුං, අථ මයං එතමත්ථං භගවතො ආරොචෙමාති.

5. අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි: එහි ත්වං භික්ඛු මම වචනෙන සාතිං භික්ඛුං කෙවට්ටපුත්තං ආමන්තෙහි: 'සත්ථා තං ආවුසො සාති ආමන්තෙතී'ති. එවං භන්තෙති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා[7] යෙන සාති භික්ඛු කෙවට්ටපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සාතිං භික්ඛුං කෙවට්ටපුත්තං එතදවොච: 'සත්ථා තං ආවුසො සාති ආමන්තෙතී'ති එවමාවුසොති ඛො සාති භික්ඛු කෙවට්ටපුත්තො තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො සාතිං භික්ඛුං කෙවට්ටපුත්තං භගවා එතදවොච: සච්චං කිර තෙ සාති එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: තථාහං භගවතා ධම්මං දෙසිතං අජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤන්ති. "එවං ඛ්‍යා ඛො අහං භන්තෙ භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤන්ති."

---

* අස්සුම්හ ඛො මයං . . . අනඤ්ඤන්ති අයං සබ්බො පාඨො සයා. මජසං. පොත්ථකෙසු න දිස්සති

1. සමනුග්ගාහිම්හ, මජසං. සයා.
2. අබ්භාචික්ඛ, සයා.
3. අනෙකපරියායෙනාවුසො, මජසං අනෙකපරියායෙන ආවුසො, සයා.
4. සමනුග්ගාහියමානො, මජසං. සයා.
5. පරාමාසා, මජසං.
6. නාසක්ඛම්හා, සයා.
7. පටිසුත්වා, මජසං

4 වහන්ස, කෙවුළුපුතු සාතිමහණහට මෙ අයුරු පවිටු දිටු උපන: “එ විඥානය ම දිවෙයි, සෙරෙයි, අන් විඥානයෙක් නැති යි භාග්‍යවතුන් වහන්සේ විසින් යම් පරිදි දෙසූ සේක් ද එපරිදි දෙසූ දහම මම දැන සිටිමි”යි කියායි. වහන්ස, අපි “එ විඥානය ම දිවෙයි, සෙරෙයි, අන් විඥානයෙක් නැති යි භාග්‍යවතුන් වහන්සේ විසින් යම්පරිදි දෙසූසේක් ද, එපරිදි දෙසූ දහම මම දැන සිටිමි”යි කෙවුළුපුතු සාතිමහණහට මෙ අයුරු පවිටු දිටු උපන යනු ඇසුම්හ. වහන්ස, එසඳ අපි කෙවුළුපුතු සාතිමහණහු කරා ගියම්හ. ගොස් කෙවුළුපුතු සාතිමහණහට තෙල කියුම්හ: “ඇවැත් සාතියෙනි, තොපට මෙ අයුරු පවිටු දිටු උපන් ල: එ විඥානය ම දිවෙයි, සෙරෙයි, අන් විඥානයෙක් නැති යි භාග්‍යවතුන් වහන්සේ විසින් යම් පරිදි දෙසූසේක් ද, එපරිදි දෙසූ දහම මම දැන සිටිමි” යනු සැබෑ ද” යි. වහන්ස, අප මෙසේ කියන්නා හා ම, කෙවුළුපුතු සාතිමහණ අපට තෙල බස් කී: “එ විඥානය ම දිවෙයි, සෙරෙයි, අන් විඥානයෙක් නැති යි භාග්‍යවතුන් වහන්සේ විසින් යම් පරිදි දෙසූ සේක් ද, එපරිදි දෙසූ දහම එසේ විය හෙති යි මම දැන සිටිමි” කියායි. වහන්ස, එසඳ අපි කෙවුළුපුතු සාතිමහණ තෙල පවිටු දිටුයෙන් වෙන් කරවනු කැමැත්තමෝ ලබ්ධි පුළුවුසුම්හ, ලබ්ධි ගැත්වූම්හ, කරුණු විචාළම්හ: “ඇවත, සාතියෙනි, නහමක් මෙසේ කියා. භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන නො කරව. භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන නො මැනව. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො වදාරනසේක. ඇවැත, සාතියෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් ‘විඥානය ප්‍රත්‍යයොත්පන්න’යයි නන් අයුරින් වදාරන ලදි. ප්‍රත්‍යය විනා විඥානයාගේ සම්භවයෙක් නැති යි වදාරන ලදි.” වහන්ස කෙවුළුපුත් සාති-මහණ අප විසින් මෙසෙයිනුදු ප්‍රශ්න නගනු ලබනුයේ, ලබ්ධි ගන්වනු ලබනුයේ, කරුණු විචාරනු ලබනුයේ එ පවිටු දිටු බලයෙන් පරාමර්‍ශ කොට ගෙන පිවිසගෙන බෙණෙයි: “එම විඥානය ම දිවෙයි, සෙරෙයි, අනෙකක් නො වෙයි භාග්‍යවතුන් වහන්සේ විසින් යම්පරිදි දෙසූ සේක් ද, එපරිදි දෙසූ දහම එසේ විය හෙති යි මම දැන සිටිමි”යි කියයි. වහන්ස යම් හෙයකින් අපි කෙවුළුපුතු සාතිමහණ තෙල පවිටු දිටුයෙන් වෙන් කරවන්නට නොහැකි වූමෝ ද, එහෙයින් අපි තෙල කරුණ භාග්‍යවතුන් වහන්සේට සැල කරම්හ යි.

5. එසඳ බුදුහු එක්තරා මහණකු ඇමතූසේක: මහණ තෝ එව, මා බසින් කෙවුළුපුතු සාතිමහණ අමත: ‘ඇවත, සාතියෙනි, බුදුහු තා කැඳවනසේකැ”යි. ඒ මහණ වහන්ස, එසේ යයි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී කෙවුළුපුතු සාතිමහණහු කරා එළඹියේය. එළඹ කෙවුළුපුතු සාති මහණහට තෙල බස් කී: ‘ඇවැත සාතියෙනි, ශාස්තෘන්වහන්සේ තොප කැඳවනසේකැ’යි. ‘ඇවැත, එසේයැ’යි කෙවුළුපුතු සාතිමහණ ඒ මහණහට පිළිවදන් අස්වා භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව හින. එකත්පස්ව හුන් කෙවුළුපුතු සාතිමහණහට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළසේක: “සැබැව, සාතියෙනි, තොපට මෙ අයුරු පවිටු දිටු උපන් ල: එ විඥානය ම දිවෙයි, සෙරෙයි, අන් විඥානයෙක් නොවෙ යි භාග්‍යවතුන් වහන්සේ විසින් යම් පරිදි දෙසූසේක් ද, එපරිදි දෙසූ දහම මම දැන සිටිමි”යි. “වහන්ස, ‘එ විඥානයම දිවෙයි, සෙරෙයි, අන් විඥානයෙක් නොවෙ’යි යම් පරිදි දෙසූසේක් ද, භාග්‍යවතුන් වහන්සේ විසින් එපරිදි දෙසූ දහම එසේ විය හෙති යි මම දැන සිටිමි”යි.

6. කතමං තං සාති විඤ්ඤාණන්ති?

“ය්වායං භන්තෙ වදෙ වෙදෙය්‍යො තත්‍ර තත්‍ර කල්‍යාණපාපකානං කම්මානං විපාකං පටිසංවෙදෙතී”ති.

කස්ස නු ඛො නාම ත්වං මොඝපුරිස මයා එවං ධම්මං දෙසිතං ආජානාසි? නනු මයා මොඝපුරිස අනෙකපරියායෙන පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං වුත්තං අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවොති. අථ ච පන ත්වං මොඝපුරිස අත්තනා දුග්ගහීතෙන අම්හෙ චෙව අබ්භාචික්ඛසි, අත්තානඤ්ච ඛණසි[1], බහුඤ්ච අපුඤ්ඤං පසවසි. තං හි තෙ මොඝපුරිස භවිස්සති දීඝරත්තං අහිතාය දුක්ඛායාති.

7. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: තං කිං මඤ්ඤථ භික්ඛවෙ, අපි නායං[2] සාති භික්ඛු කෙවට්ටපුත්තො උස්මීකතොපි ඉමස්මිං ධම්මවිනයෙති. “කිං හි සියා භන්තෙ, නො හෙතං භන්තෙ”ති. එවං වුත්තෙ සාති භික්ඛු කෙවට්ටපුත්තො තුණ්හීභූතො මඞ්කුභූතො පත්තක්ඛන්ධො අධොමුඛො පජ්ඣායන්තො අප්පටිභානො[3] නිසීදි. අථ ඛො භගවා සාතිං භික්ඛුං කෙවට්ටපුත්තං තුණ්හීභූතං මඞ්කුභූතං පත්තක්ඛන්ධං අධොමුඛං පජ්ඣායන්තං අප්පටිභානං[4] විදිත්වා සාතිං භික්ඛුං කෙවට්ටපුත්තං එතදවොච: “පඤ්ඤායිස්සසි ඛො ත්වං[5] මොඝපුරිස එතෙන සකෙන පාපකෙන දිට්ඨිගතෙන. ඉධාහං භික්ඛූ පටිපුච්ඡිස්සාමී”ති.

8. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: තුම්හෙපි මෙ භික්ඛවෙ එවං ධම්මං දෙසිතං ආජානාථ යථායං සාති භික්ඛු කෙවට්ටපුත්තො අත්තනා දුග්ගහීතෙන අම්හෙ චෙව අබ්භාචික්ඛති, අත්තානඤ්ච ඛණති,[6] බහුඤ්ච අපුඤ්ඤං පසවතීති. “නො හෙතං භන්තෙ, අනෙකපරියායෙන හි නො භන්තෙ පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං වුත්තං භගවතා, අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවො”ති. සාධු[7] භික්ඛවෙ, සාධු ඛො මෙ තුම්හෙ භික්ඛවෙ එවං ධම්මං දෙසිතං ආජානාථ. අනෙකපරියායෙන හි වො භික්ඛවෙ පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං වුත්තං මයා, අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවොති. අථ ච පනායං සාති භික්ඛු කෙවට්ටපුත්තො අත්තනා දුග්ගහීතෙන අම්හෙ චෙව අබ්භාචික්ඛති, අත්තානඤ්ච ඛණති,[8] බහුඤ්ච අපුඤ්ඤං පසවති. තං හි තස්ස මොඝපුරිසස්ස භවිස්සති දීඝරත්තං අහිතාය දුක්ඛාය.

[සාතිඛණ්ඩං.]

---

1 ඛනසි, සයා 2 නායං, සීමු මජසං. සයා. PTS
3 අප්පටිභ ණො, සයා සී කාළුවි 4. අප්පටිභාණං, සයා. සී. කාළුවි.
5 ත්වං, සී. කාළුවි 6. ඛනති, සයා. 7. සාධු සාධු, මජසං. 8. ඛනති, සයා.

Free Distribution www.aathaapi.org

6. සාතියෙනි, ඒ විඥාන කිම?

“වහන්ස, ඒ යමෙක් වචන කියන්නේ (කථා කරන්නේ), වේදනා විඳින්නේ, ඒ ඒ (භව යොනි ගති ආදි) තන්හි කුශලාකුශල කර්මයන්ගේ විපාක විඳින්නේ වේ ද, මෙ විඥානය”යි සැලකෙළේ ය.

මොඝපුරුෂය, තෝ කවරක්හට නම් මා මෙසේ දහම් දෙසුවා දන්හි? මොඝපුරුෂය, මා විසින් නන්අයුරින් විඥානය ප්‍රත්‍යයසමුත්පන්න ය යි, ප්‍රත්‍යය විනා විඥානසම්භවයෙක් නැති යි වදාරන ලද්දේ නොවේ ද? ඒ මතු ද, මොඝපුරුෂය, තෝ තමා වරදවා ගත් දෘෂින් අපට ද අභ්‍යාඛ්‍යාන කෙරෙහි. තමා ද (ගුණ සාරාලීමෙන්) කණිහි. බොහෝ අකුසල් ද ප්‍රසව කෙරෙහි. මොඝපුරුෂය, ඒ පවිටු දිටු තට දීර්ඝ රාත්‍රයෙහි අහිතයට දුඃඛයට වැටෙයි වදාළහ.

7. එක්බිති බුදුහු භික්ෂූන් ඇමැතූසේක: මහණෙනි, ඒ කිම හඟිවූ ද, කෙවුළුපුතු මේ සාති මහණ මෙ සස්නෙහි උසුම් කෙළේ (මගපල පිණිස උණුසුමකුදු ඇත්තේ) වේ ද? “වහන්ස, කෙසේ නම් වන්නේය. වහන්ස, තෙල නොවන්නේ ම ය.” මෙසේ කී කල්හි කෙවුළුපුතු සාති මහණ නිහඬව, නිතෙදව, බැහු කඳට ඇති ව, අධොමුඛ ව, සිතිවිලි සිතනු ව, වටහනු නැති ව හිඳ. එසඳ බුදුහු කෙවුළුපුතු සාතිමහණහු තූෂ්ණීම්භූත වූවහු, නිසෙතජසක වූවහු, නැමූ කඳට ඇතියහු, අධොමුඛ වූවහු, සිතිවිලි සිතනුවහු, නොවැටහෙනහු දැන කෙවුළුපුතු සාතිමහණහට තෙල බස් වදාළහ: “මොඝපුරුෂය, තො ම තෙල ලාමක දෘෂ්ටියෙන් පැණෙහි. මම මෙහි (මුළුදුන්) මහණගණ පුළුවුස්මි”යි.

8. එක්බිති බුදුහු මහණුන් ඇමතූසේක: “මහණෙනි, යම්සේ මේ කෙවුළුපුතු සාති මහණ තමා වරදවා ගත් දිටුවෙන් අපට ද අභිභවා බෙණේ ද, තමනුදු (ගුණඛණනයෙන්) කැණෑගන්නේ වේද, බොහෝ අකුසලුදු රැස්කොට ගන්නේ වේ ද, තෙපිදු එසේ මා දහම් දෙසුවා දන්හුදු”යි වදාළහ. “වහන්ස, තෙල තෙ වේ ම ය. වහන්ස, භාග්‍යවතුන්වහන්සේ විසින් අපට නන්අයුරින් විඥානය ප්‍රතීත්‍යසමුත්පන්න යැයි, ප්‍රත්‍යයයෙන් තොරව විඥානසම්භවයෙක් නැතී”යි වදාරන ලදි. මැනැව, මහණෙනි. මහණෙනි, තෙපි මා විසින් මෙසේ දහම් දෙසුවා පිළිගනුව, මනාමය. මහණෙනි, මා විසින් තොපට විඥානය ප්‍රතීත්‍යසමුත්පන්න යැ යි, ප්‍රත්‍යය විනා විඥාන-සම්භවයෙක් නැති යි නන්නියරින් වදාරන ලදි. එනෙකුදු වුව, කෙවුළු පුතු මේ සාති මහණ තමන් වරදවා ගත් දිටුයෙන් අපට ද අභ්‍යාඛ්‍යාන කෙරෙයි. තමා ද කණියි. බොහෝ පව් ද රැස් කෙරෙයි. එය ම ඒ මොඝපුරුෂහට දීර්ඝරාත්‍රයෙහි අහිතයට දුඃඛයට වැටේ යැ යි වදාළෝ.

[සාති කාණ්ඩය.]

9. යඤ්ඤදෙව[1] භික්ඛවෙ පච්චයං පටිච්ච උප්පජ්ජති විඤ්ඤාණං තෙන තෙනෙව සඞ්ඛං[2] ගච්ඡති: චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති විඤ්ඤාණං, චක්ඛුවිඤ්ඤාණන්තෙව[3] සඞ්ඛං ගච්ඡති. සොතඤ්ච පටිච්ච සද්දෙ ච උප්පජ්ජති විඤ්ඤාණං, සොතවිඤ්ඤාණන්තෙව[4] සඞ්ඛං ගච්ඡති. ඝානඤ්ච පටිච්ච ගන්ධෙ ච උප්පජ්ජති විඤ්ඤාණං, ඝානවිඤ්ඤාණන්තෙව[5] සඞ්ඛං ගච්ඡති. ජිව්හඤ්ච පටිච්ච රසෙ ච උප්පජ්ජති විඤ්ඤාණං, ජිව්හාවිඤ්ඤාණන්තෙව[6] සඞ්ඛං ගච්ඡති. කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බෙ ච උප්පජ්ජති විඤ්ඤාණං, කායවිඤ්ඤාණන්තෙව[7] සඞ්ඛං ගච්ඡති. මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති විඤ්ඤාණං, මනොවිඤ්ඤාණන්තෙව[8] සඞ්ඛං ගච්ඡති.

සෙය්‍යථාපි භික්ඛවෙ යඤ්ඤදෙව පච්චයං පටිච්ච අග්ගි ජලති, තෙන තෙනෙව සඞ්ඛං ගච්ඡති: කට්ඨඤ්ච පටිච්ච අග්ගි ජලති, කට්ඨග්ගිතෙව[9] සඞ්ඛං ගච්ඡති. සකලිකඤ්ච පටිච්ච අග්ගි ජලති, සකලිකග්ගිතෙව සඞ්ඛං ගච්ඡති. තිණඤ්ච පටිච්ච අග්ගි ජලති, තිණග්ගිතෙව සඞ්ඛං ගච්ඡති. ගොමයඤ්ච පටිච්ච අග්ගි ජලති, ගොමයග්ගිතෙව සඞ්ඛං ගච්ඡති. ථුසඤ්ච පටිච්ච අග්ගි ජලති, ථුසග්ගිතෙව සඞ්ඛං ගච්ඡති. සඞ්කාරඤ්ච පටිච්ච අග්ගි ජලති, සඞ්කාරග්ගිතෙව සඞ්ඛං ගච්ඡති. එවමෙව ඛො භික්ඛවෙ යඤ්ඤදෙව පච්චයං පටිච්ච උප්පජ්ජති විඤ්ඤාණං තෙන තෙනෙව සඞ්ඛං ගච්ඡති: චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති විඤ්ඤාණං, චක්ඛුවිඤ්ඤාණන්තෙව සඞ්ඛං ගච්ඡති. සොතඤ්ච පටිච්ච සද්දෙ ච උප්පජ්ජති විඤ්ඤාණං, සොතවිඤ්ඤාණන්තෙව සඞ්ඛං ගච්ඡති. ඝානඤ්ච පටිච්ච ගන්ධෙ ච උප්පජ්ජති විඤ්ඤාණං, ඝානවිඤ්ඤාණන්තෙව සඞ්ඛං ගච්ඡති. ජිව්හඤ්ච පටිච්ච රසෙ ච උප්පජ්ජති විඤ්ඤාණං, ජිව්හාවිඤ්ඤාණන්තෙව සඞ්ඛං ගච්ඡති. කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බෙ ච උප්පජ්ජති විඤ්ඤාණං, කායවිඤ්ඤාණන්තෙව සඞ්ඛං ගච්ඡති. මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති විඤ්ඤාණං, මනොවිඤ්ඤාණන්තෙව සඞ්ඛං ගච්ඡති.

10. භූතමිදන්ති[10] භික්ඛවෙ පස්සථාති? එවම්භන්තෙ. තදාහාරසම්භවන්ති භික්ඛවෙ පස්සථාති? එවම්භන්තෙ. තදාහාරනිරොධා යං භූතං තං නිරොධධම්මන්ති භික්ඛවෙ පස්සථාති? එවම්භන්තෙ.

11. භූතමිදං නොස්සූති භික්ඛවෙ කඞ්ඛාතො[11] උප්පජ්ජති විචිකිච්ඡා'ති? එවම්භන්තෙ. තදාහාරසම්භවං නොස්සූති භික්ඛවෙ කඞ්ඛාතො උප්පජ්ජති විචිකිච්ඡාති? එවම්භන්තෙ. තදාහාරනිරොධා යං භූතං තං නිරොධධම්මං නොස්සූති භික්ඛවෙ කඞ්ඛාතො උප්පජ්ජති විචිකිච්ඡාති? එවම්භන්තෙ.

---

1. යංයදෙව, මජසං.
2. සඞ්ඛං, මජසං. සයා.
3. චක්ඛුවිඤ්ඤාණංත්වෙව, මජසං. සයා.
4. සොතවිඤ්ඤාණංත්වෙව, මජසං. සයා.
5. ඝාණවිඤ්ඤාණංත්වෙව, මජසං. සයා.
6. ජිව්හාවිඤ්ඤාණංත්වෙව, මජසං. සයා.
7. කායවිඤ්ඤාණංත්වෙව, මජසං. සයා.
8. මනොවිඤ්ඤාණංත්වෙව, මජසං. සයා.
9. කට්ඨග්ගිත්වෙව, මජසං. සයා.
10. භූතමිදං භික්ඛවෙ, සයා.
11. කඞ්ඛන්තො, මජසං. සීමු.

9. මහණෙනි, යම් යම් ම ප්‍රත්‍යයක් නිසා විඥානය පහළ වේ ද, එයිනෙයින් ම (ඒ විඥාන) ගණනට (ඇඳිනීමට) යෙයි. ඇස ද රූපයන් ද නිසා විඥානයෙක් පහළ වේ. (එය) චක්ඛුවිඤ්ඤාණ යයි ම ගණනට යෙයි. කණ ද ශබ්දයන් ද නිසා විඥානයෙක් පහළ වේ. (එය) සොතවිඤ්ඤාණ යයි ම ගණනට යෙයි. නැහැය ද ගන්ධයන් ද නිසා විඥානයෙක් පහළ වේ. (එය) ඝානවිඤ්ඤාණ යයි ම ගණනට යෙයි. දිව ද රසයන්ද නිසා විඥානයෙක් පහළ වේ (එය) ජිව්හාවිඤ්ඤාණ යයි ම ගණනට යෙයි කය ද ස්ප්‍රෂ්ටව්‍යයන් ද නිසා විඥානයෙක් පහළ වේ. (එය) කායවිඤ්ඤාණ යයි ම ගණනට යෙයි මනස ද ධර්මයන් ද නිසා විඥානයෙක් පහළ වේ. (එය) මනොවිඤ්ඤාණ ය යි ම ගණනට යෙයි.

මහණෙනි, යම් යම් ම ප්‍රත්‍යයක් නිසා ගිනි දිලේ ද, (ඒ ගිනි) ඒ ඒ ප්‍රත්‍යයනාමයෙන් ම යම්සේ ගණනට යේ ද- කාෂ්ඨය ද නිසා අග්නි දිලෙයි, කාෂ්ඨාග්නි ම ය යි ගණනට යෙයි. සකලිකා (කටපොතු - ලී කැබලි) ද නිසා අග්නි දිලෙයි, සකලිකාග්නිම ය යි ගණනට යෙයි. තෘණ ද නිසා ගිනි දිලෙයි, තෘණාග්නි ම ය යි ගණනට යෙයි. ගොම ද නිසා ගිනි දිලෙයි, ගොමයාග්නි ම ය යි ගණනට යෙයි. තුෂ (දහයිවි නිසා) ද ගිනි දිලෙයි, තුෂාග්නිම ය යි ගණනට යෙයි. සඞ්කාර (කසළ) ද නිසා ගිනි දිලෙයි, සඞ්කාරාග්නි ම ය යි ගණනට යෙයි. මහණෙනි, එපරිදි ම ය ම් යම් ම ප්‍රත්‍යයයක් නිසා විඥාන උපදනේ වේද, ඒ ඒ ප්‍රත්‍යයනාමයෙන් ම ගණනට යෙයි. ඇස ද රූපයන්ද නිසා විඥාන පහළ වේ. චක්ඛුවිඤ්ඤාණ ම යයි ගණනට යෙයි. කණ ද ශබ්දයන් ද නිසා විඥාන පහළ වේ. සොතවිඤ්ඤාණ ම යයි ගණනට යෙයි. නැහැය ද ගන්ධයන්ද නිසා විඥාන පහළ වේ. ඝානවිඤ්ඤාණ ම ය යි ගණනට යෙයි. දිව ද රසයනුදු නිසා විඥාන පහළ වෙයි. ජිව්හාවිඤ්ඤාණ ම යයි ගණනට යෙයි. කය ද ස්ප්‍රෂ්ටව්‍යයන් ද නිසා විඥාන පහළ වේ. කායවිඤ්ඤාණ ම ය යි ගණනට යෙයි. සිත ද ධර්මයන් ද නිසා විඥාන පහළ වේ. මනොවිඤ්ඤාණ ම ය යි ගණනට යෙයි.

10. මහණෙනි, මේ පඤ්චස්කන්ධය භූත යයි (වූ දෙයෙකැයි) දක්නාහු ද? වහන්ස, එසේය. මහණෙනි, ඒ පඤ්චස්කන්ධය ආහාරසම්භව (ප්‍රත්‍යය ඇතිකල උපදනේ)ය යි දක්නාහු ද? වහන්ස, එසේය. මහණෙනි, යම් භූත වූ පඤ්චස්කන්ධයෙක් ඇද්ද, එය ඒ ප්‍රත්‍යයනිරොධහෙතුයෙන් නිරොධ සැහැවි ඇතැයි දක්නාහු ද? වහන්ස එසේය.

11. මහණෙනි, මේ පස්කඳ භූත වේ දෝ නොවේ දෝ යි සැකෙන් විචිකිත්සා උපදනේ වේ ද? වහන්ස, එසේය. ඒ පස්කඳ ප්‍රත්‍යයසම්භව වේ දෝ නොවේදෝ යි සැකෙන් විචිකිත්සා උපදනේ වේ ද? වහන්ස, එසේය. මහණෙනි, යම් භූත වූ පස්කඳෙක් ඇද්ද, ඒ පස්කඳ ඒ ප්‍රත්‍යයනිරොධ-හෙතුයෙන් නිරොධ සැහැවි ඇද්දෝ නැද්දෝ යි 'සැකෙන් විචිකිත්සා උපදනේ වේ ද? වහන්ස එසේය.

Free Distribution www.aathaapi.org

12. භූතමිදන්ති භික්ඛවෙ යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා විචිකිච්ඡා සා පහීයතීති? එවම්භන්තෙ. තදාහාරසම්භවන්ති භික්ඛවෙ යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා විචිකිච්ඡා සා පහීයතීති? එවම්භන්තෙ. තදාහාරනිරොධා යං භූතං තං නිරොධධම්මන්ති භික්ඛවෙ යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා විචිකිච්ඡා සා පහීයතීති? එවම්භන්තෙ.

13. භූතමිදන්ති භික්ඛවෙ ඉතිපි වො එත්ථ නිබ්බිචිකිච්ඡාති[1]? එවම්භන්තෙ. තදාහාරසම්භවන්ති භික්ඛවෙ ඉතිපි වො එත්ථ නිබ්බිචිකිච්ඡාති? එවම්භන්තෙ. තදාහාරනිරොධා යං භූතං තං නිරොධධම්මන්ති භික්ඛවෙ ඉතිපි වො එත්ථ නිබ්බිචිකිච්ඡාති? එවම්භන්තෙ.

14. භූතමිදන්ති භික්ඛවෙ යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨන්ති? එවම්භන්තෙ. තදාහාරසම්භවන්ති භික්ඛවෙ යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨන්ති? එවම්භන්තෙ. තදාහාරනිරොධා යං භූතං තං නිරොධධම්මන්ති භික්ඛවෙ යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨන්ති? එවම්භන්තෙ.

15. ඉමඤ්චෙ තුම්හෙ භික්ඛවෙ දිට්ඨිං එවං පරිසුද්ධං එවං පරියොදාතං අල්ලීයෙථ කෙළායෙථ ධනායෙථ[2] මමායෙථ, අපි නු තුම්හෙ භික්ඛවෙ කුල්ලූපමං ධම්මං දෙසිතං ආජානෙය්‍යාථ නිත්ථරණත්ථාය නො ගහණත්ථායාති? නො හෙතම්භන්තෙ. ඉමඤ්චෙ තුම්හෙ භික්ඛවෙ දිට්ඨිං එවං පරිසුද්ධං එවං පරියොදාතං න අල්ලීයෙථ න කෙළායෙථ න ධනායෙථ[3] න මමායෙථ, අපි නු තුම්හෙ[4] භික්ඛවෙ කුල්ලූපමං ධම්මං දෙසිතං ආජානෙය්‍යාථ නිත්ථරණත්ථාය නො ගහණත්ථායාති? එවම්භන්තෙ.

16. චත්තාරොමෙ භික්ඛවෙ ආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය. කතමෙ චත්තාරො? කබළිඞ්කාරො[5] ආහාරො ඔළාරිකො වා සුඛුමො වා, ඵස්සො දුතියො, මනොසඤ්චෙතනා තතියා, විඤ්ඤාණං චතුත්ථං.

17. ඉමෙ ච භික්ඛවෙ චත්තාරො ආහාරා කින්නිදානා කිංසමුදයා කිඤ්ජාතිකා කිම්පභවා? ඉමෙ චත්තාරො ආහාරා තණ්හානිදානා තණ්හාසමුදයා තණ්හාජාතිකා තණ්හාපභවා.

18. තණ්හා චායං භික්ඛවෙ කින්නිදානා කිංසමුදයා කිඤ්ජාතිකා කිම්පභවා? තණ්හා වෙදනානිදානා වෙදනාසමුදයා වෙදනාජාතිකා වෙදනාපභවා.

---

1. නිබ්බිචිකිච්ඡා, සී-සාළුවී. 2. ධනෙය්‍යාථ, ස්‍යා.
3. න ධනෙය්‍යාථ, ස්‍යා. 4. මෙ තුම්හෙ, ස්‍යා.
5. කබළීකාරො, මජසං. කවළීඞ්කාරො, ස්‍යා. PTS

12. මහණෙනි, මේ පස්කඳ භූත යැයි තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥායෙන් දක්නාහට යම් විචිකිස් ඇද්ද, ඒ ප්‍රහීණ වේද? වහන්ස, එසේය. මහණෙනි, ඒ පස්කඳ ප්‍රත්‍යයසම්භව යැයි තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥායෙන් දක්නාහට යම් විචිකිත්සායෙක් ඇද්ද, ඒ ප්‍රහීණ වේද? වහන්ස, එසේය. මහණෙනි, යම් භූත වූ පස්කඳෙක් ඇද්ද, ඒ පස්කඳ ඒ ප්‍රත්‍යය නිරොධ-හෙතුයෙන් නිරොධ සැහැවි ඇති යි සම්‍යක් ප්‍රඥායෙන් දක්නාහට යම් විචිකිත්සායෙක් ඇද්ද, ඒ ප්‍රහීණ වේද? වහන්ස, එසේය.

13. මහණෙනි, මේ පස්කඳ භූත වේ යැයි මෙසෙයිනුදු තෙපි මෙහි විචිකිත්සා නැතියහු ද? වහන්ස, එසේය. මහණෙනි, ඒ පස්කඳ ප්‍රත්‍යය-සම්භව වේ යැයි මෙසෙයිනුදු තෙපි මෙහි විචිකිත්සා නැතියහු ද? වහන්ස, එසේය. මහණෙනි, යම් භූත වූ පස්කඳෙක් ඇද්ද, ඒ පස්කඳ ඒ ප්‍රත්‍යය නිරොධයෙන් නිරොධ සැහැවි ඇති යි මෙසෙයිනුදු තෙපි මෙහි විචිකිත්සා නැතියහු ද? වහන්ස, එසේය.

14. මහණෙනි, මේ පස්කඳ භූත වේ යැයි යථාභූතය සම්‍යක් ප්‍රඥායෙන් මනාව දුටුයේ වේ ද? වහන්ස, එසේය. මහණෙනි, ඒ පස්කඳ ප්‍රත්‍යයසම්භව වේ යැයි යථාභූතය විවසුන් නුවණින් මනාව දුටුයේ වේ ද? වහන්ස, එසේය. මහණෙනි, යම් භූත වූ පස්කඳෙක් ඇද්ද, ඒ පස්කඳ ඒ ප්‍රත්‍යයනිරොධයෙන් නිරොධස්වභාව ඇතියි යථාභූතය විවසුන් නුවණින් දුටුයේ වේ ද? වහන්ස, එසේය.

15 මහණෙනි, ඉදින් තෙපි මෙසෙයින් (ස්වභාවදර්ශනයෙන්) පරිශුද්ධ, මෙසෙයින් (ප්‍රත්‍යයදර්ශනයෙන්) පර්‍යවදාත, මේ සම්‍යග්දෘෂ්ටිය (තෘෂ්ණා දෘෂ්ටීන්) ඇලීගෙන වසවූ නම්, කෙළිකොට ගතිවූ නම්, ධනය මෙන් කොට ගතිවූ නම්, මමත්වය කරවූ නම්, මහණෙනි, "නිස්තරණය (සසරින් එතෙර වීම) පිණිස වන් මුත් ග්‍රහණය පිණිස නොවෙති"යි පසුරක් බඳු කොට මවිසින් දහම් දෙසුවා තෙපි පිළිගතිවූ ද? වහන්ස, තෙල නොවේ ම ය. මහණෙනි, ඉදින් තෙපි මෙසෙයින් පරිශුද්ධ, මෙසෙයින් පර්‍යවදාත, මේ සම්දිටු ඇලීගෙන නොවසවූ නම්, කෙළිකොට නොගතිවූ නම්, ධන වැනි කොට නොගතිවූ නම්, මහණෙනි, තෙපි "නිස්තරණය පිණිස වන් මුත් (නිකාන්ති විසින්) ගන්නා සඳහා නොවෙති"යි පසුරක් බඳු කොට දහම් දෙසුවා පිළිගන්නහු ද? වහන්ස, එසේය.

16 මහණෙනි, හටගත් සත්ත්වයනට සිටියි පිණිස හටගන්නා සත්ත්වයනට අනුග්‍රහ පිණිස මේ ආහාරයෝ සතරදෙනෙකි. කවර සතර-දෙනෙක යත්: කවලීංකාර (පිඩුකොට කෑ යුතු ඖදාරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ ආහාර ය, දෙවන ඵස්සාහාර ය, තෙවන මනොසඤ්චෙතනාහාර ය, සතරවන විඥානාහාර යි.

17. මහණෙනි, මේ ආහාරයෝ සතරදෙන කුමක් නිදාන කොට කුමක් සමුදය කොට කුමක් ජාතික කොට කුමක් ප්‍රභව කොට ඇද්ද? මේ ආහාරයෝ සතරදෙන තෘෂ්ණානිදාන කොට තෘෂ්ණාසමුදය කොට තෘෂ්ණා-ජාතික කොට තෘෂ්ණාප්‍රභව කොට ඇතියහ.

18. මහණෙනි, මේ තෘෂ්ණා කුමක් නිදාන කොට කුමක් සමුදය කොට කුමක් ජාතික කොට කුමක් ප්‍රභව කොට ඇද්ද? තෘෂ්ණා වේදනානිදාන කොට වේදනාසමුදය කොට වේදනා ජාතික කොට වේදනා ප්‍රභව කොට ඇතිය

19. වෙදනා චායං භික්ඛවෙ කිංනිදානා කිංසමුදයා කිංජාතිකා කිම්පභවා? වෙදනා ඵස්සනිදානා ඵස්සසමුදයා ඵස්සජාතිකා ඵස්සපභවා.[1]

20. ඵස්සො චායං භික්ඛවෙ කිංනිදානො කිංසමුදයො කිංජාතිකො කිම්පභවො? ඵස්සො සළායතනනිදානො සළායතනසමුදයො සළායතන-ජාතිකො සළායතනප්පභවො.[2]

21. සළායතනඤ්චිදං භික්ඛවෙ කිංනිදානං කිංසමුදයං කිංජාතිකං කිම්පභවං? සළායතනං නාමරූපනිදානං නාමරූපසමුදයං නාමරූපජාතිකං නාමරූපප්පභවං.[3]

22. නාමරූපඤ්චිදං භික්ඛවෙ කිං නිදානං කිං සමුදයං කිං ජාතිකං කිං පභවං? නාමරූපං විඤ්ඤාණනිදානං විඤ්ඤාණසමුදයං විඤ්ඤාණජාතිකං විඤ්ඤාණප්පභවං.[4]

23. විඤ්ඤාණඤ්චිදං භික්ඛවෙ කිංනිදානං කිංසමුදයං කිංජාතිකං කිම්පභවං? විඤ්ඤාණං සඞ්ඛාරනිදානං සඞ්ඛාරසමුදයං සඞ්ඛාරජාතිකං සඞ්ඛාරප්පභවං.[5]

24. සඞ්ඛාරා චිමෙ භික්ඛවෙ කිංනිදානා කිංසමුදයා කිංජාතිකා කිම්පභවා? සඞ්ඛාරා අවිජ්ජානිදානා අවිජ්ජාසමුදයා අවිජ්ජාජාතිකා අවිජ්ජාපභවා.[6]

25. ඉති ඛො භික්ඛවෙ අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

26. ජාතිපච්චයා ජරාමරණන්ති ඉති ඛො පනෙතං වුත්තං. ජාති-පච්චයා නු ඛො භික්ඛවෙ ජරාමරණං නො වා, කථං වො එත්ථ හොතීති? ජාතිපච්චයා භන්තෙ ජරාමරණං. එවං නො එත්ථ හොති: ජාතිපච්චයා ජරාමරණන්ති.

27. භවපච්චයා ජාතීති ඉති ඛො පනෙතං වුත්තං. භවපච්චයා නු ඛො භික්ඛවෙ ජාති නො වා, කථං වො එත්ථ හොතීති? භවපච්චයා භන්තෙ ජාති. එවං නො එත්ථ හොති: භවපච්චයා ජාතීති.

---

1. ඵස්සප්පභවා, මජසං. 2. සළායතනපභවො, සතා.
3. නාමරූපපභවං, සතා. 4. විඤ්ඤාණපභවං, සතා. 5. සඞ්ඛාරපභවං, සතා
6. අවිජ්ජාප්පභවා, මජසං.

Free Distribution www.aathaapi.org

19. මහණෙනි, මේ වේදනා කුමක් නිදාන කොට කුමක් සමුදය කොට කුමක් ජාතික කොට කුමක් ප්‍රභව කොට ඇද්ද? වේදනා ස්පර්ශනිදාන කොට ස්පර්ශසමුදය කොට ස්පර්ශජාතික කොට ස්පර්ශප්‍රභව කොට ඇති ය,

20. මහණෙනි, මේ ස්පර්ශ කුමක් නිදාන කොට කුමක් සමුදය කොට කුමක් ජාතික කොට කුමක් ප්‍රභව කොට ඇද්ද? ස්පර්ශ ෂඩායතනනිදාන කොට ෂඩායතනසමුදය කොට ෂඩායතනජාතික කොට ෂඩායතනප්‍රභව කොට ඇති ය.

21 මහණෙනි, මේ ෂඩායතන කුමක් නිදාන කොට කුමක් සමුදය කොට කුමක් ජාතික කොට කුමක් ප්‍රභව කොට ඇද්ද? ෂඩායතන නාමරූපනිදාන කොට නාමරූපසමුදය කොට නාමරූපජාතික කොට නාමරූපප්‍රභව කොට ඇතිය.

22. මහණෙනි, මේ නාමරූප කුමක් නිදාන කොට කුමක් සමුදය කොට කුමක් ජාතික කොට කුමක් ප්‍රභව කොට ඇද්ද? නාම රූප විඥානනිදාන කොට විඥානසමුදය කොට විඥානජාතික කොට විඥාන ප්‍රභව කොට ඇතිය.

23. මහණෙනි, මේ විඥාන කුමක් නිදාන කොට කුමක් සමුදය කොට කුමක් ජාතික කොට කුමක් ප්‍රභව කොට ඇද්ද? විඥාන සංස්කාර නිදාන කොට සංස්කාරසමුදය කොට සංස්කාරජාතික කොට සංස්කාර-ප්‍රභව කොට ඇතිය.

24. මහණෙනි, මේ සංස්කාරයෝ කුමක් නිදාන කොට කුමක් සමුදය කොට කුමක් ජාතික කොට කුමක් ප්‍රභව කොට ඇද්ද? සංස්කාරයෝ අවිද්‍යානිදාන කොට අවිද්‍යාසමුදය කොට අවිද්‍යාජාතික කොට අවිද්‍යාප්‍රභව කොට ඇතියහ.

25. මහණෙනි, මෙසෙයිත් අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝය, සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය, විඥානප්‍රත්‍යයෙන් නාමරූපය, නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතනය, ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය, ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනාය, වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාය, තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදානය, උපාදාන ප්‍රත්‍යයෙන් භවය, භවප්‍රත්‍යයෙන් ජාතිය, ජාතිප්‍රත්‍යයෙන් ජරා මරණ ශොක පරිදෙව දුඃඛ දෞර්මනස්‍ය උපායාසයෝ (යන මොහු) පහළ වෙති. මෙසෙයිත් (සත්ත්ව පුද්ගල විරහිත) ශුද්ධ දුඃඛස්කන්ධයාගේ උත්පාදය වෙයි.

26. 'ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වෙයි' මෙසෙයිත් තෙල බස වදාරන ලදී. මහණෙනි, ජාතිප්‍රත්‍යයෙන් ජරා මරණ වේ ද, නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, ජාති ප්‍රත්‍යයෙන් ජරා මරණ වෙයි. මෙසෙයිත් මෙහි අපට සිත් උපදනේය: 'ජාතිප්‍රත්‍යයෙන් ජරා මරණ වේ'ය කියා යි.

27. 'භවප්‍රත්‍යයෙන් ජාතිය වෙයි' මෙසෙයිත් තෙල බස වදාරන ලදී. මහණෙනි, භවප්‍රත්‍යයෙන් ජාතිය වේ ද, නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, භවප්‍රත්‍යයෙන් ජාතිය වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේය: 'භවප්‍රත්‍යයෙන් ජාතිය වේ'ය කියායි.

28. උපාදානපච්චයා භවොති ඉති ඛො පනෙතං වුත්තං. උපාදානපච්චයා නු ඛො භික්ඛවෙ භවො නො වා, කථං වො එත්ථ හොතීති? උපාදානපච්චයා භන්තෙ භවො. එවං නො එත්ථ හොති: උපාදානපච්චයා භවොති.

29. තණ්හාපච්චයා උපාදානන්ති ඉති ඛො පනෙතං වුත්තං. තණ්හාපච්චයා නු ඛො භික්ඛවෙ උපාදානං නො වා, කථං වො එත්ථ හොතීති? තණ්හාපච්චයා භන්තෙ උපාදානං. එවං නො එත්ථ හොති: තණ්හාපච්චයා උපාදානන්ති.

30. වෙදනාපච්චයා තණ්හාති ඉති ඛො පනෙතං වුත්තං. වෙදනාපච්චයා නු ඛො භික්ඛවෙ තණ්හා නො වා, කථං වො එත්ථ හොතීති? වෙදනාපච්චයා භන්තෙ තණ්හා. එවං නො එත්ථ හොති: වෙදනාපච්චයා තණ්හාති.

31. ඵස්සපච්චයා වෙදනාති ඉති ඛො පනෙතං වුත්තං. ඵස්සපච්චයා නු ඛො භික්ඛවෙ වෙදනා නො වා, කථං වො එත්ථ හොතීති? ඵස්සපච්චයා භන්තෙ වෙදනා. එවං නො එත්ථ හොති: ඵස්සපච්චයා වෙදනාති.

32. සළායතනපච්චයා ඵස්සොති ඉති ඛො පනෙතං වුත්තං. සළායතනපච්චයා නු ඛො භික්ඛවෙ ඵස්සො නො වා, කථංවො එත්ථ හොතීති?. සළායතනපච්චයා භන්තෙ ඵස්සො. එවං නො එත්ථ හොති: සළායතනපච්චයා ඵස්සොති.

33. නාමරූපපච්චයා සළායතනන්ති ඉති ඛො පනෙතං වුත්තං. නාමරූපපච්චයා නු ඛො භික්ඛවෙ සළායතනං නො වා, කථං වො එත්ථ හොතීති?. නාමරූපපච්චයා භන්තෙ සළායතනං. එවං නො එත්ථ හොති: නාමරූපපච්චයා සළායතනන්ති.

34. විඤ්ඤාණපච්චයා නාමරූපන්ති ඉති ඛො පනෙතං වුත්තං. විඤ්ඤාණපච්චයා නු ඛො භික්ඛවෙ නාමරූපං නො වා, කථං වො එත්ථ හොතීති?. විඤ්ඤාණපච්චයා භන්තෙ නාමරූපං. එවං නො එත්ථ හොති: විඤ්ඤාණපච්චයා නාමරූපන්ති.

35. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණන්ති ඉති ඛො පනෙතං වුත්තං. සඞ්ඛාරපච්චයා නු ඛො භික්ඛවෙ විඤ්ඤාණං නො වා, කථං වො එත්ථ හොතීති?. සඞ්ඛාරපච්චයා භන්තෙ විඤ්ඤාණං. එවං නො එත්ථ හොති: සඞ්ඛාරපච්චයා විඤ්ඤාණන්ති.

28. 'උපාදාන ප්‍රත්‍යයෙන් භවය වෙයි' මෙසේසින් තෙල බස වදාරන ලදී. මහණෙනි, උපාදාන ප්‍රත්‍යයෙන් භවය වේ ද, නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, උපාදාන ප්‍රත්‍යයෙන් භවය වෙයි. මෙසේසින් මෙහි අපට සිත් උපදනේය: 'උපාදාන ප්‍රත්‍යයෙන් භවය වේ'ය කියා යි.

29. 'තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන වෙයි' මෙසෙයින් තෙල බස වදාරන ලදී. මහණෙනි, තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදානය වේ ද, නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේය: 'තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදාන වේ'ය කියායි

30 'වෙදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණා වෙයි' මෙසෙයින් තෙල බස වදාරන ලදී. මහණෙනි, වෙදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ ද, නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, වෙදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණා වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේ ය: 'වෙදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණා වේ'ය කියායි.

31. 'ස්පර්ශ ප්‍රත්‍යයෙන් වෙදනා වෙයි' මෙසෙයින් තෙල බස වදාරන ලදී. මහණෙනි, ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනා වේ ද, නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, ස්පර්ශ ප්‍රත්‍යයෙන් වෙදනා වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේය: 'ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනා වේ'ය කියායි.

32. 'ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වෙයි' මෙසෙයින් තෙල බස වදාරන ලදී. මහණෙනි, ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වේ ද, නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේය: 'ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශ වේ'ය කියා යි.

33. 'නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතන වෙයි' මෙසෙයින් තෙල බස වදාරන ලදී. මහණෙනි, නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතන වේ ද, නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතන වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේය: 'නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතන වේ'ය කියා යි.

34. 'විඥානප්‍රත්‍යයෙන් නාමරූප වෙයි' මෙසෙයින් තෙල බස වදාරන ලදී. මහණෙනි, විඥානප්‍රත්‍යයෙන් නාම රූප වේ ද, නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද, වහන්ස, විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේය: 'විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප වේ'ය කියා යි.

35. 'සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය වෙයි' මෙසෙයින් තෙල බස වදාරන ලදී. මහණෙනි, සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය වේ ද, නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේය: 'සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය වේ'ය කියා යි.

36. අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති ඉති ඛො පනෙතං වුත්තං. අවිජ්ජාපච්චයා නු ඛො භික්ඛවෙ සඞ්ඛාරා නො වා, කථං වො එත්ථ හොතීති? අවිජ්ජාපච්චයා භන්තෙ සඞ්ඛාරා. එවං නො එත්ථ හොති: අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති.

37. සාධු භික්ඛවෙ. ඉති ඛො භික්ඛවෙ තුම්හෙපි එවං වදෙථ. අහමපි එවං වදාමි: ඉමස්මිං[1] සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති - යදිදං අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

38. අවිජ්ජාය ත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, නාමරූපනිරොධා සළායතනනිරොධො, සළායතනනිරොධා ඵස්සනිරොධො, ඵස්සනිරොධා වෙදනානිරොධො, වෙදනානිරොධා තණ්හානිරොධො, තණ්හානිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

39. ජාතිනිරොධා ජරාමරණනිරොධොති ඉති ඛො පනෙතං වුත්තං. ජාතිනිරොධා නු ඛො භික්ඛවෙ ජරාමරණනිරොධො නො වා, කථං වො එත්ථ හොතීති? ජාතිනිරොධා භන්තෙ ජරාමරණනිරොධො. එවං නො එත්ථ හොති: ජාතිනිරොධා ජරාමරණනිරොධොති.

40. භවනිරොධා ජාතිනිරොධොති ඉති ඛො පනෙතං වුත්තං. භවනිරොධා නු ඛො භික්ඛවෙ ජාතිනිරොධො නො වා, කථං වො එත්ථ හොතීති? භවනිරොධා භන්තෙ ජාතිනිරොධො. එවං නො එත්ථ හොති: භවනිරොධා ජාතිනිරොධොති.

---

1. ඉති ඉමස්මිං, සීමු.

36. 'අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාර වෙයි' මෙසෙයින් තෙල බස වදාරන ලදී. මහණෙනි. අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාර වේ ද, නොහොත් නො වේ ද, මෙහි නොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාර වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේය: 'අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාර වේ'ය කියා යි.

37. මැනව මහණෙනි. මෙසේ මහණෙනි, තෙපිදු මෙසෙයින් කියත්නාව. මම ද මෙසෙයින් වදාරමි: "මෙ දහම් ඇති වත් ම මෙ දහම් වෙයි, මෙ දහම් පහළ වත්නා හා ම මෙ දහම් පහළ වෙයි - කෙසේය යත්: අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ ය, සංස්කාර ප්‍රත්‍යයයෙන් විඥාන ය, විඥාන ප්‍රත්‍යයයෙන් නාමරූප ය, නාමරූප ප්‍රත්‍යයයෙන් ෂඩායතන ය, ෂඩායතන ප්‍රත්‍යයයෙන් ස්පර්ශ ය, ස්පර්ශ ප්‍රත්‍යයයෙන් වෙදනා ය, වෙදනා ප්‍රත්‍යයයෙන් තෘෂ්ණා ය, තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදාන ය, උපාදාන ප්‍රත්‍යයයෙන් භව ය, භව ප්‍රත්‍යයයෙන් ජාති ය, ජාතිප්‍රත්‍යයයෙන් ජරා මරණ ශොක පරිදෙව දුඃඛ දෞර්මනස්‍ය උපායාසයෝ (යන මොහු) පහළ වෙති. මෙසේ හුදු දුඃඛ රාශිහුගේ සම්භවය වේ"ය කියා යි.

38. අවිද්‍යාවගේ ම විරාග සංඛ්‍යාත මාර්ගයෙන් වන අශෙෂ නිරොධ හෙතුයෙන් සංස්කාරයන්ගේ අනුත්පාද නිරොධ වෙයි. සංස්කාරයන්ගේ අනුත්පාදයෙන් විඥානයාගේ අනුත්පාදය වෙයි. විඥානයාගේ අනුත්පාදයෙන් නාමරූපයන්ගේ අනුත්පාදය වෙයි. නාමරූපයන්ගේ අනුත්පාදයෙන් ෂඩායතනයන්ගේ අනුත්පාදය වෙයි. ෂඩායතනයන්ගේ අනුත්පාදයෙන් ස්පර්ශයාගේ අනුත්පාදය වෙයි. ස්පර්ශයාගේ අනුත්පාදයෙන් වෙදනාවගේ අනුත්පාදය වෙයි. වෙදනාවගේ අනුත්පාදයෙන් තෘෂ්ණාවගේ අනුත්පාදය වෙයි. තෘෂ්ණාවගේ අනුත්පාදයෙන් උපාදානයාගේ අනුත්පාදය වෙයි. උපාදානයාගේ අනුත්පාදයෙන් භවයාගේ අනුත්පාදය වෙයි. භවයාගේ අනුත්පාදයෙන් ජාතියගේ අනුත්පාදය වෙයි ජාතියගේ අනුත්පාදයෙන් ජරා මරණ ශොක පරිදෙව දුඃඛ දෞර්මනස්‍ය උපායාසයෝ (අනුත්පාද නිරොධයෙන්) නිරුද්ධ වෙති. මෙසේ තෙල දුඃඛ පුඤ්ජයාගේ අනුත්පාද වෙයි.

39. 'ජාතිනිරොධයෙන් ජරාමරණ නිරොධ වෙයි' මෙසෙයින් තෙල බස වදාරන ලදි. මහණෙනි, ජාති නිරොධයෙන් ජරාමරණ නිරොධය වේ ද, නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, ජාති නිරොධයෙන් ජරාමරණ නිරොධය වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේය: 'ජාතිනිරොධයෙන් ජරාමරණ නිරොධ වේ' ය කියා යි.

40. 'භවනිරොධයෙන් ජාතිනිරොධ වෙයි' මෙසෙයින් තෙල බස වදාරන ලදී. මහණෙනි, භව නිරොධයෙන් ජාති නිරොධ වේ ද, නොහොත් නො වෙ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, භව නිරොධයෙන් ජාතිනිරොධ වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේය: 'භවනිරොධයෙන් ජාතිනිරොධ වේ' ය කියා යි.

41. උපාදානනිරොධා භවනිරොධොති ඉති ඛො පනෙතං වුත්තං. උපාදානනිරොධා නු ඛො භික්ඛවෙ භවනිරොධො නො වා, කථං වො එත්ථ හොතීති? උපාදානනිරොධා භන්තෙ භවනිරොධො. එවං නො එත්ථ හොති: උපාදානනිරොධා භවනිරොධොති.

42. තණ්හානිරොධා උපාදානනිරොධොති ඉති ඛො පනෙතං වුත්තං. තණ්හානිරොධා නු ඛො භික්ඛවෙ උපාදානනිරොධො නො වා, කථං වො එත්ථ හොතීති? තණ්හානිරොධා භන්තෙ උපාදානනිරොධො. එවං නො එත්ථ හොති: තණ්හානිරොධා උපාදානනිරොධොති.

43. වෙදනානිරොධා තණ්හානිරොධොති ඉති ඛො පනෙතං වුත්තං වෙදනානිරොධා නු ඛො භික්ඛවෙ තණ්හානිරොධො නො වා, කථං වො එත්ථ හොතීති? වෙදනානිරොධා භන්තෙ තණ්හානිරොධො. එවං නො එත්ථ හොති: වෙදනානිරොධා තණ්හානිරොධොති.

44. ඵස්සනිරොධා වෙදනානිරොධොති ඉති ඛො පනෙතං වුත්තං. ඵස්සනිරොධා නු ඛො භික්ඛවෙ වෙදනානිරොධො නො වා, කථං වො එත්ථ හොතීති? ඵස්සනිරොධා භන්තෙ වෙදනානිරොධො. එවං නො එත්ථ හොති: ඵස්සනිරොධා වෙදනානිරොධොති.

45. සළායතනනිරොධා ඵස්සනිරොධොති ඉති ඛො පනෙතං වුත්තං. සළායතනනිරොධා නු ඛො භික්ඛවෙ ඵස්සනිරොධො නො වා, කථං වො එත්ථ හොතීති? සළායතනනිරොධා භන්තෙ ඵස්සනිරොධො. එවං නො එත්ථ හොති: සළායතනනිරොධා ඵස්සනිරොධොති.

46. නාමරූපනිරොධා සළායතනනිරොධොති ඉති ඛො පනෙතං වුත්තං. නාමරූපනිරොධා නු ඛො භික්ඛවෙ සළායතනනිරොධො නො වා, කථං වො එත්ථ හොතීති? නාමරූපනිරොධා භන්තෙ සළායතනනිරොධො. එවං නො එත්ථ හොති: නාමරූපනිරොධා සළායතනනිරොධොති.

47. විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධොති ඉති ඛො පනෙතං වුත්තං. විඤ්ඤාණනිරොධා නු ඛො භික්ඛවෙ නාමරූපනිරොධො නො වා, කථං වො එත්ථ හොතීති? විඤ්ඤාණනිරොධා භන්තෙ නාමරූපනිරොධො. එවං නො එත්ථ හොති: විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධොති.

41. 'උපාදාන නිරෝධයෙන් භවනිරෝධ වෙයි' මෙසෙයින් තෙල බස වදාරන ලදී. මහණෙනි, උපාදාන නිරෝධයෙන් භවනිරෝධ වේ ද, නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, උපාදාන නිරෝධයෙන් භවනිරෝධ වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේය: 'උපාදාන නිරෝධයෙන් භවනිරෝධ වේ' ය කියා යි.

42. 'තෘෂ්ණානිරෝධයෙන් උපාදානනිරෝධ වෙයි' මෙසෙයින් තෙල බස වදාරන ලදී. මහණෙනි, තෘෂ්ණානිරෝධයෙන් උපාදාන නිරෝධ වේ ද නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, තෘෂ්ණානිරෝධයෙන් උපාදාන නිරෝධ වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේය: "තෘෂ්ණානිරෝධයෙන් උපාදානනිරෝධ වේ"ය කියායි.

43. 'වේදනා නිරෝධයෙන් තෘෂ්ණානිරෝධ වෙයි' මෙසෙයින් තෙල බස වදාරන ලදී. මහණෙනි, වේදනානිරෝධයෙන් තෘෂ්ණානිරෝධ වේ ද නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, වේදනානිරෝධයෙන් තෘෂ්ණානිරෝධ වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේ ය: 'වේදනානිරෝධයෙන් තෘෂ්ණානිරෝධ වේ'ය කියාය.

44. 'ස්පර්ශනිරෝධයෙන් වේදනානිරෝධ වෙයි' මෙසෙයින් තෙල බස වදාරනලදී. මහණෙනි, ස්පර්ශනිරෝධයෙන් වේදනානිරෝධ වේ ද නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, ස්පර්ශනිරෝධයෙන් වේදනානිරෝධ වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේය: 'ස්පර්ශනිරෝධයෙන් වේදනානිරෝධ වේ' ය කියායි.

45. 'ෂඩායතනනිරෝධයෙන් ස්පර්ශනිරෝධ වෙයි' මෙසෙයින් තෙල බස වදාරන ලදී. මහණෙනි, ෂඩායතනනිරෝධයෙන් ස්පර්ශනිරෝධ වේ ද නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, ෂඩායතනනිරෝධයෙන් ස්පර්ශනිරෝධ වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේ ය: 'ෂඩායතනනිරෝධයෙන් ස්පර්ශනිරෝධ වේ' ය කියායි.

46. 'නාමරූපනිරෝධයෙන් ෂඩායතනනිරෝධ වෙයි' මෙසෙයින් තෙල බස වදාරනලදී. මහණෙනි, නාමරූප නිරෝධයෙන් ෂඩායතන-නිරෝධ වේ ද නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, නාමරූපනිරෝධයෙන් ෂඩායතනනිරෝධ වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේ ය: "නාමරූපනිරෝධයෙන් ෂඩායතනනිරෝධ වේ" ය කියායි.

47. 'විඥානනිරෝධයෙන් නාමරූපනිරෝධ වෙයයි මෙසෙයින් තෙල බස වදාරන ලදී. මහණෙනි, විඥානනිරෝධයෙන් නාමරූපනිරෝධ වේ ද නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, විඥානනිරෝධයෙන් නාමරූපනිරෝධ වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේ ය: "විඥානනිරෝධයෙන් නාමරූපනිරෝධ වේ"ය කියායි.

48. සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධොති ඉති ඛො පනෙතං වුත්තං. සඞ්ඛාරනිරොධා නු ඛො භික්ඛවෙ විඤ්ඤාණනිරොධො නො වා, කථං වො එත්ථ හොතීති? සඞ්ඛාරනිරොධා භන්තෙ විඤ්ඤාණ නිරොධො. එවං නො එත්ථ හොති: සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධොති.

49. අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධොති ඉති ඛො පනෙතං වුත්තං. අවිජ්ජානිරොධා නු ඛො භික්ඛවෙ සඞ්ඛාරනිරොධො නො වා, කථං වො එත්ථ හොතීති? අවිජ්ජානිරොධා භන්තෙ සඞ්ඛාරනිරොධො. එවං නො එත්ථ හොති: අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධොති

50. සාධු භික්ඛවෙ. ඉති ඛො භික්ඛවෙ තුම්හෙපි එවං වදෙථ. අහම්පි එවං වදාමි: ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති - යදිදං අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, නාමරූපනිරොධා සළායතනනිරොධො, සළායතනනිරොධා ඵස්සනිරොධො, ඵස්සනිරොධා වෙදනානිරොධො, වෙදනානිරොධා තණ්හානිරොධො, තණ්හානිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරා මරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

51 අපි නු තුම්හෙ භික්ඛවෙ එවං ජානන්තා එවං පස්සන්තා පුබ්බන්තං වා පටිධාවෙය්‍යාථ: අහොසිම්හ[1] නු ඛො මයං අතීතමද්ධානං, න නු ඛො අහොසිම්හ අතීතමද්ධානං, කින්නු ඛො අහොසිම්හ අතීතමද්ධානං, කථන්නු ඛො අහොසිම්හ අතීතමද්ධානං, කිං හුත්වා කිං අහොසිම්හ නු ඛො මයං අතීතමද්ධානන්ති. නො හෙතං භන්තෙ.

52. අපි නු තුම්හෙ භික්ඛවෙ එවං ජානන්තා එවං පස්සන්තා අපරන්තං වා ආධාවෙය්‍යාථ:[2] භවිස්සාම නු ඛො මයං අනාගතමද්ධානං, න නු ඛො භවිස්සාම අනාගතමද්ධානං, කින්නු ඛො භවිස්සාම අනාගතමද්ධානං, කථන්නු ඛො භවිස්සාම අනාගතමද්ධානං, කිං හුත්වා කිං භවිස්සාම නු ඛො මයං අනාගතමද්ධානන්ති. නො හෙතං භන්තෙ.

53. අපි නු තුම්හෙ භික්ඛවෙ එවං ජානන්තා එවං පස්සන්තා එතරහි වා පච්චුප්පන්නං අද්ධානං[3] අජ්ඣත්තං කථංකථී අස්සථ:[4] අහන්නු ඛොස්මි, නො නු ඛොස්මි, කින්නු ඛොස්මි, කථන්නු ඛොස්මි, අයන්නු ඛො සත්තො කුතො ආගතො, සො කුහිංගාමී භවිස්සතීති. නො හෙතං භන්තෙ.

1 අහෙසුම්හා, ස්‍යා. අහෙසුම්හ - අඤ්ඤත්‍ර 2. පටිධාවෙය්‍යාථ, මජසං. ස්‍යා.
3. පච්චුප්පන්නද්ධානං ආරබ්භ, ස්‍යා. පච්චුප්පන්නමද්ධානං අජ්ඣත්තං, මජසං.
4 කථං කථීථ, ස්‍යා.

Free Distribution www.aathaapi.org

48. 'සංස්කාරනිරෝධයෙන් විඥානනිරෝධ වෙයි' මෙසෙයින් තෙල බස වදාරනලදී. මහණෙනි, සංස්කාරනිරෝධයෙන් විඥානනිරෝධ වේ ද නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, සංස්කාරනිරෝධයෙන් විඥානනිරෝධ වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේය සංස්කාරනිරෝධයෙන් විඥානනිරෝධ වේ' ය කියායි.

49. 'අවිද්‍යානිරෝධයෙන් සංස්කාරනිරෝධ වෙයි' මෙසෙයින් තෙල බස වදාරනලදී මහණෙනි, අවිද්‍යානිරෝධයෙන් සංස්කාරනිරෝධ වේ ද නොහොත් නො වේ ද, මෙහි තොපට කෙසේ සිත් උපදනේ ද? වහන්ස, අවිද්‍යානිරෝධයෙන් සංස්කාරනිරෝධ වෙයි. මෙසෙයින් මෙහි අපට සිත් උපදනේය: 'අවිද්‍යානිරෝධයෙන් සංස්කාරනිරෝධ වේ' ය කියායි.

50. මැනැව මහණෙනි, මෙසෙයින් මහණෙනි, තෙපිදු මෙසේ කියන්නාව. මම ද මෙසේ වදාරමි: මේ දහම් නැතිවත් ම මේ දහම් නො වෙයි. මේ හෙතු ධර්මයාගේ අනුත්පාදයෙන් මේ ඵලධර්ම අනුත්පන්න වෙයි - කෙසේය යත්: අවිද්‍යාවගේ අනුත්පාදනිරෝධයෙන් සංස්කාරනිරෝධය වෙයි. සංස්කාරනිරෝධයෙන් විඥානනිරෝධය වෙයි. විඥානනිරෝධයෙන් නාමරූපනිරෝධය වෙයි නාමරූපනිරෝධයෙන් ෂඩායතනනිරෝධය වෙයි. ෂඩායතන නිරෝධයෙන් ස්පර්ශනිරෝධය වෙයි. ස්පර්ශනිරෝධයෙන් වෙදනානිරෝධය වෙයි, වෙදනානිරෙධයෙන් තෘෂ්ණානිරෝධය වෙයි. තෘෂ්ණානිරෝධයෙන් උපාදානනිරෝධය වෙයි. උපාදානනිරෝධයෙන් භවනිරෝධය වෙයි භවනිරෝධයෙන් ජාතිනිරෝධ වෙයි. ජාතිනිරෝධයෙන් ජරා මරණ ශොකපරිදෙවදුඃඛදෞර්මනස්‍ය උපායාසයෝ (අනුත්පාද නිරෝධයෙන්) නිරුද්ධ වෙති. මෙසේ මේ තෙල කෙවල දුඃඛ පුඤ්ජයාගේ නිරෝධ වේය යයි.

51 මහණෙනි, කිම, තෙපි මෙසේ (ප්‍රත්‍යය නියාමය) දන්නාහු මෙසේ දක්නාහු (අතීතස්කන්ධාදි) පූර්වාන්තයට හෝ (තෘෂ්ණාදෘෂ්ටි විසින්) වටාලා දුවන්නාව? "අපි අතීතයෙහි වූමෝ ද, අතීතයෙහි නො වූමෝ ද, අතීතයෙහි (ජාත්‍යාදීන්) කෙබඳු වූමෝ ද, අතීතයෙහි (සටහන් විසින්) කෙබඳු අයුරු ඇති වූමෝ ද, අපි අතීතයෙහි කෙබඳුව සිට කෙබඳු අයුරු ඇති වූමෝ ද, කියායි. වහන්ස, තෙල නොවන්නේය.

52. මහණෙනි, කිම, තෙපි මෙසේ දන්නාහු මෙසේ දක්නාහු, අපරාන්තයට හෝ ඉදිරි බලා යන්නාව? "අපි අනාගතයෙහි වන්නමෝ ද, අනාගතයෙහි නො වන්නමෝ ද, අනාගතයෙහි කෙබඳු වන්නමෝ ද, අනාගතයෙහි කෙබඳු අයුරු ඇති වන්නමෝ ද, අපි අනාගතයෙහි කෙබඳු ව කෙබඳු අයුරු ඇති වන්නමෝ ද" කියායි. වහන්ස, තෙල නොවන්නේය.

53 මහණෙනි, කිම, තෙපි මෙසේ දන්නාහු මෙසේ දක්නාහු දැන් ප්‍රත්‍යුත්පන්නකාලයෙහි හෝ තමා කෙරෙහි සැක ඇතියාව? "මම වෙම් දෝ, නො වෙම් දෝ, කෙබඳු වෙම් දෝ, කෙබඳු අයුරු වෙම් දෝ, මේ සත්ත්ව කොයින් ආයේ වේ දෝ හෝ, හේ කොහි යන්නේ වේ දෝ" කියායි වහන්ස, තෙල නොවන්නේය.

54. අපි නු තුම්හෙ භික්ඛවෙ එවං ජානන්තා එවං පස්සන්තා එවං වදෙය්‍යාථ: සත්ථා නො ගරු, සත්ථුගාරවෙන ච[1] මයං එවං වදෙමාති.[2] නො හෙතං භන්තෙ.

55. අපි නු තුම්හෙ භික්ඛවෙ එවං ජානන්තා එවං පස්සන්තා එවං වදෙය්‍යාථ: සමණො නො එවමාහ,[3] සමණවචනෙන ච මයං[4] එවං වදෙමාති. නො හෙතං භන්තෙ.

56. අපි නු තුම්හෙ භික්ඛවෙ එවං ජානන්තා එවං පස්සන්තා අඤ්ඤං සත්ථාරං උද්දිසෙය්‍යාථාති. නො හෙතං භන්තෙ.

57. අපි නු තුම්හෙ භික්ඛවෙ එවං ජානන්තා එවං පස්සන්තා යානි තානි පුථුසමණබ්‍රාහ්මණානං වතකොතූහලමඞ්ගලානි, තානි සාරතො පච්චාගච්ඡෙය්‍යාථාති. නො හෙතං භන්තෙ.

58. නනු භික්ඛවෙ[5] යදෙව තුම්හාකං සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං තදෙව තුම්හෙ වදෙථාති.[6] එවම්භන්තෙ.

59. සාධු භික්ඛවෙ. උපනීතා ඛො මෙ තුම්හෙ භික්ඛවෙ ඉමිනා සන්දිට්ඨිකෙන ධම්මෙන අකාලිකෙන එහිපස්සිකෙන ඔපනයිකෙන පච්චත්තං වෙදිතබ්බෙන විඤ්ඤූහි. සන්දිට්ඨිකො "අයං භික්ඛවෙ ධම්මො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී"ති. ඉති යන්තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

60. තිණ්ණං ඛො පන භික්ඛවෙ සන්නිපාතා ගබ්භස්සාවක්කන්ති හොති: ඉධ මාතාපිතරො සන්නිපතිතා හොන්ති, මාතා ච න උතුනී හොති, ගන්ධබ්බො ච න පච්චුපට්ඨිතො හොති, නෙව තාව ගබ්භස්සාවක්කන්ති හොති. ඉධ මාතාපිතරො ච සන්නිපතිතා හොන්ති, මාතා ච උතුනී හොති, ගන්ධබ්බො ච න පච්චුපට්ඨිතො හොති, නෙව තාව ගබ්භස්සාවක්කන්ති හොති. යතො ච ඛො භික්ඛවෙ මාතාපිතරො සන්නිපතිතා හොන්ති, මාතා ච උතුනී හොති, ගන්ධබ්බො ච පච්චුපට්ඨිතො හොති, එවං තිණ්ණං සන්නිපාතා ගබ්භස්සාවක්කන්ති හොති.

61. තමෙනං භික්ඛවෙ මාතා නව වා දස වා මාසෙ ගබ්භං කුච්ඡිනා පරිහරති මහතා සංසයෙන ගරුම්භාරං[7]. තමෙනං භික්ඛවෙ මාතා නවන්නං වා දසන්නං වා මාසානං අච්චයෙන විජායති මහතා සංසයෙන ගරුම්භාරං. තමෙනං ජාතං සමානං සකෙන ලොහිතෙන පොසෙති. ලොහිතං හෙතං භික්ඛවෙ[8] අරියස්ස විනයෙ යදිදං මාතුථඤ්ඤං.

---

1. සත්ථුගාරවෙනෙව, ස්‍යා 2. වදෙය්‍යාමාති, ස්‍යා. මයං වදෙමාති, PTS. සී-කළුවි.
3. සමණො එවමාහ, ස්‍යා. මජසං. 4. සමණා ච නාම මයං, මජසං. සමණා ච න ච මයං, ස්‍යා. PTS සමණා ච වත මයං, සී කළුවි.
5 නනු ඛො භික්ඛවෙ, සීමු. 6 වදෙය්‍යාථාති, ස්‍යා. 7 ගරුභාරං, ස්‍යා.
8. ලොහිතං භික්ඛවෙ, සී කළුවි.

54. මහණෙනි, කිම, තෙපි මෙසේ දත්තාහු මෙසේ දක්නාහු මෙසේ කියන්නාව? "අපට ගුරුවන (නොකැමැති වුව ද අනුවර්තිත වියයුතු වන) ශාස්තෘවරයෝ ය, එයින් ශාස්තෘගෞරවයෙන් අපි මෙසේ කියම්හ" කියායි. වහන්ස, තෙල නොවන්නේය.

55. මහණෙනි, කිම, තෙපි මෙසේ දත්තාහු මෙසේ දක්නාහු මෙසේ කියන්නාව? "අපගේ බුද්ධශ්‍රමණයන් වහන්සේ මෙසේ වදාරති. අපි ඒ ශ්‍රමණවචනයෙනුදු මෙසේ කියම්හ" කියායි. වහන්ස, තෙල නොවන්නේය.

56. මහණෙනි, කිම, තෙපි මෙසේ දත්තාහු මෙසේ දක්නාහු අන් බාහ්‍යශාස්තෘකෙනෙකු උදෙසන්නාව? වහන්ස, තෙල නොවන්නේ ය.

57. මහණෙනි, කිම, තෙපි මෙසේ දත්තාහු මෙසේ දක්නාහු බොහෝ තීර්ථකශ්‍රමණයන් හා බ්‍රාහ්මණයන්ගේ යම් ව්‍රතසමාදාන, දිටුකුතුහල්, දෘෂ්ටාදිමඞ්ගල ඇත්ද, ඒ සාර විසින් පිළිගන්නාව? වහන්ස, තෙල නොවන්නේය

58. මහණෙනි, යම් ම දැයෙක් තොප විසින් තමන් නුවණින් දන්නා ලද ද, තමන් පැහැසින් දක්නා ලද ද, තමන් පාල කොට ගන්නා ලද ද, එය ම තෙපි කියන්නාහු නොවේ ද? වහන්ස, එසේය.

59. මැනැව මහණෙනි. මා විසින් - ඵල දෙනුවට කලතුරක් නැත්තා වූ, එව, බලව යන විධියට තිසිවූ, තමා සිතින් එළඹීමට සුදුසු වූ, විඥයන් විසින් තමන් කෙරෙහි ලා දතයුතු වූ, තමා විසින් ම දක්ක යුතු මේ සාන්දෘෂ්ටික ධර්මයෙන් තෙපි නිවන් කරා පමුණුවන ලද්දහුය. මහණෙනි, "මේ ධර්මය සාන්දෘෂ්ටිකය, අකාලිකය, එව, බලව යන විධියට තිසිය, උපනයනාර්හීය, විඥයන් විසින් තමන් කෙරෙහි ලා' මෙසේ යම් බණෙක් වදාරන ලද ද, තෙල බස (තොපගේ) මේ ස්වයංඥතාදි භාවය පිණිස කියන ලදී.

60. මහණෙනි, තුන්දෙනෙකුන්ගේ සමවධානයෙන් ගර්භාවක්‍රාන්ති (ගබ්ගැනීම) වෙයි. මේ සත්ත්වලෝකයෙහි දෙමාපියෝ සන්නිපතිත වෙත් ද, (එතෙකුදු වුව) මව ඔසප් නො වූ ද, ගඳඹෙක් (එහි උපදනා සතෙක්) නො එළඹියේ වේ ද, එතෙක් ගර්භාවක්‍රාන්ති නො වන්නේ ය. මෙලොව දෙමාපියෝ සන්නිපතිත වෙත් ද, මව ද ඔසප් වූ ද, (එතෙකුදු වුව) ගඳඹෙක් නො එළඹියේ වේද, එතෙකිනුදු ගර්භාවක්‍රාන්ති නො ම වෙයි. මහණෙනි, යම් අවස්ථාවෙක දෙමාපියෝ සන්නිපතිත වෙත් ද, මව ද ඔසප් වූ ද, ගඳඹෙක් එළඹියේත් වේ ද, මෙසේ තුන් දෙනෙකුන්ගේ සන්නිපාතයෙන් ගර්භාවක්‍රාන්ති වෙයි.

61. මහණෙනි, මව ගුරුභාරයක් වන තෙල ගබ නවමසක් හෝ දසමසක් හෝ මහත් (දිවි) සැකෙන් කුසින් උසුලයි. මහණෙනි, මව ගරුබරක් වන තෙල දරු නවමසක්හුගේ හෝ දසමසක්හුගේ ඇවෑමෙන් මහත්සැකෙන් වදයි. උපන් තෙල දරු සිය මවු ලෙහෙයෙන් පුස්නේ වේ. මහණෙනි, ආර්‍යවිනයෙහි දී තෙල ලෙහෙය මවගේ තනකිරි නම් වෙයි.

62. ස ඛො සො භික්ඛවෙ කුමාරො වුද්ධිමන්වාය[1] ඉන්ද්‍රියානං පරිපාකමන්වාය යානි තානි[2] කුමාරකානං කීළාපනකානි තෙහි කීළති: සෙය්‍යථීදං- වඞ්කකං[3] ඝටිකං මොක්ඛචිකං[4] චිඞ්ගුලකං[5] පත්තාළ්හකං රථකං ධනුකං.

63. ස ඛො සො භික්ඛවෙ කුමාරො වුද්ධිමන්වාය[6] ඉන්ද්‍රියානං පරිපාකමන්වාය පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො[7] පරිචාරෙති: චක්ඛුවිඤ්ඤෙය්‍යෙහි රූපෙහි ඉට්ඨෙහි කන්තෙහි මනාපෙහි පියරූපෙහි කාමූපසංහිතෙහි රජනීයෙහි,[8] සොතවිඤ්ඤෙය්‍යෙහි සද්දෙහි -පෙ- ඝානවිඤ්ඤෙය්‍යෙහි ගන්ධෙහි. -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යෙහි රසෙහි -පෙ- කායවිඤ්ඤෙය්‍යෙහි ඵොට්ඨබ්බෙහි ඉට්ඨෙහි කන්තෙහි මනාපෙහි පියරූපෙහි කාමූපසංහිතෙහි රජනීයෙහි.

64. සො චක්ඛුනා රූපං දිස්වා පියරූපෙ[9] රූපෙ සාරජ්ජති, අප්පියරූපෙ රූපෙ බ්‍යාපජ්ජති.[10] අනුපට්ඨිතකායසති ච විහරති පරිත්තචෙතසො. තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්ස තෙ පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති. සො එවං අනුරොධවිරොධං සමාපන්නො යං කිඤ්චි වෙදනං වෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සො තං වෙදනං අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති. තස්ස තං වෙදනං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දී. යා වෙදනාසු නන්දී තදුපාදානං. තස්සුපාදානපච්චයා[11] භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා. -පෙ- මනසා ධම්මං විඤ්ඤාය පියරූපෙ ධම්මෙ සාරජ්ජති, අප්පියරූපෙ ධම්මෙ බ්‍යාපජ්ජති, අනුපට්ඨිතකායසති ච විහරති පරිත්තචෙතසො. තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්ස තෙ පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති. සො එවං අනුරොධවිරොධං සමාපන්නො යං කිඤ්චි වෙදනං වෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සො තං වෙදනං අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති. තස්ස තං වෙදනං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දී. යා වෙදනාසු නන්දී තදුපාදානං තස්සුපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරා මරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

---

1. වුඩ්ඪිමන්වාය, සයා. 2. යානි, සී. 3 වඞ්කං සයා.සී කාවචි. 4 මොක්ඛලිකා, සී. 5. චිඞ්ගුලිකං, සයා. 6. වුඩ්ඪිමන්වාය, සයා. 7. සමඞ්ගිභූතො, සයා. 8 රජනීයෙහි පෙමනියෙහි, සයා 9. පියරූපෙ සාරජ්ජති, සිමු. 10 අප්පියරූපෙ බ්‍යාපජ්ජති, සිමු. 11. තස්ස උපාදානපච්චයා, සයා

62. මහණෙනි, ඒ කුමර ඉදුරන් පිනවත්නට තිසි වැඩිවියට පැමිණ ඉන්ද්‍රිය පරිපාකය ලදින් කුමරුන් කෙළෙනා යම් යම් කෙළිබඩු ඇත් ද, එයින් කෙළියි. ඒ කෙළි කෙසෙය යත්: කුඩානගුල, දඬුකඩ, (කල්ලි ගැසුම), පිරිවැටුම, බුමුසක, පත්මුවානැළි, කුඩාරිය, කුඩාදුනු යන මෙයි.

63. මහණෙනි, ඒ කුමර (ඉඳුරන් පිනවත්නට නිසි) වියපැමිණ මුහුකුරාගිය ඉඳුරන් ඇති බවට පැමිණ පස්කම්ගුණෙන් සමර්පිත ව සිය ඉඳුරන් පිනවයි. (කෙසේය?) ඉෂ්ට, කාන්ත, මනාප, ප්‍රියරූප, කාමොප-සංහිත, රජනීය, චක්ෂුර්විඥෙය රූපයෙන් පිනවයි. ශ්‍රොත්‍රවිඥෙයශබ්ද-යෙන් ... ඝ්‍රාණවිඥෙය ගන්ධයෙන් ... ජිහ්වාවිඥෙයරසයෙන්...ඉට්ඨ වූ කලණවූ මනවඩන, පියසැහැවි ඇති, කම්සුව ඇසිරිකල, සිත්අලවන්නට නිසි කායවිඥෙය පහසින් පිනවයි.

64. හේ ඇසින් රූ'දැක පියරූප වූ රූපයෙහි සංරාග කෙරෙයි. අප්‍රිය රූප වූ රූපයෙහි ව්‍යාපාද උපදවයි. අකුසල් සිතැති ව නො එළඹ සිටි කායිකානුස්සති ඇති ව ද වාස කෙරෙයි. යම් පල සමවතෙකැ ඒ ලාමක වූ අකුසල්දහම්හු නිරවශෙෂ ව නිරුද්ධ වෙත් ද, ඒ චෙතොවිමුක්තිය ද ප්‍රඥාවිමුක්තිය ද තත්වූ පරිදි නොදනී. හේ මෙසෙයින් රාගද්වෙෂ දෙකට පැමිණියේ සුඛ වේවයි, දුඃඛ වේවයි, අදුඃඛාසුඛ වේවයි, යම් කිසි වෙදනාවක් විඳුතේ වේ ද, හේ ඒ වෙදනා (තෘෂ්ණාවෙන්) අභිනන්දනා කෙරෙයි. (අහො සුවයෙකියි) බෙණෙයි. ගැලැගෙන සිටී. ඔහුට ඒ වෙදනායෙන් තුෂ්නාහට, බණනුවාහට, ගැලැගෙන සිටුනාහට තෘෂ්ණා උපදී. වෙදනායෙහි යම් තන්‍දියෙක් ඇත් ද, ඒ උපාදන වෙයි. ඔහට උපාදන ප්‍රත්‍යයෙන් භවය වෙයි. භවප්‍රත්‍යයෙන් ජාති වෙයි. ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණශොකපරිදෙවදුඃඛ දෞර්මනස්‍ය උපායාසයෝ පහළ වෙති. මෙසෙයින් තෙල කෙවල දුඃඛ-පුඤ්ජයාගේ උදාවීම වෙයි. කණින් ශබ්ද අසා ... නැහැයෙන් ගඳ ආඝ්‍රාණ කොට ... දිවින් රස ආස්වාද කොට ... කයින් පහස විඳ ... මෙනෙන් දහම් දැන ප්‍රිය වූ දහම් අරමුණෙහි ඇලේ. අප්‍රිය ධර්මාලම්බනයෙහි විරොධ කෙරේ. අකුසල් සිතැතිව නො එළඹි කායිකානුසි ඇතිව වාස කෙරේ. යම් පලසමවතෙකැ ඒ ලමු අකුසල් දහම්හු නිඃශෙෂව නිරුද්ධ වෙත් ද, ඒ චෙතොවිමුක්ති හා ප්‍රඥාවිමුක්ති හං තත්වූ පරිදි නො දනී. හේ මෙසෙයින් අනුරොධ විරොධ දෙකට පැමිණියේ සුඛ වේවයි, දුඃඛ වේවයි, උපෙක්ෂා වේවයි, යම්කිසි වෙදනාවක් විඳුතේ වේ ද, හේ ඒ වෙදනා අභිනන්දන කෙරේ, බෙණේ, ගැලැගෙන සිටී. ඒ වෙදනා අභිනන්දනා කරන බණන, ගැලැගෙන සිටුනා ඔහුට තෘෂ්ණා උපදී. වෙදනායෙහි යම් තෘෂ්ණා-යෙක් ඇත් ද, වේදිතව්‍යයයි. ඒ උපාදන වෙයි. ඔහුට උපාදනප්‍රත්‍යයෙන් භවය වෙයි. භවප්‍රත්‍යයෙන් ජාති වෙයි. ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ ශොකපරිදෙව දුඃඛ දෞර්මනස්‍ය උපායාසයෝ පහළ වෙත්. මෙසේ තෙල කෙවල දුඃඛ පුඤ්ජයාගේ උදාවීම වන්නේ ය.

65 ඉධ භික්ඛවෙ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං, සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං, කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චාජාතො.[1] සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉතිපටිසඤ්චික්ඛති: සම්බාධො ඝරාවාසො රජාපථො, අබ්භොකාසො පබ්බජ්ජා; නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං; යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය, මහන්තං වා භොගක්ඛන්ධං පහාය, අප්පං වා ඤාතිපරිවට්ටං පහාය, මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය, කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති.

66. සො එවං පබ්බජිතො සමානො භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති. නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා. මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති සච්චවාදී සච්චසන්ධො ථෙතො[2] පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. පිසුණං[3] වාචං පහාය පිසුණාය වාචාය[4] පටිවිරතො හොති: ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය[5] පටිවිරතො හොති: යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හොති. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති: කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා[6] කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං.

---

1. පච්ඡාජාතො, ස්‍යා 2. ඨෙතො, ස්‍යා 3. පිසුණා, සී. කත්ථචි
4. පිසුණාවාචා, සී කත්ථචි 5. ඵරුසාවාචා, සී කත්ථචි. 6. භාසිතාහොති, ස්‍යා.

65. මහණෙනි, මෙලොව අර්හත් වූ, සම්‍යක්සම්බුද්ධ වූ, විද්‍යාචරණසම්පන්න වූ, සුගත වූ, ලොකවිද් වූ, අනුත්තරපුරුෂදම්‍යසාරථි වූ, දෙවමනුෂ්‍යයනට ශාස්තෘ වූ, චතුස්සත්‍යාවබොධ කළා වූ, භාග්‍යවත් වූ තථාගතයන් වහන්සේ පහළ වනසේක. උන්වහන්සේ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මෙලොව, මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාව තමන් විසින් විශිෂ්ටඥානයෙන් පසක් කොට දන්වනසේක. උන්වහන්සේ ආදිකල්‍යාණ කොට මධ්‍යකල්‍යාණ කොට පර්‍ය්‍යවසානකල්‍යාණ කොට සාර්ථ කොට සව්‍යඤ්ජන කොට දහම් දෙසනසේක. කෙවලපරිපූර්ණ කොට පරිශුද්ධ කොට බඹසර පවසනසේක. ගැහැවියෙක් හෝ ගැහැවිපුතෙක් හෝ එක්තරා නීචකුලයෙක උපනුවෙක් හෝ ඒ දහම් අසයි. හේ එදහම් අසා තථාගතයන් වහන්සේ කෙරෙහි සැදැහැ ලබයි. ඒ ශ්‍රද්ධාප්‍රතිලාභයෙන් සමන්වාගත වූයේ මෙසේ මෙනෙහි කෙරේ: "ගෘහවාසසම්බාධය, (රාගාදි විසින්) රජොමාර්ගය, ප්‍රව්‍රජ්‍යා අභ්‍යවකාශය. ගිහිගෙයි වසනුවහු විසින් එකාන්තපරිපූර්ණ, එකාන්තපරිශුද්ධ, ධෞතශඞ්ඛසදෘශ මේ බඹසර සරන්නට සුකර නො වේ. මම කෙහෙරවුළු බහා කහවත් හැඳ ගෙන් නික්ම පැවිද්දට පැමිණෙම් නම් මනා මැනැ යි" කියායි. හේ පසු කලෙක අල්පවූ හෝ භොගස්කන්ධය පියා, මහත් වූ හෝ භොගස්කන්ධය පියා, අල්ප වූ හෝ ඥාතිපරිවර්තය පියා, මහත් වූ හෝ ඥාතිපරිවර්තය පියා, කෙහෙමස් අපහරණ කොට කහවත් හැඳ ගෙන් නික්ම පැවිද්දට වදනේය.

66. හේ මෙසේ පැවිදිවූයේ, (අධිශීලසඞ්ඛ්‍යාත) ශික්ෂාවට ද (ප්‍රඥප්තශික්ෂාපදසඞ්ඛ්‍යාත) සාජීවයට ද පැමිණියේ, පණිවා පියා පණිවායෙන් දුරුවූයේ වෙයි. බහාතැබූ දඬු ඇතියේ බහාලූ සැත් ඇතියේ, ලජ්ජිවූයේ, දයාවට පැමිණියේ, සර්‍වසත්ත්වහිතානුකම්පී ව වාස කෙරේ. අයිනාදන් පියා අයිනාදනින් වැළැකියේ වෙයි. දුන්දෑ ගන්නේ, දුන්දෑ කැමැතිවනුයේ, නොසොර පිවිතුරු ආත්මයෙන් වෙසේ. අබ්‍රහ්මචර්‍ය්‍යය පියා බඹසර ඇතියේ වෙයි. (මෙවුන් දම්න්) දුරුහැසිරීම් ඇතියේ, ගැමිදහම් වන මෛථුනයෙන් විරත වෙයි. මුසවා පියා මුසවායෙන් වැළකියේ වෙයි. සත්‍යවාදී වූයේ, සත්‍යසන්ධාන ඇතියේ, ස්ථිරවචන ඇතියේ, ඇදහිය යුතු බස් ඇතියේ, ලොකයා විසංවාද නොකරනුයේ වෙයි. පිසුණු බස් පියා පිසුණු බසින් වැළැකියේ වෙයි: මුන් බිඳිනු සඳහා මෙහිදී අසා එහි නොකියනු වෙයි. එතැන අසා උන්බිඳිනු සඳහා මුනට නො කියනු වෙයි. මෙසේසින් බුන් අය ගළපනු හෝ සමගි වූවනට සන්ධාන දෙනු හෝ වෙයි. සමගරම් ව සමගරත ව සමගියෙහි අභිනන්දනා ඇති ව සමගකරණබස් බණනු වෙයි. පරුස් බස් පියා පරුස් බසින් වැළකියේ වෙයි: නිදොස් (ව්‍යඤ්ජන විසින්) කණට සුවදෙන, පෙමට නිසි, ලගන්නා, (ගුණපරිපූර්ණතායෙන්) පුරවැසි, බොහෝ දෙනට ප්‍රිය, බොහෝ දෙනගේ මනවඩන යම් බස් ඇත් ද, එබඳු බස් බණනු වෙයි. සම්ඵප්පලාප පියා පලපිත් වැළකියේ වෙයි: බුණුවමනා කල්බලා බණන, දහම් බණන (මෙලෝපරලෝ) අරුත් ඇසිරි කොට බණන, නවලොව්තුරු දහම් ඇසිරි කොට බණන, (සංවර - ප්‍රහාණ) විනය ඇසිරි කොට බණන, අයුතුකල්හි සකාරණ, පරිච්ඡෙද ඇති, අර්ථසංහිත, ලෙහි ලා ගතයුතු බස් බණනු වෙයි.

67. සො බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති. එකභත්තිකො හොති රත්තූපරතො[1] විරතො විකාලභොජනා. නච්චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජතපටිග්ගහණා පටිවිරතො හොති. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා[2] පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති. අජෙළකපටිග්ගහණා පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතො හොති. හත්ථිගවාස්සවළවාපටිග්ගහණා පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතො හොති. දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූට - කංසකූට - මානකූටා පටිවිරතො හොති. උක්කොටන - වඤ්චන - නිකති - සාචියොගා[3] පටිවිරතො හොති. ඡෙදන - වධ - බන්ධන - විපරාමොස[4] - ආලොප - සහසාකාරා පටිවිරතො හොති.

68. සො සන්තුට්ඨො හොති කායපරිහාරියෙන[5] චීවරෙන කුච්ඡිපරිහාරියෙන පිණ්ඩපාතෙන. යෙන යෙනෙව පක්කමති, සමාදායෙව පක්කමති. සෙය්‍යථාපි නාම පක්ඛිසකුණො[6] යෙන යෙනෙව ඩෙති, සපත්තභාරොව ඩෙති, එවමෙව භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරියෙන චීවරෙන කුච්ඡිපරිහාරියෙන පිණ්ඩපාතෙන. යෙන යෙනෙව[7] පක්කමති, සමාදායෙව පක්කමති.

සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති.

69. සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙති.

---

1. රත්තූපරතො, මජසං සයා. PTS. 2. ඉත්ථිකුමාරි පටිග්ගහණා, සී-කාළුවි. 3. සාචියොගා, සයා. 4. විපරාමාසා, සී-කාළුවි. 5. කායපරිහාරිකෙන, මජසං. සයා. PTS. සී-කාළුවි. 6. පක්ඛිසකුණා, මජසං. සයා. 7. සො යෙන යෙනෙව, මජසං

67. හේ (මූලබීජාදී) බීජග්‍රාම හා (නීලතෘණාදී) භූතග්‍රාම (ඡේදන-පචනාදී) විකොපනායෙන් වැළකියේ වෙයි. රාත්‍රි භොජනයෙන් වැළැකියේ වෙයි. විකල්බොජුනෙන් වැළැකියේ ඒකභක්තික වෙයි. නටනුගනු වයනු විසුළු දස්නෙන් වැළැකියේ වෙයි. මල්ගඳවිලෙවුන් බැරීමය මණ්ඩනය විභූෂණය යන මින් වැළැකියේ වෙයි. උසසුන් මහඅස්නෙන් වැළකියේ වෙයි. රන්රිදී පිළිගැන්මෙන් වැළකියේ වෙයි. අමුධාන්‍ය පිළිගැන්මෙන් වැළකියේ වෙයි. අමුමස් පිළිගැන්මෙන් වැළැකියේ වෙයි. (පුරුෂාන්තර ගත) ස්ත්‍රීන් හා (තදන්‍ය) ස්ත්‍රීන් පිළිගැන්මෙන් වැළැකියේ වෙයි. (කැපකරු ඇරැම් වසයෙන් වත් මුත්) දැසිදස් පිළිගැන්මෙන් වැළැකියේ වෙයි. එළුතිරෙළු පිළිගැන්මෙන් වැළැකියේ වෙයි. කුකුළුහූරු පිළිගැන්මෙන් වැළකියේ වෙයි. ඇත් ගෙරි අස් වෙළඹ පිළිගැන්මෙන් වැළැකියේ වෙයි. කෙත්වත් පිළිගැන්මෙන් වැළකියේ වෙයි. දූතකම පිණිස තැන තැන යැමෙන්, තෙපුල්ගෙන ගෙන් ගෙට යන කුදුගමනින් වැළැකියේ වෙයි. ක්‍රය වික්‍රය දෙකින් වැළකියේ වෙයි. තුලාකූට – කංසකූට – මානකූට විසින් වඤ්චා(තුළු) කිරීමෙන් වැළැකියේ වෙයි. ලස්ගැන්ම – තුළුකිරීම – මායා – සාචියොගයෙන් (කුටිලප්‍රයොගයෙන්) වැළැකියේ වෙයි. (අත්සිඳීම් ආ) ඡේදනය, වධය, (රජ්ජුබන්ධනාදී) බන්ධනය, විපරාමොෂය (සැඟවී සිට මංපැහැරීම), ගම්වොලොගැන්ම, සාහසිකක්‍රියා යන මෙයින් වැළැකියේ වෙයි.

68. හේ කායපරිහරණමාත්‍ර චීවරයෙන් සන්තුෂ්ට වෙයි. කුක්ෂිපරිහරණමාත්‍ර පිණ්ඩපාතයෙන් සන්තුෂ්ට වෙයි. යම් යම් ම දිගෙක බැස යේ ද, (අෂ්ටපරිෂ්කාරමාත්‍රය) ගෙන ම යෙයි. යම්සේ පියා ඇති ලිහිණියෙක් යම් යම් ම දිගෙක්හි පියා පැහැර යේ ද, පත්‍රභාර සහිත ව ම අහස නැගගන්නේ වේ ද, එපරිද්දෙන් ම මහණ කායපරිහරණමාත්‍ර චීවරයෙනුදු කුක්ෂිපරිහරණමාත්‍ර පිණ්ඩපාතයෙනුදු සතුටු වෙයි. යම් යම් ම දිගෙක බැස යේ ද, (අටපිරිකර) ගෙන ම යෙයි.

හේ මේ අරීසිල් කඳින් සමන්වාගත වූයේ තමා තුළ අනවද්‍යසුඛය විඳුනේය.

69. හේ ඇසින් රූඅරමුණු දැක නිමිති ගන්නාසුලු නො වේ. අනුවියඳුන් ගන්නාසුලු නො වේ. යම් හෙයෙකින් චක්ෂුරින්ද්‍රිය අසංවෘත කොට ගෙන වාස කරන තුලුන් ලමු අකුසල්දහම් වන අභිධ්‍යාදෞර්මනස්‍යයෝ ලුහුබැඳ ගැලගනිත් ද, ඒ ඉන්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදනේය. චක්ෂුරින්ද්‍රිය රක්නේය. චක්ෂුරින්ද්‍රියෙහි සංවරයට වදනේය. කණින් ශබ්ද අසා ...නැහැයෙන් ගඳ ආඝ්‍රාණ කොට ...දිවින් රස ආස්වාද කොට ...කයින් පහස පැහැස ... සිතින් දහම් දැන නිමිත්තග්‍රාහී නො වේ. අනුව්‍යඤ්ජන ග්‍රාහී නො වේ. යම්හෙයෙකින් මනින්ද්‍රිය අසංවෘත කොට ගෙන වාස කරන තුලුන් ලමු අසල්දහම් වන අභිධ්‍යාදෞර්මනස්‍යයෝ ලුහුබැඳ ගැලගනිත් ද, ඒ මනින්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදනේය. මනින්ද්‍රිය රක්නේය. මනින්ද්‍රියෙහි සංවරයට වදනේය. හේ මෙකී ඉන්ද්‍රියසංවරයෙන් සමන්වාගත වූයේ සියසතන්හි අව්‍යාසෙක (කෙලෙස්මුසු නැති) සුඛය විඳුනේය.

Free Distribution www.aathaapi.org

70. සො අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති. ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති. සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති. සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති. අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති. උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති.

71. සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො, ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො, ඉමිනා ච සතිසම්පජඤ්ඤෙන[1] සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති: අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා, උජුං කායං පණිධාය, පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

72. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති, අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතහිතානුකම්පී. බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං[2] පහාය විගතථීනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො. ථීනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු. විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

73. සො ඉමෙ පඤ්ච නීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං[3] උපසම්පජ්ජ විහරති. පුන ච පරං භික්ඛවෙ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. පීතියා ච විරාගා උපෙක්ඛකො -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති.

74. සො චක්ඛුනා රූපං දිස්වා පියරූපෙ රූපෙ න සාරජ්ජති.[4] අප්පියරූපෙ රූපෙ න බ්‍යාපජ්ජති. උපට්ඨිතකායසති ච විහරති අප්පමාණචෙතසො. තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති යත්ථස්ස තෙ පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති. සො එවං අනුරොධවිරොධවිප්පහීනො යං කිඤ්චි වෙදනං වෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සො තං වෙදනං නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති. තස්ස තං වෙදනං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො යා වෙදනාසු නන්දි සා නිරුජ්ඣති. තස්ස නන්දිනිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

---

1. අරියෙන සතිසම්පජඤ්ඤෙන, මජසං. 2. ථීනමිද්ධං, මජසං,
3. පඨමජ්ඣානං, සීමු. 4. පියරූපෙ නසාරජ්ජති. සී.

Free Distribution www.aathaapi.org

70. හේ ඉදිරිගමනෙහි ද වටාලා ඊමෙහි ද සම්‍යක්ප්‍රඥාවෙන් දැන එය කරන්නේ වේ. ඉදිරි බැලීමෙහි ඔබමොබ බැලීමෙහි සම්පජානකාරී වේ. (අත්පා) හැකිළීම් දිගුකිරීම්හි සම්පජානකාරී වේ. සඟල හා පාසිවුරු දැරීමෙහි සම්පජානකාරී වේ භොජ්‍යයෙහි පෙයයෙහි ඛාද්‍යයෙහි ලෙය්‍යයෙහි සම්පජානකාරී වේ. මලමූත්‍රයෙහි සම්පජානකාරී වේ. යෑමෙහි සිටීමෙහි හිඳීමෙහි නිදීමෙහි නිදි වැරීමෙහි කිණීමෙහි නිහඬ බැව්හි සම්පජානකාරී වේ.

71. හේ මෙකී ආර්‍යශීලස්කන්ධයෙනුදු සමන්වාගත වූයේ, මෙකී ආර්‍ය ඉන්ද්‍රියසංවරයෙනුදු සමන්වාගත වූයේ, මෙකී ස්මෘතිසම්ප්‍රජන්‍යයෙනුදු සමන්වාගත වූයේ ජනශූන්‍ය සෙනසුන් සෙවුනේය: (දුනුපත්සියෙන්-දුරෙහි වූ) අරන, (ගහනා) රුක්මුල, සෙල, කඳුර, දෙපවුඅතුර, සොහොන, ගැඹුරුවන, නොයත්අබවස, පිදුරුකිළි යි හේ පසුබත පිඬුවායෙන් වැලැකියේ උඩුකය ඉදිකොට තබා, කමටහන් අභිමුඛ කොට සිහි එළවා, පලක් බැඳ හිඳුනේය.

27. හේ පඤ්චොපාදනස්කන්ධයෙහි රාගය (විෂ්කම්භන විසින්) පියා, පැහූ අභිධ්‍යා ඇතිසිතින් වාස කෙරේ. අභිධ්‍යායෙන් සිත මුදවයි. ව්‍යාපාද සඞ්ඛ්‍යාත ප්‍රද්වෙෂය (ක්‍රොධය) පියා සර්වසත්ත්වහිතානුකම්පී ව ව්‍යාපාදයට නො පත් සිතැති ව වාස කෙරේ. ක්‍රොධයෙන් සිත්සතන මුදවයි. ස්ත්‍යානමිද්ධය පියා පැහූ ස්ත්‍යානමිද්ධ ඇතියේ, ආලොක සංඥ ඇතියේ, සිහි ඇතියේ, නුවණැතියේ වාස කෙරේ. ස්ත්‍යාන මිද්ධයෙන් සිත මුදවයි. ඖද්ධත්‍ය කෞකෘත්‍යය පියා අනුද්ධත ව සියසතන සන්හුන් සිතැති ව වාස කෙරේ. ඖද්ධත්‍යකෞකෘත්‍යයෙන් සිත මුදවයි. විචිකිත්සා පියා තුණ්ණවිචිකිච්ඡ ඇති ව අනවද්‍යධර්මයෙහි කථංකථඞ්කාර නැති ව වාස කෙරේ විචිකිත්සායෙන් සිත මුදවයි.

73 හේ චිත්තොපක්ලෙශ වන, ප්‍රඥාව දුර්වලකරණ මේ පඤ්චනීවරණයන් පියා කාමයෙන් වෙන් ව ම අකුසල්දහමින් වෙන් ව ම සවිතර්ක, සවිචාර, විවෙකජ ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යාන උපයා වාස කෙරේ. තව ද මහණෙනි, මහණ මතුයෙහි විතර්කවිචාර සන්හිඳීමෙන් සියසතන්හි පැහැදීම් කරන, උතුම් චිත්තෛකාග්‍රභාව ඇති, අවිතර්ක අවිචාර වූ සමාධියෙන් උපන් ප්‍රීතිසුඛ ඇති ද්විතීයධ්‍යාන උපයා වාස කෙරේ. ප්‍රීතියාගේ ද විරාගයෙන් උපෙක්ෂා ඇත්තේ ... තෘතීයධ්‍යාන උපයා වාස කෙරේ... සුඛදුඃඛප්‍රහාණයෙන් ... චතුර්ථධ්‍යාන උපයා වාස කෙරේ.

74. හේ ඇසින් රූ දැක ප්‍රියරූප රූපයෙහි රාග නො කෙරේ. අප්‍රියරූප රූපයෙහි ව්‍යාපාදයට නො පැමිණේ. එළඹ සිටි කායිකාසි ඇතියේ, මාත්‍රවිත්තසමන්විත වූයේ, යම් ඵලසමාපත්තියෙක ඒ ලමු අකුසල් දහම්හු නිඃශෙෂ ව නිරුද්ධ වෙත් ද, ඒ චෙතොවිමුක්ති ප්‍රඥාවිමුක්ති තත්වූ පරිදි දනී. හේ මෙසේසින් රාගද්වෙෂ විප්‍රහීණ ව සුඛ වේවයි, දුඃඛ වේවයි, අදුඃඛාසුඛ වේවයි යම් ම වේදනාවෙක් විඳුනේ වේද, හේ ඒ වේදනාව (තෘෂ්ණා) විසින් අභිනන්දනා නො කෙරෙයි. (අහෝ සුඛයෙකි යි) නො බෙණේ ගැලැගෙන නොසිටී. ඒ වේදනා අභිනන්දනා නො කරන, තුති විසින් නොබණන, ගැලැගෙන නො සිටුනා ඔහට වේදනායෙහි යම් නන්දියෙක් ඇත් ද, ඒ නිරුද්ධ වෙයි. ඔහුට නන්දිනිරොධයෙන් උපාදාන නිරොධ වෙයි. උපාදානනිරොධයෙන් භවනිරොධ වෙයි. භව-නිරොධයෙන් ජාතිනිරොධ වෙයි. ජාතිනිරොධයෙන් ජරාමරණ ශොක-පරිදෙව දුඃඛදෞර්මනස්‍යයෝ නිරුද්ධ වෙති. මෙසේසින් සකල කෙවලදුඃඛ පුඤ්ජයාගේ නිරොධය වෙයි.

75. සොතෙන සද්දං සුත්වා පියරූපෙ සද්දෙ -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා පියරූපෙ ගන්ධෙ -පෙ- ජිව්හාය රසං සායිත්වා පියරූපෙ රසෙ -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා පියරූපෙ ඵොට්ඨබ්බෙ -පෙ- මනසා ධම්මං විඤ්ඤාය පියරූපෙ ධම්මෙ න සාරජ්ජති. අප්පියරූපෙ ධම්මෙ න බ්‍යාපජ්ජති. උපට්ඨිතකායසති ච විහරති අප්පමාණචෙතසො. තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති යත්ථස්ස තෙ පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති. සො එවං අනුරොධවිරොධවිප්පහීනො යං කිඤ්චි[1] වෙදනං වෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සො තං වෙදනං නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති. තස්ස තං වෙදනං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො යා වෙදනාසු නන්දි සා නිරුජ්ඣති. තස්ස නන්දිනිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

76. ඉමං ඛො මෙ තුම්හෙ භික්ඛවෙ සඞ්ඛිත්තෙන තණ්හාසඞ්ඛයවිමුත්තිං ධාරෙථ. සාතිං පන භික්ඛුං[2] කෙවට්ටපුත්තං මහාතණ්හාජාල’- තණ්හාසඞ්ඝාට[3] පටිමුක්කන්ති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

මහාතණ්හාසඞ්ඛයසුත්තං අට්ඨමං.

1. 4. 9.

මහාඅස්සපුරසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා අඞ්ගෙසු විහරති අස්සපුරං නාම අඞ්ගානං නිගමො. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: භික්ඛවො’ති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. සමණාති වො භික්ඛවෙ ජනො සඤ්ජානාති. තුම්හෙ ච පන කෙ තුම්හෙති පුට්ඨා සමණා සමණම්හාති පටිජානාථ. තෙසං වො භික්ඛවෙ එවං සමඤ්ඤානං සතං එවම්පටිඤ්ඤානං සතං “යෙ ධම්මා සමණකරණා ච බ්‍රාහ්මණකරණා ච තෙ ධම්මෙ සමාදාය වත්තිස්සාම. එවං නො අම්හාකං සමඤ්ඤා ච අයං සච්චා භවිස්සති පටිඤ්ඤා ච භූතා. යෙසඤ්ච මයං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං[4] පරිභුඤ්ජාම, තෙසං තෙ කාරා අම්හෙසු මහප්ඵලා භවිස්සන්ති මහානිසංසා. අම්හාකඤ්චෙවායං පබ්බජ්ජා අවඤ්ඣා භවිස්සති සඵලා සඋද්‍රයාති[5]” එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

1. කිඤ්ච, PTS. 2. සාතිං භික්ඛුං, සී. 3. සඞ්ඝාටි, සී.
4. පරික්ඛාරෙ, ස්‍යා. සී.-කත්ථචි. 5. සඋද්‍රයාති, සීමු.

75. කණින් ශබ්ද අසා ප්‍රියරූපශබ්දයෙහි ... ඝ්‍රාණයෙන් ගන්ධ ආඝ්‍රාණ කොට ප්‍රිය රූපගන්ධයෙහි ... දිවින් රස ආස්වාද කොට ප්‍රියරූප රසයෙහි ... කයින් ස්පර්ශ පැහැස ප්‍රියරූපස්පර්ශයෙහි ... මනසින් දහම් දැන ප්‍රියරූප ධර්මාලම්බනයෙහි රාග නො කෙරේ. අප්‍රියරූපධර්මාලම්බනයෙහි ව්‍යාපාද නො කෙරේ. එළඹසිටි කායගතාසති ඇතිව මාර්ගචිත්තසමන්විත ව වාස කෙරේ. යම් පලසමවතෙක දී ඒ ලමු අකුසල් දහම්හු නිඃශෙෂ ව නිරුද්ධ වෙත් ද, ඒ චෙතොවිමුක්ති ද ප්‍රඥාවිමුක්ති ද තත් වූ පරිදි දනී. හේ මෙසෙයින් අනුරොධවිරොධවිප්‍රහීණ වූයේ සුඛ වේවයි, දුඃඛ වේවයි, අදුඃඛාසුඛ වේවයි යම් වෙදනාවක් විඳුනේ වේද, හේ ඒ වෙදනා අභිනන්දනා නො කෙරේ, නො බෙණේ, ගැලගෙන නොසිටි. ඒ වෙසින අභිනන්දනා නොකරන, නොබණන, ගැලෑගෙන නොසිටුනා ඔහට වෙදනායෙහි යම් නන්දියෙක් ඇත් ද, ඒ නිරුද්ධ වෙයි. ඔහට නන්දිනිරොධයෙන් උපාදානනිරොධ වෙයි. උපාදානනිරොධයෙන් භව-නිරොධ වෙයි. භවනිරොධයෙන් ජාතිනිරොධ වෙයි. ජාතිනිරොධයෙන් ජරාමරණ ශොකපරිදෙව දුඃඛදෞර්මනස්‍ය උපායාසයෝ නිරුද්ධ වෙති. මෙසෙයින් තෙල කෙවලදුඃඛපුඤ්ජයාගේ නිරොධය වෙයි.

76. මහණෙනි, තෙපි සැකෙවින් දෙසූ මාගේ මේ තෘෂ්ණාසඞ්ඛය-විමුක්තිය (විමුක්තිපටිලාභහෙතු වූ දෙසනාව) ධරව. කෙවුළුපුත් සාතිමහණ මහා තෘෂ්ණා දැලෙහි - මහා තෘෂ්ණා සඞ්ඝාටයෙහි (බන්ධනයෙහි) පිළිමුතුවකු (පිවිසියකු) කොට ධරවයි වදාළහ.

භාග්‍යවතුන් වහන්සේ මේ මහාතණ්හාසඞ්ඛය සූත්‍රය වදාළසේක. සියමන (තුටුසිත්) ඇති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිනන්දනා කළහ.

මහාතණ්හාසඞ්ඛය සූත්‍රය අටවැනියි.

1. 4. 9.

මහාඅස්සපුර සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ අඞ්ග ජනපදයෙහි අඞ්ගරටවැසියන්ගේ අස්සපුර නම් නියම්ගම්හි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි මහණන් ඇමතූ-සේක. ඒ මහණහු 'වහන්සැ'යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළසේක:

2. මහණෙනි, මහදෙනෝ තොප 'ශ්‍රමණයහ, ශ්‍රමණයහ'යි හඳුනත්-තේය. තෙපිදු 'තෙපි කවරහු'යි පුළුවුස්නා ලදුව 'ශ්‍රමණයම්හ'යි පිළිත කරව. මහණෙනි, මෙබඳු නම් ඇති, මෙබඳු පිළිත දෙන ඒ තොප විසිනුදු "ශ්‍රමණකරණ (පව් සමණ කරණ) බ්‍රාහ්මණකරණ (පව් බහන) යම් ධර්ම ඇත් ද, ඒ ධර්මසමාදාන විසින් ගෙන වැටෙම්හ. මෙසේ වත්ම, අපගේ මේ ශ්‍රමණසංඥාව සත්‍ය වෙයි. ප්‍රතිඥා ද යථාර්ථ වෙයි. අපි යම් ම කෙනෙකුන්ගේ සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර වළඳ කරමෝ ද, උන් අප කෙරෙහි කරන ඒ උපකාරයෝ මහත්ඵල මහානෘශංස වෙති. අපගේ ද මේ පැවිද්ද අවන්ධ්‍ය වෙයි, සඵල වෙයි, සවෘද්ධික වෙයි" කියා මෙසෙයින් මහණෙනි, තොප හික්මෙන්නේ මැනැව.

3. කතමෙ ච භික්ඛවෙ ධම්මා සමණකරණා ච බ්‍රාහ්මණකරණා ච?

4. හිරොත්තප්පෙන සමන්නාගතා භවිස්සාමා'ති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.[1]

5. සියා ඛො පන භික්ඛවෙ තුම්හාකං එවමස්ස: හිරොත්තප්පෙනම්හා[2] සමන්නාගතා. අලමෙත්තාවතා, කතමෙත්තාවතා. අනුප්පත්තො නො සාමඤ්ඤත්ථො. නත්ථි නො කිඤ්චි උත්තරිං කරණීයන්ති තාවතකෙනෙව තුට්ඨිං ආපජ්ජෙය්‍යාථ.

6. ආරොචයාමි වො භික්ඛවෙ, පටිවෙදයාමි වො භික්ඛවෙ: මා වො සාමඤ්ඤත්ථිකානං සතං සාමඤ්ඤත්ථො පරිහායි සති උත්තරිං කරණීයෙ. කිඤ්ච භික්ඛවෙ උත්තරිං කරණීයං? 'පරිසුද්ධො නො කායසමාචාරො භවිස්සති උත්තානො විවටො, න ච ඡිද්දවා සංවුතො ච. තාය ච පන පරිසුද්ධකායසමාචාරතාය නෙවත්තානුක්කංසිස්සාම, න පරං වම්භිස්සාමා'ති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

7. සියා ඛො පන භික්ඛවෙ තුම්හාකං එවමස්ස: හිරොත්තප්පෙනම්හා සමන්නාගතා, පරිසුද්ධො නො කායසමාචාරො. අලමෙත්තාවතා, කතමෙත්තාවතා. අනුප්පත්තො නො සාමඤ්ඤත්ථො. නත්ථි නො කිඤ්චි[3] උත්තරිං කරණීයන්ති තාවතකෙනෙව තුට්ඨිං ආපජ්ජෙය්‍යාථ.

8. ආරොචයාමි වො භික්ඛවෙ, පටිවෙදයාමි වො භික්ඛවෙ: මා වො සාමඤ්ඤත්ථිකානං සතං සාමඤ්ඤත්ථො පරිහායි සති උත්තරිං කරණීයෙ. කිඤ්ච භික්ඛවෙ උත්තරිං කරණීයං? 'පරිසුද්ධො නො වචීසමාචාරො භවිස්සති උත්තානො විවටො න ච ඡිද්දවා සංවුතො ච. තාය ච පන පරිසුද්ධවචීසමාචාරතාය නෙවත්තානුක්කංසිස්සාම න පරං වම්භිස්සාමා'ති[5] එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

9. සියා ඛො පන භික්ඛවෙ තුම්හාකං එවමස්ස: හිරොත්තප්පෙනම්හා සමන්නාගතා, පරිසුද්ධො නො කායසමාචාරො, පරිසුද්ධො වචීසමාචාරො. අලමෙත්තාවතා, කතමෙත්තාවතා. අනුප්පත්තො නො සාමඤ්ඤත්ථො. නත්ථි නො කිඤ්චි උත්තරිං කරණීයන්ති තාවතකෙනෙව තුට්ඨිං ආපජ්ජෙය්‍යාථ.

10. ආරොචයාමි වො භික්ඛවෙ, පටිවෙදයාමි වො භික්ඛවෙ: මා වො සාමඤ්ඤත්ථිකානං සතං සාමඤ්ඤත්ථො පරිහායි සති උත්තරිං කරණීයෙ. කිඤ්ච භික්ඛවෙ උත්තරිං කරණීයං? 'පරිසුද්ධො නො මනොසමාචාරො භවිස්සති උත්තානො විවටො න ච ඡිද්දවා සංවුතො ච තාය ච පන පරිසුද්ධමනොසමාචාරතාය නෙවත්තානුක්කංසිස්සාම, න පරං වම්භිස්සාමා'ති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

11. සියා ඛො පන භික්ඛවෙ තුම්හාකං එවමස්ස: හිරොත්තප්පෙනම්හා සමන්නාගතා, පරිසුද්ධො නො කායසමාචාරො, පරිසුද්ධො වචීසමාචාරො, පරිසුද්ධො මනොසමාචාරො. අලමෙත්තාවතා, කතමෙත්තාවතා. අනුප්පත්තො නො සාමඤ්ඤත්ථො. නත්ථි නො කිඤ්චි උත්තරිං කරණීයන්ති තාවතකෙනෙව තුට්ඨිං ආපජ්ජෙය්‍යාථ.

---

1. සික්ඛිතබ්බන්ති, ස්‍යා. 2 හිරොත්තප්පෙනම්හ, මජසං ස්‍යා. PTS.
3. නත්ථි කිඤ්චි, ස්‍යා. 4 නෙවත්තානුක්කංසෙය්‍යාම, මජසං
5. වම්භෙය්‍යාම, මජසං.

Free Distribution www.aathaapi.org

3. මහණෙනි, ශ්‍රමණකරණ - බ්‍රාහ්මණකරණ ධර්මයෝ කවරහ යත්:

4. "හිරි ඔතප් දෙකින් සමන්‍වාගත වම්හ"යි මහණෙනි, මෙසේසිත් තොප හික්මෙත්තේ මැනැව.

5. මහණෙනි, තොපට මෙබඳු සිතෙක් විය හෙත්තේය: "හිරි ඔතප් දෙකින් සමන්‍වාගතයම්හ. එමතුයෙන් පමණ වෙයි. එමතුයෙන් මහණුවම් කරන ලදී. අප විසින් ශ්‍රාමණ්‍යාර්ථය ලැබිණ. අපට මතුයෙහි කරණී කිසිදු නැති" යි එතෙකින් ම තුෂ්නට පැමිණෙත්තාව.

6. මහණෙනි, තොප බෙණෙමි, මහණෙනි, තොප දත්වමි: මතුයෙහි කරණී තිබිය දී, ශ්‍රාමණ්‍යාර්ථීව සිටුනා තොපගේ ශ්‍රාමණ්‍යාර්ථය (මාර්ග හා ඵල) නහමක් පිරිහියේවා. මහණෙනි, මතුයෙහි කරණී නම් කිමෙක යත්: "අපගේ කායසමාචාර පිරිසිදු වෙයි, තොමුවහ වෙයි, විවෘත වෙයි, සිදුරැති නො වෙයි, සංවෘත ද වෙයි. ඒ පරිශුද්ධ(පරමසල්ලේඛ) කායසමාචාරතායෙනුදු තමත් නො ම හුවම්හ, මෙරමා නොගරම්හ"යි මහණෙනි, මෙසේසිත් තොප හික්මෙත්තේ මැනැව.

7. මහණෙනි, තොපට මෙබඳු සිතෙක් විය හෙත්තේය: "හිරිඔතප් දෙකින් සමන්‍වාගතයම්හ. අපගේ කායසමාචාරපිරිසිදු වෙයි. එමතුයෙන් පමණ, එතෙකින් මහණුම් කරන ලදී. අප විසින් ශ්‍රාමණ්‍යාර්ථය ලැබිණ. අපට මතුයෙහි කරණී කිසිදු නැති"යි එතෙකින් ම තුෂ්නට පැමිණෙත්තාව.

8. මහණෙනි, තොප බෙණෙමි, මහණෙනි, තොප දත්වමි: මතුයෙහි කරණී තිබියදී, ශ්‍රාමණ්‍යාර්ථීව සිටුනා තොපගේ ශ්‍රාමණ්‍යාර්ථය නහමක් පිරිහියේවා. මහණෙනි, මතුයෙහි කරණී නම් කිමෙක යත්: "අපගේ වාක්සමාචාර පිරිසිදු වෙයි, තොමුවහ වෙයි, විවෘත වෙයි, සිදුරැති නොවෙයි, සංවෘත ද වෙයි. ඒ පරිශුද්ධ(පරමසල්ලේඛ) වාක්සමාචාරතායෙනුදු තමත් නො ම හුවම්හ. මෙරමා නොගරහම්හ" යි මහණෙනි, මෙසේසිත් තොප හික්මෙත්තේ මැනැව.

9. මහණෙනි, තොපට මෙබඳු සිතෙක් විය හෙත්තේය: "හිරිඔතප් දෙකින් සමන්‍වාගතයම්හ. අපගේ කායසමාචාර පිරිසිදු වෙයි, වාක්සමාචාර පිරිසිදු වෙයි. එමතුයෙන් පමණ, එමතුයෙන් මහණුවම්කරන ලදී. අප විසින් ශ්‍රාමණ්‍යාර්ථය ලබිණ. අපට මතුයෙහි කරණී කිසිදු නැති"යි එතෙකින් ම තුෂ්නට පැමිණෙත්තාව.

10. මහණෙනි, තොප බෙණෙමි, මහණෙනි, තොප දත්වමි: මතුයෙහි කරණී තිබියදී, ශ්‍රාමණ්‍යාර්ථීව සිටුනා තොපගේ ශ්‍රාමණ්‍යාර්ථය නහමක් පිරිහියේවා. මහණෙනි, මතුයෙහි කරණී නම් කිමෙක යත්: "අපගේ මනඃසමාචාර පිරිසිදු වෙයි, තොමුවහ වෙයි, විවෘත වෙයි, සිදුරැති නො වෙයි, සංවෘත ද වෙයි. ඒ පරිශුද්ධ (පරමසල්ලේඛ) මනඃසමාචාරතායෙනුදු තමත් නො ම හුවම්හ. මෙරමා නොගරහම්හ" යි මහණෙනි, මෙසේසිත් තොප හික්මෙත්තේ මැනැව.

11. මහණෙනි, තොපට මෙබඳු සිතෙක් විය හෙත්තේය: "හිරිඔතප් දෙකින් සමන්‍වාගතයම්හ. අපගේ කායසමාචාර පිරිසිදු වෙයි, වාක්සමාචාර පිරිසිදු වෙයි, මනඃ සමාචාර පිරිසිදු වෙයි. එමතුයෙන් පමණ වෙයි, එමතුයෙන් මහණුවම කරනලදී. අප විසින් ශ්‍රාමණ්‍යාර්ථය ලැබිණ. මතුයෙහි අපට කරණී කිසිදු නැති" යි එතෙකින් ම තුෂ්නට පැමිණෙත්තාව.

12. ආරොචයාමි වො භික්ඛවෙ, පටිවෙදයාමි වො භික්ඛවෙ: මා වො සාමඤ්ඤත්ථිකානං සතං සාමඤ්ඤත්ථො පරිහායි සති උත්තරිං කරණීයෙ. කිඤ්ච භික්ඛවෙ උත්තරිං කරණීයං? 'පරිසුද්ධො නො ආජීවො භවිස්සති උත්තානො විවටො න ච ඡිද්දවා සංවුතො ච. තාය ච පන පරිසුද්ධාජීවතාය නෙවත්තානුක්කංසිස්සාම, න පරං වම්භිස්සාමා'ති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

13. සියා ඛො පන භික්ඛවෙ තුම්හාකං එවමස්ස: හිරොත්තප්පෙනම්හා සමන්නාගතා, පරිසුද්ධො නො කායසමාචාරො, පරිසුද්ධො වචීසමාචාරො, පරිසුද්ධො මනොසමාචාරො, පරිසුද්ධො ආජීවො. අලමෙත්තාවතා, කතමෙත්තාවතා. අනුප්පත්තො නො සාමඤ්ඤත්ථො. නත්ථි නො කිඤ්චි උත්තරිං කරණීයන්ති තාවතකෙනෙව තුට්ඨිං ආපජ්ජෙය්‍යාථ.

14. ආරොචයාමි වො භික්ඛවෙ, පටිවෙදයාමි වො භික්ඛවෙ: මා වො සාමඤ්ඤත්ථිකානං සතං සාමඤ්ඤත්ථො පරිහායි සති උත්තරිං කරණීයෙ. කිඤ්ච භික්ඛවෙ උත්තරිං කරණීයං? 'ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරා භවිස්සාම: චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජිස්සාම, රක්ඛිස්සාම චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජිස්සාම. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජිස්සාම, රක්ඛිස්සාම මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජිස්සාමා'ති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

15. සියා ඛො පන භික්ඛවෙ තුම්හාකං එවමස්ස: හිරොත්තප්පෙනම්හා සමන්නාගතා, පරිසුද්ධො නො කායසමාචාරො, පරිසුද්ධො වචීසමාචාරො, පරිසුද්ධො මනොසමාචාරො, පරිසුද්ධො ආජීවො. ඉන්ද්‍රියෙසුම්හා ගුත්තද්වාරා. අලමෙත්තාවතා, කතමෙත්තාවතා. අනුප්පත්තො නො සාමඤ්ඤත්ථො. නත්ථි නො කිඤ්චි උත්තරිං කරණීයන්ති තාවතකෙනෙව තුට්ඨිං ආපජ්ජෙය්‍යාථ.

16. ආරොචයාමි වො භික්ඛවෙ, පටිවෙදයාමි වො භික්ඛවෙ: මා වො සාමඤ්ඤත්ථිකානං සතං සාමඤ්ඤත්ථො පරිහායි සති උත්තරිං කරණීයෙ. කිඤ්ච භික්ඛවෙ උත්තරිං කරණීයං? 'භොජනෙ මත්තඤ්ඤුනො භවිස්සාම. පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහරිස්සාම: 'නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය. 'ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි[1] නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි.[2] යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චා'ති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

---

1. පටිහඞ්ඛාම, මජසං. ස්‍යා.   2. න උප්පාදෙස්සාම, මජසං. ස්‍යා.

Free Distribution   www.aathaapi.org

12. මහණෙනි, තොප බෙණෙමි, මහණෙනි, තොප දත්වමි: මතුයෙහි කරණී තිබියදී, ශ්‍රාමණ්‍යාර්ථිව සිටුනා තොපගේ ශ්‍රාමණ්‍යාර්ථය නගමක් පිරිහී යේවා. මහණෙනි, මතුයෙහි කරණී නම් කිමෙක යත්: "අපගේ ආජීව පිරිසිදු වෙයි, නො මුවහ වෙයි, විවෘත වෙයි, සිදුරැති නො වෙයි, සංවෘත ද වෙයි. ඒ පරිශුද්ධාජීවතායෙනුදු තමත් නො ම හුවම්හ. මෙරමා නො ගරහම්හ" යි මහණෙනි, මෙසෙයින් තොප හික්මෙත්තේ මැනැව.

13. මහණෙනි, තොපට මෙබඳු සිතෙක් විය හෙත්තේය: "හිරිඔතප් දෙකින් සමන්‍වාගතයම්හ අපගේ කායසමාචාර පිරිසිදු වෙයි, වාක්සමාචාර පිරිසිදු වෙයි, මනඃසමාචාර පිරිසිදු වෙයි, ආජීව පිරිසිදු වෙයි. එමතුයෙන් පමණ වෙයි, එමතුයෙන් මහණුවම් කරන ලදී. අප විසින් ශ්‍රාමණ්‍යාර්ථය ලැබිණ. අපට මතුයෙහි කරණී කිසිදු නැති"යි එතෙකින් ම තුස්නට පැමිණෙත්නාව.

14 මහණෙනි, තොප බෙණෙමි, මහණෙනි, තොප දත්වමි: මතුයෙහි කරණී තිබියදී, ශ්‍රාමණ්‍යාර්ථිව සිටුනා තොපගේ ශ්‍රාමණ්‍යාර්ථය නගමක් පිරිහීයේවා. මහණෙනි, මතුයෙහි කරණී නම් කිමෙක යත්: 'ඉන්ද්‍රියෙහි ගුප්තද්වාර ඇතියමෝ වම්හ: ඇසින් රූඅරමුණු දැක නිමිති නොගන්නා සුල්ලමෝ අනුව්‍යඤ්ජන නො ගන්නා සුල්ලමෝ වම්හ. යමක් හෙතුකොට ගෙන චක්ෂුරින්ද්‍රිය අසංවෘත කොට වාස කරන තුලුත් අභිධ්‍යාදෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලමු අකුසල්දහම්හු ලුහුබැඳ ගැලැ ගනිත් ද, ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරණ පිණිස පිළිපදුම්හ, චක්ෂුරින්ද්‍රිය රකුම්හ, චක්ෂුරින්ද්‍රියෙහි සංවරයට පැමිණෙම්හ. කණින් සද අරමුණු අසා ... ඝ්‍රාණයෙන් ගන්‍ධාලම්බන ආඝ්‍රාණ කොට ... දිවින් රසඅරමුණු ආස්වාද කොට ... කයින් ස්පර්ශාලම්බන ස්පර්ශ කොට ... මනසින් ධර්මාලම්බන දැන නිමිති ගන්නාසුල්ලමෝ, අනුව්‍යඤ්ජන ගන්නාසුල්ලමෝ නොවම්හ. යමක් හෙතු කොට ගෙන මනින්ද්‍රිය අසංවෘත කොට වාස කරන තුලුත් අභිධ්‍යාදෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලමු අකුසල් දහම්හු ලුහුබැඳ ගැලැ ගනිත් ද, ඒ මනින්ද්‍රියයාගේ සංවරණ පිණිස පිළිපදුම්හ, මනින්ද්‍රිය රකුම්හ, මනින්ද්‍රියෙහි සංවරයට පැමිණෙම්හ'යි මහණෙනි, මෙසෙයින් තොප හික්මෙත්තේ මැනැව.

15. මහණෙනි, තොපට මෙබඳු සිතෙක් විය හෙත්තේය: "හිරිඔතප් දෙකින් සමන්‍වාගතයම්හ. අපගේ කායසමාචාර පිරිසිදු වෙයි. වාක්සමාචාර පිරිසිදු වෙයි, මනඃසමාචාර පිරිසිදු වෙයි, ආජීව පිරිසිදු වෙයි, ඉන්ද්‍රියෙහි ගුප්තද්වාරයම්හ. එමතුයෙන් පමණ වෙයි, එමතුයෙන් මහණුවම් කරනලදී. අප විසින් ශ්‍රාමණ්‍යාර්ථය ලැබිණ. අපට මතුයෙහි කරණී කිසිදු නැති"යි එතෙකින් මතු තුස්නට පැමිණෙත්නාව.

16. මහණෙනි, තොප බෙණෙමි, මහණෙනි, තොප දත්වමි: මතුයෙහි කරණී තිබියදී, ශ්‍රාමණ්‍යාර්ථිව සිටුනා තොපගේ ශ්‍රාමණ්‍යාර්ථය නගමක් පිරිහීයේවා. මහණෙනි, මතුයෙහි කරණී නම් කිමෙක යත්: 'භොජනයෙහි මාත්‍රඥ වම්හ. නුවණින් පස්විකා අහර වළඳම්හ. (කෙසේය යත්:) දවය පිණිස නො ම වෙයි, මදය පිණිස නො ම වෙයි, මණ්ඩනය පිණිස නො ම වෙයි, විභූෂණය පිණිස නො ම වෙයි. මේ කායයාගේ ස්ථිති පිණිස යැපීම පිණිස විහිංසා සන්හිඳුවනු පිණිස බ්‍රහ්මචර්‍යයට අනුග්‍රහ පිණිස වත් මූත් අන් අර්ථයක් පිණිස නො වෙයි. 'මෙසෙයින් (නොවැළඳීමෙන් වූ) පැරැණි වෙදනා නසමි. නව්‍ය වෙදනාත් නො උපදවමි. මාගේ ජීවිතයාත්‍රා ද වෙයි. අනවද්‍යතා හා පහසුවිහරණ වෙති' යි කියායි. මහණෙනි, මෙසෙයින් තොප හික්මෙත්තේ මැනැව.

17. සියා ඛො පන භික්ඛවෙ තුම්හාකං එවමස්ස: හිරොත්තප්පෙනම්හා[1] සමන්නාගතා, පරිසුද්ධො නො කායසමාචාරො, පරිසුද්ධො වචීසමාචාරො, පරිසුද්ධො මනොසමාචාරො, පරිසුද්ධො ආජීවො, ඉන්ද්‍රියෙසුම්හා ගුත්තද්වාරා, භොජනෙ මත්තඤ්ඤුනො. අලමෙත්තාවතා, කතමෙත්තාවතා. අනුප්පත්තො නො සාමඤ්ඤත්ථො. නත්ථි නො කිඤ්චි උත්තරිං කරණීයන්ති තාවතකෙනෙව තුට්ඨිං ආපජ්ජෙය්‍යාථ.

18. ආරොචයාමි වො භික්ඛවෙ, පටිවෙදයාමි වො භික්ඛවෙ: මා වො සාමඤ්ඤත්ථිකානං සතං සාමඤ්ඤත්ථො පරිහායි සති උත්තරිං කරණීයෙ. කිඤ්ච භික්ඛවෙ උත්තරිං කරණීයං? ජාගරියං අනුයුත්තා භවිස්සාම: දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙස්සාම, රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙස්සාම, රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙස්සාම පාදෙ පාදං අච්චාධාය සතා සම්පජානා[2] උට්ඨානසඤ්ඤං මනසිකරිත්වා, රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙස්සාමාති[3] එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

19. සියා ඛො පන භික්ඛවෙ, තුම්හාකං එවමස්ස: හිරොත්තප්පෙනම්හා සමන්නාගතා, පරිසුද්ධො නො කායසමාචාරො, පරිසුද්ධො වචීසමාචාරො පරිසුද්ධො මනොසමාචාරො, පරිසුද්ධො ආජීවො, ඉන්ද්‍රියෙසුම්හා ගුත්තද්වාරා, භොජනෙ මත්තඤ්ඤුනො, ජාගරියං අනුයුත්තා. අලමෙත්තාවතා, කතමෙත්තාවතා. අනුප්පත්තො නො සාමඤ්ඤත්ථො. නත්ථි නො කිඤ්චි උත්තරිං කරණීයන්ති තාවතකෙනෙව තුට්ඨිං ආපජ්ජෙය්‍යාථ.

20. ආරොචයාමි වො භික්ඛවෙ, පටිවෙදයාමි වො භික්ඛවෙ: මා වො සාමඤ්ඤත්ථිකානං සතං සාමඤ්ඤත්ථො පරිහායි සති උත්තරිං කරණීයෙ කිඤ්ච භික්ඛවෙ උත්තරිං කරණීයං? සතිසම්පජඤ්ඤෙන සමන්නාගතා භවිස්සාම: අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී, සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී, සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී, අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී, උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී, ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරීති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

21. සියා ඛො පන භික්ඛවෙ තුම්හාකං එවමස්ස: හිරොත්තප්පෙනම්හා සමන්නාගතා, පරිසුද්ධො නො කායසමාචාරො, පරිසුද්ධො වචීසමාචාරො, පරිසුද්ධො මනොසමාචාරො, පරිසුද්ධො ආජීවො, ඉන්ද්‍රියෙසුම්හා ගුත්තද්වාරා, භොජනෙ මත්තඤ්ඤුනො, ජාගරියං අනුයුත්තා, සතිසම්පජඤ්ඤෙන සමන්නාගතා. අලමෙත්තාවතා, කතමෙත්තාවතා. අනුප්පත්තො නො සාමඤ්ඤත්ථො. නත්ථි නො කිඤ්චි උත්තරිං කරණීයන්ති තාවතකෙනෙව තුට්ඨිං ආපජ්ජෙය්‍යාථ.

---

1 හිරොත්තප්පෙනම්හ, මජ්සං. සයා. PTS 2. සතො සම්පජානො, මජ්සං.
3. පරිසොධිස්සාමාති, කත්ථචි.

17. මහණෙනි, තොපට මෙබඳු සිතෙක් විය හෙන්නේය: "හිරිඔතප් දෙකින් සමන්වාගතයම්හ, අපගේ කායසමාචාර පිරිසිදු වෙයි, වාක්සමාචාර පිරිසිදු වෙයි, මනඃසමාචාර පිරිසිදු වෙයි, ආජීව පිරිසිදු වෙයි, ඉන්ද්‍රියෙහි ගුප්තද්වාරයම්හ, භොජනයෙහි මාත්‍රඥයම්හ. එමතුයෙන් පමණ වෙයි, එමතුයෙන් මහණුවම් කරනලද්දී අප විසින් ශ්‍රාමණ්‍යාර්ථය ලැබිණ අපට මතුයෙහි කරණී කිසිදු නැති"යි එතෙකින් මතු තුස්නට පැමිණෙන්නාව.

18. මහණෙනි, තොප බෙණෙමි, මහණෙනි, තොප දන්වමි: මතුයෙහි කරණී තිබියදී, ශ්‍රාමණ්‍යාර්ථිව සිටුනා තොපගේ ශ්‍රාමණ්‍යාර්ථය නහමක් පිරිහියේවා. මහණෙනි, මතුයෙහි කරණී නම් කිමෙක යත්: නිදිවැරීමෙහි යුක්තප්‍රයුක්තයමෝ වම්හ: දවස සක්මනින් හිඳුමින් නීවරණදහමින් සිත පරිශොධන කරම්හ, රැය පළමුයම සක්මනින් හිඳුමින් නීවරණදහමින් සිත පරිශොධන කරම්හ, රැය මැදුම්යම සමෘතිසමප්‍රජන්‍යයමෝ සම්ප්‍රඥන ඇතියමෝ උත්ථානසංඥ (අසෝ වේලෙහි නැඟී සිටුම්හයි) මෙනෙහි කොට දකුණුඇලයෙන් දකුණු පාමත වම්පය මඳක් හයා තබාගෙන සිංහශය්‍යා කරම්හ, රැය පැසුළුයම නැඟීසිට සක්මනින් හිඳුමින් නීවරණ දහමින් සිත පරිශොධන කරම්හ යි මහණෙනි, මෙසෙයින් තොප හික්මෙන්නේ මැනැව

19 මහණෙනි, තොපට මෙබඳු සිතෙක් විය හෙන්නේය: "හිරිඔතප් දෙකින් සමන්වාගතයම්හ, අපගේ කායසමාචාර පිරිසිදු වෙයි, වාක්සමාචාර පිරිසිදු වෙයි, මනඃසමාචාර පිරිසිදු වෙයි, ආජීව පිරිසිදු වෙයි, ඉන්ද්‍රියෙහි ගුප්තද්වාරයම්හ, භොජනයෙහි මාත්‍රඥයම්හ, නිදිවැරීමෙහි යුක්තප්‍රයුක්තයම්හ. එමතුයෙන් පමණ වෙයි, එමතුයෙන් මහණුවම් කරන ලදී. අප විසින් ශ්‍රාමණ්‍යාර්ථය ලැබිණ අපට මතුයෙහි කරණී කිසිදු නැති"යි එතෙකින් තුස්නට පැමිණෙන්නාව.

20. මහණෙනි, තොප බෙණෙමි, මහණෙනි, තොප දන්වමි; මතුයෙහි කරණී තිබියදී ශ්‍රාමණ්‍යාර්ථිව සිටුනා තොපගේ ශ්‍රාමණ්‍යාර්ථය නහමක් පිරිහියේවා. මහණෙනි, මතුයෙහි කරණී නම් කිමෙක යත්: සමෘතිසම්ප්‍රජන්‍යයෙන් සමන්වාගත වම්හ: ඉදිරි බලා යෑමෙහි දු වටාලා ඊමෙහි දු සම්පජානකාරී වම්හ. ආලොකනවිලොකන දෙක්හි සම්පජානකාරී වම්හ, සම්ඤ්ජනප්‍රසාරණ දෙක්හි සම්පජානකාරී වම්හ, සඟළ පාසිවුරු ධැරීමෙහි සම්පජානකාරී වම්හ, අසන - පාන - ඛාදන - ආස්වාදනයෙහි (චතුර්විධ අහර වළඳන වේලෙහි) සම්පජානකාරී වම්හ, මළමූ කිසෙහි සම්පජානකාරී වම්හ, ගමන - ස්ථාන - නිෂද්‍ය - සවප්න - ජාගරණ - භාෂණ තූෂ්ණීම්භාව යන ක්‍රියායෙහි සම්පජානකාරී වම්හ යි මහණෙනි, මෙසෙයින් තොප හික්මෙන්නේ මැනැව.

21. මහණෙනි, තොපට මෙබඳු සිතෙක් විය හෙන්නේය: "හිරිඔතප්-දෙකින් සමන්වාගතයම්හ, අපගේ කායසමාචාර පිරිසිදු වෙයි, වාක්සමාචාර පිරිසිදු වෙයි, මනඃසමාචාර පිරිසිදු වෙයි, ආජීව පිරිසිදු වෙයි, ඉන්ද්‍රියෙහි ගුප්තද්වාරයම්හ, භොජනයෙහි මාත්‍රඥයම්හ, නිදි වැරීමෙහි ප්‍රයුක්තයම්හ, සමෘතිසම්ප්‍රජන්‍යයෙන් සමන්වාගතයම්හ. එමතුයෙන් පමණ වෙයි, එමතුයෙන් මහණුවම් කරන ලදී. අප විසින් ශ්‍රාමණ්‍යාර්ථය ලැබිණ. අපට මතුයෙහි කරණී කිසිදු නැති"යි එතෙකින් ම තුස්නට පැමිණෙන්නාව.

22. ආරොචයාමි වො භික්ඛවෙ, පටිවෙදයාමි වො භික්ඛවෙ: මා වො සාමඤ්ඤත්ථිකානං සතං සාමඤ්ඤත්ථො පරිහායි සති උත්තරිං කරණීයෙ. කිඤ්ච භික්ඛවෙ උත්තරිං කරණීයං? ඉධ භික්ඛවෙ භික්ඛු විවිත්තං සෙනාසනං භජති: අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා, උජුං කායං පණිධාය, පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතහිතානුකම්පී. බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථිනමිද්ධං පහාය විගතථිනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො. ථිනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු. විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

23. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො ඉණං ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය, තස්ස තෙ කම්මන්තා සමිජ්ඣෙය්‍යුං, සො යානි ච පොරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීකරෙය්‍ය, සියා චස්ස උත්තරිං අවසිට්ඨං දාරාභරණාය, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ ඉණං ආදාය කම්මන්තෙ පයොජෙසිං. තස්ස මෙ කම්මන්තා සමිජ්ඣිංසු. සො අහං යානි ච පොරාණානි ඉණමූලානි, තානි ච බ්‍යන්තීඅකාසිං. අත්ථි ච මෙ උත්තරිං අවසිට්ඨං දාරාභාරණායා"ති.[1] සො තතොනිදානං ලභෙථ පාමුජ්ජං,[2] අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

24. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො ආබාධිකො අස්ස දුක්ඛිතො බාළ්හගිලානො, භත්තඤ්චස්ස නච්ඡාදෙය්‍ය,[3] න චස්ස කායෙ බලමත්තා, සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය, භත්තඤ්චස්ස ඡාදෙය්‍ය, සියා චස්ස කායෙ බලමත්තා, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ ආබාධිකො අහොසිං දුක්ඛිතො බාළ්හගිලානො. භත්තඤ්ච මෙ නච්ඡාදෙසි. න ච මෙ ආසි කායෙ බලමත්තා. සොම්හි එතරහි තම්හා ආබාධා මුත්තො. භත්තඤ්ච මෙ ඡාදෙති. අත්ථි ච මෙ කායෙ බලමත්තාති." සො තතොනිදානං ලභෙථ පාමුජ්ජං, අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං-

25. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො බන්ධනාගාරෙ බද්ධො[5] අස්ස, සො අපරෙන සමයෙන තම්හා බන්ධනා මුච්චෙය්‍ය සොත්ථිනා අබ්‍යයෙන,[6] න චස්ස කොචි භොගානං වයො, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ බන්ධනාගාරෙ බද්ධො අහොසිං. සොම්හි එතරහි තම්හා බන්ධනා මුත්තො සොත්ථිනා අබ්‍යයෙන. නත්ථි ච මෙ කොචි[7] භොගානං වයො"ති. සො තතොනිදානං ලභෙථ පාමුජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

1. දූරභරණායාති, මජසං. 2. පාමොජ්ජං, මජසං. 3. න ඡාදෙය්‍ය, සයා.
4. අධිගච්ඡෙ, සී කත්ථචි. PTS. 5. බන්ධො, මජසං. සයා.
6. අබ්භයෙන, මජසං. අභයෙන, සයා. 7. කිඤ්චි, මජසං. සයා. PTS.

22. මහණෙනි, තොප බෙණෙමි, මහණෙනි, තොප දත්වමි: මතුයෙහි කරණී තිබියදී ශ්‍රාමණ්‍යාර්ථව සිටුනා තොපගේ ශ්‍රාමණ්‍යාර්ථය නහමක් පිරිහීයේවා. මහණෙනි, මතුයෙහි කරණී නම් කිමෙක යත්: මහණෙනි, මෙසස්නෙහි, මහණ තීහඩ සෙනසුන් සෙවුනේය. එනම් - අරන, රුක්මුල, පව්, කඳුරු, ගිරිගුහා, සොහොන, වනපෙත, අභ්‍යවකාශ, පිදුරුකිළි යන මෙය. හේ පසුබත පිඬුවායෙන් වැළැකියේ, උඩුකය ඍජු කොට තබා ගෙන, කම්සථානාභිමුඛ කොට සිහි එළවාගෙන, පලක් බැඳගෙන හිඳුනේය. හේ (පඤ්චෝපාදානස්කන්ධ) ලොකයෙහි අභිධ්‍යාසඞ්ඛ්‍යාත කාමච්ඡන්දය (විෂ්කම්භණ විසින්) පහා, විගතාභිධ්‍ය වූ සිතින් වාස කෙරෙයි. අභිධ්‍යායෙන් සිත මුදා ගනී. ව්‍යාපාදසඞ්ඛ්‍යාත ප්‍රද්වේෂය (ක්‍රොධය) පහා අව්‍යාපන්නචිත්ත ව සර්‍වසත්ත්වහිතානුකම්පී ව වාස කෙරේ. ක්‍රොධයෙන් සිත මුදාගනී. ස්ත්‍යානමිද්ධය පහා අපගතස්ත්‍යානමිද්ධ ඇති ව ආලොකසංඥා ඇති ව සමෘතිමත් ව නුවණැති ව වාස කෙරේ. ස්ත්‍යානමිද්ධයෙන් සිත මුදාගනී. උද්ධච්චය හා කුක්කුච්චය පහා සියසතන්හි සත්හුන්සිත් ඇති ව නිවිගියා ව වාස කෙරේ. නොතිව්බැවිනුදු කුකුසිනුදු සිත මුදාගනී. විසිකිස් පහා තුණුවිසිකිස් ඇතිව කුසල්දහම්හි කථංකථංකාරරහිත ව වාස කෙරේ. විචිකිත්සායෙන් සිත මුදාගනී.

23. මහණෙනි, යම්පරිදි පුරුෂ ණයක් ගෙන කර්මාන්ත නිමිති කොට යොදන්නේ වේනම්, උහුගේ ඒ කමන්හු සමෘද්ධ වෙත් නම්, යම් පැරැණි ඍණමුල ඇත් ද, එද ඉවර කරන්නේ වේ නම්, ඔහුට මතුයෙහි අඹුවන් පුස්නට ඉතිරි දූයෙකුදු වේ නම්, ඔහුට මෙසේ සිත් පහළවෙයි: "මම පෙර ණය ගෙන කමන්හි යෙදිමි. මාගේ කර්මාන්තයෝ සමෘද්ධ වූහ. ඒ මම යම් පැරැණි ඍණමුල වී ද, එහැම ඉවර කෙළෙමි. මට මතුයෙහි අඹුවන් පුස්නට අවශිෂ්ට දූයත් ඇතැ" යි කියායි. හේ ණය නැතිසේ නිදන කොට ගෙන ප්‍රමොදය ලබන්නේය. සොම්නස් විඳුනේය. -

24. මහණෙනි, යම්පරිදි පුරුෂ ආබාධ ඇතියේ, දුක ඇතියේ, අධිමාත්‍ර ගිලන්ගති ඇතියෙක් වේ නම්, ඔහුට බත ද නුරුස්නේ නම්, ඔහුට කායබලත් නැත් නම්, පසුකලෙක ඒ ආබාධයෙන් මිදේ නම්, ඔහුට බතුදු රුස්නේ නම්, ඔහුට කායබලත් ඇත් නම්, ඔහුට මෙබදු සිත් වෙයි: "මම පෙර හටගත් අබාධ ඇතියෙම්, දුක් ඇති දැඩිගිලන් වූයෙකිම් විමි. මට බතුදු නොරිසිවී. මට කාය බලත් නොවී. ඒ මම දැන් ඒ ආබාධයෙන් මිදී සිටිමි. මට බතුදු රිසි වෙයි. මාගේ කායබලත් ඇති"යි කියායි. හේ ඒ හෙතුවින් ප්‍රමොද ලබන්නේය. සොම්නස් ලබන්නේය.-

25. මහණෙනි, යම්පරිදි පුරුෂ දඟගෙහි බැඳුණේ වේ නම්, හේ පසුකලෙක භොගව්‍යයෙන් වෙත් ව සුවසේ ඒ දඟගෙයින් මිදී යන්නේ නම්, ඔහුගේ කිසිදු භොගව්‍යයෙක් නො වේ නම්, ඔහුට මෙබඳු සිත් වෙයි: "මම පෙර බන්ධනාගාරයෙහි බැඳුණෙම් වීමි. ඒ මම දැන් භොගව්‍යයෙන් වෙත්ව සුවසේ ඒ බන්ධනයෙන් මිදුණිම් වීමි. මට කිසිදු භොගව්‍යයෙක් නොවී"ය කියායි. හේ බන්ධමොක්ෂ හෙතුවින් ප්‍රමොද ලබන්නේය. සොම්නස් ලබන්නේය. -

Free Distribution www.aathaapi.org

16. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො දාසො අස්ස අනත්තාධීනො පරාධීනො න යෙනකාමඞ්ගමො, සො අපරෙන සමයෙන තම්හා දාසව්‍යා මුච්චෙය්‍ය අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙනකාමඞ්ගමො. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ දාසො අහොසිං අනත්තාධීනො පරාධීනො න යෙනකාමඞ්ගමො, සොම්හි එතරහි තම්හා දාසව්‍යා මුත්තො අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙනකාමඞ්ගමොති. සො තතොනිදානං ලභෙථ පාමුජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

17. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො සධනො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය, සො අපරෙන සමයෙන තම්හා කන්තාරා නිත්ථරෙය්‍ය සොත්ථිනා අබ්‍යයෙන,[1] න චස්ස කිඤ්චි භොගානං වයො. තස්ස එවමස්ස අහං ඛො පුබ්බෙ සධනො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජිං සොම්හි එතරහි තම්හා කන්තාරා නිත්ථිණ්ණො සොත්ථිනා අබ්‍යයෙන,[1] නත්ථි ච මෙ කිඤ්චි භොගානං වයොති. සො තතොනිදානං ලභෙථ පාමුජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

18. එවමෙව ඛො[2] භික්ඛවෙ භික්ඛු යථා ඉණං, යථා රොගං, යථා බන්ධනාගාරං, යථා දාසව්‍යං, යථා කන්තාරද්ධානමග්ගං, ඉමෙ පඤ්චනීවරණෙ අප්පහීනෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි භික්ඛවෙ, යථා ආනණ්‍යං[3] යථා ආරොග්‍යං, යථා බන්ධනා මොක්ඛං, යථා භුජිස්සං, යථා ඛෙමන්තභූමි , එවමෙව[4] භික්ඛු ඉමෙ පඤ්චනීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සති

19. සො ඉමෙ පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං[5] හොති. සෙය්‍යථාපි භික්ඛවෙ දක්ඛො නහාපකො[6] වා නහාපකන්තෙවාසී වා කංසථාලෙ නහානීයචුණ්ණානි[7] ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං සන්නෙය්‍ය[8], සාස්ස[9] නහානීයපිණ්ඩි සෙනහානුගතා සෙනහපරෙතා සන්තරබාහිරා ඵුටා[10] සෙනහෙන න ච පග්ඝරණී. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති.

1. අබ්භයෙන, මජ්ඣං. අභයෙන, ස්‍යා 2 එවං ඛො, ස්‍යා
3. යථා අනණං, ස්‍යා 4 එමමෙව ඛො, ස්‍යා 5 අප්ඵුතං, සීමු.
6. නහාපකො, මජ්ඣං ස්‍යා 7 නහානියචුණ්ණානි, මජ්ඣං
8. සන්දෙය්‍ය, මජ්ඣං 9 සායං, මජ්ඣං 10. ඵුට්ඨා, ස්‍යා

16. මහණෙනි, යම්පරිදි පුරුෂ ආත්මාධීන නොවූ, (එයින්ම) පරාධීන වූ, කැමැති දිගු නොයාහෙන, දාසයෙක් වේනම්, හේ පසු කලෙක ආත්මාධිපති වූ, (එයින්ම) පරායත්ත නොවූ, කැමැතිසේ ඒ ඒ දිග යාහෙන, නිර්දාසයෙක්ව, ඒ දාසභාවයෙන් මිදියත්තේ වේ නම්, ඔහුට මෙබඳු සිතෙක් වෙයි: "මම පෙර ආත්මාධීන නො වූ, පරාධීන වූ, කැමැතිසේ ඒ ඒ දිග නොයාහෙන, දස් වීමි. ඒ මම දැන් ආත්මාධිපති වූ, පරාධීන නො වූ, කැමැතිසේ ඒ ඒ දිග යාහෙන, නිර්දාසයෙක් ව ඒ දාසභාවයෙන් මිදුණෙම් වීමි"යි කියායි. හේ ඒ නිර්දාසභාවහෙතුවෙන් ප්‍රමොද ලබන්නේය. සොම්නස් ලබන්නේය.

17. මහණෙනි, යම්පරිදි පුරුෂ සධන ව සභොග ව කතරදිග්මගට වදනේ වේ නම්, හේ පසු කලෙක භොගව්‍යය නො කොට ම සුවසේ ඒ කතරින් නිස්තිණී වන්නේ නම්, ඔහුගේ කිසිදු භොගව්‍යයෙක් නො වේ නම්, ඔහුට මෙබඳු සිතෙක් වන්නේය: "මම පෙර සධන ව සභොග ව කතරදිග්මගට වැදිණීමි. ඒ මම දැන් භොගව්‍යය නො කොට ම සුවසේ නිස්තිණීයෙමි. මාගේ කිසිදු භොගහානියෙක් නැති" යි කියාය. හේ ඒ ක්‍ෂෙමභූමියට පැමිණීම හෙතුවෙන් ප්‍රමොද ලබන්නේය. සොම්නස් ලබන්නේය.

18. මහණෙනි, එපරිදි ම මහණ සියසතන්හි අප්‍රහීණ ව සිටුනා මේ පඤ්චනීවරණයන් ණයක් දක්නා සෙයින්, රොගයක් දක්නා සෙයින්, බන්ධනාගාරයක් දක්නා සෙයින්, දාසභාවයක් දක්නා සෙයින්, කතරමගක් දක්නා සෙයින් මොනොවට දක්නේය. මහණෙනි, යම්සේ අනෘණභාවය දක්නේ වේද, යම්සේ ආරොග්‍යය දක්නේ වේ ද, යම්සේ බන්ධනමොක්‍ෂය දක්නේ වේ ද, යම්සේ නිර්දාසභාවය දක්නේ වේ ද, යම්පරිදි ක්‍ෂෙමාන්තභූමිය දක්නේ වේ ද, එපරිදි ම මහණ සියසතන්හි ප්‍රහීණ ව ගිය මේ පඤ්චනීවරණයන් දක්නේය.

19. ඒ මහණ චිත්තොපක්ලෙශ වූ, ප්‍රඥාදෞර්බල්‍යයට කාරණ වූ, මේ පඤ්චනීවරණයන් හැරපියා කාමයෙන් වෙන් ව අකුසල්දහමින් වෙන් ව සවිතර්කී, සවිචාර, විවෙකජ, ප්‍රීතිසුඛ ඇති, ප්‍රථමධ්‍යාන උපයාගෙන වාස කෙරේ. හේ මේ කරජ කය ම විවෙකයෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි (හැමතැන පැවැති ප්‍රීතිසුඛ ඇතියා කෙරෙයි), හාත්පසින් තෙමයි, හාත්පසින් පුරවයි, හාත්පසින් සපයී කෙරෙයි. තෙල මහණහුගේ හැම අඟින් යුත් කරජකය පිළිබඳව විවෙකජප්‍රීතිසුඛයා විසින් නොපහළ කිසිදු තැනෙක් නොවෙයි. මහණෙනි, යම්සේ ප්‍රතිබලසම්පන්න නහවනු වෙක් වේවයි, නහවනු - අතැවැසියෙක් වේවයි, කස්තලියෙක නහනුසුණු බහා දියෙන් පුනපුනා ඉසා, පිඩු කරන්නේ වේද, ඒ නහනුපිඩු උදකස්නෙහයෙන් අනුගත ව දියසනායෙන් ඔබනා ලදු ව සහතුරුබැහැර දියෙන් පහරනලදු ව නොවගුළු ව සිටුනේ වේ ද, මහණෙනි, එපරිදිම මහණ මේ කරජකය ම විවෙකයෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි, හාත්පසින් තෙමයි, හාත්පසින් පුරවයි, හාත්පසින් සපයී කෙරෙයි. තෙල මහණහුගේ හැම අඟින් යුත් කරජකය පිළිබඳ ව විවෙකජ ප්‍රීතිසුඛය විසින් නොපහළ කිසිදු තැනෙක් නොවෙයි.

20. පුනචපරං භික්ඛවෙ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති[1] පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං[2] හොති. සෙය්‍යථාපි භික්ඛවෙ උදකරහදො[3] උබ්භිදොදකො, තස්ස නෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්සායමුඛං,[4] න පච්ඡිමාය දිසාය උදකස්සායමුඛං, න උත්තරාය දිසාය උදකස්සායමුඛං. න දක්ඛිණාය දිසාය උදකස්සායමුඛං. දෙවො ච කාලෙන කාලං සම්මා ධාරං නානුප්පවෙච්ඡෙය්‍ය. අථ ඛො තම්හාව[5] උදකරහදා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා තමෙව උදකරහදං සීතෙන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය, නාස්ස කිඤ්චි සබ්බාවතො උදකරහදස්ස සීතෙන වාරිනා අප්ඵුටං අස්ස. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති.

21. පුනචපරං භික්ඛවෙ භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යන්තං අරියා ආචික්ඛන්ති: 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං හොති. සෙය්‍යථාපි භික්ඛවෙ උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි[6] උදකානුග්ගතානි අන්තොනිමුග්ගපොසීනි, තානි යාව චග්ගා[7] යාව ච මූලා සීතෙන වාරිනා අභිසන්නානි පරිසන්නානි පරිපූරානි පරිප්ඵුටානි. න නෙසං[8] කිඤ්චි සබ්බාවතං උප්පලානං වා පදුමානං වා පුණ්ඩරීකානං වා සීතෙන වාරිනා අප්ඵුටං අස්ස. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං හොති.

22. පුනචපරං භික්ඛවෙ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං හොති.

---

1. අභිසන්නෙති පරිසන්නෙති, ස්‍යා. 2. අප්ඵුතං, සීමු.
3. උදකරහදො ගම්භීරො, ස්‍යා. 4. උදකස්ස ආයමුඛං, මජ්සං. ස්‍යා.
5. තම්හා ච, ස්‍යා. 6. සංවද්ධානි, ස්‍යා. 7. යාව ච අග්ගා, ස්‍යා.
8. නාස්ස, ස්‍යා.

20. තවද මහණෙනි, මහණ විතර්කවිචාරයන් සන්සිඳීමෙන් සිය සන්තතිහි පැහැදීම් කරන, සිත පිළිබඳ උතුම් ව උදාවන එකභාවය ඇති, විතර්කරහිත විචාරරහිත, සමාධිජ ප්‍රීතිසුඛ ඇති, ද්විතීයධ්‍යානය උපයාගෙන වාස කෙරේ. හේ මේ කරජකය ම සමාධියෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි, හාත්පසින් තෙමයි, හාත්පසින් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි. තෙල මහණහුගේ සියලු කයෙහි සමාධිජප්‍රීතිසුඛයෙන් නොපහළ කිසිදු තැනෙක් නොවෙයි. මහණෙනි, යම්පරිදි උල්නැගි දිය විලෙක් වේ ද, එයට පෙරදිග්හි දිය වැහෙන මං නැත් ද, පැසිම් දිග්හිදු දිය වැහෙන මං නැත් ද, උතුරුදිග්හිදු දිය වැහෙන මං නැත් ද, දකුණු දිග්හිදු දිය වැහෙන මං නැත් ද, මෙඝ ද කලින්කල සම්‍යග්ධාරා වර්ෂා නොකෙරේ ද, වැලිද එම දියවිලින් සිහිල් දියදහර පැනනැගී එම දියවිල් සිහිල් දියෙන් තෙමා ද, හාත්පස තෙමා ද, හාත්පස පුරා ද, හාත්පසින් ස්පර්ශ කෙරේ ද, තෙල සියලු දියවිලැ සිහිල් දිය දහරින් නොපහළ කිසිදු දූයෙක් නො වේ ද, මහණෙනි, එපරිදි ම මහණ මෙ ම කරජකය සමාධිජප්‍රීතිසුඛයෙන් මොනවට තෙමයි, හාත්පසින් තෙමයි, හාත්පසින් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි. තෙල මහණහුගේ සියලු කයෙහි සමාධිජප්‍රීතිසුඛයෙන් නොපහළ කිසිදු තැනෙක් නැත.

21. තවද මහණෙනි, මහණ ප්‍රීතියගේ විරාගයෙන් උපෙක්‍ෂක ව ද වෙසේ. සිහිඇත්තෙ ද නුවණ ඇත්තෙ ද කයින් සුඛය ද විඳුතේය. යම් ධ්‍යානයක් ගෙන 'තෘතීය ධ්‍යාන ඇති පුඟුලා උපෙක්‍ෂකය, සමෘතිමත්ය, සුඛවිහරණවත් යැ' යි ආර්‍ය්‍යයෝ බණෙත් ද, ඒ තෘතීයධ්‍යානය උපයාගෙන වාස කෙරේ. හේ මේ කය ම නිෂ්ප්‍රීතිකසුඛයෙන් මොනවට තෙමයි, හාත්පසින් තෙමයි, හාත්පසින් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි. තෙල මහණහුගේ සියලු කය නිෂ්ප්‍රීතිකසුඛයෙන් නොපහල තැනෙක් නැත. මහණෙනි, යම්සේ උපුල්විලෙක වේවයි, හෙලපියුම් විලෙක වේවයි, රත් පියුම් විලෙක වේවයි, ඇතැම් උපුල් හෝ, හෙල පියුම් හෝ, රත්පියුම් හෝ, දියෙහි සඤ්ජාත ව දියෙහි සංවර්ධිත ව, දියෙන් නොනැග සිට, දියතුල ගැලැසිට වැඩේ ද, ඒ උපුල් හා පියුම් අග දක්වාත් මුල දක්වාත් සිහිල් දියෙන් මොනවට තෙත් ව හාත්පස තෙත් ව පරිපූරිත ව හාත්-පසින් දියපහස ලද්‍ද ව ඇත් ද, එ හැම උත්පලයන්ගේ වේවයි, හැම පද්ම-යන්ගේ වේවයි, හැම පුණ්ඩරීකයන්ගේ වේවයි, කිසිදු තැනෙක් සිහිල් පහස නොලද්දේ නො වේද, මහණෙනි, එපරිදි ම මහණ මෙ ම කය නිෂ්ප්‍රීතිකසුඛයෙන් මොනවට තෙමයි, හාත්පසින් තෙමයි, හාත්පසින් පුරවයි. හාත්පසින් ස්පර්ශ කෙරෙයි. තෙල මහණහුගේ හැම කය කිසිදු තැනෙක් නිෂ්ප්‍රීතිකසුඛයෙන් නො පහළේ නො වෙයි.

22. තවද මහණෙනි, මහණ සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් සෞමනස් දෞර්මනස් කැලැ ම අස්තඞ්ගම වීමෙන් අදුඃඛ වූ අසුඛ වූ උපෙක්‍ෂායෙන් ජනිත සමෘතිපරිශුද්ධභාව ඇති චතුර්ථධ්‍යානය උපයා ගෙන වාස කෙරේ. හේ මෙ ම කය පර්‍ය්‍යවදාත පරිශුද්ධ සිතින් ඵරණය කොට හුන්නේ වෙයි. තෙල මහණහුගේ හැම කය කිසිදු තැනෙක් පර්‍ය්‍යවදාත පරිශුද්ධ සිතින් නො පහළේ නො වෙයි. -

සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං[1] පාරුපිත්වා[2] නිසින්නො අස්ස, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස ඔදාතෙන වත්ථෙන අප්ඵුටං අස්ස, එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං හොති.

23. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසතිම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි, අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ 'අමුත්‍රාසිං එවන්නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං. තත්‍රාපාසිං එවන්නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො සකම්හා ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය,[3] තම්හාපි ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය, සො තම්හා[4] ගාමා සකංයෙව ගාමං පච්චාගච්ඡෙය්‍ය, තස්ස එවමස්ස: 'අහං ඛො සකම්හා ගාමා අමුං ගාමං අගඤ්ඡිං[5] තත්‍ර එවං අට්ඨාසිං, එවං නිසීදිං, එවං අභාසිං, එවං තුණ්හී අහොසිං. තම්හාපි ගාමා අමුං ගාමං අගඤ්ඡිං. තත්‍රාපි එවං අට්ඨාසිං, එවං නිසීදිං, එවං අභාසිං, එවං තුණ්හී අහොසිං. සොම්හි තම්හා ගාමා සකංයෙව ගාමං පච්චාගතො'ති. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

24. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති: චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ. යථාකම්මූපගෙ සත්තෙ පජානාති: -

1. සීසං, සයා. 2. පාරුපෙත්වා, මජසං. 3. ආගච්ඡෙය්‍ය, සීමු.
4. තම්හාපි, සයා. 5. ආගඤ්ඡිං සීමු. ආගච්ඡිං, මජසං.

Free Distribution www.aathaapi.org

මහණෙනි, යම්සේ පුරුෂයෙක් සුදුවස්ත්‍රයෙකින් හිසවසා පෙරෙව හුන්නේ වේ ද, ඔහුගේ හැමකය කිසිදු තැනෙක් හෙළුවතින් නොපහළේ නො වේ ද, මහණෙනි, එපරිදිම මහණ මෙම කය පර්‍යවදාත පරිශුද්ධ චිත්තයෙන් ඵරණය කොට හුන්නේ වෙයි. තෙල මහණහුගේ හැමකය කිසිදු තැනෙක් පර්‍යවදාත පරිශුද්ධ චිත්තයා විසින් නො පහළේ නො වෙයි.

23. ඒ මහණ මෙසෙයින් සමාධිගත සිත පරිශුද්ධ ව, (ප්‍රභාස්වර විසින්) පර්‍යවදාත ව, අනඞ්ගණ ව, විගතොපක්ලේශ ව, මෘදුභූත ව, කර්මණ්‍ය ව, ස්ථිත ම, නිශ්චලප්‍රාප්ත ව පිහිටත් ම, පූර්වේනිවාසානුස්මෘතිඥානය පිණිස සිත නතු කෙරෙයි. හේ අනේකවිධ පූර්වේනිවාසය සිහි කෙරෙයි. ඒ කෙසේය යත්: ජාති එකකුදු, ජාති දෙකකුදු, ජාති තුනකුදු, ජාති සතරකුදු, ජාති පසකුදු, ජාති දසයකුදු, ජාති විස්සකුදු, ජාති තිසකුදු, ජාතිසතළිසකුදු ජාති පනසකුදු, ජාති සියකුදු, ජාති දහසකුද, ජාති සියක්දහසකුදු, නොඑක් සංවර්තකල්පයකුදු, නො එක් විවර්තකල්පයකුදු, නොඑක් සංවර්තවිවර්තකල්පයකුදු- "අසෝ තැනැ මෙබඳුනම් ඇතියෙම් වීමි, මෙබඳු ගොත් ඇතියෙම් වීමි, මෙබඳු වර්ණ ඇතියෙම් වීමි, මෙබඳු අහර ඇතියෙම් වීමි, මෙසේ සුවදුක් විඳියෙම් වීමි, මෙසේ ආයු කෙළවර කෙළෙම් වීමි. මම එයින් සැව අසෝ තැන උපනිමි. එහිදු මෙබඳු නම් ඇතියෙම් වීමි, මෙබඳු ගොත් ඇතියෙම් වීමි, මෙබඳු වර්ණ ඇතියෙම් වීමි, මෙබඳු අහර ඇතියෙම් වීමි, මෙසේ සුවදුක් විඳියෙම් වීමි, මෙසේ ආයු කෙළවර කෙළෙම් වීමි. මම එයින් සැව මෙහි උපනිමි" කියායි. මෙසේ සාකාර, සොද්දෙස, අනේකප්‍රකාර, පූර්වේනිවාසය සිහි කෙරෙයි. මහණෙනි, යම්පරිදි පුරුෂ සියගමින් අන්ගමකට යන්නේ වේ ද, එගමිනුදු අන්ගමකට යන්නේ වේ ද, හේ එගමින් සියගමට ම වටාලා එන්නේ වේ ද, ඔහුට මෙබඳු සිත් වන්නේය: "මම වනාහි සියගමින් අසෝ ගමට ගියෙමි. එහි දී මෙලෙස සිටියෙමි, මෙලෙස හිඳගතිමි, මෙලෙස බිණීමි, මෙලෙස නිහඬ වීමි. මම එගමිනිදු අසෝගමට ගියෙමි. එහිදීත් මෙලෙස සිටියෙමි, මෙලෙස හිඳ-ගතිමි, මෙලෙස නිහඬවීමි. මම එගමින් සියගමටම වටාලා ආයෙමි" යි. මහණෙනි, එපරිදි මහණ අනේකප්‍රකාර පූර්වේනිවාසය සිහි කෙරෙයි: ඒ කෙසේය යත්: ජාති එකකුදු, ජාතිදෙකකුදු ... මෙසේ සාකාර, සොද්දෙස, අනේකප්‍රකාර පූර්වේනිවාසය සිහි කෙරෙයි.

24. ඒ මහණ මෙසේ සමාධිගත සිත පරිශුද්ධ ව, පර්‍යවදාත ව, අනඞ්ගණ ව, විගතොපක්ලේශ ව, මෘදුභූත ව, කර්මණ්‍ය ම, ස්ථිත ව, නිශ්චලප්‍රාප්ත ව පිහිටත් ම, සත්ත්වයන්ගේ ච්‍යුති - උපපාතඥානය පිණිස සිත නතු කෙරෙයි හේ පිරිසිදු, මිනිසැස ඉක්ම සිටුනා දිවැසින් මියන උපදනා හීන, ප්‍රණීත, සුවර්ණ, දුර්වර්ණ, සතුන් දක්නේය. සුගත, දුර්ගත, සතුන් දක්නේය. යථාකර්මොපග සත්ත්වයන් දන්නේය. -

"ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදනා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදනා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා"ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. සෙය්‍යථාපස්සු භික්ඛවෙ ද්වෙ අගාරා සද්වාරා, තත්‍ර චක්ඛුමා පුරිසො මජ්ඣෙ ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තෙපි නික්ඛමන්තෙපි අනුචඞ්කමන්තෙපි අනුවිචරන්තෙපි, එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ. යථාකම්මූපගෙ සත්තෙ පජානාති -පෙ-.

25. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙති: සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති. ඉමෙ ආසවාති යථාභූතං පජානාති, අයං ආසවසමුදයොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති, භවාසවාපි චිත්තං විමුච්චති, අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාති. සෙය්‍යථාපි භික්ඛවෙ පබ්බතසඞ්ඛෙපෙ උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො, තත්‍ථ චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි සක්ඛරකඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි, තස්ස එවමස්ස: අයං ඛො උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො. තත්‍රිමෙ සිප්පිසම්බුකාපි සක්ඛරකඨලාපි මච්ඡගුම්බාපි චරන්තිපි තිට්ඨන්තිපී'ති.[1] එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති. ඉමෙ ආසවාති යථාභූතං පජානාති, අයං ආසවසමුදයොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති.

1. තිට්ඨන්තම්පි - සයා.

‘‘මේ භවත් සත්ත්වයෝ එකාන්තින් කායදුශ්චරිතයෙන් සමන්වාගතයහ, වාග්දුශ්චරිතයෙන් සමන්වාගතයහ, මනොදුශ්චරිතයෙන් සමන්වාගතයහ. (බුද්ධාදි) ආර්‍ය්‍යයනට උපවාද කරනුවහ, මිථ්‍යාදෘෂ්ටිකයහ, මිථ්‍යාදෘෂ්ටික-කර්‍මසමාදන ඇතියහ. ඔහු කාබුත් මරණින් මතු සැපෙන් පහ ව සිටි, දුර්ගතික වූ, විනිපාත වූ, නිරයට පැමිණියහ. මේ භවත් සත්ත්වයෝ කායසුචරිතයෙන් සමන්වාගතයහ, වාක්සුචරිතයෙන් සමන්වාගතයහ, මනඃසුචරිතයෙන් සමන්වාගතයහ, ආර්‍ය්‍යයනට උපවාද නොකරනුවහ, සම්‍යග්දෘෂ්ටිකයහ, සම්‍යග්දෘෂ්ටිකර්‍මසමාදන ඇතියහ. ඔහු කාබුත් මරණින් මතු ශොභනගති ඇති ස්වර්ගලොකයට පැමිණියහ’’යි කියායි. මෙසෙයින් විශුද්ධ වූ, මිනිසැස ඉක්ම සිටි, දිවැසින් මියන, උපදනා, හීන, ප්‍රණීත, සුවර්ණ, දුර්වර්ණ, සුගත, දුර්ගත, සතුන් දක්නේය. යථාකර්‍මෝපග සත්ත්වයන් දන්නේය. මහණෙනි, යම්සේ සභද්වාර දෙගෙයෙක් ඇත් ද, එහි ඇස් ඇති පුරුෂයෙක් ගෙමැද සිටියේ, ගෙට වදනාවුන්, බැහැරයන්නාවුන්, ඔබමොබ සක්මන් කරන්නාවුන්, ගෙන් ගෙට වදනාවුන් මිනිසුන් දක්නේ වේ ද, මහණෙනි, එ සෙයින් ම මහණ පිරිසිදු වූ මිනිසැස ඉක්ම සිටි, දිවැසින් මියන, උපදනා, හීන, ප්‍රණීත, සුවර්ණ, දුර්වර්ණ, සුගත, දුර්ගත, සත්ත්වයන් දක්නේය. යථාකර්‍මෝපග සත්ත්වයන් දන්නේය ...

25. ඒ මහණ මෙසෙයින් සමාහිත සිත පරිශුද්ධ ව, පර්‍ය්‍යවදාත ව, අනඞ්ගණ ව, විගතොපක්ලේශ ව, මෘදුභූත ව, කර්‍මණ්‍ය ව, ස්ථිත ව, නිශ්චල ප්‍රාප්ත ව පවතුත් ම, ආශ්‍රව ක්ෂයඥානය පිණිස සිත නතු කෙරෙයි. හේ ‘මේ දුකයි’ යථාභූතය දන්නේ ය. ‘මේ දුඃඛසමුදය’යි යථාභූතය දන්නේය. ‘මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපත්’යි යථාභූතය දන්නේය. ‘මොහු ආශ්‍රවයහ’යි යථාභූතය දන්නේය. ‘මේ ආශ්‍රවසමුදය’යි යථාභූතය දන්නේය. ‘මේ ආශ්‍රවනිරොධය’යි යථාභූතය දන්නේය. ‘මේ ආශ්‍රවනිරොධගාමිනී ප්‍රතිපද්’යි යථාභූතය දන්නේය. මෙසෙයින් දන්නා, මෙසෙයින් දක්නා ඔහුගේ සිත කාමාශ්‍රවයෙනුදු මිදෙයි. භවාශ්‍රවයෙනුදු සිත මිදෙයි. අවිද්‍යාශ්‍රව-යෙනුදු සිත මිදෙයි. විමුක්ත කල්හි ‘විමුක්තයෙමි’ යි ඥාන වෙයි. ජාති ක්ෂීණය සපුත්බ්‍රහ්මසරවස් හා මගබ්‍රහ්මසරවස් වසන ලදී. (සතර-මගින් කළ යුතු සොළසවිධ)කරණී කරන ලදී. නැවත මේ මිනිස්බවට නො එමියි දන්නේය. මහණෙනි, යම්සේ පර්වතමුදුනෙක විමල්, වෙසෙසින් පහන්, නොකැලැත් දියවිලෙක් වේ ද, එවිල්තෙර සිටි ඇස් ඇති පුරුෂ-යෙක් ඇවිදුනා වූත් සිටුනා වූත් සිප්පිබෙල්ලන් හා සක්බෙල්ලනුදු මස්-ගලඳු, සිටුනා කැට හා කැබිලිති දු දක්නේ වේ ද, ඔහුට මෙබඳු සිතෙක් වෙයි: ‘මේ දියවිල නිර්මල වෙයි, විප්‍රසන්නවෙයි, කර්දම රහිත වෙයි. මේ සිප්පිබෙල්ලන් හා සක්බෙල්ලෝ ද, මස්රැළහු ද හැසිරෙන්නාහුදු සිටුනාහුදු වෙති. කැට හා කැබිලිත්තෝ ද සිටුනාහු වෙති’යි කියායි. ‘මහණෙනි, එසෙයින්ම මහණ ‘මේ දුකැ’ යි යථාභූතය දන්නේය ‘මේ දුඃඛසමුදය’යි යථාභූතය දන්නේය, ‘මේ දුඃඛනිරොධය’ යි යථාභූතය දන්නේය, මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපද්’යි යථාභූතය දන්නේය. ‘මොහු ආශ්‍රවයහ’යි යථාභූතය දන්නේය, ‘මේ ආශ්‍රවසමුදය’යි යථාභූතය දන්නේය, ‘මේ ආශ්‍රවනිරොධය’යි යථාභූතය දන්නේය, ‘මේ ආශ්‍රවනිරොධගාමිනී ප්‍රතිපද්‍ය’යි යථාභූතය දන්නේය.

තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති. භවාසවාපි චිත්තං විමුච්චති. අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාති.

26. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු සමණො ඉතිපි, බ්‍රාහ්මණො ඉතිපි, නහාතකො ඉතිපි, වෙදගු ඉතිපි, සොත්තියො ඉතිපි, අරියො ඉතිපි, අරහං[1] ඉතිපි.

27. කථඤ්ච භික්ඛවෙ භික්ඛු සමණො හොති? සමිතාස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සඞ්කිලෙසිකා[2] පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා. එවං ඛො භික්ඛවෙ භික්ඛු සමණො හොති.

28. කථඤ්ච භික්ඛවෙ භික්ඛු බ්‍රාහ්මණො හොති? බාහිතාස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සඞ්කිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා. එවං ඛො භික්ඛවෙ භික්ඛු බ්‍රාහ්මණො හොති.

29. කථඤ්ච භික්ඛවෙ භික්ඛු නහාතකො හොති? නහාතාස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සඞ්කිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා. එවං ඛො භික්ඛවෙ භික්ඛු නහාතකො හොති.

30. කථඤ්ච භික්ඛවෙ භික්ඛු වෙදගු හොති? විදිතාස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සඞ්කිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා. එවං ඛො භික්ඛවෙ භික්ඛු වෙදගු හොති.

31. කථඤ්ච භික්ඛවෙ භික්ඛු සොත්තියො හොති? නිස්සුතාස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සඞ්කිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා. එවං ඛො භික්ඛවෙ භික්ඛු සොත්තියො හොති.

32. කථඤ්ච භික්ඛවෙ භික්ඛු අරියො හොති? ආරකාස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සඞ්කිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා. එවං ඛො භික්ඛවෙ භික්ඛු අරියො හොති.

33. කථඤ්ච භික්ඛවෙ භික්ඛු අරහං හොති? ආරකාස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සඞ්කිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා. එවං ඛො භික්ඛවෙ භික්ඛු අරහං හොති.

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

මහාඅස්සපුරසුත්තං නවමං.

---

1. අරහා - සයා.
2. පොනොබ්භවිකා - මජ්සං, සයා

මෙසෙයින් දන්නා, මෙසෙයින් දක්නා ඔහුගේ සිත කාමාස්‍රවයෙනුදු මිදෙයි. භවාස්‍රවයෙනුදු සිත මිදෙයි. අවිද්‍යාස්‍රවයෙනුදු සිත මිදෙයි. විමුක්තවත් ම ‘විමුක්තයෙමි’ යි ඥාන වෙයි. ‘ජාතිය ක්‍ෂීණය. බ්‍රහ්මචරියවාසය නිමවන ලදී. කරණී කරන ලදී. නැවත මේ මිතිස්බවට නො එමි’ දන්නේය.

26. මහණෙනි, මේ මහණ (සන්හුන් ඇති බැවින්) ශ්‍රමණයහයි ද) (බැහැර ලූ පාප ඇති බැවින්) බ්‍රාහ්මණයහයි ද, (ධෞතකෙලශ ඇති බැවින් නහාතකය හයිද, (චතුර්මාර්ගඥානවෙදයෙන් ලමුදම් දත් වන බැවින්) වෙදගු හයිද, (පැහූකෙලෙස් ඇති බැවින්) සොත්‍රියහයි ද, (කෙලෙසුන් දුරුකළ බැවින්) අරියහයි ද, රහත්හයි ද කියනු ලැබේ.

27. මහණෙනි, කෙසේ මහණ ‘සමණ’ නම් වේ ද යත්: මොහු විසින් සිත කෙලෙසන, පුනර්භවය පිණිස වැටෙන, කායචිත්තදරථසහිත, දුඃඛ-විපාක ඇති, මතුයෙහි ජාතිජරාමරණයට කරුණු වන ලමු අකුසල් දහම්හු සමිත වෙති. මහණෙනි, මෙසෙයින් මහණ ‘සමණ’ නම් වෙයි.

28. මහණෙනි, කෙසේ මහණ ‘බ්‍රාහ්මණ’ නම් වේ ද යත්: මොහු විසින් සිත කෙලෙසන, පුනර්භවය පිණිස වැටෙන, කායචිත්තදරථසහිත, දුඃඛවිපාක ඇති, මතුයෙහි ජාතිජරාමරණයට කරුණු වන, ලමු අකුසල් දහම්හු බාහිත වෙති. මහණෙනි, මෙසෙයින් මහණ ‘බ්‍රාහ්මණ’ නම් වෙයි.

29. මහණෙනි, කෙසේ මහණ ‘නහාතක’ නම් වේ ද යත්: මොහු විසින් සිත කෙලෙසන, පුනර්භවය පිණිස වැටෙන, කායචිත්තදරථසහිත, දුඃඛ විපාක ඇති, මතුයෙහි ජාතිජරාමරණයට කරුණු වන, ලමුඅකුසල් දහම්හු ධෞතාලදහු වෙති. මහණෙනි, මෙසෙයින් මහණ ‘නහාතක’ නම් වෙයි.

30. මහණෙනි, කෙසේ මහණ වෙදගු නම් වේ ද යත්: මොහු විසින් සිත කෙලෙසන, පුනර්භවය පිණිස වැටෙන, කායචිත්තදරථසහිත, දුඃඛවිපාක ඇති, මතුයෙහි ජාතිජරාමරණයට කරුණු වන, ලමු අකුසල්හු විදිත වෙති. මහණෙනි, මෙසෙයින් මහණ ‘වෙදගු’ නම් වෙයි.

31. මහණෙනි, කෙසේ මහණ ‘සොත්‍රිය’ නම් වේ ද යත්: මොහු විසින් සිත කෙලෙසන, පුනර්භවය පිණිස වැටෙන, කායචිත්තදරථසහිත, දුඃඛ විපාක ඇති, මතුයෙහි ජාතිජරාමරණයට කරුණු වන, ලමු අකුසල් දහම්හු නිඃසෘත (හරණලද) වෙති. මහණෙනි, මෙසෙයින් මහණ ‘සොත්‍රිය’ නම් වෙයි.

32. මහණෙනි, කෙසේ මහණ ‘අරිය’ නම් වේ ද යත්: මොහු පිළිබඳ සිත කෙලෙසන, පුනර්භවය පිණිස වැටෙන, කායචිත්තදරථසහිත, දුඃඛවිපාක ඇති, මතුයෙහි ජාතිජරාමරණයට කරුණු වන, ලමු අකුසල් දහම්හු දුරිභූත වෙති. මහණෙනි, මෙසෙයින් මහණ ‘අරිය’ නම් වෙයි.

33. මහණෙනි, කෙසේ මහණ ‘අරහන්ත’ නම් වේ ද යත්: මොහු පිළිබඳ සිත කෙලෙසන, පුනර්භවය පිණිස වැටෙන, කායචිත්තදරථසහිත, දුඃඛ-විපාක ඇති, මතුයෙහි ජාතිජරාමරණයට කරුණු වන, ලමු අකුසල් දහම්හු දුරීභූත වෙති. මහණෙනි, මෙසෙයින් මහණ ‘අරහන්ත’ නම් වෙයි.

භාග්‍යවතුන් වහන්සේ මෙ මහාඅස්සපුරසූත්‍රය දෙසූහ. සතුටුසිත් ඇති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව අභිනන්‍දන කළෝ.

මහාඅස්සපුර සූත්‍රය නවවැනියි.

Free Distribution www.aathaapi.org

1. 4. 10.

චූළඅස්සපුරසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා අඞ්ගෙසු විහරති අස්සපුරං නාම අඞ්ගානං නිගමො. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. සමණා සමණාති වො භික්ඛවෙ ජනො සඤ්ජානාති. තුම්හෙ ච පන කෙ තුම්හෙති පුට්ඨා සමානා සමණම්හාති පටිජානාථ. තෙසං වො භික්ඛවෙ එවංසමඤ්ඤානං සතං එවංපටිඤ්ඤානං සතං 'යා සමණසාමීචිපටිපදා, තං පටිපදං පටිපජ්ජිස්සාම, එවං නො අයං අම්හාකං සමඤ්ඤා ච සච්චා භවිස්සති, පටිඤ්ඤා ච භූතා යෙසඤ්ච මයං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං[1] පරිභුඤ්ජාම,' තෙසං තෙ කාරා අම්හෙසු මහප්ඵලා භවිස්සන්ති මහානිසංසා. අම්හාකඤ්චෙවායං පබ්බජ්ජා අවඤ්ඣා භවිස්සති සඵලා සඋද්‍රයා'ති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

3. කථඤ්ච භික්ඛවෙ භික්ඛු න සමණසාමීචිපටිපදං පටිපන්නො හොති? යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුනො අභිජ්ඣාලුස්ස අභිජ්ඣා අප්පහීනා හොති, බ්‍යාපන්නචිත්තස්ස බ්‍යාපාදො අප්පහීනො හොති, කොධනස්ස කොධො අප්පහීනො හොති, උපනාහිස්ස උපනාහො අප්පහීනො හොති, මක්ඛිස්ස මක්ඛො අප්පහීනො හොති, පළාසිස්ස පළාසො අප්පහීනො හොති, ඉස්සුකිස්ස ඉස්සා අප්පහීනා හොති, මච්ඡරිස්ස මච්ඡරියං අප්පහීනං හොති, සඨස්ස සාඨෙය්‍යං අප්පහීනං හොති, මායාවිස්ස මායා අප්පහීනා හොති, පාපිච්ඡස්ස පාපිකා ඉච්ඡා අප්පහීනා හොති, මිච්ඡාදිට්ඨිස්ස[2] මිච්ඡාදිට්ඨි අප්පහීනා හොති, ඉමෙසං ඛො අහං භික්ඛවෙ සමණමලානං සමණදොසානං සමණකසටානං[3] ආපායිකානං ඨානානං දුග්ගතිවෙදනියානං අප්පහානා න සමණසාමීචිපටිපදං පටිපන්නොති වදාමි. සෙය්‍යථාපි භික්ඛවෙ මටජං නාම[4] ආවුධජාතං උභතො ධාරං පීතනිසිතං, තදස්ස සඞ්ඝාටියා සම්පාරුතං සම්පලිවෙඨිතං[5], තථූපමාහං භික්ඛවෙ ඉමස්ස භික්ඛුනො පබ්බජ්ජං වදාමි.

---

1. පරික්ඛාරෙ - සයා. 2. මිච්ඡාදිට්ඨිකස්ස - මජසං.
3. සමණකසාවානං - සයා. 4. මතජන්නාම - සයා. 5. සම්පලිවෙධිතං - සයා.

1. 4. 10.

චූලඅස්සපුර සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ අඞ්ගදනව්හි අඞ්ගුරට වැසියන්ගේ අස්සපුර නම් නියම්ගම්හි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි මහණුන් ඇමැතූසේක. ඒ මහණහු ‘වහන්සැ’ යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

2. මහණෙනි, මහදෙන තෝ ‘ශ්‍රමණයහ, ශ්‍රමණයහ’ යි තොප හඳුනාගනී. තෙපිදු ‘තෙපි කවරව’ යි පුළුවුස්නා ලදුව ‘ශ්‍රමණයම්හ’ යි පිළිත කරන්නාව. මහණෙනි, මෙබඳු ශ්‍රමණසංඥ ලත්, මෙබඳු ශ්‍රමණ ප්‍රතිඥ කරන, ඒ තොප විසින් “යම් මහණුනට නිසි අනුලොම් පිළිවෙත් ඇද්ද, එ පිළිවෙත් පිළිපදුම්හ. මෙසේ පිළිපදුත් ම, අපගේ මේ ශ්‍රමණසංඥත් සත්‍ය වෙයි, ප්‍රතිඥත් යථාර්ථ වෙයි. අපි යම් ම කෙනෙකුන්ගේ සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර වළඳකරමෝ නම්, අප කෙරෙහි කරන උන්ගේ ඒ සත්කාරයෝ මහත්ඵල මහානෘශංස වෙති. අපගේ ද මේ පැවිද්ද අවන්ධ්‍ය වෙයි, සඵල වෙයි, වෘද්ධි සහිත වේ”ය යි මහණෙනි, මෙසෙයින් තොප හික්මෙන්නේය.

3. මහණෙනි, කෙසේ මහණ මහණුනට නිසි අනුලොම් පිළිවෙත නො පිළිපන්නේ වේ ද යත්: මහණෙනි, ලොභබහුල යම්කිසි මහණකුට ඒ දලලොබ නොපුහුත් වේ ද, ව්‍යාපන්න සිතැති මහණකුට ඒ ව්‍යපාද නොපුහුත් වේ ද, කිපෙනසුලු මහණකුට ඒ ක්‍රොධ නොපුහුත් වේ ද, බද්ධවෛර ඇති මහණකුට ඒ බද්ධවෛර නොපුහුත් වේ ද, මකුගුණ ඇති මහණකුට ඒ මකුසැහැවි නොපුහුන් වේ ද, (යුගග්‍රාහ ලක්‍ෂණ) පළාස ඇති මහණකුට ඒ පළාස ප්‍රහීණ නො වේ ද, ඊර්ෂ්‍යා ඇති මහණකුට ඒ ඊර්ෂ්‍යා ප්‍රහීණ නො වේ ද, මසුරු ඇති මහණකුට ඒ මසුරු බව ප්‍රහීණ නො වේ ද, ශඨ වූ මහණකුට ඒ සට බව ප්‍රහීණ නො වේ ද, මායා ඇති මහණකුට ඒ මායා ප්‍රහීණ නො වේ ද, පාපඉච්ඡා ඇති මහණකුට ඒ පාපෙච්ඡා ප්‍රහීණ නො වේ ද, මිසදිටු ඇති මහණකුට ඒ මිසදිටු ප්‍රහීණ නො වේ ද, මහණෙනි, අපායෙහි ඉපැද්මට කරුණු වන, දුගතියෙහි විවාදුකට කරුණු වන, මේ මහණමල, මහණදොස්, මහණකසල ප්‍රහීණ නො කිරීමෙන් සමණසාමීචිපටිපදා නො පිළිපන්හ’යි මම කියමි. මහණෙනි, යම්සේ දෙපස මුවාත් ඇති, දියපි, තහස්නා පහණ (උරගල)ගා තියුණුකළ මටජ නම් ආයුධ ජාතයෙක් වේද, එද සඟළින් පොරොනා ලදුයේ, (කොපුවෙහි බහන ලදුයේ) මැනැවින් වෙළෙනා ලදුයේ වේ ද, මහණෙනි, මම මේ මහණහුගේ පැවිද්ද එබඳු කොට කියමි.

4. නාහං භික්ඛවෙ සඞ්ඝාටිකස්ස සඞ්ඝාටිධාරණමත්තෙන සාමඤ්ඤං වදාමි. නාහං භික්ඛවෙ අචෙලකස්ස අචෙලකමත්තෙන සාමඤ්ඤං වදාමි. නාහං භික්ඛවෙ රජොජල්ලිකස්ස රජොජල්ලිකමත්තෙන සාමඤ්ඤං වදාමි. නාහං භික්ඛවෙ උදකොරොහකස්ස උදකොරොහකමත්තෙන[1] සාමඤ්ඤං වදාමි. නාහං භික්ඛවෙ රුක්ඛමූලිකස්ස රුක්ඛමූලිකමත්තෙන සාමඤ්ඤං වදාමි. නාහං භික්ඛවෙ අබ්භොකාසිකස්ස අබ්භොකාසිකමත්තෙන සාමඤ්ඤං වදාමි. නාහං භික්ඛවෙ උබ්භට්ඨකස්ස උබ්භට්ඨකමත්තෙන සාමඤ්ඤං වදාමි. නාහං භික්ඛවෙ පරියායභත්තිකස්ස පරියායභත්තිකමත්තෙන සාමඤ්ඤං වදාමි. නාහං භික්ඛවෙ මන්තජ්ඣායකස්ස[2] මන්තජ්ඣායකමත්තෙන සාමඤ්ඤං වදාමි. නාහං භික්ඛවෙ ජටිලකස්ස ජටාධාරණමත්තෙන සාමඤ්ඤං වදාමි.

5. සඞ්ඝාටිකස්ස චෙ භික්ඛවෙ සඞ්ඝාටිධාරණමත්තෙන අභිජ්ඣාලුස්ස[3] අභිජ්ඣා පහීයෙථ, බ්‍යාපන්නචිත්තස්ස බ්‍යාපාදො පහීයෙථ, කොධනස්ස කොධො පහීයෙථ, උපනාහිස්ස උපනාහො පහීයෙථ, මක්ඛිස්ස මක්ඛො පහීයෙථ, පළාසිස්ස පළාසො පහීයෙථ, ඉස්සුකිස්ස ඉස්සා පහීයෙථ, මච්ඡරිස්ස මච්ඡරියං පහීයෙථ, සඨස්ස සාඨෙය්‍යං පහීයෙථ, මායාවිස්ස මායා පහීයෙථ, පාපිච්ඡස්ස පාපිකා ඉච්ඡා, පහීයෙථ, මිච්ඡාදිට්ඨිකස්ස මිච්ඡාදිට්ඨි පහීයෙථ, තමෙනං මිත්තාමච්චා ඤාතිසාලොහිතා ජාතමෙව නං සඞ්ඝාටිකං කරෙය්‍යුං, සඞ්ඝාටිකත්තමෙව සමාදපෙය්‍යුං: "එහි ත්වං භද්‍රමුඛ, සඞ්ඝාටිකො හොහි සඞ්ඝාටිකස්ස තෙ සතො සඞ්ඝාටිධාරණමත්තෙන අභිජ්ඣාලුස්ස අභිජ්ඣා පහීයිස්සති, බ්‍යාපන්නචිත්තස්ස බ්‍යාපාදො පහීයිස්සති, කොධනස්ස කොධො පහීයිස්සති, උපනාහිස්ස උපනාහො පහීයිස්සති, මක්ඛිස්ස මක්ඛො පහීයිස්සති, පළාසිස්ස පළාසො පහීයිස්සති, ඉස්සුකිස්ස ඉස්සා පහීයිස්සති, මච්ඡරිස්ස මච්ඡරියං පහීයිස්සති, සඨස්ස සාඨෙය්‍යං පහීයිස්සති, මායාවිස්ස මායා පහීයිස්සති, පාපිච්ඡස්ස පාපිකා ඉච්ඡා පහීයිස්සති, මිච්ඡාදිට්ඨිකස්ස මිච්ඡාදිට්ඨි පහීයිස්සතී"ති. යස්මා ච ඛො අහං භික්ඛවෙ සඞ්ඝාටිකම්පි ඉධෙකච්චං පස්සාමි අභිජ්ඣාලුං බ්‍යාපන්නචිත්තං කොධනං උපනාහිං මක්ඛිං පළාසිං ඉස්සුකිං මච්ඡරිං සඨං මායාවිං පාපිච්ඡං මිච්ඡාදිට්ඨිං, තස්මා න සඞ්ඝාටිකස්ස සඞ්ඝාටිධාරණමත්තෙන සාමඤ්ඤං වදාමි.

---

1. උදකොරොහණමත්තෙන - මජ්ඣසං, සතා. 2. මන්තජ්ඣායිකස්ස - සතා.
3. අභිජ්ඣාලුස්ස පුග්ගලස්ස - සතා.

4. මහණෙනි, මම සඞ්ඝාටිධාරණය සිල්කොට ඇතියහුගේ සඞ්ඝාටිධාරණමාත්‍රයෙන් මහඵල නොවදරමි. මහණෙනි, මම අචෙලකයාගේ බහාලුපිළී ඇතිමතුයෙන් මහඵල නොවදරමි. මහණෙනි, මම රජොජල්ල ධාරණය සිල් කොට ඇතියහුගේ රජස්දූලි බැරීම් මාත්‍රයෙන් මහඵල නොවදරමි. මහණෙනි, මම දවස තුන්යලක් උදකාවගාහය (දියෙහි බැසීම) සිල් කොට ඇතියහුගේ උදකාවගාහමාත්‍රයෙන් මහඵල නො වදාරමි. මහණෙනි, මම වෘක්‍ෂමූලවාසය සිල් කොට ඇතියහුගේ වෘක්‍ෂමූලවාසමාත්‍රයෙන් මහඵල නොවදරමි. මහණෙනි, මම අභ්‍යවකාශවාසය සිල්කොට ඇතියහුගේ අභ්‍යවකාශවාසිකමාත්‍රයෙන් මහඵල නොකියමි. මහණෙනි, මම උබුකුරුව සිටිනු සිල් කොට ඇතියහුගේ උබුකුරුව සිටීම්මතුයෙන් මහඵල නොවදරමි මහණෙනි, මම (මාසයෙකින් වේවයි, අඩමසෙකින් වේවයි වාරවශයෙන් බුදින) පය්‍ර්‍යායභක්තභොජනය සිල් කොට ඇතියහුගේ පය්‍ර්‍යායභක්ත භොජනශීලමාත්‍රයෙන් මහඵල නොවදරමි. මහණෙනි, මම වෙදමන්ත්‍රහදාරන්නහුගේ මතුරුහදාරනු මතුයෙන් මහඵල නොවදරමි. මහණෙනි, මම ජටිලකයාගේ ජටාධාරණමාත්‍රයෙන් මහඵල නොවදරමි.

5. මහණෙනි, ඉදින් සඞ්ඝාටි ධරණ අභිධ්‍යාබහුලයාගේ අභිධ්‍යාව සඞ්ඝාටිධාරණමාත්‍රයෙන් පහ ව යේ නම්, ව්‍යාපන්න චිත්ත පුද්ගලයාගේ ව්‍යාපාදය පහ ව යේ නම්, කොධශීලීහුගේ ක්‍රොධය පහ ව යේ නම්, උපනාහී පුද්ගලයාගේ උපනාහය පහ ව යේ නම්, ම්‍රක්‍ෂීපුද්ගලයාගේ ම්‍රක්‍ෂය පහ ව යේ නම්, පලාසිපුද්ගලයාගේ පලාසය පහ ව යේ නම්, ඉස්සුකී පුද්ගලයාගේ ඊර්‍ෂ්‍යාව පහ ව යේ නම්, මසුරු ඇතියහුගේ මසුරුබව පහ ව යේ නම්, සඨපුද්ගලාගේ සඨබව පහ ව යේ නම්, මායා ඇතියහුගේ මායාව පහ ව යේ නම්, පාපෙච්ඡයාගේ පාපෙච්ඡා පහ ව යේ නම්, මිථ්‍යාදෘෂ්ටිකයාගේ මිථ්‍යාදෘෂ්ටි පහ ව යේ නම්, මිත්‍රාමාත්‍යයෝ ද නෑසහලේනෑයෝ ද ජාතමාත්‍ර වූ ම (උපන්දා උපන්වන ම සිටි) තුලුන් සඞ්ඝාටික කරන්නාහ' සාඞ්ඝාටිකත්වය ම සමාදන්කරවන්නාහ. කෙසේය යත්: "භද්‍රමුඛය, තො එ. සඞ්ඝාටික ව. සඞ්ඝාටික වූ අභිධ්‍යා බහුල තාගේ සඞ්ඝාටිධාරණ මාත්‍රයෙන් අභිධ්‍යා පහව යෙයි. ව්‍යාපන්නචිත්ත වූ තාගේ ව්‍යාපාද පහව යෙයි. ක්‍රොධඇති තාගේ ක්‍රොධ පහ ව යෙයි. උපනාහී වූ තාගේ උපනාහ පහ ව යෙයි. ම්‍රක්‍ෂි වූ තාගේ ම්‍රක්‍ෂය පහ ව යෙයි. පලාසී වූ තාගේ පලාස පහ ව යෙයි. ඉස්සුකී වූ තාගේ ඊර්‍ෂ්‍යා පහ ව යෙහි. මච්ඡරී වූ තාගේ මාත්සය්‍ර්‍ය පහ ව යෙයි. සඨ වූ තාගේ සඨබව පහ ව යෙයි. මායාවී වූ තාගේ මායාව පහ ව යෙයි. පාපිච්ඡ වූ තාගේ පාපෙච්ඡා පහව යෙයි. මිච්ඡාදිට්ඨික වූ තාගේ මිසදිටු පහ එ යෙයි' කියායි. මහණෙනි, මම යම්හෙයෙකින් මෙලොව සඞ්ඝාටික වූත් කිසිවකු අභිධ්‍යාබහුල ව සිටුනහු දක්නෙම් ද, ඛ්‍යාපන්නචිත්ත වූවහු, කොධන වූවහු, උපනාහී වූවහු, මක්ඛී වූවහු, පලාසී වූවහු, ඉස්සුකී වූවහු, මච්ඡරී වූවහු, සඨ වූවහු, මායාවී වූවහු, පාපිච්ඡ වූවහු, මිච්ඡාදිට්ඨික වූවහු, දක්නෙම් ද, එහෙයින් සඞ්ඝාටිකයාගේ සඞ්ඝාටිධාරණ මාත්‍රයෙන් මහඵල නොවදරමි.

6. අචෙලකස්ස වෙ භික්ඛවෙ -පෙ- රජොජල්ලිකස්ස වෙ භික්ඛවෙ -පෙ- උදකොරොහකස්ස වෙ භික්ඛවෙ -පෙ- රුක්ඛමූලිකස්ස වෙ භික්ඛවෙ -පෙ- අබ්භොකාසිකස්ස වෙ භික්ඛවෙ -පෙ- උබ්භට්ඨකස්ස වෙ භික්ඛවෙ -පෙ- පරියායභත්තිකස්ස වෙ භික්ඛවෙ -පෙ- මන්තජ්ඣායකස්ස වෙ භික්ඛවෙ -පෙ- ජටිලකස්ස වෙ භික්ඛවෙ ජටාධාරණමත්තෙන අභිජ්ඣාලුස්ස අභිජ්ඣා පහීයෙථ, බ්‍යාපන්නචිත්තස්ස බ්‍යාපාදො පහීයෙථ, කොධනස්ස කොධො පහීයෙථ, උපනාහිස්ස උපනාහො පහීයෙථ, මක්ඛිස්ස මක්ඛො පහීයෙථ, පළාසිස්ස පළාසො පහීයෙථ, ඉස්සුකිස්ස ඉස්සා පහීයෙථ, මච්ඡරිස්ස මච්ඡරියං පහීයෙථ, සඨස්ස සාඨෙය්‍යං පහීයෙථ, මායාවිස්ස මායා පහීයෙථ, පාපිච්ඡස්ස පාපිකා ඉච්ඡා පහීයෙථ, මිච්ඡාදිට්ඨිකස්ස මිච්ඡාදිට්ඨි පහීයෙථ, තමෙනං මිත්තාමච්චා ඤාතිසාලොහිතා ජාතමෙව නං ජටිලකං කරෙය්‍යුං, ජටිලකත්තමෙව සමාදපෙය්‍යුං: "එහි ත්වං භද්‍රමුඛ, ජටිලකො හොහි, ජටිලකස්ස තෙ සතො ජටාධාරණමත්තෙන අභිජ්ඣාලුස්ස අභිජ්ඣා පහීයිස්සති, බ්‍යාපන්නචිත්තස්ස බ්‍යාපාදො පහීයිස්සති, කොධනස්ස කොධො පහීයිස්සති, උපනාහිස්ස උපනාහො පහීයිස්සති, මක්ඛිස්ස මක්ඛො පහීයිස්සති, පළාසිස්ස පළාසො පහීයිස්සති, ඉස්සුකිස්ස ඉස්සා පහීයිස්සති, මච්ඡරිස්ස මච්ඡරියං පහීයිස්සති, සඨස්ස සාඨෙය්‍යං පහීයිස්සති, මායාපිස්ස මායා පහීයිස්සති. පාපිච්ඡස්ස පාපිකා ඉච්ඡා පහීයිස්සති, මිච්ඡාදිට්ඨිකස්ස මිච්ඡාදිට්ඨි පහීයිස්සති"ති. යස්මා ච ඛො අහං භික්ඛවෙ ජටිලකම්පි ඉධෙකච්චං පස්සාමි අභිජ්ඣාලුං බ්‍යාපන්නචිත්තං කොධනං උපනාහිං මක්ඛිං පළාසිං ඉස්සුකිං මච්ඡරිං සඨං මායාවිං පාපිච්ඡං මිච්ඡාදිට්ඨිං, තස්මා න ජටිලකස්ස ජටාධාරණමත්තෙන සාමඤ්ඤං වදාමි.

7. කථඤ්ච භික්ඛවෙ භික්ඛු සමණසාමීචිප්පටිපදං පටිපන්නො හොති? යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුනො අභිජ්ඣාලුස්ස අභිජ්ඣා පහීනා හොති, බ්‍යාපන්නචිත්තස්ස බ්‍යාපාදො පහීනො හොති, කොධනස්ස කොධො පහීනො හොති, උපනාහිස්ස උපනාහො පහීනො හොති, මක්ඛිස්ස මක්ඛො පහීනො හොති, පළාසිස්ස පළාසො පහීනො හොති, ඉස්සුකිස්ස ඉස්සා පහීනා හොති, මච්ඡරිස්ස මච්ඡරියං පහීනං හොති, සඨස්ස සාඨෙය්‍යං පහීනං හොති, මායාවිස්ස මායා පහීනා හොති, පාපිච්ඡස්ස පාපිකා ඉච්ඡා පහීනා හොති, මිච්ඡාදිට්ඨිකස්ස මිච්ඡාදිට්ඨි පහීනා හොති, ඉමෙසං ඛො අහං භික්ඛවෙ සමණමලානං සමණදොසානං සමණකසටානං ආපායිකානං ඨානානං දුග්ගතිවෙදනියානං පහානා සමණසාමීචිප්පටිපදං පටිපන්නොති වදාමි.

6. මහණෙනි, ඉදින් අචෙලක අභිධ්‍යාබහුලයාගේ ...මහණෙනි, ඉදින් රජොජල්ලික අභිධ්‍යා බහුලයාගේ ... මහණෙනි, ඉදින් උදකාවරොහක අභිධ්‍යාබහුලයාගේ ... මහණෙනි, ඉදින් රුක්ඛමූලික අභිධ්‍යාබහුලයාගේ ... මහණෙනි, ඉදින් අබ්භොකාසික අභිධ්‍යාබහුලයාගේ ... මහණෙනි, ඉදින් උබ්භට්ඨක අභිධ්‍යාබහුලයාගේ ... මහණෙනි, ඉදින් පරියායභත්තික අභිධ්‍යාබහුලයාගේ ... මහණෙනි, ඉදින් මන්තජ්ඣායක අභිධ්‍යාබහුලයාගේ ... මහණෙනි, ඉදින් ජටිලක අභිධ්‍යාබහුලයාගේ ජටාධාරණමාත්‍රයෙන් අභිධ්‍යා පහ ව යේ නම්, (ජටිලකවූ) ව්‍යාපන්න සිත් ඇතියහුගේ ව්‍යාපාද පහ ව යේ නම්, (ජටිලක වූ) ක්‍රොධ ඇතියහුගේ ක්‍රොධය පහ ව යේ නම්, (ජටිලකවූ) බද්ධවෛර ඇතියහුගේ බද්ධවෛරය පහ ව යේ නම්, (ජටිලක වූ) ම්‍රක්ෂ ඇතියහුගේ ම්‍රක්ෂය පහ ව යේ නම්, (ජටිලක වූ) යුගග්‍රාහ ලක්ෂණපලාස ඇතියහුගේ පලාසය පහ ව යේ නම්, (ජටිලක වූ) ඊර්ෂ්‍යා ඇතියහුගේ ඊර්ෂ්‍යා පහ ව යේ නම්, (ජටිලක වූ) මසුරු ඇතියහුගේ මසුරුබව පහ වයේ නම්, (ජටිලක් වූ) සඨයාගේ සඨබව පහ ව යේ නම්, (ජටිලක වූ) මායාවීහුගේ මායා පහ ව යේ නම්, (ජටිලක වූ) පාපෙච්ඡයාගේ පාපෙච්ඡා පහ ව යේ නම්, (ජටිලක වූ) මිථ්‍යාදෘෂ්ටිකයාගේ මිසදිටු පහ ව යේ නම්, මිත්‍රාමාත්‍යයන් හා නෑසහලේ නෑයෝ ජාතමාත්‍ර වූ ම තුලුන් ජටිලක කරන්නාහ. ජටිලක බව ම සමාදන් කරවන්නාහ. කෙසේ ය යත්: "භද්‍ර මුඛය, තෝ එව ජටිලක ව ජටිලක වූ අභිධ්‍යාබහුල තාගේ ජටාධාර-ණමාත්‍රයෙන් අභිධ්‍යා පහ ව යෙයි. ව්‍යාපන්නචිත්ත වූ තාගේ ව්‍යාපාද පහ ව යෙයි. ක්‍රොධන වූ තාගේ ක්‍රොධ පහ ව යෙයි. උපනාහී වූ තාගේ උපනාහ පහ ව යෙයි. මක්ඛී වූ තාගේ ම්‍රක්ෂ පහ ව යෙයි. පළාසී වූ තාගේ පලාස පහ ව යෙයි. ඉස්සුකී වූ තාගේ ඊර්ෂ්‍යා පහ ව යෙයි. මච්ඡරී වූ තාගේ මාත්සර්‍ය්‍ය පහව යෙයි. සඨවූ තාගේ සඨබව පහ ව යෙයි. මායාවී වූ තාගේ මායාව පහව යෙයි. පාපිච්ඡ වූ තාගේ පාපෙච්ඡා පහ ව යෙයි. මිච්ඡාදිට්ඨික වූ තාගේ මිසදිටු පහ ව යෙයි" කියායි. මහණෙනි, මම යම්හෙයෙකින් මෙලොව ජටිලකවූන් කිසිවකු අභිධ්‍යාබහුල ව සිටුනහු දක්නෙම් ද, ඛ්‍යාපන්නචිත්ත වූවහු, කොධන වූවහු, උපනාහී වූවහු, මක්ඛී වූවහු, පළාසී වූවහු, ඉස්සුකී වූවහු, මච්ඡරී වූවහු. සඨ වූවහු, මායාවී වූවහු, පාපිච්ඡ වූවහු, මිච්ඡාදිට්ඨික වූවහු, දක්නෙම ද, එහෙයින් ජටිලකයාගේ ජටාධාරණමාත්‍ර-යෙන් මහණල නොවදරම්.

7. මහණෙනි, කෙසේ මහණ මහණුනට තිසි අනුලොම් පිළිවෙත පිළි-පන්නේ වේ ද යත්: මහණෙනි, ලොබබිහිලි යම්කිසි මහණකුට ඒ දලලොබ, පුහුන් වේ ද, ව්‍යාපන්න සිතැති මහණකුට ඒ ව්‍යාපාද පුහුන් වේ ද, කිපෙනසුලු මහණකුට ඒ ක්‍රොධ පුහුන් වේ ද, බද්ධවෛර ඇති මහණකුට ඒ බද්වෛර පුහුන් වේද, මකු මහණකුට ඒ මකුසැහැවි පුහුන් වේද, (යුගග්‍රාහලක්ෂණ) පලාස ඇති මහණකුට ඒ පලාස පුහුන් වේද, ඊර්ෂ්‍යා ඇති මහණකුට ඒ ඊර්ෂ්‍යා පුහුන් වේද, මසුරු ඇති මහණකුට ඒ මසුරුබව පුහුන් වේද, ශඨ මහණකුට ඒ සළබෙ පුහුන් වේද, මායා ඇති මහණකුට ඒ මායා පුහුන් වේ ද, ලමුරිසි ඇති මහණකුට ඒ ලමුරිසි පුහුන් වේ ද, මිසදිටු ඇති මහණකුට ඒ මිසදිටු පුහුන් වේ ද, මහණෙනි, අපායෙහි ඉපැදීමට කරුණු වන, දුගතියෙහි විවාදුකට කරුණු වන, මේ මහණමල, මහණ දෙස්, මහණ කසල පුහුන් කිරීමෙන් සමණ-සාමීචිපටිපදා පිළිපන්හයි මම කියමි.

Free Distribution www.aathaapi.org

8. සො සබ්බෙහි ඉමෙහි පාපකෙහි අකුසලෙහි ධම්මෙහි විසුද්ධමත්තානං සමනුපස්සති තස්ස සබ්බෙහි ඉමෙහි පාපකෙහි අකුසලෙහි ධම්මෙහි විසුද්ධමත්තානං සමනුපස්සතො පාමුජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති.

9. සො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන[1] ඵරිත්වා විහරති. කරුණාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බසි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං කරුණාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. මුදිතාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මුදිතාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. උපෙක්ඛාසහගතෙන[2] චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං.[3] ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති.

10. සෙය්‍යථාපි භික්ඛවෙ පොක්ඛරණී අච්ඡොදිකා සාතොදිකා සීතොදිකා[4] සෙතකා සුපතිත්ථා රමණීයා, පුරත්ථිමාය චෙපි දිසාය පුරිසො[5] ආගච්ඡෙය්‍ය ඝම්මාභිතත්තො ඝම්මපරෙතො කිලන්තො තසිතො පිපාසිතො.- සො තං පොක්ඛරණිං ආගම්ම විනෙය්‍ය උදකපිපාසං, විනෙය්‍ය ඝම්මපරිළාහං. පච්ඡිමාය චෙපි දිසාය පුරිසො ආගච්ඡෙය්‍ය පෙ - උත්තරාය චෙපි දිසාය පුරිසො ආගච්ඡෙය්‍ය -පෙ- දක්ඛිණාය චෙපි දිසාය පුරිසො ආගච්ඡෙය්‍ය ·පෙ- යතො කුතො චෙපි තං පුරිසො[5] ආගච්ඡෙය්‍ය ඝම්මාභිතත්තො ඝම්මපරෙතො කිලන්තො තසිතො පිපාසිතො, සො තං පොක්ඛරණිං ආගම්ම විනෙය්‍ය උදකපිපාසං, විනෙය්‍ය ඝම්මපරිළාහං.

11. එවමෙව ඛො භික්ඛවෙ ඛත්තියකුලා චෙපි අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සො ච තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම එවං මෙත්තං කරුණං මුදිතං උපෙක්ඛං[6] භාවෙත්වා ලභති අජ්ඣත්තං වූපසමං. අජ්ඣත්තං වූපසමා සමණසාමීචිප්පටිපදං[7] පටිපන්නොති වදාමි. බ්‍රාහ්මණකුලා චෙපි - පෙ - වෙස්සකුලා චෙපි - පෙ - සුද්දකුලා චෙපි - පෙ - යස්මා කස්මා චෙපි කුලා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සො ච තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම එවං මෙත්තං කරුණං මුදිතං උපෙක්ඛං භාවෙත්වා ලභති අජ්ඣත්තං වූපසමං. අජ්ඣත්තං වූපසමා සමණසාමීචිප්පටිපදං පටිපන්නොති[8] වදාමි.

1. අබ්‍යාපජ්ජෙන, මජ්ඣසං. 2. උපෙඛාසහගතෙන, සීමු මජ්ඣසං සයා. PTS.
3. චතුත්ථං, මජ්ඣසං. සයා චතුත්ථිං උද්ධමධො, PTS
4. අච්ඡොදකා, සාතොදකා, සීතොදකා, මජ්ඣසං. සයා PTS 5 චෙපි පුරිසො, සයා.
6 උපෙඛං, කණ්ඨචි. 7. තමහං සමණසාමීචිපටිපදං. මජ්ඣසං සයා.
8 පටිපන්නො හොතීති වදාමි, සයා.

8. හේ 'මේ හැම ලමු අකුසල් දහමින් තමා විශුද්ධයහ'යි දක්නේය. 'මෙ හැම ලමු අකුසල් දහමින් තමා විශුද්ධයහ'යි දක්නා ඔහුට ප්‍රමොද උපදනේය. ප්‍රමුදිතයාහට ප්‍රීති උපදී. ප්‍රීතිසම්ප්‍රයුක්ත පුද්ගලයාගේ නාමකාය සන්හිඳුනේ වේ. සන්හුන්කය ඇතියේ සුව විඳුනේ ය. සුඛිතයාගේ සිත සමාධිගත වෙයි.

9. හේ මෙත් සහගිය සිතින් එක් දිගක් පැතිරැ ගෙන වාස කෙරෙයි. එසෙයින් දෙවන දිග, එසෙයින් තෙවනදිග, එසෙයින් සිවුවනදිග පැතිරැගෙන වාස කෙරෙයි. මෙසෙයින් උඩ යට සරස හැමතැන සර්‍වාත්මතායෙන් (සියලු සතුන් කෙරෙහි ආත්මසමතායෙන්) සර්‍වසත්‍ත්‍වවත් ලොව විපුල වූ, මහද්ගත වූ, අප්‍රමාණ වූ, අවෛර වූ, දොම්නස් රහිත වූ මෙත් සහගිය සිතින් පැතිරැගෙන වාස කෙරෙයි. කුළුණු සහගිය සිතින් එක්දිගක් පැතිරැගෙන වාස කෙරෙයි එසෙයින් දෙවන දිග, එසෙයින් තෙවන දිග, එසෙයින් සිවුවන දිග පැතිරැගෙන වාස කෙරෙයි. මෙසෙයින් උඩ යට සරස හැමතැන ... කුළුණු සහගිය සිතින් පැතිර ගෙන වාස කෙරෙයි. මුදිතාසහගත සිතින් එක් දිගක් පැතිරැගෙන වාස කෙරෙයි. එසෙයින් දෙවන දිග, එසෙයින් තෙවන දිග, එසෙයින් සිවුවන දිග. පැතිරැගෙන වාස කෙරෙයි. මෙසෙයින් උඩ යට සරස හැම තැන සර්‍වාත්මතායෙන් සර්‍ව සත්‍ත්‍ව සහිත ලොව විපුල, මහද්ගත, අප්‍රමාණ අවෛර, ව්‍යාබාධරහිත මුදිතාසහගත සිතින් පැතිරැගෙන වාස කෙරෙයි. උපෙක්‍ෂාසහගත සිතින් එක් දිගක් පැතිරැගෙන වාස කෙරෙයි. එසෙයින් දෙවන දිග, එසෙයින් තෙවන දිග, එසෙයින් සිවුවන දිග පැතිරැගෙන වාස කෙරෙයි. මෙසෙයින් උඩ යට සරස හැමතැන සර්‍වාත්මතායෙන් සර්‍ව සත්‍ත්‍ව සහිත ලොව විපුල, මහද්ගත, අප්‍රමාණ, අවෛර, ව්‍යාබාධ රහිත උපෙක්‍ෂාසහගත සිතින් පැතිරැගෙන වාස කෙරෙයි.

10. මහණෙනි, යම්සේ පහන්දිය ඇති, මිහිරිදිය ඇති, සිහිල් දිය ඇති, මඩ නැති, මනාතොට ඇති, රමණී පොකුණෙක් වේද, පෙරදිගිනුදු සම්යෙන් තැවුලිපත්, සම්යෙන් පෙළුණ, කලකුළු, නාමිත, දියපියැටි පුරුෂයෙක් එන්නේ වේ ද, හෙ එපොකුණ වෙත එළඹ දියපවස දුරුකර ගන්නේ වේ ද, සම්පරිදාහ දුරුකරගන්නේ වේ ද, පැසුළුදිගිනුදු පුරුෂයෙක් එන්නේ වේ ද,... උතුරුදිගිනුදු පුරුෂයෙක් එන්නේ වේ ද,... දකුණු දිගිනුදු පුරුෂයෙක් එන්නේ වේද... යම් ම දිගෙකිනුදු සම්යෙන් තැවුලිපත්, සම්යෙන් පෙළුණ, කලකුළු, නාමිත, දියපියැටි පුරුෂයෙක් එ පොකුණ කරා එන්නේ වේ ද, හෙ එ පොකුණ කරා අවුදු දියපවස දුරුකරගන්නේ වේ ද, සම්පරිදාහ දුරුකරගන්නේ වේ ද-

11. මහණෙනි, එපරිදි ම කැත්කුලිනුදු ගිහිගෙන් නික්ම ඉදින් සස්නට පැමිණියේ වේ නම්, හෙ ද තථාගත ප්‍රවේදිත ධම්විනයට අවුදු මෙසෙයින් මෛත්‍රී කරුණා මුදුතා උපෙක්‍ෂා වඩාගෙන සියසතන්හි ව්‍යුපශම ලබයි. සියසතන්හි ව්‍යුපශමයෙන් සමණසාමීචි - ප්‍රතිපදාවට පිළිපන්නේයයි කියමි. ඉදින් බ්‍රාහ්මණකුලයෙනුදු... ඉදින් වෛශ්‍යකුලයෙනුදු... ඉදින් ශුද්‍රකුලයෙනුදු ... ඉදින් යම් ම කුලයෙකිනුදු ගිහිගෙන් නික්ම සස්නට පැමිණියේ වේ ද, හෙ ද බුදුන් වදහල දහම්විනයට අවුදු මෙසේ මෛත්‍රී කරුණා මුදිතා උපෙක්‍ෂා භාවාගෙන සියසතන්හි සන්හිඳුම ලබයි. සියසතන්හි සන්හිඳුමින් සමණසාමීචි - ප්‍රතිපදාවට පිළිපන්නේයයි කියමි.

12. ඛත්තියකුලා චෙපි අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සො ච ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. ආසවානං ඛයා සමණො හොති. බ්‍රාහ්මණකුලා චෙපි -පෙ- වෙස්සකුලා චෙපි -පෙ- සුද්දකුලා චෙපි -පෙ- යස්මා කස්මා චෙපි කුලා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සො ච ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. ආසවානං ඛයා සමණො හොතීති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති

චූළඅස්සපුරසුත්තං දසමං.

මහායමකවග්ගො චතුත්ථො.

තස්ස වග්ගස්ස උද්දානං.

භිඤ්ජකසාලවනං[1] පරිහාතුං පාපිමතො[2] පුනසච්චකිසෙධො[3]
වණ්ණපසීදනතාදි ච[4] ඉසෙන්තු කෙවට අස්සපුරං ජටිලෙනාති.[5*]

1. භිඤ්ජක ජකකසාලවනං, සී. භිඤ්ජකසාලවනා, සයා.
2. පරිහාතුං පඤ්ඤවතො සී. පරිහරිතුං පඤ්ඤවතො, මජසං.
3. පුන සච්චකිසෙවො, සී. පුනසච්චකනිසෙධො, මජසං.
4. මුඛවණ්ණ පසීදනතාදි, සී. මුඛවණ්ණපසීදනතා, මජසං.
5 තසිතො කෙවට්ටඅස්සපුර ජටිලෙනාති, සී. සයා. විසෙනුකෙවට්ටඅස්සපුර ජටිලෙන, මජසං
* භිඤ්ජකජකක සාලවනං පරිහරිතුං පඤ්ඤවතො සච්චකනිසෙධො මුඛ වණ්ණපසීදනාදිනා තිවඩ්ඪකෙවට්ට අස්සපුර පටිලෙනාති, සිමු

12. ඉදින් ක්‍ෂත්‍රියකුලයෙනුදු ගිහිගෙන් නික්ම සස්නට පැමිණියේ වේ නම්, හෙ ද ආශ්‍රවක්‍ෂය හෙතුයෙන් අනාශ්‍රව වූ චෙතොවිමුක්ති ප්‍රඥාවිමුක්ති දුටුදැමියෙහි ම තමා විසින් වෙසෙසින් දැන පසක් කොට උපයාගෙන වාස කෙරෙයි. ආශ්‍රවක්‍ෂයහෙතුයෙන් ශ්‍රමණ වෙයි. ඉදින් බ්‍රාහ්මණකුලයෙනුදු... ඉදින් වෛශ්‍යකුලයෙනුදු... ඉදින් ශුද්‍රකුලයෙනුදු... ඉදින් යම් ම කුලයෙකිනුදු ගිහිගෙන් නික්ම සස්නට පැමිණියේ වේ නම්, හෙද ආශ්‍රවක්‍ෂය හෙතුයෙන් අනාශ්‍රව වූ චෙතොවිමුක්ති ප්‍රඥාවිමුක්ති ඉහාත්මයෙහි ම තමා විසින් දැන පසක් කොට සපයා වාස කෙරෙයි. ආශ්‍රවක්‍ෂයහෙතුයෙන් ශ්‍රමණ වෙයි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සතුටු සිතැති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේගේ බස අභිනන්දන කළහ.

චූලඅස්සපුර සූත්‍රය දසවැනියි.

මහායමක වග සතරවැනියි.

ඒ වග්ගයාගේ උද්දානය:

('එකං සමයං භගවා නාදිකෙ විහරති ගිඤ්ජකාවසථෙ' යනාදීන් ආරබ්ධ) චූලගොසිඞ්ග සූත්‍රය හා ('එකං සමයං භගවා ගොසිඞ්ගසාලවන දායෙ විහරති' යනාදීන් ආරබ්ධ) මහා ගොසිඞ්ග සූත්‍රය යන සූත්‍ර දෙක ය, (අභබ්බො ගොගණං පරිහරිතුං, යනාදීන් වදාළ) මහාගොපාලක සූත්‍රය, (ජිණ්ණං පාපිමතො සොතං'ති 'පාපිමතො' යනු සඳහන් ලත්) චූලගොපාලක සූත්‍ර ය, නැවත චූලසච්චක සූත්‍ර ය හා (අනඳ තෙරණුවන් විසින් 'සාධු භන්තෙ භගවා මුහුත්තං නිසීදතු'යි භගවත්හුගේ ගමනනිෂෙධය කළ සෙ සඳහන් වන) මහාසච්චක සූත්‍රය, (පහයෙහි වැනුම් හා මුගලන් තෙරණුවන් කළ ඉද්ධියෙන් එහි සැලුම් ආදිය ද, 'සක්කං දෙවානමින්දං සංවිග්ගං ලොමහට්ඨජාතං'යි ත්‍රස්ත ඉන්ද්‍රයා ද සඳහන් ලත්) චූලතණ්හාසඞ්ඛය සූත්‍ර ය, ('සාතිස්ස නාම භික්ඛුනො කෙවට්ටපුත්තස්ස' යනාදීන් දෘෂ්ටිගතය සඳහන් ලත්) මහාතණ්හාසඞ්ඛය සූත්‍ර ය, මහාඅස්සපුර සූත්‍ර ය, ('තස්මා න ජටිලකස්ස ජටාධාරණමත්තෙන සාමඤ්ඤං වදාමි'යි 'ජටිලක'යා පර්‍යවසාන කොට තබා මහණුවම් නගනගා වදාළ සෙ සඳහන් ලත්) චූලඅස්සපුර සූත්‍රයෙතැ යි මෙසේ මහායමකවර්ගය' නිමියේ යි.

5. චූළයමකවග්ගො

1. 5. 1.

සාලෙය්‍යකසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන සාලා නාම කොසලානං බ්‍රාහ්මණගාමො තදවසරි

2. අස්සොසුං ඛො සාලෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා: "සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං සාලං අනුප්පත්තො. තං ඛො පන භවන්තං[1] ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං, සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා[2] සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං. කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී"ති.

3. අථ ඛො සාලෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං[3] වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ යෙන භගවා තෙනඤ්ජලිං පනාමෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ භගවතො සන්තිකෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො සාලෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා භගවන්තං එතදවොචුං:

4. කො නු ඛො භො ගොතම හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති?[4] කො පන භො ගොතම හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති?

5. අධම්මචරියා විසමචරියා හෙතු ඛො ගහපතයො එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති. ධම්මචරියා සමචරියා හෙතු ඛො ගහපතයො එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

---

1. භගවන්තං, සී. 2. අභිඤ්ඤාය, සී. කත්ථචි. 3. සාරණීයං, මජසං.
4. උපපජ්ජන්ති, සී. 5. ඛො පන භවං, සයා.

5. චූළයමක වග්ගය

1. 5. 1.

සාලෙය්‍යක සූත්‍රය

1 මා විසින් මෙසේ අසනලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ මහභික්සඟන හා සමඟ කොසොල් දනව්වෙහි (අතුරිතචාරිකා විසින්) සැරිසරනසේක් කොසොල්රටියන්ගේ සාලා නම් බමුණු ගමට වැඩිසේක.

2. සාලා බමුණුගැමි බමුණු ගැහැවියෝ "භවත්නි, සැහැපුත්, සැහැකුලෙන් පැවිදිපත්, මහණගොයුම්හු මහභික්සඟන හා සමඟ කොසොල් දනව්හි සැරිසරනසේක් සාලාගමට වැඩිසේක්ල. ඒ භවත් ගොයුම් ගොතුවත්ගේ මෙබඳු කලණ යසසි පැතැනැඟිණ: ඒ භගවත්හු මෙ කරුණිනුදු අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, විද්‍යාචරණසම්පන්නයහ, සුගතයහ, ලොකවිත්හ, අනුත්තර පුරුෂදම්‍යසාරථියහ, දෙව්මිනිස්නට ශාස්තෲයහ, බුද්ධයහ, භගවත්හ. ඒ භගවත්හු දෙවියන් සහිත මරුන් සහිත මෙලොව හා, මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාව තමා විසින් දැන පසක් කොට දත්වත් ඒ භගවත්හු ආදිකල්‍යාණ කොට මධ්‍යකල්‍යාණ කොට පර්‍ය්‍යවසාන කල්‍යාණ කොට සාර්‍ථ කොට සව්‍යඤ්ජන කොට දහම් දෙසත්. කෙවලපරිපූර්ණ පරිශුද්ධ බඹසර පවසත්. එවත් රහතුන් දස්නෙක් වේ නම් මනා මැ තු"යි ඇසූහු මැයි.

3. එසඳ සාලාගම බමුණු ගැහැවියෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හුන්හ. කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ හා සමඟ සතුටු වූහු තුස්නට නිසි සිහිකරන්නට නිසි කථා කොට නිමවා එකත්පස් ව හුන්හු. කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ එකත් පස්ව හුන්හු. කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ හමියෙහි තම්ගොත් අස්වා එකත්පස් ව හුන්හු. කෙනෙක් නිහඬ ව එකත්පස් ව හුන්හු. එකත්පස් ව හුන් සාලාගම බමුණුගැහැවියෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කළහ:

4. භවත් ගොයුම් ගොතුව, යම් හෙයෙකින් මෙලොව කිසි සත්ත්ව කෙනෙක් කාබුත් මරණින් මතුයෙහි සැපෙත් පහ ව ගිය, නපුරුගති ඇති, විනිපාත වූ, නිරා වැදූ ගනිද්ද, එයට හෙතු කවරේ ය? ප්‍රත්‍යය කවරේ ය? භවත් ගොයුම්ගොතුව, යම් හෙයෙකින් මෙලොව කිසි සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතුයෙහි මනාගති ඇති සවර්ගලොකයට වැද ගනිද්ද, එයට හෙතු කවරේ ය? ප්‍රත්‍යය කවරේ ය?යි පුළුවුත් හු.

5. ගැහැවියෙනි, අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා හෙතුයෙන් මෙසේ මෙලොව කිසි සත්ත්ව කෙනෙක් කාබුත් මරණින් මතුයෙහි සැපෙන් වෙත් ව සිටි, නපුරුගති ඇති, විනිපාත වූ නිරා වැදගනිති. ගැහැවියෙනි, ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා හෙතුයෙන් මෙසේ මෙලොව කිසි සත්ත්ව කෙනෙක් කාබුත් මරණින් මතුයෙහි මනාගති ඇති සවර්ගලොකයට වැද ගනිතියි වදාළහ.

6. න ඛො මයං ඉමස්ස භොතො ගොතමස්ස සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං ආජානාම. සාධු නො භවං ගොතමො තථා ධම්මං දෙසෙතු යථා මයං ඉමස්ස භොතො ගොතමස්ස සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං ආජානෙය්‍යාමාති. තෙන හි ගහපතයො සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. එවං භොති ඛො සාලෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා භගවතො පච්චස්සොසුං භගවා එතදවොච:

7 තිවිධං ඛො ගහපතයො කායෙන අධම්මචරියා විසමචරියා හොති. චතුබ්බිධං වාචාය අධම්මචරියා විසමචරියා හොති. තිවිධං මනසා අධම්මචරියා විසමචරියා හොති.

8. කථඤ්ච ගහපතයො තිවිධං කායෙන අධම්මචරියා විසමචරියා හොති? ඉධ ගහපතයො එකච්චො පාණාතිපාතී හොති ලුද්දො[1] ලොහිතපාණී හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො[2] පාණභූතෙසු.[3] අදින්නාදායී ඛො පන හොති, යං තං පරස්ස පරවිත්තූපකරණං ගාමගතං වා අරඤ්ඤගතං වා අදින්නං[4] ථෙය්‍යසඞ්ඛාතං ආදාතා හොති. කාමෙසු මිච්ඡාචාරී ඛො පන හොති, යා තා මාතුරක්ඛිතා පිතුරක්ඛිතා මාතාපිතුරක්ඛිතා[5] භාතුරක්ඛිතා භගිනීරක්ඛිතා ඤාතිරක්ඛිතා ගොත්තරක්ඛිතා ධම්මරක්ඛිතා[6] සස්සාමිකා සපරිදණ්ඩා, අන්තමසො මාලාගුණපරික්ඛිත්තාපි, තථාරූපාසු චාරිත්තං ආපජ්ජිතා හොති. එවං ඛො ගහපතයො තිවිධං කායෙන අධම්මචරියා විසමචරියා හොති.

9. කථඤ්ච ගහපතයො චතුබ්බිධං වාචාය අධම්මචරියා විසමචරියා හොති? ඉධ ගහපතයො එකච්චො මුසාවාදී හොති සභාගතො[7] වා පරිසගතො[8] වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුල මජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො:[9] 'එහම්භො[10] පුරිස යං ජානාසි තං වදෙහී'ති. සො අජානං වා ආහ ජානාමීති, ජානං වා ආහ න ජානාමීති, අපස්සං වා ආහ පස්සාමීති, පස්සං වා ආහ න පස්සාමීති. ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිස කිඤ්චික්ඛහෙතු වා සම්පජානමුසා භාසිතා හොති. පිසුණාවාචො[11] ඛො පන හොති: ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති සමග්ගානං වා භෙත්තා[12] භින්නානං වා අනුප්පදාතා, වග්ගාරාමො වග්ගරතො වග්ගනන්දී වග්ගකරණිං[13] වාචං භාසිතා හොති. ඵරුසාවාචො[14] ඛො පන හොති. යා සා වාචා අණ්ඩකා[15] කක්කසා පරකටුකා පරාභිසජ්ජනී කොධසාමන්තා අසමාධිසංවත්තනිකා, තථාරූපිං වාචං භාසිතා හොති. සම්ඵප්පලාපී ඛො පන හොති: අකාලවාදී අභූතවාදී අනත්ථවාදී අධම්මවාදී අවිනයවාදී අනිධානවතිං වාචං[16] භාසිතා[17] අකාලෙන අනපදෙසං අපරියන්තවතිං අනත්ථසංහිතං. එවං ඛො ගහපතයො චතුබ්බිධං වාචාය අධම්මචරියා විසමචරියා හොති.

---

1. ලුද්දො දාරුණො, මජ්ඣං
2. අලජ්ජී අදයාපන්නො, සයා.
3. සබ්බපාණභූතෙසු, මජ්ඣං සයා
4. තං අදින්නං, මජ්ඣං. සයා. PTS.
5. මාතාපිතුරක්ඛිතා, සීමු PTS. පොත්ථකෙසු නත්ථි
6. ධම්මරක්ඛිතා, සීමු. නත්ථි.
7. සභග්ගතො, සයා
8. පරිසග්ගතො, සයා.
9. සක්ඛිං පුට්ඨො, සයා
10. එවං භො, PTS; සී කත්ථචි.
11. පිසුණවාචො, සයා මජ්ඣං. පිසුණවාචො පන, සී. කත්ථචි.
12. භෙදකො, මජ්ඣං.
13. වග්ගකරණිවාචං, සී, කත්ථචි.
14. ඵරුසවාචො, මජ්ඣං. සයා
15. කණ්ටකා, මජ්ඣං.
16. අනිධානවතීවාචං, සී. කත්ථචි.
17. භාසිතා හොති, සයා.

Free Distribution www.aathaapi.org

6. "විස්තර වශයෙන් අර්ථවිභාග නොකළ, සැකෙවින් වදාළ, භවත් ගෞතමයන් වහන්සේගේ මේ බස පිළිබඳ ව විස්තර වශයෙන් අර්ථභාගය අපි නො දනුම්හ. භවත් ගෞතමයන් විස්තර වශයෙන් අර්ථවිභාග නොකළ, සැකෙවින් වදාළ, මේ බස යම් සේ අපි විස්තර වශයෙන් අර්ථ දැනගන්නෙමු නම්, භවත් ගෞතමයන් වහන්සේ ඒ සැටියෙන් අපට දහම් දෙසනසේක් නම් මැනවැ"යි සැළකළහ. "ගෘහපතියෙනි, එසේ නම් අසව්, මනාකොට මෙනෙහි කරව්, කියමි"යි වදාළහ. "භවත්නි, එසේ යැ"යි සල්ගම් බමුණුගෘහපතියෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ වදාළහ:

7. ගෘහපතියෙනි, කායද්වාරයෙන් අධර්මචර්‍ය්‍යා සඞ්ඛ්‍යාත විෂමචර්‍ය්‍යා ත්‍රිවිධ වෙයි. වාග්ද්වාරයෙන් අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා චතුර්විධ වෙයි. මනොද්වාර-යෙන් අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා ත්‍රිවිධ වෙයි.

8. ගෘහපතියෙනි, කෙසේ කායද්වාරයෙන් අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා ත්‍රිවිධ වේද යත්: ගෘහපතියෙනි, මෙලොව එකෙක් ප්‍රාණිවධ කරනු වෙයි, කෑකුළු වෙයි. ලෙයින් වැකි අත් ඇති වෙයි. මෙරමා කෙටීමෙහි ද මැරීමෙහි ද නිවිෂ්ට වෙයි. ප්‍රාණීන් කෙරෙහි නිදයලු වෙයි. අයිනාදන් කරනුවෙයි. පරා අයත්, එයිත්ම පරාසතු පරා තුටු කරන පිරිකරබඩු ගම්හි තැබුවා වේවායි, අරණ්‍යයෙහි තැබුවා වේවයි ඇද්ද, ඒ නුදුන් දෑය සොරසඞ්ඛ්‍යාතයෙන් (සොරසිතින්) ගන්නා සුළු වෙයි. කාමයෙහි මිසගසර ඇතිවෙයි: මාතුරක්ඛිතා ය, පිතුරක්ඛිතා ය, මාතාපිතුරක්ඛිතා ය, භාතුරක්ඛිතා ය, භගිනිරක්ඛිතා ය ඤාතිරක්ඛිතාය, ගොත්තරක්ඛිතා ය, ධම්මරක්ඛිතා ය, සස්සාමිකා ය, සපරිදණ්ඩා යයි යම් ම ස්ත්‍රී කෙනෙක් ඇද්ද, යටත්පිරිසෙයින් මාලාදාමයෙන් විවාහපිණිස පිරිකෙව් ලද්දියක් හෝ ඇද්ද, එබඳු මාගමුන් කෙරෙහි මිථ්‍යාචාරි භාවයට පැමිණෙනු වෙයි. ගෘහපතියෙනි, මෙසේ කායදොරින් අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා ත්‍රිවිධ වෙයි.

9. ගෘහපතියෙනි, කෙසේ වාග්ද්වාරයෙන් අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා චතුර්විධ වේද යත්: ගෘහපතියෙනි, මෙලොව එකෙක් මුසවා බණනු වෙයි: සෙබෙහි සිටියේ වේවයි, ගම්පිරිස්හි සිටියේ වේවයි, නෑමුළුයෙහි සිටියේ වේව යි, සෙනිකුලන් මැද සිටියේ වේවයි, රජකුලන් මැද මහවිනිසෙහි සිටියේ වේවයි, "එම්බා පුරුෂය, යමක් දන්හි ද, එ කියා"යි පුළුවුස්නා සඳහා අභිමුඛයට කැඳවනලද්දේ ව, සාක්ෂි කොට පුළුවුස්නාලද්දේ ව හේ නොදන්මින් හෝ දන්මි කියයි. දන්මින් හෝ නොදන්මි කියයි, නොදක්මින් හෝ දක්මි කියයි, දක්මින් හෝ නොදක්මි කියයි. මෙසේ ආත්මහෙතුයෙන් වේවයි, පරහෙතුයෙන් වේවයි, අල්පමාත්‍ර අත්ලස්හෙතුයෙන් වේවයි, දැන දැන මුසවා බණනු වෙයි. පිසුනුබස් ඇති වෙයි: මෙහි දී අසා මුන් බිඳුනා සඳහා එතැන කියනු වෙයි, එතැන දී හෝ අසා උන් බිඳුනා සඳහා මුනට කියනු වෙයි. මෙසේ සමගි දෙයගළු බිඳුනේ හෝ වෙයි, බිඳුණු දෙයගළුවන් වියෝවනු සඳහා අනුබල දෙනු හෝ වෙයි. වගී ව සිටිනු දක්නා කැමැතියේ, වගීයෙහි ඇලුම් ඇතියේ, වගීව සිටුනා දැක තුස්නේ (සමග වූවනුදු බිඳී යනසේ) වගී කරන බස් බණනු වෙයි. පරුස් බස් ඇති වෙයි: (ගරහනු අවමනු ඇ වදනින්) අඹු ඇති, කෑකුළු, පරහට කුළු වූ, (චිත්ත දූෂණ උදකරන) මෙරමා සටන, කොපයට අසල්ව සිටුනා, සමාධියට හානිකර යම් ම බස් ඇද්ද, එබඳු බස් බණනු වෙයි. ප්‍රලාප ඇති වෙයි: (යුතුකල් පියා) අයුතුකල කියනු වෙයි, නොවූ දෑය කියනු වෙයි, අර්ථරහිත දෑය කියනු වෙයි, අසවභාව කියනු වෙයි, සංවරවිනය නොකියනු වෙයි, (හෘදයම්ඤ්ජූෂායෙහි) නිදහනට නොනිසි බස් බණනු වෙයි, අකාල-යෙහි සූත්‍රාපදෙශරහිත කොට පර්‍ය්‍යන්තරහිත කොට අනර්ථසංහිත කොට බෙණෙයි. ගෘහපතියෙනි, මෙසේ වචීදොරින් අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා චතුර්විධ වෙයි.

10. කථඤ්ච ගහපතයො තිවිධං මනසා අධම්මචරියා විසමචරියා හොති? ඉධ ගහපතයො එකච්චො අභිජ්ඣාලු හොති: යං තං පරස්ස පරවිත්තූපකරණං තං අභිජ්ඣිතා[1] හොති. 'අහො වත යං පරස්ස තං මම අස්සා'ති. බ්‍යාපන්නචිත්තො ඛො පන හොති පදුට්ඨමනසඞ්කප්පො: ඉමෙ සත්තා හඤ්ඤන්තු වා වජ්ඣන්තු වා උච්ඡිජ්ජන්තු වා විනස්සන්තු වා මා වා අහෙසුං[2] ඉති වා'ති. මිච්ඡාදිට්ඨි[3] ඛො පන හොති විපරීතදස්සනො: නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරො[4] ලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඕපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා[5] සම්මා පටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී'ති. එවං ඛො ගහපතයො තිවිධං මනසා අධම්මචරියා විසමචරියා හොති.

11. එවං අධම්මචරියා විසමචරියා හෙතු ඛො ගහපතයො එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති.[6]

12. තිවිධං ඛො ගහපතයො කායෙන ධම්මචරියා සමචරියා හොති. චතුබ්බිධං වාචාය ධම්මචරියා සමචරියා හොති. තිවිධං මනසා ධම්මචරියා සමචරියා හොති.

13. කථඤ්ච ගහපතයො තිවිධං කායෙන ධම්මචරියා සමචරියා හොති? ඉධ ගහපතයො එකච්චො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති: නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති: යං තං පරස්ස පරිවිත්තූපකරණං ගාමගතං වා අරඤ්ඤගතං වා තං නාදින්නං[7] ථෙය්‍යසඞ්ඛාතං ආදාතා හොති. කාමෙසු මිච්ඡාචාරං පහාය කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති: යා තා මාතුරක්ඛිතා පිතුරක්ඛිතා මාතාපිතුරක්ඛිතා භාතුරක්ඛිතා භගිනිරක්ඛිතා ඤාතිරක්ඛිතා ගොත්තරක්ඛිතා ධම්මරක්ඛිතා සස්සාමිකා සපරිදණ්ඩා, අන්තමසො මාලාගුණපරික්ඛිත්තාපි, තථාරූපාසු න චාරිත්තං ආපජ්ජිතා හොති. එවං ඛො ගහපතයො තිවිධං කායෙන ධම්මචරියා සමචරියා හොති.

1. අභිජ්ඣාතා, මජ්ඣං. PTS. 2. මා වා අහෙසුන්ති, සයා.
3. මිච්ඡාදිට්ඨිකො, මජ්ඣං. සයා. සී. කම්බෝජ 4. පරලොකො, සී. කම්බෝජ.
5. සමග්ගතා, මජ්ඣං. සී. කම්බෝජ 6. උපපජ්ජන්ති, සී. 7. න තං අදින්නං, සයා.

10. ගෘහපතියෙනි, කෙසේ මනොද්වාරයෙන් අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා ත්‍රිවිධ වේ ද යත්: ගෘහපතියෙනි, මෙලොව එකෙක් අභිධ්‍යාබහුල වෙයි. පරා අයත් යම් පිරිකර බඩු ඇද්ද, එබඩු (තමනට වුව මැනැව යන) ලොබ සිතින් බලනු වෙයි. “අහෝ, පරාසතු යම් දෑයෙක් වේ ද, ඒ මා සතු වේවයි” පතනුයේ වෙයි. විපත්සිත් ඇති වෙයි, ද්වෙෂයෙන් දුෂ්ට චිත්තසඞ්කල්ප ඇති වෙයි: “මෙසත්හු ඝාතන ලබත්වයි හෝ, සිඳුනා ලබත්වයි හෝ, නසනුලබත්වයි හෝ, නොහොත් නහමික් වෙත්වයි හෝ” කියායි. විපර්‍ය්‍යාසදර්ශන ඇති මිසදිටුයෙක් (අකුසලදර්ශන ඇතියෙක්) හෝ වෙයි: “දුන් දෑය විපාක නැත. යාගවිපාක නැත. අමුතුවනට පුදු කළ දන විපාක නැත. කුශලාකුශල කර්‍මයන්ගේ ඵලවිපාක නැත. (පරලොව සිටියානට) මෙලෝ නැත. (මෙලෝ සිටියානට) පරලෝ නැත. (මාපියන් කෙරෙහි සම්‍යක් ප්‍රතිපත්ති - මිථ්‍යා ප්‍රතිපත්තියෙන් වන ඵල නැතියෙන්) මවු නැත. පියා නැත. (සැව උපදනා සතුන් නැතියෙන්) ඖපපාතික සත්ත්වයෝ නැත. යම් කෙනෙක් මෙලෝ පරලෝ තමන් විසින් විශිෂ්ටඥානයෙන් පසක් කොට ගෙන පවසද්ද, එබඳු සම්‍යග් ගත, සම්‍යක් ප්‍රතිපන්න මහණ බමුණෝ ලොව නැත” කියායි. ගෘහපතියෙනි, මෙසේ මනදෙරින් අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා ත්‍රිවිධ වෙයි.

11. ගෘහපතියෙනි, මෙසේ අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා හෙතුයෙන් කිසි සත්ත්ව කෙනෙක් මෙසෙයින් කා බුන් මරණින් මතුයෙහි සැපයෙන් පහ ව සිටි, නපුරු ගති ඇති, විවශ ව පතිත වන නිරයට වැද ගතිති.

12. ගෘහපතියෙනි, කායද්වාරයෙන් ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ත්‍රිවිධ වෙයි. වාග්ද්වාරයෙන් ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා චතුර්විධ වෙයි. මනොද්වාරයෙන් ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ත්‍රිවිධ වෙයි.

13. ගෘහපතියෙනි, කෙසේ කාදෙරින් ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ත්‍රිවිධ වේය යත්: ගෘහපතියෙනි, මෙලොව එකෙක් පණිවා හැර පියා පණිවායෙන් දුරුවූයේ වෙයි: බහා ලූ දඬු ඇති ව, බහා ලූ සත් ඇති ව, (පාපජුගුප්සා ලක්‍ෂණ) ලජ්ජා ඇති ව, දයාපන්න ව, සර්‍වසත්ත්ව හිතානුකම්පී ව වාස කෙරෙයි. අයිනාදන් හැර පියා අයිනාදනින් වැළකියේ වෙයි: පරා අයත්, එයින් ම පරාසතු, තුටු උපදවන, පිරිකර බඩු ගම්හි තුබුවා වේවයි, අරන්හි තුබුවා වේවයි ඇද්ද, ඒ නුදුන් දෑය ථෙයසඞ්ඛ්‍යාත සොරසිතින් නොගන්නා නුවූ වෙයි. කාමයෙහි මිසහසර හැර පියා කාමයෙහි මිසහසරින් වැළකියේ වෙයි: මතුරක්‍ෂිතාය, පිතුරක්‍ෂිතාය, මාතාපිතුරක්‍ෂිතාය භාතුරක්‍ෂිතාය, භගිනිරක්‍ෂිතාය, ඥාතිරක්‍ෂිතාය, ගොත්තරක්‍ෂිතාය, ධම්මරක්‍ෂිතාය, සස්සාමිකාය, සපරිදණ්ඩාය යි යම් ස්ත්‍රී කෙනෙක්. ඇද්ද, යටතින් මල්දමින් පිරිකෙව් ලද්දියක් හෝ ඇද්ද, එබඳු මාගමුන් කෙරෙහි මිථ්‍යාචාරිත්වයට නොපැමිණෙනු වෙයි. ගෘහපතියෙනි මෙසේ කායද්වාරයෙන් ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ත්‍රිවිධ වෙයි.

14. කථඤ්ච ගහපතයො චතුබ්බිධං වාචාය ධම්මචරියා සමචරියා හොති? ඉධ ගහපතයො එකච්චො මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති: සභාගතො[1] වා පරිසගතො[2] වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො:[3] 'එහම්භො[4] පුරිස යං ජානාසි තං වදෙහී'ති. සො අජානං[5] වා ආහ න ජානාමීති, ජානං වා ආහ ජානාමීති, අපස්සං වා ආහ න පස්සාමීති,[6] පස්සං වා ආහ පස්සාමීති. ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා න සම්පජානමුසා භාසිතා හොති. පිසුණං වාචං[7] පහාය පිසුණාය වාචාය[8] පටිවිරතො හොති: ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා, සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං[9] භාසිතා හොති.

ඵරුසං වාචං[10] පහාය ඵරුසාය වාචාය[11] පටිවිරතො හොති: යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා තථාරූපිං වාචං භාසිතා හොති. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති: කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී, නිධානවතිං වාචං භාසිතා[12] කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං. එවං ඛො ගහපතයො චතුබ්බිධං වාචාය ධම්මචරියා සමචරියා හොති.

15. කථඤ්ච ගහපතයො තිවිධං මනසා ධම්මචරියා සමචරියා හොති? ඉධ ගහපතයො එකච්චො අනභිජ්ඣාලු හොති: යං තං පරස්ස පරිවිත්තූප-කරණං, තං නාභිජ්ඣිතා[13] හොති: 'අහො වත යං පරස්ස තං මම අස්සා'ති. අබ්‍යාපන්නචිත්තො ඛො පන හොති අප්පදුට්ඨමනසඞ්කප්පො: 'ඉමෙ සත්තා අවෙරා අබ්‍යාපජ්ඣා[14] අනීඝා සුඛී අත්තානං පරිහරන්තූ'ති. සම්මාදිට්ඨී[15] ඛො පන හොති අවිපරීතදස්සනො: 'අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්ථි අයං ලොකො, අත්ථි පරො ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා[16] සම්මාපටිපන්නා, යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී'ති. එවං ඛො ගහපතයො තිවිධං මනසා ධම්මචරියා සමචරියා හොති.

16. එවං ධම්මචරියා සමචරියා හෙතු ඛො ගහපතයො එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති.[17]

---

1. සභග්ගතො, සයා. සීමු කත්ථචි. 2. පරිසග්ගතො, සයා. සීමු. කත්ථචි.
3. සක්ඛිං පුට්ඨො, සයා. 4. එවං භො PTS. සීමු. කත්ථචි. 5. න ජානං. සී.
6. අපස්සාමීති, සී. 7. පිසුණාවාචං, සී. කත්ථචි 8. පිසුණාවාචා, සී. කත්ථචි
9. සමග්ගකරණිවාචං, සී. කත්ථචි. 10. ඵරුසාවාචං, සී. කත්ථචි.
11. ඵරුසාවාචා, සී. කත්ථචි. 12. භාසිතා හොති, සයා
13. නාභිජ්ඣාතා, මජසං PTS. 14. අබ්‍යාපජ්ජා, මජසං.
15 සම්මාදිට්ඨිකො ඛො, මජසං සයා. සී. කත්ථචි. 16. සමග්ගතා, මජසං සයා.
17 උපපජ්ජන්ති, සී.

14. ගැහැවියෙනි, කෙසේ වාග්ද්වාරයෙන් ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා චතුර්විධ වේද යත්: ගැහැවියෙනි, මෙලොව එකෙක් මුසාවා හැරපියා මුසාවායෙන් වැළකියේ වෙයි: සෙබෙහි සිටියේ වේවයි, ගම්පිරිස්හි සිටියේ වේවයි, නෑමුළුයෙහි සිටියේ වේවයි, සේනාසමූහයන් මැද සිටියේ වේවයි, රජකුලයන් මැද මහාවිනිශ්චයෙහි සිටියේ වේවයි, "එම්බා පුරුෂය, යමක් දන්හි ද, එ කියා"යි පුළුවුස්නා සඳහා අභිමුඛයට කැඳවනලදු ව, සාක්ෂි කොට පුළුවුස්නාලදු ව, හේ නොදන්මින් හෝ නො දන්මි කියයි. දන්මින් හෝ දන්මි කියයි. නොදක්මින් හෝ නොදක්මි කියයි. දක්මින් හෝ දක්මි කියයි. මෙසේ ආත්මහෙතුයෙන් වේවයි, පරහෙතුයෙන් වේවයි, අල්පමාත්‍ර අත්ලස්හෙතුයෙන් වේවයි, දැන දැන මුසාවා නො බණනු වෙයි. පිසුනු බස් පියා පිසුනු බසින් වැළකියේ වෙයි. මෙහිදී අසා මුන් බිඳුනා සඳහා එතැන නොකියනු වෙයි. එතැන දී හෝ අසා උන් බිඳුනා සඳහා මුනට නොකියනු වෙයි. මෙසේ බිඳුණු දෙයහළුවන් සන්ධාන කරනු හෝ වෙයි. සමඟි දෙයහළුවන් සන්ධාන සඳහා අනුබල දෙනු හෝ වෙයි. සමඟ ව සිටිනු දක්නා කැමතියේ, සමඟියෙහි ඇලුම් ඇතියේ, සමඟ ව සිටුනා දැක තුස්නේ, සමඟ කරන බස් බණනු වෙයි. පරුෂ් බස් පියා පරුෂ් බසින් වැළකියේ වෙයි. නිදොස්, කනට සුවඳ, පෙම් දනවන, ළගන්නා, පුරවැසියනට නිසි, බොහෝදෙනාට පිය වූ, බොහෝදෙනා මනවඩන යම් බස් ඇද්ද, එබඳු බස් කියනු වෙයි. ප්‍රලාප පියා පලපින් වැළකියේ වෙයි. බුණුව මනා කල් බලා බණනු වෙයි. ඇතිසැටි බණනු වෙයි. අරුත් බණනු වෙයි. දහම් බණනු වෙයි. විනය දහම් බණනු වෙයි. යුතුකල කරුණු සහිත, පිරිසිඳුම් ඇති, අරුත් ඇසිරි කළ ලෙහි නිදහන් කළයුතු බස් බණනු වෙයි. ගැහැවියෙනි, මෙසේ වාග්ද්වාරයෙන් ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා චතුර්විධ වෙයි.

15. ගැහැවියෙනි, කෙසේ මනොද්වාරයෙන් ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ත්‍රිවිධ වේද යත්: ගැහැවියෙනි, මෙලොව එකෙක් අභිධ්‍යාබහුල නොවෙයි. පරාඅයත් එයින් ම පරාසතු තුටු දනවන, යම් පිරිකර බඩු ඇද්ද, ඒ ලොබසිතින් නොබලනු වෙයි: "පරාසතු යම් දෑයෙක් වේද, ඒ මා සතු වේවයි පතනුයේ නොවෙයි. විපන් සිත් ඇති නොවෙයි ද්වේෂයෙන් දූෂට චිත්තසඞ්කල්ප ඇති නොවෙයි. "මේ සත්හු අවෛර ව, අව්‍යාබාධ ව, අනීඝ ව, සුඛිතව ආත්ම පරිහරණ කෙරෙත්වා" කියාය. අවිපරීත දර්ශන ඇති, සම්‍යග් දෘෂ්ටික වෙයි: "දුන් දෑය විපාක ඇත. යාග විපාක ඇත. අමුතුවනට සකස් කළ දන විපාක ඇත. කුශලාකුශලකර්මයන්ගේ ඵලවිපාක ඇත. මෙලෝ ඇත. පරලෝ ඇත. මවු ඇත. පියා ඇත. ඖපපාතික සත්ත්වයෝ ඇත. යම් කෙනෙක් මෙලෝ පරලෝ තමන් විසින් විශිෂ්ට ඥානයෙන් පසක් කොටගෙන පවසද්ද, එබඳු සම්‍යග්ගත, සම්‍යක්ප්‍රතිපන්න මහණ බමුණෝ ලොව ඇත" කියාය. ගැහැවියෙනි, මෙසේ මනදෙරින් ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ත්‍රිවිධ වෙයි.

16. ගැහැවියෙනි, මෙසේ ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා හෙතුයෙන් මෙලොව මෙසේ කිසි සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතුයෙහි ශොභනගති ඇති ස්වර්ගලොකයට වැදගනිති.

17. ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා ඛත්තියමහාසාලානං වා සහව්‍යතං[1] උපපජ්ජෙය්‍යන්ති,[2] ඨානං ඛො පනෙතං විජ්ජති යං සො කායස්ස භෙදා පරම්මරණා ඛත්තියමහාසාලානං වා සහව්‍යතං උපපජ්ජෙය්‍ය. තං කිස්ස හෙතු? තථා හි සො ධම්මචාරී සමචාරී. ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා බ්‍රාහ්මණමහාසාලානං වා -පෙ- ගහපතිමහාසාලානං වා සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති, ඨානං ඛො පනෙතං විජ්ජති යං සො කායස්ස භෙදා පරම්මරණා ගහපතිමහාසාලානං වා සහව්‍යතං උපපජ්ජෙය්‍ය තං කිස්ස හෙතු? තථා හි සො ධම්මචාරී සමචාරී

18. ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති, ඨානං ඛො පනෙතං විජ්ජති යං සො කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය. තං කිස්ස හෙතු? තථා හි සො ධම්මචාරී සමචාරී. ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා තාවතිංසානං දෙවානං -පෙ- යාමානං දෙවානං -පෙ- තුසිතානං දෙවානං -පෙ- නිම්මානරතීනං දෙවානං -පෙ- පරනිම්මිතවසවත්තීනං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති, ඨානං ඛො පනෙතං විජ්ජති යං සො කායස්ස භෙදා පරම්මරණා පරනිම්මිතවසවත්තීනං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය. තං කිස්ස හෙතු? තථා හි සො ධම්මචාරී සමචාරී

19. ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා බ්‍රහ්මකායිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති, ඨානං ඛො පනෙතං විජ්ජති යං සො කායස්ස භෙදා පරම්මරණා බ්‍රහ්මකායිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය. තං කිස්ස හෙතු? තථා හි සො ධම්මචාරී සමචාරී. ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා ආභානං දෙවානං -පෙ- පරිත්තාභානං දෙවානං -පෙ- අප්පමාණාභානං දෙවානං -පෙ- ආභස්සරානං දෙවානං[3] -පෙ- සුභානං දෙවානං -පෙ- පරිත්තසුභානං[4] දෙවාන -පෙ- අප්පමාණසුභානං දෙවානං -පෙ- සුභකිණ්ණකානං[5] දෙවානං -පෙ- වෙහප්ඵලානං දෙවානං -පෙ- අවිහානං දෙවානං -පෙ- අතප්පානං දෙවානං -පෙ- සුදස්සානං දෙවානං -පෙ- සුදස්සීනං දෙවානං -පෙ- අකනිට්ඨකානං දෙවානං -පෙ- ආකාසානඤ්චායතනූපගානං දෙවානං -පෙ- විඤ්ඤාණඤ්චායතනූපගානං දෙවානං -පෙ- ආකිඤ්චඤ්ඤායතනූපගානං දෙවානං -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති, ඨානං ඛො පනෙතං විජ්ජති යං සො කායස්ස භෙදා පරම්මරණා නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය. තං කිස්ස හෙතු? තථා හි සො ධම්මචාරී සමචාරී.

---

1 සබ්‍යතං, මජ්ඣ . සං. PTS.   2. උපපජ්ජෙය්‍යන්ති, සී
3. ආභානං දෙවානං, මජ්සං. PTS. පොත්ථකෙසු න දිස්සති
4. සුභානං දෙවානං සීමු. 1. මජ්සං. පොත්ථකෙසු න දිස්සති
5 සුභකිණ්හානං, මජ්සං සුභකිණ්හකානං සං. සුභකිණ්ණානං PTS.

17. ගැහැවියෙනි, ඉදින් ධම්චාරී සමචාරී පුද්ගල "මම කාබුන් මරණින් මතුයෙහි කැත්මහසල්කුලන්ගේ වේවයි සහභාවයට පැමිණෙම් නම් මනා මැනැ"යි කැමති වේ නම් "හේ කාබුන් මරණින් මතුයෙහි කැත්මහසල් කුලන්ගේ වේවයි, සහභාවයට පැමිණේ" යන තෙල කරුණ සිදු වන්නේ ය. ඒ කවරහෙයින යත්: හේ ධම්චාරී සමචාරී වෙයි. එහෙයින. ගැහැවියෙනි, ඉදින් ධම්චාරී සමචාරී පුද්ගල "මම කාබුන් මරණින් මතුයෙහි බමුණු මහසල්කුලන්ගේ වේවයි, සහභාවයට පැමිණෙම් නම්, මනා මැනැ" යි ... ගැහැවිමහසල්කුලන්ගේ වේවයි සහභාවයට පැමිණෙම් නම් මනා මැනැ" යි කැමති වේ නම්, "හේ කාබුන් මරණින් මතුයෙහි ගැහැවිමහසල් කුලන්ගේ වේවයි සහභාවයට පැමිණේ" යන තෙල කරුණ සිදු වන්නේය. ඒ කවර හෙයින යත්: හේ ධම්චාරී සමචාරී වෙයි. එ හෙයින.

18. ගැහැවියෙනි, ඉදින් ධම්චාරී සමචාරී පුද්ගල "මම කාබුන් මරණින් මතුයෙහි සිවුමහරජවැසි දෙවියන්ගේ සහභාවයට පැමිණෙම් නම් මනා මැනැ"යි කැමති වේ නම් "හේ කාබුන් මරණින් මතුයෙහි සිවුමහරජ වැසි දෙවියන්ගේ සහභාවයට පැමිණේ" යන තෙල කරුණ සිදු වන්නේ ය. ඒ කවර හෙයින යත්: හේ ධම්චාරී සමචාරී වෙයි. එහෙයින.

ගැහැවියෙනි. ඉදින් ධම්චාරී සමචාරී පුද්ගල "මම කාබුන් මරණින් මතුයෙහි තව්තිසාවැසි දෙවියන්ගේ... යාම වැසි දෙවියන්ගේ...තුසී පුර වැසි දෙවියන්ගේ ... නිම්මානරති වැසි දෙවියන්ගේ ... පරනිම්මිතවස වත්තිවැසි දෙවියන්ගේ සහභාවයට පැමිණෙම් නම මනා මැනැ"යි. කැමති වේ නම්, "හේ කාබුන් මරණින් මතුයෙහි පරනිම්මිත වසවත්ති දෙවියන් ගේ සහභාවයට පැමිණේ" යන තෙල කරුණ සිදු වන්නේ ය. ඒ කවර හෙයින යත්: හේ ධම්චාරී සමචාරී වෙයි, එහෙයින.

19. ගැහැවියෙනි, ඉදින් ධම්චාරී සමචාරී පුද්ගල "මම කාබුන් මරණින් මතුයෙහි බ්‍රහ්මකායික දෙවියන්ගේ සහභාවයට පැමිණෙම් නම්, මනා මැනැ"යි කැමති වේ නම්, "හේ කාබුන් මරණින් මතුයෙහි බ්‍රහ්මකායිකදෙවියන්ගේ සහභාවයට පැමිණේ" යන තෙල කරුණ සිදු වන්නේ ය. ඒ කවර හෙයින යත්: හේ ධම්චාරී සමචාරී වෙයි. එ හෙයින. ගැහැවියෙනි, ඉදින් ධම්චාරී සමචාරී පුද්ගල "මම කාබුන් මරණින් මතුයෙහි ආභ දෙවියන්ගේ ... පරිත්තාභ දෙවියන්ගේ ... අප්පමාණාභදෙවියන්ගේ ... ආභස්සරදෙවියන්ගේ ... සුභ දෙවියන්ගේ ... පරිත්තසුභදෙවියන්ගේ .. අප්පමාණසුභදෙවියන්ගේ ... සුභකිණ්ණක දෙවියන්ගේ ... වෙහප්ඵල දෙවියන්ගේ ... අවිහදෙවියන්ගේ... අතප්පදෙවියන්ගේ ... සුදස්ස දෙවියන්ගේ ... සුදස්සී දෙවියන්ගේ ... අකනිට්ඨක දෙවියන්ගේ ... ආකාසානඤ්චායතනූපග දෙවියන්ගේ ... විඤ්ඤාණඤ්චායතනූපග දෙවියන්ගේ...ආකිඤ්චඤ්ඤායතනූපග දෙවියන්ගේ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපග දෙවියන්ගේ සහභාවයට පැමිණෙම් නම් මනා මැනැ"යි කැමැති වේ නම්, "හේ කාබුන් මරණින් මතුයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපග දෙවියන්ගේ සහභාවයට පැමිණේ" යන තෙල කරුණ සිදු වන්නේය, ඒ කවරහෙයින යත්: හේ ධම්චාරී සමචාරී වෙයි. එ හෙයින.

Free Distribution www.aathaapi.org

20. ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී 'අහො වතාහං ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යන්ති. ඨානං ඛො පනෙතං විජ්ජති යං සො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍ය. තං කිස්ස හෙතු? තථා හි සො ධම්මචාරී සමචාරීති[1].

21. එවං වුත්තෙ සාලෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා භගවන්තං එතදවොචුං: "අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය 'චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී'ති, එවමෙවං[2] භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එතෙ මයං භවන්තං[3] ගොතමං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකෙ නො භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතෙ සරණං ගතෙ"ති[4]

සාලෙය්‍යකසුත්තං පඨමං.

1. 5. 2.

වෙරඤ්ජක සුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන වෙරඤ්ජකා බ්‍රාහ්මණගහපතිකා සාවත්ථියං පටිවසන්ති කෙනචිදෙව කරණීයෙන.

2. අස්සොසුං ඛො වෙරඤ්ජකා බ්‍රාහ්මණගහපතිකා. "සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තං ඛො පන භවන්තං[5] ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං, සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා[6] සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං. කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී"ති.

---

1. සමචාරී, මජසං. 2. එවමෙව, මජසං. සයා. 3. භගවන්තං, සී. කාම්බො.
4. සරණගතෙති, සී. කාම්බො. 5. භගවන්තං සී. කාම්බො.
6. අභිඤ්ඤාය කාම්බො

20. ගැහැවියෙනි, ඉදින් ධර්මචාරී සමචාරී පුද්ගල "මම ආශ්‍රවක්ෂයයෙන් අනාශ්‍රව වූ චේතොවිමුක්ති ප්‍රඥාවිමුක්ති දුටුදම්යෙහි ම තමා විසින් දැන පසක් කොට උපයාගෙන වාස කෙරෙම් නම් මනා මැනැවි"යි කැමැති වේ නම්, "හේ ආශ්‍රවක්ෂයයෙන් අනාශ්‍රව වූ චේතොවිමුක්ති - ප්‍රඥාවිමුක්ති දුටුදම්යෙහි ම තමා විසින් දැන පසක් කොට උපයා ගෙන වාස කෙරේ" යන තෙල කරුණ සිදුවන්නේය. ඒ කවර හෙයින යත්: හේ ධර්මචාරී සමචාරී වෙයි. එහෙයින.

21. මෙසේ වදාළ කල්හි සල්ගම් වැසි බමුණු ගැහැවියෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කළහ: භවත් ගොයුම්ගෙතුවෙනි, ඉතා මැනවි, භවත් ගොයුම්ගොතුවෙනි, ඉතා මැනවි. භවත් ගොයුම්ගොතුවෙනි, යම් පරිදි යටිකුරු කළ දැයක් හෝ උඩුකුරු කරන්නේ වේ ද, පිළිසත් දැයක් විවර කරන්නේ වේ ද, මඟ මුළාපත් යමකුට මඟ හෝ කියා පාන්නේ වේද, 'ඇස් ඇතියාහු රූ දක්නාහ' යි අඳුරෙහි තෙල් පහන් දරන්නේ හෝ වේ ද, එපරිදි ම භවත් ගොයුම් ගොතුවන් විසින් නන්නියරින් දහම් පැවසිණ. තෙල අපි භවත් ගෞතමයන් වහන්සේ සරණ කොට යම්හ, ධර්මය හා භික්සඟන ද සරණ කොට යම්හ. භවත් ගෞතමයන් වහන්සේ අද ආදිකොට අප දිවිහිම්යෙන් සරණගත උපාසකයන් සේ රැක්නාසේක්වයි සැල කළහ.

සාලෙය්‍යක සූත්‍රය පළමු වැනියි

1 5. 2.

වෙරඤ්ජක සූත්‍රය

1 මා විසින් මෙසේ අසනලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවත්නුවර 'ජෙතවන' නම් වූ, අනේපිඬු මහසිටාණන්ගේ අරම්හි වැඩවසනසේක. එකල වෙරඤ්ජාවැසි බමුණු ගැහැවිහු කිසියම් කරුණින් සැවත්හි වාස කෙරෙති.

2. වෙරඤ්ජාවැසි බමුණුගැහැවිහු "භවත්නි, සැහැපුත්, සැහැකුලෙන් පැවිදිපත්, මහණගොයුම්හු සැවත් නුවර 'ජෙතවන' නම් වූ, අනේපිඬු මහසිටාණන් අරමෙහි වැඩ වසනසේක්ල. ඒ භවත් ගොයුම් ගොතුවන්ගේ මෙවන් කලණ යසගී උස් ව නැගිණ: ඒ භගවත්හු මෙකරුණිනුදු අර්හත්හ, සම්‍යක්සම්බුද්ධයහ, විද්‍යාචරණ සම්පන්නයහ, සුගතයහ, ලොක-විත්හ, අනුත්තරපුරුෂදම්‍යසාරථියහ, දෙව්මිනිසුන්ට ශාස්තෘයහ, බුද්ධයහ, භගවත්හ. ඒ භගවත්හු දෙවියන් සහිත බඹුන් සහිත මරුන් සහිත මෙලොව හා, මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාව තමාවිසින් දැන, පසක් කොට දන්වති. ඒ භගවත්හු ආදිකල්‍යාණ කොට මධ්‍ය කල්‍යාණ කොට පර්‍යවසාන කල්‍යාණ කොට සාර්ථ කොට සව්‍යඤ්ජන කොට දහම් දෙසති. කෙවලපරිපූර්ණ පරිශුද්ධ බ්‍රහ්මචර්‍යය පවසති. එබඳු රහතුන්ගේ දර්ශනයෙක් වේ නම් මනා මැනැවි" යි ඇසූහු මැයි.

3. අථ ඛො වෙරඤ්ජකා බ්‍රාහ්මණගහපතිකා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ භගවතො සන්තිකෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො වෙරඤ්ජකා බ්‍රාහ්මණගහපතිකා භගවන්තං එතදවොචුං:

4. කො නු ඛො භො ගොතම හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති? කො පන භො ගොතම හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති?

5. අධම්මචරියා විසමචරියා හෙතු ඛො ගහපතයො එවමිධෙකච්චෙ සත්තා කයස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති; ධම්මචරියා සමචරියා හෙතු ඛො ගහපතයො එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති.

6. "න ඛො මයං ඉමස්ස භොතො ගොතමස්ස සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං ආජානාම. සාධු නො භවං ගොතමො තථා ධම්මං දෙසෙතු, යථා මයං ඉමස්ස භොතො ගොතමස්ස සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං ආජානෙය්‍යාමා"ති.

7. තෙන හි ගහපතයො සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. එවං භොති ඛො වෙරඤ්ජකා බ්‍රාහ්මණගහපතිකා භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

8 තිවිධං ඛො ගහපතයො කායෙන අධම්මචාරී විසමචාරී හොති. චතුබ්බිධං වාචාය අධම්මචාරී විසමචාරී හොති. තිවිධං මනසා අධම්මචාරී විසමචාරී හොති.

Free Distribution www.aathaapi.org

3. එක්බිති වෙරඤ්ජාවැසි බමුණුගැහැවිහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හුන්හු. කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ හා සමග සම්මෝදනා කළහ. සම්මෝදනයට නිසි, සිහිකරන්නට නිසි කථා කොට නිමවා එකත්පස්ව හුන්හු. කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ එකත්පස් ව හුන්හු. කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ හමියෙහි නම්ගොත් අස්වා එකත්පස් ව හුන්හු. කෙනෙක් නිහඬ ව එකත්පස් ව හුන්හු. එකත්පස් ව හුන් වෙරඤ්ජාවැසි බමුණු ගැහැවිහු භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කළහ:

4. භවත් ගොයුම්ගොතුව, යම්හෙයෙකින් මෙලොව කිසි සත්ත්ව කෙනෙක් කාබුත් මරණින් මතුයෙහි සැපෙත් පහව සිටි, තපුරු ගති ඇති, විනිපාත වූ නිරය වැද ගනිද්ද, එයට හෙතු කවරේ ය? ප්‍රත්‍යය කවරේ ය? භවත් ගොයුම්ගොතුව, යම්හෙයෙකින් මෙලොව කිසි සත්ත්ව කෙනෙක් කාබුත් මරණින් මතුයෙහි මනාගති ඇති, ස්වර්ගලොකයට වැදගනිද්ද, එයට හෙතු කවරේ ය? ප්‍රත්‍යය කවරේ ය?යි පුළුවුත්හු.

5. ගැහැවියෙනි, අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යාහෙතුයෙන් මෙසේ මෙලොව කිසි සත්ත්ව කෙනෙක් කාබුත් මරණින් මතුයෙහි සැපෙත් වෙන් ව සිටි තපුරුගති ඇති, විනිපාත වූ, නිරයට වැදගනිති ගැහැවියෙනි, ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යාහෙතුයෙන් මෙසේ මෙලොව කිසි සත්ත්ව කෙනෙක් කාබුත් මරණින් මතුයෙහි මනාගති ඇති, ස්වර්ගලොකයට වැදගනිතියි වදාළහ.

6. "භවත් ගොයුම්ගොතුවන් විසින් විස්තර විසින් අර්ථ විභාග නො කළ, සැකෙවින් වදාළ, තෙල බස පිළිබඳ විස්තරාර්ථමාර්ගය අපි නො දනුම්හ. භවත් ගොයුමන් විස්තර විසින් අර්ථවිභාග නොකළ, සැකෙවින් වදාළ තෙල බස ගෙන යම් සැටියෙකින් අපි විස්තර විසින් අර්ථ දැන ගනුමෝ නම්, භවත් ගෞතමයන් වහන්සේ ඒ සැටියෙන් අපට දහම් දෙසන සේක් නම් මනා මැනැ"යි ඔහු සැළකළහ.

7 ගැහැවියෙනි, එකරුණින් අසව, මනා කොට මෙනෙහි කරව, කියම්හ"යි වදාළහ. 'භවත්නි, එසේ යැ'යි වෙරඤ්ජායෙහි වාස කරන බමුණු ගැහැවිහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළහ.

8. ගැහැවියෙනි, කාදොරින් අධර්මචාරී විෂමචාරී පුද්ගල ත්‍රිවිධ වෙයි. වසිදොරින් අධර්මචාරී විෂමචාරී පුද්ගල චතුර්විධ වෙයි. මනදොරින් අධර්ම-චාරී විෂමචාරී පුද්ගල ත්‍රිවිධ වෙයි.

9. කථඤ්ච ගහපතයො තිවිධං කායෙන අධම්මචාරී විසමචාරී හොති? ඉධ ගහපතයො එකච්චො පාණාතිපාතී හොති ලුද්දො ලොහිතපාණී හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු. අදින්නාදායී ඛො පන හොති: යං තං පරස්ස පරවිත්තූපකරණං ගාමගතං වා අරඤ්ඤගතං වා අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදාතා හොති. කාමෙසු මිච්ඡාචාරී ඛො පන හොති: යා තා මාතුරක්ඛිතා පිතුරක්ඛිතා මාතාපිතුරක්ඛිතා භාතුරක්ඛිතා භගිනීරක්ඛිතා ඤාතිරක්ඛිතා ගොත්තරක්ඛිතා ධම්මරක්ඛිතා සස්සාමිකා සපරිදණ්ඩා, අන්තමසො මාලාගුණපරික්ඛිත්තාපි, තථාරූපාසු චාරිත්තං ආපජ්ජිතා හොති. එවං ඛො ගහපතයො තිවිධං කායෙන අධම්මචාරී විසමචාරී හොති.

10. කථඤ්ච ගහපතයො චතුබ්බිධං වාචාය අධම්මචාරී විසමචාරී හොති? ඉධ ගහපතයො එකච්චො මුසාවාදී හොති: සභාගතො වා පරිසගතො වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො 'එහම්භො පුරිස යං ජානාසි තං වදෙහී'ති. සො අජානං වා ආහ ජානාමීති, ජානං වා ආහ න ජානාමීති, අපස්සං වා ආහ පස්සාමීති, පස්සං වා ආහ න පස්සාමීති. ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා සම්පජානමුසා භාසිතා හොති. පිසුණාවාචො ඛො පන හොති: ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය, ඉති සමග්ගානං වා භෙත්තා භින්නානං වා අනුප්පදාතා, වග්ගාරාමො වග්ගරතො වග්ගනන්දී වග්ගකරණිං වාචං භාසිතා හොති. ඵරුසාවාචො ඛො පන හොති: යා සා වාචා අණ්ඩකා[1] කක්කසා පරකටුකා පරාභිසජ්ජනී කොධසාමන්තා අසමාධිසංවත්තනිකා, තථාරූපිං වාචං භාසිතා හොති. සම්ඵප්පලාපී ඛො පන හොති: අකාලවාදී අභූතවාදී අනත්ථවාදී අධම්මවාදී අවිනයවාදී අනිධානවතිං වාචං භාසිතා[2] අකාලෙන අනපදෙසං අපරියන්තවතිං අනත්ථසංහිතං. එවං ඛො ගහපතයො චතුබ්බිධං වාචාය අධම්මචාරී විසමචාරී හොති.

11. කථඤ්ච ගහපතයො තිවිධං මනසා අධම්මචාරී විසමචාරී හොති? ඉධ ගහපතයො එකච්චො අභිජ්ඣාලු හොති: යං තං පරස්ස පරවිත්තූපකරණං තං අභිජ්ඣිතා හොති: 'අහො වත යං පරස්ස තං මම අස්සා'ති.

1. කණ්ඩකා - මජසං, 2. භාසිතා හොති - සභා,

9 ගැහැවියෙනි, කෙසේ කාදොරින් අධර්මචාරී විෂමචාරී පුද්ගල ත්‍රිවිධ වේද යත්: ගැහැවියෙනි, මෙලොව එකෙක් පණිවා කරනු වෙයි: දරුණු වෙයි, ලෙයින් වැකි අතැති වෙයි, මෙරමා කොටීමෙහිදු මැරීමෙහිදු නිවිෂ්ට වෙයි, ප්‍රාණීන් කෙරෙහි දයාරහිත වෙයි. අයිනාදන් ගනු වෙයි, පරා අයත්, පරාසතු තුටු දනවන පිරිකර බඩු ගමෙහි තුබුවා වේවයි, අරත්හි තුබුවා වේවයි ඇද්ද, ඒ නුදුන් දෑය ථෙය්‍යසඞ්ඛ්‍යාතයෙන් (සොර සිතින්) ගන්නා සුලු වෙයි. කාමයෙහි මිසහසර ඇති වෙයි: මාතුරක්ඛිතාය, පිතුරක්ඛිතාය, මාතාපිතුරක්ඛිතාය, භාතුරක්ඛිතාය, භගිනිරක්ඛිතාය, ඤාතිරක්ඛිතාය, ගොත්තරක්ඛිතාය, ධම්මරක්ඛිතාය, සස්සාමිකාය, සපරිදණ්ඩාය යි යම් ම ස්ත්‍රී කෙනෙක් ඇද්ද, යටකිත් මල්දමින් පිරිකෙව් ලද්දියක් හෝ ඇද්ද, එබඳු මාගමුන් කෙරෙහි මිථ්‍යාචාරිත්වයට පැමිණෙනු වෙයි. ගැහැවියෙනි, මෙසේ කයින් අධර්මචාරී විෂමචාරී පුද්ගල ත්‍රිවිධ වෙයි.

10. ගැහැවියෙනි, කෙසේ වචනයෙන් අධර්මචාරී විෂමචාරී පුද්ගල චතුර්විධ වේද යත්: ගැහැවියෙනි මෙලොව එකෙක් මුසවා බණනු වෙයි: සබෙහි සිටියේ වේවයි, ගම්පිරිස්හි සිටියේ වේවයි, නෑමුළුයෙහි සිටියේ වේවයි, සෙනිකුලන් මැද සිටියේ වේවයි, රජකුලන් මැද මහවිනිසෙහි සිටියේ වේවයි 'එම්බා පුරුෂය, යමක් දන්හි ද, ඒ කියා''යි පුළුවුස්නා සඳහා ඉදිරියට කැඳවනු ලදු ව, සාක්ෂි කොට පුළුවුස්නාලදු ව, හේ නොදත්මින් හෝ දත්මි කියයි, දත්මින් හෝ නොදත්මි කියයි, නො දක්මින් හෝ දක්මි කියයි, දක්මින් හෝ නොදක්මි කියයි. මෙසේ ආත්මහෙතුයෙන් වේවයි, පරහෙතුයෙන් වේවයි, අල්පමාත්‍ර අත්ලස් හෙතුයෙන් වේවයි, දැන දැන මුසවා බණනු වෙයි. පිසුනු බස් ඇති වෙයි: මෙහිදී අසා මුන් බිඳුනා සඳහා එතැන කියනු වෙයි. එතැන දී හෝ අසා උන් බිඳුනා සඳහා මුනට කියනු වෙයි. මෙසේ සමගි දෙයහළු බිඳිනු හෝ වෙයි. බිඳුනු දෙයහළුවන් අසන්ධාන සඳහා අනුබල දෙනු හෝ වෙයි. වගී ව සිටිනු දක්නා කැමැතියේ, වගීයෙහි ඇලුම් ඇතියේ, වගී ව සිටුනා දැක තුස්තේ, (සමග වූවනුදු බිඳීයන සේ) වග කරන බස් බණනු වෙයි. පරුස් බස් ඇති වෙයි: (ගරහනු අවමනු ඈ වදනින්) අඹු ඇති, කැකුළු, පරාහට කුළු වූ, (චිත්ත දූෂණ උද කරන) මෙරමා සවන කොපයට අසල් ව සිටුනා, සමාධියට ඝාතිකර යම් ම බස් ඇද්ද, එබඳු බස් බණනු වෙයි. පලප් ඇති වෙයි: (යුතුකල් පියා) අයුතු කල කියනු වෙයි. නො වූ දෑය කියනු වෙයි. අර්ථරහිත දෑය කියනු වෙයි. අසව-භාව කියනු වෙයි. සංවර විනය නොකියනු වෙයි. (ලෙහි) නිදහනට නොනිසිබස් බණනු වෙයි. අකාලයෙහි සූත්‍රාපදෙශ රහිත කොට පර්‍යන්ත රහිත කොට අනර්ථසංහිත කොට බෙණේ. ගැහැවියෙනි, මෙසේ වචනයෙන් අධර්මචාරී විෂමචාරී පුද්ගල චතුර්විධ වෙයි.

11. ගැහැවියෙනි, කෙසේ මනසින් අධර්මචාරී විෂමචාරී පුද්ගල ත්‍රිවිධ වේද යත්: ගැහැවියෙනි, මෙලොව එකෙක් අභිධ්‍යා බහුල වෙයි පරා අයත්, යම් ම තුටු කරන පිරිකර බඩු ඇද්ද, එබඩු (තමනට වුව මැනව යන) ලොබ සිතින් බලනු වෙයි: ''යහන, පරාසතු යම් දෑයක් වේ ද ඒ මා සතු වේවා'' කියා ය.

බ්‍යාපන්නචිත්තො ඛො පන හොති පදුට්ඨමනසඞ්කප්පො: 'ඉමෙ සත්තා හඤ්ඤන්තු වා වජ්ඣන්තු වා උච්ඡිජ්ජන්තු වා විනස්සන්තු වා, මා වා අහෙසුං ඉති වා'ති. මිච්ඡාදිට්ඨි[1] ඛො පන හොති විපරීතදස්සනො: නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරො ලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඕපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති. එවං ඛො ගහපතයො තිවිධං මනසා අධම්මචාරී විසමචාරී හොති.

12. එවං අධම්මචරියා විසමචරියා හෙතු ඛො ගහපතයො එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති.

13. තිවිධං ඛො ගහපතයො කායෙන ධම්මචාරී සමචාරී හොති. චතුබ්බිධං වාචාය ධම්මචාරී සමචාරී හොති. තිවිධං මනසා ධම්මචාරී සමචාරී හොති.

14. කථඤ්ච ගහපතයො තිවිධං කායෙන ධම්මචාරී සමචාරී හොති? ඉධ ගහපතයො එකච්චො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති, නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති: යන්තං පරස්ස පරවිත්තූපකරණං ගාමගතං වා අරඤ්ඤගතං වා, තං නාදින්නං ථෙය්‍යසඞ්ඛාතං න ආදාතා හොති. කාමෙසු මිච්ඡාචාරං පහාය කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති. යා තා මාතුරක්ඛිතා පිතුරක්ඛිතා මාතාපිතුරක්ඛිතා භාතුරක්ඛිතා භගිනිරක්ඛිතා ඤාතිරක්ඛිතා ගොත්තරක්ඛිතා ධම්මරක්ඛිතා සස්සාමිකා සපරිදණ්ඩා, අන්තමසො මාලාගුණපරික්ඛිත්තාපි, තථාරූපාසු න චාරිත්තං ආපජ්ජිතා හොති. එවං ඛො ගහපතයො තිවිධං කායෙන ධම්මචාරී සමචාරී හොති.

15. කථඤ්ච ගහපතයො චතුබ්බිධං වාචාය ධම්මචාරී සමචාරී හොති?. ඉධ ගහපතයො එකච්චො මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති: සභාගතො වා පරිසග්ගතො වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො: 'එහම්භො පුරිස, යං ජානාසි තං වදෙහී'ති සො අජානං වා ආහ න ජානාමීති, ජානං වා ආහ ජානාමීති, අපස්සං වා ආහ න පස්සාමීති, පස්සං වා ආහ පස්සාමී'ති.-

---

1. මිච්ඡාදිට්ඨිකො - මජ්ඣං

Free Distribution www.aathaapi.org

ව්‍යාපන් සිත් ඇත්තේ ද්වේෂයෙන් දුෂ්ට චිත්තසඞ්කල්ප ඇති වෙයි: “මේ සත්හු ඝාතන ලබත්වයි හෝ, වධ ලබත්වයි හෝ, සිඳුනා ලබත්වයි හෝ, නස්නා ලබත්වයි හෝ, නොහොත් නහමක් වෙත්වයි හෝ”යි කියායි. විපර්‍යාස දර්ශන ඇති මිසදුටුවෙක් හෝ වෙයි: “දුන් දෑය විපාක නැත. යාග විපාක නැත. අමුතුවනට පුහුකළ දන විපාක නැත. කුශලාකුශලකර්මයන් ගේ ඵලවිපාක නැත. (පරලොව සිටියාහට) මෙලෝ නැත. (මෙලෝ සිටියාහට) පරලෝ නැත. (මාපියන් කෙරෙහි සම්‍යක් ප්‍රතිපත්ති - මිථ්‍යා ප්‍රතිපත්තියෙන් වන ඵල නැතියෙන්) මවු නැත, පියා නැත. (සැව උපදනා සතුන් නැතියෙන්) ඔපපාතික සත්ත්වයෝ නැත. යම් කෙනෙක් මෙලෝ පර ලෝ තමන් විසින් විශිෂ්ටඥානයෙන් පසක් කොට ගෙන පවසද්ද, එබඳු සම්‍යග්ගත, සම්‍යක් ප්‍රතිපන්න මහණ බමුණෝ ලොව නැත” කියායි. ගැහැවියෙනි, මෙසේ මනසින් අධර්මචාරී විෂමචාරී පුද්ගල ත්‍රිවිධ වෙයි.

12. ගැහැවියෙනි, මෙසේ අධර්මචර්‍යා විෂමචර්‍යා හෙතුයෙන් මෙලොව කිසි සත්ත්ව කෙනෙක් මෙසෙයින් කාබුත් මරණින් මතුයෙහි සැපයෙන් පහ ව සිටි, නපුරු ගති ඇති, විවශ ව පතිත වන නිරයට වැදගනිති.

13. ගැහැවියෙනි, කයින් ධර්මචාරී සමචාරී පුද්ගල ත්‍රිවිධ වෙයි. වචනයෙන් ධර්මචාරී සමචාරී පුද්ගල චතුර්විධ වෙයි. මනසින් ධර්මචාරී සමචාරී පුද්ගල ත්‍රිවිධ වෙයි.

14. ගැහැවියෙනි, කෙසේ කයින් ධර්මචාරී සමචාරී පුද්ගල ත්‍රිවිධ වේද යත්: ගැහැවියෙනි, මෙලොව එකෙක් පණිවා හැරපියා පණිවායෙන් දුරුවූයේ වෙයි. බහාතැබූ දඬු ඇති ව, බහා තැබූ සත් ඇති ව, ලජ්ජා ඇති ව, දයාපන්න ව, සර්වසත්ත්වහිතානුකම්පී ව වාස කෙරෙයි. අයිනාදන් හැරපියා අයිනාදනින් වැළකියේ වෙයි: පරා අයත්, එසින් ම පරා සතු තුවූද පිරිකරබඩු ගම්හි තුබූවා වේවයි. අරණ්හි තුබූවා වේවයි, ඇද්ද, ඒ තුදුන් දෑය සොර්‍ය සඞ්ඛ්‍යාතයෙන් නොගන්නා සුළු වෙයි. කාමයෙහි මිසහසර හැරපියා කාමයෙහි මිසහසරින් වැළැකියේ වෙයි: මාතුරක්ඛිතාය පිතුරක්ඛිතාය, මාතාපිතුරක්ඛිතාය, භාතුරක්ඛිතාය, භගිනිරක්ඛිතාය, ඤාතිරක්ඛිතාය, ගොත්තරක්ඛිතාය, ධම්මරක්ඛිතාය, සස්සාමිකාය, සපරිදණ්ඩායයි යම් ම ස්ත්‍රී කෙනෙක් ඇද්ද, යටතින් මල්දමින් පිරිකෙව් ලද්දියක් හෝ ඇද්ද, එවන් මාගමුන් කෙරෙහි මිථ්‍යාචාරිත්වයට නොපැමිණෙනු වෙයි. ගැහැවියෙනි, මෙසේ කයින් ධර්මචාරී සමචාරී පුද්ගල ත්‍රිවිධ වෙයි

15. ගැහැවියෙනි, කෙසේ වචනයෙන් ධර්මචාරී සමචාරී පුද්ගල චතුර්විධ වේද යත්: ගැහැවියෙනි, මෙලොව එකෙක් මුසාවා හැරපියා මුසාවායෙන් වැළැකියේ වෙයි: සෙබෙහි සිටියේ වේවයි. ගම්පිරිස්හි සිටියේ වේවායි, නෑමුළුයෙහි සිටියේ වේවයි, සෙනිකුලන් මැද සිටියේ වේවයි, රජකුලන් මැද මහවිනිසෙහි සිටියේ වේවයි “එම්බා පුරුෂය, යමක් දන්හි ද, ඒ කියා”යි පුළුවුස්නා සඳහා නෙත්තියට කැඳවන ලදු ව, සාක්ෂි කොට පුළුවුස්නාලදු ව, හේ නොදන්මින් හෝ නොදන්මි කියයි. දන්මින් හෝ දන්මි කියයි. නොදක්මින් හෝ නොදක්මි කියයි, දක්මින් හෝ දක්මි කියයි. -

ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා න සම්පජානමුසා භාසිතා හොති. පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති: ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය, ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා, සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති: යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හොති. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති[1] කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී, නිධානවතිං වාචං භාසිතා[1] කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං. එවං ඛො ගහපතයො චතුබ්බිධං වාචාය ධම්මචාරී සමචාරී හොති.

16. කථඤ්ච ගහපතයො තිවිධං මනසා ධම්මචාරී සමචාරී හොති? ඉධ ගහපතයො එකච්චො අනභිජ්ඣාලු හොති: යං තං පරස්ස පරවිත්තූපකරණං තං නාභිජ්ඣිතා හොති: අහො වත යං පරස්ස තං මම අස්සා'ති. අබ්‍යාපන්නචිත්තො ඛො පන හොති අප්පදුට්ඨමනසඞ්කප්පො: ඉමෙ සත්තා අවෙරා අබ්‍යාපජ්ඣා අනීඝා සුඛී අත්තානං පරිහරන්තූති. සම්මාදිට්ඨී[2] ඛො පන හොති අවිපරීතදස්සනො: අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්ථි අයං ලොකො, අත්ථි පරො ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී'ති. එවං ඛො ගහපතයො තිවිධං මනසා ධම්මචාරී සමචාරී හොති.

17. එවං ධම්මචරියාසමචරියාහෙතු ඛො ගහපතයො එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති.

18. ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී 'අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා ඛත්තියමහාසාලානං වා සහබ්‍යතං[3] උපපජ්ජෙය්‍යන්ති, ඨානං ඛො පනෙතං විජ්ජති යං සො කායස්ස භෙදා පරම්මරණා ඛත්තියමහාසාලානං වා සහබ්‍යතං උපපජ්ජෙය්‍ය. තං කිස්ස හෙතු? තථා හි සො ධම්මචාරී සමචාරී. -

---

1. භාසිතා හොති - සං.
2. සම්මාදිට්ඨිකො - මජ්ඣං.
3. සහබ්‍යතං - මජ්ඣං සං.

මෙසේ ආත්මහෙතුයෙන් වේවයි, පරහෙතුයෙන් වේවයි, ඇලුප් පමණ අත්ලස් හෙතුයෙන් වේවයි, දැන දැන මුසවා නො බණනු වෙයි. පිසුනු බස් පියා පිසුනු බසින් වැළැක්මයේ වෙයි: මෙහිදී අසා මුන් බිඳුනා සඳහා එතැන නොකියනු වෙයි. එතැන දී හෝ අසා උන් බිඳුනා සඳහා මුනට නොකියනු වෙයි. මෙසේ බිඳුණු දෙපසහළුවන් සන්ධාන කරනු හෝ වෙයි. සමඟි දෙපසහළුවන් ගළපනු සඳහා අනුබල දෙනු හෝ වෙයි. සමගි ව සිටිනු දක්නා කැමැත්තේ, සමඟියෙහි ඇලුම් ඇත්තේ, සමගි ව සිටුනා දැක තුස්තේ, සමඟ කරන බස් බණනු වෙයි. පරුෂ බස් පියා පරුස් බසින් වැළැක්මයේ වෙයි: නිදොස්, කනට සුවඳ, පෙම් දනවන, ලගන්නා, පුරට නිසි, බොහෝ දෙනාට ප්‍රිය, බොහෝ දෙනා මනවඩන, යම්බස් ඇද්ද, එබඳු බස් කියනු වෙයි. පලප් පියා පලපින් වැළැක්මයේ වෙයි: කල් බලා බණනු වෙයි. ඇති දැය බණනු වෙයි අරුත් බණනු වෙයි. දහම් බණනු වෙයි. විනය බණනු වෙයි. සුතුකල කරුණු සහිත, පිරිසිඳුම් ඇති, අරුත් ඇසිරි කළ, ලෙහි නිදහන් කල යුතු, බස් බණනු වෙයි. ගෘහපතියෙනි, මෙසේ වචනයෙන් ධර්මචාරී සමචාරී පුද්ගල චතුර්විධ වෙයි.

16. ගෘහපතියෙනි, කෙසේ මනසින් ධර්මචාරී සමචාරී පුද්ගල ත්‍රිවිධ වේද යත්: ගෘහපතියෙනි, මෙලොව එකෙක් අභිධ්‍යාබහුල නොවෙයි. පරා අයත්, යම් පරාසතු තුටුඳ පිරිකරබඩු ඇද්ද, ඒ ලොබසිතින් නොබලනු වෙයි: "අහෝ පරා සතු යම් දෑයෙක් වේද, ඒ මාසතු වේවා" කියායි. විපත් සිත් නැත්තේ ද්වෙෂයෙන් දුෂ්ට චිත්ත සඞ්කල්ප ඇත්තේ නොවෙයි: "මෙසත්හු අවෛර ව, අව්‍යාබාධ ව, අනීඝ ව, සුඛිත ව, ආත්ම පරිහරණ කෙරෙත්වා" කියායි. අවිපරීත දර්ශන ඇති සම්‍යක් දෘෂ්ටික වෙයි: "දුන් දෑය විපාක ඇත, යාගවිපාක ඇත, අමුතුවනට සකස් කළ දන විපාක ඇත, කුශලාකුලකර්මයන්ගේ ඵලවිපාක ඇත, මෙලෝ ඇත, පරලෝ ඇත, මවු ඇත, පියා ඇත, ඔපපාතික සත්ත්වයෝ ඇත, යම් කෙනෙක් මෙලෝ පරලෝ තමන් විසින් විශිෂ්ටඥානයෙන් පසක් කොට ගෙන පවසද්ද, එබඳු සම්‍යග්ගත, සම්‍යක් ප්‍රතිපන්න, මහණබමුණෝ ලොව ඇත" කියායි ගෘහපතියෙනි, මෙසේ මනසින් ධර්මචාරී සමචාරී පුද්ගල ත්‍රිවිධ වෙයි.

17. ගෘහපතියෙනි, මෙසේ ධර්මචර්‍යා සමචර්‍යා හෙතුයෙන් මෙලොව මෙසෙසින් කිසි සත්ත්ව කෙනෙක් කාබුත් මරණින් මතුයෙහි ශොභනගති ඇති ස්වර්ගලොකයට වැදගතිති.

18. ගෘහපතියෙනි, ඉදින් ධර්මචාරී සමචාරී පුද්ගල "මම කාබුත් මරණින් මතුයෙහි ක්ෂත්‍රියමහාසල්කුලන්ගේ වේවයි සහභාවයට පැමිණෙම් නම් මනා මැනු" යි කැමැති වේ නම්, "හේ කාබුත් මරණින් මතුයෙහි ක්ෂත්‍රියමහාසල් කුලන්ගේ වේව යි, සහභාවයට පැමිණේ" යන තෙල කරුණ සිදු වන්නේය ඒ කවර හෙයින යත්: හේ ධර්මචාරී සමචාරී වෙයි. එහෙයින. -

ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී 'අහො වතාහං' කායස්ස භෙදා පරම්මරණා බ්‍රාහ්මණමහාසාලානං වා -පෙ- ගහපතිමහාසාලානං වා සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති, ඨානං ඛො පනෙතං විජ්ජති යං සො කායස්ස භෙදා පරම්මරණා ගහපතිමහාසාලානං වා සහව්‍යතං උපපජ්ජෙය්‍ය. තං කිස්ස හෙතු? තථා හි සො ධම්මචාරී සමචාරී.

19. ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී 'අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති' ඨානං ඛො පනෙතං විජ්ජති යං සො කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය. තං කිස්ස හෙතු? තථා හි සො ධම්මචාරී සමචාරී. ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා තාවතිංසානං දෙවානං -පෙ- යාමානං දෙවානං -පෙ- තුසිතානං දෙවානං -පෙ- නිම්මානරතීනං දෙවානං -පෙ- පරනිම්මිතවසවත්තීනං දෙවානං -පෙ- බ්‍රහ්මකායිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති' ඨානං ඛො පනෙතං විජ්ජති යං සො කායස්ස භෙදා පරම්මරණා බ්‍රහ්මකායිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය. තං කිස්ස හෙතු? තථා හි සො ධම්මචාරී සමචාරී.

20. ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී 'අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා ආභානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති' ඨානං ඛො පනෙතං විජ්ජති යං සො කායස්ස භෙදා පරම්මරණා ආභානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය. තං කිස්ස හෙතු? තථා හි සො ධම්මචාරී සමචාරී. ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී 'අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා පරිත්තාභානං දෙවානං -පෙ- අප්පමාණාභානං දෙවානං -පෙ- සුභානං දෙවානං -පෙ- පරිත්තසුභානං දෙවානං -පෙ- අප්පමාණසුභානං දෙවානං -පෙ- සුභකිණ්ණකානං[1] දෙවානං -පෙ- වෙහප්ඵලානං දෙවානං -පෙ- අවිහානං දෙවානං අතප්පානං දෙවානං -පෙ- සුදස්සානං දෙවානං -පෙ- සුදස්සීනං දෙවානං -පෙ- අකනිට්ඨකානං දෙවානං -පෙ- ආකාසානඤ්චායතනූපගානං දෙවානං -පෙ- විඤ්ඤාණඤ්චායතනූපගානං දෙවානං -පෙ- ආකිඤ්චඤ්ඤායතනූපගානං දෙවානං -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති' ඨානං ඛො පනෙතං විජ්ජති යං සො කායස්ස භෙදා පරම්මරණා නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය. තං කිස්ස හෙතු? තථා හි සො ධම්මචාරී සමචාරී.

1. සුභකිණ්ණකානං - සිමු. සුභකිණ්හකානං - මජසං.

ගෘහපතියෙනි, ඉදින් ධර්මචාරී සමචාරී පුද්ගල "මම කාබුත් මරණින් මතුයෙහි බමුණු මහසල්කුලත්ගේ වේව යි, සහභාවයට පැමිණෙම් නම් මනා මැනැ යි ... ගෘහපතිමහසල්කුලත්ගේ වේව යි සහභාවයට පැමිණෙම් නම් මනා මැනැ"යි කැමැති වේ නම්, "හේ කාබුත් මරණින් මතුයෙහි ගෘහපතිමහසල්කුලත්ගේ වේවයි සහභාවයට පැමිණේ" යන හෙල කරුණ සිදු වන්නේය ඒ කවර හෙයින යත්: හේ ධර්මචාරී සමචාරී වෙයි. එහෙයින.

19. ගෘහපතියෙනි, ඉදින් ධර්මචාරී සමචාරී පුද්ගල "මම කාබුත් මරණින් මතුයෙහි සිවුමහරජ වැසි දෙවියන්ගේ සහභාවයට පැමිණෙම් නම් මනා මැනැ"යි කැමති වේ නම්, "හේ කාබුත් මරණින් මතුයෙහි සිවුමහරජ වැසි දෙවියන්ගේ සහභාවයට පැමිණේ" යන හෙල කරුණ සිදු වන්නේ ය. ඒ කවර හෙයින යත්: හේ ධර්මචාරී සමචාරී වෙයි. එහෙයින. ගෘහපතියෙනි, ඉදින් ධර්මචාරී සමචාරී පුද්ගල "මම කාබුත් මරණින් මතුයෙහි තවුතිසා වැසි දෙවියන්ගේ ... යාම වැසි දෙවියන්ගේ ... තුසීපුරවැසිදෙවියන්ගේ ... නිම්මාණරති වැසි දෙවියන්ගේ ... පරනිම්මිතවසවත්ති වැසි දෙවියන්ගේ ... බ්‍රහ්මකායික දෙවියන්ගේ සහභාවයට පැමිණෙම් නම් මනා මැනැ"යි කැමති වේ නම්, "හේ කාබුත් මරණින් මතුයෙහි බ්‍රහ්මකායික දෙවියන්ගේ සහභාවයට පැමිණේ" යන හෙල කරුණ සිදු වන්නේ ය. ඒ කවරහෙයින යත්: හේ ධර්මචාරී සමචාරී වෙයි. එහෙයින.

20. ගෘහපතියෙනි, ඉදින් ධර්මචාරී සමචාරී පුද්ගල "මම කාබුත් මරණින් මතුයෙහි ආභදෙවියන්ගේ සහභාවයට පැමිණෙම් නම් මනා මැනැ"යි කැමති වේ නම්, "හේ කාබුත් මරණින් මතුයෙහි ආභදෙවියන්ගේ සහභාවයට පැමිණේ" යන හෙල කරුණ සිදු වන්නේය. ඒ කවර හෙයින යත්: හේ ධර්මචාරී සමචාරී වෙයි. එහෙයින. ගෘහපතියෙනි, ඉදින් ධර්මචාරී සමචාරී පුද්ගල "මම කාබුත් මරණින් මතුයෙහි පරිත්තාභ දෙවියන්ගේ ... අප්පමාණාභදෙවියන්ගේ ... ආභස්සර දෙවියන්ගේ ... සුභ දෙවියන්ගේ ... පරිත්තසුභදෙවියන්ගේ ... අප්පමාණසුභ දෙවියන්ගේ ... සුභකිණ්ණක දෙවියන්ගේ ... වෙහප්ඵල දෙවියන්ගේ ... අවිහ දෙවියන්ගේ... අතප්පදෙවියන්ගේ ... සුදස්ස දෙවියන්ගේ ... සුදස්සි දෙවියන්ගේ ... අකනිට්ඨක දෙවියන්ගේ ... ආකාසානඤ්චායතනූපග දෙවියන්ගේ ... විඤ්ඤාණඤ්චායතනූපග දෙවියන්ගේ ... ආකිඤ්චඤ්ඤායතනූපග දෙවියන්ගේ ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපග දෙවියන්ගේ සහභාවයට පැමිණෙම් නම් මනා මැනැ"යි කැමැති වේ නම්, "හේ කාබුත් මරණින් මතුයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපග දෙවියන්ගේ සහභාවයට පැමිණේ" යන හෙල කරුණ සිදු වන්නේය. ඒ කවරහෙයින යත්: හේ ධර්මචාරී සමචාරී වෙයි. එහෙයින.

21 ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහො වතාහං ආසවානං ඛයා අනාසව චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යන්ති' ඨානං ඛො පනෙතං විජ්ජති යං සො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍ය. තං කිස්ස හෙතු? තථා හි සො ධම්මචාරී සමචාරීති.

22. එවං වුත්තෙ වෙරඤ්ජකා බ්‍රාහ්මණගහපතිකා භගවන්තං එතදවොචුං: අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය: චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එතෙ මයං භවන්තං ගොතමං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකෙ නො භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතෙ සරණං ගතෙති.

වෙරඤ්ජකසුත්තං දුතියං

1. 5. 3.

මහාවෙදල්ල සුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා මහාකොට්ඨිතො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං[1] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකොට්ඨිතො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච:

2. "දුප්පඤ්ඤො දුප්පඤ්ඤොති ආවුසො වුච්චති. කිත්තාවතා නු ඛො ආවුසො දුප්පඤ්ඤොති වුච්චතී"ති?

නප්පජානාති නප්පජානාතීති ඛො ආවුසො, තස්මා දුප්පඤ්ඤොති වුච්චති. කිඤ්ච නප්පජානාති? ඉදං දුක්ඛන්ති නප්පජානාති, අයං දුක්ඛසමුදයොති නප්පජානාති, අයං දුක්ඛනිරොධොති නප්පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති නප්පජානාති. නප්පජානාති, නප්පජානාතීති ඛො ආවුසො, තස්මා දුප්පඤ්ඤොති වුච්චති.

---

1. සාරණීයං, මජසං.

21. ගැහැවියෙනි, ඉදින් ධර්මචාරී සමචාරී පුද්ගල "මම ආශ්‍රවක්ෂයයෙන් අනාශ්‍රව වූ චේතොවිමුක්ති ප්‍රඥාවිමුක්ති දුටුදම්යෙහි ම තමා විසින් දැන පසක් කොට උපයාගෙන වාස කෙරෙම් නම්, මනා මැනැ"යි කැමැති වේ නම්, "හේ ආශ්‍රවක්ෂයයෙන් අනාශ්‍රව වූ චේතොවිමුක්ති ප්‍රඥාවිමුක්ති දුටුදම්යෙහි ම තමා විසින් දැන පසක් කොට උපයාගෙන වාස කෙරේ" යන තෙල කරුණ සිදු වන්නේය. ඒ කවර හෙයින යත්: හේ ධර්මචාරී සමචාරී වෙයි. එහෙයින.

22. මෙසේ වදාළ කල්හි වෙරඤ්ජා වැසි බමුණු ගැහැවියෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළහ: භවත් ගොයුම්ගොතුමෙනි, ඉතා මැනැවි. භවත් ගොයුම්ගොතුමෙනි, ඉතා මැනැවි. භවත් ගොයුම්ගොතුමෙනි, යම්පරිදි යටිකුරු කළ දැයක් හෝ උඩුකුරු කරන්නේ වේ ද, පිළිසන් දැයක් විවර කරන්නේ වේද, මඟ මුළාපත් යමකුට මඟ කියා පාන්නේ හෝ වේ ද, එපරිදි ම භවත් ගොයුම්ගොතුවන් විසින් නන්නියරින් දහම් පැවැසිණ. තෙල අපි භවත් ගෞතමයන් වහන්සේ සරණ කොට යම්හ. ධර්මය හා භික්සඟන ද සරණ කොට යම්හ. භවත් ගෞතමයන් වහන්සේ අද ආදි කොට දිවිහිම්යෙන් සරණ ගත උපාසකයන් සේ අප රැක්නා සේක්වයි සැලකළහ.

වෙරඤ්ජක සූත්‍රය දෙවැනියි.

1. 5. 3.

මහාවෙදල්ල සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් කාලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර 'ජේතවන' නම් වන, අනේපිඬු මහසිටාණන්ගේ අරම්හි වැඩවසනසේක. එකල ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ සවස්වරුයෙහි පලසමවතින් නැගී සිටියාහු ආයුෂ්මත් සැරියුත් තෙරුණුවන් කරා එළැඹියහ. එළඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා සමග සතුටු වූහ. තුන්නට නිසි සිහිකරනුවට නිසි බස් බැණ නිමවා එකත්පසෙහි හුන්හු. එකත් පසෙක හුන් ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට තෙල සැලකළහ.

2. 'ඇවැත්නි, දුෂ්ප්‍රාඥය, දුෂ්ප්‍රාඥයයි කියනු ලැබේ. ඇවැත්නි, කීපමණෙකින් දුෂ්ප්‍රාඥය යි කියනු ලැබේ ද?''

'නොදනියි නොදනියි' යනු යම් හේතුයෙක් වේ ද, එහෙයින් 'දුෂ්ප්‍රාඥය'යි කියනු ලැබේ. කුමක් නොදන්නේය යත්: 'දුක මේ' යයි නොදන්නේය. 'දුඃඛසමුදය මේ' යයි නොදන්නේය, 'දුඃඛනිරොධ මේ'යයි නොදන්නේය. 'දුඃඛනිරොධගාමිනී ප්‍රතිපත් මේ'යයි නොදන්නේය. ඇවැත්නි, මෙසේ 'නොදනියි නොදනියි' යන යම් හෙතුයෙක් වේද, එහෙයින් 'දුෂ්ප්‍රාඥය'යි කියනු ලැබේ

3. සාධාවුසොති ඛො ආයස්මා මහාකොට්ඨිතො ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා ආයස්මන්තං සාරිපුත්තං උත්තරිං පඤ්හං ආපුච්ඡි:

"පඤ්ඤවා පඤ්ඤවාති ආවුසො වුච්චති. කිත්තාවතා නු ඛො ආවුසො පඤ්ඤවාති වුච්චතී"ති?

පජානාති පජානාතීති ඛො ආවුසො, තස්මා පඤ්ඤවාති වුච්චති. කිඤ්ච පජානාති? ඉදං දුක්ඛන්ති පජානාති, අයං දුක්ඛසමුදයොති පජානාති, අයං දුක්ඛනිරොධොති, පජානාති. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති පජානාති. පජානාති පජානාතීති ඛො ආවුසො, තස්මා පඤ්ඤවාති වුච්චති.

4. "විඤ්ඤාණං විඤ්ඤාණන්ති ආවුසො වුච්චති. කිත්තාවතා නු ඛො ආවුසො විඤ්ඤාණන්ති වුච්චතී"ති?

විජානාති විජානාතීති ඛො ආවුසො, තස්මා විඤ්ඤාණන්ති වුච්චති. කිඤ්ච විජානාති: සුඛන්තිපි විජානාති, දුක්ඛන්තිපි විජානාති, අදුක්ඛමසුඛන්තිපි විජානාති. විජානාති විජානාතීති ඛො ආවුසො, තස්මා විඤ්ඤාණන්ති වුච්චතීති.

5. "යා චාවුසො පඤ්ඤා, යඤ්ච විඤ්ඤාණං ඉමෙ ධම්මා සංසට්ඨා උදාහු විසංසට්ඨා, ලබ්භා ච පනිමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතු"න්ති.

යා චාවුසො පඤ්ඤා, යඤ්ච විඤ්ඤාණං ඉමෙ ධම්මා සංසට්ඨා නො විසංසට්ඨා. න ච ලබ්භා ඉමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතුං. යඤ්චාවුසො පජානාති තං විජානාති. යං විජානාති තං පජානාති. තස්මා ඉමෙ ධම්මා සංසට්ඨා නො විසංසට්ඨා. න ච ලබ්භා ඉමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතුන්ති.

6. "යා චාවුසො පඤ්ඤා, යඤ්ච විඤ්ඤාණං ඉමෙසං ධම්මානං සංසට්ඨානං නො විසංසට්ඨානං කිං නානාකරණ"න්ති?

යා චාවුසො පඤ්ඤා, යඤ්ච විඤ්ඤාණං ඉමෙසං ධම්මානං සංසට්ඨානං නො විසංසට්ඨානං පඤ්ඤා භාවෙතබ්බා, විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං. ඉදං නෙසං නානාකරණන්ති.

7. "වෙදනා වෙදනාති ආවුසො වුච්චති කිත්තාවතා නු ඛො ආවුසො වෙදනාති වුච්චතී"ති?

3. ඇවැත්නි, මැනැවැ”යි කියා ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ගේ බස අභිනන්දන කොට අනුමෝද ව ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් මතුයෙහි පැන පුළුවුත්හ:

“ඇවැත්නි. ‘පැනැතිය පැනැතිය’ යි කියනු ලැබේ. ඇවැත්නි, කිපමණෙකින් පැනැතිය’යි කියනු ලැබේ ද?

ඇවැත්නි, ‘දනී දනී’ යන යම්හෙතුයෙක් වේද, එහෙයින් පැනැතියහ’යි කියනු ලැබේ. කුමක් දන්නේය යත්: ‘දුක මේ’ යයි දන්නේය, ‘දුඃඛසමුදය මේ’යයි දන්නේය ‘දුඃඛනිරොධ මේ’යයි දන්නේය, ‘දුඃඛනිරොධගාමිනී ප්‍රතිපත් මේ’ යයි දන්නේය. ඇවැත්නි, මෙසේ ‘දනී දනී’ යන යම් හෙතුයෙක් වේද, එහෙයින් ‘පැනැතියහ’යි කියනු ලැබේ.

4. “ඇවැත්නි ‘විඥානය විඥානය’යි කියනු ලැබේ. ඇවැත්නි, කිපමණෙකින් ‘විඥාන’යයි කියනු ලැබේ ද?”

ඇවැත්නි, ‘දන්නේය, දන්නේය’ යන යම් හෙතුයෙක් වේද, එහෙයින් විඥානයයි කියනු ලැබේ. කුමක් දන්නේය යත්: ‘සුඛවෙදනා ය’යි ද දන්නේ ය. ‘දුඃඛ වෙදනා ය’ යිද දන්නේය. ‘අදුඃඛාසුඛවෙදනා ය’යි ද දන්නේය. ඇවැත්නි, මෙසේ ‘දන්නේය, දන්නේ ය’ යන යම් හෙතුයෙක් වේද, එහෙයින් ‘විඥාන’ය යි කියනු ලැබේ.

5. “ඇවැත්නි, යම් ප්‍රඥායෙක් ඇද්ද, යම් විඥානයෙක් ඇද්ද, මේ දහම්හු (එකොත්පාදාදි ලකුණින්) සංසට්ඨ (මිශ්‍ර) වෙද්ද?. නොහොත් විසංසට්ඨ (අමිශ්‍ර) වෙද්ද? මේ දහමුන් වෙන් වෙන් කොට වෙනස පනවන්නට හැකි වේ ද?”

ඇවැත්නි, යම් ප්‍රඥායෙක් ඇද්ද, යම් විඥානයෙක් ඇද්ද, මේ දහම්හු සංසට්ඨයහ. මේ දහමුන් (අරමුණු ආදී විසින්) වෙන් වෙන් කොට වෙනස පනවන්නට නො ද හැකිය. ඇවැත්නි, (මාර්ගප්‍රඥාව) යම් චතුස්සත්‍යධර්මයක් (ප්‍රඥානකෘත්‍ය විසින්) දනී ද, (මර්ග විඥානය ද) ඒ දහම (විඥාන කෘත්‍ය විසින්) දන්නේ ය. (මාර්ග විඥානය) යම් චතුස්සත්‍යධර්මයක් (විඥාන කෘත්‍ය විසින්) දනී ද, (මාර්ග ප්‍රඥාව ද) ඒ දහම (ප්‍රඥානකෘත්‍ය විසින්) දනී. එහෙයින් මේ දහම්හු සංසට්ඨයහ. අසංසට්ඨ නො වෙත්. මේ දහමුන් වෙන් වෙන් කොට වෙනස පනවන්නට නො ද හැකිය.

6. “ඇවැත්නි, යම් ප්‍රඥායෙක් ඇද්ද, යම් විඥානයෙක් ඇද්ද, සංසට්ඨ ව සිටි, අසංසට්ඨ නො වන, මේ දහමුන්ගේ වෙනස කිම?”

ඇවැත්නි, යම් ප්‍රඥායෙක් ඇද්ද, යම් විඥානයෙක් ඇද්ද, සංසට්ඨ ව සිටි, අසංසට්ඨ නො වන, මේ දහමුන් අතුරින් (මාර්ග) ප්‍රඥාව භාවිය යුතුය. (විදර්ශනා) විඥානය පරිඥෙය (පිරිසිඳ දත යුතු) වෙයි. මේ උන් දෙදෙනාගේ වෙනස යි.

7 “ඇවැත්නි, ‘වෙදනාය වෙදනාය’ යි කියනු ලැබේ. ඇවැත්නි, කිපමණෙකින් වෙදනා’යයි කියනු ලැබේ ද?”

වෙදෙති වෙදෙතීති ඛො ආවුසො, තස්මා වෙදනාති වුච්චති. කිඤ්ච වෙදෙති? සුඛම්පි වෙදෙති, දුක්ඛම්පි වෙදෙති, අදුක්ඛමසුඛම්පි වෙදෙති. වෙදෙති වෙදෙතීති ඛො ආවුසො, තස්මා වෙදනාති වුච්චතීති

8 "සඤ්ඤා සඤ්ඤාති ආවුසො වුච්චති. කිත්තාවතා නු ඛො ආවුසො සඤ්ඤාති වුච්චති"ති?

සඤ්ජානාති සඤ්ජානාතීති ඛො ආවුසො, තස්මා සඤ්ඤාති වුච්චති. කිඤ්ච සඤ්ජානාති? නීලකම්පි සඤ්ජානාති, පීතකම්පි සඤ්ජානාති, ලොහිතකම්පි සඤ්ජානාති, ඔදාතම්පි සඤ්ජානාති සඤ්ජානාති, සඤ්ජානාතීති ඛො ආවුසො, තස්මා සඤ්ඤාති වුච්චති.

9. "යා චාවුසො වෙදනා යා ච සඤ්ඤා යඤ්ච විඤ්ඤාණං ඉමෙ ධම්මා සංසට්ඨා උදාහු විසංසට්ඨා, ලබ්භා ච පනිමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතු"න්ති?

යා චාවුසො වෙදනා යා ච සඤ්ඤා යඤ්ච විඤ්ඤාණං ඉමෙ ධම්මා සංසට්ඨා නො විසංසට්ඨා. න ච ලබ්භා ඉමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතුං. යඤ්චාවුසො වෙදෙති තං සඤ්ජානාති, යං සඤ්ජානාති තං විජානාති, තස්මා ඉමෙ ධම්මා සංසට්ඨා නො විසංසට්ඨා. න ච ලබ්භා ඉමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතුන්ති

10. "නිස්සට්ඨෙන හාවුසො පඤ්චහි ඉන්ද්‍රියෙහි පරිසුද්ධෙන මනොවිඤ්ඤාණෙන කිං නෙය්‍ය"න්ති?

නිස්සට්ඨෙන හාවුසො පඤ්චහි ඉන්ද්‍රියෙහි පරිසුද්ධෙන මනොවිඤ්ඤාණෙන අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං නෙය්‍යං, අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං නෙය්‍යං, නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං නෙය්‍යන්ති.

11. "නෙය්‍යං පනාවුසො ධම්මං කෙන පජානාතී"ති,

නෙය්‍යං ඛො ආවුසො ධම්මං පඤ්ඤාචක්ඛුනා පජානාතීති.

12. "පඤ්ඤා පනාවුසො කිමත්ථියා"ති?

පඤ්ඤා ඛො ආවුසො අභිඤ්ඤත්ථා පරිඤ්ඤත්ථා පහානත්ථාති.

ඇවැත්නි, 'විඳුතේය විඳුතේ'ය යන යම් හෙතුයෙක් වේ ද, එහෙයින් 'වෙදනා'යයි කියනු ලැබේ. කුමක් විඳුනේය යත්: සුව අරමුණ ද විඳුතේය. දුක්අරමුණද විඳුතේ ය. නොදුක් නොසුව අරමුණද විඳුතේය. ඇවැත්නි, මෙසේ, 'විඳුතේය විඳුතේ'යයි යම් හෙතුයෙක් වේද, එහෙයින් 'වෙදනා' යයි කියනු ලැබේ.

8 "ඇවැත්නි, 'සංඥා, සංඥා'යයි කියනු ලැබේ ඇවැත්නි, කිපමණෙකින් 'සංඥා' යයි කියනු ලැබේ ද?"

ඇවැත්නි, 'හඳුනා ගනී, හඳුනා ගනී' යන යම් හෙතුයෙක් වේද, එහෙයින් සංඥා යයි කියනු ලැබේ. කුමක් හඳුනා ගන්නේය යත්: නිල්වන ද, හඳුනාගනී, කහාවන ද හඳුනාගනී ලෙහෙවන ද හඳුනාගනී, සුදුවන ද හඳුනාගනී. ඇවැත්නි මෙසේ 'හඳුනා ගනී, හඳුනාගනී, යන යම් හෙතුයෙක් වේ ද, එහෙයින් 'සංඥා'යි කියනු ලැබේ

9. "ඇවැත්නි, යම් වෙදනායෙක් ඇද්ද, යම් සංඥායෙක් ඇද්ද, යම් විඥානයෙක් ඇද්ද, මේ දහම්හු සංසට්ඨ වෙද්ද? නොහොත් අසංසට්ඨ වෙද්ද? මේ දහමුන් වෙන් වෙන් කොට වෙනස පනවන්නට හැකි වේ ද?"

ඇවැත්නි, යම් වෙදනායෙක් ඇද්ද, යම් සංඥායෙක් ඇද්ද, යම් විඥානයෙක් ඇද්ද, මේ දහම්හු සංසට්ඨයහ. අසංසට්ඨ නො වෙත්. මේ දහමුන් වෙන් වෙන් කොට වෙනස පනවන්නට නො ද හැකිය. ඇවැත්නි, (වෙදනාව) යම් අරමුණක් විඳී ද, (සංඥාව) ඒ අරමුණ හඳුනයි. (සංඥාව) යම් අරමුණක් හඳුනා ද, (විඥානය ද) ඒ අරමුණ (විඥානකෘත්‍ය විසින්) දනී එහෙයින් මේ දහම්හු සංසට්ඨයහ. නොසසට නො වෙත්. මේ දහමුන් වෙන් වෙන් කොට වෙනස පනවන්නට නො ද හැකිය.

10. "ඇවැත්නි, පඤ්චෙන්‍ද්‍රියයන් විසින් පරිත්‍යක්ත, පරිශුද්ධ, මනොවිඥානයෙන් (රූපාවචරචතුර්ථධ්‍යානචිත්තයෙන්) කුමක් දතයුතු ද?"

ඇවැත්නි, පසිඳුරන් විසින් නිඃසෘත, පරිශුද්ධ, මනොවිඥානයෙන් 'ආකාශය අනන්ත'යයි ආකාශානන්ත්‍යායතනය දත යුතුය. 'විඥානය අනන්ත' ය යි විඥානනන්ත්‍යායතනය දත යුතුය 'කිසිදු නැති'යි ආකිඤ්චඤ්ඤායතනය දත යුතුය.

11 "ඇවැත්නි, ඥෙය ධර්මය වනාහි කිමෙකින් දන්නේ ද?"

ඇවැත් නි, ඥෙය වූ ධර්මය ප්‍රඥාචක්ෂුසින් දන්නේය.

12. "ඇවැත්නි, ප්‍රඥා වනාහි කිනම් අර්ථ ඇත් ද?"

ඇවැත්නි, ප්‍රඥාව (අභිඥෙය ධර්ම දනීනුයි) අභිඥා අර්ථ කොට ඇත. (පරිඥෙයධර්ම දනීනුයි) පරිඥා අර්ථ කොට ඇත (ප්‍රහාතව්‍ය ධර්ම පහා නුයි) ප්‍රහාණ අර්ථ කොට ඇත.

13. කති පනාවුසො පච්චයා සම්මාදිට්ඨියා උප්පාදායාති?

ද්වෙ ඛො ආවුසො පච්චයා සම්මාදිට්ඨියා උප්පාදාය: පරතො ච ඝොසො, යොනිසො ච මනසිකාරො. ඉමෙ ඛො ආවුසො ද්වෙ පච්චයා සම්මාදිට්ඨියා උප්පාදායාති.

14. කතීහි පනාවුසො අඞ්ගෙහි අනුග්ගහීතා සම්මාදිට්ඨි චෙතොවිමුත්තිඵලා ච හොති චෙතොවිමුත්තිඵලානිසංසං ච. පඤ්ඤාවිමුත්තිඵලා ච හොති පඤ්ඤාවිමුත්තිඵලානිසංසා චාති?

පඤ්චහි ඛො ආවුසො අඞ්ගෙහි අනුග්ගහීතා සම්මාදිට්ඨි චෙතොවිමුත්තිඵලා ච හොති චෙතොවිමුත්තිඵලානිසංසා ච. පඤ්ඤාවිමුත්තිඵලා ච හොති පඤ්ඤාවිමුත්තිඵලානිසංසා ච: ඉධාවුසො සම්මාදිට්ඨි සීලානුග්ගහීතා ච හොති, සුතානුග්ගහීතා ච හොති, සාකච්ඡානුග්ගහීතා ච හොති, සමථානුග්ගහීතා ච හොති, විපස්සනානුග්ගහීතා ච හොති. ඉමෙහි ඛො ආවුසො පඤ්චහි අඞ්ගෙහි අනුග්ගහීතා සම්මාදිට්ඨි චෙතොවිමුත්තිඵලා ච හොති චෙතොවිමුත්තිඵලානිසංසා ච පඤ්ඤාවිමුත්තිඵලා ච හොති පඤ්ඤාවිමුත්තිඵලානිසංසා චාති.

15. කති පනාවුසො භවාති?

තයො මෙ ආවුසො භවා: කාමභවො රූපභවො අරූපභවොති.

16. කථං පනාවුසො ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති හොතීති?.

අවිජ්ජානීවරණානං ඛො ආවුසො සත්තානං තණ්හාසඤ්ඤොජනානං තත්‍ර තත්‍රාභිනන්දනා එවං ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති හොතීති.

17. කථං පනාවුසො ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති න හොතීති?

අවිජ්ජාවිරාගා ඛො ආවුසො විජ්ජුප්පාදා තණ්හානිරොධා එවං ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති න හොතීති.

18. කතමං පනාවුසො පඨමං ඣානන්ති?

ඉධාවුසො භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදං වුච්චතාවුසො පඨමං ඣානන්ති.

19. පඨමං පනාවුසො ඣානං කතඞ්ගිකන්ති[1]?

පඨමං ඛො ආවුසො ඣානං පඤ්චඞ්ගිකං: ඉධාවුසො පඨමං ඣානං සමාපන්නස්ස භික්ඛුනො විතක්කො ච වත්තති විචාරො ච. පීති ච සුඛඤ්ච චිත්තෙකග්ගතා ච. පඨමං ඛො ආවුසො ඣානං එවං පඤ්චඞ්ගිකන්ති.

1. කති අඞ්ගන්ති, මජසං.

13. ඇවැත්නි, සම්‍යග්දෘෂ්ටි උත්පාදය පිණිස කෙතෙක් ප්‍රත්‍යයයෝ ඇද්ද?

ඇවැත්නි, සම්‍යග්දෘෂ්ටි උත්පාදය පිණිස ප්‍රත්‍යයයෝ දෙදෙනෙක් ඇත: පරතොඝොෂය (සත්ප්‍රාය ධර්ම ශ්‍රවණය) හා යොනිසොමනසිකාරය (තමන්ගේ උපාය මනසිකාරය) හා දෙකයි. ඇවැත්නි, සම්‍යග්දෘෂ්ටිඋත්පාදය පිණිස මොහු දෙදෙන ප්‍රත්‍යය වෙති.

14 ඇවැත්නි, කෙතෙක් අඞ්ගයෙන් වහල ලැබූ සම්‍යග්දෘෂ්ටිය චෙතොවිමුක්තිය ඵල කොට ඇද්ද? චෙතො විමුක්තිඵලය අනුසස් කොට ඇද්ද? ප්‍රඥාවිමුක්තිය ඵලකොට ඇද්ද? ප්‍රඥාවිමුක්තිඵලය අනුසස් කොට ඇද්ද?

ඇවැත්නි, අඞ්ගපසෙකින් අනුග්‍රාහිත සම්‍යග්දෘෂ්ටිය චෙතොවිමුක්තිය ඵල කොට ඇත. චෙතොවිමුක්ති ඵලය අනුසස් කොට ද ඇත. ප්‍රඥා-විමුක්තිය ඵල කොට ඇත. ප්‍රඥාවිමුක්තිඵලය අනුසස් කොට ද ඇත. ඇවැත්නි, මෙහි සම්‍යග්දෘෂ්ටිය ශීලානුග්‍රාහිත ද වෙයි. ශ්‍රුතානුග්‍රාහිත ද වෙයි. සාකච්ඡානුග්‍රාහිත ද වෙයි. සමථානුග්‍රාහිත ද වෙයි. විදර්ශනානුග්‍රාහිත ද වෙයි. ඇවැත්නි, මේ පසඟින් වහල ලත් සම්දිටු චෙතොවිමුක්තිය ඵල කොට ඇත්තේ ද වෙයි. චෙතොවිමුක්තිඵලය අනුසස් කොට ඇත්තේ ද වෙයි. ප්‍රඥාවිමුක්තිය ඵල කොට ඇත්තේ ද වෙයි. ප්‍රඥාවිමුක්තිඵලය අනුසස් කොට ඇත්තේ ද වෙයි.

15. ඇවැත්නි, භවයෝ කෙතෙක් වෙද්ද?

ඇවැත්නි, මේ භවයෝ තුන් දෙනෙකි: කාමභවය, රූපභවය, අරූපභවයි.

16 ඇවැත්නි, මතු අනාගතයෙහි පුනර්භවයෙහි ඉපැද්ම කෙසේ වේ ද?

ඇවැත්නි, අවිද්‍යානීවරණ ඇති, තෘෂ්ණා සංයෝජන ඇති සත්ත්වයන්ගේ ඒ ඒ තන්හි රූපාදිඅභිනන්දනයෙන් මෙසේ මතුයෙහි පුනර්භවයෙහි ඉපැද්ම වෙයි.

17 ඇවැත්නි, අනාගතයෙහි පුනර්භවයෙහි ඉපැද්ම කෙසේ නොවේ ද?

ඇවැත්නි, අවිද්‍යාක්ෂය විරාගහෙතුයෙන් වන අර්හත් මාර්ග විද්‍යොත්පාදයෙන් තෘෂ්ණා ක්ෂය නිරොධයෙන් මෙසේ මතුයෙහි පුනර්භවයෙහි ඉපැද්ම නො වෙයි.

18. ඇවැත්නි, ප්‍රථමධ්‍යාන කවරේ ද?

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කාමයෙන් වෙන් ව අකුසල් දහමින් වෙන්ව ම සවිතර්ක, සවිචාර, විවෙකජ ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යාන උපදවා ගෙන වාස කෙරෙයි. ඇවැත්නි, මේ ප්‍රථමධ්‍යාන යයි කියනු ලැබේ.

19 ඇවැත්නි, ප්‍රථමධ්‍යානය කෙතෙක් අඞ්ග ඇද්ද?

ඇවැත්නි, ප්‍රථම ධ්‍යානය පඤ්චාඞ්ගික වෙයි. ඇවැත්නි, මෙසස්නෙහි පලමු දහන් සමවත් මහණහට විතර්කය ද, විචාරය ද, ප්‍රීතිය ද, සුඛය ද, චිත්තෛකාග්‍රතා ද පවතින් ඇවැත්නි, මෙසේ පලමු දහන් පඤ්චාඞ්ගික වෙයි.

20. පඨමං පනාවුසො ඣානං කතඞ්ගවිප්පහීනං කතඞ්ගසමන්නාගතන්ති?

පඨමං ඛො ආවුසො ඣානං පඤ්චඞ්ගවිප්පහීනං පඤ්චඞ්ගසමන්නාගතං: ඉධාවුසො පඨමං ඣානං සමාපන්නස්ස භික්ඛුනො කාමච්ඡන්දො පහීනො හොති, බ්‍යාපාදො පහීනො හොති, ථීනමිද්ධං පහීනං හොති, උද්ධච්ච-කුක්කුච්චං පහීනං හොති, විචිකිච්ඡා පහීනා හොති. විතක්කො ච වත්තති විචාරො ච පීති ච සුඛඤ්ච චිත්තෙකග්ගතා ච. පඨමං ඛො ආවුසො ඣානං එවං පඤ්චඞ්ගවිප්පහීනං පඤ්චඞ්ගසමන්නාගතන්ති.

21. පඤ්චිමානි ආවුසො ඉන්ද්‍රියානි නානාවිසයානි නානාගොචරානි, න අඤ්ඤමඤ්ඤස්ස ගොචරවිසයං පච්චනුභොන්ති. සෙය්‍යථීදං: චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං. ඉමෙසං ඛො ආවුසො පඤ්චන්නං ඉන්ද්‍රියානං නානාවිසයානං නානාගොචරානං න අඤ්ඤමඤ්ඤස්ස ගොචරවිසයං පච්චනුභොන්තානං කිං පටිසරණං, කො ච නෙසං ගොචරවිසයං පච්චනුභොතීති?

පඤ්චිමානි ආවුසො ඉන්ද්‍රියානි නානාවිසයානි නානාගොචරානි න අඤ්ඤමඤ්ඤස්ස ගොචරවිසයං පච්චනුභොන්ති සෙය්‍යථීදං: චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං. ඉමෙසං ඛො ආවුසො පඤ්චන්නං ඉන්ද්‍රියානං නානාවිසයානං නානාගොචරානං න අඤ්ඤමඤ්ඤස්ස ගොචරවිසයං පච්චනුභොන්තානං මනොපටිසරණං, මනො ච නෙසං ගොචරවිසයං පච්චනුභොතීති.

22. පඤ්චිමානි ආවුසො ඉන්ද්‍රියානි. සෙය්‍යථීදං: චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං. ඉමානි ඛො ආවුසො පඤ්චින්ද්‍රියානි කිං පටිච්ච තිට්ඨන්තීති?.

පඤ්චිමානි ආවුසො ඉන්ද්‍රියානි. සෙය්‍යථීදං චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං ඉමානි ඛො ආවුසො පඤ්චින්ද්‍රියානි ආයුං පටිච්ච තිට්ඨන්තීති.

23. ආයු පනාවුසො කිං පටිච්ච තිට්ඨතීති.

ආයු උස්මං පටිච්ච තිට්ඨතීති.

24. උස්මා පනාවුසො කිං පටිච්ච තිට්ඨතීති?

උස්මා ආයුං පටිච්ච තිට්ඨතීති.

25. ඉදානෙව ඛො මයං ආවුසො ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං එවං ආජානාම: ආයු උස්මං පටිච්ච තිට්ඨතීති. ඉදානෙව ඛො මයං ආවුසො ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං එවං ආජානාම: උස්මා ආයුං පටිච්ච තිට්ඨතීති. යථාකථං පනාවුසො ඉමස්ස භාසිතස්ස අත්ථො දට්ඨබ්බොති?

20. ඇවැත්නි, පළමු දැහැන් අඞ්ග කෙතෙකින් විප්‍රහීණ වේ ද? අඞ්ග කෙතෙකින් සමන්‍වාගත වේ ද?

ඇවැත්නි, පළමු දැහැන් පඤ්චාඞ්ග විප්‍රහීණ වෙයි. පඤ්චාඞ්ග සමන්‍වාගත වෙයි. ඇවැත්නි, මෙසස්නෙහි පළමු දැහැන් සමවත් මහණ හට කාමච්ඡන්‍ද ප්‍රහීණ වෙයි. ව්‍යාපාද ප්‍රහීණ වෙයි. ථිනමිද්ධ ප්‍රහීණ වෙයි. උද්ධච්චකුක්කුච්ච ප්‍රහීණ වෙයි. විචිකිච්ඡා ප්‍රහීණ වෙයි. විතර්කය ද විචාරය ද, ප්‍රීතිය ද, සුඛය ද, චිත්තෙකාග්‍රතා ද පවතිත්. ඇවැත්නි, මෙසේ පළමු දැහැන් පඤ්චාඞ්ග විප්‍රහීණ වෙයි. පඤ්චාඞ්ගසමන්‍වාගත වෙයි.

21. ඇවැත්නි, මේ පඤ්චෙන්‍ද්‍රියයෝ නානාවිෂය ඇත්තෝ වෙති. නානාගොචර ඇත්තෝ වෙති. උනුන්ගේ ගොචරවිෂය වළඳ නො කෙරෙති. ඒ කවරහ යත්: චක්‍ෂුරින්‍ද්‍රියය, ශ්‍රොත්‍රෙන්‍ද්‍රියය, ඝ්‍රාණෙන්‍ද්‍රියය, ජිහ්වෙන්‍ද්‍රියය, කායෙන්‍ද්‍රියයි. ඇවැත්නි, විෂය විසින් පෘථග්භූත, ගොචර විසින් පෘථග්භූත, උනුන්ගේ ගොචර විෂය වළඳ නොකරන මේ පඤ්චෙන්‍ද්‍රියයන්ගේ පිළිසරණ කිම? කවරෙක් උන්ගේ ගොචරවිෂය වළඳ කෙරේ ද?

ඇවැත්නි, නානාවිෂය වූ, නානාගොචර වූ, උනුන්ගේ ගොචරවිෂය වළඳ නොකරන මේ ඉන්‍ද්‍රියයෝ පස්දෙනෙකි. ඔහු කවරහ යත්: චක්‍ෂුරින්‍ද්‍රියය, ශ්‍රොත්‍රෙන්‍ද්‍රිය ය, ඝ්‍රාණෙන්‍ද්‍රිය ය, ජිහ්වෙන්‍ද්‍රිය ය, කායෙන්‍ද්‍රියයි. ඇවැත්නි, විෂය විසින් වෙන් ව සිටි, ගොචර විසින් වෙන් ව සිටි, උනුන්ගේ ගොචර විෂය වළඳ නොකරන මේ පඤ්චෙන්‍ද්‍රියයන්ගේ පිළිසරණ ජවන මනස වෙයි. (මනොද්වාරික හෝ පඤ්චද්වාරික හෝ) ජවනමනස උන්ගේ ගොචරවිෂය වළඳ කෙරෙයි.

22. ඇවැත්නි, මේ ඉන්‍ද්‍රියයෝ පස්දෙනෙකි ඔහු කවරහ යත්: චක්‍ෂුරින්‍ද්‍රිය ය, ශ්‍රොත්‍රෙන්‍ද්‍රිය ය, ඝ්‍රාණෙන්‍ද්‍රිය ය, ජිහ්වෙන්‍ද්‍රිය ය, කායෙන්‍ද්‍රිය යි. ඇවැත්නි, මෙ පඤ්චෙන්‍ද්‍රියයෝ කුමක් නිසා සිටිත් ද?

ඇවැත්නි, මේ ඉන්‍ද්‍රියයෝ පස්දෙනෙකි. ඔහු කවරගයත්: චක්‍ෂුරින්‍ද්‍රිය ය, ශ්‍රොත්‍රෙන්‍ද්‍රිය ය, ඝ්‍රාණෙන්‍ද්‍රිය ය, ජිහ්වෙන්‍ද්‍රිය ය, කායෙන්‍ද්‍රිය යි. ඇවැත්නි, මේ පසිඳුරෝ ආයු නිසා සිටුති.

23. ඇවැත්නි, ආයු කුමක් නිසා සිටුනේ වේද?

ආයු උසුම නිසා සිටුනේ වෙයි

24. ඇවැත්නි, උස්ම කුමක් නිසා සිටුනේ වේද?

උස්ම ආයු නිසා සිටුනේ ය.

25. ඇවැත්නි, අපි දැන් ආයුෂමත් සැරියුත් තෙරණුවන්ගේ බස් මෙසේ වටහා ගනුම්හ: 'ආයු උස්ම නිසා සිටුනේය' යනුයි. ඇවැත්නි තවද අපි දැන් ආයුෂමත් සැරියුත් තෙරණුවන්ගේ බස මෙසේ වටහා ගනුම්හ: 'උස්ම ආයු නිසා සිටුනේය' යනු යි. ඇවැත්නි, කෙබඳු සෙයෙකින් මේ භාෂිතයාගේ අරුත් දත මනා වේ ද?

Free Distribution www.aathaapi.org

තෙන හාවුසො උපමං තෙ කරිස්සාමි. උපමායපිධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති. සෙය්‍යථාපි ආවුසො තෙලප්පදීපස්ස ඣායතො අච්චිං පටිච්ච ආභා පඤ්ඤායති, ආභං පටිච්ච අච්චි පඤ්ඤායති, එවමෙව ඛො ආවුසො ආයු උස්මං පටිච්ච තිට්ඨති. උස්මා ච ආයුං පටිච්ච තිට්ඨතීති.

26. තෙව නු ඛො ආවුසො ආයුසඞ්ඛාරා තෙව වෙදනියා ධම්මා, උදහු අඤ්ඤෙ ආයුසඞ්ඛාරා අඤ්ඤෙ වෙදනියා ධම්මාති?

න ඛො ආවුසො තෙව ආයුසඞ්ඛාරා තෙව වෙදනියා ධම්මා. තෙව ඛො ආවුසො ආයුසඞ්ඛාරා අභවිංසු තෙව වෙදනියා ධම්මා, නයිදං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස භික්ඛුනො වුට්ඨානං පඤ්ඤායෙථ. යස්මා ච ඛො ආවුසො අඤ්ඤෙ ආයුසඞ්ඛාරා, අඤ්ඤෙ වෙදනියා ධම්මා, තස්මා සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස භික්ඛුනො වුට්ඨානං පඤ්ඤායතීති.

27. යදා නු ඛො ආවුසො ඉමං කායං කති ධම්මා ජහන්ති, අථායං කායො උජ්ඣිතො අවක්ඛිත්තො සෙති යථා කට්ඨං අචෙතනන්ති?

යදා ඛො ආවුසො ඉමං කායං තයො ධම්මා ජහන්ති: ආයු උස්මා ච විඤ්ඤාණං, අථායං කායො උජ්ඣිතො අවක්ඛිත්තො සෙති යථා කට්ඨං අචෙතනන්ති.

28. ය්වායං ආවුසො මතො කාලකතො, යො චායං භික්ඛු සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො, ඉමෙසං කිං නානාකරණන්ති?

ය්වායං ආවුසො මතො කාලකතො තස්ස කායසඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා. වචීසඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා. චිත්තසඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා. ආයු පරික්ඛීණො. උස්මා වූපසන්තා. ඉන්ද්‍රියානි විපරිභින්නානි. යො චායං භික්ඛු සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො, තස්සපි කායසඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා. වචීසඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා. චිත්තසඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා. ආයු අපරික්ඛීණො. උස්මා අවූපසන්තා. ඉන්ද්‍රියානි විප්පසන්නානි. ය්වායං ආවුසො මතො කාලකතො යො චායං භික්ඛු සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො, ඉදං තෙසං නානාකරණන්ති.

29. කති පනාවුසො පච්චයා අදුක්ඛමසුඛාය චෙතොවිමුත්තියා සමාපත්තියාති?

ඇවත්නි, එකරුණින් තොපට උපමාවක් කරමි. උපමායෙනුදු මෙලොව විඥ පුරුෂ කෙතෙක් භාෂිතයාගේ අර්ථ වටහා ගනිති. ඇවත්නි, යම් පරිදි දලන තෙල්පහන සිළු නිසා අලු පැනේ ද, අලු නිසා සිළු පැනේ ද, ඇවැත්නි, එපරිදි ම ආයු උස්ම නිසා සිටුනේ ය. උස්ම ආයු නිසා සිටුනේ ය.

26. ඇවැත්නි, ඔහු ම ආයුසංස්කාර වෙද්ද? ඔහු ම වෙදනා ධර්මවෙද්ද? නොහොත් අන්හු ආයුසංස්කාර වෙද්ද? අන්හු වෙදනාධර්ම වෙද්ද?

ඇවැත්නි, ඔහු ම ආයුසංස්කාරයෝත්, ඔහු ම වෙදනාධර්මයෝත් නොවෙති. ඇවැත්නි, ඔහු ම ආයුසංස්කාරයෝත්, ඔහු ම වෙදනාධර්මයෝත් වූහු නම්, සංඥාවෙදයිතනිරොධ සමවත් සමවත් මහණහුගේ (සමවතින්) නැඟීසිටුම නො පැනෙන්නේ ය. ඇවැත්නි, යම්හෙයෙකින් අන්හු ආයුසංස්කාරයෝ වෙද්ද, අන්හු වෙදනාධර්මයෝ වෙද්ද, එහෙයින්, සංඥා-වෙදයිතනිරොධසමවත් සමවත් මහණහුගේ (සමවතින්) නැඟීම පැනේය.

27. ඇවැත්නි, යම් දිනෙක කෙතෙක් දහම්හු මේ කය හැරපියද්ද, එසඳ මේ කය හරනාලදු ව බැහැර හෙරනා ලදු ව අචෙතන වූ කාෂ්ඨයක් සෙයින් හෝනේ වේ ද?

ඇවැත්නි, යම් කලෙක ආයුෂය, උස්මය, විඥනය යන දහම්හු තුන් දෙන මේ කය හැරපියද්ද, එකල මේ කය හරනාලදු ව බැහැර හෙරනා ලදු ව හෝනේ වෙයි. අචෙතන කාෂ්ඨයක් සෙයින.

28. ඇවැත්නි, යම් මේ පුද්ගලයෙක් මළේ කළුරිය කෙළේ වේ ද, යම් මේ මහණෙක් සංඥාවෙදයිත නිරොධයට සමවත්නේ වේ ද, මොවුන්ගේ වෙනස කවරේ ද?

ඇවැත්නි, යම් මේ පුද්ගලයෙක් මළේ කළුරිය කෙළේ වේ ද, උහුගේ ආශ්වාස ප්‍රශ්වාස නිරුද්ධයහ, නැවතියහ. විතර්කවිචාරයෝ නටහ, නැවැත්තහ. සංඥාවෙදනාවෝ බුන්හ, නැවැත්තහ. ආයු ක්ෂීණ විය. උසුම සන්හින. ඉඳුරහු නටහ. යම් මේ මහණෙක් සංඥාවෙදයිතනිරොධයට සමවත්නේ වේ ද, උහුගේත් කායසංස්කාරයෝ නිරුද්ධයහ, ප්‍රතිප්‍රශ්‍රබ්ධයහ. වාක්සංස්කාරයෝත් නිරුද්ධයහ, ප්‍රතිප්‍රශ්‍රබ්ධයහ. චිත්තසංස්කාරයෝත් නිරුද්ධයහ, ප්‍රතිප්‍රශ්‍රබ්ධ-යහ. ආයු අපරික්ෂීණ වෙයි. උස්ම අව්‍යුපශාන්ත වෙයි. ඉන්ද්‍රියයෝ විප්‍රසන්න වෙති. ඇවැත්නි, යම් මේ පුද්ගලයෙක් මළේ කළුරිය කෙළේ වේ ද, යම් මේ මහණෙක් සංඥාවෙදයිතනිරොධයට සමවත්නේ වේ ද, මේ උන්ගේ වෙනස යි.

29. ඇවැත්නි, උපෙක්ෂාචෙතොවිමුක්තියට සමවදනට ප්‍රත්‍යයයෝ කෙතෙක් ඇද්ද?

චත්තාරො ඛො ආවුසො පච්චයා අදුක්ඛමසුඛාය චෙතොවිමුත්තියා සමාපත්තියා: ඉධාවුසො භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. ඉමෙ ඛො ආවුසො චත්තාරො පච්චයා අදුක්ඛමසුඛාය චෙතොවිමුත්තියා සමාපත්තියාති.

30. කති පනාවුසො පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා සමාපත්තියාති?

ද්වෙ ඛො ආවුසො පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා සමාපත්තියා: සබ්බනිමිත්තානඤ්ච අමනසිකාරො, අනිමිත්තාය ච ධාතුයා මනසිකාරො. ඉමෙ ඛො ආවුසො ද්වෙ පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා සමාපත්තියාති.

31. කති පනාවුසො පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා ඨිතියාති?

තයො ඛො ආවුසො පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා ඨිතියා: සබ්බනිමිත්තානඤ්ච අමනසිකාරො, අනිමිත්තාය ච ධාතුයා මනසිකාරො, පුබ්බෙ ච අභිසඞ්ඛාරො. ඉමෙ ඛො ආවුසො තයො පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා ඨිතියාති.

32. කති පනාවුසො පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා වුට්ඨානායාති?

ද්වෙ ඛො ආවුසො පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා වුට්ඨානාය: සබ්බනිමිත්තානඤ්ච මනසිකාරො, අනිමිත්තාය ච ධාතුයා අමනසිකාරො. ඉමෙ ඛො ආවුසො ද්වෙ පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා වුට්ඨානායාති.

33. යා චායං ආවුසො අප්පමාණා චෙතොවිමුත්ති, යා ච ආකිඤ්චඤ්ඤා චෙතොවිමුත්ති, යා ච සුඤ්ඤතා චෙතොවිමුත්ති, යා ච අනිමිත්තා චෙතොවිමුත්ති, ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච, උදාහු එකත්ථා බ්‍යඤ්ජනමෙව නානන්ති?

ඇවැත්නි, උපෙක්‍ෂාචෙතොවිමුක්තියට සමවදනට ප්‍රත්‍යයයෝ සතර දෙනෙක් ඇත: ඇවැත්නි, මේ සස්නෙහි මහණ සුඛය හා දුඃඛයාගේ ප්‍රහාණයෙන් කලැ ම සොමනස් දොම්නසුන් හඬනායට යැමෙන් අදුඃඛ අසුඛ වූ උපෙක්‍ෂායෙන් ජනිත සමෘතිපරිශුද්ධි ඇති, චතුර්ථධ්‍යානය උපයාගෙන වාස කෙරෙයි. ඇවැත්නි, උපෙක්‍ෂාචෙතොවිමුක්තියට සමවදනු පිණිස මේ (විගත) ප්‍රත්‍යයයෝ සතරදෙනෙක් ඇත.

30. ඇවැත්නි, අනිමිත්තචෙතොවිමුක්තියට සමවදනට ප්‍රත්‍යයයෝ කොතෙක් ඇද්ද?

ඇවැත්නි, අනිමිත්තචෙතොවිමුක්තියට සමවදනට ප්‍රත්‍යයයෝ දෙදෙනෙක් ඇත: (රූපාදි) හැම නිමිති නොමෙනෙහි කිරීමය, අනිමිත්ත-ධාතු සඞ්ඛ්‍යාත නිර්වාණය මෙනෙහි කිරීමයි. ඇවැත්නි, අනිමිත්තචෙතො-විමුක්තියට සමවදනට මේ ප්‍රත්‍යයයෝ දෙදෙනෙක් වෙති.

31. ඇවැත්නි, අනිමිත්තචෙතොවිමුක්තියගේ ස්ථිතිය පිණිස ප්‍රත්‍යයයෝ කොතෙක් ඇද්ද?

ඇවැත්නි, අනිමිත්තචෙතොවිමුක්තියගේ ස්ථිතිය පිණිස ප්‍රත්‍යයයෝ තුන් දෙනෙක් ඇත: (රූපාදි) සර්වනිමිත්තයන් නොමෙනෙහි කිරීම ය, නිර්වාණධාතු මෙනෙහි කිරීම ය, කලැ ම අභිසංස්කාරයි. (කාලපරිච්ඡෙද කිරීමයි) ඇවැත්නි, අනිමිත්තචෙතොවිමුක්තිස්ථිතිය පිණිස මේ ප්‍රත්‍යයයෝ තුන් දෙනෙක් වෙති.

32. ඇවැත්නි, අනිමිත්තචෙතොවිමුක්තියගේ (භවාඞ්ග) ව්‍යුත්ථානය පිණිස ප්‍රත්‍යයයෝ කොතෙක් ඇද්ද?

ඇවැත්නි, අනිමිත්තචෙතොවිමුක්තියගේ ව්‍යුත්ථානය පිණිස ප්‍රත්‍යයයෝ දෙදෙනෙක් ඇත: හැම නිමිති මෙනෙහි කිරීමය, අනිමිත්තධාතු මෙනෙහි නො කිරීමයි. ඇවැත්නි, අනිමිත්තචෙතොවිමුක්තියගේ ව්‍යුත්ථානය පිණිස මෙ ප්‍රත්‍යයයෝ දෙදෙනෙක් වෙති.

33. ඇවැත්නි, යම් මේ අප්‍රමාණා චෙතොවිමුක්තියෙක් ඇද්ද, යම් ආකිඤ්චන්‍යා චෙතොවිමුක්තියෙක් ඇද්ද, යම් ශූන්‍යතා චෙතොවිමුක්තියෙක් ඇද්ද, යම් අනිමිත්තා චෙතොවිමුක්තියෙක් ඇද්ද, මේ දහම්හු නානාර්ථත් නානාව්‍යඤ්ජනත් වෙද්ද, නොහොත් එකාර්ථ වෙද්ද? ව්‍යඤ්ජනමාත්‍රය ම වෙනස් වේ ද?

යා චායං ආවුසො අප්පමාණා චෙතොවිමුත්ති යා ච ආකිඤ්චඤ්ඤා චෙතොවිමුත්ති යා ච සුඤ්ඤතා චෙතොවිමුත්ති, යා ච අනිමිත්තා චෙතොවිමුත්ති, අත්ථි ඛො ආවුසො පරියායො යං පරියායං ආගම්ම ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච, අත්ථි ච ඛො ආවුසො පරියායො යං පරියායං ආගම්ම ඉමෙ ධම්මා එකත්ථා බ්‍යඤ්ජනමෙව නානං.

34. කතමො චාවුසො පරියායො යං පරියායං ආගම්ම ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච?

ඉධාවුසො භික්ඛු මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. අයං වුච්චතාවුසො අප්පමාණා චෙතොවිමුත්ති.

කතමා චාවුසො ආකිඤ්චඤ්ඤා චෙතොවිමුත්ති?

ඉධාවුසො භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං වුච්චතාවුසො ආකිඤ්චඤ්ඤා චෙතොවිමුත්ති.

කතමා චාවුසො සුඤ්ඤතාචෙතොවිමුත්ති?

ඉධාවුසො භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසඤ්චික්ඛති: සුඤ්ඤමිදං අත්තෙන වා අත්තනියෙන වාති. අයං වුච්චතාවුසො සුඤ්ඤතා චෙතොවිමුත්ති.

කතමා චාවුසො අනිමිත්තා චෙතොවිමුත්ති?

ඉධාවුසො භික්ඛු සබ්බනිමිත්තානං අමනසිකාරා අනිමිත්තං චෙතොසමාධිං උපසම්පජ්ජ විහරති. අයං වුච්චතාවුසො අනිමිත්තා චෙතොවිමුත්ති.

අයං ඛො ආවුසො පරියායො යං පරියායං ආගම්ම ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච.

ඇවැත්නි, යම් මේ අප්‍රමාණා චෙතොවිමුක්තියෙක් ඇද්ද, යම් ආකිඤ්චඤ්ඤා චෙතොවිමුක්තියෙක් ඇද්ද, යම් ශූන්‍යතා චෙතොවිමුක්තියෙක් ඇද්ද, යම් අනිමිත්තා චෙතොවිමුක්තියෙක් ඇද්ද, ඇවැත්නි, යම් නියරක් ගෙන "මේ දහම්හු නානාර්ථත් වෙති, නානා ව්‍යඤ්ජනත් වෙති" යි කියහෙද්ද, එබඳු කරුණෙක් ඇත. ඇවැත්නි, සම් කරුණක් ලැබ "මේ දහම්හු එකාර්ථ වෙති, ව්‍යඤ්ජනමාත්‍ර ම වෙනසැ" යි කියහෙත් ද, එබඳු කරුණෙක් ද ඇත.

31. ඇවැත්නි, යම් කරුණක් ගෙන "මේ දහම්හු නානාර්ථ ද වෙති, නානා ව්‍යඤ්ජන ද වෙති"යි කියහෙත් ද, ඒ කරුණ කවරේය යත්:

ඇවැත්නි, මෙසස්නෙහි මහණ මෛත්‍රීසහගිය සිතින් එක් දිගක් පැහැස (අරමුණු කොට) ගෙන වාස කෙරෙයි. එසෙයින් ම දෙවන, තෙවන, සතරවන, දිග දූයි මෙසේ උඩ යට සරස හැමතන්හි සර්වාත්මසමතායෙන් සර්වසත්ත්වයන් ඇති ලොකය-විපුල, මහද්ගත, අප්‍රමාණ, අවෛර, අව්‍යාබාධ, මෛත්‍රීසහගත සිතින් ස්ඵරණ කොට වාස කෙරෙයි. කරුණාසහගත සිතින්... මුදිතාසහගත සිතින්... උපෙක්ෂාසහගත සිතින් එක් දිගක් අරමුණු කොටගෙන වාස කෙරෙයි. එසෙයින් ම දෙවන, තෙවන, සතරවන, දිග දූයි මෙසේ උඩ යට සරස හැමතන්හි සර්වාත්මසමතායෙන් සර්වසත්ත්වයන් ඇති ලොකය-විපුල, මහද්ගත, අප්‍රමාණ, අවෛර, අව්‍යාබාධ, උපෙක්ෂාසහගත සිතින් අරමුණු කොටගෙන වාස කෙරෙයි. ඇවැත්නි, මෝ අප්‍රමාණා චෙතොවිමුක්ති නමුයි කියනු ලැබේ.

ඇවැත්නි, ආකිඤ්චඤ්ඤා චෙතොවිමුක්ති කවර යත්: ඇවැත්නි, මෙ සස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් විඥානානන්ත්‍යායතනය ඉක්ම 'කිසිත් නැති'යි ගෙන ආකිඤ්චන්‍යායතනය උපයාගෙන වාස කෙරෙයි. ඇවැත්නි, මෝ ආකිඤ්චන්‍යායතනචෙතොවිමුක්ති නමුයි කියනු ලැබේ.

ඇවැත්නි, ශූන්‍යතා චෙතොවිමුක්ති කවර යත්: ඇවැත්නි, මේ සස්නෙහි මහණ අරණ්‍යගත වූයේ හෝ වෘක්ෂමූලගත වූයේ හෝ ශූන්‍යාගාරගත වූයේ හෝ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි: "ආත්ම ආත්මීය විසින් මේ ශූන්‍ය වේය"යි කියායි. ඇවැත්නි, මෝ ශූන්‍යතා චෙතොවිමුක්ති නමුයි කියනු ලැබේ.

ඇවැත්නි, අනිමිත්තාචෙතොවිමුක්ති කවර යත්: ඇවැත්නි, මෙ සස්නෙහි මහණ රාගාදි හැමනිමිති නොමෙනෙහි කිරීමෙන් අනිමිත්තාචෙතොසමාධිය උපයාගෙන වාස කෙරෙයි. ඇවැත්නි, මෝ අනිමිත්තාචෙතොවිමුක්ති නමුයි කියනු ලැබේ.

ඇවැත්නි, යම් කරුණක් ගෙන "මේ දහම්හු නානාර්ථ ද වෙති, නානා ව්‍යඤ්ජන ද වෙති"යි කියහෙද්ද, මේ ඒ කරුණ වෙයි.

35. කතමො චාවුසො පරියායො යං පරියායං ආගම්ම ඉමෙ ධම්මා එකත්ථා බ්‍යඤ්ජනමෙව නානං?

රාගො ඛො ආවුසො පමාණකරණො, දොසො පමාණකරණො, මොහො පමාණකරණො. තෙ ඛීණාසවස්ස භික්ඛුනො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. යාවතා ඛො ආවුසො අප්පමාණා චෙතොවිමුත්තියො, අකුප්පා තාසං චෙතොවිමුත්ති අග්ගමක්ඛායති. සා ඛො පනාකුප්පා චෙතොවිමුත්ති සුඤ්ඤා රාගෙන සුඤ්ඤා දොසෙන සුඤ්ඤා මොහෙන.

රාගො ඛො ආවුසො කිඤ්චනො, දොසො කිඤ්චනො, මොහො කිඤ්චනො. තෙ ඛීණාසවස්ස භික්ඛුනො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. යාවතා ඛො ආවුසො ආකිඤ්චඤ්ඤා චෙතොවිමුත්තියො, අකුප්පා තාසං චෙතොවිමුත්ති අග්ගමක්ඛායති. සා ඛො පනාකුප්පා චෙතොවිමුත්ති සුඤ්ඤා රාගෙන, සුඤ්ඤා දොසෙන, සුඤ්ඤා මොහෙන.

රාගො ඛො ආවුසො නිමිත්තකරණො, දොසො නිමිත්තකරණො, මොහො නිමිත්තකරණො. තෙ ඛීණාසවස්ස භික්ඛුනො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. යාවතා ඛො ආවුසො අනිමිත්තා චෙතොවිමුත්තියො අකුප්පා තාසං චෙතොවිමුත්ති අග්ගමක්ඛායති. සා ඛො පනාකුප්පා චෙතොවිමුත්ති සුඤ්ඤා රාගෙන, සුඤ්ඤා දොසෙන සුඤ්ඤා මොහෙන.

අයං ඛො ආවුසො පරියායො යං පරියායං ආගම්ම ඉමෙ ධම්මා එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානන්ති.

ඉදමවොචායස්මා සාරිපුත්තො. අත්තමනො ආයස්මා මහාකොට්ඨිකො ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දීති.

මහාවෙදල්ලසුත්තං තතියං.

35. ඇවැත්නි, යම් කරුණක් ගෙන "මේ දහම්හු එකාර්ථ වෙති, ව්‍යඤ්ජනමාත්‍ර ම වෙනසි"යි කියහෙද්ද, ඒ කරුණ කවරේ ද?

ඇවැත්නි, රාගය ප්‍රමාණකරණ වෙයි. ද්වේෂය ප්‍රමාණකරණ වෙයි. මෝහය ප්‍රමාණකරණ වෙයි. ඕහු ක්ෂීණාශ්‍රව මහණහට ප්‍රහීණ වෙති. උදුත්මුල් වෙති. මුදුන්සුන් තලක් සෙයින් කල අවස්තුකභාව ඇති වෙති. කල අභාව ඇති වෙති. මතුයෙහි නූපදනා සැහැවි ඇති වෙයි. ඇවැත්නි, යම් පමණ අප්පමාණා චේතොවිමුක්තීහු ඇද්ද, උන් අතුරින් අකොප්‍ය (අර්හත්ඵල) චේතොවිමුක්ති අග්‍රයයි කියනු ලැබේ. ඒ අකොප්‍යචේතොවිමුක්තිය රාග විසින් ශූන්‍ය වෙයි ද්වේෂ විසින් ශූන්‍ය වෙයි. මෝහ විසින් ශූන්‍ය වෙයි.

ඇවැත්නි, රාගය කිඤ්චනයෙකි. ද්වේෂය කිඤ්චනයෙකි. මෝහය කිඤ්චනයෙකි. ඔහු ක්ෂීණාශ්‍රව මහණහට ප්‍රහීණයහ. උදුත්මුල්හ. තාලාවාස්තුකෘතයහ අභාවකෘතයහ මතු අනුත්පාදධර්මයහ. ඇවැත්නි, යම් පමණ ආකිඤ්චන්‍යා චේතොවිමුක්තීහු ඇද්ද, ඔවුනතුරින් අකොප්‍ය-චේතොවිමුක්තිය අග්‍රයයි කියනු ලැබේ ඒ අකොප්‍යචේතොවිමුක්තිය රාග විසින් ශූන්‍ය වෙයි. ද්වේෂ විසින් ශූන්‍ය වෙයි. මෝහ විසින් ශූන්‍ය වෙයි.

ඇවැත්නි, රාගය නිමිත්තකරණයෙකි. ද්වේෂය නිමිත්තකරණයෙකි. මෝහය නිමිත්තකරණයෙකි. ඔහු ක්ෂීණාශ්‍රව මහණහට ප්‍රහීණයහ. උදුත් මුල්හ. තාලාවාස්තුකෘතයහ. අභාවකෘතයහ. මතු අනුත්පාදධර්මයහ ඇවැත්නි, යම් පමණ අනිමිත්තාචේතොවිමුක්තීහු ඇද්ද, ඔවුනතුරින් අකොප්‍යචේතොවිමුක්ති අග්‍රයයි කියනු ලැබේ. ඒ අකොප්‍යචේතොවිමුක්තිය රාග විසින් ශූන්‍ය වෙයි. ද්වේෂ විසින් ශූන්‍ය වෙයි. මෝහ විසින් ශූන්‍ය වෙයි.

ඇවැත්නි, යම් නියරක් ගෙන "මේ දහම්හු එකාර්ථ වෙති, ව්‍යඤ්ජනමාත්‍ර ම වෙනසි" යි කියහෙද්ද, මේ ඒ නියර වෙයි.

ආයුෂ්මත් සැරියුත් මහ තෙරණුවෝ මෙය දෙසූහු. (සොම්නසිත්) ගත් සිත් ඇති ආයුෂ්මත් මහාකොට්ඨිත මහතෙරහු ආයුෂ්මත් සැරියුත් මහ තෙරණුවන්ගේ භාෂිතය අභිනන්දන කළහ.

මහාවෙදල්ලසූත්‍රය තුන්වැනියි.

1. 5 4.

චූළවෙදල්ල සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. අථ ඛො විසාඛො උපාසකො යෙන ධම්මදින්නා භික්ඛුනී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ධම්මදින්නා භික්ඛුනිං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො විසාඛො උපාසකො ධම්මදින්නං භික්ඛුනිං එතදවොච:

1. සක්කායො සක්කායොති අය්‍යෙ වුච්චති. කතමො නු ඛො අය්‍යෙ සක්කායො වුත්තො භගවතාති?

පඤ්ච ඛො ඉමෙ ආවුසො විසාඛ උපාදානක්ඛන්ධා සක්කායො වුත්තො භගවතා. සෙය්‍යථීදං: රූපුපාදානක්ඛන්ධො වෙදනුපාදානක්ඛන්ධො සඤ්ඤුපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණුපාදානක්ඛන්ධො. ඉමෙ ඛො ආවුසො විසාඛ පඤ්චුපාදානක්ඛන්ධා සක්කායො වුත්තො භගවතාති.

2. සාධු අය්‍යෙති ඛො විසාඛො උපාසකො ධම්මදින්නාය භික්ඛුනියා භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා ධම්මදින්නං භික්ඛුනිං උත්තරිං පඤ්හං ආපුච්ඡි: සක්කායසමුදයො සක්කායසමුදයොති අය්‍යෙ වුච්චති. කතමො නු ඛො අය්‍යෙ සක්කායසමුදයො වුත්තො භගවතාති?

යායං ආවුසො විසාඛ තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං: කාමතණ්හා භවතණ්හා විභවතණ්හා. අයං ඛො ආවුසො විසාඛ සක්කායසමුදයො වුත්තො භගවතාති.

3. සක්කායනිරොධො සක්කායනිරොධොති අය්‍යෙ වුච්චති. කතමො නු ඛො අය්‍යෙ සක්කායනිරොධො වුත්තො භගවතාති?

යො ඛො ආවුසො විසාඛ තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො, අයං ඛො ආවුසො විසාඛ සක්කායනිරොධො වුත්තො භගවත ති

4. සක්කායනිරොධගාමිනී පටිපදා සක්කායනිරොධගාමිනීපටිපදාති අය්‍යෙ වුච්චති. කතමා නු ඛො අය්‍යෙ සක්කායනිරොධගාමිනීපටිපදා වුත්තා භගවතාති?

1. 5. 4.

චූළවෙදල්ල සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර (ලෙහෙනුනට තිම දුන්නෙන්) කලන්දකනිවාප නම් වූ වෙළුවනයෙහි වැඩවසන සේක. එසමයෙහි විසාඛ උවසු ධම්මදින්නා මෙහෙණ කරා එළඹිණ. එළඹ ධම්මදින්නා මෙහෙණ ඇදුරු කොට වැඳ එකත්පසෙක හින. එකත්පස් ව හුන් විසාඛ උපාසක ධම්මදින්නා මෙහෙණට (සක්කායො-ආදි) තෙලබස් කී:

1. අයියාවෙනි, 'සත්කාය, සත්කාය' යි කියනු ලැබේ. භාග්‍යවතුන් වහන්සේ විසින් කවර දහමෙක් 'සත්කාය' යි වදාරන ලද්දේ ද?

ඇවැත විසාඛයෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ උපාදානයනට ප්‍රත්‍යය වූ ස්කන්ධ පස 'සත්කාය'යි වදාරන ලද්දේය. හෙ යෙසේය යත්: රූපොපාදානස්කන්ධය, වෙදනොපාදානස්කන්ධය, සංඥොපාදානස්කන්ධය, සංස්කාරොපාදානස්කන්ධය, විඥානොපාදානස්කන්ධයි. ඇවැත විසාඛයෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ පඤ්චොපාදානස්කන්ධ 'සත්කාය' යි වදාරන ලදී.

2. විසාඛ උපාසක 'ආර්‍ය්‍යාවෙනි, බුණුසේ මැනැවැ'යි ධම්මදින්නා මෙහෙණගේ බසට තුටු ව, අනුමෝදන් ව ධම්මදින්නා මෙහෙණ මතුයෙහි (ආපුච්ඡා විසින්) පැන පිළිවිත්: අයියාවෙනි, 'සත්කාය සමුදය, සත්කාය සමුදය' යි කියනු ලැබේ. ආර්‍ය්‍යාවෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කිනම් දහමෙක් 'සත්කාය සමුදය'යි වදාරන ලද්දේ ද?

ඇවැත විශාඛයෙනි, පුනර්භවය පිණිස වැටෙන, නන්දිරාගසහගත, ඒ ඒ භවයෙහි ඇලුම් කරන යම් මේ තෘෂ්ණා ඇද්ද, ඕ කවර යත්: කාම තෘෂ්ණාය, භවතෘෂ්ණාය, විභවතෘෂ්ණායි. ඇවැත විශාඛයෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ තෘෂ්ණා 'සත්කාය සමුදය' විසින් වදාරන ලදු.

3. ආර්‍ය්‍යාවෙනි, 'සත්කායනිරොධය සත්කායනිරොධය'යි කියනු ලැබේ. ආර්‍ය්‍යාවෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කිනම් දහමෙක් 'සත්කාය නිරොධය'යි වදාරන ලද්දේ ද?

ඇවැත, විශාඛයෙනි, එම තෘෂ්ණාවගේ යම් අශෙෂවිරාගනිරොධයෙක් ත්‍යාගයෙක් ප්‍රතිනිස්සර්ගයෙක් විමුක්තියෙක් අනාලයෙක් ඇද්ද, ඇවැත විශාඛයෙනි, තෘෂ්ණාවගේ මේ අශෙෂවිරාගනිරොධය 'සත්කාය නිරොධය' යි භාග්‍යවතුන්වහන්සේ විසින් වදාරන ලදී.

4. ආර්‍ය්‍යාවෙනි, සත්කායනිරොධගාමිනී ප්‍රතිපදාය, සත්කායනිරොධ-ගාමිනීප්‍රතිපදාය'යි කියනු ලැබේ. ආර්‍ය්‍යාවෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කිනම් ප්‍රතිපදා 'සත්කායනිරොධගාමිනීප්‍රතිපදාය'යි වදාරන ලදු ද?

අයමෙව ඛො ආවුසො විසාඛ අරියො අට්ඨඞ්ගිකො මග්ගො සක්කායනිරොධගාමිනීපටිපදා වුත්තා භගවතා සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධීති.

5. තඤ්ඤෙව නු ඛො අය්‍යෙ උපාදානං තෙව පඤ්චුපාදානක්ඛන්ධා, උදාහු අඤ්ඤං නු ඛො පඤ්චහුපාදානක්ඛන්ධෙහි උපාදානන්ති?

න ඛො ආවුසො විසාඛ තඤ්ඤෙව උපාදානං, තෙව පඤ්චුපාදානක්ඛන්ධා, නපි අඤ්ඤත්‍ර පඤ්චහුපාදානක්ඛන්ධෙහි උපාදානං. යො ඛො ආවුසො විසාඛ පඤ්චසුපාදානක්ඛන්ධෙසු ඡන්දරාගො, තං තත්‍ථ උපාදානන්ති.

6. කථං පනය්‍යෙ සක්කායදිට්ඨි හොතීති?

ඉධාවුසො විසාඛ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. වෙදනං අත්තතො සමනුපස්සති, වෙදනාවන්තං වා අත්තානං, අත්තනි වා වෙදනං, වෙදනාය වා අත්තානං. සඤ්ඤං අත්තතො සමනුපස්සති, සඤ්ඤාවන්තං වා අත්තානං, අත්තනි වා සඤ්ඤං, සඤ්ඤාය වා අත්තානං. සංඛාරෙ අත්තතො සමනුපස්සති, සංඛාරවන්තං වා අත්තානං, අත්තනි වා සංඛාරෙ, සඞ්ඛාරෙසු වා අත්තානං විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං. එවං ඛො ආවුසො විසාඛ සක්කායදිට්ඨි හොතීති

7. කථං පනය්‍යෙ සක්කායදිට්ඨි න හොතීති?.

ඉධාවුසො විසාඛ සුතවා අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො, සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො න රූපං අත්තතො සමනුපස්සති, න රූපවන්තං වා අත්තානං, න අත්තනි වා රූපං, න රූපස්මිං වා අත්තානං. න වෙදනං අත්තතො සමනුපස්සති, න වෙදනාවන්තං වා අත්තානං, න අත්තනි වා වෙදනං, න වෙදනාය වා අත්තානං. න සඤ්ඤං අත්තතො සමනුපස්සති, න සඤ්ඤාවන්තං වා අත්තානං, න අත්තනි වා සඤ්ඤං, න සඤ්ඤාය වා අත්තානං. න සංඛාරෙ අත්තතො සමනුපස්සති, න සංඛාරවන්තං වා අත්තානං, න අත්තනි වා සංඛාරෙ, න සංඛාරෙසු වා අත්තානං. න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, න විඤ්ඤාණවන්තං වා අත්තානං, න අත්තනි වා විඤ්ඤාණං, න විඤ්ඤාණස්මිං වා අත්තානං. එවං ඛො ආවුසො විසාඛ සක්කායදිට්ඨි න හොතීති.

ඇවැත, විශාඛයෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ආර්‍ය්‍යමාර්ගය ම 'සත්කායනිරොධගාමිනීප්‍රතිපදා'යයි වදරනලදී. හෙ කෙසේය යත්: සම්‍යග්දෘෂ්ටිය, සම්‍යක්සඞ්කල්පය, සම්‍යග්වාචාය, සම්‍යක්කර්මාන්තය, සම්‍යගාජීවය, සම්‍යග් ව්‍යායාමය, සම්‍යක්සමෘතිය, සම්‍යක්සමාධියි.

5. ආර්‍ය්‍යාවෙනි, ඒ උපාදාන හා ඒ පඤ්චොපාදානස්කන්ධ හා එක් ම වේ ද? නොහොත් පඤ්චොපාදානස්කන්ධ පියා උපාදාන අනෙකෙක් වේ ද?

ඇවැත විශාඛයෙනි, ඒ උපාදාන හා ඒ පඤ්චොපාදානස්කන්ධ හා එකෙක් ම නොවේ. පඤ්චොපාදානස්කන්ධ පියා උපාදාන නො ද අනෙකෙක් වෙයි. ඇවැත විශාඛයෙනි, පඤ්චොපාදානස්කන්ධ කෙරෙහි යම් ඡන්දරාගයෙක් ඇද්ද, ඒ එහි උපාදාන නම් වෙයි.

6. ආර්‍ය්‍යාවෙනි, කෙසේ නම් සත්කායදෘෂ්ටි ඇති වේ ද?

ඇවැත විශාඛයෙනි, මේ ලොව ආර්‍ය්‍යයන් නොදක්නා සුලු, ආර්‍ය්‍යධර්මය පිළිබඳ අකොවිද, ආර්‍ය්‍යධර්මයෙහි අවිනීත, (බුද්ධාදි) සත්පුරුෂයන් නොදක්නාසුලු, සත්පුරුෂධර්මය පිළිබඳ අකොවිද, සත්පුරුෂධර්මයෙහි අවිනීත අශ්‍රුතවත් පෘථග්ජන ශුද්ධරූපය ආත්මවශයෙන් (අද්වය කොට) දක්නේ ය. අරූප ආත්මයා රූපවත් කොට හෝ, රූපය ආත්මයා කෙරෙහි එලවා හෝ, ආත්මයා රූපයා කෙරෙහි එලවා හෝ (දෘෂ්ටිදර්ශනයෙන්) දක්නේය. වෙදනා ආත්ම වශයෙන් දක්නේය. ආත්මයා වෙදනාවත් කොට හෝ, වෙදනා ආත්මයා කෙරෙහි එලවා හෝ, ආත්මයා වෙදනා කෙරෙහි එලවා හෝ දක්නේ ය. සංඥ ආත්මවශයෙන් දක්නේ ය. ආත්මයා සංඥවත් කොට හෝ, සංඥ ආත්මයා කෙරෙහි එලවා හෝ, ආත්මයා සංඥ කෙරෙහි එලවා හෝ දක්නේ ය. සංස්කාරයන් ආත්මවශයෙන් දක්නේ ය. ආත්මයා සංස්කාරවත් කොට හෝ, සංස්කාර ආත්මයා කෙරෙහි එලවා හෝ, ආත්මයා සංස්කාර කෙරෙහි එලවා හෝ දක්නේ ය. විඥන ආත්ම වශයෙන් දක්නේ ය. ආත්මයා විඥනවත් කොට හෝ, විඥන ආත්මයා කෙරෙහි එලවා හෝ, ආත්මයා විඥන කෙරෙහි එලවා හෝ දක්නේ ය. ඇවැත විශාඛයෙනි, මෙසෙයින් සත්කාය දෘෂ්ටි ඇති වෙතියි කීහු.

7. ආර්‍ය්‍යාවෙනි, කෙසේ නම් සත්කායදෘෂ්ටි නොවේ ද?

ඇවැත, විශාඛයෙනි, මෙලොව ආර්‍ය්‍යයන් දක්නා සුලු, ආර්‍ය්‍යධර්මය පිළිබඳව කොවිද, ආර්‍ය්‍යධර්මයෙහි සුවිනීත, සත්පුරුෂයන් දක්නාසුලු, සත්පුරුෂධර්මය පිළිබඳ ව කොවිද, සත්පුරුෂධර්මයෙහි සුවිනීත ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක රූපය ආත්ම වශයෙන් නො දක්නේ ය. ආත්මයා රූපවත් කොට හෝ, රූපය ආත්මයෙහි පිහිටියේය යි හෝ, ආත්මය රූපයෙහි පිහිටියේය යි හෝ, නො දක්නේය. වෙදනා ආත්ම වශයෙන් නො දක්නේ ය. ආත්මයා වෙදනාවත් කොට හෝ, වෙදනා ආත්මයෙහි පිහිටියේ ය යි හෝ, ආත්මය වෙදනායෙහි පිහිටියේය යි හෝ නොදක්නේ ය. සංඥ ආත්ම වශයෙන් නො දක්නේ ය. ආත්මයා සංඥවත් කොට හෝ සංඥ ආත්මයෙහි පිහිටියායි හෝ, ආත්මය සංඥයෙහි පිහිටියේය යි හෝ, නො දක්නේය. සසකාර ආත්ම විසින් නො දක්නේය. ආත්මය සංස්කාරවත් කොට හෝ, සංස්කාර ආත්මයෙහි පිහිටියේ ය යි හෝ, ආත්මය සංස්කාරයෙහි පිහිටියේ ය යි හෝ නො දක්නේ ය. විඥන ආත්මවශයෙන් නො දක්නේ ය. ආත්මය විඥනවත් කොට හෝ, විඥනය ආත්මයෙහි පිහිටියේ ය යි හෝ, ආත්මය විඥනයෙහි පිහිටියේ ය යි හෝ නො දක්නේ ය. ඇවැත විශාඛයෙනි, මෙසෙයින් සත්කායදෘෂ්ටි නොවෙතියි කීහු.

Free Distribution www.aathaapi.org

8. කතමො පනය්‍යෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගොති?

අයමෙව ඛො ආවුසො විසාඛ අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මා ආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධීති.

9. අරියො පනය්‍යෙ අට්ඨඞ්ගිකො මග්ගො සඞ්ඛතො උදාහු අසඞ්ඛතොති?

අරියො ඛො ආවුසො විසාඛ අට්ඨඞ්ගිකො මග්ගො සඞ්ඛතොති.

10. අරියෙන නු ඛො අය්‍යෙ අට්ඨඞ්ගිකෙන මග්ගෙන තයො ඛන්ධා සඞ්ගහිතා, උදාහු තීහි ඛන්ධෙහි අරියො අට්ඨඞ්ගිකො මග්ගො සඞ්ගහීතොති?

න ඛො ආවුසො විසාඛ අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන තයො ඛන්ධා සඞ්ගහිතා. තීහි ච ඛො ආවුසො විසාඛ ඛන්ධෙහි අරියො අට්ඨඞ්ගිකො මග්ගො සඞ්ගහීතො: යා චාවුසො විසාඛ සම්මාවාචා යො ච සම්මාකම්මන්තො යො ච සම්මාආජීවො, ඉමෙ ධම්මා සීලක්ඛන්ධෙ සඞ්ගහිතා. යො ච සම්මාවායාමො යා ච සම්මාසති යො ච සම්මාසමාධි, ඉමෙ ධම්මා සමාධික්ඛන්ධෙ සඞ්ගහිතා. යා ච සම්මාදිට්ඨි යො ච සම්මාසඞ්කප්පො, ඉමෙ ධම්මා පඤ්ඤාක්ඛන්ධෙ සඞ්ගහිතාති.

11. කතමො පනය්‍යෙ සමාධි, කතමෙ සමාධිනිමිත්තා, කතමෙ සමාධිපරික්ඛාරා, කතමා සමාධිභාවනාති?

යා ඛො ආවුසො විසාඛ චිත්තස්ස එකග්ගතා අයං සමාධි. චත්තාරො සතිපට්ඨානා සමාධිනිමිත්තා. චත්තාරො සම්මප්පධානා සමාධිපරික්ඛාරා. යා තෙසංයෙව ධම්මානං ආසෙවනා භාවනා බහුලීකම්මං, අයං තත්‍ථ සමාධි-භාවනාති.

12. කති පනය්‍යෙ සඞ්ඛාරාති?

තයොමෙ ආවුසො විසාඛ සඞ්ඛාරා: කායසඞ්ඛාරො වචීසඞ්ඛාරො චිත්තසඞ්ඛාරොති.

13. කතමො පනය්‍යෙ කායසඞ්ඛාරො, කතමො වචීසඞ්ඛාරො, කතමො චිත්තසඞ්ඛාරොති?

අස්සාසපස්සාසා ඛො ආවුසො විසාඛ කායසඞ්ඛාරො. විතක්කවිචාරා වචීසඞ්ඛාරො. සඤ්ඤා ච වෙදනා ච චිත්තසඞ්ඛාරොති.

8. ආර්‍ය්‍යාවෙනි, අරිඅටඟිමඟ කවරේ ද?

ඇවැත විශාඛයෙනි, මේ ම අරිඅටඟිමඟ වෙයි. හෙ කෙසෙය යත්: සම්‍යග්දෘෂ්ටිය, සම්‍යක්සඞ්කල්පය, සම්‍යග්වාචාය, සම්‍යක්කර්මාන්තය, සම්‍යගාජීවය, සම්‍යග්ව්‍යායාමය, සම්‍යක්ස්මෘතිය, සම්‍යක්සමාධියයි.

9. ආර්‍ය්‍යාවෙනි, අරිඅටඟිමඟ කිසිප්‍රත්‍යයෙකින් කරන ලද වේ ද?

ඇවැත විශාඛයෙනි, අරිඅටඟිමඟ කිසි ප්‍රත්‍යයෙකින් කරන ලද වෙයි.

10 ආර්‍ය්‍යාවෙනි, ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය විසින් ත්‍රිවිධස්කන්ධයෝ සංග්‍රහ කොට ගන්නා ලද්දාහු ද?' නොහොත් ත්‍රිවිධස්කන්ධයන් විසින් ආර්‍ය්‍ය-අෂ්ටාඞ්ගිකමාර්ගය සංග්‍රහ කොට ගන්නා ලද්දේ ද?

ඇවැත විශාඛයෙනි, ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ගය විසින් ත්‍රිවිධස්කන්ධයෝ සඞ්ගෘහීත නොවෙති. ඇවැත විශාඛයෙනි, ත්‍රිවිධස්කන්ධ විසින් ආර්‍ය්‍යාෂ්ටා-ඞ්ගිකමාර්ගය සඞ්ගෘහීත වෙයි. ඇවැත විශාඛයෙනි, යම් සම්‍යග්වාචායෙක් ඇද්ද, යම් සම්‍යක් කර්මාන්තයෙක් ඇද්ද, යම් සම්‍යගාජීවයෙක් ඇද්ද, මේ දහම්හු ශීලස්කන්ධය විසින් සඞ්ගෘහීත වෙති. යම් සම්‍යග්ව්‍යායාමයෙක් ඇද්ද, යම් සම්‍යක් ස්මෘතියෙක් ඇද්ද, යම් සම්‍යක්සමාධියෙක් ඇද්ද, මේ දහම්හු සමාධිස්කන්ධය විසින් සඞ්ගෘහීත වෙති. යම් සම්‍යග්දෘෂ්ටියෙක් ඇද්ද, යම් සම්‍යක්සඞ්කල්පයෙක් ඇද්ද, මේ දහම්හු ප්‍රඥාස්කන්ධය විසින් සඞ්ගෘහීත වෙතියි කියූ.

11. ආර්‍ය්‍යාවෙනි, සමාධි කවරේ ද? සමාධිනිමිත්තයෝ කවරහු ද? සමාධිපරිෂ්කාරයෝ කවරහු ද? සමාධිභාවනා කවර?

ඇවැත විශාඛයෙනි, යම් චිත්තෛකාග්‍රතායෙක් ඇද්ද, මේ ය සමාධි-නම්. සතරසිවටන්හු සමාධිනිමිති වෙති. සතර සම්‍යක්ප්‍රධන්වීර්‍ය්‍යයෝ සමාධිපරිෂ්කාර වෙති. එම දහමුන් පිළිබඳ යම් ආසෙවනායෙක් භාවනා-යෙක් බහුලීකමෙක් ඇද්ද, මෙය එහි සමාධි භාවනා නම්.

12. ආර්‍ය්‍යාවෙනි, සංස්කාරයෝ කෙතෙක් ඇද්ද?

ඇවැත විශාඛයෙනි, සංස්කාරයෝ මොහු තුන් දෙනෙකි. කායසංස්කා-රය, වාක්සංස්කාරය, චිත්තසංස්කාරයි.

13. ආර්‍ය්‍යාවෙනි, කායසංස්කාර කවරේ ද? වාක්සංස්කාර කවරේ ද? චිත්තසංස්කාර කවරේ ද?

ඇවත විශාඛයෙනි, ආශ්වාසප්‍රශ්වාස කායසංස්කාර යි. විතර්කවිචාර වාක්සංස්කාර යි. සංඥා හා වෙදනා චිත්තසංස්කාර යි.

14. කස්මා පනය්‍යෙ අස්සාසපස්සාසා කායසඞ්ඛාරො? කස්මා විතක්කවිචාරා වචීසඞ්ඛාරො, කස්මා සඤ්ඤා ච වෙදනා ච චිත්තසඞ්ඛාරොති?

අස්සාසපස්සාසා ඛො ආවුසො විසාඛ කායිකා එතෙ ධම්මා කායපටිබද්ධා. තස්මා අස්සාසපස්සාසා කායසඞ්ඛාරො. පුබ්බෙ ඛො ආවුසො විසාඛ විතක්කෙත්වා විචාරෙත්වා පච්ඡා වාචං භින්දති. තස්මා විතක්කවිචාරා වචීසඞ්ඛාරො. සඤ්ඤා ච වෙදනා ච චෙතසිකා එතෙ ධම්මා චිත්තපටිබද්ධා. තස්මා සඤ්ඤා ච වෙදනා ච චිත්තසඞ්ඛාරොති.

15. කථං ච පනය්‍යෙ සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති හොතීති?

න ඛො ආවුසො විසාඛ සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජන්තස්ස භික්ඛුනො එවං හොති: අහං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජිස්සන්ති වා, අහං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජාමීති වා, අහං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නොති වා. අථ ඛ්වාස්ස පුබ්බෙව තථා චිත්තං භාවිතං හොති යන්තං තථත්තාය උපනෙතීති

16. සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජන්තස්ස පනය්‍යෙ භික්ඛුනො කතමෙ ධම්මා පඨමං නිරුජ්ඣන්ති: යදි වා කායසඞ්ඛාරො යදි වා වචීසඞ්ඛාරො යදි වා චිත්තසඞ්ඛාරොති?

සඤ්ඤාවෙදයිත නිරොධං සමාපජ්ජන්තස්ස ඛො ආවුසො විසාඛ භික්ඛුනො පඨමං නිරුජ්ඣති වචීසඞ්ඛාරො, තතො කායසඞ්ඛාරො, තතො චිත්තසඞ්ඛාරොති.

17. කථං පනය්‍යෙ සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨානං හොති?

න ඛො ආවුසො විසාඛ, සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨහන්තස්ස භික්ඛුනො එවං හොති: අහං සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨහිස්සන්ති වා, අහං සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්තියා වුට්ඨහාමීති වා, අහං සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨිතොති වා. අථ ඛ්වාස්ස පුබ්බෙව තථා චිත්තං භාවිතං හොති යන්තං තථත්තාය උපනෙතීති

14. ආයුෂ්මතී, කවරහෙයෙකින් ආශ්වාසප්‍රශ්වාස කායසංස්කාර වේද? කවරහෙයෙකින් විතර්කවිචාර වාක්සංස්කාර වේද? කවරහෙයෙකින් සංඥා හා වේදනා චිත්තසංස්කාර වේද?

ඇවැත විසාඛයෙනි, ආශ්වාසප්‍රශ්වාසයෝ කායික වෙති. මේ ධර්මයෝ කාය ප්‍රතිබද්ධයහ. එයින් ආශ්වාස ප්‍රශ්වාසයෝ කායසංස්කාර වෙති. ඇවැත විසාඛයෙනි, කැලැම විතර්ක කොට විචාර කොට පසු ව බස බිඳුනේ ය. එයින් විතර්කවිචාරයෝ වාක්සංස්කාර වෙති. සංඥා ද වේදනා ද චෛතසිකයහ. මේ ධර්මයෝ චිත්තප්‍රතිබද්ධයහ. එයින් සංඥා ද වේදනා ද චිත්ත සංස්කාර වෙති.

15. ආයුෂ්මතී, කෙසෙයින් සංඥාවෙදයිත නිරෝධ සමාපත්ති වේද?

ඇවැත විසාඛයෙනි, සංඥාවෙදයිතනිරෝධසමවතට සමවදනා මහණහට මෙවන් සිත් නොවෙයි: "මම සංඥාවෙදයිතනිරොධයට (මතු) සමවදින්නෙමි කියා හෝ, (දැන්) සමවදිමි කියා හෝ, (අනොනානිරොධ විසින්) සමවැදුණිමි කියා හෝ"යි. වැලිදු, යම් භාවිත චිත්තයෙක් ඒ මහණ (අනොනානිරොධ විසින් අචිත්තකභාව සඞ්ඛ්‍යාත) තථාත්වයට එළවා ද, ඒ මහණහුයේ කාලය පිරිසිඳුනා සිත (නිරොධසමාපත්තියෙන්) පළමු කොට ම එසෙයින් භාවිත වෙයි.

16. ආයුෂ්මතී, සංඥාවෙදයිතනිරොධසමවතට සමවදනා මහණහට කිනම් ධර්මකෙනෙක් පළමු ව නිරුද්ධ වේද් ද, කායසංස්කාර හෝ නිරුද්ධ වේද? වාක්සංස්කාර හෝ නිරුද්ධ වේද? චිත්තසංස්කාර හෝ නිරුද්ධ වේද?

ඇවැත විසාඛයෙනි, සංඥාවෙදයිතනිරෝධයට සමවදනා මහණහට පළමු ව වාක්සංස්කාර නිරුද්ධ වෙයි. ඉන් පසු කායසංස්කාර නිරුද්ධ වෙයි. ඉන්පසු චිත්තසංස්කාර නිරුද්ධ වෙයි.

17. ආයුෂ්මතී, සංඥාවෙදයිතනිරොධසමවතින් නැඟී සිටීම කෙසේ වේද?

ඇවැත විසාඛයෙනි, සංඥාවෙදයිතනිරොධසමවතින් නැඟෙන මහණහට මෙබඳු සිත් නොවෙයි: "මම සංඥාවෙදයිතනිරොධසමවතින් නැඟෙන්නෙමි කියා හෝ, නැඟෙමි කියා හෝ, නැඟුණෙමි කියා හෝ"යි. 'වැලිදු, යම් භාවිත චිත්තයෙක් ඒ මහණ (අචිත්තකභාව සඞ්ඛ්‍යාත) තථාත්වයට ගෙන යේද, ඒ මහණහුගේ (අධ්‍යානපරිච්ඡෙද) චිත්තය කැලැම (අධ්‍යාන පරිච්ඡේදකාලයෙහි ම) එසෙයින් භාවිත වෙයි.

18. සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨහන්තස්ස පනය්‍යෙ භික්ඛුනො කතමෙ ධම්මා පඨමං උප්පජ්ජන්ති, යදි වා කායසඞ්ඛාරො, යදි වා වචීසඞ්ඛාරො, යදි වා චිත්තසඞ්ඛාරොති?

සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨහන්තස්ස ඛො ආවුසො විසාඛ භික්ඛුනො පඨමං උප්පජ්ජති චිත්තසඞ්ඛාරො, තතො කායසඞ්ඛාරො, තතො වචීසඞ්ඛාරොති.

19. සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨිතං පනය්‍යෙ භික්ඛුං කති ඵස්සා ඵුසන්තීති?

සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨිතං ඛො ආවුසො විසාඛ භික්ඛුං තයො ඵස්සා ඵුසන්ති: සුඤ්ඤතො ඵස්සො, අනිමිත්තො ඵස්සො, අප්පණිහිතො ඵස්සොති.

20. සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨිතස්ස පනය්‍යෙ භික්ඛුනො කින්නින්නං චිත්තං හොති කිම්පොණං කිම්පබ්භාරන්ති?

සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨිතස්ස ඛො ආවුසො විසාඛ භික්ඛුනො විවෙකනින්නං චිත්තං හොති විවෙකපොණං විවෙකපබ්භාරන්ති.

21. කති පනය්‍යෙ වෙදනාති?

තිස්සො ඛො ඉමා ආවුසො විසාඛ වෙදනා: සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනාති.

22. කතමා පනය්‍යෙ සුඛා වෙදනා, කතමා දුක්ඛා වෙදනා, කතමා අදුක්ඛමසුඛා වෙදනාති?

යං ඛො ආවුසො විසාඛ කායිකං වා චෙතසිකං වා සුඛං සාතං වෙදයිතං, අයං සුඛා වෙදනා. යං ඛො ආවුසො විසාඛ කායිකං වා චෙතසිකං වා දුක්ඛං අසාතං වෙදයිතං, අයං දුක්ඛා වෙදනා. යං ඛො ආවුසො විසාඛ කායිකං වා චෙතසිකං වා නෙවසාතං නාසාතං වෙදයිතං, අයං අදුක්ඛමසුඛා වෙදනාති.

23. සුඛා පනය්‍යෙ වෙදනා කිංසුඛා, කිංදුක්ඛා? දුක්ඛා වෙදනා කිංදුක්ඛා කිංසුඛා? අදුක්ඛමසුඛා වෙදනා කිංසුඛා කිංදුක්ඛාති?

18. ආයුෂ්මතෙනි, සංඥාවේදයිතනිරොධ සමවතින් නැඟෙන මහණහට කිනම් ධර්ම කෙතෙක් පළමු ව උපදනාහු ද, කායසංස්කාර හෝ උපදනේ වේද? වාක්සංස්කාර හෝ උපදනේ වේ ද? චිත්තසංස්කාර හෝ උපදනේ වේ ද?

ඇවැත විසාඛයෙනි, සංඥාවේදයිත නිරොධසමවතින් නැඟෙන මහණහට පළමු ව චිත්තසංස්කාර උපදනේය. ඉත්පසු කායසංස්කාර උපදනේය. ඉත්පසු වාක්සංස්කාර උපදනේය.

19. ආයුෂ්මතෙනි, කෙතෙක් ස්පර්ශයෝ සංඥාවේදයිතනිරොධසමවතින් නැඟි මහණ පැහැස ගනිද්ද?

ඇවැත විසාඛයෙනි, ස්පර්ශයෝ තුන් දෙනෙක් සංඥාවේදයිතනිරොධසමවතින් නැඟි මහණ පැහැස ගනිති: සුඤ්ඤත පහස, අනිමිත්ත පහස, අප්පණිහිත පහසයි.

20. ආයුෂ්මතෙනි, සංඥාවේදයිතනිරොධසමවතින් නැඟි මහණහුගේ සිත කිමෙක අවනත ව ඇද්ද? කිමෙක ප්‍රවණව (නැමී) ඇද්ද? කිමෙක ප්‍රාග්භාර ව (නැඹුරු) ව ඇද්ද? ඇවැත විසාඛයෙනි, සංඥාවේදයිතනිරොධසමවතින් නැඟි මහණහුගේ සිත උපධිවිවෙකය (නිවන) කෙරෙහි අවනතව ඇත. උපධි විවෙකය කෙරෙහි ප්‍රවණ ව සිටියේ වෙයි. උපධිවිවෙකය කරෙහි (හෙත්නාක් සෙයින්) ප්‍රාග්භාරව සිටියේ වෙයි.

21. ආයුෂ්මතෙනි, වෙදනාවෝ කෙතෙක් ඇද්ද? ඇවැත විසාඛයෙනි, මේ වෙදනාවෝ තුන්දෙනෙකි: සුඛවෙදනාය, දුඃඛවෙදනාය, අදුඃඛාසුඛවෙදනායි.

22. ආයුෂ්මතෙනි, සුඛවෙදනා කවරි? දුඃඛවෙදනා කවරි? අදුඃඛාසුඛ වෙදනා කවර?

ඇවැත විසාඛයෙනි, (පඤ්චද්වාරික විසින්) කායික වූ (මනොද්වාරික) විසින් මිහිරි සැහැවි ඇති යම් සුඛවෙදනාවෙක් ඇද්ද, මේ සුඛ සඟගිය වෙදනා වෙයි. ඇවැත විසාඛයෙනි, කායික වේවයි, චෛතසික වේවයි, නොමිහිරි සැහැවි ඇති යම් දුක්ඛවෙදනාවෙක් ඇද්ද, මේ දුක්වෙදනා වෙයි. ඇවැත විසාඛයෙනි, කායික වේවයි, චෛතසික වේවයි, මධුරත් අමධුරත් නො වූ යම් වෙදනාවෙක් ඇද්ද, මේ අදුඃඛාසුඛ වෙදනායි කියූ.

23. ආයුෂ්මතෙනි, සුඛවෙදනා කුමක් සුඛ කොට ඇති වේ ද, කුමක් දුක් කොට ඇති වේ ද? දුඃඛවෙදනා කුමක් දුක් කොට ඇති වේ ද, කුමක් සුඛ කොට ඇති වේ ද? උපෙක්ෂාවෙදනා කුමක් සුඛ කොට ඇති වේද, කුමක් දුක් කොට ඇති වේ ද?

සුඛා ඛො ආවුසො විසාඛ වෙදනා ඨිතිසුඛා විපරිණාමදුක්ඛා, දුක්ඛා වෙදනා ඨිතිදුක්ඛා විපරිණාමසුඛා, අදුක්ඛමසුඛා වෙදනා ඤාණසුඛා අඤ්ඤාණදුක්ඛාති.

24. සුඛාය පනාය්‍යෙ වෙදනාය කිං අනුසයො අනුසෙති? දුක්ඛාය වෙදනාය කිං අනුසයො අනුසෙති? අදුක්ඛමසුඛාය වෙදනාය කිං අනුසයො අනුසෙතීති?

සුඛාය ඛො ආවුසො විසාඛ වෙදනාය රාගානුසයො අනුසෙති. දුක්ඛාය වෙදනාය පටිඝානුසයො අනුසෙති. අදුක්ඛමසුඛාය වෙදනාය අවිජ්ජානුසයො අනුසෙතීති.

25. සබ්බාය නු ඛො අය්‍යෙ සුඛාය වෙදනාය රාගානුසයො අනුසෙති? සබ්බාය දුක්ඛාය වෙදනාය පටිඝානුසයො අනුසෙති? සබ්බාය අදුක්ඛමසුඛාය වෙදනාය අවිජ්ජානුසයො අනුසෙතීති?

න ඛො ආවුසො විසාඛ සබ්බාය සුඛාය වෙදනාය රාගානුසයො අනුසෙති. න සබ්බාය දුක්ඛාය වෙදනාය පටිඝානුසයො අනුසෙති. න සබ්බාය අදුක්ඛමසුඛාය වෙදනාය අවිජ්ජානුසයො අනුසෙතීති.

26. සුඛාය පනාය්‍යෙ වෙදනාය කිං පහාතබ්බං? දුක්ඛාය වෙදනාය කිං පහාතබ්බං? අදුක්ඛමසුඛාය වෙදනාය කිං පහාතබ්බන්ති?

සුඛාය ඛො ආවුසො විසාඛ වෙදනාය රාගානුසයො පහාතබ්බො. දුක්ඛාය වෙදනාය පටිඝානුසයො පහාතබ්බො. අදුක්ඛමසුඛාය වෙදනාය අවිජ්ජානු-සයො පහාතබ්බොති.

27. සබ්බාය නු ඛො අය්‍යෙ සුඛාය වෙදනාය රාගානුසයො පහාතබ්බො? සබ්බාය දුක්ඛාය වෙදනාය පටිඝානුසයො පහාතබ්බො? සබ්බාය අදුක්ඛම-සුඛාය වෙදනාය අවිජ්ජානුසයො පහාතබ්බොති?

න ඛො ආවුසො විසාඛ සබ්බාය සුඛාය වෙදනාය රාගානුසයො පහාතබ්බො. න සබ්බාය දුක්ඛාය වෙදනාය පටිඝානුසයො පහාතබ්බො. න සබ්බාය අදුක්ඛමසුඛාය වෙදනාය අවිජ්ජානුසයො පහාතබ්බො.

ඇවැත විසාඛයෙනි, සුඛවෙදනා ස්ථිති (අස්තිභාවයෙහි) සුඛ වෙයි. විපරිණාම (නාස්තිභාවයෙහි) දුඃඛ වෙයි. දුඃඛවෙදනා ස්ථිති දුඃඛ වෙයි. විපරිණාම සුඛ වෙයි. උපෙක්ෂාවෙදනා ඥාන සුඛ (දන්නාබව සුව කොට ඇති) වෙයි. අඥාන දුඃඛ (නොදන්නාබව දුක්කොට ඇති) වෙයි.

24. ආයුෂ්මතුනි, සුඛවෙදනායෙහි කිනම් අනුශය දහමෙක් (නොපුහුන් බැවින් සතන්හි) හෝනේ වේ ද? දුඃඛ වෙදනායෙහි කිනම් අනුශය දහමෙක් (සතන්හි) ලගනේ වේ ද? උපෙක්ෂාවෙදනායෙහි කිනම් අනුශය දහමෙක් ලුහුබැඳ ලැගගන්නේ වේ ද?

ඇවැත විසාඛයෙනි, සුඛවෙදනායෙහි රාගානුශය අනුශායන කෙරෙයි. දුඃඛවෙදනායෙහි ප්‍රතිඝානුශය හෝනේ වෙයි. උපෙක්ෂාවෙදනායෙහි අවිද්‍යානුශය හෝනේ වෙයි.

25. ආයුෂ්මතුනි, හැම සුඛවෙදනායෙහි රාගානුශය ලුහුබැඳගෙන ලගනේ වේ ද? හැම දුඃඛවෙදනායෙහි ප්‍රතිඝානුශය ලුහුබැඳගෙන ලගනේ වේ ද? හැම උපෙක්ෂාවෙදනායෙහි අවිද්‍යානුශය ලුහුබැඳගෙන ලගනේ වේ ද?

ඇවැත විසාඛයෙනි, හැමසුඛවෙදනායෙහි රාගානුශය නො ලගනේය. හැම දුඃඛවෙදනායෙහි ප්‍රතිඝානුශය නො ලගනේය. හැම උපෙක්ෂා වෙදනා-යෙහි අවිද්‍යානුශය නො ලගනේය.

26. ආයුෂ්මතුනි, සුඛවෙදනායෙහි කිමෙක් ප්‍රහාතව්‍ය වේ ද? දුඃඛ-වෙදනායෙහි කිමෙක් ප්‍රහාතව්‍ය වේ ද? උපෙක්ෂා වෙදනායෙහි කිමෙක් ප්‍රහාතව්‍ය වේ ද?

ඇවැත විසාඛයෙනි, සුඛවෙදනායෙහි රාගානුශය ප්‍රහාතව්‍ය වේ. දුඃඛවෙදනායෙහි ප්‍රතිඝානුශය ප්‍රහාතව්‍ය වේ. උපෙක්ෂා වෙදනායෙහි අවිද්‍යානුශය ප්‍රහාතව්‍ය වේ.

27. ආයුෂ්මතුනි, හැම සුඛවෙදනායෙහි රාගානුශය ප්‍රහාතව්‍ය වේ ද? හැම දුඃඛවෙදනායෙහි ප්‍රතිඝානුශය ප්‍රහාතව්‍ය වේ ද? හැම උපෙක්ෂාවෙදනා-යෙහි අවිද්‍යානුශය ප්‍රහාතව්‍ය වේ ද?

ඇවැත විසාඛයෙනි, හැම සුඛවෙදනායෙහි රාගානුශය ප්‍රහාතව්‍ය නො වේ. හැම දුඃඛවෙදනායෙහි ප්‍රතිඝානුශය ප්‍රහාතව්‍ය නො වේ. හැම උපෙක්ෂාවෙදනායෙහි අවිද්‍යානුශය ප්‍රහාතව්‍ය නො වේ.

ඉධාවුසො විසාඛ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. රාගං තෙන පජහති. න තත්ථ රාගානුසයො අනුසෙති.

ඉධාවුසො විසාඛ භික්ඛු ඉති පටිසඤ්චික්ඛති: 'කුදාස්සු නාමාහං තදායතනං උපසම්පජ්ජ විහරිස්සාමි, යදරියා එතරහි ආයතනං උපසම්පජ්ජ විහරන්තී'ති. ඉති අනුත්තරෙසු විමොක්ඛෙසු පිහං උපට්ඨාපයතො උප්පජ්ජති. පිහාපච්චයා දොමනස්සං. පටිඝං තෙන පජහති. න තත්ථ පටිඝානුසයො අනුසෙති.

ඉධාවුසො විසාඛ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අවිජ්ජං තෙන පජහති. න තත්ථ අවිජ්ජානුසයො අනුසෙතීති.

28. සුඛාය පනාය්‍යෙ වෙදනාය කිං පටිභාගොති?.

සුඛාය ඛො ආවුසො විසාඛ වෙදනාය දුක්ඛා වෙදනා පටිභාගොති.

29. දුක්ඛාය පනාය්‍යෙ වෙදනාය කිං පටිභාගොති?

දුක්ඛාය ඛො ආවුසො විසාඛ වෙදනාය සුඛා වෙදනා පටිභාගොති.

30. අදුක්ඛමසුඛාය පනාය්‍යෙ වෙදනාය කිං පටිභාගොති?

අදුක්ඛමසුඛාය ඛො ආවුසො විසාඛ වෙදනාය අවිජ්ජා පටිභාගොති.

31. අවිජ්ජාය පනාය්‍යෙ කිං පටිභාගොති?

අවිජ්ජාය ඛො ආවුසො විසාඛ විජ්ජා පටිභාගොති.

32. විජ්ජාය පනාය්‍යෙ කිං පටිභාගොති?

විජ්ජාය ඛො ආවුසො විසාඛ විමුත්ති පටිභාගොති.

33. විමුත්තියා පනාය්‍යෙ කිං පටිභාගොති?

විමුත්තියා ඛො ආවුසො විසාඛ නිබ්බානං පටිභාගොති.

ඇවැත විසාඛයෙනි, මෙ සස්නෙහි මහණ කාමයෙන් වෙන් ව අකුසල් දහමින් වෙන් ව සවිතර්ක, සවිචාර, විවෙකජ ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යාන උපදා ගෙන වාස කෙරෙ. ඒ ප්‍රථමධ්‍යානයෙන් රාගය ප්‍රහීණ කෙරෙ. ඒ ප්‍රථමධ්‍යාන(සුඛවෙදනා)යෙහි රාගානුශය ලුහුබැඳ ගෙන හෝනේ නො වෙයි.

ඇවැත විසාඛයෙනි, මෙසස්නෙහි මහණ මෙසෙයින් ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙ: "ආර්‍ය්‍යයෝ දැන් යම් රහත්බවක් (ඇපිඇපිසඳ) සමවැද වෙසෙද්ද, මම කිනම් දිනෙක ඒ අර්හත්ත්වායතනයට සමවැද වෙසෙම් දෝ" කියායි. මෙසේ අනුත්තරවිමොක්‍ෂයෙහි (අර්හත්ත්වයෙහි) ප්‍රාර්ථනා එලවා තවනුවගට තත්ප්‍රාර්ථනා නො ලැබීම් හෙතුයෙන් දොම්නස් උපදනේ වෙයි. ඒ දෞර්මනස්‍යයෙන් ප්‍රතිඝ දුරුකෙරෙ. තද්රූපදෞර්මනස්‍ය(දුඃඛවෙදනා)යෙහි ප්‍රතිඝානුශය අනුශයන නො කෙරෙ.

ඇවැත විසාඛයෙනි, මෙසස්නෙහි මහණ සුඛයාගේ ද දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් සොම්නස් දොම්නසුත් කලින් ම පහව යැමෙන් අදුඃඛ වූ, අසුඛ වූ, උපෙක්‍ෂාවෙන් ජනිත ස්මෘතිපරිශුද්ධි ඇති චතුර්ථධ්‍යාන සමවැද වෙසෙයි. ඒ චතුර්ථධ්‍යානයෙන් අවිද්‍යා පුහුත් කෙරෙ. ඒ ධ්‍යාන (උපෙක්‍ෂා වෙදනා) යෙහි අවිද්‍යානුශය ලුහුබැඳ ලගනේ නො වෙයි.

28. ආර්‍ය්‍යාවෙනි, සුඛවෙදනාවට ප්‍රතිභාග කිම?

ඇවැත විසාඛයෙනි, සුඛවෙදනාවට දුඃඛවෙදනා විසභාග (විරුද්ධ) ප්‍රතිභාග වෙයි.

29. ආර්‍ය්‍යාවෙනි, දුඃඛවෙදනාවට ප්‍රතිභාග කිම?

ඇවැත විසාඛයෙනි, දුඃඛවෙදනාවට සුඛවෙදනා විසභාග (විරුද්ධ) ප්‍රතිභාග වෙයි.

30. ආර්‍ය්‍යාවෙනි, උපෙක්‍ෂාවෙදනාවට ප්‍රතිභාග කිම?

ඇවැත විසාඛයෙනි, උපෙක්‍ෂාවෙදනාවට අවිද්‍යා සභාග (අවිරුද්ධ) ප්‍රතිභාග වෙයි.

31. ආර්‍ය්‍යාවෙනි, අවිද්‍යාවට ප්‍රතිභාග කිම?

ඇවැත විසාඛයෙනි, අවිද්‍යාවට විද්‍යා විසභාගප්‍රතිභාග වෙයි.

32. ආර්‍ය්‍යාවෙනි, විද්‍යාවට ප්‍රතිභාග කිම?

ඇවැත විසාඛයෙනි, විද්‍යාවට විමුක්ති සභාගප්‍රතිභාග වෙයි.

33. ආර්‍ය්‍යාවෙනි, විමුක්තියට ප්‍රතිභාග කිම?

ඇවැත විසාඛයෙනි, විමුක්තියට නිවන සභාගප්‍රතිභාග වෙයි.

34. නිබ්බානස්ස පනය්‍යෙ කිං පටිභාගොති?

අච්චසරාවුසො[1] විසාඛ පඤ්හං. නාසක්ඛි පඤ්හානං පරියන්තං ගහෙතුං. නිබ්බානොගධං හි ආවුසො විසාඛ බ්‍රහ්මචරියං නිබ්බාන පරායනං නිබ්බාන පරියොසානං. ආකඞ්ඛමානො ච ත්වං[2] ආවුසො විසාඛ භගවන්තං උපසඞ්කමිත්වා එතමත්ථං පුච්ඡෙය්‍යාසි, යථා ච තෙ භගවා බ්‍යාකරොති තථා නං ධාරෙය්‍යාසීති.

අථ ඛො විසාඛො උපාසකො ධම්මදින්නාය භික්ඛුනියා භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා ධම්මදින්නං භික්ඛුනිං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො විසාඛො උපාසකො යාවතකො අහොසි ධම්මදින්නාය භික්ඛුනියා සද්ධිං කථාසල්ලාපො, තං සබ්බං භගවතො ආරොචෙසි.

එවං වුත්තෙ භගවා විසාඛං උපාසකං එතදවොච: පණ්ඩිතා විසාඛ ධම්මදින්නා භික්ඛුනී, මහාපඤ්ඤා විසාඛ ධම්ම දින්නා භික්ඛුනී. මමඤ්චෙපි ත්වං විසාඛ එතමත්ථං පුච්ඡෙය්‍යාසි, අහම්පි තං එවමෙවං[3] බ්‍යාකරෙය්‍යං යථා තං ධම්මදින්නාය භික්ඛුනියා බ්‍යාකතං. එසො චෙවෙතස්ස[4] අත්ථො. එවමෙතං ධාරෙහීති.

ඉදමවොච භගවා. අත්තමනො විසාඛො උපාසකො භගවතො භාසිතං අභිනන්දීති.

චූළවෙදල්ලසුත්තං චතුත්ථං.

1. අච්චයාසි ආවුසො, මජසං 2. ආකඞ්ඛමානො ත්වං, සී. 3. එවමෙව, සයා.
4. එසො චෙතස්ස, සයා.

34. ආර්‍ය්‍යාවෙනි, නිවනට ප්‍රතිභාග කිම?

ඇවැත විශාඛයෙනි, පැන පත්වා ගියෙහි නො. ප්‍රශ්නයන්ගේ පර්‍ය්‍යන්තය ගන්නට නොහැකි විහි නො. ඇවැත විශාඛයෙනි, බ්‍රහ්මචරවස නිවන් බැසගෙන ඇත. නිවන් පරම්ගති කොට ඇත. නිවන් කෙළවර කොට ඇත. ඇවැත විශාඛයෙනි, තෙපි කැමැතියහු නම් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ තෙල අරුත් විචාරව භාග්‍යවතුන් වහන්සේ යම්පරිදි තොපට විභාග කොට වදාරද්ද, එ අරුත් එපරිදි ගෙන ධරව.

එක්බිති විශාඛ උපාසක ධම්මදින්නා මෙහෙණගේ තෙපුල් අභිනන්දන කොට අනුමෝදන් ව හුනස්නෙන් නැඟී ධම්මදින්නා මෙහෙණ සකසා වැඳ පැදකුණු කොට භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ මැනැවින් වැඳ එකත්පසෙක හිඳ. එකත්පස්ව හුන් විශාඛ උපාසක ධම්මදින්නා මෙහෙණ හා සමග යම්තාක් කථා සංලාප වී ද, එතැම භාග්‍යවතුන් වහන්සේට සැලකෙළේය.

මෙසේ සැලකලකල්හි භාග්‍යවතුන් වහන්සේ විශාඛ උපාසකහට තෙල වදාළහ: විශාඛයෙනි, ධම්මදින්නා මෙහෙණ පණ්ඩිතභාව ඇතියක. විශාඛයෙනි, ධම්මදින්නා මෙහෙණ මහපැන ඇතියක. විශාඛයෙනි, තෙපි මසිත් තෙල පැන පුළුවුස්තහු නම්, යම් පරිදි ධම්මදින්නා මෙහෙණ විසින් පවසන ලද නම්, මම ද එය එපරිදි ම ප්‍රකාශ කරමි. තෙල භාෂිතයාගේ අර්ථ තෙල ම වෙයි. තෙල අරුත් එපරිදි ම ධරව.

භාග්‍යවතුන් වහන්සේ මේ බස් වදාළසේක. (ප්‍රීතිසෞමනස්‍යයෙන්) ගත් සිතැති විශාඛ උපාසක භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිමුඛ ව ගෙන සතුටු වී.

චූලවෙදල්ලසූත්‍රය සතරවැනියි.

1. 5. 5.

චූළධම්මසමාදාන සුත්තං

1. එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. චත්තාරිමානි භික්ඛවෙ ධම්මසමාදානානි. කතමානි චත්තාරි?

අත්ථි භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නසුඛං ආයතිං දුක්ඛ විපාකං. අත්ථි භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛඤ්චෙව ආයතිඤ්ච දුක්ඛවිපාකං. අත්ථි භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්න දුක්ඛං ආයතිං සුඛවිපාකං. අත්ථි භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නසුඛඤ්චෙව ආයතිඤ්ච සුඛවිපාකං.

3. කතමඤ්ච භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නසුඛං ආයතිං දුක්ඛ විපාකං?

සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: නත්ථි කාමෙසු දොසොති. තෙ කාමෙසු පාතව්‍යතං[1] ආපජ්ජන්ති. තෙ ඛො මොළිබද්ධාහි[2] පරිබ්බාජිකාහි පරිචාරෙන්ති. තෙ එවමාහංසු: 'කිං සු නාම තෙ භොන්තො සමණබ්‍රාහ්මණා කාමෙසු අනාගතභයං සම්පස්සමානා කාමානං පහානමාහංසු, කාමානං පරිඤ්ඤං පඤ්ඤපෙන්ති[3]? සුඛො ඉමිස්සා පරිබ්බාජිකාය තරුණාය මුදුකාය ලොමසාය බාහාය සම්ඵස්සො'ති. තෙ කාමෙසු පාතව්‍යතං ආපජ්ජන්ති. තෙ කාමෙසු පාතව්‍යතං ආපජ්ජිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති.[4] තෙ තත්ථ දුක්ඛා තිප්පා[5] කටුකා වෙදනා වෙදියන්ති. තෙ එවමාහංසු: 'ඉදං ඛො තෙ භොන්තො සමණබ්‍රාහ්මණා කාමෙසු අනාගතභයං සම්පස්සමානා කාමානං පහානමාහංසු, කාමානං පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, ඉමෙහි[6] මයං කාමහෙතු කාමනිදානා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියාමා'ති.

සෙය්‍යථාපි භික්ඛවෙ ගිම්හානං පච්ඡිමෙ මාසෙ මාලුවාසිපාටිකා ඵලෙය්‍ය, අථ ඛො තං භික්ඛවෙ මාලුවාබීජං අඤ්ඤතරස්මිං සාලමූලෙ නිපතෙය්‍ය, අථ ඛො භික්ඛවෙ යා තස්මිං සාලෙ අධිවත්ථා දෙවතා සා භීතා සංවිග්ගා සන්තාසං ආපජ්ජෙය්‍ය. අථ ඛො භික්ඛවෙ තස්මිං සාලෙ අධිවත්ථාය දෙවතාය මිත්තාමච්චා ඤාතිසාලොහිතා ආරාමදෙවතා වනදෙවතා රුක්ඛ-දෙවතා ඔසධිතිණවනප්පතීසු අධිවත්ථා දෙවතා සඞ්ගම්ම සමාගම්ම එවං සමස්සාසෙය්‍යුං:

---

1. පාතබ්‍යතං, මජසං. ස්‍යා. PTS.
2. තෙ මොළිබන්ධාහි, ස්‍යා.
3. පඤ්ඤපෙන්ති, මජසං.
4. උපපජ්ජන්ති, සී
5. තිබ්බා ඛරා, මජසං
6. කාමෙහි, සී, කම්බො

1. 5. 5.

චූළධම්මසමාදාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ ජේතවන නම් වූ, අනේපිඬු මහසිටාණන්ගේ අරම්හි වැඩවසන සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ මහණෙනියි භික්ෂූන් ඇමතූසේක. වහන්සැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

2. මහණෙනි, ධර්මසමාදානයෝ මොහු සතරදෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මේ වත්මනු සුව දෙන මතුයෙහි දුක්විපාදෙන ධර්මසමාදානයෙක් ඇත. මහණෙනි, මෙ වත්මනු දුක්ද වූත්, මතුයෙහි ද දුක් විපාද වූත් ධර්මසමාදානයෙක් ඇත. මහණෙනි, මෙවත්මනු දුක්ද, මතුයෙහි සුවවිපාද ධර්මසමාදානයෙක් ඇත. මහණෙනි, මෙ වත්මනු සුවදවූත්, මතුයෙහිදු සුවවිපාද වූ ධර්මසමාදානයෙක් ඇත.

3 මහණෙනි, ප්‍රත්‍යුත්පන්නසුඛ ඇති, අනාගතවිපාකකාලයෙහි දුඃඛවිපාක ඇති ධර්මසමාදාන නම් කවරේ ය යත්:

මහණෙනි, වස්තුකාම හා ක්ලේශකාමයෙහි දොසෙක් නැතැයි එවංවාදී වූ (මෙසේයයි බණනා සැහැවි ඇති) එවංදෘෂ්ටික වූ (මෙසේයයි ගත් දෘෂ්ටිගත ඇති) මහණබමුණු කෙනෙක් ඇත. ඔහු වස්තුකාමයෙහි (ක්ලේශකාමද්වාරයෙන්) පිය යුතු බවට (රිසිසේ වැළඳිය යුතු බවට) පැමිණෙති. ඔහු මොළි බැඳි තාපසපරිබ්‍රාජිකාවන් හා ඉඳුරන් පිනවත්. ඔහු මෙසේ බණෙති: 'ඒ භවත් මහණ බමුණෝ කාමයෙහි කිනම් අනාබියක් දක්මින් කාමප්‍රහාණය කියද්ද, කාමසමතික්‍රමය පනවද්ද? තරුණ, මෘදු, ලූ ඇති මේ පරිබ්‍රාජිකාවගේ බාහු පහස සුවද වෙතියි, (මෙසේ බැණ) ඔහු කාමයෙහි පියයුතු බවට පැමිණෙති. ඔහු කාමයෙහි (ආස්වාද විසින්) පියයුතු බවට වැද කාබිත් මරණින් මතුයෙහි අපාය වූ, දුර්ගති වූ, විනිපාත වූ නිරයට එළඹෙති. ඔහු ඒ නිරැහි තීව්‍ර, කටුක, දුක්වේදනා විඳුති. (එසඳ) ඔහු මෙසේ කියති: 'ඒ භවත් මහණ බමුණෝ කාමයෙහි මේ අනාබිය දක්මින් කාමප්‍රහාණය කියති, කාමසමතික්‍රමය පනවති. මේ අපි කාමහෙතුයෙන් දුඃඛ, තීව්‍ර, කටුක වේදනා විඳුම්හ'යි.

මහණෙනි, යම්පරිදි ග්‍රීෂ්මමාසයන් කෙරෙහි පැසිම් මස (සිපත් බඳු දිගු සටහන් ඇති) මාලුවා ලියපල පැලෙනු වේ ද, මහණෙනි, එක්බිති ඒ මාලුවා ලියබිජු එක්තරා රුක්මුලෙක හෙන්නේ වේ ද, මහණෙනි, එකල එරුක්හි අධිපති ව වාස කරන යම් දෙවියෙක් ඇද්ද, ඒ දෙවි බියපත් ව සංවිග්න ව සංත්‍රාසයට පැමිණෙන්නේ වේ ද, මහණෙනි, එසඳ එරුක්හි අධිවාස කරන දෙවිහුගේ මිත්‍රාමාත්‍යයන් හා නෑසාලේනෑ වූ අරම්වැසි-දෙවියන් හා වනවැසි දෙවියෝ ද, රුක්වැසි දෙවියන් හා ඖෂධිතෘණ වනස්පති වෘක්ෂයෙහි අධිපති ව වසන දෙවියෝද මුළුදී මෙසේයයි අස්වැසුම් කෙරෙති:

‘මා භවං භායි, මා භවං භායි. අප්පෙව නාමේතං මාලුවා බීජං මොරෙ වා ගිලෙය්‍ය, මගො වා[1] ඛාදෙය්‍ය, දවඩාහො[2] වා ඩහෙය්‍ය, වනකම්මිකා වා උද්ධරෙය්‍යුං, උපචිකා වා උද්‍රභෙය්‍යුං[3], අබීජං වා පනස්සා’ති. අථ ඛො තං භික්ඛවෙ මාලුවාබීජං නෙව මොරෙ ගිලෙය්‍ය, න මගො ඛාදෙය්‍ය, න දවඩාහො ඩහෙය්‍ය, න වනකම්මිකා උද්ධරෙය්‍යුං, න උපචිකා උද්‍රභෙය්‍යුං, බීජංච[4] පනස්ස. තං පාවුස්සකෙන මෙඝෙන අභිප්පවට්ඨං සම්මදෙව විරූළ්හෙය්‍ය. සාස්ස මාලුවාලතා තරුණා මුදුකා ලොමසා විලම්බිනී, සා තං සාලං උපනිසෙවෙය්‍ය.

අථ ඛො භික්ඛවෙ තස්මිං සාලෙ අධිවත්ථාය දෙවතාය එවමස්ස: “කිං නු නාම තෙ භොන්තො මිත්තාමච්චා ඤාතිසාලොහිතා ආරාමදෙවතා වනදෙවතා රුක්ඛදෙවතා ඔසධිතිණවනප්පතීසු අධිවත්ථා දෙවතා මාලුවාබීජෙ අනාගතභයං සම්පස්සමානා සඞ්ගම්ම සමාගම්ම එවං සමස්සාසෙසුං: මා භවං භායි. මා භවං භායි. අප්පෙව නාමේතං මාලුවාබීජං මොරෙ වා ගිලෙය්‍ය මගො වා ඛාදෙය්‍ය දවඩාහො වා ඩහෙය්‍ය, වනකම්මිකා වා උද්ධරෙය්‍යුං, උපචිකා වා උද්‍රභෙය්‍යුං, අබීජං වාපනස්සාති. සුඛො ඉමිස්සා මාලුවාලතාය තරුණාය මුදුකාය ලොමසාය විලම්බිනියා සම්ඵස්සො”ති. සා තං සාලං අනුපරිහරෙය්‍ය, සා තං සාලං අනුපරිහරිත්වා උපරි විටභිං කරෙය්‍ය, උපරි විටභිං කරිත්වා ඔඝනං ජනෙය්‍ය, ඔඝනං ජනෙත්වා යෙ තස්ස සාලස්ස මහන්තා මහන්තා ඛන්ධා තෙ පදාලෙය්‍ය. අථ ඛො භික්ඛවෙ තස්මිං සාලෙ අධිවත්ථාය දෙවතාය එවමස්ස: “ඉදං ඛො තෙ භොන්තො මිත්තාමච්චා ඤාතිසාලොහිතා ආරාමදෙවතා වනදෙවතා රුක්ඛදෙවතා ඔසධිතිණවනප්පතීසු අධිවත්ථා දෙවතා මාලුවාබීජෙ අනාගතභයං සම්පස්සමානා සඞ්ගම්ම සමාගම්ම එවං සමස්සාසෙසුං: මා භවං භායි, මා භවං භායි. අප්පෙව නාමේතං මාලුවාබීජං මොරෙ වා ගිලෙය්‍ය මගො වා ඛාදෙය්‍ය දවඩාහො වා ඩහෙය්‍ය වනකම්මිකා වා උද්ධරෙය්‍යුං උපචිකා වා උද්‍රභෙය්‍යුං, අබීජංවා පනස්සාති, යඤ්චාහං මාලුවාබීජහෙතු දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියාමි”ති.

එවමෙව ඛො භික්ඛවෙ සන්ති එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවදිට්ඨිනො: නත්ථි කාමෙසු දොසොති. තෙ කාමෙසු පාතබ්‍යතං ආපජ්ජන්ති. තෙ මොළිබද්ධාහි පරිබ්බාජිකාහි පරිචාරෙන්ති. තෙ එවමාහංසු:

1. මිගො, සයා.. සී කම්බොජ 2. වනදාහො, මජසං.
3. උද්දෙහෙය්‍යුං, සී. කම්බොජ. 4. බීජං, මජසං. බීජත්තාය, සයා. බීජං වා, සී.

"භවත් තහමක් බියපත්වා, භවත් තහමක් බියපත්වා. මොණරෙක් හෝ තෙල මාලුවා බිජු ගලත්තේ නම්, මුවෙක් හෝ බුදිත්තේ නම්, ලැව්ගිනි හෝ දවත්තේ නම්, වනකම් කරනුවෝ හෝ උදුරා ලත්තාහු නම්, වේයෝ හෝ කත්තාහු නම්, අබීජ හෝ වේ නම්, මනා මැනු" යි. එතෙකුදු වුව මහණෙනි, මොණරෙක් හෝ ඒ මාලුවා බිජු නොම ගැලැගත්තේය මුවෙක් හෝ නො බුදිත්තේ ය. ලැව්ගිනි හෝ නො දවත්තේය. වනකම්යෙහි නියුක්තයෝ හෝ නො උදුරාලත්තාහ. වේයෝ හෝ නොකත්තාහ. (එයින්) බීජයෙක් ම වෙයි. එ බිජු ප්‍රාවෘෂ්‍යමෙඝයා (වැසිකල මහමෙ) විසින් මොනොවට වස්නා ලදුව මනාකොට ම නැගෙත්තේය. ඒ මාලුවාලිය (වැඩුණි) තරුණ ව මෘදු ව බූ ඇති ව ඔබමොබ ලෙලෙනු වෙයි. ඒ මාලුවා ලතා එ රුක් පිරිරැඹ සෙවුනී වෙයි.

මහණෙනි, එසඳ එ රුක්හි අධිපති ව වසන දෙව්පුත්හට මෙසේ සිත් වෙයි: "ඒ භවත් මිත්‍රාමාත්‍යයන් හා නෑසහලේ නෑ වූ අරම්වැසිදෙවියන් හා වනවැසිදෙවියෝ රුක්වැසිදෙවියන් හා ඔෂධිතෘණ වනදෙවූ රුක්හි නිවැසි දෙවියෝ මාලුවා ලියැ කිනම් අනාබියක් දක්මින් මුළුදී මෙසෙයින් අස්වසාලූහු ද: "භවත් නොබාතේ මැනැව, භවත් නො බාතේ මැනැව. මොණරෙක් හෝ තෙල මාලුවාබීජය ගැලැගත්තේ නම්, මුවෙක් හෝ කත්තේ නම්, ලැව්ගිනි හෝ දවත්තේ නම්, වන කැමියෝ හෝ උදුරා ලත්තාහු නම්, වේයෝ හෝ කත්තාහු නම්, අබීජ හෝ වේනම් මනා මැනු යි. තරුණ, මෘදු, බූ ඇති, ඔබමොබ ලෙලෙන, මේ මාලුවාලතායෙහි පහස සුවද වෙයි." (මෙවත් සිත් වෙයි.) එ මාලුවාලිය එ රුක් වැලඳ ගනී. එ ලිය එ රුක් වැලඳගෙන මතුයෙහි (ඡත්‍රාකාරයෙන්) වෙලඹ කොට ගනී. මතුයෙහි වෙලෙප් කොට ගෙන අවසන (යට බස්මින් අවට වසාගත් ලතාගුල්ම) උපදවයි. අවසන උපදවා එ රුක්හි යම් මහත් මහත් කඳ ඇත් ද, ඒ කඳ පලාපියයි. මහණෙනි, එසඳ එ රුක්හි අධිපති ව වසන දෙවිහට මෙසේ සිත් වෙයි: "ඒ භවත් මිත්‍රාමාත්‍යයන් හා නෑසාලේනෑවූ, අරම්වැසිදෙවියන් හා වනවැසිදෙවියෝ, රුක්වැසිදෙවියන් හා ඔෂධිතෘණවනස්පති වෘක්ෂයෙහි නිවැසි දෙවියෝ මාලුවාබීජයෙහි මේ අනාබිය දක්මින් මුළුදී මෙසේ අස්වැසුහු - භවත්, නොබාතේ මැනැව, භවත් නොබාතේ මැනැව. මොණරෙක් හෝ තෙල මාලුවා බීජය ගැලැගත්තේ නම්, මුවෙක් හෝ කත්තේ නම්, ලැව්ගිනි හෝ දවත්තේ නම්, වනකැමියෝ හෝ උදුරාපියත්තාහු නම් වේයෝ හෝ කත්තාහු නම්, අබීජ හෝ වේ නම් මනා මැනුයි කියායි. මම (දැන්) යම් හෙයෙකින් මාලුවාබීජහෙතුයෙන් දුක්, තිව්‍ර, කටුක වේදනා විඳිම් ද, (එහෙයින් එසේ අස්වැසූහුය.)

මහණෙනි, එපරිදි ම 'වස්තුකාම හා ක්ලේශකාමයෙහි දෙසෙක් නැති'යි එවංවාදී වූ, එව දෘෂ්ටික වූ මහණ බමණු කෙනෙක් ඇත. ඔහු වස්තුකාමයෙහි පියයුතු බවට පැමිණෙති. ඔහු මොළි බැඳි තාපසපරිබ්‍රාජකාවන් හා ඉදුරත් පිනවති. ඔහු මෙසේ බෙණෙති:

Free Distribution www.aathaapi.org

කිං – සුත්වා මෙ භොන්තො සමණබ්‍රාහ්මණා කාමෙසු අනාගතභයං සම්පස්සමානා කාමානං පහානමාහංසු, කාමානං පරිඤ්ඤං පඤ්ඤාපෙන්ති? 'සුඛො ඉමිස්සා පරිබ්බාජිකාය තරුණාය මුදුකාය ලොමසාය බාහාය සම්ඵස්සො'ති. තෙ කාමෙසු පාතබ්‍යතං ආපජ්ජන්ති. තෙ කාමෙසු පාතබ්‍යතං ආපජ්ජිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති. තෙ තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති. තෙ එවමාහංසු: ඉදං ඛො භොන්තො සමණබ්‍රාහ්මණා කාමෙසු අනාගතභයං සම්පස්සමානා කාමානං පහානමාහංසු. කාමානං පරිඤ්ඤං පඤ්ඤාපෙන්ති. ඉමෙ හි මයං කාමහෙතු කාමනිදානං දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියාමා'ති. ඉදං වුච්චති භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නසුඛං ආයතිං දුක්ඛවිපාකං.

4. කතමඤ්ච භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛඤ්චෙව ආය-තිඤ්ච දුක්ඛවිපාකං?

ඉධ භික්ඛවෙ එකච්චො අචෙලකො හොති මුත්තාචාරො හත්ථාවලෙඛනො. න එහිභද්දන්තිකො න තිට්ඨභද්දන්තිකො, න අභිහටං න උද්දිස්සකතං න නිමන්තනං සාදියති. සො න කුම්භිමුඛා පටිග්ගණ්හාති, න කළොපිමුඛා පටිග්ගණ්හාති, න එළකමන්තරං න දණ්ඩමන්තරං න මුසලමන්තරං න ද්වින්නං භුඤ්ජමානානං, න ගබ්භිනියා න පායමානාය න පුරිසන්තරගතාය, න සඞ්කිත්තීසු, න යත්ථ සා උපට්ඨිතො හොති, න යත්ථ මක්ඛිකා සණ්ඩසණ්ඩචාරිණී, න මච්ඡං න මංසං. න සුරං න මෙරයං න ථුසොදකං පිබති. –

සො එකාගාරිකො වා හොති එකාලොපිකො, ද්වාගාරිකො වා හොති ද්වාලොපිකො, -පෙ- සත්තාගාරිකො වා හොති සත්තාලොපිකො. එකිස්සාපි දත්තියා යාපෙති, ද්වීහිපි දත්තීහි යාපෙති -පෙ- සත්තහිපි දත්තීහි යාපෙති. එකාහිකම්පි ආහාරං ආහාරෙති, ද්වාහිකම්පි ආහාරං ආහාරෙති, -පෙ- සත්තාහිකම්පි ආහාරං ආහාරෙති. ඉති එවරූපං අද්ධමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරති.

'ඒ භවත් මහණ බමුණෝ කාමයෙහි කිනම් අනාදීනයක් දක්මින් කාම ප්‍රහාණය කියද්ද, කාම සමතික්‍රමය පනවද්ද? 'තරුණ, මෘදු, ලොම් ඇති, මේ පරිබ්‍රාජිකාවගේ බාහායෙහි පහස සුවදය වෙති' යි (මෙසේ බැණ) ඔහු කාමයෙහි පාතව්‍යතාවට පැමිණෙති. ඔහු කාමයෙහි (ආස්වාද පිසින්) පියයුතු බවට වැද කාබුත් මරණින් මතුයෙහි අපාය වූ, දුගීති වූ, විනිපාත වූ නිරයට එළැඹෙති. ඔහු ඒ නිරයෙහි තීව්‍ර, කටුක, දුඃඛවේදනා විඳිති. (එසඳ) ඔහු මෙසේ කියති: ඒ භවත් මහණබමුණෝ කාමයෙහි මේ අනාදීනය දක්මින් කාමප්‍රහාණය කියති. කාමසමතික්‍රමය පනවති. මේ අපි කාම හේතුයෙන් කාමනිදානයෙන් දුඃඛ, තීව්‍ර, කටුක වේදනා විඳුම්හ යි. මහණෙනි, මේ මෙවත්මත්හි සුව දෙන, මතු දුක් විපාක දෙන ධර්මසමාදාන යයි කියනු ලැබේ.

4. මහණෙනි, මෙවත්මත්හිත් දුඃඛදායක වූ මතුයෙහිත් දුඃඛවිපාක දායක වූ ධර්මසමාදාන නම් කවරේ ය යත්:

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සෙලු වෙයි. හළ ආචාර ඇති වෙයි. (අහරකිස නිමි කල) අත ලොවන්නේ වෙයි. අහර පිණිස 'එව, වහන්සැ'යි කීකල නො එනු සිල් කොට ඇති වෙයි. 'සිටුව, වහන්සැ'යි කීකල නොසිටුනු සිල් කොට ඇති වෙයි. ළඟට එළවූ අහර නො පිළිගනු වෙයි. උදෙසා කළ අහර නො පිළිගනු වෙයි. නිමන්ත්‍රණ නො පිළිගනු වෙයි. හෙ කලමුවින් ගෙන දෙන අහර නො පිළිගනු වෙයි. හෙ සැළ-මුවින් ගෙන දෙන අහර නො පිළිගනු වෙයි. එළිපත අතර කොට දෙන අහර නො පිළිගනු වෙයි. දඬු අතර කොට දෙන අහර නො පිළිගනු වෙයි. මොහොල් අතර කොට දෙන අහර නො පිළිගනු වෙයි. වළඳන දෙදෙනකුන් අතුරින් එකකු නැගී දෙන අහර නො පිළිගනු වෙයි. ගැබිලිය දෙන අහර නො පිළිගනු වෙයි. කිරිපොවන්නිය දෙන අහර නො පිළිගනු වෙයි පුරුෂාන්තර ගත ස්ත්‍රිය දෙන අහර නොපිළිගනු වෙයි. සමාදන් කොට පිසූ කල දෙන අහර නො පිළිගනු වෙයි. යම් තැනෙක බලු එළඹ සිටියේ නම් එහි දෙන අහර නො පිළිගනු වෙයි යම් තැනෙක මැසිමුළු ගළගළා ව හැසිරෙත් නම් එහි දෙන අහර නො පිළිගනු වෙයි මත්ස්‍ය නො පිළිගනු වෙයි. මාංශ නො පිළිගනු වෙයි. රහ නො බොනු වෙයි. මෙර නො බොනු වෙයි. සෞවීර නො බොනු වෙයි.

හෙ එක් ගෙයකින් පිඬු ලැබ නවත්නේ හෝ වෙයි. එක් ආලොප-යෙකින් යැපෙන්නේ හෝ වෙයි. දෙගෙයකින් පිඬු ලැබ නවත්නේ හෝ වෙයි. ආලොප දෙකෙකින් යැපෙන්නේ හෝ වෙයි. ... සත්ගෙයකින් පිඬු ලැබ නවත්නේ හෝ වෙයි. ආලොපසතෙකින් යැපෙන්නේ හෝ වෙයි එක් දත්තෙකිනුදු (එක් බත්තැටියකිනුදු) යැපෙයි දෙ දත්තෙකිනුදු යැපෙයි ... සත් දත්තෙකිනුදු යැපෙයි. එක් දවසක් ද හැර ගන්නා අහර වළඳ කෙරෙයි. දෙදවසක් ද හැර ගන්නා අහර වළඳ කෙරෙයි ... සත්දවසක් ද හැර ගන්නා අහර වළඳ කෙරෙයි මෙසේ මෙබඳු අඩමසක් අතර කොට ගන්නා අහර ද යි වාරභක්ත භොජනයෙහි යෙදුණේ වෙයෙහි.

සො සාකභක්ඛො වා හොති සාමාකභක්ඛො වා හොති නීවාරභක්ඛො වා හොති දද්දුලභක්ඛො[1] වා හොති හටභක්ඛො වා හොති කණභක්ඛො වා හොති ආචාමභක්ඛො වා හොති පිඤ්ඤාකභක්ඛො වා හොති තිණභක්ඛො වා හොති ගොමයභක්ඛො වා හොති. වනමූලඵලාහාරො වා යාපෙති පවත්තඵලභොජී.

සො සාණානිපි ධාරෙති මසාණානිපි ධාරෙති ඡවදුස්සානිපි ධාරෙති පංසුකූලානිපි ධාරෙති තිරීටානිපි ධාරෙති අජිනානිපි[2] ධාරෙති අජිනක්ඛිපම්පි[3] ධාරෙති කුසචීරම්පි ධාරෙති වාකචීරම්පි ධාරෙති ඵලකචීරම්පි ධාරෙති කෙසකම්බලම්පි ධාරෙති වාලකම්බලම්පි ධාරෙති උලූකපක්ඛම්පි ධාරෙති. කෙසමස්සුලොචකොපි හොති කෙසමස්සුලොචනානුයොගමනුයුත්තො. උබ්භට්ඨකොපි හොති ආසනපටික්ඛිත්තො.[4] උක්කුටිකොපි හොති උක්කුටිකප්පධානානුයොගමනුයුත්තො,[5] කණ්ටකාපස්සයිකොපි හොති කණ්ටකාපස්සයෙ සෙය්‍යං කප්පෙති. සායතතියකම්පි උදකොරොහණානුයොගමනුයුත්තො විහරති.

ඉති එවරූපං අනෙකවිහිතං කායස්ස ආතාපනපරිතාපනානුයොගමනුයුත්තො විහරති. සො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.[6] ඉදං වුච්චති භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛඤ්චෙව ආයතිඤ්ච දුක්ඛවිපාකං.

6. කතමඤ්ච භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛං ආයතිං සුඛවිපාකං?

ඉධ භික්ඛවෙ එකච්චො පකතියා තිබ්බරාගජාතිකො හොති. සො අභික්ඛණං රාගජං දුක්ඛං දොමනස්සං[7] පටිසංවෙදෙති. පකතියා තිබ්බදොසජාතිකො හොති, සො අභික්ඛණං දොසජං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පකතියා තිබ්බමොහජාතිකො හොති, සො අභික්ඛණං මොහජං දුක්ඛං දොමනස්සං[7] පටිසංවෙදෙති. සො සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන[8] අස්සුමුඛො[9] රුදමානො[10] පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති. සො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. ඉදං වුච්චති භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛං ආයතිං සුඛවිපාකං.

7. කතමඤ්ච භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නසුඛඤ්චෙව ආයතිඤ්ච සුඛවිපාකං?

---

1. ගද්දුල, සී. 2. අජිනම්පි, මජසං. අජජිනානිපි, ස්‍යා.
3. අජිනක්ඛිකම්පි, සී. අජජිනක්ඛිපම්පි, ස්‍යා.
4. ආසනපටික්ඛිත්තොපි, ස්‍යා. 5. උක්කුටිකප්පධානමනුයුත්තො, සී. කත්ථචි.
6. උපපජ්ජති, සී. 7. දුක්ඛදොමනස්සං, සී. කත්ථචි.
8. දොමනස්සෙන පුට්ඨො සමානො, ස්‍යා. 9 අස්සුමුඛොපි, මජසං. ස්‍යා
10 රොදමානො, ස්‍යා.

හේ පලා වළඳන්නේ හෝ වෙයි. ඛබහමු වළඳන්නේ හෝ වෙයි. හුරුහැල් වළඳන්නේ හෝ වෙයි. සම්කඩ වැහැරි වළඳන්නේ හෝ වෙයි ලහටු වළඳන්නේ හෝ වෙයි. කුඩු වළඳන්නේ හෝ වෙයි. දඹුබත් වළඳන්නේ හෝ වෙයි. පුනක්කු වළඳන්නේ හෝ වෙයි. තණ වළඳන්නේ හෝ වෙයි. ගොම වළඳන්නේ හෝ වෙයි. තුවටුයෙන් ගිලුණු ඵල වළඳ කරන පුල්ලු වූයේ, වන මූලඵල අහර කොට ඇතියේ ද යැපෙයි.

හෙ හණවැහැරි ද දරයි. මුසුහණවැහැරි ද දරයි. මිනියෙන් මුදුහළ පිළි ද දරයි. පහුල්පිළිද දරයි. රුක්සුඹුළු ද දරයි. අඳුන්මුවසම් ද දරයි. කුරසහිත අඳුන්මුවසම් ද දරයි. කුසවැහැරි ද දරයි. කෙඳිවැහැරි ද දරයි. ලීපත් වැහැරි ද දරයි. කෙසකම්බලය ද දරයි. අස්ලොම්කම්බලය ද දරයි. මහමුහුණු පියාපතුදු දරයි. හිසකේ රවුළු උදුරනුයේ හිසකේ රවුළු උදුරන වතෙහි යෙදුණේ වෙයි. අසුන් පිළිකෙව් කෙළේ, උඩුහුරු ව සිටුනේ වෙයි. උක්කුටුක ව (උලුළුයෙන්) හිඳ තවුස්වැර වැඩීමෙහි යෙදුණේ උලුළුයෙන් හිඳුනේ ද වෙයි. කටු ඇතිරියෙහි වැතිරෙන්නේ ද වෙයි කටුඇතිරියෙහි ශයන ද කෙරෙයි. සවස තුන්වනු කොට තෙවරක් දියට බැසීම් වතෙහි යෙදුණේ වෙසේ.

මෙසේ මෙබඳු අනෙකප්‍රකාර වූ කය (තැවීමෙහි හාත්පස තැවීමෙහි) යෙදුණේ වාස කෙරෙයි. හේ කාබුත් මරණින් මතුයෙහි අපාය වූ, දුගීති වූ, විනිපාත වූ, නිරයට පැමිණෙයි මහණෙනි, මෙ වනාහි මෙවත්මත්හි දුක් දෙන්නා වූ ද, මතුයෙහි දුක් විපාක දෙන්නා වූ ද කර්මසමාදානය යි කියනු ලැබේ

6. මහණෙනි, මෙ වත්මනු දුඃඛදායක වූත්, මතු අනාගෙහි සුඛ විපාකදායක වූත් ධර්මසමාදාන නම් කවරේ ය යත්:

මහණෙනි, මෙ ලොව ඇතැම් පුද්ගලයෙක් ප්‍රකෘතීන් තියුණු රාග ගති ඇති වෙයි. හේ නිතොර (ඇදුරු වත්තෙරුත්ගේ දඬුවම් නිසා) රාගයෙන් හටගත්නා දුක්දොම්නස් විඳුනේ ය. ප්‍රකෘතීන් තියුණු ද්වේෂ ගති ඇති වෙයි. හේ නරතුරු ද්වේෂයෙන් හටගත්නා දුක්දොම්නස් විඳුනේ ය. ප්‍රකෘතීන් තියුණු මොහගති ඇති වෙයි. හේ නරතුරු මොහයෙන් හට-ගත්නා දුක්දොම්නස් විඳුනේ ය. හේ සහගිය දුක් ඇතිව ද, සහගිය දොම්නස් ඇතිව ද, කඳුළුමුසු මුහුණු ඇතිව හඬනුයේ පරිපූර්ණ පරිශුද්ධ බ්‍රහ්ම-චර්‍ය්‍යය පුරයි. හේ කාබුත් මරණින් මතුයෙහි සුගීසගලෝ එළඹෙන්නේ ය. මහණෙනි, මෙ වනාහි මෙවත්මන්හි දුක් දෙන මතු අනායෙහි සුඛවිපාක දෙන ධර්මසමාදාන යයි කියනු ලැබේ.

7. මහණෙනි, මෙවත්මත්හිදු සුව දෙන්නා වූ, මතු අනායෙහිදු සුඛ විපාකදායක වූ ධර්මසමාදාන නම් කවරේ ය යත්:

ඉධ භික්ඛවෙ එකච්චො පකතියා න තිබ්බරාගජාතිකො හොති, සො න අභික්ඛණං රාගජං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පකතියා න තිබ්බදොසජාතිකො හොති, සො න අභික්ඛණං දොසජං දුක්ඛං දොම-නස්සං පටිසංවෙදෙති. පකතියා න තිබ්බමොහජාතිකො හොති, සො න අභික්ඛණං මොහජං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති.

සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවි-චාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. විතක්ක-විචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං[1] උපසම්පජ්ජ විහරති. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යං තං අරියා ආචික්ඛන්ති 'උපෙක්ඛකො[2] සතිමා සුඛවිහාරී'ති තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා[3] අදුක්ඛං අසුඛං උපෙක්ඛා-සතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. ඉදං වුච්චති භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නසුඛඤ්චෙව ආයතිඤ්ච සුඛවිපාකං.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි ධම්මසමාදානානීති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

චූළධම්මසමාදානසුත්තං පඤ්චමං.

1 දුතියජ්ඣානං -පෙ- චතුජ්ඣානං, සං.
2 උපෙඛකො, මජසං. සතා. PTS.
3. අත්ථගමා, මජසං.

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් ප්‍රකෘතීන් තියුණු රාග සැහැවි ඇති නො වෙයි. හේ නරතුරු රාගජ දුඃඛදෞර්මනස්‍ය නොවිඳු-තේ ය. ප්‍රකෘතීන් තියුණු ද්වේෂ සැහැවි ඇති නො වෙයි. හේ නරතුරු ද්වේෂයෙන් හටගත්තා දුක්දොම්නස් නොවිඳුතේ ය. ප්‍රකෘතීන් තියුණු මෝහ සැහැවි ඇති නො වෙයි. හේ නරතුරු මෝහයෙන් හටගත්තා දුක්දොම්නස් නොවිඳුතේ ය.

හේ කාමයෙන් වෙන් ව ම, අකුසල් දහමින් වෙන් ව සවිතර්ක, සවිචාර, විවෙකජ, ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යාන උපයා වාස කෙරෙයි. විතර්කවිචාරයන් සන්හිඳීමෙන් සියසතන්හි සම්ප්‍රසාද ඇති, චෙතසෙකාග්‍ර-භාව ඇති, අවිතර්ක, අවිචාර, සමාධිජ, ප්‍රීතිසුඛ ඇති ද්විතීයධ්‍යාන උපයා වාස කෙරෙයි. ප්‍රීති විරාගයෙනුදු උපෙක්ෂක ව ද ස්මෘතිමත් ව සම්ප්‍රඥත ඇති ව වාස කෙරෙයි. ආර්යයෝ යම් ධ්‍යානයක් ගෙන "ඒ උපෙක්ෂක, ස්මෘතිමත් පුද්ගල සුඛවිහාර ඇත්තේ ය"යි බෙණෙද්ද, ඒ තෘතීයධ්‍යාන උපයා වාස කෙරෙයි. සුඛය හා දුඃඛයාගේ ප්‍රහාණයෙන් පළමු ම සෞමනස්දෞර්මනසුත් පහව යෑමෙන් අදුඃඛ වූ. අසුඛ වූ උපෙක්ෂායෙන් ජනිත ස්මෘතිපරිශුද්ධි ඇති චතුර්ථධ්‍යාන උපයා වාස කෙරෙයි. හේ කාබුත් මරණින් මතුයෙහි සුගීනග බඹලොව කරා එළඹෙයි. මහණෙනි, මෙ මෙවත්මත්හි සුඛදායක වූත්, මතු අනාගෙහි සුඛවිපාකදායක වූත් ධර්මසමාදාන යයි කියනු ලැබේ.

මහණෙනි, මොහු ධර්මසමාදානයෝ සතර දෙන යයි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මේ සුත් වදාළසේක. හටගත් සොම්නස් ඇති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

චූලධම්මසමාදානසූත්‍රය පස් වැනි යි.

Free Distribution www.aathaapi.org

1. 5. 6.

මහාධම්මසමාදානසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: භික්ඛවො’ති. භදන්තෙ’ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. යෙභුය්‍යෙන භික්ඛවෙ සත්තා එවංකාමා එවංඡන්දා එවංඅධිප්පායා: අහො වත අනිට්ඨා අකන්තා අමනාපා ධම්මා පරිහායෙය්‍යුං, ඉට්ඨා කන්තා මනාපා ධම්මා අභිවඩ්ඪෙය්‍යුන්ති. තෙසං භික්ඛවෙ සත්තානං එවංකාමානං එවංඡන්දානං එවංඅධිප්පායානං අනිට්ඨා අකන්තා අමනාපා ධම්මා අභිවඩ්ඪන්ති, ඉට්ඨා කන්තා මනාපා ධම්මා පරිහායන්ති. තත්‍ර තුම්හෙ භික්ඛවෙ[1] කං හෙතුං පච්චෙථාති[2]. “භගවංමූලකා නො භන්තෙ ධම්මා භගවංනෙත්තිකා භගවංපටිසරණා. සාධු වත භන්තෙ[3] භගවන්තංයෙව[4] පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො. භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තී”ති. තෙන හි භික්ඛවෙ සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

3. ඉධ භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරිය-ධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිස-ධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො සෙවිතබ්බෙ ධම්මෙ න ජානාති, අසෙවිතබ්බෙ ධම්මෙ න ජානාති, භජිතබ්බෙ ධම්මෙ න ජානාති, අභජිතබ්බෙ ධම්මෙ න ජානාති. සො සෙවිතබ්බෙ ධම්මෙ අජානන්තො අසෙවිතබ්බෙ ධම්මෙ අජානන්තො, භජිතබ්බෙ ධම්මෙ අජානන්තො අභජි-තබ්බෙ ධම්මෙ අජානන්තො, අසෙවිතබ්බෙ ධම්මෙ සෙවති සෙවිතබ්බෙ ධම්මෙ න සෙවති, අභජිතබ්බෙ ධම්මෙ භජති, භජිතබ්බෙ ධම්මෙ න භජති. තස්ස අසෙවිතබ්බෙ ධම්මෙ සෙවතො සෙවිතබ්බෙ ධම්මෙ අසෙවතො, අභජිතබ්බෙ ධම්මෙ භජතො භජිතබ්බෙ ධම්මෙ අභජතො අනිට්ඨා අකන්තා අමනාපා ධම්මා අභිවඩ්ඪන්ති. ඉට්ඨා කන්තා මනාපා ධම්මා පරිහායන්ති. තං කිස්ස හෙතු? එවං හෙතං භික්ඛවෙ හොති යථා තං අවිද්දසුනො.

1. තත්‍ර භික්ඛවෙ, සී. 2. තං කිස්සහෙතු, සයා 3. සාධු භන්තෙ, සී.
4. භගවන්තඤ්ඤෙව, මු සී මජසං. සයා PTS.

1. 5. 6.

මහාධම්මසමාදාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬු** මහසිටාණන්ගේ ආරාමයෙහි වැඩවාස කරන සේක. එකල භාග්‍යවතුන් වහන්සේ **'මහණෙනි'**යි භික්‍ෂූන් ඇමැතූසේක. ඒ භික්‍ෂූහු 'වහන්සැ' යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක:

2. මහණෙනි, සත්ත්වයෝ "අනිෂ්ට, අකාන්ත, අමනාප, ධර්මයෝ පිරිහී යෙත්වා - ඉෂ්ට, කාන්ත, මනාප, ධර්මයෝ වෙසෙසින් වැඩියෙත්වා"යි බෙහෙවින් මෙසේ කැමැතියහ. මෙසේ සඳ ඇතියහ. මෙසේ අධිප්‍රාය ඇතියහ. මහණෙනි, මෙසේ කැමැති, මෙසේ සඳ ඇති, මෙසේ අධිප්‍රාය ඇති ඒ සත්ත්වයනට අනිෂ්ට, අකාන්ත, අමනාප ධර්මයෝ වැඩෙත්. ඉෂ්ට, කාන්ත, මනාප ධර්මයෝ පිරිහෙත් මහණෙනි, එකරුණෙහි තෙපි කිනම් හේතුවක් ප්‍රත්‍යය කොට ගනිව්? "වහන්ස, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇතියහ. භාග්‍යවතුන් වහන්සේ නෙතෘ කොට ඇතියහ. භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පිළිසරණ ඇතියහ. වහන්ස, අයැද සිටුම්හ: මෙම භාෂිතයාගේ අර්ථ භාග්‍යවතුන් වහන්සේට ම වැටහේවා. භාග්‍යවතුන් වහන්සේගේ බස් අසා භික්‍ෂූහු ධරන්නාහ." එසේ නම් මහණෙනි, අසව, මනාකොට මෙනෙහි කරව. කියම්හ. 'වහන්ස, එසේ ය' යි ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ:

3. මහණෙනි, මෙලොව (බුද්ධාදී) ආර්‍ය්‍යයන් නො දක්නාසුලු, ආර්‍ය්‍ය ධර්මයෙහි අදක්‍ෂ, ආර්‍ය්‍යධර්මයෙහි අවිනීත, (බුද්ධාදි) සත්පුරුෂයන් නො දක්නාසුලු, සත්පුරුෂධර්මයෙහි අදක්‍ෂ, සත්පුරුෂධර්මයෙහි අවිනීත අශ්‍රුතවත් පෘථග්ජන සෙවියයුතු දහම් නො දන්නේ ය. නොසෙවියයුතු දහම් නො දන්නේ ය. භජන කළයුතු ධර්ම නො දන්නේ ය. භජන නො කළයුතු ධර්ම නො දන්නේ ය. හේ සෙවියයුතු ධර්ම නො දන්මින් නොසෙවියුතු ධර්ම නො දන්මින් භජන කළයුතු ධර්ම නො දන්මින් භජන නොකළයුතු ධර්ම නො දනිමින්, නොසෙවිය යුතු ධර්ම සෙවුනේ ය. සෙවියයුතු ධර්ම නොසෙවුනේ ය. භජන නොකළයුතු ධර්ම භජන කරන්නේ ය. භජන කළයුතු ධර්ම භජන නො කරන්නේ ය. නොසෙවියයුතු දහම් සෙවුනා, සෙවියයුතු දහම් නොසෙවුනා, භජන කළයුතු දහම් භජන නො කරන, භජන නොකළයුතු දහම් භජන කරන ඒ අශ්‍රුතවත් පෘථග්ජනයාහට අනිෂ්ට, අකාන්ත, අමනාප ධර්මයෝ වෙසෙසින් වැඩියෙති. ඉෂ්ට, කාන්ත, මනාප ධර්මයෝ පිරිහියෙති. ඒ කවර හෙයින යත්: මහණෙනි, අඤබාල පෘථග්ජනයාහට යම්බඳු (හේතුයෙක්) වේ ද, මෙය එබඳු ම වෙයි

4. සුතවා ච ඛො භික්ඛවෙ අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො, සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො සෙවිතබ්බෙ ධම්මෙ පජානාති[1] අසෙවිතබ්බෙ ධම්මෙ පජානාති, භජිතබ්බෙ ධම්මෙ පජානාති අභජිතබ්බෙ ධම්මෙ පජානාති. සො සෙවිතබ්බෙ ධම්මෙ පජානන්තො[2] අසෙවිතබ්බෙ ධම්මෙ පජානන්තො, භජිතබ්බෙ ධම්මෙ පජානන්තො අභජිතබ්බෙ ධම්මෙ පජානන්තො, අසෙවිතබ්බෙ ධම්මෙ න සෙවති, සෙවිතබ්බෙ ධම්මෙ සෙවති. අභජිතබ්බෙ ධම්ම න භජති, භජිතබ්බෙ ධම්මෙ භජති. තස්ස අසෙවිතබ්බෙ ධම්මෙ අසෙවතො සෙවිතබ්බෙ ධම්මෙ සෙවතො, අභජිතබ්බෙ ධම්මෙ අභජතො භජිතබ්බෙ ධම්මෙ භජතො, අනිට්ඨා අකන්තා අමනාපා ධම්මා පරිහායන්ති. ඉට්ඨා කන්තා මනාපා ධම්මා අභිවඩ්ඪන්ති. තං කිස්ස හෙතු? එවං හෙතං භික්ඛවෙ හොති යථා තං විද්දසුනො.

5. චත්තාරිමානි භික්ඛවෙ ධම්මසමාදානානි. කතමානි චත්තාරි?

අත්ථි භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛඤ්චෙව ආයතිඤ්ච දුක්ඛවිපාකං. අත්ථි භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නසුඛං ආයතිං දුක්ඛවිපාකං අත්ථි භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛං ආයතිං සුඛවිපාකං. අත්ථි භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නසුඛඤ්චෙව ආයතිඤ්ච සුඛවිපාකං.

6. තත්‍ර භික්ඛවෙ යදිදං[3] ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛඤ්චෙව ආයතිඤ්ච දුක්ඛවිපාකං, තං අවිද්වා[4] අවිජ්ජාගතො යථාභූතං නප්පජානාති. ඉදං ඛො ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛඤ්චෙව ආයතිඤ්ච දුක්ඛ-විපාකන්ති. තං අවිද්වා අවිජ්ජාගතො යථාභූතං අප්පජානන්තො තං සෙවති, තං න පරිවජ්ජෙති. තස්ස තං සෙවතො තං අපරිවජ්ජයතො අනිට්ඨා අකන්තා අමනාපා ධම්මා අභිවඩ්ඪන්ති. ඉට්ඨා කන්තා මනාපා ධම්මා පරිහායන්ති තං කිස්ස හෙතු? එවං හෙතං භික්ඛවෙ හොති යථා තං අවිද්දසුනො.

7. තත්‍ර භික්ඛවෙ යදිදං[3] ධම්මසමාදානං පච්චුප්පන්නසුඛං ආයතිං දුක්ඛවිපාකං, තං අවිද්වා අවිජ්ජාගතො යථාභූතං නප්පජානාති: ඉදං ඛො ධම්මසමාදානං පච්චුප්පන්නසුඛං ආයතිං දුක්ඛවිපාකන්ති. තං අවිද්වා අවිජ්ජාගතො යථාභූතං අප්පජානන්තො තං සෙවති, තං න පරිවජ්ජෙති. තස්ස තං සෙවතො තං අපරිවජ්ජයතො අනිට්ඨා අකන්තා අමනාපා ධම්මා අභිවඩ්ඪන්ති ඉට්ඨා කන්තා මනාපා ධම්මා පරිහායන්ති. තං කිස්ස වහෙතු? එං හෙතං භික්ඛවෙ හොති යථා තං අවිද්දසුනො.[5]

1. ජානාති, මජසං. සයා 2. ජානන්තො, මජසං. සයා.
3. යමිදං, මජසං. සයා PTS. 4 අවිද්ධා, සයා. 5. අවිද්දසුනොති, සයා.

4. මහණෙනි, ආර්‍යයන් දක්නාසුලු, ආර්‍යධර්මයෙහි දක්‍ෂ, ආර්‍ය-ධර්මයෙහි සුවිනීත, සත්පුරුෂයන් දක්නාසුලු, සත්පුරුෂධර්මයෙහි දක්‍ෂ, සත්පුරුෂ ධර්මයෙහි සුවිනීත, ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක සෙවියයුතු දහම් දන්නේ ය. නොසෙවියයුතු දහම් දන්නේ ය. භජන කළයුතු දහම් දන්නේය. භජන නොකළයුතු දහම් දන්නේය. හේ සෙවියයුතු දහම් දනිමින් නො සෙවියයුතු දහම් දන්මින්, භජන කළයුතු දහම් දනිමින් භජන නො කළයුතු දහම් දනිමින්, නොසෙවියයුතු දහම් නොසෙවුනේ ය. සෙවියයුතු දහම් සෙවුනේ ය. භජන නොකළයුතු දහම් භජන නො කරන්නේ ය. භජන කළයුතු දහම් භජන කරන්නේ ය. නොසෙවියුතු දහම් නො සෙවුනා සෙවියයුතු දහම් සෙවුනා, භජන නො කළයුතු දහම් භජන නොකරන, භජන කළයුතු දහම් භජන කරන ඒ ආර්‍යශ්‍රාවකයාහට අනිෂ්ට, අකාන්ත, අමනාප ධර්මයෝ පිරිහීයෙති. ඉෂ්ට, කාන්ත, මනාප ධර්මයෝ වැඩීයෙති. ඒ කවර හෙයින යත්: මහණෙනි, ප්‍රශස්ත බුද්ධිඇති පණ්ඩිතයාහට යම්බඳු (හෙතුයෙක්) වේ ද, තෙල එබඳු ම වෙයි.

5. මහණෙනි, මේ ධර්මසමාදානයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්:

මහණෙනි, මෙවත්මත්හිදු දුක්දෙන මතු අනාගතයෙහි දු දුක්විවා දෙන ධර්මසමාදානයෙක් ඇත. මහණෙනි, මෙවත්මතු සුව දෙන, මතු අනාගතයෙහි දුඃඛවිපාක දෙන ධර්මසමාදානයෙක් ඇත. මහණෙනි, මෙවත්මතු දුක් දෙන, මතු අනාගතයෙහි සුඛවිපාක දෙන ධර්මසමාදානයෙක් ඇත. මහණෙනි මෙවත්මතුයෙහි සුව දෙන, මතු අනාගතයෙහි සුඛවිපාක දෙන ධර්මසමාදාන-යෙක් ඇත.

6. මහණෙනි, එ ධර්මසමාදානයන් කෙරෙහි මෙවත්මතු දුඃඛදායක මතු අනාගතයෙහි දුඃඛවිපාකදායක වූ යම් ධර්මසමාදානයෙක් (ප්‍රාණවධාදි ධර්මයන්ගේ ග්‍රහණයෙක්) ඇද්ද, එය අවිද්‍යායෙන් සමන්‍විාගත විද්වත් නො වූ පුද්ගල "මේ ධර්මසමාදානය නම් මෙවත්මතු දුක් දෙන්නා වූ ද, මතු අනාගතයෙහි දුඃඛවිපාක දෙන්නා වූ ද එකෙකැයි ඇතිසැටි නො දන්නේ ය. අවිද්‍යාසමන්‍විාගත අවිද්වත් පුද්ගල ඒ ධර්මසමාදානය යථාවයෙන් නො දන්නේ එය සෙවුනේ ය, එය නො හරනේ ය. ඒ ධර්මසමාදාන සෙවුනා, එය නො හරනා, ඔහට අනිෂ්ට, අකාන්ත, අමනාප ධර්මයෝ වෙසෙසින් වැඩෙත්. ඉෂ්ට, කාන්ත, මනාප, ධර්මයෝ පිරිහීයෙත්. ඒ කවර හෙයින යත්: මහණෙනි අවිද්වත්හට යම් බඳු (හෙතුයෙක්) වේ ද, තෙල එබඳු ම වෙයි.

7. මහණෙනි, ඒ ධර්මසමාදානයන් කෙරෙහි මෙවත්මත්හි සුඛ වූ මතු අනාගතයෙහි දුඃඛවිපාක වූ යම් ධර්ම සමාදානයෙක් ඇද්ද, අවිද්‍යායෙන් සමන්‍විාගත අවිද්වත් පුද්ගල "මේ ධර්ම සමාදාන නම්, ප්‍රත්‍යුත්පන්නසුඛ ය, අනාගත දුඃඛවිපාක ය" කියා එය යථාස්වභාවයෙන් නො දන්නේ ය. අවිද්‍යා-ගත විද්‍යාහැති පුද්ගල එය ඇතිසැටි නො දන්නේ එය සෙවුනේ ය. එය නොහරනේ ය. එය සෙවුනා, එය නො හරනා ඔහට අනිෂ්ට, අකාන්ත, අමනාප ධර්මයෝ වෙසෙසින් වැඩෙත්. ඉෂ්ට, කාන්ත, මනාප, ධර්මයෝ පිරිහීයෙත්. ඒ කවර හෙයින යත්: මහණෙනි, අවිද්වත්හට යම්බඳු (හෙතු යෙක්) වේ ද, තෙල එබඳු ම වෙයි

8. තත්‍ර භික්ඛවෙ යදිදං[1] ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛං ආයතිං සුඛවිපාකං, තං අවිද්වා[2] අවිජ්ජාගතො යථාභූතං නප්පජානාති: ඉදං ඛො ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛං ආයතිං සුඛවිපාකන්ති. තං අවිද්වා අවිජ්ජාගතො යථාභූතං අප්පජානන්තො තං න සෙවති, තං පරිවජ්ජෙති. තස්ස තං අසෙවතො තං පරිවජ්ජයතො අනිට්ඨා අකන්තා අමනාපා ධම්මා අභිවඩ්ඪන්ති. ඉට්ඨා කන්තා මනාපා ධම්මා පරිහායන්ති. තං කිස්ස හෙතු? එවං හෙතං භික්ඛවෙ හොති යථා තං අවිද්දසුනො.

9. තත්‍ර භික්ඛවෙ යදිදං ධම්මසමාදානං පච්චුප්පන්න සුඛඤ්චෙව ආයතිඤ්ච සුඛවිපාකං,[3] තං අවිද්වා අවිජ්ජාගතො යථාභූතං නප්පජානාති: ඉදං ඛො ධම්මසමාදානං පච්චුප්පන්නසුඛඤ්චෙව ආයතිඤ්ච සුඛවිපාකන්ති. තං අවිද්වා අවිජ්ජාගතො යථාභූතං අප්පජානන්තො තං න සෙවති, තං පරිවජ්ජෙති. තස්ස තං අසෙවතො තං පරිවජ්ජයතො අනිට්ඨා අකන්තා අමනාපා ධම්මා අභිවඩ්ඪන්ති. ඉට්ඨා කන්තා මනාපා ධම්මා පරිහායන්ති. තං කිස්ස හෙතු? එවං හෙතං භික්ඛවෙ හොති යථා තං අවිද්දසුනො.

10. තත්‍ර භික්ඛවෙ යදිදං ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛඤ්චෙව ආයතිඤ්ච දුක්ඛවිපාකං, තං විද්වා[4] විජ්ජාගතො යථාභූතං පජානාති: ඉදං ඛො ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛඤ්චෙව ආයතිඤ්ච දුක්ඛ විපාකන්ති. තං විද්වා විජ්ජාගතො යථාභූතං පජානන්තො තං න සෙවති, තං පරිවජ්ජෙති. තස්ස තං අසෙවතො තං පරිවජ්ජයතො අනිට්ඨා අකන්තා අමනාපා ධම්මා පරිහායන්ති. ඉට්ඨා කන්තා මනාපා ධම්මා අභිවඩ්ඪන්ති. තං කිස්ස හෙතු? එවං හෙතං භික්ඛවෙ හොති යථා තං විද්දසුනො.

11. තත්‍ර භික්ඛවෙ යදිදං ධම්මසමාදානං පච්චුප්පන්නසුඛං ආයතිං දුක්ඛවිපාකං, තං විද්වා විජ්ජාගතො යථාභූතං පජානාති: ඉදං ඛො ධම්මසමාදානං පච්චුප්පන්නසුඛං ආයතිං දුක්ඛවිපාකන්ති. තං විද්වා විජ්ජාගතො යථාභූතං පජානන්තො තං න සෙවති, තං පරිවජ්ජෙති. තස්ස තං අසෙවතො තං පරිවජ්ජයතො අනිට්ඨා අකන්තා අමනාපා ධම්මා පරිහායන්ති. ඉට්ඨා කන්තා මනාපා ධම්මා අභිවඩ්ඪන්ති. තං කිස්ස හෙතු? එවං හෙතං භික්ඛවෙ හොති යථා තං විද්දසුනො.[5]

---

1. යමිදං, මජසං. සයා. PTS.
2. අවිද්ධා, සයා.
3. සුඛවිපාකන්ති, මජසං
4. විද්ධා, සයා.
5. විද්දසුනොති, සයා

8 මහණෙනි, ඒ ධර්‍මසමාදානයන් කෙරෙහි වර්තමානයෙහි දුඃඛදායක වූ, අනාගතයෙහි සුඛවිපාක වූ, යම් ධර්‍මසමාදානයෙක් ඇද්ද, අවිද්‍යාගත අවිද්වත් පුද්ගල "මේ ධර්‍මසමාදානය ප්‍රත්‍යුත්පන්නදුඃඛ ය, අනාගත සුඛවිපාක ය" කියා එය යථාභූත වශයෙන් නොදන්නේ ය. අවිද්‍යාගත අවිද්වත් පුද්ගල එය ඇතිතතු නොදන්නේ එය නො සෙවුනේ ය. එය හරනේය එය නොසෙවුනා, එය හරනා ඔහට අනිෂ්ට, අකාන්ත, අමනාප ධර්‍මයෝ වෙසෙසින් වැඩෙත්. ඉෂ්ට, කාන්ත, මනාප ධර්‍මයෝ පිරිහීයෙත් ඒ කවර හෙයින යත්: මහණෙනි, අවිද්වත්හට යම්බඳු (හෙතුයෙක්) වේ ද, තෙල එබඳු ම වෙයි.

9. මහණෙනි, ඒ ධර්‍මසමාදානයන් කෙරෙහි ප්‍රත්‍යුත්පන්න සුඛ වූත්, අනාගතසුඛවිපාක වූත් යම් ධර්‍මසමාදානයෙක් ඇද්ද, අවිද්‍යාසමන්‍වාගත, අවිද්වත් පුද්ගල 'මේ ධර්‍මසමාදානය ප්‍රත්‍යුත්පන්නසුඛ ද වෙයි, අනාගත සුඛවිපාක ද වේ ය" යි එය යථාභූත වශයෙන් නො දන්නේ ය. අවිද්‍යා-සමන්‍වාගත, අවිද්වත් පද්ගල එය යථාවශයෙන් නොදන්නේ, එය නො සෙවුනේ ය. එය හරනේ ය. එය නොසෙවුනා, එය හරනා ඔහට අනිෂ්ට, අකාන්ත, අමනාප ධර්‍මයෝ වෙසෙසින් වැඩෙත්. ඉෂ්ට, කාන්ත, මනාප ධර්‍මයෝ පිරිහීයෙත් ඒ කවර හෙයින යත්: මහණෙනි, අවිද්වත්හට යම් බඳු (හෙතුයෙක්) වේ ද තෙල එබඳු ම වෙයි.

10. මහණෙනි, ඒ ධර්‍මසමාදානයන් කෙරෙහි ප්‍රත්‍යුත්පන්න දුඃඛ වූත්, අනාගතදුඃඛවිපාක වූත් යම් ධර්‍මසමාදානයෙක් ඇද්ද, විද්‍යායෙන් සමන්‍වා-ගත, විද්වත් පුද්ගල "මේ ධර්‍මසමාදානය ප්‍රත්‍යුත්පන්නසුඛ ද වෙයි. අනාගත දුඃඛවිපාක ද වේ"යයි යථාභූත වශයෙන් දන්නේ ය. විද්‍යාගත, විද්වත් පුද්ගල එය යථාභූත වශයෙන් දන්නේ, එය නොසෙවුනේ ය එය හරනේ ය. එය නො සෙවුනා, එය හරනා ඔහට අනිෂ්ට, අකාන්ත, අමනාප ධර්‍මයෝ පිරිහීයෙත්. ඉෂ්ට, කාන්ත, මනාප ධර්‍මයෝ වෙසෙසින් වැඩෙත්. ඒ කවර හෙයින යත්: මහණෙනි, විද්වත්හට සම්බඳු (හෙතුයෙක්) වේද, තෙල එබඳු ම වෙයි.

11. මහණෙනි, ඒ ධර්‍මසමාදානයන් කෙරෙහි ප්‍රත්‍යුත්පන්නසුඛ වූත්, අනාගතදුඃඛවිපාක වූත් යම් ධර්‍මසමාදානයෙක් ඇද්ද, විද්‍යායෙන් යුක්ත, විද්වත් පුද්ගල "මේ ධර්‍මසමාදානය ප්‍රත්‍යුත්පන්නසුඛ ද, අනාගතදුඃඛ-විපාක ද වේ ය"යි යථාභූත වශයෙන් දන්නේ ය. විද්‍යායෙන් යුක්ත, විද්වත් පුද්ගල එය තත් වූ පරිදි දන්නේ එය නො සෙවුනේ ය. එය හරනේ ය. එය නොසෙවුනා, එය හරනා ඔහට අනිෂ්ට, අකාන්ත, අම-නාප ධර්‍මයෝ පිරිහීයෙත්. ඉෂ්ට, කාන්ත, මනාප ධර්‍මයෝ වෙසෙසින් වැඩෙත්. ඒ කවර හෙයින යත්: මහණෙනි, විද්වත්හට යම් බඳු (හෙතු-යෙක්) වේ ද, තෙල එබඳු ම වෙයි.

12. තත්‍ර භික්ඛවෙ යදිදං ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛං ආයතිං සුඛවිපාකං, තං විද්වා විජ්ජාගතො යථාභූතං පජානාති: ඉදං ඛො ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛං ආයතිං සුඛවිපාකන්ති. තං විද්වා විජ්ජාගතො, යථාභූතං පජානන්තො තං සෙවති, තං න පරිවජ්ජෙති. තස්ස තං සෙවතො තං අපරිවජ්ජයතො අනිට්ඨා අකන්තා අමනාපා ධම්මා පරිහායන්ති. ඉට්ඨා කන්තා මනාපා ධම්මා අභිවඩ්ඪන්ති. තං කිස්ස හෙතු? එවං හෙතං භික්ඛවෙ හොති යථා තං විද්දසුනො.

13. තත්‍ර භික්ඛවෙ යදිදං ධම්මසමාදානං පච්චුප්පන්නසුඛඤ්චෙව ආයතිඤ්ච සුඛවිපාකං, තං විද්වා විජ්ජාගතො යථාභූතං පජානාති: ඉදං ඛො ධම්මසමාදානං පච්චුප්පන්නසුඛඤ්චෙව ආයතිඤ්ච සුඛවිපාකන්ති. තං විද්වා[1] විජ්ජාගතො යථාභූතං පජානන්තො තං සෙවති, තං න පරිවජ්ජෙති; තස්ස තං සෙවතො තං අපරිවජ්ජයතො අනිට්ඨා අකන්තා අමනාපා ධම්මා පරිහායන්ති. ඉට්ඨා කන්තා මනාපා ධම්මා අභිවඩ්ඪන්ති. තං කිස්ස හෙතු? එවං හෙතං භික්ඛවෙ හොති යථා තං විද්දසුනො.

14. කතමඤ්ච භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛඤ්චෙව ආයතිඤ්ච දුක්ඛවිපාකං?

ඉධ භික්ඛවෙ එකච්චො සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන පාණාතිපාතී හොති පාණාතිපාතපච්චයා ච දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන අදින්නාදායී හොති අදින්නාදානපච්චයා ච දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන කාමෙසු මිච්ඡාචාරී හොති. කාමෙසු මිච්ඡාචාරපච්චයා ච දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන මුසාවාදී හොති. මුසාවාදපච්චයා ච දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන පිසුනාවාචො[2] හොති. පිසුනාවාචපච්චයා ච[3] දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන ඵරුසාවාචො[4] හොති ඵරුසාවාචපච්චයා ච[5] දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන සම්ඵප්පලාපී හොති. සම්ඵප්පලාපපච්චයා ච දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන අභිජ්ඣාලු හොති. අභිජ්ඣාපච්චයා ච දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන බ්‍යාපන්නචිත්තො හොති. බ්‍යාපාදපච්චයා ච දුක්ඛං දොමනස්සංපටිසංවෙදෙති. සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන මිච්ඡාදිට්ඨි හොති. මිච්ඡාදිට්ඨිපච්චයා ච දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති[6]. ඉදං වුච්චති භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛඤ්චෙව ආයතිඤ්ච දුක්ඛවිපාකං.

---

1 විද්ධා, සයා. 2. පිසුණවාචො, මජසං. සයා.
3. පිසුණාවාචාපච්චයා, සීමු පිසුණවාචාපච්චයා, මජසං සයා.
4. ඵරුසවාචො, මජසං සයා.
5. ඵරුසාවාචපච්චයා, සීමු ඵරුසවාචාපච්චයා, මජසං සයා 6. උපපජ්ජති, සි.

12. මහණෙනි, ඒ ධර්මසමාදානයන් කෙරෙහි ප්‍රත්‍යුත්පන්න දුඃඛ වූ ද, අනාගතසුඛවිපාක වූ ද, යම් ධර්මසමාදානයෙක් ඇද්ද, විඥසමන්‍වාගත, විඥවත් පුද්ගල. "මේ ධර්මසමාදාන නම්, ප්‍රත්‍යුත්පන්න දුඃඛ ය, අනාගතසුඛවිපාක ය" යි එය තතු සේ දන්නේ ය. විඥායෙන් යුක්ත, විඥවත්-පුද්ගල එය ඇතිසේ දන්නේ, එය සෙවුනේ ය. එය නො හරනේ ය. එය සෙවුනා, එය නොහරනා, ඔහට අනිෂ්ට, අකාන්ත, අමනාප, ධර්මයෝ පිරිහීයෙත්. ඉෂ්ට, කාන්ත මනාප, ධර්මයෝ වෙසෙසින් වැඩෙත් ඒ කවර හෙයින යත්: මහණෙනි, විඥවත් පුද්ගලහට යම්බඳු (හෙතුයෙක්) වේද, තෙල එබඳු ම වෙයි.

13. මහණෙනි, ඒ ධර්මසමාදානයන් කෙරෙහි ප්‍රත්‍යුත්පන්න සුඛ වූ ද, අනාගතසුඛවිපාක වූ ද, යම් ධර්මසමාදානයෙක් ඇද්ද, විඥයෙන් සමන්‍වාගත විඥවත් පුද්ගල "මේ ධර්මසමාදාන නම්, ප්‍රත්‍යුත්පන්නසුඛ ද වෙයි, අනාගත සුඛවිපාක ද වෙයි" යි එය තතුසේ දන්නේ ය. විඥයෙන් යුතු. විඥවත් පුද්ගල එය තතුසේ දන්නේ, එය සෙවුනේ ය. එය නොහරනේ ය. එය සෙවුනා, එය නො හරනා, ඔහට අනිෂ්ට, අකාන්ත, අමනාප, ධර්මයෝ පිරිහීයෙත්. ඉෂ්ට, කාන්ත, මනාප, ධර්මයෝ වෙසෙසින් වැඩෙත්. ඒ කවර හෙයින යත්: මහණෙනි, විඥවත්හට යම්බඳු (හෙතුයෙක්) වේද, තෙල එබඳු ම වෙයි.

14. මහණෙනි, මෙවත්මනු දුක් වූ, මතු අනායෙහි දුක් විපාක වූ ධර්මසමාදාන කවරේ ය යත්:

මහණෙනි, මෙලොව කිසිවෙක් සහගිය දුකිනුදු, සහගිය දොම්නසිනුදු පණිවා කරනු වෙයි. ඒ පණිවාහෙතුයෙනුදු දුක්දොම්නස් විඳී. සහගිය දුකිනුදු, සහගිය දොම්නසිනුදු. අයිනාදන් ගනු වෙයි. ඒ අයිනාදන් හෙතුයෙනුදු දුක් දොම්නස් විඳී. සහගිය දුකිනුදු, සහගිය දොම්නසිනුදු කාමයෙහි මිසහසර ඇති වෙයි. ඒ කාමයෙහි මිසහසර හෙතුයෙනුදු දුක් දොම්නස් විඳී. සහගිය දුකිනුදු, සහගිය දොම්නසිනුදු මුසවා බණනු වෙයි. ඒ මුසවා හෙතුයෙනුදු දුක් දොම්නස් විඳී. සහගිය දුකිනුදු, සහගිය දොම්නසිනුදු පිසුනුබස් බණනු වෙයි. ඒ පිසුනු බස් හෙතුයෙනුදු දුක් දොම්නස් විඳී. සහගිය දුකිනුදු සහගිය දොම්නසිනුදු පරොස්බස් බණනු වෙයි. ඒ පරොස්බස් හෙතුයෙනුදු, දුක්දොම්නස් විඳී. සහගිය දුකිනුදු, සහගිය දොම්නසිනුදු පලප් බණනු වෙයි. ඒ පලප් හෙතුයෙනුදු දුක් දොම්නස් විඳී. සහගිය දුකිනුදු, සහගිය දොම්නසිනුදු, පරා අයත්හි ලොබ බිහිලි වෙයි. ඒ අභිධ්‍යාහෙතුයෙනුදු දුක් දොම්නස් විඳී. සහගිය දුකිනුදු, සහගිය දොම්නසිනුදු ව්‍යාපන්නසිත් ඇති වෙයි. ඒ ව්‍යාපාදහෙතුයෙනුදු දුක්දොම්ස් විඳී. සහගිය දුකිනුදු, සහගිය දොම්නසිනුදු මිසිදිටු ඇති වෙයි. ඒ මිසදිටු හෙතුයෙනුදු දුක් දොම්නස් විඳී. හේ කාබුන් මරණින් මතුයෙහි අපාය දුර්ගති විනිපාත සඞ්ඛ්‍යාත නිරයට එළඹෙයි. මහණෙනි, මේ ධර්මසමාදාන මෙවත්මනු දුක් ඇතැයි ද, මතු දුක් විපාක ඇතැයි ද කියනු ලැබේ.

15. කතමඤ්ච භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නසුඛං ආයතිං දුක්ඛවිපාකං?

ඉධ භික්ඛවෙ එකච්චො, සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන පාණාතිපාතී හොති. පාණාතිපාතපච්චයා ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන අදින්නාදායී හොති. අදින්නාදානපච්චයා ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන කාමෙසු මිච්ඡාචාරී හොති කාමෙසු මිච්ඡාචාරපච්චයා ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන මුසාවාදී හොති. මුසාවාදපච්චයා ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන පිසුනාවාචො[1] හොති. පිසුනාවාචපච්චයා ච[2] සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන ඵරුසාවාචො[3] හොති. ඵරුසාවාචපච්චයා[4] ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන සම්ඵප්පලාපී හොති. සම්ඵප්පලාපපච්චයා ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන අභිජ්ඣාලු හොති. අභිජ්ඣාපච්චයා ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන බ්‍යාපන්නචිත්තො හොති. බ්‍යාපාදපච්චයා ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන මිච්ඡාදිට්ඨී හොති. මිච්ඡාදිට්ඨිපච්චයා ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. ඉදං වුච්චති භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නසුඛං ආයතිං දුක්ඛවිපාකං.

16. කතමඤ්ච භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛං ආයතිං සුඛවිපාකං?

ඉධ භික්ඛවෙ එකච්චො සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන පාණාතිපාතා පටිවිරතො හොති. පාණාතිපාතා වෙරමණිපච්චයා ච දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන අදින්නාදානා පටිවිරතො හොති. අදින්නාදානා වෙරමණිපච්චයා ච දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති. කාමෙසු මිච්ඡාචාරා වෙරමණිපච්චයා ච දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන මුසාවාදා පටිවිරතො හොති. මුසාවාදා වෙරමණිපච්චයා ච දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන පිසුනාය වාචාය[5] පටිවිරතො හොති. පිසුනාය වාචාය වෙරමණිපච්චයා ච දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන ඵරුසාය වාචාය[6] පටිවිරතො හොති. ඵරුසාය වාචාය වෙරමණිපච්චයා ච දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන සම්ඵප්පලාපා පටිවිරතො හොති. සම්ඵප්පලාපා වෙරමණිපච්චයා ච දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති -

1 පිසුණවාචො, මජසං. සයා
2. පිසුණාවාචාපච්චයා, සීමු. පිසුණවාචා පච්චයා, මජසං. සයා.
3 ඵරුසවාචො. මජසං. සයා 4. ඵරුසාවාචාපච්චයා, සීමු. ඵරුසවාචාපච්චයා, මජසං. සයා
5 පිසුණාවාචා, සීමු 6 ඵරුසාවාචා, සීමු

15. මහණෙනි, මෙවත්මනු සුව ඇති, මතු දුක් විපාක ඇති ධර්මසමාදාන කවරේ ය යත්:

මහණෙනි, මෙලොව කිසිවෙක් සහගිය සුව ඇතිවත්, සහගිය සොම්නස් ඇතිවත් පණිවා කරනු වෙයි. පණිවාහෙතුයෙනුදු සුවසොම්නස් විඳී. සහගියසුව ඇති වත්, සහගිය සොම්නස් ඇති වත් අයිනාදන් ගනු වෙයි. අයිනාදන් හෙතුයෙනුදු සුවසොම්නස් විඳී. සහගිය සුව ඇති වත්, සහගිය සොම්නස් ඇති වත් කාමයෙහි මිසහසර ඇති වෙයි. කාමයෙහි මිසහසර හෙතුයෙනුදු සුවසොම්නස් විඳී. සහගිය සුව ඇති වත්, සහගිය සොම්නස් ඇති වත් මුසවා බණනු වෙයි. මුසවා හෙතුයෙනුදු සුවසොම්නස් විඳී. සහගිය සුව ඇති වත්, සහගිය සොම්නස් ඇති වත් පෙහෙසුන් බණනු වෙයි. පෙහෙසුන්බස් හෙතුයෙනුදු සුව සොම්නස් විඳී. සහගිය සුව ඇති වත්, සහගියසොම්නස් ඇති වත් පරොස්බස් බණනු වෙයි. පරොස්බස් හෙතුයෙනුදු සුවසොම්නස් විඳී. සහගිය සුව ඇති වත්, සහගිය සොම්නස් ඇති වත් පලප් බණනු වෙයි. පලප් හෙතුයෙනුදු සුව සොම්නස් විඳී. සහගිය සුව ඇතිවත්, සහගිය සොම්නස් ඇතිවත් (පරා අයත්හි) අභිධ්‍යා (වසම්ලොබ) බිහිලී වෙයි. අභිධ්‍යාහෙතුයෙනුදු සුවසොම්නස් විඳී. සහගිය සුව ඇති වත්, සහගිය සොම්නස් ඇතිවත් ව්‍යාපන්නසිත් ඇති වෙයි. ව්‍යාපාද හෙතුයෙනුදු සුව සොම්නස් විඳී. සහගියසුව ඇති වත්, සහගිය සොම්නස් ඇති වත් මිසදිටු ඇති වෙයි. මිසදිටු හෙතුයෙනුදු, සුවසොම්නස් විඳී. හේ කය බුන් මරණින් මතුයෙහි අපාය, දුර්ගති, විනිපාත සඞ්ඛ්‍යාත නිරයට එළඹෙයි. මහණෙනි, මේ ධර්මසමාදාන ප්‍රත්‍යුත්පන්නසුඛය යි අනාගත දුඃඛවිපාකය යි කියනු ලැබේ.

16. මහණෙනි, මෙවත්මනු දුක් ඇති, මතු සුඛවිපාක ඇති ධර්මසමාදාන කවරේ ය යත්:

මහණෙනි, මෙලොව කිසිවෙක් සහගිය දුක් ඇති වත්, සහගිය දෙම්නස් ඇති වත් පණිවායෙන් දුරු වූයේ වෙයි. පණිවායෙන් දුරුවීම්හෙතුයෙනුදු දුක් දෙම්නස් විඳී. සහගිය දුක් ඇති වත්, සහගිය දෙම්නස් ඇති වත් අයිනාදනින් දුරු වූයේ වෙයි. අයිනාදනින් දුරුවීම්හෙතුයෙනුදු දුක්දෙම්නස් විඳී. සහගිය දුක් ඇති වත්, සහගිය දෙම්නස් ඇති වත් කාමයෙහි මිසහසරින් දුරු වූයේ වෙයි. කාමයෙහි මිසහසරින් දුරුවීම් හෙතුයෙනුදු දුක් දෙම්නස් විඳී. සහගිය දුක් ඇති වත්, සහගිය දෙම්නස් ඇති වත් මුසවායෙන් දුරු වූයේ වෙයි. මුසවායෙන් දුරුවීම් හෙතුයෙනුදු දුක් දෙම්නස් විඳී. සහගිය දුක් ඇති වත්, සහගිය දෙම්නස් ඇති වත් පිසුනුබසින් දුරුවූයේ වෙයි. පිසුනුබසින් දුරු වීම් හෙතුයෙනුදු දුක්දෙම්නස් විඳී. සහගිය දුක් ඇති වත්, සහගිය දෙම්නස් ඇති වත් පරොස්බසින් දුරුවූයේ වෙයි. පරොස්බසින් දුරුවීම් හෙතුයෙනුදු, දුක් දෙම්නස් විඳී. සහගිය දුක් ඇති වත්, සහගිය දෙම්නස් ඇති වත් පලපින දුරු වූයේ වෙයි. පලපින් දුරුවීම් හෙතුයෙනුදු දුක් දෙම්නස් විඳී.

Free Distribution www.aathaapi.org

සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන අනභිජ්ඣාලු හොති. අනභිජ්ඣාපච්චයා ච දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන අබ්‍යාපන්නචිත්තො හොති. අබ්‍යාපාදපච්චයා ච දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන සම්මාදිට්ඨි හොති. සම්මාදිට්ඨිපච්චයා ච දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.[1] ඉදං වුච්චති භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛං ආයතිං සුඛවිපාකං.

17. කතමඤ්ච භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නසුඛඤ්චෙව ආයතිඤ්ච සුඛවිපාකං?

ඉධ භික්ඛවෙ එකච්චො සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන පාණාතිපාතා පටිවිරතො හොති. පාණාතිපාතා වෙරමණිපච්චයා ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන අදින්නාදානා පටිවිරතො හොති. අදින්නාදානා වෙරමණිපච්චයා ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති. කාමෙසු මිච්ඡාචාරා වෙරමණිපච්චයා ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන මුසාවාදා පටිවිරතො හොති. මුසාවාදා වෙරමණිපච්චයා ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන පිසුනාය වාචාය[2] පටිවිරතො හොති. පිසුනාය වාචාය වෙරමණිපච්චයා ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන ඵරුසාය වාචාය[3] පටිවිරතො හොති. ඵරුසාය වාචාය වෙරමණිපච්චයා ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන සම්ඵප්පලාපා පටිවිරතො හොති. සම්ඵලාපා වෙරමණිපච්චයා ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන අනභිජ්ඣාලු හොති. අනභිජ්ඣාපච්චයා ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන අබ්‍යාපන්නචිත්තො හොති. අබ්‍යාපාදපච්චයා ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සහාපි සුඛෙන සහාපි සොමනස්සෙන සම්මාදිට්ඨි හොති. සම්මාදිට්ඨිපච්චයා ච සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. ඉදං වුච්චති භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නසුඛඤ්චෙව ආයතිඤ්ච සුඛවිපාකං.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි ධම්මසමාදානානි.

18. සෙය්‍යථාපි භික්ඛවෙ තිත්තකාලාපු[4] විසෙන සංසට්ඨො, අථ පුරිසො ආගච්ඡෙය්‍ය ජීවිතුකාමො අමරිතුකාමො, සුඛකාමො දුක්ඛපටික්කූලො, තමෙනං එවං වදෙය්‍යුං: 'අම්භො පුරිස, අයං තිත්තකාලාපු විසෙන සංසට්ඨො. සචෙ ආකඞ්ඛසි පිව[5]. තස්ස තෙ පිවතො[6] චෙව නච්ඡාදෙස්සති වණ්ණෙනපි ගන්ධෙනපි රසෙනපි. –

1. උපපජ්ජති, සී. 2 පිසුණාවාච, සී. - කාළුච් 3. පරුසාවාචා, සී කාළුච්.
4 තිත්තකාලාබු, මජසං PTS සී. කාළුච්; තිත්තිකාලාබු, සසා.
5. පිප, සීමු. 6. පි ඡතා, සීමු

සහගිය දුක් ඇති වත්, සහගිය දොම්නස් ඇතිවත් අභිධ්‍යාබහුල නො වෙයි. අනභිධ්‍යාහෙතුයෙනුදු දුක්දොම්නස් විඳී. සහගිය දුක් ඇතිවත්, සහගිය දොම්නස් ඇතිවත් ව්‍යාපාද රහිත සිත් ඇති වෙයි. අව්‍යාපාදහෙතු-යෙනුදු දුක් දොම්නස් විඳී. සහගියදුක් ඇති වත්, සහගිය දොම්නස් ඇති වත් සම්දිට්ඨි ඇති වෙයි. සම්දිට්ඨි හෙතුයෙනුදු දුක් දොම්නස් විඳී. හේ කාබුන් මරණින් මතුයෙහි මනාගති වූ ස්වර්ගලොකයට එළඹෙයි. මහණෙනි, මෙවත්-මනු දුක් ඇති, මතු සුඛ විපාක ඇති ධර්මසමාදාන මෙයයි කියනු ලැබේ.

17. මහණෙනි, මෙවත්මනු සුඛ ඇති, මතුයෙහි සුඛවිපාක ඇති ධර්මසමාදාන කවරේ ය යත්:

මහණෙනි, මෙලොව කිසිවෙක් සහගිය සුව ඇතිවත්, සහගිය සොම්නස් ඇතිවත් පණිවායෙන් දුරුවූයේ වෙයි. පණිවායෙන් දුරුවීම් හෙතුයෙනුදු සුවසොම්නස් විඳී. සහගිය සුඛ ඇතිවත්, සහගියසොම්නස් ඇතිවත් අයිනාදනින් දුරුවූයේ වෙයි. අයිනාදනින් දුරුවීම් හෙතුයෙනුදු සුවසොම්නස් විඳී. සහගියසුව ඇතිවත්, සහගිය සොම්නස් ඇතිවත් කාමයෙහි මිසහසරින් දුරුවූයේ වෙයි. කාමයෙහි මිසහසරින් දුරුවීම් හෙතුයෙනුදු සුවසොම්නස් විඳී. සහගියසුව ඇතිවත්, සහගිය සොම්නස් ඇතිවත්. මුසවායෙන් දුරුවූයේ වෙයි. මුසවායෙන් දුරුවීම්හෙතුයෙනුදු සුවසොම්නස් විඳී. සහගිය සුව ඇතිවත්, සහගිය සොම්නස් ඇතිවත් පිසුනුබසින් දුරුවූයේ වෙයි. පිසුනු බසින් දුරුවීම්-හෙතුයෙනුදු සුවසොම්නස් විඳී. සහගියසුව ඇතිවත්, සහගිය සොම්නස් ඇතිවත් පරොස්බසින් දුරුවූයේ වෙයි. පරොස්බසින් දුරුවීම් හෙතුයෙනුදු සුවසොම්නස් විඳී. සහගිය සුව ඇතිවත්, සහගිය සොම්නස් ඇතිවත් පලපිත් දුරුවූයේ වෙයි. පලපිත් දුරුවීම් හෙතුයෙනුදු සුවසොම්නස් විඳී. සහගියසුව ඇතිවත්, සහගිය සොම්නස් ඇතිවත් අභිධ්‍යාබහුල නොවෙයි. අනභිධ්‍යාහෙතුයෙනුදු සුවසොම්නස් විඳී. සහගිය සුව ඇතිවත්, සහගිය සොම්නස් ඇතිවත් ව්‍යාපාද රහිත සිත් ඇති වෙයි. අව්‍යාපාද හෙතුයෙනුදු සුවසොම්නස් විඳී. සහගිය සුව ඇතිවත්, සහගිය සොම්නස් ඇතිවත් සම්දිට්ඨි ඇති වෙයි. සම්දිට්ඨි හෙතුයෙනුදු සුවසොම්නස් විඳී. හේ කාබුන් මරණින් මතුයෙහි මනාගති ඇති ස්වර්ගලොකයට එළඹෙයි. මහණෙනි, මේ ධර්මසමාදාන ප්‍රත්‍යුත්පන්නසුඛ යයි ද, ආයතිසුඛවිපාක යයි ද කියනු ලැබේ.

මහණෙනි මොහු සතර ධර්මසමාදාන වෙති.

18. මහණෙනි, යම්සේ (හලාහල) විස මුසු තිත්ලබු එලයෙක් වේ ද, එවිට, ජීවත්වනු කැමැති, නොමැරෙනු කැමැති, සුවකැමැති, දුකෙහි පිළිකුල් ඇති පුරුෂයෙක් එන්නේ වේ ද, ඔහට මෙසේ කියත් ද: "එම්බා පුරුෂය, මේ තිත්ලබුපල විස සහිත වෙයි. කැමැතියෙහි නම් එය බොනු. බොන්නාවූ තට වර්ණයෙනුදු, ගන්ධයෙනුදු රසයෙනුදු නො රුස්නේය. -

පිවිත්වා[1] ච පන මරණං වා නිගච්ඡසි[2] මරණමත්තං වා දුක්ඛන්ති. සො තං අප්පටිසඞ්ඛාය[3] පිවෙය්‍ය, න පටිනිස්සජ්ජෙය්‍ය.[4] තස්ස තං පිවතො චෙව නච්ඡාදෙය්‍ය වණ්ණෙනපි ගන්ධෙනපි රසෙනපි. පිවිත්වා ච පන මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං. තථූපමාහං භික්ඛවෙ ඉමං ධම්මසමාදානං වදාමි යමිදං[5] ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛඤ්චෙව ආයතිඤ්ච දුක්ඛවිපාකං. (1)

19. සෙය්‍යථාපි භික්ඛවෙ ආපානීයකංසො වණ්ණසම්පන්නො ගන්ධසම්පන්නො රසසම්පන්නො, සො ච ඛො විසෙන සංසට්ඨො. අථ පුරිසො ආගච්ඡෙය්‍ය ජීවිතුකාමො අමරිතුකාමො, සුඛකාමො දුක්ඛපටිකූලො. තමෙනං එව වදෙය්‍යුං: 'අම්භො පුරිස, අයං ආපානීයකංසො[6] වණ්ණසම්පන්නො ගන්ධසම්පන්නො රසසම්පන්නො. සො ච ඛො විසෙන සංසට්ඨො. සචෙ ආකඞ්ඛසි පිව. තස්ස තෙ පිවතො හි ඛො ඡාදෙස්සති වණ්ණෙනපි ගන්ධෙනපි රසෙනපි. පිවිත්වා ච පන මරණං වා නිගච්ඡසි මරණමත්තං වා දුක්ඛන්ති. සො තං අප්පටිසඞ්ඛාය පිවෙය්‍ය, න පටිනිස්සජ්ජෙය්‍ය. තස්ස තං පිවතො හි ඛො ඡාදෙය්‍ය වණ්ණෙනපි ගන්ධෙනපි රසෙනපි. පිවිත්වා ච පන මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං. තථූපමාහං භික්ඛවෙ ඉමං ධම්මසමාදානං වදාමි යමිදං ධම්මසමාදානං පච්චුප්පන්නසුඛං ආයතිං දුක්ඛවිපාකං. (2)

20. සෙය්‍යථාපි භික්ඛවෙ පූතිමුත්තං නානාභෙසජ්ජෙහි සංසට්ඨං, අථ පුරිසො ආගච්ඡෙය්‍ය පණ්ඩුරොගී. තමෙනං එවං වදෙය්‍යුං: 'අම්භො පුරිස, ඉදං පූතිමුත්තං නානාභෙසජ්ජෙහි සංසට්ඨං. සචෙ ආකඞ්ඛසි පිව. තස්ස තෙ පිවතො හි ඛො නච්ඡාදෙස්සති වණ්ණෙනපි ගන්ධෙනපි රසෙනපි, පිවිත්වා ච පන සුඛී භවිස්සසී'ති. සො තං පටිසඞ්ඛාය පිවෙය්‍ය න පටිනිස්සජ්ජෙය්‍ය. තස්ස තං පිවතො හි ඛො නච්ඡාදෙය්‍ය වණ්ණෙනපි ගන්ධෙනපි රසෙනපි. පිවිත්වා ච පන සුඛී අස්ස. තථූපමාහං භික්ඛවෙ ඉමං ධම්මසමාදානං වදාමි යමිදං ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛං ආයතිං සුඛවිපාකං. (3)

21. සෙය්‍යථාපි භික්ඛවෙ දධි ච මධු ච සප්පි ච[7] ඵාණිතඤ්ච එකජ්ඣං සංසට්ඨං, අථ පුරිසො ආගච්ඡෙය්‍ය ලොහිතපක්ඛන්දිකො. තමෙනං එවං වදෙය්‍යුං: අම්භො පුරිස, ඉමං දධි ච මධු ච සප්පි ච ඵාණිතඤ්ච එකජ්ඣං සංසට්ඨං, සචෙ ආකඞ්ඛසි පිව. තස්ස තෙ පිවතො චෙව ඡාදෙස්සති වණ්ණෙනපි ගන්ධෙනපි රසෙනපි පිවිත්වා ච පන සුඛී භවිස්සසීති. සො තං පටිසඞ්ඛාය පිවෙය්‍ය, න පටිනිස්සජ්ජෙය්‍ය.[4] තස්ස තං පිවතො චෙව ඡාදෙය්‍ය වණ්ණෙනපි ගන්ධෙනපි රසෙනපි. පිවිත්වා ච පන සුඛී අස්ස. තථූපමාහං භික්ඛවෙ ඉමං ධම්මසමාදානං වදාමි යමිදං ධම්මසමාදානං පච්චුප්පන්නසුඛඤ්චෙව ආයතිඤ්ච සුඛවිපාකං. (4)

1. පීත්වා, සීමු. 2 නිගච්ඡසි, සයා. 3. අප්පටිසඞ්ඛාය, මජ්ස. සයා.
4. නප්පටිනිස්සජ්ජෙය්‍ය, සී මජ්ස. සයා PTS 5 යදිදං, සයා
6. ආපානියකංසො, සයා 7 දධිඤ්ච මධුඤ්ච සප්පිඤ්ච, සීමු.

Free Distribution www.aathaapi.org

පානය කොට මරණයට හෝ මරණමාත්‍රදුඃඛයට හෝ යන්නෙහි.” හේ එබස් නොසලකා බොන්නේ වේද, නො හරනේ වේද, එය බොන ඔහට වර්ණයෙනුදු ගන්ධයෙනුදු රසයෙනුදු නො රුස්නේ වේද, පානය කොට ද මරණයට හෝ මරණමාත්‍රදුඃඛයට හෝ යන්නේ වේ ද, මහණෙනි, මම ප්‍රත්‍යුත්පන්නදුඃඛ වූත්, ආයතිදුඃඛවිපාක වූත් යම් ධර්මසමාදානයෙක් ඇද්ද, මේ ධර්ම සමාදානය එබඳු කොට කියමි. (1)

19. මහණෙනි, යම්සේ වර්ණසම්පන්න, ගන්ධසම්පන්න, රසසම්පන්න, ආපානීය (පියයුතු මිහිරිපැනකින් පිරුණු) කස්තලියෙක් වේද, එද විස මුසු වේ ද, එසඳ, ජීවත්වනු කැමැති,නොමැරෙනු කැමැති, සුවකැමැති, දුකෙහි පිළිකුල් ඇති පුරුෂයෙක් එන්නේ වේ ද, තෙල පුරුෂයාහට මෙසේ කියද්ද: “එම්බා පුරුෂය, මේ අවත් කස්තලිය වර්ණසම්පන්න ය, ගන්ධසම්පන්න ය, රසසම්පන්න ය. එද විසෙන් හැතිණ. කැමැතියෙහි නම් බෝ. බොන තට වර්ණයෙනුදු, ගන්ධයෙනුදු, රසයෙනුදු රුස්නේ ය. එහෙත් පානය කොට මරණයට හෝ මරණමාත්‍රදුඃඛයට හෝ යන්නෙහි”යි. හේ එබස් නොසලකා බොන්නේ වේ ද, නො හරනේ වේ ද, එය බොන ඔහට වර්ණයෙනුදු, ගන්ධයෙනුදු, රසයෙනුදු රුස්නේ වේ ද, පානය කොට ද මරණයට හෝ මරණමාත්‍ර දුඃඛයට හෝ යන්නේ වේ ද, මහණෙනි, මම ප්‍රත්‍යුත්පන්න සුඛ වූත්, ආයතිදුඃඛවිපාක වූත් යම් ධර්මසමාදානයෙක් ඇද්ද, මේ ධර්මසමාදානය එබඳු කොට කියමි. (2)

20. මහණෙනි, යම්සේ (අරළු ඇඹුලු ඈ) නන්බෙහෙදින් මුසු ගොමුත්‍රයක් වේද, එසඳ පාණ්ඩුරෝග ඇති පුරුෂයෙක් එන්නේ වේද, තෙල පුරුෂයාහට මෙසේ කියද්ද: “එම්බා පුරුෂය, මේ ගොමුත්‍ර නානාභෛෂජ්‍යයෙන් හතන ලද්දේය. කැමැතියෙහි නම් බෝ. බොන තොපට වර්ණයෙනුදු ගන්ධයෙනුදු රසයෙනුදු නො රුස්නේය. එහෙත් පානය කොට සුඛිත වෙහි” යි. හේ එබස් සලකා බොන්නේ වේ ද, නො හරනේ වේ ද, එය බොන ඔහට වර්ණයෙනුදු, ගන්ධයෙනුදු, රසයෙනුදු නොරුස්නේ වේ ද, එහෙත් පානය කොට සුවපත් වන්නේ වේ ද, මහණෙනි, මම ප්‍රත්‍යුත්පන්න දුඃඛ වූ ද, ආයතිසුඛවිපාක වූ ද යම් ධර්මසමාදානයෙක් ඇද්ද, මේ ධර්මසමාදානය එබඳු කොට කියමි. (3)

21. මහණෙනි, යම්සේ දිහි මී ගිතෙල් හා පැණි එකතු කොට ඇලළුණේ වේ ද, එසඳ (පිත්තසංසර්‍ගයෙන්) ලොහිතපක්ඛන්දිකාබාධ ඇති පරුෂයෙක් එන්නේ වේ ද, ඔහුට මෙසේ කියද්ද: “එම්බා පුරුෂය, මේ දිහි මී ගිතෙල් හා පැණි එකතු කොට ඇලළිණ. කැමතියෙහි නම් බෝ. පානය කරන තට වර්ණයෙනුදු, ගන්ධයෙනුදු, රසයෙනුදු රුස්නේ ය. පානය කොට ද සුඛිත වෙහි”යි. හේ එය සලකා පානය කරන්නේ වේ ද, නොහරන්නේ වේද, එය පානය කරන ඕහට වර්ණයෙනුදු, ගන්ධයෙනුදු, රසයෙනුදු රුස්නේ වේද, පානය කොට සුවපත් වන්නේ වේද, මහණෙනි, මම ප්‍රත්‍යුත්පන්නසුඛ වූත්, ආයතිසුඛවිපාක වූත් යම් ධර්මසමාදානයෙක් ඇද්ද, මේ ධර්මසමාදානය එබඳු කොට කියමි (4)

22. සෙය්‍යථාපි භික්ඛවෙ වස්සානං පච්ඡිමෙ මාසෙ සරදසමයෙ විද්ධෙ විගතවලාහකෙ දෙවෙ ආදිච්චො නභං අබ්භුස්සක්කමානො සබ්බං ආකාසගතං තමගතං අභිවිහච්ච භාසති ච තපති ච විරොචති ච, එවමෙව ඛො භික්ඛවෙ යමිදං ධම්මසමාදානං පච්චුප්පන්නසුඛඤ්චෙව ආයතිඤ්ච සුඛවිපාකං, තදඤ්ඤෙ[1] පුථුසමණබ්‍රාහ්මණපරප්පවාදෙ අභිවිහච්ච භාසති ච තපති ච විරොචති චාති.

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

මහාධම්මසමාදානසුත්තං ඡට්ඨං.

1 තදඤ්ඤෙ ච, සී. කාථච

Free Distribution www.aathaapi.org

22. මහණෙනි, යම්සේ වර්ෂා සෘතුවෙහි පැසිම්මස සරා කල්හි අහස බිඳීගිය (එහෙයින්ම) දුරු ව සිටි වලා ඇතිවත් ම, හිරු අහස්කුස් තඟිමින් අහස සිටුනා හැම අඳුරු මැඩ බිඳ පියා බබලන්නේ වේ ද, තවන්නේ වේ ද, දිලෙන්නේ වේ ද, මහණෙනි, එපරිදි ම මම ප්‍රත්‍යුත්පන්න සුඛ වූත්, ආයතිසුඛවිපාකවූත් යම් ධර්මසමාදානයෙක් ඇද්ද, එය අන්‍ය ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ ප්‍රවාදයන් ඔබාබිඳ බබලනු ද වෙයි. තවනු ද වෙයි. දිලෙනු ද වෙයි.

භාග්‍යවතුන් වහන්සේ මේ මහාධම්මසමාදාන සූත්‍රය වදාළහ. (ප්‍රීති-සෞමනස්‍ය විසින්) ගත් සිතැති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිමුඛ ව ගෙන සතුටු වූහු.

මහාධම්මසමාදානසූත්‍රය සවැනියි.

1. 5. 7.

වීමංසකසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. වීමංසකෙන භික්ඛවෙ භික්ඛුනා පරස්ස චෙතොපරියායං අජානන්තෙන තථාගතෙ සමන්නෙසනා කාතබ්බා 'සම්මාසම්බුද්ධො වා නො වා' ඉති විඤ්ඤාණායාති.

"භගවංමූලකා නො භන්තෙ ධම්මා භගවංනෙත්තිකා භගවංපටිසරණා. සාධු වත භන්තෙ භගවන්තංයෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො. භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති."[1]

තෙන හි භික්ඛවෙ සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

3. වීමංසකෙන භික්ඛවෙ භික්ඛුනා පරස්ස චෙතොපරියායං අජා-නන්තෙන ද්වීසු ධම්මෙසු තථාගතො සමන්නෙසිතබ්බො: චක්ඛුසොත-විඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු-

යෙ සඞ්කිලිට්ඨා චක්ඛුසොතවිඤ්ඤෙය්‍යා ධම්මා, සංවිජ්ජන්ති වා තෙ තථාගතස්ස නො වා'ති. තමෙනං සමන්නෙසමානො එවං ජානාති: යෙ සඞ්කිලිට්ඨා චක්ඛුසොතවිඤ්ඤෙය්‍යා ධම්මා, න තෙ තථාගතස්ස සංවිජ්ජන්ති'ති. (1)

යතො නං සමන්නෙසමානො එවං ජානාති: යෙ සඞ්කිලිට්ඨා චක්ඛුසොත විඤ්ඤෙය්‍යා ධම්මා, න තෙ තථාගතස්ස සංවිජ්ජන්තීති. තතො නං උත්තරිං සමන්නෙසති: යෙ වීතිමිස්සා[2] චක්ඛුසොතවිඤ්ඤෙය්‍යා ධම්මා, සංවිජ්ජන්ති වා තෙ තථාගතස්ස නො වා'ති. තමෙනං සමන්නෙසමානො එවං ජානාති: යෙ වීතිමිස්සා[2] චක්ඛුසොත විඤ්ඤෙය්‍යා ධම්මා, න තෙ තථාගතස්ස සංවිජ්ජන්තී ති (2)

---

1 ධාරිස්සන්තීති, මජසං. 2 වෙතිමිස්සා, සී කළුවි.

1. 5. 7.

විමංසක සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු මහසිටාණන්ගේ අරමෙහි වැඩ වසන සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමැතූසේක. වහන්සැ යි ඒ භික්ෂූහු භාග්‍ය-වතුන් වහන්සේට පිළිවදන් දුන්හු. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

2. මහණෙනි, මෙරමාගේ සිත්නියර (සරාගාදි විභාග විසින් පවත්නා ආකාර පරිච්ඡේදය) නොදන්නා විමංසක (විමසන) මහණ විසින් 'සම්‍යක් සම්බුද්ධ වේ ද හෝ නො වේ ද හෝ' යි දනු සඳහා තථාගතයන් කෙරෙහි සමන්වේෂණ (පිරියෙස්ලි) කළයුතු වෙයි.

"වහන්ස, අපගේ දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ විනෙතෘ කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බැස සිටුනාහ. වහන්ස, තෙල භාෂිතයාගේ අර්ථ භාග්‍යවතුන් වහන්සේට ම වැටහේ නම් මනා මැනැ. භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අසා භික්ෂූහු ධරන්නාහ"යි.

මහණෙනි, එකරුණින් අසව. මනාකොට මෙනෙහි කරව. කියමියි. 'වහන්ස එසේ ය'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළහ:

3. මහණෙනි, මෙරමාගේ සිත්හසර නොදන්නා විමංසක මහණ විසින් දෙදහමෙක්හි ලා තථාගතයන් වහන්සේ පර්‍යේෂණ කළයුතු වෙති: චක්ෂුර්විඥෙය (කායසමාචාර), ශ්‍රොත්‍ර විඥෙය (වාක්සමාචාර) ධර්මද්වයෙහිය.

චක්ෂුර්විඥෙය වූ ශ්‍රොත්‍ර විඥෙය වූ කෙලශසම්ප්‍රයුක්ත යම් ධර්ම කෙනෙක් ඇද්ද, ඔහු තථාගතයන් වහන්සේට වෙත් ද හෝ නො වෙත් ද හෝයි. තෙල තථාගතයන් වහන්සේ පර්‍යේෂණ කරන විමංසක මහණ මෙසෙ-යින් දන්නේය: "චක්ෂුඃශ්‍රොත්‍රවිඥෙය වූ කෙලශසම්ප්‍රයුක්ත යම් ධර්ම කෙනෙක් ඇද්ද, ඔහු තථාගතයන් වහන්සේට (නැති හෙයින් ම) නැත" කියායි (1)

"චක්ෂුඃ ශ්‍රොත්‍රවිඥෙය වූ කෙලශසම්ප්‍රයුක්ත යම් ධර්මකෙනෙක් ඇද්ද, ඔහු තථාගතයන් වහන්සේට නැතැ"යි යම් අවධියෙක ඔබ පර්‍යේෂණ කරනුයේ මෙසේ දන්නේ වේ ද, ඔබ ඉන් මතුදු සමන්වේෂණ කෙරෙයි. කෙසේ ය: (කලෙක කෘෂ්ණයහ, කලෙක ශුක්ලයහ යි මෙසේ) ව්‍යතිමිශ්‍ර වූ චක්ෂුඃ ශ්‍රොත්‍රවිඥෙය වූ යම් ධර්ම කෙනෙක් ඇද්ද, ඔහු තථාගතයන් වහන්සේට වෙද්ද හෝ නො වෙද්ද හෝ යි ඔබ සොයනුයේ මෙසේ දන්නේ ය: ව්‍යතිමිශ්‍රවූ චක්ෂුඃශ්‍රොත්‍රවිඥෙය වූ යම් ධර්ම කෙනෙක් ඇද්ද, ඔහු තථාගතයන් වහන්සේට නැත කියා යි. (2)

යතො නං සමන්නෙසමානො එවං ජානාති: යෙ වීතිමිස්සා චක්ඛු සොත විඤ්ඤෙය්‍යා ධම්මා, න තෙ තථාගතස්ස සංවිජ්ජන්තීති. තතො නං උත්තරිං සමන්නෙසති: යෙ වොදාතා චක්ඛුසොතවිඤ්ඤෙය්‍යා ධම්මා, සංවිජ්ජන්ති වා තෙ තථාගතස්ස නො වාති. තමෙනං සමන්නෙසමානො එවං ජානාති: යෙ වොදාතා චක්ඛුසොතවිඤ්ඤෙය්‍යා ධම්මා, සංවිජ්ජන්ති තෙ තථාගතස්සාති. (3)

යතො නං සමන්නෙසමානො එවං ජානාති: යෙ වොදාතා චක්ඛු-සොතවිඤ්ඤෙය්‍යා ධම්මා, සංවිජ්ජන්ති තෙ තථාගතස්සාති. තතො නං උත්තරිං සමන්නෙසති: දීඝරත්තං සමාපන්නො අයමායස්මා[1] ඉමං කුසලං ධම්මං, උදාහු ඉත්තරසමාපන්නොති. තමෙනං සමන්නෙසමානො එවං ජානාති: දීඝරත්තං සමාපන්නො අයමායස්මා ඉමං කුසලං ධම්මං, නායමායස්මා ඉත්තරසමාපන්නොති. (4)

යතො නං සමන්නෙසමානො එවං ජානාති: දීඝරත්තං සමාපන්නො අයමායස්මා ඉමං කුසලං ධම්මං, නායමායස්මා ඉත්තරසමාපන්නොති. තතො නං උත්තරිං සමන්නෙසති: ඤත්තජ්ඣාපන්නො[2] අයමායස්මා භික්ඛු යසම්පත්තො,[3] සංවිජ්ජන්තස්ස ඉධෙකච්චෙ ආදීනවාති.

"න තාව භික්ඛවෙ භික්ඛුනො ඉධෙකච්චෙ ආදීනවා සංවිජ්ජන්ති යාව න ඤත්තජ්ඣාපන්නො[2] හොති යසම්පත්තො[3]. යතො ච ඛො භික්ඛවෙ භික්ඛු ඤත්තජ්ඣාපන්නො හොති යසම්පත්තො, අථස්ස ඉධෙකච්චෙ ආදීනවා සංවිජ්ජන්ති."

තමෙනං සමන්නෙසමානො එවං ජානාති. ඤත්තජ්ඣාපන්නො[2] අයමායස්මා භික්ඛු යසම්පත්තො,[3] නාස්ස ඉධෙකච්චෙ ආදීනවා සංවිජ්ජන්තීති. (5)

යතො නං සමන්නෙසමානො එවං ජානාති: ඤත්තජ්ඣාපන්නො අයමායස්මා භික්ඛු යසම්පත්තො, නාස්ස ඉධෙකච්චෙ ආදීනවා සංවිජ්ජන්තීති තතො නං උත්තරිං සමන්නෙසති: අභයූපරතො අයමායස්මා නායමා-යස්මා භයූපරතො, වීතරාගත්තා කාමෙ න සෙවති ඛයා රාගස්සාති. තමෙනං සමන්නෙසමානො එවං ජානාති: අභයූපරතො අයමායස්මා, නායමායස්මා භයූපරතො, වීතරාගත්තා කාමෙ න සෙවති ඛයා රාගස්සාති. (6)

1. අයං අයස්මා, සී. 2. ඤාතජ්ඣාපන්නො, ස්‍යා. 3. යසප්පත්තො.

යම් අවස්ථාවක ඔබ සොයනුයේ "ව්‍යතිමිශ්‍ර වූ චක්ෂුඃශ්‍රොත්‍ර විඥෙය වූ යම් ධර්ම කෙනෙක් ඇද්ද, ඔහු තථාගතයන් වහන්සේට නැතැ" යි මෙසේ දන්නේ වේ ද, ඉන්මතුදු ඔබ සොයන්නේ ය. කෙසේ ය: "පරිශුද්ධ වූ චක්ෂුඃශ්‍රොත්‍රවිඥෙය වූ යම් ධර්මකෙනෙක් ඇද්ද' ඔහු තථාගතයන් වහන්සේට වෙද්ද හෝ නො වෙද්ද හෝ, කියා යි. ඔබ සොයාබලනුයේ පරිශුද්ධ වූ චක්ෂුඃශ්‍රොත්‍රවිඥෙය වූ යම් ධර්මකෙනෙක් ඇද්ද, ඔහු තථාගතයන් වහන්සේට ඇතැයි මෙසේ දන්නේ ය. (3)

යම් අවස්ථායෙක ඔබ සොයනුයේ "පරිශුද්ධ වූ චක්ෂුඃශ්‍රොත්‍ර විඥෙය වූ යම් ධර්ම කෙනෙක් ඇද්ද, ඔහු තථාගතයන් වහන්සේට ඇතැ" යි මෙසේ දන්නේ වේ ද, ඉන් මතු දු ඔබ සොයන්නේය. කෙසේ ය; "මේ ආයුෂ්මත් (තථාගත තෙම) දීර්ඝරාත්‍රයෙහි (බොහෝ කලෙක) සිට මේ කුසලදහමට (ආජීවාෂ්ටමක ශීලයට) සමවන්නේ වේ ද නොහොත් ස්වල්ප කලෙක (ඊයේ පෙරදා) සිට සමවන්නේ වේ ද කියා යි. ඔබ සොයනුයේ "මේ ආයුෂ්මත් දීර්ඝ රාත්‍රයෙහි සිට මේ කුසල් දහමට සමවන්නේ ය.. මේ ආයුෂ්මත් මඳකලෙක සිට සමවන්නේ නො වේය" යි මෙසේ දන්නේ ය (4)

යම් අවස්ථායෙක ඔබ ගවේෂණ කරනුයේ "මේ ආයුෂ්මත් දීර්ඝරාත්‍රයෙහි සිට මේ කුසල්දහමට සමවන්නේ ය. මේ ආයුෂ්මත් මඳකලෙක සිට සමවන්නේ නො වේය"යි මෙසේ දන්නේ වේ ද, ඉන් මතුදු ඔබ ගවේෂණ කෙරෙයි. කෙසේය: "මේ ආයුෂ්මත් භික්ෂු (තථාගත) තෙම ප්‍රකටභාවයට පැමිණියේ, පිරිවරසැපත් ලදුයේ වේ ද, (ඒහෙතුවින්) ඔහට මෙහි (මානාතිමානාදි) කිසි ආදීනව ඇද්ද," කියා යි.

"මහණෙනි, යම්තාක් ප්‍රකටභාවයට පැමිණියේ, පරිවාර සම්පත් ලදුයේ නො වේ ද, ඒතාක් මහණහට මෙහි (මානාතිමානාදි) ඇතැම් ආදීනවයෝ නො වෙති. මහණෙනි, යම් අවධියෙක සිට මහණ අභිඥාතභාවයට පැමිණියේ, පරිවාර සම්පත් ලදුයේ වේ ද, එක්බිති ඔහට මෙහි ඇතැම් ආදීනවයෝ ඇති වෙති."

ඔබ (මේ කරුණෙහි ලා) ගවේෂණ කරනුයේ "මේ ආයුෂ්මත් භික්ෂු ප්‍රතීත භාවයට පැමිණියේ, පිරිවරසැපත් ඇතියේ වෙයි. ඔහට මෙහි කිසිදු ආදීනව නැතැ"යි මෙසේ දන්නේ ය. (5)

යම් අවධියෙක ඔබ ගවේෂණ කරනුයේ, "මේ ආයුෂ්මත් භික්ෂු වනාහි ප්‍රසිද්ධියට පැමිණියේ, පරිවාරසම්පත් ඇතියේය (ඒ හෙතුයෙන්) ඔහට මෙහි ඇතැම් ආදීනවයෝ නැතැ"යි මෙසේ දන්නේ වේ ද, ඉන්මතු ද ඔබ ගවේෂණ කෙරෙයි. කෙසේ ය: "මේ ආයුෂ්මත් අභයප්‍රාප්ත ව කාමයෙන් වැළැක්කේ වී ද, මේ ආයුෂ්මත් භයප්‍රාප්ත ව වැළැක්කේ නො වී ද, රාගක්ෂයහෙතුයෙන් වීතරාග බැවින් කාමයන් නො සෙවුනේ වේ ද, කියායි. ඔබ (මෙසේ) සොයනුයේ "මේ ආයුෂ්මත් අභයොපරත වේ. මේ ආයුෂ්මත් භයොපරත නො වේ. මේ ආයුෂ්මත් රාගක්ෂය හෙතුයෙන් වීතරාග බැවින් කාමයන් නො සෙවුනේය"යි මෙසේ දන්නේ ය. (6)

තමෙනං භික්ඛවෙ භික්ඛුං පරෙ එවං පුච්ඡෙය්‍යුං: "කෙ පනායස්මතො ආකාරා කෙ අන්වයා යෙනායස්මා එවං වදෙති:[1] අභයූපරතො අයමායස්මා නායමායස්මා භයූපරතො, වීතරාගත්තා කාමෙ න සෙවති ඛයා රාගස්සා"ති. සම්මා බ්‍යාකරමානො[2] භික්ඛවෙ භික්ඛු එවං බ්‍යාකරෙය්‍ය:[3] තථා හි පන අයමායස්මා සංඝෙ වා විහරන්තො එකො වා විහරන්තො, යෙ ච තත්ථ සුගතා, යෙ ච තත්ථ දුග්ගතා, යෙ ච තත්ථ ගණමනුසාසන්ති, යෙ ච ඉධෙකච්චෙ ආමිසෙසු සන්දිස්සන්ති, යෙ ච ඉධෙකච්චෙ ආමිසෙන අනුපලිත්තා, නායමායස්මා තං තෙන අවජානාති. සම්මුඛා ඛො පන මෙ තං භගවතො සුතං සම්මුඛා පටිග්ගහිතං: "අභයූපරතොහමස්මි, නාහමස්මි භයූපරතො, වීතරාගත්තා කාමෙ න සෙවාමි ඛයා රාගස්සා"ති

4. තත්‍ර භික්ඛවෙ තථාගතොව උත්තරිං පටිපුච්ඡිතබ්බො:

"යෙ සංකිලිට්ඨා චක්ඛුසොතවිඤ්ඤෙය්‍යා ධම්මා, සංවිජ්ජන්ති වා තෙ තථාගතස්ස නො වා"ති. බ්‍යාකරමානො භික්ඛවෙ තථාගතො එවං බ්‍යාකරෙය්‍ය: යෙ සංකිලිට්ඨා චක්ඛුසොතවිඤ්ඤෙය්‍යා ධම්මා න තෙ තථාගතස්ස සංවිජ්ජන්තීති. (1)

"යෙ වීතිමිස්සා චක්ඛුසොතවිඤ්ඤෙය්‍යා ධම්මා, සංවිජ්ජන්ති වා තෙ තථාගතස්ස නො වා'ති. බ්‍යාකරමානො භික්ඛවෙ තථාගතො එවං බ්‍යාකරෙය්‍ය: යෙ වීතිමිස්සා චක්ඛුසොතවිඤ්ඤෙය්‍යා ධම්මා න තෙ තථාගතස්ස සංවිජ්ජන්තීති. (2)

"යෙ වොදාතා චක්ඛුසොතවිඤ්ඤෙය්‍යා ධම්මා, සංවිජ්ජන්ති වා තෙ තථාගතස්ස නො වා"ති. බ්‍යාකරමානො භික්ඛවෙ තථාගතො එවං බ්‍යාකරෙය්‍ය: යෙ වොදාතා චක්ඛුසොතවිඤ්ඤෙය්‍යා ධම්මා, සංවිජ්ජන්ති තෙ තථාගතස්ස, එතපථොහමස්මි[4] එතගොචරො, නො ච තෙන තම්මයොති. (3)

---

1. වදෙසි, සීමු, මජසං. 2. ව්‍යාකරමානො, සී. 3. ව්‍යාකරෙය්‍ය, සී.
4. එතාපථොහමස්මි - ඉතිපි පාඨො, අට්ඨකථා.

මහණෙනි, "මේ ආයුෂ්මත් අභයොපරත වෙයි. මේ ආයුෂ්මත් භයොපරත නො වෙයි. මේ ආයුෂ්මත් රාගක්‍ෂය හෙතුයෙන් කාමයන් නො සෙවුනේය" යි හවත් යම්හෙයකින් මෙසේ බණේ ද, ඒ ආයුෂ්මත්හුගේ තද්කාරයෝ කවරහු, ඒ අනුබුද්ධීහු (ප්‍රමාණ) කවරහ?" යි සෙස්සෝ ඒ විචාරක මහණ අතින් මෙසේ පැන පිළිවිසිත් නම්, මහණෙනි, මනාකොට පිළිතුරු දෙන මහණ මෙසේ පසතුරු දෙන්නේය: එසේ මැය. මේ ආයුෂ්මත් සඟුන් මැද වාස කරන්නේ වේවයි, එකලාව වාස කරන්නේ වේවයි, එහි සුපිළිපන් යම් කෙනෙක් ඇද්ද, එහි දුපිළිපන් යම් කෙනෙක් ඇද්ද, එහි යම් කෙනෙක් (ගණබන්ධන බද්ධ ව) ගණානුශාසනා කෙරෙද්ද, මෙසස්නෙහි යම් කිසි කෙනෙක් ආමිසයෙහි පැතීයෙද්ද, මෙසස්නෙහි යම් කිසි කෙනෙක් ආමිසයෙන් අනුපලිප්ත වෙද්ද, මේ ආයුෂ්මත් ශාස්තෘ තෙමේ එබඳු මහණ ඒ ඒ කරුණින් හෙළා නො දක්නේ ය "මම අභයොපරත යෙමි, මම භයොපරත නො වෙමි රාගක්‍ෂය හෙතුයෙන් වීතරාග වන බැවින් කාමයන් නො සෙවුනෙමි" යි තෙල කරුණ මා විසින් බුදුන් හමියෙහි අසන ලදී, හමියෙහි පිළිගන්නා ලදැ" යි කියා යි.

4 මහණෙනි, ශ්‍රැතිවීමංසකය (සාධන විමසන්නා), මූලවීමංසකය (ශාස්තෘවරයාගෙන් ම අසා විමසන්නා) යන වීමංසකයන් අතුරෙහි මූලවීමංසකයා විසින් තථාගතයන් වහන්සේ ම මතුයෙහි පිළිවිසියයුතු වෙති:

"ක්ලෙශසම්ප්‍රයුක්ත වූ චක්‍ෂුඃශ්‍රොත්‍රවිඥෙය වූ යම් ධර්ම කෙනෙක් ඇද්ද, ඒ ධර්මයෝ තථාගතයන් වහන්සේට ඇද්ද හෝ නැද්ද හෝ" යි කියා යි. මහණෙනි, එය ප්‍රකාශ කරන තථාගතයන් වහන්සේ මෙසේ ප්‍රකාශ කෙරෙති: "ක්ලෙශ සම්ප්‍රයුක්ත වූ චක්‍ෂුඃශොත්‍රවිඥෙය වූ යම් ධර්ම කෙනෙක් ඇද්ද, ඒ ධර්මයෝ තථාගතයන් වහන්සේට නැත" කියා යි. (1)

"ව්‍යතිමිශ්‍ර වූ චක්‍ෂුඃශ්‍රොත්‍රවිඥෙය යම් ධර්ම කෙනෙක් ඇද්ද, ඒ ධර්මයෝ තථාගතයන් වහන්සේට ඇද්ද හෝ නැද්ද හො" යි (මූලවීමංසකයා විසින් තථාගතයන් වහන්සේ පිළිවිසියයුතු වෙති.) මහණෙනි, එය ප්‍රකාශ කරන තථාගතයන් වහන්සේ මෙසේ ප්‍රකාශ කෙරෙති: "ව්‍යතිමිශ්‍ර වූ චක්‍ෂුඃශ්‍රොත්‍රවිඥෙය යම් ධර්ම කෙනෙක් ඇද්ද, ඒ ධර්මයෝ තථාගතයන් වහන්සේට නැත" කියා යි. (2)

,,පරිශුද්ධ වූ චක්‍ෂුඃශ්‍රොත්‍රවිඥෙය යම් ධර්ම කෙනෙක් ඇද්ද, ඒ ධර්මයෝ තථාගතයන් වහන්සේට ඇද්ද හෝ' නැද්ද හෝ" යි (පිළිවියයුතු වෙති.) මහණෙනි, එය ප්‍රකාශ කරන තථාගතයන් වහන්සේ මෙසේ ප්‍රකාශ කෙරෙති: "පරිශුද්ධ වූ චක්‍ෂුඃශොත්‍රවිඥෙය යම් ධර්ම කෙනෙක් ඇද්ද, ඒ ධර්මයෝ තථාගතයන් වහන්සෙට ඇත. මම තෙල (පරිශුද්ධ ආජීවාෂ්ටමක ශීල ධර්මය) පථය කොට (විමසනුවන්ට ජානන මාර්ග කොට) ඇතියෙමි. තෙල ගොදුරු කොට (මා කෙරෙහි විෂය කොට) ඇතියෙමි. ඒ පරිශුද්ධ ශීලය නිසා තෘෂ්ණා සහිතයෙම් ද නො වෙමි." (3)

5. එවංවාදිං ඛො භික්ඛවෙ සත්ථාරං අරහති සාවකො උපසඞ්කමිතුං ධම්මසවණාය. තස්ස සත්ථා ධම්මං දෙසෙති උත්තරුත්තරිං පණීතපණීතං කණ්හසුක්කසප්පටිභාගං. යථා යථා ඛො භික්ඛවෙ භික්ඛුනො සත්ථා ධම්මං දෙසෙති උත්තරුත්තරිං පණීතපණීතං කණ්හසුක්කසප්පටිභාගං, තථා තථා සො තස්මිං ධම්මෙ අභිඤ්ඤාය ඉධෙකච්චං ධම්මං ධම්මෙසු නිට්ඨං ගච්ඡති, සත්ථරි පසීදති: සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො සඞ්ඝොති.

6 තඤ්ච භික්ඛවෙ භික්ඛුං පරෙ එවං පුච්ඡෙය්‍යුං: කෙ පනායස්මතො ආකාරා කෙ අන්වයා යෙනායස්මා එවං වදෙති: සම්මා සම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො සඞ්ඝො'ති. සම්මා බ්‍යාකරමානො භික්ඛවෙ භික්ඛු එවං බ්‍යාකරෙය්‍ය: ඉධාහං ආවුසො යෙන භගවා තෙනුපසඞ්කමිං ධම්මසවණාය. තස්ස මෙ භගවා ධම්මං දෙසෙති උත්තරුත්තරිං පණීතපණීතං කණ්හසුක්කසප්පටිභාගං. යථා යථා මෙ ආවුසො භගවා ධම්මං දෙසෙති උත්තරුත්තරිං පණීතපණීතං කණ්හසුක්කසප්පටිභාගං, තථා තථාහං තස්මිං ධම්මෙ අභිඤ්ඤාය ඉධෙකච්චං ධම්මං ධම්මෙසු නිට්ඨමගමං, සත්ථරි පසීදිං: සම්මා සම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො සඞ්ඝො'ති.

7. යස්ස කස්සචි භික්ඛවෙ ඉමෙහි ආකාරෙහි ඉමෙහි පදෙහි ඉමෙහි බ්‍යඤ්ජනෙහි තථාගතෙ සද්ධා නිවිට්ඨා හොති මූලජාතා පතිට්ඨිතා, අයං වුච්චති භික්ඛවෙ ආකාරවතී සද්ධා දස්සනමූලිකා දළ්හා, අසංහාරියා සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං.

එවං ඛො භික්ඛවෙ තථාගතෙ ධම්මසමන්නෙසනා හොති. එවඤ්ච පන තථාගතො ධම්මතාසුසමන්නිට්ඨො හොතීති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

වීමංසකසුත්තං සත්තමං.

5. මහණෙනි, ශ්‍රාවක තෙම එවංවාදී (මෙසේ බණන) ශාස්තෲන් වහන්සේ කරා ධර්මශ්‍රවණය සඳහා එළඹෙන්නට නිසි වෙයි. ශාස්තෲන් වහන්සේ ඔහට මතුමතුයෙහි (අතිවිශෙෂය වැඩිවැඩියෙන් පැහැදිලි වනසේ) ප්‍රණීත ප්‍රණීත කොට, පාපපුණ්‍යයන් ඔවුනොවුන් විපක්‍ෂ විපාක ඇති බැව් දක්වමින් දහම් දෙසත්. මහණෙනි, ශාස්තෲන් වහන්සේ මහණ-හට යම් යම් පරිද්දෙකින් මතුමතුයෙහි ප්‍රණීතතර කොට කෘෂ්ණ ශුක්ල ධර්ම සප්‍රතිභාග කොට දක්වමින් දහම් දෙසත සේක් ද, ඒ මහණ ඒ ඒ පරිදි දෙසූ ඒ දහමෙහි කිසි ධර්මයක් ප්‍රතිවෙධ වශයෙන් දැන (අභිඥත වූ ඒ ප්‍රතිවෙධ ධර්මයෙන්) දෙශනාධර්මයෙහි (සත්‍යය පිළිබඳ) නිෂ්ඨා-වට යෙයි: "භාග්‍යවත්හු සම්‍යක්සම්බුද්ධයහ"යි ශාස්තෲන් වහන්සේ කෙරෙහි පහදී. "භගවත්හු විසින් ධර්මය ස්වාඛ්‍යාතය, සඞ්ඝයා සුපිළි-පන්න"යි පහදී.

6. මහණෙනි, "භගවත්හු සම්‍යක්සම්බුද්ධයහ, භගවත්හු විසින් ධර්මය ස්වාඛ්‍යාතය, සඞ්ඝයා සුපිළිපන්න යි යම් හෙයෙකින් ආයුෂ්මත් මෙසේ බෙණේ ද, ආයුෂ්මත්හුගේ එයට සාධනයෝ කවරයහ, එයට අනුබුද්ධීහු (ප්‍රමාණ) කවරහ?"යි පරනු ඒ මහණ මෙසේ පුළුවුසිත් නම්, මහණෙනි, මොනොවට ප්‍රකාශ කරන මහණ මෙසේ පවසන්නේය: "ඇවැත්නි, මම ධර්මශ්‍රවණය පිණිස භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියෙමි. භාග්‍යවතුන් වහන්සේ මට මතු මතුයෙහි ප්‍රණීතතර කොට ශුක්ල කෘෂ්ණ ධර්ම සප්‍රතිභාග කොට දහම් දෙසති. ඇවැත්නි, යම් පරිදි භාග්‍යවතුන් වහන්සේ මට මතු මතුයෙහි ප්‍රණීතතර කොට පව්පින් ප්‍රතිපක්‍ෂ විපාක ඇතියවුන් කොට දහම් දෙසත් ද එපරිදි මම ඒ දහමෙහි කිසි දහමක් ප්‍රතිවෙධ විසින් දැන දෙශනා ධර්මයෙහි නිෂ්ඨාවට ගියෙමි: භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධයහයි ඔබ කෙරෙහි පැහැදිණිමි. භාග්‍යවතුන් විසින් ධර්මය ස්වාඛ්‍යාතය, (භාග්‍යවත්හුගේ ශ්‍රාවක) සඞ්ඝයා සුපිළිපන්නහයි පැහැදිණිමි.

7. මහණෙනි, යම්කිසිවක්හට මෙ අයුරින් මේ පෙදෙන් මෙ ව්‍යඤ්ජනයෙන් තථාගතයන් වහන්සේ කෙරෙහි සැදැහැ පිහිටියේ වේ ද, (ශ්‍රොතාපත්ති මාර්ගයෙන් හටගත්මුල් ඇති වේ ද,) මහණෙනි, මේ සකාරණ (ප්‍රතිවෙධ සහිත) ශ්‍රද්ධාව දර්ශන (ශ්‍රොතාපත්තිමාර්ග) මූලිකය, දෘඪය. මහණකු විසින් වේවයි, බමුණකු විසින් වේවයි, දෙවියකු විසින් වේවයි, මරහු විසින් වේවයි, බඹහු විසින් වේවයි, ලොව අන් කිසිවකු විසින් වේවයි, හැරලිය නො හෙයි.

මහණෙනි, මෙසේ තථාගතයන් කෙරෙහි ධම්මසමන්නෙසනා (ස්වභාව සමන්වෙෂණ) වෙයි. මෙසේ තථාගතයන් වහන්සේ ධර්මතායෙන් (ඇතිසැටියෙන්) සමන්නෙසනා කරනලද වෙති.

භාග්‍යවතුන් වහන්සේ මේ (බුද්ධසීහනාද නම් වන) සූත්‍රාන්තය වදාළහ. සතුටු සිත් ඇති ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය මැනැවින් පිළිගත්හ.

වීමංසකසූත්‍රය සත්වැනියි.

1. 5. 8.

කොසම්බියසුත්තං

1 එවං මෙ සුතං: එකං සමයං භගවා කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. තෙන ඛො සමයෙන කොසම්බියං භික්ඛූ භණ්ඩනජාතා කලහජාතා විවාදපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති. තෙ න චෙව අඤ්ඤමඤ්ඤා සඤ්ඤාපෙන්ති, න ච සඤ්ඤත්තිං උපෙන්ති, න ච අඤ්ඤමඤ්ඤං නිජ්ඣාපෙන්ති, න ච නිජ්ඣත්තිං උපෙන්ති.

2. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: ඉධ භන්තෙ කොසම්බියං භික්ඛූ භණ්ඩනජාතා කලහජාතා විවාදපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති. තෙ න චෙව අඤ්ඤමඤ්ඤං සඤ්ඤාපෙන්ති, න ච සඤ්ඤත්තිං උපෙන්ති, න ච අඤ්ඤමඤ්ඤං නිජ්ඣාපෙන්ති, න ච නිජ්ඣත්තිං උපෙන්තීති.

3. අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි: එහි ත්වං භික්ඛු මම වචනෙන තෙ භික්ඛූ ආමන්තෙහි 'සත්ථා ආයස්මන්තෙ ආමන්තෙතී'ති. එවම්භන්තෙති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: සත්ථා ආයස්මන්තෙ ආමන්තෙතීති. එවමාවුසොති ඛො තෙ භික්ඛූ තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො තෙ භික්ඛූ භගවා එතදවොච: සච්චං කිර තුම්හෙ භික්ඛවෙ භණ්ඩනජාතා කලහජාතා විවාදපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරථ, තෙ න චෙව අඤ්ඤමඤ්ඤං සඤ්ඤාපෙථ, න ච සඤ්ඤත්තිං උපෙථ, න ච අඤ්ඤමඤ්ඤං නිජ්ඣාපෙථ, න ච නිජ්ඣත්තිං උපෙථාති. 'එවම්භන්තෙ.'

4. තං කිං මඤ්ඤථ භික්ඛවෙ: යස්මිං තුම්හෙ සමයෙ භණ්ඩනජාතා කලහජාතා විවාදපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරථ, අපි නු තුම්හාකං තස්මිං සමයෙ මෙත්තං කායකම්මං පච්චුපට්ඨිතං හොති සබ්රහ්මචාරීසු ආවි චෙව රහො ච, මෙත්තං වචීකම්මං පච්චුපට්ඨිතං හොති සබ්රහ්මචාරීසු ආවි චෙව රහො ච, මෙත්තං මනොකම්මං පච්චුපට්ඨිතං හොති සබ්රහ්මචාරීසු ආවි චෙව රහො චාති. 'නො හෙතම්භන්තෙ'.

Free Distribution www.aathaapi.org

1. 5. 8.

කොසම්බිය සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක්සමයෙක්හි භගවත්හු කොසැඹෑ නුවර ඝොසසිටුහු කළ ඝොසිතාරාමයෙහි වැඩවාස කෙරෙති. එසමයෙහි කොසැඹෑයෙහි භික්ෂූහු හටගත් කලහපූර්වභාග සටන් ඇතියෝ, හටගත් (හස්තපරාමර්ශ-පාත්‍රචීවරනීහරණාදි) කලහ ඇතියෝ, පැමිණි විරුද්ධවාද ඇතියෝ, උනුන් තෙපුල් සැතින් විදුනාහු වාස කෙරෙති. ඔහු (අර්ථ හා කාරණ හා දක්වා) උනුන් නො ම හඟවත්. (ඉදින් හඟවන්නට නිසි වුව ද) සංඥප්තියට (හඟනට) නො එළඹෙති. (දන්නට නො කැමැති වෙති.) උනුන් නො ම සිතවත්. සිතීමට නො එළඹෙති.

2. එක්බිති අන්‍යතර (තොපාල) මහණෙක් භගවත්හු කරා එළඹිණ. එළඹ භගවත්හු සකසා වැද එකත්පස් ව හින. එකත් පස් ව හුන් ඒ මහණ භගවත් හට තෙල සැළකෙළේ: "වහන්ස, කොසැඹෑ නුවර නිවැසි භික්ෂූහු උපන් ඔබර ඇත්තාහු, (හස්තපරාමර්ශාදි විසින්) උපන් මුදුන්පත් කලහ ඇත්තාහු, විරුද්ධවාදයට ගියාහු, උනුන් මුව සැතින් විදුනාහු වාස කෙරෙති. ඔහු උනුන් නො ම හඟවත්. සංඥප්තියට නො වැටෙති. උනුන් නොම සිතවති. සිතීමට නො වැටෙති" කියායි.

3. එසඳ භගවත්හු එක්තරා මහණකු ඇමැතූසේක. "මහණ, තො එව 'ශාස්තෘන් වහන්සේ ආවුසුන් අමතන සේකැ'යි මා බසින් ඒ භික්ෂූන් අමතුව" යි වදාළෝ. 'වහන්ස, එසේයැ' යි ඒ මහණ භගවත්හට පිළිවදන් දී ඒ මහණුන් කරා එළඹියේය. එළඹ ඒ මහණුන්හට තෙල කී: "ශාස්තෘන් වහන්සේ ආයුෂ්මතුන් අමතන සේකැ" යි. 'ඇවත එසේ යැ' යි ඒ මහණහු ඒ මහණහට පිළිවදන් දී භගවත්හු කරා එළඹියහ. එළඹ භගවත්හු සකසා වැද එකත්පස් ව හුන්හු. එකත්පස් ව හුන් ඒ මහණුන්ට භගවත්හු තෙල බස් වදාළසේක: "සැබැව? මහණෙනි' තෙපි උපන් ඔබර ඇති ව උපන් මුදුන්පත් කලහ ඇති ව විවාදපන්න ව අන්‍යෝන්‍යයන් මුවඅඩයටියෙන් විදුනහු වාස කරව? තෙපි උනුන් නොම හඟවනු ව? හඟනට නොයන්නාව? උනුන් නොම සිතවන්නාව? සිතන්නට නො යන්නාව?"යි. 'වහන්ස, එසේ ය'යි සැළ කළෝ.

4. මහණෙනි, ඒ කිසේ හඟනාව? තෙපි යම් දවසෙක උපන් කලහාරම්භ ඇති ව උපන් කලහ ඇතිව අවත් විරුද්ධවාද ඇති ව උනුන් මුවතෙබින් විදුනහු වාස කරහු නම්, එදවස් තොප තුළ සබ්‍රම්සරුන් කෙරෙහි හමුවෙහිත් නොහමුවෙහිත් මෙත්සහගිය කායකම් එළවිණි ද, සබ්‍රම්සරුන් කෙරෙහි හමුවෙහිත් නො හමුවෙහිත් මෙත් සහගිය වාක්කම් එළවිණි ද, සබ්‍රම්සරුන් කෙරෙහි හමුවෙහිත් නොහමුවෙහිත් මෙත්සහගිය මනඃකම් එළවිණි දැයි පුළුවුත්සේක. "වහන්ස, තෙල නො වේ මයැ" යි පිළිවදන් දුන්හු

Free Distribution www.aathaapi.org

ඉති කිර භික්ඛවෙ යස්මිං තුම්හෙ සමයෙ භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරථ, නෙව තුම්හාකං තස්මිං සමයෙ මෙත්තං කායකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච. න මෙත්තං වචීකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච. න මෙත්තං මනොකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච. අථ කිං චරහි තුම්හෙ මොඝපුරිසා කිං ජානන්තා කිං පස්සන්තා භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරථ, තෙ න චෙව අඤ්ඤමඤ්ඤං සඤ්ඤාපෙථ, න ච සඤ්ඤත්තිං උපෙථ, න ච අඤ්ඤමඤ්ඤං නිජ්ඣාපෙථ, න ච නිජ්ඣත්තිං උපෙථ. තං හි තුම්හාකං මොඝපුරිසා භවිස්සති දීඝරත්තං අහිතාය දුක්ඛායාති.

5. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: ඡයිමෙ භික්ඛවෙ ධම්මා සාරාණීයා පියකරණා ගරුකරණා සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තන්ති. කතමෙ ඡ?

ඉධ භික්ඛවෙ භික්ඛුනො මෙත්තං කායකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති. (1)

පුන ච පරං භික්ඛවෙ භික්ඛුනො මෙත්තං වචීකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති. (2)

පුන ච පරං භික්ඛවෙ භික්ඛුනො මෙත්තං මනොකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති. (3)

පුන ච පරං භික්ඛවෙ භික්ඛු යෙ තෙ ලාභා ධම්මිකා ධම්මලද්ධා අන්තමසො පත්තපරියාපන්නමත්තම්පි, තථාරූපෙහි ලාභෙහි අප්පටිවිභත්තභොගී හොති සීලවන්තෙහි සබ්‍රහ්මචාරීහි සාධාරණභොගී. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති. (4)

“මහණෙනි, මෙසෙසිත් තෙපි යම් දිනෙක භණ්ඩනජාත ව කලහජාත ව විවාදාපන්න ව අන්‍යෝන්‍යයන් මුවසැතිත් විදුමින් වාස කරවු නම්, එදින තොප තුල සබ්‍රහ්මසරුන් කෙරෙහි හමුයෙහිදු නො හමුයෙහිදු මෛත්‍රීමය කායකර්ම නො ම එලඹිණ. සබ්‍රහ්මසරුන් කෙරෙහි හමුයෙහිදු නොහමුයෙහිදු මෛත්‍රීමය වාක්කර්ම නො එලඹිණ. සබ්‍රහ්මසරුන් කෙරෙහි හමුයෙහිදු නොහමුයෙහිදු මෛත්‍රීමය මනඃකර්ම නො එලඹිණ. කිමෙක, මොඝපුරුෂයෙනි, එබැවින් තෙපි කුමක් දන්මින් කුමක් දක්මින් භණ්ඩන ජාත ව කලහජාත ව විවාදාපන්න ව උනුන් මුව සැතින් විදුමින් වාස කරන්නාවු? තෙපි උනුන් නො ම හඟවන්නාවු? හඟනට නො එන්නාවු? උනුන් නො ම සිතවන්නාවු? සිතන්නට නො එන්නාවු? මොඝපුරුෂයෙනි, එකරුණ තොපට දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වේ යයි වදාලෝ.

5. එක්බිති භගවත්හු මහණුන් ඇමතූසේක. මහණෙනි, සිහිකට යුතු, (සබ්‍රහ්මසරුන්ට) ප්‍රිය කරන, ගරු කරන මේ දහම්හු සදෙනෙක් සඞ්ග්‍රහ පිණිස අවිවාද පිණිස සමග්‍රභාව පිණිස එකීභාව පිණිස වැටෙති. කවර සදෙනෙක යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණක්හට සබ්‍රහ්මසරුන් කෙරෙහි හමු-යෙහිදු නොහමුයෙහිදු මෙත්සිතින් කලයුතු කායකර්ම එලඹසිටියේ වේ ද, සිහිකල යුතු ප්‍රිය කරන ගරු කරන මේ දහම ද සඞ්ග්‍රහ පිණිස අවිවාද පිණිස සමග්‍රභාව පිණිස එකීභාව පිණිස වැටෙත්තේ ය. (1)

තවද මහණෙනි, ඉන් මතුදු, මහණක්හට සබ්‍රහ්මසරුන් කෙරෙහි හමුයෙහි දු නොහමුයෙහි දු මෙත්සිතින් කලයුතු වාක්කර්ම එලඹ සිටියේ වේ ද, සිහිකලයුතු ප්‍රිය කරන ගරු කරන මේ දහම ද සඞ්ග්‍රහ පිණිස අවිවාද පිණිස සමග්‍රභාව පිණිස එකීභාව පිණිස වැටෙත්තේ ය. (2)

තවද මහණෙනි, ඉන් මතුදු, මහණක්හට සබ්‍රහ්මසරුන් කෙරෙහි හමුයෙහිදු නොහමුයෙහිදු මෙත්සිතින් කලයුතු මනඃකර්ම එලඹසිටියේ වේ ද, සිහිකලයුතු ප්‍රිය කරන ගරුකරන මේ දහම ද සඞ්ග්‍රහ පිණිස අවිවාද පිණිස සමග්‍රභාව පිණිස එකීභාව පිණිස වැටෙත්තේ ය. (3)

තවද මහණෙනි, ඉන් මතුදු, මහණෙක් යටතින් පාත්‍රපර්‍ය්‍යාපන්නමාත්‍ර වේවයි, දැහැමි වූ දැහැමින් ලත් යම් ලාභ කෙනෙක් ඇද්ද, එවත් ලාභයන් (ආමිෂ විසින් වේවයි, පුද්ගල විසින් වේවයි) ප්‍රතිවිභක්ත නො කොට (මෙ පමණක් දෙමි, මෙ පමණක් නො දෙමි, අසුවල් තැනට දෙමි, අසුවල් තැනට නො දෙමි යි මෙසේ සිතින් නොබෙදා) වලඳ කරනසුලු වේ ද, සිල්වතුන් හා සබ්‍රහ්මසරුන් හා සාධාරණ කොට වලඳ කරනසුලු වේ ද, සිහිකලයුතු ප්‍රිය කරන ගරු කරන මේ දහම ද සඞ්ග්‍රහ පිණිස අවිවාද පිණිස සමග්‍රභාව පිණිස එකීභාව පිණිස වැටෙත්තේ ය. (4)

පුන ච පරං භික්ඛවෙ භික්ඛු යානි තානි සීලානි අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤූප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි, තථාරූපෙසු සීලෙසු සීලසාමඤ්ඤගතො විහරති සබ්‍රහ්මචාරීහි ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති. (5)

පුන ච පරං භික්ඛවෙ භික්ඛු යායං දිට්ඨි අරියා නිය්‍යානිකා නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයාය, තථාරූපාය දිට්ඨියා දිට්ඨිසාමඤ්ඤගතො විහරති සබ්‍රහ්මචාරීහි ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති. (6)

ඉමෙ ඛො භික්ඛවෙ ඡ සාරාණීයා ධම්මා පියකරණා ගරුකරණා සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තන්ති.

ඉමෙසං ඛො භික්ඛවෙ ඡන්නං සාරාණීයානං ධම්මානං එතං අග්ගං එතං සඞ්ගාහිකං එතං සංඝාතනිකං යදිදං යායං දිට්ඨි අරියා නිය්‍යානිකා නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයාය. සෙය්‍යථාපි භික්ඛවෙ කූටාගාරස්ස එතං අග්ගං එතං සඞ්ගාහිකං එතං සංඝාතනිකං යදිදං කූටං, එවමෙව ඛො භික්ඛවෙ ඉමෙසං ඡන්නං සාරාණීයානං ධම්මානං එතං අග්ගං එතං සඞ්ගාහිකං එතං සංඝාතනිකං යදිදං යායං දිට්ඨි අරියා නිය්‍යානිකා නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයාය.

6. කථඤ්ච භික්ඛවෙ යායං දිට්ඨි අරියා නිය්‍යානිකා නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයාය?

ඉධ භික්ඛවෙ භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසඤ්චික්ඛති: අත්ථි නු ඛො මෙ තං පරියුට්ඨානං අජ්ඣත්තං අප්පහීනං යෙනාහං පරියුට්ඨානෙන පරියුට්ඨිතචිත්තො යථාභූතං න ජානෙය්‍යං න පස්සෙය්‍යන්ති.

තවද මහණෙනි, ඉන් මතුදු, මහණෙක් අඛණ්ඩ අච්ඡිද්‍ර, අශබල, අකල්මාෂ, භුජිෂ්‍ය, විඥාතුන් විසින් ප්‍රශස්ත, තෘෂ්ණා දෘෂ්ටි විසින් අපරාමෘෂ්ට, සමාධිසංවර්තනික යම් සිල් ඇද්ද, එබඳු ශීලයෙහි ලා සබ්‍රහ්මචාරීන් හා හමුයෙහිදු නොහමුයෙහිදු ශීලයෙන් සමාන භාවයට ගියේ වාස කෙරේ ද, සිහිකළ යුතු ප්‍රිය කරන ගරු කරන මේ දහම ද සඞ්ග්‍රහ පිණිස අවිවාද පිණිස සමග්‍රභාව පිණිස එකීභාව පිණිස වැටෙත්තේ ය. (5)

තවද මහණෙනි, ඉන් මතුදු, නිර්දෝෂ වූ නෛර්යාණික වූ එය පිළිපදනහු මොනොවට දුඃඛක්ෂය පිණිස පමුණුවන යම් (මාර්ගසම්ප්‍රයුක්ත) සම්‍යක් දෘෂ්ටියෙක් ඇද්ද, එබඳු දෘෂ්ටියෙන් සබ්‍රහ්මචාරීන් හා හමුයෙහිදු නොහමුයෙහිදු සමානදෘෂ්ටිභාවයට ගියේ වේ ද, සිහිකළ යුතු ප්‍රිය කරන ගරු කරන මේ දහම ද සඞ්ග්‍රහ පිණිස අවිවාද පිණිස සමග්‍රභාව පිණිස එකීභාව පිණිස වැටෙත්තේ ය. (6)

මහණෙනි, ප්‍රිය කරන ගරු කරන මේ සාරණීය ධර්මයෝ සදෙන සඞ්ග්‍රහ පිණිස අවිවාද පිණිස සමග්‍රභාව පිණිස එකීභාව පිණිස වැටෙත්.

මහණෙනි, මේ සරණීය ධර්මයන් සදෙනා අතුරෙහි නිර්දෝෂ වූ නෛර්යාණික වූ එය කරනහු මනාකොට දුඃඛක්ෂය පිණිස ගෙන යන යම් දෘෂ්ටියෙක් ඇද්ද, තෙල අග්‍ර වෙයි. තෙල සාඞ්ග්‍රාහික වෙයි. තෙල හැම ගලපනු වෙයි. මහණෙනි, යම් පරිදි කූටාගාරයාගේ කූටයෙක් (කැණිමඬලෙක්) ඇද්ද, තෙල කූටය අග්‍ර වේ ද, තෙල සාඞ්ග්‍රාහික වේ ද, තෙල හැම ගොනැස් ගලපනු වේ ද, මහණෙනි, එපරිදි ම මේ සවැදෑරුම් සාරණීය ධර්මයන් අතුරෙහි නිර්දෝෂ, නෛර්යාණික, එය කරනහු මැනැවින් දුඃඛක්ෂය පිණිස පමුණුවන යම් දෘෂ්ටියෙක් ඇද්ද, තෙල අග්‍ර වෙයි. තෙල සාඞ්ග්‍රාහික වෙයි. තෙල හැම මුළුලූ කරනු වෙයි.

6. මහණෙනි, නිර්දෝෂ වූ, නෛර්යාණික වූ, පිළිපදනහු මොනොවට දුඃඛක්ෂයට එලවන යම් ශ්‍රොතාපත්තිමාර්ග දෘෂ්ටියෙක් ඇද්ද, ඒ දෘෂ්ටිය කෙසේ ඔහු දුඃඛක්ෂය කරා ගෙන යේ ද?

මහණෙනි, මෙසස්නෙහි මහණ අරණ්‍යගත වූයේ වේවයි, වෘක්ෂමූලගත වූයේ වේවයි, ශූන්‍යාගාරගත වූයේ වේවයි මෙසේසිත් සලකන්නේ ය: මම යම් පර්‍යවුත්ථානයෙකින් (කෙලෙසුන්ගේ නැගී සිටීමකින්) මැඩුණු සිතැති ව යථාභූතය නො දන්නෙම් නම්, නො දක්නෙම් නම්, මා සතන්හි නො පුහුත් ඒ පර්‍යවුත්ථාන ඇද්ද හෝ කියායි.

"සචෙ භික්ඛවෙ භික්ඛු කාමරාගපරියුට්ඨිතො හොති, පරියුට්ඨිතචිත්තොව හොති. සචෙ භික්ඛවෙ භික්ඛු බ්‍යාපාදපරියුට්ඨිතො හොති, පරියුට්ඨිතචිත්තොව හොති. සචෙ භික්ඛවෙ භික්ඛු ථීනමිද්ධපරියුට්ඨිතො හොති, පරියුට්ඨිතචිත්තොව හොති. සචෙ භික්ඛවෙ භික්ඛු උද්ධච්චකුක්කුච්චපරියුට්ඨිතො හොති, පරියුට්ඨිතචිත්තොව හොති. සචෙ භික්ඛවෙ භික්ඛු විචිකිච්ඡාපරියුට්ඨිතො හොති, පරියුට්ඨිතචිත්තොව හොති. සචෙ භික්ඛවෙ භික්ඛු ඉධලොකචින්තාය පසුතො හොති, පරියුට්ඨිත චිත්තොව හොති. සචෙ භික්ඛවෙ භික්ඛු පරලොකචින්තාය පසුතො හොති, පරියුට්ඨිතචිත්තොව හොති. සචෙ භික්ඛවෙ භික්ඛු භණ්ඩනජාතො කලහජාතො විවාදාපන්නො අඤ්ඤමඤ්ඤං[1] මුඛසත්තීහි විතුදන්තො විහරති, පරියුට්ඨිතචිත්තොව හොති."

සො එවං පජානාති: නත්ථි ඛො මෙ තං පරියුට්ඨානං අජ්ඣත්තං අප්පහීනං යෙනාහං පරියුට්ඨානෙන පරියුට්ඨිතචිත්තො යථාභූතං න ජානෙය්‍යං න පස්සෙය්‍යං. සුප්පණිහිතං මෙ මානසං සච්චානං බොධායාති. ඉදමස්ස පඨමං ඤාණං අධිගතං හොති අරියං ලොකුත්තරං ආසාධාරණං පුථුජ්ජනෙහි. (1)

7. පුන ච පරං භික්ඛවෙ අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: ඉමං නු ඛො අහං දිට්ඨිං ආසෙවන්තො භාවෙන්තො බහුලීකරොන්තො ලභාමි පච්චත්තං සමථං, ලභාමි පච්චත්තං නිබ්බුතින්ති. සො එවං පජානාති: ඉමං ඛො අහං දිට්ඨිං ආසෙවන්තො භාවෙන්තො බහුලීකරොන්තො ලභාමි පච්චත්තං සමථං, ලභාමි පච්චත්තං නිබ්බුතින්ති. ඉදමස්ස දුතියං ඤාණං අධිගතං හොති අරියං ලොකුත්තරං අසාධාරණං පුථුජ්ජනෙහි. (2)

8. පුන ච පරං භික්ඛවෙ අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යථා රූපායාහං දිට්ඨියා සමන්නාගතො, අත්ථි නු ඛො ඉතො බහිද්ධා අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා තථාරූපාය දිට්ඨියා සමන්නාගතොති. සො එවං පජානාති: යථාරූපායාහං දිට්ඨියා සමන්නාගතො, නත්ථි ඉතො බහිද්ධා අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා තථාරූපාය දිට්ඨියා සමන්නාගතොති. ඉදමස්ස තතියං ඤාණං අධිගතං හොති අරියං ලොකුත්තරං අසාධාරණං පුථුජ්ජනෙහි. (3)

---

1. 'අඤ්ඤමඤ්ඤං' ඉති සීමු පොත්ථකෙ ඌනං.

"මහණෙනි, ඉදින් මහණ කාමරාගයා විසින් මඩනා ලද්දේ වේද, එයින් ම මැඩුණු සිතැතියේ වේ. මහණෙනි, ඉදින් මහණ ව්‍යාපාදයා විසින් මඩනා ලද්දේ වේද, එයින් ම මැඩුණු සිතැතියේ වේ. මහණෙනි, ඉදින් මහණ ථිනමිද්ධයා විසින් මඩනා ලද්දේ වේද, එයින් ම මැඩුණු සිතැතියේ වේ. මහණෙනි, ඉදින් මහණ උද්ධච්චකුක්කුච්චයා විසින් මඩනා ලද්දේ වේද, එයින් ම මැඩුණු සිතැතියේ වේ. මහණෙනි, ඉදින් මහණ විචිකිච්ඡා විසින් මඩනා ලද්දේ වේද, එයින්ම මැඩුණු සිතැතියේ වේ. මහණෙනි, ඉදින් මහණ ඉධලොකචින්තායෙහි යුතුපතු වේද, එයින් ම මැඩුණු සිතැතියේ වේ. මහණෙනි, ඉදින් මහණ පරලොකචින්තායෙහි යුතුපතු වේද, එයින් ම මැඩුණු සිතැතියේ වේ. මහණෙනි, ඉදින් මහණ භණ්ඩනජාත ව කලහජාත ව විවාදපන්න ව උනුන් මුව හැතින් විදුමින් වාස කරනුයේ වේද, එයින් ම මැඩුණු සිතැතියේ වේ."

ඒ මහණ මෙසෙයින් දන්නේය: "මම සියසතන්හි අප්‍රහීණ වූ යම් පර්‍යුත්ථානයෙකින් මැඩුණු සිතැති ව සත්‍යය නොදන්නෙම් වේ ද, නොදක්නෙම් වේ ද, ඒ පර්‍යුත්ථානය මට නැත. සත්‍යාවබොධය පිණිස මා විසින් සිත මැනැවින් තැබිණ" කියායි. ඒ මහණ විසින් ආර්‍යයන් කෙරෙහි වූ, ලොකොත්තර වූ, පුහුදුන් හා අසාධාරණ වූ මේ ප්‍රථම (ප්‍රත්‍යවෙක්ෂා) ඥානය අධිගත (ලබන ලද්දේ) වෙයි. (1)

7. තවද මහණෙනි, ඉත් මතුදු, ආර්‍යශ්‍රාවක මෙසේ සලකන්නේ ය: "මම මේ මාර්ග දෘෂ්ටිය සෙවුනෙම්, වඩන්නෙම් බහුල කරන්නෙම් තමා තුල එකාග්‍රතා ලබම් දෝ හෝ, තමා තුල කෙලශව්‍යපශම ලබම් දෝ හෝ" කියායි. ඒ මහණ මෙසේ දන්නේ ය: "මම මේ දෘෂ්ටිය සෙවුනෙම්, වඩන්නෙම්, බහුල කරන්නෙම් තමා තුල එකාග්‍රතා ලබමි. තමා තුල නිර්වෘතිය (නිවීම) ලබමි" කියායි ඒ මහණ විසින් ආර්‍ය වූ, ලොකොත්තරවූ, පුහුදුන් හා අසාධාරණ වූ මේ ද්විතීය ඥානය අධිගත වෙයි. (2)

8. තවද මහණෙනි, ඉත් මතුදු, ආර්‍යශ්‍රාවක මෙසේ සලකන්නේ ය: "මම යම්බඳු ශ්‍රොතාපත්තිමාර්ගදෘෂ්ටියෙකින් සමන්‍වාගතයෙම් ද, මෙසස්නෙන් බැහැර එබඳු දෘෂ්ටීන් සමන්‍වාගත අන් මහණෙක් හෝ බමුණෙක් හෝ ඇද්ද?" කියායි. ඒ මහණ මෙසේ දන්නේය: "මම යම් බඳු දෘෂ්ටීන් සමන්‍වාගතයෙම් ද, මෙසස්නෙන් බැහැර එබඳු දෘෂ්ටීන් සමන්‍වාගත අන් මහණෙක් හෝ බමුණෙක් හෝ නැත කියායි." ඒ මහණ විසින් ආර්‍ය වූ, ලොකොත්තර වූ, පෘථග්ජනයන් හා අසාධරණ වූ මේ තෘතීය ඥානය අධිගත වෙයි (3)

9 පුන ච පරං භික්ඛවෙ අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යථාරූපාය ධම්මතාය දිට්ඨිසම්පන්නො පුග්ගලො සමන්නාගතො, අහම්පි තථාරූපාය ධම්මතාය සමන්නාගතොති.

"කථංරූපාය ච භික්ඛවෙ ධම්මතාය දිට්ඨිසම්පන්නො පුග්ගලො සමන්නාගතො? ධම්මතා එසා භික්ඛවෙ දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස: කිඤ්චාපි තථාරූපිං ආපත්තිං[1] ආපජ්ජති යථාරූපාය ආපත්තියා උට්ඨානං[2] පඤ්ඤායති, අථ ඛො ඛිප්පමෙව සත්ථරි වා විඤ්ඤූසු වා සබ්‍රහ්මචාරීසු දෙසෙති විවරති උත්තානී[3]කරොති. දෙසෙත්වා විවරිත්වා උත්තානී කරිත්වා[4] ආයතිං සංවරං ආපජ්ජති. සෙය්‍යථාපි භික්ඛවෙ දහරො කුමාරො මන්දො උත්තානසෙය්‍යකො හත්ථෙන වා පාදෙන වා අඞ්ගාරං අක්කමිත්වා ඛිප්පමෙව පටිසංහරති, එවමෙව ඛො භික්ඛවෙ ධම්මතා එසා දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස: කිඤ්චාපි තථාරූපිං ආපත්තිං[1] ආපජ්ජති යථාරූපාය ආපත්තියා උට්ඨානං[2] පඤ්ඤායති, අථ ඛො තං ඛිප්පමෙව සත්ථරි වා විඤ්ඤූසු වා සබ්‍රහ්මචාරීසු දෙසෙති විවරති උත්තානී[3]කරොති. දෙසෙත්වා විවරිත්වා උත්තානී කරිත්වා[4] ආයතිං සංවරං ආපජ්ජති."

සො එවං පජානාති: යථාරූපාය ධම්මතාය දිට්ඨිසම්පන්නො පුග්ගලො සමන්නාගතො, අහම්පි තථාරූපාය ධම්මතාය සමන්නාගතොති. ඉදමස්ස චතුත්ථං ඤාණං අධිගතං හොති අරියං ලොකුත්තරං අසාධාරණං පුථුජ්ජනෙහි. (4)

10. පුන ච පරං භික්ඛවෙ අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යථාරූපාය ධම්මතාය දිට්ඨිසම්පන්නො පුග්ගලො සමන්නාගතො, අහම්පි තථාරූපාය ධම්මතාය සමන්නාගතොති.

"කථංරූපාය ච භික්ඛවෙ ධම්මතාය දිට්ඨිසම්පන්නො පුග්ගලො සමන්නාගතො? ධම්මතා එසා භික්ඛවෙ දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස: කිඤ්චාපි යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිඞ්කරණීයානි, තත්ථ උස්සුක්කං ආපන්නො[5] හොති. අථ ඛ්වාස්ස[6] තිබ්බාපෙක්ඛා[7] හොති අධිසීලසික්ඛාය අධිචිත්තසික්ඛාය අධිපඤ්ඤාසික්ඛාය. සෙය්‍යථාපි භික්ඛවෙ ගාවී තරුණවච්ඡා ථම්බඤ්ච[8] ආලුම්පති[9] වච්ඡකඤ්ච අපවීනති,[10] එවමෙව ඛො භික්ඛවෙ ධම්මතා එසා දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස: කිඤ්චාපි යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිඞ්කරණීයානි තත්ථ උස්සුක්කං ආපන්නො හොති. අථ ඛ්වාස්ස තිබ්බාපෙක්ඛා හොති අධිසීලසික්ඛාය අධිචිත්තසික්ඛාය අධිපඤ්ඤාසික්ඛාය."

සො එවං පජානාති: යථාරූපාය ධම්මතාය දිට්ඨිසම්පන්නො පුග්ගලො සමන්නාගතො, අහම්පි තථාරූපාය ධම්මතාය සමන්නාගතොති. ඉදමස්ස පඤ්චමං ඤාණං අධිගතං හොති අරියං ලොකුත්තරං අසාධාරණං පුථුජ්ජනෙහි. (5)

---

1. තථාරූපිආපත්තිං, සී කත්ථචි 2 වුට්ඨානං සී 3. උත්තානිං, මජසං
4. උත්තානිං කත්වා, මජසං, උත්තානී කත්වා, සං, PTS. උත්තානිං කත්වා, සී
5 උස්සුක්කමාපන්නො, මජසං. 6. අථඛ්වස්ස, සං 7. තිබ්බාපෙඛා, සී කත්ථචි.
8 දබ්බඤ්ච, මජසං.
9 ආලුප්පති, සං 10 අපචිනති, මජසං සං, අපවිණායි, සී කත්ථචි

9. තවද මහණෙනි, ඉන් මතුදු, ආර්‍ය්‍යශ්‍රාවක මෙසේ සලකන්නේය: දෘෂ්ටිසම්පන්නපුද්ගල යම්බඳු ස්වභාවයෙකින් සමන්වාගත වේ ද, මම ද එබඳු ස්වභාවයෙකින් සමන්වාගතයෙම් වේ දෝ හෝ කියායි.

"මහණෙනි, කෙබඳු ධර්මතාවයෙකින් දෘෂ්ටිසම්පන්න පුද්ගල සමන්වාගත වේ ද යත්: මහණෙනි, දෘෂ්ටිසම්පන්න පුද්ගලයාගේ තෙල ධර්මතා වෙයි: යම් බඳු ආපත්තියෙකින් (සඞ්ඝකර්ම විසින් වේවයි, දේශනා විසින් වේවයි) ව්‍යුත්ථානය (ඇවැතින් නැගී සිටීම) පැනේ ද, එබඳු ඇවැතක් අවන් නමුදු, වහාම ශාස්තෘන් වහන්සේ කෙරෙහි වේවයි, විඥසබ්‍රහ්මචාරීන් කෙරෙහි වේවයි දෙසන්නේය. විවර කරන්නේ ය, හෙළි කරන්නේය. දෙසා, විවර කොට, හෙළි කොට ආයතිසංවරයට පැමිණෙන්නේය යනු දෘෂ්ටිසම්පන්න-පුද්ගලයාගේ තෙල ධර්මතා වෙයි. මහණෙනි, යම්සේ මන්ද වූ, උඩුහුරුව හෝනා, ළදරු කුමරෙක් අතින් වේවයි, පයින් වේවයි, ගිනි අඟුරක් ඇක්මෙන්නා හාම අත හකුළාගන්නේ වේ ද, මහණෙනි, එපරිද්දෙන් ම දෘෂ්ටිසම්පන්න පුද්ගලයාගේ තෙල ධර්මතායෙක් ඇත: යම්බඳු ආපත්තියෙකින් ව්‍යුත්ථානය පැනේ ද, එබඳු ඇවත් අවන් නමුදු, වහාම ඒ ඇවැත ශාස්තෘන් වහන්සේ කෙරෙහි වේවයි, විඥසබ්‍රහ්මචාරීන් කෙරෙහි වේවයි, දෙසන්නේය, විවර කරන්නේය, හෙළි කරන්නේය. දෙසා විවර කොට, හෙළි කොට, ආයතිසංවරයට පැමිණෙන්නේය."

ඒ මහණ මෙසේ දන්නේය: "දෘෂ්ටිසම්පන්න පුද්ගල යම්බඳු ධර්මතායෙකින් සමන්වාගත වේද, මම ද එබඳු ධර්මතායෙන් සමන්වාගත යෙමි" කියායි. ඒ මහණ විසින් ආර්‍ය්‍ය වූ, ලොකොත්තර වූ, පෘථග්ජනයන් හා අසාධාරණ වූ මේ චතුර්ථඥානය අධිගත වෙයි. (4)

10. තවද මහණෙනි, ඉන් මතුදු, ආර්‍ය්‍යශ්‍රාවක මෙසේ සලකන්නේය: දෘෂ්ටිසම්පන්න පුද්ගල යම්බඳු ධර්මතායෙකින් සමන්වාගත වේද, මම ද එබඳු ධර්මතායෙන් සමන්වාගත යෙම් ද හෝ කියායි.

"මහණෙනි, දෘෂ්ටිසම්පන්න පුද්ගල කෙබඳු ධර්මතායෙකින් සමන්වාගත වේද යත්: සබ්‍රහ්මචාරීන්ගේ යම් ඒ උච්චාවච (උස්පහත්) කිංකර්තව්‍යයෝ (කුමැයි විමසා කටයුතු) ඇද්ද, එහි උත්සුක වේ. වැලිත් ඔහු තුළ අධිශීලශික්ෂායෙහි අධිචිත්තශික්ෂායෙහි අධිප්‍රඥශික්ෂායෙහි තීව්‍රප්‍රාර්ථනා ඇති වේ' යනු දෘෂ්ටිසම්පන්න පුද්ගලයාගේ තෙල ධර්මතා වෙයි. මහණෙනි, යම්සේ තුරුණුවසු ඇති එළදෙන තණ ද කද කන්නී වසුන් බලා ද, මහණෙනි, එපරිදිම දෘෂ්ටිසම්පන්න පුද්ගලයාගේ තෙල ධර්මතා ඇත: සබ්‍රහ්මචාරීන්ගේ යම්යම් උච්චාවච කිංකර්තව්‍යයෝ ඇද්ද, එහි සොත්සුක වේ. වැලිත් අධිශීලශික්ෂායෙහි අධිචිත්තශික්ෂායෙහි අධිප්‍රඥශික්ෂායෙහි තීව්‍රප්‍රාර්ථනා ඇති වේ" යනුයි.

ඒ මහණ මෙසේ දන්නේය: දෘෂ්ටිසම්පන්න පුද්ගල සම්බඳු ධර්මතායෙකින් සමන්වාගත වේ ද, මම ද එබඳු ධර්මතායෙන් සමන්වාගතයෙමි කියායි. ඒ මහණ විසින් ආර්‍ය්‍ය වූ ලොකොත්තර වූ, පුහුදුන් හා අසාධාරණ වූ මේ පඤ්චමඥානය අධිගත වෙයි. (5)

11. පුන ච පරං භික්ඛවෙ අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යථාරූපාය බලතාය දිට්ඨිසම්පන්නො පුග්ගලො සමන්නාගතො, අහම්පි තථාරූපාය බලතාය සමන්නාගතොති.

"කථංරූපාය ච භික්ඛවෙ බලතාය දිට්ඨිසම්පන්නො පුග්ගලො සමන්නාගතො? බලතා එසා භික්ඛවෙ දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස: යං තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ දෙසියමානෙ අට්ඨිකත්වා[1] මනසි කත්වා සබ්බචෙතසො සමන්නාහරිත්වා ඔහිතසොතො ධම්මං සුණාති."

සො එවං පජානාති: යථාරූපාය බලතාය දිට්ඨිසම්පන්නො පුග්ගලො සමන්නාගතො, අහම්පි තථාරූපාය බලතාය සමන්නාගතොති. ඉදමස්ස ඡට්ඨං ඤාණං අධිගතං හොති අරියං ලොකුත්තරං අසාධාරණං පුථුජ්ජනෙහි.(6)

